

අවසන් වාර්තාව

මානව හිමිකම් උල්ලංඝනයවීම්, බරපතල ගණයේ ජාත්‍යන්තර මානුෂීය නීති කඩකිරීම් සහ වෙනත් එවැනි බරපතල වැරදි පිළිබඳව විමර්ශනය කිරීම සඳහා පූර්වගාමීව පත් කරන ලද පරීක්ෂණ කොමිෂන් සභා සහ කමිටු මගින් සොයා ගන්නා ලද කරුණු සහ ඒවායෙහි නිර්දේශ පිළිබඳව විමර්ශනය කිරීම සහ පරීක්ෂා කිරීම, අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම සහ වාර්තා කිරීම සඳහා පත් කරන ලද ජනාධිපති විමර්ශන කොමිෂන් සභාව

I වෙනි වෙළුම

කොමිෂන් සභාවේ වාර්තාව

2023 දෙසැම්බර්



අවසන් වාර්තාව

මානව හිමිකම් උල්ලංඝනයවීම්, බරපතල ගණයේ ජාත්‍යන්තර මානුෂීය නීති කඩකිරීම් සහ වෙනත් එවැනි බරපතල වැරදි පිළිබඳව විමර්ශනය කිරීම සඳහා පූර්වගාමීව පත් කරන ලද පරීක්ෂණ කොමිෂන් සභා සහ කමිටු මගින් සොයා ගන්නා ලද කරුණු සහ ඒවායෙහි නිර්දේශ පිළිබඳව විමර්ශනය කිරීම සහ පරීක්ෂා කිරීම, අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම සහ වාර්තා කිරීම සඳහා පත් කරන ලද ජනාධිපති විමර්ශන කොමිෂන් සභාව

I වෙනි වෙළුම

කොමිෂන් සභාවේ වාර්තාව

2023 දෙසැම්බර්

පටුන

1 වෙනි පරිච්ඡේදය: හැඳින්වීම

1. විධිනියෝගය 27

2. ක්‍රමවේදය 36

3. කාල රාමුව 38

2 වන පරිච්ඡේදය: පූර්වගාමී විමර්ශන කොමිෂන් සභා සහ කමිටු

1. හැඳින්වීම. 40

2. පූර්වගාමී විමර්ශන කොමිෂන් සභාවල විධිනියෝග 41

3. පූර්වගාමී කොමිෂන් සභාවල ඉහත සඳහන් විධිනියෝග පිළිබඳ මෙම ජනාධිපති විමර්ශන කොමිෂන් සභාවේ නිරීක්ෂණ. 47

3 වන පරිච්ඡේදය: පූර්වගාමී විමර්ශන කොමිෂන් සභා සහ කමිටුවල සොයාගැනීම් සහ නිර්දේශ

I කොටස: හැඳින්වීම 64

II වෙනි කොටස: සොයාගත් කරුණු සහ නිර්දේශ 78

III වෙනි කොටස: පූර්වගාමී විමර්ශන කොමිෂන් සභාවල නිර්දේශ ක්‍රියාත්මක කිරීම 203

4 වන පරිච්ඡේදය: ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාවේ විමර්ශන හා පරීක්ෂණ

1. හැඳින්වීම 245

2. ප්‍රසිද්ධ රැස්වීම් පිළිබඳ නිරීක්ෂණ 247

5 වන පරිච්ඡේදය: අවසන් කිරීමේ නිරීක්ෂණ

1. හැඳින්වීම. 312

2. ශ්‍රී ලංකාව තුළ සංක්‍රාන්ති යුක්තිය පිළිබඳව පැවති අතීත ප්‍රවේශ 316

3. ශ්‍රී ලංකාව සම්බන්ධයෙන් එක්සත් ජාතීන්ගේ සංවිධානයෙහි මානය හිමිකම් කවුන්සිලයෙහි යෝජනාව. .. 322

4. යාපනය සහ කිලිනොච්චි වාචික සාක්ෂි ඇගයීම 333

6 වන පරිච්ඡේදය: ඉදිරි ගමන්මග සහ නිර්දේශ

1. හැඳින්වීම 347

2. සංදෘෂ්ඨික තාර්කිකය 350

3. යෝජිත සත්‍යය කොමිෂන් සභාවේ ගති ලක්ෂණ/ආකෘතිය/ මාර්ගෝපදේශ 353

4. යෝජිත සත්‍ය සෙවීමේ සහ ප්‍රතිසන්ධාන කොමිෂන් සභාව පිළිබඳ තවත් නිර්දේශ - සත්‍ය සෙවීමේ සහ ප්‍රතිසන්ධාන කොමිෂන් සභාව විසින් විමර්ශනය කළ යුතු පූර්වගාමී කොමිෂන් සභාවල නිර්දේශ 363

5. අනෙකුත් නිර්දේශ..... 365

පූර්විකාව

2021 ජනවාරි මස 21 වෙනි බ්‍රහස්පතින්දා දින නිකුත් කරන ලද අංක 2211/55 දරන අති විශේෂ ගැසට් පත්‍රය ප්‍රකාරව ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මැතිතුමන් විසින් මෙම කොමිෂන් සභාව (ජනාධිපති විමර්ශන කොමිෂන් සභාව) පත් කරන ලදී.

මානව හිමිකම් උල්ලංඝනයවීම්, බරපතල ගණයේ ජාත්‍යන්තර මානුෂීය නීති කඩකිරීම් සහ වෙනත් එවැනි බරපතල වැරදි පිළිබඳව විමර්ශනය කිරීම සඳහා පූර්වගාමීව පත් කරන ලද පරීක්ෂණ කොමිෂන් සභා සහ කමිටු මගින් සොයා ගන්නා ලද කරුණු සහ ඒවායෙහි නිර්දේශ පිළිබඳව විමර්ශනය කිරීම සහ පරීක්ෂා කිරීම, අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම සහ වාර්තා කිරීම මෙම කොමිෂන් සභාවේ (මෙහි මින් මතු ජනාධිපති විමර්ශන කොමිෂන් සභාව හෝ කොමිෂන් සභාව යනුවෙන් හඳුන්වනු ලබන) විධිනියෝගය වේ. පූර්වගාමී කොමිෂන් සභා මගින් ඉදිරිපත් කර ඇති නිර්දේශ අතරින් මෙතෙක් ඉටුකර නොමැති, ඉතිරි නිර්දේශ ක්‍රියාත්මක කිරීම සඳහා ගත යුතු පියවර නිශ්චිතව සඳහන් කිරීම සඳහා ද ජනාධිපතිතුමාගේ අධිකාර පත්‍රය මගින් කොමිෂන් සභාවට බලය ලබා දී තිබේ. මෙකී කාර්යය ඉටුකිරීම පිණිස මෙම ජනාධිපති විමර්ශන කොමිෂන් සභාව කොළඹ ප්‍රදේශයෙන් පමණක් නොව උතුරු සහ නැගෙනහිර පළාත්වලින් ද සාක්ෂි ලබා ගත් අතර, සාක්ෂිකරුවන්ගේ විස්තර වෘත්තාන්ත වලට ද සවන් දුන්නේය.

ස්වකීය බලතල ක්‍රියාත්මක කිරීමේ දී කොමිෂන් සභාව ගැටුම් වලින් විනාශයට පත්වූ ප්‍රදේශවලට ගමන් කළ අතර, සාක්ෂිකරුවන්ගේ විස්තර වලට සවන්දීමෙන් අනතුරුව, වර්තමාන මෙහොතෙහි සහ අවස්ථාවෙහි පූර්ව නිමිත්ත එයට අනුගාමී අභියෝග පිළිගෙන කල්පවත්නා සාමය සහ සමගිය සහිත යුගයක් උදාකර ගැනීම සඳහා ඒ හා බැඳී ඇති වගකීම ප්‍රකාශ කරන්නේ ය යන සුභවාදී අපේක්ෂාව මගින් ධෛර්යමත් වූ බව කොමිසමට හැඟී යයි.

සියලු ම ශ්‍රී ලාංකිකයින්ට එක සමාන ලෙස ප්‍රජාතන්ත්‍රවාදයේ සහ පුරවැසිභාවයේ ප්‍රතිලාභ බුක්ති විඳීමට හැකිවීමට නම්, සමාජ සුවකිරීම සඳහා කාලය සහ අවකාශය ස්ථාපනය කිරීම අවශ්‍ය කරන අතර, ප්‍රධානම ජනරාවය වේදනාවන්ගේ උරුමය ඔස්සේ තිරසාර සාමය සහ සමගිය සහිත යුගයක් වෙත ගමන් කිරීම සඳහා විය යුතුය.

මෙම කොමිෂන් සභාව තමන් ඉදිරියේ කතා කළ බොහෝ දෙනාගෙන් කරුණු දැනගන්නට ලැබීම පිළිබඳව සතුටට පත්වූ අතර, අදාළ විෂයයෙහි කොටසක් ගවේෂණය කිරීමට ලැබීම සහ එම ක්‍රියාවලියේ දී ඉස්මතු වූ සත්‍යයන් ඉදිරිපත් කිරීමට ලැබීම තමන්ට ලැබුණු වරප්‍රසාදයක් ලෙස සලකයි. අනාගතය සඳහා අත්‍යාවශ්‍ය පාඩම් වන, අපගේ අතීතය පිළිබඳ වෘත්තාන්තය අපට කළ හැකි වූ සෑම ආකාරයකින් ම මෙම සත්‍යය තුළට අන්තර්ගත කිරීමට අපි ප්‍රයත්න දරා ඇත්තෙමු.

රටේ විවිධ ප්‍රදේශවල ජීවත් වන, සමාජයේ සියලු ම මට්ටම්වලට අයත් පුද්ගලයන්ගේ සාක්ෂි විස්තර කිරීම්වලට සවන් දීමෙන් අනතුරුව මෙම කොමිෂන් සභාව, ඇතැම් ඉදිරි කාර්යයන් කෙතරම් අභියෝගාත්මක සහ බැරෑරුම් වූවද, මෙය එක්සත් වූ, සාමකාමී, යළි නැගී සිටින දිවයිනක් ය යන සුභවාදී හැඟීම බෙදා ගැනීමට අදහස් කරයි.

කෙසේ වෙතත්, ප්‍රජාතන්ත්‍රවාදී ශ්‍රී ලංකාවක් තුළ, බිය සැකයෙන් තොර, තෘප්තිමත්, බහුවාර්ගික සහ බහුවිධ ජාතියක ස්වරූපයෙන් අපගේ අපේක්ෂාවන් යථාර්ථයත් බවට පත් කර ගැනීමට නම්, සද්භාවයෙන් යුතුව මෙම කොමිෂන් සභාවෙහි නිර්දේශ ක්‍රියාත්මක කරනු ලබන බව සහතික කිරීම සඳහා අවශ්‍ය තීරණ ගැනීම පිණිස රජය සහ සියලු ම දේශපාලන නායකයින් දේශපාලන අධිෂ්ඨානය සහ අවංක දේශපාලන කැපවීම ප්‍රදර්ශනය කළ යුතු ය.

මෙම කොමිෂන් සභාවට ජනතාවගෙන් දැනගැනීමට ලැබුණු කරුණු වලට අනුව, පූර්වගාමී කොමිෂන් සභා සහ කමිටු මගින් නිර්දේශ කර ඇති පරිදි, දේශපාලන නායකයින් සාධාරණත්වයේ, අන් අයගේ

අදහස්වලට අවස්ථාව දීමේ සහ සම්මුතියේ හැඟීමෙන් යුතුව මූලිකත්වය ගන්නා තාක් කල්, සියලු පුරවැසියන් සඳහා පොදු යහපත, ප්‍රතිසන්ධානය, යුක්තිය සහ සමානාත්මතාවය වැඩිදියුණු කරන පොදු එකඟත්වයන් ගොඩනැගීමේ උපාය මාර්ගවලට සහායවීම සඳහා ජනතාව සූදානමින් සහ කැමැත්තෙන් සිටින බවට මෙම කොමිෂන් සභාවට ඉහළ විශ්වාසයක් තිබේ.

මෙම කොමිෂන් සභාව විසින් සොයාගත් කරුණු සහ ඉදිරිපත් කරනු ලබන යෝජනා මගින් ප්‍රජා සවිඥානිකත්වය සහිත සියලු නායකයින්ගේ සහ විවිධ ප්‍රජා පාර්ශ්වකරුවන්ගේ සහයෝගී ප්‍රයත්නයන් අවශ්‍ය කරන, සමාජ සුවකිරීම, ප්‍රතිසන්ධානය සහ සාමය ප්‍රවර්ධනය කරන ව්‍යූහයන් සහ යාන්ත්‍රණ ස්ථාපනය කිරීම පිණිස ප්‍රතීයමාන ප්‍රතිචාර ඇති කරනු ඇතැයි මෙම කොමිෂන් සභාව අපේක්ෂා කරයි.

ශ්‍රී ලංකාවේ ආණ්ඩු ක්‍රමයේ විවිධ ස්තර අතර මිත්‍රත්වය, සහයෝගීත්වය, පශ්චාත්-ගැටුම් සමයේ සාමය සහ ආරක්ෂාව වැඩිදියුණු කරන පදනමක් ස්ථාපනය කිරීම සඳහා මෙම නිර්දේශ ඉතා වැදගත් සාධකයක් වනු ඇති බවට මෙම මෙම කොමිෂන් සභාවට විශ්වාසයක් තිබේ. මෙම කොමිෂන් සභාව ස්වකීය දෙවෙනි අතුරු වාර්තාවේ සත්‍ය සෙවීමේ යාන්ත්‍රණයක් සඳහා වන නිර්දේශ ඉදිරිපත් කිරීමේ දී දැක්වූ බලවත් උනන්දුව, අපි නිවැරදි දිශාවට සංක්‍රමණය වෙමින් සිටින්නේය යන අපේක්ෂාව සහ බලාපොරොත්තුව ඇතිකරන අනාගත යථාර්ථයකට පරිවර්තනය වී තිබේ. මෙම අවසන් වාර්තාව සකස් කිරීමේ දී පරීක්ෂාවට ලක්කරන ලද පූර්වගාමී කොමිෂන් සභා විසින් ඉදිරිපත් කරන ලද නිර්දේශ ගණනාවකට ම නිසි පිළිගැනීමක් ලැබී නොතිබුණ ද, උපදේශක මණ්ඩලයක් පිහිටුවීම, දීර්ඝ කාලයක් මුළුල්ලේ සිරගත කරගෙන සිටින රැඳවූවන් වහාම නිදහස් කිරීම සහ සත්‍ය සෙවීමේ යාන්ත්‍රණයක් ස්ථාපනය කිරීම සඳහා වන අපගේ අතුරු නිදේශවලට නිසි පිළිගැනීම ලබා දී ඇති බව දැනගන්නට ලැබීම සතුටට කරුණක් වේ.

අපගේ නිර්දේශ මගින් අපි දණ්ඩ මුක්තිය ප්‍රතික්ෂේප කරන අතර, පූර්වගාමී කොමිෂන් සභා විසින් ලේඛනගත කර ඇති සියලු ම ක්‍රියාවන් සහ සිද්ධීන් සඳහා වගවීම සාක්ෂාත් කර ගැනීම ප්‍රවර්ධනය කරන්නෙමු.

මෙම ජනාධිපති විමර්ශන කොමිෂන් සභාව ඓතිහාසික සිදුවීම්, සිද්ධීන් සහ වාර්තා වී ඇති අයුක්තීන් පිළිගනියි;

මෙරටෙහි දේශපාලන නිදහස, භෞමික අඛණ්ඩතාවය, සාමය, සාධාරණත්වය, එක්සත්කම සහ සංවර්ධනය වෙනුවෙන් දිවි පූජා කළ සහ දායක වූ පුද්ගලයන්ට ප්‍රනාමය පුදකර සිටියි;

තම විවිධත්වයන් නොතකා සියලු ම ශ්‍රී ලාංකික පුරවැසියන් රටේ සහ එහි අනාගත පරම්පාවන්හි අභිවෘද්ධිය උදෙසා එක්සත්ව නැගී සිටින බව විශ්වාස කරයි;

භේද සමාදාන කර, ප්‍රජාතන්ත්‍රවාදී මූලධර්ම, සමාජ සාධාරණත්වය, සහ මානව ගරුත්වය, සමානාත්මතාවය සාක්ෂාත් කර ගැනීම සහ මූලික මානව හිමිකම්වල සහ නන් වැදෑරුම් නිදහසෙහි අභිවෘද්ධිය මත පදනම් වූ සමාජයක් ගොඩනැගිය යුතු යැයි ද;

නීතිය විසින් සියලු පුරවැසියන්ව එක සමාන ලෙස ආරක්ෂා කරන සහ රාජ්‍ය පාලනය ජනතාවගේ කැමැත්ත මත පදනම් වන ප්‍රජාතන්ත්‍රවාදී, විවෘත සමාජයක් සඳහා වන මූලික පදනම සහ නව ආරම්භයක් සපයා දිය යුතු යැයි ද;

සියලු ම පදිංචිකරුවන්ගේ ජීවන මට්ටම වැඩිදියුණු කර, එක් එක් පුද්ගලයාගේ විභවයෙහි බැමි මුදා හැරිය යුතු යැයි ද; අන්තර්ජාතික ප්‍රජාව තුළ දේශපාලන ස්වාධීනත්වය සහිත ස්වෛරී රාජ්‍යයක් ලෙස ස්වකීය නියමාකාර තත්ත්වය ආරෝපණය කර ගැනීමට සමර්ථභාවය ඇති එක්සත්, ප්‍රජාතන්ත්‍රවාදී ශ්‍රී ලංකාවක් ස්ථාපනය කළ යුතු යැයි සම්මත කරයි.

අපි මෙම අවසන් වාර්තාව ඔබ වෙත ඉදිරිපත් කරන්නේ එම අවංක බලාපොරොත්තුව පෙරදැරි කරගෙන ය.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ජනාධිපති
අතිගරු රනිල් වික්‍රමසිංහ මහතා වෙත

අතිගරු රනිල් වික්‍රමසිංහ මහතා,

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ජනාධිපති,

ජනාධිපති ලේකම් කාර්යාලය,

කොළඹ 01.

අතිගරු ජනාධිපතිතුමනි,

මෙම ජනාධිපති විමර්ශන කොමිෂන් සභාවේ කොමසාරිස්වරුන් ලෙස පහත අත්සන් කර ඇති අය පත්කරමින්, (393 අධිකාරය වූ) පරීක්ෂණ කොමිෂන් සභා පනතෙහි 2 වෙනි වගන්තියෙහි දක්වා ඇති විධිවිධාන ප්‍රකාරව හිටපු ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතා විසින් 2021 ජනවාරි 21 වෙනි බ්‍රහස්පතින්දා දින නිකුත් කරන ලද ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 2211/55 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය සහ ඉන්පසුව 2021 පෙබරවාරි 12 වෙනි සිකුරාදා දින නිකුත් කරන ලද අංක 2214/75 දරන ගැසට් පත්‍රය, 2021 ජූලි 27 වෙනි අඟහරුවාදා දින නිකුත් කරන ලද අංක 2238/6 දරන ගැසට් පත්‍රය සහ 2022 ජනවාරි 18 වෙනි අඟහරුවාදා දින නිකුත් කරන ලද අංක 2263/4 දරන ගැසට් පත්‍රයට අදාළව මෙය ලියන බව අපි ගෞරවයෙන් යුතුව සඳහන් කරන්නෙමු. මෙම කොමසාරිස්වරුන් 2021 ජූලි මාසයේ දී 1 වෙනි අතුරු වාර්තාව ද, 2022 පෙබරවාරි මාසයේ දී 2 වෙනි අතුරු වාර්තාව ද වශයෙන් අතුරු වාර්තා දෙකක් භාර දුන් බව අපි සතුටින් සඳහන් කරන්නෙමු. එමෙන්ම මෙම ජනාධිපති විමර්ශන කොමිෂන් සභාව 2023 පෙබරවාරි මාසයේ දී මෙම අවසන් වාර්තාවට ඇතුළත් කිරීමට නියමිත නිර්දේශවල සාරාංශයක් ද ඔබතුමාට භාර දුන්නේ ය.

අප විසින් සිදුකරන ලද අදහස් විමසීම්වල විශාලත්වය සහ මෙම අවසන් වාර්තාව ඔබතුමා වෙත ඉදිරිපත් කිරීමේ කාර්යය සාක්ෂාත් කර ගැනීම සඳහා දැරිය යුතු පරිශ්‍රමය සහ ප්‍රයත්නය සැලකිල්ලට ගෙන ඔබතුමා විසින් අදාළ ගැසට් නිවේදන මගින් මෙම කොමිෂන් සභාවෙහි කාලය 2023 දෙසැම්බර් මාසය දක්වා දීර්ඝ කිරීමට ද සතුටින් කටයුතු කරන ලදී.

අපි ගෞරවයෙන් යුතුව ඔබතුමා වෙත මෙම වාර්තාව ඉදිරිපත් කර භාර දෙන්නෙමු.

උතුමාණෙනි, අපගේ ඉහළ ම ශුභාශිංසන ඔබතුමාට පිළිගන්වන්නෙමු.

මෙයට අවංක,

විනිසුරු ඒ.එච්.එම්.ඩී. නවාස්, සභාපති

චන්ද්‍රා ප්‍රනාන්දු මහතා, සාමාජික

නිමල් අබේසිරි මහතා, සාමාජික

යෝගේශ්වරී පත්කුනරාජා මහත්මිය, සාමාජික

- *මානව හිමිකම් උල්ලංඝනයවීම්, බරපතල ගණයේ ජාත්‍යන්තර මානුෂීය නීති කඩකිරීම් සහ වෙනත් එවැනි බරපතල වැරදි පිළිබඳව විමර්ශනය කිරීම සඳහා පූර්වගාමීව පත් කරන ලද පරීක්ෂණ කොමිෂන් සභා සහ කමිටු මගින් සොයා ගන්නා ලද කරුණු සහ ඒවායෙහි නිර්දේශ පිළිබඳව විමර්ශනය කිරීම සහ පරීක්ෂා කිරීම, අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම සහ වාර්තා කිරීම සඳහා පත් කරන ලද ජනාධිපති විමර්ශන කොමිෂන් සභාව.*

ගරු ඒ.එච්.එම්.ඩී. නවාස් මැතිතුමා - සභාපති

ශ්‍රී ලංකාවේ ශ්‍රේෂ්ඨාධිකරණ විනිශ්චයකාර

.....

චන්ද්‍රා ප්‍රනාන්දු මැතිතුමා - සාමාජික

විශ්‍රාමික පොලිස්පති

.....

නිමල් අබේසිරි මැතිතුමා - සාමාජික

විශ්‍රාමික දිස්ත්‍රික් ලේකම්

.....

යෝගේශ්වරී පත්කුනරාජා මැතිණිය - සාමාජික

යාපනය නගර සභාවේ හිටපු නගරාධිපතිනිය

.....

ස්තුතිය

මෙම ජනාධිපති විමර්ශන කොමිෂන් සභාවේ වාර්තාව අතිගරු ජනාධිපති රනිල් වික්‍රමසිංහ මැතිතුමා වෙත භාර දීමට ලැබීම ඉමහත් ගෞරවයකි. මෙම වාර්තාව සකස් කිරීමේ කාර්යය සඵල කර ගැනීම සඳහා දායකත්වය දැක්වූ සියලු ම දෙනාට මෙම කොමිෂන් සභාවේ සභාපතිවරයා වශයෙන් මම නිලවශයෙන් මාගේ කෘතඥතාවය පළකර සිටිමි. ප්‍රධාන වශයෙන් ම, සමස්ත ජාතියට ම පීඩාවක් ඇතිකරමින්, දෙපාර්ශ්වයට ම බරපතල හානි ගෙන දුන් ගැටුම් අතරතුර දී ජාත්‍යන්තර මානුෂීය නීතිය උල්ලංඝනය කිරීම් සහ ජාත්‍යන්තර මානව හිමිකම් කඩවීම් සම්බන්ධයෙන් පූර්වයෙන් පත්කරන ලද කොමිෂන් සභා මගින් සොයා ගන්නා ලද කරුණු සහ නිර්දේශ ලේඛනගත කිරීම පෙරදැරි කර ගත් මෙම ඓතිහාසික සංධිස්ථානයක් වූ කොමිෂන් සභාවේ විධිනියෝගය ක්‍රියාත්මක කිරීමේ කාර්යය සම්පූර්ණ කරන බව සහතික කර ගැනීම සඳහා දිගු වේලාවක් රැස්වෙමින් කැපවී කටයුතු කළ මාගේ සහෝදර කොමසාරිස්වරුන් සියලු දෙනාට මාගේ කෘතඥතාවය පුද කිරීමට කැමැත්තෙමි.

මෙම විධිනියෝගය සම්පූර්ණ කිරීම සඳහා දැඩි සහයෝගීත්වයෙන් යුතුව සහ අන්‍යෝන්‍ය සහයෝගයෙන් ක්‍රියා කළ මාගේ සහෝදර කොමසාරිස්වරුන්ට මාගේ ඉමහත් කෘතඥතාවය පුද කරමි. අවම සම්පත් සහිතව සහ රටේ පැවති අරබුදයෙහි අනෙකුත් බලපෑම් මධ්‍යයෙහි වුව ද විවිධ අවස්ථාවල දී බොහෝ දෙනෙක් මෙම කොමිෂන් සභාවට සහාය දැක්වූහ. එමෙන්ම, කොමිෂන් සභාවට ස්වකීය සාකච්ඡාකිරීම් වලදී සහ, අවබෝධ කර ගැනීමට සහ නිවැරදි දෘෂ්ටි කෝණයට ගෙන ඒමට ප්‍රයත්න දැරීමේ දී පැහැදිලි කර ගැනීමට හැකි වූ සංකීර්ණ ජාත්‍යන්තර නීතිමය කරුණු අවබෝධ කර ගැනීම සඳහා ප්‍රයත්න දැරීමට සිදු වූ අතර, එහිදී කොමිෂන් සභාව ශ්‍රී ලංකාවේ මෙන්ම විදේශ රටවල ද විද්වත් ප්‍රකාශන සහ පොත්පත් ගණනාවක් පරිහරණය කළ අතර, කොමිෂන් සභාව ඒවායින් ලබාගත් සහාය වෙනුවෙන් කෘතවේදීත්වය පළ කර සිටියි.

එමෙන්ම මම මෙම කොමිෂන් සභාවේ ජ්‍යෙෂ්ඨ කාර්ය මණ්ඩල සාමාජිකයින්ට මාගේ අවංක කෘතවේදීත්වය පළ කිරීමට මෙය අවස්ථාව කර ගන්නා අතර, ඔවුන්ගේ සහයෝගය නොතිබෙන්නට මෙම කොමිෂන් සභාවේ අරමුණු සාක්ෂාත් කර ගැනීමට නොහැකි වෙන්නට තිබූ බව ද සඳහන් කිරීමට කැමැත්තෙමි.

තවද, කොමිෂන් සභාවේ විධිනියෝගයට අදාළ කාරණා සම්බන්ධයෙන් ලිඛිතව අදහස් ඉදිරිපත් කළ සියලු ම දෙනාටත්, තම අදහස් ප්‍රකාශ කිරීම සඳහා කොමිෂන් සභාව ඉදිරියේ පෙනී සිටි සියලු ම දෙනාටත් කොමිෂන් සභාව සිය කෘතඥතාවය පළ කර සිටියි. එපමණක් නොව, සාර්ථක ඉදිරි කාර්යයකට තමන්ගේ විශේෂ සහයෝගය ලබා දීම සඳහා කොමිෂන් සභාව ඉදිරියේ තම අදහස් ප්‍රකාශ කිරීමට මෙරට සහ විදේශයන්හි සිට දුර බැහැර ගෙවා පැමිණ විශේෂ කැපවීමක් දැක්වූ ජනතා සාමාජිකයින් පිළිබඳව මෙහි දී විශේෂයන් සඳහන් කළ යුතු වේ. තවද, කොමිෂන් සභාව ඉදිරියට පැමිණ, පිළිවෙලින් දකුණු අප්‍රිකාවේ සහ කොලොම්බියාවේ ක්‍රියාත්මක වන සත්‍ය සෙවීමේ යාන්ත්‍රණ සහ ශ්‍රී ලංකාවට ඒවායෙහි ඇති අදාළත්වය පිළිබඳව ස්වකීය දෘෂ්ටි කෝණයන් ඉදිරිපත් කළ ශ්‍රී ලංකාවේ දකුණු අප්‍රිකානු ජනරජයේ මහකොමසාරිස් අතිගරු සැන්ඩයිල් එඩ්වින් ස්ලෝක් මහතා සහ ශ්‍රී ලංකාව සහ මාලදිවයින සඳහා යුරෝපා සංගමයේ නියෝජිත මණ්ඩලයේ නියෝජ්‍ය ප්‍රධානී ලාර්ස් බ්‍රෙඩල් මහතා වැනි විදේශ රටවල රාජ්‍යතාන්ත්‍රිකයන්ට ද මෙම කොමිෂන් සභාව ස්වකීය කෘතඥතාවය පළකර සිටියි.

කොළඹ දී මෙන්ම උතුරු සහ නැගෙනහිර පළාත්වලදී ද පවත්වන ලද කොමිෂන් සභාවේ කටයුතු පිළිබඳව පුළුල් මාධ්‍ය ආවරණයක් ලබා දීම වෙනුවෙන් මෙම කොමිෂන් සභාව මුද්‍රිත සහ විද්‍යුත් මාධ්‍යවලට ස්වකීය කෘතඥතාවය පළකර සිටියි.

සමස්තයක් ලෙස, කොමිෂන් සභාවේ කටයුතු වලට විවිධ ආකාරවලින් සහාය ලබා දුන් සියලු ම දෙනාට මෙම කොමිෂන් සභාව ස්වකීය අවංක ස්තුතිය පුද කර සිටියි.

මෙම වාර්තාව නිවැරදිව සම්පාදනය කිරීම සඳහා සහ අනෙකුත් පර්යේෂණ සහ සංස්කරණ කාර්යයන් සඳහා අගනා සහයෝගයක් ලබා දෙමින් නූරුල් ෆාරා නිකිටා රශීන් මහත්මිය, LLB (ගෞරව) - ලන්ඩන්, මෙම ජනාධිපති විමර්ශන කොමිෂන් සභාව සඳහා ඉටු කළ ඉතා වැදගත් කාර්යභාරයක් වෙනුවෙන් එම මහත්මියට ද මෙම කොමිෂන් සභාවේ ස්තුතිය පුද කරන්නෙමු. එම මහත්මිය දැඩි උද්‌යෝගයෙන් යුතුව, විශිෂ්ඨ කැපවීමකින් ක්‍රියාකිරීම කොමිෂන් සභාවේ පැසසුමට ලක්වේ.

තවද, මෙම ජනාධිපති විමර්ශන කොමිෂන් සභාවේ මනා ක්‍රියාකාරීත්වය සහ සම්බන්ධීකරණය සහතික කරමින් උපරිම කැපවීමෙන් සහ නොපසුබට සහයෝගයෙන් කටයුතු කළ අභාවප්‍රාප්ත එස්.ඒ. රන්ජන් මහතාට ද අපි අපගේ මාහැඟි ස්තුතිය පුද කිරීමට මෙය අවස්ථාව කර ගනිමු. ඒ මහතා වෙත පවරන ලද කාර්යයන් සහ කටයුතු ප්‍රශංසනීය ලෙස ඉටුකරමින් ස්වකීය ආත්මලාභය නොතකා ඒ මහතා ඉටු කළ සේවය දැඩි ඇගයීමට ලක්කරන්නෙමු.

විනිසුරු ඒ.එච්.එම්.ඩී. නවාස්

කොමිෂන් සභාවේ ලේකම්

2023 දෙසැම්බර්

කොමිෂන් සභාවේ විධිනියෝගය

මානව හිමිකම් උල්ලංඝනයවීම්, බරපතල ගණයේ ජාත්‍යන්තර මානුෂීය නීති කඩකිරීම් සහ වෙනත් එවැනි බරපතල වැරදි පිළිබඳව විමර්ශනය කිරීම සඳහා පූර්වගාමීව පත් කරන ලද පරීක්ෂණ කොමිෂන් සභා සහ කමිටු මගින් සොයා ගන්නා ලද කරුණු සහ ඒවායෙහි නිර්දේශ පිළිබඳව විමර්ශනය කිරීම සහ පරීක්ෂා කිරීම, අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම සහ වාර්තා කිරීම සඳහා වන ජනාධිපති විමර්ශන කොමිෂන් සභාව (කොමිෂන් සභාව) හිටපු ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතා විසින් (393 අධිකාරය වූ) පරීක්ෂණ කොමිෂන් සභා පනතෙහි 2 වෙනි වගන්තියෙහි දක්වා ඇති විධිවිධාන ප්‍රකාරව 2021 ජනවාරි 20 දිනැති ජනාධිපති අධිකාර පත්‍රය ප්‍රකාරව පත් කරන ලදී.

2021 ජනවාරි 21 වෙනි බ්‍රහස්පතින්දා දින නිකුත් කරන ලද ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 2211/55 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය ප්‍රකාරව කොමිෂන් සභාවේ විධිනියෝගය මානව හිමිකම් උල්ලංඝනයවීම්, බරපතල ගණයේ ජාත්‍යන්තර මානුෂීය නීති කඩකිරීම් සහ වෙනත් එවැනි බරපතල වැරදි පිළිබඳව විමර්ශනය කිරීම සඳහා පූර්වගාමීව පත් කරන ලද පරීක්ෂණ කොමිෂන් සභා සහ කමිටු මගින් සොයා ගන්නා ලද කරුණු සහ ඒවායෙහි නිර්දේශ පිළිබඳව විමර්ශනය කිරීම සහ පරීක්ෂා කිරීම, අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම සහ වාර්තා කිරීම වේ. ඉන් අනතුරුව නිකුත් කරන ලද ගැසට් නිවේදන මගින් මෙම කොමිෂන් සභාවේ කාලය තවදුරත් දීර්ඝ කරන ලදී.

කොමිෂන් සභාවට පහත සඳහන් කරුණු පරීක්ෂා කර සහ විමර්ශනය කර, අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමේ හෝ වාර්තා කිරීමේ කාර්යය පවරන ලදී:

"(අ) මානව හිමිකම් උල්ලංඝනයවීම් පිළිබඳව විමර්ශනය කිරීම සඳහා පූර්වගාමීව පත්කරන ලද පරීක්ෂණ කොමිෂන් සභා සහ කමිටු මගින් සිදු කරන ලද විමර්ශනයන්හි දී බරපතල ගණයේ මානව හිමිකම් උල්ලංඝනයවීම්, බරපතල ගණයේ ජාත්‍යන්තර මානුෂීය නීති කඩකිරීම් සහ වෙනත් එවැනි වරදවල් පිළිබඳව අනාවරණය කරගෙන තිබේද යන වග;

(ආ) එකී පරීක්ෂණ කොමිෂන් සභා සහ කමිටු මගින් උක්ත බරපතල ගණයේ මානව හිමිකම් උල්ලංඝනයවීම්, බරපතල ගණයේ ජාත්‍යන්තර මානුෂීය නීති කඩකිරීම් සහ වෙනත් එවැනි වරදවල් සම්බන්ධව සොයාගත් කරුණු කවරේද යන්න හඳුනා ගැනීම සහ එකී කරුණු පිළිබඳව කටයුතු කළ යුතු ආකාරය සම්බන්ධයෙන් නිර්දේශ ලබා තී තිබේද යන වග;

(ඇ) එකී නිර්දේශයන් සම්බන්ධයෙන් පවත්නා නීතිය ප්‍රකාරව මෙතෙක් කටයුතු කර ඇති ආකාරය හා වර්තමාන රාජ්‍ය ප්‍රතිපත්තියට අනුකූලව තවදුරටත් එම නිර්දේශ ක්‍රියාත්මක කිරීමට ගත යුතු පියවරයන් මොනවාද යන්න;

(ඈ) ඉහත (අ) සහ (ඇ) ප්‍රකාරව කටයුතු කරනු ලබන්නේද යන්න සම්බන්ධව අධීක්ෂණය කිරීම."

(අදාළ ගැසට්පත්‍රයේ පළකර ඇති පරිදි).

විධායක සාරාංශය

ශ්‍රී ලංකා රජය සහ රාජ්‍ය නොවන ක්‍රියාකාරිකයෙක් (එල්.ටී.ටී.ඊ. සංවිධානය) අතර පැවති ගැටුම් අතරතුර දී ජාත්‍යන්තර මානුෂීය නීතිය සහ ජාත්‍යන්තර මානව හිමිකම් නීතිය උල්ලංඝනයවීම් පිළිබඳව සොයා බැලීඹට පූර්වයෙන් පත්කර තිබූ කොමිෂන් සභා සහ කමිටු විසින් සොයාගන්නා ලද කරුණු සහ ඒවායෙහි නිර්දේශ ඇගයීම සඳහා හිටපු ජනාධිපතිවරයා විසින් මෙම ජනාධිපති විමර්ශන කොමිෂන් සභාව ස්ථාපනය කර එයට බලය පවරන ලදී.

සමාජයේ සියලු ම ස්ථරයන්ට අයත් සාක්ෂිකරුවන් විසින් ලබාදෙන ලද සාක්ෂි සහ මෙම ජනාධිපති විමර්ශන කොමිෂන් සභාව ඉදිරියේ දී ඉදිරිපත් කරන ලද ලියවිලි පරීක්ෂා කර බැලීමේ දී, මෙම සාක්ෂි එකින් එක සලකා බලන විට ඒවා විවිධ දිශා ඔස්සේ විසිර යන බව පැහැදිලි වෙයි. ජාත්‍යන්තර මානුෂීය නීතිය සහ ජාත්‍යන්තර මානව හිමිකම් නීතිය උල්ලංඝනයවීම් සම්බන්ධයෙන් වගකිවයුත්තන්ට එම උල්ලංඝනයවීම් පිළිබඳ වගකීම පැවරිය යුතු යැයි ඇතැම් සාක්ෂිකරුවන් ඉල්ලා සිටි අතර, සාමය සහ සංහිඳියාව එක්සත් ශ්‍රී ලංකාවක් ගොඩනැගීම සඳහා අත්‍යාවශ්‍ය සාධක විය යුතු ය යන්න සාක්ෂිකරුවන්ගෙන් බහුතරයකගේ අපේක්ෂව විය. යමෙකුගේ සතුරාට හෝ වැරදි සිදුකළ පුද්ගලයාට සමාව දීම සහ එම පුද්ගලයා සමග සමාදාන වීම පුද්ගලික කරුණක් වන අතර, එසේ සිදුකළ යුතු යැයි අවවාද කිරීම හෝ බලයෙන් පැවරීම කළ නොහැක. එබැවින්, සත්‍ය සෙවීමේ කොමිෂන් සභාවල ප්‍රතිසන්ධාන බලපෑම පුරෝකථනය කිරීමට හෝ උපකල්පනය කිරීමට හැකියාවක් නැත. සම්පූර්ණ සත්‍ය දැනගැනීමට ඇති අභිලාෂය සාර්වත්‍රික නොවන අතර එසේ විය යුතු යැයි උපකල්පනය කළ නොහැක.

මෙම ජනාධිපති විමර්ශන කොමිෂන් සභාව ඉදිරියේ සාක්ෂි ලබා දුන් හිටපු එල්.ටී.ටී.ඊ. සටන්කරුවන්ගෙන් කිසිවෙක් නඩුපැවරීම සම්බන්ධව කිසිවිටෙක එකාකාර අදහස් ප්‍රකාශ නොකළ බව මෙහිදී සිහිපත් කළ යුතු වේ. ඔවුන් ශ්‍රී ලංකා රජය ඔවුන්ගේ ජීවන තත්ත්වයන් වැඩිදියුණු කර ගැනීමට සහ කරදරයකින් තොර, ඔබින ජීවිතයක් ගත කිරීම සඳහා අවශ්‍ය මූලික වියපැහැදම් සපයා දීමට අවශ්‍ය පියවර ගත යුතුය යන බලාපොරොත්තුව සහ අපේක්ෂාව පළ කළේය. හිටපු සටන්කරුවන් සමග සම්බන්ධකම් පැවැත්වීමෙන් වැළකී සිටි මහජනතාව එක්තරා මට්ටමකට ඔවුන් සමග කථාබහ කිරීමෙන් වැළකී සිටින බවක් සහ ඔවුන්ව බැහැර කරනු ලබන බවක් ප්‍රදර්ශනය කළේය.

එකිනෙකා මරාගන්නා කටුක යුගයට ආපසු යාමට තමන්ට අවශ්‍ය නැති බව සාක්ෂිකරුවන් ගණනාවක් ම සාක්ෂි දෙමින් සඳහන් කළහ. අපට ඉදිරි ගමන් මග දෙස බැලීමට සිදුව ඇත්තේ මෙම සංදර්භය තුළ වන අතර, මෙම ජනාධිපති විමර්ශන කොමිෂන් සභාව වන අපි, සාක්ෂි වලින් ගොඩනැගුණු විශ්වාසය මත, සංක්‍රාන්ති යුක්තිය සඳහා වන බිම් මට්ටමේ ප්‍රවේශයක් විසින් ශ්‍රී ලංකාවේ සාමය සහ සංහිඳියාව සඳහා වන න්‍යාය පත්‍රය මෙහෙයවිය යුතුය යන නිගමනයට නොවැළැක්විය ලෙස එළඹුණු බැවින්, මෙම කොමිෂන් සභාව ස්වකීය දෙවැනි අතුරු වාර්තාවේ දී සහ නිර්දේශවල සාරාංශයේ දී 'සත්‍ය සෙවීමේ සහ ප්‍රතිසංධාන කොමිසමක්' නිර්මාණය කර ක්‍රියාත්මක කළ යුතු ය යන අදහස අදිරිපත් කළේ අප ඉදිරියෙහි ඇති සාක්ෂි ප්‍රමාණයෙහි විශාලත්වය නිසා ය. මෙම කොමිෂන් සභාව මෙහි ඉදිරි පරිච්ඡේද වලදී එවැනි දෘෂ්ටි කෝණයක් ස්ථාපනය කරන, සාක්ෂිකරුවන් ලබා දුන් සාක්ෂි විස්තර කර ඇති අතර, කොමිෂන් සභාව ශ්‍රී ලංකාව සඳහා පහළ සිට ඉහළට වන ප්‍රවේශයකින් දකින්නා වූ සංක්‍රාන්ති යුක්ති වැඩසටහනක් අවශ්‍ය ය යන සංකල්පය ගොඩනගන ලද්දේ මෙම පසුබිම තුළ ය.

පූර්වගාමී කොමිෂන් සභා විසින් ක්‍රියාත්මක කිරීම සඳහා අපමණ නිර්දේශ සංඛ්‍යාවක් ඉදිරිපත් කරනු ලැබුව ද, එම නිර්දේශ සඳහා අවසර දීමට හෝ අනුමත කිරීමට දේශපාලන අධිෂ්ඨානය හෝ මහජන සහයෝගය නොතිබුණි.

වින්දිතයන් අති විශාල සංඛ්‍යාවකගෙන් සාක්ෂි ලබා ගත්ත ද, ඔවුන්ගෙන් බොහෝ දෙනෙක් වරදකරුවන්ට දඬුවම් ලබා දීමේ අවශ්‍යතාවය අවධාරණය කළේ නැත. ප්‍රතිපාක්ෂික නඩු විභාගවලට යොමු නොවී, ඔවුන්ට විඳීමට සිදුවූ පීඩාවන් වෙනුවෙන් වන්දියක් ලබා ගෙන තම ඉදිරි ජීවිතය සාර්ථක කර ගැනීමට හැකි කර ගැනීම ඔවුන්ගේ බලාපොරොත්තුව විය. වරදකරුවන්ට එරෙහිව නඩු විභාග පවත්වා ඔවුන්ට දඬුවම් ලබා දිය යුතු යැයි ඇතැම් වින්දිතයින් දැඩි ලෙස ඉල්ලා සිටිය හ. තමන්ට සිදු වූයේ කුමක්ද යන්න පිළිබඳ සත්‍යය දැනගැනීම සියලු ම වින්දිතයන්ගේ එක්සත් වූ අභිලාෂය විය.

පැහැදිලිව ම, සත්‍ය සෙවීමේ කොමිෂන් සභාවක් අතිශය වැදගත් වීමට හේතුව මෙය වේ. එයට නිශ්චිතව ම සත්‍යය සොයා ගැනීමේ සහ හෙළිකිරීමේ මාර්ගය සපයා දිය හැක. එසේ කිරීමේ දී එම කොමිෂන් සභාවට, හානිපූරණය සඳහා හෝ සමාව දීම සඳහා හෝ දඬුවම් දීම සඳහා හෝ වේවා, එක් එක් සිද්ධියේ වින්දිතයන්ගේ අදහස් සැලකිල්ලට ගෙන යෝග්‍ය ප්‍රතිකාර්ය ක්‍රියාමාර්ග සඳහා නිර්දේශ ඉදිරිපත් කළ හැක. සත්‍ය සෙවීමේ කොමිෂන් සභාව දණ්ඩ මුක්තිය අවසන් කිරීම සහ වගවීම දිරිමත් කිරීම සඳහා වන ඉතා වැදගත් පියවරක් වේ. අධික ලෙස විපරම් සහගත වූ සහ අන්තර්කරණය වූ සංවිධානයක් ලෙස එම කොමිෂන් සභාවට සත්‍යය අනාවරණය කර ගැනීම සහ උල්ලංඝනයවීම් සිදු වූ බව තහවුරු කර ගැනීම සඳහාත්, විවිධ ආකාරවලින් යුක්තිය ඉටුකර ගත හැකි බව පිළිගනිමින් වින්දිතයන්ගේ විශේෂිත අවශ්‍යතාවලට ගැළපෙන ලෙස සකස් කළ පිළියම් හඳුනාගැනීම සඳහාත් පහසුකම් සැලසිය හැක. පූර්වාගාමී කොමිෂන් සභා සියල්ල විසින් නිර්දේශ කර ඇති පරිදි, ඇතැම් සිද්ධීන් වලදී නඩුපැවරීම් සඳහා ඇති මාර්ග නිසි ලෙස අවහිරයකින් තොරව පවතියි. එය, සත්‍ය සෙවීමේ කොමිෂන් සභාව විසින් නිර්දේශ කරනු ලබන පරිදි, සත්‍යය සෙවීම, පිළිගැනීම සහ සමාව ඉල්ලීම, සහ වන්දි ලබාදීම සහතික කරන ක්‍රියාමාර්ගවලට සමගාමීව ක්‍රියාත්මක කළ හැක.

සියලු කණ්ඩායම් අතර, එනම් සියලු පාර්ශ්ව වල වින්දිතයන් සහ වරදකරුවන් අතර එකමුතුකම සහ ප්‍රතිසන්ධානය දිරිමත් කිරීම සත්‍ය සෙවීමේ කොමිෂන් සභාවේ වැදගත් ම අභිලාෂය වේ. සත්‍ය සෙවීමේ කොමිෂන් සභාවේ සුවකිරීමේ ඡත්‍රය සෙවනේ වගවීම සඳහා ඇති සියලු ම මාවත් යොදවා ගැනීම මගින් ප්‍රතිපාක්ෂික නොවන වාතාවරණයක් තුළ මෙය වඩාත් ම සාර්ථක ලෙස ඉටුකර ගත හැක.

එම නිසා, එවැනි ආයතනයක් පිහිටුවිය යුතු යැයි අපි සියලු ශ්‍රී ලාංකිකයන්ට නිර්දේශ කරන අතර, පූර්වගාමී කොමිෂන් සභාවල නිර්දේශ, සාක්ෂිකරුවන්ගේ වඩාත්ම වැදගත් වූ ඉල්ලීම්, සහ අපගේ ජාතියෙහි අභ්‍යන්තර ප්‍රේරණයන් මගින් අපගේ නිගමන සහ නිර්දේශ තවත් ශක්තිමත් කරයි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 2211/55 - 2021 ජනවාරි මස 21 වැනි බ්‍රහස්පතින්දා - 2021.01.21

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

ජනාධිපතිතුමාණන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය

මුද්‍රාව

ගෝඨාභය රාජපක්ෂ

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිගරු ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මැතිතුමන් විසිනි

1. ගරු ඒ.එච්.එම්.ඩී. නවාස් මැතිතුමා
ශ්‍රේෂ්ඨාධිකරණ විනිශ්චයකාර

2. චන්ද්‍රා ප්‍රනාන්දු මැතිතුමා
විශ්‍රාමික පොලිස්පති

3. නිමල් අබෙසිරි මැතිතුමා
විශ්‍රාමික දිස්ත්‍රික් ලේකම්

වෙත,

ශුභාශිංසන පූර්වකවයි !

ශ්‍රී ලංකාවේ සංහිඳියාව, වගවීම හා මානව හිමිකම් ප්‍රවර්ධනය පිළිබඳ 2019 මාර්තු මස 40/1 යෝජනාවලියේ සහ එහි පූර්වගාමී 2015 ඔක්තෝබර් මස 30/1 හා 2017 මාර්තු මස 34/1 යෝජනාවන්හි සම අනුග්‍රාහකත්වයෙන් ශ්‍රී ලංකා රජය ඉටත් වීමට ගනු ලැබූ තීරණය සම්බන්ධව 2020 පෙබරවාරි මස 26 සහ 27 දිනයන් හි දී පැවැති එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කවුන්සිලයේ 43 වන සැසිවාරයේදී නිවේදනය කරනු ලැබ ඇති හෙයින් ද ;

උක්ත යෝජනා සඳහා සම අනුග්‍රාහකත්වය දැක්වීමෙන් ශ්‍රී ලංකාව ඉවත් වුවද, තිරසාර සාමයක් හා සංහිඳියාවක් දිනාගැනීම සඳහා වගවීම සහ මානව සම්පත් සංවර්ධනය සපුරා ගැනීම සඳහා තවදුරටත් එක්සත් ජාතීන්ගේ සංවිධානය සහ එහි නියෝජිතායතන සමග සහයෝගයෙන් කටයුතු කිරීම ශ්‍රී ලංකා රජයේ ප්‍රතිපත්තිය වන හෙයින් ද ;

විසඳීමට ඇති අනෙකුත් ගැටළු සඳහා ප්‍රජාතාන්ත්‍රික හා නීතිමය ක්‍රියාවලි තුළින් විසඳුම් ලබා දීමට සහ අවශ්‍ය අවස්ථාවන්හි දී ආයතනික සංශෝධන සිදුකරමින් යුක්තිය හා සංහිඳියාව තහවුරු කිරීමට ශ්‍රී ලංකා රජය කැපවී සිටින බැවින් ද;

රජයේ ප්‍රතිපත්ති ප්‍රකාශනයේ සඳහන් කර ඇති අරමුණු සාක්ෂාත් කර ගැනීමේදී ශ්‍රී ලංකාවේ ස්වෛරීත්වය ආරක්ෂා කරනු ලබන නොබැඳුන විදේශ ප්‍රතිපත්තියක් පදනම් කර ගනිමින් කටයුතු කිරීම මූලික අවශ්‍යතාවයක් ලෙස හඳුනාගෙන ඇති බැවින් ද ;

සිදුවී ඇතැයි කියනු ලබන මානව හිමිකම් උල්ලංඝනය කිරීම් පිළිබඳව විමර්ශනය කිරීම සඳහා පූර්වගාමීව පරීක්ෂණ කොමිෂන් සභා සහ කමිටු පත් කිරීමට කටයුතු කරනු ලැබ ඇති හෙයින් ද ;

එකී පරීක්ෂණ කොමිෂන් සභා සහ කමිටු මගින්, සිදුවී ඇතැයි වාර්තා වී ඇති යම් යම් මානව හිමිකම් සම්බන්ධ හා වෙනත් එවැනි වරදවල් පිළිබඳව නිර්දේශ ඉදිරිපත් කර ඇති බැවින් ද ;

මෙහි ඉන්මතු දැක්වෙන කරුණු පිළිබඳව විමර්ශනය කිරීම, පරීක්ෂා කිරීම හා වාර්තා කිරීම හෝ අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම සඳහා පරීක්ෂණ කොමිෂන් සභාවක් පත්කිරීම අවශ්‍ය යැයි මා අදහස් කරන හෙයින් ද;

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ජනාධිපති ධුරන්ධර ගෝඨාභය රාජපක්ෂ වන මම, ඔබතුමන්ලා ගේ විචක්ෂණභාවය, සාමාර්ථය සහ විශ්වාසවන්තභාවය කෙරෙහි මහත් වූ භක්තියෙන් හා විශ්වාසයෙන් යුතුව, පරීක්ෂණ කොමිෂන් සභා පනතෙහි (393 වන අධිකාරය වන) 2 වන වගන්තියෙහි විධිවිධාන ප්‍රකාරව ඉහත කී,

1. ගරු ඒ.එච්.එම්.ඩී. නවාස් මැතිතුමා
ශ්‍රේෂ්ඨාධිකරණ විනිශ්චයකාර

2. චන්ද්‍රා ප්‍රනාන්දු මැතිතුමා
විශ්‍රාමික පොලිස්පති

3. නිමල් අබේසිරි මැතිතුමා
විශ්‍රාමික දිස්ත්‍රික් ලේකම්

වන ඔබතුමන්ලා මතු දැක්වෙන කරුණු විමර්ශනය කිරීම, පරීක්ෂා කිරීම සහ වාර්තා කිරීම හෝ අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම සඳහා මගේ කොමසාරිස්වරුන් ලෙස මෙයින් පත්කරමි.

එකී කරුණු කවරේද යත්,

(අ) මානව හිමිකම් උල්ලංඝණය වීම් පිළිබඳව විමර්ශනය කිරීම සඳහා පූර්වගාමීව පත්කරන ලද පරීක්ෂණ කොමිෂන් සභා සහ කමිටු මගින් සිදු කරන ලද විමර්ශනයන් හි දී බරපතල ගණයේ මානව හිමිකම් උල්ලංඝණය වීම්, බරපතල ගණයේ ජාත්‍යන්තර මානුෂීය නීති කඩකිරීම් සහ වෙනත් එවැනි බරපතල වරදවල් පිළිබඳව අනාවරණය කරගෙන තිබෙද යන වග;

(ආ) එකී පරීක්ෂණ කොමිෂන් සභා සහ කමිටු මගින් උක්ත බරපතල ගණයේ මානව හිමිකම් උල්ලංඝණය වීම්, බරපතල ගණයේ ජාත්‍යන්තර මානුෂීය නීති කඩකිරීම් හා වෙනත් එවැනි වරදවල් සම්බන්ධව සොයා ගත් කරුණු කවරේද යත් හඳුනා ගැනීම සහ එකී කරුණු පිළිබඳව කටයුතු කළයුතු ආකාරය සම්බන්ධයෙන් නිර්දේශ ලබා දී තිබෙද යන වග;

(ඇ) එකී නිර්දේශයන් සම්බන්ධයෙන් පවත්නා නීතිය ප්‍රකාරව මෙහෙයක් කටයුතු කර ඇති ආකාරය හා වර්තමාන රාජ්‍ය ප්‍රතිපත්තියට අනුකූලව තවදුරටත් එම නිර්දේශ ක්‍රියාත්මක කිරීමට ගත යුතු පියවරයන් මොනවාද යන්න;

(ඈ) ඉහත (ආ) සහ (ඇ) ප්‍රකාරව කටයුතු කරනු ලබන්නේ ද යන්න සම්බන්ධව අධීක්ෂණය;

තවද, ඉහත කී, ශ්‍රේෂ්ඨාධිකරණ විනිශ්චයකාර ගරු ඒ.එච්.එම්.ඩී. නවාස් වන ඔබතුමන්, කොමිෂන් සභාවේ සභාපතිවරයා ලෙස මම මෙයින් පත් කරමි.

තවද, පූර්වෝක්ත කරුණු පිළිබඳව ඔබහට පෙනී යන පරිදි අවශ්‍ය විය හැකි පරීක්ෂණ සහ සියලුම විමර්ශන පැවැත්වීමට ඉහත කී කොමසාරිස්වරුන් වන ඔබහට මෙයින් බලය හා අධිකාරිය පවරන අතරම, එහිදී අනාවරණය වන කරුණු සම්බන්ධයෙන් අතුරු වාර්තා අවශ්‍යතාවය පරිදි ඉදිරිපත් කළ යුතු වන අතර, ඔබ ගේ නිර්දේශ ගෙනහැර දක්වමින් ඔබගේ අන්තිමින් යුතුව එකී කරුණු පිළිබඳව අවසන් වාර්තාව මෙම අධිකාරී පත්‍රයෙහි දින සිට මාස හයක් ඇතුළත මා වෙත ඉදිරිපත් කරන මෙන් ඔබතුමන්ලාට මෙයින් නියම කරමි.

තවද, පූර්වෝක්ත කරුණුවලට අදාළ වන කිසියම් විමර්ශනයක හෝ පරීක්ෂණයක යම් කොටසක් ප්‍රසිද්ධියේ නොපැවැත්විය යුතු බවට ඔබේ අභිමතය පරිදි නිගමනය කරනු ලැබේ නම්, එම කොටස ප්‍රසිද්ධියේ නොපැවැත්විය යුතු යැයි මම ඔබට නියම කරමි.

තවද, ඔබ ගේ විමර්ශනයන්හි හෝ පරීක්ෂණයන්හි කාර්යයන් සඳහා ඔබ විසින් සහාය හෝ තොරතුරු ඉල්ලා සිටිය හැකි සියලුම රජයේ නිලධරයන්, ව්‍යවස්ථාපිත මණ්ඩලයන්හි නිලධරයන් සහ වෙනත් තැනැත්තන් විසින් තත් කාර්යය සඳහා නිසි පරිදි දෙනු ලැබිය හැකි සියලුම සහාය දිය යුතු යැයි ද, සපයනු ලැබිය හැකි සියලුම තොරතුරු සැපයිය යුතු යැයි ද මෙයින් නියම කොට විධාන කරමි.

තවද, පූර්වෝක්ත පරීක්ෂණ කොමිෂන් සභා පනතේ (393 අධිකාරය) 14 වන වගන්තියෙහි විධිවිධාන, මේ කොමිෂන් සභාවට අදාළ විය යුතු බව මම මෙයින් ප්‍රකාශ කරමි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුද්‍රාව යටතේ වර්ෂ දෙදහස් විසිඑකක් වූ ජනවාරි මස 20 වැනි දින කොළඹ දී දෙන ලදී.

අතිගරු ජනාධිපතිතුමා ගේ අණ පරිදි,

පී. බී. ජයසුන්දර,
ජනාධිපති ලේකම්.

02 - 17

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 2214/75 - 2021 පෙබරවාරි මස 12 වැනි සිකුරාදා - 2021.02.12

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

ජනාධිපතිතුමාණන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිගරු ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මැතිතුමන් විසිනි

මුද්‍රාව

ගෝඨාභය රාජපක්ෂ.

1. ගරු ඒ.එච්.එම්.ඩී. නවාස් මැතිතුමා
   ශ්‍රේෂ්ඨාධිකරණ විනිශ්චයකාර
2. චන්ද්‍රා ප්‍රනාන්දු මැතිතුමා
   විශ්‍රාමික පොලිස්පති
3. නිමල් අබේසිරි මැතිතුමා
   විශ්‍රාමික දිස්ත්‍රික් ලේකම්

වෙත,

ශුභාශිංසන පුර්වකවයි!

පරීක්ෂණ කොමිෂන් සභා පනතෙහි (393 වන අධිකාරය) 2 වන වගන්තියෙහි විධිවිධාන ප්‍රකාරව වර්ෂ 2021 ජනවාරි මස 20 වැනි දිනැති අධිකාරී පත්‍රය මගින් ම විසින් මානව හිමිකම් උල්ලංඝණය වීම් සම්බන්ධයෙන් ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාවක් පිහිටුවා ඇති හෙයින් ද,

තවද, මෙම කොමිෂන් සභාවට පැවරී ඇති කාර්යයන් වඩාත් කඩිනමින් හා කාර්යක්ෂමව සපුරාලිය යුතු බව හඳුනාගෙන ඇති බැවින් ද,

1A - G 33269 — 390 (2021/02)

මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

තවද, ශ්‍රී ලාංකීය සමාජයේ බහුත්ත්ව ලක්ෂණය සහ ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිඹිඹු වීමේ අවශ්‍යතාවය අවධානයට ලක්කරමින් ද,

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ වන මම, පරීක්ෂණ කොමිෂන් සභා පනතේ 3 වන වගන්තියේ විධිවිධානයන්ට අනුකූලව යෝග්‍යෝෂ්වරී පත්කුණරාජා මැතිතුමිය, එතුමියගේ විචක්ෂණභාවය, සාමාර්ථය හා විශ්වාසවන්තභාවය කෙරෙහි මහත්වූ භක්තිය හා විශ්වාසය තබමින්, පෙරකී අධිකාරී පත්‍රය ප්‍රකාර ස්ථාපනය කරනු ලැබූ ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාවේ කොමසාරිස්වරියක ලෙස මෙයින් පත්කරමි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුද්‍රාව යටතේ වර්ෂ 2021 ක් වූ පෙබරවාරි මස 11 වන මෙදින කොළඹ දී දෙන ලදී.

අතිගරු ජනාධිපතිතුමාගේ නියමය පරිදි,

පී. බී. ජයසුන්දර,
ජනාධිපති ලේකම්.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොමිෂන් සභාවේ කාර්ය මණ්ඩලය

ආර්. විජයලෙව්වුමි මහත්මිය ලේකම්	කේ.සී. මල්කාන්ති පෙරේරා මහත්මිය කළමනාකරණ සහකාර
අභාවප්‍රාප්ත එස්.ඒ. රන්ජන් මහතා සම්බන්ධීකරණ ලේකම්	බී. ඉන්ද්‍රානි මහත්මිය ලඝුලේඛක - සිංහල
එම්.අයි. ගුණරත්න මහතා පරිපාලන නිලධාරී	ටී.කේ. සේනාරත්න මහත්මිය ලඝුලේඛක - ඉංග්‍රීසි
රිෂාන්ති වැලිකන්න මහත්මිය පුද්ගලික ලේකම්	අයි.ඩී.අයි. සඳමාලි මහත්මිය ලඝුලේඛක - ඉංග්‍රීසි
එස්.ඒ. රෝහණ මහතා මුඩ්ලියර්	ටී. දයාරත්න මහතා කා.කා.ස.
සිරිසේන කෝනාරගේ මහතා කළමනාකරණ සහකාර	එල්.ආර්. ආරියදාස මහතා කා.කා.ස.

නීතිපති දෙපාර්තමේන්තුවේ නිලධාරීන්

ආර්.කේ.අයි. ද එස්. බාලපටබැඳි නියෝජ්‍ය සොලිසිටර් ජෙනරාල්	ආර්.එන්.සී.එස්. පෙරේරා මහතා ජ්‍යෙෂ්ඨ රජයේ නීති

කොමිෂන් සභාවේ පර්යේෂණ නිලධාරීන් සහ පර්යේෂණ සහායකයින්

තෙරුණි හංසිකා රණතුංග මහත්මිය	ටෙහානී හේමවන්ද්‍ර මහත්මිය
මධූෂා කාවින්දි මහත්මිය	එම්.ඒ.එම්. හකීම් මහතා
රුක්ෂානා මුක්තාර් මහතා	ෆයිසර් මොහොමඩ් ෂාහීඩ් මහතා
මලින්ද්‍රි රසාර ලොකුආරච්චි මහතා	නූරුල් ෆාරා නිකිටා රශීන් මහත්මිය

කෙටි යෙදුම් සහ සංකේත නාම ලැයිස්තුව

ACF	කුසගින්නට එරෙහි ක්‍රියාකාරීත්වය වැඩසටහන
AG	නීතිපති
AGA	උප දිසාපති
AJIL	ජාත්‍යන්තර නීතිය පිළිබඳ ඇමරිකානු සඟරාව
CAT	වධදීමට සහ අනිකුත් කෲර, අමානුෂික හෝ නින්දිත සැළකීමට හෝ දඬුවම්වලට එරෙහි
CCHA	මානුෂීය ආධාර පිළිබඳ උපදේශක කමිටුව
CDS	ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී
CEDAW	කාන්තාවන්ට එරෙහි සියලු ආකාරයේ වෙනස්කොට සැලකීම පිටුදැකීම පිළිබඳ සම්මුතිය
CFA	සටන් විරාම ගිවිසුම
CID	අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව
COA	නොදුටු සහතිකය
COI	විමර්ශන කොමිෂන් සභාව
CoI	විමර්ශන අධිකරණය
CRC	ළමා අයිතිවාසිකම් පිළිබඳ සම්මුතිය
CSI	ප්‍රජා සහාය වැඩසටහන
CSO	සිවිල් සමාජ සංවිධාන
DMI	හමුදා බුද්ධි අධ්‍යක්ෂ
DS	ප්‍රාදේශීය ලේකම් කාර්යාලය
DSO	ප්‍රාදේශීය ලේකම්වරුන්ගේ කාර්යාල
ENDLF	ඊළාම් ජාතික ප්‍රජාතන්ත්‍රවාදී විමුක්ති පෙරමුණ
EPDP	ඊළාම් ජනතා ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂය
EPRLF	ඊළාම් ජනතා විප්ලවවාදී විමුක්ති පෙරමුණ
FTRU	පවුල් සොයාගැනීමේ සහ පවුල් සමග නැවත ඒකාබද්ධවීමේ ඒකකය
GA	දිසාපති
GC	ජිනීවා සම්මුතිය
GN	ග්‍රාම නිලධාරී
GOSL/GSL	ශ්‍රී ලංකා රජය
HR	මානව හිමිකම්
HRCSL	ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිසම
HRC	මානව හිමිකම් කවුන්සිලය
HRW	හියුමන් රයිට්ස් වොච් සංවිධානය
HSZ	අධි ආරක්ෂිත කලාපය
IAAC	අන්තර් ආයතන උපදේශක කමිටුව
IAC	අන්තර්ජාතික සන්නද්ධ ගැටුම
ICC	ජාත්‍යන්තර අපරාධ අධිකරණය
ICC-NHRI	ජාතික මානව හිමිකම් ආයතන ජාත්‍යන්තර සම්බන්ධීකරණ කමිටුව
ICCPR	සිවිල් සහ දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර සම්මුතිය
ICG	ඉන්ටර්නැෂනල් ක්‍රයිසිස් ගෲප්
ICRC	ජාත්‍යන්තර රතුකුරුස සංවිධානය
ICTR	රුවන්ඩාව සඳහා වන ජාත්‍යන්තර අපරාධ විනිශ්චය සභාව
ICTY	පෙර තිබූ යුගොස්ලාවියාව සඳහා වන ජාත්‍යන්තර අපරාධ විනිශ්චය සභාව

ICJ	ජාත්‍යන්තර යුක්ති අධිකරණය
IDP	අභ්‍යන්තර ලෙස අවතැන්වූ පුද්ගලයා
IHL	ජාත්‍යන්තර මානුෂීය නීතිය
IHRL	ජාත්‍යන්තර මානව හිමිකම් නීතිය
IIGEP	කීර්තිමත් පුද්ගලයන්ගේ ජාත්‍යන්තර ස්වාධීන කණ්ඩායම
IMF	ජාත්‍යන්තර මූල්‍ය අරමුදල
INGO	ජාත්‍යන්තර රාජ්‍ය නොවන සංවිධානය
IOM	සංක්‍රමණය පිළිබඳ ජාත්‍යන්තර සංවිධානය
IU	විමර්ශන ඒකකය / විමර්ශන කිරීමේ ඒකකය
JVP	ජනතා විමුක්ති පෙරමුණ
KKS	කන්කසන්තුරෙයි
LRRP	දිගු දුර පෙර පිරික්සුම් මුර සංචාර
LLRC	උගත් පාඩම් සහ ප්‍රතිසංධාන කොමිෂන් සභාව
LST	නීතිය හා සමාජ භාරය
LTTE	දෙමළ ඊළාම් විමුක්ති කොටි සංවිධානය (දෙමළ කොටි ලෙස ද හැඳින්වේ)
MIS	කළමනාකරණ තොරතුරු පද්ධතිය
MT	මෙට්‍රික් ටොන් (මානුෂීය ආහාර ආධාර සඳහා ආහාර ප්‍රමාණය මිනුම් ඒකකය)
MOD	ආරක්ෂක අමාත්‍යාංශය
NCO	අධිකාරී නොලත් නිලධාරී
NFZ	යුධ මුක්ත කලාපය
NGO	රාජ්‍ය නොවන සංවිධානය
NHRI	ජාතිතක මානව හිමිකම් ආයතනය
NIAC	ජාත්‍යන්තර නොවන සන්නද්ධ ගැටුම
NLC	ජාතික ඉඩම් කොමිෂන් සභාව
NPoA	ජාතික ක්‍රියාකාරී සැලැස්ම
NSC	ජාතික ආරක්ෂක මණ්ඩලය
OISL	මානව හිමිකම් පිළිබඳ මහකොමසාරිස් කාර්යාලයේ ශ්‍රී ලංකාව පිළබඳ විමර්ශනය
OHCHR	එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් පිළිබඳ මහ කොමසාරිස්වරයාගේ කාර්යාලය
OLA	නීති කටයුතු කාර්යාලය
OMP	අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය
ONUR	ජාතික සමගිය සහ ප්‍රතිසන්ධානය සඳහා වන කාර්යාලය
OR	හානිපූරණය සඳහා වන කාර්යාලය
PC	පරණගම කොමිසම
P.C	ජනාධිපති නීතිඥ
PCs	පළාත් සභාව/සභා
PCOI	ජනාධිපති විමර්ශන කොමිෂන් සභාව (මෙයි මෙම කොමිෂන් සභාව අදහස් වෙයි)
PCR	පරණගම කොමිෂන් සභාවේ වාර්තාව
PHI	මහජන සෞඛ්‍ය පරීක්ෂක
PLOTE	දෙමළ ඊළාම් ජනතා විමුක්ති සංවිධානය
POE	විද්වත් මණ්ඩලය
PSO	1947 අංක 25 දරන මහජන ආරක්ෂක ආඥාපනත
PTA	1979 අංක 48 දරන ත්‍රස්තවාදය වැළැක්වීමේ (තාවකාලික විධිවිධාන) පනත
PTF	උතුරු පළාතේ නැවත පදිංචිකිරීම, සංවර්ධනය සහ ආරක්ෂාව සඳහා වන ජනාධිපති
QC	රාජ නීතිඥ

RDS	ග්‍රාම සංවර්ධන සමිති
REPPIA	පුද්ගලයින්, දේපළ සහ කර්මාන්ත පුනරුත්ථාපනය කිරීමේ අධිකාරිය
ROE	යුද කිරීමට පනවා ඇති නීති
SCORE	සමාජ ඒකාබද්ධතාවය සහ ප්‍රතිසන්ධානය
SCRM	ප්‍රතිසංධාන යාන්ත්‍රණ සම්බන්ධීකරණය සඳහා වන ලේකම්කාර්යාලය
SCSL	සියෙරා ලියොන් සඳහා වන විශේෂ අධිකරණය
SFHQ	ආරක්ෂක බලකා මූලස්ථානය
SLA	ශ්‍රී ලංකා යුධ හමුදාව
SLAF	ශ්‍රී ලංකා ගුවන් හමුදාව
SLFRD	ප්‍රතිසන්ධානය සහ සංවර්ධනය සඳහා වන ශ්‍රී ලංකා සංසදය
SLMM	ශ්‍රී ලංකා සටන් විරාම නිරීක්ෂණ කමිටුව
SLN	ශ්‍රී ලංකා නාවික හමුදාව
STF	විශේෂ කාර්ය බලකාය
TELO	දෙමළ ඊළාම් විමුක්ති සංවිධානය
TID	ත්‍රස්ත විමර්ශන කොට්ඨාසය
TMVP	දෙමළ ජනතා විමුක්ති කොටි
TRC	සත්‍ය සහ සහ ප්‍රතිසංධාන කොමිසම
TRO	දෙමළ පුනරුත්ථාපන සංවිධානය
TYO	දෙමළ තරුණ සංවිධානය
UAV	නියමුවන් රහිත ගුවන් යානය
UC	උදලාගම කොමිසම
UCR	උදලාගම කොමිසමේ වාර්තාව
UN/UNO	එක්සත් ජාතීන්ගේ සංවිධානය
UNESCO	එක්සත් ජාතීන්ගේ අධ්‍යාපන, විද්‍යා සහ සංස්කෘතික සංවිධානය
UNHRC	එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කවුන්සිලය
UNHCR	සරණාගතයන් සඳහා වන එක්සත් ජාතීන්ගේ මහකොමසාරිස්
UNOCHA	එක්සත් ජාතීන්ගේ මානුෂීය කටයුතු පිළිබඳ සම්බන්ධීකාරක කාර්යාලය
UNRC/HC	එක්සත් ජාතීන්ගේ මානුෂීය සහ සම්බන්ධීකාරක කාර්යාලය
UNSG	එක්සත් ජාතීන්ගේ මහ ලේකම්
UPFA	එක්සත් ජනතා නිදහස් සංධානය
UPR	විශ්ව කාලීන සමාලෝචනය
USAID	ජාත්‍යන්තර සංවර්ධනය සඳහා වන එක්සත් ජනපද නියෝජිතායතනය
UTHR(J)	මානව හිමිකම් සඳහා වන විශ්වවිද්‍යාල ආචාර්යවරු - යාපනය
VFSU	වින්දිතයන්ට සහ පවුල්වලට සහාය දීමේ ඒකකය
VWAPU	වින්දිතයන්ට සහ සාක්ෂිකරුවන්ට සහායවීමේ සහ ආරක්ෂා කිරීමේ ඒකකය
WFP	ලෝක ආහාර වැඩසටහන
WGEID	බලහත්කාරයෙන් පුද්ගලයන් අතුරුදහන් කිරීම පිළිබඳ ක්‍රියාකාරී කණ්ඩායම

1 වෙනි පරිච්ඡේදය

හැඳින්වීම

1. පූර්වගාමීව පත් කරන ලද පරීක්ෂණ කොමිෂන් සභා සහ කමිටු මගින් සොයා ගන්නා ලද කරුණු සහ ඒවායෙහි නිර්දේශ පිළිබඳව විමර්ශනය කිරීම සහ පරීක්ෂා කිරීම, අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම සහ වාර්තා කිරීම සඳහා වන ජනාධිපති විමර්ශන කොමිෂන් සභාව (මෙහි මින් මතු කොමිෂන් සභාව, මෙම කොමිෂන් සභාව හෝ ජනාධිපති විමර්ශන කොමිෂන් සභාව යනුවෙන් හඳුන්වනු ලබන) 2021 ජනවාරි මස 21 වෙනි බ්‍රහස්පතින්දා දින නිකුත් කරන ලද අංක 2211/55 දරන අති විශේෂ ගැසට් පත්‍රයෙහි පළ කරන ලද, පරීක්ෂණ කොමිෂන් සභා පනතෙහි 2 වෙනි වගන්තිය යටතේ නිකුත් කරන ලද ජනාධිපති අධිකාරි පත්‍රයක් මගින් හිටපු ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මැතිතුමන් විසින් පත් කරන ලදී. මානව හිමිකම් උල්ලංඝනයවීම්, බරපතල ගණයේ ජාත්‍යන්තර මානුෂීය නීති කඩකිරීම් සහ වෙනත් එවැනි බරපතල වැරදි පිළිබඳව විමර්ශනය කිරීම සඳහා පූර්වගාමීව පත් කරන ලද පරීක්ෂණ කොමිෂන් සභා සහ කමිටු මගින් සොයා ගන්නා ලද කරුණු සහ ඒවායෙහි නිර්දේශ පිළිබඳව විමර්ශනය කිරීම සහ පරීක්ෂා කිරීම, අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම සහ වාර්තා කිරීම මෙම කොමිෂන් සභාවේ විධිනියෝගය වේ.

2. ඉහත සඳහන් කරන ලද ගැසට් නිවේදනයේ පූර්විකාමය වගන්ති පරීක්ෂාකාරීව කියවා බැලීමේ දී මෙම කොමිෂන් සභාව පත් කිරීමට පෙර ශ්‍රී ලංකා රජය ශ්‍රී ලංකාවේ ප්‍රතිසන්ධානය, වගවීම සහ මානව හිමිකම් ප්‍රවර්ධනය කිරීම පිළිබඳ සම අනුග්‍රහය දක්වන ලද එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කවුන්සිලයේ අංක 40/1 දරන යෝජනා සම්මතයට[1] සහ එයට පූර්වගාමී වූ 2015 ඔක්තෝබර් මස අංක 30/1 දරන යෝජනා සම්මතයට සහ 2017 මාර්තු මස අංක 34/1 දරන යෝජනා සම්මතයට[2] සහාය දැක්වීමෙන් ඉවත්ව තිබූ බව පැහැදිලි වේ.

3. ශ්‍රී ලංකා රජය ඉහත කී යෝජනා සම්මතයන්ට සහාය දැක්වීමෙන් ඉවත්වීමේ ස්වකීය තීරණය 2020 පෙබරවාරි මස 26 සහ 27 වෙනි දිනවල පැවති එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කවුන්සිලයේ 43 වෙනි සැසිවාරයේ දී නිවේදනය කළ බව ද පෙනී යයි.

4. රජයේ ප්‍රතිපත්ති රාමුවට අනුකූලව, පවතින යාන්ත්‍රණ යෝග්‍ය පරිදි අනුගත කර ගැනීම හරහා ද ඇතුළුව, අන්තර්කරණය වූ, දේශීයව සකස් කර ක්‍රියාත්මක කරනු ලබන ප්‍රතිසංධාන සහ වගවීමේ ක්‍රියාවලියක් හරහා තිරසාර සාමයක උදාකර ගැනීමට සිය රට කැපවීමෙන් කටයුතු කරන බව 2020 පෙබරවාරි මස 26 වෙනි දින ජිනීවා හි පැවති එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කවුන්සිලයේ දී ශ්‍රී ලංකා රජය ප්‍රකාශයක් සිදු කළේය.

5. මෙම සංදර්භය තුළ, මෙම කොමිෂන් සභාව පත්කිරීම සම්බන්ධයෙන් සඳහන් කර ඇති, එවක සිටි විදේශ සබඳතා අමාත්‍යවරයාගේ කථාවේ දෙවෙනි සහ තුන්වෙනි ඡේද කෙරෙහි අවධානය යොමු කිරීම මෙහි දී යෝග්‍ය වේ. ශ්‍රී ලංකා රජය අංක 30/1, අංක 34/1 සහ 40/1 යන යෝජනා සම්මතයන්ට සහාය දැක්වීමෙන් ඉවත් වුවද, යුක්තිය සහ ප්‍රතිසන්ධානය ප්‍රවර්ධනය කරමින් සහ සහතික කරමින්, සමාජයේ අවදානම් සහගත කණ්ඩායම් මුහුණ දෙන ගැටළු ආමන්ත්‍රණය කිරීම ද සිදු කරන අතර ම,

---

[1] දිනේෂ් ගුණවර්ධන, විදේශ සබඳතා අමාත්‍ය, *එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කවුන්සිලයේ 43 වෙනි සැසිවාරයේ ඉහළ මට්ටමේ සැසියේ දී පවත්වන ලද කථාවේ පාඨය*', https://mfa.gov.lk/43rd-session-hrc/

[2] ශ්‍රී ලංකා රජය ඉහත කී යෝජනා සම්මතවලට සහාය දැක්වීමෙන් ඉවත් වන බව සඳහන් වන, මෙම ජනාධිපති විමර්ශන කොමිෂන් සභාවේ විධිනියෝගයේ පූර්විකාමය ඡේදවල පදානුගත පාඨයේ නැවත ඉදිරිපත් කිරීමක් සඳහා බලන්න: මෙම අවසන් වාර්තාවේ *2 වෙනි පරිච්ඡේදයේ* 73 වෙනි ඡේදය.

එක්සත් ජාතීන්ගේ නියෝජිතායතන සමග අඛණ්ඩව සම්බන්ධවී කටයුතු කිරීම රජයේ ප්‍රතිපත්තිය වී තිබෙන්නේය යන පොරොන්දුවක් පැහැදිලිව ප්‍රකාශ කළේය.

2020 පෙබරවාරි 26 වෙනි දින උක්ත කාරණයට අදාළව අමාත්‍යවරයාගේ කථාවේ දී සිදු කරන ලද ප්‍රකාශය සහ පොරොන්දුව මගින් පහත සඳහන් කරුණු කෙරෙහි නැවත අවධානය යොමු කරයි:

"... මානව හිමිකම් සහ අන්තර්ජාතික මානුෂීය නීතිය උල්ලංඝනයවීම් පිළිබඳ චෝදනා විමර්ශනය කළ, පූර්වගාමී ශ්‍රී ලාංකික විමර්ශන කොමිෂන් සභාවල වාර්තා සමාලෝචනය කර, ඒවායෙහි නිර්දේශ ක්‍රියාත්මක කිරීමේ මට්ටම ඇගයීම පිණිස සහ නව රජයේ ප්‍රතිපත්තිය අනුව ඒවා ක්‍රියාත්මක කිරීම සඳහා ප්‍රයෝගික ක්‍රියාමාර්ග යෝජනා කිරීම පිණිස ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිශ්චයකාරවරයෙකුගේ ප්‍රධානත්වයෙන් යුත් පරීක්ෂණ කොමිෂන් සභාවක් පත් කිරීම මෙයට ඇතුළත් වනු ඇත.

දෙවනුව, රජය අනෙකුත් ප්‍රධාන ගැටළු ද ආමන්ත්‍රණය කරමින්, 2030 තිරසාර සංවර්ධන න්‍යාය පත්‍රයට ඇතුළුව, ශ්‍රී ලංකාව ලබා දී ඇති පොරොන්දු වලට අනුකූල වන ආකාරයකට අවශ්‍ය අවස්ථාවල දී ආයතනික ප්‍රතිසංස්කරණ ද හඳුන්වා දෙනු ඇත. අපි යුක්තිය සහ ප්‍රතිසන්ධානය සහතික කරමින්, සහ සමාජයේ අවදානම් සහගත තත්ත්වයන්හි සිටින කොටස්වල ගැටළු ආමන්ත්‍රණය කරමින්, නීතිය යටතේ පුද්ගලික සහ සාමූහික අයිතිවාසිකම් සහ ආරක්ෂාවන් වැඩිදියුණු කිරීම මගින් රජය ජනතාව වෙත ලබා දී ඇති පොරොන්දුවල දැඩි ලෙස ගැබ්වී ඇති ප්‍රතිපත්ති ක්‍රියාත්මක කරන්නෙමු. ජනාධිපතිතුමා සහ එක්සත් ජාතීන්ගේ සංවිධානයේ නේවාසික සම්බන්ධීකාරක අතර මේ වන විටත් සාකච්ඡාවක් පවතවා ඇති අතර, තිරසාර සංවර්ධන ඉලක්ක ක්‍රියාත්මක කිරීමේ දී ශ්‍රී ලංකා රජයට උපකාර කිරීම පිණිස අදාළ එක්සත් ජාතීන්ගේ නියෝජිතායන සම්බන්ධ කිරීමට එහිදී එකඟ වී තිබේ.

තුන්වෙනුව, ශ්‍රී ලංකාව දේශීය ප්‍රමුඛතාවයන්ට සහ ප්‍රතිපත්ති වලට අනුකූලව කටයුතු කරමින්, හැකියා සංවර්ධනය කිරීම සඳහා සහ තාක්ෂණික සහාය සඳහා අවශ්‍ය පරිදි නිත්‍ය මානව හිමිකම් විධිනියෝග / ආයතන සහ යාන්ත්‍රණවල ද ඇතුළුව එක්සත් ජාතීන්ගේ සංවිධානයේ සහ එහි නියෝජිතායතන වල සහාය අපේක්ෂා කරයි.

අවසන් වශයෙන්, ශ්‍රී ලංකාව එක්සත් ජාතීන්ගේ සංවිධානයේ සියලු ම සාමාජිකයන් සමග එක්ව, යෝජනා සම්මතය අවසන් කිරීම සඳහා කටයුතු කිරීමට අපේක්ෂා කරයි."[3]

6. මෙම කොමිෂන් සභාව පත්කරමින් නිකුත් කරන ලද ගැසට් නිවේදනය මගින් ද එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කවුන්සිලයේ දී ශ්‍රී ලංකා රජය විසින් සිදු කරන ලද එකී ප්‍රකාශය යළි අවධාරණය කරන අතර, විසඳීමට ඇති අනෙක් ගැටළු ද ප්‍රජාතන්ත්‍රවාදී ක්‍රියාවලියක් හරහා ක්‍රියාත්මක කරනු ලබන බව සහතික කිරීම ශ්‍රී ලංකා රජයේ ප්‍රතිපත්තිය බව එහි වැඩිදුරටත් සඳහන් වේ. ශ්‍රී ලංකා රජයේ ප්‍රතිපත්ති ප්‍රකාශයේ සඳහන් කර ඇති අරමුණු සාක්ෂාත් කර ගැනීමේ දී ශ්‍රී ලංකාවේ ස්වෛරීත්වය ආරක්ෂා වන නොබැඳි විදේශ ප්‍රතිපත්තියක් ශ්‍රී ලංකාව විසින් අනුගමනය කළ යුතු බව ද හඳුනාගෙන තිබේ.

7. ශ්‍රී ලංකා රජය අංක 30/1 දරන යෝජනා සම්මතයෙන් සහ ඉන් පසුව සම්මත කර ගන්නා ලද යෝජනා මගින් ලබා දී ඇති පොරොන්දු වලින් තවදුරටත් බැඳී නොසිටින බව ශ්‍රී ලංකා රජය විසින් නිවේදනය කරනු ලැබුව ද, එක්සත් ජාතීන්ගේ සංවිධානයේ ක්‍රියාවලිය සමග කටයුතු කිරීම පිණිස

[3] මානව හිමිකම් කවුන්සිලයේ 43 වෙනි සැසිවාරයේ දී විදේශ සබඳතා අමාත්‍ය ගරු දිනේෂ් ගුණවර්ධන මහතා විසින් සිදු කරන ලද ප්‍රකාශය:
https://mfa.gov.lk/statement-made-by-minister-of-foreign-relations-at-the-43rd-session-of-the- hrc-eng/

අන්‍යෝන්‍ය මිත්‍රත්වය අඛණ්ඩව පවත්වා ගැනීම සඳහා ඇති ස්වකීය අධිෂ්ඨානය ප්‍රකාශ කළ බව සඳහන් කිරීම වැදගත් වේ. ශ්‍රී ලංකාව එක්සත් ජාතීන්ගේ සංවිධානය සමග ඇතිකරගෙන තිබෙන සාධනීය සම්බන්ධතාවය එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කමිටුව සමග ඇති අන්‍යෝන්‍ය ක්‍රියාකාරකම්[4] වලින් සහ එය මෑතකදී ස්වේච්ඡාවෙන් ම එක්සත් ජාතීන්ගේ සංවිධානය සමග සිදු කිරීමට හාරගත් කාර්යය, එනම් විශ්ව කාලීන සමාලෝචනය නිම කිරීම[5] මගින් පෙන්නුම් කරයි.

8. කාන්තාවන්ට එරෙහි සියලු ආකාරවල වෙනස්කොට සැලකීම තුරන් කිරීම පිළිබඳ සම්මුතියේ කමිටුව වෙත වාර්තාවක් භාර දී ඇති බව සහ වධහිංසාවට එරෙහි සම්මුතිය පිළිබඳ අමතර කෙටුම්පතට අලුතින් කොටස් එකතු කිරීම 2017 දෙසැම්බර් 5 වැනි දින තරම් පෙර කාලයේ සිදුවී ඇත යන්න මෙම කොමිෂන් සභාව ඉදිරියේ ඉදිපත් වූ සාක්ෂි වේ.

9. ශ්‍රී ලංකාව සාමය සහ ප්‍රතිසන්ධානය ගොඩනැගීම සඳහා එක්සත් ජාතීන් විසින් යෝජනා කරන ලද ක්‍රියාවලිය වෙනුවට ස්වකීය දේශීය ක්‍රියාවලියක් ක්‍රියාත්මක කරන බවට තරයේ ප්‍රකාශ කළ ද, එය එක්සත් ජාතීන්ගේ සංවිධානය සමග සම්බන්ධ වෙමින් තාක්ෂණික සහාය සහ හැකියා සංවර්ධනය කිරීමේ සහාය ඉල්ලා සිටීම පැසසුමට ලක්වී තිබේ. මෙම ප්‍රකාශ සහ ප්‍රතිඥා වලින් විශ්වාසය ගොඩනගා ගනිමින්, ශ්‍රී ලංකා රජය සත්‍යය සෙවීමේ සහ ප්‍රතිසන්ධානය ඇති කිරීමේ අව්‍යාජ ක්‍රියාවලියක් අනුගමනය කරමින් සිටින්නේය යනුවෙන් උපකල්පනය කළ හැකි අතර, ශ්‍රී ලංකා රජය අංක 30/1 දරන යෝජනා සම්මතයෙහි සඳහන් ප්‍රතිඥා පිළිගැනීම ප්‍රතික්ෂේප කළ නමුත් රජය එක්සත් ජාතීන්ගේ සංවිධානය සමග අන්තර්ක්‍රියාකාරී සංවාදය සහ සාධනීය සම්බන්ධවීම අඛණ්ඩව පවත්වා ගැනීමට අපේක්ෂා කළේය යන කරුණ රජය සංක්‍රාන්ති යුක්තියේ කුළුණු වැඩි දියුණු කිරීම සඳහා කැපවී සිටීමක් ලෙස අර්ථ දැක්විය යුතුය. දේශීය වශයෙන් ශක්තිමත්ව ස්ථාපනය වූ සංක්‍රාන්ති යුක්ති යාන්ත්‍රණයක් ඇති කිරීම පිණිස, ප්‍රතිඥා දුන් ප්‍රතිපත්ති ප්‍රකාශය ක්‍රියාත්මක කිරීම සඳහා අවංක සහ අව්‍යාජ කැපවීමක් තිබිය යුතු නමුත්, ශ්‍රී ලංකා රජය සහාය දැක්වීම ප්‍රතික්ෂේප කළ අංක 30/1 දරන යෝජනා සම්මතයෙහි සඳහන් කර තිබූ සත්‍යය සෙවීමේ යාන්ත්‍රණයක් වන 'අතුරුදහන්වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයක්' ස්ථාපනය කිරීමට ශ්‍රී ලංකා රජය කටයුතු කළ බව ද පෙන්වා දිය යුතු වේ.

10. අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයේ සභාපතිවරයා මෙම ජනාධිපති විමර්ශන කොමිෂන් සභාව ඉදිරියේ ලබා දුන් සාක්ෂිවලට අනුව, 2021 පෙබරවාරි මාසයේ දී එම කාර්යාලයේ ප්‍රථම කොමසාරිස්වරුන්ගේ ධුර කාලය අවසන් වූ විට ශ්‍රී ලංකා රජය එම කොමසාරිස්වරුන්ගේ අනුප්‍රාප්තිකයන් ලෙස අලුතින් කොමසාරිස්වරුන් කණ්ඩායමක් පත් කළේය. 2021 අගෝස්තු මාසයේ දී, අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය විනිදිතයන් සිටින ස්ථාන වලට ගොස් සේවා සැපයීම පිණිස දිස්ත්‍රික්කවල සිය ශාඛා කාර්යාල පිහිටවූයේය. මෙමගින් රජයේ කැපවීමෙහි අඛණ්ඩත්වය පෙන්නුම් කරන අතර, එවැනි ක්‍රියාමාර්ගයක් මගින් විවිධ කාල පරිච්ඡේදවල දී සත්‍යය සහ යුක්තිය සම්බන්ධයෙන් අතුරුදහන්වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයේ සේවා සපයා දියු යුතු පුද්ගලයන් තුළ විශ්වාසයක් ගොඩනගනු ඇත.[6]

11. මෙම කොමිෂන් සභාව (ජනාධිපති විරමර්ශන කොමිෂන් සභාව) පූර්වගාමී කොමිෂන් සභා සහ කමිටු වලින් පසුව පවා අඛණ්ඩව පවතින චෝදනා වලට ප්‍රතිචාර දක්වන, සත්‍යය සෙවීමේ යාන්ත්‍රණයක ආරම්භය ප්‍රකාශයට පත් කළේ මෙවැනි වාතාවරණයක් තුළ ය. 2022 පෙබරවාරි මස 18 වෙනි දින

[4] මානව හිමිකම් කවුන්සිලයේ අංක 5/1 සහ 12/21 දරන යෝජනා සම්මත අනුව භාර දෙන ලද ජාතික වාර්තාව බලන්න; 2023 මාර්තු 8 - 9 යන දිනවල සිවිල් සහ දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර සම්මුතිය අනුව සිදු කරන ලද සමාලෝචනය.

[5] ශ්‍රී ලංකාවේ විශ්ව කාලීන සමාලෝචනය පිළිබඳ ක්‍රියාකාරී කණ්ඩායමේ A/HRC/53/16 දරන වාර්තාව බලන්න.

[6] අවසන් වාර්තාවේ 3 වෙනි පරිච්ඡේදයේ III වෙනි කොටසේ සඳහන් අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය පිළිබඳ විස්තර අනුවාදය කියවන්න.

නිකුත් කරන ලද ස්වකීය දෙවැනි අතුරු වාර්තාව මගින් මෙම ජනාධිපති විමර්ශන කොමිෂන් සභාව, එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කවුන්සිලයේ ඇතැම් පූර්ව යෝජනා සම්මතවල පමණක් නොව, පරණගම කොමිෂන් සභාව වැනි දේශීය යාන්ත්‍රණ වල ද සාමූහික ඉල්ලීමක් වී තිබූ විශ්වාසනීය සත්‍යය සෙවීමේ යාන්ත්‍රණයක් ස්ථාපනය කිරීමේ අවශ්‍යතාවය නැවත අවධාරණය කළේය.[7]

2023 පෙබරවාරි 6 වෙනි දිනැති නිර්දේශවල සංක්ෂිප්තය - සත්‍යය සහ ප්‍රතිසංධාන සඳහා වන ව්‍යවස්ථාපිත කොමිෂන් සභාවක්

12. සැබවින් ම, 2023 පෙබරවාරි මස 06 වෙනි දින ජනාධිපතිතුමා වෙත භාර දුන් මෙම වාර්තාවෙහි ඇතුළත් කිරීමට නියමිත වූ නිර්දේශවල සංක්ෂිප්තය මගින් මෙම කොමිෂන් සභාව ව්‍යවස්ථාපිත වශයෙන් නිර්වචනය කළ යුතු සහ සීමා නියම කළ යුතු සත්‍යය සහ ප්‍රතිසන්ධානය සඳහා වන කොමිසමක දළ සැලැස්මෙහි අවශ්‍යතාවය අවධාරණය කළ අතර, එම කාර්යය සාක්ෂාත් කර ගැනීම පිණිස මෙම විමර්ශන කොමිෂන් සභාව මෙම අවසන් වාර්තාවෙහි 5 වෙනි සහ 6 වෙනි පරිච්ඡේදවල එම සීමාවන් සම්බන්ධයෙන් සාකච්ඡා කිරීමට අපේක්ෂා කරයි. මෙම විමර්ශන කොමිෂන් සභාව ස්වකීය දෙවෙනි අතුරු වාර්තාවෙහි සත්‍යය සහ ප්‍රතිසන්ධානය සඳහා වන කොමිෂන් සභාවක් ස්ථාපනය කිරීම පිළිබඳව ඉදිරිපත් කළ ස්වකීය නිර්දේශය ක්‍රියාත්මක කිරීම ශ්‍රී ලංකා රජය විසින් මූලික අමාත්‍ය මණ්ඩල පත්‍රිකාවක් මගින් ආරම්භ කර ඇති බැවින්, මෙම කොමිෂන් සභාවට පැහැදිලි වන පරිදි එය මෙම කොමිෂන් සභාවේ එකී නිර්දේශය පිළිගැනීමට ලක්කිරීමක් වන අතර, එකී කාර්යය සඳහා පනත් කෙටුම්පතක් කෙටුම්පත් කිරීමේ කාර්යයට අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලැබීමෙන් අනතරුව, සත්‍යය සහ ප්‍රතිසන්ධානය සඳහා වන කොමිෂන් සභාවක් ස්ථාපනය කිරීමේ කාර්යය අධීක්ෂණය කිරීම පිණිස අන්තර්කාලීන ලේකම් කාර්යාලයක් ස්ථාපනය කර ඇති බව මෙම කොමිෂන් සභාවට දැනුම් දී ඇත. මෙම පියවර ගැනීම නිවැරදි මාර්ගය බව මෙම ජනාධිපති විමර්ශන කොමිෂන් සභාව අවධානයට ගෙන ඇත. මෙරට විදේශ අමාත්‍යවරුන් දෙදෙනෙක් සත්‍යය සෙවීම සම්බන්ධයෙන් ඔවුන් විසින් දරන ලද ප්‍රයත්න පිළිබඳව සිදු කළ සඳහන් කිරීම් සැලකිල්ලට ගෙන ඇති මෙම කොමිෂන් සභාව, සත්‍යය සෙවීමේ කොමිෂන් සභාවක් ස්ථාපනය කිරීම සඳහා වන ස්වකීය නිර්දේශවලට එම සඳහන් කිරීම් ද එකතුකර තිබේ.[8] [9]

---

[7] සත්‍යය සෙවීමේ යාන්ත්‍රණ පිළිබඳව සඳහන් කර ඇති 2012 මාර්තු මස 22 වෙනි දින සම්මත කර ගන්නා ලද res/19/2, 2013 මාර්තු මස 21 වෙනි දින සම්මත කර ගන්නා ලද res/22/1, 2014 මාර්තු මස 27 වෙනි දින සම්මත කර ගන්නා ලද res/25/1, 2015 ඔක්තෝබර් මස 1 වෙනි දින සම්මත කර ගන්නා ලද res/30/1, 2017 මාර්තු මස 23 වෙනි දින සම්මත කර ගන්නා ලද res/14/1, 2019 මාර්තු මස 21 වෙනි දින සම්මත කර ගන්නා ලද res/40/1, 2021 මාර්තු මස 23 වෙනි දින සම්මත කර ගන්නා ලද res/46/1 යන යෝජනා සම්මත සහ පරණගම වාර්තාවේ 620 වෙනි ඡේදය බලන්න. විශේෂයෙන් ම මෙම ජනාධිපති විමර්ශන කොමිෂන් සභාවේ දෙවෙනි අතුරු වාර්තාවේ පි. 2, 129 සහ 130 ඡේද බලන්න. 2020 පෙබරවාරි 20 වෙනි දින ශ්‍රී ලංකා රජය සහාය දීමෙන් ඉවත් වූයේ අංක res 30/1, res 34/1 සහ res 40/1 යන යෝජනා සම්මත වලින් බව සැලකිල්ලට ගැනීම වැදගත් වේ.

[8] 2022 ඔක්තෝබර් 6 වෙනි දින ශ්‍රී ලංකාවේ විදේශ කටයුතු අමාත්‍ය අලි සබ්‍රි විසින් එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කවුන්සිලයේ දී සිදු කරන ලද ප්‍රකාශය බලන්න. https://srilankaembassy.at/wp-content/uploads/2022/10/Full-Statement.pdf

අනෙකුත් සංසද වලදී සිදු කරන ලද ප්‍රකාශ ද බලන්න: https://www.ft.lk/news/Foreign-Minister-gives-emphatic-reassurances-at-UNHRC-sessions-in-Geneva/56-739810;

https://www.srilanka.co.za/news/minister-of-foreign-affairs-ali-sabry-accompanied-by-the-minister-of-justice-prison-affairs-and-constitutional-reforms-wijeyadasa-rajapakse-concluded-the-3-day-working-visit-to-south-africa-from-21-25-march-2023

[9] මහාචාර්ය ජී.එල්. පීරිස් මහතා විසින් සිදු කරන ලද අනෙකුත් ප්‍රකාශ බලන්න: https://www.themorning.lk/articles/195180

http://srilankaembassyjakarta.com/2022/01/31/access-to-justice-programme-begins/

13. සංක්‍රාන්ති යුක්තියේ ප්‍රධානතම කුළුණක් වන එවැනි යාන්ත්‍රණයක් පසුගිය කාලය මුළුල්ලෙහි පැවති කථිකා ගණනාවක වැදගත් කොටසක් වී ඇති නිසා සහ එය බොහෝ කාලයක සිට ක්‍රියාත්මක කළ යුතුව තිබෙන යාන්ත්‍රණයක් නිසා, එවැනි යාන්ත්‍රණයක් පිළිබඳව සහ එවැනි යාන්ත්‍රණයක අභිශය වැදගත් අවශ්‍යතාවය පිළිබඳව සාකච්ඡා කළ යුතු යැයි මෙම ජනාධිපති විමර්ශන කොමිෂන් සභාව යෝජනා කරයි. අංක 30/4 සහ 34/1 දරන පූර්වගාමී යෝජනා සම්මතයන්ට සෘජුව ම සම්බන්ධවී ඇති, ශ්‍රී ලංකා රජය සහාය දීම ප්‍රතික්ෂේප කර ඇති 2019 පෙබරවාරි මාසයේ දී සම්මත කරන ලද අංක 40/1 දරන යෝජනා සම්මතයෙහි එක් හැඳින්වීමේ වගන්තියක පහත සඳහන් කරුණු අවධාරණය කර සහ පිළිගෙන ඇති බව සඳහන් කිරීම මෙහිදී වැගදත් වේ:

(ආ) හානිපූරණය සඳහා වන කාර්යාලයක් ස්ථාපනය කිරීම සම්බන්ධ ප්‍රගතිය, සත්‍යය සහ ප්‍රතිසන්ධානය සඳහා වන කොමිෂන් සභාවක් ස්ථාපනය කිරීම සඳහා වන පනත් කෙටුම්පතක් පිළිබඳ සංකල්ප පත්‍රිකාවක් සම්බන්ධයෙන් අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කරන ලද අදහස් දැක්වීම් සහ 1978 වර්ෂයේ හඳුන්වා දුන් ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත අහෝසි කර යෝජිත ප්‍රති ත්‍රස්ත පනතක කෙටුම්පත සකස් කිරීමේ යෝජනාව ඇතුළුව අංක 30/1 දරන යෝජනා සම්මතය ක්‍රියාත්මක කිරීම සඳහා රජය ගෙන ඇති පියවර.

14. මෙය 2018 සැප්තැම්බර් මාසය තරම් පෙර කාලයේ දී, වර්තමාන ජනාධිපති, එවකට අග්‍රාමාත්‍යවරයා වූ රනිල් වික්‍රමසිංහ මහතා විසින් සාදන ලද සත්‍යය සහ ප්‍රතිසන්ධානය පිළිබඳ පනත් කෙටුම්පතක් අමාත්‍ය මණ්ඩලයට ඉදිරිපත් කිරීම පිළිබඳ ඇඟවීමක් වන නමුත්, එක් සාක්ෂිකරුවෙක් මෙම කොමිෂන් සභාව ඉදිරියේ කුපිතයෙන් මෙන් අවධාරණය කර පෙන්වා දුන් සහ තැවුණු පරිදි, මෙම පනත් කෙටුම්පත අමාත්‍ය මණ්ඩලයේ සිට ව්‍යවස්ථාදායක ක්‍රියාවලිය දක්වා ගෙන යෑමේ ඉදිරි කටයුතු සිදු කිරීම 2018 වර්ෂයේ දී සිදුවූ බාහිර සිදුවීම් හේතුවෙන් අසාර්ථක වූ බවක් පෙනෙන්නට තිබේ.

15. සත්‍යය සහ ප්‍රතිසන්ධානය සඳහා වන කොමිෂන් සභාවක් ස්ථාපනය කිරීම අපේක්ෂා සහගත තත්ත්වයක තිබූ නමුත් අනපේක්ෂිත තත්ත්වයන් හේතුවෙන් එය යථාර්ථයක් බවට පත්වීම බොහෝ සෙයින් දුරස් වී ඇති බව මෙම සියලු කාරණා වලින් බොහෝ දුරට පෙන්නුම් කරයි.

ඒකාබද්ධ නිල නිවේදනය

16. මෙම කොමිෂන් සභාව පශ්චාත් ගැටුම් සමයට අයත් ලියවිලි ගණනාවක් පරීක්ෂා කර බැලීමේ දී වගවීම සහ ඉදිරි මග දීර්ඝ කාලයක් පුරා සාකච්ඡාවට භාජනය වී ඇති කරුණු බව පැහැලි වෙයි. එක්සත් ජාතීන්ගේ මහ ලේකම්වරයා ශ්‍රී ලංකාවේ සිදු කළ සංචාරය නිම කරන අවස්ථාවේ දී ශ්‍රී ලංකා රජය සහ එක්සත් ජාතීන්ගේ සංවිධානය විසින් නිකුත් කරන ලද ඒකාබද්ධ නිල නිවේදනය පිළිබඳව සඳහනක් නොකළ හොත් මෙම අවසන් වාර්තාවේ හැඳින්වීමේ පරිච්ඡේදය අසම්පූර්ණ පරිච්ඡේදයක් වනු ඇත.[10] 2009 මැයි 23 වැනි දින සිදු කරන ලද එම ඒකාබද්ධ ප්‍රකාශයේ පහත සඳහන් කරුණු ද ඇතුළත් විය:

(අ) සියලුම ප්‍රජාවන්ගේ අපේක්ෂාවන් සහ දුක්ගැනවිලි ආමන්ත්‍රණය කිරීම සහ තිරසාර දේශපාලන විසඳුමක් උදෙසා කටයුතු කිරීම දීර්ඝ කාලීන සමාජ ආර්ථික සංවර්ධනය සහතික කිරීම සඳහා වන

---

https://www.news.lk/news/political-current-affairs/item/33735-foreign-minister-peiris-addresses diplomatic-corps-based-in-new-delhi

[10] එක්සත් ජාතීන්ගේ මහ ලේකම්වරයා සහ ශ්‍රී ලංකා රජය විසින් සිදු කරන ලද ඒකාබද්ධ ප්‍රකාශය, SG/2151, 2009 මැයි 26; මෙම කොමිෂන් සභාව ඉදිරියේ සාක්ෂි දුන් හිටපු විදේශ කටයුතු අමාත්‍යවරයා 2009 මැයි මස 18 වෙනි දින එක්සත් ජාතීන්ගේ මහලේකම්වරයා මෙරට සිදු කළ සංචාරය සහ ඒකාබද්ධ ප්‍රකාශය අත්සන් කිරීම හා සම්බන්ධ කරුණු සහ වාතාවරණයන් විස්තර කළේය - මෙම අවසන් වාර්තාවේ II වෙනි වෙළුමෙහි දී ඇති අමාත්‍යවරයාගේ සම්පූර්ණ සාක්ෂිය කියවන්න.

මූලික අවශ්‍යතාවයක් ය යන එකඟත්වය. 13 වෙනි සංශෝධනය ක්‍රියාත්මක කිරීමේ කාර්යය ඉදිරියට සිදු කර ගෙන යාම මෙන්ම මෙම ක්‍රියාවලිය තවදුරටත් වැඩිදියුණු කිරීම සඳහා සහ ශ්‍රී ලංකාවේ තිරසාර සාමයක් සහ සංවර්ධනයක් ඇතිකිරීම සඳහා මෙම නව වාතාවරණයන් තුළ දෙමළ පක්ෂ ඇතුළු සියලු ම පක්ෂ සමග පුළුල් සංවාදයක් ආරම්භ කිරීම සඳහා තමන් තුළ ඇති ස්ථීර අරමුණ ජනාධිපතිවරයා විසින් ප්‍රකාශ කරනු ලැබීම.

(ආ) ජාත්‍යන්තර මානව හිමිකම් ප්‍රමිතීන්ට සහ ශ්‍රී ලංකාවේ ජාත්‍යන්තර බැඳීම් වලට අනුකූලව මානව හිමිකම් ප්‍රවර්ධනය කිරීම සහ ආරක්ෂා කිරීම සඳහා ශ්‍රී ලංකාවේ ස්ථීර කැපවීම නැවත අවධාරණය කිරීම. ආන්තර්ජාතික මානුෂීය නීතිය සහ මානව හිමිකම් නීතිය උල්ලංඝනයවීම් ආමන්ත්‍රණය කිරීම සඳහා වගවීමේ ක්‍රියාවලියක් තිබීමේ වැදගත්කම මහ ලේකම්වරයා විසින් අවධාරණය කරනු ලැබීම සහ මෙම මැසිවිලි ආමන්ත්‍රණය කිරීම සඳහා ක්‍රියාමාර්ග ගනු ලබන්නේ යැයි රජය විසින් ප්‍රකාශ කිරීම.

17. මේ අනුව, සත්‍යය සෙවීම, යුක්තිය, ප්‍රතිසන්ධානය, හානිපූරණය සහ ගැටුම් නැවත ඇතිවීම වැළැක්වීම සම්බන්ධ ගැටළු ආමන්ත්‍රණය කරන ස්වාධීන දේශීය යාන්ත්‍රණ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා රාමුව ඇතුළත ස්ථාපනය කිරීම පශ්චාත් ගැටුම් කාලපරිච්ඡේදය පුරා දක්නට ලැබෙන අතර, 2009 මැයි මස 27 වෙනි දින ශ්‍රී ලංකාවට පක්ෂව ගෙන එන ලද යෝජනා සම්මතයෙහි (S-11/3) ද මෙය පිළිබිඹු වෙයි.[11]

18. මෙම කොමිෂන් සභාව පූර්වගාමී පරීක්ෂණ කොමිෂන් සභා සහ කමිටු කෙරෙහි අවධානය යොමු කිරීමට පෙර, යුද්ධයේ අවසන් අදියර සම්බන්ධයෙන් විවිධ වූ මත තිබෙන බව ආරම්භයේ දී ම සඳහන් කළ යුතු වේ. යුධ හමුදාව විසින් මානුෂීය මෙහෙයුම පිළිබඳ ස්වකීය වාර්තාවේ[12] යුද්ධයේ අවසන් අදියර පිළිබඳව දී ඇති විස්තර අනුවාදය, හියුමන් රයිට්ස් වොච්, ඉන්ටර්නැෂනල් ක්‍රයිසිස් ගෘප් සහ ඇම්නෙස්ටි ඉන්ටර්නැෂනල් වැනි ජාත්‍යන්තර රාජ්‍ය නොවන සංවිධාන විසින් ඉදිරිපත් කර ඇති උද්දේශනය දිශානත වූ ලියවිලි සහ මානව හිමිකම් සඳහා වන යාපනය විශ්වවිද්‍යාල ආචාර්යවරුන් නැමති සංවිධානය විසින් ඉදිරිපත් කර ඇති වඩාත් විශ්වාස කටයුතු ඇසින් දුටු සාක්ෂිකරුවන්ගේ විස්තර අනුවාද මෙයට ඇතුළත් වේ. පරණගම කොමිසම මානව හිමිකම් සඳහා වන යාපනය විශ්වවිද්‍යාල ආචාර්යවරුන් නැමති සංවිධානය විසින් ඉදිරිපත් කර ඇති විස්තර පිළිබඳව බහුල වශයෙන් සඳහන් කර ඇති බව මෙම ජනාධිපති විමර්ශන කොමිෂන් සභාව නිරීක්ෂණය කර ඇත.[13]

19. නමුත් මෙම සියලු වාර්තා අතරින්, වැඩි අවධානයක් යොමු වූ සහ වැඩි විචාරයක් එල්ල වූ වාර්තා දෙක මූලාශ්‍ර දෙකක් විසින් ඉදිරිපත් කරන ලද වාර්තා ය: එක්සත් ජාතීන්ගේ සංවිධානයේ මහ ලේකම්වරයා විසින් පත් කරන ලද විද්වත් කමිටුව[14] සහ ශ්‍රී ලංකා රජය විසින් පත් කරන ලද

---

[11] 2009 මැයි මාසයේ දී, එවකට බලයේ සිටි ශ්‍රී ලංකා රජය 'මානව හිමිකම් ප්‍රවර්ධනය කිරීම සහ ආරක්ෂා කිරීම සඳහා ශ්‍රී ලංකාවට සහාය වීම' යන මාතෘකාව යටතේ එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කවුන්සිලයට යෝජනාවක් (S-11) ඉදිරිපත් කළ අතර 2009 මැයි 27 වැනි දින ශ්‍රී ලංකාවට එම කවුන්සිලයේ දී ස්වකීය යෝජනාව සම්මත කරවා ගැනීමට හැකි විය (පක්ෂව ඡන්ද 29 ක් ද, විරුද්ධව ඡන්ද 12 ක් ද, ඡන්දය දීමෙන් වැළකී සිටීම් 6 ක් ද වශයෙන්).

[12] විමර්ශන අධිකරණය විසින් සොයා ගන්නා ලද කරුණුවල කෙටි සාරාංශයක් ශ්‍රී ලංකා රජය විසින් මානව හිමිකම් කමිටුව වෙත 2013 වර්ෂයේ දී ඉදිරිපත් කරන ලද වාර්තාවේ ඇතුළත් වේ.

[13] *'පැහැර ගැනීම් සහ අතුරුදහන්වීම් පිළිබඳ පැමිණිලි විමර්ශනය කිරීම සඳහා පත් කරන ලද ජනාධිපති විමර්ශන කොමිෂන් සභාවේ දෙවෙනි විධිනියෝගය පිළිබඳ වාර්තාව - 2015 අගෝස්තු'* නැමති මාතෘකාව යටතේ පරණගම කොමිසම විසින් ඉදිරිපත් කරන ලද වාර්තාව බලන්න.

[14] ඉහත 16 වෙනි ඡේදයේ (ආ) උපඡේදය යටතේ විස්තර කර ඇති පරිදි ඒකාබද්ධ ප්‍රකාශයේ අවසන් වාක්‍ය දෙක මගින් විද්වත් කමිටුව ස්ථාපනය කිරීම සම්බන්ධයෙන් කරුණු සොයා ගැනීමට හැකි වෙයි. එම විද්වත් කමිටුවේ වාර්තාව එක්සත්

කොමිසමක් වන උගත් පාඩම් හා ප්‍රතිසංධාන කොමිසම[15] එම මූලාශ්‍ර දෙකයි. කෙසේ වෙතත්, එකී විද්වත් මණ්ඩලය විසින් ඉදිරිපත් කරන ලද වාර්තාව එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කවුන්සිලය නිල වශයෙන් ප්‍රකාශයට පත් නොකළ බව සහ යුද්ධය පැවති කාලයේ සිදුවී තිබිය හැකි මානව හිමිකම් උල්ලංඝනයවීම් පිළිබඳව මහ ලේකම්වරයා දැනුවත් කිරීම සහ මහ ලේකම්වරයාගේ දැනුවත්භාවය සඳහා නිර්දේශ ඉදිරිපත් කිරීම එම විද්වත් මණ්ඩලය පත්කිරීමෙහි අරමුණ වූයේ යැයි නිවේදනය කරන ලද බව අවධානයට ගත යුතු වේ.[16]

20. අතුරුදහන් වූ තැනැත්තන් සම්බන්ධ ගැටළු ආමන්ත්‍රණය කිරීම සඳහා ප්‍රවේශයක් නොතිබීම කවර හෝ අන්තර්කරණය වූ සහ දීර්ඝ කාලීන ප්‍රතිසංධාන ක්‍රියාවලියක් ක්‍රියාත්මක කිරීම කෙරෙහි බරපතල බාධාවක් වනු ඇති බැවින්, ශ්‍රී ලංකාව අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ ගැටළු ආමන්ත්‍රණය කිරීම සඳහා පරිපූර්ණ ප්‍රවේශයක් අනුගත කර ගත යුතු බවට උගත් පාඩම් හා ප්‍රතිසංධාන කොමිසම විසින් ඉදිරිපත් කර ඇති නිර්දේශය ක්‍රියාත්මක කිරීම පිණිස ශ්‍රී ලංකාව ඉන් පසුව තවත් කොමිෂන් සභාවක්[17] පත් කළ බව පැහැදිලි කරුණකි[18].

21. මේ අවස්ථාවේ දී මෙම ජනාධිපති විමර්ශන කොමිෂන් සභාවේ විධිනියෝගය මීළඟට සලකා බැලීම වැදගත් වේ. මෙම කොමිෂන් සභාව පත් කිරීම 2020 පෙබරවාරි 20 වෙනි දින ශ්‍රී ලංකා රජය එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කවුන්සිලය වෙත ලබාදෙන ලද පොරොන්දුවක් ඉටු කිරීමට උපකාරී වනු පිණිස සිදු කරන ලද අතර, මෙහි විධිනියෝගය මගින් පූර්වගාමී විමර්ශන කොමිෂන් සභා සහ කමිටු විසින් සොයා ගන්නා ලද පරිදි අන්තර්ජාතික මානව හිමිකම් නීතිය සහ අන්තර්ජාතික මානුෂීය නීතිය උල්ලංඝනය වීම් පිළිබඳව සොයා බැලීමට සහ අනුගමනය කළ යුතු ඉදිරිමාර්ගය සම්බන්ධයෙන් සලකා බැලීම සඳහා වන නිර්දේශ සහ යෝජනා ඉදිරිපත් කිරීමට විශේෂයෙන් ම මෙම කොමිෂන් සභාවට බලය ලබා දෙයි.

22. ඉහත සඳහන් කළ ප්‍රස්තුතයෙහි වැදගත්කම අවබෝධ කර ගැනම පිණිස, අදාළ ගැසට් නිවේදනයෙහි පළ කර ඇති, වර්තමාන කොමිෂන් සභාවෙහි විධිනියෝගය පරීක්ෂා කර බැලීම යෝග්‍ය වේ.[19]

1. විධිනියෝගය

23. 2021 ජනවාරි 21 වෙනි දින, හිටපු ජනාධිපති ඝෝඨාභය රාජපක්ෂ 'පරීක්ෂණ කොමිෂන් සභ පනතේ' 2 වෙනි වගන්තියෙහි සඳහන් විධිවිධාන ප්‍රකාරව මූලික වශයෙන් කොමසාරිස්වරුන් තිදෙනෙකු (3) පත් කළ අතර ඉන් පසුව කොමිෂන් සභාවට 4 වෙනි සාමාජිකයෙක් ද පත් කළේය.[20]

ජාතීන්ගේ මානව හිමිකම් කවුන්සිලයේ 2012, 2013 සහ 2014 වර්ෂවල ඉදිරිපත් වූ යෝජනා සම්මත ඇතුළුව එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කවුන්සිලයේ දී ජාත්‍යන්තර විමර්ශනයක් ඉල්ලා ඉදිරිපත් කරන ලද ඉල්ලීම්වල පදනම බවට පත් විය.

[15] *උගත් පාඩම් හා ප්‍රතිසංධාන කොමිසම පිළිබඳ හැඳින්වීමක් කියවීම සඳහා මෙම අවසන් වාර්තාවේ පූර්වගාමී කොමිෂන් සභා සහ කමිටු* නැමති මාතෘකාව යටතේ ඇති 2 වෙනි පරිච්ඡේදය කියවන්න.

[16] 'ශ්‍රී ලංකාවේ වගවීම පිළිබඳ එක්සත් ජාතීන්ගේ මහ ලේකම්වරයාගේ විද්වත් මණ්ඩලයේ වාර්තාව' සම්බන්ධ සමාලෝචනය පිළිබඳ සිවිල් සමාජ සම්මන්ත්‍රණයක වාර්තාව සහ ඒ හා සම්බන්ධ "වගවීම සහ පුනස්ථාපන යුක්තිය සහ ප්‍රතිසන්ධානය" නැමති මාතෘකාව යටතේ වන පත්‍රිකා, (මාග ආයතනය, 2011 සැප්තැම්බර්), බලන්න.

[17] 1990 ජූනි 10 සහ 2009 මැයි 19 අතර කාලය තුළ උතුරු හා නැගෙනහිර පළාත්වල සිදු වූයේ යැයි පැවසෙන බලහත්කාරයෙන් සහ කැමැත්ත නොමැතිව සිදු කරන ලද අතුරුදහන් කිරීම් විමර්ශනය කිරීම සඳහා පත්කරන ලද "අතුරුදහන්වීම් සම්බන්ධයෙන් පරීක්ෂා කිරීම සඳහා පත් කරන ලද ජනාධි විමර්ශන කොමිසම" (2013 අගෝස්තු 15 දිනැති අංක 1823/42 දරන අති විශේෂ ගැසට්පත්‍රය). පරණගම කොමිසම පිළිබඳ හැඳින්වීමක් සඳහා මෙම අවසන් වාර්තාවේ *පූර්වගාමී කොමිෂන් සභා සහ කමිටු* නැමති මාතෘකාව යටතේ ඇති 2 වෙනි පරිච්ඡේදය කියවන්න.

[18] උගත් පාඩම් හා ප්‍රතිසංධාන කොමිෂන් සභාවේ වාර්තාව සහ නිර්දේශවල 9.48 සහ 9.49 වෙනි ඡේද කියවන්න.

[19] 2021 ජනවාරි 21 දිනැති අංක 2211/55 දරන ගැසට් නිවේදනය බලන්න.

24. කොමිෂන් සභාවට පහත සඳහන් කරුණු පරීක්ෂා කර සහ විමර්ශනය කර, අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමේ හෝ වාර්තා කිරීමේ කාර්යය පවරන ලදී:

"(අ) මානව හිමිකම් උල්ලංඝනයවීම් පිළිබඳව විමර්ශනය කිරීම සඳහා පූර්වගාමීව පත්කරන ලද පරීක්ෂණ කොමිෂන් සභා සහ කමිටු මගින් සිදු කරන ලද විමර්ශනයන්හි දී බරපතල ගණයේ මානව හිමිකම් උල්ලංඝනයවීම්, බරපතල ගණයේ ජාත්‍යන්තර මානුෂීය නීති කඩකිරීම් සහ වෙනත් එවැනි වරදවල් පිළිබඳව අනාවරණය කරගෙන තිබේද යන වග;

(ආ) එකී පරීක්ෂණ කොමිෂන් සභා සහ කමිටු මගින් උක්ත බරපතල ගණයේ මානව හිමිකම් උල්ලංඝනයවීම්, බරපතල ගණයේ ජාත්‍යන්තර මානුෂීය නීති කඩකිරීම් සහ වෙනත් එවැනි වරදවල් සම්බන්ධව සොයාගත් කරුණු කවරේද යන්න හඳුනා ගැනීම සහ එකී කරුණු පිළිබඳව කටයුතු කළ යුතු ආකාරය සම්බන්ධයෙන් නිර්දේශ ලබා තී තිබේද යන වග;

(ඇ) එකී නිර්දේශයන් සම්බන්ධයෙන් පවත්නා නීතිය ප්‍රකාරව මෙතෙක් කටයුතු කර ඇති ආකාරය හා වර්තමාන රාජ්‍ය ප්‍රතිපත්තියට අනුකූලව තවදුරටත් එම නිර්දේශ ක්‍රියාත්මක කිරීමට ගත යුතු පියවරයන් මොනවාද යන්න;

(ඈ) ඉහත (ආ) සහ (ඇ) ප්‍රකාරව කටයුතු කරනු ලබන්නේද යන්න සම්බන්ධව අධීක්ෂණය කිරීම."

25. ඉහත සඳහන් කරන ලද බලතල සහ කර්තව්‍යයන්හි සීමාවන් තුළ, අවශ්‍ය පරීක්ෂණ සහ විමර්ශන සිදු කිරීමටත්, කාරක සභාව විසින් අවශ්‍ය යැයි සලකනු ලබන පරිදි අන්තර්කාලීන වාර්තා ඉදිරිපත් කිරීමටත් මෙම ජනාධිපති විමර්ශන කොමිෂන් සභාවට අවසරය සහ බලතල ලබා දී ඇති බව පැහැදිලි ය.

26. දීර්ඝ කාලයක් පුරා පැවති කොවිඩ්-19 වසංගතය මෙම ජනාධිපති විමර්ශන කොමිෂන් සභාවේ අඛණ්ඩ ක්‍රියාකාරිත්වය සහ එහි විධිනියෝගය ක්‍රියාත්මක කිරීම කෙරෙහි බාධා එල්ල කළ බව මෙම වාර්තාව ආරම්භයේ දී ම සඳහන් කළ යුතු ය; එහෙත්, කොමිෂන් සභාව ස්වකීය විමර්ශන කාර්යයන් සඳහා ගැටුම් වලින් පීඩාවට පත් උතුරු නැගෙනහිර ප්‍රදේශවල සංචාරය කරමින් විවිධ ස්ථානවලට ගමන් කළ බව සතුටින් වාර්තා කරන්නෙමු. මෙම කොමිෂන් සභාව මේ දක්වා නිර්දේශ ගණනාවක් අඩංගු අතුරු වාර්තා දෙකක් නිකුත් කර ඇති අතර, ශ්‍රී ලංකා රජය ත්‍රස්තවාදය වැළැක්වීමේ පනතේ 13 වැනි වගන්තිය යටතේ උපදේශක මණ්ඩලයක් ස්ථාපනය කිරීම වැනි කොමිෂන් සභාවේ ඇතැම් නිර්දේශ ක්‍රියාත්මක කර ඇති බව සඳහන් කිරීම මෙහි දී වැදගත් වේ. එමෙන්ම, කොමිෂන් සභාව 2021 ජූලි මාසයේ දී නිකුත් කරන ලද ස්වකීය පළමු වෙනි අතුරු වාර්තාවේ දී ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත අහෝසි කර එය අලුතින් සකස් කිරීම වෙනුවෙන් ද දීර්ඝ වශයෙන් පෙනී සිටියේ ය. එමෙන් ම, ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත වෙනුවට ජාත්‍යන්තර යහ පරිචයන්ට අනුකූල වන ත්‍රස්ත විරෝධී පනතක් අලුතින් හඳුන්වා දිය යුතු යැයි ද මෙම කොමිෂන් සභාව නිර්දේශ කළේය. 2022 පෙබරවාරි මාසයේ දී කොමිෂන් සභාව ස්වකීය දෙවෙනි අතුරු වාර්තාව ඉදිරිපත් කිරීමෙන් අනතුරුව මෙරට ඇතිවූ තත්ත්වයන් හේතුවෙන් කොමිෂන් සභාවට කඩිනමින් නිමකර භාරදීමට අවශ්‍යව තිබූ ස්වකීය අවසන් වාර්තාව සකස් කිරීමේ වේගවත් බව සහ කඩිසර බව හදිසියේ ඇනහිටි අතර, අතිගරු රනිල් වික්‍රමසිංහ මැතිතුමා මෙරට ජනාධිපති ධුරයට පත්වීමෙන් අනතුරුව, මෙම කොමිෂන් සභාවට ස්වකීය අවසන් වාර්තාව සකස් කිරීමේ කාර්යය නිම කිරීමට හැකි වනු පිණිස එතුමා කලින් කලට මෙම කොමිෂන් සභාවේ කාලය තවදුරටත් දීර්ඝ කළේය. මෙම අවසන් වාර්තාව භාර දීමට පෙර, කොමිෂන් සභාව 2023 පෙබරවාරි මස 06 වෙනි දින ස්වකීය අවසන් වාර්තාවට ඇතුළත් කිරීමට අපේක්ෂා කරන නිර්දේශවල සාරාංශයක් අතිගරු ජනාධිපතිතුමා වෙත භාර දුන්නේ ය.

---

[20] 2021 පෙබරවාරි 12 දිනැති අංක 2214/75 දරන ගැසට් නිවේදනය බලන්න.

27. මෙම ජනාධිපති විමර්ශන කොමිෂන් සභාවේ විධිනියෝගය කෙරෙහි අවධානය යොමු කිරීමේ දී, ජාත්‍යන්තර මානව හිමිකම් නීතිය සහ ජාත්‍යන්තර මානුෂීය නීතිය උල්ලංඝනයවීම් පිළිබඳව විමර්ශනය කළ පූර්වගාමී විමර්ශන කොමිෂන් සභා සහ කමිටු හඳුනා ගැනීම මෙම කොමිෂන් සභාවේ මූලික ම වගකීම විය. එයින් අනතුරුව, යම් මානව ජාත්‍යන්තර හිමිකම් උල්ලංඝනයවීම්, බරපතල ගණයේ ජාත්‍යන්තර මානුෂීය නීති කඩකිරීම් සහ වෙනත් එවැනි බරපතල වැරදි කිසිවක් සිදුවී ඇතැයි එම කොමිෂන් සභා සහ කමිටු විසින් හෙළි කර තිබේද යන්න තහවුරු කර ගැනීම මෙම කොමිෂන් සභාවේ වගකීම විය. මෙම කොමිෂන් සභාවේ විමර්ශනවල විෂය පථය පූර්වගාමී කොමිෂන් සභා සහ කමිටු විසින් සොයාගෙන ඇති පරිදි එකී ජාත්‍යන්තර මානව හිමිකම් උල්ලංඝනයවීම්, බරපතල ගණයේ ජාත්‍යන්තර මානුෂීය නීති කඩකිරීම් සහ වෙනත් එවැනි බරපතල වැරදි වලට පමණක් සීමා කිරීමට විධිනියෝගයේ මෙම කොටස මගින් මෙම කොමිෂන් සභාවට ප්‍රමාණවත් බලය ලබා දෙයි.

28. එමගින් පූර්වාගාමී කොමිෂන් සභා සහ කමිටු සහ එම කොමිෂන් සභා සහ කමිටු විසින් සොයා ගන්නා ලද පරිදි ජාත්‍යන්තර මානව හිමිකම් උල්ලංඝනයවීම් සහ ජාත්‍යන්තර මානුෂීය නීති කඩකිරීම් මොනවාද යන්න හඳුනා ගැනීම පිළිබඳ ප්‍රශ්නය ඉස්මතු කරයි. මෙම කොමිෂන් සභාව එම ප්‍රශ්නය වෙත යොමු වීමට පෙර උල්ලංඝනය කිරීම් වර්ග පිළිබඳ දැනුවත්වීම සඳහා වන කෙටි විස්තරයක් පහත ඉදිරිපත් කර ඇත.

- **ජාත්‍යන්තර මානව හිමිකම් උල්ලංඝනයකිරීම් සහ ජාත්‍යන්තර මානුෂීය නීති කඩකිරීම්**

29. "මානව හිමිකම් උල්ලංඝනය කිරීම්" යන්න විවිධාකාරයෙන් නිර්වචනය කරනු ලබන අතර, ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ III වෙනි පරිච්ඡේදයේ දක්වා ඇති පරිදි, එහි සඳහන් විවර්ජනයන්ට යටත්ව, එහි දක්වා ඇති මූලික අයිතිවාසිකම් උල්ලංඝනය වන ඕනෑම ක්‍රියාවක්, වැඩසටහනක්, ක්‍රියාවලියක්, ක්‍රමවේදයක් හෝ ප්‍රතිචාරයක් සිදු කිරීම හෝ සිදු කිරීම පැහැර හැරීම එයින් අදහස් කෙරෙයි. එමෙන්ම, ජාත්‍යන්තර පරිචයෙහි දී නිර්වචනය කරනු ලබන 'බරපතල මානව හිමිකම් උල්ලංඝනය කිරීම්' යනුවෙන් තවත් යෙදුමක් තිබෙන අතර, එය තේමාත්මක සාධනපත්‍රවල පරිපූර්ණ වශයෙන් සාකච්ඡා කරනු ලැබේ.[21]

30. "බරපතල අන්තර්ජාතික මානුෂීය නීති කඩකිරීම්" යන්නෙන් සන්නද්ධ ගැටුම් සම්බන්ධ සම්මත රීති සහ ජාත්‍යන්තර මානුෂීය නීතියේ සම්මත රීති බරපතල ලෙස උල්ලංඝනය කිරීම් අදහස් කෙරෙයි.[22]

---

[21] "*බරපතල ජාත්‍යන්තර මානව හිමිකම් නීති උල්ලංඝනය කිරීමක් වන්නේ කුමන්ද?*", 2013 අවි ආයුධ වෙළඳාම පිළිබඳ ගිවිසුමේ කාර්යය සඳහා පරිචය පිළිබඳ ඇගයීමක් සහ විශේෂඥ මතය යන මාතෘකාව යටතේ ඇති ශාස්ත්‍රීය සටහන අංක 6 බලන්න.

[22] "බරපතල ගණයේ ජාත්‍යන්තර මානුෂීය නීති කඩකිරීම්" මොනවාද? පහැදිලි කිරීමේ සටහන - "බරපතල ගණයේ ජාත්‍යන්තර මානුෂීය නීති කඩකිරීම්" යනු "යුධ අපරාධ" වේ. වර්තමානයේ මෙම යෙදුම් දෙක එකිනෙක අතුරුමාරු කර යොදනු ලැබේ. මේවා අන්තර්ජාතික හෝ අන්තර්ජාතික නොවන සන්නද්ධ ගැටුම්වල දී සිදු විය හැක. මෙම නීති කඩකිරීම් හේතුවෙන් ආරක්ෂිත පුද්ගලයින්ව (උදා: සිවිල් වැසියන්, යුධ සිරකරුවන්, තුවාල ලැබූවන් සහ රෝගීන්) හෝ වස්තූන් (උදා: සිවිල් වැසියන්ට අයත් වස්තූන් හෝ යටිතල පහසුකම්) අවදානම් සහගත තත්ත්වයකට පත් කරන්නේ නම් හෝ එමගින් වැදගත් සාරධර්ම කඩකරන්නේ නම් හෝ එම උල්ලංඝනය කිරීම් බරපතල වන අතර ඒවා යුධ අපරාධ වේ. බොහොමයක් යුධ අපරාධ වලට මරණය, තුවාල සිදු කිරීම හෝ දේපළ විනාශ කිරීම හෝ නීති විරෝධී ලෙස අත්පත් කර ගැනීම අයත් වේ. එම ක්‍රියා මගින් සෘජුව ම පුද්ගලයින්ව කායික වශයෙන් හෝ ද්‍රව්‍ය භෞතික වශයෙන් අවදානමට ලක් කරන්නේ නැති වුව ද වටිනා විශ්වීය සාර්ධර්ම උල්ලංඝනය කරන බැවින් ඒවා යුධ අපරාධ බවට පත් වේ. උදාහරණ ලෙස, මෘත ශරීර අපයෝජනය කිරීම සහ වයස අවුරුදු 15 ට අඩු ළමයින් සන්නද්ධ හමුදා වලට බඳවා ගැනීම මේවාට ඇතුළත් වේ.
https://www.icrc.org/en/doc/assets/files/2012/att-what-are-serious-violations-of-ihl-icrc.pdf

එවැනි බරපතල උල්ලංඝනය කිරීම් යුධ අපරාධ වශයෙන් ද හඳුන්වනු ලබන අතර, අන්තර්ජාතික හෝ අන්තර්ජාතික නොවන සන්නද්ධ ගැටුම් වලදී එවැනි උල්ලංඝනය කිරීම් සිදු විය හැක.[23]

31. "එවැනි අනෙකුත් බරපතල වැරදි" යන්නෙන්, දණ්ඩ නීති සංග්‍රහය යටතේ[24] හෝ වෙන යම් පනතක් යටතේ හෝ දඬුවම් ලැබිය හැකි වැරදි වන 'බරපතල වැරදි' යන අර්ථය ඇඟවෙයි. විවිධ ස්වරූපවලට අයත් යැයි ප්‍රත්‍යක්ෂ වන අපරාධ හෝ වැරදි පුළුල් කාණ්ඩ දෙකකට වෙන් කරනු ලැබේ: බරපතල වැරදි හෙවත් බරපතල ගණයේ වැරදි (මහාධිකරණයේ නඩු පැවරිය හැකි වැරදි) සහ සුළු අපරාධ (පොලීසිය විසින් නඩු පවරනු ලැබිය හැකි වැරදි).[25]

- **පූර්වගාමී විමර්ශන කොමිෂන් සභා සහ කමිටු**

32. "පූර්වගාමී විමර්ශන කොමිෂන් සභා" යන යෙදුමෙන් 1948 අංක 17 දරන පරීක්ෂණ කොමිෂන් සභා පනතේ විධිවිධාන ප්‍රකාරව සහ එහි පසුකාලීන සංශෝධනවලට යටත්ව රාජ්‍ය නායකයා විසින් පත් කරන ලද පරීක්ෂණ කොමිෂන සභා අදහස් කෙරෙයි. "පූර්ගාමී විමර්ශන කොමිෂන් සභා" යන්නෙන් නිශ්චිතව දක්වා ඇති කරුණු/කරුණු සම්බන්ධයෙන් වර්තමාන විමර්ශන කොමිෂන් සභාව පත්කිරීමට පූර්වයෙන් පත්කර තිබූ සහ ක්‍රියාත්මක කර තිබූ ඕනෑම විමර්ශන කොමිෂන් සභාවක් පූර්වකල්පනය කරනු ලැබේ.[26] එවැනි විමර්ශන කොමිෂන් සභාවක් වර්තමාන විමර්ශන කොමිෂන් සභාවේ පරීක්ෂණ කාර්යය සඳහා අදාළ වන විමර්ශන කොමිෂන් සභාවක් වේ.

33. තවද, විධිනියෝගය මගින් කාල සීමාවක් පිළිබඳව හෝ සීමාකිරීම් පිළිබඳව නිශ්චිතව සඳහන් කර නොමැති බැවින්, මෙම කොමිෂන් සභාවට කටයුතු ආරම්භ කිරීම සඳහා විමර්ශන කොමිෂන් සභා ගණනාවක් තිබෙන බව පැහැදිලි වන නමුත්, එකසත් ජාතීන්ගේ මානව හිමිකම් කවුන්සිලයේ යෝජනා සම්මත වැනි පූර්වයෙන් සිදුවී ඇති සිද්ධීන් සමග කියවිය යුතු විධිනියෝගය පිළිබඳ තාර්කික නිර්වචනයකට අනුව, මෙම විමර්ශන කොමිෂන් සභාවේ කාර්යය පිණිස පූර්වගාමී විමර්ශන කොමිෂන් සභා යන්නට පහත සඳහන් කොමිෂන් සභා අයත් වන්නේ යැයි මෙම කොමිෂන් සභාවට අවිවාදයෙන් නිගමනය කළ හැක:

    1. උගත් පාඩම් සහ ප්‍රතිසන්ධානය පිළිබඳ වූ ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාව (උගත් පාඩම් කොමිසම)

---

[23] ජාත්‍යන්තර මානුෂීය නීතිය බරපතල ලෙස කඩකිරීම් වලට පහත සඳහන් ඒවා ඇතුළත් වේ: 1949 වර්ෂයේ ජිනීවා සම්මුතීන් හතර යටතේ නිශ්චිතව දක්වා ඇති පරිදි බරපතල උල්ලංඝනය කිරීම් (පිළිවෙළින් අංක I, II, III සහ IV දරන සම්මුතීන් හි අංක 50, 51, 130 සහ 147 යන වගන්ති), 1997 වර්ෂයේ I වෙනි අමතර කෙටුම්පත යටතේ නිශ්චිතව දක්වා ඇති බරපතල උල්ලංඝනය කිරීම්, ජාත්‍යන්තර අපරාධ අධිකරණයේ රෝම ප්‍රඥප්තියෙහි 8 වෙනි වගන්තිය යටතේ නිශ්චිතව දක්වා ඇති යුධ අපරාධ, සහ සාම්ප්‍රදායික ජාත්‍යන්තර මානුෂීය නීතියෙහි දක්වා ඇති පරිදි ජාත්‍යන්තර සහ ජාත්‍යන්තර නොවන සන්නද්ධ ගැටුම් වලදී සිදු වන අනෙකුත් යුධ අපරාධ. 1949 වර්ෂයේ ජිනීවා සම්මුතීන් හතරෙහි නිශ්චිතව දක්වා ඇති පරිදි බරපතල උල්ලංඝනය කිරීම් ජාත්‍යන්තර සන්නද්ධ ගැටුම්වලට අදාළ වේ. සියලු ම රාජ්‍යයන් මෙම ජිනීවා සම්මුති හතරෙහි පාර්ශ්ව වේ. 1997 වර්ෂයේ I වෙනි අමතර කෙටුම්පත යටතේ නිශ්චිතව දක්වා ඇති බරපතල උල්ලංඝනය කිරීම් ජාත්‍යන්තර සන්නද්ධ ගැටුම්වලට අදාළ වේ. රාජ්‍යයන් 172 ක් මෙම I වෙනි අමතර කෙටුම්පතෙහි පාර්ශ්වකරුවන් වේ. රෝම ප්‍රඥප්තිය යටතේ නිශ්චිතව දක්වා ඇති යුධ අපරාධ ජාත්‍යන්තර සහ ජාත්‍යන්තර නොවන සන්නද්ධ ගැටුම්වලට අදාළ වේ. රටවල් 123 ක් රෝම ප්‍රඥප්තියේ පාර්ශ්වකාර රාජ්‍යයන් වේ. සන්නද්ධ ගැටුම්වල ස්වභාවය කුමක් වුව ද, එම ගැටුම්වලට සම්බන්ධ සියලු ම පාර්ශ්ව සාම්ප්‍රදායික ජාත්‍යන්තර මානුෂීය නීතියෙන් බැඳී සිටිති.

[24] ශ්‍රී ලංකා දණ්ඩනීති සංග්‍රය

[25] "බරපතල අපරාධ පිළිබඳ සංක්ෂිප්තය" https://police.lk./ (ශ්‍රී ලංකා පොලීසිය)

[26] පූර්වගාමී විමර්ශන කොමිෂන් සභා යන්නට යොමුවක් ලෙස 2021 ජනවාරි 21 දිනැති අංක 2211/55 දරන ගැසට් නිවේදනයේ සඳහන් කර ඇති විධිනියෝගය (අ) කියවන්න.

2. පැහැරගැනීම් සහ අතුරුදන් කිරීම් පිළිබඳ පැමිණිලි විමර්ශනය කිරීමේ ජනාධිපති කොමිෂන් සභාව (පරණගම කොමිසම)

3. 2005 අගෝස්තු මස 1 වැනි දින සිට ශ්‍රී ලංකාව තුළ සිදුවී ඇතැයි කියන බරපතල මානව හිමිකම් උල්ලංඝනය කිරීම් පිළිබඳ චෝදනා විමර්ශනය කිරීමට සහ පරීක්ෂණය කිරීමට පත් කරන ලද විමර්ශන කොමිෂන් සභාව (උදලාගම කොමිසම)[27]

34. ජාත්‍යන්තර මානව හිමිකම් නීති සහ ජාත්‍යන්තර මානුෂීය නීති කඩකිරීම් සම්බන්ධයෙන් විමර්ශනය කර ඇති "පූර්වගාමී කොමිෂන් සභා" පිළිබඳව ද විධිනියෝගයෙහි සඳහන් කර ඇත. මෙවැනි ම කාර්යභාරයක් පවරා තිබූ කමිටු ගණනාවක් පිළිබඳව මෙම ජනාධිපති විමර්ශන කොමිෂන් සභාව තොරතුරු සොයා ගත් අතර, ඇතැම් කමිටු උගත් පාඩම් හා ප්‍රතිසන්ධානය පිළිබඳව වූ විමර්ශන කොමිෂන් සභාව, පරණගම කොමිෂන් සභාව වැනි කොමිෂන් සභාවල නිර්දේශ මගින් මතු කර තිබූ ජාත්‍යන්තර මානව හිමිකම් නීති සහ ජාත්‍යන්තර මානුෂීය නීති කඩකිරීම් සම්බන්ධ ගැටලු පිළිබඳව සොයා බලා ඇත. මෙම ජනාධිපති විමර්ශන කොමිෂන් සභාව ස්වකීය විධිනියෝගය සලකා බැලීම උගත් පාඩම් හා ප්‍රතිසන්ධානය පිළිබඳව වූ කොමිෂන් සභාවට, පරණගම කොමිසමට සහ උදලාගම කොමිසමට සීමා කර ඇති බැවින්, යම් කමිටුවක් පිළිබඳව සඳහන් කරන්නේ නම්, එම කමිටුව ඉහත කී කොමිෂන් සභා තුනෙන් කවර හෝ කොමිෂන් සභාවක අවධානයට ලක් වූ සිදුවීම් විමර්ශනය කිරීමේ කාර්යය භාර ගන්නා ලද අස්තිත්වයක් විය යුතුය.

35. මෙම අවස්ථාවෙහි දී, ජාත්‍යන්තර මානව හිමිකම් නීති සහ ජාත්‍යන්තර මානුෂීය නීති කඩකිරීම් පිළිබඳ ගැටළු සම්බන්ධයෙන් ශ්‍රී ලංකා රජය විසින් පත් කරන ලද කමිටු ලැයිස්තුවක් පිළිබඳව සඳහන් කිරීම යෝග්‍ය වේ.

1. ඩී.එස්. විජේසිංහ කමිටුව

36. 2009 ඔක්තෝම්බර් මාසයේ දී, එක්සත් ජනපද රාජ්‍ය දෙපාර්තමේන්තුව විසින් ශ්‍රී ලංකාවේ යුද්ධයේ අවසාන අදියරේ දී මානුෂීය නීතිය අවභාවිත කරන ලදැයි පැවසෙන සිද්ධීන් පිළිබඳ සංක්ෂිප්තයක් සහිතව එක්සත් ජනපද කොන්ග්‍රසයට වාර්තාවක් ඉදිරිපත් කළේය.[28]

37. 2009 නොවැම්බර් 4 වෙනි දින ශ්‍රී ලංකා රජය එම වාර්තාව අධ්‍යයනය කිරීම සඳහා කීර්තිමත් නීතිඥවරුන් සහ සුප්‍රසිද්ධ අධ්‍යාපනඥයෙකුගෙන් සමන්විත කමිටුවක් පත් කළේය.[29]

38. පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් සොයා බැලීම එම කමිටුවේ විධිනියෝගය විය:

(අ) එක්සත් ජනපද වාර්තාවේ සෘජුව ම සඳහන් කර ඇති පුද්ගලයින් පිළිබඳ විස්තරය සහ පසුබිම, සහ ඔවුන්ගේ චෝදනාවෙහි ස්වභාවය;

(ආ) ඉහත කී වාර්තාවේ එකී පුද්ගලයන් සම්බන්ධයෙන් සඳහන් කිරීමට පාදක වූ හෝ හේතු වූ තත්ත්වයන්;

---

[27] පූර්වගාමී විමර්ශන කොමිෂන් සභා පිළිබඳ පොදු සාකච්ඡාවක් කියවීම සඳහා මෙම අවසන් වාර්තාවේ *2 වෙනි පරිච්ඡේදය* බලන්න.

[28] *"ශ්‍රී ලංකාවේ මෑතකාලීන ගැටුම් අතරතුර සිදුවූ සිද්ධීන් පිළිබඳව කොන්ග්‍රස් මණ්ඩලයට ඉදිරිපත් කරන ලද වාර්තාව"* බලන්න. https://2009-2017.state.gov/documents/organization/131025.pdf

[29] එම කමිටුව ජනාධිපති නීතිඥ ඩී.එස්. විජේසිංහ මහතා, ජනාධිපති නීතිඥ නිහාල් ජයමාන්න මහතා, ජනාධිපති නීතිඥ සී.ආර්. ද සිල්වා මහතා, මනෝ රාමනාදන් මහත්මිය, ජෙසීමා ඉස්මයිල් මහත්මිය සහ අනුර මැද්දගොඩ මහතා යන සාමාජිකයන්ගෙන් සමන්විත විය.

(ඇ) එකී වාර්තාවේ අන්තර්ගතයෙහි ස්වභාවය, යෝග්‍ය බව සහ සඵලත්වය;

(ඈ) එම නිශ්චිත චෝදනා සම්බන්ධයෙන් ලබා දෙන නිර්දේශ ද ඇතුළුව, වාර්තාවේ අන්තර්ගතය සහ සොයාගෙන ඇති කරුණු සම්බන්ධයෙන් ශ්‍රී ලංකාවේ නීතිවලට අනුකූලව ගත යුතු සුදුසු ක්‍රියාමාර්ග.

(ඉ) ස්වකීය අධ්‍යයනයට අනුව අදාළ වන්නේ යැයි කමිටුව විසින් සලකනු ලබන වෙනත් නිර්දේශ.

39. 2010 ඔක්තෝම්බර් මස 30 වන දින ඩී.එස්. විජේසිංහ කමිටුව සිය වාර්තාව ඉදිරිපත් කර ස්වකීය නිගමන සහ නිර්දේශ ඉදිරිපත් කළේය. මෙම අවසන් වාර්තාවේ 3 වෙනි පරිච්ඡේදයේ දී ඒවායින් සමහරක් පිළිබඳව මෙම ජනාධිපති විමර්ශන කොමිෂන් සභාවේ අවධානය යොමු කරනු ඇත. ඩී.එස්. විජේසිංහ කමිටුවේ විධිනියෝගය උගත් පාඩම් හා ප්‍රතිසන්ධානය පිළිබඳව වූ කොමිෂන් සභාවේ විධිනියෝගය තුළ ද යම් ප්‍රමාණයකට පිළිබිඹු වන බව මෙම ජනාධිපති විමර්ශන කොමිෂන් සභාව නිරීක්ෂණය කරයි.

2. උගත් පාඩම් සහ ප්‍රතිසන්ධානය පිළිබඳව වූ කොමිෂන් සභාවේ අතුරු නිර්දේශ ක්‍රියාත්මක කිරීමට පහසුකම් සැලසීම සඳහා වූ අන්තර්-ආයතන උපදේශක කමිටුව (IAAC)

40. නීතිපතිවරයාගේ සභාපතිත්වයෙන් යුත් මෙම කමිටුව ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම්, රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ ලේකම්, අධිකරණ අමාත්‍යාංශයේ ලේකම්, ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ ලේකම්, පුනරුත්ථාපන හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශයේ ලේකම්, විදේශ කටයුතු අමාත්‍යාංශයේ ලේකම් සහ නීතිපති දෙපාර්තමේන්තුවේ නිලධාරීන් යන සාමාජිකයන්ගෙන් සමන්විත විය.

41. උගත් පාඩම් හා ප්‍රතිසන්ධානය පිළිබඳව වූ කොමිෂන් සභාවේ අතුරු නිර්දේශ ප්‍රායෝගික ක්‍රියාමාර්ග හරහා ක්‍රියාත්මක කිරීම පිණිස සහ ඒ වන විටත් ක්‍රියාත්මක වෙමින් පැවති අදාළ ක්‍රියාවලීන් ශක්තිමත් කිරීම පිණිස 2010 ඔක්තෝබර් 27 වෙනි දින මෙම කමිටුව පිහිටුවන ලදී.[30]

42. මෙම කමිටුව 2011 පෙබරවාරි මාසයේ දී ස්වකීය ප්‍රගති වාර්තාව ජනාධිපතිවරයා වෙත ඉදිරිපත් කළේය.[31] උගත් පාඩම් හා ප්‍රතිසන්ධානය පිළිබඳව වූ කොමිෂන් සභාව එහි අවසන් වාර්තාවේ දී "ස්වකීය අතුරු නිර්දේශ තවමත් සම්පූර්ණයෙන් ක්‍රියාත්මක නොකිරීම පිළිබඳව කොමිෂන් සභාව කණගාටු වන්නේය" යනුවෙන් සඳහන් කිරීම සැලකිල්ලට ගැනීම වැදගත් වේ.[32]

3. උගත් පාඩම් හා ප්‍රතිසන්ධානය පිළිබඳ වූ කොමිෂන් සභාව විසින් ඉදිරිපත් කරන ලද නිර්දේශ පිළිබඳව පරීක්ෂණය කිරීම සඳහා විමර්ශන අධිකරණයක්

43. මෙම විමර්ශන අධිකරණය 2012 ජනවාරි මස 3 වෙනි දින පත් කරන ලදී. එහි ප්‍රධානියා ලෙස මේජර් ජෙනරාල් ක්‍රිෂාන්ත ද සිල්වා කටයුතු කළේ ය. IV වෙනි ඊළාම් යුද්ධයේ අවසන් අදියරේ දී සිවිල් වැසියන්ට හානි සිදු වූවා යැයි පැවසෙන චෝදනා සම්බන්ධයෙන් උගත් පාඩම් හා ප්‍රතිසන්ධානය පිළිබඳ වූ කොමිෂන් සභාව එහි අවසන් වාර්තාවේ ඉදිරිපත් කර ඇති නිරීක්ෂණ සහ චැනල් 4

---

[30] අන්තර්-ආයතන උපදේශක කමිටුව, "*උගත් පාඩම් හා ප්‍රතිසන්ධානය පිළිබඳව වූ කොමිෂන් සභාවේ අතුරු නිර්දේශ ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය පිළිබඳ වාර්තාව*".

[31] ඒසියන් ට්‍රිබියුන් "*අන්තර් ආයතන උපදේශක කමිටුව උගත් පාඩම් හා ප්‍රතිසන්ධානය පිළිබඳව වූ කොමිෂන් සභාවේ නිර්දේශ ක්‍රියාත්මක කිරීමේ දී අත්කර ගත් ප්‍රගතිය",* 2011 පෙබරවාරි 4

[32] උසත් පාඩම් හා ප්‍රතිසන්ධානය පිළිබඳව වූ වාර්තාවේ අංක 9.211, 9.64, 5.58, 5.78, 8.189, 8.190, 9.70 සහ 9.74 යන ඡේද බලන්න.

නාලිකාවේ වීඩියෝ පටයේ අඩංගු චෝදනා සම්බන්ධයෙන් එහි දර්ශනවල සත්‍යතාවය කුමක්ද යන්න නොතකා හෝ අන්‍යාකාරයකින් විමර්ශනය කිරීම සඳහා එකී විමර්ශන අධිකරණය පත් කරන ලදී.[33]

44. එකී කොමිෂන් සභා සහ කමිටු යම් මානව හිමිකම් කඩකිරීම්, ජාත්‍යන්තර මානුෂීය නීතිය බරපතල ලෙස උල්ලංඝනය කිරීම් සහ වෙනත් එවැනි බරපතල වැරදි කිසිවක් පිළිබඳ සොයා ගත් කරුණු හෙළිදරව් කර තිබේද යන ප්‍රශ්නයේ දී ඉහත සඳහන් කළ කොමිෂන් සභා සහ කමිටුවල වාර්තා, ඒවායෙහි ඇමුණුම් සහ අනෙකුත් අදාළ ලියවිලි පිළිබඳ ද්විතියික සමාලෝචනයක් සිදු කළ යුතු වේ.

45. මෙකී තත්ත්වයන් තුළ, මෙම කොමිෂන් සභාව ස්වකීය බලතල අනුව සිදු කරන පරීක්ෂණ සහ විමර්ශන ක්‍රියාවලියේ දී පහත සඳහන් විමර්ශන කොමිෂන් සභාවල වාර්තා ප්‍රථමයෙන් සලකා බලනු ලැබේ:

(අ) උගත් පාඩම් හා ප්‍රතිසන්ධානය පිළිබඳ වූ ජනාධිපති විමර්ශන කොමිෂන් සභාව[34]

(ආ) පැහැරගැනීම් සහ අතුරුදන් කිරීම් පිළිබඳ පැමිණිලි විමර්ශනය කිරීමේ ජනාධිපති කොමිෂන් සභාව (පරණගම කොමිසම)[35]

(ඇ) 2005 අගෝස්තු මස 1 වැනි දින සිට ශ්‍රී ලංකාව තුළ සිදුවී ඇතැයි කියන බරපතල මානව හිමිකම් උල්ලංඝනය කිරීම් පිළිබඳ චෝදනා විමර්ශනය කිරීමට සහ පරීක්ෂණය කිරීමට පත් කරන ලද විමර්ශන කොමිෂන් සභාව (උදලාගම කොමිසම)[36]

46. ඉහත සඳහන් කරන ලද විමර්ශන කොමිෂන් සභාවල වාර්තා මගින් මානව හිමිකම් උල්ලංඝනය කිරීමේ සිද්ධීන් සහ අවස්ථා ගණනාවක් සොයාගෙන ඇති අතර, බරපතල ගණයේ ජාත්‍යන්තර මානුෂීය නීති කඩකිරීම් සහ අනෙකුත් බරපතල වැරදි යැයි සැලකිය හැකි සිදුවීම් පිළිබඳ වැඩිදුර විමර්ශන සිදු කළ යුතු යැයි අවධාරණය කර ඇති බව ප්‍රතික්ෂේප කළ නොහැකි කරුණකි. මෙම අවසන් වාර්තාවේ ඉදිරි පරිච්ඡේදවල දී පූර්වගාමී විමර්ශන කොමිෂන් සභා විසින් සොයාගන්නා ලද කරුණු සැලකිල්ලට ගනිමින්, ඒවායෙහි නිගමන පුළුල් පරීක්ෂා කරනු ලැබේ.[37]

47. බරපතල මානව හිමිකම් උල්ලංඝනය කිරීම්, බරපතල ගණයේ ජාත්‍යන්තර මානුෂීය නීති කඩකිරීම් සහ වෙනත් එවැනි බරපතල වැරදි සම්බන්ධයෙන් ඉහත කී කොමිෂන් සභා සහ කමිටු විසින් සොයා

---

[33] ශ්‍රී ලංකා රජය 2013 වර්ෂයේ දී මානව හිමිකම් කමිටුව වෙත ඉදිරිපත් කළ වාර්තාවේ එකී විමර්ශන අධිකරණය විසින් සොයාගන්නා ලද කරුණුවල කෙටි සාරාංශයක් ඇතුළත් විය.

[34] 2002 පෙබරවාරි 21 සහ 2009 මැයි 19 අතර කාලපරිච්ඡේදය තුළ සිදු වූ සිද්ධීන් පිළිබඳව සොයා බලා වාර්තා කිරීම සඳහා 2010 මැයි 15 දිනැති ජනාධිපති අධිකාර පත්‍රය අනුව හිටපු ජනාධිපති මහින්ද රාජපක්ෂ මහතා විසින් උගත් පාඩම් හා ප්‍රතිසන්ධානය පිළිබඳ වූ කොමිෂන් සභාව පත් කරන ලදී. මෙම කොමිෂන් සභාව 2011 නොවැම්බර් 15 වෙනි දින සිය වාර්තාව ජනාධිපතිවරයා වෙත ඉදිරිපත් කළේය. එම වාර්තාව පාර්ලිමේන්තුවේ සභාගත කිරීමෙන් පසු 2011 දෙසැම්බර් 16 වෙනි දින ප්‍රසිද්ධියට පත් කරන ලදී. http://www.slembassyusa.org/downloads/LLRC-REPORT.pdf

[35] *පැහැරගැනීම් සහ අතුරුදන් කිරීම් පිළිබඳ පැමිණිලි විමර්ශනය කිරීමේ ජනාධිපති කොමිෂන් සභාවේ දෙවැනි විධිනියෝගය පිළිබඳ වාර්තාව* - https://parliament.lk/uploads/documents/paperspresented/report-of-paranagama.pdf.

[36] විශ්‍රාමලත් ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු නිශ්ශංක උදලාගම මහතාගේ ප්‍රධානත්වයෙන් යුත් මෙම ජනාධිපති විමර්ශන කොමිෂන් සභාව 2005 අගෝස්තු 01 වැනිදා සිට සිදුවී ඇති, හිටපු විදේශ කටයුතු අමාත්‍ය ලක්ෂ්මන් කදිරගාමර් ඝාතනය කිරීම, *Action Contre Le Faim* නැමති ප්‍රංශ ජාත්‍යන්තර රාජ්‍ය නොවන සංවිධානයේ ආධාර සපයන සේවකයින් 17 දෙනකු මුතූර් හි දී ඝාතනය කිරීම, ත්‍රිකුණාමලයේ දී තරුණයන් පස් දෙනෙකු ඝාතනය කිරීම සහ 2006 අගෝස්තු 28 දින අලෙයිපිඩි ප්‍රදේශයේ පිහිටි පිලිප් නේරි දේවස්ථානයේ පූජ්‍ය නිහාල් ජීම් බ්‍රවුන් අතුරුදහන් කිරීම ඇතුළු බරපතල මානව හිමිකම් උල්ලංඝනය කිරීමේ සිද්ධීන් පිළිබඳව සොයා බැලීම සඳහා පත් කරන ලදී. සිදුවීම් හතක් පිළිබඳව පමණක් විමර්ශන අවසන් කර තිබිය දී එහි පරීක්ෂණ හදිසියේ අවසන් විය.

[37] විශේෂයෙන් ම මෙම වාර්තාවේ 3 වෙනි පරිච්ඡේදයේ II වෙනි කොටස බලන්න.

ගන්නා ලද කරුණු මොනවාද යන්න සහ එම කරුණු සම්බන්ධයෙන් කටයුතු කළ යුතු ආකාරය පිළිබඳව නිර්දේශ ඉදිරිපත් කර තිබේද යන්න හඳුනා ගැනීමට විධිනියෝගය (ආ) ප්‍රකාරව මෙම ජනාධිපති විමර්ශන කොමිෂන් සභාවට නියම කර ඇත.

48. උදාහරණයක් ලෙස: සන්නද්ධ ගැටුමක පාර්ශවයක් විසින් ගැටුමේ සන්දර්භය තුළ සහ ගැටුමට අදාළව: (අ) හිතාමතාම පුද්ගලයන් එක් අයෙක් හෝ වැඩි ගණනක් ඝාතනය කිරීම; සහ (ආ) එවැනි පුද්ගලයන් එදිරිවාදිකම් වලට කිසිදු සෘජු සම්බන්ධතාවයක් නොමැති සිවිල් වැසියන් වීම; සහ (ඇ) අපරාධකරු මෙම පුද්ගලයන් සිවිල් වැසියන් ය යන්න තහවුරු කරන සැබෑ තත්ත්වයන් පිළිබඳව දැන සිටීම යන තත්ත්වයන් තුළ සිවිල් වැසියන් හිතාමතා මරාදැමීම හෝ ඝාතනය කිරීම සිදු වේ.

    i. ජාත්‍යන්තර මානුෂීය නීතිය මගින් ස්ත්‍රී දූෂණ සහ වෙනත් ආකාරයේ ලිංගික හිංසනයන් තහනම් කර ඇත.

    ii. ගැටුමක පාර්ශ්වයන් විසින් සිවිල් ජනතාව සහ සටන්කරුවන් අතර වෙනස හඳුනාගත යුතු අතර, සිවිල් ජනතාවට හෝ තනි සිවිල් වැසියන්ට එරෙහිව ප්‍රහාර එල්ල නොකළ යුතුය.

    iii. සන්නද්ධ ගැටුම්වල පාර්ශ්වයන් විසින් අවශ්‍යතා ඇති සිවිල් වැසියන් සඳහා කඩිනමින් සහ බාධාවකින් තොරව මානුෂීය සහන සැලසීමට ඉඩ දිය යුතුය සහ පහසුකම් සැලසිය යුතුය.

    iv. හමුදාමය වස්තූන් හෝ හමුදා මෙහෙයුම් ආරක්ෂා කිරීම සඳහා මිනිස් පලිහක් ලෙස භාවිතා කරන සිවිල් වැසියන් පැහැදිලිව ම ප්‍රහාරයට ලක්වීමේ බරපතල අවදානමකට ලක් වෙයි.

    v. ගැටුමට සම්බන්ධ පාර්ශ්වයන් සෑමවිටම සිවිල් වැසියන්ගේ වස්තූන් සහ හමුදාවට අයත් වස්තූන් පැහැදිලිව වෙන්කර හඳුනාගත යුතු අතර, සිවිල් වැසියන්ගේ වස්තුවකට හිතාමතා පහර නොදිය යුතුය.

    vi. ගැටුමට සම්බන්ධ හේතූන් මත සිවිල් වැසියන් නීති විරෝධී ලෙස පිටුවහල් කිරීම, බලහත්කාරයෙන් වෙනත් ස්ථානයකට මාරු කිරීම හෝ අවතැන් කිරීම ජාත්‍යන්තර මානුෂීය නීතිය මගින් තහනම් කර ඇත.

    vii. සන්නද්ධ ගැටුමක සන්දර්භය තුළ සහ ගැටුමට අදාළව, ගැටුමට සම්බන්ධ පාර්ශ්වයක් විසින් යම් තැනැත්තෙකුට අත්‍යාවශ්‍ය අධිකරණමය සහතිකවීම් සහිතව සාධාරණ නඩු විභාගයක් ලබා නොදී එම තැනැත්තා වරදකරු කිරීම හෝ එම තැනැත්තාට දඬුවම් කිරීම ජාත්‍යන්තර මානුෂීය නීතිය උල්ලංඝනය කිරීමක් වේ.[38]

49. උගත් පාඩම් හා ප්‍රතිසන්ධානය පිළිබඳ වූ කොමිෂන් සභාව සහ පරණගම කොමිෂන් සභාව ඔවුන් ඉදිරියේ ඇති කරුණු ජාත්‍යන්තර මානුෂීය නීතියේ සම්මතයන්ට අදාළ කිරීමේ දී එම කොමිෂන් සභා විසින් ඉදිරිපත් කරන ලද වාර්තාවල සාකච්ඡා තුළ සැලකිය යුතු ලෙස පැතිර ඇත්තේ ජාත්‍යන්තර මානුෂීය නීතියේ සම්මතයන්ගෙන් සමහරක් වන අතර, අදාළ විෂය කරුණු සම්බන්ධයෙන් නීතිවේදීන් සහ ලේඛකයින් විසින් ප්‍රකාශ කර ඇති විවිධ මත සැලකිල්ලට ගැනීමේ දී එම පූර්වගාමී කොමිෂන් සභා දෙක ඔවුන් ඉදිරියේ මතු වූ කරුණු සම්බන්ධයෙන් නිවැරදි නෛතික ස්ථාවරය අදාළ කර ගත්තේද යන්න විවාදයට තුඩු දෙන්නක් වේ.[39]

---

[38] උපුටා ගැනීම: මානව හිමිකම් පිළිබඳ මහකොමසාරිස්වරයාගේ කාර්යාලයේ *"ජාත්‍යන්තර මානව හිමිකම් සහ මානුෂීය නීතිය උල්ලංඝනය කිරීම් පිළිබඳ පාරිභාෂික පද මාලාව"*

[39] උගත් පාඩම් හා ප්‍රතිසන්ධානය පිළිබඳ වූ කොමිෂන් සභාව සහ පරණගම කොමිෂන් සභාව යන දෙක ම ජාත්‍යන්තර මානුෂීය නීතිය පිළිබඳ මනා දැනුමක් ඇති, එම කොමිෂන් සභා දෙකෙහි වාර්තාවල ජාත්‍යන්තර මානුෂීය නීති සහ ජාත්‍යන්තර මානව

50. ඉහත 17 වෙනි ඡේදයේ දක්වා ඇති පරිදි, යුද්ධය පිළිබඳ වෘත්තාන්ත කිහිපයක් දැනට පවතින බව ප්‍රතික්ෂේප කළ නොහැකි කරුණකි. මේ අනුව, ගැටුම සම්බන්ධයෙන් පවතින මෙම සුවිශේෂී තත්වයන් සහ සන්දර්භය මත පදනම්ව වගවීමේ ගැටළු පිළිබඳ ඇගයීමක් කළ යුතුය.

51. සත්‍ය සෙවීමේ කොමිෂන් සභා ගණනාවක සිදුවී ඇති පරිදි සාක්ෂි ඇගයීම එවැනි විමර්ශන මණ්ඩල තුළ සිදුවන්නේය යන්න සැලකිල්ලට ගැනීමේ දී, මුල් අවස්ථාවේ දී ම යුද්ධයට අදාළ කරුණු, වඩාත් විශේෂිතව සඳහන් කරන්නේ නම්, යුද්ධයේ අවසන් අදියරට අදාළ කරුණු සත්‍ය සේවීමේ මණ්ඩලයක් විසින් ඇගයිය යුතු බවට සඳහන් කෙරෙන මෙම කොමිෂන් සභාවේ ස්ථිර නිර්දේශය අනුව, යුද්ධයේ නීතිය නිවැරදිව අදාළ කර ගැනීම සත්‍ය සෙවීමේ මණ්ඩලයක් විසින් සිදු කර, ඒ අනුව නිගමන වලට එළඹිය යුතු වේ. මෙම තත්ත්වයන් තුළ, මෙම කොමිෂන් සභාව නීතිය අදාළ කර ගැනීම සහ කරුණු නැවත ඇගයීමේ කාර්යය එකී මණ්ඩලය වෙත ඉතිරි කර තබන අතර, එම මණ්ඩලය විසින් අනුගත කර ගත යුතු වන ස්වරූපය සහ සාක්ෂි ඇගයීමේ ක්‍රම මෙම අවසන් වාර්තාවේ 5 වෙනි සහ 6 වෙනි පරිච්ඡේදවල කෙටියෙන් දක්වා ඇත.

52. කෙසේ වෙතත්, පූර්වගාමී කොමිෂන් සභා විසින් සොයාගත් කරුණු සහ නිර්දේශ තුළින් පැන නගින වගවීම පිළිබඳ ගැටළු මෙම අවසන් වාර්තාවේ 3 වෙනි පරිච්ඡේදය (සොයාගත් කරුණු, නිර්දේශ සහ ඒවා ක්‍රියාත්මක කිරීම), 5 වෙනි පරිච්ඡේදය (අවසාන නිරීක්ෂණ) සහ 6 වෙනි පරිච්ඡේදය තුළ හඳුනාගෙන සහ සාකච්ඡා කර ඇති අතර, මෙම ජනාධිපති විමර්ශන කොමිෂන් සභාව ස්වකීය නිර්දේශ සහ ඉදිරි මග සඳහන් කරනු ඇත.

53. කෙටියෙන් සඳහන් කරන්නේ නම්, 3 වෙනි පරිච්ඡේදයේ දී පූර්වගාමී කොමිෂන් සභා විසින් සොයාගන්නා ලද කරුණු, ඒවායෙහි නිර්දේශ සහ ඒවා ක්‍රියාත්මක කිරීම් පිළිබඳ වමසා බලන අතර, සමාලෝචනය කරනු ලබන එක් එක් කොමිෂන් සභාවෙහි නිර්දේශ ක්‍රියාත්මක නොකිරීම පිළිබඳව සාකච්ඡාවක් ඇතුළුව මෙම කොමිෂන් සභාවේ අවසාන නිරීක්ෂණ 5 වෙනි පරිච්ඡේදයෙහි අඩංගු වේ.

54. (ඇ) ඡේදයෙහි දක්වා ඇති මෙම කොමිෂන් සභාවේ විධිනියෝගය මගින් මෙම කොමිෂන් සභාව ඉදිරිපත් කරන නිර්දේශ රජයේ ප්‍රතිපත්තියට අනුකූල විය යුතු බව අවධාරණය කරයි.[40] විධිනියෝගයෙහි මෙම කොටසෙන් ගම්‍ය වන අර්ථය නිශ්චය කරගැනීම පිණිස, මෙම කොමිෂන් සභාව 2019 පෙබරවාරි මාසයේ දී එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කවුන්සිලයේ සැසිවාරයේ දී සිදුකර ඇති ප්‍රකාශය සැලකිල්ලට ගෙන ඇති අතර, එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කවුන්සිලයේ

හිමිකම් නීති ගැටළු සම්බන්ධයෙන් සාකච්ඡා කරන අදාළ පරිච්ඡේදවල දී වැදගත් වන අදහස් සහ නිපුණත්වය සහිත සාමාජිකයින්ගෙන් සහ උපදේශකයන්ගෙන් සමන්විත වූ බව මතක තබා ගත යුතු ය. මානුෂීය නීතිය සහ අන්තර් ජාතික මානව හිමිකම් නීති ගැටළු. නීති විශාරදයින් විසින් ලියන ලද ලියවිලි සහ ඔවුන්ගේ මතවලට විශාල අවධානයක් යොමු වන බව ප්‍රතික්ෂේප කළ නොහැකි කරුණක් වන අතර, වාර්තාවල ඇති කරුණු ඇගයීමට අදාළව ඔවුන් ඉදිරිපත් කරන අදහස් නොසලකා හැරිය නොහැක. කෙසේ වෙතත්, අනෙක් ලේඛකයින් වන ඉසබෙල් ලෙසී සහ නීන් ඇන්කෙටෙල් විසින් ප්‍රකාශ කරන ලද ප්‍රතිවිරුද්ධ අදහස් සහිත "*කරුණු සාධාරණීකරණය කිරීම සඳහා නීතිය නැවත අර්ථ නිරූපණය කිරීම: ලංකාවේ ජාත්‍යන්තර මානුෂීය නීතිය අර්ථ නිරූපණය කිරීම පිළිබඳ විශ්ලේෂණයක්*" වාර්තාවල අඩංගු වන අදහස් සංසන්දනය කර බලන්න; *ජාත්‍යන්තර මානුෂීය නීතිය පිළිබඳ ආසියා පැසිෆික් දෘෂ්ටි කෝණයන්* (සංස්කරණය: සුසැනා ලින්ටන්) බලන්න පි. 423 - 439; "*වගවීම සහ ශ්‍රී ලංකාවේ සිවිල් යුද්ධය*" (2012)106(4)AJIL795 නැමති වාර්තාවෙහි විශේෂඥ මණ්ඩලයේ එක් සාමාජිකයෙක් වන ස්ටීවන් ආර්. රට්නර් විසින් විසින් ජාත්‍යන්තර මානුෂීය නීතියේ මූලධර්ම අදාළ කර ගැනීම සම්බන්ධයෙන් විශේෂඥ මණ්ඩලය විසින් ගෙන ඇති නීතිමය ස්ථාවරය ආරක්ෂා කිරීම සඳහා ඉදිරිපත් කර ඇති කරුණු බලන්න. එමෙන්ම, සත්‍යය සහ වගවීම යන යුද්ධය සම්බන්ධ ගැටළු වලට අදාළ කරුණු පිළිබඳ තවත් වැදගත් විශ්ලේෂණයක් සඳහා මාර්ග ආයතනය විසින් ප්‍රබාශයට පත් කරන ලද (2014) "III වෙනි වෘත්තාන්තය - ශ්‍රී ලංකාවේ යුද්ධයේ අවසන් අදියර" නැමති ප්‍රකාශනය ද, දර්ශන වීරසේකර විසින් රචිත (2020) "*මානව හිමිකම් පිළිබඳ මහ කොමසාරිස්ගේ කාර්යාලයේ ශ්‍රී ලංකාව පිළිබඳ විමර්ශනයේ වාර්තාව පිළිබඳ කරුණුම ඇගයීමක්: සන්නද්ධ හමුදාවලට එරෙහි චෝදනා නිෂ්ප්‍රභ කිරීමක්*" නැමති ප්‍රකාශනය ද බලන්න.

[40] 2021 ජනවාරි 21 දිනැති අංක 2211/55 දරන ගැසට් නිවේදනයේ විධිනියෝගය (ඇ) බලන්න.

අංක 30/1 යෝජනා සම්මතය මගින් යෝජනා කරන ලද පරිදි විදේශීය විනිසුරුවන් ඇතුළත් කිරීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකා රජය ප්‍රතිවරුද්ධත්වය දැක්වීම හැරුණු විට, සංක්‍රාන්ති යුක්ති යාන්ත්‍රණ දේශීය පදනමක් මත ස්ථාපනය කර තිබෙන තාක් එම යාන්ත්‍රණ ප්‍රවර්ධනය කිරීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකාව ගෙන ඇතැයි දෘශ්‍යමාන වන විරුද්ධ මතයක් නැති බව මෙම කොමිෂන් සභාවේ මතය වේ. මෙය පැහැදිලි කරුණක් වන අතර, ශ්‍රී ලංකා රජය එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කවුන්සිලය සමග සම්බන්ධවී කටයුතු කිරීමේදී සිදු කරන ලද ප්‍රකාශයන් පරීක්ෂා කිරීමේදී එය පිළිබිඹු වේ.

55. මෙම කොමිෂන් සභාව 1 වන පරිච්ඡේදයේ 5 වෙනි ඡේදයෙහි සඳහන් කර ඇති පරිදි, ශ්‍රී ලංකා රජය 2030 තිරසාර සංවර්ධන න්‍යාය පත්‍රය (SDG) ද ඇතුළුව ශ්‍රී ලංකාව දී ඇති පොරොන්දු වලට අනුකූල වන ආකාරයකට අනෙකුත් ප්‍රධාන ගැටළු ආමන්ත්‍රණය කරන බවට සහ අවශ්‍ය අවස්ථාවලදී ආයතනික ප්‍රතිසංස්කරණ හඳුන්වා දෙන බවට එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කවුන්සිලයේ දී නිවේදනය කළේය. මෙම කොමිෂන් සභාව මෙයට පෙර ප්‍රකාශ කළ පරිදි, ආයතනික ප්‍රතිසංස්කරණ සහ සත්‍ය සෙවීමේ යාන්ත්‍රණ පිළිබඳ පොරොන්දුව තුළ ගැබ්ව ඇතැයි වැටහී යන පරිදි, සංක්‍රාන්ති යුක්තියේ ප්‍රකට කුළුණු ස්ථාපනය කිරීම මෙයට ඇතුළත් වන පරිදි මෙම නිවේදනය අවබෝධ කර ගත යුතු අතර, සංක්‍රාන්ති යුක්තියේ විකල්ප ආකෘතීන් පිළිබඳ ඇඟවීම් කරන සාහිත්‍යයක් ඇති බව මෙම කථිකාවේදී ප්‍රතික්ෂේප කළ නොහැක.[41] කොමිෂන් සභාව මෙම වාර්තාවේ 5 වෙනි පරිච්ඡේදයේ (අවසාන නිරීක්ෂණ) මේ පිළිබඳව සාකච්ඡා කරයි.

2. ක්‍රමවේදය

56. මෙම ජනාධිපති විමර්ශන කොමිෂන් සභාවේ කටයුතු කොළඹ මෙන්ම උතුරු සහ නැගෙනහිර යුද්ධයෙන් පීඩාවට පත් ප්‍රදේශ යන දෙකෙහිම පවත්වන ලද අදහස් විමසීම් සහ සම්මුඛ සාකච්ඡා පදනම් කරගෙන සිදු කර ඇත. සම්මුඛ සාකච්ඡාවලට සහ අදහස් විමසීම්වලට භාජනය වූවන් අතර හිටපු සටන්කරුවන් (හිටපු එල්.ටී.ටී.ඊ. සාමාජිකයින්), චින්දිතයන්, පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්, සිවිල් සමාජ සාමාජිකයින්, විද්වතුන් සහ අදාළ විෂයයන්හි විශේෂඥයින්, රාජ්‍ය නිලධාරීන් සහ හිටපු රාජ්‍ය නිලධාරීන්, විදේශ රාජ්‍ය තාන්ත්‍රිකයින් සහ විදේශීය සාක්ෂිකරුවන් ඇතුළත් වූහ.[42] ඇතැම් ශාස්ත්‍රීය සාක්ෂිකරුවන් ජාත්‍යන්තර මානව හිමිකම් නීතියේ සහ ජාත්‍යන්තර මානුෂීය නීතියේ මූලධර්ම පිළිබඳ ඔවුන්ගේ විෂය විශේෂඥතාව සහ ජාත්‍යන්තර නොවන සන්නද්ධ ගැටුමකට ඒවා යොදා ගැනීම පිළිබඳව කතා කළහ.

57. වර්තමාන සහ හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්, රාජ්‍ය තාන්ත්‍රිකයින්, සිවිල් සමාජ ක්‍රියාකාරීන් සහ හිටපු කොමිෂන් සභා සාමාජිකයින් සහ හිටපු අමාත්‍යාංශ ලේකම්වරුන් ඇතුළු රජයේ නිලධාරීන් මහත් උනන්දුවෙන් මෙම ජනාධිපති විමර්ශන කොමිෂන් සභාවේ විධිමත් විභාගකිරීම් වලට සහභාගී වී ඔවුන්ගේ සිතුවිලි, අත්දැකීම් සහ ගත යුතු ඉදිරි මග පිළිබඳව අදහස් බෙදාගත් බව විශේෂයෙන් සඳහන් කළ යුතු වේ.

58. මෙම ජනාධිපති විමර්ශන කොමිෂන් සභාවට ස්වකීය විධිනියෝගය ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය විමර්ශන සහ පරීක්ෂණ පැවැත්වීමට අවසර දී ඇති බැවින්, මෙම කොමිෂන් සභාව මාධ්‍ය ඔස්සේ ප්‍රස්ද්ධ නිවේදන නිකුත් කිරීම මගින් නියෝජනයන් සහ ඉදිරිපත් කිරීම් සිදු කරන ලෙස උනන්දුවක් දක්වන පුද්ගලයින්ගෙන් ඉල්ලා සිටිමින් ස්වකීය කටයුතු ආරම්භ කළේය. එයට ලැබුණු ප්‍රතිචාරය බොහෝ දිරිගන්වනසුළු වූ අතර, තම අදහස් ප්‍රකාශ කිරීමට උනන්දුවක් දැක්වූ බොහෝ පුද්ගලයින්

[41] ලැම්බෝර්න්, වෙන්ඩි (2014), "*සංක්‍රාන්ති යුක්තියේ කුළුණු මොනවාද?*" එක්සත් ජාතීන්ගේ සංවිධානය, බුරුන්ඩි හි සිවිල් සමාජය සහ Justice Cascade, Macquarie නීති සහරාව, 13, 41-60 බලන්න.

[42] මෙම අවසන් වාර්තාවේ 4 වෙනි පරිච්ඡේදයේ දී ඇති සාක්ෂිකරුවන්ගේ සාක්ෂි බලන්න.

මෙම කොමිසම හමුවේ පෙනී සිටීමට සහ ඔවුන්ගේ ඉදිරිපත් කිරීම් සිදු කිරීමට කැමැත්ත පළ කරමින් මෙම කොමිසමට ලිඛිත දැනුම් දීම් සිදු කළහ. කොමිසම ද සාක්ෂි ලබා දෙන ලෙස කීර්තිමත් පුද්ගලයන්ට ද ආරාධනා කළේය.

59. විශාලතම සාක්ෂිකරුවන් කණ්ඩායම වූ ගැටුමේ වින්දිතයින් බහු වාර්ගික පසුබිම්වලට අයත් පුද්ගලයන් බවත්, එක්සත් ශ්‍රී ලංකාවක් බිහි කිරීම සඳහා කටයුතු කිරීමට ඔවුන්ව පෙළඹවූ ඔවුන්ගේ ප්‍රමුඛතම අපේක්ෂාවන් කෙරෙහි අවධානය යොමු කරවීමට ඔවුන්ට හැකිවූ බවත්, හිටපු සටන්කරුවන් ගැටුම පිළිබඳව පමණක් නොව, ගැටුමෙන් පසු ඔවුන්ගේ ජීවිතය පිළිබඳව ද සාක්ෂි ලබා දුන් බවත් ආරම්භයේදී ම සඳහන් කළ යුතු වේ.[43] වෙනත් වචන වලින් කිවහොත්, ස්වකීය අවසාන නිරීක්ෂණවල (මෙම අවසාන වාර්තාවේ 5 වෙනි පරිච්ඡේදය) සහ නිර්දේශවල (මෙම අවසාන වාර්තාවේ 6 වෙනි පරිච්ඡේදය) කාර්යය සඳහා මෙම කොමිෂන් සභාව ස්වකීය සාක්ෂි විභාගකිරීම්වලදී සහ යුද්ධයෙන් පීඩාවට පත් දිස්ත්‍රික්කවල සිටින යුද්ධයෙන් දිවි ගලවා ගත් අය සමග සිදු කළ සම්මුඛ සාකච්ඡා වලදී රැස්කර ගත් සහභාගිවන්නන්ගේ නිරීක්ෂණ මත පදනම්ව උද්ගාමී ප්‍රවේශයක් අනුගමනය කරයි.

60. මෙම වාර්තාවේ පසුව ඉස්මතු වනු ඇති පරිදි, මෙම ජනාධිපති විමර්ශන කොමිසමේ නිර්දේශ සඳහා වන පදනම සපයා දෙනුයේ ඉහත සාක්ෂිවල සමස්තයෙහි ඇති සාරය සහ හරයයි. මෙය මෙම කොමිෂන් සභාවේ විධිනියෝගය (ඇ) අනුව අවශ්‍ය කරන පරිදි ඉදිරි මග සඳහා වන පදනම සකස් කරනු ඇත.[44]

61. මෙම කොමිෂන් සභාව විසින් අනුගමනය කරන ලද ඉහත සඳහන් කළ ක්‍රමවේදයට සහ ඉහත සඳහන් කළ ආකාරයට අමතරව, කොමිෂන් සභාවට පූර්වගාමී කොමිෂන් සභා සහ කමිටුවල වාර්තා සහ ඇමුණුම්, රජයේ ලේඛන සහ මාධ්‍ය වාර්තා මූලාශ්‍ර ලෙස යොදා ගැනීමට හැකි විය.

62. විධිනියෝගය ක්‍රියාත්මක කිරීම සඳහා භාවිතා කරන ලද න්‍යායාත්මක මෙවලම් නීති පාඨවලින් සහ වෘත්තිකයන් සහ ප්‍රතිපත්ති සම්පාදකයින් විසින් සංක්‍රාන්ති යුක්තිය පිළිබඳව රචනා කර ඇති පුළුල් පරාසයක ද්‍රව්‍ය මෙන්ම විවේචනාත්මක නෛතික න්‍යාය මගින් ද උකහා ගන්නා ලදී.[45]

63. මෙම කොමිෂන් සභාව අනෙකුත් රටවල පවතින යහ පරිචයන් පිළිබඳව ගැඹුරු ද්විතියික සමාලෝචනයක නියැළුණු අතර, සමස්තයක් ලෙස කොමිෂන් සභාව ස්වකීය විධිනියෝගය ක්‍රියාත්මක කිරීම පිණිස ද්විතියික අධ්‍යයන, ව්‍යුහගත ගුණාත්මක සම්මුඛ සාකච්ඡා සහ අදහස් විමසීම්වල එකතුවක් යොදාගෙන ඇත.

64. පළමු වෙනි හා දෙවෙනි අතුරු වාර්තාවල[46] කාර්යය සඳහා සහ 2023 පෙබරවාරි 6 දිනැති අවසාන නිර්දේශවල සාරාංශය සඳහා අනුගමනය කරන ලද ක්‍රමවේදය ද මෙය විය.

65. මේ අනුව, ක්‍රමවේදමය ලෙස මෙම කොමිෂන් සභාව පර්යේෂණ ක්‍රම, වාචික සහ ලිඛිත සාක්ෂි මෙන්ම ලේඛ්‍යගත සහ කතිකා විශ්ලේෂණවල පුළුල් සංකලනයක් යොදා ගනියි.

---

[43] මෙම ජනාධිපති විමර්ශන කොමිෂන් සභාවේ කටයුතු පිළිබඳව කියවීමට 4 වෙනි පරිච්ඡේදය බලන්න. එක් එක් සාක්ෂිකරුවන්ගේ සම්පූර්ණ සාක්ෂි පිළිබඳ පදනුගත වාර්තාවක් සඳහා අවසාන වාර්තාවේ II වෙනි වෙළුම බලන්න. මෙම කොමිෂන් සභාව ඉදිරියේ සාක්ෂි දුන් සාක්ෂිකරුවන්ගේ නම් ලැයිස්තුව සඳහා මෙම අවසන් වාර්තාවේ 1 වෙනි ඇමුණුම බලන්න.

[44] 2021 ජනවාරි 21 දිනැති අංක 2211/55 දරන ගැසට් නිවේදනය බලන්න.

[45] *ජනාධිපති විමර්ශන කොමිෂන් සභාවේ අවසාන නිරීක්ෂණ සඳහා 5 වෙනි පරිච්ඡේදය බලන්න.*

[46] 2021 ජූලි මස නිකුත් කළ පළමු වෙනි අතුරු වාර්තාව සහ 2022 පෙබරවාරි මස නිකුත් කළ දෙවන අතුරු වාර්තාව.

66. ක්‍රමවේදයේ ඉහත කී වෘත්තාන්තය මෙම අවසාන වාර්තාවේ 2 වන පරිච්ඡේදයේ පසුව එන පරිච්ඡේද පිළිබඳව දැක්වෙන කෙටි හැඳින්වීමට මග සලසයි.

67. මෙම අවසන් වාර්තාවේ 2 වන පරිච්ඡේදය මගින් පූර්වගාමී කොමිෂන් සභා සහ කමිටු පිළිබඳ හැඳින්වීමක් ඉදිරිපත් කර ඇති අතර, 3 වෙනි සහ 5 වෙනි පරිච්ඡේද මගින් පිළිවෙලින් ජාත්‍යන්තර මානව හිමිකම් නීතිය සහ ජාත්‍යන්තර මානුෂීය නීතිය කඩ කිරීම් සම්බන්ධයෙන් ඒවායෙහි නිර්දේශ පිළිබඳව සහ ශ්‍රී ලංකා රජය විසින් ඒවා ක්‍රියාත්මක කිරීම හෝ නොකිරීම පිළිබඳව අවධානය යොමු කරනු ලැබේ.

68. තවද, මෙහි 4 වෙනි පරිච්ඡේදය මගින් මෙම කොමිෂන් සභාව විසින් සිදු කරන ලද කාර්යයන්, එනම් සම්මුඛ සාකච්ඡාවලට සහභාගීවූවන් සහ අදහස් විමසීම්වලට භාජනයවූවන් සමග සිදු කරන ලද එහි විමර්ශන පිළිබඳව පූර්ව ඇඟවීමක් සිදු කරනු ලැබේ. පෙර ප්‍රකාශ කළ පරිදි, කොමිෂන් සභාව විසින් සිදු කරන ලද කාර්යයන් පිළිබඳ නිගමනය පදනම් කර ගෙන 5 වෙනි පරිච්ඡේදය සම්පාදනය කර ඇති අතර, 4 වෙනි පරිච්ඡේදයෙහි විස්තර කර ඇති පරිදි කොමිෂන් සභාව විසින් සිදු කරන ලද කාර්යයන් පිළිබඳ ප්‍රේරක විශ්ලේෂණයකින් උකහා ගන්නා ලද, පූර්වගාමී කොමිෂන් සභා සහ කමිටුවල නිර්දේශ ක්‍රියාත්මක නොකිරීම පිළිබඳ සඳහනක් ඇතුළත් අවසාන නිරීක්ෂණ එහි අඩංගු වේ.

69. මෙහි 6 වෙනි පරිච්ඡේදය මගින් මෙම ජනාධිපති විමර්ශන කොමිෂන් සභාවේ නිර්දේශ සහ කොමිෂන් සභාව විසින් සිදු කරන ලද කාර්යයෙහි සමස්තය පදනම් කර ගෙන පුරෝකථනය කරන ලද ඉදිරි මාර්ගය විස්තර කර ඇත. සත්‍ය වශයෙන් ම, එම නිර්දේශවල සාරාංශයක් 2023 පෙබරවාරි මාසයේ දී ජනාධිපතිවරයා වෙත ඉදිරිපත් කරන ලද වාර්තාවෙහි ඇතුළත් කර ඇති නමුත්, පූර්වයෙන් ප්‍රකාශ කළ පරිදි ජනාධිපති විමර්ශන කොමිෂන් සභාවේ මෙම අවසන් වාර්තාවේ 6 වන පරිච්ඡේදයෙහි ඒවා සවිස්තර ලෙස ඉදිරිපත් කර ඇත.

3. කාල රාමුව

70. ජනාධිපති විමර්ශන කොමිෂන් සභාව විසින් සලකා බලක ලද පූර්වගාමී කොමිෂන් සභා විසින් 2002 වර්ෂයේ සිට 2009 වර්ෂය දක්වා විහිදෙන කාල පරාසය ආවරණය කරන්නේ යැයි පෙනෙන්නට තිබෙන බව පෙන්වා දිය යුතු ය. මෙම කොමිෂන් සභාව 2 වෙනි පරිච්ඡේදයේ දී පූර්වගාමී කොමිෂන් සභාවල විධිනියෝග සාකච්ඡා කිරීමේ දී එය පැහැදිලි වේ. කෙසේ වෙතත්, 2002 ට පෙර සිදු වූ සිදුවීම් පිළිබඳව පවා මෙම ජනාධිපති විමර්ශන කොමිෂන් සභාව ඉදිරියේ කතා කළ සාක්ෂිකරුවන් සිටියහ. උදාහරණයක් ලෙස, යාපනය ප්‍රදේශයේ දී 2002 වර්ෂයට බොහෝ කාලයකට පෙර සිදු වූ පැහැරගැනීම් පිළිබඳ කතා කළ සාක්ෂිකරුවන් සිටියහ. එලෙස ම, 1990 වර්ෂයේ දී තමන්ගේ ඥාතීන් සහ මිතුරන් අතුරුදහන් කරනු ලැබීම් පිළිබඳව කතා කළ කාත්තන්කුඩි ප්‍රදේශයේ සාක්ෂිකරුවන් ද සිටියහ. මෙම තත්ත්වයට මුහුණ දුන්නේ මෙම කොමිසම පමණක් නොවේ. උගත් පාඩම් සහ ප්‍රතිසන්ධාන කොමිෂන් සභාව ද එම කොමිසමට ලබා දී තිබූ විධිනියෝගයේ කාලසීමාවට බොහෝ කලකට පෙර සිදුවූ සිදුවීම් ගැන කතා කළ සාක්ෂිකරුවන් හමුවීම් ඇති බව අපට පෙනී යයි. එවැනි පසුබිමක් තුළ, එම සාක්ෂිකරුවන් ඉදිරිපත් කළ වෘත්තාන්ත අනිවාර්යයෙන් ම සංක්‍රාන්ති යුක්ති ක්‍රියාමාර්ගවල කොටසක් විය යුතු හෙයින් ද, සංක්‍රාන්ති යුක්තිය පිළිබඳව වන කවර හෝ සංවාදයන් මගින් මෙම කොමිෂන් සභාව සීමාකිරීම්වලට ලක් කරන කාල නියමයන් නොසලකා, සන්නද්ධ ගැටුම් හේතුවෙන් සිදුවූවා විය හැකි ප්‍රතිඵල සහ සිදුවීම් හෙළිදරව් කළ යුතු හෙයින් ද, මෙම කොමිෂන් සභාව ඔවුන්ගේ වෘත්තාන්ත ද සැලකිල්ලට ගනිමින් නිර්දේශ ඉදිරිපත් කිරීමට අදහස් කරයි. මෙම කොමිෂන් සභාව ඉදිරියේ දිග හැරුණු සාක්ෂිකරුවන්ගේ මෙම වෘත්තාන්ත අප විසින් යෝජනා කරනු ලබන සත්‍ය සෙවීමේ යාන්ත්‍රණයෙහි කාල පරාසය කුමක් විය යුතුද යන්න තීරණය කිරීමට වැදගත් වන තීරණාත්මක සාධක වේ. සත්‍ය සෙවීමේ යාන්ත්‍රණයක කාල පරාසය තීරණය කිරීම සඳහා වන

තාර්කික පදනම 5 වෙනි පරිච්ඡේදයේ (අවසාන නිරීක්ෂණ) සහ 6 වෙනි පරිච්ඡේදයේ (නිර්දේශ සහ ඉදිරි මග) පැහැදිලි කර ඇත.

2 වෙනි පරිච්ඡේදය

පූර්වගාමී විමර්ශන කොමිෂන් සභා සහ කමිටු

1. හැඳින්වීම.

71. මෙම පරිච්ඡේදයේ දී මෙම ජනාධිපති විමර්ශන කොමිෂන් සභාව පූර්වගාමී විමර්ශන කොමිෂන් සභා සහ කමිටු, ඒවායෙහි විධිනියෝග සහ විෂය සීමාවන් හඳුන්වා දීමට යෝජනා කරයි. මෙම කොමිෂන් සභාව 3 වෙනි පරිච්ඡේදයේ දී එකී කොමිෂන් සභා සහ කමිටු විසින් සොයාගන්නා ලද කරුණු, ඒවායෙහි නිර්දේශ සහ ඒවා ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් සාකච්ඡා කිරීමට පෙර මුලින් ම අදාළ විධිනියෝග සාකච්ඡා කර ඉන් පසුව සාමාන්‍ය නිරීක්ෂණ කිහිපයක් ඉදිරිපත් කරයි.

72. මෙම කොමිෂන් සභාවේ විධිනියෝගයෙහි සීමාවන් නියම කිරීමේ දී, 2021 ජනවාරි 21 දිනැති අංක 2211/55 දරන ගැසට් නිවේදනයෙහි මානව හිමිකම් කඩකිරීම් සහ බරපතල ගණයේ ජාත්‍යන්තර මානුෂීය නීති කඩකිරීම් සම්බන්ධයෙන් විමර්ශනය කිරීම සඳහා පත් කරන ලද පූර්වගාමී විමර්ශන කොමිෂන් සභා සහ කමිටු පිළිබඳව පැහැදිලිව සඳහන් කර ඇත. විධිනියෝගයෙහි විෂය සීමාව සහ විෂය පථය විශ්ලේෂණය කිරීමේ දී, මෙම ජනාධිපති කොමිෂන් සභාව උගත් පාඩම් සහ ප්‍රතිසන්ධානය පිළිබඳ වූ ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාව (උගත් පාඩම් කොමිසම), පැහැරගැනීම් සහ අතුරුදන් කිරීම් පිළිබඳ පැමිණිලි විමර්ශනය කිරීමේ ජනාධිපති කොමිෂන් සභාව (පරණගම කොමිසම) සහ 2005 අගෝස්තු මස 1 වැනි දින සිට ශ්‍රී ලංකාව තුළ සිදුවී ඇතැයි කියන බරපතල මානව හිමිකම් උල්ලංඝනය කිරීම් පිළිබඳ චෝදනා විමර්ශනය කිරීමට සහ පරීක්ෂණය කිරීමට පත් කරන ලද විමර්ශන කොමිෂන් සභාව (උදලාගම කොමිසම) යන කොමිෂන් සභා විසින් කරන ලද නිර්දේශවල තත්ත්වය ඇගයීම ස්වකීය වගකීම වන බව මෙම කොමිෂන් සභාවේ අදහස වන්නේ යැයි 1 වන පරිච්ඡේදයේ සඳහන් දී කළේය.

73. පහත දැක්වෙන පරිදි කොමිෂන් සභාව වෙත පැවරී ඇති විධිනියෝගයෙහි පූර්විකාමය ඡේද සැලකිල්ලට ගනිමින් මෙම කොමිෂන් සභාව මෙම මතයට එළඹුනේය:

ශ්‍රී ලංකාවේ සංහිදියාව, වගවීම හා මානව හිමිකම් ප්‍රවර්ධනය කිරීම පිළිබඳ 2019 මාර්තු මස 40/1 යෝජනාවලියේ සහ එහි පූර්වගාමී 2015 ඔක්තෝම්බර් මස 30/1 හා 2017 මාර්තු මස 34/1 යෝජනාවන්හි සම අනුග්‍රහකත්වයෙන් ශ්‍රී ලංකා රජය ඉවත් වීමට ගනු ලැබූ තීරණය සම්බන්ධව 2020 පෙබරවාරි 26 සහ 27 යන දිනයන්හි පැවති එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කවුන්සිලයේ 43 වන සැසිවාරයේ නිවේදනය කරනු ලැබ ඇති හෙයින් ද;

උක්ත යෝජනා සඳහා සම අනුග්‍රාහකත්වය දැක්වීමෙන් ශ්‍රී ලංකාව ඉවත් වුවද, තිරසාර සාමයක් හා සංහිදියාවක් දිනා ගැනීම සඳහා වගවීම සහ මානව සම්පත් සංවර්ධනය සපුරා ගැනීම සඳහා එක්සත් ජාතීන්ගේ සංවිධානය සහ එහි නියෝජිතායතන සමග සහයෝගයෙන් කටයුතු කිරීම ශ්‍රී ලංකා රජයේ ප්‍රතිපත්තිය වන හෙයින් ද;

විසඳීමට ඇති අනෙකුත් ගැටළු සඳහා ප්‍රජාතන්ත්‍රික හා නීතිමය ක්‍රියාවලි තුළින් විසඳුම් ලබා දීමට සහ අවශ්‍ය අවස්ථාවන්හි දී ආයතනික සංශෝධන සිදු කරමින් යුක්තිය සහ සංහිදියාව තහවුරු කිරීමට ශ්‍රී ලංකා රජය කැපවී සිටින හෙයින් ද;

රජයේ ප්‍රතිපත්ති ප්‍රකාශයේ සඳහන් කර ඇති අරමුණු සාක්ෂාත් කර ගැනීමේදී ශ්‍රී ලංකාවේ ස්වෛරීභාවය ආරක්ෂා කරනු ලබන නොබැඳුනු විදේශ ප්‍රතිපත්තියක් පදනම් කර ගනිමින් කටයුතු කිරීම මූලික අවශ්‍යතාවක් ලෙස හඳුනාගෙන ඇති හෙයින් ද;

සිදුවී ඇතැයි කියනු ලබන මානව හිමිකම් උල්ලංඝනය කිරීම් පිළිබඳව විමර්ශනය කිරීම සඳහා පූර්වගාමීව පරීක්ෂණ කොමිෂන් සභා සහ කමිටු පත් කිරීමට කටයුතු කරනු ලැබ ඇති හෙයින් ද;

එකී පරීක්ෂණ කොමිෂන් සභා සහ කමිටු මගින්, සිදුවී ඇතැයි වාර්තා වී ඇති යම් යම් මානව හිමිකම් සම්බන්ධ හා වෙනත් එවැනි වරදවල් පිළිබඳව නිර්දේශ ඉදිරිපත් කර ඇති හෙයින් ද;

මෙහි මින්මතු දැක්වෙන කරුණු පිළිබඳව විමර්ශනය කිරීම, පරීක්ෂා කිරීම හා වාර්තා කිරීම හෝ අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම සඳහා පරීක්ෂණ කොමිෂන් සභාවක් පත් කිරීම අවශ්‍ය යැයි මා අදහස් කරන හෙයින් ද.[47]

74. ස්වකීය විමර්ශන කටයුතු සඳහා වන පූර්වගාමී විමර්ශන කොමිෂන් සභා කමිටු පහත සඳහන් ඒවා විය යුතු යැයි මෙම ජනාධිපති විමර්ශන කොමිෂන් සභාව මෙහි 1 වෙනි පරිච්ඡේදයේ 33 වෙනි ඡේදයේ දී නිගමනය කළේය:

    1. උගත් පාඩම් සහ ප්‍රතිසන්ධාන කොමිෂන් සභාව;

    2. පරණගම කොමිෂන් සභාව; සහ

    3. උදලාගම කොමිෂන් සභාව.

75. විධිනියෝගයෙහි ක්‍රියාකාරී ඡේද සමග ඒකාබද්ධව කියවිය යුත පූර්විකාමය ඡේද පරීක්ෂා කිරීමෙන් මෙම නිගමනයට එළඹිය හැක.[48] උගත් පාඩම් සහ ප්‍රතිසන්ධාන කොමිෂන් සභාව, පරණගම කොමිසම සහ උදලාගම කොමිසම ජාත්‍යන්තර මානව හිමිකම් නීතිය සහ ජාත්‍යන්තර මානුෂීය නීතිය උල්ලංඝනය කිරීම් කිසිවක් සිදුවී තිබේදැයි නිර්ණය කර ගැනීම සඳහා විමර්ශන සිදු කිරීම ස්වකීය විෂය පථය ලෙස නියම කර ගනු ඇත. මෙම කොමිෂන් සභා තුන 2009 මැයි මාසයේදී අවසන් වූ ජාත්‍යන්තර නොවන සන්නද්ධ ගැටුමට සමීප ආසන්න කාල පරිච්ඡේද තුළ පිහිටුවන ලද බැවින්, ඉහත කොමිෂන් සභා ද මෙම කොමිෂන් සභාවේ (ජනාධිපති විමර්ශන කොමිෂන් සභාවේ) විධිනියෝගයේ සීමා තුළට අයත් වන බව අවබෝධ කර ගැනීම අර්ථවත් වනු ඇත.

76. මෙම අවස්ථාවේ අනුක්‍රමිකව එක් එක් කොමිෂන් සභාවේ විධිනියෝගය පිළිබඳව සොයා බැලීම සහ ඒවායෙහි ආරම්භ සහ ඉන් අනතුරුව ඒවායෙහි කටයුතු පිළිබඳව කෙටියෙන් විමසා බැලීම යෝග්‍ය වේ.

2. පූර්වගාමී විමර්ශන කොමිෂන් සභාවල විධිනියෝග

(i) උගත් පාඩම් සහ ප්‍රතිසන්ධානය පිළිබඳ වූ ජනාධිපති විමර්ශන කොමිෂන් සභාව (උගත් පාඩම් කොමිසම)

පත් කළ දිනය: 2010 මැයි 15.

පත්කිරීම සිදු කළේ: හිටපු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමා

[47] 2021 ජනවාරි 21 දිනැති අංක 2211/55 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ සඳහන් ඉහත දැක්වෙන පූර්විකමෙය ඡේද බලන්න.

[48] ඉහත 73 වෙනි ඡේදය බලන්න.

කොමිෂන් සභාවේ සංයුතිය:

1. චිත්ත රන්ජන් ද සිල්වා මැතිතුමා, ජනාධිපති නීතිඥ
2. ආචාර්ය අමිරිත් රොහාන් පෙරේරා මැතිතුමා, ජනාධිපති නීතිඥ
3. මහාචාර්ය මොහොමඩ් තාහීර් මොහොමඩ් ජිෆ්රි මැතිතුමා
4. මහාචාර්ය කරුණාරත්න හඟවත්ත මැතිතුමා
5. චන්දිරපාල් චන්මුගම් මැතිතුමා
6. හේවා මාතර ගමගේ සිරිපාල පලිහක්කාර මැතිතුමා
7. මනෝහරි රාමනාදන් මැතිනිය
8. මැක්ස්වෙල් පරාක්‍රම පරණගම මැතිතුමා

77. මහාචාර්ය මොහොමඩ් තාහීර් මොහොමඩ් ජිෆ්රි මහතාලේ අයහපත් සෞඛ්‍ය තත්ත්වයෙන් පසුව, එම පුරප්පාඩුව සඳහා මොහොමඩ් තවුෆික් මොහොමඩ් බෆික් මහතා 2010 සැප්තැම්බර් 6 වන දින පත් කරන ලදී.

- **උගත් පාඩම් සහ ප්‍රතිසන්ධානය පිළිබඳ වූ කොමිෂන් සභාවේ විධිනියෝගය:**

78. 2002 පෙබරවාරි 21 සහ 2009 මැයි 19 අතර කාලසීමාව තුළ සිදුවී තිබිය හැකි පහත සඳහන් කරුණු පිළිබඳව පරීක්ෂණය කර වාර්තා කිරීමට මෙම කොමිෂන් සභාවේ කොමසාරිස්වරුන්ට නියම කරන ලදී:

1. *වර්ෂ 2002 ක් වූ පෙබරවාරි 21 දින ක්‍රියාත්මක කෙරුණු සටන් විරාම ගිවිසුම අසාර්ථකවීමට තුඩුදුන් කරුණු හා අවස්ථානුගත තත්ත්වයන් සහ ඉනික්බිතිව 2009 ක් වූ මැයි මස 19 දින තෙක් අනුපිළිවෙලින්වූ සිද්ධීන්;*
2. *කිසියම් තැනැත්තෙක්, කණ්ඩායමක් හෝ යම් ආයතනයක් සෘජුව හෝ අනියමින් මේ සම්බන්ධයෙන් වගකීම් දරනුයේ ද යන වග;*
3. *මෙබඳු සිද්ධීන් යළි ඇති නොවනු බවට සහතික කරගනු පිණිස එකී සිද්ධීන්ගෙන් අප උගත යුතු පාඩම් සහ අපගේ සැලකිල්ල යොමු විය යුතු තදාශ්‍රිත කරුණු;*
4. *මෙකී සිද්ධීන්ගෙන් පීඩාවට පත් කිසියම් තැනැත්තෙකුට හෝ ඔවුන්ගෙන් යැපෙන්නන්ට හෝ උරුමක්කාරයන්ට ප්‍රතිසංස්ථාපනයක් කරනු ලැබිය හැකි ක්‍රමවේදය;*
5. *මෙබඳු සිද්ධීන් ඉදිරි කාලයේදී යළි ඇතිවීම වළක්වාලනු පිණිසත්, සියලු ප්‍රජාවන් අතර තවදුරටත් ජාතික සමගිය හා ප්‍රතිසන්ධානය ප්‍රවර්ධනය කරලනු පිණිසත් ගනු ලැබිය යුතු ආයතනික, පරිපාලනමය සහ ව්‍යවස්ථාමය ක්‍රියාමාර්ග සහ මේ අධිකාරි පත්‍රෙයහි නියමයයන් යටතේ පරීක්ෂණයට භාජනය කරනු ලැබූ කරුණු වලින් කිසියම් කරුණකට අදාළ එබඳු යම් වෙනත් නිර්දේශයන් කිරීම*".[49]

(ii) පැහැරගැනීම් සහ අතුරුදන් කිරීම් පිළිබඳ පැමිණිලි විමර්ශනය කිරීමේ ජනාධිපති කොමිෂන් සභාව (පරණගම කොමිසම)

- පරණගම කොමිසමේ පළමු වෙනි විධිනියෝගය

පත් කළ දිනය: 2013 අගෝස්තු 15

[49] 2011 නොවැම්බර් මස නිකුත් කරන ලද උගත් පාඩම් සහ ප්‍රතිසන්ධානපිළිබඳ වූ කොමිෂන් සභාවේ වාර්තාවේ ii – v බලන්න.

පත්කිරීම සිදු කළේ: හිටපු ජනාධිපති මහින්ද රාජපක්ෂ මහතා

කොමිෂන් සභාවේ සංයුතිය:

1. හිටපු විනිසුරු මැක්ස්වෙල් පරාක්‍රම පරණගම මැතිතුමා - සභාපති
2. දිමින්ගු බඩතුරුගේ ප්‍රියන්ති සුරංජනා විද්‍යාරත්න මැතිතුමිය
3. මනෝ රාමනාදන් මැතිතුමිය

79. පහත සඳහන් කරුණු පිළිබඳව සොයා බලා වාර්තා කිරීමට මෙම කොමිෂන් සභාවේ කොමසාරිස්වරුන්ට නියම කරන ලදී:

(අ) 1990 ජුනි මස 10 දින සිට 2009 මැයි මස 19 දක්වා උතුරු හා නැගෙනහිර දෙපළාතේ පදිංචිව සිටි යම් තැනැත්තන් සිය කැමැත්තෙන් තොරව පදිංචි ස්ථාන වලින් ඉවත් කරගෙන යනු ලැබ හෝ අතුරුදහන් වී ඇත්ද යන වග;

(ආ) එසේ ඉවත්කරගෙන යනු ලැබූ බවට හෝ අතුරුදහන් වූ බවට ඔප්පු කිරීමට පවත්නා සාක්ෂි;

(ඇ) එසේ ඉවත් කරනු ලැබූ හෝ අතුරුදහන් වූ පුද්ගලයන් කවුරුන්ද සහ එකී පුද්ගලයින් දැනට සිටින ස්ථාන;

(ඈ) ඉහත කී ඉවත් කරනු ලැබීම් හෝ අතුරුදහන් වීම් වලට වගකිව යුතු තැනැත්තෙකු හෝ තැනැත්තන් පිළිබඳ අදහසක් ඇති කර ගැනීමට සමත් විශ්වාසනීය කරුණු හෝ සාක්ෂි;

(ඉ) එසේ වගකිව යුතුයැයි නිශ්චය කෙරෙන තැනැත්තෙකු හෝ තැනැත්තන්ට විරුද්ධව ගනු ලැබිය හැකි නීතිමය ක්‍රියාමාර්ග;

(ඊ) එවැනි ක්‍රියා අනාගතයේදී සිදුවීම වැලැක්වීම සඳහා ගතයුතු ක්‍රියාමාර්ග;

(උ) එසේ ඉවත් කරගෙන යනු ලැබුවේයැයි හෝ අතුරුදහන් වූවේයැයි කියනු ලබන තැනැත්තන්ගේ දෙමව්පියන්ට, කලත්‍රයන්ට සහ යැපෙන්නන්ට රජයේ වගකීමක් ලෙස සැලසිය යුතු සහන කිසිවක් තිබේ නම් එකී සහන.[50]

• පරණගම කොමිසමේ දෙවෙනි විධිනියෝගය

පත් කළ දිනය: 2014 ජූලි 15

දෙවෙනි විධිනියෝගය පිළිබඳ විස්තර

80. උගත් පාඩම් සහ ප්‍රතිසන්ධානය පිළිබඳ වූ කොමිෂන් සභා වාර්තාවේ සඳහන් කර ඇති පහත සඳහන් කරුණු පිළිබඳව සොයා බලා වාර්තා කිරීමේ කාර්යය මෙම කොමිෂන් සභාවට පවරන ලදී:[51]

"(අ). උගත් පාඩම් සහ ප්‍රතිසන්ධානය පිළිබඳ වූ පරීක්ෂණ කොමිෂන් සභා වාර්තාවේ 4.359 වැනි ඡේදයේ සඳහන් කරුණු. මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිශ්චිත කාරණා පිළිබඳව කොමිෂන් සභාව විමර්ශනය කොට වාර්තා කළ යුතු වේ.

[50] 2013 අගෝස්තු 15 දිනැති අංක 1823/42 දරන ගැසට් නිවේදනය බලන්න.

[51] 2014 ජූලි 15 දිනැති අංක 1871/18 දරන ගැසට් නිවේදනය බලන්න.

i. 2009 මැයි මස 19 වැනි දින අවසන් වූ අභ්‍යන්තර සන්නද්ධ ගැටුමේදී සිවිල් ජනයාගේ ජීවිත අහිමිවීමට තුඩුදුන් ප්‍රධාන සාධක හා වාතාවරණයන් සහ ජාත්‍යන්තර මානුෂීය නීතිය හෝ ජාත්‍යන්තර මානව හිමිකම් නීතිය හෝ උල්ලංඝණය කිරීම හෝ උල්ලංඝණය කිරීම් හේතුකොටගෙන මේ සම්බන්ධයෙන් කිසියම් පුද්ගලයෙකු, කණ්ඩායමක් හෝ ආයතනයක් සෘජු ලෙස හෝ අනියම් ලෙස හෝ වගකිවයුත්තේ ද යන වග.

ii. එසේ සිවිල් ජනයාගේ ජීවිත හානිවීම සන්නද්ධ ක්‍රියාදාමයක දී ඉලක්කගත හමුදාමය අරමුණුවලට එරෙහිව එල්ල කරනු ලබන සමානුපාතික ප්‍රහාරවලදි සිදුවිය හැකි සහ, සන්නද්ධ ගැටුම් පිළිබඳ නීති සහ ජාත්‍යන්තර මානුෂීය නීතිය යටතේ නිශ්චිතව හඳුනාගෙන ඇති ආනුෂාංගික හානි ලෙස සැලකිය හැක්කේ ද යන වගත්, එවැනි සිවිල් ජනයාගේ ජීවිත හානිවීම ඉහත සඳහන් සන්නද්ධ ගැටුම් සමයේදී සටන් කිරීමේදී අනුගමනය කළ යුතු රීති ක්‍රියාත්මක කිරීමේදී හිතාමතා සිදුකළ හෝ අනපේක්ෂිත ප්‍රතිඵලයක් වන්නේ ද යන වග.

iii. සන්නද්ධ ගැටුම් පිළිබඳ නීති සහ ජාත්‍යන්තර මානුෂීය නීතිය යටතේ පවතින වෙන්කොට හඳුනා ගැනීම, යුද්මය අවශ්‍යතාවය සහ අනුපාතික බලය යන මූලධර්මවලට ශ්‍රී ලංකාවේ සන්නද්ධ හමුදා අනුගත වීම හෝ ඒවා නොසලකා හැරීම.

iv. රාජ්‍ය නොවන පාර්ශවයක් වශයෙන් එල්.ටී.ටී.ඊ. සංවිධානය සිය හමුදාමය ක්‍රියාන්විතවල දී ජාත්‍යන්තර මානුෂීය නීතියට යටත් වුයේ ද යන වග.

v. එල්.ටී.ටී.ඊ. සංවිධානය විසින් සිවිල් වැසියන් මිනිස් පලිහක් ලෙස භාවිතා කිරීම සහ එකී ක්‍රියාව කොතරම් දුරට ජාත්‍යන්තර මානුෂීය නීතිය හෝ ජාත්‍යන්තර මානව හිමිකම් නීතිය උල්ලංඝණය කිරීමක් වන්නේ ද යන වග සහ එම ක්‍රියාව කෙතරම් දුරට සිවිල් පුරවැසියන්ගේ ජීවිත අහිමි කිරීමට හෝ සැලකිය යුතු ලෙස ඒ සඳහා දායක වූයේ ද යන වග.

(ආ). ජාත්‍යන්තර මානුෂීය නීතිය හෝ ජාත්‍යන්තර මානව හිමිකම් නීතිය උල්ලංඝණය කරමින් එල්.ටී.ටී.ඊ. සංවිධානය විසින් හෝ එම සංවිධානයට අනුබද්ධිත නීති විරෝධී සන්නද්ධ කණ්ඩායම් විසින් හෝ යම් දේශපාලන පක්ෂයක් විසින් ළමා සොල්දාදුවන් බඳවා ගැනීම.

(ඇ). එල්.ටී.ටී.ඊ. සංවිධානය විසින් ශ්‍රී ලංකාවෙහි සම්ප්‍රදායික සහ ගරිල්ලා සටන් සිදු කිරීමේ දී එම සංවිධානය විසින් සිදුකරන ලද ජාත්‍යන්තර සාපරාධී ක්‍රියාකාරකම් සහ එම නීති විරෝධී ක්‍රියාකාරකම් හරහා ලබාගත් මූල්‍ය හා වෙනත් සම්පත් එම සංවිධානය විසින් යොදා ගැනීම.

(ඈ). එල්.ටී.ටී.ඊ. සංවිධානයේ ප්‍රධානියා වූ වේලුපිල්ලේ ප්‍රභාකරන්ගේ හෝ ඔහු වෙනුවෙන් ක්‍රියා කරන තැනැත්තන්ගේ සෘජු නියමයන් යටතේ ළමා සොල්දාදුවන් හෝ සටන්කාමීන් භාවිතා කරමින් එල්.ටී.ටී.ඊ. සංවිධානය විසින් සිදුකරන ලද මරාගෙන මැරෙන සියදිවි හානිකර ගැනීම් සහ ජාත්‍යන්තර මානුෂීය නීතිය යටතේ හෝ ජාත්‍යන්තර මානව හිමිකම් නීතිය යටතේ එම ක්‍රියාවල වරදකාරිත්වය."[52]

81. පරණගම කොමිෂන් සභාවේ සභාපති, හිටපු මහාධිකරණ විනිසුරු මැක්ස්වෙල් පරණගම මහතා ම මෙම කොමිසම (ජනාධිපති විමර්ශන කොමිෂන් සභාව) ඉදිරියේ සාක්ෂි ලබා දෙමින් එම කොමිෂන් සභාව සිදු කළ කාර්ය භාරය විස්තර කළේය.

82. මුලින් ම 2013 අගෝස්තු මාසයේ දී පරණගම කොමිසම පත් කරන ලද්දේ 2 වෙනි ඊලාම් යුද්ධය ආරම්භ වූ 1990 ජූනි 10 වෙනි දින සහ එම යුද්ධය අවසන් වූ 2009 මැයි 19 වෙනි දින අතර කාලය

[52] 2014 ජූලි 15 දිනැති අංක 1871/18 දරන ගැසට් නිවේදනය බලන්න. (පළමු වෙනි විධිනියෝගය)

තුළ උතුරු හා නැගෙනහිර පළාත්වල සිදුවූයේ යැයි පැවසෙන බලහත්කාරයෙන් සහ ස්වකැමැත්තෙන් නොවන ඉවත්කිරීම් පිළිබඳ විමර්ශනය කිරීම සඳහා බව එහි පළමුවෙනි විධිනියෝගයෙන් පැහැදිලි වේ.[53]

83. 2014 මාර්තු මාසයේ දී එවක ජනාධිපතිවරයා විසින් මෙම කොමිෂන් සභාවේ විෂය පථයෙහි සීමාව 1983 ජනවාරි 1 දින ආරම්භවී 2009 මැයි 19 දින අවසන් වන පරිදි පසුදාතම් කරන ලදී.[54]

84. 2014 ජූලි මාසයේ දී ලබා දෙන ලද එම කොමිසමේ දෙවෙනි විධිනියෝගය වූයේ ද එල්.ටී.ටී.ඊ. සංවිධානයේ ජාත්‍යන්තර අපරාධ ක්‍රියාකාරකම්, ළමා සොල්දාදුවන් බඳවා ගැනීම සහ මරාගෙන මැරෙන ප්‍රහාර මෙන්ම ඉහත 80 ඡේදයේ (අ) උපඡේදයෙහි නිශ්චිතව සඳහන් කර ඇති කරුණු විමර්ශනය කර වාර්තා කිරීම විය.

(iii) 2005 අගෝස්තු මස 1 වැනි දින සිට ශ්‍රී ලංකාව තුළ සිදුවී ඇතැයි කියන බරපතල මානව හිමිකම් උල්ලංඝනය කිරීම් පිළිබඳ චෝදනා විමර්ශනය කිරීමට සහ පරීක්ෂණය කිරීමට පත් කරන ලද විමර්ශන කොමිෂන් සභාව (උදලාගම කොමිසම)

පත් කළ දිනය: 2006 නොවැම්බර් 2

පත්කිරීම සිදු කළේ: හිටපු ජනාධිපති මහින්ද රාජපක්ෂ

කොමිෂන් සභාවේ සංයුතිය:

1. විනිසුරු එන්.කේ. උදලාගම මැතිතුමා (විශ්‍රාමික ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු) - සභාපති
2. උපවංශ යාපා මැතිතුමා, ජනාධිපති නීතිඥ - 2006.11.03 සිට 2007.01.31 දක්වා
3. ආචාර්ය දේවනේසන් නේසියා මැතිතුමා (විශ්‍රාමික සිවිල් සේවා නිලධාරී) 2006.11.03 සිට 2008.06.24 දක්වා
4. කේ.සී. ලෝගේස්වරන් මැතිතුමා (විශ්‍රාමික ශ්‍රී.ලං.ප.සේ. නිලධාරි) 2006.11.03 සිට 2007.03.01 දක්වා, 2007.09.05 සිට 2008.11.02 දක්වා
5. මනෝරි මුත්තෙටුවේගම මැතිනිය, නීතිඥ 06.11.03 සිට 08.11.03 දක්වා
6. ජෙසිමා ඉස්මයිල් මැතිනිය - විශ්‍රාමික ශ්‍රී.ලං.අ.ප.සේ. නිලධාරිනී
7. එස්.එස්. විජේරත්න මැතිතුමා නීතිඥ
8. ඒ. ජාවිඩ් යූසුෆ් මැතිතුමා, නීතිඥ 2006.11.03 සිට 2008.07.31 දක්වා
9. ඩග්ලස් ප්‍රේමරත්න මැතිතුමා, ජනාධිපති නීතිඥ 2007.05.16 සිට ඉදිරියට
10. එම්. ෆයිසල් රසීන් මැතිතුමා, නීතිඥ 2008.11.04 සිට ඉදිරියට
11. ඩෙන්සිල් ජේ. ගුණරත්න මැතිතුමා, ජනාධිපති නීතිඥ, 2008.11.04 සිට

- **උදලාගම කොමිෂන් සභාවේ විධිනියෝගය**

85. 2006 නොවැම්බර් තුන්වෙනි දින ජනාධිපතිවරයා විසින් ඔහුගේ මුද්‍රාව යටතේ නිකුත් කරන ලද අධිකාර පත්‍රයක් මගින් 1948 අංක 17 දරන පරීක්ෂණ කොමිෂන් සභා පනතේ 2 වැනි වගන්තිය සහ පසුකාලීනව එයට සිදු කරන ලද සංශෝධන යටතේ පහත සඳහන් විධිනියෝගය සහිතව, මෙම විමර්ශන කොමිෂන් සභාව (පරීක්ෂණ කොමිෂන් සභාව) පත් කරන ලදී:

[53] 2014 ජූලි 15 දිනැති අංක 1871/18 දරන ගැසට් නිවේදනය බලන්න. (පළමු වෙනි විධිනියෝගය)

[54] 'අතුරුදහන්වීම් කොමිසමේ විමර්ශන කාලය දීර්ඝ කෙරේ', ද අයිලන්ඩ් (කොළඹ, 2014 මාර්තු 26).

(අ) 2005 අගෝස්තු 1 වෙනි දින සිට සිදුවී තිබෙන බරපතල මානව හිමිකම් උල්ලංඝනය කිරීම් සම්බන්ධ සිද්ධීන්, විශේෂයෙන් ම අධිකාර පත්‍රයේ උපලේඛනයේ දක්වා ඇති බරපතල මානව හිමිකම් උල්ලංඝනය කිරීම් ඇතුළු සිද්ධීන් සම්බන්ධයෙන් ස්වාධීන සහ විස්තීර්ණ පරීක්ෂණ සිදු කිරීම,

(ආ) බරපතල මානව හිමිකම් උල්ලංඝණය කිරීම් ගණයට වැයෙන සිදුවීම් සම්බන්ධයෙන් දැනටමත් සිදු කර ඇති පරීක්ෂණවල ප්‍රමාණවත්භාවය සහ යෝග්‍යතාවය පරීක්ෂා කිරීම,

(ඇ) "ජාත්‍යන්තර කීර්තිමත් පුද්ගලයින්ගේ ස්වාධීන කණ්ඩායම" යන නමින් පත්කර නම් කරනු ලබන ජාත්‍යන්තර වශයෙන් කීර්තියක් දිනා ඇති ශ්‍රී ලාංකික නොවන පුද්ගලයින් කණ්ඩායමකට විමර්ශන කොමිෂන් සභාවේ විමර්ශන සහ පරීක්ෂණ සාර්ථක ලෙස නිරීක්ෂණය කිරීමට හැකි වන ආකාරයකට එම විමර්ශන සහ පරීක්ෂණ පරිපූර්ණ ලෙස සහ අදාළ මූලික ජාත්‍යන්තර ප්‍රමිතීන් හා සම්මතයන්ට අනුකූලව සිදු කර ඇති බවට උනන්දුවක් දක්වන පාර්ශ්වයන් සෑහීමකට පත් කිරීම සඳහා එම විමර්ශනවල සහ පරීක්ෂණවල විනිවිදභාවය සහතික කිරීම.

86. විමර්ශන කොමිෂන් සභාවේ විමර්ශන වලින් සහ පරීක්ෂණ වලින් සොයාගත් කරුණු මත පදනම්ව ඉදිරිපත් කරනු ලබන නිර්දේශ වලින් ආවරණය කළ යුතු ක්ෂේත්‍ර ද අධිකාර පත්‍රයෙහි සඳහන් කර ඇත. ඒවා පහත සඳහන් පරිදි වේ:

(1) *විමර්ශන කොමිෂන් සභාව විසින් විමර්ශනය කරන ලද සහ පරීක්ෂණය කරන ලද එක් එක් සිද්ධියට අදාළ කරුණු සහ තත්වයන්,*

(2) විමර්ශන කොමිෂන් සභාව විසින් විමර්ශනය කරන ලද සහ පරීක්ෂණය කරන ලද සිද්ධීන් හේතුවෙන් සෘජුව ම මරණයට, තුවාලවීම් වලට හෝ වෙනත් ශාරීරික හානියකට ලක් වූ පුද්ගලයන්ගේ විස්තර, හානියෙහි ස්වභාවය සහ පසුබිම,

(3) එම පුද්ගලයන්ට එවැනි මරණයක්, තුවාලයක් හෝ ශාරීරික හානියක් සිදුවීමට පාදක වූ හෝ හේතු වූ තත්වයන්,

(4) විමර්ශන කොමිෂන් සභාව විසින් විමර්ශනය කරන ලද සහ පරීක්ෂණය කරන ලද කවර හෝ සිදුවීමක් අතරතුර, සිදුවීම සිදුවන කාලය පුරා හෝ සිදුවීමෙහි ප්‍රතිඵලයක් ලෙස කවර හෝ පුද්ගලයෙකුට මරණය, තුවාල හෝ ශාරීරික හානි සිදුකිරීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකාවේ අදාළ නීති සහ නෛතික මූලධර්ම යටතේ වගකිව යුතු පුද්ගලයන්ගේ සහ පුද්ගල කණ්ඩායම්වල අනන්‍යතා, විස්තර සහ පසුබිම්,

(5) පරීක්ෂණ පැවැත්වීමට හේතු පාදක වූවා හෝ අදාළ වූවා විය හැකි අදාළ තත්ත්වයන් සහ හේතු සැලකිල්ලට ගනිමින්, සිද්ධීන් සම්බන්ධයෙන් පවත්වනු ලබන විමර්ශනවල ස්වභාවය, යෝග්‍යතාවය සහ සාර්ථකත්වය පිළිබඳව පරීක්ෂා කර අදහස් ඉදිරිපත් කිරීම,

(6) හඳුනාගත් පුද්ගලයන්ට එරෙහිව ශ්‍රී ලංකාවේ නීතිවලට අනුකූලව ගත යුතු ක්‍රියාමාර්ග නිර්දේශ කිරීම,

(7) විමර්ශන කොමිෂන් සභාව විසින් විමර්ශනය කරන ලද සහ පරීක්ෂණය කරන ලද බරපතල මානව හිමිකම් උල්ලංඝනය කිරීම්වලට ගොදුරු වූවන්ට සහ ඔවුන්ගේ සමීපතම ඥාතීන්ට ලබා දිය යුතු යෝග්‍ය වන්දි ගෙවීමේ ක්‍රියාමාර්ග නිර්දේශ කිරීම,

(8) විමර්ශන කොමිෂන් සභාව විසින් විමර්ශනය කරන ලද සහ පරීක්ෂණය කරන ලද ආකාරයේ සිදුවීම් ඇතිවීම වැළැක්වීම සඳහා ශ්‍රී ලංකා රජය විසින් ගත යුතු ක්‍රියාමාර්ග නිර්දේශ කිරීම,

(9) අධිකාර පත්‍රයට අනුව විමර්ශන කොමිෂන් සභාව විසින් සොයා ගන්නා ලද කරුණු වලට අදාළ වන්නේ යැයි කොමිෂන් සභාව විසිනු සලකනු ලබන වෙනත් නිර්දේශ.[55]

3. පූර්වගාමී කොමිෂන් සභාවල ඉහත සඳහන් විධිනියෝග පිළිබඳ මෙම ජනාධිපති විමර්ශන කොමිෂන් සභාවේ නිරීක්ෂණ.

87. ඉහත නම් සඳහන් කරන ලද විශේෂිත කොමිෂන් සභා තුනෙහි විධිවිධාන පිළිබඳ නිරීක්ෂණ ඉදිරිපත් කිරීමට පෙර, ඇතැම් ප්‍රබල තත්ත්වයන්හි ප්‍රතිඵලයක් ලෙස ඉහත කොමිෂන් සභා එවකට ඉතාම වැදගත් ම අවශ්‍යතාවයන් බවට පත් වූ බව නිරීක්ෂණය කිරීම අදාළ වේ. උගත් පාඩම් සහ ප්‍රතිසන්ධාන කොමිෂන් සභාව පිහිටුවීමට හේතු වූ ජාත්‍යන්තර බලකිරීම් තිබූ බව ප්‍රතික්ෂේප කළ නොහැක. 2010 මැයි මාසයේ දී උගත් පාඩම් සහ ප්‍රතිසන්ධාන කොමිෂන් සභාව පත් කරන ලද අතර, 2010 ජුනි මාසයේ දී මහලේකම්වරයා සිය විද්වත් මණ්ඩලය පත් කළේ ය. යුද්ධය අවසන් වූ පසු උගත් පාඩම් සහ ප්‍රතිසන්ධාන කොමිෂන් සභාව සහ පරණගම කොමිසම පත් කරන ලද අතර, උදලාගම කොමිසම විසින් 2005 අගෝස්තු 01 වැනි දායින් පසුව ඇති වූ සිදුවීම් පිළිබඳව අවධානය යොමු කරන ලද බව අවධානයට ගැනීම වැදගත් වේ. කෙසේ වෙතත්, එම කොමිෂන් සභා තුන ම බරපතළ මානව හිමිකම් කඩවීම් සම්බන්ධයෙන් අවධානය යොමු කළ අතර, උගත් පාඩම් සහ ප්‍රතිසන්ධාන කොමිෂන් සභාව සහ පරණගම කොමිසම ජාත්‍යන්තර මානුෂීය නීති කඩකිරීම් පිළිබඳව ද විමර්ශනය කළහ.

i. උගත් පාඩම් සහ ප්‍රතිසන්ධානය පිළිබඳ වූ කොමිෂන් සභාව පිළිබඳ නිරීක්ෂණ.

88. පැහැදිලිව පෙනී යන පරිදි, ආණ්ඩුව තමන්ගේ ම දේශීය සංක්‍රාන්ති යුක්ති ප්‍රතිචාරය, 'එනම් උගත් පාඩම් සහ ප්‍රතිසන්ධාන කොමිෂන් සභාව' ප්‍රකාශයට පත් කළේ 2010 මැයි මාසයේ දී ය. රජයට අතිශය වැදගත් වූ යුධ ජයග්‍රහණය සංක්‍රාන්ති යුක්තිය ක්‍රියාත්මක කිරීමට රජයට භාර කළ උපායමාර්ගික බලකිරීම ඉතා අල්ප වුව ද, උගත් පාඩම් සහ ප්‍රතිසන්ධාන කොමිෂන් සභාව පිහිටුවීම නිවැරදි දිශාව ඔස්සේ ගන්නා ලද, පිළිගැනීමට ලක් වූ පියවරක් වන අතර, මේ දක්වා එහි කටයුතු සාපේක්ෂ වශයෙන් දිරිගන්වන සුළු ඒවා වී ඇතැයි සැලකිය යුතුය. උගත් පාඩම් සහ ප්‍රතිසන්ධාන කොමිසමේ මූලාරම්භය 2009 මැයි මාසයේ දී ශ්‍රී ලංකා රජය එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කවුන්සිලයේ දී ඉතා පැහැදිලි විත්ති වාචකයක් ඉදිරිපත් කර, ප්‍රචණ්ඩකාරී යැයි පැවසෙන යුද්ධය අවසන් කරනු ලැබූ ආකාරය හෙළා දකිමින් ඉදිරිපත් කරන ලද යෝජනාවක් පරාජය කිරීමට සමත් වූ පසුබිමක් තුළ සිදු විය.[56]

89. උගත් පාඩම් සහ ප්‍රතිසන්ධාන කොමිෂන් සභාව පිහිටුවීමෙන් පසුව ලියන ලද ලිපියක වාසුකී නේසියා විසින් යම් සැක සංකා පළ කරනු ලැබුව ද, පශ්චාත් යුධ සමයේ ශ්‍රී ලංකාව තුළ සත්‍ය සෙවීමේ හා

---

[55] 2006 නොවැම්බර් 13 දිනැති අංක 1471/6 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය බලන්න.

[56] ශ්‍රී ලංකාව විසින් මෙම ගැටුම 'බාහිර මැදිහත්වීම් අවශ්‍ය නොකරන අභ්‍යන්තර කාරණයක්' ලෙස විස්තර කරමින් ඉදිරිපත් කරන ලද යෝජනාවට සහාය දුන් සංවර්ධනය වෙමින් පවතින රටවල් 29 අතර චීනය, ඉන්දියාව, ඊජිප්තුව සහ කියුබාව විය. බලන්න, කැතරින් පිලිප්, 'යුධ අපරාධ සම්බන්ධයෙන් බටහිර රටවල් ශ්‍රී ලංකාවට එරෙහිව එක්සත් ජාතීන්ගේ සංවිධානයට පැමිණිලි කිරීම පසුබට කිරීමට ශ්‍රී ලංකාව බල කරයි', ටයිම්ස්, 2009 මැයි 28

ප්‍රතිසන්ධාන කොමිෂන් සභාවක් සඳහා ඇති විභවය සැබවින් ම සංක්‍රාන්ති යුක්තිය වෙනුවෙන් පෙනී සිටින්නන් විසින් නැවත නැවත අවධාරණය කරන ලද තේමාවක් විය.[57]

90. එම කාලයේ දී ම ක්‍රියාත්මක කරන ලද බාහිර ක්‍රියාමාර්ග පිළිබඳව, එනම් මෙම කොමිෂන් සභාව මෙහි ඉහත 1 වෙනි පරිච්ඡේදයෙහි සඳහන් කර ඇති එක්සත් ජාතීන්ගේ විශේෂඥ මණ්ඩලය පිළිබඳව පරීක්ෂා කිරීම සහ තක්සේරු කිරීම මෙම කොමිෂන් සභාවේ විධිනියෝගයට අයත් නොවන නමුත්, ශ්‍රී ලංකා රජය 2010 මැයි මාසයේදී උගත් පාඩම් සහ ප්‍රතිසන්ධාන කොමිෂන් සභාව පිහිටුවද්දී, එක්සත් ජාතීන්ගේ මහලේකම්වරයා විසින් ශ්‍රී ලංකා ගැටුම සම්බන්ධ වගවීමේ ගැටළු යනුවෙන් හඳුන්වන ලද කරුණු සම්බන්ධයෙන් උපදෙස් දීම සඳහා විශේෂඥ මණ්ඩලය පිහිටුවීමට තීරණය කළේ 2010 ජුනි මාසයේදී බව මේ අවස්ථාවේ දී අවධාරණය කළ යුතු ය.

91. විශේෂයෙන්ම, උගත් පාඩම් සහ ප්‍රතිසන්ධාන කොමිෂන් සභාවට 2002 සටන් විරාම ගිවිසුම පිළිබඳව සහ 2009 මැයි මාසයේ යුද්ධය අවසානයේ දී ඇති වූ සිදුවීම් මාලාව පිළිබඳව වාර්තා කිරීමට, එනම් යම් පුද්ගලයෙක් මේ සම්බන්ධයෙන් වගකීම දැරුවේද, මෙම කාලපරිච්ඡේදයෙන් උගත් පාඩම් සහ ගැටුම් නැවත ඇතිවීම වැළක්වීමට සහ සියලු ප්‍රජාවන් අතර සංහිඳියාව ප්‍රවර්ධනය කිරීමට ගත යුතු ආයතනික, පරිපාලන සහ ව්‍යවස්ථාදායක ක්‍රියාමාර්ග මොනවාද යන්න වාර්තා කිරීමේ කාර්යය පවරන ලදී.

92. එම කොමිෂන් සභාව අගනුවර සහ ගැටුම් ඇති වූ දිස්ත්‍රික්කවල මහජන සාක්ෂි විමසීම් පවත්වා 2011 නොවැම්බර් මාසයේදී සිය වාර්තාව ඉදිරිපත් කළේය. උගත් පාඩම් සහ ප්‍රතිසන්ධාන කොමිසමේ සාධනීය ගුණාංග කිහිපයක් තිබුණි. එය යුද්ධය අවසානයේ සංක්‍රාන්ති යුක්තියට සම්බන්ධ වීමට ශ්‍රී ලංකා රජය ගත් උත්සාහයක් සනිටුහන් කළ බව ප්‍රකාශ කළ යුතු ය. කොමිෂන් සභාව ඉදිරියේ පෙනී සිටීමින් ඔවුන්ගේ අත්දැකීම් පිළිබඳ සාක්ෂි ලබා දීමට ඉදිරිපත් වූ පුද්ගලයින් සංඛ්‍යාව අනුව විනිශ්චය කිරීමේ දී යුද්ධයෙන් පීඩාවට පත් දිස්ත්‍රික්කවල කොමිසම පැවැත්වූ රැස්වීම් ප්‍රජාවන්ගේ මතකයන් අවදි කළ බව පැහැදිලි ය.[58] 2010 නොවැම්බර් මාසයේ දී උගත් පාඩම් සහ ප්‍රතිසන්ධාන කොමිෂන් සභාව වහාම ක්‍රියාත්මක කළ යුතු නිර්දේශ කිහිපයක් සහිතව අතුරු වාර්තාවක් රජයට ඉදිරිපත් කළේය. චෝදනාවක් නොමැතිව දීර්ඝ කාලයක් තිස්සේ රැඳවුම් භාරයේ සිටින අය සම්බන්ධයෙන් කටයුතු කිරීමට යාන්ත්‍රණයක් සැකසීම, පෞද්ගලික ඉඩම් රාජ්‍ය ආයතන විසින් ජනාවාස සඳහා යොදා නොගන්නා බවට ශ්‍රී ලංකා රජය විසින් කරනු ලබන පැහැදිලි ප්‍රකාශයක් (උතුරු නැගෙනහිර ඉඩම් ගැටලු පිළිබඳ අනාරක්ෂිත තත්ත්වයන් ආමන්ත්‍රණය කිරීම සඳහා) සහ පරිපාලන ව්‍යුහයන් තුළ පවතින භාෂා විෂමතා වහාම නිවැරදි කිරීම එම නිර්දේශවලට ඇතුළත් විය.

93. මෙම නිර්දේශ මගින්, තමන්ගේ බලතල සීමාවන් තුළ වුවද, කොමසාරිස්වරුන් අතර පැවති අරමුණ පිළිබඳ හැඟීම ප්‍රදර්ශනය කළේ ය. උගත් පාඩම් සහ ප්‍රතිසන්ධාන කොමිෂන් සභා නිර්දේශවල කැපී පෙනෙන අවධාරණය කිරීම් සමහරක් ශ්‍රී ලංකා රජයට සහ ආරක්ෂක අංශ වෙත එල්ල කරන ලද චෝදනාවලට බලපාන ඉතා වැදගත් ගැටළු සම්බන්ධයෙන් වේ.

94. හැඳින්වීමක් වශයෙන්, සමස්තයක් ලෙස උගත් පාඩම් සහ ප්‍රතිසන්ධාන කොමිෂන් සභා වාර්තාවේ පැහැදිලිව පෙනෙන පහත සඳහන් කරුණු අපි ඉස්මතු කරන්නෙමු:

---

[57] වාසුකී නේසියා, "*ශ්‍රී ලංකාවේ සත්‍යය හෙළිදරව් කිරීම*", සන්ඩේ අයිලන්ඩ්, 2009 අගෝස්තු 16.

[58] යුද්ධයෙන් පීඩාවට පත් වන්නි ප්‍රදේශයේ පැවති සාක්ෂි විභාග කිරීමකදී පුද්ගලයින් 500 ට අධික පිරිසක් එම සාක්ෂි විභාග කිරීමට පැමිණ සිටි බවත්, සාක්ෂි දුන් අය යුද්ධයේදී අතුරුදහන් වූ තම පවුලේ සාමාජිකයන් සොයා ගැනීමේ අවශ්‍යතාවය ගැන කතා කළ බවත් මාධ්‍යවේදීහු වාර්තා කළහ. එන්. පරමේස්වරන්, *උගත් පාඩම් සහ ප්‍රතිසන්ධාන කොමිෂන් සභාවේ සාක්ෂි විමසීම්: අතුරුදහන් වූ නෑදෑ හිතවතුන් පිළිබඳ දැනගැනීම උතුරේ සිවිල් වැසියන්ගේ ප්‍රධාන සැලකිල්ල විය*, සන්ඩේ ටයිම්ස්, 2010 සැප්තැම්බර් 26

1. ජාත්‍යන්තර මානව හිමිකම් නීති සහ ජාත්‍යන්තර මානුෂීය නීති ගැටළු.
2. නීති විරෝධී සන්නද්ධ කණ්ඩායම්.
3. අදහස් ප්‍රකාශ කිරීමේ නිදහස සහ තොරතුරු දැනගැනීමේ අයිතිය.
4. ආගම ඇදහීමේ, සමාගමයේ සහ ගමන් කිරීමේ නිදහස.
5. අතුරුදහන් කිරීම්
6. බලය බෙදීම
7. ඉඩම් ගැටළු - ආපසු ලබා දීම සහ නැවත පදිංචි කිරීම
8. ත්‍රෙහාෂික ජාතියක් ඉදිරි මාවත විය යුතු බව
9. ප්‍රතිෂ්ඨාපනය, වන්දි සහන සහ ප්‍රතිසන්ධානය
10. නීතිය හා සාමය නීති විරෝධී සන්නද්ධ කණ්ඩායම් අඛණ්ඩව සිටීම
11. උතුරු පළාතේ හමුදාව රැඳී සිටීමේ ආක්‍රමණශීලී බව
12. උතුරු ප්‍රදේශයේ මුස්ලිම් ජනතාව නැවත පදිංචි කිරීම

95. ඇතැම් නිර්දේශ ප්‍රගතිශීලී සහ නව්‍ය ඒවා ලෙස පැසසුමට ලක් විය. වගවීම පිළිබඳ ගැටළු සැලකීමේ දී, උගත් පාඩම් සහ ප්‍රතිසන්ධාන කොමිෂන් සභාව අතුරුදහන්වීම් පිළිබඳ චෝදනා පිළිබඳව දැඩි ලෙස විමර්ශනය කිරීමේ අවශ්‍යතාව අවධාරණය කළේය. ශ්‍රී ලංකා රජය ආරක්ෂක අංශ විසින් අත්අඩංගුවට ගත් තම ආදරණීයයන් අතුරුදන් වූ බවට ඇසින් දුටු සාක්ෂි නොසලකා හැරිය යුතු නැති බව උගත් පාඩම් සහ ප්‍රතිසන්ධාන කොමිෂන් සභාව තවදුරටත් කියා සිටියේය.

96. එම වාර්තාවේ 5.1 ඡේදයේ උගත් පාඩම් සහ ප්‍රතිසන්ධාන කොමිෂන් සභාව ගැටුම හේතුවෙන් පැන නැඟුණු ප්‍රධාන මානව හිමිකම් ගැටළු ගණනාවක් සලකා බැලූ බව සඳහන් කරයි. ඉන් සමහරක් මගින් ශ්‍රී ලංකාව නිදහස දිනා ගත් අවස්ථාවේ සිට පොරොන්දු වී ඇති ප්‍රධාන ජාත්‍යන්තර මානව හිමිකම් ලියවිලිවල සහ අනෙකුත් ජාත්‍යන්තර බැඳීම්වල මෙන්ම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ සහ අනෙකුත් නීතිවල සඳහන් අදාළ විධිවිධානවල ද අඩංගු වන මානව හිමිකම් නීතියේ මූලධර්ම ඉස්මතු කළහ. මෙම කොමිෂන් සභාව ගැටුමෙන් පීඩාවට පත් ප්‍රදේශවල සාක්ෂිකරුවන් කිහිප දෙනෙකුගෙන් අසා දැනගත් පරිදි, උගත් පාඩම් සහ ප්‍රතිසන්ධාන කොමිෂන් සභාව ඉදිරියේ ගැටුමෙන් පීඩාවට පත් වූ ජනතාවගේ මූලික අයිතිවාසිකම් සහ නන් වැදෑරුම් නිදහස උල්ලංඝණය වූ බවට වන චෝදනා විශාල සංඛ්‍යාවක් ඉදිරිපත් කර තිබුණි. පැහැර ගැනීම්, බලහත්කාරයෙන් හෝ ස්වකැමැත්තෙන් නොවන ඉවත් කිරීම්, අත්තනෝමතික ලෙස රඳවා තබා ගැනීම්, බාලවයස්කාර ළමයින් බලහත්කාරයෙන් බඳවා ගැනීම්, නීති විරෝධී, ලඝු හෝ අත්තනෝමතික ලෙස මරණ දණ්ඩනය ලබා දීම්, අදහස් ප්‍රකාශ කිරීමේ, ගමන් කිරීමේ, සමාගමයේ සහ ආගම ඇදහීමේ නිදහස උල්ලංඝනය කිරීම් සහ මාධ්‍ය නිදහස උල්ලංඝනය කිරීම් ආදිය එයට ඇතුළත් විය. එමෙන්ම, අභ්‍යන්තර ලෙස අවතැන් වූවන්ගේ අයිතිවාසිකම් සහ කාන්තාවන්, ළමයින් සහ ආබාධිතයන් වැනි අවදානමට ලක්විය හැකි කණ්ඩායම්වල අයිතිවාසිකම් සම්බන්ධයෙන් ද උගත් පාඩම් සහ ප්‍රතිසන්ධාන කොමිෂන් සභාව ඉදිරියේ අදහස් දැක්වීම් සිදුකර තිබුණි. යාපනය, කිලිනොච්චිය සහ මඩකලපුව යන ප්‍රදේශවල දී මානව හිමිකම් කඩවීම් වලින් සහ වෙනත් අපයෝජන වලින් පීඩාවට පත්වූ සාක්ෂිකරුවන් විශාල සංඛ්‍යාවකගේ කරුණු දැක්වීම් මෙම කොමිෂන් සභාව විසින් විභාග කරන ලදී.

97. මානව හිමිකම් ගැටළු පිළිබඳ ස්වකීය නිර්දේශ ප්‍රතිසන්ධාන ක්‍රියාවලියට තීරණාත්මක ලෙස අදාළ වන බව උගත් පාඩම් සහ ප්‍රතිසන්ධාන කොමිෂන් සභාව ප්‍රකාශ කළේය.[59]

[59] උගත් පාඩම් සහ ප්‍රතිසන්ධාන කොමිසමේ වාර්තාවේ ' මානව හිමිකම්' නැමති මාතෘකාව යටතේ ඇති 5 වෙනි පරිච්ඡේදයේ 5.1 වෙනි ඡේදය බලන්න.

98. අතුරුදහන් වූවන් පිළිබඳ ගැටළුව විසඳීම සඳහා ප්‍රවේශයක් නොතිබීම අන්තර්කණ්ය වූ, දීර්ඝ කාලීන ප්‍රතිසන්ධාන ක්‍රියාවලියකට බරපතල බාධාවක් විය හැකි බැවින්, අතුරුදහන් වූවන් පිළිබඳ ගැටළුව විසඳීම සඳහා හදිසි කාරණයක් ලෙස සලකා පරිපූර්ණ ප්‍රවේශයක් සොයා ගත යුතු බව දැක්වෙන, යහපත් අරමුණින් සඳහන් කරන ලද ප්‍රකාශයක් 5.36 ඡේදයේ ඇතුළත් කර ඇත. මේ අනුව, ඉදිරි පරිච්ඡේදවල දී අපට දැනගත හැකි වන පරිදි, අතුරුදහන් වූවන් පිළිබඳ කාර්යාලය (OMP)[60] සහ '2018 අංක 5 දරන බලහත්කාරයෙන් අතුරුදහන් කිරීම්වලින් සියලු තැනැත්තන් ආරක්ෂා කිරීම සඳහා වූ ජාත්‍යන්තර සම්මුති පනත' නැමති බලහත්කාරයෙන් අතුරුදන් කිරීම් පිළිබඳ නීතිය වැනි සංක්‍රාන්ති යුක්ති යාන්ත්‍රණ හරහා ප්‍රමාද වී හෝ මෙම නිර්දේශවලින් සමහරක් ක්‍රියාත්මක කර ඇති බව පැවසිය හැක.

99. චන්දිමා වික්‍රමසිංහ මහත්මිය මෙම කොමිෂන් සභාවේ හමුවේ සාක්ෂි දුන් පරිදි, උගත් පාඩම් සහ ප්‍රතිසන්ධාන කොමිෂන් සභාවේ නිර්දේශ ක්‍රියාත්මක කිරීමේ අරමුණින් සකස් කරන ලද 'ජාතික ක්‍රියාකාරී සැලැස්ම'[61] 2012 ජූලි මාසයේදී අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදී. කෙසේ වෙතත්, ජාත්‍යන්තර මානව හිමිකම් නීති සහ ජාත්‍යන්තර මානුෂීය නීති සම්බන්ධ ගැටළුවලට අදාළ නිර්දේශ ක්‍රියාත්මක කිරීම මන්දගාමීව සිදු වූ නමුත්, එම නිර්දේශ සාධනීය ලෙස ක්‍රියාත්මක කිරීම ප්‍රමාද වී ඇත්තේ මන්දැයි ඒ මහත්මිය හේතු ඉදිරිපත් කළාය.[62]

100. උගත් පාඩම් සහ ප්‍රතිසන්ධාන කොමිසමේ නිර්දේශ ක්‍රියාත්මක කිරීමට පහසුකම් සැලසීම පිණිස විදේශ කටයුතු අමාත්‍යාංශය විසින් අන්තර් ආයතන උපදේශක කමිටුවක් පිහිටවූ බව මෙම වාර්තාවේ සම්පූර්ණත්වය සඳහා මෙම අවස්ථාවේ දී මෙම ජනාධිපති විමර්ශන කොමිෂන් සභාව සිහපත් කරන අතර, උගත් පාඩම් සහ ප්‍රතිසන්ධාන කොමිසමේ නිර්දේශ සම්බන්ධයෙන් මෙම අන්තර් ආයතන උපදේශක කමිටුව අත්කරගෙන ඇති ප්‍රගතිය මෙම කොමිෂන් සභාව ස්වකීය අවසන් වාර්තාවේ උගත් පාඩම් සහ ප්‍රතිසන්ධාන කොමිසමේ නිර්දේශ ක්‍රියාත්මක කිරීම පිළිබඳව සාකච්ඡා කරන 3 වෙනි පරිච්ඡේදයේ III වෙනි කොටසෙහි සාරාංශ කර ඇත.

101. නිර්දේශ ක්‍රියාත්මක කිරීමේ ප්‍රශ්නය සම්බන්ධයෙන් කටයුතු කිරීම සඳහා ශ්‍රී ලංකා රජය දරන උත්සාහයේ දැඩි උනන්දුව ප්‍රදර්ශනය කිරීම පිණිස මෙම කොමිෂන් සභාව මෙම ක්‍රියාමාර්ගය ඉස්මතු කරන නමුත්, චන්දිමා වික්‍රමසිංහ මහත්මිය මෙම ජනාධිපති විමර්ශන කොමිසම හමුවේ සාක්ෂි දුන් පරිදි, මෙම ගම්‍යතාව සැලකිල්ලට ගැනීමේ දී, රේඛීය අමාත්‍යාංශ අතර සම්බන්ධීකරණයක් නොතිබීම නොවෙන්නට බොහෝ දේ සාක්ෂාත් කර ගත හැකිව තිබුණි.[63]

102. උගත් පාඩම් සහ ප්‍රතිසන්ධාන කොමිෂන් සභාවේ අගුණ කියන්නන් ද නැතුවා නොවේ. උගත් පාඩම් සහ ප්‍රතිසන්ධාන කොමිෂන් සභාව ඇම්නෙස්ටි ඉන්ටර්නැෂනල්, හියුමන් රයිට්ස් වොච් සහ ඉන්ටර්නැෂනල් ක්‍රයිසිස් ගෘප් වෙත ආරාධනා කළද, එම ආරාධනය ප්‍රතික්ෂේප විය. උගත් පාඩම් සහ ප්‍රතිසන්ධාන කොමිසමේ විධිනියෝගය සටන් විරාම ගිවිසුම ක්‍රියාත්මක වූ දිනය සහ යුද්ධය අවසන් වූ දිනය අතර කාලයට සීමා වූ බවට විවේචන එල්ල වුවද, කොමිෂන් සභාවේ

---

[60] 'අතුරුදහන් වූවන් පිළිබඳ කාර්යාලය' පිළිබඳ විස්තීර්ණ සාකච්ඡාවක් සඳහා මෙම ජනාධිපති විමර්ශන කොමිෂන් සභාවේ අවසන් වාර්තාවේ *3 වෙනි පරිච්ඡේදයේ III වෙනි කොටස* බලන්න.

[61] උගත් පාඩම් සහ ප්‍රතිසන්ධාන කොමිෂන් සභාවේ නිර්දේශ සාධනීය ලෙස ක්‍රියාත්මක කිරීම පිළිබඳ සාකච්ඡාවක් සඳහා *3 වෙනි පරිච්ඡේදයේ III වෙනි කොටස* බලන්න.

[62] මෙම ජනාධිපති විමර්ශන කොමිෂන් සභාවේ අවසන් වාර්තාවේ *4 වෙනි පරිච්ඡේදයේ* දී ඇති චන්දිමා වික්‍රමසිංහගේ සාක්ෂි බලන්න.

[63] එම

කොමසාරිස්වරුන් සාමය සහ සංහිදියාව සඳහා වන සැලැස්මක් ලෙස යොදා ගත හැකි ඵලදායී වාර්තාවක් ඉදිරිපත් කළ බව සෑම අතින්ම පිළිගනු ලැබේ.

103. 2002 පෙබරවාරි 21 දින සිට 2009 මැයි 19 දින දක්වා කාලය තුළ සිදු වූ සිද්ධීන් පිළිබඳ කරුණු සොයා බලා වාර්තා කිරීමට උගත් පාඩම් සහ ප්‍රතිසන්ධාන කොමිෂන් සභාවට නියම කර තිබුණ ද, එම කොමිෂන් සභාව එයට වඩා පුළුල් කාල පරිච්ඡේදයක් ආවරණය කළ බව පෙන්වා දිය යුතු ය. මෙම ජනාධිපති විමර්ශන කොමිෂන් සභාවේ සිදු වූ පරිදි ම, උගත් පාඩම් සහ ප්‍රතිසන්ධාන කොමිෂන් සභාව ඉදිරියේ කරුණු දැකුවූ සාක්ෂිකරුවන්ගේ වාර්තා වලින් ද බොහෝ විට එම කොමිෂන් සභාවට පැවරී ඇති විධිනියෝගයට පෙර කාල පරිච්ඡේදයක් ආවරණය වූ බැවින්, අවසාන විග්‍රහයේ දී එම කරුණු නොසලකා හැරිය නොහැකි විය. මෙම ජනාධිපති විමර්ශන කොමිෂන් සභාවට නියමිත කාල සීමාවෙන් පරිබාහිරව වුවද එම සාක්ෂි විස්තර මෙම කොමිෂන් සභාවේ අනාගත නිර්දේශ සඳහා අදාළ වන අතර, උගත් පාඩම් සහ ප්‍රතිසන්ධාන කොමිෂන් සභාවට ද 2002 පෙබරවාරි 21 වැනි දිනට පෙර සිදුවූ සිදුවීම් පිළිබඳ කතා කළ සාක්ෂිකරුවන් රැසක් සිටියහ.

104. උදාහරණයක් ලෙස, මෙම කොමිෂන් සභාව යාපනයේ සහ මඩකලපුවේ දී ස්වකීය කටයුතු සිදු කරන අවස්ථාවේ දී සාක්ෂිකරුවන් ගණනාවක් කතා කළ පැහැරගැනීම් සහ අතුරුදන් කිරීම් පිළිබඳ සිද්ධීන් මෙම කොමිෂන් සභාවට නියමිත කාලසීමාවට පෙර සිදුවූ ඒවා නමුත් ඒ පිළිබඳ සාක්ෂි විස්තර ලියා තැබිය යුතු බව සහ ඔවුන්ගේ තත්ත්වයන් වැඩිදියුණු කිරීම සඳහා නිර්දේශ ඉදිරිපත් කළ යුතු බව මෙම ජනාධිපති විමර්ශන කොමිෂන් සභාවේ අදහස වේ.

105. උගත් පාඩම් සහ ප්‍රතිසන්ධාන කොමිෂන් සභාව පහත සඳහන් මාතෘකා පිළිබඳ විස්තීර්ණ පරිච්ඡේද ඇතුළත් කරමින් 2011 නොවැම්බර් මාසයේදී ස්වකීය අවසන් වාර්තාව ඉදිරිපත් කළේය: සටන් විරාම ගිවිසුම් (II වෙනි පරිච්ඡේදය), ජාත්‍යන්තර මානුෂීය නීති ගැටලු (IV වෙනි පරිච්ඡේදය), මානව හිමිකම් (V වෙනි පරිච්ඡේදය), ඉඩම් ආපසු ලබා දීම සහ නැවත පදිංචි කිරීම (VI වෙනි පරිච්ඡේදය), වන්දි ගෙවීම / වන්දි සහන (VII වෙනි පරිච්ඡේදය), සහ ප්‍රතිසන්ධානය (VIII වෙනි පරිච්ඡේදය). උගත් පාඩම් සහ ප්‍රතිසන්ධාන කොමිෂන් සභාව 2011 නොවැම්බර් 15 දිනැති ස්වකීය අවසන් වාර්තාවේ 9 වන පරිච්ඡේදයේ එම කොමිෂන් සභාවේ ප්‍රධාන නිරීක්ෂණ සහ නිර්දේශවල සාරාංශයක් ඉදිරිපත් කළේය.

106. මෙම ජනාධිපති විමර්ශන කොමිෂන් සභාව ඉදිරියේ ඇති කාර්යය වන්නේ, ස්වකීය විධිනියෝගයට පැහැදිලිව ම ඇතුළත් වන පරිදි, සොයාගෙන ඇති කරුණු මගින් ජාත්‍යන්තර මානව හිමිකම් නීතිය සහ ජාත්‍යන්තර මානුෂීය නීතිය උල්ලංඝනය කිරීම් පිළිබඳව හෙළිදරව් වන්නේද යන්න සහ එම කරුණු සම්බන්ධයෙන් ඉදිරිපත් කර තිබූ නිර්දේශ රජය විසින් ක්‍රියාත්මක කරනු ලැබ තිබේද යන්න සොයා බැලීමයි. ඇතැම් නිර්දේශ සම්බන්ධයෙන් ඉහත ප්‍රශ්නයට පිළිතුර 'නැත' යන්න නම්, මෙම අවසන් වාර්තාවේ 6 වැනි පරිච්ඡේදයේ දී අනුගමනය කළ යුතු ඉදිරි මග නිර්දේශ කිරීමට මෙම කොමිෂන් සභාව කටයුතු කරයි.

107. උගත් පාඩම් සහ ප්‍රතිසන්ධාන කොමිෂන් සභාව පිළිබඳ පොදු අදහසක්, එහි විධිනියෝගය සහ එහි නිර්දේශ ක්‍රියාවට නැංවීමේ ප්‍රගතිය පිළිබඳ සංක්ෂිප්ත කාලනුක්‍රමයක් ඉදිරිපත් කිරීමෙන් පසුව, මෙම කොමිෂන් සභාව දැන් විමර්ශනය කළ යුතු තවත් විෂය කරුණක් වන 'පැහැරගැනීම් සහ අතුරුදහන්කිරීම් පිළිබඳ ජනාධිපති විමර්ශන කොමිෂන් සභාව (පරණගම කොමිසම) කෙරෙහි අවධානය යොමු කරයි.

ii. පරණගම කොමිෂන් සභාව පිළිබඳ නිරීක්ෂණ

108. පරණගම කොමිෂන් සභාවට සත්‍ය සෙවීමේ බලතල පැවරූ විධිනියෝග දෙක සලකා බැලීමෙන් පරණගම කොමිෂන් සභාවේ විෂය ක්ෂේත්‍රය සහ විෂය සීමාව නිසි ලෙස විමසා බැලිය හැක.

109. 2013 අගෝස්තු 12 වැනි දිනැති පළමු විධිනියෝගයේ පූර්විකාවේ ඡේදවල පහත සඳහන් දේ සඳහන් වේ:

දෙවන ඊළාම් යුද්ධය ආරම්භ වූ 1990 ජූනි මාසය සහ එකී යුද්ධය අවසන් වූ 2009 මැයි 19 වැනි දින අතර කාලපරිච්ඡේදය තුළ අවාසනාවන්ත සිදුවීම්වලින් පීඩාවට පත් වූ ශ්‍රී ලංකාවේ උතුරු සහ නැගෙනහිර පළාත්වල පදිංචිව සිටි ඇතැම් පුද්ගලයන් ඔවුන් පදිංචිව සිටි ස්ථානවලින් පැහැරගෙන ගොස් හෝ එම පුද්ගලයන් ඔවුන් පදිංචිව සිටි ස්ථානවලින් අතුරුදන් වී ඇති බවට පැමිණිලි ලැබී ඇති හෙයින් ද, සහ පැහැර ගැනීමට ලක් වූ හෝ අතුරුදන් වූ බවට කියන එම පුද්ගලයන් සිටින්නේ කොහිදැයි නොදනනා හෙයින් ද;

තවද, එම පැමිණිල්ලිවල සත්‍යතාව තහවුරු කර ගැනීමට සහ එම පැමිණිලි සත්‍ය බව පෙනී ගියහොත්, එසේ පැහැරගෙන ගොස් හෝ අතුරුදන් කර ඇතැයි කියන පුද්ගලයන් හඳුනා ගැනීමට අවශ්‍ය වී ඇති හෙයින් ද;

එමෙන්ම, එවැනි පැහැරගැනීම් හෝ අතුරුදන් කිරීම්වලට වගකිව යුතු පුද්ගලයා හෝ පුද්ගලයන් හඳුනා ගැනීමට සහ එම පුද්ගලයාට හෝ පුද්ගලයන්ට එරෙහිව නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට අවශ්‍යව ඇති හෙයින් ද;

තවද, අනාගතයේදී එවැනි ක්‍රියාවන් නැවත සිදුනොවීම සහතික කිරීම සඳහා අනුගමනය කළ යුතු ක්‍රියාමාර්ග මොනවාද යන්න තීරණය කිරීම පිණිස පරීක්ෂණ පැවැත්වීම මහජන ආරක්ෂාවට සහ යහපැවැත්මට හිතකර බව මගේ අදහස වන හෙයින් ද,.

මෙහි ඉන්පසු සඳහන් කර ඇති කරුණු පිළිබඳව විමර්ශනය කර වාර්තා කිරීම සඳහා විමර්ශන කොමිෂන් සභාවක් පත් කිරීමට අවශ්‍ය බව මාගේ අදහස වන හෙයින් ද,[64]

110. පරණගම කොමිෂන් සභාව ස්වකීය දෙවෙනි විධිනියෝගය යටතේ (ඉහත නැවත සඳහන් කර ඇති පරිදි) ස්වකීය විමර්ශන යුද්ධයේ අවසන් අදියර ලෙස සැලකිය හැකි, එල්.ටී.ටී.ඊ පරිපාලන අගනුවර වන කිලිනොච්චිය බිඳවැටුණු 2009 ජනවාරි 02 වැනි දින සහ යුද්ධය අවසන් වූ 2009 මැයි 19 වන දින අතර කාලපරිච්ඡේදයට සීමා කළ බව නැවත පැවසීමට අවශ්‍ය නැත. දෙවෙනි විධිනියෝගයෙහි කාල සීමාව එලෙස සීමා කිරීමට හේතු වූ තර්කය පැහැදිලි කළ හැක. වැදගත්ම කරුණ නම්, දෙවන විධිනියෝගයෙහි මතු කරන ලද ප්‍රධාන ප්‍රශ්න 'යුද්ධයේ අවසාන අදියර' ලෙස හඳුනාගෙන ඇති කාල පරිච්ඡේදයට සම්බන්ධ වීමයි. උගත් පාඩම් සහ ප්‍රතිසන්ධාන කොමිෂන් සභා වාර්තාවේ 4.359 ඡේදයේ සඳහන් කර ඇති කරුණු පිළිබඳව සොයා බලා වාර්තා කිරීම සඳහා පරණගම කොමිෂන් සභාවේ විධිනියෝගයෙහි කාලික විෂය පථය දීර්ඝ කරනු ලැබුවේ 2014 ජූලි 15 වෙනිදා ය.

111. මෙම කරුණුවලට සමානුපාතිකත්වය පිළිබඳ මූලධර්මවලට අනුකූල වීම සම්බන්ධ ගැටළු සහ වෙනස, එනම් ජාත්‍යන්තර මානුෂීය නීතිය එල්.ටී.ටී.ඊ. සංවිධානයට අදාළ වීම සහ 2009 මැයි මාසයේ දී අවසන් වූ සන්නද්ධ ගැටුමේ සන්දර්භය තුළ එල්.ටී.ටී.ඊ. සංවිධානය විසින් සිවිල් වැසියන් "මිනිස් පලිහක්" ලෙස යොදා ගැනීම හරහා ජාත්‍යන්තර මානව හිමිකම් නීතිය හෝ ජාත්‍යන්තර මානුෂීය නීතිය උල්ලංඝනය කිරීම පිළිබඳ ගැටළු ඇතුළත් වේ.

[64] 2013 අගෝස්තු 15 දිනැති අංක 1823/42 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය.

112. පරණගම කොමිෂන් සභාවේ විධිනියෝගය පුළුල් වීමෙන් පසුව, එම කොමිෂන් සභාවට උපදෙස් දීම සඳහා ශ්‍රී ලංකා රජය 2014 අගෝස්තු මාසයේ දී ජාත්‍යන්තර නීති විශේෂඥයින්ගෙන් සමන්විත උපදේශක සභාවක් පිහිටුවීමට කටයුතු කළේය. ශ්‍රීමත් ඩෙස්මන්ඩ් ද සිල්වා, රාජනීතිඥ, ශ්‍රීමත් ජෙෆ්රි නයිස්, රාජනීතිඥ, මහාචාර්ය ඩේවිඩ් ක්‍රේන් සහ රොඩ්නි ඩික්සන්, රාජනීතිඥ, ඇතුළු තවත් අය උපදේශක මණ්ඩලයේ සාමාජිකයින් ලෙස පත් කරන ලදී.[65] පරණගම කොමිෂන් සභාවට උපදෙස් දෙන විශේෂඥයන් කිහිප දෙනෙකු විසින් ඉදිරිපත් කරන ලද අදහස් පිළිබඳව ජනාධිපති විමර්ශන කොමිෂන් සභාවේ අවධානය යොමු විය. පරණගම කොමිෂන් සභාව මෙම අදහස් අනුමත කර තිබෙන බව සඳහන් කිරීම වැදගත් වේ.[66]

113. පුද්ගලයන් කිහිප දෙනෙක් ඔවුන්ගේ පැමිණිලි පරණගම කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කර ඇති බව අවධානයට ගත යුතුය. පරණගම කොමිෂන් සභාවට පැමිණිලි ඉදිරිපත් කළ සාක්ෂිකරුවන් කිහිප දෙනෙක් මෙම කොමිෂන් සභාවේ ද මහජන රැස්වීම් කිහිපයකදී ම පෙනී සිටි බව මේ අවස්ථාවේදී නිරීක්ෂණය කිරීම වැදගත් වේ. පරණගම කොමිෂන් සභාවේ සභාපති මැක්ස්වෙල් පරණගම මහතා ම මෙම කොමිෂන් සභාව හමුවේ සාක්ෂි දෙමින් පරණගම කොමිෂන් සභාවේ ක්‍රියාකාරීත්වය පිළිබඳ සවිස්තර වාර්තාවක් ලබා දුන්නේය.[67] පැමිණිලි විශාල ප්‍රමාණයක් ලැබීමෙන් පසු පරීක්ෂකවරුන් කිහිප දෙනෙකු පත් කළ බවත්, මෙම නඩුවලට අදාළ විමර්ශන ලේඛනය තවමත් ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුවේ පවතින බවත් ඔහු මෙම කොමිෂන් සභාවේ අවධානයට යොමු කළේය. මෙම හෙළිදරව්ව මත, මෙම කොමිෂන් සභාවේ දෙවන අතුරු වාර්තාවේ නිර්දේශය වූයේ අදාළ නඩු පැවරීමේ බලධාරීන් සෑහීමකට පත්වන අයුරින්, නඩුවක් පවතින්නේ යැයි පිළිගත යුතු සේ හැඟෙන කරුණු සම්පූර්ණ වන්නේද යන්න පරීක්ෂා කළ හැකි වනු පිණිස එකී ලේඛන භාරගෙන ඒවා නීතිපති දෙපාර්තමේන්තුවට යොමු කළ යුතු බව ය. මැක්ස්වෙල් පරණගමගේ සාක්ෂියේ මෙම අංගය අද දක්වා ම පවතින බැවින්, මෙම ජනාධිපති විමර්ශන කොමිෂන් සභාව ද මෙම වාර්තාවේ දී එම නිර්දේශය ම ඉදිරිපත් කරයි.

114. මැක්ස්වෙල් පරණගම 1983 ජනවාරි සිට 2009 මැයි 19 දක්වා සිදු වූයේ යැයි පැවසෙන අතුරුදන්වීම් ආවරණය කරමින් දිස්ත්‍රික්ක විසිපහකින් (25) ලැබුණු පැමිණිලි 13,378 ක් වාර්තා කර තිබූ 2015 අප්‍රේල් මාසයේ නිකුත් කළ අතුරු වාර්තාවට අවධානය යොමු කළේය.[68]

115. අතුරුදන් කිරීම් පිළිබඳ සිද්ධීන්ගෙන් අති බහුතරයක දී වරෙන්තුවක් නොමැතිව අත්අඩංගුවට ගැනීමේ පිළිවෙත සහ අත්අඩංගුවට ගත් පුද්ගලයන් රඳවා සිටින රැඳවුම් මධ්‍යස්ථාන පිළිබඳ දැනුම්දීමක් නොකිරීමේ ලක්ෂණය පිළිබඳ සඳහන්වීම එම අතුරු වාර්තාවේ කැපී පෙනෙන කරුණක් වේ.

116. මෙම ජනාධිපති විමර්ශන කොමිෂන් සභාව ස්වකීය පළමු වෙනි අතුරු වාර්තාවෙන් පවා රටේ රඳවා තබා ගැනීමේ නීතිවල පවතින මෙම හිඩැස් පෙන්වා දෙන ලද අතර, ඉන් පසුව මෙම කොමිෂන් සභාව සහ පූර්වගාමී කොමිෂන් සභා විසින් පෙන්වා දෙන ලද එම කරුණු පසුව ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව විසින් ආමන්ත්‍රණය කර ඇති බව දැන් පෙනෙන්නට තිබේ. 2023 සැප්තැම්බර් 15 දිනැති ගැසට් නිවේදනය මගින් ප්‍රකාශයට පත් කරන ලද 'ත්‍රස්ත විරෝධී' නැමති පනත්

---

[65] 2014 අගෝස්තු 12 දිනැති අංක 1876/40 දරන සහ අතිවිශේෂ ගැසට් පත්‍රය.

[66] පරණගම කොමිෂන් සභා වාර්තාවේ "ස්තුතිය" නැමති කොටසේ 4 වෙනි ඡේදය බලන්න.

[67] මෙම ජනාධිපති විමර්ශන කොමිෂන් සභාවේ අවසන් වාර්තාවේ 4 වැනි පරිච්ඡේදයේ පරණගම කොමිෂන් සභාවෙ සභාපති මැක්ස්වෙල් පරණගම මහතා මෙම ජනාධිපති විමර්ශන කොමිෂන් සභාව හමුවේ ලබා දුන් සාක්ෂිය බලන්න.

[68] අතුරු වාර්තාව, අතුරුදහන් වූවන් පිළිබඳ පැමිණිලි විමර්ශනය කිරීම සඳහා පත් කළ ජනාධිපති විමර්ශන කොමිෂන් සභාව, 2015 අප්‍රේල්.

කෙටුම්පතෙහි අත් අඩංගුවට ගැනීමක් පිළිබඳ දැනුම් දීමක් සිදු කළ යුතු බවට සහ අත් අඩංගුවට ගත් දිනය, වේලාව සහ ස්ථානය පමණක් නොව අත්අඩංගුවට ගැනීමට හේතු සහ අත්අඩංගුවේ හෝ රඳවා තබා ගැනීමේ ස්ථානය පිළිබඳව ද එම දැනුම්දීමට ඇතුළත් කළ යුතු යැයි නියම කෙරෙන සාධනීය විධිවිධාන අඩංගු බව මෙම ජනාධිපති විමර්ශන කොමිෂන් සභාව සොයා ගෙන ඇත.[69]

117. පරණගම කොමිෂන් සභාව විසින් අදහස් දක්වා ඇති පරිදි, ආරක්ෂක හමුදා සාමාජිකයින්ට එරෙහිව "පිළිගත යුතු යැයි හැඟෙන" සාක්ෂි සොයා ගැනීම සඳහා ගැඹුරු විමර්ශනයක් අවශ්‍ය කළ අතර, පරණගම කොමිෂන් සභාවේ අතුරු නිර්දේශ අනුව, 2015 ජූලි මාසයේ දී ශ්‍රී ලංකා රජය මෙම ඇතැම් සිද්ධීන් සම්බන්ධයෙන් විමර්ශන කඩිනම් කිරීම පිණිස, විශ්‍රාමික අධිකරණ නිලධාරියෙකු යටතේ විශේෂ විමර්ශන කණ්ඩායමක් පත්කිරීම නිවේදනය කළේය.

118. පරණගම කොමිෂන් සභාව විසින් රැස් කරන ලද විමර්ශනවලට අදාළ සටහන් ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුවේ ගබඩා කර ඇති බවට මැක්ස්වෙල් පරණගම ලබා දුන් සාක්ෂි මෙම ජනාධිපති විමර්ශන කොමිෂන් සභාව සිහිපත් කරන අතර, එම ලේඛනවල අඩංගු සාක්ෂිමය ද්‍රව්‍ය තක්සේරු කර, ඒ සම්බන්ධයෙන් අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම සඳහා නීතිපති දෙපාර්තමේන්තුවේ ස්ථාපනය කරනු ලබන විශේෂ ඒකකයක් විසින් එම ලේඛන වහාම භාර ගත යුතු බවට මෙම කොමිෂන් සභාව දැඩි නිර්දේශයක් ලබා දෙයි. එයට අමතරව, එම විමර්ශන සටහන් මෙම කොමිෂන් සභාව විසින් යෝජනා කරනු ලබන "සත්‍ය සෙවීමේ යාන්ත්‍රණය" වෙත යොමු කළ යුතුය.

119. මෙම අවසන් වාර්තාවේ II වෙනි කොටසේ 3 වෙනි පරිච්ඡේදයේ පරණගම කොමිෂන් සභාවේ අවසන් නිර්දේශ සහ එම කොමිෂන් සභාව සොයාගත් කරුණු සම්බන්ධයෙන් විමසා බලන බව නිරීක්ෂණය කිරීමට මෙම ජනාධිපති විමර්ශන කොමිෂන් සභාව අපේක්ෂා කරයි.

iii. උදලාගම කොමිෂන් සභාව පිළිබඳ නිරීක්ෂණ.

120. 2006 නොවැම්බර් 13 දිනැති අංක 1471/6 දරන ගැසට් නිවේදනය පරීක්ෂා කර බැලීමේදී පෙනී යන පරිදි, එවකට ජනාධිපතිවරයා විසින් 2006 නොවැම්බර් මාසයේදී උදලාගම කොමිෂන් සභාව පත් කරන ලද අතර, එම කොමිෂන් සභාවේ කටයුතු නිරීක්ෂණය කිරීම සඳහා කීර්තිමත් පුද්ගලයින්ගේ ජාත්‍යන්තර ස්වාධීන කණ්ඩායමක් පත් කරන ලදී. 2005 අගෝස්තු මාසයේ සිට සිදු වූයේ යැයි පැවසෙන බරපතල මානව හිමිකම් කඩකිරීම් 16 ක් පිළිබඳ විමර්ශනය කිරීමේ සහ පරීක්ෂණය කිරීමේ කාර්යය උදලාගම කොමිෂන් සභාවට පැවරුණි.

121. විමර්ශනය කළ යුතු වූ පහත සඳහන් සිද්ධීන් එම විධිනියෝගය සමග පළකළ උපලේඛනයෙහි සඳහන් කර ඇත:

- **1 වෙනි සිදුවීම -** ශ්‍රී ලංකාවේ විදේශ අමාත්‍ය ගරු ජනාධිපති නීතිඥ ලක්ෂ්මන් කදිරගාමර් මහතා ඝාතනය කිරීම.
- **2 වෙනි සිදුවීම -** 2006 අගෝස්තු මස මුලදී ජාත්‍යන්තර රාජ්‍ය නොවන සංවිධානයක් වන Action Contre La Faim (ACF) සංවිධානයෙහි සහන සේවකයන් 17 දෙනෙකු ඝාතනය කිරීම.

[69] 2023 සැප්තැම්බර් 15 වැනි දින ගැසට් පත්‍රය II කොටස බලන්න (www.documents.gov.lk වෙත ප්‍රවේශ විය)

- **3 වෙනි සිදුවීම -** 2006 අගෝස්තු මස මුලදී සිදු වූවා යැයි පැවසෙන මුතූර්හි මුස්ලිම් ගම්වාසීන් ඝාතනය කිරීම සහ ගිලන්රථවලින් ප්‍රවාහනය කරමින් සිටි මුතූර්හි පුද්ගලයන් 14 දෙනෙකු වැලිකන්දේ දී ඝාතනය කිරීම.

- **4 වෙනි සිදුවීම -** 2005 දෙසැම්බර් 25 දින පාර්ලිමේන්තු මන්ත්‍රී ජෝසප් පරරාජසිංහම් මහතා ඝාතනය කිරීම.

- **5 වෙනි සිදුවීම -** 2006 ජනවාරි 2 හෝ එයට ආසන්න දිනයක ත්‍රිකුණාමලයේදී තරුණයන් පස් දෙනෙකු ඝාතනය කිරීම.

- **6 වෙනි සිදුවීම -** 2006 අගෝස්තු 12 වෙනි දින ශ්‍රී ලංකා සාම ලේකම් කාර්යාලයේ නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් කේතීෂ් ලෝගනාදන් ඝාතනය කිරීම.

- **7 වෙනි සිදුවීම -** 2006 අගෝස්තු මාසයේදී නද්දලමොට්ටන්කුලම් (සෙන්චෝලෙයි) හි පුද්ගලයන් 51 දෙනෙකු ගේ මරණය.

- **8 වෙනි සිදුවීම -** 2006 අගෝස්තු 28 වෙනි දින අල්ලෙපිඩි හි පිලිප් නේරි දේවස්ථානයේ පූජ්‍ය නිහාල් ජීම් බ්‍රවුන්ගේ අතුරුදහන් වීම.

- **9 වෙනි සිදුවීම -** 2006 ජූනි 17 දින පේසාලේ මුහුදු තීරයේදී සහ පේසාලේ දේවස්ථානයේදී ධීවරයින් පස් දෙනෙකු සහ තවත් පුද්ගලයෙකු ඝාතනය කිරීම.

- **10 වෙනි සිදුවීම -** 2006 මැයි 13 දින කයිට්ස් පොලිස් බල ප්‍රදේශයේ පුද්ගලයන් 13 දෙනෙකු ඝාතනය කිරීම.

- **11 වෙනි සිදුවීම -** 2006 සැප්තැම්බර් 17 දින පොතුවිල් පොලිස් බල ප්‍රදේශයේ රදැල්ලේදී මුස්ලිම් ගම්වැසියන් 10 දෙනෙකු ඝාතනය කිරීම.

- **12 වෙනි සිදුවීම -** 2006 ජූනි 15 වැනි දින කැබිතිගොල්ලෑවේදී පුද්ගලයන් 68 දෙනෙකු ඝාතනය කිරීම.

- **13 වෙනි සිදුවීම -** 2006 අප්‍රේල් 29 දින අවිස්සාවේල්ල ප්‍රදේශයෙන් හිස නැති මළ සිරුරු පහක් හමුවීමට අදාළ සිද්ධිය.

- **14 වෙනි සිදුවීම -** 2005 මැයි 29 දින වැලිකන්දේ දී පුද්ගලයින් 13 දෙනෙකු ඝාතනය කිරීම.

- **15 වෙනි සිදුවීම -** 2006 ඔක්තෝම්බර් 16 වන දින සීගිරිය දිගම්පතානේදී ආරක්ෂක අංශ සාමාජිකයින් 98 දෙනෙකු ඝාතනය කිරීම.

122. අධිකාර පත්‍රයේ උපලේඛනයෙහි නම් කර ඇති සිද්ධීන් 15 ට අමතරව, විමර්ශන කොමිෂන් සභාව පත් කිරීමෙන් කෙටි කලකට පසු, 2016 නොවැම්බර් 10 වන දින සිදු වූ පාර්ලිමේන්තු මන්ත්‍රී නඩරාජා රවිරාජ් මහතාගේ ඝාතනය එම උපලේඛනයේ 16 වෙනි සිද්ධිය ලෙස ඇතුළත් කරන ලදී.

• උදලාගම කොමිෂන් සභාව හමුවේ විභාගවන සිදුවීම් සම්බන්ධ විමර්ශනවල ප්‍රගතිය.

123. මෙම ජනාධිපති විමර්ශන කොමිෂන් සභාව විසින් ලබාගන්නා ලද උදලාගම කොමිෂන් සභා වාර්තාවට අනුව, සිද්ධීන් 16 ක් විමර්ශනය කිරීමට නියෝග කර තිබුණ ද, එම කොමිෂන් සභාවට විමර්ශනය කිරීමට හැකි වූයේ එම සිද්ධීන් 16 න් 7 ක් පමණි. ඉහත සඳහන් කළ සිදුවීම් ලැයිස්තුවට

අනුව විමර්ශනය කරන ලද සිදුවීම් 7 ට අදාළ අංක පහත සඳහන් පරිදි වේ: සිදුවීම් අංක 2, 3, 5, 7, 11, 12 සහ 15.

124. පහත සඳහන් සිදුවීම් 9, එනම් සිදුවීම් අංක 1, 4, 6, 8, 9, 10, 13, 14, සහ 16 සම්බන්ධයෙන් කොමිෂන් සභාවට ප්‍රසිද්ධ විභාග කිරීම් සිදු කිරීමට නොහැකි වූ අතර, එය එහි වාර්තාවේ මෙසේ සඳහන් කර ඇත: "ඉතිරි සිදුවීම් 9 සම්බන්ධයෙන් කොමිෂන් සභාවට නියම කර ඇති කාල සීමාව තුළ පරීක්ෂණ පැවැත්වීමට කොමිෂන් සභාවට නොහැකි තත්ත්වයක් තිබේ." උදලාගම කොමිෂන් සභාව සාක්ෂිකරුවන් නොමැතිකම සහ කාලය නොමැතිකම තම කාර්යය ඉටු කිරීමට නොහැකි වීමට හේතු ලෙස දක්වා ඇත. උදලාගම කොමිෂන් සභාව විසින් විමර්ශනය කරන ලද සිද්ධීන් අතරින්, අඛණ්ඩව අවධානයට ලක්වූ සිදුවීම් දෙකක් වන්නේ ACF නැමති රාජ්‍ය නොවන සංවිධනයේ සහන සේවකයන් ඝාතනය කිරීම (සිදුවීම් අංක 2) සහ ත්‍රිකුණාමලයේ තරුණයන් 5 දෙනෙකු ඝතනය කිරීම (සිදුවීම් අංක 5) ය.

125. ACF රාජ්‍ය නොවන සංවිධනයේ සහන සේවකයික් ඝාතනය කිරීමේ සිද්ධිය (සිදුවීම් අංක 2) - මෙම සිදුවීම සම්බන්ධයෙන් සාක්ෂි ලබා ගැනීමේ සැසි 100 ක් පවත්වා සාක්ෂිකරුවන්ගේ සාක්ෂි විභාග කළ ද, මෙම සිද්ධිය අඛණ්ඩව මහජන සහ ජාත්‍යන්තර වේදිකාවල අවධානයට ලක්ව ඇති අතර, එය "විශේෂණීය විමර්ශන" වලින් එකක් ලෙස වර්ගීකරණය කර ඇත.

126. ත්‍රිකුණාමලයේ කරුණයින් 5 දෙනෙකු ඝාතනය කිරීම (සිදුවීම් අංක 5) - 2006 ජනවාරි 2 වෙනි දින හෝ ඊට ආසන්න දිනයක ත්‍රිකුණාමලයේ දී තරුණයන් පස් දෙනෙකු ඝාතනය කිරීමේ සිද්ධිය දිගින් දිගටම සිරස්තලවලට හසු වූ සිද්ධියක් වන අතර, උදලාගම කොමිෂන් සභාවේ සිට මේ දක්වා එහි ගමන් මග මෙම අවසන් වාර්තාවේ 3 වන පරිච්ඡේදයේ II කොටසෙහි ඉදිරිපත් කර ඇත. 3 වන පරිච්ඡේදයේ II වන කොටසෙහි පූර්වගාමී කොමිෂන් සභා තුනම විසින් විමර්ශනය කරන ලද සිද්ධීන් සහ ඒවායේ නිර්දේශ විමසා බලනු ලැබේ.

127. උදලාගම කොමිෂන් සභාව විසින් විමර්ශනය කරන ලද එම "විශේෂණීය විමර්ශන" එනම් ACF සංවිධානයේ සහන සේවකයින් ඝාතනය කිරීමේ සහ ත්‍රිකුණාමලයේ තරුණයින් පස් දෙනා ඝාතනය කිරීමේ සිද්ධීන් විභාග කිරීම ඇතුළු විමර්ශන මෙම අවසන් වාර්තාවේ 3 වෙනි පරිච්ඡේදයේ II වෙනි කොටසෙහි සලකා බලනු ලැබේ.

128. උදලාගම කොමිෂන් සභාව සම්පත් හිඟය සහ දුර්වල යටිතල පහසුකම් පිළිබඳ දුක්ගැනවිලි ඉදිරිපත් කළ බව මේ අවස්ථාවේදී සඳහන් කිරීම වැදගත් වේ. විදේශීය සාක්ෂිකරුවන්ගේ සාක්ෂි සටහන් කර ගැනීමේදී පහසුකම් හා යටිතල පහසුකම් හිඟකම නිසා ගැටළු වලට මුහුණ දීමට සිදුවූ අවස්ථා සහ ශ්‍රව්‍ය දෘශ්‍ය සාක්ෂි ලබාගැනීමට සහ භාර ගැනීමට හැකිකරවන නීති නොමැතිවීම පරීක්ෂණ පැවැත්වීම සඳහා බාධාවක් වූ අවස්ථා පිළිබඳව උදලාගම කොමිෂන් සභාව විස්තර කරයි. ශ්‍රී ලංකාවෙන් පිටත දුර බැහැර ප්‍රදේශ වලින් සාක්ෂි ලබා ගැනීමේ දී පැවති දුෂ්කරතා සම්බන්ධ දුක්ගැනවිලි පිළිබඳව ද උදලාගම කොමිෂන් සභාවේ වාර්තාවේ විස්තර කර ඇත.[70] ප්‍රධාන සාක්ෂිකරුවන් කිහිප දෙනෙක් ඔවුන් සිටින ස්ථාන හෙළි නොකර විදේශ රටවල සිට වීඩියෝ සම්බන්ධතා ඔස්සේ උදලාගම කොමිෂන් සභාවට සාක්ෂි ලබා දුන්නේ ය. ත්‍රිකුණාමලයේදී තරුණයින් පස් දෙනෙකු ඝාතනය කිරීමේ සිද්ධියේ ඇතැම් සාක්ෂිකරුවන් විදේශ රටවල ජීවත් වන බැවින් ඒ සම්බන්ධයෙන් වීඩියෝ සම්මන්ත්‍රණ සැසි 6 ක් පැවැත්වූ බව උදලාගම කොමිසම සඳහන්

[70] 2005 අගෝස්තු 1 වැනි දින සිට සිදු වූයේ යැයි පැවසෙන බරපතල මානව හිමිකම් උල්ලංඝනය කිරීම් පිළිබඳ විමර්ශනය කිරීම සහ පරීක්ෂනය කිරීම සඳහා පත් කරන ලද විමර්ශන කොමිෂන් සභාවේ වාර්තාව, 10 වෙනි පිටුව බලන්න.

කරයි.[71] එම විදේශ රටවල සිට වීඩියෝ සම්මන්ත්‍රණ පැවැත්වීමට කීර්තිමත් පුද්ගලයන්ගේ ජාත්‍යන්තර ස්වාධීන කණ්ඩායම පහසුකම් සැලසුවේ ය. කෙසේ වෙතත්, 2008 මැයි මාසයේදී "විත්දිතයන් සහ සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීම" සම්බන්ධ පනත් කෙටුම්පතක් පාර්ලිමේන්තුව විසින් සම්මත කරන තෙක් එවැනි සාක්ෂි ලබා ගැනීම බැහැර කරන ලදී. මේ හේතුවෙන්, දිවි ගලවා ගත් විත්දිතයෙක් වන යෝගනාදන් පුන්කලලෝන්ගේ සාක්ෂි සටහන් කර ගැනීමට නොහැකි වූ බව උදලාගම කොමිෂන් සභාව පවසයි. මේ අනුව, එම විමර්ශනවල ප්‍රගතිය අඩාල වී ඇති බව පෙනෙනු ඇති අතර, පසුව පත් කරන ලද උගත් පාඩම් සහ ප්‍රතිසන්ධාන කොමිෂන් සභාව සහ පරණගම කොමිෂන් සභාව යන කොමිෂන් සභා දෙක ACF සහන සේවකයන් ඝාතනය කිරීමේ සිද්ධිය සහ ත්‍රිකුණාමලයේ තරුණයින් 5 දෙනෙකු ඝාතනය කිරීමේ සිද්ධිය නැවත විමර්ශනය කළ යුතු බවට ඔවුන්ගේ නිර්දේශ ඉදිරිපත් කළේ මේ හේතුව නිසා ය. උදලාගම කොමිෂන් සභාව විසින් සොයාගන්නා ලද කරුණු සහ නිගමනවලට අනුව පවා මෙම සිද්ධීන් දෙක තවදුරටත් විමර්ශනය කර අපරාධ වගකීම පිළිබඳ පරීක්ෂණය කළ යුතු බව සඳහන් කළ යුතු ය. 2008 වසරේ දී උදලාගම කොමිෂන් සභාවට ලැබුණු විදේශීය සාක්ෂිකරුවන්ගේ සාක්ෂි බැහැර කිරීමට හේතුව විත්දිතයන් සහ සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීම පිළිබඳ නීති සම්පාදනය කර නොතිබීම ලෙස පෙන්වා දුන්නද, 2015 වන තෙක් ම විත්දිතයන් සහ සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීමේ පනත් කෙටුම්පත ඉදිරිපත් නොවූ බව පෙන්වා දිය යුතුය. මෙය ද ත්‍රිකුණාමලයේ තරුණයින් 5 දෙනා ඝාතනය කිරීමේ සිද්ධියේ විමර්ශන අඩාල වීමට බලපෑ එක් හේතුවකි.

129. මෙතෙක් අවධානය යොමු කර නැති මෙම බහුවිධ නිර්දේශ සැලකිල්ලට ගැනීමේ දී, යෝජිත සත්‍ය සෙවීමේ කොමිෂන් සභාව විසින් විමර්ශන සහ පරීක්ෂණ සිදු කිරීම සඳහා මෙම සිදුවීම් දෙකට ප්‍රමුඛත්වය දිය යුතු බව මෙම ජනාධිපති විමර්ශන කොමිෂන් සභාවේ දැඩි මතය සහ නිර්දේශය වේ.[72]

130. උදලාගම කොමිෂන් සභාව තමන් විසින් ම 'විත්දිතයන්ට සහ සාක්ෂිකරුවන්ට සහාය දීමේ සහ ඔවුන් ආරක්ෂා කිරීමේ ඒකකයක්' පිහිටුවීමෙන් සහ බල ගැන්වීමෙන් සාක්ෂි ලබා ගැනීමේ ස්වකීය භාරදූර වගකීම නව්‍ය ආකාරයකට ඉටු කර තිබීම පැසසුමට ලක් කළ යුතු ය. 2015 පෙබරවාරි මාසයේදී පාර්ලිමේන්තුව විසින් 2015 අංක 4 දරන අපරාධයන විත්දිතයන් සහ සාක්ෂිකරුවන් හට සහාය දීමේ සහ ආරක්ෂා කිරීමේ පනත සම්මත කරන ලදී. මෙම පනත ප්‍රතිපත්තිමය වශයෙන් නිවැරදි දිශාව ඔස්සේ යොමු වූ ධනාත්මක පියවරක් වූ නමුත් සහ එමගින් ඇතැම් ගැටළු ආමන්ත්‍රණය කර තිබුණු නමුත්, එය ඵලදායී ආරක්ෂණ යාන්ත්‍රණයක් වනු පිණිස එයට සංශෝධන ගණනාවක් සිදු කිරීමට අවශ්‍ය විය. "2023 අංක 10 දරන අපරාධයන විත්දිතයන් සහ සාක්ෂිකරුවන් හට සහාය දීමේ සහ ආරක්ෂා කිරීමේ පනත" සම්මත කිරීමත් සමග ඉහත කී පනතේ තිබූ අඩුපාඩු නිවැරදි කර ඇති බවක් පෙනෙන්නට තිබේ.

131. මේ අවස්ථාවේ දී කීර්තිමත් පුද්ගලයන්ගේ ජාත්‍යන්තර ස්වාධීන කණ්ඩාය ගැන සඳහන් කිරීම යෝග්‍ය වේ.

• කීර්තිමත් පුද්ගලයන්ගේ ජාත්‍යන්තර ස්වාධීන කණ්ඩායම.

132. විමර්ශනවල සහ පරීක්ෂණවල විනිවිදභාවය සහතික කිරීම සඳහා සහ ඒවා මූලික ජාත්‍යන්තර ප්‍රමිතීන්ට හා සම්මතයන්ට අනුකූලව සිදු වන බව සහතික කිරීම සඳහා එම විමර්ශන සහ පරීක්ෂණ

[71] එම, I වෙනි කොටස, පි.13, - *හැඳින්වීම*: II වෙනි කොටස, පි.14, "සිදුවීම් අංක 5 - ත්‍රිකුණාමලයේ තරුණයන් පස් දෙනෙකු ඝාතනය කිරීම.

[72] මෙම අවසන් වාර්තාවේ 3 වෙනි පරිච්ඡේදයේ II වෙනි කොටසේ මෙම "සංකේතාත්මක විභාග කිරීම්" දෙක පිළිබඳ සාකච්ඡාව සහ 6 වෙනි පරිච්ඡේදයේ දී ඇති මෙම ජනාධිපති විමර්ශන කොමිෂන් සභාවේ නිර්දේශ බලන්න.

නිරීක්ෂණය කරන ලෙස 2007 ජනවාරි 12 වැනි දිනැති ලිපියක් මගින් එවකට ජනාධිපතිවරයා කීර්තිමත් පුද්ගලයන්ගේ ජාත්‍යන්තර ස්වාධීන කණ්ඩායමකට ආරාධනා කළේ ය. 2007 පෙබරවාරි මස මුලදී පැමිණි එම කීර්තිමත් පුද්ගලයන්ගේ ජාත්‍යන්තර ස්වාධීන කණ්ඩායම පහත සඳහන් අයගෙන් සමන්විත විය:

1. විනිසුරු පී.එන්. භග්වටි
2. ඇන්ඩ්‍රියැස් මොව්රොමැටිස් මහතා
3. ආචාර්ය කමල් හොසේන්
4. මර්සුකි දරුස්මාන් මහතා
5. මහාචාර්ය යොසෝ යොකොටා
6. මහාචාර්ය සී. ෆාසියර්
7. ශ්‍රීමත් නයිජල් රොඩ්ලි කේ.බී,ඊ.
8. ආතර් ඊ ඩේවි මහතා
9. මහාචාර්ය අයිවන් ෂියරර්
10. ආචාර්ය බaaස් මැතිව්ස්
11. ආචාර්ය බර්නාඩ් කුෂ්නර්

ආචාර්ය කුෂ්නර් ප්‍රංශ රජයේ අමාත්‍ය මණ්ඩලයේ අමාත්‍යවරයෙකු ලෙස පත්කරනු ලැබීමෙන් පසු ඒ වෙනුවට විනිසුරු පියරේ කොට් පත් කරන ලදී.

133. උදලාගම කොමිෂන් සභාවේ වාර්තාවට අනුව, 2007 පෙබරවාරි 11 සහ 12 යන දිනවල එම කොමිෂන් සභාවේ සභාපතිවරයා සමග පැවති රැස්වීමකදී පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් එම ජාත්‍යන්තර ස්වාධීන කණ්ඩායම දැනුවත් කරන ලදී: විමර්ශන කොමිෂන් සභාව පිහිටුවීම, නීතිපති දෙපාර්තමේන්තුවේ සහාය ලබා ගැනීම, විමර්ශන කොමිෂන් සභාවේ සංවිධාන ව්‍යුහය සහ කාර්යපටිපාටිමය රීති, විමර්ශන ඒකකය පිහිටුවීම, එහි ව්‍යුහය සහ කාර්ය පටිපාටි, චින්දිතයන් සහ සාක්ෂිකරුවන් හට සහාය දීමේ සහ ආරක්ෂා කිරීමේ ඒකකයක් පිහිටුවීම සහ එහි ව්‍යුහය සහ කාර්ය පටිපාටි සංවර්ධනය කිරීමේ අවශ්‍යතාවය, මහජනතාවගෙන්, රාජ්‍ය නොවන සංවිධානවලින් සහ අනෙකුත් අදාළ පාර්ශ්වවලින් තොරතුරු ඉල්ලා සිටීම, විමර්ශන වාර්තා සහ ලේඛන කැඳවීම, සහ පරීක්ෂණ කොමිෂන් සභා පනතෙහි ප්‍රතිඵලයක් ලෙස, සැසි වාර පැවැත්වීම සඳහා නියමිත ගණපූරණය නොමැති වීමෙන් විමර්ශන කොමිෂන් සභාව මුහුණ දෙන බාධාවන්.[73]

134. ස්වාධීන කීර්තිමත් පුද්ගලයින්ගේ කණ්ඩායමේ සාමාජිකයින්ට සහාය දීමේ කාර්යය සඳහා එක් එක් සමාජිකයාට සහායකයෙකු සිටි අතර, එම සාමාජිකයින් ස්වාධීන කීර්තිමත් පුද්ගලයින්ගේ ලේකම් කාර්යාලය තුළ ඔවුන්ගේ කටයුතු සිදු කළහ. කීර්තිමත් පුද්ගලයන්ගේ ස්වාධීන කණ්ඩායමේ කාර්යභාරය පිළිබඳව අදහස් දක්වමින් උදලාගම කොමිෂන් සභාව නිරීක්ෂණය කළේ පුද්ගලිකව එම විමර්ශන කොමිෂන් සභාවේ සාමාජිකයින් සහ එම ස්වාධීන පුද්ගලයින්ගේ කණ්ඩායම අන්තර්ක්‍රියා වලදී විශිෂ්ට සම්බන්ධතා පැවැත්වූ බව ය. එම කොමිෂන් සභාවේ කොමසාරිස්වරුන් මෙන්ම කොමිෂන් සභාවේ කාර්ය මණ්ඩලය ද කීර්තිමත් පුද්ගලයන්ගේ ස්වාධීන කණ්ඩායම විසින් කරන ලද ඉල්ලීම්වලට එකඟ වීමට මෙන්ම සහාය ලබා දීමට ද උපරිමයෙන් කටයුතු කළහ. විශේෂයෙන් ම, ජාතික භාෂාවලින් ලියා ඇති, විමර්ශන හා පරීක්ෂණවලට අදාළ සියලු ම ලියකියවිලි ඉංග්‍රීසි භාෂාවට පරිවර්තනය කර සපයා දෙන ලද අතර, නොවැළැක්විය හැකි හේතූන් නිසා ඇතැම් අවස්ථාවල දී ප්‍රමාදයන් සිදු විය.

[73] එම, පි.5

135. ඉහත සඳහන් කළ කරුණු කුමක් වුවද, උදලාගම කොමිෂන් සභාව තවදුරටත් මෙසේ පවසයි:

"කෙසේ වෙතත්, ආරම්භයේ සිට ම කීර්තිමත් පුද්ගලයින්ගේ ස්වාධීන කණ්ඩායම විමර්ශන කොමිෂන් සභාව නොදන්නා කවර හෝ හේතු මත, විමර්ශන කොමිෂන් සභාව සමග සුහද සම්බන්ධතා පවත්වා ගැනීමට හිතකර නොවන විවේචනාත්මක ආකල්පයක් පෙන්නුම් කළ අතර, එය ඔවුන්ගේ ප්‍රසිද්ධ ප්‍රකාශවලින් පිළිබිඹු විය".[74]

136. උදලාගම කොමිෂන් සභාව සහ කීර්තිමත් පුද්ගලයන්ගේ ස්වාධීන කණ්ඩායමේ සාමාජිකයන් අතර සම්බන්ධතාවය ආරම්භයේදී සුහදව පැවතිය ද, කාලය ගතවීමත් සමග එය පළුදු වූ බවක් පෙනෙන්නට තිබුණි. එම කොමිෂන් සභාවේ සාමාජිකයෙකු වන කේ.සී. ලෝගේස්වරන් එම සම්බන්ධතාවය පළුදුවීම වර්ධනය වීම සිය මතක සටහන් පොතේ මෙලෙස විස්තර කරයි:

"කීර්තිමත් පුද්ගලයන්ගේ ස්වාධීන කණ්ඩායම හුදු නිරීක්ෂකයින් විය යුතු බවත්, ඔවුන් උපදේශකයින්ගේ කාර්යභාරය ඉටු කිරීම යෝග්‍ය නොවන බව ඇතැම් සාමාජිකයින්ට හැඟී ගියේය. නීතිපති දෙපාර්තමේන්තුව ස්වාධීන කීර්තිමත් පුද්ගලයින්ගේ කණ්ඩායමට ඇති අකමැත්ත සඟවූවේ නැත. කීර්තිමත් පුද්ගලයන්ගේ ස්වාධීන කණ්ඩායම සහ ආයතන අතර පිරිහෙමින් පවතින සම්බන්ධතාවය පිළිබඳව රජය අවධානය යොමු කළේ නැත. කීර්තිමත් පුද්ගලයින්ගේ ස්වාධීන කණ්ඩායම ඉවත් කිරීමට බලපෑම ඇතිවූ විට, 2007 නොවැම්බර් මාසයේදී පැවති රැස්වීමකදී 2008 මාර්තු මාසයේ සිට සිය නිරීක්ෂක භූමිකාවෙන් ඉවත් වීමට එම ස්වාධීන කණ්ඩායම තීරණය කළේය. එය මාධ්‍ය හමුවක් පවත්වා ප්‍රසිද්ධ ප්‍රකාශයක් නිකුත් කළේය."[75]

137. කීර්තිමත් පුද්ගලයන්ගේ ස්වාධීන කණ්ඩායම විසින් ඉදිරිපත් කරන ලද ගැටළු කිහිපය අතරින් ප්‍රධාන ම කාරණය වූයේ නීතිපති දෙපාර්තමේන්තුවේ සේවාවන් ලබා ගැනීම එම කණ්ඩායම විසින් ළබැඳියා පිළිගැටුමක් ලෙස හැඳන්වීම වන අතර, උදලාගම කොමිෂන් සභාව විසින් එයට දක්වන ලද ප්‍රතිචාරය පදානුගතව පහත දක්වා ඇත:

සෑම විමර්ශන කොමිෂන් සභාවකට ම කොමිෂන් සභාවේ කටයුතු වලට සහාය වීම පිණිස නීතිපති දෙපාර්තමේන්තුවේ නීතිඥවරුන් සහභාගි කරවා ගැනීම මේ රටේ සිරිතකි. ඒ අනුව, මෙම කොමිෂන් සභාවට සහාය වීම සඳහා නිලධාරීන් කිහිප දෙනෙකු නම් කරන ලෙස මෙම විමර්ශන කොමිෂන් සභාව නීතිපතිවරයාගෙන් ඉල්ලා සිටියේය. එවන ලද නාමයෝජනා පත්‍ර අනුව විමර්ශන කොමිෂන් සභාව ඒවා හොඳින් පරීක්ෂා කර අවශ්‍ය අධ්‍යාපනික හා වෘත්තීය සුදුසුකම්, පළපුරුද්ද සහ ප්‍රවීණත්වය ඇති නිලධාරීන් පස් දෙනෙකු කොමිෂන් සභාවේ නීතිඥ මණ්ඩලයේ සාමාජිකයන් ලෙස තෝරා ගන්නා ලදී. විමර්ශන කොමිෂන් සභාව ඔවුන්ගේ වෘත්තීය හැකියාවන් සහ අවංකභාවය පිළිබඳව සෑහීමකට පත් විය. මෙම නිලධාරීන්ට කිසියම් විශේෂිත ආකාරයකින් කොමිෂන් සභාව තුළ කටයුතු කරන විට ඔවුන්ට කිසිදු පරමාධිකාර බලයක් නොමැති අතර, යුක්තියේ සහ සාධාරණත්වයේ යහපත වෙනුවෙන් ක්‍රියා නොකිරීමට ඔවුන්ට කිසිදු හේතුවක් නැත. අපරාධ පරීක්ෂණ පොලිස් නිලධාරීන්ගේ ව්‍යවස්ථාපිත කාර්යයක් බැවින් නීතිපති දෙපාර්තමේන්තුවේ නිලධාරීන් අපරාධ පරීක්ෂණවලට සහභාගි වන්නේ නැත. ශ්‍රී ලංකාවේ නීතිය හා පරිචය යටතේ, විමර්ශනයක් සිදු කෙරෙමින් පවතින අතරතුර දී නීතිපතිවරයා සහ ඔහුගේ නිලධාරීන් අපරාධ විමර්ශන නිලධාරීන්ට නීති උපදෙස් ලබා දීම පමණක් සිදු කරති. නීතිපතිවරයාගේ වෘත්තීය කාර්යය ආරම්භ වන්නේ අපරාධ නඩු පැවරීමේ කාර්යය සඳහා අපරාධ පරීක්ෂණ අවසන් වූ පසුව පමණි. විමර්ශන කොමිෂන් සභාව තුළ නීතිපති දෙපාර්තමේන්තුවේ

---

[74] උදලාගම කොමිෂන් සභාවේ වාර්තාව, පි.15 බලන්න.

[75] කෙ.සී. ලෝගේස්වරන්, *"මම ඒ සියල්ලට මුහුණ දුන්නෙමි: මගේ රාජ්‍ය සේවා වෘත්තියේ කථා (1960-2019); ජාත්‍යන්තර කීර්තිමත් පුද්ගලයන්ගේ ස්වාධීන කණ්ඩායමේ අවසන් ප්‍රසිද්ධ ප්‍රකාශය, 2008 අප්‍රේල් 15.*

නිලධාරීන් කොමිෂන් සභාවේ උපදෙස් අනුව සහ එහි අධීක්ෂණය යටතේ කටයුතු කරති. විමර්ශන කොමිෂන් සභාවේ විෂය පථය අනුව, නීතිපති දෙපාර්තමේන්තුවේ නිලධාරීන් සාක්ෂිකරුවන් ලෙස කැඳවීමේ අවශ්‍යතාවක් අපට නොපෙනෙයි. සිදු කරන ලද විමර්ශනවලදී ළබැඳියා ගැටුමක තත්ත්වයක් මතුව නැත. එමෙන්ම, කොමිෂන් සභාවට සහාය වීම සඳහා මෙම කොමිෂන් සභාව විසින් නිල නොවන නීතිඥ මණ්ඩලයේ කීර්තිමත් නීතිඥවරුන් දෙදෙනකුගේ සේවය ද ලබා ගන්නා ලදී.

විමර්ශන කොමිෂන් සභාව නීතිපති දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ගේ සේවය ලබා ගත යුතු යැයි සිතීමට තවත් හේතුවක් වූයේ විධිනියෝගය අනුව අවසානයේ දී විමර්ශන කොමිෂන් සභාවේ නිර්දේශ මත පදනම්ව නඩු පැවරීමට තීරණය කරන්නේ නීතිපතිවරයා වීම සහ මෙම මුල් අවධියේදී ම නීති උපදේශකයින් සම්බන්ධ කර ගැනීම ඔවුන්ගේ පසුකාලීන කාර්යභාරය පහසු කරනු ඇති බැවිනි.

විමර්ශන කොමිෂන් සභාව මෙම කරුණ සම්බන්ධයෙන් සොලිසිටර් ජෙනරාල්වරයා සමග සාකච්ඡාවක් පැවැත්වූ අතර, අපරාධ නඩු පැවරීම සම්බන්ධයෙන් නීතිපතිවරයා සම්පූර්ණයෙන් ම ස්වාධීන බවත්, එම ස්වාධීනත්වය පිළිබඳ උදාහරණ පවා සඳහන් කළ බවත් ඔහු පැහැදිලි කළේය. විමර්ශන කොමිෂන් සභාවට අවශ්‍ය යැයි හැඟෙන්නේ නම් තම නිලධාරීන් ඉවත් කර ගැනීමට ද නීතිපතිවරයා තවදුරටත් කැමැත්තෙන් සිටියේය. විමර්ශන කොමිෂන් සභාව දීර්ඝ වශයෙන් සාකච්ඡා කිරීමෙන් අනතුරුව කොමිෂන් සභාවේ කටයුතු සඳහා නීතිපතිවරයාගේ නිලධාරීන්ගේ සහාය තවදුරටත් ලබාගැනීමට ඒකමතිකව එකඟ විය. කෙසේ වෙතත්, නිල නොවන නීතිඥ මණ්ඩලයේ නීතිඥයින් ද පැමිණ සිටිනු ඇති අතර එම දෙමුහුන් ආකෘතිය පිළිගනු ලැබීය.

කීර්තිමත් පුද්ගලයන්ගේ ස්වාධීන කණ්ඩායම විසින් සිදු කරන ලද ප්‍රසිද්ධ ප්‍රකාශයන්හි දී පවා ඔවුන් මෙම කරුණ දිගින් දිගටම අවධාරණය කළ අතර, මෙරට නීති ව්‍යුහය තුළ නීතිපතිවරයාගේ තත්ත්වය ඔවුන් නිසි ලෙස වටහාගෙන නොමැති බව එයින් පෙන්නුම් කරයි.[76]

138. උදලාගම කොමිෂන් සභාවට නීතිපති දෙපාර්තමේන්තුවේ සාමාජිකයන්ගේ සේවය ඉවත් කිරීමට නිදහස තිබුණද, ඉහත සඳහන් කරන ලද හේතු සඳහන් කරමින් කොමිෂන් සභාව එම සාමාජිකයින් අඛණ්ඩව රඳවාගෙන සිටි අතර, නීතිපති දෙපාර්තමේන්තුවේ ඇතැම් සාමාජිකයින් කටයුතු ඉටු කිරීමේදී පෙන්නුම් කරන වෘත්තීයභාවය සහ නීතිමය විචක්ෂණභාවය කෙතරම් ඉහළ වුවත්, ජනාධිපති කොමිෂන් සභාව ඉදිරියේ එම දෙපාර්තමේන්තුවේ සාමාජිකයින් සාක්ෂි මෙහෙයවීම පිළිබඳ කනස්සල්ල පළවීම අසාමාන්‍ය දෙයක් නොවේ. ඔවුන්ගේ සේවාවන් ඉවත් කිරීම සඳහා ජනාධිපති කොමිෂන් භාවකට විවෘතව නිදහස පවතින අතර, කොමිෂන් සභාව ඉදිරියේ විභාග කිරීම් සිදු කිරීම සඳහා සහාය වීම පිණිස නීතිඥ සංගමයේ සාමාජිකයින්ගේ සේවය ලබා ගැනීමට බාධාවක් නොමැති බව ද පෙන්වා දිය යුතුය.

139. ස්වාධීන පුද්ගලයන්ගේ කණ්ඩායම ඔවුන්ගේ ප්‍රසිද්ධ ප්‍රකාශයන්හි දී ඉහත සඳහන් කරන ලද ගැටළුවට අමතරව වෙනත් කරුණු ද ඉදිරිපත් කර තිබූ අතර, උදලාගම කොමිෂන් සභාව සිය වාර්තාවෙන් ඒවාට පිළිතුරු දී ඇත. මතු කරන ලද ගැටළු සහ උදලාගම කොමිෂන් සභාව විසින් ඒවාට ලබා දෙන ලද ප්‍රතිචාර පහත දක්වා ඇත.

140. මතු කරන ලද ගැටළු විෂය අයිතම ලෙස පහත ඉදිරිපත් කර ඇති අතර, උදලාගම කොමිෂන් සභාවේ ඒවාට අනුරූප ප්‍රතිචාර පහතින් දී ඇත.

[76] එම, පි. 15 - 16

- **වින්දිතයන් සහ සාක්ෂිකරුවන් හට ඵලදායී ආරක්ෂාවක් නොමැතිකම (කීර්තිමත් පුද්ගලයින්ගේ ස්වාධීන කණ්ඩායම).**

උදලාගම කොමිෂන් සභාවේ ප්‍රතිචාරය

141. *"ශ්‍රී ලංකාවේ නීතිය යටතේ ක්‍රියාත්මකව පවතින සහ ඵලදායී වින්දිතයින් සහ සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීමේ වැඩසටහනක් නොමැති බව සත්‍යයකි. කීර්තිමත් පුද්ගලයින්ගේ ස්වාධීන කණ්ඩායම විධිනියෝගයෙහි කොන්දේසි වලට එකඟ වූ විට මෙම තත්ත්වය දැන සිටි අතර, අලුතින් නීති සම්පාදනය කිරීමට ද කාලය ගත වන බව ඔවුහු දැන සිටිති. කොමිෂන් සභාව එම නීති සම්පාදනය කිරීමේ අවශ්‍යතාවය ස්වකීය පාර්ශ්වයෙන් බලධාරීන්ගේ අවධානයට යොමු කළ අතර, 2008 ජූනි 6 වෙනි දින ඒ සම්බන්ධ පනත් කෙටුම්පතක් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී. කෙසේ වෙතත්, එය මෙතෙක් සම්මතවී නොමැති අතර, දීර්ඝ ප්‍රමාදයක් තිබෙන බව මෙම පරීක්ෂණ කොමිෂන් සභාව පිළිගන්නා නමුත්, කොමිෂන් සභාවට ඒ සම්බන්ධයෙන් කිසිදු ක්‍රියාමාර්ගයක් ගැනීමට හැකියාවක් නැත. එසේ වුවත්, 'වින්දිතයන්ගේ සහ සාක්ෂිකරුවන්ගේ ආරක්ෂාව' පිළිබඳ ඉහත කොටසේ විස්තර කර ඇති පරිදි සාක්ෂිකරුවන්ට යම් මට්ටමක ආරක්ෂාවක් සහ සහායක් ලබාදීම සඳහා මෙම විමර්ශන කොමිෂන් සභාව යම් යම් පියවර ගෙන ඇත. මෙම විමර්ශන කොමිෂන් සභාව සියලුම සාක්ෂිකරුවන්ගේ ගමන් වියදම් සහ දෛනික වියදම් සඳහා මුදල් සපයා දී තිබූ අතර, ඔවුන්ගෙන් ඇතමෙක් සැලකිය යුතු කාලයක් පුරා කොළඹ ආරක්ෂිත නිවාසවල තබා ගෙන සිට ඇත. කොමිසම පැත්තෙන් වීඩියෝ සම්මන්ත්‍රණ සංවිධානය කිරීම සඳහා දරන ලද වියදම් ද කොමිසම විසින් සපයා ඇත. නිලධාරීන්ට දීර්ඝ කාලීන පුහුණුවක් ලබා දිය හැක්කේ අදාළ නීති සම්පාදනය කිරීමෙන් පසු වින්දිතයින් සහ සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීමේ ජාතික අධිකාරිය සඳහා ස්ථිර කාර්ය මණ්ඩලයක් බඳවා ගත් විට පමණි.*[77]

- **කොමිෂන් සභාවේ කටයුතුවල විනිවිදභාවයක් සහ කාලානුරූපීභාවයක් නොමැතිකම (කීර්තිමත් පුද්ගලයන්ගේ ස්වාධීන කණ්ඩායම).**

උදලාගම කොමිෂන් සභාවේ ප්‍රතිචාරය.

142. *"මූලික පරීක්ෂණ සඳහා මහජනතාවට ප්‍රවේශයක් නොතිබූ නිසා විනිවිද භාවයක් නොමැති බව කීර්තිමත් පුද්ගලයන්ගේ ස්වාධීන කණ්ඩායම චෝදනා කළේය. කලින් සඳහන් කළ පරිදි මෙම විමර්ශන කොමිෂන් සභාව කරුණු දෙකක් සඳහා කාර්ය පටිපාටි රීතිවල 8 වැනි වගන්තිය යටතේ පරීක්ෂණ ආරම්භ කළේය. පළමුව, විධිනියෝගය යටතේ, මෙයට පෙර පොලිසිය විසින් සිදු කරන ලද පරීක්ෂණ ප්‍රමාණවත් නොවන බැවින් මෙම විමර්ශන කොමිෂන් සභාව විසින් අදාළ සිද්ධීන් විමර්ශනය කිරීම සහ පරීක්ෂණය කිරීම සිදු කළ යුතු අතර, දෙවනුව, පරීක්ෂණ කොමිෂන් සභා පනතේ විධිවිධාන අනුව, සියලුම සාමාජිකයින් විමර්ශනයට සහභාගී විය යුතුය. කීර්තිමත් පුද්ගලයන්ගේ ස්වාධීන කණ්ඩායම අන්‍යාකාරයෙන් සිතුවද, නීතිපතිවරයාගේ මෙන්ම විමර්ශන කොමිෂන් සභාවට සහාය වන ස්වාධීන නීතීඥවරයාගේද මතය වූයේ නීතිය පවතින ආකාරයටම ප්‍රසිද්ධ විමර්ශනවලදී සියලුම සාමාජිකයන් පැමිණ සිටිය යුතු බවයි. එමෙන්ම එසේ විය යුතු බවට ශ්‍රේෂ්ඨාධිකරණය ලබා දුන් තීන්දුවක් ද තිබේ. එම නිසා, ප්‍රසිද්ධ විමර්ශන ආරම්භ කිරීම සඳහා නීතිය සංශෝධනය කරන තෙක් බලා සිටීමට විමර්ශණ කොමිෂන් සභාව තීරණය කළේය. පරීක්ෂණ කොමිෂන් සභා පනත සංශෝධනය කිරීම පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද්දේ 2008 ජනවාරි මාසයේදී වන බැවින්, එය*

[77] එම, පි. 16-17

සම්මත වූ වහාම විමර්ශන කොමිෂන් සභාව ප්‍රසිද්ධ විමර්ශන සිදු කිරීම ආරම්භ කළ අතර එය සම්පූර්ණයෙන්ම විනිවිදභාවයෙන් යුක්ත විය; සිවිල් සමාජය පීඩාවට පත් පාර්ශ්වයන් වෙනුවෙන් පෙනී සිටියේය. පැහැදිලි කිරීම් කිහිපයක් සිදුකිරීමෙන් පසුව පවා, මෙම විමර්ශන කොමිෂන් සභාව මුහුණ දී ඇති නීතිමය බාධාව තේරුම් ගැනීමට කීර්තිමත් පුද්ගලයින්ගේ ස්වාධීන කණ්ඩායම අපොහොසත් වී ඇත.

ඉහත කොටසේ විස්තරාත්මකව පැහැදිලි කර ඇති වෙනත් හේතූන් නිසාද විමර්ශන ඉදිරියට සිදුකර ගෙන යාම ප්‍රමාද විය".[78]

- **රාජ්‍ය ආයතනවල පූර්ණ සහයෝගය නොමැතිකම (කීර්තිමත් පුද්ගලයින් ස්වාධීන කණ්ඩායම)**

උදලාගම කොමිෂන් සභාවේ ප්‍රතිචාරය

143. "පරීක්ෂණ කොමිෂන් සභාව විසින් කරන ලද ඉල්ලීම්වලට බොහෝ රාජ්‍ය සංවිධාන ඉතා ඉක්මනින් ප්‍රතිචාර දක්වා ඇත. වැරදි වැටහීම් හේතුවෙන් අවස්ථා එකක හෝ දෙකක ප්‍රමාදයන් සිදුවී ඇත. කෙසේ වෙතත්, විමර්ශන කොමිෂන් සභාව කරුණු පැහැදිලි කළ විට ඔවුන් සාධනීය ලෙස ප්‍රතිචාර දැක්වූහ. 8 වැනි වගන්තිය - විමර්ශන - සම්බන්ධයෙන් සැලකීමේ දී, තොරතුරු ලබාගැනීමේ ප්‍රමාදයන් ඇති වූ නමුත් ප්‍රසිද්ධ විමර්ශන ආරම්භවීමත් සමගම, සාක්ෂිකරුවන් එවීමට සහ තොරතුරු ලබාදීමට හමුදාව පූර්ණ සහයෝගය ලබාදී ඇත. ACF සංවිධානයේ සහන සේවකයන් 17 දෙනෙකු ඝාතනය කිරීමේ සිද්ධිය පිළිබඳ විමර්ශනයේ අවසාන භාගයේදී කීර්තිමත් පුදගලයින්ගේ ස්වාධීන කණ්ඩායමක් එහි සිටියේ නම්, යුද පෙරමුණේ සිට හමුදා නිලධාරීන් කොමිෂන් සභාවේ සිතාසිය අනුව කොමිෂන් සභාව ඉදිරියට පැමිණි ආකාර ඔවුන්ට දැකගත හැකි වනු ඇත. අධිකරණ සේවා කොමිෂන් සභාවේ උපදෙස් මත මහේස්ත්‍රාත්වරුන් සිතාසිවලට පිළිතුරු නොදුන් අවස්ථා දෙකක් තිබේ. අවශ්‍ය ක්‍රියාමාර්ග සඳහා මෙම කාරණය අදාළ බලධාරීන් වෙත යොමු කරන ලදී"[79]

- **කොමිෂන් සභාවේ මූල්‍ය ස්වාධීනත්වය නොමැතිකම (කීර්තිමත් පුද්ගලයින්ගේ ස්වාධීන කණ්ඩායම)**

උදලාගම කොමිෂන් සභාවේ ප්‍රතිචාරය

144. "මෙම විමර්ශන කොමිෂන් සභාවට මූල්‍ය ස්වාධීනත්වයක් නොතිබූ බවත්, ජනාධිපති ලේකම් කාර්යාලය හරහා මුදල් යෙදවූ බවත් සත්‍යයකි. මෙම විමර්ශන කොමිෂන් සභාව පිහිටුවීම තාවකාලික වැඩපිළිවෙලක් වීම නිසා රජයේ අයවැය යටතේ මේ සඳහා වෙනම ම වැය ශීර්ෂයක් වෙන් කිරීමට නොහැකි විය. ජනාධිපති ලේකම් කාර්යාලයේ ප්‍රධාන ගණන්දීමේ නිලධාරියා වන ජනාධිපති ලේකම්වරයා කොමිෂන් සභාවේ ඉල්ලීම්වලට සැමවිටම ඉඩ දුන් බැවින් ඒ සම්බන්ධයෙන් ඔහුට ස්තූතිය හිමිවිය යුතු අතර, එහෙත්, පහළ මට්ටම්වලදී රජයේ මුදල් රෙගුලාසි දැඩි ලෙස පිළිපැදීම හේතුවෙන් යම් යම් ප්‍රමාදයන් සහ අනවශ්‍ය විමසුම් ඇති වූ බව ද සඳහන් කළ යුතුය.

කීර්තිමත් පුද්ගලයින්ගේ ස්වාධීන කණ්ඩායමේ සහ විමර්ශන කොමිෂන් සභාවේ ඇතැම් වැරදි වැටහීම්වලට ප්‍රධාන වශයෙන් හේතු වී ඇත්තේ කීර්තිමත් පුද්ගලයින්ගේ ස්වාධීන කණ්ඩායම

[78] එම, පි.17

[79] එම, පි. 17

සැසිවාර බහුතරයක් සඳහා පැමිණ නොසිටීම සහ ඔවුන්ට බොහෝ දුරට ඔවුන්ගේ සහායකයින් විසින් සකස් කරන ලද වාර්තා මත යැපීමට සිදුවීමයි. ඇත්ත වශයෙන් ම, සැසිවාර පැවැත්වෙන විට කීර්තිමත් පුද්ගලයින්ගේ කණ්ඩායමෙන් අවම වශයෙන් එක් පුද්ගලයෙක් හෝ පැමිණ සිටිය යුතු බවට එක් අවස්ථාවකදී විමර්ශන කොමිෂන් සභාවේ සභාපතිවරයාට විනිසුරු භග්වටි ගෙන් ඉල්ලීමක් කිරීමට සිදු විය. ඇතැම් සහායකයින් ඔවුන්ගේ ක්ෂේත්‍රවල ඉතා දක්ෂ පුද්ගලයින් වූවාට සැකයක් නැත, නමුත් ඔවුන් දේශීය තත්ත්වයන් ගැන නොදැන සිටි අතර, ඔවුන් වෘත්තීයවේදීමය නොවන මාර්ගවලින් රැස් කරගන්නා ලද තහවුරු නොකළ බාහිර තොරතුරු මත යැපුණි. එක් ප්‍රසිද්ධ ප්‍රකාශයක් සම්බන්ධයෙන් විමර්ශන කොමිෂන් සභාව විසින් කරන ලද ප්‍රකාශයන් පිළිබඳව කීර්තිමත් පුද්ගලයන්ගේ කණ්ඩායම සාකච්ඡා කිරීමටත් පෙර සහායක නිලධාරීන් එය පුවත්පත්වලට නිකුත් කළ බව අනාවරණය විය. කීර්තිමත් පුද්ගලයින්ගේ ස්වාධීන කණ්ඩායම විසින් විමර්ශන කොමිෂන් සභාව පිළිබඳ සිදුකළ ප්‍රසිද්ධ විවේචනවල බලපෑම වූයේ කොමිෂන් සභාව කෙරෙහි මහජන විශ්වාසය බිඳ වැටීමයි. ජිනීවා මානව හිමිකම් කොමිෂන් සභාවේ සැසිවාරයට සමගාමීව මෙම ප්‍රසිද්ධ ප්‍රකාශ හිතාමතාම නිකුත් කර ඇති බවට නීතිපතිවරයා චෝදනා කර තිබේ.

ජාත්‍යන්තර කීර්තිමත් පුද්ගලයින් ස්වාධීන කණ්ඩායමක් විසින් මෙවැනි ජාතික කොමිෂන් සභාවක ක්‍රියාදාමයන් නිරීක්ෂණය කිරීම ජාත්‍යන්තර නීතියේ වංශකථාවේ පෙර නොවූ විරූ අත්හදා බැලීමකි. විත්දිතයින් සහ සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීමේ ඵලදායී යාන්ත්‍රණයක් වැනි අවශ්‍ය යටිතල පහසුකම් නොමැතිව එවැනි කාර්යයක් සිදු කිරීම අභියෝගාත්මක ව්‍යායාමයකි. මෙම කොමිෂන් සභාවට ක්‍රියාත්මක වීමට සිදුවී ඇත්තේ කවර බාධාකාරී තත්ත්වයන් යටතේද යන්න තේරුම් ගැනීමට කීර්තිමත් පුද්ගලයන්ගේ ස්වාධීන කණ්ඩායම උත්සාහ කළේ නම්, සහ ඔවුන් එකඟතාවයකින් කටයුතු කළේ නම් මෙම කොමිෂන් සභාවේ දැත් ශක්තිමත් වීමට ඉඩ තිබුණි. ඒ වෙනුවට ඔවුන් සතුරු ආකල්පයක් අනුගමනය කර, නියමිත කාලය අවසන් වීමටත් පෙර පිටව ගිය අතර, ඇතැම්විට එය ඔවුන්ගේ සහායකයින්ගේ උපදෙස් මත ඔවුන් නොමග ගිය නිසා විය හැක.

145. විමර්ශන යාන්ත්‍රණයන්ට සිදු කරන ඕනෑම ජාත්‍යන්තර මැදිහත්වීමකට පැහැදිලිව නිර්වචනය කරන ලද සහ සීමා කරන ලද කාර්යභාරයක් ලබා දිය යුතු බව සහතික කිරීමේ වැදගත්කම මෙම කීර්තිමත් පුද්ගලයින්ගේ ස්වාධීන කණ්ඩායම සම්බන්ධ අත්දැකීම් වලින් මනාව පැහැදිලි වන අතර, මෙම ජනාධිපති විමර්ශන කොමිෂන් සභාව මෙම අවසන් වාර්තාවේ 6 වෙනි පරිච්ඡේදයේ ඒ සම්බන්ධ ස්වකීය නිර්දේශය ඉදිරිපත් කරයි.[80]

146. උදලාගම කොමිෂන් සභාව ස්වකීය අවසන් වාර්තාව 2009 මැයි මාසයේ දී ජනාධිපතිවරයා වෙත ඉදිරිපත් කරන ලද අතර, විමර්ශනය කරන ලද "සංකේතාත්මක විභාග කිරීම්" සම්බන්ධයෙන් එම කොමිෂන් සභාවේ ඇතැම් නිර්දේශ මෙම අවසන් වාර්තාවේ 3 වන පරිච්ඡේදයේ II වෙනි කොටසෙහි සලකා බලනු ලැබේ.

147. ඉහත සඳහන් කර ඇත්තේ පූර්වගාමී කොමිෂන් සභාවල බලතල සහ ඒවා සම්බන්ධ නිරීක්ෂණ සහ ඒවායෙහි කටයුතු පිළිබඳ සංක්ෂිප්ත සාකච්ඡාවකි.

148. මෙම ජනාධිපති විමර්ශන කොමිෂන් සභාව පූර්වගාමී විමර්ශන කොමිෂන් සභා විසින් සොයාගන්නා ලද කරුණු සහ ඒවායෙහි නිර්දේශ විමසා බැලීම සඳහා දැන් 3 වන පරිච්ඡේදය වෙත යයි.

[80] එම, උදලාගම කොමිෂන් සභා වාර්තාවේ II වෙනි කොටසේ පි. 17- 18

3 වෙනි පරිච්ඡේදය

පූර්වගාමී විමර්ශන කොමිෂන් සභා සහ කමිටුවල සොයාගැනීම් සහ නිර්දේශ.

I කොටස: හැඳින්වීම

149. මෙම පරිච්ඡේදයේ දී මෙම ජනාධිපති විමර්ශන කොමිෂන් සභාව ජාත්‍යන්තර මානුෂීය නීතිය සහ ජාත්‍යන්තර මානව හිමිකම් නීතිය පිළිබඳ ගැටළුවලට අදාළව පූර්වගාමී විමර්ශන කොමිෂන් සභා තුනෙහි සොයාගැනීම් සහ නිර්දේශ සාකච්ඡා කරයි. මෙම ක්‍රියාවලියේ දී, පෙර පැවති ඕනෑම කොමිෂන් සභාවක් විසින් විමර්ශනය කරන ලද ගැටළු පිළිබඳව විමර්ශනය කර ඇති යුද හමුදා විමර්ශන අධිකරණය[81] වැනි ඕනෑම කමිටුවක් විසින් සොයාන්නා ලද කරුණු කෙරෙහි මෙම පරිච්ඡේදයේ දී අවධානය යොමු කරනු ලැබේ.

150. පූර්වගාමී කොමිෂන් සභා විසින් ඉදිරිපත් කරන ලද නිර්දේශ ක්‍රියාවට නැංවීමේ තත්ත්වය පිළිබඳව සොයා බැලීමට ද මෙම ජනාධිපති විමර්ශන කොමිෂන් සභාවට නියම කර ඇති බව නැවත සඳහන් කිරීම අවශ්‍ය නොවේ. ඉදිරි මග සම්බන්ධයෙන් ස්වකීය නිර්දේශ ඉදිරිපත් කිරීම ද ජනාධිපති විමර්ශන කොමිෂන් සභාවේ වගකීම වන බව එහි විධිනියෝගයෙහි තවදුරටත් සඳහන් කර ඇත. කෙටියෙන් සඳහන් කරන්නේ නම්, පෙර ඉදිරිපත් කර ඇති නිර්දේශ ඵලදායී ලෙස ක්‍රියාත්මක කර නොමැති නම්, ඒවා ක්‍රියාත්මක කිරීම සඳහා ඉදිරි පියවර ගත හැක්කේ කෙසේද යන්න පිළිබඳව ස්වකීය නිර්දේශ ඉදිරිපත් කිරීමට මෙම ජනාධිපති විමර්ශන කොමිෂන් සභාව බැඳී සිටියි. ඉහත සඳහන් කළ සොයාගැනීම් සහ නිර්දේශවලට අදාළව දැනට ක්‍රියාත්මක වෙමින් පවතින ක්‍රියාමාර්ග තිබේ නම්, ඒවා මෙම වාර්තාවේ සඳහන් කරන ලෙස ද මෙම ජනාධිපති විමර්ශන කොමිෂන් සභාවට නියම කර ඇත.[82] මෙම ජනාධිපති විමර්ශන කොමිෂන් සභාව දැනටමත් නිරීක්ෂණය කර ඇති පරිදි, මෙහි නිර්දේශ සකස්වීය යුත්තේ අනිවාර්යයෙන් ම සාක්ෂිකරුවන්ගේ සාක්ෂි සහ කොමිෂන් සභාව ඉදිරියේ තබා ඇති අතිවිශාල කරුණු ප්‍රමාණයක් තුළින් ය.[83] කොළඹ සහ උතුරු සහ නැගෙනහිර පළාත්වල විභාග කිරීම් මහජනතාවට විවෘතව තිබූ අතර, මහජනතාවට කරන ලද දැනුම්දීම් මත සාක්ෂිකරුවන් කිහිප දෙනෙක් මෙම ජනාධිපති විමර්ශන කොමිෂන් සභාව ඉදිරියට පැමිණ සාක්ෂි ලබා දුන්හ.[84] එම සාක්ෂිකරුවන්ගෙන් සමහරෙක් ඔවුන්ගේ ප්‍රකාශ සනාථ කිරීම සඳහා ලිඛිත කරුණු ද මෙම කොමිෂන් සභාවට ඉදිරිපත් කළහ.

151. පූර්වගාමී කොමිෂන් සභා ඒවායෙහි වාර්තාවල සොයාගැනීම් සහ නිර්දේශ ලෙස ඉදිරිපත් කර ඇති දේ සුරක්ෂිත කර තැබීමක් ලෙස සඳහන් කිරීමට මෙම පරිච්ඡේදයේ දී උත්සාහයක් දරන අතර, යෝග්‍ය යැයි සිතන අවස්ථාවල මෙම ජනාධිපති විමර්ශන කොමිෂන් සභාව එම සොයාගැනීම් සහ නිර්දේශ පිළිබඳව ස්වකීය නිරීක්ෂණ ඉදිරිපත් කරන බව ප්‍රකාශ කිරීමට ද මෙම ජනාධිපති විමර්ශන කොමිෂන් සභාව අපේක්ෂා කරයි.

---

[81] මෙම අවසන් වාර්තාවේ 1 වන පරිච්ඡේදයේ 43 වෙනි ඡේදය බලන්න.

[82] 2021 ජනවාරි 31 දිනැති අංක 2211/55 දරන ගැසට් නිවේදනයේ ප්‍රකාශයට පත් කර ඇති මෙම ජනාධිපති විමර්ශන කොමිෂන් සභාවේ විධිනියෝගය බලන්න.

[83] මෙම අවසන් වාර්තාවේ 1 වන පරිච්ඡේදයේ 'ක්‍රමවේදය' බලන්න.

[84] මෙම කොමිෂන් සභාව ඉදියේ සාක්ෂි ලබා දුන් සාක්ෂිකරුවන්ගේ ලැයිස්තුවක් මෙම අවසන් වාර්තාවේ ඇමුණුම 1 ලෙස ඉදිරිපත් කර ඇත.

152. මුලින් ම, ජාත්‍යන්තර මානුෂීය නීතිය සහ ජාත්‍යන්තර මානව හිමිකම් නීති උල්ලංඝනය කිරීම් සම්බන්ධයෙන් උගත් පාඩම් සහ ප්‍රතිසන්ධාන කොමිෂන් සභාව විසින් සොයාගන්නා ලද කරුණු සහ එහි නිර්දේශ සම්බන්ධයෙන් මෙම ජනාධිපති විමර්ශන කොමිෂන් සභාව අවධානය යොමු කරන අතර, ඉන් අනතුරුව ජාත්‍යන්තර මානුෂීය නීතිය සහ ජාත්‍යන්තර මානව හිමිකම් නීති උල්ලංඝණය කිරීම් පිළිබඳව පරණගම සහ උදලාගම යන කොමිෂන් සභා දෙකෙහි සොයාගැනීම් සහ නිර්දේශ සලකා බලනු ලැබේ.

153. මෙම පරිච්ඡේදයට ප්‍රස්තුත වන්නේ ජාත්‍යන්තර මානුෂීය නීතිය සහ ජාත්‍යන්තර මානව හිමිකම් නීති වන බැවින්, මෙම ජනාධිපති විමර්ශන කොමිෂන් සභාව ඒ සම්බන්ධ සම්මත සංකල්ප පිළිබඳ සාකච්ඡාවකින් මෙම පරිච්ඡේදය ආරම්භ කරයි.

154. මෙම ජනාධිපති විමර්ශන කොමිෂන් සභාව පහත සඳහන් ගිවිසුම් යටතේ ජාත්‍යන්තර මානුෂීය නීති බැඳීම් පිළිබඳ අවබෝධයක් ලබා ගනී.

(අ). ජිනීවා සම්මුති I, II, III, IV
(ආ). අමතර කෙටුම්පත් I, II, III
(ඇ). හේග් සම්මුතීන් I සහ II
(ඈ). සාම්ප්‍රදායික අවිආයුධ පිළිබඳ සම්මුතිය සහ කෙටුම්පත් පහ, 1980
(ඉ). පුද්ගල නාශක බිම්බෝම්බ තහනම් කිරීම පිළිබඳ ඔටාවා සම්මුතිය, 1997
(ඊ). සන්නද්ධ ගැටුමක් ඇති වූ විට සංස්කෘතික දේපළ ආරක්ෂා කිරීම පිළිබඳ සම්මුතිය සහ එහි අමතර කෙටුම්පත්
(උ). සන්නද්ධ ගැටුම්වලට ළමයින් සම්බන්ධ කිරීම පිළිබඳ විකල්ප කෙටුම්පත.

155. ශ්‍රී ලංකාව ඉහත සඳහන් කළ ජාත්‍යන්තර මානුෂීය නීති සාධනපත්‍ර අතරින් I වෙනි අමතර කෙටුම්පත සහ II වෙනි අමතර කෙටුම්පත වැනි සමහරක් අපරානුමත කර නොමැති වුවද, ඒවායෙහි සම්භවය පවතින්නේ සම්ප්‍රදායික ජාත්‍යන්තර නීතියේ වන බැවින්, සාම්ප්‍රදායික ජාත්‍යන්තර නීතියෙහි ඒවායෙහි ඔප්පු කළ හැකි බව නිසා, ශ්‍රී ලංකාව එම සාධනපත්‍රවලට බැඳී ඇත.[85] ජාත්‍යන්තර මානුෂීය නීති අවශ්‍යතා පිළිබඳ ප්‍රකාශ කර ඇති පරණගම කොමිෂන් සභාවේ විධිනියෝගය මෙන් නොව, උගත් පාඩම් සහ ප්‍රතිසන්ධාන කොමිෂන් සභාවේ විධිනියෝගයෙහි ජාත්‍යන්තර මානුෂීය නීතිය පිළිබඳ කිසිදු සඳහනක් කර නොතිබුණු නමුත්, උගත් පාඩම් සහ ප්‍රතිසන්ධාන කොමිෂන් සභාව ජාත්‍යන්තර නොවන සන්නද්ධ ගැටුම්වලට අදාළ ජාත්‍යන්තර මානුෂීය නීති මූලධර්ම පිළිබඳව බහුල ලෙස සඳහන් කර ඇති බව සැලකිල්ලට ගත යුතු කරුණකි.

156. ශ්‍රී ලංකාවේ ජාත්‍යන්තර මානව හිමිකම් බැඳීම් සම්බන්ධයෙන් සැලකීමේ දී, මෙම ජනාධිපති විමර්ශන කොමිෂන් සභාව ජාත්‍යන්තර ගිවිසුම් මගින් ස්ථාපනය කර ඇති මානව හිමිකම් සම්මතයන් සහ යාන්ත්‍රණ සම්බන්ධයෙන් ශ්‍රී ලංකාවේ ඇති බැඳීම් ද සැලකිල්ලට ගනියි. ශ්‍රී ලංකාව පහත සඳහන් ප්‍රධාන සම්මුති හතෙහි පාර්ශවකරුවෙකු වන අතර, ඒවා විවිධ කාල රාමු වලදී අපරානුමත කර ඇත:

(අ). සියලු ආකාරයේ වාර්ගික වෙනස්කොට සැලකීම් තුරන් කිරීම පිළිබඳ ජාත්‍යන්තර සම්මුතිය (1965) (අපරානුමත කිරීම / පිළිගැනීම - 1982 පෙබරවාරි 18).

(ආ). සිවිල් සහ දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර සම්මුතිය (1966) (1980 ජූනි 11). (පිළිගැනීම 1980 ජූනි 11).

[85] සාම්ප්‍රදායික ජාත්‍යන්තර මානුෂීය නීතිය පිළිබඳ අන්තර්ජාතික රතුකුරුස සංවිධානයේ අධ්‍යයනය, 2005.

(ඇ). ආර්ථික, සමාජීය සහ සංස්කෘතික අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර සම්මුතිය (1966) (පිළිගැනීම - 1980 ජූනි 11).

(ඈ). කාන්තාවන්ට එරෙහි සියලු ආකාරයේ වෙනස්කොට සැලකීම් තුරන් කිරීම පිළිබඳ සම්මුතිය (1979) (පිළිගැනීම - 5 ඔක්තෝබර් 1981).

(ඉ). වධදීමට සහ අනිකුත් කෲර, අමානුෂික හෝ නින්දිත සැලකීමට හෝ දඬුවම්වලට එරෙහි වූ සම්මුතිය (1984) (පිළිගැනීම - 1994 ජනවාරි 3).

(ඊ). ළමා අයිතිවාසිකම් පිළිබඳ සම්මුතිය (1989) (පිළිගැනීම - 1991 ජූලි 12).

(උ). බලහත්කාරයෙන් අතුරුදහන් කිරීම් වලින් සියලු පුද්ගලයන් ආරක්ෂා කිරීම සඳහා වූ සම්මුතිය (අපරානුමත කිරීම - 2016 මැයි 25).

157. ජාත්‍යන්තර නොවන සන්නද්ධ ගැටුම සැලකීමේ දී, ජාත්‍යන්තර මානුෂීය නීතිය යටතේ බැඳීම් II වෙනි අමතර කෙටුම්පතෙහි සහ 3 වෙනි පොදු වගන්තියෙහි සිට ජිනීවා සම්මුතීන් දක්වා වන ගිවිසුම් වලින් පමණක් නොව, ඉහත සඳහන් කර ඇති ජාත්‍යන්තර මානුෂීය නීති ගිවිසුම් වලින් ද පැන නගින බව නිරීක්ෂණය කිරීම අදාළ වේ. ජිනීවා සම්මුතීන් අතරින් "ඉතා කුඩා ස්වරූපයේ සම්මුතියක්" ලෙස හඳුන්වනු ලබන 3 වෙනි පොදු වගන්තිය, II වෙනි අමතර කෙටුම්පත සහ අනෙකුත් ජාත්‍යන්තර මානුෂීය නීති ගිවිසුම් සම්ප්‍රදායික ජාත්‍යන්තර නීතිය නියෝජනය කරන අතර[86] ඉහත සඳහන් කළ පරිදි, ජාත්‍යන්තර මානුෂීය නීතියේ සහ ජාත්‍යන්තර මානව හිමිකම් නීතියේ ඇතැම් මූලික මූලධර්ම උගත් පාඩම් සහ ප්‍රතිසන්ධාන කොමිෂන් සභාවේ[87] සහ පරණගම කොමිෂන් සභාවේ වාර්තාවලට[88] බොහෝ සෙයින් වැදගත් වේ.

158. ජාත්‍යන්තර මානුෂීය නීති මූලධර්ම පරිපූර්ණ ලෙස සැලකීම සඳහා ඇතැම් කැපී පෙනෙන ලක්ෂණ දැක්වීම මෙහිදී අදාළ වේ.

(1) *ජාත්‍යන්තර මානුෂීය නීතිය* - ජාත්‍යන්තර මානුෂීය නීතිය හෙවත් යුද්ධයේ නීතිය යනු සන්නද්ධ ගැටුමකදී ගැටුමට සම්බන්ධ වන රාජ්‍යයන්හි සහ පුද්ගලික සහභාගිවන්නන්ගේ හැසිරීම නියාමනය කිරීම සහ මිනිසුන් සහ දේපළ ආරක්ෂා කිරීම අරමුණු කරගත් ජාත්‍යන්තර නීති පද්ධතියකි. මෙම නීතිය මගින් අරමුණු දෙකක් තුලනය කිරීමට උත්සාහ කරයි: සන්නද්ධ ගැටුම අඛණ්ඩව පවත්වාගෙන යාම සඳහා රාජ්‍යයක (හෝ රාජ්‍ය නොවන ක්‍රියාකාරීන්ගේ) සන්නද්ධ හමුදාවන්හි අවශ්‍යතා සහ එදිරිවාදිකම්වලට සෘජුව ම සම්බන්ධ නොවන තවදුරටත් සම්බන්ධ නොවන අය (නැත හොත්, සටන් වලින් බැහැරව සිටින අය) ආරක්ෂා කිරීම සඳහා ඇති මානුෂීය අවශ්‍යතාවය.

(2) 1949 ජිනීවා සම්මුතිය - මේවා යුද්ධයේ කෲරත්වය සීමා කරන වඩාත්ම වැදගත්ම නීති අඩංගු වන ජාත්‍යන්තර ගිවිසුම් වේ. ඒවා සංඛ්‍යාවෙන් 4කි:

I වෙනි ජිනීවා සම්මුතිය - ක්ෂේත්‍රයේ සිටින හමුදාවල තුවාල වූ සහ අසනීප වූ අය.

II වෙනි ජිනීවා සම්මුතතිය - මුහුදේ සිටින සන්නද්ධ හමුදාවන්හි තුවාල ලැබූ, රෝගීවූ සහ මුහුදුබත් වූ යාත්‍රාවල සිටින සාමාජිකයින්.

---

[86] එම

[87] *උගත් පාඩම් සහ ප්‍රතිසන්ධාන කොමිෂන් සභා වාර්තාවේ 4 වන පරිච්ඡේදයේ 'ජාත්‍යන්තර මානුෂීය නීතියේ මූලධර්ම'* යන මාතෘකාව යටතේ I වෙනි කොටස බලන්න; පි. 42 - 50 .

[88] *නීති රාමුව නමැති දෙවන විධිනියෝගය පිළිබඳ පරණගම වාර්තාවේ 6 වන පරිච්ඡේදය බලන්න*

III වෙනි ජිනීවා සම්මුතිය - යුධ සිරකරුවන්ට සැලකීම.

IV වෙනි - යුධ කාලවලදී සිවිල් පුද්ගලයින් ආරක්ෂා කිරීම.

(3) *අමතර කෙටුම්පත්* - ජිනීවා සම්මුතීන් සම්මත වීමෙන් පසුව, ජාත්‍යන්තර නොවන සන්නද්ධ ගැටුම්වල සහ ජාතික විමුක්තිය සඳහා වන යුද්ධ සංඛ්‍යාවෙහි වැඩි වීමක් ලෝකය පුරා ඇති විය. එයට ප්‍රතිචාර වශයෙන්, 1949 ජිනීවා සම්මුතීන් හතරට අමතරව කෙටුම්පත් දෙකක් 1977 වර්ෂයේ දී සම්මත කරන ගන්නා ලදී. ඒවා ජාත්‍යන්තර (I වෙනි කෙටුම්පත) සහ ජාත්‍යන්තර නොවන (II වෙනි කෙටුම්පත) සන්නද්ධ ගැටුම්වල වින්දිතයන්ගේ ආරක්ෂාව ශක්තිමත් කරන අතර, යුද්ධ සිදු කරන ආකාරය පිළිබඳ සීමා පනවයි. II වෙනි කෙටුම්පත යනු ජාත්‍යන්තර නොවන සන්නද්ධ ගැටුම් තත්වයන් සඳහා ම පමණක් සකස් කරන ලද මුල්ම ජාත්‍යන්තර ගිවිසුමයි.

(4) සාම්ප්‍රදායික ජාත්‍යන්තර මානුෂීය නීතිය[89] - එය නීතිය (අයිතිවාසිකම හෙවත් අවශ්‍යතාවය) ලෙස පිළිගත් සාමාන්‍ය පිළිවෙත තුළින් පැන නගින් රීති වලින් සමන්විත වන අතර, ගිවිසුම් නීතියෙන් ස්වාධීනව පවතියි. සම්ප්‍රදායික ජාත්‍යන්තර නීතිය වර්තමාන සන්නද්ධ ගැටුම් වලදී අතිශය වැදගත් වේ. එය ජාත්‍යන්තර සහ ජාත්‍යන්තර නොවන යන වර්ග දෙකෙහිම ගැටුම් සම්බන්ධයෙන් ගිවිසුම් නීතියෙහි ඇති අඩුපාඩු සම්පූර්ණ කරයි. මෙම ක්‍රියාවලියේදී, *එය වින්දිතයින්ට ලබා දෙන ආරක්ෂාව ශක්තිමත් කරයි. සාම්ප්‍රදායික ජාත්‍යන්තර නීතියේ ඇති බැඳීම් ස්වභාවය පිළිබඳ උදාහරණයක් වන්නේ ජාතික සහ ජාත්‍යන්තර අධිකරණ සහ විනිශ්චය සභා විසින් එම නීතිය යොදා ගැනීමයි. රාජ්‍යයන් අතර සිදුවන සන්නද්ධ ගැටුම් නියාමනය කරන බැවින්, ගිවිසුම හෝ ව්‍යවහාර වේවා, ජාත්‍යන්තර මානුෂීය නීතිය යටතේ තත්ත්වය ද ඒ හා සමාන වේ.*

(5) *ජිනීවා සම්මුතීන් බරපතල ලෙස කඩ කිරීම්* - ජිනීවා සම්මුති පද්ධතිය තුළ, ඉතාමත් ම දැඩි ලෙස යුද නීති උල්ලංඝනය කිරීම් 'බරපතල උල්ලංඝනය කිරීම්' ලෙස හඳුන්වනු ලබන අතර, ඒවා පිළිවෙළින් 1949 ජිනීවා සම්මුති හතරෙහි 50, 51, 130 සහ 147 වෙනි වගන්තිවල මෙන්ම, I වෙනි අමතර කෙටුම්පතෙහි 11 වෙනි සහ 85 වෙනි වගන්තිවල ද අඩංගු වේ. ඒවාට ජීව විද්‍යාත්මක අත්හදා බැලීම් ඇතුළුව හිතාමතා ඝාතනය කිරීම, වධහිංසා පැමිණවීම හෝ අමානුෂික ලෙස සැලකීම, හිතාමතාම ශරීරයට හෝ සෞඛ්‍යයට දැඩි පීඩාවන් හෝ බරපතළ හානි සිදු කිරීම, හමුදාමය අවශ්‍යතාවයෙන් සාධාරණීය නොවන සහ නීති විරෝධී සහ නිකරුණේ සිදු කරනු ලබන පුළුල් දේපළ විනාශ කිරීම සහ අත්පත් කර ගැනීම ඇතුළත් වේ.

[89] 2005 වර්ෂයේ දී, පුළුල් ලෙස පර්යේෂණ සිදු කිරීමෙන් පසුව සහ ප්‍රවීණයන් සමග පුළුල් ලෙස සාකච්ඡා කිරීමෙන් පසුව, සාම්ප්‍රදායික ජාත්‍යන්තර මානුෂීය නීතිය පිළිබඳ අධ්‍යයනය ප්‍රකාශයට පත් කරන ලදී.

ජාත්‍යන්තර නොවන සන්නද්ධ ගැටුම් සඳහා අදාළ වන ජාත්‍යන්තර මානුෂීය නීති මූලධර්ම

159. ජාත්‍යන්තර නොවන සන්නද්ධ ගැටුමක දී අදාළ වන ජාත්‍යන්තර මානුෂීය නීතිය ස්වෛරීභාවය පිළිබඳ සංකල්පය සහ මානුෂීය ගැටළු අතර සම්මුතියක ප්‍රතිඵලයකි. අභ්‍යන්තර සන්නද්ධ ගැටුමක දී අවම වශයෙන් එක් පාර්ශ්වයක් හෝ රාජ්‍යයක් නොවේ; එය සාමාන්‍යයෙන් රජය පෙරලා දැමීමට අරමුණු කරගත් කැරලිකාර කණ්ඩායමක් හෝ ස්වයං පාලනයක් හෝ වෙන්වීමක් සඳහා සටන් කරන කැරලිකාර ව්‍යාපාරයක් වේ. පුද්ගලයින් ප්‍රචණ්ඩ ක්‍රියාවලට සක්‍රීයව සම්බන්ධ වුවත් නැති වුවත්, එදිරිවාදිකම්වල බලපෑමෙන් එම පුද්ගලයන්ව ආරක්ෂා කරන ජාත්‍යන්තර නීතියෙන් ඔබ්බට ගිය ප්‍රචණ්ඩත්වයේ ඉහළ තීව්‍රතාවයකින් යුත් අභ්‍යන්තර ගැටුම් පැවතිය නොහැකි බව අද පොදුවේ පිළිගනු ලැබේ. ඇත්ත වශයෙන්ම, සිවිල් යුද්ධ වලින් ද බොහෝ විට රාජ්‍යයන් අතර සිදුවන සන්නද්ධ ගැටුම්වලට සමාන විනාශකාරී බලපෑම් ඇති වෙයි. පිළිවෙළින් 1949 සහ 1977 වර්ෂවල සිට එකතු කරන ලද, **ජිනීවා සම්මුති හතරට සහ II වෙනි අමතර කෙටුම්පතට පොදු 3 වැනි වගන්තිය** මගින් ජාත්‍යන්තර නොවන සන්නද්ධ ගැටුම්වලදී ප්‍රචණ්ඩත්වය සහ පීඩාවන් සීමා කිරීම අරමුණු කර ගත් මූලික ප්‍රමිතීන් සකසා ඇත. සාම්ප්‍රදායික නීතිය මගින් මූලික 3 වෙනි වගන්තිය සහ II වෙනි අමතර කෙටුම්පතෙහි වගන්ති පහළොව තහවුරු කර ඒවා ඌනපූරණය කරයි.

160. මෙම ජනාධිපති විමර්ශන කොමිෂන් සභාව එකී සන්නද්ධ ගැටුම් වර්ග දෙක අතර ඇති අසමානතාවයන් නොපැහැදිලි වන අයුරින් විස්තර නොකරන අතර, එහෙත්, ජාත්‍යන්තර නොවන සන්නද්ධ ගැටුම්වලදී ඇතැම් ක්‍රියා තහනම් කරන සම්මතයන් මූලික වශයෙන් ම ජාත්‍යන්තර සන්නද්ධ ගැටුම්වලදී අදාළ වන සම්මතයන්ට සමාන බව දැකගත හැක.

පොදු 3 වෙනි වගන්තිය[90]

161. ජිනීවා සම්මුති හතරට පොදු 3 වෙනි වගන්තිය මගින් "ත්‍රස්තවාදය" යන වචනය භාවිතා නොකර පහත සඳහන් වචන ඇසුරින් ත්‍රස්තවාදී ක්‍රියා තහනම් කරයි.

162. සරලව විස්තර කළ හොත්, පොදු 3 වෙනි වගන්තිය "ජාත්‍යන්තර ලක්ෂණ වලින් සමන්විත නොවන සන්නද්ධ ගැටුමකට" අදාළ වන අතර, සම්පූර්ණ පාඨය පහත සඳහන් පරිදි වේ:

ගිවිසුමකට අත්සන් කර ඇති පාර්ශ්වයක භූමිය තුළ සිදු වන ජාත්‍යන්තර ස්වභාවයේ නොවන සන්නද්ධ ගැටුමක දී, ගැටුමට සම්බන්ධ සෑම පාර්ශ්වයක් ම අවම වශයෙන් පහත සඳහන් විධිවිධාන අනුගමනය කිරීමට බැඳී සිටියි:

(1) සන්නද්ධ හමුදාවලට අයත් අවි බිම තැබූ සාමාජිකයන් සහ අසනීප, තුවාල, රඳවා තබා ගැනීම හෝ වෙනත් හේතුවක් නිසා "සටන් කිරීමට නොහැකි" සාමාජිකයන් ඇතුළුව එදිරිවාදිකම්වලට සක්‍රීයව සහභාගී නොවන පුද්ගලයින්ට සෑම අවස්ථාවකදී ම, ජාතිය, වර්ණය, ආගම හෝ ඇදහිල්ල, ලිංගිකත්වය, උපත හෝ ධනය හෝ වෙනත් ඒ හා සමාන සමාන නිර්ණායක මත පදනම් ව කිසිදු අහිතකර ආකාරයකින් වෙනසක් කොට සැලකීමක් නොමැතිව මානුෂීය ලෙස සැලකිය යුතුය.

(අ) මේ සඳහා, ඉහත සඳහන් කළ පුද්ගලයන් සම්බන්ධයෙන් ඕනෑම අවස්ථාවක සහ ඕනෑම ස්ථානයක පහත සඳහන් ක්‍රියා තහනම් කළ යුතුය සහ තහනම්ව පැවතිය යුතුය:

(ආ) ජීවිතයට සහ පුද්ගලයාට එරෙහි ප්‍රචණ්ඩත්වය, විශේෂයෙන් ම සියලු වර්ගවල ඝාතනය කිරීම්, අංග ඡේදනය කිරීම්, කෲර ලෙස සැලකීම සහ වධහිංසා පැමිණවීම;

[90] 6 වෙනි පරිච්ඡේදයේ දී ඇති පොදු 3 වෙනි වගන්තිය සම්බන්ධයෙන් අදාළ වන නිර්දේශ බලන්න.

(ඇ) ප්‍රාණ ඇපකරුවන් ලෙස තබා ගැනීම;

(ඈ) පුද්ගලික අභිමානය සම්බන්ධ සාහසික ක්‍රියා, විශේෂයෙන් ම අවමන් සහගත සහ ආත්ම ගරුත්වය කෙලෙසන ආකාරයෙන් සැලකීම;

(ඉ) ශිෂ්ටසම්පන්න ජනතාව විසින් අත්හැරිය නොහැකි යැයි පිළිගනු ලබන, සියලු ම අධිකරණමය සහතිකවීම් ලබා දෙමින්, විධිමත් ලෙස පිහිටුවන ලද අධිකරණයක් විසින් ප්‍රකාශ කරනු ලබන පූර්ව විනිශ්චයකින් තොරව දඬුවම් නියම කිරීම සහ මරණ දණ්ඩනය පැනවීම.

(2) තුවාල ලැබුවන් සහ රෝගීන් එකතු කර රැකබලා ගත යුතුය.

ජාත්‍යන්තර රතු කුරුස සංවිධානය වැනි අපක්ෂපාතී මානුෂීය සහාය සපයන ආයතනයක් විසින් ගැටුමට සම්බන්ධ පාර්ශ්ව වෙත සිය සේවාවන් සපයා දිය හැක.

මෙම සම්මුතියේ අනෙකුත් විධිවිධාන සියල්ල හෝ කොටසක් විශේෂ ගිවිසුම් මගින් බලාත්මක කිරීමට ගැටුමට සම්බන්ධ පාර්ශ්ව තවදුරටත් උත්සාහ කළ යුතු ය.

ඉහත සඳහන් කළ විධිවිධාන අදාළ කර ගැනීම මගින් ගැටුමට සම්බන්ධ පාර්ශ්වවල නෛතික තත්ත්වයට බලපෑමක් ඇති නොවිය යුතු ය.[91]

163. II වෙනි අමතර කෙටුම්පත මගින් මෙම නීති නැවත තහවුරු කරමින් සංවර්ධනය කරයි. හමුදා මෙහෙයුම් වලට සහභාගී නොවන හෝ තවදුරටත් සහභාගී නොවන අයට "මානුෂීය ලෙස සැලකීම" යන මාතෘකාව යටතේ වන 4 වෙනි වගන්තියේ 2(ඈ) ඡේදය මගින් "ත්‍රස්තවාදී ක්‍රියා" නීතියට පටහැනි ලෙස එකහෙළා ම හෙළා දැකීම පවා සිදු කරයි. එපමණක් නොව, II වෙනි කෙටුම්පත මගින් මේ සම්බන්ධයෙන් නව වෙනසක් ඇතිකරමින් අභ්‍යන්තර ගැටුම් වලදී හමුදා මෙහෙයුම් සිදු කිරීම සඳහා ප්‍රමිතීන් ද සංග්‍රහ කරයි. ඇත්ත වශයෙන්ම, මූලික විධිවිධානය වන්නේ එදිරිවාදිකම්වලට සක්‍රීයව සහභාගී වන අය සහ එසේ නොවන අය, එනම් විශේෂයෙන් ම සිවිල් වැසියන්, තුවාල ලැබුවන් සහ රෝගීන්, අතර වෙනස හඳුනාගත යුතු වීමේ වගකීමයි. 13 වැනි වගන්තිය මගින් විශේෂයෙන් ම සිවිල් ජනතාවට මෙන්ම තනි සිවිල් පුද්ගලයින්ට පහර දීම තහනම් කරයි. එය 2 වෙනි ඡේදයේ තවදුරටත් මෙසේ සඳහන් කරයි, "සිවිල් ජනතාව අතර භීෂණය පැතිරවීම මූලික අරමුණ වන ප්‍රචණ්ඩ ක්‍රියා හෝ ප්‍රචණ්ඩ ක්‍රියා සිදු කරන බවට තර්ජනය කිරීම් තහනම් වේ". මෙම වචන ම ජාත්‍යන්තර සන්නද්ධ ගැටුම් සම්බන්ධයෙන් වන I වෙනි කෙටුම්පතෙහි 52 වන වගන්තියේ, 2 වෙනි ඡේදයේ දක්නට ලැබේ.

164. ජාත්‍යන්තර සන්නද්ධ ගැටුමක් සම්බන්ධයෙන් වන විට, සන්නද්ධ ගැටුමක පාර්ශ්ව වලට ඔවුන්ගේ අභිමතය පරිදි සටන් කිරීමේ ක්‍රම හෝ ආකාර තෝරා ගැනීමට නිදහස නැත, විශේෂයෙන් ම, අධික තුවාල හෝ අනවශ්‍ය පීඩා ඇති කරවන ආයුධ යොදා ගැනීම නීති විරෝධී වන්නේය යන දීර්ඝ කාලයක් පුරා ස්ථාපනය වී ඇති මූලධර්මය සංග්‍රහගත කරන I වෙනි කෙටුම්පතෙහි 35 වෙනි වගන්තිය හා සමාන විධිවිධානයක් 3 වැනි වගන්තියේ හෝ II වැනි කෙටුම්පතේ හෝ නැත. කෙසේ වෙතත්, II වෙනි කෙටුම්පතෙහි සිව්වෙනි පූර්විකාමය ඡේදය මගින් ජාත්‍යන්තර නොවන සන්නද්ධ ගැටුම් සඳහා වන 'මාර්ටෙන්ස් වගන්තියේ' පණිවිඩය නැවත සඳහන් කරයි. නිශ්චිත තහනම් කිරීමක්

[91] එම

නොමැති විට, "මනුෂ්‍යත්වයේ මූලධර්ම සහ පොදු හෘදය සාක්ෂියේ නියමයන්" සමග අනුකූල වන රීතියක් සොයාගත යුතු බව මාර්ටෙන්ස් වගන්තියේ සඳහන් වේ.[92]

165. 3 වෙනි පොදු වගන්තියේ හෝ II වෙනි අමතර කෙටුම්පතෙහි අභ්‍යන්තර සන්නද්ධ ගැටුමක දී වැරදි වර්යාව සම්බන්ධයෙන් සාපරාධී වගකීම පිළිබඳ කිසිදු විධිවිධානයක් අඩංගු නොවේ. එවැනි සන්දර්භයක් තුළ අපරාධයක් සිදු කරන ලද පුද්ගලයන් සම්බන්ධයෙන් කටයුතු කිරීම දේශීය අධිකරණ බල සීමාවන්ට අයත් වේ. කෙසේ වෙතත්, ජාත්‍යන්තර නොවන සන්නද්ධ ගැටුමකදී සිදු කරනු ලබන ඉතාමත් දරුණු අපරාධ ජාත්‍යන්තර අපරාධ ලෙස සැලකිය යුතු බව පෙර තිබූ යුගෝස්ලාවියාව සඳහා වූ ජාත්‍යන්තර අපරාධ විනිශ්චය සභාව ඉතා වැදගත් තීරණයක් මගින් නිගමනය කර ඇත. එබැවින්, ජාත්‍යන්තර නොවන සන්නද්ධ ගැටුමකදී කරන ලද අපරාධයක් සම්බන්ධයෙන් නඩු පවරනු ලබන පුද්ගලයෙකුගේ නඩු විභාගයේදී ජාත්‍යන්තර නීති අදාළ වේ.[93] ත්‍රස්තවාදී ක්‍රියා පමණක් නොව, ජාත්‍යන්තර නොවන සන්නද්ධ ගැටුමකදී සිදු කරනු ලබන දරුණු අපරාධ ද 1949 ජිනීවා සම්මුතීන් මගින් අර්ථ දක්වා ඇති පරිදි බරපතල උල්ලංඝනය කිරීම්වලට සමාන කළ හැකි බව මෙයින් අදහස් වෙයි.

166. ජාත්‍යන්තර නොවන සන්නද්ධ ගැටුම රාජ්‍යයන් අතර සන්නද්ධ ගැටුමකින් වෙන්කර හඳුනා ගන්නේ ජාත්‍යන්තර නොවන සන්නද්ධ ගැටුමේ එක් පැත්තකින් රාජ්‍යයක් සහ අනෙක් පැත්තෙන් රජයේ බල අධිකාරියට විරුද්ධ පුද්ගලයින් කණ්ඩායම් එකක් හෝ කිහිපයක් තිබීම මගින් ය. රාජ්‍ය පාර්ශ්වයේ සටන්කරුවන් එම රාජ්‍යය බැඳී සිටින ජාත්‍යන්තර බැඳීම්වලට අනුකූල වීමට බැඳී සිටින බව දැනගැනීම පුදුමයක් නොවන අතර, 3 වැනි වගන්තිය සහ II වෙනි කෙටුම්පත මගින් රාජ්‍ය නොවන සටන්කරුවන් වන රාජ්‍යය පාර්ශ්වයේ නොවන බලවේග සහ ඔවුන්ගේ සාමාජිකයින්ට ද බැඳීම් පනවා ඇත. එබැවින් එම බලවේගවල සාමාජිකයින් ත්‍රස්තවාදී ක්‍රියා තහනම් කිරීම කෙරෙහි අවධානය යොමු කළ යුතු අතර, ජාත්‍යන්තර නීතිරීතිවලට අනුකූලව ක්‍රියාත්මක වීමට රජයට විරුද්ධවාදී බලවේගවල අණ දෙන නිලධාරීහු බැඳී සිටිති. වෙනත් වචන වලින් කිවහොත්, ඔවුහු ත්‍රස්තවාදී ක්‍රියා තහනම් කිරීම බලාත්මක කිරීමට සහ එම තහනම කඩ කළහොත් ඒ සම්බන්ධයෙන් ද සුදුසු ක්‍රියාමාර්ග ගැනීමට අවශ්‍ය සියලු පියවර ගත යුතු ය.

167. ජාත්‍යන්තර මානුෂීය නීතියේ කැපී පෙනෙන ලක්ෂණ කිහිපයක් දෙස බැලීමෙන් පසුව, මෙම ජනාධිපති විමර්ශන කොමිෂන් සභාව දැන් සම්ප්‍රදායික ජාත්‍යන්තර නීතියේ ස්ථාපනය වී ඇතැයි සැලකෙන සන්නද්ධ ගැටුම් නීතියේ මූලික මූලධර්ම විමසා බලයි. ජාත්‍යන්තර මානුෂීය නීතියේ බොහෝ රීති සාම්ප්‍රදායික නීතිය සංස්ථාපනය කරන අතර, එබැවින් අදාළ ගිවිසුම් අනුමත කර තිබේද යන්න නොසලකා, සන්නද්ධ ගැටුමක සියලු පාර්ශ්ව එම නීති වලින් බැඳී සිටියි.

(අ). වෙන්කිරීම පිළිබඳ මූලධර්මය

168. සෑම විටම සිවිල් වැසියන් සහ සටන්කාමීන් අතර වෙනස හඳුනාගැනීමේ වගකීම සාම්ප්‍රදායික ජාත්‍යන්තර මානුෂීය නීතිය පිළිබඳ අධ්‍යයනයේ 1 වෙනි රීතිය ලෙස ප්‍රකාශ කර ඇත.[94]

169. වෙන් කිරීම පිළිබඳ මූලධර්මය I වෙනි අමතර කෙටුම්පතෙහි 48 වෙනි වගන්තියේ දක්වා ඇත:

---

[92] යාවත්කාලීන කරන ලද මාර්ටෙන්ස් වගන්තියේ සම්පූර්ණ පාඨය සඳහා I වෙනි කෙටුම්පතෙහි 1 වෙනි වගන්තියේ 2 වෙනි ඡේදය බලන්න.

[93] *අධිකරණ බල සීමාව සම්බන්ධ අතුරු අභියාචනය සඳහා වන ආරක්ෂක යෝජනාව පිළිබඳ තීරණය, අභිචෝදක එදිරි ඩස්කෝ ටැඩික්*, නඩු අංක IT-94-1-AR 72. ICTY අභියාචනා මණ්ඩලය, 1996 ඔක්තෝබර් 2.

[94] සාම්ප්‍රදායික ජාත්‍යන්තර මානුෂීය නීතිය (ජාත්‍යන්තර රතුකුරුස සංවිධානය), I වෙනි වෙළුම, රීති

"සිවිල් ජනතාවට සහ සිවිල් වස්තූන්ට ගරු කිරීම සහ සිවිල් ජනතාව හා සිවිල් වස්තූන් ආරක්ෂා කිරීම සහතික කිරීම සඳහා, ගැටුමට සම්බන්ධ පාර්ශ්වයන් සෑම විටම සිවිල් ජනතාව සහ සටන්කරුවන් අතර සහ සිවිල් වස්තූන් සහ හමුදාවට අයත් වස්තූන් අතර වෙනස හඳුනාගෙන ඒ අනුව ඔවුන්ගේ මෙහෙයුම් හමුදාවට අයත් වස්තූන්ට එරෙහිව පමණක් මෙහෙයවිය යුතුය."[95]

170. පෙර ප්‍රකාශ කළ පරිදි, වෙන් කිරීම පිළිබඳ මූලධර්මය සම්ප්‍රදායික ජාත්‍යන්තර නීතිය ලෙස සලකනු ලබන අතර,[96] ජාත්‍යන්තර මානුෂීය නීතියේ "ප්‍රධානම මූලධර්ම" වලින් එකක් ලෙස පිළිගෙන ඇත. ඇත්ත වශයෙන්ම, සිවිල් වැසියන් එදිරිවාදිකම් වලට සහභාගී නොවන්නේ නම්, ඔවුන් ප්‍රහාරයේ නීත්‍යානුකූල වස්තූන් නොවන්නේය යන අදහස ජාත්‍යන්තර නීති ලේඛකයන්ගේ පැරණිතම ලේඛන වලින් ගොඩනැගුණි.[97] ග්‍රෝටියස් විසින් තර්ක කරන ලද පරිදි, "යුද්ධයේ නීතිය මගින් සන්නද්ධ මිනිසුන් සහ ප්‍රතිරෝධය දක්වන අය මරා දමනු ලැබේ ... යුද්ධයේදී ආයුධ අතට ගත් අය දඬුවම් විඳිය යුතුය යන්න සාධාරණය, එහෙත් වැරදිකරුවන් නොවන අයට තුවාල නොකළ යුතු ය."[98]

171. වෙන්කිරීම පිළිබඳ මූලධර්මය ද්විත්ව වගකීමක් බව නිරීක්ෂණය කරමින්, පළමුවෙන් ම, සන්නද්ධ ගැටුමේ පාර්ශ්වයන් සෑම විටම සිවිල් වැසියන් සහ සටන්කරුවන් අතර වෙනස හඳුනාගත යුතුය. සටන්කරුවන් සටන්කරුවන් ලෙස ඔවුන්ගේ තත්ත්වය හේතුවෙන් ඉලක්ක කිරීමට බැඳී සිටිති; සිවිල් වැසියන් ප්‍රහාරයේ ඉලක්කය කර නොගත යුතු ය.[99] එලෙස ම, ප්‍රහාර එල්ල කළ යුත්තේ හමුදාමය වස්තූන්ට එරෙහිව සහ හමුදාමය අරමුණු මත පමණි; සිවිල් වස්තූන් ඉලක්ක නොකළ යුතු ය.[100] සරල උදාහරණයක් නම්, හමුදා කඳවුරක් වැනි හමුදා ස්ථාපනයක් නීත්‍යානුකූලව ඉලක්ක කළ හැකි අතර, ආගමික ස්ථානයක් (පල්ලියක්, පල්ලියක් හෝ පන්සලක්) හෝ පාසලක් වැනි බැලූබැල්මට සිවිල් ගොඩනැගිල්ලක් ලෙස පෙනෙන ස්ථාපනයක් නීත්‍යානුකූලව ඉලක්ක කළ නොහැක.[101] මෙම තහනම් කිරීමෙහි අනුෂංගය වන්නේ හමුදාමය සහ සිවිල් අතර රේඛා "බොඳ" නොකිරීමට පාර්ශවයන් සතු බැඳීමයි. මේ අනුව, සටන්කරුවන් නිල ඇඳුම් සහ වෙනත් දෘශ්‍ය ලාංඡන භාවිතා කරමින් හමුදා ස්වභාවයක් පෙන්නුම් කරමින් ඔවුන් සිවිල් ජනතාවගෙන් වෙන්කර හඳුනා ගැනීමට සැලැස්විය යුතු ය.[102]

172. හමුදා ස්ථාපනයන් ප්‍රහාරයට ලක්වීමෙන් වැළැක්වීමේ ක්‍රමයක් ලෙස ඒවා සිවිල් ජනාකීර්ණ ප්‍රදේශවල ස්ථානගත නොකළ යුතු ය. මෙම විධිවිධානය ගැටුමට සම්බන්ධ පාර්ශ්ව "*හැකි උපරිමයෙන්... ජනාකීර්ණ ප්‍රදේශ තුළ හෝ ඒ ආසන්නයේ හමුදාමය වස්තූන් ස්ථානගත කිරීමෙන්*

---

[95] I වෙනි අමතර කෙටුම්පත, 48 වෙනි වගන්තිය.

[96] ඇස්ට්‍රිඩ් ඩෙලිසෙන් සහ ජෙරාඩ් ටැන්ජා (කතුවරුන්), *සන්දර්භ ගැටුම්වල මානුෂීය නීතිය - ඉදිරි අභියෝග,* (Dordrecht: Martinus Nijhoff, 1991), පි.17 හි වෙන්කිරීමෙහි මූලධර්මය "නිසැකවම 1860 දශකයේ දී සාධනීය ලෙස සම්පාදනය වීමට පෙර තිබූ සාම්ප්‍රදායික නීතිය විය" යනුවෙන් සඳහන් කරන ජීයොෆ්‍රී බෙස්ට්, "ඓතිහාසික සහ දාර්ශනික දෘෂ්ටි කෝණයකින් යුද්ධයේ සංවරය" බලන්න.

[97]

[98] හියුගෝ ග්‍රොටියස්, De Jure Belli ac Pacis Libri Tres, පරිවර්තනය, ෆ්‍රැන්සිස් ඩබ්. කෙල්සී, ජේම්ස් බ්‍රවුන් ස්කොට් (කතුවරුන්), ජාත්‍යන්තර නීතියේ සම්භාව්‍ය කෘති (ඔක්ස්ෆර්ඩ් විශ්වවිද්‍යාල මුද්‍රණාලය 1925), III වෙනි පොත, XI වෙනි පරිච්ඡේදය, X වගන්තිය.

[99] සාම්ප්‍රදායික ජාත්‍යන්තර මානුෂීය නීතිය බලන්න, ජාත්‍යන්තර රතුකුරුස සංවිධානය, Stuch» (2005), 1 වෙනි වෙළුම, පි. 3

[100] එමිලි ක්‍රෝෆෝර්ඩ් සහ ඇලිසන් පර්ට්, "ජාත්‍යන්තර මානුෂීය නීතිය" (2015) හි 7 වන පරිච්ඡේදය, පිටු 163-166 බලන්න.

[101] එම

[102] III වෙනි ජිනීවා සම්මුතිය, සටන්කරුවන් "දුරක සිටහඳුනාගත හැකි ස්ථාවර සුවිශේෂී ලාංඡනයක්" පැළඳීමේ අවශ්‍යතාවය සම්බන්ධ 4(අ)(2)(ආ) වගන්තිය.

වැළකිය යුතුය" යනුවෙන් විධිවිධාන සලසා ඇති I වෙනි කෙටුම්පතෙහි 58(ආ) වගන්තියේ අඩංගු වේ.

173. අමතර කෙටුම්පත්වල විවරණයෙහි සඳහන් කර ඇති පරිදි,

මෙම වගන්තිය [58(ආ) වගන්තිය] සතුරු රටවල ජනගහනයේ ප්‍රයෝජනය සඳහා වන අමතර කෙටුම්පතේ අඩංගු වගන්ති රාශියකට අනුෂංගයක් වේ. එය විරුද්ධවාදියාගේ පාලනය යටතේ පවතින භූමියට පහර දීමේදී පිළිපැදිය යුතු චර්යාවන් සම්බන්ධයෙන් නීති රීති පැනවීම පිළිබඳව නොව, සෑම පාලනයක් ම තම ජාතිකයින් වෙනුවෙන් තම භූමිය තුළ හෝ තම පාලනය යටතේ ඇති භූමිය තුළ ගත යුතු ක්‍රියාමාර්ග පිළිබඳව වේ. තම විරුද්ධවාදීන් ඔවුන්ගේ ගිවිසුම් බැඳීම්වලට අනුකූලව කටයුතු කරනු ඇතැයි සහ සිවිල් වැසියන්ට ගරු කරනු ඇතැයි සටකරුවන් විසින් අපේක්ෂා කරනු ලැබිය හැක, එහෙත් ඔවුන් ඔවුන්ගේම යහපත වෙනුවෙන් පරිද්දෙන්ම, ඔවුන්ගේ ජනගහනයේ යහපත වෙනුවෙන් ද හැකි සෑම පියවරක්ම ගනිමින් සහයෝගයෙන් කටයුතු කළ යුතු ය.[103]

174. මෙය පහත සඳහන් පරිදි විධිවිධාන සලසා ඇති, කෙටුම්පතේ 51(7) වෙනි වගන්තිය පදනම් කරගෙන ගොඩනැගී ඇත:

සිවිල් ජනගහනය හෝ සිවිල් පුද්ගලයින් සිටීම හෝ ඔවුන්ගේ සංචරණයවීම් හමුදා මෙහෙයුම් වලින් යම් යම් ස්ථාන හෝ ප්‍රදේශ ආරක්ෂා කිරීමට, විශේෂයෙන් ම හමුදාමය වස්තූන් ප්‍රහාරවලින් ආරක්ෂා කිරීමට හෝ හමුදා මෙහෙයුම් ප්‍රහාර වලින් ආරක්ෂා කිරීමට, හමුදා මෙහෙයුම්වලට උපකාරී වීමට හෝ බාධා කිරීමට භාවිතා නොකළ යුතුය. ගැටුමේ පාර්ශ්ව හමුදාමය වස්තූන් ප්‍රහාරවලින් ආරක්ෂා කිරීමට හෝ හමුදා මෙහෙයුම් ප්‍රහාර වලින් ආරක්ෂා කිරීමට උත්සාහ කිරීම සඳහා සිවිල් ජනතාවගේ හෝ සිවිල් පුද්ගලයන්ගේ සංචරණය මෙහෙයවීම නොකළ යුතු ය.[104]

175. වෙන්කිරීමේ මූලධර්මය ප්‍රායෝගිකව ක්‍රියාවට නැංවීම බොහෝ විට ඉලක්ක කිරීම සම්බන්ධ නීතිවල දක්නට ලැබේ.[105] සන්නද්ධ ගැටුම් පිළිබඳ නීති බොහොමයක හරයෙහි වෙන්කිරීමේ මූලධර්මය දක්නට ලැබෙන අතර, ඇත්ත වශයෙන්ම, එය වෙනස්කොට සැලකීම, හමුදාමය අවශ්‍යතාවය මෙන්ම සමානුපාතිකත්වය පිළිබඳ මූලධර්මය වැනි අනෙකුත් මූලික මූලධර්මවල කොටසක් නිර්මාණය කරයි (නැත හොත්, ඒවායෙහි කොටසක් ලෙස දැකිය හැක).

176. වෙන්කිරීමේ මූලධර්මය ප්‍රායෝගිකව භාවිතා කිරීම සැලකීමේ දී, ප්‍රහාර වලදී වඩාත් නිවැරදිව ඉලක්ක කිරීමට දියුණු තාක්ෂණය උපකාරී වන බැවින්, සන්නද්ධ ගැටුමකට සම්බන්ධ රාජ්‍යයක් අවසරලත් ඉලක්ක නිර්ණය කිරීම සඳහා සුවිශේෂී දැඩි නීති සහ ප්‍රමිති ස්ථාපනය කළ යුතු බවට වන ජාත්‍යන්තර මානුෂීය නීතියේ පිළිගත් රීතිය උගත් පාඩම් සහ ප්‍රතිසන්ධාන කොමිෂන් සභාව විසින් නැවත සඳහන් කර ඇත. **වෙන්කිරීම සහ සමානුපාතිකත්වය පිළිබඳ මූලධර්මය** න්‍යායාත්මක නොවිය යුතුය; හමුදා මෙහෙයුම් අදාළ නීතියට අනුකූලව සිදු කරන බව සහතික කිරීම සඳහා හමුදාමය ක්‍රියාමාර්ග සැලසුම් කිරීම සහ ක්‍රියාත්මක කිරීම පුරාවට එම මූලධර්මය දැඩි ලෙස පිළිපැදිය යුතුය. ජාත්‍යන්තර සන්නද්ධ ගැටුම් සහ ජාත්‍යන්තර නොවන සන්නද්ධ ගැටුම් යන දෙකට ම අදාළ වන මෙම ප්‍රකාශ මගින් ජාත්‍යන්තර මානුෂීය නීතියේ සම්පූර්ණ අර්ථයෙහි සහ අන්තර්ගතයෙහි අත්‍යාවශ්‍ය සංකල්ප ඉදිරිපත් කරයි.[106]

---

[103] අමතර කෙටුම්පත පිළිබඳ විවරණ, පි. 692, ඡේද 2239-40

[104] I වෙනි අමතර කෙටුම්පත. 51(7) වෙනි වගන්තිය

[105] එමිලි ක්‍රෝෆෝර්ඩ් සහ ඇලිසන් පර්ට්, "ජාත්‍යන්තර මානුෂීය නීතිය" (2015) හි 7 වෙනි පරිච්ඡේදය තවදුරටත් බලන්න.

[106] උගත් පාඩම් සහ ප්‍රතිසන්ධාන කොමිෂන් සභාව, 4.261 ඡේදය

i. වෙනස් කොට සැලකීම පිළිබඳ මූලධර්මය (වගවිභාගයක් නොමැති ප්‍රහාර තහනම් කිරීම)

177. වෙන්කිරීමේ මූලධර්මයට සම්බන්ධවී ඇත්තේ වෙනස්කොට සැලකීමේ මූලධර්මයයි. වෙන්කිරීම පිළිබඳ රීති බොහෝ විට වගවිභාගයක් නොමැති උපක්‍රම පිළිබඳ තහනම් කිරීමක් ප්‍රකාරව ප්‍රකාශ කර තිබේ. මේ අනුව, 'වගවිභාගයක් නැති ප්‍රහාර' යන්න නිශ්චිත හමුදාමය වස්තුවක් ඉලක්ක කර නොගන්නා, හෝ නිශ්චිත හමුදාමය ඉලක්කයකට යොමු කළ නොහැකි ක්‍රමයක් හෝ ක්‍රමවේදයක් යොදා ගන්නා, හෝ බලපෑම සීමා සහිත නොවන ක්‍රමයක් හෝ ක්‍රමවේදයක් යොදා ගන්නා, සහ "වෙන්කිරීමක් නොමැතිව හමුදාමය වස්තූන්ට සහ සිවිල් වැසියන්ට හෝ සිවිල් වස්තූන්ට පහරදීමේ ස්වභාවයක් සහිත" ප්‍රහාර වශයෙන් නිර්වචනය කරමින්, වගවිභාගයක් නැති ප්‍රහාර තහනම් කර ඇත යනුවෙන් I වෙනි කෙටුම්පතෙහි 51(4) වගන්තියෙහි සඳහන් කර ඇත.[107] නිශ්චිත හමුදාමය ඉලක්කයක් ඉලක්ක නොකර හෝ එකිනෙකට වෙනස් හමුදාමය ඉලක්ක ගණනාවක් තනි ඉලක්කයක් ලෙස සලකා එම ස්ථානවලට දැඩි ලෙස බෝම්බ හෙලීම වගවිභාගයක් නැති පහරදීම්වලට උදාහරණ වේ. එබැවනින්, වෙනස්කොට සැලකීම යනු වෙන්කිරීමෙහි සහසම්බන්ධයකි; ඒ අනුව වෙන්කිරීම පිළිබඳ මූලධර්මය අනුගමනය කිරීමට අපොහොසත් වන ප්‍රහාරයක් වගවිභාගයක් නැති ප්‍රහාරයක් ලෙස සලකනු ලැබේ.[108]

(ආ). හමුදාමය අවශ්‍යතාවය

178. ගැටුමට සම්බන්ධ පාර්ශ්ව සතුරා දුර්වල කිරීමට සහ සතුරා යටත් කර ගැනීමට අවශ්‍ය තරමේ ක්‍රියාමාර්ග පමණක් අනුගමනය කළ යුතු ය යනුවෙන් හමුදාමය අවශ්‍යතාවය පිළිබඳ මූලධර්මය මගින් නියම කර ඇත; සතුරා හෝ සතුරාගේ සන්නද්ධ හමුදා හෝ දේපළ සම්පූර්ණයෙන් ම විනාශ කිරීම අවශ්‍ය නොවේ.[109] හමුදාමය අවශ්‍යතාවය පිළිබඳ සංකල්පය ප්‍රථම වරට ෆ්‍රැන්සිස් ලයිබර් විසින් සංග්‍රහ කරන ලදී:[110] ලයිබර් සංග්‍රහයෙහි 14 වෙනි වගන්තියේ හමුදාමය අවශ්‍යතාවය යන්න "*යුද්ධයේ අවසානය සහතික කිරීම සඳහා අත්‍යාවශ්‍ය වන සහ නූතන නීතිය අනුව සහ යුද්ධයේ සම්මුතීන් අනුව නීත්‍යානුකූල වන ක්‍රියාමාර්ගවල අවශ්‍යතාවයෙන් සමන්විත වේ*"[111] යනුවෙන් නිර්වචනය කරයි.

179. හමුදාමය අවශ්‍යතාවය නැමති සංකල්පය පිළිබඳ වඩාත් සවිස්තරාත්මක පැහැදිලි කිරීමක් දෙවන ලෝක යුද්ධයේ දී 'එක්සත් ජනපදය එදිරි ලිස්ට්' යුධ අපරාධ නඩුවෙන් උපුටා ගත හැක:

> *හමුදාමය අවශ්‍යතාවය මගින් යුධ නීතිවලට යටත්ව, හැකි අවම කාලය, ජීවිත සහ මුදල් කැප කරමින් සතුරාට සම්පූර්ණයෙන් ම යටත් වීමට බල කිරීම සඳහා ඕනෑම ප්‍රමාණයක බලයක් යෙදීමට අවසර දෙයි. පොදුවේ ගත් කල ... යුද්ධයේ සන්නද්ධ ගැටුම් නිසා අහඹු ලෙස ජීවිතය විනාශවීම වැළැක්විය නොහැකි සන්නද්ධ සතුරන්ගේ සහ වෙනත් පුද්ගලයින්ගේ ජීවිත විනාශ කිරීමට එය අවසර දෙයි ... නමුත් පළිගැනීමේ අරමුණෙන් හෝ මරාදැමීමට ඇති ආශාව නිසා අහිංසක වැසියන් මරා දැමීමට එය අවසර නොදෙයි. දේපළ විනාශ කිරීම නීත්‍යානුකූල වීමට නම්, අනිවාර්යයෙන් ම යුද්ධයේ අවශ්‍යතා අනුව එසේ කිරීමට අවශ්‍ය විය යුතු ය. විනාශ කිරීමේ අරමුණෙන් ම දේපළ*

---

[107] I වෙනි අමතර කෙටුම්පත, 51(4) වෙනි වගන්තිය

[108] එමිලි ක්‍රෝෆෝර්ඩ් සහ ඇලිසන් පර්ට්, "අන්තර්ජාතික මානුෂීය නීතිය" (2015), 7 වෙනි පරිච්ඡේදයෙහි වැඩිදුර විස්තර කියවන්න.

[109] බර්රුස් කාමහන්, "ලින්කන්, ලයිබර් සහ යුද්ධයේ නීති: හමුදාමය අවශ්‍යතාවය පිළිබඳ මූලධර්මයේ සම්භවයන් සහ සීමාවන්", (1998) 92 AJIL 213.

[110] ජාත්‍යන්තර මානුෂීය නීතියේ ඓතිහාසික වර්ධනය පිළිබඳ එමිලි ක්‍රෝෆර්ඩ් සහ ඇලිසන් පර්ට්ගේ "ජාත්‍යන්තර මානුෂීය නීතිය" (2015) හි I වෙනි පරිච්ඡේදය වැඩිදුර කියවන්න.

[111] ලයිබර් සංග්‍රහය, 14 වෙනි වගන්තිය.

විනාශ කිරීම ම ජාත්‍යන්තර නීතිය උල්ලංඝනය කිරීමක් වේ. දේපළ විනාශ කිරීම සහ සතුරු බලවේග පරාජය කිරීම අතර යම් සාධාරණ සම්බන්ධතාවයක් තිබිය යුතුය.[112]

180. හමුදාමය අවශ්‍යතාවය පිළිබඳ මූලධර්මය ජිනීවා සම්මුතිවල හෝ I වෙනි කෙටුම්පතෙහි දක්වා නැත, නමුත් හමුදාමය අවශ්‍යතාවය පිළිබඳ මූලධර්මයේ හරය සමානුපාතිකත්වය පිළිබඳ රීතිය තුළ ප්‍රකාශනය කර ඇත. හමුදාමය අවශ්‍යතාවය පිළිබඳ සංකල්පය 1907 හේග් රෙගුලාසිවල[113] සහ ජාත්‍යන්තර අපරාධ අධිකරණය සඳහා වන රෝම ප්‍රඥප්තියෙහි දක්නට ලැබේ.[114]

(ඇ). සමානුපාතිකත්වය පිළිබඳ මූලධර්මය

181. ගැටුමට සම්බන්ධ පාර්ශ්ව විසින් ගනු ලබන ඕනෑම හමුදාමය ක්‍රියාමාර්ගයක් සමානුපාතික විය යුතුය යනුවෙන් සමානුපාතිකත්වය පිළිබඳ මූලධර්මය මගින් නියම කරයි - එනම්, යම් මෙහෙයුමකින් ලබා ගන්නා හමුදාමය වාසිය සිවිල් වැසියන්ට සහ සිවිල් වස්තූන්ට සිදු වූ හානියට වඩා වැඩි විය යුතු ය. මෙම මූලධර්මය බොහෝ විට සෘණාත්මකව අවබෝධ කරගනු ලැබේ; යම් ප්‍රහාරයක් මගින් අපේක්ෂා කරනු ලබන ප්‍රත්‍යක්ෂ සහ සෘජු හමුදාමය වාසිය සැලකීමේ දී, එම ප්‍රහාරය මගින් ආනුෂංගික ලෙස සිදුවනු ඇතැයි අපේක්ෂා කරනු ලබන (හෝ සිදුවන) සිවිල් ජීවිත අහිමි වීම, සිවිල් වැසියන්ට තුවාල වීම හෝ සිවිල් වස්තූන්ට හානි වීම හෝ ඒවායෙහි සංයෝජනය එම හමුදාමය වාසියට සාපේක්ෂව පමණට වඩා අධික වන්නේ නම් එය අසමානුපාතික ලෙස සලකනු ලැබේ.

182. සමානුපාතිකත්වයේ මූලධර්මය I වෙනි අමතර කෙටුම්පතෙහි දක්වා ඇති අතර, සමානුපාතිකත්වයේ මූලධර්මය උල්ලංඝනය කිරීමක් "යම් ප්‍රහාරයක් මගින් අපේක්ෂා කරනු ලබන ප්‍රත්‍යක්ෂ සහ සෘජු හමුදාමය වාසිය සැලකීමේ දී, ආනුෂංගික ලෙස සිදුවනු ඇතැයි අපේක්ෂා කරනු ලැබිය හැකි සිවිල් ජීවිත අහිමි වීම, සිවිල් වැසියන්ට තුවාල වීම හෝ සිවිල් වස්තූන්ට හානි වීම හෝ ඒවායෙහි සංයෝජනය එම හමුදාමය වාසියට සාපේක්ෂව පමණට වඩා අධික වන ප්‍රහාරයක්" ලෙස එම කෙටුම්පතෙහි 51(ආ) වගන්තියෙහි සඳහන් වේ.[115] "ආනුෂංගික" යන්න එම විධිවිධානයෙහි ඇති ප්‍රධාන යෙදුමක් වේ. මේ අනුව, සමගාමී ලෙස ඇතැම් සිවිල් වැසියන්ට තුවාළ සිදුවීම ප්‍රහාරයක් බැලූ බැල්මට අසමානුපාතික ප්‍රහාරයක් බවට පත් නොකරනු ඇත. ගාර්ඩම් සඳහන් කර ඇති පරිදි, හමුදාමය ක්‍රියාවක ප්‍රතිඵලයක් ලෙස "ඇතැම් සිවිල් වැසියන්ට හානි සිදුවිය හැකිය" යන්න සන්නද්ධ ගැටුම් පිළිබඳ නීතිය මගින් පිළිගනියි[116]. එහෙත් සමානුපාතිකත්වය පිළිබඳ මූලධර්මය උල්ලංඝනය වනු ඇත්තේ "ප්‍රහරයට සමගාමීව සිවිල් වැසියන්ට සිදුවන හානි ප්‍රහාරය මගින් ලැබෙන නිශ්චිත හමුදාමය ප්‍රතිලාභයට සමානුපාතික නොවන්නේ නම් පමණි"[117] සමානුපාතිකත්වය වෙන්කිරීම සහ අවශ්‍යතාවය පිළිබඳ මූලධර්ම සමග සමීපව සම්බන්ධ වී ඇති

---

[112] එක්සත් ජනපදය එදිරි විල්හෙල්ම් ලිස්ට් සහ තවත් අය, ("ප්‍රාණ ඇපකරුවන් පිළිබඳ නඩුව"), එක්සත් ජනපද හමුදා විනිශ්චය සභාව, නුරෙම්බර්ග්, IX TWC 757 (1948 පෙබරවාරි 19), පි. 1253-4.

[113] හේග් IV 1907, 23(උ) වගන්තිය.

[114] ජාත්‍යන්තර අපරාධ අධිකරණයේ රෝම ප්‍රඥප්තිය, 1998 ජූලි 17, බලාත්මක වීම 2002 ජූලි 1, 2187 UNTS 90. 8(2)(ආ)(xiii) වෙනි වගන්තිය ("රෝම ප්‍රඥප්තිය") මගින් "යුද්ධයේ අවශ්‍යතා අනුව අනිවාර්යයෙන් ම අවශ්‍ය කරන්නක් නොවන "සතුරු දේපළ විනාශ කිරීම හෝ අල්ලා ගැනීම යුද අපරාධයක් නොවේ. ඉලක්ක කිරීමේදී හමුදාමය අවශ්‍යතාවය පිළිබඳ සංකල්පය පිළිබඳව වන 7 වෙනි පරිච්ඡේදය වැඩිදුරටත් බලන්න.

[115] I වෙනි අමතර කෙටුම්පත, 51(5)(ආ) වගන්තිය.

[116] ජුඩිත් ගාර්ජම්, "බලය යෙදීමේ විකල්පය පිළිබඳ නීතිය සහ එදිරිවාදිකම් සිදු කිරීම පාලනය කරන නීතිය", ලෝරන්ස් බොයිසන් ද වැසෝර්න්ස් සහ ෆිලිප් සෑන්ඩ්ස් (කතුවරුන්), ජාත්‍යන්තර නීතිය, අන්තර්ජාතික යුක්ති අධිකරණය සහ ජාත්‍යන්තර නීතිය, (කේම්බ්‍රිජ් විශ්වවිද්‍යාල මුද්‍රණාලය, 1999), පි. 283

[117] න්‍යෂ්ටික අවි, 936 ඡේදය ද බලන්න (විනිසුරු නිගින්ස්ගේ විරුද්ධ මතය)

අතර, එම නිසා එය හැකිතාක් දුරට, සිවිල් වැසියන්ට සහ සිවිල් වස්තූන්ට සිදුවන හානිය, තුවාල සහ මරණය සීමා කිරීමට උත්සාහ කරන අතර ම, හමුදා මෙහෙයුමේ අවශ්‍යතාවය ඉටුකර ගැනීම සඳහා ද ඉඩ සලසයි.

(ඈ). අනවශ්‍ය පීඩා සහ අධික තුවාල ඇති කිරීම තහනම් කිරීම

183. සන්නද්ධ ගැටුම් පිළිබඳ නීතිය මගින් අධික තුවාල හෝ අනවශ්‍ය පීඩා ඇතිකිරීමට හේතු වන යුද්ධ කිරීමේ විධි හෝ ක්‍රමවේද භාවිතා කිරීම තහනම් කරයි. අවි ආයුධ ගිවිසුම්වලින් බහුතරයකට පදනම් වී ඇති මූලධර්මය මගින් තුවාල ලැබූ පුද්ගලයින්ගේ පීඩාවන් අනවශ්‍ය ලෙස උග්‍ර කරවන, නැත හොත් නොවැළැක්විය හැකි ලෙස ඔවුන්ගේ මරණය සිදුකරවන ආකාරයෙන් හමුදා අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා දැඩි ලෙස අවශ්‍ය කරන ප්‍රමාණයට වඩා වැඩියෙන් සටන්කරුවන්ට තුවාල කිරීම තහනම් කරයි. මෙම මූලධර්මය හමුදාමය අවශ්‍යතාවයේ මූලධර්මයට ප්‍රතිවිරෝධයක් ලෙස පවතියි; ශාන්ත පීටර්ස්බර්ග් ප්‍රකාශනයේ පූර්විකාව මෙයට නිදර්ශනයක් සපයයි:

> *"ශිෂ්ටාචාරයේ ප්‍රගතිය මගින් යුද්ධයේ විපත් හැකිතාක් දුරට සමනය කිරීමේ බලපෑමක් ඇති කළ යුතු බව; යුද්ධයේ දී රාජ්‍යයන් විසින් ඉටුකර ගැනීමට උත්සාහ කළ යුතු එකම නීත්‍යානුකූල අරමුණ සතුරාගේ හමුදා බලය දුර්වල කිරීම බව; මේ සඳහා හැකි උපරිම පුද්ගලයින් සංඛ්‍යාවක් අක්‍රිය කිරීම ප්‍රමාණවත් වන බව; ආබාධයට ලක්වූ මිනිසුන්ගේ පීඩාවන් අනවශ්‍ය ලෙස උග්‍ර කරන හෝ ඔවුන්ගේ මරණය වළක්වාගත නොහැකි වන ආයුධ භාවිතා කිරීම මගින් මෙම අරමුණ ඉක්මවා යන බව; එබැවින් එවැනි ආයුධ භාවිතා කිරීම මනුෂ්‍යත්වයේ නීතිවලට පටහැනි වනු ඇති බව සැලකිල්ලට ගනිමින්."*[118]

184. අධික තුවාල හෝ අනවශ්‍ය පීඩා ඇති කිරීම තහනම් කිරීම 1907 හේග් රෙගුලාසි[119] I වෙනි අමතර කෙටුම්පත[120] ඇතුළු ජාත්‍යන්තර මානුෂීය නීති ලේඛන ගණනාවක අඩංගු වන අතර, එය අධික ලෙස හානි කළ හැකි හෝ අවිචාරවත් බලපෑම් ඇතිවනු ඇතැයි සැලකිය හැකි සාම්ප්‍රදායික අවි භාවිතය තහනම් කිරීම හෝ සීමා කිරීම පිළිබඳ 1980 සම්මුතියට පදනම්වී ඇති දර්ශනය වේ.[121]

185. ජාත්‍යන්තර හෝ ජාත්‍යන්තර නොවන ගැටුමක් වේවා, යම් සන්නද්ධ ගැටුමක ස්වභාවය කුමක් වුවද, ඉහත සඳහන් කළ මූලධර්ම ශ්‍රී ලංකාවේ ජාත්‍යන්තර නොවන සන්නද්ධ ගැටුම පාලනය කරන මූලධර්ම වනු ඇති අතර, පසුගිය කොමිෂන් සභා මගින් සහ වඩාත් විශේෂිතව සඳහන් කරන්නේ නම් රටේ යුද්ධයේ අවසන් අදියර දක්වා පැවත ඇති අනෙකුත් ආයතනිකව ස්ථාපනය කරන ලද ආයතන සහ ක්‍රමවේද මගින් ඉදිරිපත් කරන ලද කතිකාවන් සහ වෘත්තාන්තවලට වැදගත් වන්නේ මෙම මූලධර්මයි.

වගවීම පිළිබඳ විවිධ අනුවාද

186. මෙම කොමිෂන් සභා සහ අනෙකුත් ආයතනික වශයෙන් ස්ථාපනය කරන ලද ආයතන විසින් යුද්ධය මෙහෙයවීම සම්බන්ධයෙන් ලබා දී ඇති ජාත්‍යන්තර මානුෂීය නීතිය පිළිබඳ විවිධ අර්ථකථන පිළිබඳව මෙම ජනාධිපති විමර්ශන කොමිෂන් සභාව දැනුවත්ව සිටින නමුත්, ආරම්භයේ දී ප්‍රකාශ කළ පරිදි, මෙම ජනාධිපති විමර්ශන කොමිෂන් සභාව මෙම කොමිෂන් සභාවට ලබා දී

---

[118] ශාන්ත පීටර්ස්බර්ග් ප්‍රකාශය, පෙරවදන, අවධාරණයකිරීම එකතු කරන ලදී.

[119] හේග් IV 1907, 23 වෙනි වගන්තිය

[120] I වෙනි අමතර කෙටුම්පත, 36 වෙනි වගන්තිය

[121] 1980 ඔක්තෝබර් 10 දිනැති සාම්ප්‍රදායික අවිආයුධ පිළිබඳ සම්මුතිය ලෙස ද හැඳින්වේ, බලාත්මකවීම 1983 දෙසැම්බර් 2, 1342 UNTS.

ඇති විධිනියෝගය මගින් විමර්ශනය කිරීමට නියම කර ඇති කොමිෂන් සභා විසින් සොයාගන්නා ලද කරුණු පමණක් මෙහි දැක්වීම යෝග්‍ය වේ. කෙසේ වෙතත්, යුද්ධය සම්බන්ධ නඩු පැවරීම සම්බන්ධයෙන් පවතින විවිධ අනුවාද සැලකිල්ලට ගැනීමේ දී,[122] මෙම ජනාධිපති විමර්ශන කොමිෂන් සභාව 'සත්‍ය සෙවීමේ සහ ප්‍රතිසන්ධාන කොමිෂන් සභාවක්' වැනි සත්‍ය සෙවීමේ යාන්ත්‍රණ ඇතුළුව මෙම අවසන් වාර්තාවේ යෝජනා කර ඇති විමර්ශන ආයතන වෙත අවසානයේ එම විවිධ ගැටළු විනිශ්චය කිරීමේ ප්‍රශ්නය ඉතිරි කරයි. පූර්වගාමී කොමිෂන් සභා විසින් සහ, තරාතිරම කුමක් වුව ද, ආයතනික වශයෙන් පිහිටුවන ලද අනෙකුත් ආයතන විසින් හුවා දක්වන ලද යුද්ධයේ අවසන් අදියරේ දී සිදුවූ සිදුවීම් විමර්ශනය කළ යුතු අතර, ජාත්‍යන්තර මානුෂීය නීතිය උල්ලංඝණය වී ඇති බවට සාක්ෂි මතු වුව හොත්, විකල්පයක් ලෙස යුක්තිය ඉටුකිරීම සමග සත්‍ය සෙවීමට ද කටයුතු කළ යුතු ය.

187. මෙමගින් මෙරටට පීඩා ඇති කළ යුද්ධයේ අවසන් අදියරට අදාළ ගැටළු නිමා කර දැමීම සහතික කෙරෙන අතර, දීර්ඝ කාලයක් මුළුල්ලේ මෙරටට උදාකර ගැනීමට දුෂ්කරව තිබූ සාමය උදාකර ගෙන, මෙරට සාමයේ, සංහිඳියාවේ සහ ආරක්ෂාවේ දීර්ඝකාලීන තිරසරභාවයේ යහපත උදෙසා එහි දීප්තිය විහිදුවිය යුතු කාලය එළඹ ඇත.

188. එම පදනම දැමීමෙන් පසුව, යුද්ධයේ අවසන් අදියරේ දී ජාත්‍යන්තර මානුෂීය නීතිය උල්ලංඝනය කිරීම් සම්බන්ධ වගවීමේ ගැටළු ලෙස උගත් පාඩම් සහ ප්‍රතිසන්ධාන කොමිෂන් සභාව විසින් වටහාගෙන ඇති කරුණු මොනවා දැයි මෙම ජනාධිපති විමර්ශන කොමිෂන් සභාව දැන් විමසා බලයි.

189. උගත් පාඩම් සහ ප්‍රතිසන්ධාන කොමිෂන් සභාව සහ පරණගම කොමිෂන් සභාව විසින් සොයා ගන්නා ලද ජාත්‍යන්තර මානුෂීය නීතිය සහ ජාත්‍යන්තර මානව හිමිකම් නීතිය උල්ලංඝනය කිරීම් පිළිබඳව සොයාගත් කරුණු සහ ඒවායෙහි නිර්දේශ නිශ්චය කරගැනීමට මෙම ජනාධිපති විමර්ශන කොමිෂන් සභාව උත්සාහ කරන්නේ මෙම පසුබිම තුළ ය. එම කොමිෂන් සභා විසින් සොයා ගන්නා ලද ජාත්‍යන්තර මානුෂීය නීතිය සහ ජාත්‍යන්තර මානව හිමිකම් නීති උල්ලංඝනය කිරීම් පිළිබඳ සොයාගැනීම් තෝරා වෙන්කර ගැනීමේ සහ ඒවායේ නිර්දේශ ක්‍රියාත්මක කර තිබේද යන්න තහවුරු කර ගැනීමේ අවශ්‍යතාවය මෙහි විධිනියෝගය මගින් නියම කර ඇති බව මතක තබා ගත යුතුය.

190. මෙම ජනාධිපති විමර්ශන කොමිෂන් සභාව පළමුවෙන් ම උගත් පාඩම් සහ ප්‍රතිසන්ධාන කොමිෂන් සභාව විසින් සොයා ගන්නා ලද කරුණු සහ එහි නිර්දේශ තහවුරු කර ගන්නා අතර, ඉන් අනතුරුව සාක්ෂිකරුවන් විසින් සපයනු ලබන කරුණු මත පදනම්ව, ශ්‍රී ලංකා රජය එම නිර්දේශ ක්‍රියාත්මක කිරීමට දරන ප්‍රයත්නයන් ද සඳහන් කරනු ඇත. ඉන් පසුව මෙම ජනාධිපති විමර්ශන කොමිෂන්

---

[122] *යුද්ධයේ අවසාන අදියර සම්බන්ධයෙන් ඇති වගවීම පිළිබඳ විවිධ අනුවාද සඳහා, ශ්‍රී ලංකාවේ වගවීම පිළිබඳ එක්සත් ජාතීන්ගේ මහ ලේකම්වරයාගේ විශේෂඥ මණ්ඩලයේ වාර්තාව,* 2011 මාර්තු 31*; උගත් පාඩම් සහ ප්‍රතිසන්ධානය පිළිබඳ විමර්ශන කොමිෂන් සභාවේ වාර්තාව, 2011 නොවැම්බර්; සත්‍ය පිළිබඳ ගැටළු සහ වගවීම පිළිබඳ වෘත්තාන්ත iii, ශ්‍රී ලංකාවේ යුද්ධයේ අවසාන අදියර,* 2014 ජූලි*; ශ්‍රී ලංකාව පිළිබඳව එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් පිළිබඳ මහ කොමසාරිස් කාර්යාලයේ වාර්තාව (OISL) A/HRC/30/CRP.2,* 2015 සැප්තැම්බර් 16; *ශ්‍රී ලංකාව පිළිබඳව එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් පිළිබඳ මහ කොමසාරිස් කාර්යාලයේ වාර්තාව පිළිබඳ සත්‍ය තක්සේරුවක්: සන්නද්ධ හමුදාවන්ට එරෙහි චෝදනා ප්‍රතික්ෂේප කිරීමක් (සංශෝධිත සහ යාවත්කාලීන කරන ලද 2 වෙනි සංස්කරණය) 2020 ජනවාරි; ඉසබෙල් ලැසී සහ නිරන් අනකෙටෙල් විසින් රචනා කරන ලද 'කරුණු සාධාරණීකරණය කිරීම සඳහා නීතිය නැවත අර්ථකථනය කිරීම, ශ්‍රී ලංකාවේ ජාත්‍යන්තර මානුෂීය නීති අර්ථ නිරූපණය පිළිබඳ විශ්ලේෂණයක්'; උගත් පාඩම් සහ ප්‍රතිසන්ධාන කොමිෂන් සභාවේ නිරීක්ෂණ පිළිබඳ යුධ හමුදා මණ්ඩලයේ වාර්තාව; ශ්‍රී ලංකාවේ මෑත කාලීන ගැටුම් අතරතුර සිදුවූ සිද්ධීන් සම්බන්ධයෙන් අධ්‍යයනය කර වාර්තා කිරීම සඳහා එක්සත් ජනපද රාජ්‍ය දෙපාර්තමේන්තුව විසින් පත් කරන ලද කමිටුවේ වාර්තාව, 2010 ඔක්තෝම්බර් 30* බලන්න.

සභාව විසින් සලකා බලනු ලබන අනෙකුත් කොමිෂන් සභා වන පරණගම කොමිෂන් සභාව සහ උදලාගම කොමිෂන් සභාව සම්බන්ධයෙන් ද නිගමන සහ නිර්දේශ තහවුරු කර ගැනීමේ එම ක්‍රියාවලිය ම අනුගමනය කරනු ඇත.

191. පූර්වගාමී කොමිෂන් සභාවල නිර්දේශ ක්‍රියාවට නංවා ඇත්දැයි සොයා බැලීම සඳහා මෙම ජනාධිපති විමර්ශන කොමිෂන් සභාව වාචික සහ ලිඛිත නියෝජනයන් ලබා දෙන ලෙස රජයේ විධායක අංශයේ ප්‍රධාන පාර්ශ්වකරුවන්ගෙන් ඉල්ලා සිටි බව සහ ශ්‍රී ලංකා රජය විසින් ගෙන ඇති පියවර අවධාරණය කර පෙන්වීම සඳහා කොමිෂන් සභාව එම තොරතුරු ඉදිරිපත් කරනු ඇති බව ද මතක තබා ගත යුතු ය.[123]

192. මෙම ජනාධිපති විමර්ශන කොමිෂන් සභාව හමුවේ ලබා ගත් සාක්ෂිවල සංක්ෂිප්ත විස්තරයක් අඩංගු වන මෙම වාර්තාවේ 4 වෙනි පරිච්ඡේදය එහි 6 වෙනි පරිච්ඡේදයේ සඳහන් නිර්දේශ සඳහා අවශ්‍ය පදනම ද සපයයි. සාක්ෂිකරුවන් විසින් මෙම ජනාධිපති විමර්ශන කොමිෂන් සභාව ඉදිරියේ ඉදිරිපත් කරන ලද සාක්ෂි සහ ඒ සමග ඉදිරිපත් කරන ලද ලියකියවිලි ආදී ද්‍රව්‍ය එහි ප්‍රධාන නිර්දේශ සකස් කිරීමට අවශ්‍ය වැදගත්ම උපස්ථම්බය වන බව මෙම කොමිෂන් සභාව සඳහන් කර සිටියි.[124] එසේ පැවසීමෙන් පසු, මෙම ජනාධිපති විමර්ශන කොමිෂන් සභාව දැන් උගත් පාඩම් සහ ප්‍රතිසන්ධාන කොමිෂන් සභාව විසින් සොයා ගන්නා ලද කරුණු සහ එහි නිර්දේශ පිළිබඳව විමසා බලයි.

[123] සාක්ෂිකරුවන් ලබා දුන් සාක්ෂිවල සංක්ෂිප්තයක් සඳහා මෙම අවසාන වාර්තාවේ 4 වෙනි පරිච්ඡේදය සහ ප්‍රධාන සාක්ෂි පිළිබඳ සවිස්තරාත්මක වාර්තාවක් සඳහා මෙම අවසාන වාර්තාවේ II වෙනි වෙළුම බලන්න.

[124] නිර්දේශ සඳහා මෙම අවසාන වාර්තාවේ 6 වෙනි පරිච්ඡේදය බලන්න

II වෙනි කොටස: සොයාගත් කරුණු සහ නිර්දේශ

උගත් පාඩම් සහ ප්‍රතිසන්ධාන කොමිෂන් සභාව

ජාත්‍යන්තර මානුෂීය නීති ගැටළු

193. මෙම පරිච්ඡේදය තුළ, උගත් පාඩම් සහ ප්‍රතිසන්ධාන කොමිෂන් සභා වාර්තාව මගින් සොයා ගන්නා ලද ජාත්‍යන්තර මානුෂීය නීතිය සහ ජාත්‍යන්තර මානව හිමිකම් නීති උල්ලංඝනය කිරීම් පිළිබඳව මෙම ජනාධිපති විමර්ශන කොමිෂන් සභාව අවධානය යොමු කරයි. ශ්‍රී ලංකාවේ ජාත්‍යන්තර නොවන සන්නද්ධ ගැටුමට අදාළ ජාත්‍යන්තර මානුෂීය නීති කඩකිරීම් පිළිබඳව සාකච්ඡා කර ඇත්තේ උගත් පාඩම් සහ ප්‍රතිසන්ධාන කොමිෂන් සභා වාර්තාවේ 4 වෙනි පරිච්ඡේදයේ දී බව පෙන්වා දීම වැදගත් වේ. උගත් පාඩම් සහ ප්‍රතිසන්ධාන කොමිෂන් සභා වාර්තාවේ 4 වන පරිච්ඡේදයේ කොටස් පහකින් ජාත්‍යන්තර මානුෂීය නීති ගැටලු සාකච්ඡා කර ඇත. උගත් පාඩම් සහ ප්‍රතිසන්ධාන කොමිෂන් සභා වාර්තාවේ 4 වන පරිච්ඡේදයේ I වෙනි කොටසේ ජාත්‍යන්තර මානුෂීය නීතියේ පිළිගත් මූලධර්ම සම්බන්ධයෙන් සාකච්ඡා කරන අතර,[125] II වෙනි කොටසේ ශ්‍රී ලාංකීය අත්දැකීම විස්තර කරයි.[126] III වෙනි කොටසේ ජාත්‍යන්තර මානුෂීය නීතිය උල්ලංඝනය කිරීම් පිලිබඳ චෝදනා සන්දර්භය තුළ ශ්‍රී ලාංකීය අත්දැකීම් පිළිබඳ ඇගයීමක් සිදු කරන අතර, අභ්‍යන්තර ගැටුම් සඳහා එය අදාළ කිරීමේ දී ජාත්‍යන්තර මානුෂීය නීති තන්ත්‍රය පිළිබඳ එහි අවසාන කිරීමේ නිරීක්ෂණ සමග එම ඇගයීම අවසන් වේ.[127] සාක්ෂිකරුවන්ගේ කරුණු දැක්වීම් කිහිපයකට සවන් දීමෙන් පසුව උගත් පාඩම් සහ ප්‍රතිසන්ධාන කොමිෂන් සභාව ස්වකීය අවසන් වාර්තාවේ 4 වැනි පරිච්ඡේදයේ IV වෙනි කොටසේ[128] තුවාලකරුවන් පිළිබඳ නිශ්චිත සඳහනක් සිදු කරන අතර, වැනල් 4 වීඩියෝව මගින් එල්ලකර ඇති චෝදනා V වෙනි කොටසෙහි[129] සාකච්ඡා කර ඇත.

194. අපි උගත් පාඩම් සහ ප්‍රතිසන්ධාන කොමිෂන් සභාව විසින් සොයා ගන්නා ලද කරුණු සහ නිර්දේශ පිළිබඳව විමසා බලන්නේ එම අනුපිළිවෙලටයි.

ශ්‍රී ලංකාවේ අත්දැකීම - 4 වන පරිච්ඡේදයේ II වෙනි කොටස, උගත් පාඩම් සහ ප්‍රතිසන්ධාන කොමිෂන් සභාවේ වාර්තාව

195. තමන් ඉදිරියේ කරන ලද කරුණු දැක්වීම්වල දී උගත් පාඩම් සහ ප්‍රතිසන්ධාන කොමිෂන් සභාව විසින් විමර්ශනය කරන ලද, රජයේ මානුෂීය වගකීම් ඉටු කිරීම සම්බන්ධ ප්‍රධාන ක්ෂේත්‍ර 4 ක් තිබූ බව උගත් පාඩම් සහ ප්‍රතිසන්ධාන කොමිෂන් සභාව සඳහන් කරයි. (උගත් පාඩම් සහ ප්‍රතිසන්ධාන කොමිෂන් සභා වාර්තාවේ 4.31 ඡේදය)

    i. මානව හිමිකම් සහ ජාත්‍යන්තර මානුෂීය නීතියේ අදාළ අංශ පිළිබඳව සන්නද්ධ හමුදා සාමාජිකයින් දැනුවත් කිරීමේ වගකීම.

---

[125] උගත් පාඩම් සහ ප්‍රතිසන්ධාන කොමිෂන් සභාව, 4.1-4.28 ඡේද බලන්න

[126] ibid., 4.29-4.260 ඡේද

[127] උගත් පාඩම් සහ ප්‍රතිසන්ධාන කොමිෂන් සභාව, ඡේද 4.261-4.322 (ජාත්‍යන්තර මානුෂීය නීතිය උල්ලංඝනය කිරීමේ චෝදනා සම්බන්ධයෙන් ශ්‍රී ලංකා අත්දැකීම්) සහ 4.323-4.338 ඡේද (අභ්‍යන්තර ගැටුම් සඳහා එහි යෙදීමේදී IHIL, පාලන තන්ත්‍රය පිළිබඳ අවසාන නිරීක්ෂණ)

[128] උගත් පාඩම් සහ ප්‍රතිසන්ධාන කොමිෂන් සභාව. පි.137

[129] උගත් පාඩම් සහ ප්‍රතිසන්ධාන කොමිෂන් සභාව. 4.340-4.360 සහ 4.361-4.377 ඡේද

ii. හමුදා මෙහෙයුම් වලදී සිවිල් වැසියන් ආරක්ෂා කිරීමට සහ සිවිල් වැසියන්ට සිදුවන අනතුරු වළක්වා ගැනීමට පියවර ගැනීම.

iii. ගැටුම් පවතින ප්‍රදේශවල සිවිල් වැසියන්ට ආහාර සහ ඖෂධ ඇතුළු මානුෂීය සහන සැපයීම.

iv. සිවිල් වැසියන් සහ සටන්කරුවන් මුදාගත් ප්‍රදේශ වෙත ගමන් කිරීමේදී ආරක්ෂක අංශවල හැසිරීම.

196. සන්නද්ධ හමුදාවලට ජාත්‍යන්තර මානුෂීය නීතිය ඉගැන්වීමේ වගකීම සන්නද්ධ ගැටුම් කාලවලදී මෙන් ම සාමය පවතින කාලවලදී ද අදාළ වන බව ජාත්‍යන්තර මානුෂීය නීතියට අදාළ ප්‍රධාන සම්මුතීන්හි විශේෂිතව දක්වා ඇති බව ජාත්‍යන්තර මානුෂීය නීතිය සහ මානව හිමිකම් පිළිබඳ අධ්‍යාපනය සහ පුහුණුව යන මාතෘකාව යටතේ උගත් පාඩම් සහ ප්‍රතිසන්ධාන කොමිෂන් සභාව ප්‍රකාශ කරයි. (උගත් පාඩම් සහ ප්‍රතිසන්ධාන කොමිෂන් සභා වාර්තාවේ 4.31-4.32 ඡේද)

197. 2003 වසරේ සිට ශ්‍රී ලංකා යුද හමුදාව එහි සාමාජිකයින්ට මානව හිමිකම් සහ ජාත්‍යන්තර මානුෂීය නීතිය පිළිබඳ අධ්‍යාපන පාඨමාලා හඳුන්වා දී ඇති බව ජ්‍යෙෂ්ඨ ආරක්ෂක නිලධාරීන් අනාවරණය කළේ යැයි උගත් පාඩම් සහ ප්‍රතිසන්ධාන කොමිෂන් සභාව තවදුරටත් සඳහන් කරයි. ජාත්‍යන්තර රතු කුරුස සංවිධානයේ සහාය ඇතිව මෙම වැඩසටහන ක්‍රියාත්මක කර ඇත. ජාත්‍යන්තර මානුෂීය නීතිය සහ මානව හිමිකම් නීති යටතේ ඇති බැඳීම්වලට අනුකූල වීම සහතික කිරීමේ වගකීම පැවරී ඇති "මානව හිමිකම් සහ මානුෂීය නීති අධ්‍යක්ෂ මණ්ඩලය" නමින් වෙනම ම අධ්‍යක්ෂ මණ්ඩලයක් ශ්‍රී ලංකා යුද හමුදා මූලස්ථානයේ ස්ථාපනය කර තිබුණි. (උගත් පාඩම් සහ ප්‍රතිසන්ධාන කොමිෂන් සභා වාර්තාවේ 4.33 ඡේදය)

198. මෙම කර්තව්‍යය යුධ හමුදාව ඇතුළත සොල්දාදුවන් පුහුණුකිරීමේ, අධීක්ෂණය කිරීමේ සහ වාර්තා කිරීමේ පද්ධතියක් මගින් සිදු කර ඇත. ආරක්ෂක මූලස්ථාන, ප්‍රාදේශීය මූලස්ථාන, කාර්ය සාධක බළකා, බලඇණි මූලස්ථාන සහ ක්ෂේත්‍ර මට්ටම යන සෑම මට්ටමක මානව හිමිකම් කණ්ඩායම් පිහිටුවා තිබුණි. මානව හිමිකම් කණ්ඩායම් දෙසතියකට වරක් අදාළ මූලස්ථානයට රැස් වූ බව පැවසේ.

199. යුධ හමුදාව විසින් ජාත්‍යන්තර මානුෂීය නීතිය සහ මානව හිමිකම් පිළිබඳ විශේෂ පුහුණු පාසලක් කළුතර දිස්ත්‍රික්කයේ විවෘත කර තිබුණි. මෙහෙයුම් පැවති කාලය පුරාවටම අධිකාරී නොලත් නිලධාරීන් පුහුණු කර සටනේ නියැළී සිටින සෙබළුන් පුහුණු කිරීම සඳහා ක්ෂේත්‍රයට යවා ඇති බවද වැඩිදුරටත් සඳහන් විය. මෙම පුහුණු කිරීම් සම්මන්ත්‍රණ සහ පුහුණු පාඨමාලා පැවැත්වීම හරහා සිදු කර ඇති අතර එය ශ්‍රී ලංකා නාවික හමුදාව සහ ගුවන් හමුදාව වෙත ද ව්‍යාප්ත කර ඇත. (උගත් පාඩම් සහ ප්‍රතිසන්ධාන කොමිෂන් සභා වාර්තාවේ 4.34 ඡේදය)

200. ජාත්‍යන්තර මානුෂීය නීතිය සහ ජාත්‍යන්තර මානව හිමිකම් නීතිය පිළිබඳ අධ්‍යාපනය සහ පුහුණුව සඳහා ජාත්‍යන්තර රතුකුරුස සංවිධානය ලබා දුන් දායකත්වය සැලකීමේදී, ශ්‍රී ලංකා යුධ හමුදාව ජාත්‍යන්තර රතුකුරුස සංවිධානයේ සහාය ඇතිව, තමන් විසින් ම සකස් කරන ලද ජාත්‍යන්තර මානුෂීය නීතිය පිළිබඳ ඉගැන්වීමේ සහ පුහුණු කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කළ බව සඳහන් වන ජාත්‍යන්තර රතුකුරුස සංවිධානයේ 2009 වාර්ෂික වාර්තාව කෙරෙහි උගත් පාඩම් සහ ප්‍රතිසන්ධාන කොමිෂන් සභාවේ අවධානය යොමු කර ඇත. යුධහමුදාවේ මාණ්ඩලික විද්‍යාලයේ, සාම සහාය පුහුණු මධ්‍යස්ථානයේ සහ ශිෂ්‍යභට විද්‍යාපීඨයේ සාමාජිකයින් ජාත්‍යන්තර රතුකුරුස සංවිධානය විසින් සංවිධානය කරන ලද ජාත්‍යන්තර මානුෂීය නීතිය පිළිබඳ දැනුම්වත් කිරීමේ සැසි සඳහා සහභාගී වී ඇති අතර, මුහුදේ ක්‍රියාකාරී මෙහෙයුම්වල නිරත වූ යුධ හා නාවික හමුදා සාමාජිකයින් ද ඒවාට සහභාගී වී ඇත. ජාත්‍යන්තර රතුකුරුස සංවිධානය විසින් සංවිධානය කරන ලද එම දැනුම්වත්

කිරීමේ සැසිවාරවලට සහභාගී වීම සඳහා පොලිසියේ සහ ග්‍රාමාරක්ෂක සේවයේ ප්‍රාදේශීය මට්ටමේ අණදෙන නිලධාරීන් සමග තාවකාලික වැඩපිළිවෙළ යොදන ලද බව ද ජාත්‍යන්තර රතුකුරුස සංවිධානයේ වාර්තාවේ ද සඳහන් විය.[130]

201. ජාත්‍යන්තර මානුෂීය නීතිය සහ ජාත්‍යන්තර මානව හිමිකම් නීතිය පිළිබඳ මූලධර්ම කාලයත් සමග වැඩිදියුණු වන බැවින් ආරක්ෂක හමුදාවන්ට එම මූලධර්ම පිළිබඳ අඛණ්ඩ උපදෙස් සහ ශික්ෂණය ලබා දීමේ වැදගත්කම නැවත අවධාරණය කිරීමට මෙම ජනාධිපති විමර්ශන කොමිෂන් සභාව මෙය අවස්ථාව කර ගනියි.[131]

202. ජාත්‍යන්තර මානුෂීය නීතිය සහ ජාත්‍යන්තර මානව හිමිකම් නීතිය පිළිබඳ පුහුණුව ඒකාබද්ධ කරමින් ශ්‍රී ලංකා යුධ හමුදාව විසින් පවත්වනු ලබන පාඨමාලා කිහිපයක් ඇතුළත් විස්තීර්ණ අත්පොතක් සහ වෘත්තීය සංවර්ධන මොඩියුල මෙම ජනාධිපති විමර්ශන කොමිෂන් සභාවට සපයා දී ඇත. ශ්‍රී ලංකා යුධ හමුදාවේ, නිලධාරීන්ගේ පුහුණු පාඨමාලාවල විෂයමාලා මානව සම්පත් සහ ජාත්‍යන්තර මානව හිමිකම් නීති පිළිබඳ මූලික පාඨමාලා සහ මානව සම්පත් සහ ජාත්‍යන්තර මානව හිමිකම් නීති පිළිබඳ උසස් පාඨමාලා වලින් සමන්විත වන බව පෙනෙයි. මෙම පාඨමාලා ශ්‍රී ලංකාවේ ජාත්‍යන්තර රතුකුරුස සංවිධානයේ මෙහෙවර සමග සහයෝගයෙන් සියලු ම පුහුණු පාසල් සහ ආයතනවල පවත්වනු ලබන බව පෙනෙන්නට තිබේ.

203. මෙම ජනාධිපති විමර්ශන කොමිෂන් සභාව දැන් උගත් පාඩම් සහ ප්‍රතිසන්ධාන කොමිෂන් සභාව විසින් සොයා ගන්නා ලද ජාත්‍යන්තර මානුෂීය නීතිය උල්ලංඝනය කිරීම් පිළිබඳව සොයා බලයි.

යුධ මුක්ත කලාප සහ මිනිස් පලිහ

204. උගත් පාඩම් සහ ප්‍රතිසන්ධාන කොමිෂන් සභාව ස්වකීය වාර්තාවේ 4.267 සහ 4.268 ඡේදවල යුධ මුක්ත කලාප සහ එම යුධ මුක්ත කලාප පිහිටුවා ඇති ආකාරය පිළිබඳව සඳහන් කරයි. එල්.ටී.ටී.ඊ. සංවිධානය සමග විධිමත් ගිවිසුමකට එළැඹී නැති නමුත්, ප්‍රධාන යුධ මුක්ත කලාප පිහිටුවීමට හේතු වූ තත්ත්වයන් පිළිබඳව ජාත්‍යන්තර රතුකුරුස සංවිධානයේ නියෝජිත කණ්ඩායමේ ප්‍රධානියා මනා අවබෝධයක් සහිතව තොරතුරු ඉදිරිපත් කර ඇති බව එහි සඳහන් වේ. එසේ වුවද, යුධ හමුදාවේ ඉදිරිපෙළ ආසන්නයේම එම යුධ මුක්ත කලාප පිහිටා තිබූ අතර, එල්.ටී.ටී.ඊ. සංවිධානය බර අවි සමග යුධ මුක්ත කලාපවලට ඇතුල්වී තිබුණි. එල්.ටී.ටී.ඊ. සංවිධානය සිවිල් වැසියන් මිනිස් පලිහක් ලෙස යොදා ගනිමින් ආරක්ෂක හමුදාවන්ට එරෙහිව ප්‍රහාරයක් දියත් කිරීම සඳහා මෙම යුධ මුක්ත කලාප අථත්‍ය කඳවුරක් බවට පත් කරගත් බව කියනු ලැබේ. එල්.ටී.ටී.ඊ. සංවිධානයේ ක්‍රියාකාරකම් හේතුවෙන් ඔවුන් යුධ මුක්ත කලාප සීමාව තුළ ස්ථානගත වී සිටි ස්ථානවලට වෙඩි තැබීමට ආරක්ෂක හමුදාවන්ට සිදුවූ බවත්, එමගින් සිවිල් වැසියන් ආසන්න අනතුරකට නිරාවරණය වූ බවත් උගත් පාඩම් සහ ප්‍රතිසන්ධාන කොමිෂන් සභාව ස්වකීය වාර්තාවේ 4.269 ඡේදයේ සඳහන් කර ඇත.[132]

205. යුධ මුක්ත කලාප වල සිට ශ්‍රී ලංකා රජයේ පාලනය යටතේ පැවති ප්‍රදේශවලට සිවිල් වැසියන්ට ආරක්ෂිතව ගමන් කිරීම පහසු කිරීම සඳහා 'ආරක්ෂිත කොරිඩෝ' පිහිටුවා තිබූ බව උගත් පාඩම් සහ

---

[130] උගත් පාඩම් සහ ප්‍රතිසන්ධාන කොමිෂන් සභාව, 4.35 ඡේදය, පි.50

[131] හිලෙයාර් මැක්කුබ්‍රි විසින් රචිත *යුධ ගැටුම් සීමා කිරීම සම්බන්ධයෙන් ජාත්‍යන්තර මානුෂීය නීතියේ නූතන වැඩිදියුණුවීම්* (2 වෙනි සංස්කරණය), ජාත්‍යන්තර රතු කුරුස සංවිධානය, *ජාත්‍යන්තර මානුෂීය නීතිය සහ වර්තමාන සන්නද්ධ ගැටුම්වල අභියෝග; සන්නද්ධ ගැටුම්වලදී ආරක්ෂාව සම්බන්ධයෙන් නැවත කැපවීම, ජිනීවා සම්මුතිවල 70 වෙනි සංවත්සරය* (ඔක්තෝබර් 2019)

[132] උගත් පාඩම් සහ ප්‍රතිසන්ධාන කොමිෂන් සභාව, ඡේද 4.267-4.268

ප්‍රතිසන්ධාන කොමිෂන් සභාව සොයා ගෙන ඇත. ශ්‍රී ලංකා යුද හමුදාව සහ ජාත්‍යන්තර රතුකුරුස සංවිධානයේ නියෝජිත ප්‍රධානියා අතර යුධ මුක්ත කලාප මායිම් නිර්ණය කිරීම පිළිබඳව සිදුකර තිබූ ලිපි හුවමාරු මගින් මෙම යාන්ත්‍රණය පිළිබඳ තහවුරු විය. කෙසේ වෙතත්, එල්.ටී.ටී.ඊ. සංවිධානය මරාගෙන මැරෙන සාමාජිකයින් යොදා ගනිමින් සිවිල් වැසියන් ගමන් කිරීම වැළැක්වූ අතර, ඒ වෙනුවට සිවිල් වැසියන් මිනිස් පලිහක් ලෙස යොදා ගත් බව ද නිරීක්ෂණය වේ. එල්.ටී.ටී.ඊ. සංවිධානය විසින් යුධ මුක්ත කලාප ව්‍යුහය ම ඔවුන්ගේ සටන් මෙහෙයුම් සහ යුධ උපායමාර්ග තුළට ඇතුළත් කර ගැනීම නිසා එම සංවිධානය ජාත්‍යන්තර මානුෂීය නීතිය යටතේ වන ඔවුන්ගේ බැඳීම් බරපතල ලෙස උල්ලංඝනය කර ඇතැයි උගත් පාඩම් සහ ප්‍රතිසන්ධාන කොමිෂන් සභාව නිගමනය කරයි.[133]

206. 4.275 ඡේදය මගින් උගත් පාඩම් සහ ප්‍රතිසන්ධාන කොමිෂන් සභාව, එල්.ටී.ටී.ඊ. සංවිධානය විසින් ජලයෙන් දෙපැත්තකින් අවහිර වූ පටු බිම් තීරුවකට යාමට සිවිල් වැසියන්ට බල කළ බව දැක්වෙන උදාහරණයක් ඉදිරිපත් කරයි. එල්.ටී.ටී.ඊ. සංවිධානය පසුව සිවිල් වැසියන් අතර ජංගම කාලතුවක්කු ඒකක තැබූ අතර, ආරක්ෂිත කලාප තුළ සිටි කුඩා ළමයින් ඇතුළු සිවිල් වැසියන් බලහත්කාරයෙන් බඳවා ගන්නා ලදී. එම තත්ත්වයන් තුළ එල්.ටී.ටී.ඊ. සංවිධානයේ උපායමාර්ගය වූයේ සිවිල් ඇදුම් පැළඳුම් වලින් සැරසී වෙස්වලාගෙන සිටීම වන අතර, එය ආරක්ෂක හමුදාවන්ට සංකීර්ණ අභියෝග එල්ල කළේය. ජාත්‍යන්තර මානුෂීය නීතියේ පවතින ස්වරූපයෙන්, විශේෂයෙන් ම ජාත්‍යන්තර නොවන සන්නද්ධ ගැටුමක තත්වයන් තුළ, එම නීතියේ පවතින අඩුපාඩුව මෙවැනි උදාහරණයක් මගින් හෙළිදරව්කර පෙන්වන බව උගත් පාඩම් සහ ප්‍රතිසන්ධාන කොමිෂන් සභාව අවධාරණය කර සිටියි. උගත් පාඩම් සහ ප්‍රතිසන්ධාන කොමිෂන් සභාවේ ඉන් පසු නිරීක්ෂණ මගින් එල්.ටී.ටී.ඊ. සංවිධානය සිවිල් වැසියන් මිනිස් පලිහක් ලෙස යොදා ගනිමින් ආරක්ෂිත කොරිඩෝව හරහා ගමන් කළ අවස්ථා පිළිබඳව කනස්සල්ල පළ කරයි.[134]

207. පෙනී යන පරිදි, ආරක්ෂක හමුදා හසුරුවා ගැනීම සඳහා ජාත්‍යන්තර මානුෂීය නීති තන්ත්‍රයන් උපයෝජනය කරනු ලැබීම තම හමුදා වාසිය ලබා ගැනීම සඳහා සහ ප්‍රාණ ඇපකරුවන් ලෙස සිටින සිවිල් වැසියන් ආරක්ෂා කිරීම සඳහා කඩිනමින් ක්‍රියා කිරීමට සිදුවූ සටන් බිමේ සිටි අණදෙන නිලධාරීන්ට අභියෝග රැසක් එල්ල කළ බව උගත් පාඩම් සහ ප්‍රතිසන්ධාන කොමිෂන් සභාව සඳහන් කරයි. එබැවින් සටන් බිමේ සිටි අණදෙන නිළධාරීන් ගත් ක්‍රියාමාර්ග එම අවස්ථාවේ පැවති භූමි තත්ත්වය පිළිබඳ කඩිනම් තක්සේරුවකින් පසු ගැනීමට සිදු වූ ක්‍රියාමාර්ග වේ.[135]

208. පළමු වෙනි යුධ මුක්ත කලාපය නිර්මාණය කිරීමෙන් පසුව, සිවිල් වැසියන් රජයේ පැත්තට යාම අධෛර්යමත් කිරීම සඳහා එල්.ටී.ටී.ඊ. සංවිධානය පලා යන සිවිල් වැසියන්ට වෙඩි තැබීමේ සහ සිවිල් වැසියන්ට මරාගෙන මැරෙන බෝම්බකරුවන් යොදා ගනිමින් ප්‍රහාර එල්ල කරන බවට තර්ජනය කිරීමේ පිළිවෙත නිසි පරිදි සීමා ලකුණු කරන ලද ආරක්ෂිත කොරිඩෝවට යෝග්‍ය නොවන බව උගත් පාඩම් සහ ප්‍රතිසන්ධාන කොමිෂන් සභාව පවසයි. මෙය දෙවෙනි සහ තුන්වෙනි යුධ මුක්ත කලාප නිර්මාණය කිරීමට පෙළඹවූ අතර, එමගින් සිවිල් වැසියන්ට රජයේ පාලන ප්‍රදේශවලට යාමට හැකි විය.[136]

209. එල්.ටී.ටී.ඊ. සංවිධානයේ හැසිරීම, විශේෂයෙන් ම පුදුමාතලන් තීරයේ සිට මුල්ලවයික්කාල් දක්වා වූ ප්‍රදේශය තුළ ඔවුන්ගේ හැසිරීම නිසා, පෙරළා වෙඩිතබා සතුරාගේ ස්ථාන උදාසීන කිරීම හෝ සිවිල්

---

[133] උගත් පාඩම් සහ ප්‍රතිසන්ධාන කොමිෂන් සභාව, 4.272, 4.274 ඡේද

[134] උගත් පාඩම් සහ ප්‍රතිසන්ධාන කොමිෂන් සභාව, 4.275 ඡේදය

[135] එම

[136] උගත් පාඩම් සහ ප්‍රතිසන්ධාන කොමිෂන් සභාව. 4.277 ඡේදය

වැසියන් දෙසට වෙඩි තැබීමෙන් වැළකී සිටීම යන දෙකෙන් එකක් තෝරා ගැනීමට සිදුවූවා විය හැකි හමුදා අණදෙන්නන්ට නව අභියෝග එල්ල කරන්නට ඇති බව උගත් පාඩම් සහ ප්‍රතිසන්ධාන කොමිෂන් සභාව 4.278 ඡේදයෙන් යෝජනා කරයි. පළමු විකල්පය තෝරා ගැනීම මගින් සිවිල් වැසියන්ගේ ජීවිත අනතුරේ හෙළීමට ඉඩ ඇති බව උගත් පාඩම් සහ ප්‍රතිසන්ධාන කොමිෂන් සභාව විසින් පෙන්වා දෙන නමුත්, එකට එක කිරීමක් ලෙස පෙරළ වෙඩිතැබීමෙන් වැළකී සිටීමේ දෙවැනි විකල්පය මගින් අරමුණ පරාජය විය හැකි බව 4.279 ඡේදයේ දී එම කොමිෂන් සභාව තවදුරටත් සඳහන් කරයි.[137]

210. සිවිල් ජීවිතවලට සහ සිවිල් වස්තූන්ට අවම හානියක් සිදු වනු ඇතැයි අපේක්ෂා කළ හැකි ඉලක්කයක් තෝරා ගැනීමට රජය සතු බැඳීම අදාළ වන්නේ එවැනි තෝරා ගැනීමක් කළ හැකි අවස්ථාවල දී පමණක් වන බැවින් එවැනි තෝරාගැනීමක් සිදු කිරීම පරම වගකීමක් නොවන බව උගත් පාඩම් සහ ප්‍රතිසන්ධාන කොමිෂන් සභාව තවදුරටත් අදහස් දක්වයි.[138]

211. ආරක්ෂක හමුදා යුධ මුක්ත කලාපවල සිටි සිවිල් වැසියන්ට හිතාමතාම හානියක් සිදු නොකළ බවත්, ඒ වෙනුවට ඔවුන් අවශ්‍යතාවය අනුව සහ ඒ අවස්ථාවේ ඔවුන් ක්‍රියා කිරීම මග හැරියේ නම් සිදු විය හැකිව තිබූ විශාල හානිය සලකා බලා ක්‍රියා කර ඇති බව සිවිල් වැසියන්ට සිදු වී ඇති හානියේ තත්ත්වයන් පිළිබඳ විස්තර විශ්ලේෂණය කිරීමෙන් පසුව උගත් පාඩම් සහ ප්‍රතිසන්ධාන කොමිෂන් සභාව නිගමනය කරයි.[139]

212. දෙපාර්ශවය විසින් එල්ල කරන ලද වෙඩි හුවමාරුවේ දී සිවිල් වැසියන්ට තුවාල සිදු වුවද, ආරක්ෂක හමුදාව යුධ මුක්ත කලාප වල සිටි සිවිල් වැසියන් හිතාමතාම ඉලක්ක කර නොතිබූ බව උගත් පාඩම් සහ ප්‍රතිසන්ධාන කොමිෂන් සභාව සියලු කරුණු සහ තත්ත්වයන් සලකා බැලීමෙන් අනතුරුව නිගමනය කරයි. තවද, එල්.ටී.ටී.ඊ. සංවිධානය ගැටුම් පැවති ප්‍රදේශයේ සිට ආරක්ෂිත ප්‍රදේශවලට පලා යාමට තැත් කළ සිවිල් වැසියන් ඉලක්ක කර වෙඩි තැබීම සහ ඔවුන් මරා දැමීම, බිම් බෝම්බ වලින් එල්ල වූ තර්ජනය හා එහි ප්‍රතිඵලයක් ලෙස සිවිල් වැසියන්ට මරණය හා තුවාල සිදුවීම, නන්දිකඩාල් කලපුව තරණය කිරීමේදී සිදු වූ අන්තරායන් යන සාධක සියල්ල එක්වීම සිවිල් වැසියන්ට හානි කිරීමට දායක වී ඇත. එල්.ටී.ටී.ඊ. සංවිධානයේ තුවක්කු ස්ථානගත කර තිබූ ස්ථාන වෙත ප්‍රහාරයක් එල්ල කිරීම, හමුදා ප්‍රහාරයේ අරමුණට අදාළ හා සමානුපාතික දායකත්වයක් ලබා දෙනු ඇතැයි සද්භාවයෙන් යුතු අපේක්ෂාවක් තිබූ බව පෙනෙන්නට තිබුණේ යැයි නිගමනය කිරීම සාධාරණ වේ.[140]

213. ඉහත සඳහන් කරන ලද නිගමනවලට එළැඹීමෙන් පසුව උගත් පාඩම් සහ ප්‍රතිසන්ධාන කොමිෂන් සභාව, ආරක්ෂක හමුදා විසින් හිතාමතා ම සිවිල් වැසියන් ඉලක්ක කර නොතිබුණ ද, යුධ මුක්ත කලාප වෙත පෙරළා වෙඩි තැබීමට ආරක්ෂක හමුදා ගත් ක්‍රියාමාර්ගය සමානුපාතිකත්වය පිළිබඳ මූලධර්මයේ සන්දර්භය තුළ පමණට වඩා අධික ක්‍රියාවක් ද යන ප්‍රශ්නය සලකා බැලුවේය.[141] ඉහත විස්තර කර ඇති පරිදි එම අවස්ථාවේ උද්ගත වූ තත්ත්වයෙහි සංකීර්ණත්වය සැලකිල්ලට ගෙන, සියලු අංශ දැඩි සැලකිල්ලෙන් යුතුව විමසා බැලීමෙන් පසුව උගත් පාඩම් සහ ප්‍රතිසන්ධාන

---

[137] උගත් පාඩම් සහ ප්‍රතිසන්ධාන කොමිෂන් සභාව, 4.278-279 ඡේද

[138] සාම්ප්‍රදායික ජාත්‍යන්තර මානුෂීය නීතිය I වෙළුම, 5 වෙනි පරිච්ඡේදය, පි 67 - 103, '... මේ අනුව ප්‍රහාරකයෙකුට අරමුණු සාක්ෂාත් කර ගැනීමට සහ ඉඩ දිය හැකි අවදානමට යටත්ව එය කළ හැකි නම්, ඔහුට එයට අනුකූල විය හැකි ය, නැත හොත් එය කළ නොහැකි බව ඔහුට තීරණය කළ හැකි ය.'

[139] උගත් පාඩම් සහ ප්‍රතිසන්ධාන කොමිෂන් සභාව, 4.282 ඡේදය

[140] උගත් පාඩම් සහ ප්‍රතිසන්ධාන කොමිෂන් සභාව *ප්‍රධාන නිරීක්ෂණ සහ නිර්දේශවල සාරාංශය* නැමති 9 වෙනි පරිච්ඡේදයේ 9.6 වෙනි ඡේදය,.

[141] උගත් පාඩම් සහ ප්‍රතිසන්ධාන කොමිෂන් සභාව. 9.7 ඡේදය

කොමිෂන් සභාව දැරූ මතය වූයේ, වෙනත් විකල්පයක් තෝරා ගැනීමට නොහැකි වූ බැවින් පෙර නොවූ විරූ තත්ත්වයකට ආරක්ෂක හමුදාව මුහුණ දුන් බවත්, ආරක්ෂක හමුදාව එම අවස්ථාවේ ගත හැකි සියලු "ප්‍රායෝගික පූර්වාරක්ෂාවන්" ගෙන තිබූ බවත් ය.

214. හමුදා මෙහෙයුම් වලදී සිදුවන මරණ, තුවාල හෝ දේපළ හානි සම්බන්ධයෙන් රජයේ වගකීම පිළිබඳ ප්‍රශ්න සම්බන්ධ තීරණ ගැනීමේ දී, අදාළ මූලධර්ම සමූහය පිළිබඳව සඳහන් කරන ජාත්‍යන්තර විනිශ්චය සහා, "සටන් ක්‍රියාමාර්ග" සිදුවූ වාතාවරණයන් පිළිබඳ අදාළ සියළුම කරුණු ප්‍රමාණවත් පරිදි වාර්තාකර තිබුණ ද, එම සටන් සිදුවුණු සියලුම තත්ත්වයන් විනිශ්චය සභාවක් ඉදිරියේ ප්‍රතිසන්දර්භනයක් කිරීම "කළ නොහැකි දෙයක්" බව විස්තර කරයි.[142]

යුධ මුක්ත කලාපවල සිටි සිවිල් වැසියන් පිළිබඳ උගත් පාඩම් සහ ප්‍රතිසන්ධාන කොමිෂන් සභාවේ නිරීක්ෂණය

215. යුධ මුක්ත කලාපවල රඳවා සිටි සිවිල් වැසියන්ට සිදු වූ හානිය පිළිබඳ උගත් පාඩම් සහ ප්‍රතිසන්ධාන කොමිෂන් සභාවේ නිරීක්ෂණ සම්බන්ධයෙන් මෙම ජනාධිපති විමර්ශන කොමිෂන් සභාව දැනටමත් අවධානය යොමු කර ඇත.[143] උගත් පාඩම් සහ ප්‍රතිසන්ධාන කොමිෂන් සභාව 9 වෙනි පරිච්ඡේදයේ 9.6 වෙනි ඡේදයේ දී එම නිරීක්ෂණ නැවත අවධාරණය කරයි.

216. ආරක්ෂක හමුදා හිතාමතාම යුධ මුක්ත කලාපවල සිටි සිවිල් වැසියන් ඉලක්ක කර නොතිබූ බව උගත් පාඩම් සහ ප්‍රතිසන්ධාන කොමිෂන් සභාව 9.6 ඡේදයේ දී නිගමනය කරන අතර, 9.7 ඡේදයේ දී උගත් පාඩම් සහ ප්‍රතිසන්ධාන කොමිෂන් සභාව, ආරක්ෂක හමුදා පෙර නොවූ විරූ තත්වයකට මුහුණ දී, ඔවුන්ට තෝරා ගැනීමට තිබූ අනෙකුත් සියලු විකල්ප අවසන් වීමෙන් පසුව, අවශ්‍ය පරිදි, කළ හැකි සහ ශක්‍ය වූ, එවැනි ප්‍රායෝගික ක්‍රියාමාර්ග ගන්නා ලද බවට එම කොමිෂන් සභාව වෙත ලැබුණු සාක්ෂි වැදගත් සාක්ෂි සේ සැලකිල්ලට ගනියි.[144]

සිවිල් වැසියන් මරණයට පත්වීම හෝ තුවාල ලැබීම පිළිබඳ නිශ්චිත අවස්ථා

(අ) විමර්ශනය කර නඩු පැවරිය යුතු බවට උගත් පාඩම් සහ ප්‍රතිසන්ධාන කොමිෂන් සභාවේ නිර්දේශය.

217. උගත් පාඩම් සහ ප්‍රතිසන්ධාන කොමිෂන් සභාව යුධ මුක්ත කලාපවල සිදුවූ සිදුවීම් සම්බන්ධයෙන් රජයේ වගකීම පිළිබඳ ප්‍රශ්න සම්බන්ධ තීරණය කිරීමේදී කොමිෂන් සභාව මුහුණ දෙන දුෂ්කරතා පිළිබඳ කණගාටු වන අයුරින් ම, ස්වකීය අවධානය යොමුකරවන ලද සිවිල් වැසියන්ගේ ජීවිත හානිවීම ඇතුළු ඇතැම් සිදුවීම් ප්‍රතිසන්දර්භනය කිරීමට උත්සාහ කිරීමේදී කොමිෂන් සභාව මුහුණ දුන් ඒ හා සමාන දුෂ්කරතා ස්වකීය වාර්තාවේ 4.286 සහ 9.9 ඡේදවල නැවත අවධාරණය කරයි. උගත් පාඩම් සහ ප්‍රතිසන්ධාන කොමිෂන් සභාව තම වාර්තාවේ 4 වෙනි පරිච්ඡේදයේ එම සිදුවීම් සිදුවූ නිශ්චිත තත්ත්වයන් කවරේද යන්න නීර්ණය කිරීම තමන්ට දුෂ්කර බව සඳහන් කරන II වෙනි කොටසේ 4.106, 4.107, 4.109, 4.110 සහ 4.111 ඡේදවල මෙම සිදුවීම් විස්තර කර ඇත. කෙසේ වෙතත්, සිවිල් වැසියන්ට හානියක් සිදු කිරීමේ චේතනාවෙන් සිදු නොකළා විය හැකි වුවත්, සිවිල් වැසියන් මරණයට පත්වීම හෝ තුවාල සිදුවීම සම්බන්ධයෙන් ආරක්ෂක හමුදා සම්බන්ධව තිබිය හැකි ගම්‍යමානයන් එම කරුණු මගින් පෙන්වා දෙන බව උගත් පාඩම් සහ ප්‍රතිසන්ධාන කොමිෂන්

---

[142] උගත් පාඩම් සහ ප්‍රතිසන්ධාන කොමිෂන් සභාව, 9.8 වෙනි ඡේදය; ආයෝජන ආරවුල් විසඳීම සඳහා වන ජාත්‍යන්තර මධ්‍යස්ථානයේ 1990 ජූනි 27 දිනැති අංක ARB/87/3 දරන නඩුවේ "*සී/ස ආසියානු කෘෂිකාර්මික නිෂ්පාදන සමාගම එදිරි ශ්‍රී ලංකා ජනරජය අතර බේරුම්කරණය සම්බන්ධ කරුණ*" ද බලන්න.

[143] මෙම අවසන් වාර්තාවේ ඉහත අංක 211 සහ 212 ඡේද බලන්න.

[144] උගත් පාඩම් සහ ප්‍රතිසන්ධාන කොමිෂන් සභාව, 9.6 - 9.7 ඡේද

සභාව සඳහන් කරයි. මෙම තත්ත්වයන් තුළ, එවැනි සිදුවීම් සිදුවී තිබිය හැකි තත්ත්වයන් පිළිබඳව වඩාත් පූර්ණ ලෙස විමර්ශනය කිරීමටත්, වැරදි චර්යාවන් පිළිබඳව එම පරීක්ෂණ වලින් අනාවරණය වන්නේ නම්, එම වැරදි සම්බන්ධයෙන් නඩු පවරා දඬුවම් කිරීමටත් රජය පාර්ශ්වයෙන් වගකීමක් ඇති බව උගත් පාඩම් සහ ප්‍රතිසන්ධාන කොමිෂන් සභාව අවධාරණය කරයි.[145]

218. විමර්ශනය කර නඩු පැවරිය යුතු යැයි උගත් පාඩම් සහ ප්‍රතිසන්ධාන කොමිෂන් සභාව සිදුකරන තවත් නිර්දේශයක් 9.37අ ඡේදයේ දක්නට ලැබේ:

අංක 4.359 vi, (a) සහ (b) හි සඳහන් නිරීක්ෂණවල දක්වා ඇති නිශ්චිත අවස්ථා සහ සිවිල් වැසියන්ට හිතාමතා ම ප්‍රහාර එල්ල කිරීම පිළිබඳ සිද්ධීන් කිසිවක් වාර්තා වී තිබේ නම් එම සිද්ධීන් පිළිබඳව විමර්ශනය කිරීමට ක්‍රියා කළ යුතු බව කොමිෂන් සභාව නිර්දේශ කරයි. කිසියම් වරදක් සිදුවී ඇති බව විමර්ශනවලින් හෙළිවන්නේ නම්, වැරදිකරුවන්ට නඩු පැවරීමට/දඬුවම් කිරීමට සුදුසු නීතිමය ක්‍රියාමාර්ග ගත යුතුය.

219. උගත් පාඩම් සහ ප්‍රතිසන්ධාන කොමිෂන් සභා වාර්තාවේ 4.106, 4.107, 4.109, 4.110 සහ 4.111 සහ 4.359 vi, (අ) සහ (ආ) ඡේදවල සඳහන් සිද්ධීන් පිළිබඳ විස්තරවල සිවිල් වැසියන් මරණයට පත්වූ හෝ තුවාල සිදුවීමට හේතු වූ නිශ්චිත අවස්ථා පිළිබඳ සඳහන් වෙයි.

සිවිල් වැසියන් සම්බන්ධයෙන් වගවීම පිළිබඳ උගත් පාඩම් සහ ප්‍රතිසන්ධාන කොමිෂන් සභාවේ නිර්දේශ - විමර්ශනය කිරීමේ වගකීම

220. සිවිල් වැසියන් මරණයට පත්වීම හෝ තුවාල වීම සිදුවූ මෙම නිශ්චිත අවස්ථාවල ජාත්‍යන්තර මානුෂීය නීතිය කඩකිරීම් සම්බන්ධයෙන් වගවීම පිළිබඳ ප්‍රශ්නය සම්බන්ධව උගත් පාඩම් සහ ප්‍රතිසන්ධාන කොමිෂන් සභාවේ නිර්දේශ එම කොමිෂන් සභා වාර්තාවේ 9.5, 9.9 සහ 9.37අ ඡේදවල පැහැදිලිව දක්වා ඇත.

221. සාරාංශයක් ලෙස, සිවිල්වැසියන්ට සිදුවූ ජීවිත හානි සම්බන්ධයෙන් විමර්ශනය කිරීම සහ නඩු පැවරීම පිළිබඳ උගත් පාඩම් සහ ප්‍රතිසන්ධාන කොමිෂන් සභාව නිර්දේශ කර ඇත්තේ මෙම 9.5, 9.9 සහ 9.37අ ඡේදවලදි ය. මෙම ජනාධිපති විමර්ශන කොමිෂන් සභාව එම සිද්ධීන් මොනවාදැයි සඳහන් කළ යුතුය.

222. උගත් පාඩම් සහ ප්‍රතිසන්ධාන කොමිෂන් සභා වාර්තාවේ 9.9 වෙනි ඡේදයේ සඳහන් කර ඇති සිදුවීම් පහ පහත සඳහන් පරිදි වේ:

1. පිරිසක් යුධ සටන් වලින් බේරී බෝට්ටුවක නැගී පලා යමින් සිටින විට නාවික හමුදාව එම බෝට්ටුවට වෙඩි තැබූයේ යැයි පැවසෙන සිද්ධියක් හේතුවෙන් එහි ගමන් කළ මගීන් හතර දෙනෙකු මිය ගිය බවට එම බෝට්ටුවේ සිටි පිරිසට අයත් වූ පුද්ගලයෙක් වන සිවිල් වැසියෙකු විසින් වාර්තා කරන ලද සිද්ධියක්;[146] (4.106 වෙනි ඡේදය)
2. නාවික හමුදාවේ වෙඩි තැබීමෙන් බෝට්ටුවකින් පලා යමින් සිටි සිවිල් වැසියන් 8 දෙනෙකු මිය ගිය තවත් එවැනිම සිදුවීමක්[147]; (4.107 ඡේදය)
3. *මත්තලන් පක්කනායි* නම් ස්ථානයකදී යුධ හමුදාව විසින් සිවිල් වැසියන් යුද හමුදා සීමාවන් වෙතට එගොඩ වීම වළක්වන අයුරු තමා දුටු බවට අල්ලාගත් එල්.ටී.ටී.ඊ් "*බුද්ධි නිලධාරියෙක්*" ලබා දුන් සාක්ෂිය;[148] (4.109 ඡේදය)

[145] උගත් පාඩම් සහ ප්‍රතිසන්ධාන කොමිෂන් සභාව, 9.9 වෙනි ඡේදය, පි. 329

[146] උගත් පාඩම් සහ ප්‍රතිසන්ධාන කොමිෂන් සභාව, පි. 72

[147] උගත් පාඩම් සහ ප්‍රතිසන්ධාන කොමිෂන් සභාව, පි. 72

4. හමුදා ෂෙල් වෙඩි ප්‍රහාර වලින් පුද්ගලයන් 35 - 40 ක් මිය ගිය බව පැවසෙන සිද්ධියක්;[149] (4.110 ඡේදය)
5. ගැබිණි මව්වරුන් පිරිසක් "ත්‍රිපෝෂ" (කිරිපිටි ස්වරූපයෙන් ලබා දෙනු ලබන පෝෂණ අතිරේකයක්) ලබා ගැනීමට ගිය අවස්ථාවේ දී "ත්‍රිපෝෂ" බෙදාහරින මධ්‍යස්ථානයට ෂෙල් වෙඩි ප්‍රහාරයක් එල්ලවීමෙන් ගැබිණි මව්වරුන් 40 - 45 ක් මියයාමේ සිද්ධියක් සම්බන්ධයෙන් සිවිල් වැසියෙක් ලබා දුන් සාක්ෂිය.[150] (4.111 ඡේදය)

න්ධා විමර්ශන සිදු කළ යුතු යැයි උගත් පාඩම් සහ ප්‍රතිසන්ධාන කොමිෂන් සභාව විසින් නිර්දේශ කරන ලද සිද්ධීන් හතෙන් ඉතිරි සිද්ධීන් දෙක වන්නේ:

පළමුවැන්න, මියගිය නිලධාරියෙකුගේ සිරුරක් සොයා රැගෙන එන ලෙස ආරක්ෂක හමුදා සාමාජිකයින් පිරිසක් සිවිල් වැසියන් කණ්ඩායමකට බලකර ඇති අතර, එම සිවිල් වැසියන් ගණනාවක් වෙඩි හුවමාරුවට මැදිවී මිය ගොස් තිබීම; [4.359 vi (අ) ඡේදය]

දෙවැන්න, සිවිල් වැසියන් කිහිප දෙනෙකු මරණයට පත්වූ නාවික හමුදා වෙඩි තැබීමේ සිද්ධීන් දෙකක්. (4.359 vi (ආ) ඡේදය).

224. ඇසින් දුටු සාක්ෂිකරුවන්ගේ විස්තර වලින් මෙන්ම අනෙකුත් කරුණු වලින් ද යුද්ධයේ අවසන් අදියරේ දී සැබවින් ම සැලකිය යුතු පිරිසක් තුවාල ලබා ඇති බව අවධානයට ගැනීමේ දී, තුවාල ලැබූවන්ගේ සංඛ්‍යාව පිළිබඳ අපැහැදිලි බව සහ නිසි තහවුරු කර ගැනීමේ ක්‍රියාවලියක් නොමැති බව නිරීක්ෂණය කරමින්, ගැටුමේ දී සිවිල් වැසියන් මරණයට පත්වීමේ හා තුවාල ලැබීමේ මෙන්ම දේපළවලට සිදුවූ හානියේ පරිමාණය සහ තත්ත්වයන් සොයා බැලීම සඳහා දිවයිනේ සෑම ප්‍රදේශයක ම බලපෑමට ලක් වූ සියලු ම පවුල් ආවරණය වන පරිදි වෘත්තීයමය වශයෙන් සැලසුම් කරන ලද ගෘහ සමීක්ෂණයක් සිදු කළ යුතු බව උගත් පාඩම් සහ ප්‍රතිසන්ධාන කොමිෂන් සභාව නිර්දේශ කරයි.[151]

225. ඉහත සඳහන් කරන ලද නිශ්චිත සිද්ධීන් පිළිබඳ වඩාත් සම්පූර්ණ විස්තරයක් උගත් පාඩම් සහ ප්‍රතිසන්ධාන කොමිෂන් සභාවේ වචන වලින් ම සම්පූර්ණත්වය උදෙසා පහත දක්වා ඇත.[152]

(ආ) හානිපූරණය සඳහා උගත් පාඩම් සහ ප්‍රතිසන්ධාන කොමිෂන් සභාවේ නිර්දේශය.

226. සිවිල් වැසියන් මරණයට පත්වීම හෝ තුවාලවීම පිළිබඳ මෙම නිශ්චිත සිද්ධීන් සම්බන්ධයෙන් සැලකීමේ දී, ඉහත සඳහන් කළ සිදුවීම්වලට අදාළව මෙන්ම වැඩිදුර විමර්ශනවලින් හෙළි විය හැකි වෙනත් සිදුවීම්වලට අදාළව ද සිදුවී ඇති පුද්ගලික බෙදවාචක වලින් පසු සමගිය ඇති කිරීම උපකාරී වනු ඇති මානුෂීය පියවරක් ලෙස මියගිය අයගේ සහ තුවාල ලැබූවන්ගේ ළඟම ඥාතීන්ට සුදුසු සහන සැලසීම කෙරෙහි ද සලකා බැලිය යුතු බව උගත් පාඩම් සහ ප්‍රතිසන්ධාන කොමිෂන් සභාව වැඩිදුරටත් සඳහන් කරයි.[153]

---

[148] උගත් පාඩම් සහ ප්‍රතිසන්ධාන කොමිෂන් සභාව, පි.73

[149] එම

[150] උගත් පාඩම් සහ ප්‍රතිසන්ධාන කොමිෂන් සභාව, පි. 74

[151] උගත් පාඩම් සහ ප්‍රතිසන්ධාන කොමිෂන් සභාව, 4.336, 4.360 ඡේද

[152] මෙම පරිච්ඡේදයේ 229 ඡේදය බලන්න.

[153] උගත් පාඩම් සහ ප්‍රතිසන්ධාන කොමිෂන් සභාව, 9.9 වෙනි ඡේදය

මෙම ජනාධිපති විමර්ශන කොමිෂන් සභාවේ නිර්දේශය

227. මෙම තත්ත්වයන් තුළ, යෝජිත විමර්ශන ආයතනය වන 'සත්‍ය සහ ප්‍රතිසන්ධාන කොමිෂන් සභාවට' ජාත්‍යන්තර මානුෂීය නීතිය උල්ලංඝනය කිරීම්වලට තුඩු දිය හැකි මෙම නිශ්චිත සිද්ධීන් විමර්ශනය කිරීම සඳහා බලතල ලබා දිය යුතු යැයි මෙම ජනාධිපති විමර්ශන කොමිෂන් සභාව නිර්දේශ කරයි.

228. සිවිල් වැසියන් මරණයට පත්වීම හෝ තුවාල සිදුවීම පිළිබඳ ඉහත කී සිද්ධීන් පිළිබඳ විස්තර සම්පූර්ණ කිරීම සඳහා, උගත් පාඩම් සහ ප්‍රතිසන්ධාන කොමිෂන් සභාව විසින් ඉදිරිපත් කර ඇති අදාළ ඡේද අනුක්‍රමික ලෙස නැවත ඉදිරිපත් කිරීම සුදුසු යැයි මෙම ජනාධිපති විමර්ශන කොමිෂන් සභාව සලකයි.

229. සම්පූර්ණත්වය උදෙසා මෙම ජනාධිපති විමර්ශන කොමිෂන් සභාව, සිවිල් වැසියන් මරණයට පත්වීම හෝ තුවාලවීම පිළිබඳ නිශ්චිත අවස්ථා විස්තර කරන්නේ යැයි සැලකෙන උගත් පාඩම් සහ ප්‍රතිසන්ධාන කොමිෂන් සභා වාර්තාවේ පහත සඳහන් ඡේද නැවත ඉදිරිපත් කරයි:

4.106: *කොමිෂන් සභාව ඉදිරියේ කරුණු දැක්වූ සිවිල් වැසියෙක් මෙසේ ප්‍රකාශ කළේය: "මගේ බෑනා 2009 මැයි 10 වැනිදා අතුරුදන් වුණා. අපි මුල්ලිවයික්කාල් සිට බෝට්ටුවකින් එමින් සිටියේ. (යාපනයට පැන යාමට උත්සාහ කරමින්) අපි යන අතරමග වුණ්ඩිකුලම් හි දී නාවික හමුදාව අපට පහර දුන්නා. හතර දෙනෙක් එතනම මැරුණා. වේලාව අලුයම දෙකට පමණ වූ බවත් බෝට්ටුවේ අත්වැට අල්ලාගෙන තමාට පැන යාමට හැකි වූ බවත් ඔහු වැඩිදුරටත් ප්‍රකාශ කළේය. ඉන් අනතුරුව, නාවික හමුදාව පැමිණ ඔවුන් බේරාගෙන තුවාල ලැබූ තම බෑනාට වෛද්‍ය ප්‍රතිකාර ලබාදී පසුව ත්‍රිකුණාමලයට රැගෙන ගිය බවද ඔහු සඳහන් කළේ ය. නාවික හමුදාව තමා සහ තම දියණිය බේරාගත් බවත් 'තාත්තේ කරුණාකර නැවට ගොඩවෙන්න' යනුවෙන් දෙමළ භාෂාවෙන් තමාට පැවසූ බවත් ඔහු වැඩිදුරටත් ප්‍රකාශ කළේය. එය නාවික හමුදාවේ බෝට්ටුවක් බව දැනගත්තේ කෙසේ දැයි කොමිෂන් සභාව විසින් ප්‍රශ්න කිරීමේදී, එය විශාල බෝට්ටුවක් බවත්, සඳ එළිය තිබූ නිසා සැතපුම් කාලක් පමණ දුරට ඔහුට එය පෙනුන බවත් ඔහු ප්‍රකාශ කළේ ය. තම බෑනා එල්.ටී.ටී.ඊ සංවිධානයේ සාමාජිකයෙකු දැයි වැඩිදුරටත් ප්‍රශ්න කිරීමේදී ඔහු එම ව්‍යාපාරයේ කටයුතු කළ බව ඔහු පැවසුවේය.*

4.107: *2010 සැප්තැම්බර් 20 වැනි දින මුලතිවු දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ දී කොමිෂන් සභාව හමුවට පැමිණි තවත් සිවිල් වැසියෙක් මෙසේ ප්‍රකාශ කළේය: "අපි 2009 මැයි 10 වැනිදා වන්නි (මුල්ලිවයික්කාල්) ප්‍රදේශයෙන් අවතැන් වෙලා, මුහුදෙන් යමින් හිටියේ. එහෙම යමින් ඉන්න වෙලාවෙ නාවික හමුදාව හමුවුණා. අපි සුදු කොඩි දෙකක් අතේ තියාගෙන, නාවික හමුදාව දැකලා අපි එයාලට "අයියා", "අයියා" කිව්වා. එකපාරම ෂෙල් වෙඩි ප්‍රහාර එල්ල වෙලා 8 දෙනෙක් එතනම මැරුණා. අනික් අයව වුන්ඩිකුලම් වලට ගෙනිහින්, වුණ්ඩිකුලමෙන් පුල්මුඩෙට ගෙනිව්වා."*

නාවික හමුදාව ඔවුන්ව වුන්ඩිකුලම් වෙත රැගෙන ගිය බවත් අලුයම 3 ට වලෙයි නම් ප්‍රදේශයේදී වෙඩි තැබීම සිදු වූ බවත් කොමිෂන් සභාවේ ප්‍රශ්න කිරීම් වලදී ඇය ප්‍රකාශ කළේ ය. ඔවුන් යාපනයට පැන යාමට උත්සාහ කර ඇති අතර, රාත්‍රී 9 ට පමණ ඒ සඳහා පළමු උත්සාහය දැරූ නමුත් එල්.ටී.ටී.ඊ. සංවිධානය ඔවුන්ට වෙඩි තබා, ආපසු වෙරළට පැමිණ බෝට්ටුවේ එන්ජිම සඟවා තැබීමට ඔවුන්ට බලකර තිබුණි. ෂෙල් වෙඩි තැබුවේ කවුදැයි විමසූ විට නාවික හමුදාව ෂෙල් වෙඩි තැබූ බව ඇය ප්‍රකාශ කළේ ය. ඇය පවසන පරිදි, එය වැරදි අනන්‍යතාවයක් නිසා සිදු වී ඇති බැවින් නාවික හමුදාව එයට සමාව ඉල්ලා ඇත. තවත් බෝට්ටු 40 ත් 50 ත් අතර ප්‍රමාණයක් ද ගමන් කරමින් තිබූ බවත්, එම බෝට්ටු වල සිටියේ ධීවරයින් සහ ඔවුන්ගේ පවුල්වල අය බවත් ඇය තවදුරටත් ප්‍රකාශ කළා ය. තවත් සමහර බෝට්ටු එල්.ටී.ටී.ඊ. සංවිධානයේ බෝට්ටු වන්නට ඇති

බවත්, එහෙත් ඇය ඒ පිළිබඳව නිසැකව ම නොදන්නා බවත් ඇය පැවසුවාය. තවත් බෝට්ටු කිහිපයක් ද නාවික හමුදාවේ ප්‍රහාරයට ලක්ව ඇති බව තමා දැනගත් බව ඇය වැඩිදුරටත් විස්තර කළාය. තම සහෝදරිය සහ ඇයගේ සැමියා බෝට්ටුවේ සිට ඇති බවත්, සහෝදරියගේ සැමියා මුහුදු කොටියෙකු බවත් ඇය වැඩිදුරටත් පැවසුවාය.

4.108: ඉහත සඳහන් කළ, නාවික හමුදාව විසින් සිදු කළේ යැයි පැවසෙන සිද්ධීන් සම්බන්ධයෙන් කොමිෂන් සභාව විසින් ප්‍රශ්න කිරීමේ දී නාවික හමුදාව ප්‍රකාශ කළේ 2009 මැයි මාසයේ දී ඔවුන් නිරීක්ෂණ කටයුතුවල පමණක් නිරත වූ බවත්, එයට අමතරව නාවික හමුදා මුර යාත්‍රා සිවිල් වැසියන් සහ සිවිල් වැසියන්ගේ බෝට්ටු හඳුනා ගත හැකි රේඩාර් සහ රාත්‍රී දර්ශනය වන කැමරා ඇතුළු නවීන උපකරණවලින් සමන්විත වූ බවත් ය. ඔවුන්ට බුද්ධි තොරතුරු තිබූ බවත්, කොටි බෝට්ටු සහ සිවිල් වැසියන් රැගත් බෝට්ටු වෙන්කර හඳුනාගැනීමේ පළපුරුද්ද ඔවුන්ට තිබූ බවත් නාවික හමුදාව ප්‍රකාශ කළේ ය.[154]

4.109: 2010 දෙසැම්බර් 30 වැනි දින කොමිෂන් සභාව බූස්ස රැඳවුම් මධ්‍යස්ථානයට ගිය අවස්ථාවේදී, 2009 අප්‍රේල් 20 වැනි දින මාතලන් පොක්කනෙ ප්‍රදේශයේ දී යුධ හමුදාව විසින් මිනිසුන් ගමන් කිරීම සහ හමුදා සීමාවන් වෙත පැමිණීම වැළැක්වූ බවට චෝදනා කරන ලද සිද්ධියක් පිළිබඳව රැඳවූවෙක් (හිටපු එල්.ටී.ටී.ඊ. බුද්ධි නිලධාරියෙක්) කොමිෂන් සභාවේ අවධානයට යොමු කළේය. "එල්.ටී.ටී.ඊ. සංවිධානය හමුදාවට වෙඩි තිබ්බා, හමුදා නිලධාරියෙකුගේ මළ සිරුරක් එතන බිම වැටිලා තිබුණා. හමුදාව එතන නවත්තගත්ත අයට කිව්වා ඒ මිනිය අරගෙන එන්න කියලා ... ඔවුන් ඒ මිනිස්සුන්ව එතන තියාගෙන, කීප දෙනෙක් යැව්වා ඒ මළ සිරුර අරගෙන එන්න. හැමකෙනාම යන එක නැවැත්තුවේ නැහැ. හමුදාව තිහිප දෙනෙක්ව නවත්තගත්තා ... හමුදාව කණ්ඩිය උඩ ඉඳන් අර මළ සිරුර ළඟට ගිහිල්ලා ඒක අරගෙන එන්න කියලා මිනිස්සුන්ට බලකරමින් සිටියා. එතනට යන්න ප්‍රතික්ෂේප කළ අයට වෙඩි තිබ්බා. එල්.ටී.ටී.ඊ. සංවිධානය හමුදාවට වෙඩි තියන්නේ නැතිවෙයි කියලා හිතාගෙන හමුදාව තරුණයන්ව වටේට තියාගෙන හිටියා.[155]

4.110: නීර්වේලි ප්‍රදේශයේ දී කොමිෂන් සභාව ඉදිරියට පැමිණි සිවිල් වැසියෙක් මෙසේ ප්‍රකාශ කළේ ය: 'පෝක්කනෙ කියන ප්‍රදේශයේදී අපි කිරිපිටි ගන්න පෝලිමේ ඉන්න වෙලාවෙ ෂෙල් වෙඩි ප්‍රහාර එල්ල වෙලා විශාල පිරිසක් මිය ගියා. ඊට පස්සෙ අපි ආයෙත් එල්.ටී.ටී.ඊ. අය ෂෝට් ඊටිස් විකුණන තැනක ඉන්නකොටත් ආයෙත් ෂෙල් වෙඩි ප්‍රහාර එල්ල වෙලා 35 - 40 පමණ දෙනෙක් එතනම මැරෙනවා මම දැක්කා. එතනදි අපි දැකපු සියලු දේ අපට පහසුවෙන් අමතක කළ නොහැකියි. ඒවා තවමත් අපගේ මතකයේ තියෙනවා.[156] මෙම සිදුවීම සිදුවූයේ කවදා දැයි කොමිසම විසින් ප්‍රශ්න කරන ලද අවස්ථාවේ ඔහු ප්‍රකාශ කළේ පුදුමාතලන් ප්‍රදේශයෙන් විශාල පිරිසක් එගොඩ වූ දිනයට දින දෙක තුනකට පෙර එය සිදුවූ බව ය. ෂෙල් වෙඩි ප්‍රහාර එල්ල කළේ කවුරුන්ද යන්න පිළිබඳව වැඩිදුරටත් ප්‍රශ්න කිරීමේදී ඔහු ප්‍රකාශ කළේ තමාට එය නිශ්චිතව කිව නොහැකි නමුත් එය නාවික හමුදාවෙන් එල්ල කළ බවට ජනතාව ප්‍රකාශ කරන බවයි. ඒ සමග ම, රජයේ පාලන ප්‍රදේශවලට පැමිණි ජනතාවට යුද හමුදාව ඉතා හොඳින් සැලකූ බවද ඔහු තහවුරු කළේය.

---

[154] මූලාශ්‍රය: 2011 ජනවාරි 22 දින නාවික හමුදාව විසින් උගත් පාඩම් සහ ප්‍රතිසන්ධාන කොමිෂන් සභාව වෙත කරුණු දැක්වීම" සහ පසුව ඒවා ලිඛිතව තහවුරු කිරීම.

[155] කැමරා තාක්ෂණය ඔස්සේ සිදු කළ අදහස් දැක්වීම්

[156] 2010 නොවැම්බර් 11 වැනි දින නීර්වාලි හි දී උගත් පාඩම් සහ ප්‍රතිසන්ධාන කොමිෂන් සභාව ඉදිරියේ (අංක LLRC/FV/11.11.10/02 දරන පිටපත්කරය) සහ අවිධිමත් රැස්වීමක දී (අංක LLRC/FV/21.08.11/01 දරන පිටපත්කරය) සිවිල් වැසියෙක් ඉදිරිපත් කළ අදහස් දැක්වීම්.

4.111: කොමිෂන් සභාව හමුවේ පෙනී සිටි තවත් සිවිල් වැසියෙක් 2009 අප්‍රේල් මාසයේ දී[157] තම දියණියට ද තුවාල සිදු කරමින් ඇතිවූ සිද්ධියක් ගැන සඳහන් කළේය. ගැබිනි මව්වරුන්ට සහ ළමයින්ට "ත්‍රිපෝෂ" ලබාදෙන බව ඔවුන් වෙත දැනුම් දී තිබූ බැවින් එම මව්වරුන් සහ ළමයින් ත්‍රිපෝෂ බෙදාදීමට නියමිතව තිබූ ස්ථානයට රැස්වන විට එම ස්ථානයේ සිටි එල්.ටී.ටී.ඊ. සංවිධානය ඔවුන්ගේ "චෝකි ටෝකි" භාවිතා කරමින් සිටි අතර, යුධ හමුදාව එම ස්ථානයට ෂෙල් වෙඩි ප්‍රහාර එල්ල කිරීම නිසා ගැබිනි මවුවරුන් සහ ළමයින් 40 - 45 දෙනෙක් පමණ මිය ගියහ.

4.359 vi (අ): මිය ගිය හමුදා නිලධාරියෙකුගේ මළ සිරුර රැගෙන එන ලෙස ආරක්ෂක හමුදාවන් විසින් සිවිල් වැසියන්ට බල කරන ලද බවට චෝදනාවක් එල්ල වූ සිද්ධියක දී එම ක්‍රියාවලිය අතරතුර වෙඩි හුවමාරුවට මැදිවූ සිවිල් වැසියන් පිරිසක් මිය ගොස් තවත් අය තුවාල ලැබූහ. කෙසේ වෙතත්, එල්.ටී.ටී.ඊ සංවිධානයේ බුද්ධි අංශ නිලධාරියෙකු ලෙස තමන්ව හඳුන්වා ගත් පුද්ගලයෙකු විසින් ලබාදෙන ලද මෙම විස්තරය සත්‍යාපනය කර තහවුරු කර ගැනීමට කොමිෂන් සභාවට නොහැකි විය.

4.359 (ආ): නාවික හමුදාවට සම්බන්ධ තවත් සිද්ධීන් දෙකක් වන අතර, එම සිදුවීම් දෙක ම අලුයම 2 ට සහ 3 ට පමණ සිදුවී ඇත. කොමිෂන් සභාවට පෙනී ගිය පරිදි එය නාවික හමුදාව විසින් වැරදි ලෙස හඳුනාගැනීමේ සිද්ධියක් මත සිදුවූවක් මිස හිතාමතා ඉලක්ක කිරීම නොවීය. පසුව නාවික හමුදාව ඔවුන් බේරාගෙන වෛද්‍ය ප්‍රතිකාර ලබාදුන් බව විපතට පත් වූවන් විසින්ම ප්‍රකාශ කිරීම මේ සම්බන්ධයෙන් විශේෂයෙන් වැදගත් වේ.

230. උගත් පාඩම් සහ ප්‍රතිසන්ධාන කොමිෂන් සභාවේ ඉහත නිර්දේශ අනුව, යෝජිත සත්‍ය හා ප්‍රතිසන්ධාන කොමිෂන් සභාව විසින් ඉහත සිද්ධීන් විමර්ශනය කිරීම අත්‍යවශ්‍ය වන අතර, බැලූ බැල්මට නඩුවක් තිබෙන බව විමර්ශනය මගින් අනාවරණය වුව හොත්, අදාළ බලධාරීන් හරහා නඩු පැවරීමට කටයුතු කළ යුතුය.

231. සත්‍ය හා ප්‍රතිසන්ධාන කොමිෂන් සභාවට අත්‍යවශ්‍ය අනුබද්ධ ආයතන ලෙස ක්‍රියා කළ යුතු අතුරුදහන්වූ පුගද්ලයන් පිළිබඳ කාර්යාලයට සහ හානිපූරණ කාර්යාලයට සත්‍ය හා ප්‍රතිසන්ධාන කොමිෂන් සභාව විසින් මෙම නිර්දේශය ක්‍රියාවට නැංවීම සහ ක්‍රියාත්මක කිරීම සඳහා සහාය ලබා දීමට අවශ්‍ය බලතල ලබා දිය යුතුය.

රෝහල්

232. උගත් පාඩම් සහ ප්‍රතිසන්ධාන කොමිෂන් සභාව රෝහල් / තාවකාලික රෝහල් සම්බන්ධයෙන් සඳහන් කිරීම් කිහිපයක් සිදු කර ඇති අතර, විල්ලුපුනම් තාවකාලික රෝහල (4.117 - 4.120), ආනන්දපුරම් තාවකාලික රෝහල (4.121 - 4.122), උදයාර්කට්ටු තාවකාලික රෝහල (4.123 - 4.124), පී.ටී.කේ. රෝහල (4.125 - 4.132), පුදුමාතලන් තාවකාලික රෝහල (4.133 - 4.135), මුල්ලිවයික්කාල් තාවකාලික රෝහල (4.136 - 4.138) සහ වට්ටුවාල් තාවකාලික වෛද්‍ය පහසුකම (4.139) යන ස්ථානවල ඇති වූ සිද්ධීන් පිළිබඳව විශේෂයෙන් සාකච්ඡා කරයි. එල්.ටී.ටී.ඊ. සංවිධානය එම සිද්ධීන්ට වගකිවයුත්තන් වීමේ හැකියාවක් තිබෙන බව ඉස්මතු කෙරෙන, ඔවුන් එම ස්ථානයට පැමිණි සිටි බව ඇඟවෙන අදහස් දැක්වීම් කිහිපයක් ද, ආරක්ෂක හමුදාවල සම්බන්ධයක් තිබීමේ හැකියාව ගැන ඉඟි කෙරෙන අදහස් දැක්වීම් එයටත් වඩා අඩු ප්‍රමාණයක් ද

[157] 2010 නොවැම්බර් 14 වැනි දින කයිට්ස් හි දී උගත් පාඩම් සහ ප්‍රතිසන්ධාන කොමිෂන් සභාව ඉදිරියේ සිවිල් වැසියෙක් ඉදිරිපත් කළ අදහස් දැක්වීම්. පිටපත්කරය අංක LLRC/FV/14.11.10/01

ලැබුණු නමුත්, එම බොහෝ සිදුවීම්වලට වගකිව යුතු අපරාධකරුවන් හඳුනා ගැනීමට නොහැකි විය.[158]

233. ජාත්‍යන්තර මානුෂීය නීතිය මගින් වෛද්‍ය ඒකක,[159] වෛද්‍ය ප්‍රවාහන[160] සහ වෛද්‍ය ද්‍රව්‍ය[161] සඳහා පුළුල් සහ පරිපූර්ණ ආරක්ෂාවක් ස්ථාපනය කරයි.

234. මෙම වෛද්‍ය ඒකක, වෛද්‍ය ප්‍රවාහනයන් සහ වෛද්‍ය ද්‍රව්‍ය වලට සටන්කරුවන් සෑමවිට ම ගරු කර ඒවා ආරක්ෂා කළ යුතු[162] අතර ඒවා ප්‍රහාරයේ ඉලක්ක කර නොගත යුතු ය. මොනම වාතාවරණයක් යටතේ හෝ හමුදාමය වස්තූන් ප්‍රහාර වලින් ආරක්ෂා කිරීමේ උත්සාහයක් ලෙස ආරක්ෂිත ස්ථාපනයන් භාවිතා නොකළ යුතු ය.

235. වෛද්‍ය ස්ථාපනයන් ඒවායෙහි මානුෂීය කාර්යයෙන් පරිබාහිරව සතුරාට හානිදායක ක්‍රියා සිදු කිරීම සඳහා භාවිතා කරන්නේ නම් මිස, වෛද්‍ය ස්ථාපනයන්ට හිමි ආරක්ෂාව නතර නොකළ යුතු ය.[163] කෙසේ වෙතත්, එවැනි අවස්ථා වලදී ඒවායෙහි ආරක්ෂාව නතර කළ හැක්කේ, සුදුසු ඕනෑම අවස්ථාවක, සාධාරණ කාල සීමාවක් නියම කරමින් අනතුරු ඇඟවීමක් ලබා දී ඉන් පසුව ද එම අනතුරු ඇඟවීම පිළිබඳ අවධානය යොමු නොකරන්නේ නම් පමණි..[164]

236. උගත් පාඩම් සහ ප්‍රතිසන්ධාන කොමිෂන් සභා වාර්තාවේ රෝහල්වලට ෂෙල් වෙඩි ප්‍රහාර එල්ල කිරීම සම්බන්ධ විශේෂිත ඡේද කිහිපයක් පහත දක්වා ඇත:

> *4.287: සිවිල් වැසියන්ට මෙන්ම සටන්කරුවන් නොවන තුවාල ලැබුවන්ට සහ රෝගීන්ට සත්කාර සපයන රෝහල් ජාත්‍යන්තර මානුෂීය නීතිය යටතේ ආරක්ෂාව බුක්ති විඳියි. ඉහත II වෙනි කොටසේ විස්තර කර ඇති පරිදි රෝහල් මතට ෂෙල් වෙඩි ප්‍රහාර එල්ල වූ අවස්ථා පිළිබඳ සැලකිය යුතු කරුණු කොමිෂන් සභාවට ලැබී ඇත.*

මෙම කරුණු තුළින් ඉස්මතු වන සමස්ත පින්තූරය පහත සඳහන් පරිදි වේ:

---

[158] උගත් පාඩම් සහ ප්‍රතිසන්ධාන කොමිෂන් සභාව, 4.117 - 4.139 ඡේද

[159] ජිනීවා සම්මුතිය අංක I, 19-23 වගන්ති, ජිනීවා සම්මුතය අංක IV, 18 වෙනි වගන්තිය. 1 වෙනි කෙටුම්පතේ 8 (ඉ) සහ 12-14 වගන්තිවලට අනුව, "වෛද්‍ය ඒකක" යන්නෙන් වෛද්‍ය අරමුණු සඳහා, එනම් තුවාලකරුවන්, රෝගීන් සහ නැව්අනකුරුවලට පත්වූවන් ප්‍රථමාධාර ලබා දීම ඇතුළු ප්‍රතිකාර සඳහා රැස්කිරීම, ප්‍රවාහනය කිරීම, රෝග විනිශ්චය සහ රෝග නිවාරණය කිරීම සඳහා සංවිධානය කරන ලද හමුදා හෝ සිවිල් හෝ ආයතන සහ අනෙකුත් ඒකක, අදහස් කෙරෙයි. මෙම යෙදුමට උදාහරණයක් ලෙස, රෝහල් සහ වෙනත් සමාන ඒකක, රුධිර පාරවිලයන මධ්‍යස්ථාන සහ ආයතන, වෛද්‍ය මධ්‍යස්ථාන සහ එවැනි ඒකකවලට අයත් වෛද්‍ය උපකරණ සහ ඖෂධ ගබඩා ඇතුළත් වේ. වෛද්‍ය ඒකක ස්ථාවර හෝ ජංගම, ස්ථිර හෝ තාවකාලික විය හැක.

[160] I වෙනි ජිනීවා සම්මුතිය, 35 - 37 වගන්ති; II වෙනි ජිනීවා සම්මුතිය, 38-40 වගන්ති; IV වෙනි ජිනීවා සම්මුතිය, 21 - 22 වගන්ති; I වෙනි කෙටුම්පත, 8(උ) සහ 21 - 31 වගන්ති. I වෙනි කෙටුම්පතේ 8(උ) වගන්තිය අනුව, "වෛද්‍ය ප්‍රවාහන" යන්නෙන් වෛද්‍ය ප්‍රවාහනය සඳහා ම පමණක් වෙන් වූ, ගැටුමේ පාර්ශ්වයක නිසි බලධාරියෙකුගේ පාලනය යටතේ පවතින, හමුදාමය හෝ සිවිල් හෝ වේවා, ස්ථිර හෝ තාවකාලික වේවා, ඕනෑම ප්‍රවාහන ක්‍රමයක් අදහස් කෙරෙයි.

[161] I වෙනි ජිනීවා සම්මුතිය, 33 - 34 වගන්ති බලන්න.

[162] I වෙනි ජිනීවා සම්මුතිය, 19, 33 සහ 34 වගන්ති; II වෙනි ජිනීවා සම්මුතිය, 22 - 27 වගන්ති; I වෙනි කෙටුම්පත, 12(1) වගන්තිය බලන්න.

[163] I වෙනි ජිනීවා සම්මුතිය, 21 වෙනි වගන්තිය; II වෙනි ජිනීවා සම්මුතිය, 34 වෙනි වගන්තිය; I වෙනි කෙටුම්පත, 13(1) වගන්තිය බලන්න

[164] රෆින් ජීන් ක්‍රිස්ටෝෆ, "සන්නද්ධ ආරක්ෂාවේ විරුද්ධාභාසය", Medecins Sans Frontieres (සංස්කරණය), Life, Death and Aid, New York, Routledge, 1993 පි. 111-123; කැසීස් ඇන්ටෝනියෝ, "ගිලන් රථයකට පහර දීමේ අපරාධයෙන් සටන්කරුවන් නිදහස් කළ හැක්කේ කුමන කොන්දේසි යටතේද?"; ජාත්‍යන්තර අපරාධ යුක්ති සහරාවේ, 6 වෙනි වෙළුම, අංක 2, 2008, පි. 385-397.

(1) රෝහල් ආසන්නයේ දැඩි සටන් පැවතුණි. එල්.ටී.ටී.ඊ. සංවිධානය සතුව ඇතැම් රෝහල් සඳහා වෙන් කර තිබූ අරය කිලෝමීටරයක් වූ ආරක්ෂිත ප්‍රදේශ තුළ ද ඇතුළුව රෝහල්වලට ආසන්නයේ තුවක්කු ස්ථානනගත කර තිබූ ස්ථාන / අවි ගබඩා තිබුණි. එල්.ටී.ටී.ඊ. සංවිධානය විසින් රෝහල් භූමිය මායිමේ බර අවි කාලතුවක්කු සවිකර තිබූ බව එක් අවස්ථාවක දී ප්‍රකාශ විය. තවත් සමහර අවස්ථාවල දී, එල්.ටී.ටී.ඊ. සංවිධානය තම වාහන නවතා තැබීම සඳහා සහ යුද හමුදාවට එරෙහිව මෙහෙයුම් මෙහෙයවීම සඳහා පවා රෝහල් පරිශ්‍ර භාවිත කර ඇත.[165]

(ii) මෙම සාධක මගින් එල්.ටී.ටී.ඊ. සංවිධානය ඔවුන්ගේ සටන් ක්‍රමෝපායේ අත්‍යාවශ්‍ය අංගයක් ලෙස ආරක්ෂිත පරිශ්‍ර ඒකාබද්ධ කර තිබූ ප්‍රවණතාවක් අනාවරණය වෙයි.[166]

(iii) 'තාවකාලික රෝහල්' ලෙස විස්තර කර ඇති ඇතැම් වෛද්‍ය පහසුකම් රජයේ වෛද්‍ය අධිකාරීවරයාගේ විධිමත් අධීක්ෂණය යටතේ පැවතියේ වුවද, සත්‍ය වශයෙන් ම, එල්.ටී.ටී.ඊ. සංවිධානයට ඒවා කෙරෙහි සැලකිය යුතු පාලනයක් තිබූ බව කොමිෂන් සභාව සඳහන් කරයි. එල්.ටී.ටී.ඊ. සංවිධානය සහ රජය යන 'ආණ්ඩු' දෙකක් සෑහීමකට පත් වන සේ ජනතාවට සේවා සැපයීමට සිදුවූ 'එදිරිවාදී වටපිටාවක' සේවය කිරීමට සිදුවීමේ දුෂ්කරතා පිළිබඳව කොමිෂන් සභාවට පැහැදිළි කළ එක් වෛද්‍යවරයකුගේ ප්‍රකාශයෙන් ද ඒ බව සනාථ විය.

4-288: රෝහල්වලට හානි සිදුකරමින් සහ එහි ප්‍රතිඵලයක් ලෙස ජීවිත හානි සිදු කරමින් සැබවින් ම ෂෙල් වෙඩි ප්‍රහාර රෝහල් මත පතිත වූ වාතාවරණයක් තුළ සියලු තත්ත්වයන් හොඳින් සලකා බැලීමෙන් පසු මෙම කොමිෂන් සභාව සෑහීමකට පත්වේ. කෙසේ වෙතත්, කොමිෂන් සභාව ඉදිරියේ ඉදිරිපත් වූ කරුණු මගින්, කාලය, නිශ්චිත ස්ථානය සහ වෙඩි තැබීම් සිදුවූ දිශාව අනුව සිදුවීම්වල නිශ්චිත ස්වභාවය පිළිබඳව තරමක් ව්‍යාකූල චිත්‍රයක් නිර්මාණය වෙයි.

4.289: පුදුකුඩිඉරිප්පු රෝහලට සිදු වූ හානියට අදාළව සැලකිය යුතු කරුණු ප්‍රමාණයක් තිබූ අතර, එය කොමිෂන් සභාවේ විශේෂ අවධානයට ලක්විය යුතු කරුණකි.

4.290: මෙම පසුබිම තුළ, නිශ්චිත සාක්ෂි පදනම් කරගෙන අදාළ ක්‍රියාවන් සඳහා වගකිව යුත්තන් කවුද යන්න තීරණය කිරීම කොමිෂන් සභාව මුහුණ දෙන අභියෝගය වේ.

4.291: ෂෙල් වෙඩි ප්‍රහාරවල නිශ්චිත මූලාශ්‍රය හෝ කාලතුවක්කු ප්‍රහාරයේ දිශාව නිර්ණය කිරීම සංකීර්ණ කාර්යයක්ය යන්න හොඳින් පිළිගත් කරුණක් වන අතර, සාක්ෂිකරුට සිද්ධිය දර්ශනය වූ ස්ථානය සැලකිල්ලට ගනිමින්, වෙඩිතැබීම් දිශාව පිළිබඳව සාක්ෂිකරුවන් ලබාදෙන සාක්ෂි වලින් තහවුරු වන පරිදි, සිද්ධියකට සමකාලීනව සිදු කරනු ලබන සිදුරුවීම් පිළිබඳ විශ්ලේෂණය වැනි නිවැරදි තාක්ෂණික ක්‍රමවේදය මත බොහෝ රඳා පවතියි.

4.292: මෙම තීරණය ගැනීමේදී කොමිෂන් සභාව මුහුණ දෙන දුෂ්කරතාවය දෙආකාර වේ;

---

[165] උගත් පාඩම් සහ ප්‍රතිසන්ධාන කොමිෂන් සභාව විශ්වාස කරන සිවිල් වැසියෙකු විසින් කරන ලද නියෝජන. පිටපත් අංකය උගත් පාඩම් සහ ප්‍රතිසන්ධාන කොමිෂන් සභාවAST 0

[166] ආචාර්ය ටී. වර්තරාජා 2011 නොවැම්බර් 30 වැනි දින කොළඹදී උගත් පාඩම් සහ ප්‍රතිසන්ධාන කොමිෂන් සභාව හමුවේ.

(i) අදාළ ප්‍රදේශවල සිදුරුවීම් පිළිබඳ විශ්ලේෂණයක ස්වභාවයේ විමර්ශනයක් වහාම සිදු කර නොතිබූ බව කොමිෂන් සභාවට පැහැදිලි වන අතර, එය ගැටුමේ තීව්‍රතාවය අනුව එසේ වන්නට ඇතැයි අනුමාන කළ හැක.

(ii) රෝහල්වලට පතිත වූ ෂෙල් වෙඩි ප්‍රහාර ශ්‍රී ලංකා යුද හමුදාව විසින් හෝ එල්.ටී.ටී.ඊ. සංවිධානය විසින් එල්ල කරන ලද්දේ යැයි කොමිෂන් සභාව ඉදිරියේ සාක්ෂි ලබා දුන් කිසිවෙකුට නිශ්චිතවම ප්‍රකාශ කිරීමට නොහැකි විය.

කොමිෂන් සභාව හමුවේ පෙනී සිටි සිවිල් වැසියන් ප්‍රකාශ කළේ දෙපැත්තෙන්ම ෂෙල් වෙඩි ප්‍රහාර එල්ල වූ බවයි. එක් සිවිල් වැසියෙක් ප්‍රකාශ කළේ 'ෂෙල් වෙඩිල්ලක පතිත වූ විට, සාමාන්‍ය අදහස වුණේ එය හමුදාව විසින් එලල කරන්නට ඇත යන්නයි - එහෙත් හරියටම ප්‍රකාශ කළ නොහැකියි'.[167] පුදුමාතලන් රෝහලට එල්.ටී.ටී.ඊ. සංවිධානය විසින් අහම්බෙන් ෂෙල් ප්‍රහාරයක් එල්ල කළ බවත්, පසුව ඔවුන් ඒ සම්බන්ධයෙන් සමාව ඉල්ලා සිටි බවත් හිටපු එල්.ටී.ටී.ඊ සාමාජිකයෙක් තම කරුණු දැක්වීමේදී ප්‍රකාශ කළේය.[168]

4.293: මේ අනුව, රෝහල්වලට ෂෙල් වෙඩි ප්‍රහාර එල්ල කිරීම සහ ජීවිත හානි / දේපළ හානි සිදු කිරීම සම්බන්ධයෙන් වගකිව යුත්තේ කවුරුන්ද යන්න පිළිබඳව නිශ්චිත නිගමනයකට එළඹීමේ කොමිෂන් සභාවේ කාර්යය තාක්ෂණික ස්වභාවයේ ප්‍රාථමික සාක්ෂි නොමැතිකම සහ එය තහවුරු කෙරෙන සිවිල් වැසියන්ගේ සාක්ෂිවල නොපැහැදිලි බව සහ එක් පාර්ශ්වයක් හෝ අනෙක් පාර්ශ්වයක් එයට වගකිව යුතු බවට නිශ්චිත නිගමනයකට එළඹිය නොහැකිවීඔ යන කරුණු මත අතිශයින් දුෂ්කර වී ඇත.

නිසි පිළියම් සඳහා උගත් පාඩම් සහ ප්‍රතිසන්ධාන කොමිෂන් සභාවේ නිර්දේශ

4.294: ෂෙල් වෙඩි ප්‍රහාරයට එක් පාර්ශ්වයක් හෝ අනෙක් පාර්ශ්වයක් වගකිව යුතු බවට නිශ්චිත නිගමනයකට එළඹීමට කොමිෂන් සභාවට නොහැකි වුවද, කෙසේ වෙතත්, ඇත්ත වශයෙන්ම රෝහල්වලට ෂෙල් වෙඩි ප්‍රහාර එල්ල වූ බවත්, එයින් රෝහල්වලට හානි සිදුවූ බවටත්, ඇතැම් අවස්ථාවල සිවිල් වැසියන්ට ජීවිත හානි සහ තුවාල සිදුවූ බවටත් ඉදිරිපත් වූ සාක්ෂි ප්‍රමාණය අනුව, ප්‍රතිසන්ධාන ක්‍රියාවලිය කෙරෙහි විශ්වාසය ඇති කරන මානුෂීය පියවරක් ලෙස නිසි පරීක්ෂණයකින් පසුව විපතට පත් වූවන්ට සුදුසු සහන කඩිනමින් ලබා දීම ගැන සලකා බැලිය යුතුය.

237. උගත් පාඩම් සහ ප්‍රතිසන්ධාන කොමිෂන් සභා වාර්තාවේ 9 වැනි පරිච්ඡේදයේ රෝහල්වලට ෂෙල් වෙඩි ප්‍රහාර එල්ල කිරීම පිළිබඳ උගත් පාඩම් සහ ප්‍රතිසන්ධාන කොමිෂන් සභාවේ ප්‍රධාන නිරීක්ෂණ දෙස බැලීමට පෙර, එම වාර්තාවේ 76 වෙනි පිටුවේ 4.119 සහ 4.121 ඡේද පිළිබඳ නැවත සඳහන් කිරීම වැදගත් වේ.

මූලතිව් මහ රෝහලට අනුයුක්තව සේවය කළ සහ ගැටුමේ අවසන් අදියරේදී වෛද්‍ය පහසුකම් කිහිපයක සේවය කළ හෙද නිලධාරියෙකු වල්ලිපුනම් තාවකාලික රෝහල සම්බන්ධයෙන් ප්‍රකාශ කළේ 2009 ජනවාරි 21 වන දින රාත්‍රී 7 න් පසු රථගාලට ෂෙල් වෙඩි එල්ලවූ බවත් ඉන් රෝගීන්

[167] උගත් පාඩම් සහ ප්‍රතිසන්ධාන කොමිෂන් සභාව හමුවේ සිවිල් වැසියෙකු විසින් ඉදිරිපත් කරන ලද කරුණු දැක්වීම. පිටපත්කරය LLRC/IS/01.07.11/01

[168] කැමරා තාක්ෂණයෙන් කරන ලද අදහස් දැක්වීම්

කිහිප දෙනෙක් සුළු තුවාල ලැබූ බවත් ය.[169] එහිදී වැඩිදුරටත් ප්‍රශ්න කිරීමේදී, ෂෙල් වෙඩි පැමිණියේ කොහෙන්දැයි තමන් නොදන්නා බව ඔහු කියා සිටියේය. රෝහලට ආසන්නයේ සරණාගත කඳවුරක් තිබී, එයට ෂෙල් වෙඩි වැදී පුද්ගලයන් 40 දෙනෙකු පමණ මිය ගිය බව ඔහු සඳහන් කළේය. රෝහල් පරිශ්‍රයේ එල්.ටී.ටී.ඊ සංවිධානය නොසිටි අතර, මීටර 500 ක් පමණ එපිටින් කොටි සංවිධානය සිටි බවත් ඔහු වැඩිදුරටත් කියා සිටියේය.[170]

ආනන්දපුරම් තාවකාලික රෝහල 2009 පෙබරවාරි මාසයේ දින 20 ක් පමණ ක්‍රියාත්මක වූ බව එහි සේවය කළ හෙද නිලධාරියෙක් ප්‍රකාශ කළේ ය. රෝහල ආසන්නයේ විශාල එල්.ටී.ටී.ඊ. අවි ගබඩාවක් තිබී ඇති අතර, කඟීර් ප්‍රහාරයක් එල්ල වී එය විනාශවී ඇත. දින දෙකකට පසුව තාවකාලික රෝහලට ද මෙවැනිම ප්‍රහාරයක් එල්ල වූ නමුත් ඒ වන විටත් අවි ගබඩාවට එල්ල වූ ප්‍රහාරයෙන් පසු වෛද්‍ය අධිකාරීවරයා රෝහල වෙනත් ස්ථානයකට ගෙනයාමට තීරණය කිරීම නිසා රෝගීන් වෙනත් ස්ථානයකට රැගෙන ගොස් තිබූ බව ද ඔහු සඳහන් කළේය.[171]

238. ඇත්ත වශයෙන්ම රෝහල් මතට ෂෙල් වෙඩි ප්‍රහාර පතිත වී එහි ප්‍රතිඵලයක් ලෙස දේපළ හානි සහ ජීවිත හානි ද සිදුවී ඇත.[172]

239. මෙම පසුබිම තුළ, උගත් පාඩම් සහ ප්‍රතිසන්ධාන කොමිෂන් සභාව මුහුණ දුන් අභියෝගය වූයේ නිශ්චිත සාක්ෂි පදනම් කරගෙන එම ක්‍රියාවන්ට වගකිව යුතු පුද්ගලයන් කවුරුන්ද යන්න තීරණය කිරීමයි.[173]

240. දෙපාර්ශ්වයෙන් ම ෂෙල් වෙඩි ප්‍රහාර එල්ල වූ බව කොමිෂන් සභාව හමුවට පැමිණි සිවිල් වැසියන් විසින් ප්‍රකාශ කරන ලදී. "ෂෙල් වෙඩි ප්‍රහාරයක් පතිත වූ විට සාමාන්‍ය අදහස වුණේ එය යුධ හමුදාවෙන් බව - නිශ්චිතවම පවසන්න අපහසුයි." යනුවෙන් එක් සිවිල් වැසියෙකු විසින් ප්‍රකාශ කරන ලදී. තම අදහස් දැක්වීම් අතරතුර තවත් හිටපු එල්.ටී.ටී.ඊ. සාමාජිකයෙකු විසින් ප්‍රකාශ කරන ලද්දේ පුදුමාතලන් රෝහල වෙත අහම්බයෙන් එල්.ටී.ටී.ඊ. සංවිධානයේ ෂෙල් ප්‍රහාරයක් එල්ල වූ බවත්, ඉන් පසුව ඔවුන් ඒ සම්බන්ධයෙන් සමාව ඉල්ලා සිටින ලද බවත් ය.[174]

241. ඒ අනුව, තාක්ෂණික ස්වභාවයේ මූලික සාක්ෂි නොමැතිකම හේතුවෙන් මෙන් ම එම කරුණු සනාථ කරන සිවිල් වැසියන්ගේ සාක්ෂි ස්වභාවයෙන් ම අපැහැදිලි අර්ථගැන්වීමක් සහිත වීමේ කාරණය හේතුවෙන් ද ෂෙල් වෙඩි ප්‍රහාර එල්ල කිරීම සම්බන්ධයෙන් එක් පාර්ශ්වයක් හෝ අනෙක් පාර්ශ්වය හෝ වගකිව යුතු වන්නේය යන නිශ්චිත නිගමනයකට එළඹීමට ඒ තුළින් ඉඩකඩ නොසලසන බැවින් ද, රෝහල් වෙත ෂෙල් වෙඩි ප්‍රහාර එල්ල කිරීම සහ ජීවිත හා දේපළ වලට අලාභ හානි සිදු කිරීම සම්බන්ධයෙන් වගකිව යුත්තේ කවුරුන්ද යන්න පිළිබඳව නිශ්චිත

---

[169] උගත් පාඩම් සහ ප්‍රතිසන්ධාන කොමිෂන් සභාව ඉදිරියේ සිවිල් පුරවැසියෙක් ඉදිරිපත් කළ අදහස් දැක්වීම්. පිටපත්කර අංක LLRC/IS/20.08.11/01 උගත් පාඩම් සහ ප්‍රතිසන්ධාන කොමිෂන් සභාවේ ප්‍රශ්න කිරීම්වලදී රෝගීන් 2-3 දෙනෙකුට වඩා මිය ගිය බව ඔහු පැවසුවේය.

[170] උගත් පාඩම් සහ ප්‍රතිසන්ධාන කොමිෂන් සභාව ඉදිරියේ සිවිල් පුරවැසියෙක් ඉදිරිපත් කළ අදහස් දැක්වීම්. පිටපත්කර අංක LLRC/IS/01.07.11/01

[171] උගත් පාඩම් සහ ප්‍රතිසන්ධාන කොමිෂන් සභාව ඉදිරියේ සිවිල් පුරවැසියෙක් ඉදිරිපත් කළ අදහස් දැක්වීම්. පිටපත්කර අංක LLRC/IS/01.07.11/01

[172] උගත් පාඩම් සහ ප්‍රතිසන්ධාන කොමිෂන් සභාව, 9.10 ඡේදය

[173] උගත් පාඩම් සහ ප්‍රතිසන්ධාන කොමිෂන් සභාව, 9.11 ඡේදය

[174] උගත් පාඩම් හා ප්‍රතිසන්ධාන කොමිෂන් සභාව, 9.12 ඡේදය

නිගමනයකට එළඹීමේ උගත් පාඩම් සහ ප්‍රතිසන්ධාන කොමිෂන් සභාවේ කාර්යභාරය අතිශයින් අසීරු එකක් බවට පත් වී ඇත.[175]

242. ෂෙල් වෙඩි ප්‍රහාර එල්ල කිරීම සම්බන්ධයෙන් එක් පාර්ශවයක් හෝ අනෙක් පාර්ශ්වය වගකිව යුතු වන්නේය යන්න පිළිබඳව වගකීම නිර්ණය කිරීම සඳහා නිශ්චිත නිගමනයකට එළඹීමේ හැකියාවක් උගත් පාඩම් හා ප්‍රතිසන්ධාන කොමිෂන් සභාව සතුව නොපැවතියද, ප්‍රතිසන්ධාන ක්‍රියාවලිය කෙරෙහි විශ්වාසය ගොඩ නැගීමට හේතු වෙමින්, මානුෂීය ලෙස කටයුතු කරමින් නියමිත විමර්ශන වලින් අනතුරුව බලපෑමට ලක් වූවන්හට යෝග්‍ය සහන කඩිනමින් සැලසීම පිළිබඳව නිසි අවධානය යොමු කළ යුතු ය. [176]

243. රෝහල් වෙත ෂෙල් වෙඩි ප්‍රහාර එල්ල කිරීම සම්බන්ධයෙන් වන සාකච්ඡාවෙන් ඉවත් වීමට ප්‍රථම, 2009 දෙසැම්බර් 13 දිනැති 'මානව හිමිකම් සඳහා විශ්වවිද්‍යාල ගුරුවරුන් (යාපනය)' සංවිධානයෙහි අංක 34 දරණ විශේෂ වාර්තාවෙන් කරුණු උපුටා දැක්වීම යෝග්‍ය වේ.

"පෙබරවාරි 1 වැනි දින සවස 3-4 අතර කාලයේදී පුදුකුඩ්ඩුඉරිප්පු රෝහල වෙත ෂෙල් වෙඩි ප්‍රහාර 2 ක් එල්ල වූ අතර ජාත්‍යන්තර රතුකුරුස සංවිධානයේ ප්‍රකාශන වලට අනුව ඉන් පළමුවැන්න මුළුතැන්ගෙයටත් ඉන් පසුව දේවස්ථානය වෙතත් එල්ල වී ඇත. පුද්ගලයන් දෙදෙනෙකු මිය යන ලදී. පුදුකුඩ්ඩුඉරිප්පු හි සිටි ජාත්‍යන්තර රතුකුරුස සංවිධානයේ වෛද්‍ය සම්බන්ධීකාරකවරයෙකු වූ මෝවන් මර්විසන් ලොව්රි විසින් එම දිනය පිළිබඳ ප්‍රකාශයක් සිදු කරමින් මෙලෙස පවසන ලදී:

> *"හාත්පසින්ම ඇසෙන යුධ ගැටුම් වල හඬ නිසාත්, ඉතා විශාල රෝගීන් ප්‍රමාණයක් අළුතින් පැමිණීම නිසාත්, රෝහල් කාර්ය මණ්ඩලය දැඩි පීඩනයක් යටතේ කටයුතු කරමින් සිටියා. ගිලන් රථ නිතරම පැමිණුනත්, කරත්ත, ට්‍රැක්ටර් සහ ස්කූටර් රථ වලින් පවා පුද්ගලයන් රෝහල වෙත රැගෙන එනු ලැබුවා."*
>
> *මෙම තත්ත්වය මධ්‍යයේ කාර්ය මණ්ඩලය විසින් ඉතා දක්ෂව සහ කැපවීමෙන් යුක්තව රෝහල වෙත භයානක සහ අවදානම් සහගත ගමනක් පැමිණි තුවාලවූවන් සහ රෝගී වූවන් සඳහා රැකවරණය සලසනු ලැබුවා."*
>
> *එදිනම (පෙබරවාරි පළමු වන දින) පැය කිහිපයකට පසුව එනම්, ප.ව. 10.20 ට පමණ කාන්තාවන් සහ ළමුන් සිටි වාට්ටුවක් වෙත නැවත ප්‍රහාරයක් එල්ල වූ බව ජාත්‍යන්තර රතුකුරුස සංවිධානය විසින් වාර්තා කොට ඇත. මේ අවස්ථාව වන විට රෝහල තුළ පුද්ගලයන් 800කට වඩා වැඩි ප්‍රමාණයක් රැඳී සිටි අතර, අභ්‍යන්තර රෝගීන් 500ක් ද මෙයට ඇතුළත් විය. සමස්තයක් වශයෙන් පුද්ගලයන් 9 දෙනෙකු මරුමුවට පත් වූ අතර, එදින තවත් 20 දෙනෙකු තුවාල ලැබීය. පෙබරවාරි 2 වන දින ප.ව. 6.40ට පමණ රෝහල වෙත නැවත ප්‍රහාරයක් එල්ල වූ අතර හෙද නිලධාරිනියක තුවාල ලැබීය. මෙම ෂෙල් වෙඩි ප්‍රහාර එල්ල කිරීම පිටුපස පැවති එක් කාරණයක් වූයේ යුධ හමුදාවේ 59 වන සේනාංකය සැතපුම් 8 ක් දකුණින් පිහිටි මුල්ලියාවෙලෙයි හි සිට ඉදිරියට පැමිණෙමින් පුදුකුඩ්ඩුඉරිප්පු අත්පත් කර ගැනීමට උත්සාහ කරමින් සිටීමයි. ඒ වන විට යුධ හමුදාව සිටියේ රෝහලට දකුණු පසින් වැඩි දුරකට නොවන්නට ය. යුධ ගැටුම් වල ප්‍රතිඵලයක් වශයෙන් අනර්ථකාරී බලපෑමකට වඩා වැඩි යමක් ඇති නොවූවද, යුධ හමුදාවේ සහායට*

[175] උගත් පාඩම් හා ප්‍රතිසන්ධාන කොමිෂන් සභාව, 9.13 ඡේදය

[176] උගත් පාඩම් හා ප්‍රතිසන්ධාන කොමිෂන් සභාව, 9.14 ඡේදය

පැමිණෙන කෆීර් බෝම්බ හෙළන ගුවන් යානාවන් වෙත වෙඩි ප්‍රහාර එල්ල කිරීම සඳහා භාවිතා කරන ලද වෙඩි ප්‍රහාරක යානා එල්.ටී.ටී.ඊ. සංවිධානය සතු විය.

නියමුවන් නොමැති යානා (UAV) මගින් හඳුනාගැනීමට ලක් විය හැකි නිසාත්, ඒ ඔස්සේ ෂෙල් වෙඩි ප්‍රහාර එල්ල වීමකට තුඩු දිය හැකි බැවිනුත්, රෝහල ඉදිරිපස වාහන ධාවනය කිරීමට හෝ වාහන නවතා තැබීමට කටයුතු නොකරන ලෙසට ජාත්‍යන්තර රතුකුරුස සංවිධානය මගින් සිදු කරන ලද ඉල්ලීම එල්.ටී.ටී.ඊ. සංවිධානය විසින් දැඩි ලෙස නොසලකා හරින ලද බව රෝහල සමග සමීපව කටයුතු කළ ජ්‍යෙෂ්ඨ උපදේශකයෙකු විසින් අප වෙත පවසන ලදී." [177]

244. සත්‍යය සෙවීමේ යාන්ත්‍රණය මගින් විමර්ශන කටයුතු සිදු කරනු ලබන විට සත්‍යය සෙවීමේ කාර්යය සඳහාත්, සාක්ෂි එක්රැස් කිරීමේ ක්‍රියාවලිය තුළදීත්, 'මානව හිමිකම් සඳහා විශ්වවිද්‍යාල ගුරුවරුන් (යාපනය)' සංවිධානයේ වාර්තා වලින් සහ එම ලිපි ලේඛන වලින් සහාය සලසා ගැනීමට කටයුතු කිරීම යෝග්‍ය විය හැකි බව මෙම ජනාධිපති විමර්ශන කොමිසමෙහි මතය වේ.

245. රෝහල් වෙත ෂෙල් වෙඩි ප්‍රහාර එල්ල වීම පිළිබඳ චෝදනාව සත්‍ය සහ ප්‍රතිසන්ධාන කොමිසම මගින් විමර්ශනයට ලක් කළ යුතු බවට ජනාධිපති විමර්ශන කොමිසම විසින් නිර්දේශ කරනු ලැබේ.

යුධ ගැටුම් පවතින ප්‍රදේශ වල සිටින සිවිල් වැසියන් වෙත ආහාර සහ ඖෂධ ඇතුළු මානුෂීය සහන සැපයීම

246. 2006 අගෝස්තු සිට 2009 ජනවාරි දක්වා කාල සීමාවේ දී අඩු බාධක ප්‍රමාණයක් යටතේ කිලිනොච්චි සහ මුල්ලිවයික්කාල් වෙත ආහාර, ඖෂධ, ඉදිකිරීම් උපකරණ, ඉන්ධන සහ අනෙකුත් අත්‍යවශ්‍ය ද්‍රව්‍ය සැපයීමට සහ ප්‍රවාහනය කිරීමට මානුෂීය ප්‍රයත්නයන් දරා තිබෙන බව උගත් පාඩම් සහ ප්‍රතිසන්ධාන කොමිෂන් සභාව විසින් නිරීක්ෂණය කර ඇත. කෙසේ වුවද, යුධ ගැටුම් වඩා තීව්‍ර තත්ත්වයට පත් වීමෙන් පසුව මහාමාර්ග ඔස්සේ ප්‍රවාහනය කරමින් මෙම භාණ්ඩ රැගෙන යාම වඩා අභියෝගාත්මක බවට පත් වී ඇත.[178]

247. යුධ ගැටුම් වලින් බලපෑමට ලක් වූ කලාප වෙත ආරක්ෂිත රථ ඔස්සේ ආහාර ප්‍රවාහනය කිරීම සියුම්ව සිදු වන බවට සහතික කිරීම සඳහා ශ්‍රී ලංකා රජය විසින් පුළුල් ප්‍රයත්නයන් දරා ඇති බව තමන් ඉදිරියේ පවත්නා කරුණු අනුව තීරණය කළ හැකි බව උගත් පාඩම් හා ප්‍රතිසන්ධාන කොමිසම සඳහන් කර ඇත. යුද්ධය වඩා බරපතල අතට හැරුණු 2018 අවසාන භාගයේදී පවා සාමාන්‍යයෙන් භාවිතා කරනු ලැබූ භූමි මාර්ගය තවදුරටත් ආරක්ෂිත නොවූ අතර, එහිදී මානුෂීය මෙහෙයුම් සඳහා පහසුකම් සැලසීම මගින් ආරක්ෂිත ආහාර රථ සුරක්ෂිත අයුරින් ගමන් කරවීම සඳහා විකල්ප ගොඩබිම් මාර්ග විවෘත කිරීමට ශ්‍රී ලංකා රජය විසින් කඩිනමින් ක්‍රියා කොට ඇත. තවදුරටත්, තෙමසක පමණ කාලයක් සඳහා ප්‍රමාණවත් විය හැකි ආහාර තොග මෙට්‍රික් ටොන් 750-1000 අතර ප්‍රමාණයක් පවත්වාගෙන යන ලෙසට අත්‍යවශ්‍ය සේවා කොමසාරිස් ජනරාල්වරයා විසින් කිලිනොච්චි දිසාපතිවරයාට උපදෙස් ලබා දී තිබූ බවත් එම තොග පුදුකුඩුඉරිප්පු ශ්‍රී ලංකා රජයේ ගබඩා තුළ පවත්වාගෙන යන ලද බවත් උගත් පාඩම් හා ප්‍රතිසන්ධාන කොමිෂන් සභාව විසින් සඳහන් කරන ඇත. යුධ ගැටුම් පැවති කාලසීමාව පුරාවට ම යුද්ධයෙන් බලපෑමට ලක් වූ ප්‍රදේශ වල සිටි සිවිල් වැසියන් සඳහා ආහාර සහ අනෙකුත්

[177] මානව හිමිකම් සඳහා වන විශ්වවිද්‍යාල ගුරුවරු (යාපනය), 2009 දෙසැම්බර් 13, විශේෂ වාර්තා අංක 34, 2.6 ඡේදය

[178] උගත් පාඩම් හා ප්‍රතිසන්ධාන කොමිෂන් සභාව, ඡේදය 4.146

අත්‍යවශ්‍ය ද්‍රව්‍ය සැපයීමේ සහ බෙදා හැරීමේ ක්‍රියාවලිය තුළින් ශ්‍රී ලංකා රජය විසින් දක්වන ලද යහපත් ක්‍රියාකාරිත්වය උගත් පාඩම් සහ ප්‍රතිසන්ධාන කොමිෂන් සභාවේ ඇගයීමට ලක් වී ඇත.[179]

248. එසේම, 2008 ඔක්තෝබර් 16 වන දින සිට කිලිනොච්චි සහ මුලතිව් වෙත අත්‍යවශ්‍ය ආහාර සැපයුම් රැගෙන යන රථ ඉලක්ක කරගනිමින් අවස්ථා ගණනාවකදී එල්.ටී.ටී.ඊ. සංවිධානය විසින් ප්‍රහාර එල්ල කොට තිබෙන බවට ද උගත් පාඩම් සහ ප්‍රතිසන්ධාන කොමිෂන් සභාව මගින් පෙන්වා දී ඇත. උගත් පාඩම් හා ප්‍රතිසන්ධාන කොමිසම විසින් එකී ප්‍රහාර පිළිබඳව පහත සඳහන් වාර්තා කර ඇත:

> 2 වෙනි ආරක්ෂක රථය - 2008 ඔක්තෝබර් 16 පළමු දින ෂෙල් ප්‍රහාර එල්ල වීම (පුලියන්කුලමට පෙර)
>
> 3 වෙනි ආරක්ෂක රථය - 2008 නොවැම්බර් 10 ආපසු පැමිණෙන අතරතුර ෂෙල් වෙඩි ප්‍රහාරයට ලක්වීම (ඕමන්තේ)
>
> 10 වෙනි ආරක්ෂක රථය - (2009 ජනවාරි 08) ආපසු පැමිණෙන අතරතුර ෂෙල් වෙඩි ප්‍රහාරයට ලක්වීම (නැදුන්කර්නි)
>
> 11 වෙනි ආරක්ෂක රථය - (2009 ජනවාරි 16) දින 7 ක් පැවති ෂෙල් වෙඩි ප්‍රහාර (පුදුකුඩුඉරිප්පු)[180]

249. එල්.ටී.ටී.ඊ. සංවිධානය පාර්ශ්වයෙන් නිර්මාණය කරන ලද බාධාකාරී තත්ත්වයන් ගණනාවක් හේතු කොට ගෙන 2019 ජනවාරි මස සිට බරපතල යුධ ගැටුම් පැවති පසුබිම මධ්‍යයේ ආහාර සහ අත්‍යවශ්‍ය ද්‍රව්‍ය සැපයුම ප්‍රවාහනය කිරීමේ කටයුතු අභියෝගාත්මක තත්ත්වයට පත් වූ බවත් ආරක්ෂිත අයුරින් ආහාර රථ ගමන් කරවීම සඳහා එල්.ටී.ටී.ඊ. සංවිධානය සමග ඒ පිළිබඳව සාකච්ඡා කරන ලෙසට ශ්‍රී ලංකා රජය විසින් ජාත්‍යන්තර රතුකුරුස සංවිධානය වෙතින් ඉල්ලීම් කරන ලද බවත් උගත් පාඩම් සහ ප්‍රතිසන්ධාන කොමිෂන් සභාව විශේෂයෙන් සඳහන් කරයි. කෙසේ වුවද, එම සාකච්ඡා සාර්ථකත්වයට පත් වූයේ නැත. අභ්‍යන්තරව අවතැන් වූ පුද්ගලයන් සඳහා සහනාධාර සැපයීමට දිසාපති ව්‍යුහයන් ස්ථාපිත කිරීම ඔස්සේ ශ්‍රී ලංකා රජය පාර්ශ්වයෙන් ගනු ලැබූ ධනාත්මක පියවර, 2009 ජනවාරි මස 30 වෙනි දින පැවති මානුෂීය ආධාර පිළිබඳ උපදේශක කමිටු රැස්වීමේදී එක්සත් ජාතීන්ගේ නේවාසික සම්බන්ධීකාරකගේ ප්‍රශංසාවට ලක් වූ බව උගත් පාඩම් හා ප්‍රතිසන්ධාන කොමිෂන් සභාව විසින් 4.161 ඡේදයේ සඳහන් කර ඇත.[181]

250. යුධ ගැටුම් හේතුවෙන් නිර්මාණය වූ, මින් පෙර අත් නොවිඳි බාධක මධ්‍යයේ ද, බෙදා හැරීමේ ක්‍රමය තුළ පැවති දුර්වලතා මධ්‍යයේ සහ ආහාර සැපයුම් අයිති කර ගැනීමට එල්.ටී.ටී.ඊ. සංවිධානය විසින් භාවිතා කරන ලද නොයෙක් උපායමාර්ග මධ්‍යයේ ද යුද්ධයේ අවසන් සති කිහිපය අතරතුර බලපෑමට ලක්වූ පුද්ගලයන් සඳහා හැකි උපරිම ප්‍රමාණයේ සැපයුම් ලබා දීම සහතික කිරීම උදෙසා ශ්‍රී ලංකා රජය විසින් ප්‍රශංසනීය සේවා සැපයුමක් සහ සහාය ලබා දීමක් සිදු කර ඇත.[182]

---

[179] උගත් පාඩම් හා ප්‍රතිසන්ධාන කොමිෂන් සභාව, 4.151 – 4.153 ඡේද

[180] උගත් පාඩම් හා ප්‍රතිසන්ධාන කොමිෂන් සභාව, 4.158 ඡේදය

[181] උගත් පාඩම් හා ප්‍රතිසන්ධාන කොමිසන් සභාව, 4.159, 4.161 ඡේදය

[182] උගත් පාඩම් හා ප්‍රතිසන්ධාන කොමිෂන් සභාව, 9.17 ඡේදය

251. කෙසේ වුවද, මෙම ප්‍රයත්නයන් මධ්‍යයේ, විශේෂයෙන් ම යුධ ගැටුම් ඉතා උග්‍රව පැවති අවස්ථාවල දී, ස්වකීය පෝෂණ අවශ්‍යතාවයන් සපුරා ගැනීම සඳහා පහසුවෙන් ලබා ගත හැකි ආහාර සැපයුම් වල ප්‍රමාණවත්භාවය සැලකීමේ දී සිවිල් වැසියන් ඉන් බලපෑමට ලක් වී තිබූ බව පැහැදිලි වේ.[183] 2009 පෙබරවාරි මාසයෙන් පසුව පැවති බවට පෙනී ගිය අහිතකර තත්ත්වයන් 4 වෙනි පරිච්ඡේදයේ දෙවෙනි කොටස යටතේ විස්තරාත්මකව දක්වා ඇත.

252. තමන් සතුව පවතින සියලු ලිපි ලේඛන පරීක්ෂා කිරීමෙන් අනතුරුව, උගත් පාඩම් සහ ප්‍රතිසන්ධාන කොමිෂන් සභාව විසින් දරන ලද මතය වන්නේ, ජාත්‍යන්තර ප්‍රජාවගේ මෙන් ම සිවිල් සමාජ කණ්ඩායම්වල ද සහයෝගය සහිතව, ශ්‍රී ලංකා රජය විසින් ජාත්‍යන්තර සහයෝගිතාවය සහ එකමුතුකම පෙරදැරි කරගත් හැඟීමකින් යුතුව, මෙම මෙහෙයුම තුළ පැවති අතිවිශාල සංවිධානමය අසීරුතාවයන් මධ්‍යයේ වුවද, අනතුරේ වැටී සිටින සිවිල් වැසියන් වෙත ආහාර ද්‍රව්‍ය, වෛද්‍ය සැපයුම් සහ අනිකුත් අත්‍යවශ්‍ය භාණ්ඩ ලබා දීම සඳහා ගත හැකි සියළු පියවර ගෙන ඇති බව ය. [184]

253. එල්.ටී.ටී.ඊ. සංවිධානය විසින් යුධ මුක්ත කලාප තුළ ප්‍රාණ ඇපකරුවන් වශයෙන් රඳවා ගෙන සිටි සිවිල් වැසියන් සංඛ්‍යාව පිළිබඳ එකිනෙකට වෙනස් වූ ඇස්තමේන්තු ඉදිරිපත් කොට ඇති බවට ද උගත් පාඩම් හා ප්‍රතිසන්ධාන කොමිෂන් සභාව සඳහන් කර ඇත. අදාළ සිවිල් බලධාරීන් වෙතින් ලේඛනමය සාක්ෂි[185] ලබා ගනිමින් එම ඇස්තමේන්තුවල නිවැරදි භාවය පරීක්ෂා කර බැලීම සඳහා කොමිෂන් සභාව විසින් දැඩි ප්‍රයත්නයන් දරන ලද තත්ත්වයක් මධ්‍යයේ කිසිදු මූලික ලිපි ලේඛන සොයා ගැනීමක් සිදු කිරීමට කොමිසමට හැකියාවක් ලැබී නැත. යුධ වැදීමේ ක්‍රමයක් වශයෙන් සිවිල් ජනගහනය නිරාහාරව තැබීමේ අරමුණින් යුධ මුක්ත කලාප තුළ තබා ගත් සිවිල් වැසියන්ගේ සංඛ්‍යාව සුළුවෙන් දැක්වීමට හිතාමතා අරමුණු කරන ලද බවට අනුමාන හෝ නිගමනය කළ හැකි කිසිදු අවස්ථාවක්, ශ්‍රී ලංකා රජය විසින් ගනු ලැබූ උද්යෝගී ප්‍රයත්නයන් තුළින් සපයනු නොලැබේ.[186]

254. සැබැවින්ම එස්.බී. දිවාරත්න මහතා (භාණ්ඩාගාරයේ විශ්‍රාමික නියෝජ්‍ය ලේකම්වරෙයකු, මැතිවරණ කොමිෂන් සභාවේ සාමාජිකයෙකු සහ දිළිඳුකම පිටුදැකීම සහ ජීවනෝපාය සංවර්ධනය සඳහා බලයලත් කාර්යසාධක බලකායේ සභාපති) ජනාධිපති විමර්ශන කොමිසම ඉදිරියේ සාක්ෂි ලබා දෙමින් කිසිදු ප්‍රමාදයකින් හෝ බාධාවකින් තොරව උතුරු කලාපය වෙත ආහාර සැපයුම් සහ ප්‍රවාහන පහසුකම් ලබා දුන් බවට හඟවන ලදී.

255. ජනාධිපති විමර්ශන කොමිසම විසින් මතු කරන ලද ප්‍රශ්න වලට ප්‍රතිචාර දක්වමින් ඔහු පහත සඳහන් පරිදි ප්‍රකාශ කළේය:

යාපනය, කිලිනොච්චිය සහ මුලතිවු දිස්ත්‍රික්ක වල ආහාර, ඖෂධ සහ අනෙකුත් සියලු අත්‍යවශ්‍ය සේවාවන් නිසි පරිදි පවත්වාගෙන යන බව සහතික කිරීම සඳහා 2006 අගොස්තු මස සිට අත්‍යවශ්‍ය සේවාවන් පිළිබඳ කොමසාරිස් ජනරාල්වරයා වශයෙන් ඔහු පත් කොට ඇත. 2008 වසරේ අවසාන භාගයේදී යුද්ධය වඩා කටුක තත්ත්වයට පත් වීමත් සමග කිලිනොච්චියෙහි සිට ක්‍රියාත්මක වූ එක්සත් ජාතීන්ගේ ආයතන සහ ජාත්‍යන්තර රාජ්‍ය නොවන සංවිධාන වලින්

---

[183] උගත් පාඩම් හා ප්‍රතිසන්ධාන කොමිෂන් සභාව, 9.18 ඡේදය

[184] උගත් පාඩම් හා ප්‍රතිසන්ධාන කොමිෂන් සභාව ඡේදය 9.19

[185] උගත් පාඩම් හා ප්‍රතිසන්ධාන කොමිෂන් සභාව ඡේද 4.304 සහ 9.20

[186] එම

ස්වකීය ජීවිත කෙරෙහි අවදානමක් එල්ල වී පැවති බැවින් ආරක්ෂක හේතු මත වවුනියාව මූලික කරගෙන ක්‍රියාත්මක වන ලෙසට ශ්‍රී ලංකා රජය විසින් ඉල්ලීමක් සිදු කරන ලදී. වවුනියාවේ මධ්‍යම සැපයුම් කේන්ද්‍රයක් පිහිටුවන ලද අතර, ආහාර සහ අනෙකුත් අත්‍යවශ්‍ය ද්‍රව්‍ය සැපයීම සම්බන්ධයෙන් එක්සත් ජාතීන්ගේ ආයතන සහ ජාත්‍යන්තර රාජ්‍ය නොවන සංවිධාන ක්‍රියාත්මක වූයේ මෙම කේන්ද්‍රය හරහා ය. 2009 පෙබරවාරි මස දක්වා ශ්‍රී ලංකා රජය විසින් භූමි මාර්ග ඔස්සේ ආහාර රැගත් රථ වවුනියාව, නෙදුන්කර්නි, ඔඩ්ඩුසුඩාන්, පුඩුකුඩුඉරිප්පු හරහා කිලිනොච්චිය වෙතත් ඉන් පසුව මුලතිව් සහ කන්දවේලි දක්වා අනෙකුත් ප්‍රදේශ වෙතත් ආහාර ප්‍රවාහනය කොට තිබුණි. එක්සත් ජාතීන්ගේ ආයතන විසින් මෙම ආහාර රථ වලට ආරක්ෂාව සලසන ලදී. යුද්ධ කලාපය වෙත ආහාර ප්‍රවාහනය කිරීම සඳහා ලොරි රථ හිමිකරුවන්ගේ සංගමයට අයත් ලොරි රථ 150 ක් සහ ලෝක ආහාර වැඩසටහනේ ලොරි රථ 40 ක් යොදවා තිබූ බව සාක්ෂිකරුවෙකු විසින් සාක්ෂි වශයෙන් සඳහන් කරන ලදී. එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන සහ ලෝක ආහාර වැඩසටහන සතුව වවුනියාව ප්‍රදේශයේ ස්ථානගත වූ ප්‍රධාන ගබඩා පහසුකම් පැවතුණි ... ...[187]

256. එම ජනාධිපති විමර්ශන කොමිසම ඉදිරියේ සාක්ෂි ලබා දුන් එස්.බී. දිවාරත්න, මේ පිළිබඳ අධ්‍යයනය කිරීම සඳහා පත් කරන ලද ඩී.එස්. විජේසිංහ කමිටු වාර්තාවේ සහ ශ්‍රී ලංකාවේ මෑත කාලීන යුධ ගැටුම් අතරතුර සිදු වූ සිද්ධි පිළිබඳ එක්සත් ජනපද රාජ්‍ය දෙපාර්තමේන්තු වාර්තාවේ ද ප්‍රමුඛව ම කැපී පෙනෙයි.[188]

257. එක්සත් ජනපද රාජ්‍ය දෙපාර්තමේන්තු වාර්තාවේ නව වෙනි පරිච්ඡේදයට පිළිතුරු වශයෙන් පවතින ඩී.එස්. විජේසිංහ කමිටු වාර්තාවේ අට වෙනි පරිච්ඡේදය යටතේ, යුධ කලාපය තුළ කොටු වී සිටින ජනතාවට අවශ්‍ය මානුෂීය ආධාර සැපයීම සිදු නොකිරීම සම්බන්ධයෙන් වන චෝදනා දක්වන පහත පරිච්ඡේද පිළිබඳව, තවදුරටත් අවධානය යොමු වීමක් සහ විමර්ශනය කිරීමේ අවශ්‍යතාවයක් මතුවන අතර, සත්‍ය ප්‍රතිසන්ධාන කොමිෂන් සභාව වැනි සත්‍යය සෙවීමේ ව්‍යුහයක් තුළ මෙම ගැටළුව මතු වන්නේ නම්, විශේෂයෙන්ම එවැනි අවශ්‍යතාවයක් මතුවේ.

258. මානුෂීය තත්ත්වයන් පිළිබඳ එක්සත් ජනපද රාජ්‍ය දෙපාර්තමේන්තු වාර්තාවට ප්‍රතිචාර වශයෙන් දක්වන ඉහතින් දක්වා ඇති ඡේද ජනාධිපති නීතිඥ ඩී.එස්. විජේසිංහ මහතාගේ ප්‍රධානත්වයෙන් ක්‍රියාත්මක වූ කමිටු වාර්තාවේ පිටු අංක 83 සිට 86 දක්වා පිටු වල දැක ගත හැක.

> "*ආහාර හිඟය සහ වෛද්‍ය සැපයුම් වල හිඟය, මන්දපෝෂණය යනාදිය සම්බන්ධයෙන් චෝදනා 50කට වඩා වැඩි ප්‍රමාණයක් පවතී. කෙසේ වුවද, වඩාත්ම බරපතල චෝදනාව බවට පෙනී යන්නේ යුධ මුක්ත කලාප තුළ සිටින සිවිල් වැසියන් සඳහා ආහාර ලබා නොදීමේ චෝදනාවයි. කමිටුව හමුවට පත් වූ සාක්ෂි වලට අනුව රජය විසින් අවශ්‍ය ආහාර ද්‍රව්‍ය ප්‍රමාණයන් බෙදා හැර ඇති බව පැහැදිලි වන නමුත් ආහාර සම්බන්ධයෙන් යම් හිඟයක් ඇති වී තිබේ නම්, ඒ සඳහා හේතු වන්නේ එල්.ටී.ටී.ඊ. සංවිධානය විසින් ආහාර බලෙන් අයිති කර ගනිමින් ඒවා සිවිල් වැසියන් අතර බෙදා හැරීම වැළැක්වීමට කටයුතු කිරීමයි.*[189]

---

[187] මෙම ජනාධිපති විමර්ශන කොමිෂන් සභාවේ මෙම අවසන් වාර්තාවේ II වෙළුමේ 4 වන පරිච්ඡේදයේ දිවාරත්න මහතාගේ සාක්ෂිය බලන්න.

[188] එක්සත් ජනපද රාජ්‍ය දෙපාර්තමේන්තු වාර්තාවේ, 2009

[189] ඩී.එස්. විජේසිංහ කමිටු වාර්තාව, 2010, පි. 83

යම් ආකාරයක ආහාර හිඟතාවයන් පැවතිය හැකි ව තිබුණ ද මරණ ඇති කිරීමට හේතු වන ආකාරයේ බරපතල හිඟයක් නොපැවති බව මුලතිව් දිස්ත්‍රික් ලේකම්වරයා වශයෙන් ඈන් මේරි ඉමෙල්ඩා සුකුමාර් මහත්මිය විසින් පැහැදිලි කොට ඇති අතර, එම අදහස සම්පූර්ණයෙන්ම සනාථ කිරීමට අවශ්‍ය සියලු වාර්තා ඇය සතු විය. සුකුමාර් මහත්මිය විසින් කාරක සභාව හමුවට ඉදිරිපත් කරන ලද ලිපි ලේඛන තුළින් පැහැදිලි වන්නේ මාස තුනක කාලයක් සඳහා ප්‍රමාණවත්, ලෝක ආහාර වැඩසටහන යටතේ ලබා දුන් අමතර ආහාර තොග පැවති බව ය. මාසයක කාලයක් සඳහා ප්‍රමාණවත් වන අමතර ආහාර තොග සෑම විටම පැවතී ඇති බව එතුමිය විසින් සහතික කොට ඇත. ආහාර තොග ප්‍රමාණය අදාළ ප්‍රදේශය තුළ ජීවත්වන පුද්ගලයින් සංඛ්‍යාව මත පදනම් වේ. ප්‍රදේශය තුල සිටින පුද්ගලයන් ප්‍රමාණය ඔවුන් විසින් තක්සේරු කරන ලද්දේ ප්‍රාදේශීය ලේකම් කාර්යාල ඔස්සේ ය. දිස්ත්‍රික්කය වෙත අලුතින් පිවිසෙන පුද්ගලයන් පිළිබඳව ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් දෛනික තොරතුරු එවනු ලැබේ. මෙම තොරතුරු ලිඛිතව ප්‍රාදේශීය ලේකම් කාර්යාල වෙතින් නියෝජ්‍ය දිසාපති වෙත යවනු ලබන අතර නියෝජ්‍ය දිසාපතිවරුන් විසින් එම වාර්තා දිසාපතිවරයා වන ඇය වෙත යොමු කර එවනු ලැබේ. ඇය විසින් මෙම තොරතුරු වාර්තා ගොනු ගත කොට තිබෙන අතර ඒවා ඇයගේ කාර්යාලය තුළ තිබේ. සෑම විටකදීම මාසයකට ප්‍රමාණවත් වන ආහාර තොග පවත්වා ගන්නා ලෙසට අත්‍යවශ්‍ය සේවා කොමසාරිස් ජනරාල්, දිවාරත්න මහතාගෙන් ඇයට ලිඛිත උපදෙස් ලැබී තිබුණි.[190]

259. එක්සත් ජනපද රාජ්‍ය දෙපාර්තමේන්තු වාර්තාවේ 9 වන පරිච්ඡේදය තුළ මානුෂීය තත්ත්වයන් යන මාතෘකාව යටතේ පහතින් දක්වා ඇති වගුව ඉදිරිපත් කර ඇත:

යුධ මුක්ත කලාපවල ඇස්තමේන්තුගත ජනගහනය, ආහාර අවශ්‍යතාවය, බෙදා හරින ලද ආහාර ප්‍රමාණය සහ ආහාර හිඟය

මාසය	*ශ්‍රී ලංකා රජයේ ජනගහන ඇස්තමේන්තුව*	*ආහාර අවශ්‍යතාවය*	*බෙදාහරින ලද ආහාර ප්‍රමාණය*	*සමුච්චිත ආහාර හිඟය*	*ජාත්‍යන්තර ජනගහන තක්සේරුව*	*ආහාර අවශ්‍යතාවය*	*බෙදා හරින ලද ආහාර ප්‍රමාණය*	*සමුච්චිත ආහාර හිඟය*
පෙබරවාරි	*70,000*	*980*	*150*	*-830*	*250,000*	*3,500*	*150*	
මාර්තු	*50,000*	*775*	*1,080*	*-525*	*230,000*	*3,565*	*1,080*	
අප්‍රේල්	*50,000*	*775*	*1,119*	*-181*	*150,000*	*2,325*	*1,119*	*-3,350*
මැයි (දින 20ක්)	*20,000*	*200*	*50*	*-331*	*80,000*	*720*	*50*	*-5,835*

[190] එම, පි. 83-84

260. ඉහත රූපසටහනේ දෙවන පේළියේ ශ්‍රී ලංකා රජයේ ජනගහන ඇස්තමේන්තුව සැලකීමේ දී එක්සත් ජනපද රාජ්‍ය දෙපාර්තමේන්තු වාර්තාව මෙසේ ප්‍රකාශ කරයි:

** සිවිල් වැසියන්ට පලායාම සඳහා බලපෑම් කිරීමේ උත්සාහයක් වශයෙන් බෙදා හරිනු ලබන ආහාර ප්‍රමාණය අඩු කිරීම සඳහා යුධ මුක්ත කලාපය තුළ සිවිල් වැසියන් සංඛ්‍යාව පිළිබඳ අඩුවෙන් දක්වන ඇස්තමේන්තු ශ්‍රී ලංකා රජය විසින් භාවිතා කර ඇති බවට චෝදනා එල්ල වේ.*

261. රූපසටහනේ තුන් වන පේළියේ 'ආහාර අවශ්‍යතා' යන අයිතමය සම්බන්ධයෙන් එක්සත් ජනපද රාජ්‍ය දෙපාර්තමේන්තු වාර්තාව විසින් මෙසේ ප්‍රකාශ කරයි.

*** අභ්‍යන්තර වශයෙන් අවතැන්වූ පුද්ගලයන් 2,000ක් සඳහා දිනකට ආහාර මෙට්‍රික් ටොන් 1 ක් අවශ්‍ය වන බවට විවිධ සංවිධාන විසින් සිදු කරන ලද ඇස්තමේන්තු මත පදනම්ව ආහාර අවශ්‍යතා සහ ආහාර හිඟය පිළිබඳ ඇස්තමේන්තු සකස් කර ඇත.*[191]

262. ඩී.එස්. විජේසිංහ කමිටුව හමුවේ සාක්ෂි ලබා දෙන අතරතුර මුලතිවු දිසාපති ඈන් මේරි ඉමෙල්ඩා සුකුමාර් මහත්මිය ඉහත වගුවේ දක්වා ඇති සංඛ්‍යා ලේඛන වල නිරවද්‍යභාවය ප්‍රතික්ෂේප කළේය.

263. බෙදා හරින ලද ආහාර පිළිබඳ වාර්තා ඇය විසින් ඉදිරිපත් කරන ලද අතර සෑම විටක ම සංචිත වශයෙන් අතිරික්ත ආහාර පැවති බවට ප්‍රකාශ කරන ලදී. එසේම "යුද්ධයෙන් පසුව සහල් ලොරි කොපමණ ප්‍රමාණයක සහල් සොයා ගනු ලැබුවාද යන්න ඔබට පරීක්ෂා කර බැලිය හැකියි. ඒවා මිලියන ගණනකට විකුණනු ලැබුවා. මට ඒ පිළිබඳ වාර්තා ද ලබා දීමට හැකියි." යනුවෙන් ද ඇය විසින් පවසන ලදී.[192]

264. ආහාර බෙදා හැරීම සිදු කරන ලද්දේ විවිධසේවා සමූපකාර සමිති හරහා ය. ගොඩබිම් මාර්ග ඔස්සේ එවන ලද අවසන් ආහාර තොගය එවන ලද්දේ 2009 ජනවාරි 15 වන දින යි. ඉන් අනතුරුව ආහාර බෙදා හැරීම සිදු කරන ලද්දේ මුහුදු මාර්ග ඔස්සේ ය. රජය විසින් ආහාර ත්‍රිකුණාමලය වරාය වෙත බෙදා හරින ලද අතර ඉන්පසුව ඒවා මුල්ලිවයික්කාල් වෙත යවන ලදී. මුහුදු මාර්ග ඔස්සේ එවන ලද ආහාර අතිරේක දිසාපතිවරයාට ලැබුණු අතර, විවිධ සේවා සමුපකාර සමිති වෙත එම තොග මුදා හරින ලදී.

265. එල්.ටී.ටී.ඊ. සංවිධානය විසින් විවිධ සේවා සමූපකාර සමිති වලින් ආහාර තොග නීති විරෝධීව ලබාගැනීම සඳහා භාවිතා කරන ලද කුට උපක්‍රම පිළිබඳව මුලතිවු දිසාපති සුකුමාර් මහත්මිය විස්තරාත්මකව තොරතුරු දක්වන ලදී. වෙනත් වචන වලින් පැවසුවහොත් මෙලෙස බෙදා හරින ලද ආහාර තොග වලින් එල්.ටී.ටී.ඊ. සංවිධානය පවා ප්‍රතිලාභ සලසා ගත් බව ද ඇයගේ සාක්ෂිය මගින් දක්වා සිටී.

266. අත්‍යවශ්‍ය සේවා පිළිබඳ කොමසාරිස් ජනරාල් එස්.බී. දිවාරත්න මහතා පහත සඳහන් පරිදි ප්‍රකාශ කළේය:

"*ලෝක ආහාර වැඩසටහනේ ශ්‍රී ලංකා නියෝජිතවරයා විසින් ගැටුම් පැවති කලාපය වෙත යවන ලද ආහාර සැපයුම් පිළිබඳව නිරීක්ෂණය කොට ඇති අතර, යවන ලද ආහාර වල ප්‍රමාණ පිළිබඳ නිශ්චිත සංඛ්‍යා වලට අදාළ වාර්තා සහ සිවිල් වැසියන්ට ආහාර සැපයීම වෙනුවෙන් ශ්‍රී ලංකා රජය විසින් දරන ලද ප්‍රයත්නයන් පිළිබඳ තොරතුරු ඔහු සතුව පැවතිය හැක.*"

---

191 'මානුෂීය තත්වයන්' යන මැයෙන් වන එක්සත් ජනපද රාජ්‍ය දෙපාර්තමේන්තු වාර්තාවේ පිටු අංක 50 බලන්න.

192 ඩී.එස්.විජේසිංහ කමිටු වාර්තාවේ පිටු අංක 85 හි ඇති ඉමෙල්ඩා සුකුමාර් මහත්මියගේ සාක්ෂිය බලන්න.

267. සරණාගතයින් සඳහා වන එක්සත් ජාතීන්ගේ මහ කොමසාරිස්වරයාගේ නියෝජිත අමීන් අවාඩ් මහතා පහත සඳහන් පරිදි ප්‍රකාශ කොට ඇත.:

"යුධ පසුබිම තුළ සිවිල් වැසියන් මිනිස් පලිහක් වශයෙන් භාවිතා කරමින් එල්.ටී.ටී.ඊ. සංවිධානය විසින් ඇති කරන ලද මානුෂීය අර්බුදය ශ්‍රී ලංකා රජය විසින් ජනතාව වෙත අවශ්‍ය ආහාර සහ වෛද්‍ය සැපයුම් අඛණ්ඩව සපයනු ලබන බවට සහතික කිරීම මගින් නිසි පරිදි හසුරුවා ගන්නා ලද ආකාරය සැලකිල්ලට ගැනීමේ දී ශ්‍රී ලංකාව ලොව අන් රට වලට ආදර්ශයක් බවට පත් වී ඇත. වන්නි ප්‍රදේශයේ සිවිල් ජනතාව ආරක්ෂාව සහ සුරක්ෂිතතාවය පිළිබඳ සමාන අයිතිවාසිකම් සහිත ශ්‍රී ලංකාවේම පුරවැසියන් වන වග දැඩි ලෙස අවධානයට ගනිමින්, සෑම විටම ශ්‍රී ලංකා රජය විසින් කටයුතු කොට ඇත."

"යුධ මුක්ත කලාප වල සිටින ඇස්තමේන්තුගත ජනගහනය, ආහාර අවශ්‍යතා, බෙදා හරින ලද ආහාර සහ ආහාර හිඟය" යන ශීර්ෂය යටතේ වාර්තාවේ පිටු අංක 50 තුළ ඉදිරිපත් කොට ඇති සංඛ්‍යා ලේඛන සම්පූර්ණයෙන්ම සාවද්‍ය වන අතර, එයට හේතුව වන්නේ ඒ සඳහා යොදාගෙන ඇති සංඛ්‍යා කිසිවක් නිසි සංගනනයක් ඔස්සේ ලබා ගන්නා ලද ඒවා නොවීමයි."

268. ඩී.එස්. විජේසිංහ කමිටු වාර්තාවෙන් පිටපත් කරන ලද ඉහත ඡේද තුළින්, යුධ මුක්ත කලාපයට අයත් ප්‍රදේශ වල සිටින ජනතාව වෙත ආහාර සහ වෛද්‍ය සැපයුම් නිසි පරිදි ලැබෙන බවට සහතික කිරීමේ ශ්‍රී ලංකා රජය සතු වූ වගකීම නිසි අයුරින් ඉටු කොට තිබේද යන පැනය පිළිබඳව පැහැදිලි පිළිතුරක් සපයනු ලබන අතර, ඉහත ආකාරයේ සාක්ෂි ඔස්සේ, ශ්‍රී ලංකා රජයට විරුද්ධව එල්ලවන සිවිල් වැසියන් හාමතේ තැබීම පිළිබඳ චෝදනා ප්‍රතික්ෂේප කිරීම සඳහා කටයුතු කරනු ඇති බවට පිළිගනු ලැබේ.

269. මෙම ජනාධිපති විමර්ශන කොමිසම ඉහත පෙන්වා දී ඇති පරිදි, මානුෂීය ආධාර සැපයීම කෙරෙහි අවධාරණය කොට ඇති විවිධ තොරතුරු දැක්වීම් පවතී.[193]

270. මේ සම්බන්ධයෙන් පරණගම කොමිසම මගින් ඉදිරිපත් කොට ඇති නිරීක්ෂණ සඳහන් කිරීම වැදගත් වේ. ශ්‍රී ලංකා යුධ හමුදාව විසින් යුද්ධයට කොටු වී සිටින පුරවැසියන් වෙත ආහාර සැපයුම් ළඟා වීම වළක්වා ඇති බවට හමුදාවට එරෙහිව නැගෙන චෝදනා සම්බන්ධයෙන් විවිධ සාධක සහ කොමිසම හමුවට ඉදිරිපත් වූ සාක්ෂි සැලකිල්ලට ගනිමින් පහත දක්වා ඇති පරිදි ජාත්‍යන්තර මානුෂීය නීති උල්ලංඝනය වීමක් පිළිබඳ කිසිදු සාක්ෂියක් නොපවතින බව පරණගම කොමිසම මගින් නිගමනය කර ඇත.

එම නිසා, ජාත්‍යන්තර මානුෂීය නීතිය මගින් ප්‍රදේශ අවහිර කොට යුද්ධය ක්‍රියාත්මක කිරීමට ඉඩ සැලසිය හැකි සංදර්භයන් පිළිබඳ විස්තර දක්වන නමුත්, යුද්ධයේ අවසන් මාස කිහිපය තුළ ශ්‍රී ලංකා යුද්ධ හමුදාව කිසිදු ආකාරයකින් ප්‍රදේශ අවහිර කොට යුද්ධය ක්‍රියාත්මක කිරීමක් සිදු කොට ඇති බවට කිසිදු සාක්ෂියක් නොපවතී. එසේම, කොමිසම දරන මතයට අනුව, සිවිල් ජනතාව නිරාහාරව තැබීම සඳහා හිතාමතා සිදු කරන ලද ක්‍රියාදාමයක් පිළිබඳව කිසිදු සාක්ෂියක් නොපවතී. එයට ප්‍රතිපක්ෂ ලෙස, ආහාර ද්‍රව්‍ය ඇතුළු මානුෂීය ආධාර, එල්.ටී.ටී.ඊ. හමුදාවන්ගේ පාලනයට ලක් වූ ඔවුන් විසින්ම ප්‍රාණ ඇපකරුවන් වශයෙන් රඳවා ගෙන සිටි සිවිල් ජනතාව සඳහා සහාය සැලසීම අරමුණු කරගනිමින්, දෙතුන් වතාවක් ම බලපෑමට ලක් ව තිබූ එවන්

---

[193] මානුෂීය ආධාර සැපයීම පිළිබඳ මතු සඳහන් ඇතැම් වෙනස් අනුවාද බලන්න: එක්සත් ජනපද රාජ්‍ය දෙපාර්තමේන්තු වාර්තාව, 2019; ශ්‍රී ලංකාව පිළිබඳ එස්සත් ජාතීන්ගේ මානව හිමිකම් පිළිබඳ මහ කොමසාරිස්වරයාගේ වාර්තාව, ඡේද 935-1022, "*Palmyrah Fallen from Rajani to War's End*", රාජන් හූල්, පි. 233-240, *මානව හිමිකම් පිළිබඳ මහකොමසාරිස් කාර්යාලයේ ශ්‍රී ලංකාව පිළිබඳ විමර්ශන වාර්තාව පිළිබඳ සිද්ධිවාචක ඇගයීමක්: සන්නද්ධ හමුදාවලට එරෙහි චෝදනා පිළිබඳ නිරාකරණයක්"*, දර්ශන් වීරසේකර.

ජනතාව සිටින ප්‍රදේශවලට පමණක්ම ලබා දීමට අවසර සැලසී තිබුණු බවට කිසිදු වාදයක් නොමැත. අනෙක් අතට එල්.ටී.ටී.ඊ. සංවිධානය විසින් ස්වකීය යුධ මෙහෙයුම් වලට සහ ස්වකීය හමුදාවන්ට සහාය සලසා ගැනීම වෙනුවෙන් එක්සත් ජාතීන්ගේ සංවිධානය සහ අනිකුත් මානුෂීය ආධාර සැපයූ සංවිධාන විසින් යවනු ලබන සැපයුම් හාවිතා කරමින් සිටි බවට සාක්ෂි පවතී. සන්නද්ධ ගැටුම් අතරතුර ආහාර ද්‍රව්‍ය සහ අනෙකුත් ආධාර සැපයීම සඳහා ඉඩකඩ සැලසීම ඔස්සේ ප්‍රතිපාක්ෂිකයන්ට සහාය දැක්වීමක් කිසිදු සන්නද්ධ හමුදාවකින් අපේක්ෂා කළ නොහැක.[194]

271. එනමුත්, චෝදනාව සත්‍යයක් ද එසේ නොවන්නේද යන්න පිළිබඳව සැකයක් පහළ වී ඇත්නම්, මෙම ජනාධිපති විමර්ශන කොමිෂන් සභාව සිය අතුරු වාර්තාව තුළ යෝජනා කොට ඇති විමර්ශන යාන්ත්‍රණය ඔස්සේ අදාළ කාලය තුළ සරණාගතයින් සඳහා වන එක්සත් ජාතීන්ගේ මහකොමසාරිස්වරයාගේ නියෝජිත වශයෙන් කටයුතු කළ, සුකුමාර් මහත්මිය, එස්.බී. දිවාරත්න මහතා, පාර්තිපන් මහතා (අතිරේක දිසාපති), සහ අමීන් අවාඩ් මහතා වැනි සාක්ෂිකරුවන් සම්මුඛ සාකච්ඡාවට ලක්කිරීම අත්‍යවශ්‍ය වේ.

272. මේ පිළිබඳව පැහැදිලිව ප්‍රකාශ වූ මතයක් නොපවතින පසුබිමක් තුළ, රාජ්‍යය විසින් එක්සත් ජාතීන්ගේ සංවිධානය සහ ජාත්‍යන්තර රතුකුරුස සංවිධානයේ සහභාගිත්වය සහිතව, යුධ ගැටුම් අතරතුර හාවිතා කරන ලද සැපයුම් උපාය මාර්ගවල ධනාත්මක සහ ඍණාත්මක පැතිකඩ පිළිබඳව සහ මෙම අවසන් වාර්තාවේ 248 වන ඡේදයේ සහ උගත් පාඩම් සහ ප්‍රතිසන්ධාන කොමිෂන් සභාවේ සභා වාර්තාවේ 4.158 සහ අංක 4.161 ඡේද වල විශේෂයෙන් දක්වා ඇති පරිදි ආහාර සැපයුම් සුරක්ෂිතව යැවීම සම්බන්ධයෙන් මුහුණ දෙනු ලැබූ බාධක සහ අවහිරතා පිළිබඳව නිර්ණය කිරීම සඳහා රජය විසින් ස්වාධීන විමර්ශනයක් දියත් කිරීම උචිත බව මෙම ජනාධිපති විමර්ශන කොමිසම විශ්වාස කරයි.[195]

273. යුධ ගැටුම් පැවති කලාප වල සිටි සිවිල් වැසියන්ට, මානුෂීය ආධාර අහිමි කිරීමේ ප්‍රතිපත්තියක් රජය විසින් හිතාමතාම අනුගමනය කොට තිබෙන්නේද නැද්ද යන්න පිළිබඳව ඉතා පැහැදිලිව මතයක් ප්‍රකාශ කළ හැක්කේ එවන් වාතාවරණයක් යටතේ පමණකි.

- **වෛද්‍ය සැපයුම්**

274. අදාළ සියලු සාධක සැලකිල්ලට ගනිමින් සහ සාමාන්‍ය වාතාවරණයන් යටතේ අදාළ වන විෂයබද්ධ සම්මතයන් ඇසුරින් උගත් පාඩම් හා ප්‍රතිසන්ධාන කොමිෂන් සභාව නිගමනය කරනුයේ බෙහෙත් වර්ග වල හිඟයක් සහ වෛද්‍ය පහසුකම් ප්‍රමාණවත් නොවන තත්ත්වයක් පැවතී ඇති බවට පෙනී යන බව ය. කෙසේ වුවද, මෙම සාධකය සලකා බැලීමට ලක් කළ යුත්තේ යුධ ගැටුම් වල තීව්‍රතාවය සමග එම අවස්ථාවේ පැවති අසාමාන්‍ය වාතාවරණයන්ගේ සංදර්භයට සහ යුධ ගැටුම් පැවති පසුතලයේ සිට රෝහල් වෙත පැවති දුර යනාදී කාරණා මත පදනම්වය.[196]

275. උගත් පාඩම් හා ප්‍රතිසන්ධාන කොමිසම හමුවට ඉදිරිපත් වුණු සාක්ෂි ලේඛන වල අවිනිශ්චිත ස්වභාවය සැලකිල්ලට ගැනීමේදී මෙන් ම ඒ හා බැඳී ඇති මානුෂීය කාරණාවන් සලකා බැලීමේදී ද යුද්ධයේ අවසාන දින වලදී යුධ ගැටුම් පැවති ප්‍රදේශ වල සිටි සිවිල් වැසියන් හට වෛද්‍ය සැපයුම් නිකුත් කිරීම පිළිබඳ කාරණය තවදුරටත් පරීක්ෂාවට සහ හැදෑරීමට ලක් කළ යුතු

---

[194] පරණගම කොමිසම් වාර්තාව, 501 ඡේදය

[195] උගත් පාඩම් හා ප්‍රතිසන්ධාන කොමිසම, 4.296, 3.32, 4.158,- 4.161 ඡේද

[196] උගත් පාඩම් හා ප්‍රතිසන්ධාන කොමිසම, 9.21 ඡේදය

කාරණාවක් බවට උගත් පාඩම් හා ප්‍රතිසන්ධාන කොමිසම විසින් හඳුනාගනු ලැබේ. එවන් පරීක්ෂාවක දී පහත දක්වා ඇති ආකාරයේ සියලු අදාළ සාධක පිළිබඳව සැලකිල්ලක් දැක්වීම අවශ්‍ය වේ.

* තුවාල ලත් සිවිල් වැසියන් සංඛ්‍යාව
* තුවාල වල ස්වභාවය
* තුවාල ලත් සහ ප්‍රතිකාර කරන ලද එල්.ටී.ටී.ඊ. සෙබලුන් සංඛ්‍යාව
* තුවාල ලැබූවන් හට තාවකාලිකව සකසා ගත් රෝහල් තුළ ප්‍රතිකාර කිරීමේ හැකියාව, මේ හා සාපේක්ෂව සැබෑ සැපයුම් ප්‍රමාණය තක්සේරු කළ හැකිය.[197]

276. සිය අවසන් වාර්තාවේ දී, උගත් පාඩම් සහ ප්‍රතිසන්ධාන කොමිෂන් සභාව විසින් මෙසේ නිගමනය කොට ඇත: "කොමිෂන් සභාව හමුවට ඉදිරිපත් කෙරුණු කරුණු පරීක්ෂාවට ලක් කිරීමෙන් අනතුරුව, ශ්‍රී ලංකා රජය විශේෂයෙන් ම ඉහතින් සඳහන් කොට ඇති නියෝජිත ආයතන ඇතුළු ජාත්‍යන්තර ප්‍රජාවගේ සහයෝගිතාවය මෙන් ම සිවිල් සමාජ කණ්ඩායම් වල සහයෝගය ද සහිතව ජාත්‍යන්තර සහයෝගිතා සහ සුහදතා හැඟීමකින් යුතුව, ඉතා ප්‍රබල ප්‍රවර්ධන අසිරුතාවයන් මධ්‍යයේ, කොටු වී සිටි සිවිල් වැසියන් වෙත ආහාර, වෛද්‍ය සැපයුම් සහ අනෙකුත් අත්‍යවශ්‍ය භාණ්ඩ ළඟා කරවීම උදෙසා ගත හැකි සියලු පියවර ගෙන ඇත".[198]

<u>යටත්වීම් / අත්අඩංගුවට ගැනීම් වලින් පසුව සිදු වූ බවට චෝදනා එල්ල වන අතුරුදන් වීම්</u>

277. යුධ හමුදාවට භාර වීමෙන් අනතුරුව අතුරුදහන් වීමට ලක් වූ පවුලේ සාමාජිකයෙකු පිළිබඳව පුද්ගලයන් 45 දෙනෙකු විසින් සාක්ෂි ලබා දුන් බව, ඔවුන් කිහිප දෙනෙකුගේ සාක්ෂි ද උපුටා දක්වමින් උගත් පාඩම් හා ප්‍රතිසන්ධාන කොමිෂන් සභාව සිය අවසන් වාර්තාව තුළ කරුණු ඉදිරිපත් කොට ඇති බව පෙන්වා දෙනු ලැබේ.

278. අත්අඩංගුවට පත්වීමෙන් / භාරවීමෙන් පසුව සිදු වූ බවට චෝදනා එල්ල වන අතුරුදන්වීම් සම්බන්ධයෙන් උගත් පාඩම් සහ ප්‍රතිසන්ධාන කොමිෂන් සභාව වෙත ඉදිරිපත් වූ අදහස් දැක්වීම් කිහිපයක් උගත් පාඩම් සහ ප්‍රතිසන්ධාන කොමිසම විසින් අවසන් වාර්තාවේ 4.242 සහ 4.258 ඡේද වල ඉදිරිපත් කොට ඇත.

279. 9.2.3 ඡේදය තුළ උගත් පාඩම් සහ ප්‍රතිසන්ධාන කොමිෂන් සභාව මෙම අතුරුදන් වීම් පිළිබඳව තම නිර්දේශ ඉදිරිපත් කිරීමට කටයුතු කොට ඇත.

280. උගත් පාඩම් සහ ප්‍රතිසන්ධාන කොමිෂන් සභාවේ අවසන් වාර්තාවේ 4.24.2 – 4.258 යන ඉහත කී ඡේදවල ඇති කොමිෂන් සභාව හමුවට ඉදිරිපත් වූ සාක්ෂි ලැයිස්තුගත කිරීම යෝග්‍ය වේ.

281. තුවාල ලබා සිටි තම ස්වාමිපුරුෂයාගේ තුවාල වලට 2009 මැයි 17 වන දින යුධ හමුදාව විසින් ප්‍රතිකාර කළ බවට මඩකලපුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේදී 2010 ඔක්තෝබර් මස 09 වන දින උගත් පාඩම් සහ ප්‍රතිසන්ධාන කොමිෂන් සභාව හමුවට පැමිණි හිටපු එල්.ටී.ටී.ඊ. සාමාජිකයකුගේ බිරිඳක් ප්‍රකාශ කොට ඇති බව 4.2.4 ඡේදය තුළ උගත් පාඩම් සහ ප්‍රතිසන්ධාන කොමිසම විසින් වාර්තා කරනු ලැබේ. ඉන් අනතුරුව, ඇයට තම දරුවන් නැවත කඳවුර වෙත රැගෙන යන ලෙස පවසා මෙම එල්.ටී.ටී.ඊ. සාමාජිකයා රැගෙන ගොස් තිබේ. ඉන් අනතුරුව, නිලධාරීන් කිහිප දෙනෙකු නැවත පැමිණ තම ස්වාමිපුරුෂයා බැලීමට පැමිණෙන ලෙස ඇයගෙන් ඉල්ලා ඇති නමුත්, ඇය එය ප්‍රතික්ෂේප කොට ඇති අතර, එවිට එම නිලධාරීන් එතනින් ඉවත් වී

[197] උගත් පාඩම් හා ප්‍රතිසන්ධාන කොමිසම, 4.311 සහ 9.22 ඡේද

[198] උගත් පාඩම් හා ප්‍රතිසන්ධාන කොමිසම, 9.19 ඡේදය

තිබේ. ඇය විසින් පවසා සිටිනුයේ ඉන් අනතුරුව ඇය හෝ ඇගේ පවුලේ කිසිවෙකුට තම ස්වාමිපුරුෂයා පිළිබඳව කිසිදු තොරතුරක් නොලැබූ බව ය.[199]

282. 4.243 ඡේදය තුළ වාර්තා කොට ඇති තවත් සිද්ධියකදී, වත්තුවාල් ප්‍රදේශයේදී 2009 මැයි මස 17 වන දින යුධ හමුදාව විසින් තම ස්වාමිපුරුෂයා අත්අඩංගුවට ගත් බව හිටපු එල්.ටී.ටී.ඊ. සෙබලෙකුගේ බිරිඳක් විසින් ප්‍රකාශ කොට ඇත. කෙසේ වුවද, ඔහු විමර්ශනයක් සඳහා රැගෙන යන බවට හඟවා ඇති නමුත්, එම පුද්ගලයා නැවත කිසිදා නොපැමිණ ඇති අතර එතැන් සිට ඔහු සිටින තැනක් පිළිබඳව කිසිදු තොරතුරක් ද ඇය වෙත ලැබී නැත.[200]

283. 4.2.4.4 ඡේදයේදී, 2009 මැයි මස 17 වන දින වත්තුවාල් ප්‍රදේශයේ යුධ හමුදා පාලනය යටතේ තිබූ ප්‍රදේශයකට තමන් සහ තම පවුලේ අය ඇතුලු වූ බවත්, 2009 මැයි මස 19 වන දින යුධ හමුදාව විසින් ප්‍රශ්න කිරීම සඳහා තම ස්වාමිපුරුෂයා රැගෙන ගිය බවත් දක්වමින් සාක්ෂි ලබා දෙන හිටපු එල්.ටී.ටී.ඊ. සෙබලෙකුගේ බිරිඳක් පිළිබඳව උගත් පාඩම් සහ ප්‍රතිසන්ධාන කොමිෂන් සභාව වාර්තා කර ඇත. ඔහුගෙන් කරුණු විමර්ශනය කොට දින තුනක් ඇතුලත නිදහස් කරන බව ආරක්ෂක හමුදාවන් විසින් සහතික කරන ලද නමුදු එතැන් පසු ඔහු සමග පැවති සියලු සබඳතා නතර වී ඇත.

284. එයට සාපේක්ෂව ඒ හා සමාන තොරතුරු සහිත සමාන සිද්ධියක් 4.2.4.5 ඡේදය තුළ ද වාර්තා කොට ඇත. මෙහිදී සාක්ෂිකරුගේ ස්වාමිපුරුෂයා ඉහත කී වත්තුවාල් ආරක්ෂක මුර පොළේ දී ම 2009 මැයි මස 17 වන දින භාර වී ඇති අතර ඔහු පිළිබඳ විමර්ශන කිරීම් සිදු කොට නිදහස් කරන බව ආරක්ෂක හමුදාවන් විසින් පවසා සිට ඇති නමුත් එතැන් සිට ඔහු සමග කිසිදු සම්බන්ධතාවයක් නොමැති වූ බව ඇය පවසා ඇත. මෙලෙස හමුදාවට භාර වී ඇත්තේ ආබාධිත තත්ත්වයට පත්ව සිටි හිටපු එල්.ටී.ටී.ඊ. සෙබලෙකි.

285. ආරක්ෂක හමුදාවන් වෙත භාර වීමෙන් අනතුරුව තම කලත්‍රයන් අතුරුදන් වීම පිළිබඳව මෙවන් තවත් සිද්ධි කිහිපයක් 4.2.4.6 සිට 4.2.6.0 දක්වා ඡේද වල වාර්තා කොට ඇත. උදාහරණයක් වශයෙන්, 4.2.5.8 ඡේදය තුළ උගත් පාඩම් සහ ප්‍රතිසන්ධාන කොමිසම විසින් වාර්තා කරනුයේ මඩු දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ පැවති සාකච්ඡා අතරතුර හිටපු එල්.ටී.ටී.ඊ. සෙබලෙකුගේ මවක් විසින් සිය පුත්‍රයා 2009 මැයි මස මඩු[201] දේවස්ථානයේ දී යුධ හමුදාවට භාර වූ බවත්, මඩු පල්ලියේ පරිපාලක ඩෙස්මන් කුලර්ස් පියතුමා මෙම සිද්ධිය දුටු බවත්, ප්‍රකාශ කොට ඇති බව ය. තම පුත්‍රයා යම් විමර්ශන කටයුත්තක් සඳහා රැගෙන යන බවට යුධ හමුදාවෙන් ප්‍රකාශ කොට තිබුණ ද, ඔහු පිළිබඳව ඇයට කිසිදු තොරතුරක් ලැබී නොමැති අතර, කිසිදු රඳවා ගැනීමේ මධ්‍යස්ථානයක දී ඔහු හමුවී නොමැත.

286. පුදුමාතලන් ප්‍රදේශය අල්ලා ගැනීමෙන් පසුව 2009 අප්‍රේල් මස යුධ හමුදාවට භාර වූ හිටපු ජ්‍යෙෂ්ඨ එල්.ටී.ටී.ඊ. සෙබලෙකු විසින් උගත් පාඩම් සහ ප්‍රතිසන්ධාන කොමිසම හමුවට ප්‍රකාශ කරන ලද්දේ ඔහු සමග රජයේ පාලනය යටතේ පැවති ප්‍රදේශ වෙත ගිය හිටපු එල්.ටී.ටී.ඊ. සෙබලුන්ගෙන් කිසිවෙකු අතුරුදන් නොවූ බව ය. ඔවුන් මධ්‍යම මට්ටමේ එල්.ටී.ටී.ඊ. සෙබලුන්ව සිට ඇති අතර, ඔවුන් මුදා හැරීම හෝ අත්අඩංගුවේ තබා ගැනීම පමණක් සිදු වී ඇත. එසේම ඔහු

---

[199] උගත් පාඩම් හා ප්‍රතිසන්ධාන කොමිසම, 4.242 ඡේදය

[200] උගත් පාඩම් හා ප්‍රතිසන්ධාන කොමිසම, 4.243 ඡේදය

[201] මඩු ප්‍රදේශයේදී උගත් පාඩම්හා ප්‍රතිසන්ධාන කොමිසම හමුවේ සිවිල් වැසියෙකු විසින් ඉදිරිපත් කරන ලද අදහස් - පිටපත්කර අංකය LLRC/IS/08 11/01

විසින් ප්‍රකාශ කරන ලද්දේ 2009 මැයි මාසයේ යුද්ධයේ අවසාන අදියර තුලදී එල්.ටී.ටී.ඊ.යේ ඉහළ තනතුරු දැරූ සාමාජිකයින් කිහිප දෙනෙකුම හමුදාවට භාර වූ බව ය.[202]

287. ඉහත සිද්ධි විස්තර කිරීමෙන් අනතුරුව, යුධ හමුදාවට භාර වූ සහ අතුරුදහන් වීමට ලක් වූ බවට චෝදනා එල්ල වන තවත් පුද්ගල ලැයිස්තුවක් වාර්තා කොට ඇති 4.15 ඇමුණුම වෙත උගත් පාඩම් සහ ප්‍රතිසන්ධාන කොමිෂන් සභාවේ අවධානය යොමු කර තිබේ.

භාරවීමෙන් / අත් අඩංගුවට ගැනීමෙන් අනතුරුව සිදුවූ බවට චෝදනා එල්ල වන අතුරුදන්වීම් පිළිබඳව මෙම ජනාධිපති විමර්ශන කොමිෂන් සභාවෙහි නිරීක්ෂණ

අ. උගත් පාඩම් සහ ප්‍රතිසන්ධාන කොමිෂන් සභා වාර්තාවේ 4.15 ඇමුණුම තුල දක්වා ඇති අතුරුදන් වූ පුද්ගලයන්ගේ නම් පිළිබඳව ජනාධිපති විමර්ශන කොමිසම විසින් අතුරුදන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයේ අවධානය යොමු කරවන ලද අතර, ඉහත කී 4.15 ඇමුණුම සම්බන්ධයෙන් අතුරුදන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයේ අවධානයේ යොමු කරවන බව එහිදී ජනාධිපති විමර්ශන කොමිසම වෙත දැනුම් දී ඇත. තමන් වෙත ලැබී ඇති ඇතැම් අයදුම්පත්‍ර වලින් යුද්ධයේ අවසන් අදියර තුළ සිදු වී යැයි පවසනු ලබන එම අතුරුදන්වීම් පිළිබඳව සඳහන් ව තිබෙන බව අතුරුදන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයේ අධ්‍යක්ෂ ජනරාල්වරයා සහ සභාපතිවරයා විසින් ජනාධිපති විමර්ශන කොමිසම වෙත සහතික කොට ඇත. මෙම කාරණය සම්බන්ධයෙන් අතුරුදන්වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයේ ඉතා ඉහළ අවධානයක් යොමු විය යුතු බව අවධාරණය කොට ඇත. මේවා විමර්ශනය කිරීම් සිදු කිරීමට නියමිතව අතුරුදන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය තුළ පවතින සිදුවීම් / නඩු වන අතර උගත් පාඩම් සහ ප්‍රතිසන්ධාන කොමිෂන් සභාව සහ පරණගම කොමිෂන් සභාව විසින් විශ්වසනීය විමර්ශන සිදු කළ යුතු බවට බල කර සිටිනුයේද මෙම සිදුවීම් සම්බන්ධයෙනි.

288. උගත් පාඩම් සහ ප්‍රතිසන්ධාන කොමිෂන් සභාව හමුවට ඉදිරිපත් වූ සාක්ෂි විස්තර සම්පූර්ණ කර ගැනීම සඳහා උගත් පාඩම් සහ ප්‍රතිසන්ධාන කොමිෂන් සභා වාර්තාවේ 4.216 සහ 4.218 ඡේද වෙත අවධානය යොමු කිරීමට **ජනාධිපති විමර්ශන කොමිසම විසින් කටයුතු කරනු ලැබේ.**

289. එල්.ටී.ටී.ඊ. හමුදාවේ සාමාජිකයන් යටත් වීමට පැමිණි අවස්ථාවේ දී ආරක්ෂක හමුදා විසින් ක්‍රියාත්මක කරන ලද ක්‍රියා පටිපාටි සම්බන්ධයෙන් තොරතුරු සඳහන් වේ. එලෙස යටත් වන්නන්ට කිසිදු හානි කිරීමකින් හෝ වෙනස් කොට සැලකීමකින් තොරව ඔවුන් පිළිගෙන හමුදා පොලිසිය භාරයට පත් කිරීම සඳහා ඔවුන් යොමු කළ යුතු වෙයි. එල්.ටී.ටී.ඊ. කාන්තා සෙබලියන් භාර වීමේදී එම කටයුතු සඳහා පහසුකම් සැලසීමට කාන්තා හමුදා නිලධාරිනියන්ද ආරක්ෂක අංශ විසින් මෙම කටයුත්තෙහි යොදවා තිබුණි. උගත් පාඩම් සහ ප්‍රතිසන්ධාන කොමිෂන් සභාව විසින් අනුගමනය කරන ලද ක්‍රියා පටිපාටිය සම්බන්ධයෙන් අදහස් දක්වමින් ජ්‍යෙෂ්ඨ ආරක්ෂක නිලධාරීන් විසින් ද ප්‍රකාශ කොට ඇත්තේ මෙහිදී අනුගමනය කළ යුතු තත්ත්වයන්ට සාධනීයව අනුකූල වීමක් සිදුවූ බව ය. 2009 මැයි මස 17 සහ 18 දිනවල රාජ්‍ය නොවන සංවිධාන මේවාට සම්බන්ධ නොවූ බව ජ්‍යෙෂ්ඨ ක්ෂේත්‍ර අණ දෙන නිලධාරියෙකු විසින් ප්‍රකාශ කොට තිබුණි. එසේම, යුද්ධයේ මුල් අදියර වලදී යුධ පෙරමුණ තුළ විස්තරාත්මක තොරතුරු ලේඛනයක් පවත්වා ගෙන යනු ලැබූ බවට ද ඔවුන් විසින් පැහැදිලි කරන ලද අතර, එහෙත් යුද්ධයේ අවසාන අදියර වලදී යටත් වන්නන් සහ අභ්‍යන්තර වශයෙන් අවතැන්වූ පුද්ගලයන් ඉතා විශාල වශයෙන් පැමිණීම හේතු කොට ගෙන ආරක්ෂක හමුදාවන් හට එවන් ක්‍රියාමාර්ගයක් අනුගමනය කිරීම කෙරෙහි බාධා ඇති වී තිබේ. එම නිසා භාරවූවන් හට සහ අභ්‍යන්තර අවතැන් වූ පුද්ගලයන්හට වෛද්‍යමය අවශ්‍යතා සපුරාලීම,

[202] උගත් පාඩම් හා ප්‍රතිසන්ධාන කොමිසම, පිටුව4.259

ආහාර සහ අත්‍යවශ්‍ය ද්‍රව්‍ය සැපයීම යනාදිය සිදු කොට වැඩිදුර ප්‍රමාදයකින් තොරව ඕමන්තේ ප්‍රදේශය වෙත ඔවුන් රැගෙන ගොස් ඇත. හමුදාවට භාර වූවන් ලියාපදිංචි කරගනු ලැබුයේ ඉන් අනතුරුවයි.[203]

290. හමුදාව වෙත පැමිණෙන පුද්ගලයන් මූලිකවම පිලිගනු ලබන ස්ථානයේදී ඔවුන්ගේ සංඛ්‍යාව ගණන් කිරීමක් සිදු කරන ලද බවත්, එයට කාන්තාවන් / පිරිමින් / ළමුන් සහ පවුල් වල සංඛ්‍යා ඇතුළත් කරනු ලැබූ බවත් උගත් පාඩම් සහ ප්‍රතිසන්ධාන කොමිෂන් සභාව විසින් විශේෂයෙන් සඳහන් කරනු ලැබේ. එසේම, ස්වකීය අදහස් දැක්වීම් වලදී සිවිල් වැසියන් සහ රැඳවුම් භාරයේ පසුවන්නන් විසින් මෙම කාරණය පිළිගනු ලැබූ බව උගත් පාඩම් සහ ප්‍රතිසන්ධාන කොමිෂන් සභාව විසින් තහවුරු කරනු ලැබේ. තවදුරටත් හමුදාවට භාරවූ තැනැත්තන්ගේ සහ රඳවා තබා ගන්නන්ගේ ඡායාරූප ලබා ගත් බවත් ඒවා තවදුරටත් ඔවුන්ගේ දත්ත ගබඩාවන් තුළ පවතින බවත් ජ්‍යෙෂ්ඨ ආරක්ෂක නිලධාරියෙකු විසින් උගත් පාඩම් සහ ප්‍රතිසන්ධාන කොමිෂන් සභාව වෙත දැනුම් දී ඇත.[204]

291. "මුදාගත් ප්‍රදේශ වලට සිවිල් වැසියන් සහ සටන්කරුවන් සංචරණය වීම අතරතුර ශ්‍රී ලංකා ආරක්ෂක හමුදාවල ක්‍රියා කලාපය" යන මාතෘකා පාඨය යටතේ මේ සියල්ල විස්තර කොට ඇත.[205]

292. හමුදාවට භාර වන පුද්ගලයන් සම්බන්ධයෙන් ක්‍රියාත්මක කරනු ලබන ක්‍රියා පටිපාටි මධ්‍යයේ, අතුරුදහන් වීම් පිළිබඳ සාක්ෂි පවතින බවට පැහැදිලිව පෙනී යයි. මේ සම්බන්ධයෙන් උගත් පාඩම් සහ ප්‍රතිසන්ධාන කොමිෂන් සභාව විසින් අදහස් දක්වමින්, මෙම අතුරුදහන් වීම් පිළිබඳ විමර්ශන සිදු කිරීමට ශ්‍රී ලංකා රජය සතුව පවත්නා වගකීම පිළිබඳව අවධාරණය කරනු ලැබේ.

විමර්ශනය කිරීම සඳහා ශ්‍රී ලංකා රජය පාර්ශ්වයෙන් පවත්නා වගකීම[206]

293. හමුදාවට භාර වීමෙන් / අත් අඩංගුවට ගැනීමෙන් පසුව සිදුවූ බවට චෝදනා එල්ල වන අතුරුදහන් වීම් සම්බන්ධයෙන් විස්තර සාකච්ඡා කිරීමෙන් අනතුරුව උගත් පාඩම් සහ ප්‍රතිසන්ධාන කොමිෂන් සභාව විසින් 9.23 ඡේදය තුළ ස්වකීය නිර්දේශ ඉදිරිපත් කරනු ලබන අතර, එහිදී පහත අන්දමින් මෙම සිද්ධි විමර්ශනය කිරීම සඳහා ශ්‍රී ලංකා රජය සතුව පවත්නා අනිවාර්ය වගකීම් පිළිබඳව අවධාරණය කරනු ලැබේ:

> *අදහස් දැක්වීම් සම්බන්ධයෙන් සැලකිමේදී, (4 වන පරිච්ඡේදය - 2 වන කොටස 4.2.42 සිට 4.2.58 දක්වා වන ඡේද තුළ දක්වා ඇති පරිදි) එවන් සුවිශේෂී යෝජනාවක් පිළිබඳ විමර්ශනය කිරීමට රජය සතුව වගකීමක් පවතින බවත්, යුධ හමුදාවේ සාමාජිකයන්ගේ පාර්ශවයෙන් කිසියම් අනීතික ක්‍රියාවක් පිළිබඳ සාක්ෂි පවතින අවස්ථාවකදී, වැරදිකරුවන්ට එරෙහිව අභිචෝදනා කිරීමට සහ දඬුවම් පැමිණවීමට රජය බැඳී සිටින බවත් මෙම කොමිෂන් සභාව විසින් අවධාරණය කළ යුතු වේ. නිළ වශයෙන් භාර වීමෙන් අනතුරුව අතුරුදහන් වීම පිළිබඳව කිසියම් සිද්ධියක් තහවුරු කිරීමට හැකියාවක් පවතිනුයේ නම්, දණ්ඩන ප්‍රතිඵල වලට අදාළ වන අපරාධයක් ඒ තුළින් නිර්මාණය වේ. පුද්ගලයන් හමුදාවට භාරවීමේ ක්‍රියාවලිය තුළ සහ මුදාගත් ප්‍රදේශ වල*

---

[203] උගත් පාඩම් හා ප්‍රතිසන්ධාන කොමිෂන් වාර්තාව, ඡේදය 4.216 – 4.218

[204] උගත් පාඩම් හා ප්‍රතිසන්ධාන කොමිෂන් වාර්තාව, ඡේදය 4.220

[205] උගත් පාඩම් හා ප්‍රතිසන්ධාන කොමිෂන් වාර්තාව, පිටුව 102

[206] ඇතැම් පුද්ගලයන් ශ්‍රී ලංකා හමුදාව භාරයට පත් වන ආකාරය තමන් විසින් සෘජුවම දුටු බවට සඳහන් කරමින් පුද්ගලයන් ගණනාවක් විසින් ඉදිරිපත් කරන ලද අදහස් දැක්වීම්

සිවිල් වැසියන් විශාල වශයෙන් පැමිණෙන අවස්ථාවලදී අවදානමක් දරමින් ස්වකීය හැසිරීම පැහැදිලිව පවත්වා ගෙන යනු ලැබූ යුධ හමුදාවේ කීර්තිනාමය ගොඩ නැගීම සඳහා මෙම සිද්ධි සම්බන්ධයෙන් පූර්ව විමර්ශනයක් දියත් කිරීම හා අවශ්‍ය අවස්ථාවලදී අභියෝදනා ගොනු කිරීම් සිදු කිරීම අත්‍යවශ්‍ය කාරණයක් වේ. මෙම කීර්තිනාමය කිහිප දෙනෙකුගේ ක්‍රියාකාරකම් හේතුවෙන් හානියට පත් විය යුතු නොවේ.[207]

294. යුධ ගැටුම් අතරතුර සහ ඉන් පසුව කාලය සම්බන්ධයෙන් සැළකීමේදී මෙම විමර්ශන සතුව ඉතා වැදගත් භූමිකාවක් පවතින බව ජනාධිපති විමර්ශන කොමිෂන් සභාව නිරීක්ෂණය කරයි. යුද්ධය පිළිබඳව කරුණු වල අපැහැදිලිභවය හේතු කොට ගෙන භූමිය තුළ සිදුවූ යථාර්ථයන් පිළිබඳ අඳුරු සහගත තත්වයක් නිර්මාණය කරනු ලැබේ. යුද්ධයේ දී තමන්ට සිදු වූයේ කුමක්ද, එලෙස සිදුවූයේ මන්ද, ඒ සඳහා වගකිව යුතු වන්නේ කවුද සහ හානිපූරණය පිළිබඳ හිමිකමක් සහ යම් ආකාරයක නීතිමය පිළියම් සලසා ගැනීමේ හැකියාවක් තමන් සතුව පවතින්නේද යනාදි කාරණා පිළිබඳ සොයා බැලීමට යුධ වින්දිතයින් හට නොහැකි වන තත්ත්වයක් මේ ඔස්සේ නිර්මාණය විය හැකිය. ඒ ආකාරයට සැලකූ විට මෙම වින්දිතයන් ඉතා විශාල වශයෙන් රජයේ විමර්ශන මත යැපෙති.

295. සන්නද්ධ අරගලයක් අතරතුර සහ ඉන් පසුව ඇති වන සිදුවීම් රජය විසින් විමර්ශනය කළ යුත්තේ කුමන පරිමාණයකටද සහ රජය විසින් එසේ සිදු කළ යුතු වන්නේ කෙසේද යන කාරණා ජාත්‍යන්තර මානුෂීය නීතිය සහ ජාත්‍යන්තර මානව හිමිකම් නීතිය මගින් නියාමනය කරනු ලැබේ. කෙසේ වුවද, මෙම නීති තන්ත්‍රයන් දෙක මගින් ම විවිධ විස්තර මට්ටම් ඔස්සේ රජය විසින් විමර්ශනය කළ යුත්තේ කුමක්ද සහ එය එසේ සිදු කළ යුතු වන්නේ කුමන අවස්ථාවකදීද සහ කෙසේද යන්න පිළිබඳව නියාමනය කරන අතර තවද එය එකිනෙකට වෙන් වූ ආකාරයන්ගෙන් සිදු කරන බවට (අවම වශයෙන් බැලූ බැල්මට හෝ) පෙනෙන්නට සලස්වයි.[208]

<u>අතුරුදන්වීම් සම්බන්ධයෙන් පරණගම කොමිෂන් සභාවේ නිරීක්ෂණ</u>

296. හමුදාවට භාර වූ තැනැත්තන් අතුරුදන් වීම සම්බන්ධයෙන් උගත් පාඩම් සහ ප්‍රතිසන්ධාන කොමිෂන් සභාව විසින් අනාවරණය කර ගත් කරුණු සහ එහි නිර්දේශ සැළකීමේදී ජනාධිපති විමර්ශන කොමිසම විසින් ඒ වන විටත් පරණගම කොමිෂන් සභාව විසින් ඒ සම්බන්ධයෙන් සිදු කරන ලද නිරීක්ෂණ වෙත අවධානය යොමු කර තිබුණි. භාර වීමෙන් අනතුරුව, පුද්ගලයන් අතුරුදන් වීම පිළිබඳව පරණගම කොමිෂන් සභාවේ නිරීක්ෂණ මෙහිදී අවධානයට ගැනීම සම්පූර්ණයෙන්ම අදාළ නොවේ යැයි කිව නොහැක. යුධ ගැටුම් වල අවසාන දින කිහිපයේ දී හමුදාවට භාර වූ පුද්ගලයන් බස් පිටින් අතුරුදන්වීම පිළිබඳව ස්වකීය වාර්තාවේ 436 සහ 437 පරිච්ඡේද වලදී පරණගම කොමිෂන් සභාව විසින් සඳහන් කරනු ලබන අතර ප්‍රැන්සිස් පියතුමා නමින් හැඳින්වූ කතෝලික පූජකවරයෙකු ද ඇතුළත් වූ එවන් පුද්ගලයන් පිරුණු බසයක් පිළිබඳව ද සඳහන් කරනු ලැබේ.

298. චෝදනා ඉදිරිපත් කරන ලද සාක්ෂිකරුවන් 100 දෙනෙකුගේ පමණ සාක්ෂි සම්බන්ධයෙන් ස්වාධීන නීතිමය විමර්ශනයක් පැවැත්වීමේ අවශ්‍යතාවය පිළිබඳව පරණගම කොමිෂන් සභාව

---

[207] පරණගම කොමිෂන් සභාව විසින්ද හමුදාවට භාර වූ තැනැත්තන් අතුරුදහන් වීම පිළිබඳව සඳහන් කර ඇත. පරණගම කොමිෂන් සභා වාර්තාව, 436 සහ 437 ඡේද බලන්න

[208] ටැන්, එෆ්. (2022 මැයි 19), *සන්නද්ධ අරගල වටපිටාවන් තුළ විමර්ශන සිදු කිරීමේ වගකීම*: ජාත්‍යන්තර මානුෂීය නීතිය, ජාත්‍යන්තර මානව හිමිකම් නීතිය සහ ඒවායේ අන්තර්ක්‍රියාකාරිත්වය ඔස්සේ සිදු කරන පරීක්ෂාවක්

විසින් ද පැහැදිලිව ම අදහස් දක්වනු ලැබේ. පරණගම කොමිෂන් සභාවේ නිර්දේශය මෙම කාරණය සම්බන්ධයෙන් ඉතාම අදාළ වේ.

"*මෙම සිදුවීම් සම්බන්ධයෙන් විනිසුරුවරයෙකුගේ මූලිකත්වයෙන් සිදු කරන විමර්ශන අවශ්‍ය වන බැවින් සැබැවින්ම කොමිෂන් සභාව විසින් මේ සම්බන්ධයෙන් විමර්ශන කණ්ඩායමක් පත් කිරීමට දැනටමත් පියවර ගෙන ඇති අතර මෙම සිද්ධි සම්බන්ධයෙන් ස්වකීය විමර්ශන වැඩකටයුතු එම කමිටුව විසින් ආරම්භ කොට ඇත. මෙම ගැටලුව සම්බන්ධයෙන් වූ සාක්ෂි වලට සවන් දීමෙන් අනතුරුව මෙම පුද්ගලයන් මරණයට පත් කිරීමක් සිදු වී තිබෙන්නට ඉඩ ඇති බවට විශ්වාස කිරීම සඳහා වන සාධාරණ පදනමක් තිබෙන බවට අප විසින් අනාවරණය කර ගෙන ඇත.* [209]

299. බස් රථය තුළ පුද්ගලයන් සිය දෙනෙකු[210] පමණ වූ බවට ඇස්තමේන්තු කරමින් චැනල් 4 නාලිකාව විසින් එල්ල කරන ලද චෝදනා තුළින් කොමිෂන් සභාවේ ඉහත ස්ථාවරය පැන නගියි. කෙසේ වුවද, 2014 ජූලි 5 වන දින පරණගම කොමිෂන් සභාවේ හමුවක් ඉදිරියට පැමිණෙමින් 2009 මැයි 18 වන දින තම සැමියා වන එල්.ටී.ටී.ඊ. ආරක්ෂක සේවයෙහි කටයුතු කළ සෙල්වරාජා පතීරාදන් යුධ හමුදාවට භාර වූ බවට භගීරාදන් පෙරිම්බනායගී නමැති සාක්ෂිකාරිය විසින් ලබා දුන් සාක්ෂිය සමග මෙය අසමානතා දක්වන බව පෙනී යයි. හමුදාවට භාර වන අවස්ථාවේ ඇය ද තම සැමියා සමග සිට ඇත. හමුදාවට භාර වීමෙන් අනතුරුව බස් රථයකට පැටවූ ආසන්න වශයෙන් පුද්ගලයන් 50ක පමණ පිරිසගෙන් එක් අයෙකු වී ඇත්තේ මෙම තැනැත්තියගේ ස්වාමිපුරුෂයාය. ඔහුව නැවත කිසි දිනෙක දැක ගැනීමට හැකි වී නැත. [211]

<u>අතුරුදන්වීම් පිළිබඳව ජනාධිපති විමර්ශන කොමිෂමෙහි නිර්දේශ</u>

300. ඉහත දක්වා ඇති කරුණු අනුව, උගත් පාඩම් සහ ප්‍රතිසන්ධාන කොමිෂන් සභාව සහ පරණගම කොමිෂන් සභාව යන කොමිෂන් සභා දෙක මගින්ම 2009 මැයි 18 වන දින හමුදාවට භාර වූ පුද්ගලයන්ගේ අතුරුදන්වීම් සම්බන්ධයෙන් ස්වාධීන විමර්ශනයක් සහ පරීක්ෂණයක් සිදු කරන ලෙසට නිර්දේශ කොට ඇති බව ඉතාම පැහැදිලිය.

301. විමර්ශන කටයුතු සඳහා මුළු යාපනය පුරාම යමින් තම විමර්ෂකයින් විසින් එකතු කරගන්නා ලද විමර්ශනයට අදාළ විස්තරාත්මක සටහන් පිළිබඳව නීතිය බලාත්මක කිරීමේ බලධාරීන් විසින් නිසි සැලකිල්ලක් සහ අවධානයක් දක්වා නොමැති බවට ස්වකීය සාක්ෂි ලබා දෙමින් හිටපු මහාධිකරණ විනිසුරු මැක්ස්වෙල් පරණගම මහතා මෙම ජනාධිපති විමර්ශන කොමිසම හමුවේ සිය කනස්සල්ල පළ කළේය. මෙහිදී අදාළ අපරාධකරුවන්ට එරෙහිව නීතිමය ක්‍රියා පටිපාටි ක්‍රියාත්මක කිරීම සඳහා බැලූ බැල්මට ප්‍රමාණවත් නඩු කටයුත්තක් මෙම විමර්ශන සටහන් ඔස්සේ සපයනු ලබන්නේ නම් අපරාධකරුවන් කවරෙකුට හෝ විරුද්ධව අපරාධ නඩු පැවරීමක් සිදු කළ හැකි වන්නේද යන්න සහතික කර ගැනීම සඳහා නීතිපති දෙපාර්තමේන්තුව විසින් මෙම විමර්ශන සටහන් සම්බන්ධ වගකීම තමන් අතට ගත යුතු බව ජනාධිපති විමර්ශන කොමිෂමෙහි නිර්දේශයද වේ. වැඩිදුර විමර්ශන සිදුකිරීමට අවශ්‍ය වන්නේ නම් එම විමර්ශන කඩිනමින් දියත් කළ හැකිය.[212]

302. ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුව වෙතින් විමසීම් සිදු කිරීමෙන් අනතුරුව, පරණගම කොමිෂන් සභාව විසින් එක්රැස් කර ගත් මෙම විමර්ශන සටහන් ජාතික ලේඛනාරක්ෂක

---

[209] පරණගම කොමිෂන් සභාව 437 ඡේදය

[210] පරණගම කොමිෂන් සභාව 436 ඡේදය

[211] පරණගම කොමිෂන් සභාව 441 ඡේදය

[212] මෙම ජනාධිපති විමර්ශන කොමිෂන් සභාවේ අවසන් වාර්තාවේ 6 වන පරිච්ඡේදය බලන්න (නිර්දේශ සහ ඉදිරි ගමන් මග)

දෙපාර්තමේන්තුව සතුව පවතින බව මෙම කොමිෂන් සභාව විසින් අනාවරණය කර ගෙන ඇත. මෙම ලේඛන පිළිබඳ වගකීම තමන් අතට ගෙන පරණගම කොමිෂන් සභාව විසින් සකස් කරන ලද මෙම විමර්ශන ලිපි ලේඛන පිළිබඳ පරීක්ෂා කිරීම් ආරම්භ කරන ලෙස නීතිපති දෙපාර්තමේන්තුවෙන් ඉල්ලීමක් සිදු කරන ලෙසට අතිගරු ජනාධිපතිවරයා වෙත නිර්දේශ කිරීමට මෙම ජනාධිපති විමර්ශන කොමිසම කඩිනමින් කටයුතු කරනු ඇත.

303. 2008 අංක 16 දරණ විමර්ශන කොමිෂන් සභා (සංශෝධන) පනතේ පහත ආකාරයට දක්වා ඇති 24 වෙනි වගන්තිය කෙරෙහි අවධානය යොමු කිරීමට මෙම ජනාධිපති විමර්ශන කොමිසම බලාපොරොත්තු වේ.

"1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහ පනතට හෝ වෙනත් යම් නීතියකට පටහැනිව කුමක් සඳහන් වුවද, මෙම පනත යටතේ පත් කරන ලද පරීක්ෂණ කොමිෂන් සභාවක් විසින් අවස්ථාවෝචිත පරිදි පවත්වන ලද විමර්ශනයකදී හෝ පරීක්ෂණයකදී රැස් කරන ලද කරුණු සලකා බැලීමේදී කරුණු මත පදනම්ව කවර හෝ අපරාධයක් සම්බන්ධයෙන් නීතිමය අධිකරණයකදී නීතිපති වරයා විසින් අපරාධ නඩු කටයුත්තක් පැවරීම නීත්‍යානුකූල වේ."

304. මෙම විධිවිධානය හේතු කොට ගෙන පරණගම කොමිෂන් සභාව හෝ මෙම ජනාධිපති විමර්ශන කොමිසම වැනි විමර්ශන කොමිෂන් සභාවක් මගින් එක් රැස් කර ගනු ලබන කරුණු මත පදනම්ව කටයුතු කිරීමටත් එම කරුණු වල ඔප්පු කළ හැකි ඒෂණීය වටිනාකම පරීක්ෂා කිරීමෙන් අනතුරුව අපරාධ නඩු කටයුත්තක් පැවරිය හැකිද යන්න සහතික කරගැනීම සඳහා එකී ලිපි ලේඛන පරීක්ෂා කර බැලීමටත් නීතිපතිවරයා වෙත හැකියාව ඇති කරනු ලැබේ. මෙම සිද්ධි වලට අදාළව සංක්‍රාන්ති යුක්ති ක්‍රියාවලිය ක්‍රියාත්මක කිරීමට හැකි වන පරිදි ඉහත සඳහන් විමර්ශන සටහන් නීතිපති දෙපාර්තමේන්තුව භාරයට ගන්නා ලෙස මෙම ජනාධිපති විමර්ශන කොමිසම විසින් නිර්දේශ කරනු ලැබේ.

305. භාර වූවන් අතුරුදන් වීම සම්බන්ධයෙන් පෙර කොමිෂන් සභා විසින් ලබා දුන් නිර්දේශයන් ක්‍රියාත්මක නොවී පවතින බව ඒ අනුව ඉතා පැහැදිලිව පෙනී යන අතර, මෙම සිදුවීම් පිළිබඳව තවදුරටත් විමර්ශනය කොට ප්‍රමාණවත් සාක්ෂි පැන නගිනුයේ නම් අපරාධකරුවන් නීතියේ රැහැනට හසු කළ යුතු වේ.

306. ජනාධිපති විමර්ශන කොමිසම විසින් දැනටමත් පෙන්වා දී ඇති පරිදි, මෙලෙස අතුරුදන්වූ පුද්ගලයන් පිළිබඳව සොයා බලා කරුණු අනාවරණය කර ගැනීම, 2016 අංක 14 දරණ අතුරුදන්වූ තැනැත්තන් පිළිබඳ කාර්යාල පනතේ 10 වන වගන්තිය යටතේ බලය පැවරී ඇති අතුරුදන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයේ වගකීම වේ.

307. 2008 අංක 16 දරණ විමර්ශන කොමිෂන් සභා සංශෝධන පනතේ 24 වන වගන්තිය අනුසාරයෙන් විමර්ශන ව්‍යුහයන් වෙත සාමාන්‍යයෙන් පවරනු ලබන ආකාරයට, මෙම සිද්ධි පිළිබඳව සාක්ෂි විභාග කිරීම සඳහා අවශ්‍ය නීතිමය බලතල යෝජිත සත්‍ය සෙවීමේ යාන්ත්‍රණය වෙත ලබා දිය යුතු වේ. මෙම සත්‍ය සෙවීමේ යාන්ත්‍රණය තුළදී, මෙම ජනාධිපති විමර්ශන කොමිෂන් සභාව ඇතුළුව පෙර පැවති කොමිෂන් සභා ඉදිරියේ දැනටමත් ඉදිරිපත් වී ඇති සාක්ෂි මත පදනම්ව තීන්දු වලට එළඹීමට හැකියාව පැවතිය යුතු බැවින් උගත් පාඩම් සහ ප්‍රතිසන්ධාන කොමිෂන් සභාව, පරණගම කොමිෂන් සභාව, උදලාගම කොමිෂන් සභාව සහ මෙම ජනාධිපති විමර්ශන කොමිසම වෙත දැනටමත් ඉදිරිපත් කොට ඇති සාක්ෂි භාවිතාවට ගනිමින් කටයුතු කිරීමට හැකි වන සේ යෝජිත සත්‍ය සහ ප්‍රතිසන්ධාන කොමිෂන් සභාව බලාත්මක කිරීම උදෙසා මෙම සත්‍ය සහ ප්‍රතිසන්ධාන කොමිෂන් සභා ප්‍රඥප්තියට අනුශාංගික විධිවිධානයක් ඇතුලත් කිරීම ඉතාම අත්‍යවශ්‍ය වේ.

308. දේශීය වගවීම්සහගතභාවය වැඩි දියුණු කිරීම සහ ශක්තිමත් කිරීම සඳහා මෙම ජනාධිපති විමර්ශන කොමිසම විසින් 6 වෙනි පරිච්ඡේදයට අදාළ ආයතනික සංශෝධන ද යෝජනා කරනු ලැබේ.

<u>එල්.ටී.ටී.ඊ. සංවිධානයේ ක්‍රියාකලාපය සහ ජාත්‍යන්තර මානුෂීය නීති උල්ලංඝනය වීම්</u>

309. 4 වන පරිච්ඡේදය තුළ විස්තර සහිතව විස්තර කොට ඇති ආකාරයට යුධ මුක්ත කලාප තුළ එල්.ටී.ටී.ඊ. සංවිධානය විසින් නිර්දය අයුරින් සිදු කරන ලද බරපතල ජාත්‍යන්තර මානුෂීය නීති උල්ලංඝනය කිරීම් උගත් පාඩම් සහ ප්‍රතිසන්ධාන කොමිසම මගින් තවදුරටත් හඳුනා ගනු ලබන අතර, අවසාන නිරීක්ෂණ වශයෙන් පහත දක්වා ඇති කාරණා වැඩිදුරටත් අවධාරණය කරනු ලැබේ.
    * ස්වකීය හමුදාමය උපායමාර්ග ඉදිරියට ගෙන යාම සඳහා මිනිස් පළිහක් වශයෙන් සිවිල් වැසියන් භාවිතා කිරීම[213]
    * සිවිල් ජනතාව සිටින ස්ථානවල හමුදාමය උපකරණ තැබීමේ පිළිවෙත අනුගමනය කිරීම
    * ආරක්ෂිත ප්‍රදේශ වෙත පලා යාමට උත්සාහ කරන සිවිල් වැසියන්ට වෙඩි තැබීම
    * යුධ කටයුතු වල නිරත වීම සඳහා ළමයින් බලයෙන් හමුදාවට බඳවා ගැනීම
    * බිම් බෝම්බ දැමීම සහ හදිසියේ නිපදවා ගත් පුපුරන උපාංග භාවිතා කිරීම
    * හමුදාමය අභිමතාර්ථ ඉටු කර ගැනීම සඳහා සහාය සේවා සපයා ගැනීමට සිවිල් වැසියන් බලහත්කාරයෙන් භාවිතා කිරීම
    * සිවිල් වැසියන්ගේ ජීවිත වලට හානි සිදු කරමින් මරාගෙන මැරෙන ප්‍රහාර දිගින් දිගටම සිදු කිරීම[214]

310. ජාත්‍යන්තර මානුෂීය නීතිය උල්ලංඝනය කිරීම් සම්බන්ධයෙන් එල්.ටී.ටී.ඊ. සංවිධානයට චෝදනා ඉදිරිපත් කිරීම පිළිබඳව උගත් පාඩම් සහ ප්‍රතිසන්ධාන කොමිෂන් සභාව විසින් පහත පරිදි ප්‍රකාශ කරනු ලැබේ.

    විමර්ශන වලදී බැලූ බැල්මට චෝදනා ගොනු කිරීමක් සඳහා වන කරුණු අනාවරණය වන එල්.ටී.ටී.ඊ. සාමාජිකයන්ට එරෙහිව චෝදනා ගොනු කිරීමේදී, සිදු කරන ලද අපරාධයේ බරපතලභාවයට ගැලපෙන පරිදි යෝග්‍ය දඩුවම් ලබා දීම සඳහා හැකියාව නිර්මාණය වන ලෙස මූලික මානව හිමිකම් සහ ජාත්‍යන්තර මානුෂීය නීති මූලධර්ම උල්ලංඝනය වී ඇති ආකාරය පිළිබඳව නිසි සැලකිල්ලක් යොමු කළ යුතු වේ. [215]

<u>චැනල් 4 නාලිකාවේ වීඩියෝ පටය සම්බන්ධයෙන් උගත් පාඩම් සහ ප්‍රතිසන්ධාන කොමිෂන් සභාවේ නිරීක්ෂණ සහ නිර්දේශ</u>

311. උගත් පාඩම් සහ ප්‍රතිසන්ධාන කොමිෂන් සභා වාර්තාව එහි 4.361 සහ 4.377 යන ඡේද වලදී චැනල් 4 නාලිකාවේ විඩියෝ පටය තුළින් පැන නගින කාරණා ආමන්ත්‍රණය කොට තිබෙන අතර, එම සිදුවීම් ව්‍යාජ ඒවා වුවද නොඑසේ නම් අව්‍යාජ ඒවා වුවද, යන්න සැලකීමකින් තොරව බැලීමේදී වීඩියෝ පටයේ ඇති එම ඡායාරූප ආදිය ‘‘සැබවින්ම ඉතා බිහිසුණු සහ දරුණු" ඒවා බව එහිදී ප්‍රකාශ කොට ඇත.

- එම වීඩියෝ පටය තුළ කෘතිමව ගොඩනගන ලද සිදුවීම් භාවිතා කරනු ලබන බව ශ්‍රී ලංකා රජය විසින් අවධාරණය කරනු ලැබුවද, ආණ්ඩුවේ ග්‍රහණයට පත් වූ බවට

[213] උගත් පාඩම් හා ප්‍රතිසන්ධාන කොමිසම් වාර්තාව, ඡේදය 4.325

[214] උගත් පාඩම් හා ප්‍රතිසන්ධාන කොමිසම් වාර්තාව, ඡේද 4.321 සහ 9.25

[215] උගත් පාඩම් හා ප්‍රතිසන්ධාන කොමිසම් වාර්තාව, ඡේදය 9.26

සැලකෙන පුද්ගලයන් සම්බන්ධයෙන් නඩු විභාග වලින් තොරව මරා දැමීම සහ ලිංගික අඩන්තේට්ටම් කිරීම් සිදු විය හැකි තත්ත්වයක් පැවති බවට බැලූ බැල්මට සැලකිය හැකි කරුණු එම වීඩියෝපටය තුළින් සපයනු ලබන බව එක්සත් ජාතීන්ගේ විශේෂ වාර්තාකරුවන් විසින් පත් කරන ලද තාක්ෂණික ප්‍රවීණයන් විසින් අවධාරණය කරනු ලැබේ. කෙසේ වුවද රජය මෙන් ම එක්සත් ජාතීන්ගේ වාර්තාකරුගේ ප්‍රවීණයින් යන දෙපාර්ශ්වය විසින්ම, වීඩියෝ පටය ආශ්‍රිත තවදුරටත් අපැහැදිලි සහ නිරාකරණය නොවී පවතින ඇතැම් තාක්ෂණික අර්ථ ව්‍යාකූලත්වයන් කිහිපයක් පෙන්වා දෙනු ලැබේ.

- විශේෂයෙන්ම ඉලෙක්ට්‍රොනික ආකාරයෙන් දත්ත සහ අන්තර්ගතයන් වෙනස් කිරීම හෝ විකෘති කිරීම පිළිබඳවත්, රුධිරය සහිත දර්ශන කෘතිමව ගොඩ නැගීමට ඇති හැකියාව පිළිබඳවත් කරුණු මතු කරමින් වීඩියෝ පටයේ සත්‍යවත්භාවය පිළිබඳව බරපතල සැක මතු කරන ස්වාධීන ප්‍රවීණයන් වන ආචාර්ය චතුර ද සිල්වා සහ මහාචාර්ය ඊ.ඒ. ෆැන්ටිස් යන අය විසින් තවදුරටත් තාක්ෂණික ගැටළු සහ වෝහාරික පැන මතු කරනු ලැබේ.

- විකාශනය කරනු ලබන වීඩියෝ පටයේ පිටපතක් නොපැවතීම එවන් තාක්ෂණික අපැහැදිලිතාවයන් පිළිබඳ නිගමනයකට එළඹිය හැකි පැහැදිලි කිරීම් සොයාගැනීම කෙරෙහි බලපා ඇත.

- එහි ප්‍රතිඵලයක් වශයෙන්, මෙම වීඩියෝපටයේ සත්‍යවත්භාවය පිළිබඳවත්, එහි අන්තර්ගතයන්හි විශ්වසනීයභාවය පිළිබඳවත් බරපතල සැකයන් මතු කරනු ලබන බරපතල ආකාරයේ ගැටලුකාරී තාක්ෂණික සහ වෝහාරික ප්‍රශ්න ගණනාවක් පවතින බව උගත් පාඩම් සහ ප්‍රතිසන්ධාන කොමිෂන් සභාව විසින් අනාවරණය කරගනු ලැබේ. එසේම, තවද, චින්දිතයන්ගේ සිරුරු තුළ දැක ගත හැකි කම්පන තත්ත්වයන් අදාළ සිදුවීම් වලට භාවිතා කරන ලද ආයුධ වර්ගය සමගත්, අදාළ වෙඩි තැබීම් සිදුවී ඇතැයි සැලකිය හැකි කෙටි දුර සීමාව සමගත් ගැළපෙන බවක් පෙනෙන්නට නොමැත.

- කෙසේ වුවද, කිසියම් පුද්ගලයෙකු විසින් මෙම ඡායාරූප දර්ශන සහ වීඩියෝපටය පටිගත කොට හෝ නොඑසේ නම් ඒවා නිර්මාණය කොට එය අදාළ ප්‍රචාරක ආයතනය වෙත ලබා දී ඇති බව උගත් පාඩම් සහ ප්‍රතිසන්ධාන කොමිෂන් සභාව විසින් සඳහන් කරනු ලැබේ. උගත් පාඩම් සහ ප්‍රතිසන්ධාන කොමිෂන් සභාව සමග කටයුතු කරන එක් ප්‍රවීණයකු විසින් නිරීක්ෂණය කරනු ලබන්නේ "මෙම වීඩියෝ පටයේ ඇතැම් කොටස් ස්වාභාවික පරිසරයක් තුළ පටිගත කොට තිබෙන බවට පෙනී යන බවයි". එසේම, මෙලෙස චෝදනාවට ලක් වන චින්දිතයන් ඇතැමෙකුගේ ශරීර භෞතිකව හෝ ඩිජිටල් ස්වරූපයකින් යම් පාලනයකට නතු කරගැනීමක් පිළිබඳව නොපෙන්වන බව ද නිරීක්ෂණය වී ඇත.

312. වඩා විස්තරාත්මක තොරතුරු ලබා දෙන ලෙසට උගත් පාඩම් සහ ප්‍රතිසන්ධාන කොමිෂන් සභාව විසින් සිදු කරන ලද ඉල්ලීමට අදාළ ප්‍රචාරකයා විසින් ධනාත්මකව ප්‍රතිචාර දක්වා නොතිබීම පිළිබඳව උගත් පාඩම් සහ ප්‍රතිසන්ධාන කොමිෂන් සභාව කනස්සල්ල පල කරයි. මෙම වීඩියෝ ඡායාරූප රූපවාහිනී මධ්‍යස්ථාන වෙත සපයන ලද සංවිධානයේ සහ මෙම වීඩියෝ පටය විකාශනයට ලක් කළ නිෂ්පාදකයා / ප්‍රචාරකයා විසින් ලබා දෙන ප්‍රබල දායකත්වය මෙම සිද්ධියට අදාළ කරුණු තහවුරු කර ගැනීම සඳහා අත්‍යවශ්‍ය වේ.

313. ඉහතින් සඳහන් කොට ඇති කරුණු සලකා බැලීම් මත පදනම්ව, ශ්‍රී ලංකා රජය විසින් මෙම වීඩියෝ පටයට අදාළ චෝදනාවන් නිවැරදිද නොඑසේ නම්, සාවද්‍යද යන්න නිර්ණය කර ගැනීම උදෙසා මෙම කාරණය සම්බන්ධයෙන් ස්වාධීන විමර්ශනයක් ශ්‍රී ලංකා රජය විසින් ආරම්භ කළ යුතු බව නිර්දේශ කරනු ලැබේ. [216]

314. උගත් පාඩම් සහ ප්‍රතිසන්ධාන කොමිෂන් සභාව විසින් තවදුරටත් අවධාරණය කරනුයේ හේතු කාරණා දෙකක් මත එවන් ක්‍රියාමාර්ග ගැනීමක් ඉතාම අත්‍යවශ්‍ය සහ කඩිනමින් සිදු කළ යුතු බව ය. [217]

(අ) පළමුවෙන්ම, මෙම ඡායාරූප සපයන ලද තොරතුරු දැනුම් දෙන්නන් විසින් සහ ඇල්ස්ටන් හා හේන්ස් විසින් ලැයිස්තුගත කොට ඇති ප්‍රවීණයන් විසින්, මෙම වීඩියෝ පටය තුළින් ප්‍රකාශ කරනු ලබන පරිදි, මෙම වීඩියෝ පටය මගින් හමුදාව ග්‍රහණයේ සිටි පුද්ගලයන් විභාගයකින් තොරව මරා දැමීම සහ චින්දිතයන් දූෂණයට ලක් කිරීම් පිළිබඳව සැබෑ සිදුවීම් වලට අදාළ සාක්ෂි පිළිබිඹු කරනු ලබන්නේ නම්, මේවා පැහැදිලිවම නීති විරෝධී ක්‍රියාවන් වන බැවින් විමර්ශන සිදු කොට අපරාධකරුවන්ට එරෙහිව චෝදනා ගොනු කිරීම අවශ්‍ය විය හැක. අනෙක් අතට, සටන් වලදී අතිශයින්ම අමානුෂික විධික්‍රම භාවිතා කරනු ලැබූ පුළුල්ව හෙළා දකිනු ලබන ත්‍රස්තවාදී කණ්ඩායමකට එරෙහිව ස්වකීය සටන් වගකීම් ඉතා පවිත්‍ර සහ වෘත්තීයමය ස්වභාවයකින් ක්‍රියාත්මක කරමින් අවදානමකට මුහුණ දුන් දහස් ගණන් සොල්දාදුවන්ගේ ඇතුලුව ශ්‍රී ලංකාවේ හෞමික අඛණ්ඩතාවය ආරක්ෂා කරගැනීම වෙනුවෙන් කැපවූ සොල්දාදුවන්ගේ ගෞරවය සහ වෘත්තියමය කීර්තිනාමය ආරක්ෂා කරගැනීම හා ඔවුන්ගේ නම්බුව සහ ගෞරවය නැවත ඇති කිරීම ශ්‍රී ලංකා රජයේද අනිවාර්ය වගකීම වේ. කිසියම් සුළු පිරිසක් විසින් කවර හෝ අපරාධ සිදු කොට තිබෙනුයේ නම්, එහි ප්‍රතිඵලයක් වශයෙන් තම සේවාවට අදාළ ඉතා සියුම්ම සම්ප්‍රදායන් පවා නිසි පරිදි ආරක්ෂා කරමින් කටයුතු කරන ලද බහුතරයකගේ ගෞරවය ඒ තුළින් විනාශ වී යාමට ඉඩ දිය නොහැක.

(ආ) දෙවෙනි කාරණය වන්නේ, අනෙක් අතට ප්‍රවීණයින් රැසක් විසින් තරයේ ප්‍රකාශ කොට සිටින ආකාරයට මෙම වීඩියෝපටය කෘතිමව සකස් කිරීමක් හෝ අදාළ සිදුවීම් ව්‍යාජ අයුරින් සකස් කිරීමක් සිදු කොට තිබේ නම්, මෙම ගැටලුව වඩාත් බරපතල තත්ත්වයට පත් වන අතර, මෙම සිදුවීම් පිළිබඳ කරුණු නිසි පරිදි තහවුරු කිරීමේ අවශ්‍යතාවය ඒ හා සමානවම බරපතල අවශ්‍යතාවයක් බවට පත් වේ. වීඩියෝපටයේ සත්‍යභාවය පිළිබඳව ප්‍රකාශ වී ඇති ඇතැම් වැදගත් සැකසංකා වලට කොමිෂන් සභාවද එකග වන අතර එය ඒ ආකාරයෙන් ව්‍යාජව නිර්මාණය කරන ලද්දක් නම්, එම වීඩියෝපටය නිෂ්පාදනය කරන ලද කවර හෝ පාර්ශ්වයක් සහ එය ප්‍රචාරණය කරන ලද කවර හෝ ආයතනයක් සාවද්‍ය තොරතුරු ප්‍රචාරය කිරීමේ බරපතල තත්ත්වයක් යටතේ ඔවුන් ඒ සඳහා වගකිව යුතු තත්ත්වයට පත් විය යුතු බවට දැඩි මතයක් දරනු ලැබේ. එවන් ක්‍රියාකලාපයක් තුළින්, ශ්‍රී ලංකාවේ ජනතාව වෙනුවෙන් සහ එල්.ටී.ටී.ඊ. මාරාන්තික ග්‍රහණයෙන් අනෙකුත් අවිහිංසක ජීවිත බේරා ගැනීම උදෙසා ස්වකීය ජීවිත කැප කරමින් වෘත්තියමය ස්වභාවයකින් සටන් වැදුණු සොල්දාදුවන් හට බරපතල හානියක් සහ අසාධාරණයක් සිදුවේ. ඒ හා සමානවම, අදහස් ප්‍රකාශනයේ නිදහස පිළිබඳ සංකල්පයටද ඒ තුළින් විශාල හානියක් සහ බලපෑමක් එල්ල විය හැකිය. ශ්‍රී ලංකාව තුළ ප්‍රතිසන්ධානය, සුවපත් කිරීම

[216] උගත් පාඩම් හා ප්‍රතිසන්ධාන කොමිසම් වාර්තාව, ඡේද 4.375 සහ 9.39

[217] උගත් පාඩම් හා ප්‍රතිසන්ධාන කොමිසම් වාර්තා, ඡේදය 4.376 සහ 9.40

සහ ප්‍රතිනිර්මාණය කිරීම් සිදු කිරීමේ උචිත ක්‍රියාවලියක් ප්‍රවර්ධනය කිරීම සඳහා සහ තහවුරු කිරීම සඳහා ජාතික සහ ජාත්‍යන්තර යන මට්ටම් වලින් අඛණ්ඩව සිදු වන ප්‍රයත්නයන්ට ඉහත ආකාරයේ ක්‍රියාකාරකම් වලින් බරපතල අගතියක් සහ බාධා එල්ල වීමක් සිදු වන්නේය යන්න කොමිෂන් සභාවේද සැලකිල්ල යොමු වී ඇත.

315. එම නිසා මෙම චෝදනාවන් පිළිබඳ සත්‍යය හෝ අසත්‍යය කුමක්ද යන්න තහවුරු කර ගැනීමේ අදහසින් සහ දේශයේ නීති වලට අනුකූලව අදාළ ක්‍රියාමාර්ග ගැනීම වෙනුවෙන්, ශ්‍රී ලංකා රජය විසින් මෙම ගැටලුව පිළිබඳ ස්වාධීන විමර්ශනයක් දියත් කළ යුතු බවට කොමිෂන් සභාව විසින් නිර්දේශ කරනු ලැබේ. ඒ හා සමානවම, තොරතුරු වල සහ තොරතුරු දැනුම් දෙන්නන්ගේ රහස්‍යභාවය සහ ආරක්ෂාව සහතික කිරීම සඳහා සහ ඒ සඳහා අවශ්‍ය පහසුකම්සැලසීම සඳහා කටයුතු පිළියෙළ කල යුතු බවද කොමිෂන් සභාවේ අදහස වේ.[218]

මානව හිමිකම් ගැටළු

316. ජාත්‍යන්තර මානව හිමිකම් නීතිය සහ ජාත්‍යන්තර මානුෂීය නීතිය තුළ එකිනෙකට වෙනස් වූ ඓතිහාසික සහ මතවාදීය රීති පැවතුණද, මෙම නීති දෙක තුළම සියලු පුද්ගලයන් ආරක්ෂා කර ගැනීමේ පොදු අරමුණ පවතින අතර, ඒවා පුද්ගලයන්ගේ ජීවිත, සුභසිද්ධිය සහ මානව අභිමානයට ගරු කිරීමේ මූලධර්ම මත පදනම් වී ඇත. [219]

317. මානව හිමිකම් සුරක්ෂිත කිරීම සඳහා ශ්‍රී ලංකා රජය සතු වගකීම උගත් පාඩම් සහ ප්‍රතිසන්ධාන කොමිෂන් සභා වාර්තාව මගින්ද අවධාරණය කරනු ලබන බව මතක තබා ගත යුතු ය. වාර්තාව මගින් පහත ආකාරයට අදහස් ඉදිරිපත් කොට ඇත.

"*පහතින් දක්වා ඇති ජාත්‍යන්තර මානව හිමිකම් සාධනපත්‍ර හත සම්මත කරන ලද පාර්ශ්වයක් වශයෙන් ශ්‍රී ලංකාව, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මෙන්ම විධායක සහ පරිපාලනමය ක්‍රියාමාර්ග යනාදිය ඔස්සේ, ව්‍යවස්ථාදායක ක්‍රියාමාර්ග තුළින් මෙම සම්මුති යටතේ දක්වා ඇති අනිවාර්ය වගකීම් ක්‍රියාත්මක කොට ඇත.* [220]

(අ) සියලු ආකාරයේ වාර්ගික වෙනස් කොට සැලකීම් පිටුදැකීම පිළිබඳ ජාත්‍යන්තර සම්මුතිය

(ආ) සිවිල් සහ දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර සම්මුතිය

(ඇ) ආර්ථික, සමාජීය සහ සංස්කෘතික අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර ප්‍රඥප්තිය

(ඈ) කාන්තාවන්ට එරෙහි සියලු ආකාරයේ වෙනස්කොට සැලකීම් පිටුදැකීම පිළිබඳ සම්මුතිය

(ඉ) වධදීමට සහ අනෙකුත් කෲර, අමානුෂික හෝ නින්දිත සැලකීමට හෝ දඩුවම්වලට එරෙහි සම්මුතිය

(ඊ) ළමා අයිතිවාසිකම් ප්‍රඥප්තිය

---

[218] උගත් පාඩම් හා ප්‍රතිසන්ධාන කොමිසම් වාර්තාව, ඡේදය 9.41

[219] *අභිචෝදක එදිරි ඇන්ටෝ ෆ්රන්දිජා*, යුගොස්ලවියාව වෙනුවෙන් ජාත්‍යන්තර අපරාධ විනිශ්චය සභාවේ විනිශ්චය සභාව විසින් අවධාරණය කරන ලද්දේ මානව ගරුත්වය සඳහා ගෞරව කිරීමේ පොදු මූලධර්මය, ජාත්‍යන්තර මානුෂීය නීතියේ සහ ජාත්‍යන්තර මානව හිමිකම් නීතියේ මූලික පදනම වන බව ය. නඩු අංක. IT-96-17/1-T, 1998 දෙසැම්බර් 10 දින නඩු තීන්දුව, 183 ඡේදය. මානව හිමිකම් පිළිබඳ අන්තර් ඇමරිකානු කොමිෂන් සභාව, ජුවාන් කාලෝස් ඇබෙලා එදිරි ආර්ජන්ටිනාව නඩුවේ දී ජාත්‍යන්තර මානුෂීය නීතිය අදාළ කර ගැනීම මානව හිමිකම් පිළිබඳ ඇමරිකානු කොමිසමේ සම්මතයන් සහ ජිනීවා සම්මුතීන්හි අතිව්ඡාදනය මගින් ව්‍යුත්පන්න කර ගත හැකි බව සඳහන් කළේය. "පොදු වගන්තිය ශද්ධ මානව හිමිකම් කීතියේ විධිවිධානවල […] 3 වෙන වගන්තිය මගින් මූලික වශයෙන් ම මහා පරිමාණ ක්‍රියාමාර්ග වලින් ඇමරිකානු සම්මුතිය යටතේ රජය කිරීමට දැනටමත් බැඳී සිටින දේ ඉටුකිරීමට නියම කරයි." වාර්තා අංක 55/97, නඩු අංක 11.137, පාද සටහන 19.

[220] උගත් පාඩම් හා ප්‍රතිසන්ධාන කොමිසම් වාර්තාව, ඡේදය 5.2

(උ) සියලු සංක්‍රමණික සේවකයන්ගේ සහ ඔවුන්ගේ පවුල්වල සාමාජිකයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම පිළිබඳ ජාත්‍යන්තර සම්මුතිය

ඒ අනුව, සාමය පවතින අවස්ථාවලදී සහ යුද්ධය පවතින අවස්ථා අතරතුරදී මෙම ප්‍රධාන සම්මුතීන් ජාතික මට්ටමින් සාධනීයව ක්‍රියාත්මක කිරීම සඳහා ව්‍යවස්ථානුකූල සහ ජාත්‍යන්තර වශයෙන් වන අනිවාර්ය වගකීමක් ශ්‍රී ලංකාව සතු වන අතර, යුද්ධ වාතාවරණයක් පවතින අවස්ථාවලදී, එනම් සන්නද්ධ අරගල තත්ත්වයන් පවතින අවස්ථාවලදී සිවිල් වැසියන්ගේ මානව හිමිකම් ආරක්ෂා කිරීමට අදාළ වන ජාත්‍යන්තර මානුෂීය නීතීන්ද සමග කටයුතු කිරීම මෑත කාලීන වශයෙන් ඉතා ඉහළ පිළිගැනීමකට ලක් වී ඇති කාරණයකි. [221]

සංහිඳියාව, දිගුකල් පවත්නා සාමය සහ ආරක්ෂාව ඇති කිරීමේදී ඒ සඳහා වන උත්ප්‍රේරකයක් වශයෙන් මානව හිමිකම් ප්‍රවර්ධනය කිරීමේ සහ ආරක්ෂා කිරීමේ කාර්යභාරයට අප විසින් නැවතත් කැපවීමේ දැඩි වැදගත්කම පිළිබඳව කොමිෂන් සභාව ඉදිරියට පැමිණි සිය ගණනක් පුද්ගලයන් විසින් ඉතා පැහැදිලිව ප්‍රකාශ කොට ඇත. [222]

කම්පන සහගත යුධ ගැටුම් අවසන්වීමෙන් පසුව එළඹෙන ආසන්නතම අවධිය වන මෙම වර්තමාන කාලසීමාව, මෙම කාර්යය සඳහා වඩාත්ම උචිත සහ තීරණාත්මක මොහොත බවට පැහැදිලි අදහසක් මෙම කොමිෂන් සභාවද සතු වේ. කොමිෂන් සභාව විසින් තවදුරටත් සඳහන් කරනුයේ මානව හිමිකම් පිළිබඳ සංකල්පය ශ්‍රී ලංකාවේ සමාජ, ආර්ථික ආචාර විධීන්ට පිටස්තර වූ පරිබාහිර පරමාදර්ශයක් හෝ බටහිර හෝ වෙනත් එවැනි ලෝකයේ විශේෂිත වූ කොටසකට පමණක් අයිති සංකල්පයක් හෝ නොවන බවත් ශ්‍රී ලංකාව තුළ අදහනු ලබන බුද්ධාගම සහ අනෙකුත් ආගම් සමග බැඳී ඇති ප්‍රධාන හරයන් සහ චර්යා ධර්මයන් සමග ඉතා ගැඹුරින් බද්ධ වී ඇති සංකල්පයක් බවත් ය.[223]

කාරක සභාව හමුවේ ප්‍රකාශ වූ මෙවන් අදහස් වලට කාරක සභාව සම්පූර්ණයෙන්ම එකඟතාවය පළ කර සිටින අතර, මෙම කාර්යය උදෙසා තම සියළු ශක්තීන් කැප කරන ලෙසට රාජ්‍ය ආයතන, සිවිල් සමාජය සහ රටෙහි පුරවැසියන් සියලු දෙනාගෙන් ඉල්ලා සිටිනු ලැබේ. කොමිෂන් සභාවේ නිරීක්ෂණ සහ නිර්දේශ නිර්මාණය වී ඇත්තේ මෙම පුළුල් අභිමතාර්ථ තුළින් ය. [224]

විනිදිතයන් විසින් යුධ ගැටුම් හේතුවෙන් අත් විඳි බෙදනීය කම්පන තත්ත්වයන්ගෙන් මිදීම සඳහා විනිදිතයන්ට හා ස්වකීය පවුල් වලට සහාය වීමේ සහ මානව හිමිකම් උල්ලංඝනය වීම් සිදු වී ඇත්නම් ඒවායේ වැරදිකරුවන් යුක්තිය හමුවට ගෙන ඒමේ කඩිනම් අවශ්‍යතාවයක් පවතී. එසේම, මෙම අතීත සිදුවීම් තුළින් ලබන පාඩම් ඔස්සේ එවන් සිදුවීම් නැවත වරක් කිසිදා සිදු නොවන බවට සනාථ කිරීමේ දැඩි අවශ්‍යතාවයක් ද පවතී. රට තුළ ජීවත් වන සියලු පුද්ගලයන්ගේ විශ්වාසය වැඩි දියුණු කළ හැකි ආකාරයෙන් ප්‍රතිසන්ධාන ක්‍රියාවලියේ ප්‍රධාන සංරචකය ලෙස මූලික මානව හිමිකම් සහ නන් වැදෑරුම් මූලික නිදහස තවදුරටත් ප්‍රවර්ධනය කිරීමට සහ ආරක්ෂා කිරීමට හැකි වන අයුරින් ශක්තිමත් පදනමක් ගොඩ නැගිය යුතුය. එවිට ඔවුනට අභිමානයෙන් යුතුව ජීවත් වීමට සහ නීතිය ඉදිරියේ සමාන ලෙස සලකනු ලැබීමට ලක්

---

[221] උගත් පාඩම් හා ප්‍රතිසන්ධාන කොමිසම් වාර්තාව, ඡේදය 5.3

[222] උගත් පාඩම් හා ප්‍රතිසන්ධාන කොමිසම් වාර්තාව, ඡේදය 5.4 පිටුව 155

[223] එම

[224] උගත් පාඩම් හා ප්‍රතිසන්ධාන කොමිසම් වාර්තාව, ඡේදය 5.5

වීමට හැකි බවත් කොමිෂන් සභාව විසින් සලකනු ලැබේ. කොමිෂන් සභාව විසින් සිදු කරන නිරීක්ෂණ සහ ලබා දෙන නිර්දේශ තුළින් මෙම කාර්යය ඉටු වනු ඇති බවට කොමිෂන් සභාව විසින් සලකනු ලැබේ.[225]

මහජනතාව සමග පැවැත්වූ රැස්වීම් වලදී සහ යුධ ගැටුම් වලින් බලපෑමට ලක් වූ ප්‍රදේශ වෙත සිදු කරන ලද ක්ෂේත්‍ර සංචාර අතරතුරදී, යුධ ගැටුම් වලින් බලපෑමට ලක් වූ පුද්ගලයන්ගේ මූලික අයිතිවාසිකම් සහ නන් වැදෑරුම් නිදහස උල්ලංඝනය වීම පිළිබඳ චෝදනා කරමින් කොමිෂන් සභාව ඉදිරියට ඉතා විශාල අදහස් දැක්වීම් ප්‍රමාණයක් ඉදිරිපත් වී ඇත. පැහැර ගෙන යාම්, බලහත්කාරයෙන් අතුරුදන් කරවීම්, අත්තනෝමතික අයුරින් රඳවා ගැනීම්, අඩු වයස් ළමුන් සංවිධානයට බඳවා ගැනීම, නීති විරෝධීව, නඩු විභාග වලින් තොරව හෝ අත්තනෝමතික අයුරින් මරණයට පත් කිරීම්, අදහස් ප්‍රකාශනයේ, සංචරණයේ සහ සමාගමයේ නිදහස උල්ලංඝනය කිරීම, ආගම පිළිබඳ නිදහස උල්ලංඝනය කිරීම සහ මාධ්‍ය[226] *පිළිබඳ ස්වාධීනත්වය නැති කිරීම යනාදිය මෙයට ඇතුළත් විය. පැහැර ගැනීමක්, නීත්‍යානුකූල අත් අඩංගුවට ගැනීමක්, අත්තනෝමතික අයුරින් රඳවා ගැනීමක් සහ බලහත්කාරයෙන් අතුරුදන් කරවීමක් යනාදියෙහි ප්‍රතිඵලයක් වශයෙන් ඇතැම් විට වසර ගණනාවක් තිස්සේ කොහි සිටින්නේදැයි නොදන්නා පුද්ගලයන් සම්බන්ධයෙන් අදහස් දැක්වීම් විශාල ප්‍රමාණයක් සිදු කොට ඇත.* [227]

එසේම අභ්‍යන්තර වශයෙන් අවතැන් වීමට ලක් වූ පුද්ගලයන්ගේ සහ කාන්තාවන්, ළමයින් හා ආබාධිත තැනැත්තන් වැනි අවදානම් පාත්‍රතාවයෙහි සිටින වෙනත් කණ්ඩායම්වල අයිතිවාසිකම් සම්බන්ධයෙන් වන ගැටලු පිළිබඳවද අදහස් දැක්වීම් ඉදිරිපත් වී තිබුණි. ***මානව හිමිකම් ගැටලු සම්බන්ධයෙන් තමන් විසින් ලබා දෙන නිර්දේශ ප්‍රතිසන්ධාන ක්‍රියාවලියට තදබල ලෙස අදාළ වන බවට කොමිෂන් සභාව විසින් සලකනු ලැබේ.***[228]

යුධ ගැටුම් තුළින් පැන නගින මානව හිමිකම් ගැටළු - උගත් පාඩම් සහ ප්‍රතිසන්ධාන කොමිෂන් සභාව විසින් අනාවරණය කර ගත් පරිදි[229]

318. යුධ ගැටුම් වලින් බලපෑමට ලක් වූ ප්‍රදේශ වලින් බැහැරව ජීවත් වූ, එහෙත් දශක තුනකට වඩා වැඩි කාලයක් තිස්සේ එල්.ටී.ටී.ඊ. සංවිධානය විසින් සිදු කරන ලද කිසිදු වගවිභාගයක් නොමැති බෝම්බ ප්‍රහාර සහ වෙනත් බිහිසුණු මරා දැමීම් වල වින්දිතයන් බවට පත් වූ අහිංසක සිවිල් වැසියන් දහස් ගණනක් වෙනුවෙන් ද වැඩි දුර අදහස් ඉදිරිපත් කිරීම් සිදු විය.[230]

320. යුධ ගැටුමක් පවතින අතරතුරදී, හමුදා බලකායන් විසින් සපුරාලිය යුතු මානව හිමිකම් සම්බන්ධ අනිවාර්ය වගකීම් පිළිබඳ යුධ හමුදාව, නාවික හමුදාව සහ ගුවන් හමුදාව තුළ සමීප අවබෝධයක් ඇති කිරීම පිළිබඳව ආරක්ෂක අමාත්‍යාංශය විසින් උගත් පාඩම් හා ප්‍රතිසන්ධාන කොමිෂන් සභාව වෙත අදහස් ඉදිරිපත් කොට ඇත. [231]

---

[225] උගත් පාඩම් හා ප්‍රතිසන්ධාන කොමිසම් වාර්තාව, ඡේදය 5.6

[226] උගත් පාඩම් හා ප්‍රතිසන්ධාන කොමිසම් වාර්තාව, ඡේදය 5.1 සහ පිටුව 154

[227] උගත් පාඩම් හා ප්‍රතිසන්ධාන කොමිසම් වාර්තාව, ඡේදය 5.12 සහ 9.42

[228] එම

[229] උගත් පාඩම් හා ප්‍රතිසන්ධාන කොමිසම් වාර්තාව, පිටුව 156

[230] උගත් පාඩම් හා ප්‍රතිසන්ධාන කොමිසම් වාර්තාව, ඡේදය 5.8

[231] උගත් පාඩම් හා ප්‍රතිසන්ධාන කොමිසම් වාර්තාව, ඡේදය 5.10

320. යුධ ගැටුම් වලින් අනතුරුව මතු වූ මානව හිමිකම් පිළිබඳ සමස්ත තත්ත්වය සැලකීමේදී, පුද්ගලයන් කිහිප දෙනෙකු විසින් ම උගත් පාඩම් සහ ප්‍රතිසන්ධාන කොමිෂන් සභාව හමුවට ඉදිරිපත් කර තිබූ අදහස වූයේ, යුධ ගැටුම් වලින් පසුව සමාජ සාරධර්මවල සමස්ත වශයෙන් විනාශ වීමක් සිදු වී තිබූ බවත්, මානව හිමිකම් ඉටු කිරීම යන්න අහම්බයක් පමණක් වූ බවත් ය.[232]

මානව හිමිකම් උල්ලංඝනය වීම්, අතුරුදන් කරවීම් සම්බන්ධ චෝදනා සහ පැහැර ගැනීම්

- පස්වෙනි පරිච්ඡේදයේ 5.12. සිට 5.33 දක්වා වන කොටස් මානව හිමිකම් උල්ලංඝනය වීම් සම්බන්ධයෙන් වේ.

321. චෝදනා එල්ල වන අතුරුදන් කරවීම් පිළිබඳ සිද්ධි වලට එරෙහිව නිශ්චිත ක්‍රියාමාර්ග ගැනීම මෙන්ම ඒවා වැළැක්වීම සඳහා ක්‍රියාමාර්ග ගැනීම ඔස්සේ ප්‍රතිසන්ධාන ක්‍රියාවලිය කෙරෙහි සැලකිය යුතු බලපෑමක් ඇති වන බව උගත් පාඩම් හා ප්‍රතිසන්ධාන කොමිසම හමුවට තම අදහස් ඉදිරිපත් කළ බොහෝ පුද්ගලයන් විසින් අවධාරණය කරන ලදී. අතීත සිදුවීම් නැවත නැවත සිදු වීම වැළැක්වීමට හැකි වන පරිදි අතීත අත්දැකීම් තුළින් පාඩම් ඉගෙන ගනු ලබන බව සහතික කිරීමේ මූලික අවශ්‍යතාවය පිළිබඳව ද මෙම අදහස් දැක්වීම් අතරතුරදී නැවත නැවතත් සිහිගන්වන ලදී. [233]

322. පැහැර ගෙන යෑම්, බලහත්කාරයෙන් අතුරුදන් කරවීම් සහ අත්තනෝමතික අයුරින් රඳවා තබා ගැනීම් පිළිබඳ චෝදනා එල්ල කරමින් ඉදිරිපත් වූ ඉතා විශාල අදහස් දැක්වීම් ප්‍රමාණය හේතුවෙන් උගත් පාඩම් සහ ප්‍රතිසන්ධාන කොමිසම ද මවිතයට පත් වී ඇත. එම බොහොමයක් අවස්ථාවලදී පොලිස් ස්ථාන වෙත, ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව වෙත සහ අන්තර්ජාතික රතුකුරුස සංවිධානය වෙත නිල වශයෙන් පැමිණිලි ගොනු කිරීමක් සිදු වී තිබූ බව ද අනාවරණය වී ඇත. ඇතැම් අවස්ථාවලදී අදහස් දැක්වීම් ඉදිරිපත් වී තිබුණේ පෙර පැවති විමර්ශන කොමිෂන් සභා වෙතයි. එහෙත්, එලෙස අතුරුදන්වූ තැනැත්තන් බොහොමයකගේ ආගිය තොරතුරු හෝ සිටින ස්ථාන පිළිබඳ තොරතුරු කිසිවක් තමන් සතුව නොපවතින බව එම තැනැත්තන්ගේ සමීප ඥාතීන් දිගින් දිගටම පැමිණිලි කරති. එම නිසා මෙම චෝදනා නිසි පරිදි විමර්ශනය කොට වරදකරුවන් නීතිය හමුවට ඉදිරිපත් කරනු ලබන බව සහතික කිරීම උදෙසා කඩිනමින් පියවර ගන්නා ලෙසට නීතිය බලාත්මක කිරීමේ අංශ වෙත උපදෙස් ලබා දීමේ අනිවාර්ය වගකීමක් රජය සතුව පවතී. [234]

323. රජය වෙත භාර වීමේදී හෝ අත් අඩංගුවට ගැනීමකදී රජයේ බලධාරීන්ගේ භාරයට ගනු ලබන කවර හෝ පුද්ගලයෙකුගේ ආරක්ෂාව සහ සුරක්ෂිතභාවය තහවුරු කිරීම රජයේ වගකීම වන බව උගත් පාඩම් සහ ප්‍රතිසන්ධාන කොමිෂන් සභාව විසින් අවධාරණය කරනු ලැබේ.[235]

324. ඉතා කඩිනමින් අවධානය යොමු විය යුතු කාරණයක් වශයෙන්, අතුරුදන් වූ පුද්ගලයන්ගේ ගැටළු ආමන්ත්‍රණය කිරීම සඳහා වඩා විස්තරාත්මක ප්‍රවේශයක් සොයා ගත යුතු වන අතර එසේ නොවුවහොත් ඒ ඔස්සේ ඕනෑම අන්තර්කරණයෙන් යුතු සහ දීර්ඝකාලීන ප්‍රතිසන්ධාන ක්‍රියාවලියක් කෙරෙහි බරපතල බාධකයක් නිර්මාණය කරනු ලැබිය හැකිය. රටෙහි විවිධ ප්‍රදේශ ආශ්‍රිතව සිදුවූ අතුරුදන්වීම් පිළිබඳ අතීත සිද්ධි හේතුවෙන් සහ ඉන් අනතුරුව ඒවා විමර්ශනය

[232] උගත් පාඩම් හා ප්‍රතිසන්ධාන කොමිසම් වාර්තාව, ඡේදය 5.11

[233] උගත් පාඩම් හා ප්‍රතිසන්ධාන කොමිසම් වාර්තාව, ඡේදය 5.13 සහ 9.44

[234] උගත් පාඩම් හා ප්‍රතිසන්ධාන කොමිසම් වාර්තාව, ඡේදය 9.46

[235] උගත් පාඩම් හා ප්‍රතිසන්ධාන කොමිසම් වාර්තාව, ඡේදය 5.35 සහ 9.47

කිරීමට ගෙන ඇති ප්‍රයත්නයන් සලකමින් එම ගැටළුව ආමන්ත්‍රණය කිරීම උදෙසා සහ අනාගතයේදී නැවත වතාවක් එවන් සිදුවීම් ඇතිවීමට බාධාකාරී තත්ත්වයන් නිර්මාණය කිරීම සඳහාත් විශේෂ යාන්ත්‍රණයක් අතීතයේ පැවති කොමිෂන් සභාව විසින් නිර්දේශ කොට ඇති බව සඳහන් කළ යුතුය. මානව හිමිකම් සංදර්භය තුළ මතුවී ඇති එමෙන්ම, වරින් වර බලයට පැමිණි රජයන් විසින් ක්‍රියාත්මක කළ මෙම බරපතල ගැටලුව ආමන්ත්‍රණය කිරීම සඳහා මෙම නිර්දේශ තුළින් සහායක් සැලසෙනු ලබන බැවින් මෙම නිර්දේශ කඩිනමින් ක්‍රියාත්මක කළ යුතුව පවතී. අතීතයේ පත් කරන ලද කොමිෂන් සභා වල එවන් බරපතල නිර්දේශ බලාත්මක කිරීම සඳහා අඛණ්ඩවම අසමත් වීම ඔස්සේ කොමිෂන් සභා වල අරමුණ කුමක් වන්නේද යන්න පිළිබඳව නින්දා සහගත තත්ත්වයක් නිර්මාණය කරනු ලබන අතර, උගත් පාඩම් සහ ප්‍රතිසන්ධාන කොමිෂන් සභාවටත් එම ඉරණම ම අත්වේද යන්න පිළිබඳ සැක සැංකාද මතු වේ.[236]

325. ස්වකීය ආදරණීයයන් සිටින්නේ කොතැනද යන්න දැනගැනීමේ අයිතිය අතුරුදන් වීමට ලක්වූ පුද්ගලයන්ගේ ඥාතීන් සතුව පවතින බව උගත් පාඩම් සහ ප්‍රතිසන්ධාන කොමිෂන් සභාව මගින්ද අවධාරණය කරනු ලැබේ. එම පුද්ගලයන්ට සිදුවූයේ කුමක්ද යන්න දැනගැනීමටත් ඒ ඔස්සේ අදාළ සිද්ධිය අවසානයක් කරා රැගෙන ඒමටත් ඔවුනට අයිතිය පැවතිය යුතුය. අතුරුදන්වීම් වලට ලක් වූ පුද්ගලයන් සිටින්නේ කොතැනකද යන්න පිළිබඳව කාරණා සොයා බැලීමටත්, එම තැනැත්තන් නැවත තම පවුල් සමග එකතු වන බව සහතික කිරීමටත් ජාත්‍යන්තර රතුකුරුස සංවිධානය හි සහයෝගීතාවයෙන් යුතුව නීතිය බලාත්මක කිරීමේ බලධාරීන් විසින් හැකි සෑම ප්‍රයත්නයක්ම දැරිය යුතුය.[237]

326. මෙම අතුරුදන්වීම් පිළිබඳව විමර්ශනය කොට අපරාධ නඩු කටයුතු පැවරිය යුත්තේ කුමන ඒවා සම්බන්ධයෙන්ද යන්න නීතිපතිවරයා වෙත වාර්තා කිරීම සඳහා විශේෂ විමර්ශන කොමිෂන් සභාවක් නිර්මාණය කරන ලෙසට උගත් පාඩම් සහ ප්‍රතිසන්ධාන කොමිෂන් සභාව විසින් නිර්දේශ කරනු ලැබේ.[238] මෙලෙස, විශේෂ කොමිෂන් සභාවක් ස්ථාපිත කිරීම පිළිබඳ නිර්දේශය 2013 අගෝස්තු මාසයේදී පරණගම කොමිෂන් සභාව පත් කිරීමත් සමග ද ක්‍රියාත්මක වී ඇති බවට පෙනෙන්නට තිබෙන අතර අතුරුදන්වූ තැනැත්තන් පිලිබඳ මෙම කොමිෂන් සභාවේ කාලසීමාව 2016 පෙබරවාරි මස 15 වන දින දක්වා දීර්ඝ කිරීමක් පවා සිදු කොට ඇත.

327. කඩිනම් අවධානය යොමු විය යුතු කාරණයක් වශයෙන් සලකමින් මරණ සහතික නිකුත් කිරීම සහ මූල්‍යමය වන්දි ලබා දීම් සිදු කිරීමට උගත් පාඩම් හා ප්‍රතිසන්ධාන කොමිෂන් සභාව විසින් නිර්දේශ කරනු ලැබේ.[239]

328. කිසිදු නිල වාර්තාවකින් තොරව අත්අඩංගුවට ගනු ලැබූ පුද්ගලයන් සම්බන්ධයෙන් වන චෝදනා ගණනාවක් උගත් පාඩම් සහ ප්‍රතිසන්ධාන කොමිෂන් සභාව හමුවේ විභාග කරන ලදී. පුද්ගලයන් අත් අඩංගුවට ගැනීමේදී අත් අඩංගුවට ගැනීම පිළිබඳව නිල ලදුපතක් නිකුත් කිරීම සහ රඳවා තබා ගන්නා ස්ථානය පිළිබඳ තොරතුරු ලබා දීම වැනි ආකාරයෙන් නීතිය බලාත්මක කිරීමෙහි අධිකාරීන් විසින් අදාළ වන නෛතික විධිවිධාන නිසි පරිදි අනුගමනය කළ යුතු බවට උගත් පාඩම් සහ ප්‍රතිසන්ධාන කොමිෂන් සභාව මගින් නිර්දේශ කරනු ලැබේ.[240]

---

[236] උගත් පාඩම් හා ප්‍රතිසන්ධාන කොමිසම් වාර්තාව, ඡේදය 5.36 සහ 9.48

[237] උගත් පාඩම් හා ප්‍රතිසන්ධාන කොමිසම් වාර්තාව, ඡේදය 5.37, 5.38 සහ 9.49, 9.50

[238] උගත් පාඩම් හා ප්‍රතිසන්ධාන කොමිසම් වාර්තාව, ඡේදය 9.51

[239] උගත් පාඩම් හා ප්‍රතිසන්ධාන කොමිසම් වාර්තාව, ඡේදය 9.52

[240] උගත් පාඩම් හා ප්‍රතිසන්ධාන කොමිසම් වාර්තාව, ඡේදය 5.40 සහ 9.53

329. එවන් පුද්ගලයන් රඳවා තබා ගත යුත්තේ නීතිය මගින් ප්‍රකාශිත රැඳවුම් මධ්‍යස්ථාන තුළ පමණි. එලෙස බලයලත් රඳවා තබා ගැනීමේ ස්ථාන පිළිබඳව ප්‍රමාණවත් පරිදි තොරතුරු ප්‍රසිද්ධ කළ යුතු අතර, සමීප ඥාතීන් සඳහා ප්‍රවේශය පැවතිය යුතුය.[241]

330. අදාළ වන ජාත්‍යන්තර මානව හිමිකම් සාධනපත්‍ර වලට අනුකූලව සහ ශ්‍රී ලංකාවේ ජාතික නීතිවල අවශ්‍යතාවයන්ට අනුකූලව ශ්‍රී ලංකාව සතුව පවත්නා අනිවාර්ය වගකීම් හා බැඳීම් වලට සමගාමීව පහත කාරණා සම්බන්ධයෙන් පහත සඳහන් ක්‍රියාමාර්ග ගත යුතුය: [242]

(අ) නීතියට අනුකූලව අදාළ කටයුතු සිදුකිරීමට හැකි වන සේ අත්අඩංගුවට ගත් පුද්ගලයෙකු වහාම මහේස්ත්‍රාත්වරයකු ඉදිරියට පැමිණවිය යුතුය.

(ආ) පුද්ගලයෙකු රඳවා තබා ගන්නා ස්ථානයේ කිසියම් වෙනසක් සිදු වීමේදී, අත් අඩංගුවට පත් වූ පුද්ගලයාගේ පවුල වෙත සහ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව වෙත එම කාරණය වහාම දැනුම්දිය යුතුය.

(ඇ) සෑම මසකම මහේස්ත්‍රාත්වරුන් රැඳවුම් මධ්‍යස්ථාන වෙත සංචාරය කළ යුතුය.

(ඈ) රැඳවුම් භාරයෙන් පුද්ගලයෙකු නිදහස් කිරීම අධිකරණ හරහා සිදු කළ යුතුය.

331. ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත තුළ දක්වා ඇති උපරිම කාලසීමාවන් ඉක්මවා යමින් නැවත නැවතත් දිග්ගැස්සෙමින් දීර්ඝ කාලසීමාවක් පුරා ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ පුද්ගලයන් රඳවා තබා ගෙන සිටි අවස්ථා පැවතී ඇති බව උගත් පාඩම් හා ප්‍රතිසන්ධාන කොමිෂන් සභාව විසින් නිරීක්ෂණය කරනු ලැබේ. ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත සහ මහජන ආරක්ෂක ආඥා පනත යටතේ සිදු කරනු ලබන අත් අඩංගුවට ගැනීම් අධීක්ෂණය කිරීම සඳහා ස්වාධීන උපදේශක කොමිෂන් සභාවක් පැවතිය යුතු බවට උගත් පාඩම් හා ප්‍රතිසන්ධාන කොමිෂන් සභාව මගින් නිර්දේශ කරනු ලැබේ.[243]

332. ඇතැම් අවස්ථාවලදී වසර ගණනාවක් තිස්සේ ස්වකීය පවුල් වල සාමාජිකයන් සිටින්නේ කොතැනකද යන්න නොදැන සිටීමේ කම්පනය දරා ගනු ලබන පවුල් සහ විශේෂයෙන්ම අතුරුදන්නවූ තැනැත්තා පවුලේ ආදායම් උපයන්නා වශයෙන් සිට ඇති පුද්ගලයා වූ අවස්ථා වලදී එම පවුල් වෙත මූල්‍යමය වශයෙන් සහයෝගය සැලසීමක් සිදු කළ යුතු ය. මෙම ගැටලුව විස්තරාත්මක වශයෙන් ආමන්ත්‍රණය කිරීම සඳහාත් අනාගතයේදී මෙවැනි සංසිද්ධීන් නැවත ඇතිවීම පිටුදැකීම සඳහාත් මෙන්ම මේ සම්බන්ධයෙන් පවත්නා හිඩැස් පිරවීම සඳහාත් විශේෂයෙන්ම බලහත්කාරයෙන් සිදු කරනු ලබන අතරුදන්කරවීම් අපරාධමය කටයුත්තක් බවට පත් කළ හැකි වන පරිදි දේශීය නීති සම්පාදන සිදු කළ යුතු බවට උගත් පාඩම් හා ප්‍රතිසන්ධාන කොමිෂන් සභාව විසින් දැඩිව නිර්දේශ කරනු ලැබේ.[244]

333. අතීතයේ සිදුවූ සිදුවීම් නැවත කිසි දිනෙක සිදු නොවන බවට සහතික විය හැකි ආකාරයකින් එම අතීත සිදුවීම් පිලිබඳ පාඩම් ඉගෙන ගනු ලබන බව සහතික කිරීමේ මූලික අවශ්‍යතාවයක් පවතින බව උගත් පාඩම් හා ප්‍රතිසන්ධාන කොමිෂන් සභාව විසින් ප්‍රකාශ කරනු ලැබේ. මේ සම්බන්ධයෙන් සැලකීමේදී, පාසල් ළමුන්, තරුණයින්, ආරක්ෂක බලකායන්ගේ සාමාජිකයන් සහ පොලීසිය

---

[241] එහිම - ඡේදය 179

[242] උගත් පාඩම් හා ප්‍රතිසන්ධාන කොමිසම් වාර්තාව, ඡේදය 5.41 සහ 9.54

[243] උගත් පාඩම් හා ප්‍රතිසන්ධාන කොමිසම් වාර්තාව, ඡේද 5.44 සහ 9.57

[244] උගත් පාඩම් හා ප්‍රතිසන්ධාන කොමිසම් වාර්තාව, ඡේද .5.45 සහ 9.58

ඉලක්ක කර ගනු ලබන මානව හිමිකම් පිළිබඳ දීප ව්‍යාප්ත පුළුල් අධ්‍යාපන වැඩසටහන්වල අවශ්‍යතාවය මෙහිදී අවධාරණය කරනු ලැබේ.[245]

334. ලාබාල රැඳවියන් සඳහා විධිමත් අධ්‍යාපනය ලබා දීමටත්, ඔවුනගේ පවුල් වල සමීපතම ඥාතීන් හට ඔවුන් බැහැ දැකීමට පැමිණීමටත්, ඔවුන් සිටිනා ස්ථාන පිළිබඳව තොරතුරු ලබාගැනීමටත් හැකි වන පරිදි අවශ්‍ය කටයුතු පිළියෙළ කල යුතු බවට උගත් පාඩම් සහ ප්‍රතිසන්ධාන කොමිෂන් සභාව විසින් නිර්දේශ කරනු ලැබේ. රැඳවුම් භාරයේ සිටින තැනැත්තන් සම්බන්ධයෙන් වන සියලු අතුරු නිර්දේශ පූර්ණ වශයෙන් ක්‍රියාත්මක වන බවට සහතික කිරීම සඳහා අදාළ බලධාරීන්ට නියෝග කරන ලෙසට උගත් පාඩම් සහ ප්‍රතිසන්ධාන කොමිෂන් සභාව රජයෙන් ඉල්ලා සිටී. සමීපතම ඥාතීන් හට රැඳවියන් වෙත ප්‍රවේශ වීමේ අයිතිය පැවතිය යුතුය. එම නිසා, එම මූලධර්මය උල්ලංඝනය කරනු ලබන කවර හෝ පිළිවෙත් වේ නම්, ඒවා ඉවත් කර දැමිය යුතුය. ඇතැම් සමීප ඥාතීන් හට වාචිකව තොරතුරු සැපයීමක් පමණක් සිදු කොට ඇති බව උගත් පාඩම් සහ ප්‍රතිසන්ධාන කොමිෂන් සභාව විසින් නිරීක්ෂණය කොට ඇත. තවදුරටත්, ඉතා දුර බැහැරක් ගෙවා එම රැඳවුම් ස්ථාන වෙත පැමිණියද, ඇතැම් පවුලේ සාමාජිකයන් හට රැඳවියන් පෞද්ගලිකව හමු වීමට ඉඩ ලබා දී නොමැත. රැඳවූ ස්ථාන වල රඳවා සිටින ස්වකීය පවුලේ සාමාජිකයන් හමු වීම සඳහා පැමිණෙන පවුලේ සමීප ඥාතීන්ගේ ප්‍රවාහනය උදෙසා දැනට පවත්නා පහසුකම් වැඩි දියුණු කිරීම සම්බන්ධයෙන් ජාත්‍යන්තර රතුකුරුස සංවිධානය සහ ස්විට්සර්ලන්ත සංවිධාන වල සහයෝගිතාවය සහිතව අදාළ බලධාරීන් විසින් කටයුතු කළ යුතු බවටද උගත් පාඩම් සහ ප්‍රතිසන්ධාන කොමිෂන් සභාව විසින් නිර්දේශ කරනු ලැබේ. [246]

335. ජාත්‍යන්තර රතුකුරුස සංවිධානය සමග වන මෙම සහයෝගිතා ප්‍රතිපත්තිය උගත් පාඩම් හා ප්‍රතිසන්ධාන කොමිෂන් සභාව විසින්ද පිලිගනු ලබන අතර, රැඳවියන්ගේ සුභසාධනය සහතික කිරීම උදෙසා ජාත්‍යන්තර රතුකුරුස සංවිධානය සහ වෙනත් ඒ හා සමාන මානුෂීය සංවිධාන සමග කටයුතු කිරීමේදී රජය විසින් සහයෝගිතාවය සහ ධනාත්මක නියුක්තවීම පිළිබඳ මෙම ප්‍රතිපත්තිය වඩා පුළුල්ව භාවිතා කළ යුතු බවට දැඩිව නිර්දේශ කරනු ලැබේ. [247]

336. පුද්ගලයන් රඳවා තබා ගනු ලබන සියලු ස්ථාන රැඳවීම් සඳහා බලයලත් සහ විධිමත්ව වෙන් කරනු ලැබූ ස්ථාන විය යුතු අතර, එවන් බලයලත් රැඳවුම් ස්ථාන නොවන වෙනත් ස්ථානවල කිසිදු පුද්ගලයෙකු රඳවා තබා ගැනීමක් සිදු නොකළ යුතුය. පුද්ගලයන් අත් අඩංගුවට ගැනීමේදී නීතිය බලාත්මක කිරීමේ බලධාරීන් විසින් අත් අඩංගුවට ගැනීම පිළිබඳ විධිමත් ලදුපතක් නිකුත් කිරීම සහ රඳවා තබා ගන්නා ස්ථානය පිළිබඳව තොරතුරු සැපයීම වැනි නීතිමය විධිවිධාන දැඩිව අනුගමනය කළ යුතුය.

337. උගත් පාඩම් සහ ප්‍රතිසන්ධාන කොමිෂන් සභාවේ අතුරු නිර්දේශ මත පදනම්ව සැලකිය යුතු රැඳවියන් සංඛ්‍යාවක් සම්බන්ධයෙන් වන නඩු පිළිබඳ කටයුතු ඉදිරියට කරගෙන යාම සඳහා රජය විසින් ගෙන ඇති ක්‍රියාමාර්ග පිළිබඳ උගත් පාඩම් හා ප්‍රතිසන්ධාන කොමිෂන් සභාව විසින් ප්‍රශංසාභිමුඛව සඳහන් කරනු ලැබේ. කෙසේ වුවද, නිසි පරිදි චෝදනා ඉදිරිපත් කිරීමකින් තොරව ඉතා දිගු කාලසීමාවක් තිස්සේ සිරගත කොට තිබෙන රැඳවියන් සම්බන්ධයෙන් උගත් පාඩම් සහ ප්‍රතිසන්ධාන කොමිෂන් සභාවේ කනස්සල්ල ප්‍රකාශ වී ඇත. [248] චෝදනා ගොනු කිරීම මගින්

---

[245] උගත් පාඩම් හා ප්‍රතිසන්ධාන කොමිසම් වාර්තාව, ඡේදය 5.47 සහ 9.60

[246] උගත් පාඩම් හා ප්‍රතිසන්ධාන කොමිසම් වාර්තාව, ඡේදය 5.58, 5.59 සහ 9.64, 9.65

[247] උගත් පාඩම් හා ප්‍රතිසන්ධාන කොමිසම් වාර්තාව, ඡේදය 5.60 සහ 9.66

[248] උගත් පාඩම් හා ප්‍රතිසන්ධාන කොමිසම් වාර්තාව, ඡේදය 5.61 සහ 9.67

හෝ කිසිදු අපරාධමය වරදක් සිදු කොට ඇති බවට කිසිදු සාක්ෂියක් නොපවතින අවස්ථා වලදී අදාළ රැඳවියන් නිදහස් කිරීම මගින් මෙම නඩු පිළිබඳ කටයුතු අවසන් කිරීමට නිශ්චිත ක්‍රියාමාර්ග ගැනීමක් සිදු කළ යුතු බවට උගත් පාඩම් හා ප්‍රතිසන්ධාන කොමිෂන් සභාව විසින් අවධාරණය කරනු ලැබේ.[249]

නීතිවිරෝධී සන්නද්ධ කණ්ඩායම්

338. නීති විරෝධී සන්නද්ධ කණ්ඩායම් වල ක්‍රියාකාරකම්, විශේෂයෙන්ම සමාලෝචිත කාලසීමාව තුළ සිදුවූ එවන් ක්‍රියාකාරකම් උගත් පාඩම් සහ ප්‍රතිසන්ධාන කොමිෂන් සභාවේ ප්‍රබල සැලකිල්ලට බඳුන් විය. යුද්ධයෙන් බලපෑමට ලක් වූ ප්‍රදේශ වෙත සිදු කරන ලද ක්ෂේත්‍ර චාරිකා අතරතුර උගත් පාඩම් සහ ප්‍රතිසන්ධාන කොමිෂන් සභාව ඉදිරියට ඉදිරිපත් වූ අදහස් දැක්වීම් වලට අනුව එවැනි කණ්ඩායම් වල ප්‍රබල පෙනී සිටීම සහ ඒවායේ ක්‍රියාකාරකම් හේතුවෙන් මහජනතාව අතර බියක් නිර්මාණය වී තිබූ බවත්, ඒ ඔස්සේ දුර්විපාක නොලැබීමේ වටපිටාවක් කෙරෙහි දායකත්වය සැලසුණු බවත් පෙනෙන්නට ඇත. මෙවන් කණ්ඩායම් විසින් පුද්ගලයන් පැහැර ගැනීම්, වැරදි සහගත ආකාරයෙන් සිරගත කිරීම් සහ මුදල් ආදිය බලයෙන් පැහර ගැනීම වැනි සිදුවීම් ගණනාවක් පිළිබඳව චෝදනා පවතින බැවින් ජීවත් වීමේ අයිතිය වැනි පුද්ගලයන්ගේ මූලික අයිතින් කෙරෙහි ද මෙම කණ්ඩායම් වල ඇතැම් නීති විරෝධී ක්‍රියාකාරකම් බලපෑමක් ඇති කොට තිබෙන බව පෙනී යයි. මෙලෙස පැහැර ගනු ලැබූ ඇතැම් පුද්ගලයන් සිටින්නේ කොතැනකද යන්න තවමත් කිසිවෙක් නොදන්නා අතර එවන් ඇතැම් පුද්ගලයන් මිය ගොස් ඇති බවට අනාවරණය වී ඇත. මෙවැනි ක්‍රියාකාරකම් සත්‍ය වශයෙන්ම සිදුවූ බවට සනාථ වන්නේ නම්, ජනතාවගේ මූලික නිදහස සහ නන් වැදෑරුම් මූලික අයිතිවාසිකම් උල්ලංඝනය වීමක් ඒ තුළින් සිදු වේ. මෙ චෝදනාවන්ගේ සත්‍ය අසත්‍යභාවය සහතික කර ගැනීම සඳහා සහ ප්‍රමාණවත් සාක්ෂි සොයාගත හැකි වන අවස්ථාවලදී අදාළ අපරාධකරුවන්ට එරෙහිව අපරාධ නඩු කටයුතු ක්‍රියාත්මක කිරීම සඳහා හැකියාව ලැබෙන පරිදි මෙම නීති විරෝධී සන්නද්ධ කණ්ඩායම් වලට එරෙහි චෝදනා සම්බන්ධයෙන් නිසි විමර්ශනයක් සිදු කළ යුතු බවට උගත් පාඩම් සහ ප්‍රතිසන්ධාන කොමිෂන් සභාව විසින් නිර්දේශ කරනු ලැබේ. එසේම, මෙම කණ්ඩායම් නිරායුධ කිරීම සඳහාත් ඔවුන්ගේ නීතිවිරෝධී ක්‍රියාකාරකම් වල අවසානයක් ඇති කිරීම සඳහාත් ක්‍රියාමාර්ග ගත යුතුව පවතී.[250]

ළමා සොල්දාදුවන්

339. යුද්ධයෙන් බලපෑමට ලක් වූ ප්‍රදේශ වෙත සිදු කරන ලද ක්ෂේත්‍ර සංචාර අතරතුරදී බලහත්කාරයෙන් හමුදා සේවයට ළමුන් බඳවා ගැනීම සම්බන්ධයෙන් අදහස් දැක්වීම් ගණනාවක් ඉදිරිපත් වූ බවත්, දෙමව්පියන්ගේ අදහස් දැක්වීම් වලට අනුව මෙම ළමුන් සිටිනුයේ කොතැනකද යන්න තවමත් කිසිවෙකු නොදන්නා බවත් උගත් පාඩම් සහ ප්‍රතිසන්ධාන කොමිෂන් සභාව විසින් ප්‍රකාශ කරනු ලැබේ. ළමුන් බලහත්කාරයෙන් හමුදා සේවයට බඳවා ගැනීම යනු යුධ කාල වකවානුව තුළදී එල්.ටී.ටී.ඊ. සංවිධානය විසින් සිදු කරන ලද අපරාධ අතරින් එක් වඩාත්ම වරදකාරී ස්වභාවයේ අපරාධයකි. [251]

340. එසේම එල්.ටී.ටී.ඊ. සංවිධානය නොවන වෙනත් කණ්ඩායම් විසින් නැගෙනහිර ප්‍රදේශ වලදී අඩු වයස් ළමුන් බඳවාගැනීම සම්බන්ධයෙන්ද අදහස් දැක්වීම් සිදු කොට ඇත. ළමුන් බලහත්කාරයෙන්

[249] උගත් පාඩම් හා ප්‍රතිසන්ධාන කොමිසම් වාර්තාව, ඡේදය 5.64 සහ 9.70

[250] උගත් පාඩම් හා ප්‍රතිසන්ධාන කොමිසම් වාර්තාව, ඡේදය 5.66 සහ 9.72

[251] උගත් පාඩම් හා ප්‍රතිසන්ධාන කොමිසම් වාර්තාව, ඡේදය 5.79 සහ 9.75

හමුදාවට බඳවා ගැනීම යනු ශ්‍රී ලංකාවේ දණ්ඩන නීති ද උල්ලංඝනය කිරීමකි. ආරක්ෂක මණ්ඩල යෝජනා 1612 (2005) සහ වෙනත් අදාළ යෝජනා සම්මතයන්ට අනුකූලව මෙම ගැටලුව පිළිබඳව රජය විසින් අඛණ්ඩවම යුනිසෙෆ් සංවිධානය සහ ආරක්ෂක මණ්ඩලයේ ක්‍රියාකාරී කණ්ඩායම සමග සහයෝගීතාවයෙන් කටයුතු කොට ඇති බවද උගත් පාඩම් සහ ප්‍රතිසන්ධාන කොමිෂන් සභාවේ අවධානයට ලක් වේ. [252]

341. පශ්චාත් යුධ අවදියේදී රජය විසින් ඉහළ ප්‍රමුඛතාවයක් වහාම ලබා දිය යුතු කාරණයක් වන්නේ හිටපු ළමා සොල්දාදුවන් පුනරුත්ථාපනය කිරීමයි. හිටපු ළමා සොල්දාදුවන් සිය ගණනක් පුනරුත්ථාපනය සහ නැවත සමාජානුයෝජනය කිරීම සඳහා ඉඩකඩ සලසමින් රජය විසින් ගෙන ගිය පුනරුත්ථාපන වැඩසටහන පිළිබඳවත් විශේෂයෙන්ම ළමාරක්ෂක සහ පරිවාස කොමසාරිස් ජනරාල්වරයාගේ ප්‍රජා පාදක විශෝධක වැඩසටහන් ප්‍රවේශය පිළිබඳවත් උගත් පාඩම් සහ ප්‍රතිසන්ධාන කොමිෂන් සභාව ප්‍රශංසනීයව සඳහන් කරයි. රාජ්‍ය නොවන සංවිධාන සහ සිවිල් සමාජ සංවිධාන වල සහයෝගීතාවයෙන් යුතුව හිටපු ළමා සොල්දාදුවන් පුනරුත්ථාපනය කිරීම සඳහා එම ප්‍රජා පාදක ප්‍රවේශයම අනුගමනය කරන ලෙසට උගත් පාඩම් සහ ප්‍රතිසන්ධාන කොමිෂන් සභාව මගින් නිර්දේශ කරනු ලැබේ.[253]

342. පුනරුත්ථාපන ක්‍රියාවලියේදී, පුනරුත්ථාපන වැඩසටහන සම්පූර්ණ කළ වහාම ළමුන් හට ස්වකීය පවුල් සමග ජීවත් වීමට ඉඩකඩ සලසා දීම, යම් ආදායමක් උපයාගැනීමට ඔවුන්ට සහාය වීම සහ ඔවුන්ගේ විධිමත් සහ අවිධිමත් අධ්‍යයන කටයුතු අඛණ්ඩව කරගෙන යාම සඳහා ඔවුනට සහාය වීම යනාදිය අදාළ පුනරුත්ථාපන බලධාරීන් විසින් වගබලා ගත යුතු බව උගත් පාඩම් සහ ප්‍රතිසන්ධාන කොමිෂන් සභාව විසින් අවධාරණය කරනු ලැබේ. මේ සම්බන්ධයෙන්, අප විසින් ආරක්ෂා කළ යුතු සංස්කෘතික සම්ප්‍රදායයන්ගේ ඉතාමත් වැදගත් කොටසක් ලෙස සලකමින් ළමුන් හට ස්වකීය දෙමව්පියන් සමග සහ / හෝ තමන්ගේම ප්‍රජාවන් තුළ විස්තෘත පවුල් සාමාජිකයන් සමග රැඳී සිටීමට ඉඩකඩ සැලසීමේ වැදගත්කම උගත් පාඩම් හා ප්‍රතිසන්ධාන කොමිෂන් සභාව විසින් අවධාරණය කරනු ලැබේ. මෙම ළමුන් දීර්ඝකාලීන වශයෙන් ස්වකීය පවුල් සහ ප්‍රජාවන් සමග නැවත අනුකලනය වීම සඳහා මේ ඔස්සේ සහාය සැලසේ. ළමුන් සොල්දාදුවන් වශයෙන් බලයෙන් හමුදාවට සම්බන්ධ කර ගැනීම පිළිබඳව සාක්ෂි බැලූ බැල්මට පවත්නා අවස්ථාවලදී, උගත් පාඩම් සහ ප්‍රතිසන්ධාන කොමිෂන් සභාව විසින් නිර්දේශ කරන පරිදි එවන් චෝදනා එල්ල වන සිදුවීම් පිළිබඳව නිසි පරිදි විමර්ශනය කිරීමත් අපරාධකරුවන් නීතිය හමුවට පැමිණවීමත් අවශ්‍ය වේ. [254]

343. පෞද්ගලික අංශය සමග සාකච්ඡා කොට යුධ ගැටුම් වලින් බලපෑමට ලක් වූ ප්‍රදේශ වලට වැඩියෙන් රැකියා අවස්ථා සැලසීමට කටයුතු කරන ලෙස අදාළ බලධාරීන්ගෙන් උගත් පාඩම් හා ප්‍රතිසන්ධාන කොමිෂන් සභාව විසින් ඉල්ලා සිටිනු ලැබේ. පාසල් යාමේ අවස්ථාව අහිමි වූ ළමා සොල්දාදුවන් සම්බන්ධයෙන් කිසියම් නම්‍යශීලී ක්‍රමවේදයක් අනුගමනය කළ යුතු වේ. තවදුරටත්, ආදායම් උත්පාදන රැකියා අවස්ථාවක නිරත වන අතරතුර ස්වකීය විධිමත් අධ්‍යාපන අවශ්‍යතාවයන් සම්පූර්ණ කර ගැනීම සඳහා හිටපු ළමා සොල්දාදුවන් දිරිගැන්වීමත් ඒ සඳහා ඔවුනට අවශ්‍ය පහසුකම් සැලසීමත් සිදු කළ යුතුය. [255]

---

[252] උගත් පාඩම් හා ප්‍රතිසන්ධාන කොමිසම් වාර්තාව, ඡේදය 5.90 සහ 9.76

[253] උගත් පාඩම් හා ප්‍රතිසන්ධාන කොමිසම් වාර්තාව, ඡේදය 5.94 සහ 9.77

[254] උගත් පාඩම් හා ප්‍රතිසන්ධාන කොමිසම් වාර්තාව, ඡේද 5.95 සහ 9.78

[255] උගත් පාඩම් හා ප්‍රතිසන්ධාන කොමිසම් වාර්තාව, ඡේද 5.97 සහ 9.80

344. තරුණ එල්.ටී.ටී.ඊ. සැකකරුවන් සම්බන්ධ සිද්ධි වලදී ප්‍රමාදයකින් තොරව ඔවුන් සම්බන්ධයෙන් නීතිමය ක්‍රියාමාර්ග ආරම්භ කිරීමට, ඔවුන් පුනරුත්ථාපනය කිරීමට සහ / හෝ ඔවුන් මුදා හැරීමට හැකි වන පරිදි එම සිද්ධි එකින් එක පදනමින් ගෙන පරීක්ෂා කොට බලා අවශ්‍ය කටයුතු සිදු කිරීමට ප්‍රමුඛතාවය ලබා දෙන ලෙසට උගත් පාඩම් සහ ප්‍රතිසන්ධාන කොමිෂන් සභාව විසින් නිර්දේශ කොට ඇත.[256]

<u>අවදානම් පාත්‍රතාවයේ සිටින කණ්ඩායම්</u>

345. යුධ ගැටුම් වල ප්‍රතිඵලයක් වශයෙන් කාන්තාවන්, ළමුන්, අභ්‍යන්තර අවතැන්වූ තැනැත්තන් සහ ආබාධිත තැනැත්තන් වැනි අවදානම් පාත්‍රතාවයෙහි සිටින කණ්ඩායම් සම්බන්ධයෙන් ගැටලු ගණනාවක් පැනනැගී ඇත. සැලකිය යුතු අයුරින් මෙලෙස පීඩාවන්ට ලක් වූ මෙම කණ්ඩායම් පිළිබඳ විස්තර රැසක් උගත් පාඩම් සහ ප්‍රතිසන්ධාන කොමිෂන් සභාව හමුවට ලැබී ඇත. උගත් පාඩම් හා ප්‍රතිසන්ධාන කොමිෂන් සභාවේ නිරීක්ෂණයට අනුව වර්තමාන පශ්චාත් යුධ වටපිටාව තුළ මෙම කණ්ඩායම් වල මූලික අවශ්‍යතා සපුරාලීම රජයේ ප්‍රමුඛතාවය හිමි විය යුතු කාරණයකි.[257]

<u>කාන්තාවන්, ළමුන් සහ වැඩිහිටි පුද්ගලයන්</u>

346. තම ජීවිත කෙරෙහි ඉතා බරපතල හානි නිර්මාණය වීම මගින් යුධ ගැටුම් හේතුවෙන් වඩාත් බරපතලම පීඩාවන්ට පත් වූ කාණ්ඩ වන්නේ කාන්තාවන්, ළමුන් සහ වැඩිහිටි තැනැත්තන් බව ක්ෂේත්‍ර චාරිකා අතරතුරදී උගත් පාඩම් සහ ප්‍රතිසන්ධාන කොමිෂන් සභාව විසින් අවබෝධ කර ගෙන ඇත.[258]

<u>කාන්තාවන්</u>

347. උතුරු සහ නැගෙනහිර පළාත්වල තිබෙන කාන්තා ගෘහමූලික නිවාස ඒකක සංඛ්‍යාව 59,501 ක් බවට තක්සේරු කොට ඇත.

348. කාන්තාවන්, ළමුන්, අභ්‍යන්තර අවතැන්වූ තැනැත්තන් සහ ආබාධ සහිත තැනැත්තන් වැනි අවදානම් පාත්‍රතාවයේ සිටින කණ්ඩායම් ආශ්‍රිත නිරීක්ෂණ සම්බන්ධයෙන් උගත් පාඩම් සහ ප්‍රතිසන්ධාන කොමිෂන් සභාවේ සංවේගය ප්‍රකාශ කරනු ලබන අතර, එම කණ්ඩායම් වල අසරණ භාවය අවසන් කිරීමේ අවශ්‍යතාවය අවධාරණය කරනු ලැබේ. ඔවුන්ගේ එම අසරණභාවය සහ අවදානම් පාත්‍රතාවය අවසානයකට ගෙන ඒම සඳහා වන එවන් යාන්ත්‍රණයක්, අර්ථාන්විත සුවපත්කිරීමේ සහ ප්‍රතිසන්ධාන ක්‍රියාවලියක් ඇති කිරීමට දායකත්වය සලසන ඉතා වැදගත් සාධකයක් විය හැකි බව උගත් පාඩම් සහ ප්‍රතිසන්ධාන කොමිෂන් සභාව විසින් පැහැදිලි කරනු ලැබේ.[259]

349. ප්‍රතිසන්ධානය උදෙසා වන සාමූහික ප්‍රයත්නයකදී රජය සහ අනෙකුත් සියලු පාර්ශ්වකරුවන් විසින් ප්‍රධාන ප්‍රමුඛතා කාරණයක් වශයෙන් ආමන්ත්‍රණය කළ යුතු ප්‍රධාන පශ්චාත් යුධ අභියෝගයක් වශයෙන්, මෙම කාන්තාවන්ගේ සහ කාන්තා ගෘහ මූලිකත්වයක් සහිත නිවාස

[256] උගත් පාඩම් හා ප්‍රතිසන්ධාන කොමිසම් වාර්තාව, ඡේද 5.99 සහ 9.82

[257] උගත් පාඩම් හා ප්‍රතිසන්ධාන කොමිසම් වාර්තාව, ඡේද 5.100 සහ 9.83

[258] උගත් පාඩම් හා ප්‍රතිසන්ධාන කොමිසම් වාර්තාව, ඡේද 5.102 සහ 9.84

[259] උගත් පාඩම් හා ප්‍රතිසන්ධාන කොමිසම් වාර්තාව, ඡේද 5.103 සහ 9.85

ඒකකවල සුභසාධනය ඇති කිරීම බව උගත් පාඩම් හා ප්‍රතිසන්ධාන කොමිෂන් සභාව විසින් හඳුනාගනු ලැබේ.[260]

350. බොහොමයක් කාන්තාවන් හට ස්වකීය ස්වාමිපුරුෂයන් අහිමි වී තිබෙන අතර, ඇතැමෙක් තම ස්වාමිපුරුෂයන් සිටින්නේ කොතැනකද යන්න පවා නොදැන සිටිති. තවත් ඇතැම් අවස්ථාවලදී අවිනිශ්චිත දීර්ඝ කාලසීමාවක් තිස්සේ ස්වකීය ස්වාමිපුරුෂයන් රඳවා ගැනීමේ කඳවුරු වල රඳවා තබා ගෙන ඇත. යුධ ගැටුම් වලින් බලපෑමට ලක් වූ කාන්තාවන්, ළමුන්, වැඩිහිටියන් සහ ආබාධිත තැනැත්තන් වැනි අනෙකුත් අවදානම් පාත්‍රතාවයේ සිටින කණ්ඩායම් වල අවශ්‍යතාවයන් වඩාත් පුළුල් ආකාරයකින් ආමන්ත්‍රණය කිරීම සඳහාත්, අවශ්‍ය සහන සැලසීම සඳහාත් බලයලත් අන්තර් ආයතන කාර්යසාධක බලකායක් ප්‍රමාදයකින් තොරව ස්ථාපිත කළ යුතුය. මෙම කාර්යභාරය සඳහා සහාය සලසා ගැනීමට, මෙම ක්ෂේත්‍රය පිළිබඳ ප්‍රවීණත්වය සහ අවශ්‍ය සම්පත් සහිත අදාළ ජාත්‍යන්තර සංවිධාන සහ සිවිල් සමාජ කණ්ඩායම් ලැයිස්තුගත කර ගැනීමටත්, ඒවායේ සේවාවන් සලසා ගැනීමටත් රජය විසින් වඩා විශිෂ්ඨ සහ තිරසාර ප්‍රයත්නයක් දැරිය යුතු වේ.[261]

351. යුද්ධයේ දිග්ගැසුණු ස්වභාවය හේතුවෙන් සහ පවුලේ පිරිමි පුද්ගලයන් අතුරුදන්වීම් වැනි තත්ත්වයන් හේතුවෙන් බොහොමයක් කාන්තාවන් හට ස්වකීය විධිමත් අධ්‍යාපන කටයුතු අඛණ්ඩව කරගෙන යාමට නොහැකි වී ඇති බව උගත් පාඩම් සහ ප්‍රතිසන්ධාන කොමිෂන් සභාව විසින් නිරීක්ෂණය කරනු ලබන අතර, පශ්චාත් යුධ වටපිටාවක් තුළ එවන් කාන්තාවන් හට ස්වකීය විධිමත් අධ්‍යාපන කටයුතු ඉදිරියට කර ගෙන යාමටත්, රැකියා අවස්ථා සොයා ගැනීමට සහ / හෝ වෙනත් ජීවනෝපාය ක්‍රියාකාරකම් වල නියුක්ත වීමට පහසුකම් සලසනු ලැබිය හැකි ආකාරයෙන් වෙනත් අවිධිමත් අධ්‍යාපන ස්වරූපයන් සහ / හෝ වෘත්තිය පුහුණු අවස්ථාවන් හැදෑරීමට අවශ්‍ය අවස්ථා සහ විකල්ප එම කාන්තාවන් වෙත සැලසිය යුතු බවට නිර්දේශ කරනු ලැබේ.[262]

<u>ළමයින්</u>

352. ළමුන් සඳහා සහාය සැලසීම, විශේෂයෙන්ම ස්වකීය අධ්‍යාපනය සඳහා සහාය සැලසීම ප්‍රධාන ප්‍රමුඛතාවයක් වශයෙන් පැවතිය යුතු බවට උගත් පාඩම් හා ප්‍රතිසන්ධාන කොමිෂන් සභාව විසින් දැඩිව නිර්දේශ කරනු ලැබේ. පාසල්, ගුරුවරුන්, පාසල් උපකරණ ආදිය සපයා දීම, මූල්‍යමය සහාය සැලසීම සහ ශිෂ්‍යත්ව වැනි වෙනත් ආකාරයේ සහාය සැලසීම කෙරෙහි මෙහිදී සැලකිල්ල යොමු කළ යුතුය.[263]

353. වඩා ප්‍රශස්ත අධ්‍යාපන සහ සෞඛ්‍ය පහසුකම් සැලසීම සහ අඛණ්ඩව සහාය සැලසීම් පවත්වාගෙන යාම, ළමා නිවාස සහ අනාථ නිවාස වෙත අවශ්‍ය මූල්‍යමය සහ ද්‍රව්‍යමය සහයෝගය සැලසීම යනාදිය මෙම ප්‍රයත්නයේදී ඉතාම වැදගත් වේ. [264]

354. ඇතැම් විට තම මව හෝ පියා ඇතුළුව සිය පවුල් වල ආදරණීයයන්ගේ අහිමිවීම සහ බිහිසුණු යුධ ගැටුම් වලට නිරාවරණය වී තිබීම හේතුවෙන් ඇතැම් ළමුන් කම්පන තත්ත්වයන්ගෙන් සහ වෙනත් මානසික රෝගී තත්ත්වයන්ගෙන් පීඩා විඳින බව උගත් පාඩම් හා ප්‍රතිසන්ධාන කොමිෂන් සභාව විසින් සැලකිල්ලට ගනු ලබන අතර, විධිමත් අධ්‍යාපන පද්ධතිය ඔස්සේ මෙන්ම, එවන් ප්‍රදේශ තුළ

[260] උගත් පාඩම් හා ප්‍රතිසන්ධාන කොමිසම් වාර්තාව, ඡේද 5.103 සහ 9.86

[261] උගත් පාඩම් හා ප්‍රතිසන්ධාන කොමිසම් වාර්තාව, ඡේද 5.112 සහ 9.87

[262] උගත් පාඩම් හා ප්‍රතිසන්ධාන කොමිසම් වාර්තාව, ඡේද 5.115 සහ 9.89

[263] උගත් පාඩම් හා ප්‍රතිසන්ධාන කොමිසම් වාර්තාව, ඡේද 5.118 සහ 9.93

[264] එම

ක්‍රියාත්මක වන වෙනත් ප්‍රජා සිවිල් සමාජ කණ්ඩායම් යනාදිය ඔස්සේ ප්‍රමුඛතාවය ලබා දිය යුතු කාරණයක් වශයෙන් මෙලෙස විශේෂ අවධානය අවශ්‍ය වන එවන් ළමුන් හඳුනාගැනීමට රජය ක්‍රියාකළ යුතු බවට දැඩිව නිර්දේශ කරනු ලැබේ.[265]

<u>වැඩිහිටි තැනැත්තන්</u>

355. යුධ ගැටුම් වලින් බලපෑමට ලක්වූ ප්‍රදේශ වල සිටින වැඩිහිටි තැනැත්තන් මහත් වූ දුක් වේදනාවන්ගෙන් පීඩාවට ලක් වී ඇති බවත්, ඇතැම් විට ස්වකීය පවුල්වල දරුවන් සහ ස්වකීය පවුල්වල දරු මුණුබුරන් යුද්ධයේ ඍජු වින්දිතයන් බවට පත් වීම හේතුවෙන් වසර ගණනාවක් තිස්සේ ස්වකීය විස්තෘත පවුල් වල අවශ්‍යතා සපුරාලීමට ඇතැම් විට ඔවුනට සිදු වී ඇති බවත් උගත් පාඩම් සහ ප්‍රතිසන්ධාන කොමිෂන් සභාව විසින් හඳුනාගනු ලැබේ. සමාජයේ මෙම පිරිස විසින් අත් විඳිනු ලැබූ ශාරීරික අසීරුතාවයන්, මානසික කම්පනය සහ ආර්ථික අසීරුතාවයන් නිසි පිළිගැනීමකට ලක් වීම අවශ්‍ය වේ. එම නිසා, උගත් පාඩම් සහ ප්‍රතිසන්ධාන කොමිෂන් සභාව විසින් පහත කාරණා දැඩිව නිර්දේශ කරනු ලැබේ:

අ. යුධ ගැටුම් වලින් බලපෑමට ලක් වූ පවුල් වල පවත්නා තත්ත්වයන් වැඩි දියුණු කිරීම කෙරෙහි යොමු වූ වැඩසටහන් තුළ, ස්වකීය විස්තෘත පවුල් පවත්වාගැනීම සහ ඒවායේ කටයුතු බලා ගැනීම තුළදී වැඩිහිටි තැනැත්තන් විසින් දරනු ලබන බර අඩු කිරීම උදෙසා වන ප්‍රතිපාදන ඇතුළත් විය යුතුය.

ආ. යුද්ධය හා බැඳුණු කම්පනය ඇතුළුව දීර්ඝකාලීන වශයෙන් නොසලකා හැරුණු සෞඛ්‍ය ගැටළු සහ ආබාධිතතාවයන් වැනි කාරණා හේතු කොට ගෙන ඇතිවන වැඩිහිටි තැනැත්තන්ගේ විශේෂ අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් රජය සහ අනෙකුත් පාර්ශ්වකරුවන් විසින් අවධානය යොමු කළ යුතු වෙයි.[266]

356. ආධ්‍යාත්මික සහ සංස්කෘතික ක්‍රියාකාරකම් වෙත පහසු සහ බාධාවකින් තොර ප්‍රවේශයක් ඇති කිරීමට පහසුකම් සැලසීම ඔස්සේ වැඩිහිටි තැනැත්තන්ට ස්වකීය කම්පන තත්ත්වයන් හසුරුවා ගැනීමට සහාය සැලසීමක් සිදු කළ හැකි බවට මතයක් උගත් පාඩම් හා ප්‍රතිසන්ධාන කොමිෂන් සභාව විසින් දරනු ලැබේ.[267]

<u>ආබාධිත තැනැත්තන්</u>

357. යුධ ගැටුම් වලට නිරාවරණය වූ තැනැත්තන්ගේ ජීවිත කෙරෙහි ඇති වී තිබෙන ඍජු බලපෑම හේතු කොට ගෙන, යුධ ගැටුම් වලින් බලපෑමට ලක් වූ ප්‍රදේශ තුළ සිටින ආබාධ සහිත තැනැත්තන් විශාල ප්‍රමාණයක් ඉතා අසීරු වාතාවරණයන් යටතේ ජීවත් වනු ඇති බවට අපේක්ෂා කරනු ලැබේ. ඔවුන්ගේ ආර්ථික, සමාජීය, සංස්කෘතික සහ ආධ්‍යාත්මික අවශ්‍යතාවයන් කෙරෙහි බලධාරීන්ගේ විශේෂ සහ කඩිනම් අවධානය යොමු වීම සිදු විය යුතුය.[268]

---

[265] උගත් පාඩම් හා ප්‍රතිසන්ධාන කොමිසම් වාර්තාව, ඡේද 5.119 සහ 9.94

[266] උගත් පාඩම් හා ප්‍රතිසන්ධාන කොමිසම් වාර්තාව, ඡේද 5.121 සහ 9.96

[267] උගත් පාඩම් හා ප්‍රතිසන්ධාන කොමිසම් වාර්තාව, ඡේද 5.122 සහ 9.97

[268] උගත් පාඩම් හා ප්‍රතිසන්ධාන කොමිසම් වාර්තාව, ඡේද 5.123 සහ 9.98

<u>අභ්‍යන්තරව අවතැන්වූ තැනැත්තන් (*IDPS)*</u>

358. අභ්‍යන්තර වශයෙන් අවතැන් වූ පුද්ගලයන් සම්බන්ධයෙන් වන ගැටලු පිළිබඳව අදහස් දැක්වීම් ගණනාවක් උගත් පාඩම් හා ප්‍රතිසන්ධාන කොමිෂන් සභාවට ලැබී ඇත. මෙලෙස යුද්ධයේ අවසාන අදියරයන් තුළදී අවතැන්වීම් වලට ලක් වූ අභ්‍යන්තරව අවතැන්වූ තැනැත්තන් බොහොමයක් මේ වන විට නැවත පදිංචි වී ඇත. කෙසේ වුවද, මෙලෙස නැවත පදිංචි කරවනු ලැබූ සහ ස්වකීය ජීවිත නැවත ගොඩනගා ගැනීම සඳහා වන ප්‍රයත්න දැරීමේ ක්‍රියාවලියෙහි තවදුරටත් නිරත වී සිටින පුද්ගලයන්ගේ අඛණ්ඩ අවශ්‍යතාවයන් කෙරෙහි දිගින් දිගටම අවධානය යොමුකිරීම තවදුරටත් අවශ්‍ය වේ.[269]

359. මෙලෙස නැවත පැමිණෙන පුද්ගලයන් බොහෝ දෙනෙක් තවමත් තාවකාලිකව අටවා ගත් වාසස්ථානවල ජීවත් වන බැවින් ඔවුන් හට ස්වකීය නිවාස පිලිසකර කර ගැනීමට හෝ ස්ථීර වාසස්ථාන ඉදි කර ගැනීමට අවශ්‍ය සහාය සැලසිය යුතු වෙයි. විශේෂයෙන්ම නිවාස ක්ෂේත්‍රය තුළ ඇතුළුව සිවිල් සමාජය වැනි ස්වේච්ඡා කණ්ඩායම් වල උපකාරය සහ සහයෝගය සැලසීම දිරිගැන්විය යුතු වේ. යටිතල පහසුකම් සැලසීම ද අවශ්‍ය වේ. ස්වේච්ඡාවෙන් නැවත පැමිණීම සම්බන්ධයෙන් ජාත්‍යන්තර වශයෙන් පිළිගත් මූලධර්මයන්ට අනුකූලව තමන්ගේ මුල් වාසභූමි ප්‍රදේශ වල නැවත පදිංචි වීම සඳහා පුද්ගලයෙකු සතුව පවත්නා නිදහසට ගරු කිරීමේ අවශ්‍යතාවයක් පවතී. මේ සම්බන්ධයෙන්, පුද්ගලයන්ට නැවත පදිංචි වීම සඳහා පවතින ප්‍රදේශ සම්බන්ධයෙන් සැලකීමේදී රජය විසින් අනුගමනය කරනු ලබන ප්‍රතිපත්ති වල වැඩි පැහැදිලිතාවයක් පැවතිය යුතු වන අතර, එවන් ප්‍රතිපත්ති පිළිබඳවත් තමන් වෙත පවත්නා විකල්ප තත්ත්වයන් පිළිබඳවත් ජනතාව[270] අතර වැඩි දැනුවත්භාවයක් ඇති කිරීම ද අවශ්‍ය වේ. එලෙස නැවත පදිංචි කරවනු ලබන පුද්ගලයන් හට ඉඩම් පිළිබඳ නීතිමය හිමිකාරිත්වය ලබා දීමේ අවශ්‍යතාවයක් ද පවතී.[271]

360. බිය, සැකය හෝ අවිශ්වාසය සහිත වටපිටාවක් නිර්මාණය වීමට තුඩු නොදෙන ආකාරයට ආරක්ෂක අවශ්‍යතාවයන් ඇතුළු ජනතාවගේ අනෙකුත් අවශ්‍යතා ආමන්ත්‍රණය කළ යුතු වේ. නැවත පදිංචි කිරීමෙහි ප්‍රතිලාභ නෙලා ගනිමින් අව්‍යාජ ප්‍රතිසන්ධාන ක්‍රියාවලියක් සපුරාගත හැකි වන්නේ ආරක්ෂාව සහ විශ්වාසය කැටි වුණු එවන් වටපිටාවක් තුළ පමණි.[272]

361. තමන්ගේම උවමනාවෙන් ශ්‍රී ලංකාව වෙත නැවත පැමිණ, නැවත පදිංචි වීමට අපේක්ෂාවෙන් සිටින දැනට ඉන්දියාවේ ජීවත් වන අවතැන් වූ පුද්ගලයින් සඳහා රජය විසින් පහසුකම් සැලසීමත්, ඔවුන් දිරිගැන්වීමත් සිදු කළ යුතුය. මේ සම්බන්ධයෙන් සැලකීමේදී ඔවුන් නැවත ශ්‍රී ලංකාව වෙත පැමිණෙනුයේ නම් ඔවුන් සඳහා වන අත්‍යවශ්‍ය පහසුකම් ලබා දීමට කටයුතු කළ යුතුය. ඉන්දියාවේ සිට මෙලෙස නැවත පැමිණෙන පුද්ගලයන් සඳහා සහ ස්වකීය ඉඩකඩම් වෙත නැවත පැමිණෙන දේශීය වශයෙන් අභ්‍යන්තරව අවතැන්වූ පුද්ගලයන් හට පවත්නා පහසුකම් සම්බන්ධයෙන් සැලකීමේදී වෙනස් කොට සැලකීම පිළිබඳ හැඟීමක් නිර්මාණය වීමට ඉඩකඩක් නොමැති බව සහතික කිරීමද වැදගත් වේ. අවතැන්වූ පුද්ගලයන් හට ශ්‍රී ලංකාව වෙත නැවත පැමිණීම සම්බන්ධයෙන් හොඳින් සලකා බලා තීරණයක් ගැනීමට හැකියාව ඇති වන පරිදි ශ්‍රී

---

[269] උගත් පාඩම් හා ප්‍රතිසන්ධාන කොමිසම් වාර්තාව, ඡේද 5.127 සහ 9.101

[270] උගත් පාඩම් හා ප්‍රතිසන්ධාන කොමිසම් වාර්තාව, ඡේද 5.131 සහ 9.103

[271] උගත් පාඩම් හා ප්‍රතිසන්ධාන කොමිසම් වාර්තාව, ඡේද 5.132 සහ 9.104

[272] උගත් පාඩම් හා ප්‍රතිසන්ධාන කොමිසම් වාර්තාව, ඡේද 5.135 සහ 9.107

ලංකාව සහ ඉන්දියාව අතර නිල ද්විපාර්ශ්වික සාකච්ඡා ක්‍රියාවලියක් සඳහා ද නිර්දේශ කරනු ලැබේ.[273]

<u>උතුරු සහ නැගෙනහිර මුස්ලිම් ජනතාව</u>

362. 1990 වසරේ ඔක්තෝබර් වැනි ඇත කාලයකදී එල්.ටී.ටී.ඊ. තර්ජන හේතු කොට ගෙන දිස්ත්‍රික්ක පහකින් අවතැන් ව සිටින අභ්‍යන්තරව අවතැන්වූ මුස්ලිම් ජාතිකයන්ගේ ගැටළුව පශ්චාත් යුධ අභියෝග අතර එක් ප්‍රධාන අභියෝගයක් වශයෙන් පවතින අතර මේ ඔස්සේ ප්‍රතිසන්ධාන ක්‍රියාවලිය කෙරෙහි සැලකිය යුතු බලපෑමක් ඇති වේ. දශක දෙකකට වඩා වැඩි කාලසීමාවක් තිස්සේ ඉතා අසීරු සහ දරුණු වටපිටාවන් තුළ ජීවත් වී ඇති මෙම අභ්‍යන්තර වශයෙන් අවතැන්වූ තැනැත්තන්ගේ තත්ත්වය සම්බන්ධයෙන් උගත් පාඩම් සහ ප්‍රතිසන්ධාන කොමිෂන් සභාව ඉදිරියේ අදහස් දැක්වීම් ඉතා විශාල ප්‍රමාණයක් සිදු කොට තිබුණි.[274]

363. ඉතා දීර්ඝ කාලසීමාවක් තිස්සේ පුත්තලම ප්‍රදේශයේ කඳවුරු තුළ ජීවත්වීමට සිදුවූ යාපනයේ මුස්ලිම් ජනතාවගේ මෙම භයංකර තත්ත්වය සම්බන්ධයෙන් ප්‍රමාණවත් අවධානයක් ලබා දී නොමැති බවද ප්‍රකාශ වී ඇත. එසේම, මෙම ගැටලුව පිළිබඳ අවධානය යොමු කරනු ලබන්නේ මැතිවරණ ව්‍යාපාරයන් අතරතුරදී පමණක් වන බව පෙන්වා දී ඇත. එසේම ඉතා දීර්ඝ කාලසීමාවන් තිස්සේ, එවන් වාතාවරණයන් යටතේ රාජ්‍ය අනුග්‍රහයෙන් ජීවත් වී ඇති එම පුද්ගලයන්, එම අනුග්‍රහය අත් හැර දමා, තමන්ගේ මුල් නිවෙස් හෝ ගම්මාන වෙත නැවත යාමට කැමැත්තක් දක්වනු ඇති ද යන්න පිළිබඳව ද විවිධ අදහස් මතු වී ඇත.[275]

364. රාජ්‍ය ප්‍රතිපත්තිය තුළ, නිවාස ගොඩනැගීම සඳහා වන මූල්‍යමය සහාය සැලසීම සහ අනෙකුත් ද්‍රව්‍යමය සහයෝගය සැලසීම් සහිත සහාය සැලසීමේ පැකේජයක් ද ඇතුලත් විය යුතු ය.[276]

365. අභ්‍යන්තරව අවතැන්වූ තැනැත්තන් සහ සත්කාරක ප්‍රජාවන් සමග පුළුල් අදහස් සාකච්ඡා කිරීම් පැවැත්වීමෙන් අනතුරුව මෙම ගැටළුව සම්බන්ධයෙන් විස්තීර්ණ රාජ්‍ය ප්‍රතිපත්තියක් සම්පාදනය කිරීම සඳහා සහ කල් පවත්නා විසඳුම් පිළිබඳව පරීක්ෂා කර බැලීම සඳහා විශේෂ කාරක සභාවක් පත් කළ යුතුය.[277]

<u>අදහස් ප්‍රකාශනයේ නිදහස සහ තොරතුරු දැනගැනීමේ අයිතිය</u>

366. තොරතුරු දැනගැනීමේ නිදහස සහතික කිරීම සහ ප්‍රවර්ධනය කිරීම උදෙසා වඩා ශක්තිමත් නීති සම්පාදනයන් සහ වඩා පූර්ව ක්‍රියාකාරී විධායක ක්‍රියාමාර්ග පැවතීමේ අවශ්‍යතාවය අවධාරණය කරමින් අදහස් දැක්වීම් ගණනාවක් උගත් පාඩම් සහ ප්‍රතිසන්ධාන කොමිෂන් සභාව හමුවට ඉදිරිපත් විය. මාධ්‍යවේදීන් සහ පුවත් වෙබ් අඩවි ඇතුළු මාධ්‍ය ආයතන ඉලක්ක කරමින් එල්ල වූ ප්‍රහාර සහ ඇති වූ බාධක සම්බන්ධයෙනුත්, මාධ්‍යවේදීන් මරා දැමීම සම්බන්ධයෙනුත් අඛණ්ඩව ඉදිරිපත් වන වාර්තා හේතුවෙන් සහ එවන් සිදුවීම් පිලිබඳ විමර්ශනය කොට නිගමන වලට එළඹීම සහ අපරාධකරුවන් යුක්තිය හමුවට පැමිණවීම තවදුරටත් සිදු වී නොමැති වීම හේතුවෙන් උගත්

---

[273] උගත් පාඩම් හා ප්‍රතිසන්ධාන කොමිසම් වාර්තාව, ඡේද 5.136 සහ 9.108

[274] උගත් පාඩම් හා ප්‍රතිසන්ධාන කොමිසම් වාර්තාව, ඡේද 5.137 සහ 9.109

[275] උගත් පාඩම් හා ප්‍රතිසන්ධාන කොමිසම් වාර්තාව, ඡේදය 5.148

[276] උගත් පාඩම් හා ප්‍රතිසන්ධාන කොමිසම් වාර්තාව, ඡේද 5.150 සහ 9.112

[277] උගත් පාඩම් හා ප්‍රතිසන්ධාන කොමිසම් වාර්තාව, ඡේද 5.152 සහ 9.113

පාඩම් සහ ප්‍රතිසන්ධාන කොමිෂන් සභාව දැඩි කනස්සල්ලට පත් වී ඇත. උගත් පාඩම් සහ ප්‍රතිසන්ධාන කොමිෂන් සභාවේ පුද්ගල හමු සිදු වෙමින් පවතින අවස්ථාවේම යාපනය ප්‍රදේශයේදී උදයන් පුවත්පතේ කතෘවරයාට එල්ල වූ නින්දිත ප්‍රහාරයෙන් උගත් පාඩම් සහ ප්‍රතිසන්ධාන කොමිෂන් සභාවද මවිතයට පත් විය. උගත් පාඩම් හා ප්‍රතිසන්ධාන කොමින් සභාව විසින් මෙම ප්‍රහාරය හෙළා දකිනු ලැබේ. එවන් ක්‍රියාකාරකම් හේතුකොට ගෙන ප්‍රතිසන්ධානය උදෙසා වන ඕනෑ ම ප්‍රයත්නයක් සඳහා ඉමහත් බාධක නිර්මාණය විය හැකිය.[278]

367. විශ්වීය වශයෙන් මූලික මිනිස් අයිතිවාසිකම් වශයෙන් සලකනු ලබන අදහස් ප්‍රකාශනයේ නිදහස සහ තොරතුරු දැනගැනීමේ අයිතිය ඕනෑම ප්‍රතිසන්ධාන ක්‍රියාවලියක් තුළ ඉතා ප්‍රබල භූමිකාවක් දරනු ලැබේ. මාධ්‍ය නිදහස සම්බන්ධයෙන් එල්ල වන සීමාවන් සහ බාධකයන් හේතු කොට ගෙන ජනවාර්ගික කණ්ඩායම් තුළ සහ එවන් කණ්ඩායම් අතර අවිශ්වාසය සහ බිය නිර්මාණය වන වටපිටාවක් ඇතිවීම කෙරෙහි දායක වීම පමණක් සිදු වන බැවින් ප්‍රජාතන්ත්‍රවාදී මූලධර්ම සහ අදාළ මූලික අයිතිවාසිකම් පිළිබඳව වගකීම් සපුරාලමින් මාධ්‍ය නිදහස වැඩි දියුණු කිරීම අත්‍යවශ්‍ය වේ. මේ හේතුවෙන් සිදුවනුයේ දැනට සිදුවෙමින් පවත්නා ප්‍රතිසන්ධාන ක්‍රියාවලිය කෙරෙහි බරපතල බාධාවන් නිර්මාණය කරමින් තොරතුරු සහ මතවාද ධනාත්මක ආකාරයෙන් හුවමාරු කර ගැනීම වැළකී යාමයි. ඒ අනුව උගත් පාඩම් හා ප්‍රතිසන්ධාන කොමිෂන් සභාව විසින් පහත කරුණු දැඩිව නිර්දේශ කරනු ලැබේ:[279]

(අ) මාධ්‍යවේදීන් සහ මාධ්‍ය ආයතන මුහුණ දෙන හිංසන සහ එල්ල වන ප්‍රහාර වැළැක්වීම උදෙසා සියලු ක්‍රියාමාර්ග ගත යුතු ය.

(ආ) එවන් අපරාධ සම්බන්ධයෙන් දඩුවම් පැමිණවීම සඳහා ක්‍රියාමාර්ග ගත යුතු වන අතර, අපරාධ යුක්ති පද්ධතිය කෙරෙහි ජනතා විශ්වාසය ගොඩනැගීමට හැකි වන පරිදි එවන් සිද්ධි පිළිබඳ විමර්ශනය කිරීමට, නඩු චෝදනා ගොනු කිරීමට සහ එවන් නඩු අදාළ පරිදි බැහැර කිරීමට ප්‍රමුඛතාවය ලබා දිය යුතු ය.

(ඇ) එවන් නීති විරෝධී ක්‍රියාකාරකම් පිළිබඳ අතීත සිදුවීම් නිසි පරිදි විමර්ශනය කළ යුතුය. මෑත අතීතය තුළදී ජනමාධ්‍යවේදීන් සහ මාධ්‍ය ආයතන ගණනාවකට මෙවැනි ප්‍රහාර එල්ල වී ඇති බව උගත් පාඩම් සහ ප්‍රතිසන්ධාන කොමිෂන් සභාව විසින් දැඩිව නිරීක්ෂණය කරනු ලැබේ. එවන් අපරාධ හේතු කොට ගෙන අධිකරණ පද්ධතිය කෙරෙහි පවත්නා ජනතා විශ්වාසය පළුදු වී යයි. එම නිසා, වැඩිදුර ප්‍රමාදයකින් තොරව අපරාධකරුවන් නීතියේ රැහැනට හසු කර ගැනීමට හැකි වන පරිදි අදාළ විමර්ශන කඩිනමින් අවසන් කිරීම සඳහා අවශ්‍ය පියවර ගන්නා ලෙස උගත් පාඩම් සහ ප්‍රතිසන්ධාන කොමිෂන් සභාව විසින් නිර්දේශ කරනු ලැබේ.

(ඈ) ප්‍රතිසන්ධාන ක්‍රියාවලිය කෙරෙහි දායක වෙමින් තොරතුරු හුවමාරු කරගැනීම සඳහා නිසි පරිදි සහාය සැලසෙන බැවින් උතුරු සහ නැගෙනහිර ප්‍රදේශ වල සිටින මාධ්‍ය නිලධාරීන්ගේ සංචරණය පිළිබඳ නිදහස රජය විසින් සහතික කළ යුතුය.

(ඊ) තොරතුරු දැනගැනීමේ අයිතිය සහතික කිරීමට හැකි වන පරිදි නීති බලාත්මක කළ යුතුය.

---

[278] උගත් පාඩම් හා ප්‍රතිසන්ධාන කොමිසම් වාර්තාව, ඡේදය 9.114

[279] උගත් පාඩම් හා ප්‍රතිසන්ධාන කොමිසම් වාර්තාව, ඡේද 5.156 සහ 9.115

<u>ආගම ඇදහීමේ, සමාගමයේ සහ සංචරණය වීමේ නිදහස</u>

368. පුද්ගලයන් හට ස්වකීය ආගම ඇදහීමේ කටයුතුවල නිදහසේ නිරත වීමට ඇති අයිතිය සහ සමාගමයේ සහ සංචරණය පිළිබඳ නිදහස වැනි අනෙකුත් නන් වැදෑරුම් නිදහසට ගරු කරනු ලබන, ඒවා ප්‍රවර්ධනය කරනු ලබන සහ එම අයිතීන් ආරක්ෂා කරනු ලබන වටපිටාවක් නිර්මාණය කිරීම ඕනෑම විශ්වසනීය සහ තිරසර ප්‍රතිසන්ධාන ක්‍රියාවලියකදී අවශ්‍ය වන බව උගත් පාඩම් සහ ප්‍රතිසන්ධාන කොමිෂන් සභාව විසින් ප්‍රකාශ කරනු ලැබේ.[280]

369. බාධාවීම් වලින් තොරව සාමකාමී උත්සව සහ රැස්වීම් සංවිධානය කිරීමට අවශ්‍ය නිදහස ජනතාව, ප්‍රජා නායකයන් සහ ආගමික නායකයන් සතුව තිබිය යුතුය. අනවශ්‍ය බාධාවීම් ඇති නොවන පරිදි මෑතකදී ජනතාව යළි පදිංචි කරන ලද ප්‍රදේශ වලට පැමිණ ස්වකීය මිතුරන් සහ ඥාතීන් බැහැදැකීමට විදේශ රටවල සිට පැමිණෙන අමුත්තන් හට ඉඩකඩ සලසා දිය යුතු බවට උගත් පාඩම් සහ ප්‍රතිසන්ධාන කොමිෂන් සභාව විසින් නිර්දේශ කරනු ලැබේ.[281]

පූර්වගාමී විමර්ශන කොමිෂන් සභා පිළිබඳ පසු විපරමක්

370. 2005 අගෝස්තු මස සිට සිදුවී ඇති බවට චෝදනා එල්ල වන බරපතල මානව හිමිකම් උල්ලංඝනය වීම් පිළිබඳව විමර්ශනය කිරීම සඳහා පත් කරන ලද ජනාධිපති විමර්ශන කොමිෂන් සභා වාර්තාවේ නිර්දේශ ක්‍රියාත්මක කරන ලෙසට උගත් පාඩම් සහ ප්‍රතිසන්ධාන කොමිෂන් සභාව විසින් දැඩිව නිර්දේශ කරනු ලබන අතර විශේෂයෙන් ම 2006 ජනවාරි මාසයේ ත්‍රිකුණාමලය ප්‍රදේශයේදී සිසුන් 5 දෙනෙකු මරණයට පත් වීම සහ 2006 අගෝස්තු මාසයේ දී ACF සංවිධානයේ සහාය සේවකයන් 17 දෙනෙකු මරණයට පත්වීම පිළිබඳ සිදුවීම් වලට අදාළ වරදකරුවන්ට එරෙහිව නීතිය ක්‍රියාත්මක කිරීම සහ වැඩිදුර විමර්ශන පැවැත්වීම සම්බන්ධයෙන් වන කාරණා පිළිබඳ නිර්දේශ මෙහිදී විශේෂයෙන්ම අදාළ වේ. එවන් ක්‍රියාමාර්ග ගැනීමක් ඔස්සේ නීතියේ ආධිපත්‍යයට ගරු කිරීම තහවුරු කෙරෙන බවට ප්‍රබල සංඥාවක් නිකුත් කෙරෙනු ඇති අතර, අනෙක් අතට ඒ ඔස්සේ සුවපත් කිරීමේ ක්‍රියාවලිය කෙරෙහිද ධනාත්මක දායකත්වයක් ඇති කිරීමට මග පාදා දෙයි. [282]

ජාත්‍යන්තර මානුෂීය නීතිය සහ ජාත්‍යන්තර මානව හිමිකම් නීතිය උල්ලංඝනය වීම සම්බන්ධයෙන් මෙම ජනාධිපති විමර්ශන කොමිසමේ නිරීක්ෂණ සහ උගත් පාඩම් සහ ප්‍රතිසන්ධාන කොමිෂන් සභාව විසින් සිදු කරන ලද නිර්දේශ

371. මෙම පරිච්ඡේදයේ ඉදිරි කොටස් තුළදී ජනාධිපති විමර්ශන කොමිෂන් සභාව වශයෙන් අප විසින් අවධානය යොමු කරනු ලබන්නේ ජාත්‍යන්තර නොවන සන්නද්ධ අරගලයේ අවසන් අදියර අතරතුරදී සිදුවූ බවට චෝදනා එල්ලවන ජාත්‍යන්තර මානුෂීය නීතිය සහ ජාත්‍යන්තර මානව හිමිකම් නීතිය උල්ලංඝනය වීමේ අවස්ථා පිළිබඳ උගත් පාඩම් සහ ප්‍රතිසන්ධාන කොමිෂන් සභාව විසින් අනාවරණය කරගත් කරුණු සහ එහි නිර්දේශ පිළිබඳවයි. විවිධ මාතෘකා යටතේ සුවිශේෂී කරුණු අනාවරණය කරගැනීම් පිළිබඳව සාකච්ඡා කරන අතරතුර අප විසින් මෙම කරුණු අනාවරණය කර ගැනීම් සහ නිර්දේශ පිළිබඳව අපගේ ස්වාධීන නිරීක්ෂණ ද අවශ්‍ය අවස්ථාවලදී ඒකාබද්ධ කොට ඇත. ශ්‍රී ලංකා රජය විසින් උගත් පාඩම් සහ ප්‍රතිසන්ධාන කොමිෂන් සභාව විසින් අනාවරණය කරගත් කරුණු විශේෂයෙන් ක්‍රියාත්මක කිරීම සඳහා දිගින් දිගටම කටයුතු

[280] උගත් පාඩම් හා ප්‍රතිසන්ධාන කොමිසම් වාර්තාව, ඡේද 5.159 සහ 9.116

[281] උගත් පාඩම් හා ප්‍රතිසන්ධාන කොමිසම් වාර්තාව, ඡේද 5.161, 5.162 සහ 9.118, 9.119

[282] උගත් පාඩම් හා ප්‍රතිසන්ධාන කොමිසම් වාර්තාව, ඡේද 5.163 සහ 9.120

කොට නොමැති බැවින් එලෙස සිදු කරන ලෙස අප විසින් මෙම පරිච්ඡේදය තුළ යෝජනා කරනු ලැබේ.

372. පරණගම සහ උදලාගම කොමිෂන් සභා දෙක මගින් අනාවරණය කරගෙන ඇති පරිදි ජාත්‍යන්තර මානුෂීය නීතිය සහ ජාත්‍යන්තර මානව හිමිකම් නීතිය උල්ලංඝනය වීම් පිළිබඳව එම කොමිෂන් සභා දෙකේ කරුණු අනාවරණය කරගැනීම් සම්බන්ධයෙන් අප විසින් තවදුරටත් අවධානය යොමු කිරීමට පෙර, 2021 නොවැම්බර් මස උගත් පාඩම් සහ ප්‍රතිසන්ධාන කොමිෂන් සභා වාර්තාව නිකුත් කිරීමෙන් අනතුරුව ශ්‍රී ලංකා රජය විසින් ස්ථාපනය කරන ලද වගවීම පිළිබඳ බහුවිධ යාන්ත්‍රණ පිළිබඳව මෙම අවස්ථාවේදී අප විසින් සාකච්ඡා කිරීම වඩා යෝග්‍ය වේ.

373. ශ්‍රී ලංකා රජය විසින් ස්ථාපනය කරන ලද මෙම යාන්ත්‍රණ පිළිබඳව සමස්ත විශ්ලේෂණයක් සිදු කිරීමේදී, එම නිර්දේශ වලට සහාය සැලසීම සඳහා වන ස්වකීය කැපවීම ශ්‍රී ලංකා රජය විසින් පෙනෙන්නට සලස්වා ඇත.

374. කෙසේ වුවද, පෙර කොමිෂන් සභා විසින් නිකුත් කරන ලද නිර්දේශ සෑහීමකට පත් විය හැකි ආකාරයෙන් ක්‍රියාවට නංවා නොමැති බවට මෙම ජනාධිපති විමර්ශන කොමිෂන් සභාව ඉදිරියේ සාක්ෂි ලබා දෙමින් කිහිප දෙනෙකු විසින් මතු කරන ලද අදහස යමෙකුට අවතක්සේරු කළ නොහැකිය. මෙම ජනාධිපති විමර්ශන කොමිෂන් සභාව ඉදිරියේ සාක්ෂි ලබා දුන් පෙර කොමිෂන් සභාවල සාමාජිකයන් දෙදෙනෙකු වන උගත් පාඩම් සහ ප්‍රතිසන්ධාන කොමිෂන් සභාවේ සාමාජික එච්.එම්.ජී.එස්. පලිහක්කාර මහතා සහ පරණගම කොමිෂන් සභාවේ[283] සභාපති මැක්ස්වල් පරණගම මහතා යන අය විසින් ඒකමතිකව ප්‍රකාශ කරන ලද ප්‍රබල අදහස වූයේ මෙයයි. නිදිවර්ජිත රාත්‍රීන් සහ අප්‍රතිහත උද්යෝගයන්ගේ නිමැවුමක් වූ මෙම සාර්ථක නිර්දේශ, ක්‍රියාත්මක කිරීමේ අදියර තුළදී දක්වන ලද ඇල්මැරුණු ස්වභාවය හේතු කොටගෙන ඒවා දැඩි අසාර්ථකත්වයට පත් වීම තුළින් තමන්ට ඇති වූ අපේක්ෂා භංගත්වය පිළිබඳව ඔවුන් දෙදෙනා විසින්ම අදහස් දක්වන ලදී.

375. පූර්වගාමී කොමිෂන් සභා විසින් ලබා දෙන ලද නිර්දේශ විශ්වසනීය ආකාරයෙන් ක්‍රියාවට නැංවීම තුළ ඇතිවූ අඩුපාඩු හේතු කොට ගෙන ශ්‍රී ලංකාව අද මුහුණ දෙන ආරවුල් තත්ත්වය නිර්මාණය වී ඇති බව ආචාර්ය ජේහන් පෙරේරා, ආචාර්ය පාකාසෝති සරවනමුත්තු, ඔස්ටින් ප්‍රනාන්දු සහ චන්දිම වික්‍රමසිංහ වැනි සාක්ෂිකරුවන් කිහිප දෙනෙකු විසින්ම එක හෙලාම ප්‍රකාශ කර සිටින ලදී.

376. අප විසින් පෙර සඳහන් කළ පරිදි, 2011 වර්ෂයේ නොවැම්බර් මසදී උගත් පාඩම් හා ප්‍රතිසන්ධාන කොමිෂන් සභා වාර්තාව එලිදැක්වීමත් සමග ක්‍රියාකාරකම් වලට ප්‍රවිෂ්ඨ වීමේ දැඩි උද්යෝගයක් නිර්මාණය විය. අදාළ නිර්දේශ ක්‍රියාවට නැංවීම සඳහා අව්‍යාජ ප්‍රයත්නයක් දරන ලදී. ඒ අනුව ශ්‍රී ලංකා රජය විසින් ස්වකීය පොරොන්දු සහ වගකීම් වලට ප්‍රතිචාර ලෙස මේ සම්බන්ධයෙන් පියවර කිහිපයක් ගනු ලැබූ බව ප්‍රතික්ෂේප කළ නොහැකි අතර, ඒවා කිහිපයක් පහත ආකාරයට දැක්විය හැකිය.

(1) ශ්‍රී ලංකාව සහ එක්සත් ජාතීන්ගේ සංවිධානය අතර ඒකාබද්ධ ප්‍රකාශනය (2009 මැයි 23).

(2) ශ්‍රී ලංකාව විසින් යෝජනා කොට එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කවුන්සිලය විසින් සම්මත කරන ලද (2009 මැයි 27) *AHRCS 11(1)* දරණ "මානව හිමිකම්

[283] මෙම ජනාධිපති විමර්ශන කොමිෂන් සභා අවසන් වාර්තාවේ 4 වන පරිච්ඡේදයේ ඇති සාක්ෂි ලබාදීම් බලන්න.

ප්‍රවර්ධනය සහ ආරක්ෂා කිරීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකාවට සහාය සැලසීම" නමින් ඉදිරිපත් වූ *S11/1* යෝජනාව[284]

(3) උගත් පාඩම් සහ ප්‍රතිසන්ධාන කොමිෂන් සභාවේ නිර්දේශ (උගත් පාඩම් සහ ප්‍රතිසන්ධාන කොමිසම - 2011 නොවැම්බර්)

377. උගත් පාඩම් සහ ප්‍රතිසන්ධාන කොමිෂන් සභාව විසින් ඉදිරිපත් කරන ලද නිර්දේශ අතර, අදාළ අවස්ථාව හා බැඳුණු දැඩි අවශ්‍යතාවයක් වශයෙන් පැන නැගුණු වඩා ප්‍රත්‍යක්ෂ නිර්දේශයක් වූයේ අතුරුදන් වූ පුද්ගලයන් සම්බන්ධයෙන් වන පැමිණිලි විමර්ශනය කිරීම සඳහා ජනාධිපති කොමිෂන් සභාවක් පත් කිරීම සඳහා වන නිර්දේශය වන අතර, පසුව 2013 අගෝස්තු මස 15 වන දින එම කොමිෂන් සභාව පත්කරන ලදී. පරණගම කොමිෂන් සභාව වෙත ඉතා දැඩි ආකර්ෂණයක් හිමි වූ අතර, ඒ වෙත ඉදිරිපත් වූ 20,000 ට අධික පැමිණිලි සංඛ්‍යාව තුළින් ඒ බව පැහැදිලි වේ.

<u>උගත් පාඩම් සහ ප්‍රතිසන්ධාන කොමිෂන් සභාව මගින් අනාවරණය කරගත් කරුණු</u>

378. උගත් පාඩම් සහ ප්‍රතිසන්ධාන කොමිෂන් සභාවේ 4 වන පරිච්ඡේදය තුළින්, වගවීම පිළිබඳ ගැටළුව සම්බන්ධයෙන්, ප්‍රාමාණික මට්ටමින් සහ ආනුභවික මට්ටමින් තොරතුරු දක්වනු ලැබේ. ප්‍රාමාණික මට්ටම තුළදී, එල්.ටී.ටී.ඊ. සංවිධානය වැනි රාජ්‍ය නොවන ක්‍රියාකරුවකුට එරෙහිව ක්‍රියාත්මක කරනු ලැබූ හමුදාමය ව්‍යාපාරයක අද්විතීය ස්වභාවය සහ අංග ලක්ෂණ සම්බන්ධයෙන් දැනට ක්‍රියාත්මක වන ජාත්‍යන්තර මානුෂීය නීතිය අදාළ කර ගැනීම පිළිබඳව වාර්තාව මගින් සාකච්ඡා කරනු ලැබේ. මේ තුළින් මතු වන අත්‍යන්ත තෝරා ගැනීම් සම්බන්ධයෙන් කටයුතු කිරීම සඳහා දැනට පවත්නා නීතියේ ප්‍රමාණවත් භාවය උගත් පාඩම් සහ ප්‍රතිසන්ධාන කොමිෂන් සභාව මගින් විශේෂයෙන් ප්‍රශ්න කරනු ලබන අතර, නීතිය යන්න "අවිනිශ්චිතතාවයෙන් අනාවරණය වී ඇති බවත්" එසේම, "අපැහැදිලි" සහ "නිසිපරිදි අර්ථ නිරූපණය නොවූ" සංකල්ප සමග මිශ්‍රව පවතින්නක් වශයෙනුත් නීතිය විස්තර කරනු ලැබේ.[285]

<u>සිවිල් වැසියන් අනතුරේ හෙළීම</u>

379. "සිවිල්වැසියා""සිවිල් ජනගහනය"සහ "සෘජුවම එදිරිවාදිකම්වල කොටසක් බවට පත්වීම" යන යෙදුම් ඇතුලුව ජාත්‍යන්තර මානුෂීය නීතියට අදාළ ප්‍රධාන යෙදුම්වල අර්ථ නිරූපණයන් සම්බන්ධයෙන් උගත් පාඩම් සහ ප්‍රතිසන්ධාන කොමිෂන් සභාවේ ඉතා වැදගත් නිරීක්ෂණයක් ඉදිරිපත් වී ඇත. විශේෂයෙන්ම සටන්කරුවන් සිවිල් ජනතාව වෙසෙන ප්‍රදේශ වලට ඇතුළත් වීමේදී ඇතුළුව මෙම යෙදුම් සඳහා නිශ්චිත අර්ථ නිරූපණ පැවතීම අවශ්‍ය වේ. කොමිෂන් සභාව පහත සඳහන් පරිදි නිරීක්ෂණය කරයි.

"*මෙහිදී බොහෝ විට සිදු වන්නේ රජයේ හමුදා නොවන සන්නද්ධ කණ්ඩායම්, සිතා මතාම තමන් සිවිල් වැසියන්ගෙන් වෙනස් කොට හඳුනාගැනීමෙන් වැළකී සිටීමට කටයුතු කරමින් (යුධ උපාය මාර්ගයක් වශයෙන්), සිවිල් වැසියන් අනතුරෙහි හෙලමින්, ප්‍රහාරයක් සිදු වන ආසන්නතම අවස්ථාව වන තෙක් සිවිල් වැසියන් අතරට වී හිඳිමින් ස්වකීය අනන්‍යතාවය සඟවා ගැනීමට කටයුතු කිරීමයි. මේ හේතු කොට ගෙන සිවිල් වැසියන්ගට කැමැත්තෙන් හෝ ඇතැම්*

[284] සභය සලසන ලද්දේ: ආජන්ටිනාව, බොස්නියා හර්සගොවිනියාව, කැනඩාව, චිලී රාජ්‍යය, ප්‍රංශය, ඉතාලිය, මෙක්සිකෝව, මුරුසිය, නෙදර්ලන්තය,කොරියානු සමුහාණ්ඩුව,ස්ලෝවැකියාව,ස්ලෝවිනියව ස්විට්සර්ලන්තය,යුක්රේනය,එක්සත් රාජධානිය සහ උරුගුවේ රාජ්‍යය

[285] උගත් පාඩම් හා ප්‍රතිසන්ධාන කොමිසම් වාර්තාව, ඡේද 4.4 සහ 4.5

අවස්ථාවලදී අකැමැත්තෙන් රජයේ පාර්ශ්වයන් නොවන සන්නද්ධ කණ්ඩායම් වල සමස්ත යුධ උපාය මාර්ගයන්හි කොටසක් බවට පත් වීමට සිදු වන වාතාවරණයක් නිර්මාණය වීමට මෙම තත්ත්වය තුඩු දෙන අතර ඒ හේතුකොටගෙන ජාත්‍යන්තර මානුෂීය නීතිය යටතේ සිවිල් වැසියන් හට හිමිකම පවතින ආරක්ෂාව පිළිබඳ කාරණය අනතුරෙහි හෙලන තත්ත්වයක් නිර්මාණය වේ.[286]

380. ඒ අනුව, එවන් තත්ත්වයන් සම්බන්ධයෙන් ප්‍රමාණවත් අයුරින් කටයුතු කිරීමේදී නීතියේ පවත්නා නොහැකියාව පිළිබඳව උගත් පාඩම් සහ ප්‍රතිසන්ධාන කොමිෂන් සභාව විසින් පෙන්වා දෙනු ලබන අතර, මෙම අප්‍රමාණවත් බව හේතුවෙන් ‘‘සැලකිය යුතු මට්ටමක අර්ථ ව්‍යාකූලත්වයක් ඇති වීම කෙරෙහි තුඩු දී ඇති බවත්, වෙන් කිරීමේ මූලධර්මය ප්‍රධාන ජාත්‍යන්තර මානුෂීය නීති මූලධර්ම, ප්‍රධාන නියමයන් (යෙදුම්) සම්බන්ධයෙන් එක් එක් සිද්ධිය අනුව වෙන් වෙන් වශයෙන් කටයුතු කළ යුතු තත්ත්වයක් නිර්මාණය කරනු ලැබේ."[287]

381. ආනුභවික හෝ සිද්ධිවාචක මට්ටමින් සැලකූ කල උගත් පාඩම් සහ ප්‍රතිසන්ධාන කොමිෂන් සභාව විසින් කරුණු අනාවරණය කරගැනීම් ගණනාවක් ඉදිරිපත් කරනු ලබන අතර ඒවා ප්‍රධාන ක්ෂේත්‍ර තුනක් යටතේ පුළුල්ව වර්ගීකරණය කළ හැකිය.

(1) සිවිල් වැසියන් හදිසි අනතුරු වලට ලක් වීම;

(2) සිවිල් වැසියන් සඳහා ආහාර, ඖෂධ සහ වාසස්ථාන සැපයීම; සහ

(3) අයිතිවාසිකම් උල්ලංඝනය වීම් සම්බන්ධයෙන් වෙන් වෙන් වශයෙන් විමර්ශනය කිරීම.

(1) සිවිල් වැසියන් හදිසි අනතුරු වලට ලක්වීම

382. සිවිල් වැසියන් තුවාල ලැබීමේ ගැටලුව පිළිබඳ පරීක්ෂා කර බැලීම සඳහා උගත් පාඩම් සහ ප්‍රතිසන්ධාන කොමිෂන් සභාව විසින් යුද්ධයේ අවසන් අදියර වල පැවති තත්ත්වය පිළිබඳ විස්තරාත්මක සහ පුළුල් තොරතුරු දැක්වීමක් සිදු කරනු ලැබේ. සටන් කිරීම සඳහා භාවිතා කරන ලද සටන් ක්‍රම සහ සටන්කරුවන් නොවන සාමාන්‍ය පුද්ගලයන් ආරක්ෂා කර ගැනීම සඳහාත් සිවිල් වැසියන්ගේ තුවාල ලැබීම් අවම කිරීම සඳහාත් ගනු ලැබූ ක්‍රියාමාර්ග පිළිබඳව මෙම වාර්තාව තුළ විස්තරාත්මකව කරුණු ඉදිරිපත් කරනු ලැබේ. විශේෂයෙන්ම සිවිල් වැසියන් ප්‍රාණ ඇපකරුවන් වශයෙන් රඳවා තබා ගත් සහ ඔවුන් විසින් බේදනීය ප්‍රතිවිපාකයන්ට මුහුණ දෙනු ලැබූ යුධ මුක්ත කලාප තුළ පැවති වාතාවරණයන් පිළිබඳව උභත් පාඩම් සහ ප්‍රතිසන්ධාන කොමිෂන් සභා විස්තර දැක්වීම තුළ පැහැදිලි කරනු ලැබේ.

383. කොමිෂන් සභාව හමුවට ඉදිරිපත් වී ඇති සාක්ෂි වලට අනුව, සිවිල් වැසියන් ආරක්ෂා කිරීම සහ මුදවා ගැනීම සඳහා ගත හැකි සියලු ක්‍රියාමාර්ග ගැනීමට රජය විසින් කටයුතු කොට ඇති බවට කොමිෂන් සභාව විසින් නිගමනය කරනු ලබන අතර යුධමය මෙහෙයුම් අතරතුරදී රජය විසින් සිවිල් වැසියන් හිතාමතා ඉලක්ක කර ගනු ලැබූ බවට එල්ල වන චෝදනාව බිඳ හෙලීමක් ඒ ඔස්සේ සිදු කරනු ලැබේ. ස්වකීය රැස්වීම් සහ තොරතුරු ලබා ගැනීම් ඔස්සේ උත්පාදනය කරන ලද කරුණු කාරණා මත පදනම්ව උගත් පාඩම් සහ ප්‍රතිසන්ධාන කොමිෂන් සභාව විසින් පහත පරිදි නිගමනය කරනු ලැබේ.

---

[286] එම

[287] එම

"ජාත්‍යන්තර මානුෂීය නීතිය උල්ලංඝනය වීම පිළිබඳව එල්ල වන චෝදනාවන් සන්දර්භය ලෙස ගෙන ශ්‍රී ලංකාවේ අත්දැකීම් ඇගයීමට ලක් කිරීමේදී, එල්.ටී.ටී.ඊ. සංවිධානය යටතේ තිබූ ප්‍රදේශ මුදවා ගැනීම සඳහා අනුගමනය කරන ලද යුධමය ක්‍රමෝපාය ඉතා පැහැදිලි අවබෝධයකින් යුතුව ක්‍රියාත්මක කරන ලද්දක් බවට උගත් පාඩම් සහ ප්‍රතිසන්ධාන කොමිෂන් සභාව සෑහීමකට පත් වන අතර ප්‍රමුඛතාවය ලබා දී තිබුණේ සිවිල් ජනතාව ආරක්ෂා කර ගැනීම කෙරෙහි ය. තවද යුද්ධයේ අවසාන අදියර තුළදී ආරක්ෂක බලකායන් ස්වකීය ක්‍රියාන්විතයක් ක්‍රියාත්මක කිරීමේ දී ඉතා අඩු වේගයකින් හිතාමතාම මෙහෙයුම් දියත් කොට ඇති බවට කොමිෂන් සභාව විසින් විශේෂයෙන් සඳහන් කරනු ලබන අතර, සිවිල් වැසියන් තුවාල ලැබීම අවම කිරීම උදෙසා සහ එම අවස්ථා මග හැර ගැනීම සඳහා හමුදාවන් විසින් ඉතා ප්‍රවේශම් සහගතව කිසියම් ක්‍රමෝපායයක් දියත් කරන ලද බවට සාක්ෂි ඒ ඔස්සේ ඉදිරිපත් වේ. [288]

384. එක්සත් ජාතීන්ගේ විද්වත් මණ්ඩල වාර්තාවට බොහෝ දුරට සමාන පරිදි කරුණු ඉදිරිපත් කරනු ලබන මානව හිමිකම් පිළිබඳ මහකොමසාරිස් කාර්යාලයේ ශ්‍රී ලංකාව පිළබඳ විමර්ශනය, හි සුවිශේෂී කරුණු දැක්වීම් වලට සාපේක්ෂව මෙම නිගමනය ප්‍රතිවිරුද්ධ වේ.[289]

385. තුවාල ලත් මුළු සිවිල් වැසියන් සංඛ්‍යාව පිළිබඳව තීරණය කිරීම සඳහා සිදු කරන ලද විවිධ තක්සේරු කිරීම් පිළිබඳ පරීක්ෂා කිරීමටද උගත් පාඩම් සහ ප්‍රතිසන්ධාන කොමිෂන් සභාව උත්සාහ කරනු ලැබේ.[290] කෙසේ වුවද, මෙම තක්සේරු කිරීම් කිසිවක් සත්‍ය සාක්ෂි මත පදනම්ව නොමැති බව උගත් පාඩම් සහ ප්‍රතිසන්ධාන කොමිෂන් සභාව විසින් අනාවරණය කරගනු ලබන අතර නිසි පරිදි කරුණු තහවුරු වී නොමැති බවට දක්වමින් මෙම ඇතැම් විශේෂිත සංඛ්‍යා ප්‍රතික්ෂේප කරනු ලැබේ. මේ පිළිබඳව නිශ්චිත සංඛ්‍යාවක් නිත්‍යානුකූලව ඉදිරිපත් කිරීම සිදු කිරීමේදී ඒ සඳහා භාවිතා කරනු ලබන ක්‍රමවේදය ඉතා විස්තරාත්මකව සහ ප්‍රවේසම් සහගතව සලකා බැලීමට අවශ්‍ය වීම හේතු කොට ගෙන නිශ්චිත සංඛ්‍යා පිළිබඳව නිත්‍යානුකූලව ප්‍රකාශ කිරීමට කොමිෂන් සභාව දක්වන පැකිලීම අවබෝධ කරගත හැකිය.

***(2)* ආහාර සහ ඖෂධ**

386. යුද්ධයේ අවසන් අදියර තුළදී ආහාර සහ ඖෂධ ආදිය සැපයීමටත්, අභ්‍යන්තර වශයෙන් අවතැන් වූ පුද්ගලයන් සඳහා අවශ්‍ය වාසස්ථාන සහ රැකවරණය ලබා දීමට අවශ්‍ය කටයුතු පිලියෙල කිරීම සඳහාත් රජය මගින් ගනු ලැබූ ප්‍රයත්නයන් පිළිබඳව උගත් පාඩම් සහ ප්‍රතිසන්ධාන කොමිෂන් සභා වාර්තාවේ විස්තර දැක්වීම් තුළ සඳහන් වේ. යුද්ධය අවසන් වූ වහාම අභ්‍යන්තරව අවතැන් වූ ජනතාව සිරභාරයේ තබා ගැනීම සම්බන්ධයෙන් වන සංකීර්ණ තත්ත්වයන් කෙරෙහිද උගත් පාඩම් සහ ප්‍රතිසන්ධාන කොමිෂන් සභාවේ විස්තර දැක්වීම් තුළ අවධානය යොමු කොට ඇත. මෙලෙස පුද්ගලයන් සිර භාරයේ තැබීම පිළිබඳව චෝදනා එල්ල වන නමුදු අවතැන් වූ ජනතාව සඳහා යම් නවාතැනක් සැපයීම සම්බන්ධයෙන් මතු වූ කඩිනම් අවශ්‍යතාවය කෙරෙහි අවධානය යොමු කරමින් මෙම චෝදනා ප්‍රතික්ෂේප කිරීමට හෝ නිෂ්ප්‍රභ කිරීමට උගත් පාඩම් සහ ප්‍රතිසන්ධාන කොමිෂන් සභාව විසින් උත්සාහ දරනු ලැබේ.

(3) නීති උල්ලංඝනය වීම් පිළිබඳ හුදකලා සිදුවීම්

---

[288] උගත් පාඩම් හා ප්‍රතිසන්ධාන කොමිසම් වාර්තාව, ඡේද 4.262

[289] එක්සත් ජාතීන්ගේ මණ්ඩලයේ වාර්තාව, ඡේදය 251

[290] උගත් පාඩම් හා ප්‍රතිසන්ධාන කොමිසම් වාර්තාව, ඡේද 4.240 සහ 4.260

387. ජාත්‍යන්තර මානුෂීය නීතිය ක්‍රමානුකූලව උල්ලංඝනය කිරීම සහ එවන් උල්ලංඝනය කිරීම් සඳහා තුඩු දී ඇති හුදකලා සිදුවීම්[291] අතර වෙනස උගත් පාඩම් සහ ප්‍රතිසන්ධාන කොමිෂන් සභාවේ අවධානයට ලක් වී ඇත. විවිධ පාර්ශ්වයන් කිහිපයකින් එකවර වෙඩි ප්‍රහාර එල්ල වීමේදී සිවිල් වැසියන් තුවාල ලැබීම් සිදුවී තිබීමට ඉඩ ඇති බව උගත් පාඩම් සහ ප්‍රතිසන්ධාන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන අතර, ආරක්ෂක හමුදාවන්ගේ වෙඩි තැබීමෙන් සිවිල් වැසියන් මිය යාම[292] සිදු වීමට ඉඩ තිබූ සුවිශේෂී සිදුවීම් පිළිබඳව උපුටා දක්වනු ලැබේ. තුවාල ලැබීම් සහ හදිසි තුවාල ලැබීම් පිළිබඳව භාවිතා කරන ලද ප්‍රතිපත්තියක් හේතු කොට ගෙන සිවිල් වැසියන්ගේ තුවාල ලැබීම් ප්‍රමාණය නොසලකා හැරිය හැකි තරමේ වන බවට රජය විසින් දරනු ලබන ස්ථාවරය මෙම කරුණු දැක්වීම් වලට වඩා වෙනස් හා ප්‍රතිවිරුද්ධ වේ.

388. එසේම යුධ අපරාධ පිළිබඳව චෝදනා එල්ල කරනු ලබන චැනල් 4 නාලිකාවේ විඩියෝ පටය සම්බන්ධයෙන් ද උගත් පාඩම් සහ ප්‍රතිසන්ධාන කොමිෂන් සභාව විසින් සාකච්ඡා කරන ලදී. කරුණු සැලකිය යුතු මට්ටමින් වෙනස් කොට තිබීම හේතු කොට ගෙන, රජය විසින් බලය පවරන ලද පරිදි නිර්මාණය වූ වීඩියෝපටය පිළිබඳ විද්වත් වාර්තා දෙකක් මගින්, මෙම වීඩියෝ පටය විශ්වසනීය නොවන බවට, කරුණු නිගමනය කරනු ලැබුව ද උගත් පාඩම් සහ ප්‍රතිසන්ධාන කොමිෂන් සභාව විසින් නිර්දේශ ලබා දී ඇත්තේ වීඩියෝ පටය සම්බන්ධයෙන් වැඩිදුර ස්වාධීන විමර්ශන අවශ්‍ය වන බව ය.[293]

389. මේ සම්බන්ධයෙන් උගත් පාඩම් සහ ප්‍රතිසන්ධාන කොමිෂන් සභාවේ නිගමනය වන්නේ රජය විසින් සිතා මතා ම ජාත්‍යන්තර මානුෂීය නීතිය උල්ලංඝනය කිරීමක් සිදු කොට නොමැති බවත් සැබැවින්ම ජාත්‍යන්තර මානුෂීය නීතිය උල්ලංඝනය වී ඇති හුදකලා සිදුවීම් කීපයක් සිදු වීමට ඉඩකඩ පවතින බවත් ය. ජනාධිපති විමර්ශන කොමිෂන් සභාව ස්වකීය තෙවන අතුරු වාර්තාව තුළ නිර්දේශ කරන ලද යාන්ත්‍රණයක් වන සත්‍ය සහ ප්‍රතිසන්ධාන කොමිෂන් සභාව විසින් මෙම සියලු චෝදනාවන් පිළිබඳව නැවත සලකා බලා කරුණු හැදෑරීමක් සිදු කළ යුතු බවට ජනාධිපති විමර්ශන කොමිෂන් සභාව විසින් ලබා දී ඇති අවසන් නිර්දේශ සැලකීමේදී ද මෙම කරුණු අනාවරණය කරගැනීම් තවදුරටත් සනාථ වන අතර එහි ආකෘතිය මෙම අවසන් වාර්තාවේ 6 වන පරිච්ඡේදය තුළ සාකච්ඡා කරනු ලැබේ.

<u>උගත් පාඩම් සහ ප්‍රතිසන්ධාන කොමිෂන් සභාවේ නිර්දේශ සංක්ෂිප්තව</u>

390. ඉහත ඡේද තුල විස්තරාත්මකව සාකච්ඡා කොට ඇති පරිදි, උගත් පාඩම් සහ ප්‍රතිසන්ධාන කොමිෂන් සභාවේ රැස්වීම් අතරතුර එහි අවධානයට ගෙන එන ලද ජාත්‍යන්තර මානුෂීය නීතිය උල්ලංඝනය වීම් සිදු විය හැකි එක් එක් හුදකලා සිදුවීම් සම්බන්ධයෙන් උගත් පාඩම් සහ ප්‍රතිසන්ධාන කොමිෂන් සභාව විසින් සුවිශේෂී නිර්දේශ ඉදිරිපත් කරනු ලැබේ. මේ එක් එක් සිද්ධි ආශ්‍රිතව සැලකීමේදී උගත් පාඩම් සහ ප්‍රතිසන්ධාන කොමිෂන් සභාව විසින් වැඩිදුර ක්‍රියාත්මක වීම සඳහා වන සුවිශේෂී යාන්ත්‍රණ නිර්දේශ කරනු ලැබේ. මෙම වගවීම පිළිබඳව උගත් පාඩම් සහ ප්‍රතිසන්ධාන කොමිෂන් සභාවේ ඇතැම් ප්‍රධාන නිර්දේශ කිහිපයක් පහතින් ලැයිස්තුගත කොට ඇත.

---

[291] උගත් පාඩම් හා ප්‍රතිසන්ධාන කොමිසම් වාර්තාව, ඡේදය 4.282

[292] උගත් පාඩම් හා ප්‍රතිසන්ධාන කොමිසම් වාර්තාව, ඡේදය 4.286

[293] උගත් පාඩම් හා ප්‍රතිසන්ධාන කොමිසම් වාර්තාව, ඡේදය 4.375

- ආරක්ෂක හමුදාවන් මරණයට පත්වීම සහ සිවිල් වැසියන් හට අනතුරු සිදුවීම පිළිබඳ හඟවන කාරණා විමර්ශනය කිරීම, ඒවා පිළිබඳ වැරදිකරුවන්ට චෝදනා ගොනු කිරීම[294]

- ෂෙල් වෙඩි ප්‍රහාර එල්ල කිරීම සම්බන්ධයෙන් වරදකාරිත්වය දරනුයේ කුමන පාර්ශ්වය ද යන්න පිළිබඳ සෙවීම සහ සැලකිල්ලකින් තොරව රෝහල් වෙත ෂෙල් ප්‍රහාර එල්ල කිරීමෙන් බලපෑමට ලක් වූ තැනැත්තන් හට සහන සැලසීම[295]

- වෛද්‍ය සැපයුම් පිළිබඳව තක්සේරු කළ හැකි සියලු අදාළ සාධක සලකා බැලීමට ලක් කරමින් යුද්ධයේ අවසාන දින කිහිපය අතරතුර යුධ ගැටුම් පැවති ප්‍රදේශ වල සිටි සිවිල් වැසියන් සඳහා වෛද්‍ය සැපයුම් ලබා දීමේ මානුෂීය ගැටලුව පිළිබඳව පරීක්ෂා කොට බැලීම[296]

- හමුදාවට යටත්වීම පිළිබඳ විශේෂිත සිද්ධි සම්බන්ධයෙන් විමර්ශන සිදු කිරීම, නිල වශයෙන් හමුදාව භාරයට පත් වීම සඳහා භාරවීමෙන් අනතුරුව සිදු වූ අතුරුදන් වීම් සම්බන්ධයෙන් වගකිව යුතු වන හමුදා සාමාජිකයන්ට එරෙහිව චෝදනා ගොනු කිරීම [297]

- සිවිල් වැසියන්ඉලක්ක කරගනිමින් සිතාමතා සිදු කරන ලද ප්‍රහාර පිළිබඳව වාර්තාවේ ඇති සිදුවීම් විමර්ශනය කිරීම, ඒවා සම්බන්ධයෙන් යෝග්‍ය නීතිමය ක්‍රියාමාර්ග ගැනීම[298]

- චැනල් 4 නාලිකාවේ වාර්තාමය වීඩියෝ පටය තුල ඇති චෝදනාවල සත්‍ය අසත්‍යභාවය නිර්ණය කර ගැනීම සඳහා ස්වාධීන විමර්ශනයක් ආරම්භ කිරීම[299]

- චෝදනා එල්ල වන පුද්ගල අතුරුදන්වීම් සම්බන්ධයෙන් සහ විශේෂයෙන්ම ආරක්ෂක හමුදාවන්ට භාර වීමෙන් අනතුරුව සිදුවූ පුද්ගල අතුරුදන්වීම් සම්බන්ධයෙන් විමර්ශනය කිරීම සඳහා විශේෂ විමර්ශන කොමසාරිස්වරයෙකු පත් කිරීම[300]

- නීති විරෝධී සන්නද්ධ කණ්ඩායම් පිළිබඳව විමර්ශන පවත්වා ඒවා සම්බන්ධයෙන් චෝදනා ගොනු කිරීම.[301]

<u>වගවීම වැඩි දියුණු කිරීමේදී සංක්‍රාන්ති යුක්තිය හා උගත් පාඩම් හා ප්‍රතිසන්ධාන කොමිෂන් සභාව</u>

391. සංක්‍රාන්ති යුක්ති[302] සංකල්පයන් හා සමගාමීව වින්දිත කේන්ද්‍රීය ප්‍රවේශයක් වැඩි දියුණු වී ඇති බව මෙම අවස්ථාවේදී අවධාරණය කිරීම යෝග්‍ය වේ. කිසියම් වින්දිතයකු සංක්‍රාන්ති යුක්තිය ඉටු

---

[294] උගත් පාඩම් හා ප්‍රතිසන්ධාන කොමිසම් වාර්තාව, ඡේදය 4.286

[295] උගත් පාඩම් හා ප්‍රතිසන්ධාන කොමිසම් වාර්තාව, ඡේදය 4.294

[296] උගත් පාඩම් හා ප්‍රතිසන්ධාන කොමිසම් වාර්තාව, ඡේදය 4.311

[297] උගත් පාඩම් හා ප්‍රතිසන්ධාන කොමිසම් වාර්තාව, ඡේදය 4.319

[298] උගත් පාඩම් හා ප්‍රතිසන්ධාන කොමිසම් වාර්තාව, ඡේදය 4.360

[299] උගත් පාඩම් හා ප්‍රතිසන්ධාන කොමිසම් වාර්තාව, ඡේදය 4.375

[300] උගත් පාඩම් හා ප්‍රතිසන්ධාන කොමිසම් වාර්තාව, ඡේදය 5.48

[301] උගත් පාඩම් හා ප්‍රතිසන්ධාන කොමිසම් වාර්තාව, ඡේදය 5.77

[302] සයිමන් රොබින්ස්" 'විත්දිතයන් කේන්ද්‍රකරගත් සංක්‍රාන්ති යුක්තිය: නේපාලයේ ගැටුම් වලින් පසු අතුරුදහන් වූ පවුල්වල අවශ්‍යතා අවබෝධ කර ගැනීම' [2011] 5(1) සංක්‍රාන්ති යුක්තිය පිළිබඳ ජාත්‍යන්තර සඟරාව 75-98: ජෙනාත් "සංක්‍රාන්ති යුක්තියේ චිකිත්සක මානයන්: ජාත්‍යන්තර සහ සත්‍ය කොමිෂන් සභාවල විත්තවේගී ප්‍රකෘතිමත්වීම සහ විත්දිත

කිරීම උදෙසා දේශීය වශයෙන් නිර්මාණය කොට ඇති සත්‍ය සෙවීමේ යාන්ත්‍රණයක අපේක්ෂාව තුළ සිටිනුයේ නම්, මෙම යාන්ත්‍රණය ඉදිරියේ චින්දිතයන් විසින් ඉදිරිපත් කරනු ලබන අදහස් දැක්වීම්, මෙම යාන්ත්‍රණය ඔස්සේ අත්පත් කරගනු ලබන සත්‍යය, යුක්තිය සහ හානිපූරණය පිළිබඳ සංකල්ප නිර්මාණය වීම කෙරෙහි හේතු විය හැකිය. මෙහිදී මතුවන පැනය වනුයේ, උගත් පාඩම් සහ ප්‍රතිසන්ධාන කොමිෂන් සභා යාන්ත්‍රණය තුළ මෙම ක්‍රියාවලීන් තුන කිසි ලෙසකින් හෝ දැකගත හැකිවන්නේද යන්නයි. යුක්තිය, සත්‍යය සහ හානිපූරණය යන කාරණා මගින් සංක්‍රාන්ති යුක්තියේ අවම තත්ත්වයන් නිර්මාණය කරන්නේය යන්නට පටහැනිව කතා කළ නොහැකි අතර, යමෙකු විසින් උගත් පාඩම් හා ප්‍රතිසන්ධාන කොමිෂන් සභාවේ කරුණු අනාවරණය කර ගැනීම් සාපේක්ෂව බැලීමේදී, මෙම මූලික සංකල්ප, ප්‍රතිසන්ධානය සහ සාමය ගොඩනැගීම සඳහා අත්‍යවශ්‍ය වන අනුබද්ධ කාරණා වශයෙන් උගත් පාඩම් සහ ප්‍රතිසන්ධාන කොමිෂන් සභාවේ කරුණු අනාවරණය කිරීම් සහ නිර්දේශ තුල පැහැදිලිව ඉස්මතු වන බව පෙනෙන්නට ඇත.

392. අවිවාදයෙන්ම, අප විසින් උගත් පාඩම් සහ ප්‍රතිසන්ධාන කොමිෂන් සභාවේ නිර්දේශ වශයෙන් ඉහතින් සලකා බලන ලද සියලු ම කාරණා තුළ සත්‍යය, යුක්තිය සහ හානිපූරණය පිළිබඳ සංරචක අන්තර්ගත වී ඇත. මෙම සංදර්භයට අනුව සත්‍යය, යුක්තිය සහ හානිපූරණය පිළිබඳ ගවේෂණය කිරීම අවශ්‍යතාවයක් බවට පත් වේ. [303]

<u>සත්‍යය</u>

393. දුර්විපාක නොලබා සිටීමට එරෙහිව සටන් කිරීම සඳහා ක්‍රියාත්මක වීම ඔස්සේ මානව හිමිකම් ප්‍රවර්ධනය සහ ආරක්ෂා කිරීම පිළිබඳ යාවත්කාලීන කළ මූලධර්ම කට්ටලයේ තෙවන මූලධර්මය තුළින් සත්‍යය දැන ගැනීම සඳහා පවත්නා හිමිකම පිළිගැනීමට ලක් කරනු ලැබේ.

"සෑම පුද්ගලයෙකු හටම *සාහසික අපරාධ සම්බන්ධයෙන් වන අතීත සිදුවීම් පිළිබඳ සත්‍යය දැන ගැනීමට අභිමි කළ නොහැකි හිමිකමක් පවතී. මහා පරිමාණ හෝ පද්ධතිමය උල්ලංඝනය වීම් ඔස්සේ, එවන් සාහසික අපරාධ සිදු කිරීම සඳහා හේතු වූ තත්ත්වයන් හා හේතු කාරණා පිළිබඳව දැනගැනීමට අභිමි කළ නොහැකි හිමිකමක් සෑම පුද්ගලයෙකු සතුවම පවතී.*[304]

394. සත්‍යය ප්‍රකාශ කිරීම සඳහා වන අත්‍යාජ කැපවීමක් සඳහා චින්දිත කේන්ද්‍රීය ප්‍රවේශයක් අවශ්‍ය වේ. සත්‍යය දැනගැනීම පිළිබඳ හිමිකම සම්බන්ධයෙන් මෑතකදී සිදු කරන ලද එක්සත් ජාතීන්ගේ අධ්‍යයනයක් තුළින් මෙම හිමිකම පිළිබඳ විස්තරාත්මකව කරුණු දක්වන අතර "සිදු වූ සිදුවීම් පිළිබඳ සියලුම සහ සම්පූර්ණ සත්‍යය, ඒවායේ සුවිශේෂී වාතාවරණයන්, ඒවා සඳහා සහභාගි වූයේ කවුරුන්ද, යනාදිය පිළිබඳ දැනගැනීම, හා එම උල්ලංඝනය වීම් සිදු වූ වාතාවරණයන් පිළිබඳව මෙන් ම ඒවා සඳහා අදාළ වූ හේතු කාරණා පිළිබඳව දැන ගැනීම ඇතුළුව අදාළ සිදුවූ සිදුවීම්

තෘප්තිමත්භාවය' [2011] 11(2) ජාත්‍යන්තර අපරාධ නීති සමාලෝචනය 263-298; Stephane Leman-Langlois: Mobilizing Victimization: දකුණු අප්‍රිකානු සත්‍ය සහ ප්‍රතිසංධාන කොමිෂන් සභාවේ චින්දිත කේන්ද්‍රීය ප්‍රවේශයක් සකස් කිරීම [2000] 33(1) La Victimologie: Quelques Enjeux 145-165

[303] සංක්‍රාන්ති යුක්ති ක්‍රියාවලීන් වලදී සත්‍යය දැනගැනීමේ අයිතිය – නටාෂා ස්ටේමන්කොවික්ග්, බ්‍රිල් නිජොෆ්, ජාත්‍යන්තර නීතිය සහ රාජ්‍ය පාලනයේ දෘෂ්ටිකෝණ, සංක්‍රාන්ති මානව නීතිමීමංසාවේ සත්‍ය දැනගැනීම සඳහා ඇති සියුම් අයිතිය, ජේම්ස් ඒ. ස්වීනි, ජාත්‍යන්තර සහ සන්සන්දනාත්මක නීති ත්‍රෛමාසිකය (ICLQ) 67 වෙනි වෙළුම, 2018 අප්‍රේල්, පි. 387

[304] 2005 පෙබරවාරි 8 E/CN.4/2005/102/Addl.1

පිළිබඳ සියලු සහ සම්පූර්ණ සත්‍ය දැනගැනීම ''යනාදිය මෙම අයිතිය තුළින් හඟවනු ලබන බව උපකල්පනය කොට ඇත.[305]

395. අතුරුදන් වූ තැනැත්තන් පිළිබඳ ගැටලුව සම්බන්ධයෙන් කටයුතු කරන ආකාරය තුළ උගත් පාඩම් හා ප්‍රතිසන්ධාන කොමිෂන් සභාව විසින් මෙම සත්‍යය දැන ගැනීමේ හිමිකම පිළිබඳ වඩා ප්‍රශස්ත අයුරින් හඳුනාගැනීමට ලක් කරනු ලැබේ. ඒ තුළ පහත සඳහන් පරිදි අවධාරණය කරනු ලැබේ:

''තම ආදරණීයයන් සිටින්නේ කොතැනකද යන්න පිළිබඳ වගතුග දැනගැනීමට අයිතියක් අතුරුදන් වූ තැනැත්තන්ගේ ඥාතීන් සතුව පවතී. එම පුද්ගලයාට සිදුවූයේ කුමක්ද යන්න පිළිබඳව සත්‍යය දැන ගැනීමටත් අදාළ කාරණය පිළිබඳ කටයුතු ඒ ඔස්සේ අවසන් කිරීමටත් අයිතියක් ඔවුන් සතුව පවතී. ප්‍රතිසන්ධානය යනු ක්‍රියාවලියකි. එම පුද්ගලයන් යුධ ගැටුම් වල වින්දිතයන් වන්නේද නොඑසේ නම් එල්.ටී.ටී.ඊ. ත්‍රස්තවාදයේ වින්දිතයන් වන්නේද යන්න පිළිබඳව සැලකීමකින් තොරව, එම දීර්ඝ සහ සංකීර්ණ ගමන් මග තුළ ගනු ලබන පළමු අසීරු සහ චිත්තවේගාත්මක පියවර වන්නේ එම ක්‍රියාවලිය සමාප්ත කිරීමයි." [306]

396. මෙහිදී උගත් පාඩම් හා ප්‍රතිසන්ධාන කොමිෂන් සභාව විසින් විශේෂයෙන්ම කාන්තාවන්ගේ අයිතීන් හඳුනාගැනීමට ලක් කරනු ලැබේ. ඒ තුළ පහත පරිදි තීරණය කොට ඇත.

''අතුරුදන් වූ තැනැත්තන්, පැහැර ගැනීම්, අත්තනෝමතික ලෙස රඳවාගැනීම්, දීර්ඝකාලීන සහ අවිනිශ්චිත කාලසීමා සඳහා රඳවා ගැනීම් සහ අතුරුදන්වීම් සම්බන්ධයෙන් වන ගැටලු වලදී බොහෝ විට නිවසේ ආදායම් උපයන්නා වශයෙන් මෙන් ම පවුලට අවශ්‍ය ආරක්ෂාව සපයන්නා වශයෙන් ද ඉතා ප්‍රධාන සහ සුවිශේෂී භූමිකාවක් දරනු ලබන පවුලේ ස්වාමිපුරුෂයන්, පුතුන්, පියවරුන් සහ සහෝදරයන් ආදීන් බොහෝ විට වින්දිතයන් බවට පත් වන බැවින් ඒ හේතු කොට ගෙන මේ තත්ත්වය යටතේ කාන්තාවන් කෙරෙහි ඍජු බලපෑමක් ඇති වේ."[307]

397. ඒ අනුව, ස්වකීය ආදරණීයයන් සිටිනුයේ කොතැනකද යන්නත්, ඒ හා බැඳුණු සත්‍යය දැනගැනීම සඳහාත් කාන්තාවන් හට පවත්නා හිමිකම කොමිෂන් සභාව මගින් පැහැදිලිව පිළිගැනීමට ලක් කරනු ලැබේ. [308]

398. විනිවිදභාවය සහතික කිරීම සම්බන්ධයෙන් උගත් පාඩම් සහ ප්‍රතිසන්ධාන කොමිෂන් සභාවේ කැපවීම තුළින්ම සත්‍යය දැනගැනීම සඳහා ඇති අයිතිය ප්‍රවර්ධනය කරනු ලැබේ. ජනතා හමු සියල්ලෙහි පිටපත් හා අනු පිටපත් පළකිරීම සඳහා ගනු ලැබූ තීරණය ඔස්සේ සාක්ෂිකරුවන්ගේ මුල් සාක්ෂි ලබා දීම් පිළිබඳ අවබෝධය ලබා දීම පමණක් නොව, උගත් පාඩම් සහ ප්‍රතිසන්ධාන කොමිෂන් සභාවේ ක්‍රියාවලීන් සම්බන්ධයෙන් එය විවේචනය කිරීම සඳහා අවශ්‍ය වන අවාහජ අවකාශයන් නිර්මාණය කර දීම ද සිදු විය. සාක්ෂිකරුවන් විසින් ලබා දුන් සාක්ෂි වල කිසිදු වෙනස්කිරීමකට ලක් නොකළ පිටපත් ජනතාව විසින් පරීක්ෂා කර බැලීමට හැකි පරිදි, ජනතාවට ලබා ගත හැකි ආකාරයට පවතින බැවින්, සත්‍යය සොයාගැනීම සඳහා මෙම අනු පිටපත් වලින් ඉතා වැදගත් දායකත්වයක් සලසනු ලැබේ. මෙම සන්දර්භය සැලකීමේදී, උගත් පාඩම් සහ

---

[305] සත්‍යය දැනගැනීමේ හිමිකම පිළිබඳ මානව හිමිකම් අධ්‍යයනය සඳහා එක්සත්ජාතීන්ගේ කොමිෂන් සභාව, පෙබරවාරි 8

[306] උගත් පාඩම් හා ප්‍රතිසන්ධාන කොමිසම් වාර්තාව, ඡේද 5.37 සහ 9.49

[307] උගත් පාඩම් හා ප්‍රතිසන්ධාන කොමිසම් වාර්තාව, ඡේද 5.117

[308] ජනාධිපති විමර්ශන කොමිෂන් සභාවේ අවසන් වාර්තාවේ කාන්තාවන් සම්බන්ධයෙන් 6 වන පරිච්ඡේදය බලන්න (නිර්දේශ පිළිබඳ ඉදිරි ගමන් මග)

ප්‍රතිසන්ධාන කොමිෂන් සභාව විසින් වගකීම් සහගත අයුරින් කටයුතු කිරීම තුළදී සත්‍යය යන්න එහි ඉතා වැදගත් හරයක් වශයෙන් පවත්වා ගනියි.

යුක්තිය

399. දුර්විපාක නොලබා සිටීමට එරෙහිව කටයුතු කිරීමේ ක්‍රියාකාරීත්වය ඔස්සේ මානව හිමිකම් ප්‍රවර්ධනය සහ ආරක්ෂා කිරීම පිළිබඳ යාවත්කාලීන කළ මූලධර්ම මාලාවේ පළමුවන මූලධර්මය තුළ යුක්තිය සහතික කිරීම සම්බන්ධයෙන් රාජ්‍යයන් සතු ප්‍රධාන සහ අනිවාර්ය වගකීම් කිහිපයක් පිළිබඳව විශේෂයෙන් දක්වනු ලැබේ. අයිතිවාසිකම් උල්ලංඝනය වීම් පිළිබඳ විමර්ශනය කිරීමේ වගකීම සහ අපරාධ කටයුතු සඳහා සම්බන්ධ වී ඇති බවට සැක කරනු ලබන පුද්ගලයන්ට එරෙහිව චෝදනා ගොනු කිරීම, චෝදනා විභාග කිරීම සහ නිසි පරිදි දඬුවම් ලබා දීම සිදු වන බවට සහතික කිරීම ඔස්සේ, විශේෂයෙන්ම යුක්තිය පිළිබඳ විෂයපථය ආශ්‍රිතව අපරාධකරුවන් සම්බන්ධයෙන් යෝග්‍ය ක්‍රියාමාර්ග ගැනීමේ වගකීම්, මෙම වගකීම් වලට ඇතුළත් වේ.

400. උගත් පාඩම් සහ ප්‍රතිසන්ධාන කොමිෂන් සභාව මගින් විපාකදායී යුක්තිය සහ ප්‍රතිෂ්ඨාපන යුක්තිය පිළිබඳ ගැටලු සම්බන්ධයෙන් විවෘතව සහ පැහැදිලිව කටයුතු කිරීමක් සිදු නොවේ. කෙසේ වුවද, උගත් පාඩම් සහ ප්‍රතිසන්ධාන කොමිෂන් සභාවේ විධිනියෝගය විපාකදායී යුක්තිය සහ ප්‍රතිෂ්ඨාපන යුක්තිය යන දෙඅංශයේම එකතුවකි. එහි විධිනියෝගයට අදාළ එක් අංශයක් තුළින් මතු වන පැනය වන්නේ කවර හෝ පුද්ගලයෙකු, කණ්ඩායමක් හෝ ආයතනයක් සෘජුව හෝ වක්‍රව වගකීම දරනුයේද යන්නයි. ඒ පරිද්දෙන්, බැලූ විට, උගත් පාඩම් සහ ප්‍රතිසන්ධාන කොමිෂන් සභාවේ විධිනියෝගය තුළින් ජාත්‍යන්තර මානුෂීය නීතිය හෝ මානව හිමිකම් නීතිය උල්ලංඝනය වීම් පිළිබඳ වගකීම නිර්ණයනය කිරීමක් වක්‍රව සිදු කරනු ලැබේ. ජාත්‍යන්තර මානුෂීය නීතිය සහ ජාත්‍යන්තර මානව හිමිකම් නීතිය උල්ලංඝනය වීම පිළිබඳ සුවිශේෂී අවස්ථාවන් සම්බන්ධයෙන් විමර්ශන සිදුකිරීම, චෝදනා ගොනු කිරීම සහ දණ්ඩන ක්‍රියාමාර්ග ගැනීම නිර්දේශ කිරීම ඔස්සේ උගත් පාඩම් සහ ප්‍රතිසන්ධාන කොමිෂන් සභාව විසින් මෙම විධිනියෝගය ක්‍රියාත්මක කරන ලදී.

401. සිවිල් වැසියන්[309] තුවාල ලැබීම සහ අනතුරුවලට ලක්වීම සම්බන්ධයෙන් මෙන් ම පැහැර ගැනීම්, බලහත්කාරයෙන් අතුරුදන් කරවීම් සහ අත්තනෝමතික අයුරින් රඳවා ගැනීම[310] වැනි මානව හිමිකම් උල්ලංඝනය වීම් සම්බන්ධයෙන් හා නීති විරෝධී සන්නද්ධ කණ්ඩායම්[311] විසින් සිදු කරන ලද අයිතිවාසිකම් උල්ලංඝනය කිරීම් සම්බන්ධයෙන් උගත් පාඩම් සහ ප්‍රතිසන්ධාන කොමිෂන් සභාව විසින් ලබා දී ඇති නිර්දේශ බොහොමයක් තුළින් අනාවරණය වනුයේ, විපාකදායී සහ ප්‍රතිෂ්ඨාපන යුක්තියේ ඒකාබද්ධ වීමකි. ඒ අනුව යුක්තිය ප්‍රවර්ධනය කරමින් වගවීම සහතික කිරීම උදෙසා මෙම නිර්දේශ කඩිනමින් ක්‍රියාත්මක කළ යුතු බවට කිසිදු සැකයක් නොමැත.

හානිපූරණ කටයුතු

402. මානව හිමිකම් උල්ලංඝනය වීම් වැළැක්වීම, එවැනි සිද්ධි පිළිබඳ විමර්ශනය කිරීම සහ ඒවා සඳහා දඬුවම් ලබා දීම සම්බන්ධයෙන් රජය සතු අනිවාර්ය වගකීමට අමතරව, අපරාධකරුවන් හට දඬුවම් පැමිණවීමේ හැකියාවක් නොමැති අවස්ථාවකදී වුවද, වින්දිතයන් සහ වින්දිතයන්ගේ

---

[309] උගත් පාඩම් හා ප්‍රතිසන්ධාන කොමිසම් වාර්තාව, ඡේද 4.311, 4.319 4,360 සහ 9.14

[310] උගත් පාඩම් හා ප්‍රතිසන්ධාන කොමිසම් වාර්තාව, ඡේද 5.34

[311] උගත් පාඩම් හා ප්‍රතිසන්ධාන කොමිසම් වාර්තාව, ඡේද 5.77

පවුල් සඳහා සදාචාරාත්මක සහයෝගය සැලසිම සහ ද්‍රව්‍යමය හානිපූරණ කටයුතු සිදු කිරීම සඳහා ස්වාධීන වගකීමක්ද රජය සතුව පවතින බව මානව හිමිකම් පිළිබඳ අන්තර් ඇමරිකානු අධිකරණයේ නවතම *Velasquez Rodriguez* නඩුවේදී තීරණය කොට ඇත. [312]

403. හානිපූරණය කිරීම් විවිධාකාර ස්වරූපයෙන් සිදු විය හැකි අතර, අයිතිවාසිකම් ප්‍රතිෂ්ඨාපනය කිරීම, මූල්‍යමය වන්දි ලබා දීම, වෛද්‍යමය සහ මනෝ විද්‍යාත්මක සේවා සැලසිම, සෞඛ්‍ය රැකවරණය, අධ්‍යාපනික සහයෝගය, දේපළ නැවත ලබා දීම හෝ දේපළ අහිමිවීම් සඳහා වන්දි ලබා දීම වැනි ඇතැම් ප්‍රත්‍යක්ෂ හානිපූරණ ස්වරූප එයට ඇතුළත් විය හැකිය. නිල වශයෙන් ප්‍රසිද්ධියේ සමාව භජනය කිරීම, කෞතුකාගාර සහ ස්මාරක ඉදි කිරීම හා නිල සැමරුම් දින ස්ථාපිත කිරීම වැනි සංකේතාත්මක ස්වරූපයන් ආකාරයටද හානි පූරණය කිරීම් සිදු විය හැකිය. දුර්විපාක නොලබා සිටීමට එරෙහිව සටන් කිරීමේ ක්‍රියාත්මක විම් ඔස්සේ මානව හිමිකම් ප්‍රවර්ධනය සහ ආරක්ෂා කිරීම පිළිබඳ යාවත්කාලීන කළ මූලධර්ම මාලාවේ පළමු වන මූලධර්මය තුළ හානිපූරණය කිරීමේ අවශ්‍යතාවය හඳුනාගැනීමට ලක් කොට ඇත.

404. උගත් පාඩම් සහ ප්‍රතිසන්ධාන කොමිෂන් සභාව විසින් ස්වකීය කරුණු අනාවරණය කිරීම් තුළ සහ ස්වකීය නිර්දේශ තුල සෑම විටම වින්දිතයන් සඳහා හානිපූරණය කිරීමේ වැදගත්කම ඉස්මතු කරනු ලැබේ. කොමිෂන් සභාව විසින් විශේෂයෙන්ම ඉඩම් හිමිකම්[313] ප්‍රතිෂ්ඨාපනය, වන්දි ගෙවීම[314] සහ අධ්‍යාපන සහ සෞඛ්‍යාරක්ෂක සේවාවන්[315] සැපයිම යනාදිය පිළිබඳ නිර්දේශ ඉදිරිපත් කරනු ලැබේ. තවද, උගත් පාඩම් සහ ප්‍රතිසන්ධාන කොමිෂන් සභාව විසින්, ''*මෙවැනි යුධ ගැටුමක් නිර්මාණය වීම වැළැක්වීම සඳහා සියලු පාර්ශ්වයන්ට අයත් දේශපාලන නායකත්වයන් සාමූහික වශයෙන් අසමත් වීමෙහි ප්‍රතිඵලයක් ලෙස එම ගැටුමේ වින්දිතයන් බවට පත් වූ අසරණ පුරවැසියන් වෙත සමාව භජනය කරමින් සියලු පාර්ශ්වයන්ට අයත් නායකයන් විසින් නිහතමානීව එකිනෙකා සමග සම්බන්ධ වෙමින් ඒකාබද්ධ ප්‍රකාශනයක් නිකුත් කරන ලෙසට*''[316] නිර්දේශ කරනු ලැබේ. *''ඉතා දුක්ඛදායක යුධ ගැටුම් වල වින්දිතයන් බවට පත් වූ සියල්ලන් වෙත එකමුතුකම සහ සහකම්පනය ප්‍රකාශ කිරීම සඳහා සහ රට තුළ නැවත වතාවක් එවැනි භයංකර ලේ ගැලීම් සිදු නොවිය යුතු බවට සහතික කිරීම උදෙසා අප සතුව පවත්නා සාමූහික කැපවීම පිළිබඳව පොරොන්දුවක් ලබා දීම උදෙසාන්* " ජාතික දිනයේදී වෙනම උත්සව අවස්ථාවක් පැවැත්වීම සඳහා වන නිර්දේශයද සමගින්, මෙම නිර්දේශය හානි පූරණය සමග සංකේතාත්මකව බැඳී පවතී.

405. ජාත්‍යන්තර මානව හිමිකම් නීති උල්ලංඝනය වීම් පිළිබඳව උගත් පාඩම් සහ ප්‍රතිසන්ධාන කොමිෂන් සභාව ලබා දී ඇති නිරීක්ෂණ[317] සම්බන්ධයෙන් ජනාධිපති විමර්ශන කොමිෂන් සභාව විසින් මේ වන විටත් හැදෑරීමක් සිදු කොට තිබෙන අතර පිළිවෙලින් පරණගම සහ උදලාගම කොමිෂන් සභා විසින් ලබා දී ඇති නිර්දේශ පිළිබඳව යොමුවීම උදෙසා මෙම අවස්ථාවේදී එය ඉතාම සුදුසු සහ යෝග්‍ය කටයුත්තක් වේ. එකී නිර්දේශ සම්පූර්ණයෙන්ම ක්‍රියාත්මක කරනු

---

[312] කරිල්ලෝ (2006) පිටු 504, 506

[313] උගත් පාඩම් හා ප්‍රතිසන්ධාන කොමිසම් වාර්තාව, ඡේද 5.132, 5.136 සහ 5.104(3)

[314] උගත් පාඩම් හා ප්‍රතිසන්ධාන කොමිසම් වාර්තාව, ඡේද 7.1.7.15(3), 7.15(7) සහ 7.15(10)

[315] උගත් පාඩම් හා ප්‍රතිසන්ධාන කොමිසම් වාර්තාව, ඡේද 5.115, 5.118 සහ 5.121

[316] උගත් පාඩම් හා ප්‍රතිසන්ධාන කොමිසම් වාර්තාව, ඡේද 8.303

[317] උගත් පාඩම් හා ප්‍රතිසන්ධාන කොමිසම් වාර්තාව, ඡේද 8.304

ලබන්නේද, නොඑසේ නම් ඉන් කොටසක් ක්‍රියාත්මක කරනු ලබන්නේද යන පැනය මතු වීමට පෙර එම නිර්දේශ පිළිබඳව අවධානය යොමු කිරීම සුදුසුය.

පරණගම කොමිෂන් සභාව

406. 1990 ජුනි මස 10 වෙනි දින සිට 2009 මැයි මස 19 වෙනි දින දක්වා කාල වකවානුව අතරතුර ශ්‍රී ලංකාවේ උතුරු සහ නැගෙනහිර ප්‍රදේශ වල සිදුවූ පැහැර ගෙන යාම් සහ අතුරුදන්වීම් පිළිබඳව පැමිණිලි ලබා ගැනීමට සහ විමර්ශනය කිරීමටත් ඒ ඔස්සේ එවන් පැහැර ගැනීම් සහ අතුරුදන් කරවීම් පිළිබඳ වගකිව යුතු පුද්ගලයන් හඳුනාගෙන ඔවුන්ට එරෙහිව නඩු කටයුතු ආරම්භ කිරීමටත් අවශ්‍ය විධිනියෝගය මුලින් ම පරණගම කොමිෂන් සභාව වෙත ලබා දී තිබුණි.

407. ඉන් අනතුරුව, 2014 ජුලි මස 15 වන දින මෙම විමර්ශන වල කාලසීමාව 1983 ජනවාරි මාසය දක්වා පසුදාතම් කරන ලදී. ඉන් අනතුරුව, පරණගම කොමිෂන් සභාවේ විධිනියෝගයට අදාළ විෂයපථය වඩා පුළුල් කරමින් 2019 මැයි මස අවසාන වූ යුධ ගැටුම් අතරතුර සිදු වූ සිවිල් වැසියන්ගේ ජීවිත අහිමි වීම් සහ ජාත්‍යන්තර නීතිය උල්ලංඝනය වීම් පිළිබඳ වගකීම දරනුයේ කවුරුන්ද යන පැනයට අදාළව පැවති කාරණා සහ වාතාවරණයන් ආමන්ත්‍රණය කිරීමට ඉඩකඩ සලසන ලදී. විශේෂයෙන්ම, මෙහිදී 2011 වසරේ උගත් පාඩම් සහ ප්‍රතිසන්ධාන කොමිෂන් සභා වාර්තාවේ 4.359 ඡේදය තුළ සඳහන් කොට ඇති ඇතැම් කාරණා සම්බන්ධයෙන් මෙහිදී අවධානය යොමු කරන ලදී. පරණගම කොමිෂන් සභාවේ 1 වන සහ 2 වන විධිනියෝග තුළ පැවති කොන්දේසි මෙම අවසන් වාර්තාවේ 2 වන පරිච්ඡේදය තුළ දක්වා ඇත.

408. මෙම අවසන් වාර්තාවේ 2 වන පරිච්ඡේදය තුළ සඳහන් කොට ඇති පරිදි, පරණගම කොමිෂන් සභාව සඳහා නීති උපදේශක සභාවක් කොමිෂන් සභාවේ නියමය පරිදි ස්ථාපනය කරන ලද අතර, ඒ සඳහා පත් කරන ලද ජාත්‍යන්තර නීති ප්‍රවීණයින්ගෙන් එය සමන්විත විය. [318]

409. පරණගම කොමිෂන් සභාව විසින් ස්වකීය දෙවන විධිනියෝගය යටතේ විමර්ශන කටයුතු යුද්ධයේ අවසාන අදියරට පමණක් සීමා කළ අතර, මෙම කාලසීමාව නිශ්චිතව දක්වතොත් 2009 ජනවාරි මස 2 වන දින දෙමළ ඊළාම් විමුක්ති කොටි (එල්.ටී.ටී.ඊ.) සංවිධානයේ පරිපාලන අගනගරය වූ කිලිනොච්චි නගරය අල්ලා ගැනීමේ සිට 2009 මැයි මස 19 වන දින යුද්ධය නිමා කිරීම දක්වා වන කාලසීමාව මෙහිදී අදාළ කර ගන්නා ලදී.

410. සත්‍ය වශයෙන්ම පරණගම කොමිෂන් සභාව විසින් ශ්‍රී ලංකා යුධ ගැටුම ජාත්‍යන්තර නොවන සන්නද්ධ අරගලයක් වශයෙන් වර්ගීකරණය කරනු ලබන අතර, එහි අවසාන අදියර තුළ ජාත්‍යන්තර නීතිය බරපතල අයුරින් උල්ලංඝනය වීම පිළිබඳ බරපතල චෝදනා එල්.ටී.ටී.ඊ. සංවිධානයට සහ ශ්‍රී ලංකා හමුදාවට එරෙහිව ගොනු වී ඇත.

411. 2015 ඔක්තෝබර් මස නිකුත්කරන ලද පරණගම කොමිෂන් සභා වාර්තාව තුළින් දරුස්මාන් වාර්තාව යනුවෙන්ද හඳුන්වනු ලබන එක්සත් ජාතීන්ගේ මහලේකම්වරයාගේ 'විද්වත් මණ්ඩල වාර්තාව - 2011' පිළිබඳව ද සඳහන් කරනු ලබන අතර, එම වාර්තාවේ නිගමන පිළිබඳ ප්‍රශ්න මතු කරනු ලැබේ. විද්වත් වමණ්ඩල වාර්තාව සහ පරණගම කොමිසම මගින් ජාත්‍යන්තර මානුෂීය නීතියේ මූලධර්ම ප්‍රතිවිරුද්ධ ආකාරයකට භාවිතා කිරීම සැලකීමේදී සහ මෙම ජනාධිපති විමර්ශන කොමිෂන් සභාව විසින් සිය අතුරු වාර්තාව තුළ තවදුරටත් දක්වා ඇති සත්‍ය සෙවීමේ යාන්ත්‍රණය ඔස්සේ වගකීම් යලි ලබා ගැනීම පිළිබඳව මෙම ජනාධිපති විමර්ශන කොමිෂන්

[318] දෙවන පරිච්ඡේදය බලන්න. ජනාධිපති විමර්ශන කොමිසමේ මෙම අවසන් වාර්තාවේ 112 ඡේදය 2 වන පරිච්ඡේදය බලන්න

සභාවේ තීරණය සැලකීමේදී, සත්‍යය සෙවීමේ යාන්ත්‍රණය හැදින්වීමට කුමන ආකාරයේ නාමකරණයක් යොදා තිබුණද, ඒ පිළිබඳ සැලකීමකින් තොරව සත්‍ය සෙවීමේ යාන්ත්‍රණය සඳහා ජාත්‍යන්තර මානුෂීය නීති මූලධර්ම භාවිතාවට ගැනීම පිළිබඳව හෝ එහි නිවැරදිභාවය පිළිබඳව ජනාධිපති විමර්ශන කොමිෂන් සභාව විසින් අදහස් දක්වනු ලැබේ. මෙම අවසන් වාර්තාවේ 6 වන පරිච්ඡේදය තුළින් පෙන්වා දෙන පරිදි සත්‍ය සෙවීමේ යාන්ත්‍රණය මගින් අනිවාර්යයෙන්ම නිසි කරුණු අනාවරණය කරගැනීමක් උදෙසා සාක්ෂි තක්සේරු කිරීමේ කටයුත්තකට එළඹිය යුතු අතර, මෙම ක්‍රියාවලිය තුළදී මෙලෙස යම් කරුණු අනාවරණයක් වෙත එළඹීමේ ක්‍රියාවලියේදී ප්‍රතිවාදී අර්ථ නිරූපණයන් අතරින් තෝරා ගැනීමක් සිදු කළ යුතු වේ.

412. කෙසේ වුවද යුද්ධයේ අවසන් අදියර තුළදී ජාත්‍යන්තර මානුෂීය නීතිවල මූලධර්ම භාවිතාවට ගැනීම පිළිබඳව ලියවිලි / තොරතුරු දැක්වීම් ඉතා විශාල ප්‍රමාණයක් පවතින අතර, එම මතවාද සමහරක් අත්‍යන්තයෙන්ම එකිනෙකට ප්‍රතිවිරුද්ධ වී ඇත.[319]

413. පරණගම කොමිෂන් සභාව වෙත යොමු වී ඇති ශ්‍රී ලංකා රජයට එරෙහි ප්‍රධාන චෝදනාවන් ජනාධිපති විමර්ශන කොමිසම විසින් මෙම අවස්ථාවේදී ආමන්ත්‍රණය කරනු ලැබේ. උගත් පාඩම් සහ ප්‍රතිසන්ධාන කොමිෂන් සභා නිර්දේශ පිළිබඳ සාකච්ඡාව තුළින් මතකයට නගා ගත හැකි පරිදි මෙම චෝදනා ප්‍රධාන වශයෙන්ම චැනල් 4 නාලිකාවේ වීඩියෝ පටය, යුද්ධයේ අවසන් අදියර තුළ රැඳවුම් භාරයේ සිටි පුද්ගලයන් අතුරුදන් වීම, සුදු කොඩි දැරූ පුද්ගලයන් මරා දැමීම, සිවිල් වැසියන්ට සහ රෝහල්වලට ෂෙල් ප්‍රහාර එල්ල කිරීම සහ මානුෂීය ආධාර සැපයීම ප්‍රතික්ෂේප කිරීම සම්බන්ධයෙන් ප්‍රධාන වශයෙන් ම මෙම චෝදනා ඉදිරිපත් වී ඇත. පරණගම කොමිෂන් සභාව විසින් මෙම ප්‍රශ්නගත තත්ත්වයන් සම්බන්ධයෙන් අදහස් දක්වා ඇත්තේ එකී වාර්තාවේ 7 වන පරිච්ඡේදය තුළයි.

414. ජනාධිපති විමර්ශන කොමිසම වෙතින් උගත් පාඩම් සහ ප්‍රතිසන්ධාන කොමිෂන් සභාව පිළිබඳ ස්වකීය සාකච්ඡාව තුලදී මෙම සමාන වූ කාරණාවන් පිළිබඳ ඉතා විස්තරාත්මක වශයෙන් අවධානය යොමු කොට කටයුතු කොට ඇති බැවින්, සමාන චෝදනාවන් පිළිබඳව උගත් පාඩම් සහ ප්‍රතිසන්ධාන කොමිෂන් සභාව විසින් ලබා දී ඇති නිර්දේශ විපාකදායී සහ ප්‍රතිෂ්ඨාපන යුක්ති ක්‍රියාවලින් තුළින් ඇති වූ ප්‍රතිඵල බව මතකයට නගා ගත යුතු අතර, එය වින්දිත කේන්ද්‍රීය වූවක් විය යුතුය.

415. දෙවන විධිනියෝගය යටතේ මතු කරන ලද ප්‍රශ්න වලට පිලිතුරු ලබා දීම සඳහා වන පදනම පරණගම කොමිෂන් සභා වාර්තාව තුළින් ඉදිරිපත් කරනු ලැබේ. මෙම සිදුවීම් වලට අදාළ සත්‍යය අනාවරණය කර ගැනීම වෙත ප්‍රවිෂ්ඨ වීම සඳහාත්, වින්දිතයන් සඳහා යුක්තිය සලසා දීම සඳහාත් යුධ අපරාධ සහ / හෝ මනුෂ්‍යත්වයට එරෙහි අපරාධ වශයෙන් සැලකිය හැකි බරපතල සිදුවීම් පිළිබඳව ස්වාධීන විනිසුරුවරුන්ගේ මූලිකත්වයෙන් යුතු විමර්ශනයක් සිදු කළ යුතු බවට පරණගම කොමිෂන් සභාව විසින් අදහස් කරයි.[320]

416. පරණගම කොමිෂන් සභාව විසින් 2014 ජනවාරි මාසයේ දී ශ්‍රී ලංකාවේ උතුරු සහ නැගෙනහිර ප්‍රදේශ වල මහජන හමු පැවැත්වීම ආරම්භ කරන ලදී. ආසන්න වශයෙන් පුද්ගලයන් 2,700 දෙනෙකුගෙන් පමණ වාචික සාක්ෂි තමන් විසින් වාර්තා කර ගනු ලැබූ බවත්, විද්‍යුත් මුද්‍රණ සහ

---

[319] ඉසබෙල් ලැසීගේ, *Last Stages of the War : Clarifying the application of IHL,* 2015 නොවැම්බර් දකුණු ආසියානු නීති අධ්‍යයන මධ්‍යස්ථානය බලන්න. එසේම ජනාධිපති විමර්ශන කොමිසමේ මෙම අවසන් වාර්තාවේ 3 වන පරිච්ඡේදයේ සටහන 123 බලන්න.

[320] පරණගම කොමිෂන් වාර්තාව, 419 ඡේදය

විද්‍යුත් මාධ්‍ය ඔස්සේ භාෂාත්‍රයෙන්ම පළ කරන ලද ප්‍රසිද්ධ දැන්වීමට ප්‍රතිචාර වශයෙන් මෙම පුද්ගලයන් විසින් පැමිණිලි ඉදිරිපත් කරන ලද බවත් පරණගම කොමිෂන් සභාව විසින් ප්‍රකාශ කරනු ලැබේ.

<u>විශේෂ විමර්ශන කණ්ඩායමක් පත් කිරීම.</u>

417. පරණගම කොමිෂන් සභාව වෙත ඉදිරිපත් වූ කරුණු විමර්ශනය කිරීම සහ විභාග කිරීම අතරතුර දී අතුරුදන් වූ තැනැත්තන්ගේ පවුල් වලින් ඉදිරිපත් වූ ඇතැම් පැමිණිලි පිළිබඳව විශේෂ විමර්ශන කණ්ඩායමක් විසින් තවදුරටත් විමර්ශනය කිරීම අවශ්‍ය වන බව පැහැදිලිව ප්‍රත්‍යක්ෂ විය. විමර්ශන කණ්ඩායමක් පත් කිරීමේ ගැටලුව සම්බන්ධයෙන් සැලකීමේදී සමස්තයක් වශයෙන් සමාජයට පිළිගත හැකි විශ්වසනීය පුද්ගලයන් ඒ සඳහා තෝරා ගනු ලබන බවට කොමිෂන් සභාව විසින් සහතික කළ යුතු විය.[321]

418. ස්වකීය විමර්ශන කටයුතු සිදු කරගෙන යාම සඳහා පරණගම කොමිෂන් සභාවට සහාය සැලසිය හැකි විමර්ශන කණ්ඩායමක සේවාවන් ජනාධිපති කාර්යාලය සමග සන්නිවේදනය කිරීමෙන් අනතුරුව තමන්ට ලබා ගත හැකි වූ බව පරණගම කොමිෂන් සභාව විසින් ප්‍රකාශ කරනු ලැබේ. මෙම විමර්ශන කණ්ඩායමේ ප්‍රධානත්වය දැරුවේ විශ්‍රාමික මහාධිකරණ විනිසුරුවරයෙකු වන අතර සියලු ජනවාර්ගික ප්‍රජාවන් නියෝජනය වන විමර්ශන නිලධාරීන්ගෙන් එය සමන්විත විය.[322]

419. ජනාධිපති විමර්ශන කොමිසම හමුවට ස්වකීය සාක්ෂි ලබා දෙමින් පරණගම කොමිෂන් සභාවේ සභාපති මැක්ස්වෙල් පරණගම විසින් අතුරුදන් වීම් සම්බන්ධයෙන් තම විමර්ශන කණ්ඩායම විසින් සාක්ෂි ඉතා විශාල ප්‍රමාණයක් එක් රැස් කර ගත් බවට ප්‍රකාශ කොට සිටි අතර, මෙම සාක්ෂි පිළිබඳ ලේඛන ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුවේ තබා ඇති බවට සිය කනස්සල්ල පළකරන ලදී. විමර්ශන කණ්ඩායම විසින් එකතු කරගනු ලැබූ සාක්ෂි සටහන් පිළිබඳව මැක්ස්වෙල් පරණගමගේ සාක්ෂිය ඉතා බරපතල ලෙස සැලකිල්ලට ගත යුතු බව ස්වකීය දෙවන අතුරු වාර්තාව තුළ ජනාධිපති විමර්ශන කොමිෂන් සභාව විසින් අවධාරණය කොට ඇත. එසේම, චෝදනා ගොනු කිරීමේ කටයුතු උදෙසා වැඩිදුර විමර්ශන සිදු කිරීම අවශ්‍ය වන්නේද යන්න පිළිබඳ ව අදාළ අභිචෝදන බලධාරීන් හට උපදෙස් ලබා දීම වෙනුවෙන් එම ලේඛන නීතිපති දෙපාර්තමේන්තුව භාරයට ගත යුතු බවටද අවධාරණය කරන ලදී.

420. අතුරුදන්වූ තැනැත්තන් පිළිබඳ ඇතැම් සිද්ධි නිරාකරණය කිරීමේ අරමුණින් සිදු කරන ලද මෙම නිර්දේශය, සත්‍යය සෙවීමේ යාන්ත්‍රණය කෙරෙහි බලපෑමක් ඇති කරන බැවින්, ප්‍රමුඛතාවයන් ලෙස සලකමින් බලධාරීන්ගේ අවධානයට යොමු විය යුතු බව අවධාරණය කළ යුතු වේ. එසේම, සත්‍ය සෙවීමේ යාන්ත්‍රණයේදී මෙම සිදුවීම් පිළිබඳව අතුරුදන් වූ තැනැත්තන්ගේ කාර්යාලයේ අවධානය යොමුවී තිබේද යන්න සහතික කර ගැනීම සඳහා මෙම ලේඛන අතුරුදන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය වෙතට ඉදිරිපත් කළ යුතු වේ.

421. මීළඟට ජනාධිපති විමර්ශන කොමිසම විසින් ඉහත 413 ඡේදයේ විස්තර කොට ඇති සිද්ධි පරණගම කොමිෂන් සභාව විසින් පරීක්ෂාවට ලක් කොට ඇත්තේ කෙසේද යන්න හැදෑරීමට යොමුවනු ඇත.

---

321 එම

322 එම

අ. චැනල් 4 නාලිකාවේ වීඩියෝ පටය

422. චැනල් 4 නාලිකාවේ වැඩසටහන් තුළ අඩංගු වන චෝදනා සහ ඉදිරිපත් වී ඇති ඡායාරූප දර්ශන ඔස්සේ ශ්‍රී ලංකා හමුදාවේ ක්‍රියාකලාපය සම්බන්ධයෙන් සැලකිය යුතු අයුරින් හානිදායක ප්‍රචාරයක් ලබා දෙනු ලබන බව නැවත නැවත පැවසීම අවශ්‍ය නොවේ.

423. නිසි පරිදි විමර්ශනය කිරීමකට ලක් කළ යුතු චෝදනාවන් මෙම කාරණා තුළින් මතු වන බව උගත් පාඩම් සහ ප්‍රතිසන්ධාන කොමිෂන් සභාව විසින් මේ වන විටත් නිගමනය කොට ඇත. මෙම චෝදනා සම්බන්ධ සත්‍ය හෝ අසත්‍යතාවය තහවුරු කරගැනීම උදෙසා, සත්‍යය කුමක්ද යන්න තහවුරු කර ගැනීමේ අරමුණින් මෙම ගැටලුව සම්බන්ධයෙන් ස්වාධීන විමර්ශනයක් ශ්‍රී ලංකා රජය විසින් දියත් කළ යුතු බවත් දේශීය නීති වලට අනුකූලව නිසි ක්‍රියාමාර්ග ගත යුතු බවත් උගත් පාඩම් සහ ප්‍රතිසන්ධාන කොමිෂන් සභාව විසින් නිර්දේශ කොට තිබෙන අතර, මෙම කාරණා ඔස්සේ විමර්ශනයට ලක් කළ යුතු චෝදනා ඉස්මතු වන බවට උගත් පාඩම් සහ ප්‍රතිසන්ධාන කොමිෂන් සභාව විසින් දැනටමත් නිගමනය කොට ඇත. මේ හා සම්බන්ධ සියලු පාර්ශ්වයන් විසින්, විශේෂයෙන්ම මුල් ඡායාරූප සපයා දුන් ආයතන සහ විකාශනය කරන ලද ආයතනය විසින් මෙම විමර්ශනය සඳහා පහසුකම් සැලසීමට අවශ්‍ය තොරතුරු සපයා දීම මගින් පූර්ණ සහයෝගය ලබා දෙන ලෙසට උගත් පාඩම් සහ ප්‍රතිසන්ධාන කොමිෂන් සභාව විසින් දැඩිව ආයාචනය කොට ඇත.[323]

424. චැනල් 4 නාලිකාවේ වීඩියෝ පටය, හමුදා විමර්ශන අධිකරණයක් මගින් පවත්වන ලද විමර්ශනයක එක් කොටසක් වූ බව මෙහිදී සඳහන් කළ යුතු වන නමුත්, මෙම කාරණය සම්බන්ධයෙන් එකී හමුදා විමර්ශන අධිකරණයේ නිගමන වල පිටපතක් ලබාගැනීමට මෙම ජනාධිපති විමර්ශන කොමිෂන් සභාවට හැකි වුයේ නැත. පරණගම කොමිෂන් සභාව විසින්ද ප්‍රකාශ කරනු ලබන්නේ චැනල් 4 නාලිකාවට අදාළ විමර්ශන සම්බන්ධයෙන් හමුදා විමර්ශන අධිකරණය මගින් අනාවරණය කරගත් කරුණු තමන් වෙත ද ලබා නොදුන් බව ය.[324] චෝදනා එල්ල වන වැරදි සම්බන්ධයෙන් වීඩියෝ පටයේ මුල් පිටපත් සැපයීමට අසමත් වීම සම්බන්ධව මෙම ක්‍රියාවලියේදී පරණගම කොමිෂන් සභාව විසින් චැනල් 4 නාලිකාව විවේචනය කිරීමක්ද සිදු වේ.

425. මෙම වාර්තා වීඩියෝ පටය තුළ අඩංගු වන එක් චෝදනාවක් පිළිබඳව හෝ අවම වශයෙන් යම් මූලික සාක්ෂි විභාගයට ගැනීමෙන් අනතුරුව, අපරාධ ක්‍රියාකාරකම් පිළිබඳ විශ්වාස කළ හැකි චෝදනා වශයෙන් හඳුනාගනු ලබන කාරණාවන් පිළිබඳව පූර්ණ විමර්ශනයක් සිදු කරන ලෙසට පරණගම කොමිෂන් සභාව විසින් නියෝග කොට ඇත.

426. පරණගම කොමිෂන් සභාව චිත්‍රපටය නිෂ්පාදනය කිරීම සම්බන්ධයෙන් චැනල් 4 නාලිකාවේ වෙබ් අඩවිය උපුටා දක්වමින් පහත පරිදි කරුණු දක්වයි.

> *"එය සිදු කොට ඇත්තේ කෙසේද යන්න පිළිබඳව අපේ සාක්ෂි ඉදිරිපත් වනුයේ ජංගම දුරකථන, වීඩියෝ දර්ශන, දෙමළ සහ රජයේ චිත්‍රපට දර්ශන හා / හෝ ජංගම දුරකථන 'trophy footage' යන ස්වරූපයන්ගෙන් වන අතර, එහිදී සොල්දාදුවන් විසින් හමුදාවට භාර වූ හෝ හමුදාව විසින් අල්ලාගනු ලැබූ දෙමළ ජාතිකයන් හට පරිභව කිරීම හෝ ඔවුන් මරණයට පත් කිරීම සිදු කරන ආකාරය වීඩියෝ ගත කොට තිබුණි. මිලේච්ඡ යුධ ගැටුමක දෙපාර්ශ්වය විසින්ම යුධ අපරාධ සිදු*

[323] උගත් පාඩම් සහ ප්‍රතිසන්ධාන කොමිෂන් සභාව, 9.41 ඡේදය : එසේම මෙම ජනාධිපති විමර්ශන කොමිෂන් සභාවේ අවසන් වාර්තාවේ 313 ඡේදය බලන්න

[324] පරණගම කොමිෂන් වාර්තාව, ඡේදය 431

කොට ඇත. එහෙත්, අප විසින් වාර්තා කරනු ලබන රජයේ ක්‍රියාමාර්ග සිවිල් යුද්ධයේ මෙම අදියර තුළ දැක ගත හැකි වූ දේවල් ඉක්මවා යන ඒවා වේ. එය නැරඹීමට ඉතා අපහසු අතිශය ඛේදජනක සහ අසීරු චිත්‍රපටයක් වේ. එමගින් වැරදිකරුවන් බවට ඔප්පු කිරීම සඳහා අවශ්‍ය සාක්ෂි ඉදිරිපත් කිරීම පමණක් නොව, යුධ වැදී සිටි හමුදාවන් හට තමන් විසින් සිදු කරන ලද කටයුතු ආවරණය කිරීමට නොහැකි තත්ත්වයක් මෙම අවදිය තුළ මෙම ඩිජිටල් යුගය තුළ නිර්මාණය වී ඇති බවට වන ප්‍රථම සාක්ෂිය ද එයයි.[325]

427. *මෙම ස්වරූපයේ චෝදනා සම්බන්ධයෙන් චෝදනාවට ලක් වන චූදිතයෙකු හට විරුද්ධව වරදකාරිත්වය ඔප්පු කිරීම සඳහා අවශ්‍ය වන සාධන සම්මතය පිළිබඳව අදහස් දක්වමින් පරණගම කොමිෂන් සභාව විසින් ජාත්‍යන්තර අපරාධ අධිකරණ ප්‍රඥප්තියේ 66 වන වගන්තිය උපුටා දක්වමින් දක්වා ඇත.*

අ. අදාළ නීතියට අනුකූලව අධිකරණයක් ඉදිරියේ වරදකරු බවට සනාථ වන තෙක් සියලු දෙනාම නිදොස් බවට උපකල්පනය කරනු ලැබේ.

ආ. චූදිතයාගේ වැරැද්ද ඔප්පු කිරීමේ භාරය පවතිනුයේ පැමිණිල්ල මෙහෙයවන්නා (ප්‍රධාන අභියෝදක) මතයි

ඇ. චෝදනාවට ලක් වී ඇති චූදිතයා වරදකරු බවට ඔප්පු කිරීම සඳහා චූදිතයාගේ වැරැද්ද සාධාරණ සැකයෙන් ඔබ්බට අධිකරණයට ඒත්තු ගැන්වීම සිදු කළ යුතුය.

428. රූපවාහිනියේ වැඩ සටහන් හෝ විමර්ශන කොමිෂන් සභාවල වාර්තා හෝ, නිසි විමර්ශනයක් සහ වගවීම් ක්‍රියාවලියක් සඳහා කිසි විටෙක ආදේශක ලෙස සැලකිය නොහැකි බවට පරණගම කොමිෂන් සභාව විසින් අදහස් දක්වනු ලැබේ.[326]

- **චැනල් 4 නාලිකාවේ වීඩියෝපටයේ සත්‍යවත්භාවය**

429. එම වීඩියෝපටයේ සත්‍යවත්භාවය පිළිබඳව සැලකීමේදී පරණගම කොමිෂන් සභාව විසින් නිරීක්ෂණය කරනු ලබන්නේ මෙම චිත්‍රපටයේ වීඩියෝ දර්ශන සම්පූර්ණයෙන්ම හෝ අර්ධ වශයෙන් ව්‍යාජ ඒවා වන බවට යෝජනා ඉදිරිපත් වී ඇති බව ය. පරණගම කොමිෂන් සභාව ඉදිරියේ පැවැත්වූ විමර්ශනයේ දී, මෙහි සිදුවන ඇතැම් කටයුතු එලෙස සිදුවන ආකාරයට පෙනෙන්නට සලස්වමින් ඉදිරිපත් කොට ඇති බවට සැකයක් නිර්මාණය වීමට තුඩු දෙන ඇතැම් විෂමතාවයන් වීඩියෝපටය තුල පවතින බවට ස්වකීය ප්‍රවීණයින් භාවිතා කරමින් ශ්‍රී ලංකා රජය විසින් අවධාරණය කොට ඇත. කෙසේ වුවද, නීති විරෝධී, සාධාරණ සහ නිදහස් සටන් පාඨයකින් තොර හෝ අත්තනෝමතික අයුරින් මරණයට පත් කිරීම් සම්බන්ධයෙන් එක්සත්ජාතීන්ගේ විශේෂ වාර්තාකරු වන පිලිප් ඇල්ස්ටන් මහතා විසින් ප්‍රවීණයින් කණ්ඩායමක් පත් කරන ලද අතර ඔවුන් විසින් වීඩියෝ පටයේ ඇති සුළු අංග ලක්ෂණ ප්‍රමාණයක යම් අවිනිශ්චිත ලක්ෂණ කිහිපයක්ද පවතින බවට පිළිගනිමින් වීඩියෝ පටය සත්‍ය බවට ප්‍රකාශ කරන ලදී.[327] මෙම තාක්ෂණික ප්‍රවීනයින් අතරින් එක් අයෙකු වශයෙන් කටයුතු කළ, වෝහාරික බහුමාධ්‍ය විශ්ලේෂකයකු වන ජෙෆ් එස් ස්පිවැක් මේ පිළිබඳව දක්වා ඇති

[325] පරණගම කොමිෂන් වාර්තාව, ඡේදය 423

[326] පරණගම කොමිෂන් වාර්තාව, ඡේදය 426

[327] පරණගම කොමිෂන් වාර්තාව, ඡේදය 427

අදහස් මෙහිදී සැලකිල්ලට ගැනීම වැදගත් වන අතර අනෙකුත් කරුණු අතර ඔහු විසින් පහත පරිදි ප්‍රකාශ කොට ඇත.

"සැබැවින්ම වෙඩි තැබීම් සිදු කරන පාර්ශ්වයන්ගේ හෝ චින්දිතයන් බවට පත් වීමේ ඉඩකඩක් පවතින පාර්ශ්වයන්ගේ අනන්‍යතාවය මෙම වාර්තා පටය ඔස්සේ සහතික කරගැනීමට කිසිදු හැකියාවක් නොමැත. මෙහිදී වෙඩි තැබීම සිදු කරනු ලබන්නේ සැබැවින්ම ශ්‍රී ලංකා හමුදාවේ සාමාජිකයින් විසින්ද, නොඑසේ නම්, ශ්‍රී ලංකා හමුදා නිල ඇඳුම් වලින් සැරසුණු දෙමළ සාමාජිකයන් විසින්ද යන වගත් නොඑසේ නම්, චින්දිතයන් බවට පත් වන පාර්ශ්වයන් දෙමළ ජාතිකයන්ද නොඑසේ නම් වෙනත් ජන වාර්ගික කණ්ඩායමකට අයත් වන අහිංසක චින්දිතයන්ද යන වගත් මෙම වාර්තා පටය තුළින් නිර්ණය කර ගැනීමේ හැකියාවක් නොමැත.[328]"

430. කෙසේ වුවද මෙම වීඩියෝ පටයේ සත්‍ය අසත්‍යභාවය පිළිබඳ ගැටළුව පරණගම කොමිෂන් සභාව විසින් නිරාකරණය කළ හැකි ගැටළුවක් නොවන බව පරණගම කොමිසම විසින් ප්‍රකාශ කරනු ලබන අතර, සිය උපදේශක සභාවේ සාමාජිකයන් විසින් ඉහළම මට්ටමින් ජාත්‍යන්තර විනිශ්චය සභාවන් ඉදිරියේ මෙවැනි සිද්ධි සම්බන්ධයෙන් පරිශීලනය කොට ඇති බවත්, ඒ අනුව චැනල් 4 නාලිකාව විසින් භාවිතා කරනු ලබන ස්වරූපයේ වීඩියෝ පට පිළිබඳව ඔවුන් ඉතාම හොඳින් දන්නා බවටත් ප්‍රකාශ කරනු ලැබේ. එක්සත් ජාතීන්ගේ සංවිධානය විසින් ලෝක ප්‍රසිද්ධ ව්‍යාධිවේදීන් සහ ගිනි අවි පිළිබඳ ප්‍රවීණයින් ගණනාවක් මේ සඳහා යොදා ගෙන ඇති අතර, ඔවුන් විසින් මෙම වීඩියෝ පටය පිළිබඳව කරුණු තහවුරු කොට ඇති බැවින් පරණගම කොමිෂන් සභාව මෙම ඡායාරූප දර්ශන සත්‍ය ඒවා වන්නේය යන උපකල්පනය මත ක්‍රියා කොට ඇත. එනමුත් එය සාක්ෂි මගින් වෙනස් කර ගත හැකිය. චැනල් 4 නාලිකාවේ චෝදනාවන් සැලකිල්ලට ගනිමින් පරණගම කොමිෂන් සභාව විසින් වීඩියෝ පටය සත්‍ය එකක් වන්නේය හෝ එසේ විය හැකිය යන පදනම මත පිහිටා ඉදිරි වැඩකටයුතු සිදු කොට ඇති අතර, එම නිසා යුධ අපරාධ පිළිබඳ ප්‍රබල පර්යේෂණීය සාක්ෂි ඉදිරිපත් කොට ඇත. **චැනල් 4 නාලිකාවේ චෝදනාවන් සම්බන්ධයෙන් නිසි අධිකරණමය විමර්ශනයක් සිදු කිරීම අවශ්‍ය** වන්නේ යැයි ගනු ලැබූ තීරණයට උපදේශක සභාවේ සහාය ද සැලසුණු බවත් එම විමර්ශනය ආරම්භ කිරීමෙන් පසුව මෙම ක්‍රියාවලියට සම්බන්ධ වී ඇතැයි චෝදනා එල්ල වන ඕනෑම පාර්ශ්වයකට මේ පිළිබඳව දඩුවම් පැමිණවීම අත්‍යවශ්‍ය වන බවත් පරණගම කොමිෂන් සභාව විසින් තවදුරටත් සඳහන් කරනු ලැබේ.

431. ස්වකීය වාර්තාව නිකුත් කරන ලද අවස්ථාවේදී පරණගම කොමිෂන් සභාව විසින් ප්‍රකාශ කරන ලද්දේ හිටපු මහාධිකරණ විනිසුරුවරයෙකු විසින් විමර්ශන කණ්ඩායමේ ප්‍රධානත්වය ගත් බව ය.[329]

432. පරණගම කොමිෂන් සභාව විසින් තවදුරටත් ස්වකීය අවසන් වාර්තාවේදී පහත පරිදි සඳහන් කරනු ලැබේ.:

---

[328] නීත්‍යානුකූල නොවන, නිසි නඩු විභාගයකින් තොර හෝ අත්තනෝමතික මරණයට පත් කිරීම් පිලිබඳ විශේෂ වාර්තාකරු විසින් පිලියෙල කරන ලද තාක්ෂණික සටහන, චැනල් 4 නාලිකාවේ වීඩියෝපටයෙහි සත්‍යවත්භාවය පිළිබඳව පිලිප් ඇල්ස්ටන් විසින්, ඇමුණුම් - ස්වාධීන ප්‍රවීණයින් විසින් දක්වන ලද අදහස් : පිටුව 15.www.extrajudicialexecutions.org.

[329] පරණගම කොමිෂන් වාර්තාව, ඡේදය 428

- *මෙම චිත්‍රපටය පිළිබඳව විස්තරාත්මකව සලකා බැලීම තුළින් එහි සත්‍ය අසත්‍යභාවය පිළිබඳව ගැටළුවට අමතරව තවත් ගැටළු ගණනාවක් පැන නගින අතර, වැඩසටහන සකස් කරන ලද පාර්ශ්වයන්ගේ සාධාරණත්වය පිළිබඳ ගැටළු ද එයට ඇතුළත් වේ. එහෙත් පර්යේෂණීය සාක්ෂි වල බරපතලභාවය ප්‍රතික්ෂේප කිරීමක් ඉන් සිදු නොවේ:*

- *එල්.ටී.ටී.ඊ. සාමාජිකයන් විසින් තමන්ගේම සිවිල් වැසියන් හට වෙඩි තැබීම සහ ෂෙල් ප්‍රහාර එල්ල කිරීම සිදු කරන ලද බවට සාක්ෂි ඕනෑ තරම් තිබෙන පසුබිමක් තුළ ෂෙල් ප්‍රහාර එල්ල කිරීම සිදු කරන ලද්දේ කවුරුන් විසින්ද යන්න වෙන් කොට හඳුනා ගැනීමට මෙම වැඩසටහන අසමත් වී ඇත.*

- *මරා දමන ලද සිවිල් වැසියන් සංඛ්‍යාව සම්බන්ධයෙන් පවත්නා පරස්පර විරෝධිතාවය පිළිබඳව සාධාරණව කටයුතු කිරීමට මෙම වැඩසටහන අසමත් වීම සහ 2008 අගෝස්තු මස සිට 2009 මැයි 13 දක්වා මරණ අනුපාතය 7,721ක් වශයෙන් දක්වන එක්සත් ජාතීන්ගේ දේශීය කණ්ඩායමේ ඇස්තමේන්තුව හෝ 2009 ජනවාරි සිට 2009 මැයි දක්වා මරණයට පත් කරන ලද පුද්ගලයන් සංඛ්‍යාව 6,710ක් වශයෙන් දක්වන එක්සත් ජනපද රාජ්‍ය දෙපාර්තමේන්තු සංඛ්‍යා ඇතුළුව වඩා කුඩා සංඛ්‍යා වශයෙන් දක්වන වෙනත් වගකීම් සහගත ඇස්තමේන්තු පවතිද්දී මිය ගිය පුද්ගලයන් සංඛ්‍යාව 40,000ක් වශයෙන් මේ තුළ අවධාරණය කොට තිබීම.*

- *එල්.ටී.ටී.ඊ. සංවිධානය රජයේ යුධ මුක්ත කලාප පිළිගැනීමට අසමත් වී ඇති බැවින්, ජාත්‍යන්තර නීතිය යටතේ යුධ මුක්ත කලාප නොපවතින බවට අවධාරණය කිරීමට වැඩ සටහන අසමත් වීම.*

- *'සිවිල් වැසියන් හට ආරක්ෂිත ප්‍රදේශ වෙත පලා යාමට ඉඩ සැලසීමකින් තොරව තම හමුදාවන් සමග පසුබසින ලෙසට' එල්.ටී.ටී.ඊ. සංවිධානය සිවිල් ජනතාව වෙත බලපෑම් කිරීම හේතු කොට ගෙනත්, සිවිල් වැසියන්ගේ ජීවිත කෙරෙහි ඇති වූ අවදානම පිළිබඳව සඳහන් කිරීමට අසමත් වීම තුළත්, එසේම මේ හේතු කොට ගෙන තම සිවිල් වැසියන් එල්.ටී.ටී.ඊ. පාලනයෙන් මුදා ගනු ලබන බවට සහතික කිරීමට ශ්‍රී ලංකා රජය වෙත මේ ඔස්සේ නීතිමය වගකීමක්/බැඳීමක් නිර්මාණය වූ බව ප්‍රකාශ කිරීමටත් නිසි සැලකිල්ලක් නොදක්වා එය පැහැර හැරීම තුළින් වැඩසටහනේ අසාර්ථකත්වය දැක්විය හැකිය.[330]*

433. තාක්ෂණික හා වෝහාරික අපහැදිලිතාවයන් පිළිබඳ නිගමනාත්මක පැහැදිලි කිරීමක් ඇති කිරීමට බාධා පමුණුවමින් විකාශන වීඩියෝ පටය නොමැති වීම පිළිබඳව උගත් පාඩම් සහ ප්‍රතිසන්ධාන කොමිෂන් සභාව විසින්ද පැමිණිල්ලක් සිදු කොට ඇති බව මෙහිදී මතකයට නගා ගැනීම උචිතය.[331]

434. චැනල් 4 නාලිකාවේ වීඩියෝ පටය සම්බන්ධයෙන් උගත් පාඩම් සහ ප්‍රතිසන්ධාන කොමිෂන් සභාවේ නිර්දේශ මෙම ජනාධිපති විමර්ශන කොමිසම මගින් ද මේ වන විටත් අවධාරණය කොට තිබෙන අතර සත්‍ය පිළිබඳ නිශ්චිත තීරණයකට එළඹීම සඳහා හෝ නොඑසේ නම් වීඩියෝ පටය සම්බන්ධයෙන් වන චෝදනා වල සත්‍ය අසත්‍යභාවය තීරණය කිරීම සඳහාත් මෙම කාරණය සම්බන්ධයෙන් ස්වාධීන විමර්ශනයක් ශ්‍රී ලංකා රජය විසින් ආරම්භ කළ යුතු බවට ඉහත නිර්දේශය ඔස්සේ උගත් පාඩම් සහ ප්‍රතිසන්ධාන කොමිෂන් සභාව මගින් ශ්‍රී ලංකා රජයට නිර්දේශ

---

330 පරණගම කොමිෂන් වාර්තාව, ඡේදය 433

331 උගත් පාඩම් හා ප්‍රතිසන්ධාන කොමිෂන් සභා වාර්තාව, ඡේද 4.361 – 4.377

කොට ඇත. එවන් ක්‍රියාමාර්ග ගැනීමක් අත්‍යවශ්‍ය සහ කඩිනමින් සිදු කළ යුතු බව උගත් පාඩම් සහ ප්‍රතිසන්ධාන කොමිෂන් සභාව විසින් පෙන්වා දී ඇත.[332]

ආ. යුද්ධයේ අවසන් අදියර තුළ රඳවා තබන ලද පුද්ගලයන් අතුරුදන් වීම

435. උගත් පාඩම් සහ ප්‍රතිසන්ධාන කොමිෂන් සභාව සම්බන්ධයෙන්[333] ජනාධිපති විමර්ශන කොමිසම විසින් අදහස් දක්වා ඇති අතුරුදන් වූ තැනැත්තන් සිටින්නේ කොතැනකද යන්න දැනගැනීමේ අයිතිය පිළිබඳ ප්‍රශ්නය සම්බන්ධයෙන් පරණගම කොමිෂන් සභාවට ප්‍රකාශ කිරීමට ඇත්තේ පහත කරුණයි.

"ස්වකීය ඥාතීන්ට හෝ ආදරණීයයන්ට සිදුවූයේ කුමක්ද යන්න දැන ගැනීමට නොහැකි වීමේ වේදනාව අවසන් කර ගැනීමට අපේක්ෂාවෙන් සිටින පුද්ගලයන්ගේ සහ පවුල් වල කටුක වේදනාවන්ගෙන්, ශ්‍රී ලංකා යුධ අරගල ඉතිහාසය, පිරී ඇත. පරණගම කොමිෂන් සභාවේ පළමු විධිනියෝගය තුළ මෙම කඩිනම් අවශ්‍යතා පැතිකඩ ආමන්ත්‍රණය කරනු ලබන අතර ජාත්‍යන්තර ප්‍රජාව විසින් ද මෙම කාරණය පිළිබඳව අවධානයට ලක් කොට ඇත. "[334]

436. බලහත්කාරයෙන් සිදු කරන ලද අතුරුදන් කරවීම් පිළිබඳ ප්‍රශ්නයේදී පරණගම කොමිෂන් සභාව පහත පරිදි අදහස් දක්වනු ලැබේ:

ජාත්‍යන්තර මානව හිමිකම් නීතියට යටත් වීමට අමතරව බලහත්කාරයෙන් සිදු කරන ලද අතුරුදන්වීම් සැලකීමේදී මනුෂ්‍යත්වයට එරෙහි අපරාධ චෝදනා ලෙස ද ඒවා දැක්වීමට හැකියාව පවතින බැවින් කොමිෂන් සභාවේ පළමු විධිනියෝගය එහි දෙවන විධිනියෝගය සමග ඇතැම් සමාන ලක්ෂණ දක්වයි. මේ සම්බන්ධයෙන් සැලකීමේදී පුළුල්ව පැතිරුණු හෝ පද්ධති හා බැඳුණු කිසියම් වර්යාවක් පිළිබඳ අවබෝධ කර ගත හැකි යම් රටාවක් මේ තුළින් පැන නගින්නේද යන්න තහවුරු කර ගැනීම සඳහා කොමිෂන් සභාව සැලකිලිමත් වේ.

තවදුරටත්, අතුරුදන්වූ තැනැත්තන් හට පසුව අශෝභන අයුරින් සැලකීම සහ / හෝ මරා දැමීම සිදු කරන ලද බවට සාක්ෂි පවතින අවස්ථාවල දී ජිනීවා ප්‍රඥප්තීන්හි 3 වෙනි පොදු වගන්තිය උල්ලංඝනය කිරීම පිළිබඳ චෝදනාවක් ඒ තුළින් නිර්මාණය විය හැකිය. මෙහිදී මිනීමැරීම, ප්‍රචණ්ඩ අයුරින් සැලකීම, වධ හිංසා පැමිණවීම හෝ පූර්ව නඩු විභාගයකින් තොරව මරණයට පත් කිරීම් සිදු කිරීම යනාදිය යුධ අපරාධ වශයෙන් සලකනු ලැබේ.[335]

<u>**යුද්ධයේ අවසාන දින කිහිපය තුළදී බස් රථයකට සෙනග පැටවීම**</u>

437. ඉහත සිද්ධිය සම්බන්ධයෙන්, මේජර්වරයෙකුගේ මූලිකත්වයෙන් කෙරෙන විමර්ශනයක් මේ සඳහා අවශ්‍ය බව පරණගම කොමිෂන් සභාවේ මතය වූ බවට ප්‍රකාශ කොට ඇති අතර, මේ සම්බන්ධයෙන් විමර්ශන කණ්ඩායමක් ද කොමිසම මගින් පත් කරන ලදී. මෙම ප්‍රකාශය සිදු කරන ලද්දේ වැනල් 4 නාලිකාවේ වීඩියෝ පටය තුළ අඩංගු වූ සිද්ධින් සම්බන්ධයෙන් වන අතර යුද්ධයේ අවසාන අදියර තුළ දී බස් රථවලට පුරවන ලද පුද්ගලයන් සියයක පමණ ප්‍රමාණයක් චෝදනා එල්ල වන බලහත්කාර අතුරුදන්වීම් වලට ලක්කිරීම සහ නඩු විභාගයකින් තොරව

---

[332] උගත් පාඩම් හා ප්‍රතිසන්ධාන කොමිෂන් සභා වාර්තාව, ඡේද 4.376 – 4.377, පරණගම කොමිෂන් සභාවේ අවසන් වාර්තාවේ 573 ඡේදය බලන්න

[333] පරණගම කොමිෂන් සභා අවසන් වාර්තාවේ 324 ඡේදයබලන්න

[334] පරණගම කොමිෂන් වාර්තාව, 434 ඡේදය

[335] පරණගම කොමිෂන් වාර්තාව, 435 ඡේදය

මරණයට පත් කිරීම පිළිබඳව ඒ තුළ ඇතුලත් විය. පරණගම කොමිෂන් සභාව විසින් තවදුරටත් මෙසේ ප්‍රකාශ කොට ඇත. ‘‘මේ පිළිබඳ තොරතුරු හැදෑරීමෙන් අනතුරුව මෙම පුද්ගලයන් මරණයට පත් කොට ඇත්දැයි සිතීමට සාධාරණ පදනමක් අප සතු වන බවට අප විසින් නිගමනය කොට ඇත."[336]

438. පරණගම කොමිෂන් සභාවේ විමර්ශන කණ්ඩායමේ විමර්ශන සටහන් නැවත හැදෑරීමේ අවශ්‍යතාවය වඩාත් ප්‍රබල වන්නේ ඉහත ආකාරයේ කරුණු තහවුරු කිරීම් හේතුවෙන් බව ජනාධිපති විමර්ශන කොමිසම විසින් පෙන්වා දෙනු ලැබේ.

439. පරණගම කොමිෂන් සභාව විසින් එහි අවසන් වාර්තාවේ පිටු අංක 105-106 තුළ 439- 444 දක්වා ඡේද වල පරීක්ෂාවට ලක් කරනු ලබන අතුරුදන්වීම් පිළිබඳ සිද්ධි ඔස්සේ එළඹිය හැකි නිගමනය වන්නේ ශ්‍රී ලංකා හමුදාව යටතට පත් වූ පුද්ගලයන් නිදහස් කරනු ලැබුවේ නම් ඔවුන් බොහෝ දුරට තම පවුල් වල සාමාජිකයන් හා සම්බන්ධ වීමට වැඩි ඉඩකඩක් පැවති බව ය.

440. පරණගම කොමිෂන් සභා වාර්තාවේ 439-444 දක්වා ඡේද තුළ දක්වා ඇති පරණගම කොමිෂන් සභාවේ අවධානයට ගෙන එන ලද අතුරුදන් කරවීම් බිළිබඳ අවස්ථා කිහිපයක් ලැයිස්තුගත කිරීමට මෙම ජනාධිපති විමර්ශන කොමිෂන් සභාව අපේක්ෂා කරයි.

441. 2014 නොවැම්බර් මස 04 වන දින මුලතිව් හිදී පැවති ජනතා හමුවකදී මුරුගේසු සෙල්ලම්මා නැමති මව සාක්ෂි ලබා දෙමින් ප්‍රකාශ කරන ලද්දේ 2019 මැයි මස 17 වන දින ඇය විසින් ඇගේ පුතුන් දෙදෙනා වන සෙල්ලකුමාර් සහ රාජා යන අය ශ්‍රී ලංකා හමුදාව වෙත භාර දෙනු ලැබූ බව ය. එම දෙදෙනාගෙන් එක් අයෙකු එල්.ටී.ටී.ඊ. සංවිධානය විසින් බලහත්කාරයෙන් රැගෙන ගොස් තිබූ අතර ඇගේ අනෙක් පුතණුවන් කෙසේ හෝ එල්.ටී.ටී.ඊ. සංවිධානය සමග සම්බන්ධ වී කටයුතු කොට ඇත්තෙකි. ඔවුන් දෙදෙනාගෙන් කිසිවෙකු හෝ ඉන් පසුව නැවත හමු වී නැත.[337]

442. 2014 ජුලි මස 06 වන දින පුදුකුඩුඉරිප්පුහි දී කොමිෂන් සභාව ඉදිරියේ සාක්ෂි ලබා දෙමින් වසන්තන් රෙගිනා විසින් වයස අවුරුදු 35 ක් වයසැති තම ස්වාමිපුරුෂයා 2009 මැයි මස 17 වන දින වත්තුවාහල් හමුදා මුර පොළෙහි දී හමුදාව වෙත භාර දීමේ සිද්ධිය පිළිබඳව සඳහන් කරන ලදී. ඔහු එල්.ටී.ටී.ඊ. හමුදාවට සම්බන්ධ වී සිට ඇති නමුත් ඉන් මිදී පැමිණ තම පවුල සමග සම්බන්ධ වී ඇත. එල්.ටී.ටී.ඊ. සාමාජිකයන් වශයෙන් සිටින හෝ සිටින ලද පුද්ගලයන් ඉලක්ක කරගනිමින් හමුදාව විසින් සිදු කළ නිවේදනයක ප්‍රතිඵලයක් වශයෙන් ඔහු හමුදාවට භාර වූ අවස්ථාවේ තමා ඔහු සමග සිටි බවට ඇය විසින් සාක්ෂි ලබා දෙන ලදී. එලෙස භාර වූ අනෙකුත් පුද්ගලයන්ද සමගින් තම ස්වාමිපුරුෂයා බසයකට නගවා ගනු ලැබූ බවට ඇය සාක්ෂි දරයි. එලෙස රැගෙන යන පුද්ගලයන් විමර්ශනයකට භාජනය කරනු ලබන බවත් ඉන් අනතුරුව ඔවුන් නැවත එවනු ලබන බවත් යුධ හමුදාව විසින් ඇයට දැනුම් දී ඇත. එහෙත් ඉන් පසු කිසි දිනෙක ඇය ඇයගේ ස්වාමි පුරුෂයා දැක නැත. [338]

443. 2014 ජුලි මස 05 වන දින පුදුකුඩුඉරිප්පුහිදී කොමිෂන් සභාව විසින් පැවැත්වූ මහජන හමුවක් ඉදිරියේ සාක්ෂි ලබා දෙමින් බගීරාදන් පෙරිමිනනායගී විසින් කොමිෂන් සභාවට ලබා දී ඇත්තේ එල්.ටී.ටී.ඊ. සංවිධානයේ ආරක්ෂක සේවයේ කටයුතු කරන ලද සෙල්වරාජා පහීරාදන් නමැති

[336] පරණගම කොමිෂන් වාර්තාව, 437 ඡේදය

[337] පරණගම කොමිෂන් වාර්තාව, 439 ඡේදය

[338] පරණගම කොමිෂන් වාර්තාව, 440 ඡේදය

ඇගේ ස්වාමිපුරුෂයා 2009 මැයි මස 18 වන දින හමුදාවට බාර වූ බව ය. ඔහු හමුදාවට භාර වන අවස්ථාවේ ඇයද ඔහු සමග සිට ඇත. භාර වීමෙන් අනතුරුව ඇගේ ස්වාමිපුරුෂයා සහ දළ වශයෙන් පුද්ගලයන් 50 දෙනෙකු පමණ බස් රථයකට නග්ගවා ගෙන ඇත. ඔහු නැවත කිසි දිනෙක දක්නට ලැබී නැත.[339]

444. 2014 නොවැම්බර් මස 05 වන දින මුලතිවුහිදී චන්ද්‍රකුමාර් දයාලිනි කොමිෂන් සභාව හමුවට සාක්ෂි ලබාදී ඇත. ඇයගේ සාක්ෂිය වයස අවුරුදු 42 ක් වූ තිරිවෙල්වම් මයිල්වාගනම් නැමති ඇගේ සහෝදරයා පිළිබඳවයි. ඔහු එල්.ටී.ටී.ඊ. සාමාජිකයෙකු වශයෙන් කටයුතු කොට ඇත. ඇගේ සාක්ෂිය වූයේ හමුදාව විසින් එල්.ටී.ටී.ඊ. සාමාජිකයන් හට භාර වන ලෙසට සිදු කළ දැනුම්දීම සඳහා එයට අනුකූලව ප්‍රතිචාර දැක්වූ පුද්ගලයන් අතර තම සහෝදරයාද වූ බව ය. 2009 මැයි මස 14 වන දින ඔහු අත්තුවාල් ප්‍රදේශයේදී භාර වී ඇත. ඔහුගේ බිරිඳ හෝ පවුලේ වෙනත් කිසිවෙකු ඔහු නැවත කිසි දිනෙක නොදුටු බවට ඇය විසින් සාක්ෂි ලබා දෙන ලදී.[340]

445. 2014 නොවැම්බර් මස 03 වන දින මුලතිවුහි දී ධනබාලසිංහම් පුෂ්පබාල් විසින්ද කොමිෂන් සභාව හමුවේ සාක්ෂි ලබා දෙන ලදී. ඇය විසින් සාක්ෂි ලබා දෙන ලද්දේ වයස අවුරුදු 32ක් වයස වූ ධනබාලසිංහම් විජයපාස්කර් නමැති ඇගේ පුතා සම්බන්ධයෙනි. 2019 මැයි මස 19 වන දින මුල්ලිවයික්කාල් හිදී හමුදාවට භාර වූ අවස්ථාවේදී ඇය ද ඇගේ පුතණුවන් කැටුව පැමිණ ඇත. තම පුතණුවන් ඇයගෙන් වෙන් කොට විමර්ශනයක් සඳහා රැගෙන ගිය බවත්, හමුදාව විසින් තවත් 40 දෙනෙකු පමණ සමගින් ඔහු රතු පැහැති බස්රථයකට නංවාගත් බවත් ප්‍රකාශ කොට ඇත. ඇයව වෙන බස් රථයකට නංවා ගෙන ඇත. වවුනියාවේ පිහිටි වෙට්ටිකුලම් 4 වන කලාපය වෙත ඇය රැගෙන ගොස් ඇති අතර ඇය විසින් තම පුතණුවන් අවසාන වරට දැක ඇත්තේ තමන් සිටි බස් රථයේ සිට ඔහු තම මවට සමුදෙමින් අත වනන ලද අවස්ථාවේය. තම පුතණුවන් සමග එම රතු පැහැති බස් රථයට නංවා ගනු ලැබූ 40 දෙනාගෙන් තවත් පිරිමි ළමුන් තිදෙනෙකු ඇය හඳුනන අයයි. ඇය වවුනියාව ප්‍රදේශයේ හමුදා කඳවුරු වෙත යමින් ඔවුන් පිළිබඳ සොයා බැලූ කිසිදු අවස්ථාවකදී ඇයට ඔවුන්ගෙන් කිසිවකු හෝ නැවත දැක ගැනීමට ලැබී නොමැත. ඇයගේ සාක්ෂිය වූයේ ඔවුන් සියලු දෙනාම එල්.ටී.ටී.ඊ. සංවිධානයේ සාමාජිකයන් වූ බව ය.[341]

446. චෝදනාවට ලක් වී ඇති ආකාරයට 2009 මැයි මස 18 වන දින ශ්‍රී ලංකා හමුදාව වෙත භාර වෙනු ලැබීමෙන් පසුව බස් රථ වලට පටවනු ලැබූ පුද්ගලයන් 110කගේ නම් සහිත ලැයිස්තුවක් සහිතව දකුණු අප්‍රිකාවේ මානව හිමිකම් සඳහා වන පදනමේ විධායක අධ්‍යක්ෂ සහ ශ්‍රී ලංකාවේ පශ්චාත් යුධ වගවීම් ගැටලු පිලිබඳ හිටපු එක්සත් ජාතීන්ගේ උපදේශිකා යස්මින් සූකා විසින් එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කවුන්සිලය වෙත චෝදනාවක් ගොනු කොට තිබූ බවට වාර්තා කරමින් 2005 මැයි මස 19 වන දින සිලෝන් ටුඩේ පුවත්පතේ පළ කරන ලද ලිපියක් පරණගම කොමිෂන් සභාව විසින් උපුටා දක්වනු ලැබේ. චෝදනා එල්ල වන ආකාරයට අවසාන වරට හමුදාව භාරයේ සිටිනු දුටු මෙම පුද්ගලයන් ස්වකීය පවුල් වල සාමාජිකයන් විසින් නැවත කිසිදිනෙක දැක නැත. කතෝලික පූජකවරයෙකු වූ ෆ්‍රැන්සිස් ජෝසප් පියතුමාද මෙම පිරිස අතරට ඇතුලත් වේ. [342]

---

[339] පරණගම කොමිෂන් වාර්තාව, 441 ඡේදය

[340] පරණගම කොමිෂන් වාර්තාව, 442 ඡේදය

[341] පරණගම කොමිෂන් වාර්තාව, 443 ඡේදය

[342] පරණගම කොමිෂන් වාර්තාව, 444 ඡේදය

<u>අතුරුදන්වීම් විය හැකි යැයි පෙනී යන සිද්ධීන් *(Phantom dissapearances)*</u>

447. අතුරුදන්වීම් ලෙස පෙනී යන සිද්ධීන්ද සිදුවිය හැකි බව පරණගම කොමිෂන් සභාව විසින් අවධාරණය කොට ඇත. අතුරුදන් වූවා යැයි පැවසෙන පුද්ගලයන් වෙනත් ස්ථානවලින් හමුවීම පිළිබඳ විස්තර දැක්වීමේදී කදිරවෙල් තයපරරාජාගේ සිද්ධිය උදාහරණයක් ලෙස ගත හැකිය.[343]

448. ජනාධිපති විමර්ශන කොමිෂන් සභාව හමුවේ සාක්ෂි ලබා දෙමින් පරණගම කොමිෂන් සභාවේ සභාපති මැක්ස්වෙල් පරණගම මහතා විසින් පැහැදිලි ලෙස අප අවධානයට ලක්කරන ලද්දේ නිරන්තරයෙන් සිදු විය හැකි අතුරුදන් වීම් ලෙස පෙනී යන සිදුවීම් ද නොසලකා හැරිය නොහැකි බව ය. සැබැවින්ම මෙහිදී මැක්ස්වෙල් පරණගම මහතා විසින් කදිරවේල් තයපරරාජාගේ සිද්ධිය පිළිබඳව තොරතුරු දැක්වූ අතර, යාපනය පදනම් කරගනිමින් ක්‍රියාත්මක වන ප්‍රසිද්ධ රාජ්‍ය නොවන ආයතනයක් විසින් ඔහු වෙඩි වැදී සිට ඇති බවටත් ඉන් පසුව ඔහු ආදාහනය කරනු ලැබූ බවටත් දක්වන තොරතුරු සමගින් මෙම පුද්ගලයා ආරක්ෂක හමුදාවන් විසින් මරණයට පත් කරන ලද බවට එල්.ටී.ටී.ඊ. මූලාශ්‍ර විසින් චෝදනා එල්ල කොට තිබුණි.[344]

449. ඔහු සැඟවී තම බිරිඳ සහ දරුවන් සිව් දෙනාද සමගින් 2014 මැයි මස තමිල්නාඩුවට පැමිණ තිබීම මෙයට අදාළ සත්‍ය සිදුවීමයි. ඉන්දියාවට නීති විරෝධී ලෙස ඇතුලුවීම සම්බන්ධයෙන් මෙම පුද්ගලයා අත් අඩංගුවට ගැනීමේදී ඔහුගේ අනන්‍යතාවය හෙලිදරව් වී ඇත. පරණගම කොමිෂන් සභාව විසින් ඒ සම්බන්ධයෙන් පහත පරිදි ප්‍රකාශ කරයි.

"*මෙලෙස අතුරුදන්වීම් වශයෙන් පෙනී යනු ලබන සිද්ධීන් කොපමණ ප්‍රමාණයක් සිදුවී ඇත්ද යන්න අනුමාන කළ නොහැකිය...."*[345]

450. මෙලෙස හමුදාවට භාර වූ පුද්ගලයන් රැගෙන ගොස් තබා ගත් රඳවා ගැනීමේ කඳවුරු පිළිබඳව ලිපි ලියන ලද හිටපු බී.බී.සී. පුවත්පත් කලාවේදියකු ගේ නිරීක්ෂණ කෙරෙහි ද මෙම සංදර්භයට අදාළව පරණගම කොමිෂන් සභාවේ අවධානය යොමුවිය.

"*කඳවුරු වටා ආරක්ෂාව යොදවා, පිටිසුම් දොරටුවල ආරක්ෂකයින් රඳවා තබා, කඳවුරු වටා මුර සංචාර සිදුකරමින්, කනස්සල්ලට පත්ව සිටින ඥාතීන් විසින් ආහාර පාර්සල් ලබා දීම අධීක්ෂණය කරමින් සහ කඳවුරු තුළට අවසර දී තිබූ අමුත්තන් සුළු පිරිස හසුරුවමින් සිටි ශ්‍රී ලංකා හමුදාව, දැන් එම පුද්ගලයන්ට ඉවත්ව යාමට අවසර දුන්නේය. පහළ නිලයන්ට අයත් සෙබලුන් මිනිසුන්ට යාමට ඉඩදීම සඳහා අල්ලස් ලබා ගනිමින්, හෝ ග්‍රීස්මයෙන්, අපවිත්‍රවී තිබූ සහ කොටුකර සිරකරගෙන සිටි ස්ථානයෙන් බේරී යන කුණු තැවරුණු සහ විඩිවට පත්ව සිටි සිවිල් වැසියන් නොදුටුවා සේ අනුකම්පා සහගතව සිටි බව ජ්‍යෙෂ්ඨ අණ දෙන නිලධාරීන්ට වහාම වැටහී ගියේය."*[346]

451. යුද්ධය හා බැඳුණු වාතාවරණයන් හේතු කොට ගෙන තම ස්වාමිපුරුෂයාගෙන් වෙන් වූ ඉලංගදීපන් තුසියන්තිනී මහත්මිය විසින් පරණගම කොමිෂන් සභාව හමුවට ගොනු කරන ලද තවත් පැමිණිල්ලක් තුළින් මෙලෙස අතුරුදන් කිරීම් ලෙස පෙනී යන සිද්ධියක් පිළිබඳව තවත්

---

[343] පරණගම කොමිෂන් වාර්තාව, 445 ඡේදය

[344] මෙම ජනාධිපති විමර්ශන කොමිසම ඉදිරියේ මැක්ස්වෙල් පරණගම මහතා විසින් ඉදිරිපත් කරන ලද සාක්ෂි සඳහා මෙම අවසන් වාර්තාවේ 4 වන පරිච්ඡේදය බලන්න.

[345] පරණගම කොමිෂන් වාර්තාව, 445 ඡේදය

[346] ගෝර්ඩන් වේයිස්, ද කේජ්, පිටුව 243

උදාහරණයක් දැක්විය හැකිය. තම ස්වාමිපුරුෂයා අතුරුදන් වූ බවට ඇය විසින් පරණගම කොමිෂන් සභාව හමුවට පැමිණිල්ලක් සිදු කොට තිබූ අතර, ඉන් අනතුරුව, ඇයගේ ස්වාමිපුරුෂයා සරණාගතයකු වශයෙන් දකුණු ඉන්දියාවේ අන්දපන් කඳවුරේ සිටිනු දුටු බවට තම ස්වාමිපුරුෂයාගේ මිතුරන්ගෙන් තමන්ට තොරතුරු ලැබුණු බවට ඇය විසින් පසුව පරණගම කොමිෂන් සභාව හමුවට දැනුම් දී ඇත. පසුව ඇයට කඳවුරේදී තම ස්වාමිපුරුෂයා සමග සම්බන්ධ වීමට හැකියාව ලැබුණු අතර, මේ වන විට ඔවුන් නැවත එකතු වී ශ්‍රී ලංකාවේ ජීවත් වෙමින් සිටී.[347]

452. මෙම ජනාධිපති විමර්ශන කොමිෂන් සභාව හමුවේ සාක්ෂි ලබා දෙමින් මැක්ස්වෙල් පරණගම මහතා විසින් තවත් ඉතා වැදගත් කාරණයක් කොමසාරිස්වරුන්ගේ අවධානයට ගෙන එන ලදී. පරණගම කොමිෂන් සභාව විසින් විදේශ කටයුතු අමාත්‍යාංශය ඔස්සේ විදේශ රටවල සරණාගතභාවය ලබා ගෙන ඇති පුද්ගලයන් පිළිබඳව තොරතුරු ඉල්ලා ඇත. පෞද්ගලිකත්වය පිළිබඳ නීති බාධාවක් ලෙස මෙහිදී අදාළ වන බව ප්‍රකාශ කරමින් ශ්‍රී ලංකාවේ පිහිටි විදේශ තානාපති කාර්යාල විසින් එවන් තොරතුරු ලබා ගැනීමක් සිදු නොවීය. මැක්ස්වෙල් පරණගම මහතාට අනුව මේ හේතු කොට ගෙන මෙම කාරණය පරණගම කොමිෂන් සභාවට එතරම් ලෙහෙසි පහසු කටයුත්තක් වී නොමැත.

453. එවකට සිටි ජනාධිපතිවරයා වූ මෛත්‍රීපාල සිරිසේන මහතාට 2015 අප්‍රේල් මස 23 වන දින භාර දුන් අතුරු වාර්තාව තුළ සඳහන් වූ පරිදි, අත් අඩංගුවේ සිටි, බන්ධනාගාරගතව සිටි, රඳවා ගැනීමේ කඳවුරු වල සිටි, පුනරුත්ථාපන කඳවුරු වල සහ සරණාගත කඳවුරු වල සිටි පුද්ගලයන්ගේ නම් තහවුරු කර ගැනීම උදෙසා ආරක්ෂක අමාත්‍යාංශය වෙත සහ අධිකරණ අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කරන ලද ලිඛිත ඉල්ලීම් අනුමත කිරීමක් හෝ ඒවාට එකඟ වීමක් සිදු නොවූ බවට පරණගම කොමිෂන් සභාව විසින් කණගාටුවෙන් සඳහන් කොට ඇත. කෙසේ වුවද, අවසාන වාර්තාවේ 448 වන ඡේදය තුළ පරණගම කොමිෂන් සභාව විසින් සඳහන් කොට ඇත්තේ 2015 අප්‍රේල් මස 23 වන දින සිට කොමිෂන් සභාවට එවන් නම් ලබා දීම ආරම්භ වී ඇති බව ය.

454. පරණගම කොමිෂන් සභාව අතුරුදන් වූ පුද්ගලයන් පිළිබඳ ඉතා වැදගත් නිරීක්ෂණයක් සිය අවසන් වාර්තාවේ 449 ඡේදය තුළ අවධාරණය කොට ඇත.

"*අත් අඩංගුවේ සිටි පුද්ගලයන් නිදහස් කරනු ලැබීමෙන් අනතුරුව, ස්වකීය පවුල් වල සාමාජිකයන්ගේ දැනුවත්භාවයකින් තොරව විදේශ වලට යාමටත්, නොඑසේ නම් රහසිගතව සැඟවී සිටීමේ හෝ ස්වකීය අනන්‍යතාවයන් වෙනස් කර ගැනීමේ විකල්පයන්ට යොමු වී තිබීමටත් බොහෝ දුරට ඉඩකඩ පවතින අතර, මේ වන විට කුමන ඉරණමක් අත් වූයේද යන්න කිසිවෙකු නොදන්නා අතුරුදන් වූ තැනැත්තන් බහුතරයකගේ ඉරණම පිළිබඳව කරුණු තහවුරු කර ගැනීම වෙනුවෙන් සත්‍යය තහවුරු කර ගැනීම අවශ්‍ය වේ.*"[348]

455. යුද්ධයේ අවසන් අදියර තුළදී සිදු වූ අතුරුදන්වීම් සම්බන්ධයෙන් වන පැමිණිලි පවා තමන් වෙත ලැබී තිබෙන බව අතුරුදන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය විසින් ජනාධිපති විමර්ශන කොමිෂන් සභාවේ අවධානයට ලක් කොට ඇත. කිසියම් පුද්ගලයෙකුගේ බිරිඳක් විසින් තම ස්වාමිපුරුෂයා අතුරුදන් වූ බවට අතුරුදන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය වෙත සිදු කරන ලද පැමිණිල්ලකින් අනතුරුව, ශ්‍රී ලංකාවේ ජීවත් වන එම පළමු බිරිඳගේ දැඩි චිත්ත වික්ෂේපයට හේතු සලසමින් අතුරුදන් වූවා යැයි කියනු ලබන අදාළ ස්වාමිපුරුෂයා නැවත වතාවක් විවාහ වී

[347] පරණගම කොමිෂන් වාර්තාව, 446 ඡේදය

[348] පරණගම කොමිෂන් වාර්තාව, 449 ඡේදය

දැනට ප්‍රංශයේ ජීවත් වෙමින් සිටින බවට තොරතුරු තමන්ට අනාවරණය කර ගැනීමට හැකි වූ බව ජනාධිපති විමර්ශන කොමිෂන් සභාව වෙත දැනුම් දී ඇත.

456. කොළඹ පැවති මහජන හමු වලින් එකකදී ඉහත කී බස් රථ සිදුවීම විස්තර කරන ලද හිටපු එල්.ටී.ටී.ඊ. සාමාජිකයෙකුගේ සාක්ෂියක් මෙම ජනාධිපති විමර්ශන කොමිෂන් සභාව විසින් සිහිපත් කරනු ලැබේ. ඔහු විසින් ප්‍රකාශ කොට ඇත්තේ තමන් බස් රථයට ගොඩ නොවූ නිසාවෙන් ජීවිතය බේරා ගෙන සිටින බව ය. [349]

457. මෙම අතුරුදන්වීම් සම්බන්ධයෙන් කිසියම් අපරාධයක් හෝ වරදක් සිදු වී ඇති බවට ප්‍රමාණවත් සාක්ෂි පවතින්නේ නම්, අදාළ අපරාධකරුවන් පිළිබඳව විමර්ශනය කිරීම සහ චෝදනා ගොනු කිරීම සම්බන්ධයෙන් පවත්නා වගකීම පිළිබඳව උගත් පාඩම් සහ ප්‍රතිසන්ධාන කොමිෂන් සභාව සහ පරණගම කොමිෂන් සභාව යන කොමිෂන් සභා දෙකම මගින් අවධාරණය කරන ලද බව මෙහිදී සිහිපත් කළ යුතුය.[350]

458. මෙම ජනාධිපති විමර්ශන කොමිෂන් සභාව විසින් මෙම අවසන් වාර්තාවේ 6 වන පරිච්ඡේදය තුළ මෙම ගැටළුව සම්බන්ධයෙන් ස්වකීය නිර්දේශ ඉදිරිපත් කරනු ලැබේ.

(ඇ) සුදු කොඩි රැගත් පුද්ගලයන් මරා දැමීම

459. චැනල් 4 නාලිකාවේ වැඩසටහන් තුළින් සුදු කොඩි රැගත් පුද්ගලයන් ඝාතනය කිරීමක් වශයෙන් පෙන්වන ලද 2009 මැයි මස 18 වන දින සිදු කරන ලද නීති විරෝධී මරණයට පත් කිරීම් ස්වාධීන අධිකරණ විමර්ශනයකට ලක් විය යුතු කාරණයක් බවට පරණගම කොමිෂන් සභාව විසින් අදහස් දක්වනු ලැබේ. සුදු කොඩියක ආරක්ෂාව යටතේ සහ ස්වකීය පෞද්ගලික ආරක්ෂාව පිළිබඳ තක්සේරුවක් සහිතව ඉදිරිපත් වී ඇති බවට පැවසෙන එල්.ටී.ටී.ඊ. දේශපාලන අංශ ප්‍රධානි බාලසිංහම් නඩේෂන් සහ එල්.ටී.ටී.ඊ. සාම ලේකම් කාර්යාල ප්‍රධානී සිවරත්නම් පුලිදේවන් සහ අනෙකුත් පිරිසගේ මරණ වලට මෙම කාරණය හේතු වූ බවට චෝදනා එල්ල වනු ලැබේ. මෙම චෝදනා සනාථ කරනු ලැබුවහොත් හේග් රෙගුලාසි සහ ජිනීවා සම්මුතියේ[351] 3 වෙනි පොදු වගන්තිය යටතේ එවන් ක්‍රියාකලාපයක් නිසැකවම යුධ අපරාධයක් බවට පත් වේ. යටත්වීම විවිධ ස්වරූපයන්ගෙන් සිදු විය හැකි අතර, සුදු කොඩියක් රැගෙන පැමිණීම ද පැහැදිලිවම එයට අයත් වේ. [352]

460. භාරවීමේදී සුදු කොඩි භාවිතා කිරීමේ ක්‍රමය යොදා ගනු ලැබූ සහ හමුදාව අතට පත්වීමෙන් අනතුරුව කිසිදු හානියකට ලක් නොවූ එල්.ටී.ටී.ඊ. සෙබලුන් සහ සිවිල් වැසියන් පිළිබඳව සාක්ෂි (එල්.ටී.ටී.ඊ. නායකත්වය භාර වීම සම්බන්ධයෙන් නොවේ) පිළිබඳව උගත් පාඩම් සහ ප්‍රතිසන්ධාන කොමිෂන් සභාව ද සඳහන් කරන බව මෙහිදී මතකයට නගා ගත යුතුය.[353]

---

[349] මෙම අවසන් වාර්තාවේ 4 පරිච්ඡේදය බලන්න

[350] ඉහතින් දක්වා ඇති පරිදි ජනාධිපති විමර්ශන කොමිෂන් සභාවේ අවසන් වාර්තාවේ 454 ඡේදය සහ 9.23 ඡේදය සහ පරණගම කොමිෂන් සභා වාර්තාවේ 449 ඡේදය බලන්න.

[351] පරණගම කොමිෂන් වාර්තාව, 450 ඡේදය

[352] ජාත්‍යන්තර රතුකුරුස සංවිධානය වාර්තාවේ ව්‍යවහාර ජාත්‍යන්තර මානුෂීය නීතිය - 47 වන රීතිය බලන්න. ජාත්‍යන්තර රතුකුරුස සංවිධානය අධ්‍යයනයේ පළමු වන වෙළුමේ පිටු අංක 168 ද බලන්න.

[353] උගත්පාඩම් හා ප්‍රතිසන්ධාන කොමිෂන් සභා වාර්තාව, ඡේය 4.317

461. කෙසේ වුවද, එල්.ටී.ටී.ඊ. නායකත්වය ඉලක්ක කරගනිමින් ඔවුන් වෙන් කොට මරණයට පත් කිරීම් සිදු කරන ලද බවට පෙනී යතැයි මින් අදහස් කෙරෙන බැවින් එල්.ටී.ටී.ඊ. නායකත්වය යටත් වීම සම්බන්ධයෙන් පවත්නා චෝදනා මෙම සාක්ෂි ඔස්සේ වඩාත් බරපතල බවට පත් වන බව පරණගම කොමිෂන් සභාව විසින් සිය අදහස් දැක්වීමේදී නිරීක්ෂණය කොට ඇත. [354]

462. 2009 වසරේදී එක්සත් ජනපද රාජ්‍ය දෙපාර්තමේන්තු වාර්තාව සම්බන්ධයෙන් ද පරණගම කොමිෂන් සභාව විසින් සඳහන් කරනු ලැබේ.

එහි පහත පරිදි සඳහන් වෙයි.

"*මෙම වාර්තාවලට අනුව නඩේෂන් සහ පුලිදේවන් විසින් තවත් පුද්ගලයන් 300 දෙනෙකු පමණ සමග තමන් හමුදාවට භාර වීම සම්බන්ධයෙන් සාකච්ඡා කරගැනීම සඳහා විදේශ කටයුතු අමාත්‍යාංශයේ ලේකම් ආචාර්ය පාලිත කොහොන සමග අතරමැදියන් වශයෙන් කටයුතු කළ ජාත්‍යන්තර සහ දේශීය ක්‍රියාකාරීන් සමග ඒ පිළිබඳව අදහස් හුවමාරු කරගෙන ඇත. තමන් හමුදාවට භාර වන අවස්ථාවේදී සාක්ෂි වශයෙන් එම අවස්ථාවට එක්සත් ජාතීන්ගේ මහ ලේකම්වරයාගේ නියෝජිත විජය නම්ලියාර් සම්බන්ධ කර ගන්නා ලෙසට නඩේෂන් විසින් ඉල්ලීමක් සිදු කොට තිබූ නමුත්, හමුදාවට භාර වන එල්.ටී.ටී.ඊ. නායකයන්ගේ ආරක්ෂාව තහවුරු කරනු ලබන බවට ජනාධිපති රාජපක්ෂ මහතා විසින් තහවුරු කොට තිබෙන බව ඔහු වෙත පවසා තිබුණි. ඒ අනුව මැයි 18 වන දින උදෑසන පිරිමින් සහ කාන්තාවන් 12කින් පමණ ආසන්න වශයෙන් සමන්විත කණ්ඩායමක පෙරටු කොට ගනිමින් නඩේෂන් සහ පුලිදේවන් යන අය සුදු කොඩි සොලවමින් ශ්‍රී ලංකා හමුදා කණ්ඩායම් වෙත පැමිණ ඇත. එම ප්‍රදේශයෙන් පසුව පලා ගිය දෙමළ සාක්ෂිකරුගේ සාක්ෂියට අනුව ශ්‍රී ලංකා හමුදාව විසින් ඔවුනට මැෂින් තුවක්කු වලින් වෙඩි තැබීම ආරම්භ කොට ඇත. වාර්තා වූ පරිදි එම කණ්ඩායමේ සිටි සියලුම දෙනා මරා දමනු ලැබ ඇත.*"[355]

463. දේශපාලන කණ්ඩායම හමුදාවට යටත්වීමෙන් අනතුරුව ඔවුනට තේපැන් සංග්‍රහයක් ලබා දී පසුව ඔවුන් වෙත පහර දී වෙඩි තබන ලද බවට තමන් වෙත දැනගන්නට ලැබී ඇති බවට කරුණු දක්වමින් එක් සාක්ෂිකරුවකු විසින් අදහස් දක්වා තිබුණි.[356]

464. එල්.ටී.ටී.ඊ. දේශපාලන අංශයේ ප්‍රධානී මිය ගිය එස්.පී. තමිල් චෙල්වම්ගේ බිරිඳ වන ශෂිරේඛා තමිල් චෙල්වම් විසින් 2011 වසරේදී සම්මුඛ සාකච්ඡාවකට සහභාගි වෙමින් ප්‍රකාශ කරන ලද්දේ ඇය හමුදාවට භාර වන අවස්ථාවේ කිසිවෙකු හෝ සුදු කොඩි රැගෙන නොගිය බවත්, ඇතැම් එල්.ටී.ටී.ඊ. නායකයන් සුදු කොඩි රැගෙන පැමිණි බවට පවතින කථා බහ සත්‍ය නොවන බවත් ය.[357]

465. 2013 පෙබරවාරි මස 24 වන දින නිදහස පුවත්පතට ෆ්‍රැන්සිස් හැරිසන් විසින් ලියන ලද ලිපියක් ඔස්සේ තවත් කතන්දරයක් පිළිබඳව පරණගම කොමිෂන් සභාව දැනුවත් කොට ඇති අතර, එයට අනුව සුදු කොඩි දරමින් පැමිණ හමුදාවට භාර වීමෙන් පසු එල්.ටී.ටී.ඊ. නායකයන් ශ්‍රී ලංකා හමුදාව විසින් මරණයට පත් කරන ලද බවට චෝදනා කිරීම සඳහා පළමු වතාවට ඉදිරිපත් වූ සාක්ෂිකරුවන් දෙදෙනෙකු පිළිබඳව ඇය විසින් සඳහන් කරනු ලැබේ. මරණයට පත් කිරීමට

[354] පරණගම කොමිෂන් වාර්තාව, 451 ඡේදය

[355] පරණගම කොමිෂන් වාර්තාව, 455 ඡේදය

[356] පරණගම කොමිෂන් වාර්තාව, 457 ඡේදය

[357] පරණගම කොමිෂන් වාර්තාව, 458 ඡේදය

පෙරාතුව ඔවුන් කිසියම් ප්‍රචණ්ඩත්වයකට හෝ වෙනත් පීඩන ස්වරූපයන්ට ලක් කොට වධහිංසා පමුණුවා ඇති බවට ඔවුන්ගේ මළ සිරුරුවල ඡායාරූප තුළින් කරුණු හඟවනු ලැබේ. [358]

466. ජනාධිපති කොමිෂන් සභාවේ අදහසට අනුව සහ ඉහතින් දක්වා ඇති ඇතැම් විට පරස්පර විරෝධි වන සාක්ෂි ඔස්සේ මතු වන පරිදි, සුදු කොඩි රැගත් පුද්ගලයන් මරණයට පත් කිරීම පිළිබඳ අවස්ථාවන් කිසිදු ආකාරයකින් පැහැදිලිතාවයක් නොගනී. මෙම චෝදනාවල බරපතල භාවය හේතු කොට ගෙන, ජනාධිපති විමර්ශන කොමිෂන් සභාව විසින් ප්‍රකාශ කරනුයේ මෙම කාරණා පිළිබඳ තොරතුරු තහවුරු කර ගැනීමටත් අදාළ වගකීම් පිළිබඳ නිශ්චය කර ගැනීමටත් සත්‍යය අනාවරණය කර ගැනීමටත් ස්වාධීන අධිකරණ විමර්ශනයක් පැවැත්වීම අවශ්‍ය වන බවට එය විසින් නිගමනය කරන ලද බව ය.[359]

මරණයට පත් කිරීම් පිළිබඳ පෞද්ගලික චෝදනා

467. පරණගම කොමිෂන් සභාව විසින් ද මරණයට පත් කිරීම පිළිබඳව සිද්ධි තුනක් වෙත ස්වකීය අවධානය යොමු කරනු ලබන අතර ජනාධිපති විමර්ශන කොමිෂන් සභාව විසින් ද එම සිදුවීම් දැඩි විමර්ශනයකට ලක් කළ යුතු බවට ප්‍රබල මතයක් දරනු ලැබේ. හිතාමතා පුද්ගලයන් මරණයට පත් කරන ලද බවට බැලූ බැල්මට පෙනෙන සාක්ෂි පැන නැගීමක් සිදු වන්නේ නම් අපරාධකරුවන් නීතියේ රැහැනට හසු කිරීමට කටයුතු කළ යුතු වේ.

චෝදනා එල්ල වන ඉසයි ප්‍රියා මරණයට පත් කිරීම

468. 2013 නොවැම්බර් මාසයේ දී චැනල් 4 රූපවාහිනිය විසින් ශ්‍රී ලංකා හමුදාව යටතේ සිරකරුවකු වශයෙන් සිටි සොහානා ධර්මරාජා හෙවත් ඉසයි ප්‍රියා පිළිබඳ වීඩියෝ පටයක් නිකුත් කොට ඇත. ඇය එල්.ටී.ටී.ඊ. මුද්‍රණාලයේ සහ සන්නිවේදන අංශයේ ඉහළ ක්‍රියාකාරී සාමාජිකාවක් වී ඇත. චැනල් 4 නාලිකාව ඔස්සේ පෙන්වන ලද ඇයගේ මල සිරුරේ ඡායාරූප තුළින් පැහැදිලිව දක්වාලනුයේ බලහත්කාරයෙන් මරා දැමීමක ස්වරූපයයි. එසේම, ඉසයි ප්‍රියාගේ පවුලේ අයගෙන් ඇගේ අතුරුදන්වීම පිළිබඳ ප්‍රත්‍යක්ෂ තොරතුරු තමන් වෙත ලැබුණු බව ජනාධිපති කොමිසම විසින්ද ප්‍රකාශ කරනු ලැබේ. [360]

කර්නල් රමේෂ්ගේ මරණය

469. ටී. තුරෙයිරාජසිංහම් හෙවත් කර්නල් රමේෂ් සම්බන්ධයෙන් චැනල් 4 නාලිකාව හා අනිකුත් මූලාශ්‍ර මගින් ලබා ගත් විඩියෝ පට සහ ඡායාරූප ඔස්සේ පෙන්නුම් කරන පරිදි ආරක්ෂක නිලධාරීන් විසින් මෙම එල්.ටී.ටී.ඊ. අණ දෙන නිලධාරියා ප්‍රශ්න කිරීමකට ලක් කරනු ලැබේ. මෙම වීඩියෝ කැමරා පටිගත කිරීම් ඔස්සේ දක්වන පරිදි යුද්ධයේ අවසාන දින කිහිපය තුළ ශ්‍රී ලංකා හමුදාව විසින් මෙලෙස ප්‍රශ්න කිරීම් සිදු කරනු ලබන ආකාරය පෙන්නුම් කරනු ලබන අතර චැනල් 4 නාලිකාව විසින් ශ්‍රී ලංකා හමුදාවේ නිලධාරීන් වශයෙන් චෝදනා එල්ල කරනු ලබන ප්‍රශ්න අසනු ලබන පාර්ශ්වයන්ගේ මුහුණු ද වීඩියෝ ගත කිරීමට ලක් ව ඇත. මෙම සිදුවීමෙන් දින කිහිපයකට පසුව ලබාගත් මෙම පටිගත කිරීමේ උපාංගයේ දත්ත තුළ පෙන්වන කර්නල්

[358] පරණගම කොමිෂන් වාර්තාව, 459 ඡේදය

[359] පරණගම කොමිෂන් සභාව වාර්තාව, 460 ඡේදය

[360] පරණගම කොමිෂන් සභාව වාර්තාව, 461 ඡේදය

රමේෂ්ගේ අංග ඡේදනය කරන ලද මළ සිරුර පිළිබඳ ඡායාරූප වලින් ද නැවතත් පිලිබිඹු කරනු ලබන්නේ බලහත්කාරයෙන් පුද්ගලයන් මරණයට ලක් කිරීම පිළිබඳවයි.[361]

බාලචන්ද්‍රන් ප්‍රභාකරන්ගේ මරා දැමීම

470. එල්.ටී.ටී.ඊ. නායකයාගේ අවුරුදු 12 ක් වයසැති පුතණුවන් වන බාලචන්ද්‍රන් ප්‍රභාකරන් දක්වමින් ඡායාරූප මාලාවක් 2013 පෙබරවාරි මස ඉදිරිපත් විය. 2009 මැයි මස වන විට ඔහු බංකරයක් තුළ තනිවම හොඳින් සිටින ආකාරය මෙම ඡායාරූප වලින් පෙන්නුම් කරන ලදී. ඉන් පසුව ඔහු ශ්‍රී ලංකා හමුදාව භාරයේ සිටි බවට චෝදනාවක් එල්ල වේ. වැඩිකල් ගත නොවී උණ්ඩ වලින් සිදුරු වූ පපුවක් සහිතව ඔහු බිම මැරී වැටී සිටින ආකාරය පෙන්නුම් කරන ලදී. මෙම ඡායාරූප කට්ටල දෙවර්ගයම එකම කැමරාවෙන් පැය කිහිපයක කාල වෙනසක් තුළ ගනු ලැබූ ඒවා බවට ප්‍රකාශ වේ. චැනල් 4 නාලිකාවේ උපදෙස් යටතේ චෝහාරික විද්‍යා විශ්ලේෂකයන් විසින් යෝජනා කරනු ලබන්නේ මෙම ළමයා ද මරා දැමීමට ලක් වී ඇති බව ය.[362]

471. ඒ අනුව මෙම ජනාධිපති කොමිෂන් සභාව විසින් පහත පරිදි සඳහන් කරනු ලැබේ.

පැහැදිලිවම මෙම චෝදනාව ඔප්පු කරනු ලැබේ නම්, එය මගින් සිදුවන්නේ යුද්ධයට අදාළ නීති පැහැදිලිව උල්ලංඝනය කිරීමකි. අඩු වශයෙන් ශ්‍රී ලංකාවේ ජ්‍යෙෂ්ඨ හමුදා ජනරාල්වරයෙකු වන මේජර් ජෙනරාල් උදය පෙරේරා විසින් මෙම චෝදනාව එල්ල වන දාමරිකකම් පිළිබඳ විමර්ශනයක් සිදු කිරීමේ වැදගත්කම පිළිබඳව ප්‍රකාශයට පත් කොට ඇත. ඉන් අනතුරුව ද ෆීල්ඩ් මාර්ෂල් සරත් ෆොන්සේකා එනම් ශ්‍රී ලංකා යුධ හමුදාවේ හිටපු හමුදාපති විසින් ඉතා මෑතකදී ද යුධ අපරාධ පිළිබඳ විමර්ශනය කිරීමේ අවශ්‍යතාවය තහවුරු කොට ඇත.[363]

472. මෙම සිදුවීම් පිළිබඳව අළුතින් විමර්ශනයක් සිදු කිරීම අවශ්‍ය වන බවත්, සාක්ෂි පැවතීම මත මෙම අපරාධකරුවන් නීතියේ රැහැනට හසු කර ගත යුතු බවත් ඉතාම පැහැදිලි ය.

(ඇ) සිවිල් වැසියන් සහ රෝහල් වෙත ෂෙල් ප්‍රහාර එල්ල කිරීම

473. ජනාධිපති කොමිසම මගින් අනාවරණය කරගත් කරුණු හා සාපේක්ෂව, සිවිල් වැසියන් හා රෝහල් වෙත ෂෙල් ප්‍රහාර එල්ල කිරීම පිළිබඳව උගත් පාඩම් සහ ප්‍රතිසන්ධාන කොමිෂන් සභාවේ සාකච්ඡාව දැන් ජනාධිපති විමර්ශන කොමිෂන් සභාව විසින් සංසන්දනයට ලක් කරනු ලැබේ.

474. උගත් පාඩම් සහ ප්‍රතිසන්ධාන කොමිෂන් සභාව විසින් කටයුතු කරන ලද තවත් ක්ෂේත්‍රයක් වන්නේ සිවිල් වැසියන් සහ රෝහල් වෙත ෂෙල් ප්‍රහාර එල්ල කිරීම සම්බන්ධ සිද්ධීන් ය. විශාල අලාභ හානි ඇති කරමින් සහ තුවාලකරුවන් විශාල ප්‍රමාණයක් නිර්මාණය කරමින් මෙම ෂෙල් ප්‍රහාර රෝහල් මතට පතිත වී ඇති බවට උගත් පාඩම් සහ ප්‍රතිසන්ධාන කොමිෂන් සභාව විසින් පිළිගනු ලැබේ.[364] කෙසේ වුවද, කාලය, නිශ්චිත ස්ථානය සහ වෙඩි තැබීම් සිදුවූ දිශාව පිළිබඳ පැහැදිලි සලකා බැලීමේ දී අදාළ සිදුවීම් වල නිශ්චිත ස්වභාවය පිළිබඳ යම්තාක් දුරකට ව්‍යාකූල වූ චිත්‍රයක් උගත් පාඩම් සහ ප්‍රතිසන්ධාන කොමිෂන් සභාව ඉදිරියට ඉදිරිපත් කරන ලද කාරණා ඔස්සේ නිර්මාණය වන බවට උගත් පාඩම් සහ ප්‍රතිසන්ධාන කොමිෂන් සභාව විසින් අදහස් දක්වා

[361] පරණගම කොමිෂන් සභාව වාර්තාව, 462 ඡේදය

[362] පරණගම කොමිෂන් සභාව වාර්තාව, 463 ඡේදය

[363] එම

[364] උගත් පාඩම් සහ ප්‍රතිසන්ධාන කොමිෂන් සභාව, 9.10 ඡේදය

ඇත. මෙම පසුබිම තුළ, නිශ්චිත සාක්ෂි මත පදනම් වෙමින් මෙම ප්‍රශ්නගත ක්‍රියාකාරකම් පිළිබඳ වගකීම නිශ්චය කිරීමේ අභියෝගයට උගත් පාඩම් සහ ප්‍රතිසන්ධාන කොමිෂන් සභාව මුහුණ දෙන ලදී. [365]

475. කරුණු නිශ්චය කිරීම සම්බන්ධයෙන් පැවති දෙයාකාර අසීරුතාවයන් පිළිබඳ විස්තර කිරීමෙන් අනතුරුව, තාක්ෂණික ස්වරූපයේ මූලික සාක්ෂි නොපැවතීම හේතු කොට ගෙන, නිශ්චිත නිගමනයකට එළඹීම අතිශයින්ම අසිරු වූ බව කොමිෂන් සභාව විසින් නිරීක්ෂණය කරන ලදී. එසේම, මෙම කාරණා තහවුරු කරමින් සිවිල් වැසියන් විසින් ලබා දුන් සාක්ෂි ස්වභාවයෙන්ම සැක උපදවන සහ අපැහැදිලි ඒවා වූ අතර, මෙම ෂෙල් ප්‍රහාර එල්ල කිරීම සම්බන්ධයෙන් කුමන පාර්ශ්වයක් වගකිව යුතු වන්නේද යන්න පිළිබඳ නිශ්චිතව නිගමනයකට එළඹීම සඳහා ඒ තුළින් ඉඩකඩ සැලසීමක් සිදු නොවීය.[366]

476. කෙසේ වුවද, මෙහිදී වැදගත් වන කාරණය වන්නේ ඉහත කී ෂෙල් ප්‍රහාර එල්ල කිරීම සම්බන්ධයෙන් වැරදිකරුවන් වන්නේ කුමන පාර්ශ්වයද යන්න පිළිබඳව සැලකීමකින් තොරව රෝහල වෙත ෂෙල් ප්‍රහාර එල්ල කිරීමෙන් බලපෑමට ලක් වූ පුද්ගලයන් සඳහා හානිපූරණය කිරීමට උගත් පාඩම් සහ ප්‍රතිසන්ධාන කොමිෂන් සභාව විසින් නිර්දේශ කොට තිබීමයි.[367]

රෝහල් වෙත ෂෙල් ප්‍රහාර එල්ල කිරීම පිළිබඳව පරණගම කොමිෂන් සභාව විසින් අනාවරණය කරගත් කරුණු:

477. යුධ මුක්ත කලාප වෙතට සහ එම කලාප වලින් පිටතට ෂෙල් ප්‍රහාර එල්ල කිරීම සහ රෝහල් වෙත ෂෙල් ප්‍රහාර එල්ල කිරීම හේතු කොට ගෙන සිවිල් වැසියන් මරණයට පත් වීම සිදු වූ බවට කිසිදු වාදයක් නොපවතින අතර, මෙහිදී මෙම කොමිෂන් සභාව හමුවේ පවත්නා ගැටලුව වන්නේ ජාත්‍යන්තර මානුෂිය නීතියේ ඇති සුවිශිෂ්ඨතාවය පිළිබඳ සහ සමානුපාතිකත්වය පිළිබඳ මූලධර්ම උල්ලංඝනය කරමින් සහ සිවිල් වැසියන් හා රෝහල් වෙත ලබා දී තිබූ විශේෂ ආරක්ෂාව නොසලකා හරිමින් වගවිභාගයකින් තොරව හෝ හිතා මතා ෂෙල් ප්‍රහාර එල්ල කිරීම සම්බන්ධයෙන් රජයේ ප්‍රතිපත්තියක් පැවති බවට විශ්වාස කිරීම සඳහා සාධාරණ පසුතලයක් පවත්නා සාක්ෂි ඔස්සේ නිර්මාණය වන්නේ ද යන්නයි. එසේම යුධ අපරාධ සහ / හෝ මනුෂ්‍යත්වයට එරෙහි අපරාධ ලෙස සැලකිය හැකි ආකාරයෙන් ජාත්‍යන්තර මානුෂිය නීතියේ අදාළ මූලධර්ම බරපතල අයුරින් උල්ලංඝනය වන කවර හෝ කටයුත්තක් ශ්‍රී ලංකා හමුදාවේ සාමජිකයන් විසින් සිදු කොට තිබේද යන්න පිළිබඳව සාධාරණ පදනමක් සාක්ෂි ඔස්සේ නිර්මාණය වන්නේද යන්න ද කොමිෂන් සභාවේ සැලකීමට ලක් විය යුතුය.[368]

478. ඉහත මූලික නිරීක්ෂණය සිදු කිරීමෙන් අනතුරුව, ජනාධිපති කොමිෂන් සභාව විසින් ෂෙල් ප්‍රහාර වල මූලාශ්‍ර කෙරෙහි අවධානය යොමු කරනු ලැබේ.

- **ෂෙල් වෙඩි ප්‍රහාර වල මූලාශ්‍ර**

479. ෂෙල් වෙඩි ප්‍රහාර එල්ල කිරීම් සිදු වූ බවට චන්ද්‍රිකා ඡායාරූප ඔස්සේ අවධාරණය කෙරෙන බව ජනාධිපති කොමිෂන් සභාව විසින් පිලිගන්නා ලදී. 2009 වසරේ ඇමෙරිකා එක්සත් ජනපද රාජ්‍ය

---

[365] උගත් පාඩම් සහ ප්‍රතිසන්ධාන කොමිෂන් සභාව, 9.11 ඡේදය

[366] උගත් පාඩම් සහ ප්‍රතිසන්ධාන කොමිෂන් සභාව, 9.12, 9.13 ඡේද

[367] උගත් පාඩම් සහ ප්‍රතිසන්ධාන කොමිෂන් සභාව, 4.294

[368] පරණගම කොමිෂන් සභා වාර්තාව, 464 ඡේදය

දෙපාර්තමේන්තුව විසින් කොංග්‍රසය වෙත ඉදිරිපත් කරන ලද වාර්තාව එමගින් උපුටා දක්වනු ලැබේ.

"එක්සත් ජාතීනගේ නියෝජිත ආයතන සහ රාජ්‍ය නොවන සංවිධාන විසින් නිකුත් කරන ලද වාණිජ ඡායාරූප මත පදනම් වූ වාර්තා ගණනාවක් මගින් යුධ මුක්ත කලාප තුළ ෂෙල් ප්‍රහාර එල්ල වීම් සිදුවූ බවට සාක්ෂි හඳුනාගැනීමට ලක් කොට ඇත. මෙලෙස සිදුවූ බවට වාර්තා වන හානි සඳහා වගකිව යුතු වන්නේ ශ්‍රී ලංකා රජයද නොඑසේ නම් එල්.ටී.ටී.ඊ. හමුදාවන්ද යන්න තීරණය කිරීමට ඇමෙරිකා එක්සත් ජනපද රජයේ මූලාශ්‍ර වලට නොහැකි වී ඇත. යුධ මුක්ත කලාපයන් තුළ පැවති වැලි සහිත පාංශු තත්ත්වයන් සහ වලාකුළු ආවරණය වැඩි කිරීමට හේතු වෙමින් මෝසම් කාලසීමාව උදාවෙමින් තිබීම යන කාරණාවන් හේතු කොට ගෙන වාණිජ හෝ එක්සත් ජනපද හමුදා මූලාශ්‍ර ඔස්සේ මෙම යුධ ගැටුම් අධීක්ෂණය කිරීමේ ප්‍රයත්නයන් වඩාත් සංකීර්ණ කරන ලදී.

ඒ අනුව එල්ල වන චෝදනාවන් කරුණු ඔස්සේ තහවුරු කළ හැකිවන්නේද සහ / හෝ ඒ තුළින් ජාත්‍යන්තර නීතිය උල්ලංඝනය වීම් සිදුවී ඇති බවට සැලකිය හැක්කේද යන්න නිගමනය කිරීම සඳහා අවශ්‍ය පරීක්ෂා කිරීම් සහ කරුණු තහවුරු කරගැනීම් වලට එවන් සීමාවන් ඔස්සේ බාධා ඇති වේ."[369]

480. මෙම ජනාධිපති විමර්ශන කොමිෂන් සභාව විසින් උගත් පාඩම් සහ ප්‍රතිසන්ධාන කොමිසම පිළිබඳ ස්වකීය සාකච්ඡාවේදී එක්සත් ජනපද දෙපාර්තමේන්තු වාර්තා පිළිබඳ දැනටමත් කරුණු සඳහන් කොට තිබෙන අතර මෙම වාර්තාවේ 24 වන පිටුවේදී එක්සත් ජනපද රාජ්‍ය දෙපාර්තමේන්තුව විසින් සඳහන් කොට ඇත්තේ ශ්‍රී ලංකා හමුදාව අපකීර්තියට පත් කිරීම උදෙසා එල්.ටී.ටී.ඊ. සංවිධානය විසින් සිවිල් වැසියන් සිටින ප්‍රදේශවලට ෂෙල් ප්‍රහාර එල්ල කොට ඇතැයි යන මතය ඉවත දැමිය නොහැකි බව ය.

481. ජනාධිපති කොමිෂන් සභාව ඉතා විශාල වශයෙන් "මානව හිමිකම් සඳහා වන විශ්වවිද්‍යාල ගුරුවරුන්ගේ සංවිධානය - යාපනය" විසින් ඉදිරිපත් කරන ලද වාර්තා මත පදනම් වූ බව ජනාධිපති විමර්ශන කොමිෂන් සභාව මගින් පෙන්වා දී ඇති අතර, එල්.ටී.ටී.ඊ. සංවිධානය විසින් ඒ ආකාරයෙන් දෙමළ සිවිල් වැසියන්ට ෂෙල් ප්‍රහාර එල්ල කිරීම් සිදු කරන ලද බවට තහවුරු කරන සාක්ෂි "මානව හිමිකම් සඳහා වන විශ්වවිද්‍යාල ගුරුවරුන්ගේ සංවිධානය - යාපනය" සකස් කළ යම් වාර්තාවක් තුළින් සපයනු ලබන බව ඉන් පෙන්වා දෙනු ලැබේ.[370]

482. *යුද්ධයක දී ෂෙල් වෙඩි ප්‍රහාර එල්ල කළේ යැයි කිසි යම් පාර්ශ්වයකට කිසියම් පාර්ශ්වයකට චෝදනා එල්ල කිරීමේ දී 'යම් ස්ථානයකට යම් අවියකින් වෙඩි තැබීමට වඩා ෂෙල් වෙඩිල්ලකින් කිසියම් දිශාවකට විශේෂිත ආවාටයක් සෑදී ඇති බව ඔප්පු කිරීම අත්‍යාවශ්‍ය වේ. බ්‍රිතාන්‍ය හමුදාවේ "යුද්ධයේ දී කාලතුවක්ක පුහුණුව" නැමති අංක 12 දරන පත්‍රිකාවේ 12 වෙනි කොටස [...] මගින් ආවාට විශ්ලේෂණයක් ආවරණය කරයි. පරීක්ෂණය කිරීම සඳහා තෝරා ගන්නා ආවාටය අලුත් එකක් විය යුතු ය. කාලයත් සමග විශේෂිත ලක්ෂණ මැකීයාමට ඉඩ ඇති අතර, අයහපත් කාලගුණයේ දී ඒවා නොපෙනී යා හැක'. 'භූමිය යෝග්‍ය නොවන අවස්ථාවල ආවාට පරීක්ෂා කිරීම කළ නොහැකි වනු ඇත. පොළොව දැඩි ලෙස ගල් සහිත සහ තද ස්වභාවයේ*

[369] එක්සත් ජනපද රාජ්‍ය දෙපාර්තමේන්තු වාර්තාව, 2009 පිටුව 10

[370] UTHR වාර්තා අංක 32 1:4:2 ෂේද ගෝඩින් වේස්, ද කේජ් 109 පිටුව

විය හැකි අතර, එසේ වුව හොත් සෑදෙන සිදුර අල්ප වේ. අනෙක් අතර, පොළොව දැඩි ලෙස මෘදු විය හැකි අතර, එසේ වුව හොත් ආවාටය ජලයෙන් පිරී යා හැක. [371]

483. ශ්‍රී ලංකා යුධ හමුදා කාලතුවක්කු බලකායේ 'බැරල්' යුධ මුක්ත කලාපය තුළ වූ බැවින් යුධ මුක්ත කලාප වලට ෂෙල් ප්‍රහාර එල්ල කරන ලද්දේ ශ්‍රී ලංකා හමුදාව විසින් බවට ඒ තුළින් පෙන්නුම් කරන බව දක්වමින් දරුස්මාන් වාර්තාවේ 101 වන ඡේදයෙහි දක්වා ඇති නිගමන ජනාධිපති කොමිසමේ හමුදා ප්‍රවීණයින් විසින් ප්‍රතික්ෂේප කරනු ලැබේ. හමුදා ප්‍රවීණයින්ගේ වාර්තාව තුළ දරුස්මාන් වාර්තාවේ නිගමනය විස්තර කොට ඇත්තේ ‘‘නිවැරදි නොවන සහ වෝහාරික විශ්ලේෂණයන්ගෙන් තොර සැකය මත පදනම් වූවක්" වශයෙනි. මෙම හමුදා ප්‍රවීණයින් විසින් 71 වන ඡේදයේ දී ප්‍රකාශ කරනු ලබන්නේ හඳුනාගත් ෂෙල් වෙඩි විවර සහ සිවිල් වැසියන් තුවාල ලැබීම් යනාදිය සඳහා හේතු වූයේ කුමන පාර්ශවයේ කාලතුවක්කු සහ මෝටාර් ප්‍රහාර ද යන්න නිශ්චිතවම ප්‍රකාශ කිරීම සඳහා ‘‘මෙම අවස්ථාවේදී සහ පවත්නා සාක්ෂි මත පදනම් ව හැකියාවක් නොපවතින බවයි"[372]

484. ඔහුගේ අදහස් දැක්වීම් වන්නේ:

> ‘‘ෂෙල් ප්‍රහාර හේතුවෙන් ඇති වූ විවර පිළිබඳ විශ්ලේෂණය තුළින් නිසි නිගමනයකට එළඹීමට නොහැකි වී ඇති බැවින් සහ, විශ්වසනීය එකම තොරතුරු මූලාශ්‍රය වන්නේ ඇසින් දුටුවන්ගේ සාක්ෂි සටහන් වන බැවින්, එහිදී කිසියම් වෙඩි තැබීමක දිශාව වඩාත්ම හොඳින් නිර්ණය කරගනු ලබන්නේ එක්කෝ තුවක්කුවෙන් පිට වන ආලෝකය දෘශ්‍යමය ස්වභාවයෙන් නිරීක්ෂණය කිරීම මගින් හෝ තුවක්කුවෙන් හෝ මෝටාර් තුවක්කු ප්‍රහාරයක් නිකුත් වීම ශ්‍රවණය කිරීම මගින් ය. නැගෙනහිර වන්නි ප්‍රදේශයේ භූමිය තුළ ඇති සමතලා ස්වභාවය හේතු කොට ගෙන මෙම නිරීක්ෂණය සිදු කිරීම අසීරු එකක් බවට පත් කරනු ලබන අතර, සාක්ෂිකරුවකුට කිසියම් දිශාවකින් ඇතින් ඇසෙන හඬක් ලෙස මෙය ශ්‍රවණය වීමටත්, ඉන් සුළු වේලාවකට පසුව ෂෙල් ප්‍රහාරයක් පුපුරා යාම නිරීක්ෂණය කිරීමටත් හැකි වීමට ඉඩ තිබේ. එවන් අවස්ථාවකදී එලෙස මෙම සිදුවීම අත්දකිනු ලබන පුද්ගලයාට කිසියම් සහතික කිරීමක් යටතේ, එහෙත් සම්පූර්ණයෙන්ම නිශ්චිතව නොවුණත් එම ප්‍රහාරය නිකුත් වූයේ කිසියම් දිශාවකින් යැයි ප්‍රකාශ කිරීමට යම් හැකියාවක් පවතී. එසේ නමුත් මෙම ක්‍රමය ද සාර්ථක වන්නේ මේ සඳහා හුරුපුරුදු සවන් පැවතීම, සහ එම වටපිටාව තුළ වෙනත් අවධානයට බාධාවීම් හෝ වටපිටාවේ නොයෙකුත් ශබ්ද නොපැවතීම යන තත්ත්වයන් මත පදනම්වය. එම නිසා, මෙහි ලේඛකයා විශ්වාස කරනු ලබන පරිදි මෙම හමුදා ප්‍රවීණයින් විසින් 71 වන ඡේදයේදී ප්‍රකාශ කරනු ලබන්නේ හඳුනාගත් ෂෙල් විවර සහ සිවිල් වැසියන් තුවාල ලැබීම් යනාදී සඳහා හේතු වූයේ කුමන පාර්ශවයේ කාලතුවක්කු සහ මෝටාර් ප්‍රහාරද යන්න නිශ්චිතවම ප්‍රකාශ කිරීම සඳහා ‘‘මෙම අවස්ථාවේදී සහ පවත්නා සාක්ෂි මත පදනම් ව හැකියාවක් නොපවතින බව ය. [373]

485. ජනාධිපති කොමිසම විසින් අවසානයේ දී මෙම නිගමනය සමග එකඟවූ අතර ෂෙල් ප්‍රහාර එල්ල කිරීමේ සිදුවීම් සඳහා පැහැදිලිවම විමර්ශණයක් අවශ්‍ය බවට නිරීක්ෂණය කොට ඇත. එවන් චෝදනා අපරාධමය වරදක් මට්ටමට සනාථ කිරීම සඳහා සැබැවින්ම කටයුතු කිරීමේදී මතු

---

[371] හමුදා විශේෂඥ වාර්තාව, පරණගම කොමිෂන් සභාවේ ඇමුණුම 1 - 71 ඡේදය

[372] පරණගම කොමිෂන් සභා වාර්තාව- 468 ඡේදය

[373] පරණගම කොමිෂන් සභා වාර්තාව- 469 ඡේදය

වන ඇතැම් සාක්ෂිමය බාධකයන් පිළිබඳව මෙම නීති ක්ෂේත්‍රයට අයත් ප්‍රවීණයින් විසින් අවධාරණය කොට ඇත.[374]

- **යුධ මුක්ත කලාප තුළ ෂෙල් වෙඩි ප්‍රහාර එල්ල කිරීම**

486. 1990 වර්ෂයේදී, ශ්‍රී ලංකාවේ යුධ ගැටුම්වල මුල් වකවානුව අතරතුරදී, යාපනය රෝහල ආශ්‍රිතව රෝහල් කලාපයක් හෝ ආරක්ෂිත කලාපයක් ස්ථාපනය කිරීම සිදු කළ යුතු බවට රජය සහ එල්.ටී.ටී.ඊ. සංවිධානය විසින් එකඟතාවයකට එළඹෙන ලදී. මෙම ප්‍රදේශය හදුනාගැනීමේ කාර්යය වෙනුවෙන් රතු කුරුස යොදා එම ප්‍රදේශය සලකුණු කළ යුතු බවටත්, ඒ ආශ්‍රිත වටපිටාව තුළ කිසිදු හමුදා නිලධාරියෙකු රැඳී සිටීම හෝ හමුදා වාහන ගාල් කිරීම සිදු නොකළ යුතු බවටත් රජය සහ එල්.ටී.ටී.ඊ. සංවිධානය විසින් එකඟතාවයකට එළඹෙන ලදී. කෙසේ වුවද, එක් පාර්ශ්වයක් විසින් ඒකපාර්ශ්වීයව ප්‍රකාශනයක් ඉදිරිපත් කිරීම ප්‍රමාණවත් නොවේ. එසේ වුවත්, එල්.ටී.ටී.ඊ. සංවිධානය විසින් දියත් කරනු ලබන ප්‍රහාරයන්ට ප්‍රතිචාර දැක්වීම සඳහා ශ්‍රී ලංකා හමුදාවට පවතින නීතිමය අවසරය යුධ මුක්ත කලාප නම් කිරීම තුළින් බලපෑමට ලක් නොවීය. යුධ මුක්ත කලාපය යැයි කියනු ලබන එම කලාප වල සිදු වූ විශේෂිත කාලතුවක්කු ප්‍රහාර වල නීත්‍යානුකූලභාවය, ඒ අනුව සිද්ධියෙන් සිද්ධියට සහ ඉලක්කයෙන් ඉලක්කයට පදනම් වෙමින් සිදු කරන විශ්ලේෂණයක් මත සම්පූර්ණයෙන්ම තීරණය විය යුතු අතර එය කිසියම් සන්නද්ධ අරගල සංදර්භයක් තුළ සිදු කරන කවර හෝ ක්‍රියාන්විත පිලිබඳ තීරණ තක්සේරු කිරීමක දී පොදු කරුණක් වෙයි.[375]

487. දැනුම ක්ෂේත්‍රය සැලකිල්ලට ගැනීමේ දී එල්.ටී.ටී.ඊ. සංවිධානය විසින් යුධ මුක්ත කලාප ආරක්ෂිත ප්‍රදේශ හෝ සුරක්ෂිත කලාප වශයෙන් පිලිගැනිම ප්‍රතික්ෂේප කරන ලදී. එම නිසා ජනාධිපති කොමිසම මගින් නිරීක්ෂණය කරනු ලබන පරිදි කිසියම් ප්‍රදේශයක් හුදෙක් යුධ මුක්ත කලාපයක් වශයෙන් ලේබල් කිරීම තුළ යුද්ධයට අදාළ නීති සහ සිරිත් විරිත් යටතේ ඉඩකඩ සලසනු ලබන පරිදි නීත්‍යානුකූල ආකාරයකින් නීත්‍යානුකූල අවි ආයුධ භාවිතා කරමින් එවන් ප්‍රදේශ තුල ඇති නිත්‍යානුකූල ඉලක්ක වෙත ප්‍රහාර එල්ල කිරීමට ශ්‍රී ලංකා හමුදාව සතු අධිකාරය කෙරෙහි එමගින් කිසිදු නීතිමය බලපෑමක් ඇති කරනු නොලැබේ.[376]

488. දැඩි ජන ඝනත්වයක් පැවති යුධ මුක්ත කලාප වෙත හමුදාව යොමු කරවීමේ තීරණය ගැනීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකා රජය විවේචනයට ලක් කරමින් යාපනයේ පිහිටි රාජ්‍ය නොවන සංවිධානයක් විසින් පහත ආකාරයට කරුණු දක්වා ඇත;

"සිදු වී ඇති දේවල් දෙස බැලීමේදී රජයේ හමුදාවන් විසින් බෝම්බ ප්‍රහාර එල්ල කිරීමේ හෝ ෂෙල් ප්‍රහාර එල්ල කිරීමේ අරමුණ වූයේ සිවිල් වැසියන් මරා දැමීම යැයි අපට පැවසීමට හැකියාවක් නැත. මින් පෙර පෙන්වා දුන් පරිදි භූමියෙහි සිට සටන් සිදු කළ හමුදා කණ්ඩායම් විසින් සිවිල් වැසියන්ට හානි නොකිරීමට ප්‍රවේසම් සහගත වී ඇත. එහෙත් ප්‍රදේශ අභ්‍යන්තරයට ගොස් ප්‍රදේශ අල්ලාගැනීමට කටයුතු කිරීමේදී එල්.ටී.ටී.ඊ. සංවිධානය විසින් එල්ල කරන

[374] පරණගම කොමිෂන් සභා වාර්තාව- 470 ඡේදය

[375] පරණගම කොමිෂන් සභා වාර්තාව- 471 ඡේදය

[376] පරණගම කොමිෂන් සභා වාර්තාව- 472 ඡේදය

ප්‍රහාරයන්ට ප්‍රතිප්‍රහාර දැක්වීම අනිවාර්ය වූ අතර එහිදී අනිවාර්යයෙන්ම ඉතා විශාල සිවිල් වැසියන් ප්‍රමාණයක් තුවාල ලැබීමට හේතු වන තත්ත්වයක් නිර්මාණය විය හැකිය."[377]

- **සමානුපාතිකතාව පිළිබඳ තක්සේරුව**

489. ජනාධිපති විමර්ශන කොමිෂන් සභාව විසින් සුවිශිෂ්ඨත්වය, යුධමය අවශ්‍යතාවය සහ සමානුපාතිකත්වය පිළිබඳ ප්‍රාමාණික මූලධර්ම පිළිබඳව සාකච්ඡා කිරීමේදී සිවිල් වැසියන් රැඳී සිටි ප්‍රදේශ වෙත කාලතුවක්කු ප්‍රහාර එල්ල කිරීම ඒ ස්වරූපයෙන්ම නීත්‍යානුකූල නොවේ යැයි අවබෝධ කර ගැනීමට හැකියාවක් නොමැති බව ඉතාමත් පැහැදිලි යැයි ජනාධිපති කොමිසම විසින් නිරීක්ෂණය කරනු ලැබේ. එහෙත්, ඒවා සුවිශිෂ්ඨත්වය, යුධමය අවශ්‍යතාවය සහ සමානුපාතිකත්වය පිළිබඳ මූලධර්ම ඔස්සේ සම්ප්‍රදායික විශ්ලේෂණයකට භාජනය කිරීමේ අවශ්‍යතාවයක් පවතී.[378]

490. ෂෙල් ප්‍රහාර වලින් පමණක් මිය යන ලද සිවිල් වැසියන් සංඛ්‍යාව ගණනය කිරීමේදී ඒ පිළිබඳ වගකීම එක් පාර්ශ්වයකට හෝ අනෙක් පාර්ශ්වයට පැවරීමේ හැකියාවක් නොමැති අතර (එක්සත් ජාතීන්ගේ මධ්‍යස්ථාන හෝ රෝහල් ආසන්නයේ ස්වකීය අවි ගබඩා ස්ථාපිත කිරීමේ එල්.ටී.ටී.ඊ. සංවිධාන උපක්‍රමයෙහි ප්‍රතිඵලයක් වශයෙන් එල්.ටී.ටී.ඊ. සංවිධානය විසින් භාවිතා කරන ලද වෙඩි තබා ඉක්මනින් පලා යාමේ උපක්‍රමයෙහි ප්‍රතිඵලයක් වශයෙන් ඇති වූ මරණ ඇතුළු) එක් පාර්ශ්වයක් හෝ අනෙක් පාර්ශ්වය විසින් එල්ල කරන ලද ෂෙල් ප්‍රහාර වල ප්‍රතිඵලයක් වශයෙන් සැබැවින්ම මියගිය සිවිල් වැසියන් සංඛ්‍යාව කොපමණක්දැයි නිර්ණය කිරීම ඉතා අසීරු තත්ත්වයකට පත් කෙරෙන සාධකය වලට මුහුණ දීමට ජනාධිපති කොමිසමට සිදුවිය. එවන් අගැයීමක් සිදු කිරීමේ කාර්යය සංකීර්ණත්වයට පත් කරනු ලබන හේතු පහත පරිදි වේ.

- එල්.ටී.ටී.ඊ. සංවිධානය විසින් ප්‍රාණ ඇපකරුවන් වශයෙන් රඳවාගෙන සිටි තම දෙමළ සිවිල් වැසියන් වෙත ෂෙල් ප්‍රහාර එල්ල කිරීම.

- එල්.ටී.ටී.ඊ. සංවිධානය විසින් තමන්ම නිෂ්පාදනය කරන ලද මල්ටි බැරල්රොකට් ප්‍රහාර එල්ල කිරීම් සිදු කිරීම සහ කොමිසමේ හමුදා විශේෂඥයන්ගේ අදහසට අනුව මේ පිළිබඳ නිශ්චිත පදනමක් නොපැවති අතර ඒවායින් ප්‍රහාර එල්ල කළ විට අතිශයින්ම අස්ථාවර වාතාවරණයක් නිර්මාණය වීමට ඉඩකඩ පැවතී ඇත. එහි ප්‍රතිඵලයක් වශයෙන් සිදු වූ හානි හේතු කොට ගෙන අනිවාර්යයෙන්ම තුවාල සහ අනතුරුවලට ලක් වූ සිවිල් වැසියන් සංඛ්‍යාව ඉහළ යාමක් සිදුවී ඇතැයි උපකල්පනය කිරීමේ ඉඩකඩ පැවතීම.

- එල්.ටී.ටී.ඊ. සටන්කරුවන් බොහෝ දෙනෙකු නිල ඇඳුම් නොපැළඳ සිටීමේ කාරණය [379]

491. කිසියම් ප්‍රහාරයක ප්‍රමාණය පිළිබඳ නිර්ණය කිරීමේදී ශ්‍රී ලංකා රජයේ හමුදාවන් විසින් සැලකිල්ලට ගත යුතු ප්‍රහාරයේ ස්වභාවය, ඉලක්කය සහ යුධමය අවශ්‍යතාවය වැනි සාධක ගණනාවක් පිළිබඳව ජනාධිපති කොමිසමෙහි අවධානය යොමු වන අතර එවන් වාතාවරණයක් තුලදී ශ්‍රී ලංකා රජයේ හමුදාමය ව්‍යාපාරය පරාජය කිරීමේ තනි අරමුණ ඔස්සේ වන්නි ප්‍රදේශයේ සිවිල් ජනගහනය

---

[377] UTHR වාර්තා අංක 32 පිටුව 22

[378] පරණගම කොමිෂන් සභා වාර්තාව- 475 ඡේදය

[379] පරණගම කොමිෂන් සභා වාර්තාව- 476 ඡේදය

භාවිතා කරමින් එල්.ටී.ටී.ඊ. සංවිධානය විසින් ක්‍රියාත්මක කළ සටන් උපාය මාර්ගය සහ එවන් කෲර පුද්ගලයන් සිවිල් ජනගහනය සමග මිශ්‍ර කිරීම තුළින් ඉලක්ක කළේ කවරෙක්ද යන්න තීරණය කිරීම පිළිබඳ ප්‍රශ්නය වඩාත් අසීරු එකක් බවට පත් කරයි.[380]

- තමන්ට ප්‍රහාර එල්ල වීමට එරෙහිව තමන්ගේ ආරක්ෂාව සලසා ගැනීම සඳහා සහ සමස්ත විනාශය වළක්වා ගැනීම සඳහා වන උත්සාහයක් වශයෙන් සිවිල් වැසියන් සිටින ප්‍රදේශ වල හෝ සිවිල් වැසියන් සිටින ප්‍රදේශ වලට ආසන්නයේ සිට එල්.ටී.ටී.ඊ. හමුදාව විසින් කාලතුවක්කු ප්‍රහාර නිකුත් කරන ලද බවට විවිධ වාර්තා වලින් දක්වා ඇත.[381] එසේම එල්.ටී.ටී.ඊ. හමුදාවන් විසින් රෝහල් වැනි සිවිල් වැසියන් සිටින ස්ථාන වල ආයුධ ස්ථානගත කොට තිබුණි.[382]

- 2009 වැනි මුල් අවධියේ දී රජය විසින් එල්.ටී.ටී.ඊ. සංවිධානයට යටත් වීමේ අවස්ථාව ලබා දී තිබූ අතර ඔවුන් විසින් එය ප්‍රතික්ෂේප කොට තිබුණි. කුමාරන් පත්මනාදන් වැනි පුද්ගලයන් සම්බන්ධ කරගනිමින් එවන් යටත් වීමක් සඳහා අවශ්‍ය අතරමැදි සහාය සැපයීමේ ජාත්‍යන්තර ප්‍රයත්න පිළිබඳව තොරතුරු ප්‍රසිද්ධියට පත්ව තිබෙන අතර, එවන් උත්සාහයන් එල්.ටී.ටී.ඊ. නායක ප්‍රභාකරන්ගේ නොනැමෙන ස්වභාවය හේතු කොටගෙන අසාර්ථකත්වයට පත් වී ඇත.

- මෙහිදි වඩාත්ම බරපතල කාරණය වන්නේ, එල්.ටී.ටී.ඊ. සංවිධානය විසින් ස්වකීය මරාගෙන මැරෙන හමුදා බලකායන් භාවිතා කිරීමත්, එහිදී ඔවුන්ට සටන්කරුවන් අභිමිවීමේ තත්ත්වය හේතුවෙන් වයස අවුරුදු 13 වැනි ඉතා ලාබාල වයසේ ළමුන් සහ වැඩිහිටියන් බලයෙන් හමුදාවට බඳවා ගැනීමත් සිදු වීමයි. ජාත්‍යන්තර රතුකුරුස සංවිධානය විසින් බෝට්ටු මාර්ගයෙන් ආරක්ෂිතව ඉවත් කළ හැක්කේ කවුරුන්ද යන කාරණය ඔවුන්ගේ පාලනයට නතු කර ගෙන තිබූ අතර ශ්‍රී ලංකා හමුදාව සිටින ප්‍රදේශ වෙත මාරු වීමට උත්සාහ දරන ලද පුද්ගලයන් වෙත වෙඩි ප්‍රහාර එල්ල කිරීමද සිදුවී ඇත. මේ ආකාරයට සැලකීමේදී ජනාධිපති කොමිසම විසින් දරන ලද මතය වූයේ මෙම අර්බුදය අවසාන කිරීම සඳහා ශ්‍රී ලංකා රජය සතු පැහැදිලි වගකීමක් පැවතී ඇති බව ය. එලෙස ක්‍රියාත්මක වීමට ප්‍රමාද වීම සහ ක්‍රියාත්මක නොවී සිටීම තුළින් එල්.ටී.ටී.ඊ. ග්‍රහණය හේතුවෙන් ඉතා විශාල සිවිල් වැසියන් සංඛ්‍යාවක් තුවාල ලැබීමට සහ හදිසි අනතුරුවලට ලක්වීමට ඉඩකඩ පැවතුණි.

- අවසානයේදී එල්.ටී.ටී.ඊ. කාලතුවක්කු හමුදා කණ්ඩායම් වලට ආසන්නව සිටි සිවිල් වැසියන් මරණයට පත් වීම හෝ හදිසි තුවාල ලැබීම් වලට ලක්වීම පිළිබඳ අප්‍රියජනක තීරණය ගැනීමේ අභියෝගයට ලක් වී සිටියදී, මෙම අර්බුදය අවසාන කිරීමට ශ්‍රී ලංකා රජය විසින් තීරණය කිරීම හේතු කොට ගෙන ඉතා විශාල සිවිල් වැසියන් ප්‍රමාණයකගේ ජීවිත බේරා ගැනීමට හැකි වූ අතර, යුද්ධය අවසාන කිරීම හේතුවෙන් සන්නද්ධ හමුදා බලකායන්ගේ ජීවිත කෙරෙහි වූ අවදානමද අවසන් විය.

---

[380] පරණගම කොමිෂන් සභා වාර්තාව- 477 ඡේදය

[381] ජනාධිපති කොමිසම විසින් දරුස්මාන් වාර්තාවේ 177 ඡේදය උපුටා දක්වයි. (Island of Impunity? Report paragraph 6.104)

[382] එම

492. ජනාධිපති කොමිෂන් සභාව විසින් ඉදිරිපත් කරන ලද ඉහත අදහස් දැක්වීම තුළින් පිළිගත හැකි ප්‍රතිවිපාකයක් ජනනය කරනු ලබන අතර, එනම්, සන්නද්ධ අරගල පිළිබඳ නීති තුළින් ඉඩ සලසනු ලබන පරිදි අදාළ ප්‍රහාරය සමානුපාතිකත්වය පිළිබඳ මූලධර්මයේ අවශ්‍යතාවයන්ට අනුකූල වන තත්ත්වයක් යටතේ සමපාර්ශ්වීය හානි පිළිබඳවද ඉන් කරුණු දැක්වේ.

493. මේ ඔස්සේ අපට ජාත්‍යන්තර මානුෂීය නීතියෙහි මූලික මූලධර්ම පිළිබඳව ජනාධිපති කොමිසම විසින් ඉදිරිපත් කරනු ලබන තවත් අදහසක් වෙත ප්‍රවේශ විය හැකිය.

සමපාර්ශ්වීය හානි

494. යුද්ධයේ අවසාන අදියරේදී ඇති වූ සුවිශේෂී සිද්ධිවාචික වාතාවරණයන්, විශේෂයෙන් ම එල්.ටී.ටී.ඊ. සංවිධානය විසින් ඉතා විශාල වශයෙන් ප්‍රාණ ඇපකරුවන් ප්‍රමාණයක් ලබාගැනීම සහ මිනිස් පලිහ වශයෙන් භාවිතා කිරීම, බලහත්කාරයෙන් පුද්ගලයන් හමුදාවන්ට බඳවා ගැනීම සහ පලා යාමට උත්සාහ කරනු ලබන සිවිල් වැසියන් මරා දැමීමේ තර්ජනය යනාදිය හේතු කොට ගෙන සමානුපාතිකත්ව මූලධර්මය නැවත ඇගයීමට ලක් කිරීමේ සහ වෙනස් කිරීමේ අවශ්‍යතාවයක් නිර්මාණය කරනු ලබන බව ජනාධිපති කොමිසම විසින් දරනු ලැබූ මතය විය. [383]

495. යුද්ධයේ අවසාන අදියර වලදී සමපාර්ශ්වීය හානි සිදුවීම පිළිබඳව පෙන්නුම් කිරීමට ජනාධිපති කොමිසම විසින් දරන ලද උත්සාහයක් ඉහතින් දක්වා ඇත. පරණගම කොමිෂන් සභා වාර්තාවේ පැහැදිලි කොට ඇති ආකාරයට එල්.ටී.ටී.ඊ. සංවිධානය විසින් ප්‍රාණ ඇපකරුවන් තබා ගැනීම සහ එම පුද්ගලයන් මිනිස් පලිහ වශයෙන් භාවිතා කිරීම හේතුවෙන් සමානුපාතිකත්වය පිළිබඳ ගණනය කිරීම් හා බැඳුණු ඇගයීම් කෙරෙහි සෘජු බලපෑමක් පවතින බවට ජනාධිපති කොමිසම විසින් අනාවරණය කරගනු ලැබේ.

496. මෙහිදී අදාළ ප්‍රහාරයේ යුධමය ප්‍රතිලාභ ප්‍රශ්නගත සිවිල් වැසියන් වෙත පිරිනමනු ලබන මානුෂීය ආරක්ෂාවට වඩා වැදගත් වන්නේද යන්න පිළිබඳව තක්සේරු කිරීම සඳහා සමානුපාතිකත්වය පිළිබඳ මූලධර්මය[384] භාවිතා කිරීම ඇතුළුව හමුදාමය ප්‍රතිලාභය ඉක්මවා යමින් තුවාල ලත් සිවිල් වැසියන් සංඛ්‍යාව ඉතා ඉහළ අගයක් ගනීද යන්න පිළිබඳව තක්සේරු කිරීමේදී සතුරා විසින් නීති විරෝධී ආකාරයට ක්‍රියා කොට සිවිල් වැසියන් අනතුරෙහි හෙලා තිබෙය යන කාරණය ඉතා වැදගත් සාධකයක් වශයෙන් සැලකිල්ලට ගත හැකිය. වෙනත් වචන වලින් ප්‍රකාශ කළ හොත් මෙම වාතාවරණයන් තුළ සිවිල් වැසියන් තුවාල ලැබීම් ප්‍රමාණය ඉතා ඉහළ අගයක් ගැනීම වැළැක්විය නොහැක්කක් බවට පිළිබිඹු කිරීම සඳහා සමානුපාතිකත්වය පිළිබඳ ගණනය කිරීමේ දී එල්.ටී.ටී.ඊ. සංවිධානයේ නීති විරෝධී ක්‍රියා කලාපය සම්බන්ධයෙන් විශේෂ ඉඩ සැලසීමක් සිදු කළ හැකිය.[385]

497. සමපාර්ශ්වීය හානි පිළිබඳ ඉහත තර්කය ඉදිරියට ගෙන යමින් ජනාධිපති කොමිසම විසින් අනාවරණය කර ගනු ලබන කාරණය වන්නේ යුද්ධයේ අවසන් අදියර තුළ සිවිල් වැසියන්ගේ ජීවිත අහිමි වීම් පිළිබඳ කරුණු සහ වාතාවරණයන් සලකා බැලීමේදී සමපාර්ශ්වීය හානි සිදුවී තිබීමේ ඉඩකඩක් පවතින බව ය. එහෙත් ජනාධිපති කොමිසම විසින් මෙහිදී ඉතා අශෝභන ආකාරයෙන්

---

[383] පරණගම කොමිෂන් සභා වාර්තාව, 636 ඡේදය

[384] මිෂෙල් එන් ශ්මිත්, ජාත්‍යන්තර මානුෂීය නීතිය තුළ මිනිස් පලිහ - 2012 මානව හිමිකම් පිලිබඳ ඊශ්‍රායල් වාර්ෂික පුස්තකය, 2012

[385] පරණගම කොමිෂන් සභා වාර්තාව, 637 ඡේදය

"ශ්‍රී ලංකා හමුදාව විසින් සිදු කරන ලද සිවිල් වැසියන්ගේ ජීවිත හානි"යන යෙදුම භාවිතා කරනු ලැබේ.[386]

498. වෙනත් වචන වලින් පැවසුවහොත්, මෙය යුධමය අභිමතාර්ථයන්ට එරෙහිව නීත්‍යානුකූල ආකාරයෙන් සිදු කරන ලද සමානුපාතික ප්‍රහාරයක කොටසක් වශයෙන් එය පෙනී යන්නේද යන්න පිළිබඳ තීරණය ජනාධිපති කොමිසම විසින් විවෘතව තබා ඇත. කොමිෂන් සභාවේ සභාපතිවරයා විසින් 639 ඡේදය තුළ මේ සම්බන්ධයෙන් පසු සටහනක් එක් කොට ඇත්තේ මෙම හේතුව නිසාවෙනි.

"උගත් පාඩම් සහ ප්‍රතිසන්ධාන කොමිෂන් සභාවේද සේවය කිරීමේ වාසිය හිමි වූ මෙම කොමිෂන් සභාවේ සභාපතිවරයා, උගත් පාඩම් සහ ප්‍රතිසන්ධාන කොමිෂන් සභාව[387] වෙත සපයන ලද සීමිත ලේඛන පරිශීලනය කිරීම සම්බන්ධයෙන් සෑහීමකට පත් වන අතර, ඒ ඔස්සේ ශ්‍රී ලංකා හමුදාව විසින් යුද කිරීමට පනවා ඇති නීති යටතේ ක්‍රියාත්මක වූවාය යන කාරණයට සාක්ෂි දරනු ලැබේ. කෙසේ වුවද, 2019 පෙබරවාරි මස පළමු සතියෙන් ඔබ්බට යන කිසිදු යුද කිරීමට පනවා ඇති නීති සාක්ෂියක් මෙම සභාපතිවරයා විසින් දැක නැත. ඒ අනුව යුද්ධයේ අවසන් අදියර තුළදී යුද කිරීමට පනවා ඇති නීති තත්ත්වයන් කිසිවක් පැන නැගීමක් සිදු වී නොමැති බවට පෙනී යන්නේ යැයි ස්වකීය විමර්ශන වලට අදාළ පොදු සටහන් තුළ මේජර් ජනරල් හෝමිස් විසින් ප්‍රකාශ කරනු ලබන මතයට සභාපතිවරයාද එකඟ වේ. පැහැදිලිව ම, ජෙනරල් හෝමිස් විසින් කොමිෂන් සභාව වෙත එවන ලද හමුදා විශේෂඥ වාර්තාව තුළ නිරීක්ෂණය කරනු ලබන පරිදි ෂෙල් ප්‍රහාර එල්ල කිරීමේ සිද්ධිය ආශ්‍රිත ඕනෑම විමර්ශනයක දී මෙය ඉතා වැදගත් සාධකයක් විය හැක.[388]

499. සැබැවින්ම ජනාධිපති කොමිසමේ දෙවන විධිනියෝගය තුළින් පහත දක්වා ඇති විශේෂිත පැනය මතු කරනු ලැබේ.

> *"එලෙස සිවිල් වැසියන්ගේ ජීවිත අහිමිවීම හේතු කොටගෙන සන්නද්ධ අරගල වලදී ඉලක්කගත යුධමය අභිමතාර්ථයන්ට සාපේක්ෂව සමානුපාතික ප්‍රහාර දියත් කිරීමක් තුළ සිදුවන ආකාරයේ සමපාර්ශ්වීය හානියක් සිදු කිරීමේ හැකියාව ඒවාට පවතින්නේද සහ සන්නද්ධ අරගල සහ ජාත්‍යන්තර මානුෂීය නීතියට අදාළ නීති යටතේ එය ප්‍රකාශිතව හඳුනාගනු ලැබේද සහ එවන් සිවිල් වැසියන්ගේ තුවාල ලැබීම් ශ්‍රී ලංකාව තුළ ඇති වූ එකී සන්නද්ධ අරගලය අතරතුර ක්‍රියාත්මක වූ යුද කිරීමට පනවා ඇති නීති වල සිතා මතා ඇති කරන ලද හෝ අනපේක්ෂිත ප්‍රතිඵල වන්නේ ද?"[389]*

500. ඔවුන් විසින් අනාවරණය කරගත් පරිදි, යුද්ධයක් පැවතිය යුතු ක්‍රමයේ නීතිමය රාමුව අනුව ප්‍රහාරයේ සමානුපාතිකත්වය පිළිබඳ ප්‍රශ්නයට පිලිතුරු සැපයීමට ජනාධිපති කොමිසම උත්සාහ කරනු ලැබේ. මෙහිදී ජනාධිපති කොමිසම විසින් ගෝතමීනා අභියාචනා මණ්ඩල තීරණය උපුටා දක්වනු ලබන අතර එය පෙර තිබූ යුගොස්ලාවියාව සඳහා වන ජාත්‍යන්තර අපරාධ විනිශ්චය සභාවේ නඩු විනිශ්චය මණ්ඩලය විසින් සකස් කොට ක්‍රියාත්මක කිරීම සිදු වී ඇත.

---

386 පරණගම කොමිෂන් සභා වාර්තාව, 638 ඡේදය

387 රක්ෂිත ලේඛන අංක උගත් පාඩම් සහ ප්‍රතිසන්ධාන කොමිෂන් සභාව 6/33/122

388 හමුදා විශේෂඥ වාර්තාව, පරණගම කොමිෂන් සභා වාර්තාවේ ඇමුණුම 1 – 43 ඡේදයේ සිට

389 පරණගම කොමිෂන් සභා වාර්තාව, 161 ඡේදය

සමානුපාතිකත්වය පිළිබඳ ප්‍රශ්නයේදී, ජනාධිපති කොමිසම විසින් පහත පරිදි නිගමනය කරනු ලැබේ.

ප්‍රක්ෂිප්තයේ නිවැරදිභාවය කෙරෙහි බලපෑම් ඇති කිරීමෙන් යුධ කලාපයට දුරින් හෝ ආසන්නයේ කාලතුවක්කු භාවිතා කිරීම සැලකිල්ලට ගනිමින්, ගෝතවීනා අභියාචනා මණ්ඩලය විසින් විනිශ්චය සභාවෙන් සකස් කොට පනවන ලද මීටර් 200ක වරදක් වීමට ඉඩ සැලසිය හැකි සීමාව (මාජින් ඔෆ් එරර්) රීතිය ඒ ආකාරයෙන්ම ප්‍රතික්ෂේප කරන ලදී. මෙය හේතු දෙකක් නිසාවෙන් වැදගත් වේ. 1. ශ්‍රී ලංකා අණ දෙන නිලධාරීන් විසින් දැන සිටීමට ඉඩ තිබූ ප්‍රබල විශ්ලේෂණාත්මක රාමුවක් ඔසසේ සමානුපාතිකත්වය පිළිබඳ ගණනය කිරීම් සඳහා මග පෙන්විය හැකි පැහැදිලි තහනමක් නොපැවතිම, සහ 2. ඈත දුරක සිට යුධමය අභිමතාර්ථයක් ඔස්සේ වෙඩි තැබීම වැනි ආකාරයෙන් සිවිල් වැසියන් තුවාල ලැබීමේ තත්ත්වයන් ඉහළ යාමට තුඩු දිය හැකි සාධකයන් අපේක්ෂාවෙන් කටයුතු කිරීමට ශ්‍රී ලංකා හමුදාවන් ස්වකීය උපරිමයෙන් කැප වී කටයුතු කරන ලද බවට පවත්නා සාක්ෂි තුළින් පෙන්නුම් කරනුයේ සමානුපාතිකත්වය පිළිබඳ මූලධර්මයට අනුකූලව කටයුතු කරන ලද බව ය. අපේක්ෂා කළ හැකි මට්ටමට වඩා ඔබ්බට යන වැරදි සඳහා ශ්‍රී ලංකා හමුදාව වගකිව යුතු නොවන අතර පෙර තිබූ යුගොස්ලාවියාව සඳහා වන ජාත්‍යන්තර අපරාධ විනිශ්චය සභාවේ අභියාචනා මණ්ඩලයේ වදන් වලට අනුව, "සියලු ෂෙල් ප්‍රහාර නීත්‍යානුකූල හමුදා ඉලක්ක වෙත යොමු වී පැවතුණේය යන කාරණය බැහැර කළ හැකි නොවේ"යනුවෙන් ප්‍රකාශ වේ.[390]

එසේම යුධ අපරාධයක් වශයෙන් තක්සේරු කිරීමේ හැකියාව පවතින, කාලතුවක්කු භාවිතා කරමින් ෂෙල් ප්‍රහාර එල්ල කිරීම පිළිබඳව කරුණු දක්වන කිසිදු චෝදනාවක් යුද්ධයේ අවසන් අදියරට ප්‍රථම ගෙවුණු වසර දෙක තුළ නොපවතින අතර කොමිෂන් සභාව ද මෙම වැදගත් කාරණය පිළිබඳ දැනුවත්ව පසු වේ. [391]

501. උපදේශක මට්ටමකින් සේවය කළ යුධ හමුදා විශේෂඥ මේජර් ජෙනරල් ජෝන් හොල්මස් විසින් සිදු කරන ලද නිරීක්ෂණ කෙරෙහි පරණගම කොමිෂන් සභාව විශ්වාසය තබයි.

'2009 මෙහෙයුමේ අවසන් අදියරේදී එල්ල වන ලද විවේචන වලට සමාන වන ආකාරයෙන්, තෝරා බේරා ගැනීමකින් තොරව ෂෙල් වෙඩි ප්‍රහාර සිදුකිරීම සහ යුධ අපරාධ කිරීම සම්බන්ධයෙන් චෝදනා යුධ හමුදාව විසින් සිදු කරන ලද පසුගිය කාලතුවක්කු මෙහෙයුමේදී එල්ල වී නොතිබුණු බව අවධාරණය කිරීම වැදගත් වේ. මාගේ මතය අනුව තෝරා බේරා ගැනීමකින් තොරව ෂෙල් වෙඩි ප්‍රහාර එල්ල කිරීම හා සම්බන්ධ බව පෙනී යන අණ කිරීම් සංස්කෘතියක් මෙමගින් පෙන්නුම් කරනු ලැබේ.'[392]

"... තාවකාලික වශයෙන් සිවිල් වැසියන් කඳවුරු ගත වී සිටි ස්ථාන, විශේෂයෙන්ම අංක 2 සහ 3 දරන යුද මුක්ත කලාප කෙටි කාලයක් තුළ විනාශ කිරීම සඳහා කාලතුවක්කු ප්‍රහාර එල්ල කිරීමේ හැකියාව තිබූ ශ්‍රී ලංකා ගුවන් හමුදාව විසින් හිතාමතාම සිවිල් වැසියන් ඝාතනය කළ බවට චෝදනාවක් පවත්වාගෙන යෑම ඉතා දුෂ්කර බව මෙමගින් කතුවරයාට යෝජනා කරනු ලැබේ. අනවශ්‍ය පරිදි සිවිල් වැසියන් ඝාතනය වීමට හේතු වූ වැරදි බොහෝසෙයන්ම ශ්‍රී ලංකා ගුවන් හමුදාව විසින් සිදු කරන ලද අතර, සියළු ගැටුම්වලදී සෑම හමුදාවක් විසින්ම එවැනි ආකාරයේ වැරදි සිදු කරනු ලැබේ. මීටත් වඩා අපරීක්ෂාකාරී සිදුවීම් තිබිය හැකි ඇති අතර ඊශ්‍රායල් ආරක්ෂක හමුදාව විසින් රෝහල්වලට ප්‍රහාර එල්ල කිරීම වැනි යම් යම් සිදුවීම් පිළිබඳව පුළුල් ලෙස

---

[390] පරණගම කොමිෂන් සභා වාර්තාව, 478 ඡේදය

[391] පරණගම කොමිෂන් සභා වාර්තාව, 479 ඡේදය

[392] හමුදා විශේෂඥ වාර්තාව, පරණගම කොමිෂන් සභා වාර්තාව, 1 වන ඇමුණුම 76 වන ඡේදය

විශ්ලේෂණය කිරීමේදී මෙම කරුණ පැහැදිලි වේ. රෝහල් සහ සිවිල් වැසියන් අනතුරට ලක් කිරීම සඳහා එල්.ටී.ටී.ඊ. සංවිධානය විසින් භාවිතා කරන ලද වෙඩි ප්‍රහාර සිදු කර සැඟව යාමේ උපක්‍රමය සම්බන්ධයෙන් ප්‍රති ප්‍රහාර එල්ල කිරීමේදී මෙය සිදුවූයේ ද යන කරුණ මත මෙය රඳා පවතිනු ඇත."[393]

"කෙසේ වුවද සමස්ත තත්ත්වය සහ ඉහත සඳහන් හේතුව සලකා බැලීමේ දී පවතින සාක්ෂි අනුව මාගේ අදහස වන්නේ ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ මෙහෙයුම් කටයුතු පුළුල් අර්ථයෙන් ගත් කල, අදාළ තත්ත්වයන් තුළ දී සමානුපාතික වූ බව ය. ශ්‍රී ලංකා ගුවන් හමුදාව සාපේක්ෂ වශයෙන් ගත් කල නවීන නොවූ හමුදාවක් වුවද අවසානයේදී යුද්ධයක් බවට පත්වූ අරගලයක් ජයග්‍රහණය කිරීමේ යන්ත්‍රයක් බවට ඔවුන් විකසනය විය [...]. මාගේ යුද හමුදා මතය අනුව දෙමළ සිවිල් ජනතාව අනතුරට ලක් කිරීම සිදු කරනු ලබන කෲරතම උපායන් භාවිතා කරනු ලබන අධිෂ්ඨාන සහගත සතුරෙකු හමුවේ තමන් විසින් යොදාගත හැකි ක්‍රමෝපායන් සම්බන්ධයෙන් ශ්‍රී ලංකා ගුවන් හමුදාව සතුව තිබූයේ සීමිත විකල්පයන් සංඛ්‍යාවක් පමණි. ලොව ඉතාම හොඳින් පුහුණුවලත් සහ උපකරණ වලින් සමන්විත හමුදාවන්ට ද උහතෝකෝටික ගැටලුවක් මෙමගින් ඉදිරිපත් කරනු ලැබිය හැකිව තිබුණි. ශ්‍රී ලංකා ගුවන් හමුදාවට කළ හැකිව තිබුණේ අනතුරට ලක් වෙමින් තමාගේම සිවිල් ජනතාව ගොදුරු කර ගැනීමේ කාර්යය අඛණ්ඩව සිදුකර ගෙන යෑමට එල්.ටී.ටී.ඊ. සංවිධානයට ඉඩදීම හෝ අනතුරට ලක්වන සිවිල් වැසියන් පිරිස වැඩි වුවද එල්.ටී.ටී.ඊ. සංවිධානය සමග සටන් කිරීමයි. ක්‍රමෝපායික විකල්ප ඉතා වෙනස් වුවද මාගේ හමුදාමය මතය අනුව අවසන් අදියරේ දී ශ්‍රී ලංකා ගුවන් හමුදාව විසින් මුහුණ දෙන ලද සුවිශේෂී තත්ත්වය සලකා බැලීමේ දී ඒවා සාධාරණ හා සමානුපාතික විය. එසේ හෙයින් මා සතුව ඇති සාක්ෂි මත පදනම්ව සහ මගේම හමුදාමය අත්දැකීම් සැලකිල්ලට ගත්විට කාලතුවක්කු ප්‍රහාරය තෝරා බේරා ගැනීමකින් තොරව සිදු කරන ලද්දක් බවට පුළුල් අර්ථයෙන් ගත් විට මා හට අනාවරණය නොවන නමුත් එය ලබා ගැනීමට බලාපොරොත්තු වූ හමුදාමය අරමුණට සමානුපාතික විය."[394]

502. සුවිශේෂී සෙල් වෙඩි ප්‍රහාර සිද්ධි සම්බන්ධයෙන් පුද්ගලයන් හට අපරාධමය වගකීම පැවරීම පිළිබඳ ගැටළුව නිසි ලෙස පරීක්ෂා කළ හැක්කේ ස්වාධීන අධිකරණ විමර්ශනයක් තුළින් තුළින් පමණක් බව පිළිගන්නා අතරම ශ්‍රී ලංකා ගුවන් හමුදාව විසින් සිදු කරන ලද ෂෙල් වෙඩි ප්‍රහාරයන්ගේ සමානුපාතික බව තක්සේරු කිරීමේදී යුධ හමුදා විශේෂඥවරයාගේ නිගමනය ජනාධිපති කොමිෂන් සභාව විසින් පිළිගනු ලැබේ. විශ්‍රාමලත් මහාධිකරණ විනිසුරුවරයෙකුගේ නායකත්වයෙන් යුත් විමර්ශන කණ්ඩායමක් පත් කිරීම මගින් වගකීම වැඩිදියුණු කිරීමට තමන් අදහස් කරන බව පරණගම කොමිෂන් සභාව විසින් සඳහන් කරනු ලැබේ[395].

503. සුවිශේෂී ෂෙල් වෙඩි ප්‍රහාර සම්බන්ධයෙන් පුද්ගලයන් හට අපරාධ වගකීම් පැවරීම සහ ප්‍රහාරවල සමානුපාතිකත්වය පිළිබඳ ගැටළු විශ්‍රාමලත් මහාධිකරණ විනිසුරුවරයෙකු විසින් නායකත්වය දරනු ලබන විමර්ශන කණ්ඩායමක් මගින් පරීක්ෂා කරනු ලබන බවට ලබාදෙන ලද සහතිකය යථාර්ථයක් බවට පත් වී නොමැති අතර ප්‍රශ්නය විසඳීම සඳහා ස්වාධීන අධිකරණ විමර්ශනයක් තවමත් සිදුකර නොමැත. කෙසේ වුව ද, වෙනත් ඕනෑම විශේෂඥවරයෙකුගේ මතය මෙන්ම යුධ හමුදා විශේෂඥවරයාගේ මතය ද අනාගත විමර්ශනයක් සඳහා මගපෙන්වීමක් සිදුකරනු ලැබිය හැකි අතර, ජනාධිපති විමර්ශන කොමිෂන් සභාවේ නිර්දේශය වන්නේ මෙම කාරණය මූලිකවම විශ්වසනීය සත්‍ය සෙවීමේ යාන්ත්‍රණයක් මගින් විමර්ශනය කළ යුතු බවත් එහිදී පරණගම

[393] පරණගම කොමිෂන් සභා වාර්තාව, 481 ඡේදය

[394] හමුදා විශේෂඥ වාර්තාව, පරණගම කොමිෂන් සභා වාර්තාව, 1 වන ඇමුණුම 80-83 වන ඡේද

[395] පරණගම කොමිෂන් සභා වාර්තාව, 482 ඡේදය

කොමිෂන් සභාව විසින් සලකා බලනු ලැබ ඇති සියලුම සාක්ෂි එකි යාන්ත්‍රණය වෙත ඉදිරිපත් කළ යුතු බවත්ය.

- **ෂෙල්වෙඩි ප්‍රහාර සිද්ධීන් යුධ අපරාධ වන්නේ ද යන බව විමර්ශනය කිරීම**

504. නඩු පැවරීමේ කාර්ය සඳහා අනීතික ෂෙල් වෙඩි ප්‍රහාර හඳුනා ගැනීමේ දී පුද්ගලයන් හට අපරාධමය වගකීම පැවරීම පිළිබඳ ගැටළුවේ දී සලකා බැලිය යුතු සාධකවල පිරික්සුම් ලැයිස්තුවක් ඉහත කී මාතෘකාව යටතේ පරණගම කොමිෂන් සභාව විසින්ම සපයනු ලැබේ .

505. මෙම පිරික්සුම් ලැයිස්තුව අවුරුදු දහයක් තිස්සේ පැරණි යුගොස්ලෝවියාව සඳහා වන ජාත්‍යන්තර අපරාධ විනිශ්චය සභාවේ අභිචෝදක කාර්යාලයේ ජේෂ්ඨ නීති උපදේශකයකු ලෙස සේවය කළ, අවුරුදු ගණනාවක් තිස්සේ යුධ හමුදා නීතීඥයෙකු ලෙස කටයුතු කළ, විලියම් ෆෙන්රික් විසින් සපයන ලද විස්තරාත්මක මාර්ගෝපදේශයකි. ෂෙල් වෙඩි ප්‍රහාරය එල්ල කිරීම පිළිබඳව ගැටළුව සම්බන්ධයෙන් ගත්විට, පුද්ගලයන් වෙත අපරාධමය වගකීම පැවරීමේදී මෙම මොහොතේ දක්නට ලැබෙන විශාල සාක්ෂිමය හිඩැස විස්තර කරනු ලබන ලේඛනයක් ලෙස පරණගම කොමිෂන් සභාව විසින් මෙම ලේඛනය සලකනු ලැබේ. ෆෙන්රික් මහතාගේ මිල කළ නොහැකි පිරික්සුම් ලයිස්තුව පහත දැක්වෙන ආකාරයට ප්‍රධාන සාධක දෙකක් ඔස්සේ විස්තර කරනු ලැබේ.

(අ) ප්‍රක්ෂිප්තයන් පතිත වූ ස්ථානය පිළිබඳ විමර්ශනය

(ආ) ප්‍රක්ෂිප්තයන් දියත් කරන ලද්දේ කවර ස්ථානයක සිටද යන්න පිළිබඳ විමර්ශනය[396]

506. ඉහත සඳහන් සාධක ප්‍රකාරව (අ) සහ (ආ) ෂෙල් වෙඩි ප්‍රහාරයන් පැමිණියේ කවර ස්ථානයක සිටද සහ කවරෙකුගේ ෂෙල් වෙඩි ප්‍රහාර මගින් නීත්‍යානුකූල නොවන අලාභ සිදු කරන ලද්දේ ද යන්න පිළිබඳව ප්‍රබල සාක්ෂි සම්බන්ධයෙන් අනුමානයන් හෝ උපකල්පනයන් ආදේශකයක් නොවන බව පරණගම කොමිෂන් සභාව විසින් නිශ්චය කරනු ලැබේ. [397]

507 සත්‍ය සෙවීමේ කොමිෂන් සභාවක් වැනි කිසියම් අනාගත විමර්ශන යාන්ත්‍රණයකට සිය ඇගයීම් ක්‍රියාවලිය තුළ විලියම් ෆෙන්රික් ගේ මාර්ගෝපදේශය බෙහෙවින් ප්‍රයෝජනවත් වන බව නිශ්චය කළ යුතු බවට දැඩි සේ බලාපොරොත්තුවනු ලැබේ.

- **රෝහල්වලට ෂෙල් වෙඩි ප්‍රහාර එල්ල කිරීම**

508 තාවකාලික සහ වෙනත් රෝහල්වලට ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ කාලතුවක්කු මගින් අලාභ සිදු කරන ලද බවට ඉදිරිපත් කරන ලද සාක්ෂි පිළිබඳව විශ්ලේෂණයක් සිදු කිරීමෙන් අනතුරුව ආරක්ෂිත ඉලක්ක වෙත වෙඩි තැබීම සඳහා එල්.ටී.ටී.ඊ. සංවිධානය විසින් ශ්‍රී ලංකා ගුවන් හමුදාව පොළඹවනු ලබමින් සිටි බව පරණගම කොමිෂන් සභාව තීරණය කරයි. නිව් යෝර්ක් ටයිම්ස් සහ ගොර්ඩන් වෙයිෂ් යන පුවත්පත් දෙකම සමකාලීන නිදසුන් ගෙනහැර දක්වා ඇති බව ප්‍රකාශ වේ. කලින් පෙන්වා දී ඇති ආකාරයට, සාක්ෂිකරුවකු විසින් 'මානව හිමිකම් සඳහා වන විශ්වවිද්‍යාල ආචාර්යවරුගේ සංගමය - යාපනය' වෙත ලබාදෙන ලද සාක්ෂි පිළිබඳව පරණගම කොමිෂන් සභාව ඇඟවීමක් සිදුකරයි. [398]

---

[396] විලියම් ජේ ෆෙන්රික්"පැරණි යුගොස්ලෝවියාව සඳහා වන අන්තර්ජාතික විනිශ්චය සභාව ඉදිරියේ නීති විරෝධී ප්‍රහාර සම්බන්ධයෙන් නඩු පැවරීම'' ඩැල්හවුසි විශ්වවිද්‍යාලයේ නීති පාසල, 183-4 පිටු

[397] පරණගම කොමිෂන් සභා වාර්තාව, ඡේදය 484

[398] රාජන් හූලේ, පැල්මයිරා ෆෝලන්, පිටුව 215

509 රෝහලේ සිට මීටර් තුන්සියයක් ඈත දුරක සිට කොටින්ට අයත් බර කාලතුවක්කු උණ්ඩ නිකුත් වනු දකින්න පුළුවන් වූ බවටත් ඉදිරියට පැමිණෙන හමුදාවට එරෙහිව කොටින් විසින් යවන ලද කාලතුවක්කු වෙඩි හඬ ඇසීමත් සහ ඉන් අනතුරුව එම කාලතුවක්කු විනාශ කිරීම සඳහා ඊට ප්‍රතිචාරයක් ලෙස කාලතුවක්කු ප්‍රහාරයක් එල්ල වීමට පෙර ඉතා ඉක්මනින්ම තමන් සිටින ස්ථානය වෙනස් කරනු ලැබූ බවටත් පුදුකුඩුඉරිප්පු රෝහලේ ඉදිරිපස භූමියක සිටි එක්සත් ජාතීන්ගේ සංවිධානයේ නිලධාරියෙකු විසින් කරන ලද ප්‍රකාශයක් ද පරණගම කොමිසම විසින් උපුටා දක්වනු ලැබේ.

510 **ශ්‍රී ලංකා ගුවන් හමුදාව විසින් එල්.ටී.ටී.ඊ. සංවිධානයේ ආයුධ ඉලක්ක කරමින් සිටි බවටත් එල්.ටී.ටී.ඊ. සංවිධානය නිසැකවම ගුවන් හමුදාවට ප්‍රහාර එල්ල කිරීම සඳහා රෝහල් පරිසරයන් භාවිතා කරමින් සිටි බවටත් වූ කොමිෂන් සභාවේ නිගමනය වැඩිදුරටත් තහවුරු කිරීමක් මෙමගින් සිදු කරනු ලැබේ.** මීට අමතරව යුද හමුදාවට අයත් මිනිසුන් රහිත ගුවන් යානා මගින් නිරීක්ෂණය කරනු ලැබ ප්‍රහාරයන්ට ලක් වීමට ඉඩ ඇති හෙයින් රෝහල් ඉදිරිපිට තම හමුදා වාහන නොතබන ලෙස ජාත්‍යන්තර රතු කුරුස සංවිධානය විසින් එල්.ටී.ටී.ඊ. සංවිධානය වෙතින් සිදු කරන ලද ඉල්ලීම ඔවුන් විසින් නොසලකා හරින ලද බවට 'මානව හිමිකම් සඳහා වන විශ්වවිද්‍යාල ආචාර්යවරුන්ගේ සංගමය - යාපනය' වෙත සාක්ෂි ලැබී ඔවුන් විසින් එකී සාක්ෂි වාර්තා කරනු ලැබ ඇත.

511 ශ්‍රී ලංකා ගුවන් හමුදාව විසින් චේතාන්විතවම රෝහල්වෙත ෂෙල් වෙඩි ප්‍රහාරයක් එල්ල කරන ලද බවට වන චෝදනාව සම්බන්ධයෙන් පරණගම කොමිෂන් සභාවේ අදහස වන්නේ අපරාධයක් හෝ අපරාධ සිදුකර ඇති බවට සාධාරණ විශ්වාසයකට තුඩු දෙන ප්‍රමාණවත් සාක්ෂි ඇති බව ය. සැබවින්ම, මනා ලෙස පරීක්ෂා කරන ලද සාක්ෂි මත පදනම්ව බැලූ බැල්මට නඩුවක් තිබේද යන්න අදාළ නීතිය යටතේ තීරණය කිරීම සඳහා මෙකී චෝදනාවන්ට අදාළව විනිසුරුවරයෙකු විසින් මෙහෙයවනු ලබන පරීක්ෂණයක් සිදු විය යුතු බවද පරණගම කොමිෂන් සභාවේ අදහසයි.[399]

- **ගුවන් ප්‍රහාර අවි, පොස්පරස් සහ පොකුරු බෝම්බ**

512. සාමාන්‍යයෙන් පුළුල් පරාසයක් තුළ විශාල ප්‍රදේශයකට බලපෑමක් ඇති කිරීමට ශක්‍යතාවය ඇතැයි ප්‍රකාශ වන බැරල් බෝම්බයක් වැනි නිසඟ වශයෙන්ම තෝරා බේරා ගැනීමකින් තොරව ප්‍රහාර එල්ල කරනු ලබන ආයුධ ශ්‍රී ලංකා ගුවන් හමුදාව විසින් භාවිතා කරන ලද බවට යෝජනා කළ හැකි සාක්ෂි නොමැති බව පරණගම කොමිෂන් සභාව තීරණය කරයි [400]

513 සිවිල් ජනතාව එක්රැස් වී සිටි ප්‍රදේශවල ශ්‍රී ලංකා ගුවන් හමුදාව විසින් පොස්පරස් සහ පොකුරු ආයුධ භාවිතා කරන ලද බවට වූ වාර්තා වෙත ද කොමිෂන් සභාව විසින් අවධානය යොමු කරනු ලැබේ. පුදුකුඩිඉරිප්පු අවට පොකුරු බෝම්බ ආයුධ හෝ සුදු පොස්පරස් භාවිතා කරන ලද බවට වූ චෝදනා සම්බන්ධයෙන් දරුස්මාන් වාර්තාව මගින් ද අවධානය යොමු කර තිබුණි.[401]

514 සම්බන්ධතාවයක් නොමැති තොරතුරු මූලාශ්‍ර වෙත පහත සඳහන් අදහස මගින් සහාය දක්වනු ලැබේ.

---

[399] පරණගම කොමිෂන් සභා වාර්තාව, 490 ඡේදය

[400] පරණගම කොමිෂන් සභා වාර්තාව, 491 ඡේදය

[401] පරණගම කොමිෂන් සභා වාර්තාව, 491 ඡේදය

"*පොකුරු බෝම්බයක් භාවිතා කිරීමකදී ඇතිවන තත්ත්වයට අනුරූප විශාල පිපිරීම් සහ ඉන් අනතුරුව ඇතිවන විවිධ කුඩා පිපිරීම්, සමහර රෝහල්වල පොකුරු ආයුධ හෝ සුදු පොස්පරස් මගින් සිදු වී ඇති ඇතැයි ප්‍රකාශ වී තිබෙන තුවාල පිළිබඳ විස්තර අදාළ වේ.*"[402]

515 යුද්ධය නිම වී අවුරුදු හතරකට පසුව, 2012 වර්ෂයේ දී එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහනෙහි බෝම්බ ඉවත් කිරීමේ කණ්ඩායමෙහි සාමාජිකයකුගේ ඊමේල් පණිවිඩයක් වෙතින් අනාවරණය වූ ආකාරයට ගැටුම් පැවති ප්‍රදේශවලින් පොකුරු ආයුධ සොයාගනු ලැබූ බවට යම් යම් සාක්ෂි අනාවරණය කර ගනු ලැබ ඇති බව යෝජනා කරනු ලබන බව පරණගම කොමිෂන් සභාව නිරීක්ෂණය කරයි.[403]

516 ශ්‍රී ලංකා ගුවන් හමුදාව විසින් එම කාලයේ දී පොකුරු ආයුධ භාවිතා කිරීම ප්‍රතික්ෂේප කරන ලද බව සහ සටන් පවතින කාලය තුළදී ම එක්සත් ජාතීන්ගේ සංවිධානය විසින් මෙම ප්‍රතික්ෂේප කිරීම පිළිගනු ලැබූ බව අවධානයට ලක් කළ යුතුය.[404] එම ප්‍රතික්ෂේප කිරීම ප්‍රශ්න කරනු ලබන සමකාලීන සාක්ෂි නොතිබූ බව පරණගම කොමිෂන් සභාව පෙන්වා දෙයි. ටැමිල් නෙට් වෙබ්අඩවිය මගින් නිරන්තරව පොකුරු ආයුධ භාවිතා කිරීම සම්බන්ධයෙන් වාර්තා කරනු ලැබූ අතර එම කාලයේ දී ඒ සම්බන්ධයෙන් ඡායාරූප සාක්ෂි කිසිවක් ඔවුන් විසින් පළ නොකරන ලද බව යාපනයේ පිහිටි රාජ්‍ය නොවන සංවිධාන සහ 'මානව හිමිකම් සඳහා වන විශ්වවිද්‍යාල ආචාර්යවරුන්ගේ සංගමය - යාපනය' විසින් පැහැදිලි කරනු ලැබේ.[405]

517 එවැනි ආයුධ භාවිතා කිරීම එම කාලයේ දී එනයින්ම නීති විරෝධී නොවූ බවත් එකී ආයුධ භාවිතය තහනම් කරනු ලබන පොකුරු ආයුධ සම්මුතිය බලාත්මකව නොතිබූ බවත් පෙන්වාදීමට පරණගම කොමිෂන් සභාව විසින් අමතර ප්‍රයත්නයක් දරනු ලැබේ. එක්සත් ජනපදය, ඉන්දියාව සහ ශ්‍රී ලංකාව වැනි රටවල් එම සම්මුතියට අත්සන් තබා නොමැති රටවල් අතරට අයත් විය.[406]

518 එවැනි සිද්ධි මාලාවක් තුළින් තීරණය කළ යුතු වන ප්‍රධාන ගැටලුව කුමක් ද? එවැනි භාවිතයක් ඔප්පු කරනු ලැබේ නම්, එම ආයුධ යෙදවීම සමානුපාතික වන්නේ ද? සිවිල් වැසියන්ට එරෙහිව භාවිතා කරන ලද්දේ නම් පැහැදිලිවම මෙය ජාත්‍යන්තර මානව හිමිකම් නීතිය උල්ලංඝනය කිරීමක් වනු ඇත. එසේ වුවද, සිවිල් වැසියන් ජීවත්වන ස්ථානවලට ආසන්නව එල්.ටී.ටී.ඊ. නායකයාගේ පැන යාම සඳහා පහසුකම් සැලසීම පිණිස උත්සාහ කරන තැනැත්තන් විසින් ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ සීමාවන් කඩකිරීමට උත්සාහ කිරීමේදී එය ව්‍යර්ථ කිරීම සඳහා එකී ආයුධ භාවිතා කර තිබේ නම් එය සමානුපාතික විය හැකි බව පරණගම කොමිෂන් සභාව විසින් තීරණය කරනු ලැබේ.[407]

519 ප්‍රතික්ෂේප කිරීම සිදුකිරීමේ දී දරුස්මාන් වාර්තාවේ තර්ක සහ නිගමනයන් සිය වාර්තාවේ බොහෝ පරිච්ඡේද තුළදී පරණගම කොමිෂන් සභාව විසින්ම භාවිතා කරනු ලබන බව පෙන්වා දිය යුතු අතර මෙම ප්‍රශ්නය සම්බන්ධයෙන් පරණගම කොමිෂන් සභාව විසින් සඳහන් කරනු ලබන්නේ එවැනි

---

[402] පරණගම කොමිෂන් සභා වාර්තාව, දරුස්මාන් වාර්තාවේ 169 ඡේදය උපුටා දැක්වීම

[403] පරණගම කොමිෂන් සභා වාර්තාව, 493 ඡේදය

[404]" ශ්‍රී ලංකාවේ පොකුරු බෝම්බ භාවිතය එක්සත් ජාතීන්ගේ සංවිධානය උපුටා දක්වයි" ලොස් ඇන්ජලීස් ටයිම්ස්, 2009 පෙබරවාරි 04

[405] පරණගම කොමිෂන් සභා වාර්තාව, 494 ඡේදය

[406] පරණගම කොමිෂන් සභා වාර්තාව, 495 ඡේදය

[407] පරණගම කොමිෂන් සභා වාර්තාව, 496 ඡේදය

ආයුධ භාවිතා කරනු ලබමින් තිබුණේ කා විසින් ද, සහ භාවිතා කරන ලද නිශ්චිත ස්ථානය කවරේද යන්න සම්බන්ධයෙන් අවසානාත්මක සාක්ෂි මණ්ඩලය විසින් අනාවරණය කර නොගත් බව ය.[408]

520 කෙසේ වුවද, පරණගම කොමිෂන් සභාව කේවියට තහනමක් ලෙස හැඟී යයි. සිවිල් වැසියන් පොකුරු ආයුධ ප්‍රහාරයන්ට ලක් වූ බවට හෝ පොස්පරස් පිළිස්සුම් වලට ලක් වූ බවට බොහෝ පාර්ශව වලින් නිකුත් වන සාක්ෂි, ඒවායින් සමහරක් තහවුරු නොවුව ද, නොසලකා හැරිය නොහැක. ජාත්‍යන්තර රතුකුරුස සංවිධානය විසින් මුදවා ගන්නා ලද බොහෝ තැනැත්තන් පිළිස්සුම් තුවාල වලට ලක් ව තිබූ බව 'මානව හිමිකම් සඳහා වන විශ්වවිද්‍යාල ආචාර්යවරුන්ගේ සංගමය - යාපනය' විසින් තහවුරු කරනු ලබන බව පරණගම කොමිෂන් සභාව නිරීක්ෂණය කරයි. තමා විශ්වාස කරන ආකාරයට පොස්පරස් ෂෙල් ප්‍රහාරයක් යුද්ධයේ අවසාන අදියරේ දී තමා ජීවත් වූ කූඩාරමට ඉහළින් පුපුරා ගිය බවත් එමඟින් කුඩාරමට ගිනි ඇවිලී තම අත් සහ පිටුපස ප්‍රදේශය පිළිස්සී ගිය බවත් විදේශ රටක රැකවරණ ලබමින් සිටින දෙමළ වෛද්‍යවරයකු විසින් නගනු ලබන චෝදනාව පරණගම කොමිෂන් සභාව විසින් නොසලකා හරනු ලැබිය නොහැක. [409]

521 මෙය **තවදුරටත් විමර්ශන පැවැත්වීම අවශ්‍ය ක්ෂේත්‍රයක්** බව කොමිෂන් සභාවේ අදහසයි. මෙම ආයුධ භාවිතා කරනු ලබමින් පැවැතුනේ ද යන්න නිශ්චය කර ගැනීම සඳහා වාර්තා වූ තුවාල **පිළිබඳව විස්තීර්ණ වෛද්‍ය සමාලෝචනයක් සිදු විය යුතු** බවත් එමඟින් **චෝහාරික විශ්ලේෂණයක්** සිදුකළ හැකිවනු පිණිස සිදුවී ඇති **තුවාල** වර්ග සැසඳීමක් සිදු කළ යුතු බවත් පරණගම කොමිෂන් සභාව සඳහන් කළේය. මෙම කාරණය සම්බන්ධයෙන් ඡායාරූප වැනි වැඩිදුර ද්‍රව්‍ය අනාවරණය කරනු ලබන තත්ත්වයක එක්සත් ජාතීන්ගේ සංවිධානය ඇත්නම්, මෙමඟින් නිසැකවම මෙම කාරණය සම්බන්ධයෙන් තවදුරටත් පරීක්ෂණ සිදු කරනු ලබන දේශීය සහ අනෙකුත් පර්යේෂණ කණ්ඩායම්වලට සහාය ලැබෙනු ඇත.[410]

522 ශ්‍රී ලංකාවට ලබා දෙන ජාත්‍යන්තර සහයෝගය සහිතව සියලු කාරණා විමර්ශනය කිරීම සඳහා අවස්ථාව ශ්‍රී ලංකාවට ලබා දිය යුතු බව ජනාධිපති විමර්ශන කොමිෂන් සභාවේ අදහස වේ.

ඇ. මානුෂීය ආධාර ප්‍රතික්ෂේප කිරීම

523 උගත් පාඩම් හා ප්‍රතිසන්ධාන කොමිෂන් සභාව පිළිබඳ සාකච්ඡාවේ දී අප විසින් නිරීක්ෂණය කරන ලද ආකාරයට සන්නද්ධ අරගලයේ අවසාන අදියර වලදී, වන්නි ප්‍රදේශයේ යුද්ධයෙන් පීඩාවට පත් ප්‍රදේශවලට මානුෂීය ආධාර පැමිණීම ශ්‍රී ලංකා රජය විසින් වළක්වන ලද බවට චෝදනාවක් එල්ල වී ඇත. සිදු වී ඇතැයි ප්‍රකාශ කරනු ලබන ෂෙල් ප්‍රහාරයන් මෙය සිදු කිරීමේ එක් ක්‍රමයක් විය හැකිය. නීතිමය කරුණක් ලෙස, අරගලයක පාර්ශවකරුවන් විසින් අත්‍යාවශ්‍ය හමුදාමය කාරණා මත මානුෂීය ආධාර ගලායෑම පාලනය කිරීම හෝ සීමා කිරීම සඳහා හිමිකම් ලබන අතර, විශේෂයෙන්ම මෙය සිදුකරනු ලබන්නේ ලබාදෙනු ලබන ආධාර තම යුධමය ප්‍රයත්නයන්ට සහාය පිණිස සහ සටන්කරුවන් නඩත්තු කිරීම සඳහා විරුද්ධවාදියෙකු විසින් ලබාගනු ලබන විටදීය. නීත්‍යානුකූලව හමුදාමය අරමුණු ඉටුකර ගැනීම සඳහා උපකාරී වේ නම් යුද්ධය දියත් කිරීමේ ක්‍රමයක් ලෙස වැටලීමේ ක්‍රමය හෝ අවහිර කිරීම් භාවිතා කිරීමට ජාත්‍යන්තර මානව හිමිකම් නීති යටතේ පවා අවසර ඇත.[411]

---

[408] පරණගම කොමිෂන් සභා වාර්තාව, 497 ඡේදය

[409] පරණගම කොමිෂන් සභා වාර්තාව, 498 ඡේදය

[410] පරණගම කොමිෂන් සභා වාර්තාව, 499 ඡේදය

[411] පරණගම කොමිෂන් සභා වාර්තාව, 500 ඡේදය

524 යුද්ධයේ අවසන් මාස කීපය තුළදී කිසියම් ආකාරයකින් අවහිර කිරීමේ යුද ක්‍රමය ශ්‍රී ලංකා ගුවන් හමුදාව විසින් යොදා ගන්නා ලද බවට බවට සාක්ෂි නොමැති බව කොමිෂන් සභාව විසින් නිගමනය කරන ලදි. සිවිල් ජනතාව කුසගින්නේ තැබීම සඳහා සැලසුම් සහගත ප්‍රයත්නයක් තිබූ බවට සාක්ෂි නොමැති බව ද කොමිෂන් සභාව නිගමනය කළේය. ආහාර සහ බෙදා හැරීම් දාමයන් වැනි මානුෂීය ඉලක්ක වෙත ප්‍රහාර එල්ල කිරීම සම්බන්ධයෙන් වූ තහනම කඩ කරන ලද බවට දරුස්මාන් වාර්තාව තුළ නගන ලද චෝදනා කොමිෂන් සභාව විසින් විවේචනය කරන ලදි. [412]

525 එක්සත් ජාතීන්ගේ සංවිධානය සහ මානුෂීය සංවිධාන විසින් යවන ලද සැපයුම් එල්.ටී.ටී.ඊ. සංවිධානය විසින් තම හමුදා මෙහෙයුම් සහ තම හමුදාවන්ගේ සහාය පිණිස භාවිතා කරමින් තිබූ බවට සාක්ෂි පැවතීම හේතුවෙන් ඉහත කී නිරීක්ෂණය සිදු කරන ලදී. යුද්ධය පවතින කාලය තුළදීම ආධාර සහ ආහාර සැපයීම සඳහා ඉඩකඩ ලබා දෙමින් විරුද්ධවාදියෙකු නඩත්තු කිරීම සන්නද්ධ හමුදාවක් විසින් සිදු කරනු ඇතැයි අපේක්ෂා කළ නොහැකිය.[413]

526 විරුද්ධවාදියාට හමුදාමය වාසියක් ලබා ගැනීමට නොහැකි තත්ත්වයක් ඇති කිරීම සහ සිවිල් ජනතාවට උපකාර කිරීම අතර පරීක්ෂාකාරී සමබරතාවයක් සෑම විටම තිබීම අවශ්‍ය වේ. සැබවින්ම මානුෂීය ආධාර සිවිල් ජනතාව වෙත ළඟා කර වීම සඳහා අවසර දීමට සහ තම හමුදාවන් විසින් එකී ආධාර අයුතු ලෙස අත්පත් කර ගැනීම වැළැක්වීමට සමාන වගකීමක් විරුද්ධවාදියා හට ද ඇත.[414]

527යුද්ධයේ අවසන් අදියර තුළදී සහ ඉන් අනතුරුව මෙන්ම ඇතැම් විට ඊට පෙර වන්නි ප්‍රදේශයේ සිවිල් ජනතාව වෙත පුළුල් හා ක්‍රමානුකූල ප්‍රහාරයක් ශ්‍රී ලංකා රජය විසින් එල්ල කරන ලද බවට වූ චෝදනාව දරුස්මාන් වාර්තාවෙන් නගන ලදි.

528 සිවිල් ජනතාවට මානුෂීය ආධාර ලබා දීම ප්‍රතික්ෂේප කිරීම සහ ආහාර බෙදා හැරීමේ මධ්‍යස්ථාන වැනි ස්ථානවලට ෂෙල් වෙඩි ප්‍රහාරයන් සිදුකිරීම මගින් මෙම ප්‍රහාරය සිදු කරන ලද බව ප්‍රකාශ කරනු ලැබේ.

පහත සඳහන් සිද්ධි සිදු වී ඇතැයි දරුස්මන් වාර්තාව තුළ සඳහන් වේ.

- එක්සත් ජාතීන්ගේ මධ්‍යස්ථානයට, ආහාර බෙදා හැරීමේ දාමයන්ට සහ වෙරළ තීරයන්හි සිට තුවාල ලැබූවන් සහ ඔවුන්ගේ ඥාතීන් රැගෙන යෑමට එමින් සිටි ජාත්‍යන්තර රතු කුරුස සංවිධානයට නැව් අසල රජය විසින් ෂෙල් වෙඩි ප්‍රහාරයක් එල්ල කරන ලදි. තමාගේම බුද්ධි පද්ධතීන් සහ එක්සත් ජාතීන්ගේ සංවිධානය, ජාත්‍යන්තර රතු කුරුස සංවිධානය සහ වෙනත් ආයතන මගින් ලබා දෙන ලද නිවේදන තුළින්, ඇතිවිය හැකි බලපෑම පිළිබඳව දැනුමක් ලබ දී තිබිය දී රජය විසින් මෙම ෂෙල් වෙඩි ප්‍රහාරය එල්ල කරන ලදි.

- විශේෂ වශයෙන්ම 11 වන නැව් පංතිය, පුදුමාතලන් අසල එක්සත් ජාතීන්ගේ කාර්ය මණ්ඩලය, යුද මුක්ත කලාපයන්හි ආහාර බෙදා හැරීමේ දාමයන් සහ අම්පලවන්පොක්කන්නයි සහ ජාත්‍යන්තර රතු කුරුස සංවිධානයට අයත් නැව් අසල යනාදී

[412] පරණගම කොමිෂන් සභා වාර්තාව, 501 ඡේදය

[413] එම

[414] පරණගම කොමිෂන් සභා වාර්තාව, 502 ඡේදය

වශයෙන් මානුෂීය සහන සැලසීමේ ආයතන කිහිපයක් ශ්‍රී ලංකා ගුවන් හමුදාව විසින් එල්ල කරන ලද ෂෙල් වෙඩි ප්‍රහාරයන්ට ලක්විය.[415]

529 එසේ හෙයින්, ආහාර බෙදා හැරීමේ දාමයන් ඇතුළු මානුෂීය ආයතනයන්ට එරෙහිව ඒවා ඉලක්ක කර ගනිමින් ප්‍රහාර එල්ල කිරීම සම්බන්ධයෙන් වූ තහනම උල්ලංඝනය කරන ලද බවට විශ්වසනීය චෝදනා පවතින බව දරුස්මාන් වාර්තාව මගින් නිගමනය කරන ලදි.[416]

530 සමස්තයක් ලෙස යුද හමුදා මෙහෙයුම්වල නිත්‍යානුකූල භාවය පිළිබඳව නිගමනවලට එළඹීමේ දී විශේෂයෙන්ම සුවිශේෂීභාවය සහ සමානුපාතිකත්වය සම්බන්ධයෙන් ජාත්‍යන්තර මානව හිමිකම් නීතියෙහි මූලික සංකල්ප යෙදවීම සම්බන්ධයෙන් විශ්ලේෂණයක් දරුස්මාන් වාර්තාව තුළ අන්තර්ගත නොවන බව පරණගම වාර්තාව මගින් පෙන්වා දෙනු ලැබේ. එම ඌනතාවයම මානුෂීය ආධාර ආයතනයන්ට ප්‍රහාර එල්ල කිරීම සම්බන්ධයෙන් දරුස්මාන් වාර්තාව මගින් එළඹෙන ලද නිගමන තුළ ද විද්‍යමාන වේ. සිවිල් ආයතන වලට සිදු කරන අලාභ හෝ මානුෂීය අධාර ආයතන වලට සමීපව තම හමුදා ස්ථානගත කිරීම සඳහා එල්.ටී.ටී.ඊ. සංවිධානය විසින් කටයුතු කිරීම සහ මෙම ස්ථාන ආරක්ෂා කිරීම සඳහා සිවිල් වැසියන් පලිහක් ලෙස යොදා ගැනීම වැනි ක්‍රියාවන්ට සාපේක්ෂව යුද හමුදාවේ අවශ්‍යතාවයන් පිළිබඳව නිසි ඇගයීමක් මෙම වාර්තාව තුළ දක්නට නොලැබේ. සිවිල් වැසියන් සහ එක්සත් ජාතීන්ගේ කාර්ය මණ්ඩලය ස්ථානගත වී සිටින ස්ථානවලට පෙරළා වෙඩි තැබීම සඳහා ශ්‍රී ලංකා ගුවන් හමුදාව හිතා මතාම ආකර්ෂණය කර ගැනීම සඳහා එල්.ටී.ටී.ඊ. සංවිධානය විසින් කොපමණ දුරට උපක්‍රමයන් යොදාගනු ලැබුවේ ද යන්න පිළිබඳ ව ඇගැයීමක් ද දක්නට නොලැබේ.[417]

531මේ අනුව එල්.ටී.ටී.ඊ. සංවිධානයේ අපේක්ෂිත අරමුණුවලින් එකක් වූයේ සිවිල් වැසියන් අනතුරට ලක් කර එකී මරණ ශ්‍රී ලංකා ගුවන් හමුදාව විසින් සිදු කරන ලද අපරීක්ෂාකාරී ඝාතන ලෙස හුවා දැක්වීමය යන අදහස පරණගම කොමිෂන් සභාව විසින් ප්‍රකාශ කරන ලදි.[418]

532 මේ සම්බන්ධයෙන් බොහෝ වාර්තා පළ වී ඇති 11 වන එක්සත්ජාතීන්ගේ මානුෂීය ආධාර නැව් පන්තිය පත්ව සිටි තත්ත්වය පිළිබඳව හියුමන් රයිට්ස් වොච් ආයතනය විසින් පැහැදිලි කරනු ලැබේ.

"*දැඩි සටන් හේතුවෙන් 11 වෙනි එක්සත් ජාතීන්ගේ මානුෂීය ආධාර නැව් පන්තිය ජනවාරි මාසයේ දී සතියක පමණ කාලයක් පුදුකුඩිඉරුප්පු හී රඳවා තබාගත් අවස්ථාවේ දී, එල්.ටී.ටී.ඊ. හමුදාවන් විසින් නැව් පන්තියට සමීප ස්ථානවලට වෙඩි තැබීම සහ කාලතුවක්කු ප්‍රහාර එල්ල කිරීම ආරම්භ කරන ලදි. ශ්‍රී ලංකා ගුවන් හමුදාව තම කාලතුවක්කු යොදා ගනිමින් ප්‍රතිප්‍රහාර සිදු කළේය. එක් ෂෙල් ප්‍රහාරයක් නැව් පන්තියට මීටර් 100 ක් දුරින් පතිත විය.*"[419]

533. ශ්‍රී ලංකා ගුවන් හමුදාව විසින් වෙඩි තැබීම සිදු කළද සිදු කරන ලද්දේ එක් ෂෙල් ප්‍රහාරයක් පමණක්ය යන අදහස ලබාදීමට තමන් අපේක්ෂා නොකළ බව පැහැදිලි කිරීමට ඉහත කරුණු උපුටා දක්වමින් පරණගම කොමිෂන් සභාව අමතර වෙහෙසක් දැරීය. සැබැවින්ම, 11 වෙනි නැව් පන්තියට සිදු කරන ලද ප්‍රහාරයේ දී සිවිල් වැසියන් ඝාතනය වූ බව පිළිගනු ලබන නමුත් ප්‍රධාන

---

[415] දරුස්මන් වාර්තාව, පිටුව ii

[416] දරුස්මන් වාර්තාව, ඡේදය 210

[417] පරණගම කොමිෂන් සභා වාර්තාව, ඡේදය 504

[418] එහිම

[419] පරණගම කොමිෂන් සභා වාර්තාව, 505 ඡේදය

ගැටළුව වූයේ එක්සත් ජාතීන්ගේ නැව් පන්තියක් හෝ සිවිල් වැසියන් ඉලක්ක කරන ලද්දේ ද නැත හොත් ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ ප්‍රහාරය එල්.ටී.ටී.ඊ. ප්‍රහාරයකට **සමානුපාතික ප්‍රතිචාරයක්** වූයේද යන්නයි. තම කාලතුවක්කු එක්සත් ජාතීන්ගේ නැව් පන්තියට ආසන්නව ස්ථානගත කිරීම මගින් එල්.ටී.ටී.ඊ. සංවිධානය විසින් ජාත්‍යන්තර මානව හිමිකම් නීතිය උල්ලංඝනය කිරීම හේතු කොට ගෙන එල්.ටී.ටී.ඊ. සංවිධානය සහ ශ්‍රී ලංකා නාවික හමුදාව අතර දැඩි කාලතුවක්කු වෙඩි හුවමාරුවක් සිදු විය. මෙම වෙඩි හුවමාරුවේදී සිවිල් වැසියන් ඝාතනය වූයේ ද යන්න පිළිබඳව කුඩා සැකයක් තිබිය හැකිය. කෙසේ වුවද, මෙය ආරක්ෂිත තත්ත්වයක සිටි තැනැත්තන් තම ජීවිත අහිමිවන අවාසනාවන්ත තත්ත්වයට අනතුරට ලක් කිරීමට එල්.ටී.ටී.ඊ. හමුදාවන් විසින් **හිතාමතාම** සිදුකරන ලද ක්‍රියාවකට උදාහරණයක් වේ.[420]

534 "අවතැන් වූ තැනැත්තන්ගේ ජීවන තත්ත්වයන් ඉතාම පහළ සහ පිහිරිහුණු තත්ත්වයක පැවැති අතර නැවත නැවතත් අවතැන් වීමට ඔවුන්ට සිදුවිය. ආහාර ඇතුළු මූලික අවශ්‍යතාවයන් සපුරා ගැනීමේ අවස්ථාවන් බෙහෙවින්ම දුර්ලභ විය." යන කාරණය දරුස්මාන් වාර්තාව මගින් ද ඉස්මතු කරන ලදි. සිවිල් වැසියන් විසින් මුහුණ දෙන ලද තත්ත්වයන් ඉතා බරපතල වූ බව ඉතාම පැහැදිලිය.[421]

535 කෙසේ වුවද, මෙම තත්ත්වය සම්බන්ධයෙන් විසඳුම් සෙවීමට එල්.ටී.ටී.ඊ. සංවිධානය අසමත් වීම හෝ සත්‍ය වශයෙන්ම, සිවිල් වැසියන් ප්‍රදේශයෙන් ඉවත් වීම වැළැක්වීම සහ මානුෂීය අර්බුදය දුරලීම සඳහා ඔවුන්හට මෙම ප්‍රදේශයෙන් මිදී ගමන් කිරීම සඳහා ආරක්ෂිත මාර්ගයක් සැපයීමට අසමත් වීම මගින් එල්.ටී.ටී.ඊ. සංවිධානය විසින් මෙම තත්ත්වය නිර්මාණය කරන ලද සහ උග්‍ර තත්ත්වයට පත් කරන ලද ආකාරය දරුස්මාන් වාර්තාව පරීක්ෂා නොකරන බව පරණගම කොමිෂන් සභාව විසින් පෙන්වා දෙනු ලැබේ.[422]

536. ඒ වෙනුවට, රජය විසින් සිවිල් වැසියන් හට ආහාර සහ මානුෂීය ආධාර අහිමි කරන ලද්දේය යන චෝදනාව පිළිබඳව දරුස්මාන් වාර්තාව අවධානය යොමු කරයි. යුධ උපක්‍රමයක් ලෙස 'කුසගින්නේ තැබීම තහනම් කරනු ලබන නීතිය' මගින් 'පාර්ශ්වයන්ට තම පාලන අයිතියට යටත්ව අපක්ෂපාතී ආකාරයකින් සහ අහිතකර ආකාරයේ විශේෂත්වයක් නොදක්වමින් අවශ්‍යතාවය ඇති සිවිල් වැසියන් වෙත මානුෂීය සහනාධාර ළඟා කරවීම සඳහා ඉක්මනින් සහ බාධාවකින් තොරව ඉඩකඩ සලසා දීම සහ පහසුකම් සලසා දීමට' නියම කරනු ලබන බව නිරීක්ෂණය කරමින් එකී නීතිය උල්ලංඝනය කිරීම මගින් ශ්‍රී ලංකා රජය විසින් ජාත්‍යන්තර මානව හිමිකම් නීතිය උල්ලංඝනය කරන ලද බව, කරුණු පරීක්ෂා කිරීම හෝ තහවුරු කිරීම නොකරමින් එකී වාර්තාව මගින් නිගමනය කරන ලදි.[423]

537 කෙසේ වුවද, හමුදාමය වාසියක් ලබා ගැනීම සඳහා ප්‍රතිවිරුද්ධ පාර්ශ්වය විසින් මානුෂීය ආධාර ලබාදීම අවහාවිතා කරනු ලබන අවස්ථාවක දී, ජාත්‍යන්තර මානුෂීය නීතිය යටතේ ආධාර ලබාදීම සම්බන්ධයෙන් වන ව්‍යතිරේක අවස්ථාවන් කිසිවක් දරුස්මාන් වාර්තාව මඟින් සලකා බැලීමක් සිදු නොකරන බව පරණගම කොමිසම මගින් පෙන්වා දෙනු ලැබේ.[424]

---

[420] පරණගම කොමිෂන් සභා වාර්තාව, 506 ඡේදය

[421] පරණගම කොමිෂන් සභා වාර්තාව, 507 ඡේදය

[422] එහිම

[423] පරණගම කොමිෂන් සභා වාර්තාව, 508 ඡේදය

[424] පරණගම කොමිෂන් සභා වාර්තාව, 509 ඡේදය

538. යුද්ධයේ අවසාන අදියර වලදී මානුෂීය ආධාර ලබා දීම සම්බන්ධයෙන්ම සම්පූර්ණ තහනමක් නොතිබූ බවට දරුස්මාන් වාර්තාව එකඟ වෙයි. ආධාර සැපයීමට රජය එකඟ වූ අතර ලබාදුන් ප්‍රමාණ රජය සීමා කරන ලද බවට වාර්තාව මගින්, යම් පමණකට, පිළිගනු ලැබේ.[425]

539 එක්සත් ජාතීන්ගේ සංවිධානය විසින්ම යුධ කළාපය තුළ සිටි සිවිල් වැසියන් සංඛ්‍යාව අඩුවෙන් තක්සේරු කර තිබූ බව අවධාරණය කළ යුතුය. යුධ කලාපය තුළ කොටුවී සිටි සිවිල් වැසියන් සංඛ්‍යාව ලක්ෂයකට වඩා වැඩි වූ බව අවතැන් වූ පුද්ගලයන්ගේ මානව හිමිකම් පිළිබඳ නියෝජිත වෝල්ටර් කෙයොලින් විසින් තහවුරු කරන ලද බව උපුටා දක්වමින් 2009 අප්‍රේල් 07 දින ලන්ඩනයේ ගාඩියන් පුවත්පත සඳහන් කළේය. මෙම සංඛ්‍යාව මීට තුන් ගුණයකට වඩා වැඩි සංඛ්‍යාවක් බව දරුස්මාන් වාර්තාව ප්‍රකාශ කරයි.[426]

540 එක්සත් ජාතීන්ගේ ශ්‍රී ලංකාවේ නේවාසික නියෝජිත / මානුෂීය සම්බන්ධීකාරක සහ ලෝක ආහාර වැඩසටහනෙහි ප්‍රධානියා විසින් ශ්‍රී ලංකා රජය සමග එකඟතාවයට පැමිණීමට සමත් වන ලද අතර එමගින් ආහාර, රැකවරන සහ ඖෂධ ලබාදීම සඳහා වන්නි ප්‍රදේශයට සතිපතා ගමනාගමනය කිරීම මගින් මානුෂීය ආධාර කටයුතු ඉදිරියට කරගෙන යාමට එක්සත් ජාතීන් හට ඉඩ සලසා දෙන ලදි. ‘මෙම නැව් පන්තියෙහි කටයුතුවලට සහභාගී වන අයට සහ අහාර හා වෛද්‍ය සැපයුම් වෙත රජය විසින් විශාල සීමාවන් පනවන ලද බවත් එලෙසම විශේෂයෙන්ම ආහාර හා ඖෂධ මානුෂීය ආධාර ප්‍රමාණය සීමා කිරීම සඳහා අඩු ගණනය කිරීම් යොදා ගනිමින් එල්.ටී.ටී.ඊ. පාලන ප්‍රදේශවල සිටි සිවිල් වැසියන් සංඛ්‍යාව රජය විසින් අඩු කොට දැක්වූ බවත්’ දරුස්මාන් වාර්තාව සඳහන් කරයි. අවශ්‍යතාවයන් පිළිබඳ ගණනය කිරීම් හිතාමතාම අඩු මට්ටමකින් පවත්වාගෙන යන ලද අතර ඒ හේතුවෙන් ලෝක ආහාර වැඩසටහන මගින් වන්නි ප්‍රදේශය වෙත ලබාදෙන ලද ආහාර ප්‍රමාණය සත්‍ය වශයෙන්ම අවශ්‍ය වූ ආහාර ප්‍රමාණයෙන් කොටසක් පමණක් වූ අතර එහි ප්‍රතිඵලයක් ලෙස මන්දපෝෂණය ව්‍යාප්ත වූ අතර සහ කුසගින්නෙන් පසු විමට සිදු වූ සිද්ධීන් ද ඇති විය. වන්නි ප්‍රදේශයට ලබාදීමට ඉඩ සලසා දෙන ලද වෛද්‍ය සැපයුම් ප්‍රමාණය ෂෙල් ප්‍රහාර මගින් තුවාල ලද අයට ප්‍රතිකාර කිරීම සඳහා කිසිසේත්ම ප්‍රමාණවත් නොවූ අතර අවශ්‍ය වෛද්‍ය සැපයුම් නොමැති වීම හේතුවෙන් දැඩි පීඩාවන්ට ලක්වීමට ජනතාවට සිදුවූ අතර අනවශ්‍ය ලෙස ජීවිත හානි ද සිදුවිය.[427]

541 සපයන ලද ආධාර ලබා ගැනීමේ අවස්ථාව සිවිල් ජනතාවට අහිමි කරමින් එල්.ටී.ටී.ඊ. සංවිධානය විසින් එකී ආධාර අනවසරයෙන් ලබා ගැනීම හේතුවෙන් කිසියම් සීමාවන් පනවන ලද්දේ ද යන්න සහ එල්.ටී.ටී.ඊ. සංවිධානය විසින් එකී ආධාර තම පැවැත්ම සඳහා යොදා ගනු ලබන්නේය යන විශ්වාසය මත ඒ සම්බන්ධයෙන් කටයුතු කිරීමට ශ්‍රී ලංකා ගුවන් හමුදාවට සිදු වූයේද යන්න පිළිබඳව දරුස්මාන් වාර්තාව මගින් විශ්ලේෂණයක් සිදු නොකරනු ලබන බව පරණගම කොමිෂන් සභාව පෙන්වා දෙයි.[428]

542. 2008 වසරේ දී ආහාර සංචිත ප්‍රමාණය අඩු මට්ටමක පැවතීම, 2009 වසරේ දී එක්සත් ජාතීන්ගේ සංවිධානය වන්නි ප්‍රදේශයෙන් ඉවත් වූ විට ගබඩා කර තිබූ ආහාර කොල්ලකෑම සහ නිරන්තරවම අවතැන්වීම හේතුවෙන් පවුල් වලට ආහාර ප්‍රවාහනය දුෂ්කර වීම යන කාරණය ඇතුළුව

---

[425] පරණගම කොමිෂන් සභා වාර්තාව, 510 ඡේදය

[426] ගෙතින් චැම්බර්ලේන්," දෙමළ කොටි ත්‍රස්තවාදීන්ට එරෙහි යුද්ධයේ දී සටන් විරාමයකට එළඹෙන ලෙස ජ එක්සත් ජාතීන්ගේ සංවිධානය විසින් සිදු කරන ලද ඉල්ලීම ශ්‍රී ලංකාව ප්‍රතික්ෂේප කරයි, ද ගාඩියන්, 2009 අප්‍රෙල් 07

[427] පරණගම කොමිෂන් සභා වාර්තාව, 512 ඡේදය

[428] පරණගම කොමිෂන් සභා වාර්තාව, 513 ඡේදය

සැලකිල්ලට ගත යුතු සාධක ගණනාවක් ලැයිස්තුගත කර තිබූ පෙට්‍රි වාර්තාව පරණගම කොමිෂන් සභාව විසින් මීළඟට අවධානයට ලක් කරන ලදි. වන්නි ප්‍රදේශයට යවා තිබූ ආධාරවලින් 20% ට ආසන්න ප්‍රමාණයක් එල්.ටී.ටී.ඊ. සංවිධානය විසින් ලබාගන්නට ඇත යන චෝදනාව පිළිබඳව ද පෙට්‍රි වාර්තාව සඳහන් කරයි.[429]

543 ඉහත සඳහන් කරුණු කිසියම් සාධාරණ ආකාරයකින් ඇගැයීමට ලක් කිරීම සඳහා සැලකිල්ලට ගත යුතුව තිබූ අදාළ කාරණයක් බවට ජනාධිපති විමර්ශන කොමිෂන් සභාව එකඟ වෙයි.

544 ඉහත කී සාධක, එනම් තමන් විසින් රඳවා ගෙන සිටින සහ යුධ කලාපයෙන් පිටවීම වළක්වනු ලැබ සිටි සිවිල් ජනතාව සම්බන්ධයෙන් සහ ඔවුන්ගේ මානුෂීය අවශ්‍යතා ඉටු කිරීම සම්බන්ධයෙන් එල්.ටී.ටී.ඊ. සංවිධානය වෙත වගකීම් පැවරීමට හේතු වූ යුද්ධයේ අවසාන අදියරවලදී ඇති වූ සිද්ධිමය කරුණු සැලකිල්ලට ගෙන නීත්‍යානුකූල හමුදාමය හේතු පදනම් කරගෙන මානුෂීය සහනාධාර සැපයුම් මත පනවන ලද සීමාවන් සමස්තයක් ලෙස සැලකිල්ලට ගෙන පහත සඳහන් නිගමනයට පරණගම කොමිෂන් සභාව විසින් එළැඹෙනු ලැබේ.[430]

545 හමුදාමය වාසියක් ලබා ගැනීම සඳහා එල්.ටී.ටී.ඊ. සංවිධානය විසින් වන්නි ප්‍රදේශයේ සිවිල් ජනතාව රඳවාගෙන පාලනය කරනු ලැබූ බව තහවුරු කරනු ලබන මූලාශ්‍ර ගණනාවක් පරණගම කොමිෂන් සභාව විසින් වාර්තා කරනු ලැබේ.[431] සිවිල් ජනතාව ස්ථීර ප්‍රචණ්ඩකාරී තත්ත්වයක් මධ්‍යයේ තබා ගැනීමට එල්.ටී.ටී.ඊ. සංවිධානය විසින් උත්සාහ කරමින් සිටින බව ජාත්‍යන්තර රතු කුරුස සංවිධානයේ දකුණු ආසියාවේ මෙහෙයුම් කටයුතු භාර ප්‍රධානියා වන ජැකියුස් ද මායියෝ විසින් එක්සත් ජනපද නිලධාරීන්ට දැනුම් දෙන ලදි. එල්.ටී.ටී.ඊ. සංවිධානය විසින් සිවිල් ජනතාව "ආරක්ෂාකාරී වස්තුවක්" ලෙස සැලකූ බවත් ඔවුන්ගේ සටන්කරුවන් ඔවුන් අතරට එක් කර තබාගත් බවත් එක්සත් ජනපදයේ රාජතාන්ත්‍රික කේබල් පණිවිඩයක සඳහන් වේ.[432]

546 මානුෂීය කටයුතු පිළිබඳ එක්සත් ජාතීන්ගේ සහකාර මහ ලේකම් සහ හදිසි සහනාධාර සම්බන්ධීකාරක ශ්‍රීමත් ජෝන් හොල්ම්ස් මහතා විසින් එක්සත් ජාතීන්ගේ ආරක්ෂක මණ්ඩලය වෙත දැනුම් දෙන ලද පහත සඳහන් කරුණු නිරීක්ෂණයට ලක් කළ යුතු තවත් මූලාශ්‍රයකි.

" *තම අවි බිම තබන ලෙසත්, සිවිල් ජනතාවට ප්‍රදේශයෙන් ඉවත් වීමට ඉඩ ලබාදෙන ලෙසත් රජය විසින් කරන ලද ඉල්ලීම එල්.ටී.ටී.ඊ. සංවිධානය විසින් අඛණ්ඩව ප්‍රතික්ෂේප කරනු ලබන අතර සුවිශේෂී වශයෙන්ම සිවිල් ජනතාව බලෙන් බඳවා ගැනීම සහ ඔවුන්ගේ ශ්‍රමය බලෙන් ලබා ගැනීම ඉදිරියටත් සිදු කරගෙන ගොස් තිබේ. අවම වශයෙන් එක්සත් ජනපද කාර්ය මණ්ඩල සාමාජිකයන් දෙදෙනෙකු, යැපෙන්නන් තිදෙනෙකු, සහ රාජ්‍ය නොවන සංවිධාන වල කාර්ය මණ්ඩල සාමාජිකයන් එකොළොස් දෙනෙකු මෑත සතිවලදී එල්.ටී.ටී.ඊ. සංවිධානය විසින් බලෙන් බඳවා ගෙන තිබේ.*"[433]

547. ඉහත සඳහන් මූලාශ්‍ර සහ අනිකුත් තොරතුරු මත පදනම්ව පරණගම කොමිෂන් සභාව විසින් එළඹෙන ලද අදහස වූයේ තම හමුදාමය වස්තූන් සිවිල් ජනතාව අතර ස්ථානගත නොකිරීමෙන්

---

[429] පරණගම කොමිෂන් සභා වාර්තාව, 514 ඡේදය

[430] පරණගම කොමිෂන් සභා වාර්තාව, 515 ඡේදය

[431] දරුස්මන් වාර්තාව. ඡේදය 70

[432] පරණගම කොමිෂන් සභා වාර්තාව, 516 ඡේදය

[433] වලිගය අතහැර පිදුරු ගස් අල්ලා ගැනීම; හෝල්ම්ස්ගේ තොරතුරු සම්බන්ධයෙන් ඩයස්පෝරා ක්‍රියාකාරිකයා ටැමිල් නෙට් 2009 මාර්තු 27

සහ මෙහෙයුම් සිදුවන ප්‍රදේශවලින් සිවිල් ජනතාව ඉවත් කිරීමෙන් සිවිල් ජනතාව ආරක්ෂා කිරීම සඳහා තමන් සතු වගකීම එල්.ටී.ටී.ඊ. සංවිධානය විසින් උල්ලංඝනය කරන ලද බව ය. මීට ප්‍රතිවිරුද්ධව යමින් එල්.ටී.ටී.ඊ. සංවිධානය විසින් හිතාමතාම සිවිල් ජනතාව අනතුරට ලක් කරන ලදි.[434]

548 මෙකී උල්ලංඝනය කිරීම් හමුවේ මානුෂිය ආධාර ලබාගන්නා ලද්දේ සිවිල් ජනතාවගේ ප්‍රයෝජනය සඳහා මිස එල්.ටී.ටී.ඊ. සංවිධානය සඳහා නොවන බව තීරණය කිරීම දුෂ්කර බවට පත්කරමින් සටන්කරුවන් සිවිල් ජනතාව සමග මිශ්‍ර වී මානුෂීය ආධාර ලබාදීමේ කාර්යය දැඩි ලෙස සංකීර්ණ භාවයට පත් කරනු ලැබූ බව පරණගම කොමිෂන් සභාව තීරණය කරයි. සිවිල් ජනතාව වෙත ලබාදීමට අදහස් කර තිබූ මානුෂීය ආධාර එක්සත් ජාතීන්ගේ සංවිධානය වෙතින් සහ විවිධ රාජ්‍ය නොවන සංවිධාන වෙතින් එල්.ටී.ටී.ඊ. හමුදාවන් විසින් බලෙන් ලබාගත් සිද්ධීන් පිළිබඳව බොහෝ වාර්තා පළවිය."සේව් ද චිල්ඩ්රන් ආයතනය" විසින් ලබා දෙන ලද බෝට්ටු, සරණාගතයින් සඳහා වන එක්සත් ජාතීන්ගේ මහ කොමසාරිස් කාර්යාලය විසින් ලබාදෙන ලද කූඩාරම්, සහ රාජ්‍ය නොවන සංවිධානවල සහාය ඇතිව ඉදිකරන ලද රෝහලක් එල්.ටී.ටී.ඊ. සංවිධානය විසින් යුධමය කටයුතු සඳහා යොදාගත් බව ලිඛිතව සඳහන් වේ. [435]

549 ලබා දෙන ආධාර, තම හමුදාමය ප්‍රයත්නයන් සඳහා සහ තම බලකායන් නඩත්තු කිරීම සඳහා එල්.ටී.ටී.ඊ. සංවිධානය විසින් භාවිතා කරනු ලබන ප්‍රමාණයට ආධාර යැවීම සීමා කිරීමට ශ්‍රී <u>ලංකා රජයට අවසර ලබාදෙන ලද්දේය</u> යන අදහසට ඉහත සඳහන් කරන ලද කරුණු මත පදනම්ව කොමිෂන් සභාව විසින් එළඹෙන ලදි.[436]

550 ආහාර බෙදාහැරීමේ මධ්‍යස්ථානය ඉලක්ක කරමින් ශ්‍රී ලංකා ගුවන් හමුදාව විසින් ප්‍රහාරයන් සිදුකරන ලද බවට වන චෝදනා[437] සම්බන්ධයෙන් පරණගම කොමිෂන් සභාව විසින් පෙන්වා දෙනු ලබන්නේ" එල්.ටී.ටී.ඊ. සංවිධානය විසින් අභ්‍යන්තරිකව අවතැන් වූ පුද්ගලයන් විශාල කණ්ඩායම් ජීවත් වන ස්ථාන ආසන්නයේ සිට කාලතුවක්කු ප්‍රහාරයන් සිදු කළ බවත්, රෝහල් වැනි සිවිල් කටයුතු සඳහා යොදා ගන්නා ස්ථානවල සිට හෝ අභ්‍යන්තරික අවතැන් වූ පුද්ගලයන් සිටිනා ස්ථානවල සිට වෙඩි තැබීම් සිදුකළ බවත්, එම ස්ථානවල හමුදා උපකරණය ගබඩා කළ බවත්ය.[438] අභ්‍යන්තරිකව අවතැන් වූ පුද්ගලයන්ට ගමනාගමනය කිරීමේ නිදහස ලබාදෙන ලෙසත් අභ්‍යන්තරිකව අවතැන් වූ පුද්ගලයන් එක්රැස්වී සිටින ස්ථානවල සිට හෝ ඒ අවට සිට වෙඩි තැබීම් සිදු නොකරන ලෙසත් එක්සත් ජනපදය විසින් එල්.ටී.ටී.ඊ. සංවිධානය වෙත ප්‍රසිද්ධියේ අවධාරණය කර තිබෙන බව එකල වාර්තා විය.[439]

551 එල්.ටී.ටී.ඊ. සංවිධානය විසින් සිවිල් ජනතාව ජීවත් වන ප්‍රදේශවල සිය අවි ආයුධ ස්ථානගත කිරීම තහවුරු කළ හැකි පැහැදිලි තොරතුරු තමන් සතුව තිබුණේ නම් පමණක් එක්සත් ජනපදය විසින්ම මෙම ස්ථාවරය අනුගමනය කරන්නට ඇති බව පරණගම කොමිෂන් සභාව නිරීක්ෂණය කරයි.

---

[434] පරණගම කොමිෂන් සභා වාර්තාව, 517 ඡේදය

[435] සැකසහිත කැරලිකාර සම්බන්ධතා සම්බන්ධයෙන් ශ්‍රී ලංකාව විසින් ආධාර කණ්ඩායම වෙතින් විමසීම

[436] පරණගම කොමිෂන් සභා වාර්තාව, 519 ඡේදය

[437] දරුස්මන් වාර්තාව,ඡේදය 176(ආ)

[438] දරුස්මන් වාර්තාව,පිටුව iii

[439] ‘ ශ්‍රී ලංකාව : ආරක්ෂිත කලාපය ක්‍රියාත්මක නොවන බව ප්‍රකාශ කෙරේ: ජාත්‍යන්තර රතු කුරුස සංවිධානය සම්පූර්ණයෙන්ම ඉවත් වීම පිළිබඳව සිතා බලයි. කොළඹ තානාපති කාර්යාලය, විකිලීක්ස්, 2009 ජනවාරි 27, 7 වන ඡේදය

එසේ වුවද, ආහාර සඳහා වූ පෝලිම් චේතාන්විතවම ඉලක්ක කිරීම හා අදාළ චෝදනා සම්බන්ධයෙන් පූර්ණ පරීක්ෂණයක් අවශ්‍ය බව පරණගම කොමිෂන් සභාවේ අදහස විය.[440]

552 ඉහත සඳහන් කරුණුවලින් පරණගම කොමිෂන් සභාව විසින් එළඹෙන නිගමනය වනුයේ ඖෂධ හා ආහාර සැපයුම් යුද්ධයේ අවසාන අදියර වලදී සීමිත වූ බව ය. යුද කලාපය තුළ කොටුවී සිටි මිනිසුන් සංඛ්‍යාව පිළිබඳ ව අඩු තක්සේරුවක් තිබූ නමුත් එක්සත් ජාතීන්ගේ සංවිධානය සහ ජාත්‍යන්තර රතු කුරුස සංවිධානය ද එම සංඛ්‍යාව අඩුවෙන් තක්සේරු කළේය යන කරුණ පරණගම කොමිෂන් සභාව ද සලකා බලයි. කෙසේ වුවද, ආහාර හා ඖෂධ අහිමි කිරීම සම්බන්ධයෙන් සමබර විශ්ලේෂණයක් ලබා දීමට ජාත්‍යන්තර රාජ්‍ය නොවන සංවිධාන ද අපොහොසත් වී තිබූ බව පරණගම කොමිෂන් සභාවේ අදහස විය.[441]

553 ආහාර හා ඖෂධ සැපයුම් ප්‍රමාණවත් ලෙස නොතිබීම පිළිබඳ ගැටළුවේ දී පරණගම කොමිෂන් සභාව විසින් තහවුරු කරනු ලබන කාරණය වනුයේ, මෙය ලොව බොහෝ යුද්ධවලට අදාළ කණගාටුදායක කරුණක් වුවද, අවහිර කිරීම යන යුධ ක්‍රමයෙහි හරය කුසගින්නේ තැබීම තුළින් අවහිරයට ලක් කරනු ලබන භූමි ප්‍රදේශය අල්ලා ගැනීම සඳහා වන ප්‍රයත්නයක් තුළ දක්නට ලැබෙන බව ය. ශ්‍රී ලංකා රජයේ චේතනාව ලෙස පෙනී ගියේ කුසගින්නේ තැබීම තුළින් සිවිල් ජනතාව ඝාතනය කිරීම නොව ඒ වෙනුවට යටත් වීම සඳහා එල්.ටී.ටී. ඊ සංවිධානය පෙළඹවීම බව පරණගම කොමිෂන් සභාව දැරූ අදහස විය.[442]

554. සිවිල් ජනතාව පාලනය කරන සහ යම් කිසි ප්‍රහාරයකදී හෝ වැටලීමේ මෙහෙයුමකදී ඊට එරෙහිව කටයුතු කරන්නේ කවර පාර්ශ්වයකයක් ද යන්න සහ එම පාර්ශ්වය ඉවත්කිරීම සම්බන්ධයෙන් පහසුකම් සැපයීමේ බැඳියාවක් ඇති කරන පළමුවන අමතර කෙටුම්පතෙහි 58 වෙනි වගන්තිය ජනාධිපති කොමිෂන් සභාව විසින් උපුටා දක්වයි. මේ සිද්ධියේ දී එය එල්.ටී.ටී.ඊ. සංවිධානය වේ. 'මානව හිමිකම් සඳහා වූ විශ්වවිද්‍යාල ගුරවරු (යාපනය) (ප්‍රධාන වශයෙන්ම යාපනය පදනම් කරගත් ශ්‍රී ලංකා රජය සහ එල්.ටී.ටී.ඊ. සංවිධානය යන දෙකම විවේචනයට ලක් කරන ශාස්ත්‍රඥයින් පිරිසක්) අතරින් එක් පුද්ගලයෙක් ලබා දෙන ලද විස්තරයක් තුළ මෙම පාලනය ක්‍රියාත්මක කළ නිර්දය ආකාරය පිළිබඳ එක් සිද්ධියක් සඳහන් කළ හැකිය.

"[සිවලෝජන්] පැන යාමෙන් පසු එල්.ටී.ටී.ඊ. සංවිධානය විසින් අල්ලා ගන්නා ලදුව ඔහුගේ හදවතට හානියක් නොවන ලෙස පසුපසින් වෙඩි ප්‍රහාරයකට ලක් විය. [...] එල්.ටී.ටී.ඊ. සංවිධානයේ වෛද්‍යවරයෙක් ඔහුව දුටු අතර ඔහුව ගෙන එන ලද සංවිධාන සාමාජිකයන් ගෙන එන ලද වාර්තාව කියවා සිවලෝජන් හට මරණයට පත්වීම සඳහා අතහැර දමා තිබූ රෝගීන් අතර තබන ලදී. [...] රජයේ වෛද්‍යවරයෙකු පසුව ඔහුව දුටු අතර ඔහුව සෝදා ඇඳකට මාරු කර යම් කිසි එන්නතක් වගයක් සහ සේලයින් ලබා දී පසුව රතු කුරුස සංවිධානයේ යාත්‍රාවකට යවන ලෙස උපදෙස් ලබා දී තිබේ. වෙනත් එල්.ටී.ටී.ඊ. වෛද්‍යවරයෙකු පසුව පැමිණ ඔහුගේ වාර්තාවන් දෙස බලා එම වාර්තාවන් මත ඔහුගේ පෑනෙන් සළකුණක් තබා ලෝජන් යනු සටන් කිරීම ප්‍රතික්ෂේප කළ ද්‍රෝහියෙකු බවත් එමනිසා ඔහු ජීවත් වීමට සුදුසු නොවන බවත් නැවත සටහන් කරන ලදී. ඔහුව නැවතත් පණ අදිමින් සිටි රෝගීන් වෙත යවන ලදී. [.....] රතු කුරුස සංවිධානයේ

---

440 - දරුස්මාන් වාර්තාව, ii වන පිටුව, 83,200,202,210 ඡේද, පරණගම කොමිෂන් සභා වාර්තාව, 521 වන ඡේදය

441 පරණගම කොමිෂන් සභා වාර්තාව, 522 ඡේදය

442 පරණගම කොමිෂන් සභා වාර්තාව, 523 ඡේදය

යාත්‍රාවකට ඔහුව යැවීම සඳහා වූ අවසරය අවලංගු කරන ලදී. ප්‍රාතිහාර්යයකින් මෙන් ඔහුගේ දිවි බේරුණ අතර [....] පසුව වවිනියාව රෝහලට ඇතුළත් කරන ලදී."[443]

555. ඉහත කාරණය පැහැදිලි කරගැනීමෙන් පසුව යුධ කළාපයෙන් පිටවිය හැක්කේ කාටද පිටවිය නොහැක්කේ කාටද යන්න තම පුරවැසියන් අතිරේක හානියකට ලක් කරමින්, තීරණය කරන්නේ එල්.ටී.ටී.ඊ. සංවිධානය බවට ජනාධිපති කොමිෂන් සභාව විසින් නිගමනය කරන ලදී. කෙසේ වෙතත් ජනාධිපති කොමිෂන් සභාවේ මතය වන්නේ කොමිෂන් සභාව විසින් තවදුරටත් වැඩිදුර පරීක්ෂණ සිදුකළ යුතු යැයි සඳහන් කර තිබෙන කාරණා සහ විනිශ්චයකාරවරයෙකු මෙහෙයවන පරීක්ෂණ සම්බන්ධයෙන් ශ්‍රී ලංකා රජයේ දායකත්වය වෙනුවෙන් ශ්‍රී ලංකා රජය මෙම පැමිණිල්ලේ මෙම පැතිකඩ භාවිතා කළ යුතු බව ය.[444]

ඊ. ජන සංහාරය

556. ශ්‍රී ලංකාවේ අනුප්‍රාප්තික ආණ්ඩු දෙමළ ජනතාවට එරෙහිව ජන සංහාරයක් සිදු කර තිබෙන බව ප්‍රකාශයට පත් කරමින්, මෙම චෝදනා විමර්ශනය කිරීම සඳහා එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් පිළිබඳ මහ කොමසාරිස්වරයාගේ මැදිහත් වීම අපෙක්ෂා කළ උතුරු පළාත් සභාවේ යෝජනාව ජනාධිපති කොමිසම සිහිපත් කළේ ය.[445] ජන සංහාරය පිළිබඳ චෝදනා මතුවන්නේ යුද්ධයේ අවසාන අදියර තුළ පැවති හැසිරීම තුළ ජන සංහාරයක් සිදුවූ බවට කෙරෙන චෝදනා සහ 1950 වසරේ සිට දෙමළ ජනතාව සංහාරය කිරීමේ ඉලක්කයකට භාජනය වී සිටි බවට වන අනෙකුත් චෝදනා ද පවතින පරිසරයක් තුළ වේ. ජනාධිපති කොමිෂන් සභාව කොමිෂන් සභා වාර්තාවේ තිබෙන කලින් සඳහන් කළ චෝදනාව වෙත පමණක් අවධානය යොමු කරන බව පවසා තිබේ.[446]

557. සාමාන්‍යයන් පිළිගත හැකි ආකාරට ජනසංහාරය යනු නෛතික යෙදුමක් මිස දේශපාලනික යෙදුමක් නොවේ. ඇත්ත වශයෙන්ම ජනසංහාරය පිළිබඳ කෙරෙන චෝදනා තක්සේරු කිරීමේ දී කරුණු පදනම් කරගත් චෝදනා තහවුරු කිරීම අවශ්‍ය වෙනවා පමණක් නොව (මරණ සංඛ්‍යාවද ඇතුළත්ව) ඊට සමානවම ජනසංහාරය කිරීමේ අපරාධයට අදාළ නීතිමය ප්‍රමිතීන් අදාළ වන අකාරය නිසිලෙස වටහා ගෙන යොදාගත යුතු ය.[447]

558. ඒ අවස්ථාව වන විට කිසිදු රාජ්‍ය නොවන සංවිධානයක වාර්තාවක් ශ්‍රී ලංකා රජය "වර්ගවාදී රාජ්‍යක්" ලෙස කෙරෙන සඳහනින් නිදහස් කරමින් දේශීය ලන්දේසි උසාවියකින් දුන් නඩු තීන්දුව හෝ ජනසසංහාරය පිළිබඳ චෝදනා වලට අදාළව පසුගිය යුගොස්ලෝවියානු ගැටුම් තිබූ සන්දර්භය තුළ ජනසංහාරය පිළිබඳ ජාත්‍යන්තර අධිකරණය දුන් නීතිමීමාංසය ආමන්ත්‍රණය කරමින් සඳහනක් කර නොමැති බව ජනාධිපති කොමිෂන් සභාව මතු කර දැක්වී ය.[448]

559. මෙම සිද්ධි සමීපව අධ්‍යනය කිරීමෙන් පෙනී යන්නේ චෝදනා එල්ල කිරීම සඳහා හිතාමතාම ඇතිකර ගන්නා ලද පටු ප්‍රමිතීන් තිබූ බවත් නීති මීමාංසයේ අදහස නියම ලෙස වටහාගන්නේ නම්

---

[443] පරණගම කොමිෂන් සභා වාර්තාව, 524 ඡේදය

[444] පරණගම කොමිෂන් සභා වාර්තාව, 525 ඡේදය

[445] "එක්සත් ජාතීන්ට ශ්‍රී ලංකා රජය විසින් දෙමළ ජනතාව සංහාරය කරන බවට වන උතුරු පළාත් සභාව යෝජනාවක් සම්මත කරයි". ටැමිල් ගාඩියන්, පෙබරවාරි 10,2015

[446] පරණගම කොමිෂන් සභා වාර්තාව, 526 ඡේදය

[447] පරණගම කොමිෂන් සභා වාර්තාව, 527 ඡේදය

[448] පරණගම කොමිෂන් සභා වාර්තාව, 528 ඡේදය

එම නිසා ජනසංහාරය යන පදයේ නොනැසී පැවැත්ම දේශපාලනික වශයෙන් අභිප්‍රේරණය වූ කණ්ඩායම් විසින් දේශපාලනික අවධානය ලබා ගැනීම සඳහා යොදා ගැනීම ප්‍රතික්ෂේප කළ හැකි බවත් ය.[449]

560. අර්බුධයේ අවසාන අදියර තුළ ශ්‍රී ලංකා රජයේ ප්‍රතිපත්ති [අපේක්ෂිත]වරදකරුට යම්කිසි ජාතික, වාර්ගික, ජනවාර්ගි හෝ ආගමික කණ්ඩායමක් [...] සමස්ථයක් වශයෙන් හෝ එහි කොටසක් හෝ විනාශ කිරීමට නිශ්චිත උවමනාවක් තිබූ බවට නෛතික පරීක්ෂාවකින් තහවුරු වී ඇතිය යන අදහස ජනාධිපති කොමිෂන් සභාව ප්‍රතික්ෂේප කරයි. ශ්‍රී ලංකා රජය හෝ ශ්‍රී ලංකා හමුදාව හිතාමතා දෙමළ ජාතිය විනාශ කිරීමේ අරමුණින් දෙමළ සිවිල් ජනතාව ඉලක්ක කළ බවට වන අදහස මේ තත්ත්වය යටතේ ජනාධිපති කොමිෂන් සභාව ප්‍රතික්ෂේප කර තිබේ. ශ්‍රී ලංකා හමුදාව විසින් සිදුකරන ලදැයි කියන කිසිදු අපරාධයක් ජනසංහාරයක් සිදු කළාය කියන තත්ත්වයට ළඟා වී නොමැති බව පවසමින් දකුණු ආසියාවේ ජාත්‍යන්තර රතු කුරුස සංවිධානයේ මෙහෙයුම් භාර ජාක්ස් ඩි මාරියෝ මහතා සඳහන් කරමින් එක්සත් ජනපද තානාපති ක්ලින්ට් විලියම්සන් මහතා වෙත යවන ලද ලද එක්සත් ජනපදයේ රාජ්‍යතාන්ත්‍රික පණිවිඩ හුවමාරුවකදී සඳහන් වී තිබෙන පණිවිඩය තුළින් මෙහි නෛතික තත්ත්වය ට සහායක් ලැබී තිබෙන බව කොමිෂන් සභාව පවසයි.[450]

561. තම සමස්ථ වාර්තාව තුළ ම යාපනය පදනම් කරගත් රාජ්‍ය නොවන සංවිධානයක් වන 'මානව හිමිකම් සඳහා වන විශ්වවිද්‍යාල ගුරුවරු - යාපනය' සංවිධානය මත දැඩි විශ්වාසයක් තබා තිබෙන ජනාධිපති කොමිෂන් සභාව තම මතය සඳහා සාක්ෂි එම වාර්තාව තුළින් ලබා ගැනීමට අපේක්ෂා කරයි; එහි සඳහන් වන ආකාරයට -

"*පෙර ජනගහනය ඇස්තමේන්තු කර තිබෙන්නේ ලක්ෂ තුන සිට තුන්ලක්ෂ පනස් දහස දක්වා වේ. දැනට ලක්ෂ තුනක් පමණ අභ්‍යන්තර අවතැන් වූවන් ලෙස කඳවුරු වල වෙසෙතියි අපේක්ෂා කරයි. සියළු දෙනාම ලියාපදිංචි කර විස්තරාත්මක සොයා බැලීමක් සඳහා තව යම් කාලයක් ගත වනු ඇත. ජන සංහාරයක් පිළිබඳ කිසිදු සාක්ෂියක් හමුවී නැත. එල්.ටී.ටී.ඊ. සංවිධානයේ ප්‍රකෝපකිරීම් වැනි දේ දරාගැනීමට සිදුවූ වෙනත් හමුදාවක් සොයාගැනීමට අපහසු ය. එය ජනසංහාරයක් වෙත යොමු කිරීමට කරන උත්සාහයක් වන අතර එය සමානුපාතිකව අවම හානියක් සිදු කර තිබේ.*'[451]

562. ජනාධිපති කොමිෂන් සභාව සතුව තිබෙන සාක්ෂි සහ යොදාගත හැකි නීතිය පදනම් කරගෙන යුද්ධයේ අවසන් අදියර තුළ ජන සංහාරය නැමැති අපරාධය සිදු කළ බවට හෝ සිදු කරන්නට ඇතැයි යන සඳහන කොමිෂන් සභාව විසින් ප්‍රතික්ෂේප කරන ලදී.[452]

563. විවිධ ආණ්ඩු විසින් සුළුතරය වෙත ආගමික සහ ජාතික වෙනස්කම් මත වෙනස්කොට සැළකීමේ පුරුද්දක් කාලයක පටන් පැවතුණ ද වෙනස් කොට සැළකීම යන කරුණු සඳහා එවන් කණ්ඩායම් ඉලක්ක කොට ගැනීම ජනසංහාරයක යන කාරණය තහවුරු කිරීම සඳහා ප්‍රමාණවත් නොවේ.[453]

---

[449] එම.

[450] පරණගම කොමිෂන් සභා වාර්තාව, දය 529

[451] මානව හිමිකම් සඳහා වන විශ්වවිද්‍යාල ගුරුවරු සංවිධානයේ 32 වෙනි වාර්තාවේ 5 ඡේදයේ බලන්න

[452] පරණගම කොමිෂන් සභා වාර්තාව, වාර්තාවේ 531 ඡේදය ; එක්සත් ජනපදයේ රාජ්‍ය දෙපාර්තමේන්තුවේ වාර්තාවේ 9 වන පිටුව

[453] එම

උ. සාක්ෂිකරුවන් නොමැති යුද්ධය

564. මෙම චෝදනා මතුවන්නේ ශ්‍රී ලංකා ආණ්ඩුව මාධ්‍ය ක්‍රියාත්මක නොවන තත්ත්වයක් තුළ සඟවා තැබිය හැකිය යන අපේක්ෂාවෙන් අපරාධ සිදුකිරීම සඳහා මාධය මර්ධනය කළ බවට වන චෝදනාව තුළ වේ. ජනාධිපති කොමිෂන් සභාව දකින ආකාරයට එවන් සඳහන් කිරීම් නොමග යවන සුළු ඒවා සහ ඒක පාර්ශ්වික වන අතර ශ්‍රී ලංකා රජය මෙන්ම එල්.ටී.ටී.ඊ. සංවිධානය ද මාධ්‍ය වෙත දැඩි සීමා පනවා තිබුණි. එක්සත් ජනපද රාජ්‍ය දෙපාර්තමේන්තුව සඳහන් කරන ආකාරයට:

'ශ්‍රී ලංකා රජය සහ එල්.ටී.ටී.ඊ. සංවිධානය මාධයවලට, විදේශ ආණ්ඩු සහ වෙනත් සංවිධාන වලට අර්බුදය පවතින ප්‍රදේශවලට සීමාවකින් තොරව ඇතුල් වීමේ හැකියාව ලබා දී නොතිබුණි'[454]

565. ජනාධිපති කොමිෂන් සභාවට අනුව සන්නද්ධ අරගලයේ අවසන් මාස කිහිපය තුළ මාධ්‍යවේදීන් ගැටුම්සහිත ප්‍රදේශවලින් ඉවත් කර තැබීමට ශ්‍රී ලංකා හමුදාව ගත් පියවර තක්සේරු කිරීම කළ යුතු වන්නේ මාධ්‍යවේදීන් ආරක්ෂා කිරීමට ජාත්‍යන්තරව සකස් කර තිබෙන ව්‍යවහාරයන් තුළ වන අතර ඔවුන් එම ප්‍රදේශවල සිටීම ඔවුන්ගේ විරුද්ධවාදීන්ට අනවශ්‍ය යුධමය වාසියක් ලබා නොදෙන බව තහවුරු කර ගැනීම තුළ විය යුතු ය. ජනාධිපති කොමිෂන් සභාවට සළකා බැලීමට සිදුවන කාරණය වන්නේ මාධ්‍යවේදීන් ඉවත් කර තැබීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකා රජය දැරූ ස්ථාවරය වෙනත් ගැටුම් සහිත කළාප වල සිදුවන දේ ට වඩා වෙනස් තත්ත්වයක් ද යන්නත් එය සිදුවූයේ යුධ නීති කඩකිරීමේ අරමුණින් පමණක් ද යන්නත් ය.[455]

566. මාධ්‍යවේදීන්ගේ ආරක්ෂාව, යුධමය සහ ජාතික ආරක්ෂක අභිලාෂයන් සහ ගැටුම් පවතින ප්‍රදේශවලට ප්‍රවේශ වීමට තිබෙන අයිතිය ආරක්ෂා කිරීම සඳහා සුදුසු සීමාවන් පැනවිය හැකි බව ජනාධිපති කොමිෂන් සභාවේ අදහස වේ.[456]

567. "එල්.ටී.ටී.ඊ. සංවිධානය භාවිතා කරන ලද ඉතාමත් දියුණු ප්‍රචාරණ යාන්ත්‍රණය සහ අරමුදල් බහුල" තත්ත්වය හමුවේ ශ්‍රී ලංකා හමුදාවට ඔවුන්ට එරෙහිව සටන් කිරීමට තිබූ අපහසුතාව මත සීමා නොකරන ලද ප්‍රවේශයක් ලබා දීමට ශ්‍රී ලංකා රජය දැක්වූ ප්‍රතිරෝධය හේතුවක් විය හැකි බව ජනාධිපති කොමිෂන් සභාව සඳහන් කර තිබේ.[457]

568. ශ්‍රී ලංකාවේ අභ්‍යන්තර අරගලය "සාක්ෂිකරුවන් නොමැති යුද්ධයක්" ලෙස අර්ථ දැක්වීම බී.බී.සී. මාධ්‍යවේදී ෆ්‍රාන්සස් හැරිසන් පැවසූ ආකාරයට සත්‍ය නොවේ. විශේෂයෙන්ම මධ්‍යම රජය වෙනුවෙන් වැඩ කරන ලද කතෝලික පූජකවරු සහ කන්‍යා සොහොයුරියන් 60 ක් ද, දේශීය රාජ්‍ය නොවන සංවිධාන සේවකයන් සහ දෙමළ සිවිල් සේවකයන් 240 ක් ද එම ප්‍රදේශ වල කටයතු කර තිබේ.[458]

569. මාධ්‍යවේදීන් නොමැතිකම යුද්ධයේ නීති හිතාමතා උල්ලංඝනය කරන්නන්නට පහසුවක් ඇති කළ හැකි බව ජනාධිපති කොමිෂන් සභාව පිළිගන්නා අතර ''සාක්ෂිකරුවන් නොමැති යුද්ධය "යන්න මනුෂ්‍යත්වයට එරෙහිව කෙරෙන අපරාධ හෝ ජනසංහාරයක් සැඟවීම සඳහා යොදාගන්නා ලද

---

[454] පරණගම කොමිෂන් සභා වාර්තාව, 532ඡේදය

[455] පරණගම කොමිෂන් සභා වාර්තාව, 533 ඡේදය

[456] පරණගම කොමිෂන් සභා වාර්තාව, 540 ඡේදය

[457] පරණගම කොමිෂන් සභා වාර්තාව, 543 ඡේදය

[458] පරණගම කොමිෂන් සභා වාර්තාව, 534 ඡේදය

රජයේ ප්‍රතිපත්තියක් ලෙස කොමිෂන් සභාව හඳුනා නොගනියි. ශ්‍රී ලංකා හමුදාව විසින් යම් යම් යුධ අපරාධ සිදුකරන්නට ඇතැයි යන කාරණය ජනාධිපති කොමිෂන් සභාවට ප්‍රතික්ෂේප කළ නොහැකි කාරණයක් වන නමුදු ආණ්ඩුවේ සහාය සහිතව සිදුවිය හැකි අපරාධ සැඟවීම අරමුණු කරගෙන ශ්‍රී ලංකා රජය විසින් සකස් කරන ලද දැවැන්ත සැළසුමක කොටසක් ලෙස මාධ්‍යවේදීන් ඉවත් කරන්නට ඇතැයි යන කාරණය පිළිබඳ ජනාධිපති කොමිෂන් සභාව සෑහීමකට පත් නොවේ.[459]

ඌ. සමාප්තිය

570. වැනල් 4 නාලිකාවේ පෙන්වන ලද කාරණා එහි තිබූ රංගමය සහ නාට්‍යමය ඉදිරිපත්කිරීම් සහ සමහර අවස්ථාවල තිබූ අතිශයෝක්ති සහිත භාෂාව රහිතව ගත් විට කෙසේ වෙතත් විනිශ්චයකාරවරයෙකු විභාග කෙරෙන පරීක්ෂණයක් සඳහා සාධාරණීකරණය කිරීමට ප්‍රමාණවත් දේ එහි තිබූ බව ජනාධිපති කොමිෂන් සභාවේ මතය වේ. මෙවැනි අවස්ථාවන් හි දී යුධ අධිකරණ විශ්වසනීයත්වය ඇති කිරීම සඳහා අපක්ෂපාතීව සහ ස්වාධීනව කටයුතු කිරීමේ අඩුවක් තිබිය හැකි බවට ජනාධිපති කොමිෂන් සභාව නිර්දේශ කර තිබේ.[460]

571. *පෙන්වන ලද රූප සත්‍යය* යන තාවකාලික උපකල්පනය මත ජනාධිපති කොමිෂන් සභාව මෙම තොරතුරු සොයාගෙන තිබේ. මෙම තොරතුරු ජනාධිපති කොමිෂන් සභාව විශ්වාස කරන ආකාරයට උගත් පාඩම් සහ ප්‍රතිසන්ධාන කොමිෂන් සභාව මතු කරන ලද කාරණා වලට යම් බරක් ලබා දෙයි. පෙන්වන ලද ජීවිතක්ෂයට පත් කිරීම් සහ මළ සිරුරු යම් යම් අවස්ථාවල මරණයට පත්වූවන් වන අතර ඔවුන් ඝාතනය කළා යැයි යන කාරණය තුළ ඒ සම්බන්ධයෙන් පරීක්ෂණයක් සිදු කළ යුතුය යන කාරණාව මතු කර දක්වයි. එම පරීක්ෂණ තුළින් සියළුම අහිතකර සිදුවීම් එල්.ටී.ටී.ඊ. සංවිධානය විසින් "වේදිකාගත කිරීම සඳහා කළමනාකරණය කරන ලද" බවට දැක්වීමට හෝ එය සිදු කළ යුතු ය.[461]

572. මාධ්‍යකරණය භුක්තිවිඳින අසීමිත නිදහස තුළ වුව ද මෙම පිංතූර ඉවත හළ නොහැකි ය. මෙහි මූලික ගැටළුව වන්නේ වැනල් 4 නාලිකාවේ මාධ්‍යකරණ ප්‍රතිපත්ති නොව, නිසි ලෙස සැළකීමට ලක්විය යුතු පිරිසකට සිදු කරන ලද මරණ සහ අනිසි සැළකීමයි. ශ්‍රී ලංකා හමුදාවේ ගෞරවය අවදානමකට ඇත්ත වශයෙන් ම පාත්‍ර වී තිබෙන අතර මනා වගවීමක් ඉතා වැදගත් හෝ සමාන ලෙස වැදගත් වේ. විකාශය කරන ලද දේවල නිවැරදිභාවය සම්බන්ධ ගැටළුව විසඳීමට යටත් ව ජනාධිපති කොමිෂන් සභාව විසින් නියෝග කරන ලද සහ යොදාගන්නා ලද උගත් පාඩම් සහ ප්‍රතිසන්ධානය පිළිබඳ කොමිෂන් සභාවේ නිර්දේශ සමග එම අදහස් සමාන වේ.[462]

573. *උගත් පාඩම් සහ ප්‍රතිසන්ධාන කොමිෂන් සභා වාර්තාවේ 4.376 ඡේදයේ පහත පරිදි සඳහන් වේ.*

> *"පළමුව, මෙම වීඩියෝ පටවලින් පෙන්වනු ලබන්නේ රඳවාසිටින පුද්ගලයන් කිසිදු නඩුවිභාගයකින් තොරව ජීවිතක්ෂයට පත් කිරීම, හෝ දූෂණයට ලක්වූවායයි කියන පුද්ගලයන් පිළිබඳව නම් ඒවා පැහැදිලිවම නීති විරෝධී ක්‍රියා නිසා ඒ සම්බන්ධයෙන් පරීක්ෂණයක් කොට වැරදිකරුවන්ට දඩුවම් ලබා දීම අවශ්‍ය වේ. එසේම ශ්‍රී ලංකාවේ භෞමික අඛණ්ඩතාව ආරක්ෂා කරන සහ විශේෂයෙන්ම සටනේ දී ඉතාම අමානුෂීය උපක්‍රම භාවිතා කරන පුළුල්*

[459] පරණගම කොමිෂන් සභා වාර්තාව, 545ඡේදය

[460] පරණගම කොමිෂන් සභා වාර්තාව, 546ඡේදය

[461] පරණගම කොමිෂන් සභා වාර්තාව, 547ඡේදය

[462] පරණගම කොමිෂන් සභා වාර්තාව, 548ඡේදය

වශයෙන් හෙළාදැකීමකට පාත්‍රවූ ත්‍රස්ත සංවිධානයක් සමග කරන සටන තුළ තම වගකීම් පිරිසිදුව සහ වෘත්තිමය වශයෙන් ඉටු කරමින් මිය ගිය සෙබළුන්ගේ නම සහ ගෞරවය මෙන්ම වෘත්තීමය කීර්තිය ද ආරක්ෂා කර දීම ආණ්ඩුවේ වගකීම වේ. යම් කිසි වරදක් තිබේනම් එම සුළු වරද කිහිපය තුළ සේවයේ ඉහළ ගුණාත්මක භාවයක් පවත්වාගෙන යන බහුතරයකගේ ගෞරවය කෙළෙසීමට ඉඩ නොතැබිය යුතු ය.'[463]

574. ජනාධිපති කොමිෂන් සභාව සඳහන් කළ ආකාරයට එමගින් කරන විමසීම් වලදී සහාය වීම සඳහා විමර්ශන ඒකකයක් ස්ථාපිත කරන ලෙස ඉල්ලීමක් කිරීම තුළ මෙම ගැටළුව සම්බන්ධයෙන් මෙම ජනාධිපති කොමිෂන් සභාව උගත් පාඩම් සහ ප්‍රතිසන්ධාන කොමිෂන් සභාවට වඩා ඉදිරියට ගොස් තිබේ. ආඥන්න වශයෙන් පත්කර තිබෙන විමර්ශන කණ්ඩායම මෙම වාර්තාවේ 420 ඡේදයේ සඳහන් වන අතර එය ආරම්භ වී කටයුතු ඉදිරියට පවත්වාගෙන යනු ලැබේ.[464]

575. අරගලයේ අවසන් අදියර තුළ ශ්‍රී ලංකාවට එරෙහිව එල්ල වූ මූලික චෝදනා පිළිබඳ පරණගම කොමිෂන් සභා වාර්තාවේ සඳහන් වන දේ ඉහත ද සඳහන් වන අතර එය ඉහත සඳහන් කොමිෂන් සභාවේ දෙවන මෙහෙවර ලෙස සඳහන් වී තිබේ.

576. ජනාධිපති විමර්ශනෙ කොමිෂන් සභාව දැනටමත් නිරීක්ෂණය කර තිබෙන ආකාරයට පරණගම කොමිෂන් සභාව එයට ඉදිරිපත් කර තිබෙන සාක්ෂි පදනම් කරගෙන එහි නිර්දේශ සහ අවසන් නිගමන ඉදිරිපත් කර තිබෙන අතර පරණගම කොමිෂන් සභාව විසින් නිවැරදි සහ වැදගත් යයි සිතන තොරතුරු මූලාශ්‍ර කිහිපයකින් ද තොරතුරු ලබා ගෙන තිබේ.

577. ඉහත විස්තරය අනුව පෙනී යන්නේ පරණගම කොමිෂන් සභාව කරුණු පිළිබඳ විස්තරාත්මක විශ්ලේෂණයක් සිදු කර ඒවා යුධ නීතියේ ප්‍රමිතීන්ට යොදාගෙන තිබෙන බව ය. (යුද්ධයේ සාධාරණත්වය)

578. උගත් පාඩම් සහ ප්‍රතිසන්ධාන කොමිෂන් සභාව සහ පරණගම කොමිෂන් සභාව යන යාන්ත්‍රණ දෙකම ඉදිරියේ ශ්‍රී ලංකා රජය සහ එල්.ටී.ටී.ඊ. සංවිධානය චෝදනා ලැබූ වැරදි සමහරක් අනන්‍ය වන බව ජනාධිපති විමර්ශන කොමිෂන් සභා වාර්තාව පෙන්වා දෙයි. උගත් පාඩම් සහ ප්‍රතිස්න්ධාන කොමිෂන් සභාවේ අවසන් වාර්තාවේ 1 වෙනි කොටසේ 3 පරිච්ඡේදයේ නිර්දේශ ජනාධිපති විමර්ශන කොමිෂන් සභාව සඳහන් කරයි.

579. පරණගම කොමිෂන් සභාව විසින් ඉදිරිපත් කරන ලද නිර්දේශ ජනාධිපති විමර්ශන කොමිෂන් සභාව විසින් පරීක්ෂා කර බැලූ අතර එයින් පැහැදිලි වන්නේ විනිශ්චයකාරවරයෙකුගේ නායකත්වයෙන් යුතු විමර්ශනයක් සහ පරීක්ෂණයක් සිදුකිරීම එම නිර්දේශ ක්‍රියාත්මක කිරීම සඳහා සිදුවිය යුත්තක් බවත් උගත් පාඩම් සහ ප්‍රතිසන්ධාන කොමිෂන් සභාවේ වාර්තාවේ නිර්දේශ ක්‍රියාත්මක නොවී තිබෙන්නේ එම නිසා බවත් වන අතර උගත් පාඩම් සහ ප්‍රතිසන්ධාන කොමිෂන් සභාවේ නිර්දේශ මත යම් ප්‍රගාමී වර්ධනයක් සිදු වී තිබෙන බවද පිළිගත යුතු ය. චැනල් 4 නාලිකාව පිළිබඳ උගත් පාඩම් සහ ප්‍රතිසන්ධාන කොමිෂන් සභාවේ නිර්දේශ වල වෙනත් කොටසක් වන යුධ අධිකරණය පරණගම කොමිෂන් සභාව අනුමත කර නොමැත.

580. මෙම ජනාධිපති විමර්ශන කොමිෂන් සභාව 1 වෙනි කොටසේ 1 වෙනි පරිච්ඡේදයේ උගත් පාඩම් සහ ප්‍රතිසන්ධාන කොමිෂන් සභාව විසින් ඉදිරිපත් කරන ලද නිර්දේශ සාරාංශගත කළ තරමටම මෙම ජනාධිපති කොමිෂන් සභා වාර්තාවේ 8 වෙනි පරිච්ඡේදයේ පරණගම කොමිෂන් සභාව විසින්

[463] පරණගම කොමිෂන් සභා වාර්තාව, 549 ඡේදය

[464]පරණගම කොමිෂන් සභා වාර්තාව, 550 ඡේදය

ඉදිරිපත් කරන ලද වගවීමේ යාන්ත්‍රණය සාකච්ඡා කිරීමෙන් පසු එම පරණගම කොමිෂන් සභාව විසින් ඉදිරිපත් කරන ලද නිර්දේශ පිළිබඳව සංයුක්ත සාරාංශයක් අප විසින් ලබා දෙනු ඇත.

581. උගත් පාඩම් සහ ප්‍රතිසන්ධාන කොමිෂන් සභාව සහ ජනාධිපති කොමිෂන් සභාව යන දෙකෙහිම නිර්දේශ පිළිබඳව මෙම ජනාධිපති විමර්ශන කොමිෂන් සභාව අවබෝධයෙන් සිටින අතර, මෙම ජනාධිපති විමර්ශන කොමිෂන් සභාව දැනටමත් එහි දෙවන අන්තර්වාර වාර්තාවේ එහි යාන්ත්‍රණය පිළිබඳ ප්‍රකාශ කර තිබෙන අතර, මෙම යාන්ත්‍රණයේ සීමාවන් 6 වන පරිච්ඡේදයේ පැහැදිලි කෙරෙන අතර උතුරු හා නැගෙනහිර සිටින ජනතාව සමග අප පවත්වන ලද උද්දේශනයන් සහ 4 වන පරිච්ඡේදයේ සඳහන් වන ආකාරයට ජනාධිපති විමර්ශන කොමිෂන් සභාව ඉදිරිපිට සාක්ෂි දුන් කිහිප දෙනෙකුගේ සාක්ෂි පදනම් කරගෙන පූර්වගාමී කොමිෂන් සභාවල ක්‍රියාත්මක කිරීමට තිබෙන නිර්දේශ ඉදිරියේදී ක්‍රියාත්මක කළ හැකි වන්නේ කෙසේද පිළිබඳ අපගේ නිර්දේශ අපි විසින් සකස් කිරීමට කටයුතු කරනු ලැබේ.

582. ඉහත අපි ක්‍රියාත්මක කිරීමට තිබෙන නිර්දේශ යනුවෙන් අදහස් කරන ලද්දේ පූර්වගාමී කොමිෂන් සභා විසින් ඉදිරිපත් කරන ලද නොසළකා හරින ලද සහ ක්‍රියාත්මක නොකරන ලද නිර්දේශ වන අතර මෙහි අවසන් වාර්තාවේ 5 වන පර්ච්ඡේදයේ ඒ සම්බන්ධව සාකච්ඡා කෙරෙනු ඇත. නමුත් දැනට පෙනෙන පරිදි මෙම ක්‍රියාත්මක නොකරන නිර්දේශ පූර්වගාමී කොමිෂන් සභා දෙකත් සමග පවැත්වූ සාකච්ඡා වලින් මතුවූ කාරණා වන අතර මෙම පරිච්ඡේදයේ I හා II වෙනි කොටස් වල ඒ සම්බන්ධව අවධානය යොමු කර තිබේ. කෙසේ වෙතත් අපි ඉතා ඉක්මනින් පෙන්වා දෙන ආකාරයට උදලාගම කොමිෂන් සභාවේ නිර්දේශ ද මෙම 3 වන පරිච්ඡේදයේ III වෙනි කොටසේ දැක්වෙන ආකාරයට ක්‍රියාත්මක නොකිරීමේ දුෂ්ට ඉරණමට මුහුණ පා තිබෙන අතර ජනාධිපති විමර්ශන කොමිෂන් සභාව විසින් ඒ සම්බන්ධයෙන්ද කටයුතු කරනු ඇත.

583. මෙය සම්පූර්ණ කිරීම අවශ්‍යවන නිසා අපි දැන් පරණගම කොමිෂන් සභාව විසින් ඉදිරිපත් කරන ලද ජනාධිපති කොමිෂන් සභා වාර්තාවේ 8 වැනි පරිච්ඡේදයේ සඳහන් වන වගවීම සම්බන්ධ යාන්ත්‍රණය පිළිබඳ වූ නිර්දේශ වෙත අවධානය යොමු කරමු.

වගවීමේ යාන්ත්‍රණය

584. යුද්ධයේ අවසන් අදියර තුළ තිබූ තොරතුරු සහ ඒ ආශ්‍රිත නීතිය පිළිබඳ දරුස්මාන් වාර්තාවේ තිබෙන විස්තරය ලබාගත් මෙම ජනාධිපති කොමිෂන් සභාව එම විද්වත් මණ්ඩලයේ අදහස් වලින් බැහැර වෙමින් එම විද්වත් මණ්ඩලය සහ විවේචකයන් විසින් කරන ලද විශේෂයෙන් දරුස්මාන් වාර්තාවේ එන ප්‍රකාශයක් වන "විමර්ශන සහ නඩු යනු විකල්ප වශයෙන් තෝරාගත හැකි ඒවා නොවේ යන කාරණය වෙත අවධානය දක්වයි. මෙම විශේෂිත ප්‍රකාශය වැරදි යනුවෙන් විස්තර කරමින් මෙම ජනාධිපති කොමිෂන් සභාව, දරුස්මාන් වාර්තාවේ එන චෝදනාවක් වන "*සත්‍ය කොමිෂන් සභා පැවති බොහෝ රටවල ඒවා අපරාධ නඩු නවත්වා නැති අතර ඒ වෙනුවට එම නඩු ඒවා අනුගමනය කර තිබේ.*" යන කාරණය විසින් ප්‍රශ්න කරයි.

585. විද්වත් මණ්ඩලය විසින් කරන ලද ප්‍රකාශ සැළකිය යුතු රාජ්‍ය ව්‍යවහාරයන් සහ වෙනත් යාන්ත්‍රණයන් ට වඩා, අපරාධ නඩු පැවරීම මත වැඩි බරක් නොතබන, වර්ධනය වෙමින් පවතින ජාත්‍යන්තර ප්‍රමිතීන් අවධානයට ගෙන නොමැති අතර, සාමය ගොඩනැගීමේ සහ වගවීමේ යාන්ත්‍රණය තුළ ඇතිවන සිද්ධි මාලාවේ ඉහළම ප්‍රමුඛතාවක් ලබා දෙන කාරණයක් ලෙස එවන් නඩු පැවරීම් ඉදිරියෙන් තිබෙන බවට අවධාරණය කරයි.

586. වගවීම සහ සහනය ළඟාකරගැනීම සඳහා වන විවිධ යාන්ත්‍රණ පිළිබඳ රාජ්‍ය ව්‍යවහාරයන් සහ බලධාරීන් විසින් කරන ලද ප්‍රකාශ දෙස බැලීමේ දී, වෙනත් සළකා බැලීම් කුමක් වුවත් අපරාධ

නඩු මධ්‍යම සංරචකයක් ලෙස දක්නට නොලැබේ. *සංක්‍රාන්ති යුක්තිය සහ වගවීම සම්බන්ධයෙන් ඕනෑවට වඩා තෝරාගත් සහ පටු සාකච්ඡාවන් සහිත වූවක් ලෙස දරුස්මාන් වාර්තාව දැක්විය හැකි ය.*[465]

587. මෙම ජනාධිපති විමර්ශන කොමිෂන් සභාව මෙම විරුද්ධ මත දෙක ඇගයීමට ලක් කළ අතර සිද්ධි මාලාවන් එක පෙළට සකස් කිරීමෙන් පෙනී යන්නේ සංක්‍රාන්ති යුක්තියේ අරමුණු - සාමය ඇති කිරීම, සහ සන්ධානය ළඟාකර ගැනීම, සහ නීතියේ ආධිපත්‍ය ශක්තිමත් කිරීම යන කාරණා ද ඇතුළුව ළඟා කර ගැනීම සඳහා බහුවිධ ආයතන වල මැදිහත් වීම සහ විවිධ ක්‍රමෝපායන් යොදාගැනීම තුළ වඩා හොඳින් ළඟාකර ගත හැකි බව ය. අපරාධ නඩු ඇසීම සහ සත්‍ය කොමිෂන් සභාව පිහිටුවීම මෙම අරමුණු ළඟා කර ගැනීම සඳහා උපයෝගී වන බවට නිරන්තරයෙන් සළකනු ලැබේ. අපරාධ නඩු විභාග පැවැත්වීම සහ සත්‍ය කොමිෂන් සභාවක් ස්ථාපිත කිරීම මෙම අරමුණ ළඟා කරගැනීමේ දී ඵලදායි වන බව සෑම අවස්ථාකදීම පිළිගන්නා කාරණයකි.[466]

588. සමහර රටවල් තම සංක්‍රාන්ති යුක්ති ක්‍රියාවලිය සත්‍ය කොමිෂන් සභාවක් සමගම ක්‍රියාත්මක කරන අතර තවත් රටවල් චෝදනා ලැබූ වරදකරුවන්ට එරෙහිව නඩු විභාග පැවැත්වීම තෝරාගෙන තිබේ. තවත් සමහර රටවල් මෙම දෙවර්ගයේම ආයතන පිහිටුවා සත්‍ය සෙවීම මෙන්ම අපරාධ නඩු ඇසීම ද එකවර සිදු කරයි. මේ සම්බන්ධනේ අපි 6 වන පරිච්ඡේදයේ දී සළකා බලමු.

589. විශේෂිත අනුක්‍රමික ප්‍රවේශයක් යොදා ගැනීමට ගත් තීරණය, දැඩි වශයෙන් පරිවර්තනයක් සිදුවෙමින් පවතින සමාජයේ, ක්‍රියාකාරී මට්ටමින් පවතින දේශපාලනික, සමාජමය සහ නෛතික සාධක මත තීරණය වන්නක් වන බව මෙම ජනාධිපති විමර්ශන කොමිෂන් සභාවේ මතය වේ.

590. අවසානයේ මෙම ජනාධිපති කොමිෂන් සභාව තම නිර්දේශ ඉතාම විශේෂිතව පරණගම කොමිෂන් සභා වාර්තාවේ 620 වන පරිච්ඡේදයේ පහත පරිදි දක්වා තිබේ.

"*වගවීම යන කාරණය ආමන්ත්‍රණය කිරීමේ දී විශ්වසනීය සත්‍ය සහ ප්‍රතිසන්ධාන කොමිෂන් සභාවක් අත්‍යවශ්‍ය සංචරවකයක් ය යන්න කොමිෂන් සභාවේ අදහස වේ. මෙම කොමිෂන් සභාව දැනටමත් ප්‍රකාශ කර තිබෙන කාරණා දෙස බැලීමේ දී සියළුම අවස්ථාවන්හි දී නඩුපැවරීම යන වගකීම තවම පැහැදිලි ස්ථාවර තත්ත්වයකට ජාත්‍යන්තර ධර්මතා තුළ පත්වී නොමැති අතර ව්‍යවහාරික ජාත්‍යන්තර නීතිය තුළ ද එය කොටසක් බවට පත්වී නොමැත. නඩු පැවරීමක් සිදුවිය යුතුද යන කාරණය ශ්‍රී ලංකා ආණ්ඩුවේ සීමාවන් තුළ තිබෙන කාරණයක් වන අතර එවන් ක්‍රියාවලියක් තුළින් ප්‍රතිසන්ධාන මාවත අවහිර කරන්නේ ද යන කාරණය සළකා බලා පවතින සියළුම සාධක සැළකිල්ලට ගෙන එය සිදු කළ යුතු ය.*"

591. මෙම ජනාධිපති කොමිෂන් සභාවේ ක්‍රියාවලිය තුළ හයිටි සහ දකුණු අප්‍රිකානු තත්ත්වයන් තුළ කැපී පෙනෙන ලක්ෂණයක් වන පොදු සමාව ප්‍රදානය කිරීම සම්බන්ධයෙන් අවධානය යොමු කර තිබේ.

"*සාමය ළඟාකර ගැනීම සඳහා පොදු සමාවක් ලබා දීම වගවීම සහ සහන සැපයීම නොමැති තත්ත්වයකට සමාන ය යන්න පොදු වැරදි වැටහීම කි. හයිටිවල සහ දකුණු අප්‍රිකාවේ සිදුවූ පරිදි ඉහත විස්තර කළ ආකාරයට අඩු ආක්‍රමණශීලී සහ දේශීය හෝ ජාත්‍යන්තර නඩු පැවරීමක් සහිත වගවීමේ යාන්ත්‍රණයට පොදු සමාව එකතු කළ හැකි ය. සාමය සඳහා වන ගනුදෙනුවක දී පොදු*

---

[465] පරණගම කොමිෂන් සභා වාර්තාව, 567 ඡේදය

[466] උදාහරණ ලෙස, ලෝරල් ඊ. ෆ්ලෙචර්, හාර්වී එම් වෙන්ස්ටයින් සහ ජේමි රෝවන්, "සංදර්භය කාල නියමය සහ සංක්‍රාන්ති යුක්තියේ ගතිකය: ඓතිහාසික දෘෂ්ටිකෝණයක්" මානව හිමිකම් තෛමාසිකය, 31 වෙනි වෙළුම, අංක 1 (2009 පෙබරවාරි) පි.167

සමාව දීමක දී හෝ පිටුවහල් කිරීමක දී ඉන් පසු අවස්ථාවන්හිදී අදාළ රජය විසින් වින්දිතයන්ට හෝ පවුල් වල අයට මුදල් වන්දි ගෙවීම් සිදු කිරීම හෝ අපයෝජනයන් ලේඛනගත කිරීම සඳහා සත්‍ය කොමිෂන් සභාවක් පිහිටුවීම හෝ (සමහර අවස්ථාවලදී වැරදිකරුවන් නම් වශයෙන් හඳුනාගැනීම ද) සිදු කරන අතර එවන් වරදකරුවන් මහජන විශ්වාසය තැබිය යුතු තනතුරු වලින් ඉවත් කොට රැකියා තහනම් පැනවීම සහ එම ස්ථාන පවිත්‍රකිරීම වැනි කාරණා සිදු කරයි. අපරාධ නඩු විභාග වල ස්වරූපය මෙන්ම නොවුන ද මෙම යාන්ත්‍රණ තුළ සාධාරණත්වය ඉටු කිරීම තුළින් අපේක්ෂිත කාරණා ඉෂ්ට වීම සිදු වේ. එනම් වැළැක්වීම, නිවර්තනය, දඬුවම් දීම සහ පුනරුත්ථාපනය යන්න යි. ඇත්ත වශයෙන්ම සමහර විද්වතුන් විශ්වාස කරන ආකාරයට මෙවන් යාන්ත්‍රණයන් නඩු පැවරීම ප්‍රායෝගික නොවන අවස්ථාවන්හිදී තිබෙන "දෙවන හොඳම ප්‍රෙව්ශය" නොවුණ ද බොහෝ අවස්ථාවල අපේක්ෂිත සාධාරණත්වය ළඟාකර ගැනීම සඳහා ඒවා වඩාත් යෝග්‍ය වේ."[467]

පරණගම කොමිෂන් සභා වාර්තාවේ නිර්දේශ

592. වගවීමේ යාන්ත්‍රණයන් පිළිබඳව දීර්ඝ ලෙස සාකච්ඡා කළ මෙම ජනාධිපති කොමිෂන් සභාවේ අදහස වූයේ පහත සඳහන් යාන්ත්‍රණයන්ගෙන් ඕනෑම එකක් තනිව හෝ එකට එකතු කර යොදා ගත හැකි බව ය.

i. මානව හිමිකම් උල්ලංඝනය වූ බවට ආණ්ඩුව වෙනුවෙන් සිදුකරන පිළිගැනීම නියෝජනය කිරීම සඳහා වන්දි ගෙවීම.

ii. දකුණු අප්‍රිකානු ආකෘතිය තුළ මෙන්, පොදු සමාවක් ද ඇතුළුව සත්‍ය සහ ප්‍රතිසන්ධාන කොමිෂන් සභාවක් ඇති කිරීම.

iii. පොදු සමාවක් නොමැතිව සත්‍ය සහ ප්‍රතිසන්ධාන කොමිෂන් සභාවක් ඇති කිරීම.

iv. යුධ අපරාධ සහ / හෝ මනුෂ්‍යත්වයට එරෙහිව අපරාධ සිදුකළ බවට හෝ චෝදනා ලබා සිටින සියළු දෙනාට එරෙහිව දේශීය අධිකරණ ක්‍රමයක් තුළ නඩු පැවරීම.

v. යුධ අපරාධ සහ / හෝ මනුෂ්‍යත්වයට එරෙහිව අපරාධ සිදුකළ බවට හෝ චෝදනා ලබා සිටින එහෙත් වැඩි වගකීමක් දරන ලද පුද්ගලයන්ට එරෙහිව දේශීය අධිකරණ ක්‍රමයක් තුළ නඩු පැවරීම.

vi. (v) හි සඳහන් අයට දේශීය අධිකරණ යාන්ත්‍රණයක් තුළ නඩු පැවරීම සහ සියරා ලියෝන් හි දී මෙන් ඒ සමග සත්‍ය සහ ප්‍රතිසන්ධාන කොමිෂන් සභාවක් පිහිටුවීම යන දෙකම සිදු කිරීම.

593. ඉහත නිර්දේශ වල සාරාංශයක් සහ පරණගම කොමිෂන් සභාවේ නිරීක්ෂණ මෙම අවසන් වාර්තාවේ ඇමුණුම් 3 සහ 4 ලෙස දක්වා තිබේ.

උදලාගම කොමිෂන් සභාව

594. 2005 අගෝස්තු 1 වෙනි දිනෙන් පසුව මතුවූ මානව හිමිකම් බරපතල ලෙස උල්ලංඝනය වීම සම්බන්ධ චෝදනා පරීක්ෂා කොට විමර්ශනය කිරීම සඳහා පත් කරන ලද මෙම ජනාධිපති විමර්ශන කොමිෂන් සභාවේ (මින් මතු වරින් වර උදලාගම කොමිෂන් සභාව ලෙස හැඳින්වෙන) වාර්තාව කොමිෂන් සභාව විසින් විමර්ශනය සඳහා ගන්නා ලද සිද්ධීන් හතක තොරතුරු සහ එම

[467] Michael. P. Scharf, "From the eXile Files: An essay on Trading Justice for Peace" 63 Wash & Lee L.Rev. 339 (2006) pp. 346-347, fn 42.

සිද්ධින් විස්තරාත්මකව දක්වයි. උදලාගම කොමිෂන් සභාව සම්බන්ධයෙන් මෙම අවසන් වාර්තාවේ 2 වන පරිච්ඡේදයේ තම නිර්දේශ දක්වමින් මෙම ජනාධිපති විමර්ශන කොමිෂන් සභාව උදලාගම කොමිෂන් සභාවට යොමු කරන ලද සිද්ධීන් 16 ක් පිළිබඳ සඳහන් කරයි. මෙම සිද්ධීන්ට නඩු අංක 2 (ACF සංවිධානයේ සහාය සේවකයින් 17 දෙනෙක් ඝාතනය කිරීම), නඩු අංක 5 (ත්‍රිකුණාමලයේ තරුණයින් 5 දෙනෙක් ඝාතනය කිරීම) දැනට පවතින සංකේතාත්මක නඩු 10 න් දෙකක් ලෙස ප්‍රසිද්ධියට පත්වී තිබෙන මෙම නඩු දෙක ඇතුළත් වේ. 2006 නොවැම්බර් 3 දිනැති උදලාගම කොමිෂන් සභාවට ලබා දී ඇති බලතල අනුව ජාත්‍යන්තර මානව හිමිකම් නීතිය උල්ලංඝනය වීම් සම්බන්ධව විමර්ශනය කිරීම සම්බන්ධයෙන් කිසිදු ඇඟවීමක් දක්නට නොමැති අතර, බලය ලබා දී තිබෙන්නේ ‘‘ස්වාධීන සහ විස්තීරණ පරීක්ෂණයකට’’ සහ ‘‘බරපතල ලෙස මානව හිමිකම් උල්ලංඝනය වූ බවට සඳහන් වන දැනටමත් විමර්ශන පවත්වා තිබෙන එවන් සිද්ධි සම්බන්ධයෙන් කරන ලද විමර්ශනයන්ගේ ප්‍රමාණාත්මක බව සහ යෝග්‍යතාව පරීක්ෂා කිරීම’’ සඳහා වේ.[468]

595. උදලාගම කොමිෂන් සභාවේ වාර්තාව අනුව මෙසේ පවරා තිබෙන සිද්ධි කිහිපයක් නඩු ඇසීමක් දක්වා ගමන් කොට නැත. ජෝශප් පරරාජසිංහම් මහතා ඝාතන සිද්ධියට අදාළව සිද්ධි අංක 4 ගත්විට කාලය පිළිබඳව ඇතිවූ ගැටළු මෙන්ම සාක්ෂිකරුවන් සොයාගැනීමට තිබූ අපහසුතාව නිසා විමර්ශනයක් පවා සිදු කිරීමට නොහැකි වී තිබේ. එසේම සිද්ධි අංක 6 අංක 9, අංක 10, අංක 13, අංක14 සහ අංක 16 යන සිද්ධීන්ට ද ඉහත කාරණාව ම අදාළ වේ.

596. මෙම ජනාධිපති විමර්ශන කොමිෂන් සභාව විසින් උදලාගම කොමිෂන් සභාව විසින් විමර්ශනය කරන ලද "සංකේතාත්මක සිද්ධි’’ දෙකක් සම්බන්ධයෙන් කටයුතු කරනු ඇත. මෙම ජනාධිපති විමර්ශන කොමිෂන් සභාවේ නිරීක්ෂණ මගින් මෙම එක් එක් සිද්ධියට අදාළ කරුණු පිළිබඳ සැකෙවින් විමසා බලනු ලැබේ.

සිද්ධි අංක 2 / මුත්තූර් හි Action Contre La Faim (ACF) සංවිධානය නැමති රාජ්‍ය නොවන සංවිධානයකට අයත් සහන සේවකයන් 17 දෙනෙක් ඝාතනය කිරීම - 2006 අගෝස්තු 4

- මෙම සිද්ධිය වන අවස්ථාවේ ප්‍රංශ රාජ්‍ය නොවන සංවිධානය ත්‍රිකුණාමලය ප්‍රදේශයේ තම කටයුතු සිදු කරමින් සිට තිබේ. ඔවුන්ගේ භූමිකාව වූයේ මසකට රු. 2000 ට වඩා අඩු ආදායම් ලබන පීඩාවට පත්ව සිටින පවුල් වල යහපත වෙනුවෙන් පානීය ජල ව්‍යාපෘති, ආහාර ව්‍යාපෘති, සෞඛ්‍ය සහ වෙනත් යටිතල පහසුකම් ව්‍යාපෘති සහ ස්වයං රැකියා ව්‍යාපෘති වලට ද්‍රව්‍යාත්මක සහාය ලබා දීමයි.

- මුත්තූර් හි (ACF) සංවිධානයේ වැඩ කරමින් සිටි නිරායුධ සිවිල් වැසියන් 17 ක් මුත්තූර් හි එම කාර්යාල පරිශ්‍රය තුළ වෙඩි තබා ඝාතනය කරන ලදී.

597. සෘජුව ම යුද්ධයට සම්බන්ධ නොවුන නිරායුධ සිවිල් වැසියන් ඝාතනය වූ නිසා මෙම කාරණය ජාත්‍යන්තර මානව හිමිකම් නීතිය උල්ලංඝනය වීමට හැකියාව තිබෙන සිද්ධියක් බව මොනවට පැහැදිලි වේ. උදලාගම කොමිෂන් සභාව දක්වන ආකාරයට මෙම මරණයට පත්වූ පුද්ගලයන් යටත් කොට බිම දිගා කරවා මරණ දඩුවම දෙන ආකාරට වෙඩි තබා තිබේ. වෙඩි උණ්ඩ සිරුරු වල දක්නට ලැබුණ ආකාරය සහ සිරුරු වැටී තිබුණ ආකාරය අනුව මෙම නිගමනයට පැමිණ තිබේ.

---

[468] අංක 1471/6 සහ 2006 නොවැම්බර් 13 දිනැති අතිවිශේෂ ගැසට් පත්‍රයේ උදලාගම කොමිෂන් සභාවට ලබා දී ඇති විධි නියෝගය බලන්න.මෙම අවසන් වාර්තාවේ 2 පරිවඡේදය උදලාගම කොමිෂන් සභාවේ මෙහෙවර සහ කාර්යයන් පිළිබඳ විස්තීර්ණ සාකච්ඡාවක් සඳහා බලන්න

598. උදලාගම කොමිෂන් සභාවට අනුව සැසිවාර 100 ක් පමණ පවත්වා සාක්ෂිකරුවන් 80 ක් පමණ විභාග කර තිබේ.

599. ස්වකීය කොමිෂන් සභාව ඉදිරියේ ඉදිරිපත් කරන ලදැයි උදලාගම කොමිෂන් සභාව විස්තර කරන සාක්ෂි කිහිපයක් පහත සඳහන් වේ:

- මෙම මියගිය සේවකයන් සහ ඔවුන්ගේ ඥාතීන් අතර ඇතිවූ කථා බහෙන් පෙනී යන්නේ එම ප්‍රදේශයේ බරපතල ලෙස යුද්ධය පැවති බැවින් ACF සංවිධානයේ දිස්ත්‍රික් කාර්යාලයට දැනුම් දී ඔවුන්ව මුත්තූර් ප්‍රදේශයෙන් ඉවත් කරවා ගැනීම සඳහා යම් පීඩනයක් එල්ල කරන ලෙස පවසා ඇති බව ය.

- ඔවුන් නිවාස තුළ සිටින විටත් මෙම මියගිය බොහෝ පුද්ගලයන් ඔවුන්ගේ ACF සංවිධානයේ නිල ඇඳුම ඇඟලාගෙන සිට තිබේ.

- 2006 අගෝස්තු 04 වෙනි දින ACF සංවිධානයේ නිලධාරීන් මරණයට පත්කළ දිනයේ මුත්තූර් ප්‍රදේශයේ එල්.ටී.ටී.ඊ. සංවිධානය ගැවසුණ බවට සාක්ෂි විශාල ප්‍රමාණයක් තිබේ.

- මෙම අදාළ කාල සීමාව තුළ හමුදා භටයන් මෙම ACF සංවිධානයේ කාර්යාලය අසල නොගැවසුණ බවට සාක්ෂි නොමැති වීම.

- ACF සංවිධානයේ සේවකයන්ට ඉවත් වීමට හැකියාව සහ පහසුකම තිබුණ නමුත් සටන් අවසන් වන තුරු ACF සංවිධානයේ කාර්යාලයේ රැඳී සිටින ලෙසට කොළඹ සහ පැරිසියේ දී ගත් තීරණයන් නිසා එතැනින් ඉවත් වීමෙන් ඔවුන්ව වළක්වා තිබේ.

- ACF සංවිධානය තම සේවකයන්ගේ සුරක්ෂිත බව සහ ආරක්ෂාව පිළිබඳව සළකනවාට වඩා තමන්ගේ සුව පහසුව කල්පනා කර තිබේ.

- ප්‍රධාන විත්තිකරු පූජ්‍ය ස්වර්ණරාජ් පියතුමා (සාක්ෂිකරු) තමා අගොස්තු 4 වෙනි දින පෙ.ව. 08.30 ට ACF සංවිධානයෙ සේවකයන් එම කාර්යාලය තුළ සිටින බව දුටු බවත්, ඔවුන්ගේ මරණය සිදුවන්නට ඇත්තේ 2006 අගෝස්තු 4 වෙනි දින උදය කාලයේ විය හැකි බවත් පැවසී ය.

600. පරණගම කොමිෂන් සභාවේ විශ්වාසය තද බල ලෙස දිනාගත් 'මානව හිමිකම් සඳහා වන විශ්වවිද්‍යාල ගුරුවරු - යාපනය' නැමති සංවිධානය මෙම ACF සංවිධානයේ සිද්ධිය සම්බන්ධයෙන් වාර්තා විශාල සංඛ්‍යාවක් නිකුත් කර තිබේ. කෙසේ වෙතත් උදලාගම කොමිෂන් සභාවට අනුව මෙම කිසිදු වාර්තාවකින් ප්‍රමාණවත් සාක්ෂි අනාවරණය වී නොමැත. තවදුරටත්, උදලාගම කොමිෂන් සභාවට අනුව කොමිෂන් සභාව ඉදිරියේ ලබා දුන් සාක්ෂි වලින් මතුවන ආකාරයට බොහෝ වාර්තා ආරංචි මත පදනම් වී තිබේ.[469] උදලාගම කොමිෂන් සභාව දක්වන අකාරයට 'මානව හිමිකම් සඳහා වන විශ්වවිද්‍යාල ගුරුවරු - යාපනය' සංවිධානයේ එක් වාර්තාවක පහත පරිදි සඳහන් වේ.

'මානව හිමිකම් සඳහා වන විශ්වවිද්‍යාල ගුරුවරු - යාපනය' සංවිධානය *විසින් හඳුනාගන්නා ලද ඇසින් දුටු සාක්ෂි වලින් හෙළිදරව්වන ආකාරයට මෙම ශ්‍රී ලංකා සහන සේවකයින්ව ඝාතනය කරන ලද්දේ මුස්ලිම් ග්‍රාමාරක්ෂක භටයෙක් සහ පොලිස් නිලධාරීන් දෙදෙනෙක් බවත් ශ්‍රී ලංකා*

[469] 2005 අගෝස්තු 1 දින සිට මතුවන බරපතල මානව හිමිකම් උල්ලංඝනය වීම් සම්බන්ධයෙන් වන චෝදනා විමර්ශනය කිරීම සඳහා පත්කරන ලද ජනාධිපති විමර්ශන කොමිෂන් සභා වාර්තාවේ (2009 මැයි) 100 පිටුව බලන්න. (ජාත්‍යන්තර රාජ්‍ය නොවන සංවිධානයක් වන ACF සංවිධානයේ 2006 අගෝස්තු මුළ දී සේවකයන් 17 ක් මරා දැමීම)

නාවික හමුදාවේ විශේෂ බලකාය ඒ අවස්ථාවේ ඒ අසල සිටි බවත් වේලාව 2006 අගෝස්තු 04 සිකුරාදි ප.ව. 4.30 පමණ බවත් සඳහන් කර තිබේ.

601. 'මානව හිමිකම් සඳහා වන විශ්වවිද්‍යාල ගුරුවරු - යාපනය' සංවිධානයේ මෙම ප්‍රකාශනය සළකා බැලීමේ දී උදලාගම කොමිෂන් සභාව තම වාර්තාවේ සඳහන් කරන ආකාරයට සාක්ෂි අනුව බැලීමේ දී ACF සංවිධානයේ කාර්යාලය අවට එම අදාළ කාල සීමාව තුළ එනම් 2006 අගෝස්තු 4 දින උදය, දවල් හෝ හවස් කාලය තුළ කොමාන්ඩෝ භටයන් දක්නට ලැබුණ බව හෙළි නොවන බව සඳහන් වේ. නාවික හමුදාවේ නාවික විශේෂ බලකායක් නොමැත. තවදුරටත්, අධිකරණ වෛද්‍ය සාක්ෂි වලින හෙලිවන ආකාරයට ACF සංවිධානයේ සේවකයන් ඝාතනය කර ඇත්තේ ටී 56 ගිනි අවියකිනි. එල්.ටී.ටී.ඊ. සංවිධානය සහ ආරක්ෂක අංශ එකම ආකාරයේ ගිනි අවි සහ පතරොම් භාවිතා කර තිබේ.

602. උදලාගම කොමිෂන් සභාව පහත සඳහන් දේ සඳහන් කර තිබේ.

"*ග්‍රාමාරක්ෂක ජෙහන්ගීර් ගේ සහෝදරයන් දෙදෙනෙක් එල්.ටී.ටී.ඊ. සංවිධානය විසින් ඝාතනය කර තිබෙන අතර සහෝදරියක් එල්.ටී.ටී.ඊ. සංවිධානය විසින් පැහැරගෙන ගොස් ඇතැයි සැළකේ. තවදුරටත් මෙම සිද්ධියට දවසකට හෝ දෙකකට පෙර ඔහුගේ එක් සහෝදරයෙක් ද මරණයට පත් වී තිබේ. එම නිසා දෙමළ ජනතාව ඝාතනය කිරීම සඳහා ශක්තිමත් අභිප්‍රායක් තිබී ඇත. ජෙහන්ගීර් තමන් සැඟවී සිටි බංකරයෙන් දින හතරක් පමණ කාලයක් ඉවත් නොවූ බව සඳහන් කිරීමෙන් තමන් එම ස්ථානයෙන් ස්වභාවයෙන්ම දුරස්ව සිටි බව දක්වා තිබේ. අවස්ථා කිහිපයකදී ම ජෙහන්ගීර් පොලිස් ස්ථානයෙන් බැහැර වූ බවට සමහර පොලිස් නිලධාරීන් ලබා දුන් සම්ප්‍රකාශ වලින් මෙහි පරස්පරතාවක් පෙන්වයි. කෙසේ වෙතත් ජෙහන්ගීර්ගේ ගමන් බිමන් පිළිබඳ කිසිදු වාර්තාවක් සාක්ෂි වශයෙන් පොලිසිය ඉදිරිපත් කර නැත. එමනිසා මෙම සම්ප්‍රකාශ අනුමානයක් යන සීමාවක් තුළ පැවතිය යුතුය.*"

603. පිටු 115 ක් පුරා දිවෙන වාර්තාවක උදලාගම කොමිෂන් සභාව මෙම ඛේදවාචකයේ වරද එල්.ටී.ටී.ඊ. සංවිධානය මත පටවා ශ්‍රී ලංකා හමුදාව එයින් නිදහස් කොට තිබේ. එසේම උදලාගම කොමිෂන් සභාව විසින් එල්.ටී.ටී.ඊ. සංවිධානයට වගකිම පැවරීම ද අසම්පූර්ණ අවසානයක ස්වභාවයෙන් වාර්තාව අවසානයේ දක්වා ඇති අතර එහිදී පැවසෙන්නේ ඔවුන් මෙම අපරාධය කරන්නට ඇත්තේ යුධ හමුදාවට වරද පැටවීම අරමුණු කරගෙන විය හැකි බව ය. එසේම මෙම සාහසික අපරාධය ජෙහන්ගීර් කරන්නට ඇති බවට වැඩි ඉඩක් තිබෙන බව ද උදලාගමෙ කොමිෂන් සභාව මතුකර දක්වන අතර එයට හේතු වන්නේ තමන්ගේ සහෝදරයන් දෙදෙනෙ ඝාතනය කිරීම සහ තම සහෝදරිය පැහැරගෙන යාම නිසා ජෙහන්ගීර්ට ෆාරුක් සහ කාදර් සමග මෙම අපරාධය කිරීම සඳහා දැඩි අභිප්‍රායක් තිබූ බව ය.[470]

604. උදලාගම කොමිෂන් සභාව විසින් එළඹුණු නිගමනය අවිනිශ්චිත ස්වභාවයක් ගනියි. මෙම අවිනිශ්චිතබව කොමිෂන් සභාව පහත ආකාරයට දක්වා තිබේ.

මෙම අපරාධයට වැරදිකරුවන් කවුද යන්න පිළිබඳ යම් කිසි නිරවද්‍ය නිගමනයකට එළඹීම සඳහා ප්‍රමාණවත් සාක්ෂි නොමැති බව කොමිෂන් සභාවේ ඒකමතික මතය වේ[471].

605. නඩු විභාගය අතර හෙළිවූ නම් කිහිපයක් වන සරූක්, ජෙහන්ගීර් සහ කාදර් වැනි නම් යම් කිසි නිශ්ශබ්ද කුමන්ත්‍රණයක් විය හැකි බව පෙනෙන නිසා මෙම සිද්ධි සම්බන්ධ තවදුරටත් විමර්ශනය කිරීම උදලාගම කොමිෂන් සභාව විසින් නිර්දේශ කර තිබේ. මෙම අපරාධය සම්බන්ධයෙන්

[470] උදලාගම කොමිෂන් සභා වාර්තාව සිද්ධි අංක 2 supra fn 2 පිටුව113

[471] උදලාගම කොමිෂන් සභා වාර්තාව සිද්ධි අංක 2 op.cit 2 පිටුව103

ඔවුන්ගේ භූමිකාව සහ වගකීම සම්පූර්ණයෙන් විමර්ශනය කළ යුතු බව උදලාගම කොමිෂන් සභාවේ මතය වේ.[472]

උදලාගම කොමිෂන් සභාවේ නිර්දේශ

- වින්දිතයන්ගේ සමීපතම ඥාතීන්ට ගෙවන වන්දිය සම්පූර්ණයෙන්ම ප්‍රමාණවත් නොවේ. ACF සංවිධානය මෙම විමර්ශනයට සහභාගි නොවූ නිසා එම මිය ගිය පුද්ගලයන්ගේ ළඟම ඥාතීන්ට ගෙවන ලද වන්දියේ නිශ්චිත ප්‍රමාණය ගැන දැන ගැනීමට කොමිෂන් සභාවට හැකියාවක් නොවීය. වින්දිතයන්ගේ පවුල්වලට අනුව ACF රාජ්‍ය නොවන සංවිධානය එම මිය ගිය එක් පුද්ගලයෙකුට රු. 400,000 බැගින් ගෙවා තිබේ.
- එම වින්දිතයන් ලබා ගත් අවසන් වැටුප ලබා ගත් දින සිට ගණනය කොට ඉදිරි වසර 10 ක වැටුප ඔවුන්ගේ ළඟම ඥාතීන්ට ලබා දෙන ලෙස කොමිෂන් සභාව නිර්දේශ කරයි.
- මානව අයිතිවාසිකම් සහ මානුෂීය නීතිය පිළිබඳ පුහුණුව: හමුදා නිලධාරීන්ට මානව හිමිකම් සහ මානුෂීය නීතිය පිළිබඳ මනා දැනුමක් තිබීම අවශ්‍ය වේ.
- වැඩිදුර විමර්ශන: නඩු විභාගය අතර හෙළිවූ නම් කිහිපයක් වන සරුක්, ජෙහන්ගීර් සහ කාදර් වැනි නම් යම් කිසි නිශ්ශබ්ද කුමන්ත්‍රණයක් විය හැකි බව පෙනෙන නිසා මෙම සිද්ධි සම්බන්ධ තවදුරටත් විමර්ශනය කිරීම උදලාගම කොමිෂන් සභාව විසින් නිර්දේශ කරයි.

606. අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් මෙම ජනාධිපති විමර්ශන කොමිෂන් සභාවට යවන ලද වාර්තාව අනුව මෙම අපරාධය සම්බන්ධ පවත්වන ලද ලඝු නොවන නඩු විභාගය සතුටුදායක ලෙස ඉදිරියට ගොස් නොමැති අතර, එය සිදුවී .තිබෙන්නේ පහත දක්වා තිබෙන පරිදි උගත් පාඩම් සහ ප්‍රතිසන්ධාන කොමිෂන් සභාවේ දැඩි නිර්දේශයක් තිබියදී වේ.

"විශේෂයෙන්ම ජනවාරි මස ත්‍රිකුණාමලය ප්‍රදේශයේ ශිෂ්‍යන් 5 දෙනෙක් ඝාතනය කිරීම සහ 2006 අගෝස්තු මාසයේ දී ACF සංවිධානයේ සේවකයන් 17 දෙනෙක් ඝාතනය කිරීමට අදාළ චූදිතයන් පිළිබඳ වැඩිදුර විමර්ශන සහ නඩු කටයුතු සිදු කිරීම ද ඇතුළත්ව "2005 අගෝස්තු මස සිට මතුවන ලද බරපතල මානව හිමිකම් උල්ලංඝනය වීම පිළිබඳ චෝදනා පිළිබඳ විමර්ශනය කොට පරීක්ෂා කිරීම සඳහා පත්කරන ලද ජනාධිපති විමර්ශන කොමිෂන් සභාවේ (උදලාගම කොමිෂන් සභාවේ) නිර්දේශ ක්‍රියාත්මක කරන ලෙස කොමිෂන් සභාව (උගත් පාඩම් සහ ප්‍රතිසන්ධාන කොමිෂන් සභාව) දැඩි ලෙස නිර්දේශ කරයි. මෙවන් ක්‍රියාමාර්ග නීතියේ ආධිපත්‍යට ගරු කිරීම සම්බන්ධයෙන් ශක්තිමත් සංඥාවක් ලබා දෙන අතර එය අනෙක් අතට සුවපත්ව කිරීමේ ක්‍රියාවලියට ද දායකත්වයක් සපය යි."[473]

607. ACF සංවිධානයේ කාර්ය මණ්ඩලය විවාදාත්මකව වුවද ජිනීවා ප්‍රඥප්තිය යටතේ ''ආරක්ෂා කරන ලද පුද්ගලයන්"යන නිර්වචනය යටතට පැමිණෙයි. මෙහිදී තුවාල ලැබූ සහ අසනීපවූවන්ට සහාය ලබා දෙන අය සහ මානුෂීය සේවා සපයන්නන් ආරක්ෂා කිරීම පිළිබඳ දක්වා තිබෙන I වෙනි ජිනීවා ප්‍රඥප්තියෙහි 9 වන වගන්තිය උල්ලංඝනය කිරීමක් දැකිය හැකිය. සාක්ෂි වලින් පෙනී යන ආකාරයට ඔවුන්ගේ කාර්යයයේ ස්වභාවය වූයේ පීඩාවට පත්ව සිටින පවුල් වල යහපත වෙනුවෙන් පානීය ජල ව්‍යාපෘති, ආහාර ව්‍යාපෘති, සෞඛ්‍ය සහ වෙනත් යටිතල පහසුකම් ව්‍යාපෘති සහ ස්වයං රැකියා ව්‍යාපෘති වලට ද්‍රව්‍යාත්මක සහාය ලබා දීමයි.

---

[472] උදලාගම කොමිෂන් සභා වාර්තාව සිද්ධි අංක 2 op.cit 2 පිටුව 114

[473] උගත් පාඩම් සහ ප්‍රතිසන්ධාන කොමිෂන් සභාව ඡේදය 5, 163 සහ 9.120

මෙම ජනාධිපති විමර්ශන කොමිෂන් සභාවේ නිර්දේශ

608. ACF සංවිධිනය සම්බන්ධ සිද්ධිය තවදුරටත් විමර්ශනය කිරීමේ අවශ්‍යතාව සහ සහන සේවකයන් 17 දෙනෙක් ඝාතනය කිරීම සම්බන්ධයෙන් වූ ලඝු නොවන නඩු විභාගයේ අසතුටුදායක ප්‍රගතිය පිළිබඳ උදලාගම කොමිෂන් සභාවේ සහ උගත් පාඩම් සහ ප්‍රතිසන්ධානය පිළිබඳ කොමිෂන් සභාවේ වාර්තාව සහ නිර්දේශ සළකා බැලූ මෙම මෙම ජනාධිපති විමර්ශන කොමිෂන් සභාව, ශ්‍රී ලංකාව වහාම ස්ථාපනය කිරීමට අපේක්ෂා කරන සත්‍ය සහ ප්‍රතිසන්ධාන කොමිෂන් සභාව විසින් මේවා වහා විමර්ශනය කර ACF සංවිධානයේ සිද්ධිය සම්බන්ධ කරුණු සෙවීමේ පරීක්ෂණයක් එම කොමිෂන් සභාවේ ප්‍රමුඛතාව දිය යුතු සිද්ධින්හි එකක් ලෙස සළකා වැරදි කරුවන්ට දඩුවම් දීම සඳහා ඉක්මනින් සිදුකළ යුතු කාර්යයක් ලෙස සිදු කළ යුතු බවට නිර්දේශ කරයි.[474]

609. ACF සංවිධානයේ සිද්ධිය සම්බන්ධයෙන් සාක්ෂි දිය යුතු සාක්ෂිකරුවන් සමහරෙක් විදේශගතව සිටිය හැකි අතර 2023 අංක 10 දරන අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීමේ සහ සහාය දීමේ පනතේ සහාය සහිතව උසාවියක් පමණක් නොව සත්‍ය සහ ප්‍රතිසන්ධාන කොමිෂන් සභාවත් ඇතුළුව කොමිෂන් සභාවක් විසින් සාක්ෂිකරුවන්ගේ සාක්ෂි හුදකලා ස්ථානයකදී ලබා ගැනීමට කටයුතු කළ හැකිය.[475]

610. "2015 අංක 4 දරන අපරාධයක් වින්දිතයන් සහ සාක්ෂිකරුවන් හට සහාය දීමේ සහ ආරක්ෂා කිරීමේ පනත" සම්මත වීමත් සමග සාක්ෂිකරුවන්ට ශ්‍රව්‍ය දෘශ්‍ය සබැඳියක් හරහා සම්බන්ධ වෙමින් සාක්ෂි ලබා දීමට අවස්ථාව ලබා දීම නිසා සාක්ෂිකරුවන්ට හුදකලා ස්ථානයක සිට සාක්ෂි ලබා දීමේ අවස්ථාව ලැබී තිබේ. මෙම පනතේ 31(3) වගන්තිය යටතේ අපරාධයක වින්දිතයන් හෝ සාක්ෂිකරුවන් වෙතින් හුදකලා ස්ථානයක සිට සාක්ෂි හෝ ප්‍රකාශ ලබා ගැනීම හෝ පටිගත කිරීම ආරම්භ කිරීමට පෙර අදාළ මෙම ජනාධිපති කොමිෂන් සභාව හෝ නීතිය ක්‍රියාත්මක කරන අධිකාරිය නීතිපතිවරයාගේ සහ අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම් වරයාගේ (එහි සඳහන් වන ආකාරයට) නිර්දේශ මත 32 වෙනි වගන්තියේ ප්‍රතිපාදන වලට යටත්ව අධිකාරිය වෙතින් අදාළ ශ්‍රව්‍ය - දෘශ්‍ය සබැඳිය ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය වන මූල්‍ය සහ අනෙකුත් සම්පත් ලබාගත යුතු ය.

611. උදාහරණයක් වශයෙන් නීතිපතිවරයා සහ අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා පහත කාරණා නිරදේශ කරයි නම්:

(i) අපරාධයක වින්දිතයන් හෝ සාක්ෂිකරුවන්ගෙන් හුදකලා ස්ථානයක සිට සාක්ෂි හෝ ප්‍රකාශයක් ලබා ගැනීම ජාතික ආරක්ෂාවත් ඇතුළත්ව ජාතික අභිලාෂය තුළ නොපවතියි;

(ii) 31 වගන්තියේ 1 වෙනි උප වගන්තියේ හඳුනාගෙන තිබෙන ආකාරයට හුදකලා ස්ථානයක සිට අදාළ අපරාධයක වින්දිතයන් හෝ සාක්ෂිකරුවන් වෙතින් සාක්ෂි හෝ ප්‍රකාශ ලබා ගැනීම පහසුවෙන් කළ නොහැකි අතර, නීතිපතිවරයා තම මතය උසාවියට, කොමිෂන් සභාවට හෝ නීතිය බලාත්මක කරන අදාළ අධිකාරිය වෙත දැනුම් දිය යුතු ය.

(2) (අ) අපරාධයක යම් කිසි වින්දිතයෙකුගෙන් හෝ සාක්ෂිකරුවෙකුගෙන් යම් කිසි හුදකලා ස්ථානයක සිට සාක්ෂි පටිගත කිරීම හෝ ප්‍රකාශයක් ලබා ගැනීම අයෝග්‍ය බවට නීතිපතිවරයා මතයක් ප්‍රකාශ කරන්නේ නම් උසාවිය, කොමිෂන් සභාව හෝ නීතිය

---

[474] ජනාධිපති විමර්ශන කොමිෂන් සභාවේ අවසන් වාර්තාවේ 6 වන පරිච්ඡේදය බලන්න

[475] 2023 අංක 10 දරන අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන් හට සහාය දීමේ සහ ආරක්ෂා කිරීමේ පනතේ 40 කොටසේ (1) c සහ (h), 82(1),(2)(a) සහ (b) සහ 82(3)

ක්‍රියාත්මක කරන අදාළ අධිකාරිය විසින් එවන් භූදකලා ස්ථානයක සිට සමකාලීන ශ්‍රව්‍ය දෘෂ්‍ය සබැඳියක් හරහා අපරාධයක විත්දිතයන් සහ සාක්ෂිකරුවන්ගෙන් සාක්ෂි හෝ ප්‍රකාශ ලබා ගැනීම හෝ පටිගත කිරීම නොකළ යුතු අතර ඒ සමගම එම අධිකාරියට අවශ්‍ය සහාය සහ මූල්‍ය හෝ වෙනත් සම්පත් 31 වෙනි වගන්තිය සහ (3) වෙනි උපවගන්තිය යටතේ උසාවියට, කොමිෂන් සභාවට හෝ නීතිය ක්‍රියාත්මක කරන අධිකාරියට ලබා දීම අවශ්‍ය නොවේ."

612. මෙය 2023 අංක 10 දරන අපරාධයක විත්දිතයන් සහ සාක්ෂිකරුවන් හට සහාය දීමේ ආරක්ෂා කිරීමේ පනතේ 82(4) වගන්තිය සමග පරස්පරව බැලිය යුතු ය. එම විධිවිධානයේ පහත පරිදි සඳහන් වේ;

82 (4) වෙනි වගන්තිය අවස්ථෝචිත පරිදි යම් කිසි වාර්තාවක් හෝ යම්කිසි සාක්ෂියක් හෝ ප්‍රකාශයක් සිදු කිරීමට හෝ උප වගන්ති (2) හෝ (3) යටතේ යම් කිසි පටිගත කිරීමක් යම්කිසි සාක්ෂියක් හෝ ප්‍රකාශයක් ලබා ගැනීමට උසාවිය හෝ කොමිෂන් සභාව අවසර ලබා දුන් අවස්ථාවක අධිකාරිය එවන් උසාවියක හෝ කොමිෂන් සභාවක ඉල්ලීම මත හැකි උපරිම තත්ත්වයෙන් ඵලදායී සබැඳියක් ස්ථාපිත කිරීම සඳහා පවතින සම්පත් මත අවශ්‍ය වන ආකාරයට මූල්‍ය සහ වෙනත් සම්පත් ලබා දීම තහවුරු කළ යුතුය.

613. මෙය සාක්ෂිකරුවන්ගේ සහ විත්දිතයන්ගේ අයිතිවාසිකම් පිළිබඳ දියුණුවක් වන අතර ම එමගින් උසාවියකට හෝ කොමිෂන් සභාවකට ශ්‍රව්‍ය දෘශ්‍ය සබැඳියක් මගින් සාක්ෂි ලබා ගැනීම සඳහා ඉල්ලීම ලබා දීමට අධිකාරියට බලයක් ලබා දෙයි. නීතිපතිවරයාගේ සහ අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම් වරයාගේ මැදිහත් වීම අත්හැරීම තුළ එවන් සාක්ෂි සඳහා සෘජු පහසුකම් සැපයීම දිරිමත් කර තිබේ.

614. මෙය උදලාගම කොමිෂන් සභාව විසින් අත්‍යවශ්‍ය යයි නිර්දේශ කර දැනට නීතිය තුළට ප්‍රතිලාභී ආකාරයට ඇතුළත් කරගත් දෙයකි. සිහිකළ යුතු කාරණය වන්නේ සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීමේ යාන්ත්‍රණයට උදලාගම කොමිෂන් සභාව දැඩි නිර්දේශ ඉදිරිපත් කළ බවත් මෙම නිර්දේශ ක්‍රියාත්මක කර තිබෙන බවත් පැවසිය හැකිය.

615. මෙතෙක් කල් කිසිදු වැරදිකරුවෙකුට දඩුවම් ලබා දීමට නොහැකි වීම කණගාටුවට කරුණක් වන අතර මෙම සිද්ධිය පුවත්පත් වල ශීර්ෂපාඨ අතර සුලභ වීම තුළ අනාගතයේ දී සත්‍ය සහ ප්‍රතිසන්ධාන කොමිෂන් සභාවක් විසින් මෙම කාරණයට ප්‍රමුඛතාව ලබා දී වැරදිකරුවන්ට නිසි දඩුවම් ලබා දෙන තෙක් දීර්ඝ කාලයක් බලා සිටි විත්දිතයන්ට විශ්වසනීය සත්‍ය සෙවීමේ සාධාරණයක් නොවීමේ කාරණය තුළින් මතුවී තිබෙන අප්‍රසන්න තත්ත්වය සමනය කිරීමට කටයුතු කරනු ඇතැයි යන්න උදක්ම අපේක්ෂා කෙරේ.[476]

සිද්ධි අංක 5 - 2006 ජනවාරි 2 වෙනි දින තරුණයන් 5 දෙනෙක් මරා දැමීම (ට්‍රින්කො 5)

616. මෙම සිද්ධිය ද ශ්‍රී ලංකාවේ දැඩි අවධානයට ලක් වූ ‘‘සංකේතාත්මක සිද්ධියකි.’’ මෙම සිද්ධියේ දී දෙමළ ශිෂ්‍යාන් අවාසනාවන්ත ලෙස මිය ගොස් වසර 18 ක් ගත වුණද මෙම සිද්ධිය සම්බන්ධ යුක්තිය පසිඳලීම නිසි ලෙස සිදුවී නොමැති බව සියළුම පැතිවලින් ඇතිවූ හෙලා දැකීම් වලින් පැහැදිලි වේ. උදලාගම කොමිෂන් සභාවේ වාර්තා වී තිබෙන තොරතුරු මෙසේ සාරාංශකළ හැකිය.

---

[476] බලන්න”Palmyrah Fallen from Rajani to Wars End” Rajan Hoole පිටු 195,200,237.280.291.319.414.437-447,456,459 සහ මෙම කාරණය සම්බන්ධයෙන් සටහන් ලෙස අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව ජනාධිපති විමර්ශන කොමිෂන් සභාවට ලබා දුන් විමර්ශන අංක CR1/185/2006.

- 2006 ජනවාරි 2 දින දෙමළ ශිෂ්‍යාන් පස් දෙනෙකුගෙන් යුත් කණ්ඩායමක් එක් වී ගාන්ධි ප්‍රතිමාව අසල (ත්‍රිකුණාමලයේ කැපී පෙනෙන ස්ථානයකි) මුහුදු තීරයට මුහුණ ලා සාකච්ඡාවක යෙදී සිට තිබේ. කිහිප දෙනෙක් ඔවුන් සාමාන්‍යයෙන් කරන පරිදි කාලි කෝවිලට ගොස් කොටුවට යන මාර්ගය ආරම්භයේ කොන්ක්‍රීට් ලෑල්ලක් උඩ පාර අනෙක් පස තිබෙන මුහුදු වෙරළට මුහුණ ලා ගාන්ධි ප්‍රතිමාවට පිටුපා සුළු ආහාර සහ පැණි බීම පානය කරමින් සිට තිබේ.

- ප.ව. 7.30 ට පමණ කොළ පැහැති ත්‍රි රෝද රථයක් පැමිණ ගාන්ධි ප්‍රතිමාවට බැහැරින් මුහුදු තීරයට මුහුණලා සිටි මෙම තරුණයන් වෙත අත් බෝම්බයක් විසි කර තිබේ. මිනිත්තු 5 -10 ට පමණ පසු වෙඩි හඬ ඇසී තිබේ.

- මෙම අපරාධය සිදුවූ ස්ථානයේ මීටර 750 කට පමණ එපිටින් පිහිටි මාර්ග බාධකයක විශේෂ කාර්ය බලකායේ සෙබළු රාජකාරියේ යෙදී සිට තිබේ.

- වයස 20 ක් පමණ වූ දෙමළ ශිෂ්‍යාන් 5 දෙනාම ත්‍රිකුණාමලය මහ රෝහලට ඇතුළත් කරන අවස්ථාවේ මිය ගොස් සිටි අතර දෙදෙනෙක් බරපතල තුවාල ලබා සිටිය හ.

පශ්චාත් මරණ පරීක්ෂණය[477]

- පශ්චාත් මරණ පරීක්ෂණය පවත්වා වාර්තාවක් ලබා දෙන ලෙස 2006 ජනවාරි 3 දින කොළඹ මහ රෝහලේ වෛද්‍ය අධිකාරිවරයාට මහේස්ත්‍රාත්වරයා උපදෙස් දී තිබුණි. පශ්චාත් මරණ පරීක්ෂණය අධිකරණ වෛද්‍ය නිලධාරි වෛද්‍ය ඊ. එම්. ජී. වෛද්‍යරත්න මහතා විසින් පවත්වන ලදී.

- පසුදින පවත්වන ලද මරණ පරීක්ෂණයේ දී මැරුණ සහ තුවාල වූ අයගේ සිරුරු වල ගිනිඅවි වලින් ඇතිවූ තුවාල මෙන්ම බෝම්බයක් පිපිරීමේදී ඇතිවූ තුවාලද දක්නට තිබූ බව අධිකරණ වෛද්‍ය නිළධාරිවරයා තහවුරු කර තිබේ. තරුණයන් 7 දෙනා අතරින් සියළු දෙනා තුළ ගිනි අවි නිසා ඇතිවූ තුවාල තිබූ අතර 6 දෙනෙක් තුළ ඊට අමතරව බෝම්බ පිපිරීමකින් විසිවූ කැබලි වැදීමෙන් ඇතුවූ තුවාල සහ දෙදෙනෙක් තුළ සීරීම් තුවාල තිබුණි.

- තරුණයන් 5 දෙනාගේ මරණයට හේතුව අධිකරණ වෛද්‍ය නිලධාරියා විසින් 2006 ජනවාරි 3 දින පහත පරිදි තීරණය කර තිබේ.
    - මනෝහර් රාජ්හීර් - ගිනිඅවියකින් සිදුවූ තුවාලය නිසා මොළයට දැඩි හානි සිදුවීම
    - ෂන්මුගරාජා සජේන්ද්‍රන් - දකුණු පෙනහළුවට, මුත්‍රාශයට සහ කුඩා බඩවැලට සිදුවූ දරුණු හානි සහ ගිනිඅවියෙන් සිදුවූ තුවාල
    - ලෝහිතදාසන් රෝෂාන් - අක්මාවට සහ දකුණු වකුගඩුවට දැඩිහානී වීම සහ ගිනි අවි වලින් ඇතිවූ තුවාල
    - තංගදොරෙයි සිවනාදන් - ගිනි අවි වලින් ඇතිවූ තුවාල නිසා මොළයට දැඩි හානි සිදුවීම
    - යෝජරාජා හේමචන්ද්‍රන් - ගිනි අවිවලින් ඇතිවූ තුවාල නිසා මොළයට දැඩි හානි සිදුවීම

617. විවිධ ආයතන විසින් වින්දිතයන්ට සිදුවූ දේ පිළිබඳව ලබා දෙන ලද විවිධ පැහැදිලි කිරීම් තුළින් වින්දිතයන්ගේ මරණය, තුවාල සිදුවීම සහ ශාරීරික හානි සිදුවීම් වලට යොමු වූ හේතූන් මොනවා ද

[477] උදලාගම කොමිෂන් සභාව 11 කොටස පිටුව 4

යන්න උදලාගම කොමිෂන් සභාව පැහැදිලි කරයි.[478] පහත සඳහන් ඡේද උදලාගම කොමිෂන් සභාවෙන් ගත් පදානුගත විස්තරයක් වේ.

- බී.බී.සී. වාර්තා අනුව;

  ප්‍රහාරයෙන් දිවි ගලවාගත් දෙදෙනෙක් පැවසූ ආකාරයට යුධ හමුදා ඇඳුමෙන් සැරසුන පිරිසක් මෙම පිරිසට අත් බෝම්බයකින් පහර දී ට්‍රක් රථයකට ඇද දමා වෙඩි තබා තිබේ. මෙම මරණයන් මරණ දණ්ඩනය ලබා දීමක් වැනි විය. "පස් දෙනාගේම හිසට වෙඩි තබා තිබුණි" යැයි ප්‍රකාශකයෙක් පැවසුවේය. ප්‍රහාරයෙන් දිවි බේරාගත් ශිෂ්‍යාන් දෙදෙනෙකුට ප්‍රහාරකයන්ගේ අනන්‍යතාව තහවුරු කිරීමට නොහැකි විය. මරණ සම්බන්ධයෙන් පොලිසිය පරීක්ෂණයක් කරන බව පවසමින් පරීක්ෂණයක් කිරීම යුධ හමුදාව විසින් බැහැර කළේ ය. යුධ හමුදාවේ වෙබ් අඩවියේ තිබූ ප්‍රකාශයකින් සඳහන් වන්නේ තරුණයන් අත තිබූ අත් බෝම්බයක් පුපුරා යාම නිසා මෙය සිදු වූ බව ය. එමගින් ඔවුන් ආරක්ෂක අංශ වලට පහර දීමට කුමන්ත්‍රණය කරමින් සිටි බවට චෝදනා කර තිබේ.

- දෙමළ කොටි සටන් කරුවන් මෙසේ පවසා තිබේ;

  ශ්‍රී ලංකා හමුදාවේ විශේෂ බලකාය තරුණයන් ඝාතනය කර තිබේ. උතුරු හා නැගෙනහිර ප්‍රදේශයේ හමුදා භටයන් 40 කට වඩා ප්‍රමාණයක් මිය ගිය හමුදාව වෙත එල්ල කරන ලද ප්‍රහාර මාලාවකට පසු මෙම ප්‍රචණ්ඩත්වය ඇතිවී තිබේ. ප්‍රහාරය සම්බන්ධයෙන් ශ්‍රී ලංකා රජය දෙමළ කොටින්ට චෝදනා කරයි. පාර්ශ්ව දෙක අතර සටන් විරාමයද දැඩි පීඩනයන් යටතේ පැවතුණි. ජීවිත 64.000 ට වැඩි ප්‍රමාණයක් බිලිගත් දශක දෙකක් පුරා පැවති සන්නද්ධ අරගලය තුළ සටන් විරාමයකට එළඹී වසර හතරකට පසු ඇතිවූ දරුණුතම ප්‍රචණ්ඩත්වය මෙය වේ. කොටින්ට උතුරු සහ නැගෙනහිර සිටින දෙමළ සුළු ජාතිකයන්ට ස්වයං පාලනයක් අවශ්‍ය විය.

- දේශීය පුවත්පත්වල තිබූ මුල් වාර්තා මෙසේ පවසා තිබේ;

  මරණ සිදු වූයේ බෝම්බ පිපිරීමක් නිසා යයි සඳහන් වුවත් පසුව පැමිණි වාර්තා සඳහන් කළ ආකාරයට පශ්චාත් මරණ පරීක්ෂණයේදී ඔප්පු වී තිබූ ආකාරයට මරණ සිදුවී තිබුණේ ගිනිඅවි හේතුවෙන් ඇති වූ තුවාල නිසා වේ.

- 2006 ජනවාරි 4 දින ප්‍රකාශයට පත්කර තිබූ 'මෝර්නිං ලීඩර්' පුවත්පතේ මෙසේ පවසා තිබේ;

  හමුදා ආරංචිමාර්ග වලින් සඳහන් වූ ආකාරයට අත් බෝම්බය ගෙන ආ පිරිස අතර එය හදිසියේ ඔවුන් අතර පුපුරා ගොස් තිබේ.

  කෙසේ වෙතත්, ත්‍රිකුණාමලයේ අධිකරණ වෛද්‍ය නිලධාරී, ගාමිණී ගුණතුංග මහතා සඳුදා සොයාගත් ආකාරයට මෙම ශිෂ්‍යාන්ගේ සිරුරේ ගිනි අවිවලින් එල්ල වූ ප්‍රහාර නිසා ඇතිවූ තුවාල තිබූ බවත් එමනිසා මෙය මනුෂ්‍ය ඝාතන සිද්ධියක් බවට පත් වී තිබේ. ඒ අතර එල්.ටී.ටී.ඊ. සංවිධානය ඊයේ ප්‍රකාශ කළ ආකරයට මෙම තරුණයන්ට බිම දිගාවීමට සලස්වා වෙඩිකරුවන් විසින් කණ හරහා වෙඩි තබා තිබේ. මෙම තුවක්කුකරුවන් විශේෂ කාර්ය බලකායේ සාමාජිකයන් බව එල්.ටී.ටී.ඊ. සංවිධානය ප්‍රකාශ කරයි. මෑතකදී විශේෂ කාර්ය බලකායේ භට කණ්ඩායමක් ත්‍රිකුණාමලයට අනුයුක්ත කොට තිබුණි. විශේෂ කාර්ය බලකායේ අණදෙන නිළධාරි නියෝජ්‍ය

[478] උදලාගම කොමිෂන් සභා වාර්තාව 11 කොටස පිටු 7-9

පොලිස්පති නිමල් ලෙව්කේ මහතා ප්‍රකාශ කළ ආකාරයට මෙම තරුණයන් ඝාතනය කිරීම සම්බන්ධයෙන් විශේෂ කාර්ය බලකායේ කිසිදු සම්බන්ධයක් නිබී නොමැත. එම ප්‍රදේශයේ සිටින පදිංචිකරුවන් ඝාතනය සම්බන්ධයෙන් ආරක්ෂක අංශ වලට චෝදනා කරන අතර ආරක්ෂක අංශ දැන් පවසන්නේ ඔවුන්ට ප්‍රහාර එල්ල කිරීම තුළ ඔවුන් ද ප්‍රහාර එල්ල කළ බව ය. එසේම ආරක්ෂක අංශ පවසන ආකාරයට මෙම ඝාතන සිදුකර තිබෙන්නේ එල්.ටී.ටී.ඊ. සංවිධානය විසින් පුහුණු කරනු ලැබූ සිවිල් වැසියන් කණ්ඩායමක් විසිනි.

"පරීක්ෂණ වලින් හෙළිවී ඇති ආකාරයට මෙම සිවිල් වැසියන් කණ්ඩායම පසුගිය සති කිහිපය තුළ සිදුවූ ප්‍රහාර බොහොමයකට වගකිව යුතු විය. මෙම සියළුම ප්‍රහාර සම්බන්ධයෙන් විමර්ශන කෙරෙමින් පවතියි." හමුදා ප්‍රකාශක බ්‍රිගේඩියර් ප්‍රසාද් සමරසිංහ ඊයේ ප්‍රකාශ කරන ලදී.

- **2006 ජනවාරි 8 දින පළවූ සන්ඩේ ටයිම්ස් පුවත්පතේ පළවූ වාර්තාවකින් උපුටා ගන්නා ලද මෙම කොටස අනුව;**

  මෙම සිද්ධියට හේතුවූ කාරණා පිළිබඳව ආරක්ෂක බලධාරීන් සිදුකරන ප්‍රකාශ දෙමළ කණ්ඩායම් සහ එල්.ටී.ටී.ඊ. සංවිධානය විසින් පරස්පරතාවකට ලක් කර තිබේ. ත්‍රිකුණාමලයේ සිටින ආරක්ෂක බලධාරීන් පවසන ආකාරයට මෙම ශිෂ්‍යන් මුර සංචාරයේ යෙදෙමින් සිටි හමුදා භටයන්ට ප්‍රහාරයක් දියත් කිරීම සඳහා සුදානම් සිට තිබේ. නමුත් පසුව සඳහන් කළ පාර්ශ්වය එය ප්‍රතික්ෂේප කරයි. ත්‍රී විලර් ස්කූටර් ටැක්සියක ගමන් කරමින් සිටි පුද්ගලයන් පිරිසක් ශිෂ්‍යන් වෙත අත් බෝම්බයක් දමා ගැසූ බවත් පසුව හට පිරිස් ගිනි අවි ප්‍රහාරයක් එල්ල කළ බවත් ඔවුහු පවසා තිබේ. අඟහරුවාදා සවස වන විට මෙම පශ්චාත් මරණ පරීක්ෂණය පැවැත්වූ අධිකරණ වෛද්‍ය නිලධාරි ගාමිණී ගුණතුංග මෙම සිද්ධිය සම්බන්ධයෙන් යම් පැහැදිලි කිරීමක් සිදුකිරීමට සමත් විය. ඔහුට අනුව මෙම ශිෂ්‍යන් මිය ගොස් ඇත්තේ වෙඩි ප්‍රහාර වලිනි.

  නාවික හමුදාවේ ප්‍රධාන සුළු නිලධාරීවරයෙක් එම ස්ථානයට තවත් නාවික සෙබළුන් කිහිප දෙනෙක් සමග එක් මාර්ගයකින් එනනට ළඟා වූ බව සන්ඩේ ටයිම්ස් පුවත්පතට දැනගන්නට ලැබී තිබේ. ඔහුට ත්‍රී රෝද රථයක් හමු වී තිබේ. සිංහල මවක සහ දරුවෙක් නගරය ප්‍රදේශයට යමින් සිට තිබේ. ඔවුන්ට යන්නට හැර ඔහු අදාළ ස්ථානයට ළඟා වී තිබේ. ඒ වන විට පොලිස් විශේෂ කාර්ය බලකායේ කණ්ඩායමක් ද අසළ ස්ථානයක සිට අදාළ ස්ථානයට පැමිණ තිබේ. ඔවුන් ගිනි අවි ප්‍රහාර එල්ල කළ බවට චෝදනා තිබේ. මෙම සිද්ධිය නිසා ජනතාව කුපිත වූ අතර විරෝධතා සහ හර්තාල ක්‍රියාන්මක විය.

- 'මානව හිමිකම් සඳහා වන විශ්වවිද්‍යාල ගුරුවරු - යාපනය' සංවිධානය විසින් 2007 පෙබරවාරි 27 වෙනි දින ප්‍රකාශයට පත් කරන ලද විශේෂ වාර්තා අංක 5 අනුව;

618. 2007 පෙබරවාරි 27 වෙනි දින මානව හිමිකම් සඳහා වන විශ්වවිද්‍යාල ආචාර්යවරුන්ගේ අංක 25 දරන විශේෂ වාර්තාව ආචාර්ය රාජන් හූලේ මහතා විසින් විද්‍යුත් තැපෑල හරහා මෙම විමර්ශන කොමිෂන් සභාව වෙත ලබා දී තිබේ.

ප.ව. 7.35

පොලිස් අධිකාරි කපිල ජයසේකර ඔරලෝසු කණුව අසල සිටි විශේෂ කාර්ය බලකායේ පිරිස දැකීමෙන් පසු අදාළ ස්ථානයේ ගාන්ධි ප්‍රතිමාවට ඉදිරියෙන් තිබෙන වල්ලුවාර් ස්මාරකය අසළ තම වාහනය නවතා ශිෂ්‍යන් වෙත කොළ පැහැති ත්‍රී රෝද රථයේ සිට අතබෝම්බය එල්ල කළ පසු එය ආමී මූලස්ථානය වෙත (ෆෙඩ්රික් කොටුව) පන්සල හමුදා මුර පොල පසුකර ගොස් තිබේ.

නාවික හමුදාව විසින් එම ප්‍රදේශය වසා දමන ලදී. ලුතිනන් සූරසිංහ විසින් නායකත්වය දුන්නා යයි සිතිය හැකි නාවික හමුදා භට කණ්ඩයක් තුවාල වූ ශිෂ්‍යන් පස් දෙනා සහ ඔවුන්ට උදව් කිරීමට උත්සාහ කරමින් සිටි දෙදෙනො පරීක්ෂා කර නාවික හමුදා මූලස්ථානයට දැනුම් දී විශේෂ කාර්ය බලකායේ භට බණ්ඩයක් පාකිං ලයිට් පමණක් සහිතව පැමිණි ඩිෆෙන්ඩර් රථයකින් කොටුව මාර්ග දිගේ වෙරළ තීරය ඉදිරිපසින් පැමිණෙන විට එතනින් ඉවත් විය. වෙරළ තීරයේ තිබූ විදුලි ආලෝකය පිපිරීමෙන් පසු නාවික හමුදාව විසින් හෝ කපිලගේ මිනිසුන් විසින් නිවා දමා තිබුණි.

ප.ව. 7.45- 7.55

වී.ඒ.එස්. පෙරේරා ගේ නායකත්වයෙන් යුතු විශේෂ කාර්ය බලකායේ ඒකකයක් නාවික හමුදාව විසින් එම ශිෂ්‍යන්ට වෙඩි තැබීමට යොදාගත්තා යයි සිතිය හැකි ගිනි අවියකින් තුවාල වූවන්ට පහර දුන්හ. හැරවීමට පෙර ඩිෆෙන්ඩර් රථයේ විදුලි පහන් දල්වා තිබූ අතර එහි හෙඩ් ලයිට් තුවාල නොවූ ශිෂ්‍යන් දෙදෙනා ඉතිරි පිරිසෙන් ඈත්ව බිම වාඩිවී සිටින දෙසට එල්ල විය. ඔවුන්වත් වෙඩි තබා ඝාතනය කරන ලදී. විශේෂ කාර්ය බලකායේ පිරිස සහිතව ඩිෆෙන්ඩර් රථය හරවාගෙන කොටුව පාර දිගේ ආපසු පැමිණ තිබේ.

ප.ව. 8.10 ට පමණ:

පොලිස් පරීක්ෂක සවාර්හිර්ගේ පොලිස් කණ්ඩායම එම ස්ථානය ට පැමිණෙයි. නාවික ලුතිනන් සූරසිංහ අඳුරු කරන ලද විදුලි පහන් ආලෝකයෙන් නගර සභාව අසළ දී ඔවුන් සමග එක් විය.

ප.ව. 8.10 – 8.30

කොටුව පාර පහළට ගොස් ඔරලෝසු කණුව අසළදී හැරී ඩොක්යාර්ඩ් පාර දිගේ ආපසු පැමිණි වී.ඒ.එස්. පෙරේරාගේ විශේෂ කාර්ය බලකා කණ්ඩායම නගර සභාවේ වාහනය නවත්වා ගාන්ධි ප්‍රතිමාව අසළ සිද්ධිය වූ ස්ථානයට ආපසු යයි. මරණයට පත්වූ සහ තුවාල වූ අය රෝහලට යවා තිබේ. සහකාර පොලිස් අධිකාරි - 1 පැමිණේ. කපිල ජයසේකර පාර හරහා ගොස් ගාන්ධි ප්‍රතිමාව දෙසට පැමිණ සහකාර පොලිස් නිලධාරි -1 සහ වී.ඒ.එස්. පෙරේරා හමුවේ.

619. අපරාධය සඳහා වන අභිප්‍රාය පිළිබඳ සඳහන් කිරීම සඳහා 'මානව හිමිකම් සඳහා වන විශ්වවිද්‍යාල ගුරුවරු' පහත සඳහන් සිද්ධීන් දක්වා තිබේ.

- චින්දිතයන්ගේ පවුල්වලට ත්‍රිකුණාමලයෙන් ඉවත් වන ලෙසට එවන ලද තර්ජනාත්මක ලිපි;
- සටන් විරාම ගිවිසුම ට පසු සිංහල අන්තවාදීන් අතර විරෝධයක් මතුවීම නිසා සහ 2005 මැයි 15 නීති විරෝධී ලෙස බුද්ධ ප්‍රතිමාවක් ත්‍රිකුණාමලය මාළු වෙළෙඳපොළ ඉදිරිපිට ඉදිකිරීමෙන් පසු උච්ඡස්ථානයට පත් වූ පොංගු තමිල් විරෝධතා.
- අයිස් මංජුල නැමැති ව්‍යාපාරිකයා සහ එල්.ටී.ටී.ඊ. සංවිධානය අතර සම්බන්ධයක් ඇතැයි යන සැකය සහ ඔක්තෝබර් 25 දින ලුතිනන් කර්නල් ටී.ආර්. මෙදීන් මහතා ඝාතනයට ඔහුගේ සම්බන්ධයක් ඇතැයි යන සැකය;
- 2005 දෙසැම්බර් 24 දින ව්‍යාපාරික ඇල්බර්ට් හෙන්ඩ්රික් වීරක්කොඩි ඝාතනය පිළිබඳ එල්.ටී.ටී.ඊ. සංවිධානයට චෝදනා එල්ල වීම සහ එම අවමගුලේ දී දෙමළ ජාතිකයින් 10 දෙනෙක් එයට පළිගැනීම උදෙසා ඝාතනය කළ යුතු ය යන ඔහුගේ බිරිඳ ගේ ප්‍රකාශය.
- දෙමළ ත්‍රී රෝද රථ රියදුරන් දෙදෙනෙක් ඉහත තර්ජනය සිදු කළ දිනට පසු දින ඝාතනය කිරීම;

- ව්‍යාපරික බෙබි ටයර් මුදලාලි ඝාතනය කිරීම.
- එල්.ටී.ටී.ඊ. සංවිධානය විසින් සිදුකළ බවට සැක කෙරෙන රාජකාරියෙන් බැහැරව සිටි සොල්දාදුවෙක් 2005 දෙසැම්බර් 28 දින ඝාතනය කිරීම.

- **මානව හිමිකම් කොමිෂන් සභාවේ මානව හිමිකම් උල්ලංඝනය වීම සම්බන්ධයෙන් වන විශේෂ වාර්තාකරුගෙන් ලබා ගත් උපුටාගත් කොටසට අනුව;**

2006 ජනවාරි 1 සිට 2006 මාර්තු31 දක්වා මානව හිමිකම් උල්ලංඝනය වීම් සම්බන්ධයෙන්, එනම් ත්‍රිකුණාමලයේ පස් දෙනෙක් ඝාතනය කිරීම සම්බන්ධයෙන්, චෝදනා ලබා තිබෙන උල්ලංඝනය කිරීම් සම්බන්ධයෙන් ටී. සුන්දරලිංගම් මහතා විසින් පවත්වන ලද පරීක්ෂණයේ වාර්තාවකින් ලබා ගත් කොටස පහත දැක්වේ:

"විශේෂ කාර්ය බලකාය හැර වෙන කිසිවෙක් ගාන්ධි ප්‍රතිමාව අසළ සිටි පිරිසට වෙඩි තැබූ බව සිතිය නොහැකි ය. තුවාල වූ පුද්ගලයෙක් වන යෝගනාදන් පූනකලලන් විසින් ප්‍රකාශ කළ පරිදි ඉන් පසු නිළ ඇඳුම් ලාගත් 10 ක 15 ක පමණ පිරිසක් වහාම පැමිණි බවට ලබා දුන් සාක්ෂි අනුව මෙය තවදුරටත් තහවුරු වේ. ඉන්පසු තුවාල වූවන් ඔවුන්ගේ ජීප් රථයට දමාගෙන ඔවුන් ජීප් රථය තුළ සිටිය දී ඔවුන්ට තම ආයුධ වලින් පහර දී නැවත ජීප් රථයෙන් එළියට ඇද දමා තිබේ. ඉන් පසු වහාම වෙඩි හඬවල් කිහිපයක් ඇසුණ අතර ඉන් දෙකක් ඔහුගේ කළවට සහ පපුවේ පිටුපසට වැදී තිබේ."

620. මෙම ජනාධිපති විමර්ශන කොමිෂන් සභාව මෙම 'ට්‍රින්කෝ 5' යනුවෙන් හඳුන්වනු ලබන සිද්ධියේ දී වැදගත් සාක්ෂි ඉවත් කර ඇති බව හෝ මෙම සිද්ධියට ඉදිරිපත් නොකළ බවට වන චෝදනාව නිරීක්ෂණය කිරීම ට අපේක්ෂා කරයි. රාජන් හූලේ විසින් රචනා කර තිබෙන යම් යම් ලේඛන වලද මේ සම්බන්ධයෙන් ප්‍රකාශ දක්නට ලැබේ.[479] මෙම ජනාධිපති විමර්ශන කොමිෂන් සභාවේ අවධානය ට ලක්වූ පරිදි 2006 වසරේදී 13 දෙනෙක් අත්අඩංගුවට ගත්ත ද 2006 අප්‍රේල් 12 දින ඔවුන් ව සාක්ෂි හිගකම මත නිදහස් කරන ලදී. නීතිපතිවරයා ඔහුගේ 2009 ජූලි 19 දිනැති ලිපියෙන් මෙම සිද්ධිය නැවත විවෘත කරන ලෙස දැනුම් දී තිබේ. අපගේ අවධානයට ලක්වූ කාරණයක් වන්නේ මෙම සැකකරුවන් 2013 ජූලි 19 වෙනි දින අත්අඩංගුවට ගෙන නැවත අත්අඩංගුවට ගෙන ඇති බවත් විදේශ ගතව සිටින සාක්ෂිකරු සිටින තැන සොයාගන්නා තෙක් විමර්ශන අත්හිටුවා ඇති බවත් ය.

621. උදලාගම කොමිෂන් සභා වාර්තාව සෘජුවම පවසන දෙයක් වන "ඉහත සඳහන් ව්‍යාකූල සාධක සැළකිල්ලට ගත් විට මෙම අපරාධය සිදු කිරීමට නිල ඇඳුම් ලාගත් පිරිසකගේ සහභාගිත්වය තිබූ බවට දැඩි සාක්ෂි තිබෙන බව සැළකිල්ලට ගත් විට"[480] යන්න අවධානය ගැනීම වැදගත් වේ.

622. 2011 වසරේ දීත් උගත් පාඩම් සහ ප්‍රතිසන්ධාන කොමිෂන් සභාව පූර්වගාමී කොමිෂන් සභාවල නිර්දේශ විශේෂයෙන් ම ත්‍රිකුණාමලයේ පස් දෙනා සම්බන්ධ සිද්ධියේ දී වන විමර්ශනය සහ වැරදිකරුවන්ට දඬුවම් පැමිණවීම සම්බන්ධයෙන් වන නිර්දේශ ක්‍රියාත්මක කරන ලෙස අවධාරණය කර තිබේ. [481]

---

[479] https://www.uthr.org/SpecialReports/spreport24thm.https://www.uthr.org/SpecialReports/spreport35.htm

[480] උදලාගම කොමිෂන් සභා වාර්තාවේ 5 වෙනි සිදුවීමට අදාළ වාර්තාවේ 56 වෙනි පිටුව.

[481] LLRC පරිච්ඡේද 9, 120

623. දැන් 2023 අංක 10 දරන අපරාධයක් විත්දිතයන් සහ සාක්ෂිකරුවන් හට සහාය දීමේ සහ ආරක්ෂා කිරීමේ පනත බලාත්මක කර තිබෙන නිසා මෙම සිද්ධියට අදාළ වන විදේශ සාක්ෂිකරුවන්ගේ සාක්ෂි ලබාගැනීම, මෙම සිද්ධිය සම්බන්ධයෙන් යුක්තිය ඉෂ්ට කිරීම සඳහා සිදු කළ යුතු ය.

624. යුක්තිය ඉෂ්ට විය යුතු යැයි යන්න ආයාචනාත්මකව ඉල්ලා සිටි සංකේතාත්මක සිද්ධි දෙකක් මෙමගින් සාරාංශගත කරන අතර මෙම ජනාධිපති විමර්ශන කොමිෂන් සභාවේ අදහස වන්නේ යෝජිත සත්‍ය සහ ප්‍රතිසන්ධාන කොමිෂන් සභාව විසින් මෙම සිද්ධි දෙකට ප්‍රමුඛස්ථානය ලබා දිය යුතු බව ය.

මෙම ජනාධිපති විමර්ශන කොමිෂන් සභාවේ නිර්දේශ

625. ACF සංවිධානයේ සේවකයන් ඝාතනය කිරීමේ සිද්ධිය මෙන්ම ත්‍රිකුණාමලයේ පස් දෙනාගේ සිද්ධිය ද යෝජිත සත්‍ය සහ ප්‍රතිසන්ධාන කොමිෂන් සභාව ඉදිරියට ගෙන තවදුරටත් විමර්ශන සිදුකර සහ නඩු පවරා ප්‍රමාණවත් සාක්ෂි මතුවන්නේ නම් චූදිතයන් නඩු විභාගයකට ඉදිරිපත් කළ යුතු බව මෙම ජනාධිපති විමර්ශන කොමිෂන් සභාව නිර්දේශ කරයි.

626. උදලාගම කොමිෂන් සභාව විසින් සිදු කරන ලද තවත් නිර්දේශ දෙකක් පිළිබඳව මෙම ජනාධිපති විමර්ශනෙ කොමිෂන් සභාව තම අවධානය යොමු කළ යුතුය. එනම් මෙවන් සිද්ධි සිදුවීම අධෛර්යමත් කිරීම සඳහා අණ දීමේ වගකීම සහ "බරපතල ලෙස මානව හිමිකම් උල්ලංඝනය වීම සම්බන්ධයෙන් ස්ථාවර ස්වාධීන කොමිෂන් සභාවක් පත් කිරීම වේ".

627. උදලාගම කොමිෂන් සභාවෙන් පසුව පත් කරන ලද කොමිෂන් සභා දෙක, එනම් උගත් පාඩම් සහ ප්‍රතිසන්ධාන කොමිෂන් සභාව සහ මෙම ජනාධිපති කොමිෂන් සභාව යම් ප්‍රමාණයකට අවශ්‍යතා සම්පූර්ණ කළ බව පැවසිය හැකි වුව ද මානව හිමිකම් කොමිෂන් සභාව සෑම විටම යම් යම් සිද්ධි හරහා එන මානව හිමිකම් ආක්‍රමණය ට එරෙහි ආරක්ෂිත පවුරක් වන අතර ඔවුන් ඉදිරියට ගිය සමහර සිද්ධි බරපතල මානව හිමිකම් උල්ලංඝනය කිරීමක් බව තහවුරු කිරීමට හැකියාව ලැබී නැත.

628. නියෝගාවලිය සම්බන්ධයෙන් සාක්ෂි මතුවුව හොත් යෝජිත සත්‍ය සහ ප්‍රතිසන්ධාන කොමිෂන් සභාවේ අවධානය යොමු කළ යුතු කාරණයක් ලෙස අණ දීමේ වගකීම සම්බන්ධයෙන් අවධානය යොමු කළ යුතු අතර අදාළ පාර්ශ්වකරුවන් සමග පුළුල් ලෙස කරන ලද අදහස් හුවමාරුකිරීම් වලින් පසුව මෙම ජනාධිපති විමර්ශන කොමිෂන් සභාවේ අදහස වන්නේ එය මේ රටේ නීතියේ කොටසක් විය යුතු බව ය. අවධානය දැක්විය යුතු කාරණය වන්නේ 2006 අංක 4 දරන ජිනීවා ප්‍රඥප්තියේ අණදීමේ වගකීම යන්නෙහි මූලික උපාංග ඇතුළත් කර නොමැති අතර ජිනීවා ප්‍රඥප්තිය සමස්ථයක් වශයෙන් ශ්‍රී ලංකාවේ නීතිය පිළිබිඹු නොකරයි.

සිද්ධි අංක 3:2006 අගෝස්තු මුල් කාලය තුළ මුත්තූර් ගමෙහි මුස්ලිම් ගම් වැසියන් ඝාතනය කිරීම සහ ගිලන් රථවලින් ප්‍රවාහනය කරමින් සිටි පුද්ගලයන් 14 දෙනෙක් වැලිකන්ද ප්‍රදේශයේ දී ඝාතනය කිරීම සම්බන්ධයෙන් වන චෝදනාව.

629. **සිද්ධි අංක 3 කොටස් දෙකකින් සමන්විත වන අතර ඒවා නම් 2006 අගෝස්තු මුල් කාලය තුළ මුත්තූර් ගමෙහි මුස්ලිම් ගම් වැසියන් ඝාතනය කිරීම සහ 2006 අගොස්තු මුල ගිලන් රථවලින් ප්‍රවාහනය කරමින් සිටි පුද්ගලයන් 14 දෙනෙක් වැලිකන්ද ප්‍රදේශයේ දී ඝාතනය කිරීම වේ.**

සිද්ධි අංක 3 – I කොටස

- ශ්‍රී ලංකාවේ සාමය, එක්සත් බව සහ මානව හිමිකම් සඳහා වූ සමාජය විසින් එළි දක්වන ලද මාධ්‍ය නිවේදනයක දැක්වූ පරිදි: පච්චනූර්හි 100 ට අධික මුස්ලිම් පිරිසක් අමානුෂික ලෙස ඝාතනය කිරීම. එල්.ටී.ටී.ඊ. සංවිධානය වැඩිහිටියන් අතරින් පිරිමින් සහ තරුණයන්

වෙන්කර ඔවුන්ගේ දැත් බැඳ ඔවුන්ව අමානුෂික ලෙස ඝාතනය කර තිබේ. මෙම දිනය සම්බන්ධයෙන් ඇසින් දුටු සාක්ෂි තිබේ.

- ගොවියන්ට තම කුඹුරු වලට ජලය ලබා ගැනීම සඳහා තිබූ එකම ජල මූලාශ්‍රය වූ ‘‘මාවිල් ආරු" සොරොව්ව එල්.ටී.ටී.ඊ. සංවිධානය විසින් වසා දමන ලදී.

- එල්.ටී.ටී.ඊ. සංවිධානය යටතේ තිබෙන ප්‍රදේශ වලින් ඉවත් වීමට උත්සාහ ගත් සමහර මුස්ලිම් ගම් වැසියන් පිරිසක් හිදිසියේ සකස් කරගත් ආරක්ෂක මුර පොළකදි මුහුණ වසා ගත් පුද්ගලයෙක් විසින් පරීක්ෂා කර එම පුද්ගලයා විසින් සමහර පුද්ගලයන් ආරක්ෂක අංශ වලට උදව් කළ අය ලෙස හෝ ජිහාඩ් සංවිධානයේ සාමාජිකයන් ලෙසට සැක කළ හැකි පුද්ගලයන් බවට හෝ හඳුනාගෙන තිබේ. එවන් පුද්ගලයන්ගේ දැත් බැඳ ගෙන යන ලදී.

- එල්.ටී.ටී.ඊ. සංවිධානය මෙම සිවිල් වැසියන් වෙඩි තබා ඝාතනය කළ අතර පච්චනූර්හි එම සිවිල් වැසියන් ආරක්ෂක අංශ සමග එක්ව කටයුතු කරන බවත් එම නිසා ඔවුන් ද්‍රෝහීන් බවත් චෝදනා කරන ලදී.

- රෝහල් වලටද පහර දුන් අතර මානව හිමිකම් සඳහා වූ විශ්වවිද්‍යාල ගරුවරුන්ගේ සංවිධානයේ 23.08.06 දිනැති අංක 22 දරන විශේෂ වාර්තාවෙන් උපුටාගත් කොටසකට අනුව රෝහල් වලට ද පහර දී තිබේ.

- උදලාගම කොමිෂන් සභාව නිරීක්ෂණය කළ ආකාරයට එල්.ටී.ටී.ඊ. සංවිධානය ආරක්ෂක අංශවලට උදව් කළ බවට සැක කෙරෙන යම් යම් මුස්ලිම්වරුන් සහ වෙනත් සංවිධාන එනම් කරුණා පාර්ශ්වය හෝ ජිහාඩ් සංවිධානය අයත් අයව තෝරාගෙන තිබෙන බවට වැදගත් සාක්ෂි තිබේ.

- ගල්ෆ් ටයිම්ස් හි අෂ්රොෆ් අලීල් නම් මාධ්‍යවේදියා ප්‍රකාශ කළ ආකාරයට 2006 අගොස්තු 5 දින ඔහු එම ස්ථානයට යන විට මුස්ලිම්වරු 150 දෙනෙකුගේ පමණ මළ මිනී ඔහු දුටු අතර ඔහු ඒවා ඡායාරූපගතකර තිබේ. කෙසේ වෙතත් මෙම ඡායාරූප ඉදිරිපත් කර නොමැති අතර ඔහුගේ ප්‍රකාශයේ අඩංගු දේ වෙනත අයගේ සාක්ෂි වලින්ද තහවුරු වී නොමැත.

- මිනිස් මළ සිරුරු නොමැති අවස්ථාවක එල්.ටී.ටී.ඊ. සංවිධානය විසින් අවිධිමත් ලෙස එල්ල කරන ලද ගිනි අවි ප්‍රහාර වලින් පුද්ගලයන් කී දෙනෙක් ඝාතනය කළාද යන්න පැවසිය නොහැකි ය.

- මෙයට සම්බන්ධ වරදකරුවන් ජීවග්‍රහයෙන් සොයාගත හැකිනම් ඔවුන්ට එරෙහිව අපරාධ නඩු චෝදනා එල්ල කළ හැකිද යන්න සොයා බැලීම සඳහා මෙම කාරණය සම්බන්ධයෙන් තවදුරටත් සොයා බැලිය යුතු බව උදලාගම කොමිෂන් සභාව තව දුරටත් පැවසී ය.

මෙම ජනාධිපති විමර්ශන කොමිෂන් සභාවේ අදහස්:

630. එල්.ටී.ටී.ඊ. සංවිධානය විසින් මානුෂීය නීතිය උල්ලංඝනය කරන්නට ඇති බවට සාක්ෂි වලින් පෙනී යයි: සිවිල් වැසියන් සහ නිරායුධ පුද්ගලයන් ඝාතනය කිරීම සහ මාවිල් ආරු සොරොව්ව වැසීමෙන් අනවශ්‍ය පීඩාවන් ඇතිකිරීම එල්.ටී.ටී.ඊ. සංවිධානය පාර්ශ්වයෙන් ඇති වූ උල්ලංඝනය වීම් ලෙස පෙනේ.

631. වර්ගය ජාතිකත්වය, ආගම හෝ දේශපාලන මතවාදය පදනම් කරගෙන සිවිල් වැසියන් ඝාතනයට, වධ බන්ධන වලට සහ කෲර වධහිංසාවලට ලක්වීමෙන් ආරක්ෂා කිරීම සඳහා වන හතරවන ජිනීවා සම්මුතියේ 13 සහ 22 නියාමිතයන් එල්.ටී.ටී.ඊ. සංවිධානය විසින් උල්ලංඝනය කර තිබෙන බව පෙනී යයි.

632. I වෙනි ජිනීවා සම්මුතියෙහි 3(1) නියාමිතිය උල්ලංඝනය වී ඇති බව පෙනීයයි: අභ්‍යන්තර අරගලයේ ගැටුම්වලට පාර්ශ්වයක් නොවන පුද්ගලයන් මරා දැමීම.

සිද්ධි අංක 3 – II කොටස

- 2006 අගෝස්තු 01 දින මුත්තූර්හි දී එල්.ටී.ටී.ඊ. සංවිධානය විසින් දියත් කරන ලද අනපේක්ෂිත ප්‍රහාරයට ආනුෂංගිකව මුත්තූර් රෝහලේ සේවය කළ සේවකයන් සහ තවත් කිහප දෙනෙක් සහිත 30 දෙනක් පමණ වන පිරිසක් 2006 අගොස්තු 2 දින රෝහලට අනුයුක්ත ගිලන් රථ දෙකක නැගී පළා යමින් සිටියහ. මෙම ගිලන් රථ පච්චනූර් ප්‍රදේශයේ දී වෙඩි ප්‍රහාරයකට ලක්විය.

- එක් පුද්ගලයෙක් එම ස්ථානයේදී ම මියගිය අතර තිදෙනෙක් රෝහලේ දී මිය ගියහ. තවත් 6 දෙනෙක් එම අවස්ථාවේදී තුවාල ලැබූහ.

- ගිලන් රථ ප්‍රහාරයට ලක්වූ ස්ථානය මුත්තූර් පොලිස් ස්ථානයට ආසන්න ස්ථානයකි.

- පොලිසිය මෙම ස්ථානයට පැමිණියේ සිද්ධිය වී දින 3 කට පසුවය.

- මරණයට පත්වූ පුද්ගලයන් තිදෙනා හිසේ ඇතිවූ තුවාල, පිපුරුම් තුවාල සහ ගිනි අවි වලින් එල්ල වූ ප්‍රහාර නිසා මරණයට පත්වී සිටිය හ.

- විමර්ශන ඒකකයේ විමර්ශන නිළධාරීන් එම ප්‍රදේශය පරීක්ෂා කර සිද්ධියට අදාළව අලුත් ප්‍රකාශ ලබා ගත්හ. 2009 මාර්තු මස නඩු විභාගයක් පැවැත්විණ.

- 2006 අගෝස්තු 2 දින මෙම ප්‍රදේශයේ එල්.ටී.ටී.ඊ. සංවිධානයේ සාමාජිකයන් සිටි බවට සැකයක් නොමැති අතර ඔවුන් ප්‍රහාරකයෝ වූහ.

- එම ගිලන් රථවල ගමන් කරමින් සිටි සුළු තුවාල හෝ තුවාල නොලැබූ අනෙකුත් පුද්ගලයන් ට එල්.ටී.ටී.ඊ. සංවිධානයේ පාලනය යටතේ තිබූ භූමි ප්‍රදේශයෙන් ඉවත් වී තම නිවාස දක්වා යාමට ඉඩ ලබා දෙන ලදී.

- මෙම ප්‍රහාරය කරන ලද්දේ මෙම ගිලන් රථවල ගමන් කරන්නේ ආරක්ෂක අංශ වලට අයත් පුද්ගලයන් ය යන සැකය මත බව ය. මෙම කිසිදු පුද්ගලයෙකුට දඬුවම් ලබා දී නැති බව පෙනේ.

- ආණ්ඩුවේ ප්‍රතිපත්තිය අනුව මිය ගිය පුද්ගලයන්ගේ ළඟම ඥාතීන්ට වන්දියක් ලබා දෙන ලෙස උදලාගම කොමිෂන් සභාව නිර්දේශ කරයි.

මෙම ජනාධිපති විමර්ශන කොමිෂන් සභාවේ අදහස්:

633. එල්.ටී.ටී.ඊ. සංවිධානය විසින් ජිනීවා සම්මුතියේ IV වන සම්මුතිය උල්ලංඝනය කර ඇති බව පෙනී යයි. සිවිල් වැසියන් සඳහා වන රෝහල්, වෛද්‍ය ප්‍රවාහන පහසුකම් ආදිය. වෛද්‍ය ප්‍රවාහන පහසුකම් වලට සෑම අවස්ථාවකම ආරක්ෂා දිය යුතු සහ ගෞරව කළ යුතු බව ජිනීවා සම්මුතියේ සඳහන් වේ. මේ අවස්ථාවේදී පැහැදිලි වන්නේ මෙම ගිලන් රථ දෙක විශේෂයෙන්ම එල්.ටී.ටී.ඊ. සංවිධානය විසින් ඉලක්ක කළ බව ය.

සිද්ධි අංක 7: 2006 අගොස්තු මස නඩ්ඩලමොට්ටන්කුලම (සෙන්චෝලෙයි) ප්‍රදේශයේ පුද්ගලයන් පනස් එක් දෙනෙක් ඝාතනය කිරීම.

- නඩ්ඩලමෝට්ටන්කුලම් (සෙන්චෝලයි) නැමැති එල්.ටී.ටී.ඊ. සංවිධානයේ පුහුණු කඳවුරක් යයි විශ්වාස කෙරෙන ස්ථානයකට ශ්‍රී ලංකා ගුවන් හමුදාව බෝම්බ ප්‍රහාර එල්ල කිරීම.
- අවුරුදු 17 සහ 19 වයස් වල පාසල් ශිෂ්‍යාවන් 51 දෙනෙක් සහ කාර්ය මණ්ඩලයේ 3 දෙනෙක් එම ප්‍රහාරයෙන් මිය ගිය අතර 100 ට වැඩි ප්‍රමාණයක් තුවාල වූ බවට වාර්තා විය.
- මෙය සිදුවූයේ කොළඹදී යුධ හමුදාපතිවරයාට බරපතල තුවාල සිදුකරමින් එල්ල කළ එල්.ටී.ටී.ඊ. මරාගෙන මැරෙන ප්‍රහාරයෙන් පසුව එල්.ටී.ටී.ඊ. සංවිධානය සහ ආරක්ෂක අංශ අතර සිදුවූ ගැටුම් අතරතුර වේ.
- 2006 අගෝස්තු 16 දින පළවූ ඩේලි මිරර් පුවත්පතින් උපුටා ගත් කොටසකි:

"මුලතිව්හි ගුවන් ප්‍රහාර වලින් මිය ගිය තරුණයන් ‘‘ප්‍රචණ්ඩත්වයේ අහිංසක ගොදුරු’’ වන අතර ඔවුන් එම බෝම්බ දැමූ ස්ථානයේ ප්‍රථමාධාර පිළිබඳ දෙදින වැඩමුළුවක් හදාරමින් සිටිය පිරිසක් බව යුනිසෙෆ් සංවිධානයේ ජාත්‍යන්තර ළමා අයිතිවාසිකම් කණ්ඩායමක් පවසයි.’’

සාක්ෂි සාරාංශය

- ඇසින් දුටු සාක්ෂි අනුව එල්.ටී.ටී.ඊ. සංවිධානයේ නියෝජිතයෙකු ඔවුන්ගේ පාසලට පැමිණ ඔවුන් එල්.ටී.ටී.ඊ. සංවිධානය බව හඟවමින් එම සංවිධනයට සහාය දිය යුතු යැයි පවසා එසේ නොකරන කිසිවෙකුට පාසල් පැමිණීමට හෝ අමතර පංති වලට සහභාගි වීමට හෝ අවසර නොලැබෙන බව දැනුම් දී තිබේ. එහෙත් එල්.ටී.ටී.ඊ. සංවිධානය විසින් පවත්වන ලද දේශන වලට සහභාගිවන ලෙස ඔවුන්ට බලපෑම් කෙරිණි. ළඟදී පැවැත්වීමට යන පුහුණු වැඩසටහනක් පිළිබඳවද ඔවුන් ව දැනුවත් කරන ලද අතර එම වැඩසටහනට සහභාගි වීම සඳහා ශිෂ්‍යාන් ව්‍යාපාරයේ සටන් පෙරමුණට සම්බන්ධ විය යුත බව සඳහන් කර තිබේ
- එම්. ශ්‍රීපති කස්තුරි නැමැති සියැසින් දුටු සාක්ෂිකරුවෙක් සාක්ෂි දුන් අතර, එම සඳහන් කළ කඳවුරේ නැවතී සිටිය දී ශිෂ්‍යාන් 500 ට පමණ සටන් පුහුණුව ලබා දුන් බව සඳහන් වේ. එම පුහුණුවට පහත සඳහන් කාරණා ඇතුලත් වී තිබේ.
    - ප්‍රථමාධාර පුහුණුව
    - ගැටුමකදී තුවාල වූවන්ට ප්‍රතිකාර කිරීම
    - ගිනි අවි ගැලවීම සහ නැවත සකස් කිරීම
- දෙවන සියැසින් දුටු සාක්ෂිකරු සාක්ෂි දුන් අතර එම කාලය තුළ ශිෂ්‍යාන්ට වෙහෙසකර ශාරීරික අභ්‍යාස වල යෙදීමට සිදුවූ අතර, ඒ අවස්ථාවලදී එල්.ටී.ටී.ඊ. ධජය ඔසවා තිබුණි. එසේම වැඩමුරයක ආකාරයෙන් ඔවුන්ට පැය 1 හෝ 1½ ක් රාත්‍රී මුර සේවයේ යෙදෙන්නට ද සිදුවිය.
- දවස අවසානයේ ශාරීරික අභ්‍යාස අවසන් වූ පසුව එම භූමියේ විශාල තිරයක් දමා ත්‍රිකුණාමලයේ පාසලකට බෝම්බ දමන ප්‍රචණ්ඩත්වය සහිත විඩියෝ දර්ශන පෙන්වන ලදී. ශිෂ්‍යාන් තුවාල වූ ආකාරය බෝම්බය නිසා සිදුවූ අනෙකුත් හානිද, මිනිසුන් මැරෙන ආකාරය ද ඔවුන්ගේ සමීපතමයින් වැළපෙන ආකාරය ද පෙන්වන ලදී.

- ඉලක්කයේ නිත්‍යානුකූල භාවය සහ එල්.ටී.ටී.ඊ. සංවිධානයේ අසත්‍ය ප්‍රචාරණ: පක්ෂාංග අණ දෙන නිළධාරි වරයාගේ සාක්ෂි වලට අනුව සෙන්චෝලයි වල තිබූ කඳවුර දීර්ඝ කාලයක් තිස්සේ දැඩි පරීක්ෂාව යටතේ තිබූ අතර විවිධ මූලාශ්‍රවලින් ලැබුණ බුද්ධි අංශ වාර්තා අනුව සක්‍රිය සහ උසස් මට්ටමින් සංවර්ධනය කරන ලද එල්.ටී.ටී.ඊ. සංවිධානයේ සටන් සංකීර්ණයක් තිබුණ අතර එය ජාතික ආරක්ෂාවට තර්ජනයක් විය. පවතින සියළුම වැදගත් සාක්ෂි අධ්‍යනය කළ ගුවන් හමුදාව ද එම පරිශ්‍රය තුළ අවාහජ සිවිල් වැසියන් පදිංචි වී නොමැති බව තහවුරු කරගෙන තිබූ අතර එමනිසා එම කඳවුර ගුවන් හමුදාවේ නිත්‍යානුකූල ඉලක්කයක් බවට පත්විය.

- ඒකාබද්ධ හමුදාවන් විසින් ඉලක්ක වාර්තාවක් පිළියෙල කළ අතර ඉදිරි කටයුතු සඳහා ගුවන් හමුදාවට ඉදිරිපත් කරන ලදී. සජීවී බිම් මූලාශ්‍රවලින් සහ බුද්ධි අංශවල තොරතුරු රැස්කිරීම්වලින් ලබාගන්නා ලද මෙම හෙළිකළ නොහැකි තොරතුරු චන්ද්‍රිකා ඡායාරූප සහ නිමුවන් රහිත ගුවන් යානා වීඩියෝ පටවලින් ලබාගත් තොරතුරු වලට අනුව සෙන්චෝලයි හි මනා ලෙස සංවර්ධනය කරන ලද සටන් කඳවුරක් තිබෙන බව තහවුරු වී තිබේ.

- ගුවන් හමුදාවේ නිත්‍යානුකූල ඉලක්කයක් ලෙස මෙය හඳුනාගැනීම සඳහා ප්‍රමාණවත් සාක්ෂි තිබුණි.

- මෙම මූලස්ථානය මගින් සටන් බිමට යැවීමට පෙර එල්.ටී.ටී.ඊ. සංවිධානයේ පුහුණුව ලබා දීම සහ සාමාජිකයන් බඳවාගන්නා විශාලතම මූලස්ථානයක් ලෙස වර්ධනය වෙමින් තිබෙන බවට ප්‍රමාණවත් සාක්ෂි තිබුණි. මෙම පුහුණු ඉලක්කය වහාම නැවැත්විය යුතුය යන්න ජාතික ආරක්ෂක මණ්ඩලය විසින් තීරණය කරන ලදී. එසේ කිරීමට තීරණය කරන ලද්දේ

    - සටන් බිමට වැඩි වැඩියෙන් එල්.ටී.ටී.ඊ. භටයන් පැමිණීම වැළැක්වීම සහ
    - ඒකාබද්ධ හමුදාවන්හි මානුෂීය මෙහෙයුම් වලට සහාය දීම පිණිස වේ.

- මෙම පහසුකම් සම්බන්ධයෙන් යුනිසෙෆ් ආයතනයේ නියෝජිතයාගේ අදහස

    - එය පාසලක් මෙන් නොපෙණින;
    - ගැහැණු දරුවන් එළිමහනේ කඳවුරු බැද සිටි අතර ඔවුන් පාසල් පොත් බෑග් නොව කඳවුරු වලට සහභාගිවීමේදී ගෙනියන ආකාරයේ පිටේ එල්ලාගෙන යන බෑග් ගෙන යමින් සිටියහ;
    - 90% ක් පමණ ගැහැණු ළමයි ග්‍රාමීය ප්‍රදේශවල සිටින ගැහුණු ළමයින් අඳින සාමාන්‍ය ඇඳුම නොව කලිසම් ඇඳ සිටියහ:
    - ගැහැණු ළමයි බඳවටා පටි බැඳ සිටියහ.

- උදලාගම කොමිෂන් සභාව දකින ආකාරයට ගුවන් හමුදාවට එම ස්ථානය ඉලක්ක කිරීම සඳහා සාධාරණ හේතු තිබුණ අතර එසේ කිරීමෙන් මානව හිමිකම් උල්ලංඝනය වීමක් සිදු වී නොමැත. උදලාගම කොමිෂන් සභාව තවදුරටත් කල්පනා කරන ආකාරයට එල්.ටී.ටී.ඊ. සංවිධානය විසින් පාසල් දරුවන් ඔවුන්ගේ කැමැත්තකින් තොරව වනය මැද හුදකලා ස්ථානයකට කැඳවාගෙන යාමෙන් ගුවන් ප්‍රහාරයකින් වන අනතුරකට ඔවුන්ව නිරාවරණය කර තිබෙන අතර, එල්.ටී.ටී.ඊ. සංවිධානය විසින් ආරක්ෂක අංශ වෙත ප්‍රහාර මාලාවක් එල්ල කර තිබූ අවස්ථාවක ඒ සඳහා ප්‍රතිප්‍රහාර බලාපොරොත්තුවෙන් සිටි මොහොතක මෙසේ කිරීමෙන් එල්.ටී.ටී.ඊ. සංවිධානය එම පාසල් දරුවන්ගේ මානව හිමිකම් උල්ලංඝනය කර තිබේ.

- මරණය සහ තුවාල සිදුකිරීම සම්බන්ධයෙන් පුද්ගලයන්ගේ වගකීම: සටන් විරාම ගිවිසුම උල්ලංඝනය කිරීමෙන් එල්.ටී.ටී.ඊ. සංවිධානය ආරක්ෂක අංශ වෙත එල්ල කරන ප්‍රහාර අලුත් කර තිබූ යුගයක ගුවන් හමුදාව විසින් නිත්‍යානුකූල යුධ ඉලක්කයකට එල්ල කරන ලද ගුවන් ප්‍රහාරයක් මගින් එම අවස්ථාවේ එම ස්ථානයේ සිටීමට සිදුවූ පාසල් ශිෂ්‍යාන් මරණයට පත්වීම සහ තුවාල වීම සිදුවී තිබේ. වනය මැද තිබූ එල්.ටී.ටී.ඊ. සංවිධානයේ පුහුණු කඳවුරකට ගෙන යාමෙන් පාසල් දරුවන්ව ගුවන් ප්‍රහාරයකට මුහුණ දීම සඳහා වන අවදානමට ලක් කළ එල්.ටී.ටී.ඊ. සංවිධානය වක්‍රාකාරයෙන් පාසල් දරුවන් මරණයට පත්වීම සහ තුවාල වීම සම්බන්ධයෙන් වගකිව යුතු ය.

උදලාගම කොමිෂන් සභාවේ නිර්දේශ

- මේ සඳහා වගකිවයුතු අයට එරෙහිව ගත යුතු පියවර.

  නිත්‍යානුකූල යුධ ඉලක්කයක් වෙත ප්‍රහාර එල්ල කිරීම සම්බන්ධයෙන් ගුවන් හමුදාවට වගකීම පැවරිය නොහැකිය.

- විත්දිතයන්ට වන්දි ගෙවීමේ ක්‍රමවේදය: මෙම ප්‍රදේශය දැන් රජයේ පාලනය යටතේ පවතින නිසා සහ එම මිය ගිය අය පුහුණු කඳවුරක පුහුණු වීම සඳහා එල්.ටී.ටී.ඊ. සංවිධානය විසින් බලපෑම් කළ පාසල් ශිෂ්‍යාවන් යන කාරණය සළකා බැලීමෙන් පසුව ආණ්ඩුවේ ප්‍රතිපත්තිය අනුව ඔවුන්ගේ ළඟම ඥාතියාට වන්දි ලබා දීම.

- ප්‍රතිසන්ධානයේ සහ වන්දි ගෙවීමේ ලකුණක් වශයෙන් පාසල් පුස්තකාලයක් වැනි පොදු ගොඩනැගිල්ලක් පොදු පරිහරණය සඳහා එම ස්ථානයේ ඉදිකර මියගිය සියළු දරුවන්ගේ නම් ඇතුළත් ඵලකයක් එම ස්ථානයේ ස්ථාපිත කිරීම සුදුසු බව උදලාගම කොමිෂන් සභාව නිර්දේශ කරයි.

මෙම ජනාධිපති විමර්ශන කොමිෂන් සභාවේ අදහස්

634. IV වෙනි ජිනීවා ප්‍රඥප්තියෙහි III වෙනි කොටස: ''ආරක්ෂිත පුද්ගලයෙකුගේ තත්ත්වය සහ සැළකීම'' පිළිබඳව වන පරිච්ඡේදයේ 31 වෙනි නියාමිතිය සඳහන් කරන ආකාරයට ආරක්ෂිත පුද්ගලයෙකුට එරෙහිව කිසිදු ශාරීරික හෝ සදාචාරාත්මක බලහත්කාරකමක් සිදු කළ නොහැකි ය. ''සුමිත්‍රු'' නමැති එක් සාක්ෂිකරුවෙක්, පුහුණුව නොලබන කිසිවකුට නැවත පාසලට යාමට ඉඩ නොදෙන බවට එල්.ටී.ටී.ඊ. සංවිධානය කළ අනතුරු ඇඟවීම සිහිපත් කරයි.

635. IV වෙනි ජිනීවා ප්‍රඥප්තියෙ හි 35 වන නියාමිතයට අනුව "යම් කිසි අර්බුදයක් ආරම්භයේදී හෝ අර්බුදය අතරතුරදී එම භූමි ප්‍රදේශය අත්හැර යාමට කැමති ආරකෂක පුද්ගලයෙකු ට එසේ කිරීමේ අයිතිය තිබේ.'' සියැසින් දුටු සාක්ෂි වලින් සඳහන් වන ආකාරයට බොහෝ පාසල් ශිෂ්‍යාවන් එම කඳවුරේ සිටියේ ඔවුන්ගේ කැමැත්තට එරෙහිව වන අතර කිහිප දෙනෙක් අඩමින් සහ පීඩාවට පත්වූ හැඟීම් සහිතව සිටිය හ.

සිද්ධි අංක 11: පොතුවිල් පොලිස් බල ප්‍රදේශය තුළ මුස්ලිම් ගම්වැසියන් 10 දෙනෙක් ඝාතනය කිරීම.

- බෙල්ල ප්‍රදේශයේ ගැමුරු කැපුම් තුවාල සිදුකරමින් මුස්ලිම් ගම්වැසියන් 10 දෙනෙකු අමානුෂික ලෙස ඝාතනය කිරීම.

- මෙම සිද්ධිය සිදුවූ ප්‍රදේශය විශේෂ කාර්ය බලකායේ බලපෑම දැඩිව තිබූ ප්‍රදේශයකි. මෙම සිද්ධිය සිදුවූ ස්ථානයට ආසන්නතම කඳවුර පිහිටා තිබුණේ එම ස්ථානයට කි.මී. 4 ක් පමණ දුරිනි.

- 2007 මැයි 31 දිනැති අංක 25 දරන මානව හිමිකම් සඳහා වන විශ්වවිද්‍යාල ගුරුවරුන්ගේ සංවිධානයේ වාර්තාවෙන් උපුටා ගත්තකි:

  පොලිසිය ප්‍රකාශ කරන ආකාරයට මොහිදීන් නැමැත්තා (මෙම සිද්ධියෙන් දිවි ගලවාගත් එකම තැනැත්තා) අපරාධයේ වැරදිකරුවා වූ එල්.ටී.ටී.ඊ. සංවිධානයට සාක්ෂි ලබා දී තිබේ. තවදුරටත් එල්.ටී.ටී.ඊ. සංවිධානයයේ සම්බන්ධය ඇඟවීම සඳහා මුස්ලිම ඇමතිවරයෙක් වීඩියෝ සාක්ෂි ලබා ගැනීම සඳහා යවා තිබෙන අතර එය ආරක්ෂක අමාත්‍යාංශයේ වෙබ් අඩවියේ දක්වා තිබේ. මාධ්‍ය (විශේෂයෙන්ම රාජ්‍ය මාධ්‍ය) මෙම සිද්ධිය ආවරණය කරන ලිපි වල මෙම සිද්ධිය එල්.ටී.ටී.ඊ. සංවිධානයට එරෙහිව අවධාරණය කර තිබේ. කෙසේ වෙතත් මෙම දිවිගලවාගත් පුද්ගලයා සම්පූර්ණයෙන්ම යථා තත්ත්වයට පත්වී සිටියත් ඔහුගේ සාක්ෂි උසාවිය ඉදිරියේ ලබා ගැනීම සඳහා මහේස්ත්‍රාත් ඉදිරියට කැඳවා නැත.

උදලාගම කොමිෂන් සභාව සොයාගත් කරුණු

- මෙම අපරාධයට විශේෂ කාර්ය බලකාය සම්බන්ධ බවට වන සාක්ෂි පරිවේෂණීය වන අතර ඒ සඳහා ඇත්තේ ඉතාම අඩු අවස්ථාවකි.

- වෙනත් අය ඉදිරියේ කරන ලද තර්ජනය අනුව මුස්ලිම්වරු 10 දෙනෙක් මරණ බවට නගේෂ්ගේ පවුල සිදුකළ තර්ජනය මත ඊට පසු දින ඊට සමාන සංඛ්‍යාවක් ඝාතනය වීම මත ඔවුන් කෙරෙහි සැක පහළ වීම. කෙසේ වෙතත් එම තර්ජනය හැර ඔවුන් එම අපරාධයට සම්බන්ධ යැයි සැක කළ හැකි වෙනත් කිසිදු සාක්ෂියක් හමුවී නොමැත.

- සියැසින් දුටු සාක්ෂිකරුවන් විසින් කරන ලද ප්‍රකාශ වලින් මොහිදීන්ගේ ප්‍රකාශය වන ඝාතකයන් එල්.ටී.ටී.ඊ. සංවිධානයෙන් වන බවට තහවුරු වෙයි.

උදලාගම කොමිෂන් සභාවේ නිර්දේශ

- චින්දිතයන්ගේ පවුල්වලට රු.100,000/- ක වන්දියක් රජයෙන් ගෙවීම

- මොහදීන්ට රජයෙන් වන්දියක් නොලැබුණ බවට මොහිදීන් පැමිණිලි කරන අතර, ඔහු තවමත් ඔහුට කරන ලද ශල්‍ය කර්මයේ පසු බලපෑම් වලින් පිඩා විඳිමින් සිටියි.

- උදලාගම කොමිෂන් සභාව පහත සඳහන් නිර්දේශ ඉදිරිපත් කරයි.

- මිය ගිය පුද්ගලයන්ගේ පවුල් වල අයට 25% ක අමතර දීමනාවක් ගෙවීම. මීරා මොහිදීන්ට මෙම සිද්ධියේ ප්‍රතිඵලයක් වශයෙන් ජීවනෝපාය අහිමි වීම වෙනුවෙන් සාධාරණ මුදලක් ගෙවීම.

- උදලාගම කොමිෂන් සභාව තවදුරටත් මෙසේ නිර්ද්ශ කරයි

    - මුළු සුසාන භූමියම නැවත සීමා නිර්ණය කිරීම සඳහා දිස්ත්‍රික් ලේකම් විසින් කටයුතු කළ යුතුය.

    - මෙවන් සිද්ධි වැළැක්වීම සඳහා පළාත් පාලන අමාත්‍යාංශය විසින් ජාතික ප්‍රතිපත්තියක් සකස් කළ යුතු ය. (නාගේෂ්ගේ අවමගුල් උළෙලලේ දී සිදුවූ සිද්ධි වලට අනුව)

මෙම ජනාධිපති විමර්ශන කොමිෂන් සභාවේ අදහස්

636. මෙම සිද්ධියෙන්, ජිනීවා ප්‍රඥප්තිය රාජ්‍ය නොවන ක්‍රියාකාරින්ට එනම් එල්.ටී.ටී.ඊ. සංවිධානයට අදාළ වන්නේ කෙසේද යන්න විමසා බැලිය යුතු අතර උදලාගම කොමිෂන් සභාව විසින්

විමර්ශනය කළ පරිදි නීතිය සකස් කර තිබෙන ආකාරයට මෙම උල්ලංඝනය වීම් සිදුවී තිබෙන්නේ එල්.ටී.ටී.ඊ. සංවිධානය පාර්ශ්වයෙනි. කෙසේ වෙතත්, වන්දි ගෙවීම සඳහා වන උදලාගම කොමිෂන් සභාවේ නිර්දේශ වහාම ක්‍රියාත්මක විය යුතු ය.

සිද්ධි අංක 12: 2006 ජූනි 15 දින කැබිතිගොල්ලෑවේ දී පුද්ගලයන් 68 දෙනෙක් ඝාතනය කිරීම.

- 2006 ජූනි 15 කැබිතිගොල්ලෑව දෙසට යමින් සිටි බස් රථයක් පෙ.ව. 7.45 ට පමණ පිපිරීමකට ලක් විය.
- ප්‍රද්ගලයින් විශාල සංඛ්‍යාවක් එනම් 190 ක් පමණ බස් රථයේ ගමන් ගත් අතර පිරිමින්, කාන්තාවන් සහ ළමයින් 68 ක් පමණ එම සිද්ධියෙන් මරණයට පත්වූ අතර තවත් 68 ක් පමණ තුවාල ලැබූ හ.
- පශ්චාත් මරණ පරීක්ෂණයෙන් හෙළි වූ පරිදි මරණ 56 ක් පමණ පිපිරීම නිසා ඇතිවූ තුවාල නිසා සිදුවූ අතර තවත් 12 ක් පමණ කම්පනය නිසා මිය ගොස් සිටියහ.
- මෙම සිද්ධිය සිදුවූයේ අනුරාධපුර සහ වවුනියා දිස්ත්‍රික් සීමාව අසළ ය. මෙම මායිම් ප්‍රදේශවල සිටින සිංහල ජනතාව ත්‍රස්ත ක්‍රියාකාරකම් ආරම්භ වූ අවධියේ සිට වරින් වර එල්.ටී.ටී.ඊ. සංවිධානයේ ප්‍රහාරවලට ලක්වීම සිදුවී තිබේ. මෙම ප්‍රදේශවල ජීවත් වන ජනතාව එල්.ටී.ටී.ඊ. සංවිධානයට බියෙන් ජීවත් වූ බව එම ගම්වැසියන් ලබා දුන් සාක්ෂි වලින් පැහැදිලි වේ. මෙම ප්‍රහාරයේ වරදකරුවන් සම්බන්ධ සියැසින් දුටු සාක්ෂි නොමැති වුවත් මෙම ප්‍රදේශයට මීට පෙරත් එල්.ටී.ටී.ඊ. සංවිධානයේ ප්‍රහාර එල්ලවී තිබූ අතර පරිවේෂණීය සාක්ෂිවලින් මේ සම්බන්ධයෙන් එල්.ටී.ටී.ඊ. සංවිධානයේ මැදිහත්වීම මනාව පිළිබිඹු වේ.

637. උදලාගම කොමිෂන් සභාව විසින් පවත්වන ලද විමර්ශනයට අදාළ ව වැඩිදුර තොරතුරු දැනගැනීම සඳහා උදලාගම කොමිෂන් සභා වාර්තාවේ II වෙනි කොටස වෙත අවධානය යොමු කර තිබේ. මෙම සිද්ධිය සම්බන්ධයෙන් සකස් කරන ලද නිර්දේශ දැන් මෙම ජනාධිපති විමර්ශන කොමිෂන් සභාව විසින් ඉදිරිපත් කරයි.

උදලාගම කොමිෂන් සභාවේ නිර්දේශ

- මනුෂ්‍යත්වයට එරෙහි අපරාධ සම්බන්ධයෙන් එල්.ටී.ටී.ඊ. සංවිධානයේ නායකත්වයට වගකීම පැවරීම සඳහා ඇති හැකියාව පිළිබඳ බලධාරීන් සොයා බැලිය යුතු ය.
- වන්දි ගෙවීම

  මෙම විෂය සම්බන්ධයෙන් නිකුත් කරන ලද චක්‍රලේඛයේ දක්වා තිබෙන අනුපාත දෙගුණයක් කරමින් ගන්නා ලද අමාත්‍ය මණ්ඩල තීරණයට අනුව වන්දි ගෙවා තිබේ. ජීවන වියදම සහ තනි පුද්ගලයෙකුගේ අවශ්‍යතා සැලකිල්ලට ගෙන මෙම ප්‍රමාණය තව 25% කින් වත් වැඩි කළ යුතු යැයි උදලාගම කොමිෂන් සභාවේ මතය වේ. මෙම පුද්ගලයන්ගේ ආදායම ජීවත් වීම සඳහා කිසිසේත් ප්‍රමාණවත් නොවේ. ඩී.බී. ප්‍රේමවතී මහත්මිය තම පවුලේ පස් දෙනෙකු ත්‍රස්ත ප්‍රහාරයෙන් අහිමිවූ සහ ඇයටද තුවාල සිදුවී ඇගේ දෘෂ්ටිය පවා අහිමි වූ කාන්තාවක් වන අතර, ඇය තවමත් කඳවුරක ජීවත් වේ. එම සිද්ධිය විශේෂ සිද්ධියක් ලෙස සළකා සමාජ සේවා දෙපාර්තමේන්තුව හරහා යම් දීමනාවක් ගෙවීම සුදුසු බව නිර්දේශ කර තිබේ.

මෙම ජනාධිපති විමර්ශන කොමිෂන් සභාවේ අදහස්

638. උදලාගම කොමිෂන් සභාවට අනුව එල්.ටී.ටී.ඊ. සංවිධානය ප්‍රහාර සඳහා වගකිව යුතු ය.

- ඉහත සඳහන් කළ ආකාරයට විශේෂිත ජාත්‍යන්තර මානුෂීය නීතියේ ප්‍රතිපාදන යටතේ ජිනීවා සම්මුතියේ 13 සහ 22 වගන්ති මෙවන් තත්ත්වයන්ට අදාළ වේ.

639. ප්‍රහාරයට ඉලක්ක වූ චින්දිතයන් තම එදිනෙදා කටයුතු වල නියැලුණ නිරායුධ සිවිල් වැසියන් නිසා (දරුවන්ට ඇතුළත්ව) සම්මුතියේ 13(1) වගන්තිය එල්.ටී.ටී.ඊ. සංවිධානය විසින් උල්ලංඝනය කර තිබේ.

සිද්ධි අංක15: 2006 ඔක්තෝබර් 16 වෙනි දින සීගිරිය දිගම්පතන ප්‍රදේශයේදී ආරක්ෂක නිළධාරීන් 98 දෙනෙක් ඝාතනය කිරීම

- නිවාඩු ලබා සිටි නාවික හමුදා භටයන් රැගත් ත්‍රිකුණාමලය නාවික හමුදා කඳවුරෙන් පිටත්ව ප.ව.1.15 ට පමණ හුවමාරු ස්ථානයක් වූ දිගම්පතනට පැමිණි රථ පෙළට මරාගෙන මැරෙන ප්‍රහාරයක් එල්ල කිරීම.

- නාවික හමුදා භටයන් තම ආයුධ, හිස් වැසුම් සහ ශරීර ආරක්ෂක ඇඳුම් භාර දෙමින් සිටි අවස්ථාවේ සුදු පැහැති කැන්ටර් රථයක් පැමිණ එම රථයට සවි කර තිබූ ක්ලේමෝ බෝම්බයක් පුපුරවා හැරිය අතර එහිදී 104 මරණයට පත්වූ අතර නාවික හමුදාවේ 102 කට තුවාල සිදුවිය.

640. උදලාගම කොමිෂන් සභාව විසින් විස්තරාත්මක සාක්ෂි ලබාගත් අතර එම කථාව සම්පූර්ණ කිරීම සඳහා උදලාගම කොමිෂන් සභාවේ II වෙනි කොටසේ 3.4 වෙනි පරිච්ඡේදය බලන්න.

උදලාගම කොමිෂන් සභාවෙ නිර්දේශ

- වැඩිදුර විමර්ශන සිදුකිරීමෙන් පසුව ලුහිනන් ඕපාත යන අය සම්බන්ධයෙන් නොසැලකිලිමත්භාවය මත වරදකාරිත්වයක් තිබිය හැකි බවට දක්නට ලැබෙන නිසා නීතිපතිවරයා ඔහුට එරෙහිව අපරාධ නඩුවක් ආරම්භ කරනු ඇත.

මෙම ජනාධිපති විමර්ශන කොමිෂන සභාවේ අදහස්

641. තම ආයුධ බිම තැබූ හමුදා සාමාජිකයන්ට මානුෂීය ලෙස සැළකිය යුතු ය යන III වෙනි ජිනීවා සම්මුතියෙහි 3 වන නියාමිතය උල්ලංඝනය වීම. මේ ආකාරයෙන් බලන විට ජීවිතයට සහ පුද්ගලයන් වෙත වන ප්‍රචණ්ඩත්වය සියළුම ආකාරයේ ඝාතන ද ඇතුළුව තහනම් වේ. මේ සිද්ධියේ දී මෙම සොල්දාදුවන් ප්‍රහාරයට ලක් වූයේ ඔවුන් තම ස්ථාන තාවකාලිකව හැර යාමට පෙර තම ආයුධ සහ ශරීර ආරක්ෂක ඇඳුම් ජ්‍යෙෂ්ඨ නිළධාරීන්ට භාර දෙන අවස්ථාවේ දී වේ.

642. මෙම ප්‍රහාරය සිද්ධ වෙන අවස්ථාවේ දී බොහෝ සොල්දාදුවන් පැහැදිලිවම නිරායුධව සිටි නිසා එම සොල්දාදුවන් ව යුද්ධයේ දී සටන් කිරීමට නොහැකි තත්ත්වයේ සිටින සොල්දාදුවන් ලෙස සැළකිය හැකි ද? ඔවුන් ප්‍රතිකූල පාර්ශ්වකරුවෙක්ගේ බලය සහිත ව සිටි බව සැලකිය හැකි ද? එසේ නම්, එල්.ටී.ටී.ඊ. සංවිධානය සිරිත් බැඳි අන්තර්ජාතික මානුෂීය නීතිය උල්ලංඝනය කිරීමක් සිදු කරන්නට ඇත.

643. ඉහත සිද්ධීන් තුළින් එල්.ටී.ටී.ඊ. සංවිධානය පාර්ශ්වයෙන් අන්තර්ජාතික මානුෂීය නීතිය උල්ලංඝනය කළ බව පැහැදිලි වන අතර උදලාගම කොමිෂන් සභාවේ අවසන් නිගමන වන්නේ මෙහි වරදකරුවන් හඳුනාගත නොහැකි නිසා මෙම උල්ලංඝනය කිරීම් එල්.ටී.ටී.ඊ. සංවිධානයට එරෙහිව ඉදිරියේ දී යොදාගත හැකි සාර්ථක සිද්ධියක් නොවේ.

644. කොමිෂන් සභා තුනෙහි සොයාගත් කරුණු සහ නිර්දේශ අනුව පූර්වගාමී කොමිෂන් සභා විසින් ඉදිරිපත් කරන ලද නිර්දේශ ක්‍රියාත්මක කිරීම සඳහා ශ්‍රී ලංකාව විසින් ගන්නා ලද උත්සාහයන් වෙත මෙම ජනාධිපති විමර්ශන කොමිෂන් සභාව දැන් තම අවධානය යොමු කරයි. සමහර

විශේෂිත නිර්දේශ ක්‍රියාත්මක නොකිරීම කළින් සඳහන් කළ කොටස් වලින් යම් ආකාරයකට ආමන්ත්‍රණය කර තිබෙන නමුත් මෙම අවසන් වාර්තාවේ 6 වන පරිච්ඡේදයේ වැඩිදුර පරීක්ෂණ සහ නඩු පැවරීම සඳහා වන මෙම ජනාධිපති විමර්ශන කොමිෂන් සභාවේ නිර්දේශ නැවත සඳහන් කරනු ලැබ තිබේ.

III වෙනි කොටස: පූර්වගාමී විමර්ශන කොමිෂන් සභාවල නිර්දේශ ක්‍රියාත්මක කිරීම

645. පූර්වගාමී කොමිෂන් සභා වාර්තාවල නිර්දේශ ලබා දී තිබෙන බැවින් ශ්‍රී ලංකා ආණ්ඩුව විසින් ගෙන තිබෙන පියවර සම්බන්ධයෙන් මෙම කොටස තුළදී අවධානය දක්වනු ලැබේ.

උගත් පාඩම් සහ ප්‍රතිසන්ධාන කොමිෂන් සභාවේ අතුරු නිර්දේශ

646. 2010 සැප්තැම්බර් 10 දින උගත් පාඩම් සහ ප්‍රතිසන්ධාන කොමිෂන් සභාව විසින් තම හදිසි අවධානය දැක්විය යුතු කාරණා ලෙස හඳුනාගත් රඳවාගැනීම්, නීතිය සහ සාමය, ඉඩම්, පරිපාලනය සහ භාෂාව සහ සමාජ ආර්ථික සහ ජීවනෝපාය පිළිබඳ කාරණා වලට අදාළ ගැටළු රාශියක් ආවරණය කරමින් තම අන්තර්වාර නිර්දේශ ඉදිරිපත් කර තිබේ. මෙම කාරණා සම්බන්ධයෙන් කඩිනම් පියවර ගැනීම තුළ මෙම ගැටුම් වලින් පීඩාවට පත්වී සිටින ජනතාවට යම් කිසි විශ්වසනීය හැඟීමක් සහ සහනයක් ඇති කිරීමට සහ ප්‍රතිසන්ධාන ක්‍රියාවලියට යම් කිසි ආවේගයක් ලබා දීම සිදුවනු ඇති ය යන මතය උගත් පාඩම් සහ ප්‍රතිසන්ධාන කොමිෂන් සභාව විසින් දක්වා තිබේ. උගත් පාඩම් සහ ප්‍රතිසන්ධාන කොමිෂන් සභාවෙහි අන්තර්වාර නිර්දේශ එහි අවසන් වාර්තාවේ 1.5 ඇමුණුමෙහි දක්වා තිබේ.

647. උගත් පාඩම් සහ ප්‍රතිසන්ධාන කොමිෂන් සභාවේ අවසන් නිර්දේශ තුළද ක්ෂේත්‍ර කිහිපයකට අදාළ තම සියළු අන්තර්වාර නිර්දේශ සම්පූර්ණයෙන් ක්‍රියාත්මක කරන ලෙස එම කොමිෂන් සභාව විසින් ආණ්ඩුවට අවධාරණය කර තිබෙන බව සටහන් කිරීම වැදගත්ය.[482]

648. උගත් පාඩම් සහ ප්‍රතිසන්ධාන කොමිෂන් සභාවේ නිර්දේශ ක්‍රියාත්මක කිරීමට පහසුකම් සැලසීම සඳහා 2010 ඔක්තෝබර් 27 දිනැති අමාත්‍ය මණ්ඩල පත්‍රිකාව මගින් අන්තර් නියෝජිතායතන උපදේශක කාරක සභාවක් පිහිටුවිය. මෙම අන්තර් නියෝජිතායතන උපදේශක කාරක සභාව පිහිටුවීමේ අරමුණ වූයේ ප්‍රායෝගික ක්‍රියාමාර්ග හරහා උගත් පාඩම් සහ ප්‍රතිසන්ධාන කොමිෂන් සභාවේ නිර්දේශ ක්‍රියාත්මක කරවීම සහ දැනටමත් ක්‍රියාත්මක වන අදාළ ක්‍රියාවලීන් ශක්තිමත් කිරීමයි.

649. අන්තර් නියෝජිතායතන උපදේශක කාරක සභාව ට ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම්, රාජ්‍ය පරිපාලන සහ ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ ලේකම්, අධිකරණ අමාත්‍යාංශයේ ලේකම්, ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ ලේකම්, පුනරුත්ථාපන, බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශයේ ලේකම්, විදේශ කටයුතු අමාත්‍යාංශයේ ලේකම්, සහ මෙම ජනාධිපති කාර්ය සාධක බලකායේ ලේකම් ඇතුළත් වේ. එවකට සිටි නීතිපතිවරයා විසින් එහි මූලාසනය දරන ලදී.

650. අන්තර් නියෝජිතායතන උපදේශන කාරක සභාව එය ස්ථාපිත කළ අවස්ථාවේ සිට උගත් පාඩම් සහ ප්‍රතිසන්විධාන කොමිෂන් සභාවේ නිර්දේශ සමාලෝචනය කිරීමට හෝ ක්‍රියාත්මක කිරීමට නිරන්තරයෙන් රැස්විය. උගත් පාඩම් සහ ප්‍රතිසන්ධාන කොමිෂන් සභාව විසින් පහත සඳහන් ක්ෂේත්‍ර සම්බන්ධයෙන් ගත යුතු ක්‍රියාමාර්ග දක්වා තිබේ.

[482] උගත් පාඩම් සහ ප්‍රතිසන්ධාන කොමිෂන් සභාව ඡේද 9,211,9.64,5.58,5.78,8.189,8,190,9,70,9,74

- රඳවා තබා ගැනීම
- ඉඩම් ප්‍රශ්න
- නීතිය සහ සාමය
- පරිපාලනය සහ භාෂා ප්‍රශ්න
- සමාජ ආර්ථික සහ ජීවනෝපාය ගැටළු

අන්තර් නියෝජිතායතන උපදේශක කාරක සභාවේ ප්‍රගතිය ප්‍රසිද්ධ දැන්වීම් මගින් පැහැදිලිව ඉදිරිපත් කරන ලදී.[483]

651. නීති විරෝධී ආයුධ සන්නද්ධ කණ්ඩායම් සම්බන්ධයෙන් එහි අන්තර්වාර නිර්දේශ සම්බන්ධයෙන් උගත් පාඩම් සහ ප්‍රතිසන්ධාන කොමිෂන් සභාව පහත ප්‍රකාශය අවධාරණයෙන් යුතුව සඳහන් කරයි.

..... නීති විරෝධී සන්නද්ධ කණ්ඩායම් සම්බන්ධයෙන් තම අන්තර්වාර නිර්දේශ පූර්ණ වශයෙන් ක්‍රියාත්මක කිරීමේ වැදගත්කම කොමිෂන් සභාව නැවත අවධාරණය කරයි.[484]

තම නිර්දේශ පූර්ණ වශයෙන් ක්‍රියාත්මක නොකිරීම සම්බන්ධයෙන් කොමිෂන් සභාව කණගාටුවට පත් වේ.[485]

652. උගත් පාඩම් සහ ප්‍රතිසන්ධාන කොමිෂන් සභාවේ නිර්දේශ ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් ප්‍රගති වාර්තාවක් විදේශ කටයුතු අමාත්‍යාංශය විසින් වරින් වර නිකුත් කරනු ලැබේ.

653. මෙම ජනාධිපති විමර්ශන කොමිෂන් සභාව විසින් සොයාගත් පරිදි අන්තර්වාර නිර්දේශ ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතියේ සාරාංශයක් රඳවා ගැනීම් සහ ඉඩම් ප්‍රශ්න වලට අදාළව පහත දැක්වේ.

රඳවාගැනීම සම්බන්ධ ගැටළු

654. රඳවා තබාගෙන සිටින එල්.ටී.ටී.ඊ. සැකකරුවන් සම්බන්ධ සිද්ධි අධ්‍යනය කොට අවශ්‍ය අවස්ථාවල නීතිමය ක්‍රියාමාර්ග කඩිනම් කිරීම සඳහා සාමජිකයන් හතර දෙනෙකුලෙන් සමන්විත වන විශේෂ කමිටුවක් නීතිපති දෙපාර්තමේන්තුව විසින් පත් කරනු ලැබීය. මෙම කමිටුවේ අරමුණ වන්නේ රැඳවියන් නිදහස් කිරීම හෝ පුනරුත්ථාපන කටයුතු සඳහා නිදහස් කිරීම වේගවත් කිරීම, එල්.ටී.ටී.ඊ. සංවිධානයේ දැඩි ක්‍රියාකාරින් ලෙස කටයුතු කළ බවට ප්‍රමාණවත් සාක්ෂි තිබෙන අවස්ථාවල විමර්ශන කටයුතු වේගවත් කිරීමයි. එවන් දැඩි ක්‍රියාකාරීන් සිටියේ යැයි සිතන අවස්ථාවල නීතිපති දෙපාර්තමේන්තුව සාක්ෂි පරීක්ෂා කිරීමේ කටයුතු වේගවත් කරයි. කමිටුව බූස්ස රැඳවුම් මධ්‍යස්ථානය පරීක්ෂා කරමින් තම කටයුතු ආරම්භ කළ අතර රැඳවියන් 182 ක් සමග සම්මුඛ සාකච්ඡා පවත්වන ලදී. 2011 ජනවාරි අවසානයේ බූස්ස සිට රැගෙන ආ තවත් රැඳවියන් 80 ක් සමග කොළඹ දී සම්මුඛ සාකච්ඡා පවත්වන ලදී.

655. බූස්ස කඳවුරේ සිටි රැඳවියන් 220 ක් පමණ මානුෂීය හේතු මත (වැඩිහිටිබව, උපවද්‍යාතාවයේ ප්‍රමාණය) ආදිය සළකා බලා ඔවුන් සම්බන්ධයෙන් පුනරුත්ථාපනය, අභිචෝදනා කිරීම හෝ නිදහස් කිරීම යන ක්‍රියාමාර්ග කඩිනම් කරන ලදී.

---

[483] https:slheindia.org/index.php?option=com_content&view=article&id-271;early-steps-to-implement-Ilrc-recommendations&catid=50;demo-category&Itemid=I

[484] උගත් පාඩම් සහ ප්‍රතිසන්ධාන කොමිෂන් සභාව 9.210 ඡේදය

[485] උගත් පාඩම් සහ ප්‍රතිසන්ධාන කොමිෂන් සභාව 9.211 ඡේදය

656. ත්‍රස්ත විමර්ශන දෙපාර්තමේන්තුව විසින් පරගණකගතකරන ලද දත්ත පද්ධතියක් දැනටමත් වව්නියාවේ ස්ථාපිත කර තිබෙන බව නිවේදය කර තිබේ. සමීපතම ඥාතියාට එම දත්ත පද්ධතියට ප්‍රවේශ විය හැකි බව තවදුරටත් දන්වා තිබේ. දිගුකාලීන සමාජ - සංස්කෘතික අහිතකර ප්‍රතිඵල සලකා බලා දත්ත ප්‍රසිද්ධ ලේඛනයක් ලෙස නිකුත් නොකරන බව දැනුම් දී තිබේ.

657. එහෙත් මෙම දත්ත සංචිතය එම රඳවාතබාගත් අයගේ පවුල්වලට යම් කිසි සහායක් වන්නේ කෙසේද යන්න පැහැදිළ නැත.

658. නිදහස් කරන ලද හෝ පුනරුත්ථාපනය කරන ලද රැඳවියන්ට සහතිකයක් නිකුත් කිරීම සම්බන්ධයෙන් අදහස් කිහිපයක් තිබුණි. නව චෝදන් සම්බන්ධ සාක්ෂි ඇතිව 200 ක් පමණ නැවත අත්අඩංගුවට පත්වූ අවස්ථා තිබුණි. නීති විරෝධී කටයුතු වල යෙදීම සඳහා ආණ්ඩුව විසින් නිකුත් කරන ලද සහතිකයක් ආවරණයක් ලෙස යොදාගත නොහැකි බව අන්තර් නියෝජිතායතන උපදේශන කමිටුව වාර්තා කර තිබේ. තවදුරටත් අන්තර් නියෝජිතායතන උපදේශක කමිටුව පවසන ආකාරයට එවන් සහිතකයක් නිකුත් කිරීම ඔවුනගේ අනාගත යහපත සම්බන්ධයෙන් අහිතකර ප්‍රතිඵල ඇතිකළ හැකිය.

ඉඩම් ගැටළු

659. උගත් පාඩම් සහ ප්‍රතිසන්ධාන කොමිෂන් සභාවේ ක්‍රියාවලිය තුළ මතුකර දක්වා ඇති පරිදි ඉඩම් සම්බන්ධ ගැටළු වල සංකීර්ණත්වය සහ මෙම දීර්ඝ කාලයක් පවතින යුද්ධය නිසා එමගින් සිවිල් ජනතාවගේ ජීවිත මත එල්ල කරන බලපෑම අන්තර් නියෝජිතායතන උපදේශන කමිටුව විසින් වටහාගෙන තිබේ. මෙම සමහර ගැටළු වලට විසඳුම් අවශ්‍ය වන අතර දශක තුනක් තිස්සේ පවතින යුද්ධය නිසා පරිපාලන යටිතල පහසුකම් වලට සහ පෞද්ගලික සහ රාජ්‍ය ලේඛන වලට සිදුවී ඇති හානි නිසා ඒවා පවතින නීතිමය ප්‍රතිකර්ම මගින් ලබා දිය නොහැකි ය. ඉඩම් සම්බන්ධ ගැටළු නිසා සිවිල් වැසියටන්ට විඳින්නට සිදුවි තිබෙන අපහසුතා සහ මානසික පීඩාවන් දෙස බලා අන්තර් නියෝජිතායතන උපදේශන කමිටුව අවශ්‍ය පරිපාලන ක්‍රියාමාර්ග වේගවත් කරනු ලබන බවට නිවේදනය කරන ලදී. අන්තර් නියෝජිතායතන උපදේශන කමිටුව ඉඩම් කච්චේරි ක්‍රමය සළකා බලන බව දැනුම් දී තිබේ. එවන් අවස්ථාවක් ලැබෙන තෙක් උගත් පාඩම් සහ ප්‍රතිසන්ධාන කොමිෂන් සභාවට තම අවසන් නිර්දේශ ලබා දීමට හැකිවී තිබේ.

660. අන්තර් නියෝජිතායතන උපදේශන කමිටුව පැහැදිලිව ප්‍රකාශ කරන ආකාරයට බලහත්කාරයෙන් පදිංචිකරවීමේ සංකල්පයක් රජය විසින් ක්‍රියාත්මක කර නැත. තව දුරටත් එය ඉතාම පැහැදිලිව ප්‍රකාශ කරන ආකාරයට ශ්‍රී ලංකාවේ පදිංචි ඕනෑම පුද්ගලයෙකුට රටේ ඕනෑම ස්ථානයකින් ඉඩමක් මිලදී ගැනීමට හෝ පදිංචි වීමට නිදහස තිබේ. සමහරු චෝදනා කරන ආකාරයට අධි ආරක්ෂිත කලාප පුළුල් කිරීමේ ප්‍රතිපත්තියක් ද නොමැත.

661. යාපනයේ නිවාස ඒකක 100,000 ක් ඉදිකිරීම සඳහා වන රජයේ සැළසුම ක්‍රියාත්මක වීමත් සමග ඉඩම් ප්‍රශ්නයට දැඩි සහනයක් ලැබෙනු ඇති බව අන්තර් නියෝජිතායතන උපදේශක කමිටුව අපේක්ෂා කරයි. නිවාස වෙන් කිරීම සම්බන්ධ කාරණා ගත් විට පීඩාවට පත්වූ පුද්ගලයන්ට අන්තර් නියෝජිතායතන උපදේශක කමිටුව ප්‍රමුඛතාව ලබා දෙනු ඇත.

662. අන්තර් නියෝජිතායතන උපදේශක කමිටුව ට අනුව ආරක්ෂක හේතූන් තිබෙන අවස්ථාවලදී හැර පලාලි අධි ආරක්ෂිත කළාපය අවට තිබෙන අධි ආරක්ෂිත කළාප භූමි නිදහක් කරගෙන යමින් තිබුණි. එවකට යාපනයේ මහාධිකරණ විනිසුරුගේ සභාපතිත්වයෙන් යුතු විශේෂ කමිටුව ආරම්භ කළ පරිදි ඒ වන විටත් ප්‍රගතියක් අත්පත් කරගෙන තිබූ බව අන්තර් නියෝජිතායතන උපදේශක කමිටුව සඳහන් කරයි. අධි ආරක්ෂිත කළාප වලට නැවත පැමිණීමට ශ්‍රී ලංකා රජය ගෙන තිබූ තීරණය අර්ධ ද්වීපයේ ජනතාවගේ විස්වාශය දිනා ගැනීම සමත් වීම නිසා අධි

ආරක්ෂිත කලාප ඉවත් කිරීම යාපනයේ ආරක්ෂාව මත කිසිදු බලපෑමක් එල්ල කොට නැත. පලාලි ප්‍රදේශයේ නිවාස 256 ක් සිවිල් වැසියන්ට භාර දීමට පියවර ගෙන තිබේ. අධි ආරක්ෂිත කළාප සඳහා තබාගෙන තිබූ හෙක්ටයාර 2500 කට වැඩි ප්‍රමාණයක නිවාස 2392ක් සිවිල් වැසියන්ගේ පදංචිය සඳහා හඳුනාගෙන තිබේ. මේ සඳහා බෝම්බ ඉවත් කිරීම ද දැනටමත් වේගවත් කර තිබේ.

663. අන්තර් නියෝජිතායතන උපදේශක කමිටුව විසින් ආරම්භයේ දී වැඩ කටයුතු රාශියක් සිදු කර තිබේ.

664. උගත් පාඩම් සහ ප්‍රතිසන්ධාන කොමිෂන් සභාවේ අවසන් වාර්තාව ක්‍රියාත්මක කිරීම සඳහා එය ඉතා ඉක්මනින් ජාතික ක්‍රියකාරී සැළැස්මක් බවට පරිවර්තනය වනු ඇත.

665. සියළු දෙනාම දන්නා පරිදි උගත් පාඩම් සහ ප්‍රතිසන්ධාන කොමිෂන් සභාව එහි අවසන් වාර්තාව 2011 දෙසැම්බර් 16 දින මුද්‍රණය කර තිබේ. මෙම ජනාධිපති විමර්ශන කොමිෂන් සභාව ඉදිරියේ චන්දිමා වික්‍රමසිංහ මහත්මිය ලබා දුන් සාක්ෂි අනුව උගත් පාඩම් සහ ප්‍රතිසන්ධාන කොමිෂන් සභාවේ නිර්දේශ ක්‍රියාත්මක කිරීම අධීක්ෂණය කිරීම ජනාධිපති ලේකම්වරයාට අමාත්‍ය මණ්ඩලය විසින් පවරා තිබේ.

666. ඒ අනුව නිර්දේශ 144 ක් ඇතුළත් ජාතික ක්‍රියාකාරී සැළැස්මක් සකස් කරන ලදී. මෙම නිර්දේශ උගත් පාඩම් සහ ප්‍රතිසන්ධාන කොමිෂන් සභාවේ තේමා පහක් යටතේ වර්ගීකරණය කර තිබේ.

- ජාත්‍යන්තර මානුෂීය නීතිය
- මානව හිමිකම්
- ඉඩම් ආපසු දීම්/ නැවත පදිංචි කිරීම්
- ප්‍රතිස්ථාපනය/ වන්දි සහන
- ප්‍රතිසන්ධානය[486]

667. 2012 ජූලි 26 දින උගත් පාඩම් සහ ප්‍රතිසන්ධාන කොමිෂන් සභාවේ නිර්දේශ ක්‍රියාත්මක කිරීම සඳහා ශ්‍රී ලංකා රජය ජාතික සැළැස්මක් දියත් කරන ලදී.

උගත් පාඩම් සහ ප්‍රතිසන්ධාන කොමිෂන් සභාවේ ජාතික ක්‍රියාකාරී සැළැස්ම

668. උගත් පාඩම් සහ ප්‍රතිසන්ධාන කොමිෂන් සභාව විසින් ජාත්‍යන්තර මානුෂීය නීතිය සහ ජාත්‍යන්තර මානව හිමිකම් නීතිය උල්ලංඝනය කිරීම සම්බන්ධයෙන් වන නිර්දේශ ක්‍රියාත්මක කිරීම පිළිබඳ විමසා බැලමට අපගේ විමර්ශනය මගින් ඉලක්ක කරන අතර අපි ඒවා මෙම පරිච්ඡේදයේ II වෙනි කොටසේ අයිතම වශයෙන් දක්වා තිබේ. මෙම ක්‍රියාත්මක කිරීම් වල මූලාරම්භයන් දෙස බැලීම මේ සම්බන්ධයෙන් අදාළ වනු ඇත.

හමුදා විමර්ශන අධිකරණය

669. චන්දිමා වික්‍රමසිංහ මහත්මිය විසින් මෙම ජනාධිපති විමර්ශන කොමිෂන් සභාවට ලබා දෙන ලද ජාතික ක්‍රියාකාරී සැලැස්මෙන් පෙනී යන පරිදි සිවිල් වැසියන්ට සිදුවූ හානිය විමර්ශනය කිරීමටත් චැනල් 4 වීඩියෝ පටය පිළිබඳ චෝදනාව විභාග කිරීම සඳහා ත් ශ්‍රී ලංකා රජය යුධ හමුදා අධිකරණයක් පිහිටවූ බව පැහැදිලි ය.

---

[486] ජාත්‍යන්තර මානුෂීය නීතිය සහ ජාත්‍යන්තර මානව හිමිකම් නීතිය මත උගත් පාඩම් සහ ප්‍රතිසන්ධාන කොමිෂන් සභාවේ නිර්දේශ සඳහා මෙම පරිච්ඡේදයේ II කොටසේ කලින් කොටස බලන්න: එසේම උගත් පාඩම් සහ ප්‍රතිසන්ධාන කොමිෂන් සභාවේ නිර්දේශ වල සාරාංශය සඳහා වන අවසන් වාර්තාවේ ඇමුණුම 2 බලන්න

670. උගත් පාඩම් සහ ප්‍රතිසන්ධාන කොමිෂන් සභාවේ 9.9 සහ 9.37(අ) නිර්දේශ අනුව සිවිල් වැසියන්ට මරණය හෝ තුවාල සිදු වුණ යම් විශේෂිත අවස්ථා තිබේ නම් එම සිද්ධීන් සම්බන්ධයෙන් නිර්ණයනයක් උගත් පාඩම් සහ ප්‍රතිසන්ධාන කොමිෂන් සභාව ඉල්ලා තිබෙන අතර එවන් විමර්ශනයකදී යම් කිසි වැරදි හැසිරීමක් අනාවරණය වුවහොත් එම වැරදිකරුවන් ට අභිචෝදනා කර දඬුවම් කළ යුතු අතර, ජාතික ක්‍රියකාරී සැළැස්ම 2015 සැප්තැම්බර් මස එහි ප්‍රගතිය පහත පරිදි දක්වා තිබේ;

අතුරුදහන් වූවන් පිළිබඳ පැමිණිලි විමර්ශනය කිරීම සඳහා ස්වාධීන කොමිෂන් සභාවක් ලෙස පිහිටුවන ලද මෙම ජනාධිපති විමර්ශන කොමිෂන් සභාව පිහිටුවීමට පෙර 2012 ජනවාරි 02 දින යුධ හමුදාව විසින් යුද්ධයේ අවසන් අදියරේ දී සිවිල් ජනතාවට වූ හානි සම්බන්ධයෙන් වන චෝදනා විභාග කිරීමටත් වැනල් 4 විඩියෝ පටය එහි නිරවද්‍යතාව හෝ වෙනත් කිසිදු කාරණයක් නොසලකා ඒ සම්බන්ධයෙන් විභාග කිරීමටත් යුධ හමුදා අධිකරණයක් පිහිටුවන ලදී. අභ්‍යන්තර හමුදා කටයුතු සම්බන්ධයෙන් හමුදාවේ විනය ද ඇතුළත්ව විශේෂයෙන් ජාත්‍යන්තර මානුෂීය නීතිය උල්ලංඝනය කිරීම සම්බන්ධයෙන් හමුදා අධිකරණ වලට අධිකරණ බලය තිබෙන අතර මෙම හමුදා අධිකරණ වල නෛතික භාවය ජාත්‍යන්තර මානුෂීය නීතිය ට අදාළ බොහෝ ජාත්‍යන්තර ආයතන, ජිනීවා සම්මුතිය මෙන්ම හේග් සම්මුතිය විසින් ද පිළිගෙන තිබේ. පංච පුද්ගල විමර්ශන කොමිෂන් සභාව මේජර් ජෙනරාල් වරයෙක් ගේ මූලිකත්වයෙන් රැස්විය.

උගත් පාඩම් සහ ප්‍රතිසන්ධාන කොමිෂන් සභාවේ නිර්දේශ ක්‍රියාත්මක කිරීම සඳහා වන ජාතික ක්‍රියකාරී සැළැස්ම දියත් කිරීමට මාස හතකට පමණ පෙර ඉහත ක්‍රියාකාරිත්වය ආරම්භ විය. විමර්ශන කොමිෂන් සභාවේ පළමු කොටස (අර්බුදයේ පළමු අදියර තුළ සිවිල් ජනතාවට හානි සිදුවූ බවට කෙරෙන චෝදනා) අවසන් වූ අතර විමර්ශන කොමිෂන් සභාවේ වාර්තාව යුධ හමුදාපතිවරයාට 2013 පෙබරවාරි 15 දින භාර දෙන ලදී. විමර්ශන කොමිෂන් සභාවේ වාර්තාව සංවේදී තොරතුරු ඇතුළත් ලේඛනයක් වුවද වෙනත් දෙවල් වලට අමතරව එම සොයාගැනීම් වල සාරාංශයක් මාර්ගගත ආකාරයට ලබා ගැනීමට හැකියාව ලබා දී තිබේ.

අ. මානුෂීය මෙහෙයුම පැවැත්වූ සියළුම අදියර වලදී ශ්‍රී ලංකා හමුදාව ඉතාම විනය ගරුක යුධ හමුදාවක් ලෙස ජාත්‍යන්තර මානුෂීය නීතිය සහ යුධ නීතිය අනුගමනය කරමින් සිවිල් ජනතාවට විය හැකි හානි වැළැක්වීමට සියළු පියවර ගනිමින් කටයුතු කළ බව සාක්ෂි වලින් පෙනී යයි. යටත්වූවන් සහ අල්ලාගන්නා ලද එල්.ටී.ටී.ඊ. සංවිධානයේ සාමාජිකයන් ද ඇතුළුව, ශ්‍රී ලංකා හමුදාවේ පාලනය යටතට පත් වූ සියළු දෙනා ට ජාත්‍යන්තර මානුෂීය නීතියට අනුව මානුෂීය ආකාරයෙන් සළකා තිබේ. සිවිල් වැසියන් මිනිස් පළිහක් ලෙස යොදා ගැනීම, හමුදා ප්‍රදේශ වලට පැන යාමට උත්සාහ කළ සිවිල් වැසියන් වගවිභාගයකින් තොරව සාතනය කිරීම, සටන් සඳහා දරුවන් බලහත්කාරයෙන් බඳවා ගැනීම වැනි එල්.ටී.ටී.ඊ. ත්‍රස්තවාදීන් විසින් සිදුකරන ලද යුධ අපරාධ ද මෙම විමර්ශනයේ දී හෙළි විය. එල්.ටී.ටී.ඊ. ත්‍රස්තවාදීන් විසින් සිදුකරන ලද යුධ අපරාධ වැළැක්වීමට ජාත්‍යන්තර ප්‍රජාවට නොහැකි වූ බවද අධිකරණයේ අවධානයට ලක් විය.

ආ. උගත් පාඩම් සහ ප්‍රතිසන්ධාන කොමිෂන් සභාවේ වාර්තාවේ සඳහන් වන ෂෙල් ප්‍රහාර එල්ල කිරීම ශ්‍රී ලංකා හමුදාව විසින් සිදු කරන ලද්දක් නොවන බවත් සිවිල් ජනතාවට සිදුවූ හානි එල්.ටී.ටී.ඊ. සංවිධානයේ නීති විරෝධී කටයුතු නිසා සිදුවන්නට හැකි බවත් ඉදිරිපත් කරන ලද සාක්ෂි වලින් මෙම ජනාධිපති විමර්ශන කොමිෂන් සභාව අවසන් නිගමනයකට එළඹ තිබේ. මෙම සිද්ධි වලට හමුදා පාලනය යටතේ තිබූ ප්‍රදේශ වලට පැනයන සිවිල් වැසියන්ට වෙඩි තැබීම, මනා පුහුණුවක් නැති එල්.ටී.ටී.ඊ. සංවිධානයේ තුවක්කුකරුවන් විසින් සිවිල් වැසියන් සිටින ප්‍රදේශ වලට කාලතුවක්කු ප්‍රහාර එල්ල කිරීම, එල්.ටී.ටී.ඊ. සංවිධානය විසින් නීත්‍යානුකූල නොවන මූලාශ්‍රවලින් ලබා ගත් බාල වර්ගයේ කාලතුවක්කු උණ්ඩ යොදා ගැනීම, සටන් සඳහා

එල්.ටී.ටී.ඊ. සංවිධානය විසින් බලහත්කාරයෙන් ළමයින් සහ වැඩිහිටියන් බඳවා ගැනීමෙන් ඔවුන් අනතුරුදායකත තත්ත්වයන්ට නිරාවරණය කිරීම ආදිය අයත් වේ.

ඇ. විමර්ශන කොමිෂන් සභාව ඉදිරියට ලබා දෙන ලද සාක්ෂි වලින් ශ්‍රී ලංකා හමුදාවෙ සාමාජිකයන්ට කිසිදු චෝදනාවක් එල්ල නොකෙරුණ ද සිවිල් ජනාතවට සිදුවූ හානිය සම්බන්ධයෙන් නිශ්චිත තොරතුරු ලබා දෙමින් යම් කිසි පුද්ගලයෙකු නව සාක්ෂි ලබා දෙන්නේ නම් එම පුද්ගලයන්ට ඔවුන් සතු සාක්ෂි ලබා දීමට අවස්ථාව ලබා දෙමින් එවන් අවස්ථා තව දුරටත් විභාග කරනු ඇත.

වැනල් 4 වීඩියෝ පටයේ නිරවද්‍යභාවය කුමක් වුවත් උගත් පාඩම් සහ ප්‍රතිසන්ධාන කොමිෂන් සභාවේ නිර්දේශ මත ක්‍රිය කරමින් විමර්ශන කොමිෂන් සභාව එහි විධි නියෝගයේ දෙවන කොටස, එනම් වැනල් 4 සිද්ධියේ චෝදනා විමර්ශන කරමින් සිටියි. අල්ලාගත් පුද්ගලයන් නඩු විභාගයකින් තොරව සාතනය කිරීම සම්බන්ධ චෝදනා සම්බන්ධයෙන් දැනට උසාවිය එහි සැකැස්ම සහ විභව සාක්ෂිකරුවන් හඳුනාගැනීම සඳහා ක්ෂේත්‍රයේ විවිධ අණ දෙන නිලධාරීන් සමග සම්මුඛ සාකච්ඡා පවත්වමින් සිටින අතර එය ඉතා වෙහෙසකර කටයුත්තකි. විභව සාක්ෂිකරුවන් හඳුනාගත් පසු ඔවුන්ව විධිමත් ලෙස සාක්ෂිකරුවන් ලෙස කැඳවනු ලැබේ.

ශ්‍රී ලංකා හමුදාව වෙත චෝදනා එල්ල කරන පාර්ශ්වයන් ගෙන් එම විඩියෝ පිටපතෙහි මුල් පිටපත මෙන්ම එම සිද්ධිය වූවායයි පැවසෙන ස්ථානය, දිනය සහ වේලාව මෙන්ම වෙනත් අදාළ තොරතුරු ඉල්ලා සිටියද ඔවුන් ඒවා සැපයීමට අපොහොසත් වීම නිසා මෙම විමර්ශනයේ ප්‍රගතියට බාධා එල්ල වී තිබේ. මෙම අපහසුතා මධ්‍යයේ වුවද විමර්ශන කොමිෂන් සභාව මෙම සිද්ධියේ සත්‍යභාවය තහවුරු කරගැනීමේ ප්‍රයත්නයක නියැලී සිටියි.

එමනිසා, විමර්ශන කොමිෂන් සභාව විසින් ශ්‍රී ලංකා යුධ හමුදාව නිදොස් කිරීමක් සිදුවී තිබේ.

වැනල් 4 චෝදනා සම්බන්ධ විමර්ශනය

671. ජාතික ක්‍රියාකාරී සැළැස්මට අනුව ශ්‍රී ලංකා රජය විසින් ආමන්ත්‍රණය කිරීමට තිබෙන ප්‍රධාන ගැටළු අතර වැනල් 4 වීඩියෝ පටය මගින් ශ්‍රී ලංකා හමුදාවට එල්ල කර තිබෙන චෝදනා දැක්විය හැකිය. උගත් පාඩම් සහ ප්‍රතිසන්ධාන කොමිෂන් සභාව විසින් සත්‍ය ස්ථාපිත කිරීම සඳහා සහ එල්ල කර තිබෙන චෝදනා වල බරපතළ කම මත එම චෝදනා සම්බන්ධයෙන් කටයුතු කිරීම සඳහා ස්වාධීන විමර්ශනයක් ආරම්භ කිරීම නිර්දේශ කර තිබේ. එම වීඩියෝ පටයේ නිරවද්‍යතාව පිළිබඳ තහවුරු කර ගැනීම සඳහා තක්සේරුවක් සිදු කිරීමේ අවශ්‍යතාව ජාතික ක්‍රියාකාරී සැළැස්ම මගින් පිළිගනු ලබයි. එය 2013 පෙබරවාරි 15 දින යුධ හමුදාව වෙත භාර දෙන ලද වාර්තාවත් සමග යුධ හමුදා අධිකරණය මගින් සිදු කරන ලදී.

672. උගත් පාඩම් සහ ප්‍රතිසන්ධාන කොමිෂන් සභාවේ නිර්දේශ මත සිදු කරන විමර්ශන වලට ඉහත කරන ලද යවත්කාලීන කිරීම් වලින් පෙනෙන පරිදි හමුදා අධිකරණයක උපාංග දෙකක් තිබේ. එහි පළමු කොටස යුද්ධයේ අවසන් අදියර තුළ සිවිල් වැසියන්ට සිදුවූ තුවාල සම්බන්ධයෙන් කටයුතු කරයි. යුධ හමුදා අධිකරණයේ අවසන් නිගමනය වන්නේ ශ්‍රී ලංකා හමුදාව යුධ නීතියට අනුව (ජාත්‍යන්තර මානුෂීය නීතිය) කටයුතු කර තිබෙන බව ය. යටත් වූවන් සම්බන්ධයෙන් කටයුතු කිරීමේ දී ඔවුන්ට මානුෂීය ආකාරයෙන් සැළකූ බවට තහවුරු වී තිබේ. ෂෙල් වෙඩි ප්‍රහාර එල්ල කිරීම සම්බන්ධයෙන් අවසන් නිගමනය වන්නේ එය එල්.ටී.ටී.ඊ. සංවිධානයේ නීතිවිරෝධී ක්‍රියාකාරකම් නිසා සිදුවන්නට ඇති බව ය.

673. කෙසේ වෙතත් පරණගම කොමිෂන් සභාව පෙන්වා දෙන්නේ මෙවන් ස්වාභාවයේ සිද්ධි සම්බන්ධයෙන් යුධ හමුදාවේ විමර්ශන තුළින් විශ්වසනීයත්වය ගොඩ නොනැගෙන බව ය. වැනල් 4 වීඩියෝ පටය සම්බන්ධයෙනුත් පරණගම කොමිෂන් සභාව පෙන්වා දෙන පරිදි

"කිසිවෙකුට තමන් සම්බන්ධ කාරණයක දී විනිශ්චයකාරවරයෙක් විය නොහැකිය" යන සංකල්පය මත යුධ හමුදා අධිකරණයක් යනු එවන් විමර්ශනයක් කිරීම සඳහා වන යෝග්‍ය සංසදයක් නොවිය හැකි ය.[487]

674. චැනල් 4 වීඩියෝ පටය සම්බන්ධයෙන් යුධ හමුදා අධිකරණයේ සොයාගැනීම් වල පිටපතක් ලබා ගැනීමට තමන්ට නොහැකි වූ බව මෙම ජනාධිපති විමර්ශන කොමිෂන් සභාව මීට පෙර දක්වා තිබේ. මෙම පරිච්ඡේදයේ වෙනත් ස්ථානයක දක්වා තිබූ පරිදි මෙම උගත් පාඩම් සහ ප්‍රතිසන්ධාන කොමිෂන් සභාවේ සහ මෙම ජනාධිපති කොමිෂන් සභාවේ නිර්දේශ ස්වාධීන සහ විශ්වසනීය සත්‍ය සෙවීමේ යාන්ත්‍රණයක් වෙත යොමු කිරීම අපගේ වගකීම බව අපේ හැඟීමයි. යටත් වූ හෝ අත්අඩංගුවට ගත් පසුව අතුරුදහන් වූ බවට වාර්තාවන අය සිහිකිරීම යෝග්‍ය වේ. යටත් වූ හෝ අත්අඩංගුවට පත්වූ පුද්ගලයන් අතුරුදහන් වීම සම්බන්ධයෙන් ස්වාධීන විමර්ශනයක් උගත් පාඩම් සහ ප්‍රතිසන්ධාන කොමිෂන් සභාව විශේෂයෙන් ඉල්ලා සිටියි.

675. සත්‍ය සහ ප්‍රතිසන්ධානය පිළබඳ කොමිෂන් සභාව විසින් එවන් විශ්වසනීය සහ ස්වාධීන විමර්ශනයක් සිදුකිරීමෙන් පසුව ශ්‍රී ලංකා හමුදාවේ යම් කිසි පුද්ගලයන් ගේ පාර්ශ්වයෙන් යම් කිසි නීති විරෝධී ක්‍රියාවක් සිදුවී තිබෙන බවට සාක්ෂි හමුවන්නේ නම් වැරදිකරුවන් ඒ සම්බන්ධයෙන් වගවිය යුතුය.

676. උගත් පාඩම් සහ ප්‍රතිසන්ධාන කොමිෂන් සභාවේ සහ පරණගම කොමිෂන් සභාවේ ජාත්‍යන්තර මානුෂීය නීතිය සම්බන්ධ නිර්දේශ ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකා රජය දරන ලද උත්සාහයන් පිළිබඳ අප දැනටමත් අදහස් දක්වා තිබෙන අතර අපගේ සාකච්ඡා තුළින් පැහැදිලි වන්නේ මෙම නිර්දේශ අවංකව ඉදිරියට ගෙන යාමට නම් තවදුරටත් ඉටු කළ යුතු කාරණා රාශියක් තිබෙන බව ය.

677. මානව හිමිකම් සම්බන්ධයෙන් උගත් පාඩම් සහ ප්‍රතිසන්ධාන කොමිෂන් සභාවේ නිර්දේශ අනුව බලන විට ඒවා සමුච්චිත වශයෙන් නීතිය උල්ලංඝනය කිරීම වැළැක්වීම සඳහා වන උත්සාහයක් වශයෙන් රාජ්‍ය ආයතන ශක්තිමත් කිරීමත්, සිවිල් පරිපාලනය තහවුරු කර ශක්තිමත් කිරීමත් සහ බිය සැක නොමැති පරිසරයක ක්‍රියාත්මක වීම සඳහා ඉඩ ලබා දීමත් මගින් පශ්චාත් යුධ අවශ්‍යතා ආමන්ත්‍රණය කරයි. මානව හිමිකම් තේමා ක්ෂේත්‍ර යටතේ යුක්තිය පසිඳලීම, නීතිය ක්‍රියාත්මක කිරීම සහ තම වගකීම් ඉෂ්ට කිරීමේ දී අදාළ ආයතන වල ඵලදායිතාව සම්බන්ධයෙන් උගත් පාඩම් සහ ප්‍රතිසන්ධාන කොමිෂන් සභාවේ යම් නිශ්චිත නිර්දේශ ක්‍රියාත්මක කිරීම සඳහා වන ජාතික ක්‍රියකාරී සැළැස්ම ක්‍රියකාරකම් කිහිපයක් යෝජනා කර තිබේ.

678. මානව හිමිකම් සම්බන්ධ නිර්දේශ රාශියක් අතර 9.48 වෙනි ඡේදය සහ 9.50 වෙනි ඡේදය පූර්වගාමී කොමිෂන් සභාවල නිර්දේශ ක්‍රියාත්මක කිරීමට අමතරව අතුරුදහන් වූ පුද්ගලයන් පිළිබඳ ගැටළුව ආමන්ත්‍රණය කිරීමේදි එය හදිසි කරුණක් ලෙස සළකා ඒ සම්බන්ධව සර්වව්‍යාපී ප්‍රවේශයක් ගෙන තිබේ.

679. ඒ අකාරයෙන්ම උගත් පාඩම් සහ ප්‍රතිසන්ධාන කොමිෂන් සභාවේ වාර්තාවේ 9.51 ඡේදයේ අතුරුදහන් වූ බවට කෙරෙන චෝදනා විමර්ශනය කිරීම සඳහා සහ අපරාධ නඩු ආරම්භ කිරීම සඳහා නීතිපතවරයාට අවශ්‍ය තොරතුරු ලබා දීම පිණිස විශේෂ විමර්ශන කොමසාරිස්වරයෙක් අවශ්‍ය බව පෙන්වා දී තිබේ.

680. උගත් පාඩම් සහ ප්‍රතිසන්ධාන කොමිෂන් සභාව විසින් අතුරුදහන් වූ[488] බවට වන චෝදනා විමර්ශන සඳහා වන විශේෂ කොමසාරිස්වරයෙකුගේ අවශ්‍යතාව මතුකරමින් කරන ලද නිර්දේශය 2013

[487] ජනාධිපති විමර්ශන කොමිෂන් සභාව, 546 ඡේදය සහ අවසන් වාර්තාවේ 3 වන පරිච්ඡේදයේ II කොටස බලන්න.

පරණගම කොමිෂන් සභාව පත් කිරීමෙන් මූලික වශයෙන් සැපිරුණ අතර ඉන් පසු 2014 ජූලි 15 පරණගම කොමිෂන් සභාවේ විධි නියෝගය ජාත්‍යන්තර මානුෂීය නීතිය සහ ජාත්‍යන්තර මානව හිමිකම් නීතිය යටතේ උගත් පාඩම් සහ ප්‍රතිසන්ධාන කොමිෂන් සභාව විසින් වර්ගීකරණය කරන ලද නිර්දේශ ද ඇතුළත්ව කාරණා කිහපයක් විමර්ශන කිරීම සඳහා මෙම ජනාධිපතිවරයාගේ ප්‍රකාශයක් මගින් ඉවැඩි විය.

681. පරණගම කොමිෂන් සභාවේ කාල සීමාව 2015 අගොස්තු 15 දින අවසන් වූ අතර අතුරුදහන් වූවන්ගේ ඉරණම සහ ඔවුන් පිළිබඳ තොරතුරු දැනගැනීමට ඔවුන්ගේ පවුලේ අයට තිබෙන අවශ්‍යතාව වටහාගෙන උගත් පාඩම් සහ ප්‍රතිසන්ධාන කොමිෂන් සභාවෙ නිර්දේශ[489] වලට අනුකූලව අතුරුදහන් වූ පුද්ගලයන් සම්හන්ධ ස්වාධීන කාර්යාලයක් පාර්ලිමේන්තු පනතක් මගින් පිහිටවිය යුතු බවට යෝජනා විය.

682. අතුරුදහන් වූවන් පිළිබඳ කාර්යාලය එක්ස්ත් ජාතීන්ගේ මානව හිමිකම් පිළිබඳ කොමිෂන් සභාවේ "ශ්‍රී ලංකාවේ ප්‍රතිසන්ධානය, වගවීම සහ මානව හිමිකම් ප්‍රවර්ධනය කිරීම"[490] පිළිබඳ 30/1 යෝජනාවෙ හි ද අඩංගු වී තිබුණ බව සඳහන් කළ යුතු ය.

683. මෙම සම අනුග්‍රහය දැක්වූ යෝජනාව පසුව ප්‍රතික්ෂේප කරන ලද නමුත් ශ්‍රී ලංකාව 2016 දී අතුරුදහන් වූවන්ගේ කාර්යාලය පිළිබඳ පනත ක්‍රියාත්මක කිරීමට කටයුතු කරන ලදී.[491]

01. අතුරුදහන්වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය

684. උගත් පාඩම් සහ ප්‍රතිසන්ධාන කොමිෂන් සභාවේ නිර්දේශ මත ශ්‍රී ලංකාවේ දිර්ඝ කාලීන ප්‍රශ්නයක්ව පැවති අතුරුදහන් වූවන්ගේ ගැටළුව විසඳීම සඳහා ශ්‍රී ලංකා රජය 1991 දී පළමුව පියවර ගත් අතර පසුව පරණගම කොමිෂන් සභාව හරහා එම උත්සාහය දියත් කෙරිණි. මෙම සංසිද්ධිය ආමන්ත්‍රණය කිරීම සඳහා මෑතකාලීනව ගත් පියවරක් වනුයේ පූර්වගාමී කොමිෂන් සභාවලින් උගත් පාඩම් මත සහ එක්සත් ජාතීන්ගේ 30/1 යෝජනා ව සම්බන්ධයෙන් ශ්‍රී ලංකා රජය ලබා දී ඇති පොරොන්දු මත 2015 අතුරුදහන් වූවන්ගේ කාර්යාලය සඳහා වන යෝජනාව ක්‍රියාත්මක කිරීමයි.

685. වසර ගණනාවක් තිස්සේ අතීතයේ දී පැවති කොමිෂන් සභා[492] ද අතුරුදහන් වූවන්ට අදාළ කාරණා සම්බන්ධ කටයුතු කිරීම සඳහා කාර්යාලයක් පිහිටුවන ලෙස ශ්‍රී ලංකා රජයට අවධාරණය කර තිබෙන බව පිළිගත යුතු ය. අතුරුදහන්වූ තැනැත්තත් පිළිබඳ කාර්යාලයේ මූලාරම්භය උගත්

---

[488] උගත් පාඩම් සහ ප්‍රතිසන්ධාන කොමිෂන් සභාව 9.51 ඡේදය

[489] උගත් පාඩම් සහ ප්‍රතිසන්ධාන කොමිෂන් සභාව 9.48 සහ 9.50 ඡේද ඒවා එම අවසන් වාර්තාවේ 5.36 සහ 5.38 ඡේද වලට සමාන වේ.

[490] A/HRC/RES/30/1 2015.10.01 දින ඉදිරිපත් කරන ලදී: අදාළ මෙහෙයුම් ඡේදය 4 බලන්න

[491] මෙම ජනාධිපති විමර්ශන කොමිෂන් සභා වාර්තාවේ 1 වන පරිවඡේදයේ මේ පිළිබඳව තිබෙන සාකච්ඡාව බලන්න

[492] "නිරුත්සාහකව පුද්ගලයන් ඉවත් කිරීම" සම්බන්ධයෙන් ශ්‍රී ලංකාවේ ප්‍රථම විමර්ශන කොමිෂන් සභාව 1991 දී විය: පුද්ගලයන් නිරුත්සාහකව ඉවත් කිරීම හෝ අතුරුදහන්වීම සම්බන්ධයෙන් වන විමර්ශන කොමිෂන් සභාව(කළාප කොමිෂන් සභා තුනක්: ශ්‍රී ලංකාවේ විවිධ භූ ගෝලීය කොටස් සඳහා කොමිෂන් සභා තුනක් සහ විමර්ශන පසු විපරම් කිරීම සඳහා දීප ව්‍යාප්ත එක් කොමිෂන් සභාවක්): පැහැරගැනීම් සහ අතුරුදහන්වීම පිළිබඳ පැමිණිලි විමර්ශනය කිරීම සඳහ වන ජනාධිපති විමර්ශන කොමිෂන් සභාව, පරණගම කොමිෂන් සභාව ලෙසද එය හැඳින්වේ: සහ උගත් පාඩම් සහ ප්‍රතිසන්ධාන කොමිෂන් සභාවේ සොයාගැනීම්;

පාඩම් සහ ප්‍රතිසන්ධාන කොමිෂන් සභාවේ නිර්දේශ වලින් මතු වූ අතර එමගින් මේ කාරණය අවසන් කිරීම සඳහා අතුරුදහන්වූවන්ගේ පවුල් වලට අයට අතුරුදහන් වූවන්ගේ ඉරණම සහ ඔවුන් පිළිබඳ තොරතුරු දැනගැනීම තිබෙන අවශ්‍යතාව එයින් අවධාරණය කර තිබේ. පෙර කොටසේ දක්වා තිබූ පරිදි ශ්‍රී ලංකාව තුළ අතුරුදහන් වූවන් පිළිබඳ ගැටළුව ආමන්ත්‍රණය කිරීම සඳහා සර්වව්‍යාපී ප්‍රවේශයක් තිබිය යුතු බවත් නොඑසේ නම් මෙම කාරණය ප්‍රතිසන්ධානය[493] පිළිබඳ සියල්ල ඇතුළත්වන දිගු කාළීන ක්‍රියාවලියකදී බරපතල බාධාවක් වන බවත් උගත් පාඩම් සහ ප්‍රතිසන්ධානය පිළිබඳ කොමිෂන් සභාවේ නිර්දේශ වල සඳහන් වේ.

686. ප්‍රතිසන්ධානය යනු ක්‍රියාවලියකි. අදාළ පුද්ගලයන් ගැටුමේ වින්දිතයන් ද නැත්නම් එල්.ටී.ටී.ඊ. ත්‍රස්තවාදීන්ගේ වින්දිතයන් ද යන්න කුමක් වුවත් එම දීර්ඝ සහ සංකීර්ණ ගමනේ පළමු අපහසු චිත්තවේගික පියවර නිමවීමයි. මෙමගින් ඔවුන්ට වන්දි/හානිපූරණය ඇතුළත්ව යෝග්‍ය නීතිමය ප්‍රතිකර්ම ගැනීමට හැකියාව ලබා දෙයි.[494]

687. අතුරුදහන්වූ තැනැත්තන් පිළිබඳ තොරතුරු සොයා ගැනීමට සහ ඔවුන් නැවත එම පවුල් සමග එක් කිරීම සඳහා නීතිය බලාත්මක කරන ආයතන විසින් අදාළ නියෝජිතායතන, විශේෂයෙන්ම ජාත්‍යන්තර රතු කුරුස සංවිධානය, සමග එක්ව සියළු උත්සාහයන් දැරිය යුතු ය. මේ සම්බන්ධයෙන් අත්කරගන්නා ප්‍රගතිය සම්බන්ධව එම පවුල් දැනුවත් කළ යුතු ය.[495]

688. 2015 සැප්තැම්බර මස එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කවුන්සිලයේ 30 වන සැසිවාරයේදී ශ්‍රී ලංකා රජය යෝජනාවක් බවට පත්කෙරෙන සංක්‍රාන්ති යුක්තිය පිළිබඳ ආයතන හතරක් පිහිටුවීම සඳහා යෝජනා කරන ලදී.[496] මෙම යාන්ත්‍රණයන් හතරට අතුරුදහන්වූවන්ගේ කාර්යාලය, හානිපූරණ කාර්යාලය, සත්‍ය, යුක්තිය, ප්‍රතිසන්ධානය සහ නැවත ඇති නොවීම පිළිබඳ කොමිෂන් සභාව සහ විශේෂ අධිකරණයක් සහ විශේෂ කවුන්සිලයක් සඳහා වන කාර්යාලයකින් සමන්විත වන අධිකරණ යාන්ත්‍රණයක් ඇතුළත් වේ.

689. කෙසේ වෙතත් 2015 සැප්තැම්බර් මස අතුරුදහන් වූවන් පිළිබඳ කාර්යාලයක් ස්ථාපිත කිරීම සඳහා ආණ්ඩුව පොරොන්දු වන්නේ උගත් පාඩම් සහ ප්‍රතිසන්ධානය පිළිබඳ කොමිෂන් සභාවේ නිර්දේශ වලට අනුව ය.

690. 2017 අංක 9 දරන පනත මගින් සංශෝධනය කරන ලද 2016 අංක 14 දරන අතුරුදහන්වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය (පිහිටුවීම, පරිපාලනය කිරීම සහ කර්තව්‍ය ඉටු කිරීම) පනත, සංක්‍රාන්ති යුක්තියේ එක් ස්ථම්භයක් වන සත්‍ය සෙවීම යන කාරණ සම්බන්ධයෙන් ගත් ප්‍රශංසනීය උත්සාහයක් ලෙස සැළකිය යුතු ය. වර්තමාන මෙහෙයුම් සම්බන්ධයෙන් සහ කාර්යාලයේ වැඩකටයුතු පිළිබඳ අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයේ සභාපති ගේ සාක්ෂි ලබාගත් පසු සහ මෙම මෙම ජනාධිපති විමර්ශන කොමිෂන් සභාව විසින් අතුරුදහන් වූවන් පිළිබඳ කරන ලද පැමිණිලි සම්බන්ධයෙන් සහාය ලබා ගැනීම සඳහා ඒ වෙත යොමු කරන ලද අතිවිශාල සාක්ෂිකරුවන් පිළිබඳ සළකා බැලීමෙන් පසු අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය පනත් කෙටුම්පතේ විෂය පථය සහ එහි විෂය සීමාව සම්බන්ධයෙන් කටයුතු කිරීමට අදාළ එහි කැපී පෙනෙන ප්‍රතිපාදන පිළිබඳවත් විශ්ලේෂණයක් සිදු කර මෙම වැදගත් සත්‍ය

---

[493] උගත් පාඩම් සහ ප්‍රතිසන්ධාන කොමිෂන් සභාවේ 5.36 සහ 9.48 ඡේද

[494] උගත් පාඩම් සහ ප්‍රතිසන්ධාන කොමිෂන් සභාවේ 5.38 සහ 9.50 ඡේද

[495] උගත් පාඩම් සහ ප්‍රතිසන්ධාන කොමිෂන් සභාවේ 5.38 සහ 9.50 ඡේද

[496] මානව හිමිකම් කවුන්සිලය A/HRC/RES/30/1 "ශ්‍රී ලංකාවේ ප්‍රතිසන්ධානය, වගවීම සහ මානව හිමිකම් ප්‍රවර්ධනය කිරීම" 2015 ඔක්තෝබර් 14

සෙවීමේ යාන්ත්‍රණය සම්බන්ධයෙන් අපගේ නිරීක්ෂණ සහ අදහස් දැක්වීමට මෙම ජනාධිපති විමර්ශන කොමිෂන් සභාව අදහස් කරයි.

691. අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය බලාත්මක කරන ලද්දේ 2016 අගෝස්තු 23 වෙනිදා සිට වුවද එම ආයතනය තම මෙහෙයුම් ආරම්භ කරන ලද්දේ ව්‍යවස්ථාදායක සභාවේ නිර්දේශ වලට අනුව කොමසාරිස්වරු හත් දෙනෙක් පත් කිරීමෙන් පසු 2018 පෙබරවාරි 28 වන දින සිට වේ.

692. අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ ගැටළුව ශ්‍රී ලංකාවට පමණක් අදාළ වූවක් නොවේ. ස්ත්‍රී පුරුෂ භාවය, වයස, වාර්ගිකත්වය හෝ අධ්‍යාපනික පසුබිම කුමක් වුවත් විවිධ හේතු නිසා පුද්ගලයන් අතුරුදහන් වීම සිදු වන අතර පශ්චාත් ගැටුම් සහිත සමාජවල විශේෂයෙන්ම, එය ප්‍රමාණවත් පරිදි ආමන්ත්‍රණය කළ යුතු ගැටළුවක් ලෙස වන පිළිගැනීම ඉහළ ගොස් තිබේ.[497] අතුරුදහන්වූ තැනැත්තන් පිළිබඳ ගැටළුව සම්බන්ධයෙන් කටයුතු කිරීම සඳහා කාර්යාල, ඒකක සහ කොමිෂන් සභා පිහිටවූ රටවල් අතර විශේෂයෙන්ම පශ්චාත් ගැටුම් සහිත රටවල් බොහොමයක් අතර ශ්‍රී ලංකාව එක් රටකි.

693. අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය සත්‍ය දැනගැනීම සඳහා වින්දිතයන් සතු අයිතිය මත පදනම් වේ. මෙම නීතිය මගින් පිහිටුවන අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයෙන් අපේක්ෂා කරන්නේ අතුරුදහන් වූවන් පිළිබඳ සොයා බලා ඔවුන් හඳුනාගෙන ඔවුන්ගේ අතුරුදහන් වීම සහ ඉරණම සම්බන්ධයෙන් හේතුවූ සාධක පැහැදිලි කර ගැනීමයි. මෙම වැදගත් අරමුණු තුළින් මෙහෙයවීමෙන් අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය තම රජකාරියේ සක්‍රිය ලෙස යෙදෙමින් එම කාර්යාලයේ වර්තමාන වැඩ කටයුතු පිළිබඳව අතුරුදහන් වූ තැනැත්තන්ගේ කාර්යාලයේ අධ්‍යක්ෂ ජෙනරාල් මාර්ගයෙන් මෙම ජනාධිපති විමර්ශන කොමිෂන් සභාවට සහ සිවිල් සේවා සංවිධාන වලට අවශ්‍ය තොරතුරු ලබා දෙමින් සිටියි.

අතුරුදහන් වූ තැනැත්තෙකු යනු කවුද?

694. "අතුරුදහන් වූ තැනැත්තා"[498] යන්නෙන්, යම් තැනැත්තෙකුගේ ඉරණම හෝ සිටින ස්ථානය සාධාරණ ලෙස නොදන්නා බවට විශ්වාස කරනු ලබන්නා වූද ඒ තැනැත්තා ගණනය නොවූ බවට සහ අතුරුදහන් වූ බවට සාධාරණ ලෙස විශ්වාස කරනු ලබන්නා වූ ද:

(i) ක්‍රියාන්විතයේදී අතුරුදහන් වූ සන්නද්ධ හමුදාවල සාමාජිකයෙකු හෝ පොලිසියේ සාමාජිකයෙකු ඇතුළු උතුරු නැගෙනහිර පළාත්වල සිදු වූ සන්නද්ධ ගැටුම් අතරතුර හෝ එහි ප්‍රතිඵලයක් ලෙස නැතහොත් එම සන්නද්ධ ගැටුම්වලට පසුව "යුද්ධයේ දී අතුරුදහන් වූ තැනැත්තෙකු" ලෙස හඳුන්වනු ලබන තැනැත්තෙකු ; හෝ

(ii) දේශපාලන නොසන්සුන්තාවයක් සම්බන්ධයෙන් හෝ සිවිල් කැරළි කෝලාහල සම්බන්ධයෙන්; හෝ

(iii) "බලහත්කාරයෙන් අතුරුදහන් කිරීම් වලින් සියලු තැනැත්තන් ආරක්ෂා කිරීම සඳහා වූ ජාත්‍යන්තර සම්මුතියෙහි" බලහත්කාරයෙන් අතුරුදහන් කරවීම යනුවෙන් අර්ථ නිරූපණය කර ඇත්තාවූ ද තැනැත්තෙකු වේ.

---

[497] ජාත්‍යන්තර රතු කුරුස සංවිධානය සහ අන්තර් පාර්ලිමේන්තු සංසදය, අතුරුදහන් වූ තැනැත්තන්: පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් සඳහා වන අත්පොත, 2009 (පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් සඳහා වන අත්පොත)

[498] අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ පනත 27 කොටස

695. ඒ අනුව, මෙම පනත අදාළ වන්නේ ශ්‍රී ලංකාවේ ජාත්‍යන්තර නොවන සන්නද්ධ අරගලයට සම්බන්ධව අතුරුදහන් වූ පුද්ගලයන්ට; දේශපාලන නොඝන්සුන්තාව හෝ සිවිල් කැරලි කෝළාහල නිසා හෝ බලහත්කාරයෙන් කරන ලද අතුරුදහන්වීම් සම්බන්ධයෙන් වේ. මෙහි එක් වැදගත් ලක්ෂණයක් වන්නේ එහි අධිකරණ බලය සම්බන්ධයෙන් නිශ්චිත කාල සීමාවක් නොමැති වීම වන අතර එම නිසා අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳව එම තැනැත්තන් අතුරුදහන් වූ කාලය පිළිබඳ නොසලකා ඒ සම්බන්ධයෙන් විමර්ශන කළ හැකිය.

696. අතුරු දහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයට අතුරුදහන් වූ පුද්ගලයාගේ ඥාතියෙක් හෝ එම අතුරුදහන් වූ පුද්ගලයාට අදාළ වෙන යම් පුද්ගලයෙක් හෝ සංවිධානයක් විසින් ලබා දෙන පැමිණිලි එම අතුරුදහන් වූ පුද්ගලයා අතුරුදහන් වූ කාලය පිළිබඳ නොසළකා බාර ගැනීමට බලය තිබේ.[499]

697. සියළුම පුද්ගලයන් බලහත්කාරයෙන් අතුරුදහන් වීමෙන් ආරක්ෂා කර ගැනීම සඳහා වන ජාත්‍යන්තර සම්මුතියෙහි නිර්වචනය කර තිබෙන ආකාරයට බලහත්කාරයෙන් පැහැරගැනීමක් නිසා අතුරුදහන් වන පුද්ගලයෙක් සම්බන්ධ නිර්වචනය අතුරුදහන් වූ පුද්ගලයා යන්න නිර්වචනය කරන බව සැළකිය යුතුය.

698. බලහත්කාරයෙන් අතුරුදහන්කරවීම යන නිර්වචනයට සියළුම අතුරුදහන් වූ පුද්ගලයන් ඇතුළත් නොවන අතර එයින් ආවරණය වන්නේ:

> *"රජයේ නියෝජිතයන් හෝ රජය විසින් බලය, සහාය හෝ අනුඥානුමතිය ලබා දීම මත කටයුතු කරන පුද්ගලයන් හෝ පුද්ගල කණ්ඩායම් යම් අතුරුදහන් වූ පුද්ගලයෙක් සම්බන්ධයෙන් නිදහසක් ලබා නොදීම නොපිළිගැනීමෙන් හෝ එම පුද්ගලයාගේ ඉරණම හෝ සිටින ස්ථානය සැඟවීමෙන් හෝ එම පුද්ගලයා නීතියේ ආරක්ෂාවෙන් බැහැර වන තත්ත්වයක තබමින් කරන අත්අඩංගුවට ගැනීම්, පැහැරගැනීම් හෝ වෙනත් ආකාරයක නිදහස අහිමි කිරීම වේ."*[500]

699. නීති විරෝධී සන්නද්ධ කණ්ඩායම් ද ඇතුළු රාජ්‍ය නොවන වෙනත් පුද්ගලයන් විසින් යම් පැහැරගැනිමක් සිදු කළ විට එම තත්ත්වය ආවරණය කිරීම සඳහා එම නිර්වචනය ප්‍රමාණවත් නොවේ.

700. . සියළුම පුද්ගලයන් බලහත්කාරයෙන් අතුරුදහන් වීමෙන් ආරක්ෂා කර ගැනීම සඳහා වන ජාත්‍යන්තර සම්මුතියෙහි තිබෙන ප්‍රතිපාදන 2018 අංක 5 දරන සියළු පුද්ගලයන් බලහත්කාරයෙන් අතුරුදහන් කරවීමෙන් ආරක්ෂා කිරීම සඳහා වන ජාත්‍යන්තර සම්මුතිය ("බලහත්කාරයෙන් අතුරුදහන් කරවීමේ පනත") බලාත්මක කිරීමෙන් සම්පූර්ණයෙන්ම දේශීය නීතියට අන්තර්ග්‍රහණය කර තිබේ. මෙම පනත මගින් බලහත්කාරයෙන් අතුරුදහන් කරවීම අපරාධ වරදක් බවට පත් කර තිබෙන අතර එමගින් විත්දිතයන්ගේ පවුල්වලට ඵලදායි ප්‍රතිකර්ම වෙත යොමු වීමටත්, වන්දි සහ විත්දිතයන් සිටින ස්ථාන පිළිබඳ තොරතුරු ලබා ගැනීමටත් අවස්ථාව ලබා දෙයි.

අතුරුදහන් වූ තැනැත්තන්ගේ කාර්යාලයේ කාර්ය භාරය

701. මෙම පනත බලාත්මක කිරීම සඳහා මග පෙන්වූ ව්‍යවස්ථාමය පසුබිම අනුව මෙම පනතේ පූර්විකාවේ මෙසේ සඳහන් වේ:

---

[499] අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ පනත 12 (අ)

[500] සියළුම පුද්ගලයන් බලහත්කාරයෙන් අතුරුදහන් වීමෙන් ආරක්ෂා කර ගැනීම සඳහා වන ජාත්‍යන්තර සම්මුතිය 2 නියාමිතය

අ) පැහැරගෙන යාමේ දී අතුරුදහන් වූ තැනැත්තන් ද ඇතුළුව පුද්ගලයන් අතුරුදහන් වීමේ සිද්ධි වාර්තා වී තිබේ,

ආ) ක්‍රියාන්විතයේදී අතුරුදහන් වූ තැනැත්තන් ඇතුළුව සටන්වලදී හෝ අන්‍යාකාරයකින් සන්නද්ධ ගැටුම්වලට අදාළව අතුරුදහන් වූ තැනැත්තන්;

ඇ) අතුරුදහන් වූ තැනැත්තන් එසේ අතුරුදහන් වූ අවස්ථානුගත කරුණු පිළිබඳව සහ ඔවුන්ගේ ඉරණම සහ ඔවුන් සිටින ස්ථාන පිළිබඳව දැනගැනීමට අතුරුදහන්වූ තැනැත්තන්ගේ ඥාතීන්ට හිමිකම ඇත.

ඈ) අතුරුදහන්වූ තැනැත්තන් සෙවීම සහ ඔවුන් පිළිබඳව සොයා ගැනීමට අවශ්‍ය සියලු පියවර ගැනීම සඳහා ද අතුරුදහන්වූ තැනැත්තන්ගේ සහ ඔවුන්ගේ ඥාතීන්ගේ අයිතිවාසිකම් සහ බැඳියා ආරක්ෂා කිරීම සඳහා ද මෙවැනි සිදුවීම් නැවත සිදුවීම වැළැක්වීම සඳහා ද අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයක් පිහිටුවීම අවශ්‍ය වේ.

702. මෙම පනතේ පූර්විකාවේ සඳහන් වන කාරණය සාක්ෂාත් කරගැනීම සඳහා 2016 අංක 14 දරන පනතේ 2 වෙනි වගන්තිය යටතේ ‘‘අවශ්‍ය සියළු ක්‍රියාමාර්ග ගත් බවට සහතික කිරීම සඳහා’’ වන අරමුණු දක්වා තිබේ. ඒවා නම් -

(අ) අතුරුදහන් වූ තැනැත්තන් සෙවීම සහ ඔවුන් පිළිබඳව සොයාගැනීම සඳහා උචිත යාන්ත්‍රණ පිහිටුවීම සහ එම තැනැත්තන් අතුරුදහන් වූ අවස්ථානුගත කරුණු සහ ඔවුන්ගේ ඉරණම පැහැදිලි කර ගැනීම;

(ආ) මේ පනතේ අර්ථානුකූලව "අතුරුදහන් වූ තැනැත්තන්’’ ලෙස නිර්වචනය වී ඇති පුද්ගලයන් අතුරුදහන්වීමේ සිද්ධීන් අඩු කිරීම සඳහා අදාළ බලධාරීන්ට නිර්දේශ ඉදිරිපත් කිරීම;

(ඇ) මේ පනතේ විධිවිධාන සළසා ඇති පරිදි අතුරුදහන්වූ තැනැත්තන්ගේ සහ ඔවුන්ගේ ඥාතීන්ගේ අයිතිවාසිකම් සහ බැඳියා ආරක්ෂා කිරීම;

(ඈ) අතුරුදහන් වූ තැනැත්තන් හෝ ඔවුන්ගේ ඥාතීන්ට ප්‍රවේශ විය හැකි සහන ලබා ගැනීමේ නිසි මාර්ග හඳුනාගැනීම:

703. අතුරුදහන් වූවන් පිළිබඳ කාර්යාලය යනු අතුරුදහන් වූ පුද්ගලයන් අතුරුදහන් වීමට හේතුවූ කාරණා පිළිබඳ පැහැදිලි කරමින් සත්‍ය සෙවීමට උත්සාහ කරන සංක්‍රාන්ති යුක්තිය පිළිබඳ යාන්ත්‍රණයේ කොටසක් වන බව පැහැදිලි වන අතර අතුරුදහන් වූවන් පිළිබඳ කාර්යාලයේ විධි නියෝගය වන්නේ හානි පූරණය සඳහා පහසුකම් සැළසීමත් නැවත ඇතිවීම වැළැක්වීමත් ය. මේ හේතුව නිසා අතුරුදහන් වූවන්ගේ පවුල් වලට සහ නෑදෑයන්ට සහාය දීම සඳහා අතුරුදහන් වූවන්ගේ කාර්යාලය හානිපූරණ කාර්යාලය සමග වඩා සාමූහිකත්වයෙන් යුතුව කටයුතු කිරීම අපේක්ෂා කරන්නේ මේ නිසා ය. අතුරුදහන් වූවන් පිළිබඳ කාර්යාලය විවිධ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස වලට සම්බන්ධව කටයුතු කරන සමාජ සේවා ශ්‍රම බලකාය හෝ ජාතික ඒකාබද්ධතා සහ ප්‍රතිසන්ධාන කාර්යාලය සහ අනෙකුත් නියෝජිතායතන සමග අඛණ්ඩ සම්බන්ධතාවක් පවත්වාගනිමින් කටයුතු කළ යුතු ය.

704. අතුරුදහන් වූවන් පිළිබඳ කාර්යාලයේ 27 වන වගන්තියෙහි ප්‍රකාශ කරන පරිදි අතුරුදන් වූ තැනැත්තන්ට අදාළව "අතුරුදන් වූ තැනැත්තාගේ ඥාතියා’’ යන්නට පහත තැනැත්තන් ඇතුළත් විය යුතු ය:

(i) කලත්‍රයා

(ii) දරුකමට හදාගත් ළමයින්, විවාහ නොවූ දෙමාපියන්ගේ ළමයින් හෝ සුළු දරුවන්

(iii) (සුළු මව, සුළු පියා, දරුකමට හදා ගැනීමට ලබා ගත් තැනැත්තා ඇතුළු) දෙමාපියන්;

(iv) පූර්ණ හෝ අර්ධ සහෝදරයා හෝ සහෝදරිය නැතහොත් දරුකමට හදාගත් සහෝදරයන් හෝ සහෝදරියන්;

(v) නැන්දණිය/ මාමණ්ඩිය, මස්සිනා/ නැනා, බෑණාවරුන් සහ ලේලිවරුන්;

(iv) මුණුබුරන් සහ මිණිබිරියන්

අතුරුදහන් වූවන් පිළිබඳ කාර්යාලයේ සංයුතිය

705. අතුරුදහන් වූවන් පිළිබඳ කාර්යාලයේ සංයුතිය සාමාජියන් හත් දෙනෙක් ගෙන් සමන්විත වන අතර ඉන් එක් අයෙක් සභාපති ලෙස කටයුතු කරයි. සභාපතිවරයාගේ කාර්යයට ප්‍රධාන විධායක නිලධාරි ලෙස කටයුත්ත කිරීමද අදාළ වේ. අතුරුදහන් වූවන් පිළිබඳ කාර්යාලයේ රැස්වීම් වලදී සභාපතිවරයා මුලසුන ගන්නා අතර තීරක ඡන්දයක් ඔහු සතු වේ. රැස්වීමේ ගණපූරණය සාමාජිකයන් හතර දෙනෙකි. ව්‍යවස්ථාදායක සභාවේ යෝජනාව මත ශ්‍රී ලංකාවේ ජනාධිපතිවරයා විසින් ඔවුන්ව වසර තුනක ධුර කාලයකට පත් කරනු ලැබේ.

අතුරුදහන් වූවන් පිළිබඳ කාර්යාලයේ සාමාන්‍ය බලතල

706. අතුරුදහන් වූවන් පිළිබඳ කාර්යාලය පනතේ 2017 අංක 9 දරන පනතින් සංශෝධනය කළ පරිදි 11 වෙනි වගන්තියේ පහත සඳහන් පොදු බලතල දක්වා තිබේ.

අ) අතුරුදහන් වූවන් පිළිබඳ කාර්යාලයේ කටයුතු ඵලදායී ලෙස සිදු කිරීම සඳහා රීති සකස් කිරීම.

ආ) අතුරුදහන් වූවන් පිළිබඳ කාර්යාලයේ බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමට සහ ඉටු කිරීමට අදාළව අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයේ සියලු කාර්ය මණ්ඩලය විසින් අනුගමනය කළ යුතු ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ සංවේදී ප්‍රතිපත්ති ඇතුළු රීති සහ මාර්ගෝපදේශ කලින් කල නිකුත් කිරීම.

ඇ) කාර්ය මණ්ඩලය සහ උපදේශකයින් පත් කිරීම සහ සේවයෙන් ඉවත් කිරීම සහ රජයේ සේවකයන් අතුරුදහන් වූවන් පිළිබඳ කාර්යාලයට අනුයුක්ත පදනම මත පත්කිරීම සඳහා ඉල්ලා සිටීම;

ඈ) මේ පනතේ විශේෂයෙන් සඳහන් ඒකක සහ අංශ වලට අමතරව අතුරුදහන් වූවන් පිළිබඳ කාර්යාලයේ මනා පරිපාලනය සහ ක්‍රියාකාරිත්වය සඳහා අවශය කමිටු සහ/ හෝ ඒකක කලින් කල පිහිටුවීම සහ එම කාර්යාලයේ බලතල සහ කර්තව්‍ය එම කමිටුවලට අංශවලට සහ ඒකකවලට පවරා දීමේ බලය.

707. මෙම පනතේ 11 වගන්තිය අනුව අතුරුදහන් වූවන් පිළිබඳ කාර්යාලය තම සෙවීමේ මෙහෙයුම් නිර්ණායක 2019 ජූලි 24 වන දිනැති අංක 2133/36 දරන ගැසට් නිවේදනයේ ප්‍රකාශයට පත් කර තිබෙන අතර එමගින් යම් කිසි රඳවාතබා ගැනීමේ ස්ථානයක් පිළිබඳ සෙවීමක් 12(ඊ) වගන්තිය යටතේ ඒ සම්බන්ධයෙන් බලය පවරන ලද නිළධාරියෙකු මාර්ගයෙන් සිදු කරනෙන් කෙසේද යන්න දක්වා තිබේ. අතුරුදහන් වූවන් පිළිබඳ කාර්යාලය විමර්ශන සහ තාක්ෂණික කටයුතු මෙන්ම මිනිස් ශරීර ගොඩගැනීම නියාමනය කිරීම සඳහා වන ප්‍රමිතීන් ඵලදායී ලෙස සිදුකිරීම

සඳහා එහි පාලක සභාව තවදුරටත් රීති සහ මෙහෙයුම් නිර්ණායක සකස් කර තිබෙන බව මෙම ජනාධිපති විමර්ශන කොමිෂන් සභාව වෙත දන්වා කිබේ.

708. මෙම පනතේ 11(ඉ) වගන්තිය යටතේ මෙහි බලතල තවදුරටත් වැඩිදියුණු කිරීම සඳහා අතුරුදහන් වූවන් පිළිබඳ කාර්යාලයේ කර්තව්‍යන් සිදුකිරීම පිණිස පහත සඳහන් ඒකක පිහිටුවීම මගින් 2022 සිට කටයුතු කර තිබේ.

1. ආරක්ෂණ ඒකකය
2. නීති, ප්‍රතිපත්ති සහ පර්යේෂණ ඒකකය
3. වින්දිත සහ පවුල් සහාය ඒකකය
4. දත්ත කළමනාකරණ ඒකකය
5. මූල්‍ය සහ ප්‍රසම්පාදන ඒකකය
6. මානව හිමිකම් සහ පරිපාලන ඒකකය
7. සෙවීම් ඒකකය

709. අතුරුදහන් වූවන් පිළිබඳව සෙවීම සහ හෝඩුවාවන් ලබාගැනීම සහ අතුරුදහන්වීමට හේතුවූ සංසිද්ධීන් පැහැදිලි කර ගැනීම සඳහා අධිකරණ වෛද්‍ය අංශයක් මෙම වැදගත් විධි නියෝගය තුළ අත්‍යවශ්‍ය අංගයක් බව මෙම ජනාධිපති විමර්ශන කොමිෂන් සභාව මතු කර දක්වන අතර එවන් අධිකරණ වෛද්‍ය අංශයක් ස්ථාපිත කිරීම සම්බන්ධයෙන් නගන ලද ප්‍රශ්නට පිළිතුරු වශයෙන් අතුරුදහන් වූවන් පිළිබඳ කාර්යාලයේ කටයුතු සම්බන්ධයෙන් අධිකරණ වෛද්‍ය අංශයක් නීති, ප්‍රතිපත්ති සහ පර්යේෂණ අංශය තුළ පවතින බව මෙම ජනාධිපති විමර්ශන කොමිෂන් සභාව වෙත දැනුම් දෙන ලදී. ශ්‍රී ලංකාවේ අතුරුදහන් වූවන් පිළිබඳ කාර්යාලයට ජාත්‍යන්තර සහාය සහ නිපුණත්වය සහිත විශේෂිත අධිකරණ වෛද්‍ය අංශයක් තිබිය යුතු බව මෙම ජනාධිපති විමර්ශන කොමිෂන් සභාවේ මතය වන අතර කාබන් දින වකවානු ලබා ගැනීම සහ ඩී.එන්.ඒ. සම්බන්ධ කටයුතු මෙම තීරණාත්මක අවස්ථාවේ දී මහහැරිය නොහැකි නිසා අධිකරණ වෛද්‍ය ඒකකයක දැඩි අවශ්‍යතාව මෙම ජනාධිපති විමර්ශන කොමිෂන් සභාව අවධාරණය කරන අතර එමගින් අතුරුදහන් වූවන් පිළිබඳ කාර්යාලයේ වැඩකටයුතු වඩා ඵලදායී සහ වින්දිත කේන්ද්‍රීයව සිදු කිරීමට අවස්ථාව සළසනු ඇත.[501]

අතුරුදහන් වූවන් පිළිබඳ කාර්යාලයේ විධි නියෝගය

710. 11 වෙනි වගන්තියේ විශේෂිතව දක්වා ඇති එහි සමාන්‍ය බලතල වලට අමතරව අතුරුදහන් වූවන් පිළිබඳ කාර්යාලයේ විධිනියෝගය ඉතා පැහැදිලිව අතුරුදහන් වූවන් පිළිබඳ කාර්යාලය පනතේ 10 වෙනි වගන්තියේ පහත ආකාරයෙන් දක්වා තිබේ.

අතුරුදහන් වූ තැනැත්තන් සෙවීම සහ සොයාගැනීමට සහ ඒ සඳහා උචිත යාන්ත්‍රණ හඳුනාගැනීම සහ එම තැනැත්තන් අතුරුදහන්වූ අවස්ථානුගත කරුණු සහ ඔවුන්ගේ ඉරණම පැහැදිලි කිරීම;

(අ) අතුරුදහන් වූ තැනැත්තන් සම්බන්ධ සිදුවීම් පිළිබඳව නිසි ක්‍රියාමාර්ග ගැනීම පිණිස අදාළ බලධාරීන් වෙත නිර්දේශ ඉදිරිපත් කිරීම;

---

[501] කාත්තන්කුඩි සහ කලවංචිකුඩි සමූහ මිනිවලවල් සම්බන්ධ සාක්ෂිකරුවන්ගේ සාක්ෂි බලන්න- මෙහි අවසන් වාර්තාවේ 4 වන පරිච්ඡේදය

(ආ) මේ පනතේ විධිවිධාන සලසා ඇති පරිදි අතුරුදහන්වූ තැනැත්තන්ගේ සහ ඔවුන්ගේ ඥාතීන්ගේ අයිතිවාසිකම් සහ බැඳියා ආරක්ෂා කිරීම;

ඇ) අතුරුදහන් වූ තැනැත්තන්ට සහ ඔවුන්ගේ ඥාතීන්ට ලබා ගැනීමට හිමිකම් ඇති සහන මාර්ග හඳුනාගැනීම සහ එවැනි මාර්ග පිළිබඳව එම අතුරුදහන් වූ තැනැත්තන්ට (ජීවත්ව සිටියදී සොයාගනු ලැබුවහොත්) හෝ ඥාතීන්ට දැනුම් දීම;

ඉ) වෙනත් ආයතන, සංවිධාන, රජයේ දෙපාර්තමේන්තු සහ පරීක්ෂණ කොමිෂන් සභා සහ විශේෂයෙන් මෙම ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභා විසින් දැනට සිදුකරනු ලබන හෝ ඊට කලින් සිදු කරන ලද ක්‍රියාවලි මගින් ලබා ගන්නා අතරුදහන් වූ තැනැත්තන්ට අදාළ දත්ත එකතු කිරීම සහ මෙම පනත යටතේ පිහිටුවනු ලැබූ දත්ත සමුදායට එම තොරතුරු මධ්‍යගත කිරීම පිණිස ලබා දීම[502];

ඊ) මේ පනතේ අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා වෙනත් සියලු ක්‍රියාවන් සිදු කිරීම.

අතුරුදහන් වූවන් පිළිබඳ කාර්යාලයේ බලතල සහ විමර්ශන

711. මෙම පනතේ 12 වන වගන්තිය යටතේ පහත සඳහන් බලතල ද ඇතුළුව අතුරුදහන් වූ පුද්ගලයන් පිළිබඳ සෙවීම හෝ සිටින ස්ථානය නිශ්චය කර ගැනීම සඳහා අතුරුදහන් වූවන් පිළිබඳ කාර්යාලයට පුළුල් විමර්ශන බලතල තිබේ.[503]

අ. යම් අතුරුදහන් වූ තැනැත්තෙකු එසේ අතුරුදහන් වීමේ කාලවකවානුව නොතකා එම තැනැත්තාට අදාළ පැමිණිල්ල යම් අතුරුදහන් වූ තැනැත්තෙකුගේ ඥාතියෙකුගෙන් හෝ වෙනත් යම් තැනැත්තෙකු හෝ සංවිධානයකින් ලබා ගැනීම;

ආ. අතුරුදහන් වූවන් පිළිබඳ කාර්යාලයට කරන පැමිණිල්ලක් මත හෝ කලින් පිහිටුවන ලද පරීක්ෂණ කොමිෂන් සභාවලින්, අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කොමිෂන් සභා වලින් හෝ අතුරුදහන්වීම හෝ අතුරුදහන්වූ තැනැත්තන් පිළිබඳව චෝදනා හෝ විභාගකළ කොමිෂන් සභවලින් ලැබුණ තොරතුරු මත පරීක්ෂණ ආරම්භ කිරීම සහ එම තැනැත්තා සිටින ස්ථානය පිළිබඳව විමර්ශනයක් කිරීම සහ / හෝ යම් අතුරුදහන් වූ තැනැත්තෙකු අතුරුදහන්වීමේ අවස්ථානුගත කරුණු පිළිබඳව පරීක්ෂණයක් සහ / හෝ විමර්ශනයක් කිරීම:

එසේ වුවද අතුරුදහන් වූවන් පිළිබඳ කාර්යාලය විසින් පහත සඳහන් සිද්ධිවලට ප්‍රමුඛත්වය ලබා දිය හැකිය:-

(i) ඉතා මෑතක දී සිදුවූ පුද්ගලයන් අතුරුදහන් වීම පිළිබඳ සිද්ධින්;

(ii) දැනටමත් වැදගත් සාක්ෂි තිබෙන සිද්ධින්;

---

[502] දීර්ඝ කාලයකට පෙර තමන් අතුරුදහන් වූවන් පිළිබඳ කාර්යාලය වෙත පැමිණිලි කළ බව කියන උතුරු නැගෙනහිර ප්‍රදේශ වල සාක්ෂිකරුවන් ගේ පූර්ණ ලැයිස්තුවක් ජනාධිපති විමර්ශන කොමිෂන් සභාව විසින් අතුරුදහන් වූවන් සඳහා වන කාර්යාලයේ සභාපති සහ එයි විධායක අධ්‍යක්ෂ වෙත ලබා දී තිබේ. තවදුරටත් උතුරු සහ නැගෙනහිර ප්‍රදේශවලින් පැමිණි සාක්ෂිකරුවන් රාශියක් ජනාධිපති විමර්ශන කොමිෂන් සභාව විසින් අදාළ පළාත් වල ශාඛා කාර්යාල වලට ඉදිරිපත් කිරීම සඳහා යොමු කරන ලදී.

[503] 1996 අංක 21 දරන පනතින් ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව වෙත 28(2) වගන්තිය යටතේ පවරා තිබෙන සමාන බලතල සන්සන්සකය කරන්න. එසේම 2018 අංක 5 දරන සියළුම පුද්ගලයන් බලහත්කාරයෙන් අතුරුදහන් කරවීමෙන් ආරක්ෂා කිරීම සඳහා වන ජාත්‍යන්තර සම්මුතිය ද බලන්න.

(iii) අතුරුදහන් වූවන් පිළිබඳ කාර්යාලයෙහි මතය අනුව මහජනතාවට වැදගත් වන සිද්ධීන්,

(ඇ) පහත දැක්වනෙ පියවර ඇතුළත්ව එහෙත් එයට සීමා නොවන අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ පැමිණිලි විමර්ශනය කිරීමට අවශ්‍ය සියළු පියවර ගැනීම:

(i) වීඩියෝ සාකච්ඡා පහසුකම් භාවිත කිරීම ඇතුළුව ලිඛිත හෝ වාචික ප්‍රකාශ ලබා ගැනීම සහ තැනැත්තන්ගෙන් සාක්ෂි ලබා ගැනීම;

(ii) ප්‍රකාශකයක් ලබාදීම සඳහා හෝ ඔහුගේ සන්තකයේ ඇති යම් ලේඛනයක් හෝ වෙනත් දෙයක් ඉදිරිපත් කිරීම සඳහා අතුරුදහන් වූවන් පිළිබඳ කාර්යාලයට පැමිණෙන ලෙස ශ්‍රී ලංකාවේ සිටින හෝ පදිංචි යම් තැනැත්තෙකු කැඳවීම;

(iii) සාක්ෂි ආඥාපනතේ පටහැනිව කුමක් සඳහන්ව වුව ද සිවිල් හෝ අපරාධ නඩු කටයුතුවලදී ලිඛිත හෝ වාචික ආවේශ කළ නොහැකි යම් ප්‍රකාශයක් හෝ ලේඛනයක් පිළිගැනීම;

(iv) විත්දිතයන්ගේ සහ සාක්ෂිකරුවන්ගේ පෞද්ගලික ආරක්ෂාව සහතික වීම සඳහා උපකාරීවීමට අවශ්‍ය අවස්ථාවල දී රහස්‍යභාවයෙන් ලබා දෙන තොරතුරු භාර ගැනීමෙ ක්‍රියාවලියක් සකස් කිරීම.

ක් රහස්‍යභාවය පිළිබඳ කොන්දේසි මත තොරතුරු භාරගැනීමේ ක්‍රියාවලියක් සකස් කිරීම.

(ඈ) සැක සහිත මිනීවලවල් හෑරීම සහ / හෝ මෘත දේහ ගොඩ ගැනීම සඳහා අධිකරණ ආඥාවක් ලබා ගැනීමට ප්‍රාදේශීය අධිකරණ බලය ඇති උචිත මහේස්ත්‍රාත් අධිකරණය වෙත ඉල්ලීමක් කිරීමට සහ එකී කැණීම් කටයුතුවලදී හෝ මෘත දේහය ගොඩ ගැනීමේ දී සහ ඉන්පසුව සිදුවන වෙනත් නීති කෘත්‍යවල දී නිරීක්ෂකයෙකු ලෙස ක්‍රියා කිරීම;

(ඉ) මෙම කාර්යාලයේ කාර්යභාරය ඉටු කිරීම සඳහා යම් රජයේ, පළාතේ හෝ පළාත් පාලන ආයතනයකින් හෝ නියෝජ්‍ය ආයතනයකින් නැතහොත් එහි සේවයෙහි නියුක්ත යම් සේවකයෙකුගෙන් අවශ්‍ය සහාය ඉල්ලා සිටීම, වෙනත් යම් ලිඛිත නීතියක හො එය යටතේ සාදන ලද නියෝගයක පටහැනිව කුමක් සඳහන් වුවද අතුරුදහන් වූවන් පිළිබඳ කාර්යාලය මගින් සහාය සඳහා ඉල්ලීමක් කරනු ලබන එවැනි යම් අධිකාරියක්, නියෝජිතායතනයක් හෝ නිලධරයකු විසින් වහාම එම සහාය ලබාදිය යුතු ය. එම සහායට එම අධිකාරියේ, නියෝජිතායතනයේ හෝ නිලධරයාගේ සන්තකයේ ඇති තොරතුරු ඉදිරිපත් කිරීම සහ ලේඛන ඉදිරිපත් කිරීම ඇතුළත්වන අතර එහෙත් ඒවාට සීමා නොවේ;

(ඊ) අධිකරණ නියෝගයක් මගින් අන්‍යාකාරයකින් යම් තැනැත්තකු රඳවා තබාගෙන ඇති බවට හෝ කලින් රඳවා තබාගෙන සිටි බවට සැක කරනු ලබන යම් රඳවා තබාගැනීමේ ස්ථානයකට, පොලිස් ස්ථානයකට, බන්ධනාගාරයකට, හෝ වෙනත් යම් ස්ථානයකට, ඕනෑම වේලාවක දී වරෙන්තුවක් නොමැතිව ඇතුළුවීමට සහ රඳවා තැබීමේ තත්වයන් විමසා බැලීම සඳහා එහි විමර්ශන කිරීමට හෝ එහි සිටින යම් තැනැත්තෙකුගෙන් කරුණු විමසීමට හෝ අවශය යයි සලකනු ලබන යම් ලේඛන හෝ ද්‍රව්‍ය රඳවා තබා ගැනීමට අතුරුදහන් වූවන් පිළිබඳ කාර්යාලයේ යම් නිශ්චිත නිලධරයෙකුට ලිඛිතව බලය පැවරීම.

මෙම ඡේදයේ කාර්ය සඳහා අධිකරණ විෂය පවරා ඇති අමාත්‍යවරයා විසින්, එම සෙවීම් කටයුතු කරගෙන යාම පිළිබඳව මාර්ගෝපදේශ සකස් කළ යුතු අතර, මාස තුනක කාලයක් ඇතුළත එම මාර්ගොපදේශ පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු ය.[504]

එම සෙවීම වරෙන්තුවක් නැතිව සිදුකර පැය විසි හතරක් ඇතුළත අතුරුදහන් වූවන් පිළිබඳ කාර්යාලය විසින් ඒ බව පොලිස්පතිවරයාට දැනුම් දිය යුතු ය.

(උ) අතුරුදහන් වූවන්ගේ කාර්යාලය විසින් පවත්වනු ලබන යම් විමර්ශනයකට අදාළ සාක්ෂි ඇති බවට සැක කරනු ලබන යම් පරිශ්‍රයක් පරීක්ෂා කිරීමට යම් පොලිස් නිලධරයෙකුගේ හෝ අතුරුදහන් වූවන් පිළිබඳ කාර්යාලයෙහි යම් නිශ්චිත නිලධරයෙකුට හැකිවන පරිදි සෝදිසි වරෙන්තුවක් නිකුත් කිරීම සඳහා අදාළ ප්‍රාදේශීය අධිකරණ බලය ඇති මහේස්ත්‍රාත් අධිකරණය වෙත ඉල්ලීමක් ඉදිරිපත් කිරීම සහ අතුරුදහන් වූවන් පිළිබඳ කාර්යාලය විසින් පවත්නගෙන යනු ලබන යම් විමර්ශනයක කාර්ය සඳහා අවශ්‍ය යයි සලකනු ලබන එම ස්ථානයේ යම් ද්‍රව්‍යක් පරීක්ෂා කිරීමට සහ එහි පිටපත් හෝ උධෘත ලබා ගැනීමට, තහනමට ගැනීමට සහ රඳවා තබා ගැනීමට;

(ඌ) මෙම පනතේ අර්ථ නිරූපණය කර තිබෙන පරිදි "අතුරුදහන් වූ තැනැත්තන්" යන යෙදුමේ අර්ථ නිරූපණය තුළට නොවැටෙන අතුරුදහන් වූවන් පිළිබඳ කාර්යාලය වෙත ඉදිරිපත් කර තිබෙන අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ සියලු පැමිණිලි පැමිණිලිකරු සමග නිසි පරිදි සාකච්ඡා කිරීමෙන් පසු පොලිසිය වෙත හෝ නීතිය ක්‍රියාත්මක කරන වෙනත් අදාළ බලධරයෙකු වෙත යොමු කිරීම; සහ

(එ) දණ්ඩ නීති සංග්‍රහයේ හෝ වෙනත් යම් නීතියක අර්ථානුකූලව වූ ද විමර්ශනය කළ යුතු වූ ද යම් වරදක් සිදු කර ඇති බවට අතුරුදහන් වූවන් පිළිබඳ කාර්යාලය ට පෙනී යන අවස්ථාවක අතුරුදහන් වූවන් පිළිබඳ කාර්යාලය විසින් අතුරුදහන් වූ තැනැත්තන්ගේ ඥාතීන් සමග අවශ්‍ය යයි සලකනු ලබන සාකච්ඡා කිරීමෙන් පසුව චින්දිතයන්ගේ සහ ඔවුන්ගේ ඥාතීන්ගේ සහ සමාජයේ උපරිම යහපත සැලකිල්ලට ගෙන එම කරුණ පිළිබඳව අදාළ නීතිය ක්‍රියාවේ යෙදවීමේ ආයතනයට හෝ නඩු පැවරීමේ ආයතනයට වාර්තා කරනු ලැබිය හැකි ය. එම වාර්තාව මගින් අතුරුදහන් වූ තැනැත්තාගේ සිවිල් තත්ත්වයට අදාළ තොරතුරු (එනම් අතුරුදහන් වූ තැනැත්තාගේ නම, වයස සහ ස්ත්‍රී පුරුෂ භාවය ආදී තොරතුරු) සහ අතුරුදහන් වූ තැනැත්තා අවසන් වරට දකිනු ලැබූ ස්ථානය/ ස්ථාන හෝ දිස්ත්‍රික්කය / දිස්ත්‍රික්ක සහ ඊට අදාළ දිනයන් සඳහන් කළ යුතු ය.

712. මෙමගින් පැහැදිලි වන්නේ අතුරුදහන් වූවන් පිළිබඳ කාර්යාලය සතුව කරුණු සෙවීමේ ආයතනයක් ලෙස ප්‍රමාණවත් බලතල ලබා දී තිබෙන බව ය. එහෙත් මෙහිදී මතුවන ගැටළුව වන්නේ මෙම සියළු බලතල අවශ්‍ය සම්පත්, නිපුණත්වය සහ අතුරුදහන් වූවන් පිළිබඳ කාර්යාලයේ ධාරිතා වර්ධනයකින් තොරව කාර්යක්ෂම ලෙස භාවිතා කරන්නේ කෙසේද යන්නයි.

713 යම් කිසි විමර්ශනයකට අවශ්‍ය සාක්ෂි අඩංගු බවට සැක කෙරෙන ස්ථානයක් පරීක්ෂා කිරීමට මහේස්ත්‍රාත්වරයෙකු බලය ලබා දෙන සෝදිසි වරෙන්තුවක් ලබා ගැනීමේ බලය ද අතුරුදහන් වූවන් පිළිබඳ කාර්යාලය සතුව පවතියි. 'අතුරුදහන් වූ පුද්ගලයෙකු' සිටින හෝ තබාගෙන තිබූ බවට සැක කෙරෙන රඳවා තබාගන්නා ස්ථානයක් සෙවීම් වරෙන්තුවක් නොමැතිව පරීක්ෂා කිරීමේ බලය අතුරුදහන් වූවන් පිළිබඳ කාර්යාලය වෙත ලබා දී තිබේ.

[504] සෙවීම් මෙහෙයුම් නිර්ණායක අඩංගු වන 2019 ජූලි 24 දිනැති අංක 2133/36 දරන ගැසට් පත්‍රය බලන්න

714. 2016 අංක 14 දරන අතුරුදහන් වූවන් පිළිබඳ කාර්යාලය පනතහි 12(ඊ) වගන්තිය අනුව අධිකරණ, බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා විසින් ප්‍රකාශයටර පත් කරන ලද අතුරුදහන් වූවන් පිළිබඳ කාර්යාලය විසින් සකස් කරන ලද මෙහෙයුම් නිර්ණායක[505] වලින් රඳවාතබා සිටින ස්ථානයක්, පොලිස් ස්ථානයක් හෝ මෙම කොටසේ දක්වා තිබෙන වෙනත් පහසුකමක් පරීක්ෂා කිරීමේ බලය ලබා දී තිබේ.

715. අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය වෙත ලැබෙන පැමිණිලි විමර්ශනය කිරීම සඳහා සිර කරුවන්ගේ පසුගිය වාර්තා වලට ප්‍රවේශ වීම තුළින් ඵලදායී සිද්ධි කළමනාකරණ ව්‍යවහාරයන් සඳහා සහයෝගයෙන් ක්‍රියාත්මක කිරීමට එම කාර්යාලය බන්ධනාගාර දෙපාර්තමේන්තුව සමග විධිමත් ගිවිසුමකට එළඹ ඇති බව මෙම ජනාධිපති විමර්ශන කොමිෂන් සභාවේ අවධානයට ලක් විය.

716. අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය පනතේ 17 (1) වගන්තිය අනුව එහි සෙවීම් ඒකකයක් තිබිය යුතු අතර අතුරුදහන් වූ තැනැත්තන් සෙවීම හා ඔවුන් ව සොයාගැනීම සඳහා ද එම අතුරුදහන්වීම පිළිබඳ අවස්ථානුගත කරුණු පැහැදිලි කර ගැනීමේ දී ඊට සහාය වීම සඳහා ද එම අතුරුදහන් වූවන් සිටින ස්ථාන සහ ඔවුන්ට අත් වූ ඉරණම පිළිබඳව සොයා බැලීම සඳහා ද එම සෙවීම් ඒකකය වගකිව යුතු ය.

717. අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය සෙවීමේ සහ විමර්ශනය කිරීමේ කාර්යාලයක් මෙන්ම සන්නිවේදන සහ මහජන සේවා ඒකකයන් පිහිටුවීමට පියවර ගෙන තිබෙන බව සැළකිය යුතු කාරණයකි. මේ සම්බන්ධයෙන් විශේෂඥභාවය සහිත නිපුණ සහ සුදුසුකම් සහිත පුද්ගලයන් සොයාගැනීම අවසනාවන්ත ලෙස නොහැකි වී තිබෙන නිසා මෙම සෙවීම් ඒකකය මුල් අවස්ථාවේම පිහිටුවීමට නොහැකි වූ බව අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයේ සභාපතිවරයා මෙම ජනාධිපති විමර්ශන කොමිෂන් සභාවට දැනුම් දී තිබේ. විමර්ශන සිදුකිරීම සඳහා වන ඉතාම වැදගත් මෙම ක්ෂේත්‍රය තුළ අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයේ ආයතයනික ධාරිතාව සහ නිපුණත්වය වර්ධනය කිරීමේ අවශ්‍යතාව මෙම ජනාධිපති විමර්ශන කොමිෂන් සභාව අවධාරණය කරයි. එසේම අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය පනතේ 17(2) වගන්තිය යටතේ එම සෙවීම් ඒකකයට අදාළ තාක්ෂණික විශේෂඥ දැනුම සහ අධිකරණමය වෛද්‍ය විශේෂඥ දැනුම දැනුම ඇති තැනැත්තන් ද ඇතුළුව ප්‍රවීන, පළපුරුදු සහ සුදුසුකම්ලත් විමර්ශකයන් ඊට ඇතුළත් විය යුතු බව සඳහන් වේ.

718. අතුරුදහන් වූවන්ගේ පවුල් වල අයට බහුවිධ යාන්ත්‍රණයන්ට සහ කොමිෂන් සභා වෙතට ප්‍රවේශවීමට සිදුවීමත් එමගින් කිසිදු පිළිතුරක් නොලැබීමත් නිසා තමන්ට ඇතිවී තිබෙන වෙහෙස පිළිබඳව කරන ලද ප්‍රකාශ මේ අවස්ථාවේ දී මෙම ජනාධිපති විමර්ශන කොමිෂන් සභාවේ විශේෂ අවධානයට පාත්‍ර වී තිබේ. යාපනය, කිළිනොච්චි සහ මඩකලපුව වැනි ප්‍රදේශ වලින් ඉදිරිපත් වූ විශාල සාක්ෂිකරුවන් ප්‍රමාණය වෙත අවධානය දක්වන මෙම ජනාධිපති විමර්ශන කොමිෂන් සභාව ඔවුන් සියළු දෙනා ඉදිරිපත් කළ එකම කතන්දරය වන කොමිෂන් සභා කිහිපයක් ඉදිරියේ සාක්ෂි දුන්න ද කිසිදු ප්‍රතිඵලයක් අත් නොවූ බවට වන අදහස වෙත තම අවධානය යොමු කරයි. 1990 වසරේදී කල්මුණේ සිට නිවෙස් බලා එමින් සිටි පිරිසක් කුරුක්කල්මඩම් නැමැති ස්ථානයේ දී බලයෙන් පැහැර ගෙන ඝාතනය කර සමූහ මිනී වලක වළදැමීම සම්බන්ධයෙන් සහනය අපේක්ෂාවෙන් කාත්තන්කුඩි ප්‍රදේශයේ සාක්ෂිකරුවන් විශාල ප්‍රමාණයක් කරන ලද සානුකම්පිත ඉල්ලීම වෙතද මෙම ජනාධිපති විමර්ශන කොමිෂන් සභාවේ අවධානය යොමු වේ.

[505] 2019 ජූලි 24 දින අධිකරණ අමාත්‍යාංශය විසින් ප්‍රකාශයට පත් කරන ලද අංක 2133/36 දිනැති අතිවිශේෂ ගැසට් පත්‍රය

719. මෙම පැහැරගැනීම් සහ අතුරුදහන් වීම් එම සාක්ෂිකරුවන්ට අනුව හඳුනානොගත් එල්.ටී.ටී.ඊ. සංවිධානයේ සාමාජිකයන් විසින් සිදු කර තිබේ. කාත්තන්කුඩි පල්ලිය සහ මුස්ලිම් ආයතය සංගමය තම සාක්ෂි දෙන අවස්ථාවේ මෙම ජනාධිපති විමර්ශන කොමිෂන් සභාවෙන් කරන ලද ඉල්ලීම වන්නේ මෙම අවසන් අවස්ථාවේ දී වුවද එම වින්දිතයන්ගේ ඉතිරි වූ කොටස් නැවත ගොඩ ගෙන ඔවුන්ට ඔවුන්ගේ ආගම අනුව ගෞරවාන්විත ලෙස අවසන් කටයුතු කිරීමට අවස්ථාව ලබා දෙන ලෙසයි. සත්‍ය සොයාගෙන පීඩාවට පත්වූ පුද්ගලයන්ට සහනයක් ලබා දීම සඳහා අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයයේ සෙවීම් ඒකකයට මෙවන් ප්‍රදේශවල විශාල මෙහෙවරක් සිදු කළ හැකිය. මේ සම්බන්ධයෙන් මහේස්ත්‍රාත් උසාවියේ වැඩකටයුතු තවමත් සිදුකරගෙන යන බවත් සමුහ මිනී වලවල් හෑරීමේ ක්‍රියාවලියේ දී අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයට ඒ සම්බන්ධයෙන් උසාවියේ අධිකරණ බලය තුළ ඒ සඳහා සහාය දීමට කිසිදු බලයක් රහිතව බලා සිටින්නෙක්ගේ තත්ත්වයට පත්ව කටයුතු කළ නොහැකි බවත් මෙම ජනාධිපති විමර්ශන කොමිෂන් සභාවේ අවධානයට පාත්‍ර විය. අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයේ විධිනියෝගය තුළ තිබෙන අතුරුදහන් වූවන්ගේ පවුල් වලට සක්‍රිය ලෙස දායකත්වය ලබා දීමේ අවශ්‍යතාව අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයට ආයතනිකව නිසි විශේෂඥ දැනුම නොමැති තත්ත්වයකට පත්වුව හොත් සිදු කිරීමට නොහැකි වනු ඇත.

720. අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය පිළිබඳ පනතේ 18 වෙනි වගන්තිය අනුව අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය සතුව වින්දිතයන් සහ සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීමේ අංශයක් තිබිය යුතු අතර එම අංශය මගින් වින්දිතයන්ගේ, සාක්ෂිකරුවන්ගේ හා ඥාතීන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කර අතර එම තැනැත්තන්ගේ අවශ්‍යතා හා ගැටළු පිළිබඳව සොයා බැලිය යුතු ය. මෙම අංශය විසින් වින්දිතයන්ට, සාක්ෂිකරුවන්ට සහ අතුරුදහන්වූ තැනැත්තන්ගේ සුභසාධන සේවා හා ඥාතීන්ට මනෝ - සමාජයී සහාය ඇතුළු පරිපාලන සේවා සැපයීම හෝ සැපයීමට පහසුකම් සැලසීම සිදු කළ යුතු ය.

721. ඊට අමතරව අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය පනතේ විධිවිධාන අනුව අධිකරණ ක්‍රියාවලිය සහ අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය අතර සම්බන්ධීකරණයක් අවශ්‍ය වන අතර ඒ සඳහා පනත මගින් අවසානයේ විමර්ශන කර නඩු පැවරීම සඳහා පහසුකම් සළසන යාන්ත්‍රණයක් සපයා තිබේ. අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය පනත සකස් කර තිබෙන්නේ අපරාධ නඩු විභාග කිරීම් වලට බාධා වන අකාරයට නොව, තම ස්වාධීනත්වය රැකගෙන එවන් අධිකරණ විමර්ශන සහ නඩු විභාග වලට සහාය දැක්වීමට හැකිවන ආකාරයට වන බව මෙම ජනාධිපති විමර්ශන කොමිෂන් සභාව දරන මතය වේ.

722. 13 වගන්තියේ අඩංගු වන ආකාරයට අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය සහ වෙනත් රාජ්‍ය ආයතන අතර තිබිය යුතු සහයෝගය සහ සහජීවනය පිළිබඳ ප්‍රතිපාදන කිහිපයක් 13 වගන්තියේ අඩංගු වේ. උදාහරණයක් ලෙස අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය පනතේ 13 වගන්තියේ ඇතුළත් කර තිබෙන කැපී පෙනෙන ලක්ෂණ කිහිපයක් පහත දැක්වේ.

13 (1) (අ) වගන්තිය

I. විමර්ශනයක් පැවැත්වෙන අතරතුර පැමිණිල්ල අදාළ වන තැනැත්තා අතුරුදහන් වූ තැනැත්තෙකු බවට තීරණය කිරීමට අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයට ප්‍රමාණවත් සාක්ෂි ඇති අවස්ථාවකදී නොදුටු සහතිකයක් නිකුත් කිරීමට රෙජිස්ට්‍රාර් ජෙනරාල්වරයාට හැකිවන පරිදි අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය විසින් එසේ අතුරුදහන් වූ තැනැත්තාගේ ඥාතියා වෙත අතුරු වාර්තාවක් නිකුත් කළ යුතු ය;

II. විමර්ශනය අවසන් වීමෙන් පසු පැමිණිල්ල අදාළ වන තැනැත්තා අතුරුදහන් වූ තැනැත්තෙකු බවට හෝ මියගිය තැනැත්තකු බවට අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය විසින් තීරණය කරනු ලබන අවස්ථාවකදී අවස්ථාවෝචිත පරිදි, දක්නට නොමැති බවට වූ සහතිකයක් හෝ මරණ සහතිකයක් නිකුත් කිරීමට රෙජිස්ට්‍රාර් ජෙනරාල්වරයාට හැකිවන පරිදි අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය විසින් එම අතුරුදහන් වූ තැනැත්තාගේ ඥාතියා වෙත වාර්තාවක් නිකුත් කරනු ලැබිය යුතු ය;

13 (1) වගන්තිය

(ඉ) අවශ්‍ය අවස්ථාවල දී අතුරුදහන් වූ තැනැත්තන්ගේ ඥාතීන්ට මනෝ- සමාජීය සහාය ඇතුළු සුභසාධක සේවා හා පරිපාලන සහය ලබාදීම හෝ ලබාදීමට පහසුකම් සැළසීම;

(ඊ) වන්දි ඇතුළු එහෙත් ඒවාට සීමා නොවන ආධාර අතුරුදහන් වූ තැනැත්තන්ට සහ/ හෝ ඔවුන්ගේ ඥාතීන්ට ප්‍රදානය කරන ලෙස අදාළ බලධාරීන්ට නිර්දේශ කිරීම සහ/ හෝ ඔවුන්ට පරිපාලන සහාය සහ මනෝ සමාජීය සේවා ඇතුළු සුභසාධක සේවා ලබාදෙන ලෙස බලධාරීන් වෙත නිර්දේශ කිරීම;

(ඔ) පහත දැක්වෙන කරුණු වලට අදාළ නිර්දේශ ඇතුළු අතුරුදහන්වූ තැනැත්තත් පිළිබඳ කාර්යාලයේ කාර්යභාරය හා සම්බන්ධව අදාළ බලධාරීන් වෙත නිර්දේශ ඉදිරිපත් කිරීම:-

(i) අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයයේ වැඩකටයුත්ත අතරතුරදී හඳුනාගත් ක්‍රමවේද මත පදනම්ව අනාගත අතුරුදහන් වීම් වැළැක්වීම;

(ii) අනුස්මරණය කිරීමේ සහ පිළිගැනීමේ ක්‍රියාමාර්ග සහ ක්‍රමවේද;

(iiර හඳුනාගත නොහැකි මළ සිරුරු සහ හඳුනාගත හැකි මළසිරුරු පිළිබඳව ක්‍රියා කරන ආකාරය;

(iv) අතුරුදහන් වූ තැනැත්තනගේ අතුරුදහන් වීමට අදාළ අවස්ථානුගත කරුණු හෝ ඔවුන් සිටින ස්ථාන පැහැදිලිව දැනගත නොහැකි අවස්ථාවන් සම්බන්ධයෙන් ක්‍රියා කිරීම;

(v) දත්ත පිළිබඳ රහස්‍යභාවයට සහ ඒවා ආරක්ෂා කිරීමට අදාළ සියලු නීති පිළිබඳව නිසි සැලකිල්ලක් දක්වමින් මහජනතාවගේ දැනගැනීම සඳහා අතුරුදහන්වූවන්ගේ ප්‍රශ්න පිළිබඳ තොරතුරු පළ කිරීම;

(vi) අතුරුදහන් වූ තැනැත්තන්ට අදාළ ජාතික මට්ටමේ නීති හා නියෝග සකස් කිරීම; සහ

(vii) චින්දිතයන්ගේ සහ අතුරුදහන් වූ තැනැත්තන්ගේ ඥාතීන්ගේ සමාජීය සහ ආර්ථික තත්ත්වයන් වැඩිදියුණු කිරීමට අදාළ වන්දි ලබා දීම සහ මනෝ - සමාජීය සහාය සහ වෙනත් ක්‍රියා මාර්ග;

723. ඉහත විශේෂයෙන් 13 (1) (ඊ) වගන්තිය පරීක්ෂා කිරීමේ දී පෙනී යන්නේ වන්දි ඇතුළු එහෙත් ඒවාට සීමා නොවන ආධාර අතුරුදහන් වූ තැනැත්තන්ට සහ/ හෝ ඔවුන්ගේ ඥාතීන්ට ප්‍රදානය කරන ලෙස හානි පූරණ කාර්යාලයට නිර්දේශ කිරීම සහ/ හෝ ඔවුන්ට පරිපාලන සහාය සහ මනෝ සමාජීය සේවා ඇතුළු සුභසාධක සේවා ලබාදෙන ලෙස බලධාරීන් වෙත නිර්දේශ කිරීම ට අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය ට හැකියා ව තිබෙන බව ය.

724. අධිකරණ පද්ධතිය සහ අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය අතර හෝ අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය සහ හානිපූරණ කාර්යාලය අතර හෝ සම්බන්ධීකරණය තිබිය යුතු බව නියම කරන විධිවිධාන ඉතා වැදගත් වන අතර තුවාල සුව කිරීමේ සහ වන්දි ගෙවීමේ ක්‍රමවේදයක් තුළින් ප්‍රතිසන්ධානය සඳහා දායක වීමට ඒවා ඉතා වැදගත් භූමිකාවක් ඉටු කරයි.

725. හානිපූරණ කාර්යාලය ස්ථාපිත කිරීමත් සමග ඉදිරියට පැමිණි හානි පූරණය සම්බන්ධයෙන් මෙම ජනාධිපති ලේකම් කොමිෂන් සභාව හානිපූරණය සම්බන්ධය සාකච්ඡා කරන කොටස තුළ සහ මෙම අවසන් වාර්තාවේ 6 වන පරිච්ඡේදයේ ඒ සම්බන්ධයෙන් නිර්දේශ ඉදිරිපත් කර තිබේ.

විශ්වාසනීයත්වය

726. මෙම පනතේ 15 වෙනි වගන්තිය යටතේ ප්‍රකාශ කර තිබෙන පරිදි යම් ලිඛිත නීතියක පටහැනිව කුමක් සඳහන්ව තිබුණ ද අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයේ සෑම සාමාජිකයෙකු, නිලධරයෙකු, සේවකයකු සහ උපදේශකයෙකු මේ පනත යටතේ තම කාර්ය ඉටු කිරීමේ දී හැර තමා වෙත රහසේ දැනුම් දෙන ලද කරුණු සම්බන්ධයෙන් එම තැනැත්තා විසින් රහස්‍යභාවය ආරක්ෂා කරමින් එසේ ආරක්ෂා කිරීමට ආධාර කළ යුතු ය. මෙම විධිවිධානයට විශ්වසනීයත්වය පදනම් කරගෙන වින්දිතයන්/ නෑදෑයන් විසින් කරන ලද පැමිණිලි ද ඇතුළත් විය හැකිය. එසේම මේ සම්බන්ධයෙන් තොරතුරු දැනගැනීමේ පනතේ තිබෙන විධිවිධාන අදාළ නොවිය යුතු ය. මේවාහි අවශ්‍යතාව සඳහන් කර තිබෙන්නේ වින්දිතයන්ට එම වරද කර වරදකරුවන්ට බියෙන් හෝ පළිගැනීමකට ලක්වේ යැයි බියෙන් කටයුතු කිරීමට හැකියාව ලබා දීම සඳහා වේ.

727. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ තොරතුරු දැනගැනීමේ අයිතිය පිළිබඳව දක්වා තිබෙන 14(අ) ව්‍යවස්ථාව මගින් විශ්වසනීයත්වය මත සන්නිවේදනය කරන තොරතුරු හෙළි කිරීමෙන් වැළකී සිටීමට සීමා කිරීම වෙනත් අදාළ කාරණා ද සමග සිදුකළ හැකි බව දක්වා තිබේ.

728. කෙසේ වෙතත්, අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයේ විමර්ශන මගින් ලබා ගන්නා අනෙකුත් ද්‍රව්‍ය / සාක්ෂි (එනම්, විශ්වසනීයත්වය යටතේ ලබා දෙන ප්‍රකාශ හැර) තොරතුරු දැනගැනීමේ පනතෙහි දක්වා තිබෙන විධිවිධාන වලට යටත් වේ. යුක්තිය ඉටු කිරීම මනා ලෙස සිදු කිරීම සඳහා 15 වෙනි වගන්තිය යටතේ දක්වා තිබෙන විශ්වසනීයත්වය යන්නෙහි සීමාව අර්ථකථනය කර ගැනීම අත්‍යවශ්‍ය වේ. 15 වන වගන්තිය යටතේ නිශ්චය කර තිබෙන විශ්වසනීයත්වයේ සීමාව තීරණය කිරීමේ මෙහෙයුම් මූලධර්මය විය යුත්තේ සාක්ෂිකරුවන්ගේ ආරක්ෂාව සහ සත්‍ය සහ යුක්තිය සඳහා වින්දිතයන්ට ඇති අයිතිය යන ප්‍රගම්‍යය මත වේ. මෙම තක්සේරුව සිද්ධියෙන් සිද්ධියට සිදු කළ යුතු අතර අතුරුදහන් වූ තැන්තතන් පිළිබඳ කාර්යාලය ඉදිරියේ තිබෙන කරුණු මත සහ අවස්ථානුගත කරුණු මත පුරෝකථනය කළ යුතු ය. අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය විශ්වසනීයත්ව ලබා දීම සඳහා වන විවිධ ආරක්ෂණ පියවර ආවරණය කරන පරිපූර්ණ සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීමේ වැඩසටහනක් සකස් කළ යුතු ය යන්න නිර්දේශ කරනු ලැබේ[506]. ඉහත කාරණය සාක්ෂිකරුවන්ගේ ආරක්ෂාව සහ සුභසාධනය පිළිබඳ අපගේ අවධානය යොමු කරයි.

සාක්ෂිකරුවන්ගේ ආරක්ෂාව සහ සුභසාධනය

729. වින්දිතයන් සහ සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීම සඳහා ක්‍රමයක් සකස් කර බලාත්මක කිරීමේ කාර්යය අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය වෙත පැවරී තිබේ. අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීම සඳහා සහාය වීමට පනත් කෙටුම්පත අනුව වින්දිතයන් හෝ අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයට යෝග්‍ය නියෝග ලබා ගත හැකිය. අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය ට අතුරුදහන් වූ පුද්ගලයන්ගේ පවුලේ සාමාජිකයන්ට/ ඥාතීන්ට මනෝ සමාජයීය/ මානසික සෞඛ්‍ය සහාය ලබා දීම සඳහා සහාය ලබා දීම ද සිදු කළ හැක.

---

[506] මෙධක ප්‍රනාන්දු සහ ඉසබෙල් ලැසී, අතුරුදහන්වූ තැනැත්තතන් පිළිබඳ කාර්යාලය ක්‍රියාත්මක කිරීම: යහ පරිචයන් පිළිබඳ අත්පොත, දකුණු ආසියානු නීති අධ්‍යයන මධ්‍යස්ථානය, 2019 නොවැම්බර්, (අතුරුදහන්වූ තැනැත්තන් පිළිබඳ කාර්යාල අත්පොත) 3 වෙනි පරිච්ඡේදය, සාක්ෂිකරුවන්ගේ ආරක්ෂාව, බලන්න.

නැවත ඇති නොවීම

730. 2020 ජූලි මස සිට 2011 ඔක්තෝබර් දක්වා කාලය තුල අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය වෙත බලහත්කාරයෙන් අතුරුදහන් කරවීම හෝ අතුරුදහන් කරවීම සම්බන්ධයෙන් ලැබුණු හෝ වාර්තාවු නව පැමිණිලි නොවූ බව මෙම ජනාධිපති විමර්ශන කොමිෂන් සභාව ඉදිරියේ ලබා දුන් සාක්ෂි මගින් හෙළි වී තිබේ. අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයේ සභාපතිවරයා ලබාදුන් සාක්ෂි සහ අප ඉදිරියේ තිබෙන දත්ත අනුව පෙනී යන්නේ විශේෂයෙන්ම පසුගිය දශකය තුළ බලහත්කාරයෙන් සිදු කරන ලද අතුරුදහන්වීම ක්‍රමයෙන් අඩුවෙමින් පැවති බව ය. මේවා නැවත ඇතිනොවීමේ තත්ත්වය වැඩි ඇතක නොවේ.

නිර්වචන සංශෝධන කිරීමේ අවශ්‍යතාව

731. ආර්ථික ගැටළු නිසා ශ්‍රී ලංකාව විශාල වශයෙන් හැර යන්නන් සහ ස්වාභාවික ව්‍යසන නිසා සහ පවුල් ආරවුල් නිසා සිදුවන මරණ පවා අතුරුදහන් වූවන් සම්බන්ධ පැමිණිලි ලෙස ඉදිරිපත් වී තිබෙන බව අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය මෙම ජනාධිපති විමර්ශන කොමිෂන් සභාවට වාර්තා කර තිබේ. අතුරුදහන් වූ පුද්ගලයා යන්න පිළිබඳ දැනට තිබෙන නිර්වචනය අනුව ඉහත පැමිණිලි එම නිර්වචනය තුළට නොපැමිණෙන අතර දැනට අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය ඉදිරියේ තිබෙන පැමිණිලි වර්ග අනාගතයේදී හෙළි කිරිමකට ලක්වූ විට මතුවෙමින් තිබෙන විවිධ වර්ගීකරණයන්ට අයත් පැමිණිලි වර්ග එනම් ස්වාභාවික ආපදා සහ පවුලේ ආරවුල් නිසා පවුලෙන් බැහැර වෙන අය වැනි වෙනත් බහුවිධ සාධක නිසා වන අතුරුදහන් වීම සම්බන්ධ පැමිණිලි වෙනද අවධානය යොමු කිරීම අවශ්‍ය වනු ඇත. මේ සිද්ධි අනුව අතුරුදහන් වූ පුද්ගලයා යන නිර්වචනය වෙනම විමසා බැලි ය යුතු ය යන්න මෙම ජනාධිපති විමර්ශන කොමිෂන් සභාවේ අදහස වේ.

අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයේ විමර්ශන වර්ගීකරණය කිරීම

732. මෑතකදී සිදුවූ පුද්ගල අතුරුදහන් වීම් වලට ප්‍රමුඛස්ථානය ලබා දීම සඳහා අතුරුදහන් වූවන් පිළිබඳ කාර්යාලය තමන් සතු 14,988 ක සිද්ධි අඩංගු විචල්‍ය දත්ත ප්‍රධාන අවධි තුනකට බෙදා තිබෙන බව මෙම ජනාධිපති විමර්ශන කොමිෂන් සභාව වෙත දැනුම් දී තිබේ. අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය ට අනුව මෙම සංඛ්‍යාවලට ද්විත්ව හෝ ත්‍රිත්ව සටහන් ඇතුළත් වේ. පළමු අදියර හෝ පළමු ප්‍රමුඛතාවට 2000 -2022 අතර කාලය තුළ සිදුවූ අතුරුදහන් වූ සිද්ධි ඇතුළත් වේ. දෙවන අදියර ට 1989 -2000 දක්වා කාලය ඇතුලත් වේ. මෙහි තුන්වන අදියරට 1989ට පෙර සිදුවූ සිද්ධීන් ඇතුළත් වේ. පළමු අදියරට අයත් සිද්ධි තහවුරු කර ගැනීමට අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය ප්‍රමුඛතාව ලබා දෙන බව මෙම ජනාධිපති විමර්ශන කොමිෂන් සභාව වෙත වාර්තා වී තිබේ. මේ කාරණය සඳහා පරීක්ෂණ මණ්ඩලයක් සකස් කර ගත් තොරාගැනීමේ නිර්ණායක පදනම් කරගෙන නම් කර තිබේ. පළමුවන අදියර තුළ (2000 සහ 2022 අතර සිදුවූ අතුරුදහන් වීම්) වලට අදාළ අයදුම්පත්‍ර 6075 ක වාර්තා තක්සේරු කිරීම සඳහා වන ක්‍රියාවලිය කඩිනම් වීම මෙමගින් සිදු වී තිබේ. විමර්ශන සිදු කිරීමේදී ප්‍රධාන සාධක තුනක් සළකා බලමින් කටයුතු කරන අතර ඒවා නම් අතුරුදහන් වීමේ හේතුව, අතුරුදහන් වූ තැනැත්තාගේ අනන්‍යතාව සහ අයදුම්කරු සහ අතුරුදහන් වූ පුද්ගලයා අතර ඇති ඥාතිත්වය තීරණය කිරීම වේ.

733. කෙසේ වෙතත් යාපනය සහ මඩකලපුව ප්‍රදේශයේ සාක්ෂිලබා දුන් සාක්ෂිකරුවන් විසින් හෙළි කරන ලද අතුරු දහන් වීම් කිහිපයක් සම්බන්ධයෙන් මෙම ජනාධිපති විමර්ශන කොමිෂන් සභාව අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයේ අවධානයයොමු කර තිබේ. මේ සිද්ධීන් අයත් වන

වර්ගය කුමක් වුවද ඒ පිළිබඳව නොසලකා මේ සිද්ධීන් පිළිබඳව විමර්ශන ආරම්භ කර තිබෙන වබ අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය කොමිෂන් සභාවට දන්වා තිබේ.

734. මේ සඳහා මෙහෙයුම් ප්‍රමිතීන් සියල්ල ඇතුළත් කරමින් චර්යා ධර්ම සංග්‍රහයක් සකස් කර තිබේ.

735. දැනට ඉදිරිපත් කර ඇති පැමිණිලි වර්ගීකරණය කිරීම සඳහා වැඩිමනත් තොරතුරු ලබා ගැනීමට, මූලික පරීක්ෂණ පැවැත්වීම ආරම්භ කිරීමෙන් අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය තම පරීක්ෂණ ආරම්භ කර තිබෙන බව මෙම ජනාධිපති විමර්ශන කොමිෂන් සභාවේ අවධානයට ලක් කර තිබේ. තහවුරු ක්‍රියාවලියෙහි කොටසක් වශයෙන් පැමිණිලි 150 ට වැඩි ප්‍රමාණයක් සම්බන්ධයෙන් පරීක්ෂණ මණ්ඩලය විසින් විමර්ශන පවත්වා තිබේ. අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය අනුව ඔවුන් විසින් පවත්වන ලද පරීක්ෂණ වලට විශාල පිරිසක් සහභාගි වී තිබේ.

736. පරීක්ෂණ සඳහා ආරාධනා කරන ලද අය අතරින් පැමිණිලි වලින් අගයකළ යුතු 85% ක තරම් ප්‍රමාණයක් තොරතුරු ලබා දීමට ඉදිරිපත් විය. මෙමගින් පැමිණිලිකරුවන් විසින් අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය වෙත තබා ඇති විශ්වාසය තහවුරු වන අතර අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය සුදුසු සංවේදිකරණ වැඩසටහන් සහ ක්‍රමෝපායික සැළසුම් හරහා ජනතාව අතර විශ්වාසය වර්ධනය කිරීම සහ විශ්වසනීයත්වය වැඩිදියුණු කිරීම සඳහා රටපුරා ධනාත්මක පියවර ගත යුතුව තිබේ.

737. මෙම ජනාධිපති විමර්ශන කොමිෂන් සභාවට ලිඛිතව සහ වාචිකව ඉදිරිපත් කරන ලද ඉදිරිපත්කිරීම්වලින් දැනුම් දී ඇති පරිදි පවුල් කිහිපයක් සාර්ථක ලෙස ***නොදුටු සහතිකයක්*** සහ ***මරණ සහතිකයක්*** වන්දි සහිතව හෝ රහිතව ලබා ගෙන තිබේ. ඔවුන්ගේ ඉල්ලීම මත ඉල්ලුම්කරුවන්ට සහන හෝ පවුල් සහාය, යොමු කිරීමේ සහාය හෝ ඉදිරි කටයුතු සඳහා (ණය/ විශ්‍රාම/ වගකීම්) සඳහා අධිකාරීන්ගේ සහාය ලබා දීම නිර්දේශ කර තිබේ. අතුරුදහන් වූ පුද්ගලයන්ගේ දේපළ හෝ ජංගම හෝ ජංගම නොවන වත්කම් සහ /හෝ වැඩිදුර විමර්ශන සඳහා ප්‍රතිකර්මීය සහන ලබා ගැනීමේ දී (උසාවි නියෝග, හබයාස් කෝපුස් සිද්ධි) නීතිමය සහාය ද ලබා දෙයි.

738. සංශෝධිත 2010 අංක 19 දරන මරණ ලියාපදිංචි කිරීමේ (තාවකාලික විධිවිධාන) පනත අනුව සමාජ සුභසාධන වැඩපිළිවෙලක් යටතේ ප්‍රතිලාභ ලබා ගැනීම සඳහා අයැදුම් කිරීමට නොදුටු සහතිකයක් යොදාගත හැකි ය. නොදුටු සහතිකයක් සහිත පුද්ගලයෙකුට යම් කිසි අතුරුදහන් වූ පුද්ගලයෙකුගේ දේපළ තාවකාලිකව කළමනාකරණ කිරීම සඳහා දිස්ත්‍රික් උසාවියකට ඉල්ලුම් කල හැකි අතර එම අතුරුදහන් වූ පුද්ගලයාගේ දරුවන්ගේ භාරකරු ලෙස කටයුතු කිරීමට ද හැකියාව ලැබේ; එසේම අතුරුදහන් වූ පුද්ගලයාගේ වතු පිටි සම්බන්ධයෙන් අධිකරණය සහ පරිපාලනමය අධිකාරීන් ට නියෝජනයක් සැපයීමට ද හැකියාව ලැබේ.

739. අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය ට තමන් සිදුකරන පර්යේෂණ සම්බන්ධයෙන් ඥාතීන්ට දැනුම් දීමේ වගකීම තිබෙන අතර එසේ කළ යුත්තේ එමගින් විමර්ශන වලට බාධාවක් එල්ල නොවන අවස්ථාවකදී වේ. යම් කිසි අතුරුහන් වූ පුද්ගලයෙකු සිටින ස්ථානය හඳුනාගතහොත් අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයට එම පුද්ගලයාගේ ඥාතීන්ට ඔහු සිටින ස්ථානය පිළිබඳ තොරතුරු එම පුද්ගලයාගේ කැමැත්ත මත ලබා දිය හැකිය. අතුරුදහන් වුවන්ගේ කැමැත්ත ලබා ගැනීමේ අවශ්‍යතාව මතු වන්නේ තම් විසින්ම පිටුවහල් වී සිටින පුදුගලයන් ට ඔවුන්ගේ ඥාතීන්ගෙන් ආරක්ෂා වීමට හැකියාව ලබා දීම (උදා:- ගෘහස්ථ ප්‍රචණ්ඩත්වය) තුළින් ඔවුන් ආරක්ෂාව පැතූ එම තර්ජනයට ඔවුන් නැවත නිරාවරණය වීමට අවස්ථාව ලබා නොදීම සඳහා වේ.

740. කෙසේ වෙතත් එවන් වෙනත් පාර්ශ්වයකට එවන් පුද්ගලයෙකු සිටින ස්ථානය දැනගැනීමට නිත්‍යානුකූල අයිතියක් තිබෙ නම් මෙම විධිවිධානය මගින් ඔවුන් සිටින ස්ථානය අනෙක් පාර්ශ්වයට හෙළි කිරීමේ හැකියාව වළක්වන්නේ නැත.

විමර්ශන

741. අතුරුදහන් වූ පුද්ගලයන් සෙවීම සහ සොයාගැනීමට යාන්ත්‍රණයක් සැපයීම සහ එවන් පුද්ගලයන් අතුරුදහන් වූ හේතු සාධක පැහැදිලි කරගැනීම සඳහා අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය ට මූලික වගකීමක් තිබේ. අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය ප්‍රධාන සිද්ධි 13කට අදාළව සමුහ මිනීවලවල් 13 ක් විමර්ශනය කිරීමේ ක්‍රියාවලියට සහාය දීමෙන් සහ පැමිණිලි භාර ගැනීමෙන් කරන ලද පැමිණිලිවලට ලැබුණ තොරතුරු මත තම විමර්ශන සහ පරීක්ෂණ කටයුතු ආරම්භ කර තිබේ. අවධානයට ලක් වූ කාරණයක් වූයේ අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය පාර්ශ්වකරුවන් රාශියක් හමුවූ බවත් අතුරුදහන් වූ පුද්ගලයන්ට අදාළවන ප්‍රධාන සිද්ධි 312කට අදාළව තොරතුරු ලබාගෙන සමාලෝචනය කර, විශ්ලේෂණය කළ බව ය.

නඩු පැවරීමේ කොටසක් ලෙස අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය

742. අධිකරණය ඉදිරියේ තිබෙන නඩු සම්බන්ධයෙන් අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය නීතිපති දෙපාර්තමේන්තුවත් සමග විත්තිකරුවෙකු ලෙස නම්කර තිබුණ ද මිය ගිය පුද්ගලයන්ගේ කොටස් සම්බන්ධ පරීක්ෂණ වලදී එම පවුල් වල සහභාගිත්වයේ වැදගත්කම අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය විසින් අවධාරණය කර තිබේ. පවුල් වල අයට විමර්ශන පැවැත්වීමේ දී තීරණාත්මක තොරතුරු ලබාදිය හැකි නිසා අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය පැත්තෙන් වන මෙම යහපත් පියවර යුක්තිය ඵලදායී ලෙස පසිඳලීමේ දී අත්‍යවශ්‍ය වන කාරණයකි.

තනි පුද්ගලයන් බලහත්කාරයෙන් අතුරුදහන් කරවීම පිළිබඳව කටයුතු කරන කණ්ඩායම

743. තනි පුද්ගලයන් බලහත්කාරයෙන් අතුරුදහන් කරවීම පිළිබඳව කටයුතු කරන කණ්ඩායම විසින් අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය වෙත 6,598 ක් පමණ සිද්ධි සම්බන්ධයෙන් තහවුරු කරන ලද වාර්තා ලබා දී තිබනෙ බව මෙම ජනාධිපති විමර්ශන කොමිෂන් සභාව වෙත දැනුම් දී තිබේ. මෙම සංඛ්‍යාවෙන් පැමිණිල 1044 ක් පමණ අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය වෙත සෘජුවම වාර්තා වී තිබේ. මෙම පැමිණිලි 1044 පිළිබඳ වෙන වෙනම විස්තරාත්මක වාර්තාවක් තනි පුද්ගලයන් බලහත්කාරයෙන් අතුරුදහන් කරවීම පිළිබඳව කටයුතු කරන කණ්ඩායම සමග බෙදාගත් බව අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය මෙම ජනාධිපති විමර්ශන කොමිෂන් සභාවට දැනුම් දී තිබේ. තනි පුද්ගලයන් බලහත්කාරයෙන් අතුරුදහන් කරවීම පිළිබඳව කටයුතු කරන කණ්ඩායම වෙත අයදුම් කළ පුද්ගලයන්ගේ අමතර තොරතුරු මෙන්ම අතුරුදහන් වූ පුද්ගලයන්ගේ අනන්‍යතාව වැඩිදුර විමර්ශන සඳහා තනි පුද්ගලයන් බලහත්කාරයෙන් අතුරුදහන් කරවීම පිළිබඳව කටයුතු කරන කණ්ඩායම විසින් ඉල්ලා තිබේ.

සාමූහික කටයුතු

744. ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුව, රජයේ රස පරීකෂක දෙපාර්තමේන්තුව, පොලිස් දෙපාර්තමේන්තුව, නීතිපති දෙපාර්තමේන්තුව, ආගමන විගමන දෙපාර්තමේන්තුව, විද්වතුන්, පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව (උපත් සහ මරණ) සහ දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් (මරණ), ප්‍රශ්නගත ලියවිලි පරීක්ෂක, අධිකරණසේවා කොමිෂන් සභාව, ජාතික ඒකාබද්ධතා සහ ප්‍රතිසන්ධාන කාර්යාලය, හානිපූරණ කාර්යාලය, ඇඟිලි සළකුණු රෙජිස්ට්‍රාර් සහ රජයේ වෛද්‍ය නිලධාරි ඇතුළු ඉහත දෙපාර්තමේන්තු සමග සාමූහිකව කටයුතු කිරීම සඳහා අතුරුදහන් වූ

තැනැත්තන් පිළිබඳ කාර්යාලය විසින් ක්‍රමෝපායික මාර්ග සැළසුමක් (2022 සිට 2025 දක්වා) සකස් කර තිබෙන බව මෙම ජනාධිපති විමර්ශන කොමිෂන් සභාව වෙත දන්වා තිබේ.

රජයේ නියෝජිතායතන, රාජ්‍ය තාන්ත්‍රිකයන් සහ ආධාර ලබා දෙන නියෝජිතායතන සමග ඡාලගත වීම.

745. 2023 වර්ෂයේ දී ප්‍රකාශයට පත්කරන ලද අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයයේ මාර්ග සිතියම අනුව අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය විසින් අධිකරණ අමාත්‍යාංශයේ සහ විදේශ කටයුතු අමාත්‍යාංශයේ ප්‍රධානත්වයෙන් වෙනත් ස්වාධීන ආයතන, රාජ්‍ය තාන්ත්‍රික අස්තිත්වයන් සහ ආධාර දෙන නියෝජිතායතන සමග පවත්වන ලද රැස්වීම් කිහිපයක් සහ අදහස් විමසීම් කිහිපයක් වෙත අවධානය යොමු කරන ලදී. අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයේ ආයතනික ධාරිතාව ශක්තිමත් කිරීම සඳහා ඒකාබද්ධව ඉදිරිපත් කරන ලද ව්‍යාපෘති යෝජනා හතක් තිබූ අතර ඉන් දෙකක් ජාතික සාම මණ්ඩලය සහ ගෝලීය ප්‍රජාවගේ ආධාර සහිතව සාර්ථක විය. අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය ට අනුව මෙම ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම තුළ මහජන සේවා වැඩසටහන් සංවිධානය කිරීම සහ අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයයේ ආයතනික ධාරිතාව ශක්තිමත් කිරීම සිදුවිය. මෙම ජනාධිපති විමර්ශන කොමිෂන් සභාව අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයේ සභාපතිගේ සහ විධායක අධ්‍යක්ෂගේ සාක්ෂි ලබාගත් අතර මෙම වැදගත් සත්‍ය සෙවීමේ යාන්ත්‍රණයේ ආයතනික ළඟාවීම තහවුරු කර ගැනීම සඳහා එහි සභාපති සහ විධායක අධ්‍යක්ෂ සමග අදහස් විමසීම් කිහිපයක් ද සිදු කළ අතර අපගේ අදහස වන්නේ අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයේ බලතල සහ එහි හැකියාවන් පිළිබඳව රටේ සියළුම ප්‍රදේශ වල ජනතාව දැනුවත් විය යුතු බව ය. මඩකලපුව ප්‍රදේශයෙන් අප සම්මුඛ සාකච්ඡාවකට කැඳවන ලද සමහර සාක්ෂිකරුවන් මෙවන් කාර්යාලයක් පවතින බව නොදැන සිටියහ. මෙම ආයතනයේ සංවේදිකරණ කටයුතු තවදුරටත් ඵලදායී කළ යුත අතර මෙය පිහිටුවීමේ අභිප්‍රායයට සහ ශක්තියට පූර්ණ වශයෙන් ක්‍රියාකාරී වීමට බලය ලබා දිය යුතු බව කොමිෂන් සභාව අදහස් කරයි.

746. මෙම ආයතනය වෙත එල්ල වන විවේචන කුමක් වුවද, එහි මෙහෙයුම් ධාරිතා වර්ධනය සහ ආයතනය නගාසිටුවීම මගින් ශක්තිමත් කළ හොත් මෙම බහුවිධ භූමිකාවේ ඵලදායී ලෙස යෙදීම සඳහා එයට විභවය තිබෙන බව මෙම ජනාධිපති විමර්ශන කොමිෂන් සභාවේ මතය වේ.

747. අවසානයේ මෙම අවසන් වාර්තාවේ 6 වන පරිච්ඡේදයේ මෙම ජනාධිපති විමර්ශන කොමිෂන් සභාව විසින් තම නිර්දේශ ඉදිරිපත් කරනු ඇත.

සමාප්තිය

748. අතුරුදහන් වූවන් පිළිබඳ කාර්යාලය (පිහිටුවීම, පරිපාලනය කිරීම සහ කර්තව්‍ය ඉටු කිරීම) පනත තුළින් ස්වාධීන, වගවීමෙන් යුතු විනිවිදභාවයෙන් යුතු අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයක් මානුෂීය විධිනියෝගයක් සහිතව අතුරුදහන් වූ පුද්ගලයන් සම්බන්ධයෙන් ශ්‍රී ලංකාවේ සියළු ප්‍රදේශවලින් පැමිණෙන පැමිණිලි ආමන්ත්‍රණය කිරීම සඳහා අවශ්‍ය බලය සහිතව පිහිටුවා තිබේ. අතුරුදහන් වූවන්ගේ පවුල්වල පුද්ගලයන් තමන්ගේ ආදරණීයයන් අතුරුදහන්වූයේ කෙසේද හෝ ඔවුන් ජීවත් වනවාද නැත්නම් මරණයට පත්වී තිබේද යන කෲර අස්ථිරතාවට මුහුණ දෙති. විධිමත් ලෙස සහ කාර්යක්ෂමව ක්‍රියාත්මක කළ හොත් අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයේ බලතල වලට අතුරුදහන් වූ පුද්ගලයන්ගේ ඥාතීන් සැළකිය යුතු පිරිසකට මෙවාට පිළිතුරු ලබා දීම, අවසන් කිරීම සහ යෝග්‍ය සහන සහ සහ සහාය ලබා දීම සඳහා පහසුකම් සැළසිය හැකිය. විශ්වසනීය යාන්ත්‍රණයක් තුළින් බලහත්කාරයෙන් අතුරුදහන්

කරවීම සම්බන්ධ සිද්ධි පිළිබඳ සොයා බැලීමටත් ඒවා නැවත ඇතිවීම වැළැක්වීමටත් සැළකිය යුතු ලෙස දායකත්වය ලබා දිය හැකිය.

749. කෙසේ වෙතත් අවධාරණය කළ යුතු කාරණය වන්නෙ ප්‍රතිසන්ධානය ළඟාකර ගැනීමේ අරමුණින් සත්‍ය සෙවීමේ කාර්යය භාර ගැනීම සඳහා අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයට ව්‍යවසථාපිත බලයක් ලබාදී තිබුණ ද එහි ආයතනික ධාරිතාව පැත්තෙන් යම් යම් අඩු පාඩු දක්නට ලැබෙන බැවින් ඒවා ශක්තිමත් කිරීම සිදු කළ යුතු අතර මෙම ජනාධිපති විමර්ශන කොමිෂන් සභාව ඉදිරිටය පැමිණි බොහෝ සහභාගිවන්නන් අවශ්‍ය විශ්වසනීයත්වය ප්‍රදර්ශනය නොකළ අතර එයට හේතුව වන්නට ඇත්තේ සමාන කොමිෂන් සභා විසින් අතීතයේදී ලබා දුන් ඉෂ්ට නොකළ පොරොන්දු විය හැකිය. මෙම ජනාධිපති විමර්ශන කොමිෂන් සභාව ඉදිරියට පැමිණි ජනතාවගේ අදහස වූයේ අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය විසින් සිදුකරන විමර්ශන තුළින් සත්‍ය සොයාගැනීමට නොහැකි වූ බවය. එවන් අවස්ථාවල මෙම ජනාධිපති විමර්ශන කොමිෂන් සභාව එම ක්‍රියාකාරිත්වය තුළින් ලැබුණ ප්‍රතිඵල සම්බන්ධයෙන් තම නිරීක්ෂණ සිදු කරන අතර එහි අවසන් නිරීක්ෂණ සම්බන්ධ අදහස් විමසීම මෙම අවසන් වාර්තාවේ පස් වෙනි පරිච්ඡේදයේ දක්වා තිබේ. අවශ්‍ය නිර්දේශ 6 වන පරිච්ඡේදයේ දක්වා තිබේ. මෙම ආයතනය ඉතාමත් උදෙග්ගිවන්තව කටයුතු කරන නිලධාරින් සහිත ආයතනයක් නිසාත් මෙම නීතියේ අපේක්ෂාවන්ට සහ අරමුණු වලට පූර්ණ බලය ලබා දිය යුතු නිසාත් මෙම ඉතාම වැදගත් සත්‍ය සෙවීමේ යාන්ත්‍රණය ශක්තිමත් කිරීමේ අදහසින් අප ලබාදෙන නිර්දේශ දැඩි අවබෝධයකින් යුතුව ලබා ගනු ඇතැයි අපි අපෙක්ෂා කරමු.

750. අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය එහි ක්‍රියාකිරිත්වයේ වර්තමාන ප්‍රගතිය උතුරු නැගෙනහිර පළාත් සංවර්ධනය සහ බලය බෙදීමට අදාළව ලබා දී තිබේ. පහසුව තකා එය මෙම අවසන් වාර්තාවේ ඇමුණුම 5 ලෙස දක්වා තිබේ.

751. හානි පූරණ කාර්යාලය යනුවෙන් හඳුන්වන ආයතනයක් විසින් ක්‍රියාත්මක කෙරෙන සංක්‍රාන්ති යුක්තියේ තවත් කුළුණක් දෙස මෙම ජනාධිපති විමර්ශන කොමිෂන් සභාව තම අවධානය යොමු කරයි.

02. හානි පූරණ කාර්යාලය

752. උගත් පාඩම් සහ ප්‍රතිසන්ධාන කොමිෂන් සභාව හෝ අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය විසින් නිර්දේ කරන හානිපූරණයට අදාළ නිර්දේශ ක්‍රියාත්මක කිරීම සඳහා පහසුකම් සැළසීම පිණිස 2018 අංක 34 දරන පනත මගින් 2018 ඔක්තෝබර් 22 දින හානි පූරණය සඳහා වන කාර්යාලය පිහිටුවන ලදී. එම පනතේ පූර්විකාව තුළ පනත විස්තර කර තිබෙන්නේ හානිපූරණය සඳහා යෝග්‍ය පීඩාවට පත් තැනැත්තන් හඳුනාගත් පසුව එම තැනැත්තන්ට තනි තනිව සහ සාමූහිකව හානිපූරණයන් ලබා දීම සඳහා විධිවිධාන සැළැස්වීම පිණිස වන පනතක් ලෙස වේ. මෙම පනත මගින් හානිපූරණයේ එක් පැත්තක් ආවරණය කළ 1987 අංක 29 දරන තැනැත්තන්, දේපළ සහ කර්මාන්ත පුනරුත්ථාපනය කිරීමේ අධිකාරිය පනත ඉවත් කිරීම ද සිදුකර තිබේ. එනම් දේපළ, කර්මාන්ත සහ ව්‍යාපාර සම්බන්ධයෙන් වන ගැටළු එයට අයත් විය. තැනැත්තන්, දේපළ සහ කර්මාන්ත පුනරුත්ථාපනය කිරීමේ අධිකාරිය පනත ක්‍රියාත්මක කරන ලද්දේ 1983 ජූලි මස සිදුවූ වාර්ගික ගැටුම් වලින් පසුව වේ. තැනැත්තන්, දේපළ සහ කර්මාන්ත පුනරුත්ථාපනය කිරීමේ අධිකාරිය පනත මුල් අවස්ථාවේදී මහජන ආරක්ෂක ආඥාපනත යටතේ හදිසි කාරුණක් ලෙස ප්‍රකාශයට පත් කෙරිණි. ඉන් පසු ‘‘හදිසි තත්ත්වය" අවසන් වී එය යටතේ ක්‍රියාත්මක වූ රෙගුලාසි අවලංගු වන අවස්ථාවක යටිතල පහසුකම් අඛණ්ඩව තබා ගැනීම සඳහා එය පාර්ලිමේන්තු පනතක් වශයෙන් සම්මත කරන ලදී. පනතේ දීර්ඝ නාමය මෙසේ සඳහන් වේ.

"යම් යම් දේපළ, කර්මාන්ත සහ ව්‍යාපාර අලුත්වැඩියා කිරීම, ප්‍රතිස්ථාපනය සහ පුනරුත්ථාපනය කිරීම සඳහා සහාය වීම සඳහා වන අධිකාරියක් පිහිටුවීම සහ ඊට සම්බන්ධ හෝ ඊට ආනුෂංගික කාරණා සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද වූ පනතකි."

753. බස්නාහිර, දකුණු සහ සබරගමුව පළාත් වල[507] ස්ව කැමැත්තෙන් නොවන ආකාරයට යම්යම් පුද්ගලයන් ඉවත් කිරීම හෝ අතුරුදහන් කරවීම පිළිබඳව වූ ශ්‍රී ලංකාවේ පැවති මෙම ජනාධිපති විමර්ශන කොමිෂන් සභා විසින් ලංකාවට ම අදාළ වන ආකාරයට[508] ස්ව කැමැත්තෙන් නොවන ආකාරයට යම්යම් පුද්ගලයන් ඉවත් කිරීම හෝ අතුරුදහන් කරවීම පිළිබඳව වූ ශ්‍රී ලංකාවේ පැවති මෙම ජනාධිපති විමර්ශන කොමිෂන් සභා විසින් මීට පෙර කරන ලද නිර්දේශ වලදී ද හානිපූරණය සඳහා නිර්දේශ ලබා දී තිබේ. 1983 කැරළි කෝළාහල පිළිබඳ විමර්ශනය කිරීම සඳහා වූ කොමිෂන් සභාව ද තම පරීක්ෂණ අවසානයේ 1984 කැරළි කෝළාහල වල වින්දිතයන්ට හානිපූරණය ලබා දෙන ලෙස නිර්දේශ කළ අතර ඒවා පැරණි පාර්ලිමේන්තු සංකීර්ණයේ දී පවත්වන ලද රාජ්‍ය උත්සවයකදී කොමිෂන් සභාවේ සාමාජිකයන්ගේද සහභාගිත්වය සහිතව බෙදා දෙන ලදී. මෙහිදී සැළකිය යුතු කාරණය වන්නේ එවකට සිටි ජනාධිපති චන්ද්‍රිකා බණ්ඩාරනායක මහත්මිය මෙම උත්සවයේ දී දෙමළ ජනතාවට සිදු කරන ලද බිහිසුණු වැරදි සම්බන්ධයෙන් සමාව ඉල්ලා සිටියා ය.

754. "ශ්‍රී ලංකාවේ ප්‍රතිසන්ධානය, වගවීම සහ මානව හිමිකම් ප්‍රවර්ධනය කිරීම" යන මැයෙන් වන එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කොමිෂන් සභාවේ යෝජනාව (A/HRC/RES/30/1) තුළ මෙය පිහිටුවීමට යෝජිත යාන්ත්‍රණයන්ගෙන් එකක් වූ අතර එසේ වන්නේ එය සංක්‍රාන්ති යුක්තිය ඉටු කිරීමේ ක්‍රියාවලියේ එක් ස්ථම්භයක් වන නිසා වේ.

755. මෙම ජනාධිපති විමර්ශන කොමිෂන් සභාව විසින් තම දෙවන අතුරු වාර්තාවේ[509] පූර්ණ වශයෙන් සොයාබලන ලද සංක්‍රාන්ති යුක්තිය පිළිබඳ සාමාන්‍ය ආකෘතිය තුළ "පහළ සිට ඉහළට" ගමන් කරන සහභාගිත්ව ප්‍රවේශය පිළි ගන්නා අතර එමගින් ප්‍රචණ්ඩ අරගල වල ඉදිරි පෙළ සහ පීඩාවට පත්වන ස්ථාන වල සිටින පිරිස් සහ ප්‍රජාවන් සංක්‍රාන්ති යුක්තියේ කේන්ද්‍රස්ථානයේ තබයි.[510] "සංක්‍රාන්ති යුක්තිය කා සඳහා ද?" යන ගැටළුවට සෘජු පිළිතුරක් සාමාන්‍ය ආකෘතිය තුළ වින්දිතයන් සහ ඔවුන්ගේ අයිතිවාසිකම් (සත්‍ය, සාධාරණත්වය, හානිපූරණය ආදියට) එහි කේන්ද්‍රයේ තැබීමෙන් ලබා දෙනු ලබයි.

756. සංක්‍රාන්ති යුක්ති වැඩසහන් සකස් කිරීමේ දී සමාන්‍යයෙන් පිළිගත් ක්‍රමවේදය වන වින්දිත කේන්ද්‍රීය ක්‍රමය අනුව 27 වෙනි වගන්තියෙන් හානිපූරණය සඳහා සුදුසුකම් ලබන "පීඩාවට පත් තැනැත්තා" යන්න නිර්වචනය කරයි.

පීඩාවට පත් තැනැත්තෙක් යනු කවුද?

757. "පීඩාවට පත් තැනැත්තන්" යන්නෙන්

---

507 1997 අංක V දරන වාර පත්‍රිකාව, පි.169-171 (I වෙනි වෙළුම)

508 1997 අංක V දරන වාර පත්‍රිකාව, පි.169-171 (I වෙනි වෙළුම) Sessional paper No. I of 2001 pp.86 -87 (Vol.I)

509 2022 පෙබරවාරි 18 දරන දෙවන අන්තර්වාර වාර්තාව

510 "පහළ සිට"යන පැතිකඩ ට පක්ෂව තර්ක කරන රචනා එකතුවක ඇතුලාන්තය සඳහා පහත සඳහන් ලේඛන පරිශීලනය කරන්න. McEvoy, Kieran and McGregor, Lorna (2008) Transitional Justice form Below; An Agenda for Research, Policy and Praxis" in Kieran McEvoy and Lorna McGregor (eds.)Transitional Justice from Below; Grassroots Activism and the Struggle for Change (Oxford; Hart Publshing) 1-13

(අ) (i) උතුරු සහ නැගෙනහිර පළාත්වල සිදු වූ සන්නද්ධ ගැටුම් අතරතුර එහි ප්‍රතිඵලයක් වශයෙන්, හෝ ඊට සම්බන්ධව හෝ එහි පසුවිපාකයක් ලෙස; හෝ

(ii) දේශපාලන නොසන්සුන්තාවයක් හෝ සිවිල් කැළඹීම හේතුවෙන්: හෝ

(iii) ශ්‍රී ලංකාවේ පුද්ගලයන්ට, කණ්ඩායම්වලට හෝ ජන කොට්ඨාසවලට වූ හානිය දීර්ඝ සහ බරපතල ස්වභාවයේ හානියක් වීම හේතුවෙන් හෝ

(iv) 2018 අංක 5 දරන, බලහත්කාරයෙන් අතුරුදහන් කිරීම්වලින් සියලු තැනැත්තන් ආරක්ෂා කිරීම සඳහා වූ ජාත්‍යන්තර සම්මුති පනතේ නිර්වචනය කර ඇති පරිදි වූ බලහත්කාරයෙන් අතුරුදහන් වීමක් හේතුවෙන්,

ජීවිතය අහිමි වීම හෝ ඔවුන්ට හෝ ඔවුන්ගේ දේපළවලට හෝ හානිවීම හේතුවෙන් පීඩාවට පත්වූ තැනැත්තන් වේ.

758. හානිපූරණ පනතේ 27 කොටස යටතේ සඳහන් වන අර්ථයෙන් ඉහත සිද්ධිවල අවස්ථානුගත කරුණු වල සඳහන් මියගිය තැනැත්තකුගේ හෝ අතුරුදහන් වූ තැනැත්තකුගේ ඥාතීන් ද පීඩාවට පත් තැනැත්තකු බවට පත්වීමට සුදුසුකම් ලබයි.

759. මියගිය තැනැත්තකුගේ හෝ අතුරුදහන් වූ තැනැත්තකු සම්බන්ධයෙන් ‘‘ඥාතීන්" යන්නට පහත දැක්වෙන තැනැත්තන් ඇතුළත් විය යුතු ය.

(i) කලත්‍රයා,

(ii) ළමයින්

(iii) දෙමාපියන්

(iv) සහෝදර සහෝදරියන්

(v) නැන්දණියන්/ මාමණ්ඩිවරු, මස්සිනාවරුන්/ නැනාවරුන්, බෑණාවරුන්/ ලේලිවරුන්

(vi) මුණුබුරු මිණිබරියන් සහ ආතා සහ ආච්චි

760. පහත සඳහන් ආකාරයට ‘‘තනි හානිපූරණය" සහ ‘‘සාමූහික හානි පූරණය" පිළිබඳ නිර්වචන ඉදිරිපත් කර තිබෙන ආකාරයට හානිපූරණය යන්නෙහි පුළුල් අර්ථය ආවරණය කරයි.

761. හානිපූරණ කාර්යාලය පනතෙහි 27 වගන්තිය මගින් ‘‘තනි හානිපූරණය"යන්නෙන් තනි පීඩාවට පත් තැනැත්තකු සඳහා ඵලදායී ප්‍රතිකර්ම සහ ප්‍රතිලාභ සඳහා වන අයිතිවාසිකම් පිළිගැනීම අරමුණු කරගත් පියවර අදහස් විය යුතු අතර එයට -

අ. පීඩාවට පත් තැනැත්තෙකු සඳහා සපයන ලද යම් මූල්‍යමය ගෙවීම් හෝ ද්‍රව්‍යමය ප්‍රතිලාභ;

ආ. ක්ෂුද්‍ර මූල්‍ය සහ සහනදායී ණය;

ඇ. අධ්‍යාපන වැඩසටහන්, පුහුණු කිරීම, සහ කුසලතා සංවර්ධන වැඩසටහන්;

ඈ. පීඩාවට පත් තැනැත්තකු සඳහා සපයන ලද මනෝ සමාජීය සහාය ඇතුළු පරිපාලන සහාය, සහ සුභසාධන සේවා,

ඉ. ඉඩම් සහ නිවාස සැපයීම ඇතුළු ප්‍රතිෂ්ඨාපන පියවර;

ඊ. හානිපූරණය සඳහා වන කාර්යාලය විසින් හඳුනාගනු ලැබූ වෙනත් සුදුසු පියවර

ඇතුළත් විය යුතු ය.

762. 27 වෙනි වගන්තිය මගින් ‘‘සාමූහික හානිපූරණය"යන්නද නිර්වචනය කර තිබෙන අතර එයින් පීඩාවට පත් තැනැත්තන් කණ්ඩායම් හෝ කොට්ඨාස සඳහා ඵලදායී ප්‍රතිකර්ම සහ ප්‍රතිලාභ සඳහා වන අයිතිවාසිකම් පිළිගැනීම අරමුණු කරගත් යම් පියවර අදහස් විය යුතු අතර එයට -

අ. ස්මාරක ඇතුළුව මිය ගිය තැනැත්තන් අනුස්මරණය කිරීමේ ක්‍රම;

ආ. යටිතල පහසුකම් සංවර්ධනය;

ඇ. අධ්‍යාපනික වැඩසටහන්, පුහුණු කිරීම සහ කුසලතා සංවර්ධන වැඩසටහන්;

ඈ. ප්‍රජා සංවර්ධන වැඩසටහන් හෝ සේවා: සහ

ඉ. පීඩාවට පත් ජන කොට්ඨාස විමසා හානිපූරණය සඳහා වන කාර්යාලය විසින් හඳුනාගනු ලැබූ වෙනත් සුදුසු වැඩසටහන්,

ඇතුළත් විය යුතු ය.

763. වෙනත් වචන වලින් පවසන්නේ නම්, යම් කිසි පුද්ගල කණ්ඩායමක් හෝ ප්‍රජාවක් සාමූහිකව යම් කිසි හඳුනාගත් සිද්ධියක් නිසා සාමූහිකව යම් කිසි පාඩුවකට හෝ හානියකට මුහුණ දෙන්නේ නම් ඔවුන් පීඩාවට පත් ජනතාවක් ලෙස සළකනු ලැබේ.

764. යම් කිසි හඳුනාගත් සිද්ධියක් ඇතිවීම හේතුවෙන් යම් කිසි හානියක් හෝ පාඩුවක් අත්විඳින්නට සිදුවූ ආරක්ෂක අංශ වල සාමාජිකයන් හෝ ඔවුන්ගේ පවුල්වල අය ‘‘පීඩාවට පත් තැනැත්තන්"ලෙස හඳුනාගත හැකිය .

765. සහාය ලැබිය යුත්තේ කාටද යන්න පිළිබඳව කිසිදු භූගෝලීය නිර්ණායකයක් භාවිතා කර නොමැත. රටෙහි යම් කිසි කලාපයක් තුළ ජීවත් වන පුද්ගලයන්ට පමණක් හානිපූරණය ලබා ගත හැකිය යනුවෙන් කිසිදු නීතියක සඳහන්ව නැත. යම් කිසි අදාළ සිද්ධියක් නිසා යම් කිසි පාඩුවක් හෝ හානියක් අත්විඳින පුද්ගලයා ඔහු වර්තමානයේ ජීවත්වන ප්‍රදේශය කුමක් වුවත් හෝ ඊට පෙර ජීවත් වූ ප්‍රදේය කුමක් වුවත් වන්දි සඳහා ඔවුන්ට අයිතිය තිබේ. හානිපූරණ කාර්යාලය පනත අනුව සියලුම ජනතාව සහ ප්‍රදේශ සහන ලබා ගැනීමේ හිමිකම ලබයි.

766. අදාළ පාර්ශ්ව සමග කටයුතු කිරීමෙන් පසුව හානිපූරණ කාර්යාලයේ සාමාජිකයන් මේ කාරණය සඳහා ප්‍රතිපත්ති සහ මෙහෙයුම් නිර්ණායක සකස් කර ඉදිරිපත් කළ යුතු ය.

767. හානිපූරණ කාර්යාල පනතේ 11(1) (උ) වගන්තිය සමග කියවිය යුතු 2 (අ) කොටසට අනුකූලව සකස් කරන ලද හානිපූරණ ප්‍රතිපත්ති සහ මෙහෙයුම් නිර්ණායක අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලදුව ප්‍රතිපත්ති සහ මෙහෙයුම් නිර්ණායක සකස් කරන ලද නිර්ණායක නිරූපණය කරයි.

768. හානිපූරණ කාර්යාලයේ සභාපතිනිය වන ධාරා විජේතිලක මහත්මිය මෙම ජනාධිපති විමර්ශන කොමිෂන් සභාව ඉදිරියේ සාක්ෂි දෙමින් හානි පූරණ කාර්යාලයේ ප්‍රතිපත්ති සහ මෙහෙයුම් නිර්ණායක පිළිබඳ පැහැදිලි කළා ය. හානි පූරණ කාර්යාලයේ මෙහෙයුම් නිර්ණායක සහ ප්‍රතිපත්තිවලට අනුව යාපනය කෝපායි දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ කාන්තා ගෘහ මූලික පවුල් 25 ක් සහ මන්නාරම දිස්ත්‍රික්කයේ කාන්තා ගෘහ මූලික පවුල් 5 ක් ඉලක්ක කර 2023 සඳහා ජීවනෝපාය සංවර්ධන වැඩසටහන් ආරම්භ කරන ලදී. හානි පූරණ කාර්යාලයේ මනෝ සමාජයීය ඒකකය විසින ප්‍රජා සහාය මූලාරම්භයක් ළඟදී ම දියත් කිරීමට නියමිත ය.

769. සාක්ෂිකරුවන් යම් ප්‍රමාණයක් කම්පන සහගත අත්දැකීම් සහ ස්ත්‍රීපුරුෂ සමාජභාවය පදනම් කරගත් වැරදි ක්‍රියා පිළිබඳව පැමිණිලි කළ අතර මෙම අවසන් වාර්තාවේ 4 වන පරිච්ඡේදය මෙවන් සිද්ධි

වාර්තා කරයි. මෙම අරගලයේ දුෂ්කර පීඩාවන්ට පත් වූ මෙම කොටසට හානි පූරණ කාර්යාලයේ හානි පූරණය අත්‍යවශ්‍ය වේ.

770. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ නිර්දේශ මත පනත මගින් මෙම ජනාධිපතිවරයාට සාමාජිකයන් පස් දෙනෙකු පත් කිරීමට බලය තිබෙන අතර ඉන් කෙනෙක් එහි සභාපති ලෙස සේවය කරයි. මෙම පනතේ නීති ක්‍රියාත්මක කරනු ලබන බවට වගබලා ගැනීම මෙම සාමාජිකයන්ගේ වගකීම වේ. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව පළමු සාමාජිකයන් පස් දෙනා වසර තුනක කාලයක් සඳහා 2019 අප්‍රේල් මස පත් කරන ලදී. හානි පූරණ කාර්යාලයේ ලේකම් කාර්යාලය එහි ප්‍රතිපත්ති, වැඩසටහන් සහ සැළසුම් ක්‍රියාත්මක කිරීම සඳහා සහාය ලබා දෙන පුද්ගලයන්ගෙන් සමන්විත වේ. එහි වගකීම් ක්‍රියාත්මක කිරීම සඳහා හානි පූරණ කාර්යාලයට අමතරව කළාප කාර්යාලද විවෘත කළ හැකිය.

771. පීඩාවට පත් පුරවැසියන්ට අරමුදල බෙදා දීම සඳහා ඉහත සඳහන් මෙහෙයුම් නිර්ණායක පාර්ලිමේන්තුව විසින් අනුමත කළ යුතු ය. හානි පූරණ කාර්යාලයේ අධිකරණ බලය හමුදා සේවය සම්බන්ධ පැමිණිලි වලින් ඔබ්බට ගමන් කරන අතර පසුගිය සිද්ධි වලින් පැන නගින කරුණු පමණක් නොව යම් කිසි හදුනාගත් තත්ත්වයන් තුළ අනාගතයේ සිදුවිය හැකි විභව සිද්ධීන් නිසා ඇතිවන දුක්ගැනවිලිද ඇතුලත් වේ. එහි ප්‍රතිඵලයක් වශයෙන් එය වර්තමාන සිද්ධි මෙන්ම විභව අනාගත සිද්ධි ද සලකා බලයි.

772. හානි පූරණ කාර්යාලය යනු අධිකරණ හෝ විමර්ශන ආයතනයක් නොවේ. හානි පූරණ කාර්යාලය වැරදි කිරීම් සම්බන්ධ සෙවීම් හෝ පැමිණිලි විමර්ශනය නොකරයි. හානි පූරණ කාර්යාලයේ වගකීම වන්නේ හානිපූරණය සඳහා වන අයදුම්කරු ඒ සඳහා සුදුසුකම් ලබන්නේ ද යන්න විමසා බලා එවන් පුද්ගලයන්ට හෝ කණ්ඩායම් වලට තනි හෝ සාමූහික හානිපූරණය ලබා දීමයි.

773. යම් කිසි පුද්ගලයෙක් යම් අපරාධයකට වරදකරුද යන්න තීරණය කිරීම සඳහා අපරාධ පිළිබඳ පැමිණිලි විභාග කිරීමට හානි පූරණ කාර්යාලයට අවසර නැත. එවන් පැමිණිලි පොලිසියට ඉදිරිපත් කළ යුතු අතර එවන් සිද්ධි සම්බන්ධව සොයා බැලීම සඳහා වන නිසි නීතිය ක්‍රියාත්මක කිරීමේ ආයතනය වන්නේ පොලිසිය වේ.

774. යම්කිසි හදුනාගත් සිද්ධියක් ඇතිවන අවස්ථාවකදී යම්කිසි පුද්ගලයෙකුගේ නීතිවිරෝධී හැසිරීමක් නිසා යම්කිසි පුද්ගලයෙකුට යම් කිසි පුද්ගලික හානියක්, චිත්තවේගී අපයෝජනයක් හෝ වෙනත් ආකාරයේ පාඩුවක් හෝ හානියක් අත්දුටු විට එවන් පුද්ගලයන්ට හානි පූරණ කාර්යාලයේ සහන ඉල්ලා අයදුම් කළ හැකිය. අයදුම්කරු අගතියට පත්වූ පාර්ශ්වය ලෙස තීරණය වූ විට හානි පූරණ කාර්යාලය එම අයදුම්පත සමාලෝචනය කර, අයදුම්කරුගේ අවශ්‍යතා තීරණය කර අයදුම්කරුට ඔහුගේ හෝ ඇයගේ ජීවිතය නැවත ගොඩනගාගැනීමට හැකිවන පරිදි සහාය ලබා දීම පිළිබඳව සළකා බලයි. කෙසේ වෙතත් යම් කිසි අපරාධයක් සිදුකළ බවට සැක කෙරෙන පුද්ගලයා වැරදිකරුද නිවැරදිකරුද යනුවෙන් තීරණය කිරීමට කිසිදු පරීක්ෂණයක් නොකෙරෙනු ඇත.

හානිපූරණය යනු කුමක්ද?

775. 2005 වසරේදී හානිපූරණය සඳහා වන අයිතිය ශක්තිමත් කළ අතර එක්සත් ජාතීන්ගේ මහ සභාවේ යෝජනාවක් ලෙස ඒ සඳහා නෛතික රාමුවක් ස්ථාපිත කරන ලදී. තියෝ වැන් බොවන් සහ ෂෙර්ෆ් බැසියෝනි යන විශේෂ නියෝජිතයන් ගේ නිර්දේශ මත පදනම්ව සකස් කළ මෙම යෝජනාව බරපතළ ලෙස මානව හිමිකම් හිමිකම් උල්ලංඝනය වූ වින්දිතයන්ට පුළුල් හානිපූරණ ක්‍රමවේදයක් ලබාදීමේ ‘‘මූලික ප්‍රතිපත්ති සහ මෙහෙයුම් නිර්ණායක" ඇතුළත් වේ.

හානිපූරණයේ ස්වරූප

776. අතීතය සමග ගනුදෙනු කරන ක්‍රියාවලියේ කොටසක් වශයෙන් හානිපූරණයට විවිධ පැතිකඩ තිබිය හැකිය. මේ සඳහා මානව හිමිකම් උල්ලංඝනය කරමින් රඳවා තබාගත් ඉඩකඩම් සහ දේපළ ආපසු ලබා දීම මෙන්ම නීති විරෝධී ඝාතන, සෞඛ්‍ය ට සිදුවන හානි හෝ නිදහස අහිමි කිරීම වෙනුවෙන් මූල්‍ය වන්දි ස්වරූපයෙන් ද්‍රව්‍යාත්මක හානිපූරණය වැනි දේ ඇතුළත් විය හැකිය. එසේම තවත් වැදගත් කාරණයක් වන්නේ අත්විඳින ලද අසාධාරණය වෙනුවෙන් නෛතික සහ සදාචාර්තමක පුනරුත්ථාපනය ලබා දීමේ විවිධ ක්‍රම යොදා ගැනීමයි. පුළුල් වශයෙන් බලන විට හානිපූරණයට වින්දිතයන්ගේ අත්විඳි පීඩාවන් පිළිගැනීමට යොදාගත් ක්‍රමවේද සහ අලුතින් මානව හිමිකම් උල්ලංඝනය වීම් වැළැක්වීමයි. සැළකිය යුතු කාරණය වන්නේ උදාහරණයක් ලෙස ස්මාරක සහ සිහිකිරීම් උත්සව වේ.

777. එක්සත් ජාතීන්ගේ "මූලික මූලධර්ම" තුළ හානිපූරණයේ විවිධ ස්වරූප නිර්වචනය කර පහත ආකාරයෙන් වර්ගීකරණය කර තිබේ.[511]

- ප්‍රතිස්ථාපනය - එනම් කලින් තිබූ තත්ත්වයට පත් කිරීමයි. ඒ සඳහා උදාහරණයක් ලෙස ඉඩම් ආපසු ලබා දීම සහ දේශපාලන සිරකරුවන් නිදහස් කිරීම දැක්විය හැක.

- මූල්‍යමය වශයෙන් ගණනය කරන ලද හානි සඳහා වන්දි - රැකියා අහිමිවීම් හෝ විශ්වවිද්‍යාල අධ්‍යාපනය අහිමිවීම වැනි - භෞතික සහ මනෝ සමාජයීය හානි මෙන්ම බරපතළ මානව හිමිකම් උල්ලංඝනය වීම් නිසා ඇතිවන නීති උපදෙස් ලබා ගැනීම හෝ වෛද්‍ය ප්‍රතිකාර ලබා ගැනීම ආදිය සඳහා වන්දි ගෙවිය හැකි ය.

- පුනරුත්ථාපනය - "මූලික මූලධර්ම" වල වෛද්‍ය සහ මනෝ සමාජයීය ප්‍රතිකාර සඳහා උදාහරණ ලබා දී තිබේ. එහෙත් නඩු තීන්දු වෙනස් කිරීම හෝ යම්කිසි වෙන්කොට සැළකිමේ ක්‍රියාවක් නීතිවිරෝධී ලෙස ප්‍රකාශ කිරීමෙන් සදාචාරාත්මක පුනරුත්ථාපනය ද කළ හැකිය.

- තෘප්තිය - උදාහරණයක් ලෙස තොරතුරු තහවුරු කරගැනීම සහ සත්‍ය හෙළි කිරීම, ප්‍රසිද්ධියේ සමාව ගැනීම සහ ඒකාධිපති පාලනයක හෝ සිවිල් යුද්ධයක වින්දිතයන් වෙනුවෙන් ස්මාරක ඉදිකිරීම.

- නැවත සිදුනොව බවට තහවුරුව - යම් කිසි පුළුල් හානිපූරණ ස්වරූපයක් වන අතර වෙනස් සංක්‍රාන්ති විකල්පයක් ලෙස ද මෙය සමහර අවස්ථාවල හඳුනා ගන්නා අතර (ආයතනික ප්‍රතිසංස්කරණ) එයට සටන් කරුවන් නිරායුධ කිරීම, ආරක්ෂක සේවා අධීක්ෂණය කිරීම, විනිශ්චයකාරවරු සහ නඩු පවරන්නන් පුහුණු කිරීම සහ මානව හිමිකම් උල්ලංඝනය කරන නීති පරිවිඡින්න කිරීම ප්‍රතිකර්මයක් ලෙස සිදු කළ හැකි ය.

778. සංක්‍රාන්තිමය තත්ත්වයන්ට හානිපූරණය කිරීම සඳහා නීතිමය බැඳියාවක් තිබේ. Velasquez Rodriguez සිද්ධියේ දී පළමු වතාවට අන්තර් ඇමරිකානු මානව හිමිකම උසාවිය තීරණය කළ ආකාරයට මානව හිමිකම් උල්ලංඝනය වීම වැළැක්වීමට, විමර්ශනය කිරීමට සහ ඒවාට දඬුවම් දීමට රජයට තිබෙන වගකීමට අමතරව වැරදිකරුවන් දඬුවම් ලබා දීම අපහසු අවස්ථාවලදී පවා

[511] ජාත්‍යන්තර මානව හිමිකම් නීතිය බරපතළ ලෙස උල්ලංඝනය වීම සහ ජාත්‍යන්තර මානුෂීය නීතිය බරපතළ ලෙස උල්ලංඝනය වීම (2005 දෙසැම්බර් 16) ට අදාළ වින්දිතයන්ට ප්‍රතිකර්ම සහ හානිපූරණය සඳහා වන අයිතිය පිළිබඳ එක්සත් ජාතීන්ගේ මූලික මූලධර්ම සහ මෙහෙයුම් නිර්ණායක. UN Doc. A/RES/60/147,p.7 Colombian Justice and Peace Act (Law 975) of 2005 හි 8 වන නියාමිතයේ ඇති නිර්වචනය ද මේ මත පදනම් වේ.

විත්දිතයන්ට සහ ඔවුන්ගේ පවුල්වල අයට සදාචාරාත්මක සහ ද්‍රව්‍යාත්මක ලෙස හානිපූරණය කිරීමේ ස්වාධීන වගකීමක් තිබේ.

779. තමන්ට පාලනය කළ නොහැකි යම් යම් සිද්ධීන් නිසා යම් කිසි හානියක් හෝ පාඩුවක් සිදුවූ හෝ යම් කිසි ඥාතියෙක් අහිමි වීම නිසා පීඩාවට පත් වූ පුද්ගලයන්ට ගෙවීම් කිරීම සම්බන්ධ අදහස ශ්‍රී ලංකා රජය විසින් පෙර සිටම වටහාගෙන තිබුණි.

780. පුද්ගලයන් පුනරුත්ථාපනය කිරීමේ ක්‍රියාවලිය තුළ 1987 අංක 29 දරන දේපළ සහ කර්මාන්ත අධිකාරිය පනත තුළින් මේ ආකාරයට වන්දි ලබා දීම 1987 පමණ ඇත කාලයක සිට හඳුනාගෙන තිබුණි.

781. 1987 අංක 29 දරන දේපළ සහ කර්මානත් අධිකාරිය පනත මූල්‍ය වන්දි ලබා දීමට බලය ලබා දෙයි. මූල්‍ය වන්දි වලට අමතරව නව හානි පූරණ කාර්යාලය ප නත වෙනත් ආකාරයේ සහන ද ලබා දෙයි. එනම් මනෝසමාජීයය සහාය ලබා දීම සහ පාරවල් සහ පාසල් ගොඩනැගීම සඳහා අදාළ අධිකාරීන්ට යෝජනා ඉදිරිපත් කිරීම හෝ ප්‍රාදේශීයව සිටින ජනතාවට වෙළෙඳපොළ සඳහා ප්‍රවේශය ලබා දීම වැනි කාරණා හරහා විවිධ අමතර ක්‍රම තුළින්ද එය ජනතාවට සහන ලබා දෙයි. අගතියට පත් පාර්ශ්වය අත්විඳි ප්‍රශ්නය නියම ආකාරයෙන් වටහා ගෙන ඔවුන්ගේ අවශ්‍යතාවල ප්‍රමාණය තීරණය කර එම අගතියට පත්වූ පාර්ශ්වයට ඔවුන්ගේ ජීවිත නැවත ගොඩනැගීම සහ යථා තත්ත්වයට පත්කිරීම සඳහා සහාය ලබා දෙන අවශ්‍ය සහන ලබා දීමේ අවශ්‍යතා එය පිළිගෙන තිබේ.

782. වැදගත්ම කාරණය නම්, ස්වාභාවික ව්‍යසන හෝ පුද්ගලයන් අතර වන විරෝධතා නිසා සිදුවන හානි වලට වඩා සන්නද්ධ අරගල, සිවිල් සමාජයේ ඇතිවන නොසන්සුන්තා සහ දේශපාලන අස්ථාවරභාවය නිසා සිදුවන හානි වලට එමගින් හානි පූරණ කටයුතු සිදු කිරීමයි. මේ ආකාරයෙන් අවංක සහාය පළ කිරීම තුළ සත්‍ය වශයෙන්ම අර්බුදවලට ලක්වූ ජානතාව වෙත සමීප වීමට මෙමගින් සහායක් ලැබෙන බව මෙයින් හැඟවේ.

783. ප්‍රතිස්ථාපනය කිරීමේ ස්වාභාවය තීරණය වන්නේ පීඩාවට පත්වූ පුද්ගලයන්ට සහ ප්‍රජාවට තම ජීවිත නැවත යථා තත්ත්වයට පත් කිරීම සඳහා අවශ්‍ය වන්නේ කුමක්ද යන කාරණය මත වේ. පහත සඳහන් ඕනෑම දෙයක් වන්දි ලබා දීමේ ක්‍රමයක් ලෙස භාවිතා කළ හැකිය.

- මුදල් සහ ද්‍රව්‍යමය ප්‍රතිලාභ
- අධ්‍යාපනය සහ නිපුණතා සංවර්ධනය සඳහා සහාය
- සේවා නියුක්තිය සඳහා නව අවස්ථා
- ඉඩම් සහ නිවාස ආරක්ෂා කර ගැනීමට සහාය
- යටිතල පහසුකම් සහ මූලික අවශ්‍යතා
- වෛද්‍ය, මනෝසමාජයීය සහ සමාජ සහාය මෙන්ම මියගිය අයගේ මතකයට ගෞරව කරන ආකාරය

784. යම් කිසි පාඩුවක් හෝ හානියක් අත්දකින ලද යම්කිසි ප්‍රජාවක් දරුවන්ට පාසල් සඳහා ප්‍රවේශය වර්ධනය කිරීම හෝ මාර්ග සම්බන්ධතා වර්ධනය කිරීම හෝ මගින් යම්කිසි ප්‍රතිලාභයක් ලබන බව හානි පූරණ කාර්යාලය කල්පනා කරන්නේනම් එම කාර්යාලයට එම පහසුකම ලබා දෙන ලෙස අදාළ ආණ්ඩුවේ අධිකාරියට යෝජනා කළ හැකිය.

785. මෙම සියළු සාකච්ඡා වලින් පෙනී යන්නේ හානි පූරණ කාර්යාලය පනතේ විෂය පථය සහ වපසරිය ජාත්‍යන්තර ප්‍රමිතීන් සමග අනුගත වන බව සහ සත්‍ය සෙවීම පිළිබඳ කොමිෂන් සභා හානිපූරණය සඳහා නිර්දේශ ලබා දීම සඳහා කටයුතු කරන නිසා හානි පූරණ කාර්යාලය යෝජිත

සත්‍ය සෙවීමේ යාන්ත්‍රණය සමග ඉතා සමීපව කටයුතු කිරීමට සිදුවන බව මෙම සියළු සාකච්ඡා වලින් පෙන්වන අතර එය සත්‍ය සහ ප්‍රතිසන්ධාන කොමිෂන් සභාවේ අත්‍යවශ්‍ය අංගයක් බවට නිර්දේශ කර තිබේ.

786. හානි පූරණ කාර්යාලය වෙත අයදුම්පතක් යොමුකර තිබෙන නිසා හෝ හානි පූරණ කාර්යාලයෙන් හානිපූරණයක් ලබා තිබෙන නිසා යම් පුද්ගලයෙකුට තමන්නට එරෙහිව සිදුවූවා යැයි විශ්වාස කෙරෙන අපරාධයක් සම්බන්ධයෙන් යම් කිසි පොලිස් වාර්තාවක් හෝ වෙනත් නිල පැමිණිල්ලක් කිරීමට බාධාවක් නැත. හානි පූරණ කාර්යාලය වෙත අයදුම්පතක් යොමු කිරීම හෝ හානි පූරණ කාර්යාලයෙන් හානිපූරණ ලබා ගැනීමෙන් පසු හෝ එවන් පුද්ගලයෙකුට තවදුරටත් සියලු ම නෛතික ප්‍රතිකර්ම වෙත යොමු විය හැක.

787. හානි පූරණ කාර්යාලයේ සහන සඳහා ඉල්ලීමක් කිරීමෙන් පසුව වුවද තවත් තිබෙන වෙනත් ප්‍රතිකර්ම සඳහා විත්දිතයන්ට යොමු වීමේ හැකියාවක් පවතියි. මෙය හානි පූරණ කාර්යාලයෙන් ලැබෙන හානිපූරණය නිසා වැළැක්වීමට හාජනය නොවන සිවිල් සමාජයෙන් ලැබෙන ප්‍රතිකර්මයක් විය හැකිය.

788. 1987 අංක 29 දරන තැනැත්තන්, දේපළ සහ කර්මාන්ත පුනරුත්ථාපනය කිරීමේ අධිකාරිය පනත යටතේ හෝ හානි පූරණ කාර්යාලය යටතේ ඔවුන්ට දැනටමත් වන්දි ලැබී තිබේ නම් යම් කිසි පීඩාවට පත් වූ ප්‍රද්ගලයෙකුට හානි පූරණ කාර්යාලයේ ද වන්දි ලබා ගැනීම සඳහා ඉල්ලුම් කළ හැකිය. යෝග්‍ය හානිපූරණ ලබා දීමේ දී මුදල් වන්දියක් වශයෙන් පීඩාවට පත් වූ පුද්ගලයා තැනැත්තන්, දේපළ සහ කර්මාන්ත පුනරුත්ථාපනය කිරීමේ අධිකාරිය පනත යටතේ හෝ හානි පූරණ කාර්යාලය යටතේ පෙර අවස්ථාවක ලබා ගත් සහන සැළකීමට හාජනය කරනු ඇත.

789. යම් කිසි වරදකට හාජනය වූ පුද්ගලයෙකුට සාර්ථකව සහන ලැබුණේ නම් නැවත වෙනත් අයදුම්පත්‍රයක් ඉදිරිපත් කිරීම අවශ්‍ය නොවේ. හානි පූරණ කාර්යාලය ඉතාමත් ඵලදායී සහායක් වරදට ලක්වූ පුද්ගලයන්ට ලබා දීමට උත්සාහ කරයි. අයදුම්කරුගේ තත්ත්වය සහ පවතින සම්පත් මත හානිපූරණ කාර්යාලයට අතිරේක සහායක් ලබාදීමට හැකියාව තිබේ. එමනිසා ලැබුණ සහන සම්බන්ධයෙන් අසතුටින් සිටින යම් පුද්ගලයෙකුට හානි පූරණ කාර්යාලය සමග සාකච්ඡා කර තමන්ගේ අවශ්‍යතා ප්‍රකාශ කළ හැකිය.

790. යම් කිසි වන්දියක් ඉල්ලීමට හේතුවූ හේතුසාධක වල ප්‍රතිඵලයක් වශයෙන් ගෙවන ලද මුදල් ප්‍රමාණවත් නොවන බව සාක්ෂිකරුවන් විශාල සංඛ්‍යාවක් මෙම ජනාධිපති විමර්ශන කොමිෂන් සභාවට පැමිණිලි කර තිබේ. මෙහි ධනාත්මක ලක්ෂණය වන්නේ එසේ පෙර දෙන ලද දීමනාවක් ප්‍රමාණවත් වන්දි ප්‍රමාණයක් ලබා ගැනීම සඳහා ඉදිරිපත් කරන දෙවන අයදුම්පතට අගතියක් නොවීමයි.

791. හානිපූරණ ලබා දීම සඳහා හානිපූරණ කාර්යාලයට තම නිර්දේශ යැවීම අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයේ වගකීම වේ. මෙම නිර්දේශ මත හානි පූරණ කාර්යාලය පියවර ගනු ලැබේ. එමනිසා අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයට දැනටමත් ප්‍රකාශයක් ලබා දී තිබේ නම් හානිපූරණ කාර්යාලයට වෙනම අයදුම්පතක් යොමුකිරීම අත්‍යවශ්‍ය නොවේ.

792. තමන්ගේ ඥාතීන් හෝ හිතමිතුරන් බලහත්කාරයෙන් අතුරුදහන් කරවීම පිළිබඳ මෙම ජනාධිපති විමර්ශන කොමිෂන් සභාව ඉදිරියට පැමිණිලි කරන ලද බහුතරයක් සාක්ෂිකරුවන් අතුරුදහන් වූවන් පිළිබඳ කාර්යාලයට පැමිණිලි කර තිබෙන බව දක්නට ලැබුණ අතර එසේ නොමැති අවස්ථාවල මෙම ජනාධිපති විමර්ශන කොමිෂන් සභාව විසින් අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයෙන් ඵලදායී ප්‍රතිකර්ම ලබා ගැනීම සඳහා යොමු කර තිබේ. ඔවුන්ගෙන් බොහෝ දෙනෙකුට අවශ්‍ය වූයේ මුදල්මය වන්දි විය. එවන් අවස්ථාවල අවශ්‍ය හානිපූරණය හැකි තරම්

ඉක්මනින් ලබා ගැනීම සඳහා එය අවශ්‍ය කරන පැමිණිලිකරුවන්ගේ අයදුම්පත්‍ර හානිපූරණ කාර්යාලය වෙත යොමු කරයි.

793. මූලික අයිතිවාසිකම් සම්බන්ධ අයදුම්පත්‍ර සම්බන්ධයෙන් නඩු පවරනු ලැබූ සහ 2019 අප්‍රේල් 21 වෙනි දින සිදුවූ පාස්කු ප්‍රහාරයේ වින්දිතයන් බවට පත්වූ පෙත්සම්කරුවන් ද අතුළුව යම් වගඋත්තරකරුවන් පිරිසකට එරෙහිව නියෝග කර තිබූ වන්දි ලබා ගැනීම සඳහා එස්ක්‍රෝ ගිණුමක් විවෘත කරන ලෙස ශ්‍රේෂ්ඨාධිකරණය හානිපූරණ කාර්යාලය වෙත නියෝග කිරීම තුළ හානිපූරණ කාර්යාලයේ කාර්යක්ෂමතාව ශ්‍රේෂ්ඨාධිකරණය විසින් පිළිගෙන තිබේ. එස්ක්‍රෝ ගිණුමට යම් කිසි මුදලක් ලබා දීමට කැමති ඕනෑම දානපතියෙකුට තම පරිත්‍යාගය කැමති ලෙස කිරීමට හැකියාව තිබෙන අතර හානිපූරණ කාර්යාලය තම ව්‍යවස්ථාපිත භූමිකාව ට අනුව මෙරටෙහි ක්‍රියාත්මක වන හානිපූරණ ආයතනයක් ලෙස මෙම එස්ක්‍රෝ ගිණුම කළමනාකරණය කිරීමට සහ ලැබෙන අරමුදල් වලින් වන්දි ලැබිය යුතු වින්දිතයන්ට අවශ්‍ය පරිදි වන්දි ලබා දීමට උපදෙස් ලබා දී තිබේ. වින්දිතයන්ගේ අරමුදලට දායකත්වය දීමට කැමති කෙනෙක් වෙත්නම් එම මුදල් හානිපූරණ කාර්යාලය මගින් පවත්වාගෙන යනු ලබන එස්ක්‍රෝ අරමුදලට තැන්පත් කළ හැකි බව ශ්‍රේෂ්ඨාධිකරණය උපදෙස් ලබා දී තිබේ. වින්දිතයන්ට ඵලදායී ලෙස සහන ලබාදීම සඳහා තම වගකීම ඉටු කරන හානිපූරණ කාර්යාලයේ සැළකිය යුතු භූමිකාව සම්බන්ධයෙන් ලැබී තිබෙන අධිකරණමය පිළිගැනීමක් ලෙස මෙය දැක්විය හැකිය.

794. ව්‍යවස්ථාපිත ආයතනයක් ලෙස පරිවර්තනය වීමට නියමිත ජාතික ඒකාබද්ධතා සහ ප්‍රතිසන්ධාන කාර්යාලය විසින් සිදු කළ යුතු යැයි අපේක්ෂා කෙරෙන ප්‍රතිසන්ධානය පිළිබඳ නිර්දේශ ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් මෙම ජනාධිපති විමර්ශන කොමිෂන් සභාව ඊ ළඟට සොයා බලනු ඇත.

03. ජාතික සමගිය සහ ප්‍රතිසන්ධානය සඳහා වන කාර්යාලය

හැඳින්වීම

795. ඉවසීම සහ සමාව දීම නැමැති සංක්‍රාන්ති යුක්තියේ සුසමාදර්ශයන්ගේ ඉලක්ක අඛණ්ඩව අභියෝගයට ලක් කළ වාර්ගික සහ ආගමික මානයන් මෙන්ම පරිණාමය වෙමින් පැවති සංකීර්ණ ස්මරණීය සංස්කෘතීන් හැඩගැස්වූ ඓතිහාසික, දේශපාලනික, සමාජමය, සංස්කෘතිමය හ නෛතික සාධක දහස් ගණනක් සමග ශ්‍රී ලංකාව දශක ගණනාවක් පුරා අරගලයක යෙදී තිබේ. හැම්බර් සහ කෙලීට අනුව ප්‍රතිසන්ධාන ක්‍රියාවලියක සෑම විටම විරුද්ධාභ්‍යාස, ආතතින් සහ ප්‍රතිවිරෝධතාවන් ගෙන්ද සමන්විත වේ. එය පිළිවෙලක් සහිත හෝ පහසු ක්‍රියාවලියක් නොවන අතර සමහර අවස්ථාවල නොගැළපෙන ස්වරූපයක් පෙන්වයි. සාමය ගොඩනැගීමේ න්‍යායපත්‍රය සඳහා සියල්ලන්ටම ගැළපෙන ප්‍රවේශයක් නොමැති අතර, ශ්‍රී ලංකාවට අතීතයේදී උරුමයන් විශාල සංඛ්‍යාවක් විසඳීමට සහ රටෙහි තිබෙන බහුවිධබව අවබෝධ කරගෙන ඉදිරියට යාම සඳහා සියල්ල අතුළත් ප්‍රවේශයක් ප්‍රතිසන්ධානය වෙනුවෙන් පවත්වාගෙන යාමට සිදුවේ.

796. රටේ විවිධ ප්‍රදේශ වලින් පැමිණි සාක්ෂිකරුවන් කිහිප දෙනෙකුගේ හඬට මෙම මෙම ජනාධිපති විමර්ශන කොමිෂන් සභාව සවන් දී තිබේ. ඔවුහු සමාජයේ විවිධ ස්ථර වලින් සහ විවිධ පන්ති වලින් පැමිණි අය වෙති. මෙම පරිච්ඡේදය තුළින් මීට පෙර තිබූ කොමිෂන් සභා තුනෙහි නිර්දේශ ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් සොයා බලන අතර වාර්ගික හෝ ආගමික බෙදයකින් තොරව අභිමානවත් සහ නිදහස් වපසරියක් තුළ ජාතික ඒකාබද්ධතාව සහ ප්‍රතිසන්ධානය තැබීමේ වටිනාකම් රාමුව සකස් කළ කොමිෂන් සභාවක් ලෙස උගත් පාඩම් සහ ප්‍රතිසන්ධාන කොමිෂන් සභාව හැඳින්විය හැකිය . ප්‍රතිසන්ධානය පිළිබඳ එහි නිර්දේශය ශ්‍රී ලංකාවේ ප්‍රතිසන්ධානය පිළිබඳ

සංකල්පය මත පමණක් පදනම් නොවන අතර බෙදී ගිය ශ්‍රී ලංකාවේ අනන්‍යතාවය තුළ සැළකිය යුතු පදනමක් දරයි. එනම්,

- පළමුව, අපි එකිනෙකා කෙරෙහි ඇතිකරගත් පීඩාවන් වෙනුවෙන් සාමූහික වශයෙන් වන වරදකාරී හැඟීම සහ පසුතැවීම;
- දෙවනුව, අන්‍යෝන්‍ය විශ්වාසය සහ වටහා ගැනීම ප්‍රවර්ධනය කෙරෙන ආකාරයට සියළු පාර්ශ්වයන් අතර ආකල්ප මූලික වශයෙන් නැවත සකස් කිරීම;
- තෙවනුව, සෑම වාර්ගික කණ්ඩයමක්ම පුරවැසියන් වශයෙන් සමානත්වය බුක්තිවිඳින සියල්ල ඇතුළත් පාලන ක්‍රියාවලියක් පිළිබඳ අවධානය; සහ
- හතරවනුව, බලය සම ලෙස බෙදී තිබෙන පූර්ණ වගවීමක් සහිත සහභාගිත්ව ප්‍රජාතන්ත්‍රවාදයක් තුළ බිම් මට්ටමේ සිට ඉහළට ජනතාව බලගන්වා තිබෙන පාලන ක්‍රමයක්.

797. උගත් පාඩම් සහ ප්‍රතිසන්ධාන කොමිෂන් සභාව විවිධ පර්ෂදවල විහිදී තිබෙන ඉහත ධර්මතා වලින් පිරී තිබේ. ප්‍රතිසන්ධානය සම්බන්ධයෙන් ගත් විට උගත් පාඩම් සහ ප්‍රතිසන්ධාන කොමිෂන් සභාවේ අදහස වන්නේ රට අර්බුධයෙන් එළියට ගෙන ප්‍රතිසන්ධාන මාවත දිගේ රැගෙන යාම සංකීර්ණ දේශපාලන ක්‍රියාවලියක් වන බව ය. එයට සියල්ල ඇතුළත්වන සහභාගිත්ව වටිනාකම් සහිත සහධාරක මූලධර්මය (principle of subsidiarity) මත පදනම් වූ බලය බෙදීම මගින් මග පෙන්විය යුතු ය.

798. ප්‍රතිසන්ධාන ක්‍රියාවලිය ඉදිරියට ගෙන යාම පිණිස බලය බෙදීම සඳහා පහසුකම් සපයන දේශපාලන එකඟතාවක් තිබීම තීරණාත්මක වශයෙන් වැදගත් වන බව මෙම ජනාධිපති විමර්ශන කොමිෂන් සභාව ඉදිරියේ සඳහන් කළ සාක්ෂි කරුවන් සිටි බව සඳහන් කිරීම වැදගත් ය. උගත් පාඩම් සහ ප්‍රතිසන්ධාන කොමිෂන් සභාව මෙම මතය දැඩි ලෙස පිළිගන්නා අතර ''පශ්චාත් ගැටුම් සහිත පරිසරයක සාමය සහ ආරක්ෂාව තහවුරු කරන රාමුවක් ස්ථාපිත කිරීම'' සඳහා මෙම කොන්දේසි බොහොමයක් අවශ්‍ය බව සාකච්ඡා කරයි.

799. බලය බෙදීම සම්බන්ධ ප්‍රධාන කාරණා වෙත ප්‍රවේශ වීම සහ ආමන්ත්‍රණය කිරීම කළ යුත්තේ කෙසේද යන්න උගත් පාඩම් සහ ප්‍රතිසන්ධාන කොමිෂන් සභාව පරීක්ෂා කරයි.

ෆැටළු:

- දීර්ඝ කාලයක් තිස්සේ එවන් එකඟතාවකට පැමිණීමට බාධාවක්ව තිබුණේ එල්.ටී.ටී.ඊ. ත්‍රස්තවාදය වේ. එම බාධාව දැන් පහව ගොස් තිබෙන අතර අවශ්‍ය සම්මුතිය වෙත ගමන් කරන දේශපාලන ක්‍රියාවලිය ගොඩනැගීම සඳහා ආණ්ඩුව නායකත්වය දිය යුතු ය;
- සම්මුතිය ගොඩනැගීම සඳහා වන ක්‍රියාවලිය සියල්ල ඇතුළත් ක්‍රියාවලියක් විය යුතු අතර, එල්.ටී.ටී.ඊ. සංවිධානයේ සාමාජිකයන්ව සිටි අය ද ඇතුළුව සියලු ම ප්‍රජාවන්ගේ අයිතීන් තහවුරු කරන්නක් විය යුතු ය.
- ජාතික වශයෙන් විසඳුම් සෙවීම සඳහා සියලු පක්ෂ කැපවිය යුතු බව උගත් පාඩම් සහ ප්‍රතිසන්ධාන කොමිෂන් සභාව අවධාරණය කරන අතර එමගින් බාහිර මැදිහත්වීම මගහැරිය යුතු ය. වාර්ගික ගැටළු සම්බන්ධයෙන් අනවශ්‍ය ලෙස ජාත්‍යන්තර මැදිහත්වීම පිළිබඳව සහ එමගින් ඇතිවිය හැකි අනාරක්ෂිත හැඟීම පිළිගත හැකි විසඳුමක් වෙත යන ගමන අඩාල කළ හැකිය යන කාරණය පිළිබඳ දෙමළ ජනතාව අවධානය දැක්විය යුතු ය.;

- බලය බෙදීමේ යම් ක්‍රියාවලියක් නිර්මාණය කරන්නේ නම් භෞමික අඛණ්ඩතාව, ජාතික ස්වාධිපත්‍යය සහ බෞද්ධාදී ප්‍රවනතා පිළිබඳව වටහා ගැනීම සහ ආමන්ත්‍රණය කිරීම වැදගත් වේ;

- බලය බෙදීමේ සහ පාලනයට දායක වීමේ නියම ගැටළුව වන්නේ ජනතාව බලගැන්වීම සහ දේශපාලන නායකයන් ජනතාවට වගවීමට සැළැස්වීම බව උගත් පාඩම් සහ ප්‍රතිසන්ධාන කොමිෂන් සභාව පාර්ශ්වයන්ට වටහා දීමට උත්සාහ කරයි;

- බලය බෙදීම මත පදනම් වූ දේශපාලන විසඳුමක් වාර්ගික ගැටළුව මෙන් ප්‍රජාතන්ත්‍රවාදී පදනමට තර්ජනයක් එල්ල කරන අනෙකුත් බරපතල ගැටළු ආමන්ත්‍රණය කරන්නක් විය යුතු බව උගත් පාඩම් සහ ප්‍රතිසන්ධාන කොමිෂන් සභාව අවධාරණය කරයි.

800. මෙම ජනාධිපති විමර්ශන කොමිෂන් සභාව ඉදිරියට පැමිණි සාක්ෂිකරුවන් 13 වෙනි සංශෝධනය සහ බලය බෙදීම පිළිබඳ කථා කළ අතර එය ප්‍රතිසන්ධානය සම්බන්ධයෙන් තීරණාත්මක වන බවත් බලය බෙදාගැනීම සම්බන්ධයෙන් මෙම දිවයිනේ සියලු ම නායකයන් අතර සහභාගිත්ව සාකච්ඡාවක් ඇතිවිය යුතු බවත් ඔවුන් ප්‍රකාශ කළ අතර, මෙම ජනාධිපති විමර්ශන කොමිෂන් සභාව, යහපාලනය සහ ප්‍රතිසන්ධානය සඳහා වන දේශපාලන රාමුව පිළිබඳ උගත් පාඩම් සහ ප්‍රතිසන්ධාන කොමිෂන් සභාවේ පහත සඳහන් නිර්දේශ අනුමත කරයි.

- සමගිය සහ එකමුතුකම ප්‍රවර්ධනය කරමින් බලය බෙදීමේ ඕනෑම ස්වරූපයක ප්‍රධාන අරමුණ විය යුත්තේ එකාවන් පොදු අනන්‍යතාවක් වන අතර ශ්‍රී ලංකා සමාජය තුළ තිබෙන විවිධත්වය වටහාගනිමින් එය සිදුවිය යතු ය.

- බලය බෙදීමේ ක්‍රියාවලිය තුළ ආණ්ඩුකරණයේ සෑම ස්ථරයකදීම සියළුම ප්‍රජාවන්ට අයත් ජනතාව බලගැන්විය යුතු අතර යම් කිසි වාර්ගික ප්‍රජාවකට වැඩි වරප්‍රසාද හෝ අවාසිසහගත තත්ත්වයකට පත්වීම හෝ වෙන් කොට සැළකීමකට ලක් නොකළ යුතුය.

- ඡන්දයෙන් තේරී පත්වූ රජයක මූලික වගකීම ලෙස ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සහ රටක් වශයෙන් අත්සන් කර තිබෙන යම් යම් සම්මුතීන් පදනම් කරගෙන ජනතාව බලගැන්වීම මානව හිමිකම් ප්‍රවර්ධනය කිරීම සහ ආරක්ෂා කිරීම.

- සංවර්ධනය සහ අවශ්‍ය සමාජ - ආර්ථික ප්‍රතිපත්ති (8.215) ක්‍රියාත්මක කිරීම සඳහා ප්‍රජාවන්ට අවස්ථාව ලබා දෙන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ක්‍රියාවලියක් යොදාගැනීමට එම ක්‍රියාවලිය නායකත්වය ගත යුතු ය. යම් කිසි බලය බෙදාහැරීමේ ක්‍රියාවලියක් ස්වෛරී දේශපාලනික ස්වාධීන සහ බහුවාර්ගික ශ්‍රී ලංකා රජයක පුළුල් රාමුවක් තුල සිදුවිය යුතු ය. ඕනෑම බලය බෙදීමේ සැකැස්මක් තුල බෞද්ධාදී ප්‍රවණතා අධෛර්යමත් කරන සහ ඒව සාර්ථකව ආමන්ත්‍රණය කරන යාන්ත්‍රණයක් තිබිය යුතු ය. (8.224);

- බලය බෙදීම ජනතා කේන්ද්‍රීය විය යුතු ය. බලය විමධ්‍යගත කිරීමේ ආකාර සහ ක්‍රියාවලින් තුළින් ජනාතව ඵලදායී ලෙස බලගැන්වීම සහ දේශපාලන නායකයන් ජනතාවට වගවන අය බවට පත් කිරීම අවශ්‍ය වේ. (8.216);

- මධ්‍යම රජය සහ පළාත් අතර බලය බෙදීමේ දී සහධාරක මූලධර්මය අනුගමනය කළ යුතුය. (8.224) මෙහි අරමුණ විය යුත්තේ සියළු ප්‍රජාවන්ට අයත් ජනතාව ආණ්ඩුවේ සියළුම ස්ථර වලදී බලගැන්වී ම වේ. (8.218)

- බිම් මට්ටමේ දී ජනතා සහභාගිත්වය ප්‍රවර්ධනය කිරීම සඳහා පළාත් පාලන ආයතන බලගැන්විය යුතු අතර ජනතා අවශ්‍යතා ආමන්ත්‍රණය කළ හැකි යෝග්‍ය බලය බෙදීමේ

ක්‍රමයක් නිර්මාණය කිරීමේ දී පළාත් පාලන ආයතන වල ක්‍රියාකාරිත්වය නිසා ඇතිවූ අඩුපාඩු වලින් උගත් පාඩම් පිළිබඳව අවධානය යොමු කළ යුතු ය. (8.220)

- පළාත්වල නියෝජිතයින් සහිත දෙවන මණ්ඩලයක් ස්ථාපිත කළ යුතු අතර එමගින් පළාතේ දේශපාලන නායකත්වය සහ ජනතාවට තමන් නියෝජනය වන බවට හැඟීමක් ඇති වේ. (8.221)

- තිරසාර සහ පවතින ප්‍රතිසන්ධාන ක්‍රියාවලියක සාර්ථකත්වය තහවුරු කිරීම සඳහා බලය බෙදීම පිළිබඳ ප්‍රශ්න පිළිබඳ පැහැදිලිව දැකිය හැකි ප්‍රගතියක් ඇතිකිරීමේ වැදගත්කම මෙම නිර්දේශ සකස් කිරීමේ දී කොමිෂන් සභාව අවධාරණය කරයි. එමනිසා දැන් තිබෙන අවස්ථාව විශේෂයෙන්ම බිම් මට්ටමෙදී පළාත් දක්වා බලය විමධ්‍යගත කිරීම සහ මධ්‍යම රජයේ බලය බෙදා හැරීම සම්බන්ධයෙන් උපරිම මට්ටමට එය කළ හැකිවීම සඳහා පවතින්නේ කුමක්ද යන්න පිළිබඳව එකඟත්වයක් ඇතිකර ගැනීම සඳහා යහපත් විශ්වාසයෙන් යුතු උත්සාහයක් ඇතිකර ගැනීමට යොදාගත යුතු ය. (8.225);

- අපෙක්ෂා කෙරෙන සාකච්ඡාවේ ස්වභාවය සහ අන්තර්ගතය පිළිබඳ ආණ්ඩුවේ චින්තනය ඇතුළත් යෝජනාවක් මත සියළු දේශපාලන පක්ෂ සමග බරපතළ සහ ව්‍යුහාත්මක සාකච්ඡාවක් කිරීම සඳහා රජය විසින් මේ අවස්ථාවේ දී මූලාරම්භය ගත යුතු ය. (8.226)

801. සියළුම ප්‍රජාවන් අතර තිබෙන බව පෙනෙන ප්‍රතිසන්ධානය අවශ්‍ය වන අවසන් අරමුණ වන සාමය සහ සමගිය ළඟාකරගැනීම සඳහා අප ජාතියට අවශ්‍ය වන ප්‍රතිසන්ධානය සඳහා වන දේශපාලන රාමුව කුමක්ද යන්න මෙයින් පැහැදිලි වෙයි.

802. ගැටුම් වලට හේතුවූ මූල කාරණා නැවත සළකා බැලීමත්, මෙම රට විනාශයට පත්කළ දෙපාර්ශ්වයට ම හානිදායක ගැටුම් නැවත ඇතිවීම වැළැක්වීම පිණිස දේශපාලන ආයතන සහ ව්‍යුහයන්හි සහ පාලන ක්‍රියාවලිය තුළ වෙනස් කම් ඇති කිරීම මෙම ජනාධිපති විමර්ශන කොමිෂන් සභාව නිර්දේශ කරයි. මෙම ක්‍රියාවලිය තුළ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 3 සහ 4 වෙනි ව්‍යවස්ථා මගින් සියලු ම දේශපාලන නායකයන් සහ පාර්ලිමේන්තුව මන්ත්‍රීවරු ජනතාව වගවිය යුතු අතර සුවකිරීමේ ක්‍රියාවලිය තුළ ප්‍රතිසන්ධානය ළඟාකරගත යුත්තේ සහවේදනය, කරුණාව සහ අනුකම්පාව පෙරදැරි කරගෙන බව මෙම ජනාධිපති විමර්ශන කොමිෂන් සභාව නැවතත් අවධාරණය කරයි.

803. මෙම ජනාධිපති විමර්ශන කොමිෂන් සභාව විසින් පටිගත කර තිබෙන උතුරු සහ නැගෙනහිර මෙන්ම කොළඹ ප්‍රදේශවල අය ලබා දුන් සාක්ෂි දෙස බැලීමේ දී එම චින්දිතයන් ගේ දුක වේදනාව තුළ ප්‍රතිසන්ධානය මෙන්ම සමාව දීම යන කාරණා සිදුකිරීමට පෙර අප කොතරම් ආදරණීය ලෙස එම අවශ්‍යතා සම්පූර්ණ කළ යුතු ද යන කාරණය අපට වැටහෙ යි.

804. මෙම පරිච්ඡේදය තුළ ප්‍රතිසන්ධානය පිළිබඳ වූ ශුභවාදී නිර්දේශ ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් සොයා බලන නිසා කණගාටුවෙන් වුවද පිළිගත යුතු කාරණය වන්නේ උගත් පාඩම් සහ ප්‍රතිසන්ධාන කොමිෂන් සභාවේ නිර්දේශ සමස්තයක් වශයෙන් ක්‍රියාත්මක නොවූ බව ය. ඒවා මුද්‍රිත ස්වභාවයෙන් පමණක් තිබෙන, එහෙත් ක්‍රියාත්මක නොවූ නිර්දේශ බවට පත් ව තිබේ. මෙම පරිසරය තුළ සියලු ම දේශපාලන පක්ෂ නායකයන් සහ දේශපාලන පක්ෂ එක්ව බලය බෙදීම සම්බන්ධයෙන් එකඟතාවයකට පත්වීම සඳහා තිරසාර සහ අඛණ්ඩ සාකච්ඡාවක් පැවැත්වීමේ අවශ්‍යතාව මෙම ජනාධිපති විමර්ශන කොමිෂන් සභාව නැවත අවධාරණය කරයි.

805. ජනාධිපත විමර්ශන කොමිෂන් සභාව ඉහත ප්‍රකාශය සිදු කළ ද සාක්ෂි පරීක්ෂාකර බැලීමේ දී ජාතික ඒකාබද්ධතා සහ සහනසන්ධාන කාර්යාලය ප්‍රතිසන්ධානය සඳහා වන ගමනේ දී ගත්

මූලාරම්භයන්හි සහ උත්සාහයන්හි සැළකිය යුතු ප්‍රගතියක් අත්කරගෙන තිබෙන බව පිළිගත යුතු ය.

ජාතික ඒකාබද්ධතා සහ ප්‍රතිසන්ධාන කාර්යාලය සහ ප්‍රතිසන්ධානය සඳහා ක්‍රියාමාර්ග

806. ජාතික ඒකාබද්ධතා සහ ප්‍රතිසන්ධාන කාර්යාලය, උගත් පාඩම් සහ ප්‍රතිසන්ධාන කොමිෂන් සභාවේ අදහසක් වන අතර එමගින් ජාතික සමගිය සහ ප්‍රතිසන්ධානය සඳහා පහසුකම් සැළසීමට දේශීය යාන්ත්‍රණයක් යෝජනා කරයි. දේශීය යාන්ත්‍රණයක් සඳහා වන මෙම නිර්දේශය බලගන්වන ක්‍රියාවලිය තුළ ජාතික ඒකාබද්ධතා සහ ප්‍රතිසන්ධාන කාර්යාලය අමාත්‍ය මණ්ඩල පත්‍රිකාවක් මගින් යෝජනා කෙරුණ අතර, එය හිටපු අගමැති ගරු රනිල් වික්‍රමසිංහ මහතා විසින් 2015 මාර්තු 25 දින අමාත්‍ය මණ්ඩලයට ඉදිරිපත් කරනු ලැබීමෙන් පසු ජාතික ඒකාබද්ධතා සහ ප්‍රතිසන්ධාන කාර්යාලය ලෙස හිටපු ජනාධිපති මෛත්‍රිපාල සිරිසේන මහතා විසින් 2015 අප්‍රේල් මස ස්ථාපිත කරන ලදී.

807. ජාතික ඒකාබද්ධතා සහ ප්‍රතිසන්ධාන කාර්යාලය මුල් අවස්ථාවේ දී ක්‍රියාත්මක වූයේ 1945/41 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය අනුව ජාතික ඒකාබද්ධතා සහ ප්‍රතිසන්ධාන අමාත්‍යාංශය යටතේ වන අතර පසුව එය වෙනත් ගැසට් පත්‍රයක් මගින් ජනාධිපති ලේකම් කාර්යාලයේ විෂය පථයට ඇතුළත් කරන ලදී. පසුව 2020 අගොස්තු මස තවත් අතිවිශේෂ ගැසට් පත්‍රයක් මගින් එය අධිකරණ අමාත්‍යාංශය යටතට ගෙන එන ලදී.

808. ජාතික ඒකාබද්ධතා සහ ප්‍රතිසන්ධාන කාර්යාලය ට නෛතික අධිකාරි බලයක් ලබා දිය යුත බව මෙම ජනාධිපති විමර්ශන කොමිෂන් සභාව නිර්දේශ කළ අතර මෙම නිර්දේශය ක්‍රියාත්මක කිරීමට උත්සාහ දරා තිබීම පැසසිය යුතු ය.

809. ජාතික ඒකාබද්ධතා සහ ප්‍රතිසන්ධාන කාර්යාලය තම මෙහෙවර "ශ්‍රී ලාංකිකයින් ලෙස අපගේ විවිධත්වය ආරක්ෂා කරන අතර සාමය, ආදරය සහ එකමුතුකම ප්‍රවර්ධනය කිරීම" ලෙස ප්‍රකාශයට පත් කර තිබේ. ජාතික ඒකාබද්ධතා සහ ප්‍රතිසන්ධාන කාර්යාලය, මූලික අයිතිවාසිකම්, නිදහස, නීතියේ ආධිපත්‍යය, සමාජ වගකීම්, අන්‍යෝන්‍ය ගෞරවය, වෙනස් කොට නොසැළකීම, සමතාව සහ විවිධත්වය ගරු කරන සහ වර්ධනය කරන සමාජයක් පෝෂණය කිරීම සඳහා කැපවී සිටියි.

810. තම අරමුණු ළඟා කර ගැනීමේ දී, ජාතික ඒකාබද්ධතා සහ ප්‍රතිසන්ධාන කාර්යාලය තම උත්සාහයන් විශේෂිත කරන ලද තේමා ක්ෂේත්‍ර වර්ග කිහිපයක් හඳුනා ගනියි. ඒවා නම්:

අ. ත්‍රෛභාෂා පාසල් ස්ථාපිත කිරීමේ අරමුණ සහිතව ප්‍රාථමික, ද්විතීයික සහ තෘතීයික අධ්‍යාපනය ලබා දීම, විශ්වවිද්‍යාල වල ප්‍රතිසන්ධාන මධ්‍යස්ථාන ස්ථාපිත කිරීම, නිබන්ධන සහ පර්යේෂණ ව්‍යාපෘති සඳහා විශ්වවිද්‍යාල ශිෂ්‍යාන්ට සහ පර්යේෂකයන්ට සහාය දීම.

ආ. ග්‍රාම නිලධාරි කොට්ඨාස, ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස, දිස්ත්‍රික් සහ ජාතික මට්ටමෙන් යම් යම් සංස්කෘතික සහ කළා කටයුතු ප්‍රවර්ධනය කිරීම.

ඇ. සමගි ප්‍රවර්ධන මධ්‍යස්ථාන, විවිධ විශ්වාසයන් අතර සාකච්ඡා, පූර්ව දැනුම්දීම් සහ පූර්ව ප්‍රතිචාර සහ අන්තවාදී ප්‍රචණ්ඩත්වය වැළැක්වීම සඳහා වන වැඩසටහන් ස්ථාපනය කිරීම තුළින් ගැටුම් පරිවර්තනයක් සඳහා දායකත්වය ලබා දීම.

ඈ. විස්තීරණ දිස්ත්‍රික් සංවර්ධන සැළසුම් සකස් කිරීම.

ඉ. සියලු ම ශ්‍රී ලාංකිකයන්ගේ භාෂා අයිතිය ආරක්ෂා කිරීම.

ඊ. මනෝ සමාජයීය සහාය.

උ. කාන්තාවන් සහ තරුණයින් සම්බන්ධ වැඩසටහන්වලට සහාය ලබා දීම.

ඌ. ජීවනෝපාය දිරිගන්වන වැඩසටහන්වලට සහාය ලබා දීම.

එ. සාමය සහ ප්‍රතිසන්ධානය ප්‍රවර්ධනය කිරීම සඳහා මාධ්‍ය සහ අමාත්‍යාංශ සමග සහයෝගයෙන් කටයුතු කිරීම.

811. ජාතික ඒකාබද්ධතා සහ ප්‍රතිසන්ධාන කාර්යාලය, සංවර්ධන සහායකයන් සහ සිවිල් සමාජ සංවිධාන සමග සහයෝගිතාව ඇතිකරගෙන තිබේ. ජාතික ඒකාබද්ධතා සහ ප්‍රතිසන්ධාන කාර්යාලය මෙම සම්බන්ධතා සහ පාර්ශ්වකාරිත්වයන් පුළුල් කිරීමට කටයුතු කළ යුතු ය. මෙම ජනාධිපති විමර්ශන කොමිෂන් සභාවට ලැබුණ තොරතුරු අධ්‍යනය කිරීම තුළින් දැනටමත් භාරගෙන තිබෙන සහ ක්‍රියාත්මක වන ව්‍යාපෘති පහත ලයිස්තුගත කර තිබේ.

අ. USAID ආයතනයේ සමාජ එකමුතුකම සහ ප්‍රතිසන්ධාන ව්‍යාපෘතිය සමග ජාතික ඒකාබද්ධතා සහ ප්‍රතිසන්ධාන කාර්යාලය 2023 අගෝස්තු මස වන විට වසර දෙකක් පුරා සහයෝගයෙන් කටයුතු කරන අතර දෙපාර්ශ්වය ම විසින් ක්‍රියාකාරකම් සැළසුමක් සක්‍රිය ලෙස ක්‍රියාත්මක කර තිබේ.

ආ. යාපනය දිස්ත්‍රික්කයේ වැසි ජලයෙන් වගා කටයුතු කිරීම සම්බන්ධයෙන් වන ව්‍යාපෘතියේ දෙවන අදියර ආරම්භ කිරීම සඳහා ඉන්දියාවේ මහ කොමසාරිස්වරයා සමග අවබෝධතා ගිවිසුමක් අත්සන් කර තිබේ. මෙම ව්‍යාපෘතිය මගින් යාපනය දිස්ත්‍රික්කයේ පීඩාවට පත් පවුල් වලට ප්‍රතිලාභ ලබා දීමට සැළසුම් කර තිබේ.

ඇ. ප්‍රතිසන්ධානය සහ සමාජ සමගිය උදෙසා තරුණයන් ඇතුළත්කරගන්නා ඒකාබද්ධ ව්‍යාපෘතියක් සඳහා යුනෙස්කෝ සංවිධානය සමග ජාතික ඒකාබද්ධතා සහ ප්‍රතිසන්ධාන කාර්යාලය සහයෝගයෙන් කටයුත්ත කරයි.

ඈ. යුනෙස්කෝ සංවිධානය සහ ජාතික ඒකාබද්ධතා සහ ප්‍රතිසන්ධාන කාර්යාලය සමාජ එකමුතුකම සඳහා මාර්ගගත පුහුණු සහ මූල්‍යකරණ ව්‍යාපෘතියක් ස්ථාපනය කර තිබෙන අතර එය ඉතාමත් සාර්ථකව පවත්වන ලදී. එය "සමාජ එකමුතුකම උදෙසා තරුණ ක්‍රියාකාරිත්වය: ශ්‍රී ලංකාවේ විකාශය වන සන්දර්භය තුළ වැළැක්වීමේ සහ ප්‍රත්‍යාස්ථභාවයේ භූමිකාව ශක්තිමත් කිරීම." නමින් සිදු කරන ලදී.

812. ජාතික ඒකාබද්ධතා සහ ප්‍රතිසන්ධාන කාර්යාලය විසින් සංවර්ධන පාර්ශ්වකරුවන්ගේ සහභාගිත්වයෙන් අධිකරණ අමාත්‍යාංශය සමග වසර පහක ක්‍රමෝපායික සැළැස්මක් (2023-2027) සකස් කර තිබේ.

813. ජාතික ඒකාබද්ධතා සහ ප්‍රතිසන්ධාන කාර්යාලය විසින් විශ්ව කාලීන සමාලෝචනයට සහ එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කොමිෂන් සභාවට තම ප්‍රගතිය අඛණ්ඩ ලෙස ඉදිරිපත්කිරීම සහ වාර්තා කිරීම සිදුකර තිබේ.

814. ජාතික ඒකාබද්ධතා සහ ප්‍රතිසන්ධාන කාර්යාලය අතීතයේ දී විවිධ සිවිල් සමාජ සංවිධාන සමග විවිධාංග ව්‍යාපෘති ශ්‍රී ලංකාව තුළ සිදු කර තිබේ. මින් සමහර ව්‍යාපෘති දැනටමත් ක්‍රියාත්මක වන අතර සමහර ඒවා අලුත් කර තිබේ. එක් උදාහරණයක් වන්නේ 2022 ජාතික ඒකාබද්ධතා නිලධාරි 300ක් සඳහා දිස්ත්‍රික් සහ ප්‍රාදේශිය ලේකම් කොට්ඨාස මට්ටමේ පවත්වන ලද පුහුණු වැඩසටහන යි. මෙම ව්‍යාපෘතියට මූල්‍ය සහ තාක්ෂණික සහාය ගොලීය ප්‍රජාවන් සහ USAID ආයතනයේ SCORE වැඩසටහන මගින් ලබා දෙන ලදී.

815. 2022 වසරේදී ජාතික ඒකාබද්ධතා සහ ප්‍රතිසන්ධාන කාර්යාලය විසින් ආගමික නායකයන්, ආණ්ඩුවේ නිළධාරීන්, තරුණයන්, කාන්තාවන් සහ සිවිල් සමාජ ක්‍රියාකාරීන්ගේ

සහභාගිත්වයෙන් යුත් ප්‍රජා සාකච්ඡා ග්‍රාම නිලධාරි කොට්ඨාස 800 ක පමණ සම්බන්ධීකරණය සහ අධීක්ෂණය කර තිබේ.

816. ''ප්‍රතිසන්ධාන කමිටුව'' සහ ග්‍රාම නිලධාරි කොට්ඨාස, ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස සහ දිස්ත්‍රික්ක වල ''සමගි මධ්‍යස්ථාන'' ආරම්භ කිරීමේ දී සහ ජාතික මට්ටමින් අධිකරණ අමාත්‍යාංශයේ ජාතික ප්‍රතිසන්ධාන අංශය ආරම්භයේ දී ඒ පිළිබඳව ජාතික ඒකාබද්ධතා සහ ප්‍රතිසන්ධාන කාර්යාලය සාකච්ඡා ආරම්භ කර තිබේ.

817. ගැටුම් වැළැක්වීම සහ සිවිල් ජනතාවගේ ආරක්ෂාව වෙත නිසි කලට ප්‍රතිචාර දැක්වීම සඳහා ''පූර්ව දැනුම් දීමේ ක්‍රම'' සාමූහිකව දියත් කිරීම සඳහා මොරටුව විශ්වවිද්‍යාලයේ තාක්ෂණික සහාය සහිතව ජාතික ඒකාබද්ධතා සහ ප්‍රතිසන්ධාන කාර්යාලය විසින් ලබා තිබේ.

818. සංකල්ප පත්‍රිකාවේ අන්තවාදී ප්‍රවණ්ඩත්වය වැළැක්වීම සඳහා වන ජාතික ක්‍රියාකාරී සැලැස්මක් යෝජනා කර තිබූ අතර, එම ක්‍රියාකාරී සැළැස්ම සකස්කළ යුතු වන්නේ ඒ පිළිබඳ අදහස් විමසීමෙන් පසුව බව මෙම ජනාධිපති කොමිෂන් සභාවේ අදහස වේ.

819. අධ්‍යාපනික අභිමතාර්ථ ප්‍රවර්ධනය කෙරෙන ක්‍රියාකාරකම් දිවයිනේ දිස්ත්‍රික්ක 25 ම ආවරණය කෙරෙන පරිදි ක්‍රියාත්මක කිරීමට ජාතික ඒකාබද්ධතා සහ ප්‍රතිසන්ධාන කාර්යාලය සැළසුම් කර තිබේ. එවන් එක් ව්‍යාපෘතියක් වන්නේ ත්‍රෛභාෂා සහ විද්‍යුත් පුස්තකාල පහසුකම් සැපයීමට පහසුකම් සැපයීමයි. තවදුරටත් මෙම දිස්ත්‍රික්ක වලින් සුදුසු ස්ථාන හඳුනාගෙන පුස්තකාල ප්‍රජාවෙන් යෝග්‍ය තරුණයන් සම්බන්ධ කරවා තරුණ පුස්තකාල සමාජ ස්ථාපනය කිරීමට ජාතික ඒකාබද්ධතා සහ ප්‍රතිසන්ධාන කාර්යාලය අපේක්ෂා කරයි. මෙම අරමුණ ලඟාකර ගැනීම සඳහා ජාතික ඒකාබද්ධතා සහ ප්‍රතිසන්ධාන කාර්යාලය දිස්ත්‍රික්ක 25න් ම යෝජනා කැඳවා තිබෙන අතර, ඒ අතරින් දිස්ත්‍රික්ක පහක් සඳහා ස්ථාන හඳුනාගැනීම සිදුකර, මූලික පහසුකම් ලබා දීම සඳහා පුස්තකාල සේවා මණ්ඩලයේ නිර්ණායක යොදාගනෙ තිබේ. මූලික ස්ථාන පහට අමතරව වෙනත් දිස්ත්‍රික්ක වලින් තවත් ස්ථාන 10 ක් ද හඳුනාගෙන තිබෙන අතර ජාතික ඒකාබද්ධතා සහ ප්‍රතිසන්ධාන කාර්යාලය අදාළ දිස්ත්‍රික්ක සමග ඉහත නිශ්චිත කරන ලද අභිමතාර්ථ ළඟාකර ගැනීම සඳහා වන සන්නිවේදනයක යෙදී සිටියි.

820. අධ්‍යාපනය අරමුණක් වන ව්‍යාපෘති ගත් විට සිංහල සහ දෙමළ ජනයා ඉලක්ක කර සිදුකෙරෙන ද්විභාෂා පුහුණු වැඩසටහන දැනට පැවත්වෙන තවත් එක් ව්‍යාපෘතියකි. මෙම ව්‍යාපෘතිය මගින් තරුණයන්, ප්‍රජා නායකයන් සහ ආගමික නායකයන් ට ප්‍රජාවන් අතර තිබෙන පරතරය පියවීම සඳහා සහ සංස්කෘතීන් අතර සම්මිශ්‍රණයක් ඇතිවීම සඳහාත් විවිධ භාෂාවලින් සංවාද ඇතිකිරීම අරමුණු කරගෙන පැය 100 ක ඉගෙනුම් වැඩසටහනක් දිස්ත්‍රික්ක 25 හි ම ආරම්භ කර තිබේ.

821. ජාතික ඒකාබද්ධතා සහ ප්‍රතිසන්ධාන කාර්යාලය මෙම වැඩසටහන යටතේ දිස්ත්‍රික්ක 22 ක පුහුණු වැඩසටහන් 85ක් සම්පූර්ණ කර තිබේ. ජාතික ඒකාබද්ධතා සහ ප්‍රතිසන්ධාන කාර්යාලය ඉදිරියේදී තවත් මෙවන් පුහුණු වැඩසටහන් පැවැත්වීමට අපේක්ෂා කරන බව දැනගන්නට ලැබී තිබේ.

822. ගැටුම් පරිවර්තන හේතු වලට සහාය දීමට ද ජාතික ඒකාබද්ධතා සහ ප්‍රතිසන්ධාන කාර්යාලය වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලබයි. එවන් එක් වැඩසටහනක් වන්නේ දිස්ත්‍රික්ක 17 ක පහසුකම් සපයන්නන්ගේ ධාරිතා වර්ධනය කිරීමේ අපේක්ෂාවෙන් සංවර්ධන නිලධාරින් උදෙසා පවත්වනු ලබන ''පුහුණුකරුවන් පුහුණු කිරීම'' වැඩසටහනයි. මෙම පුහුණුකරුවන් පුහුණුකිරීමේ වැඩසටහන තවදුරටත් පුළුල් කර ප්‍රාදේශීය සහ දිස්ත්‍රික් ලේකම් කාර්යාල වල පහසුකම් සපයන්නන්ගේ සහභාගිත්වය සහිතව පවත්වන ලදී. මෙම වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහා

ජාතික ඒකාබද්ධතා සහ ප්‍රතිසන්ධාන කාර්යාලය බිම් මට්ටමේ පවා ධාරිතා වර්ධනය සිදුකිරීමට හැකියාව තිබෙන විවිධ ජාත්‍යන්තර සහ දේශීය සංවිධාන සමග එක්ව කටයුතු කරයි.

823. ජාතික ඒකාබද්ධතා සහ ප්‍රතිසන්ධාන කාර්යාලය ශ්‍රී ලංකාවේ දිස්ත්‍රික්ක 25 තුළ සෑම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයක ම එක් දින වැඩමුළු 2149 ක් පවත්වා තිබේ. එම ව්‍යාපෘතිය නම් කර තිබෙන්නේ "ප්‍රතිසන්ධානය සහ ප්‍රජා වැඩසටහන් පිළිබඳ දැනුවත් කිරීම' යනුවෙනි. මෙම ව්‍යාපෘතිය දැනට ක්‍රියාත්මක වෙමින් පවතියි.

824. ගැටුම් පරිවර්තන ක්‍රියාවලිය පිළිබඳ සමීක්ෂණ සහ වැඩමුළු ජාතික ඒකාබද්ධතා සහ ප්‍රතිසන්ධාන කාර්යාලය විසින් පවත්වා තිබෙන අතර මෙම අභිමතාර්ථයන් තවදුරටත් පුළුල් කිරීම උදෙසා ගම්, ප්‍රාදේශීය ලෙකම් කොට්ඨාස, දිස්ත්‍රික්ක සහ ප්‍රජා මට්ටම් වලින් "ප්‍රතිසන්ධාන කමිටු" පත් කර තිබේ.

825. ජාතික ඒකාබද්ධතා සහ ප්‍රතිසන්ධාන කාර්යාලය විසින් සියලු දිස්ත්‍රික්ක 25 හි ම ජාතික ඒකාබද්ධතා සම්බන්ධීකාරකවරුන් සහ ප්‍රජා විශෝධක නිලධාරින් සඳහා දැනටමත් පුහුණු වැඩසටහන් පවත්වා තිබේ.

826. විවිධ විශ්වාස සහිත හෝ විවිධ වාර්ගික කණ්ඩායම් වලට අයත් වන මිනිසුන් අතර ඇතිවිය හැකි අර්බුද හෝ උණුසුම්කාරී තත්ත්වයන්ට ක්ෂණිකව ප්‍රතිචාර දැක්වීම සඳහා වන හැකියාව ප්‍රවර්ධනය කිරීම පිණිස "පූර්ව දැනුම් දීමේ යාන්ත්‍රණයක්" සකස් කිරීම සඳහා වන ව්‍යාපෘතියක් ජාතික ඒකාබද්ධතා සහ ප්‍රතිසන්ධාන කාර්යාලය විසින් දියත් කර තිබේ.

827. මෙම යාන්ත්‍රණය තුළින් විශේෂිත ස්ථාන වල වාර්ගික සහ ආගමික ගැටුම්වල මූල හේතුව ආමන්ත්‍රණය කිරීමේ අපේක්ෂාවෙන් එය ගවේෂණය කරනු ඇත. මේ සම්බන්ධයෙන් ජංගම දුරකථන යෙදුමක් (app) සකස් කිරීම සඳහා ජාතික ඒකාබද්ධතා සහ ප්‍රතිසන්ධාන කාර්යාලය මොරටුව විශ්වවිද්‍යාලයේ නියෝජිතයින් සමග සාකච්ඡා පවත්වා තිබේ. ජාතික ඒකාබද්ධතා සහ ප්‍රතිසන්ධාන කාර්යාලය විසින් ගම් මට්ටමේ තිබෙන ප්‍රතිසන්ධාන කමිටුවල නියෝජිතයන්ට මෙම යෙදුමට ප්‍රවේශය ලබා දීමට අපේක්ෂා කරයි.

828. පෙර ගැටුම් තිබූ ප්‍රදේශ වල සිටි ජනාතව ආර්ථික කටයුතුවල නිරත කරවීම සඳහා ඔවුන්ගේ ධාරිතාව සහ හැකියාව ප්‍රවර්ධනය කිරීමේ අදහසින් "ආර්ථික කටයුතුවල නිරතවීමේ වැඩසටහන" සහ "ජීවනෝපාය සංවර්ධන වැඩසටහන" යන වැඩසටහන් ජාතික ඒකාබද්ධතා සහ ප්‍රතිසන්ධාන කාර්යාලය විසින් දියත් කර තිබේ. මෙම ප්‍රදේශයේ ජනතාව ආර්ථික වශයෙන් සවිබල ගැන්වීම සඳහා අවශ්‍ය වන මූලික යටිතල පහසුකම් සංවර්ධනය කිරීම තුළින් මෙය ළඟාකර ගැනීමට ජාතික ඒකාබද්ධතා සහ ප්‍රතිසන්ධාන කාර්යාලය අපේක්ෂා කරයි. මෙවන් යටිතල පහසුකම් වලට ආර්ථික විෂමතාවන් අවම කර අවස්ථාවන් නිර්මාණය කිරීමේ විභව හැකියාව පවතියි. මෙවන් ක්‍රියාමාර්ග ප්‍රතිසන්ධාන ක්‍රියාවලිය වේගවත් කිරීමට සහාය ලබා දෙයි.

829. මෙම ජීවනෝපාය වැඩසහන් හරහා 2020-2021 වර්ෂවල සිදු කළ ආකාරයට හිටපු සටන් කරුවන්ට සහ කාන්තා ගෘහ මූලික නිවාස වලට ජීවනෝපාය ප්‍රවර්ධන වැඩසටහන් සහ ආර්ථික සහාය වැඩසටහන් සඳහා මෙම ජීවනෝපාය වැඩසටහන් මගින් අවස්ථාවන් ලබා දිය හැකි බව මෙම ජනාධිපති විමර්ශන කොමිෂන් සභාවේ මතය වේ. මෙම ජනාධිපති විමර්ශන කොමිෂන් සභාව ඉදිරියේ සාක්ෂි ලබා දුන් හිටපු සටන් කරුවන් සහ කාන්තාවන් ගේ යහපත සඳහා මෙම වැඩසටහන් භාවිතා කළ හැකි ය.

830. ඉහත නිරීක්ෂණය කළ පරිදි, ඉහත සඳහන් ව්‍යාපෘති මගින් කාන්තා ගෘහමූලික නිවාස, හිටපු සටන්කරුවන්, කොන්කිරීමට ලක්වූ ප්‍රජාවන්, ආබාධිතයන් සහ වෙනත් වින්දිත පවුල් වලින් පැමිණි ප්‍රතිලාභීන්ට සහාය දීම අරමුණු කරයි.

831. ජාතික ඒකාබද්ධතා සහ ප්‍රතිසන්ධාන කාර්යාලය විසින් කෝප් සුපිරි වෙළෙඳසැල් පිහිටුවීම ආදිය මගින් උතුරු පළාතේ ජනතාවට ලබා දුන් ආර්ථික සහාය පිළිබඳව සඳහන් කළ යුතු ය .

832. ජාතික ඒකාබද්ධතා සහ ප්‍රතිසන්ධාන කාර්යාලය ගැටුම් පරිණාමනය කිරීම් සහ ප්‍රතිසන්ධානය ප්‍රවර්ධනය කිරීම යන වැඩසටහන් කිහිපයක නියැළී සිටින බව මෙම ජනාධිපති විමර්ශන කොමිෂන් සභාව සතුටින් තම අවධානයට ලක් කර තිබේ.

833. උතුරු සහ නැගෙනහිර පළාත් වලට අවශ්‍ය යටිතල පහසුකම් සහ ආර්ථික සංවර්ධන මූලාරම්භයන් ලබා දෙන විස්තීරණ දිස්ත්‍රික් සංවර්ධන සැළසුම් ස්ථාපිත කිරීම සම්බන්ධයෙන් ද මෙම ජනාධිපති විමර්ශන කොමිෂන් සභාවට අසන්නට ලැබී තිබේ. මෙම කලප වල අවශ්‍යතා ආමන්ත්‍රණය කිරීම සඳහා සහ ප්‍රතිසන්ධානය සඳහා අවශ්‍ය වන සමාජ සහ ආර්ථික ස්ථාවරත්වය ප්‍රවර්ධනය කිරීම සඳහා මෙය උපකාරී වේ.

834. ජාතික ඒකාබද්ධතා සහ ප්‍රතිසන්ධාන කාර්යාලය පිළිබඳ මෙම ජනාධිපති විමර්ශන කොමිෂන් සභාව ඉදිරියේ දෙන ලද යම් යම් සාක්ෂි අනුව ජාතික ඒකාබද්ධතා සහ ප්‍රතිසන්ධාන කාර්යාලයේ අයද ඇතුළුව සාක්ෂිකරුවන් විසින් දෙන ලද සංක්ෂිප්ත සාක්ෂි ඇතුළත් මෙම අවසන් වාර්තාවේ 4 වන පරිච්ඡේදය වෙත අවධානය යොමු කරයි.

835. ශ්‍රී ලංකාවේ ප්‍රතිසන්ධානය සහ සහජීවනය ඇතිකිරීම වෙනුවෙන් කටයුතු කිරීම සඳහා ජාතික ඒකාබද්ධතා සහ ප්‍රතිසන්ධාන කාර්යාලය පිහිටුවන ලදී. එහි ආරම්භක රාමුව වන 2015 පිහිටවූ *ප්‍රතිසන්ධාන යාන්ත්‍රණ සම්බන්ධීකරණය සඳහා වූ ලේකම් කාර්යාලය,* එවකට ව්‍යවස්ථාපිත නොවන ආයතනයක් වූ ජාතික ඒකාබද්ධතා සහ ප්‍රතිසන්ධාන කාර්යාලය වෙත, ආර්ථික, සමාජයීය, සංස්කෘතික සහ දේශපාලන ක්ෂේත්‍රවල සමාන අවස්ථා සහිතව සියළුලු ම ශ්‍රී ලාංකිකයන්ට සමගියෙන් සහ එකමුතුව කටයුතු කළ හැකි බහුවිධත්වයෙන් යුතු සියල්ල ඇතුළත් සමාජයක් බිහිකිරීමේ වගකීම පවරා තිබේ.

836. එමනිසා, ශ්‍රී ලංකාවේ ප්‍රතිසන්ධාන යාන්ත්‍රණය ක්‍රියාත්මක කිරීමේ විභවය පවතින්නේ ජාතික ඒකාබද්ධතා සහ ප්‍රතිසන්ධාන කාර්යාලයට වේ. ප්‍රතිසන්ධානය වෙනුවනේ තිබෙන එහි ප්‍රතිපත්ති සහ වැඩසටහන් සහ ජාතික සමගිය සහ සහජීවනය ප්‍රවර්ධනය කිරීම සඳහා සකස් කර තිබෙන මාර්ග සිතියම තුළින් අපේක්ෂිත අරමුණු වඩාත් හොඳින් සාක්ෂාත් කරගැනීම සඳහා දැනටමත් ස්ථාපිත කර තිබෙන වෙනත් යාන්ත්‍රණයන් වන අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය සහ හානිපූරණ කාර්යාලය වැනි අනෙකුත් ආයතන සමග ඒකාබද්ධව කටයුතු කළ යුතු ය. ජාතික ඒකාබද්ධතා සහ ප්‍රතිසන්ධාන කාර්යාලය ස්ථාපිත කිරීමේ මහඟු අරමුණු ළඟාකර ගැනීම සඳහා මූල්‍ය ස්වාධීනත්වය සහ පුළුල් කරන ලද ආයතනික ධාරිතාව ඉතා වැදගත් වේ.

837. සත්‍යය පමණක් නොව, ආයතනික ප්‍රතිසංස්කරණ, නැවත ඇති නොවීම, යුක්තිය සහ ප්‍රතිසන්ධානය ප්‍රවර්ධනය කිරීම සඳහා ද සංක්‍රාන්ති යුක්තියේ කුළුණු හතර එකිනෙකට එක්ව කටයුතු කිරීම තුළ සියලු ම යාන්ත්‍රණයන් අතර සහජීවනය සහ සහයෝගිතාවය තිබිය යුතු බව මෙම ජනාධිපති විමර්ශන කොමිෂන් සභාව නිර්දේශ කරයි. මේ තත්ත්වය ළඟා කර ගැනීම සඳහා මේ හා සමාන නිර්දේශ ඉදිරිපත් කරන ලද අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය කටයුතු කරන ආකාරය සලකා බැලූ විට ජාතික ඒකාබද්ධතා සහ ප්‍රතිසන්ධාන කාර්යාලය ද අනාගත සත්‍ය සෙවීමේ යාන්ත්‍රණයන්හි අත්‍යවශ්‍ය අංගයක් ලෙස කටයුතු කළ යුතු බව මෙම ජනාධිපති විමර්ශන කොමිෂන් සභාව නිර්දේශ කරයි.

4 වෙනි පරිච්ඡේදය

ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාවේ විමර්ශන හා පරීක්ෂණ

1. හැඳින්වීම

838. මෙම අදියෙර්දී, 1 වන පරිච්ඡේදයේ සඳහන් වන පරිදි කොමිෂන් සභාව (මෙම ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාව) විසින් ඊට නීත්‍යානුකූලව පැවරී ඇති අරමුණු සාක්ෂාත්කර ගැනීමෙහිලා ඉටු කරන ලද පුළුල් කාර්යය ගෙන හැර දැක්විය යුතුවේ. එහි සමාරම්භයේදී කොමිෂන් සභාව නිරීක්ෂණය කළ පරිදි ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාව විසින් සන්නද්ධ ගැටුම් හේතුවෙන් පීඩාවට පත් උතුරු හා නැගෙනහිර පළාත්වල ප්‍රදේශ කිහිපයක සංචාරය කොට විවිධ පාර්ශවයන්ගෙන් ප්‍රකාශ ලබා ගන්නා ලදී. කොළඹ දී පවත්වන ලද ප්‍රසිද්ධ සාක්ෂි විභාගවලට අමතරව කොමිෂන් සභාව විසින් ලබා දුන් පූර්ව දැනුම්දීම් හේතුවෙන් එම පළාත්හි දී සිදු කරන ලද විමර්ශන ද විනිවිදභාවයෙන් යුක්ත මෙන්ම සහභාගීවූවන් දැනුවත්භාවයෙන් යුතු විය. කොළඹ, යාපනය, කිලිනොච්චි හා මඩකලපුව ප්‍රදේශවලදී මෙතෙක් පැවති ප්‍රසිද්ධ සාක්ෂි විභාගවලදී මෙම කොමිෂන් සභාව විසින් සිදු කළ තොරතුරු විමසීම් හා සම්මුඛ සාකච්ඡා වලදී පහත සඳහන් පාර්ශවකරුවන්ගෙන් වැඩිමනත් සාක්ෂි ලැබී ඇත.

1. යුද්ධයේ දී සටන් වැදුණු හිටපු එල්.ටී.ටී.ඊ. සාමාජිකයන්;
2. සිය පවුල හෝ එහි සාමාජිකයන් එල්.ටී.ටී.ඊ. සංවිධානය හෝ ආරක්ෂක හමුදා අතින් අහිමි වූ බවට චෝදනා කරන දමිළ පුද්ගලයන්;
3. සිය පවුලේ සාමාජිකයන් අහිමිව සිටින සිංහල සාක්ෂිකරුවන්;
4. 1990 දී උතුරු පළාතෙන් නෙරපීම හේතුවෙන් සිය දේපළ හා ඉඩම්වලින් බලහත්කාරයෙන් ඉවත් කිරීමෙන් අභ්‍යන්තරිකව අවතැන් වී සිටි මුස්ලිම් පුද්ගලයන්
5. යුද්ධය පැවති සමයේදී සය ඥාති හිතමිත්‍රයන් අහිමි වූ මඩකලපුවේ සිටි මුස්ලිම් පුද්ගලයන්
6. විවිධ මත පළකරන්නන්/ සිවිල් සමාජ ක්‍රියාකාරීන්, විද්වතුන්, රාජ්‍ය නිලධාරීන් සහ අනෙකුත් පාර්ශවකරුවන්
7. පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්
8. විදේශීය උසස් නිලධාරීන් සහ තානාපතිවරුන්

839. මෙම පුද්ගල කණ්ඩායම් අතුරින් සාක්ෂිකරුවන් හා උපදෙස් ලබන්නන් කිහිපයකගේ සංක්ෂිප්ත ප්‍රකාශ පමණක් මෙම පරිච්ඡේදයේ දැක්වෙන අතර අදාළ සාක්ෂි ලබා දුන් අයවලුන්ගේ ප්‍රකාශ අවබෝධකර ගැනීම හා පැහැදිලි කර ගැනීම සඳහා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කළ විවිධ දෘෂ්ඨිකෝණයන් ගෙනහැර දැක්වීම, මෙම අවසාන වාර්තාවේ 5 වන පරිච්ඡේදයේ දී අප නිරීක්ෂණ පිළිබඳ අවසන් නිගමනයකට එළැඹීම සඳහා සුදුසු බවට කොමිෂන් සභාව සලකයි.

840. ගැටුම්වලින් බලපෑමට ලක් වූ ප්‍රදේශ කිහිපයක සංචාරය කිරීම සඳහා වූ අපගේ සැලසුම් කොරෝනා වසංගතය සමග ඇති වූ තත්ත්වය යටතේ බාධාවට ලක්වූ බව පැවසිය යුතු නමුත්, පොදු දැනුම් දීම් හා ආරාධනාවලින් අනතුරුව ඉහත සඳහන් කාණ්ඩ යටතේ සහභාගීවූවන් සිය ප්‍රකාශ ලබාදීම සඳහා කොමිෂන් සභාව හමුවේ පෙනී සිටියහ.

841. යාපනය හා කිලිනොච්චි ප්‍රදේශවල සංචාරය කොට සාක්ෂිකරුවන්ගේ වෘතාන්තවලට සවන් දීමෙන් පසු, කොමිෂන් සභාව නැගෙනහිර පළාත වෙත පැමිණි අතර එහිදී සාක්ෂිකරුවන් ආසන්න වශයෙන් 212 ක් අප නිවේදනවලට ප්‍රතිචාර දක්වමින් සිය දුක්ඛිත වෘතාන්ත මඩකලපුව/කාත්තාන්කුඩිවලදී පැවසීමට කොමිෂන් සභාව ඉදිරියේ පෙනී සිටියහ. කොමිෂන්

සභාව හමුවේ පෙනී සිට අදාළ ප්‍රකාශ ඉදිරිපත් කරන ලෙසට දිගින් දිගටම ඉල්ලීම් ගලා ආ අතර එය කොවිඩ් වසංගතයේ ආරම්භය නොවන්නට සාක්ෂිකරුවන්ගේ සංඛ්‍යාව සැලකිය යුතු ලෙස වැඩිවීමට ඉඩ තිබූ බව නිරීක්ෂණය කිරීම අතිශයෝක්තියක් නොවන්නේය.[512] රටේ කුමන ප්‍රදේශයකට ගිය ද සාමය හා සංහිඳියාව සඳහා වූ ජන හඬ එකසේ ප්‍රබල මෙන්ම පැහැදිලි බව අප කිව යුතුය.

842. යාපනය, කිලිනොච්චි හා කාත්තාන්කුඩිහි දී පැවති ප්‍රසිද්ධ සාක්ෂි විභාගවලදී අප ලද සාක්ෂි පිළිබඳ සැලකීමේදී, කොමසාරිස්වරු දෙදෙනෙකු දෙමළ බස මැනවින් ප්‍රගුණකොට සිටි හෙයින් හා ඔවුන් සම්මුඛ සාකච්ඡාවට සහභාගීවූවන් සමග චතුර ලෙස දෙමළ බසින් සංවාදයේ යෙදුන හෙයින් එම පළාත් දෙකෙහි ඉහත සඳහන් නගරවලදී ප්‍රකාශ ලබා දුන් දෙමළ හා මුස්ලිම් ජනතාව නිදහසේ සිය විස්තර ඉදිරිපත් කළහ. දෙමළ බස කතා කරන සාක්ෂිකරුවන්ගේ සාක්ෂි සියල්ල භාෂා තුනම පිළිබඳ ප්‍රවීණතාවයෙන් යුත් දක්ෂ දෙමළ බස කතා කරන භාෂා පරිවර්තකයන් මගින් ඉංග්‍රීසි බසට පරිවර්තනය කරන ලදී. එහි ප්‍රතිඵලයක් ලෙස සාක්ෂිවල මුල් පිටපත පරිවර්තන ක්‍රියාවලියේදී සහ ඔවුන්ගේ ප්‍රතිචාරවල සාරාංශය විශ්ලේෂණය කිරීමේ ක්‍රියාවලියේදී සාක්ෂිකරුවන්ගේ ස්මරණයන්හි, නිරීක්ෂණවල හා මතයන්හි සියුම් අවස්ථාවක් පවා මග නොහැරුණි.

843. සාක්ෂිකරුවන්ගේ යථා දර්ශන හා සාක්ෂි එක්රැස් කිරීම සඳහා ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාව විසින් යුද්ධයෙන් විනාශ වූ පළාත් දෙකෙහි අස්සක් මුල්ලක් නෑර සැරිසැරූ අතර කොළඹ දී මෙම කොමිෂන් සභාව හමුවේ සාක්ෂිකරුවන් ගණනාවක් ප්‍රකාශ ලබා දුන් නමුත් උතුරු හා නැගෙනහිර පළාත්වල සාක්ෂිකරුවන්ගේ ප්‍රබලතාවය සංඛ්‍යාත්මකව ඉහළ අගයක් ගැනුණි.

844. කොමිෂන් සභාව හමුවේ හෙළිදරව් කරන ලද වෘතාන්ත මගින් යුද්ධයේ ආරම්භයේ සිට එහි අවසානය දක්වා වූ කාලපරිච්ඡේදය තුළ රජයේ හමුදාවන් සහ එල්.ටී.ටී.ඊ. සංවිධානය යන දෙපාර්ශ්වයේම නොමනා හැසිරීම් පිළිබඳ තොරතුරු දැක්වේ. 2009 වසරට පෙර කාල පරිච්ඡේදයක සිදු වූ බේදනීය අත්දැකීම් සහිත සාක්ෂිකරුවන් ද අපට හමු විය. එහෙයින් ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාව විසින් එහි දෙවන අතුරු වාර්තාවෙන් දැනටමත් යෝජනා කර ඇති සත්‍ය සෙවීමේ යාන්ත්‍රණයේ කාල පරාසය මෙමඟින් තීරණය කරනු ඇත.

845. සාක්ෂිකරුවන්ගේ වාචික වාර්තා විශ්වාසවන්තව ලබාගෙන පරිවර්තනය කර ඇති බවට සහතික වීමට කොමිෂන් සභාව විශේෂ සැලකිල්ලක් දැක්වූ අතර සෑම සාක්ෂිකරුවකුගේම ප්‍රකාශයේ සවිස්තරාත්මක අනුවාදයක් මෙම අවසාන වාර්තාවේ 11 වන වෙළුමේ දක්වා ඇත. මෙම පරිච්ඡේදයේ අරමුණු වෙනුවෙන් යාපනය හා කිළිනොච්චියේ සාක්ෂිකරුවන් අනුක්‍රමිකව JW හා KW ලෙස හඳුනා ගැනේ. කාත්තාන්කුඩිහි දී ප්‍රකාශ ලබා දුන් කාත්තාන්කුඩි හා මඩකලපුවේ සාක්ෂිකරුවන් අනුක්‍රමිකව KK ලෙස දක්වනු ඇත.

846. යාපනය මහ ලේකම් කාර්යාලයේ දී පවත්වන ලද ප්‍රසිද්ධ සාක්ෂි විභාගයේ දී සාක්ෂිකරුවන් 45 දෙනෙකු පමණ සාක්ෂි ලබා දුන් අතර සාක්ෂිකරුවන් 31 දෙනෙකු කිළිනොච්චියේ දී සාක්ෂි ලබා දුන්හ. කොළඹ දී සාක්ෂිකරුවන් 40ක් පමණ සාක්ෂි ලබා දුන් අතර නැගෙනහිර පළාතේ දී සාක්ෂිකරුවන් 212ක් ප්‍රකාශ ලබා දුන්හ. මඩකලපුවේදී ප්‍රකාශ ලබා දුන් සාක්ෂිකරුවන් සංඛ්‍යාවට මඩකලපුව, කිරාන් සිට පැමිණි දමිළ සාක්ෂිකරුවන් සහ කාත්තාන්කුඩි, ඔඩ්ඩමාවඩි, එරාවුර්, අරයන්පති හා පලමුනේ සිට පැමිණි මුස්ලිම් සාක්ෂිකරුවන් ඇතුළත් විය.

[512] මෙම වාර්තාවේ ඇමුණුම 1 හි දැක්වෙන කොමිෂන් සභාව හමුවේ ප්‍රකාශ ලබාදුන් සාක්ෂිකරුවන්ගේ ලැයිස්තුව බලන්න.

847. ඒ අනුව, මෙම පරිච්ඡේදයේ වන සාක්ෂිවලට පාදක වූ ප්‍රකාශ මගින් ඔවුන්ගේම අදහස් පිළිබිඹු වන අතර සාක්ෂිකරුවන් විසින් ඉදිරිපත් කරන නිශ්චිත අවශ්‍යතා ප්‍රකාශ කෙරෙන වෘතාන්තවල පොදු ලක්ෂණ පවතින බව අපද හඳුනාගත් හෙයින් අපගේ අවසාන නිරීක්ෂණවලට අදාළ සාක්ෂි අයිතම මෙහිදී දක්වා සිටින්නෙමු.

848. සාක්ෂිකරුවන්ගේ හා උපදේශකයන්ගේ ප්‍රකාශ පුනරාවර්ජනය කිරීම සඳහා අවශ්‍ය වන අතර මෙම සාක්ෂිකරුවන්ගේ පෞද්ගලික මත පිළිබිඹු කිරීම සඳහා එය සිදු කෙරේ. එක් එක් ප්‍රකාශය පිළිබඳ සවිස්තර වාර්තාවක් මෙම අවසාන වාර්තාවේ 11 වන වෙළුමේ අන්තර්ගත වන බව නැවත සඳහන් කරන්නෙමු.

2. ප්‍රසිද්ධ රැස්වීම් පිළිබඳ නිරීක්ෂණ

849. ඉහත සඳහන් කළ පරිදි යාපනයේ දී දෙමළ පුද්ගලයන් 45 දෙනකු පමණ සාක්ෂි ලබා දුන් අතර කිළිනොච්චියේ දී සාක්ෂිකරුවන් 31 දෙනෙකු සාක්ෂි ලබා දුන්හ. 2009 වසර තුළ හා ඊට පෙර සිදු වූ බව කියන පැහැර ගැනීම් සහ බලහත්කාරයෙන් අතුරුදන් කිරීම පිළිබඳ ඔවුන්ගේ ප්‍රකාශවලින් අනාවරණය විය. ඇතැම් සාක්ෂිකරුවන් හමුදාව, නාවික හමුදාව සහ පොලිසිය සිදු කළ පැහැරගැනීම් පිළිබඳ පැවසූ අතර අනෙක් අය පැහැර ගැනීම් සම්බන්ධයෙන් එල්.ටී.ටී.ඊ. සංවිධානයට චෝදනා කළහ.

850. මෙම සාක්ෂිකරුවන් සමූහය තුළ සිය ළමුන් ඇතුළු පවුලේ සාමාජිකයන් බලහත්කාරයෙන් බඳවා ගැනීමට හා එය අවසානයේ ඔවුන්ගේ මරණයට හෝ අතුරුදන්වීමට හේතු වූ බවට එල්.ටී.ටී.ඊ. සංවිධානයට චෝදනා කරන කණ්ඩායමක් සිටී.

851. යාපනයේ සාක්ෂිකරුවන් සහ ඉන්පසු කිළිනොච්චියේ සහ මඩකලපුවේ සාක්ෂිකරුවන් විසින් ලබා දෙන ලද සාක්ෂිවල සාරනිදර්ශනයක් අපි පහතින් සලකා බලන්නෙමු.

උතුරු හා නැගෙනහිර පළාත්වලදී පවත්වන ලද

යාපනයේදී ලබා දුන් ප්‍රකාශ

852. යාපනය මහ ලේකම් කාර්යාලයේදී කොමිෂන් සභාව විසින් පවත්වන ලද මහජන රැස්වීම්වලදී ප්‍රකාශ ලබාදීමට විශාල පිරිසක් සහභාගී වූහ. ඒ අතර සිය පවුලේ සාමාජිකයන්ගේ අතුරුදන් වීම පිළිබඳ කතා කළ අයට අමතරව එල්.ටී.ටී.ඊ.ය විසින් ඔවුන් බලහත්කාරයෙන් නෙරපා හැරීම සහ යාපනයේ සිය වාසස්ථානවලින් ඔවුන්ව පිටමං කිරීම ගැන කතා කළ මුස්ලිම් ප්‍රජාවේ නියෝජිතයන් ද සිටියහ.

853. යාපනයේ සාක්ෂිකරුවන් විශාල සංඛ්‍යාවක් බලහත්කාරයෙන් අතුරුදන් කිරීම් හා පැහැර ගැනීම් පිළිබඳ සාක්ෂි ලබා දුන් අතර මෙය යාපනයේ දී ලද ප්‍රකාශවල වූ සාක්ෂි වෘතාන්තවල පොදු තේමාවක් වූ බව වාර්තා කිරීමට කැමැත්තෙමු. යාපනයෙන් පැමිණි සාක්ෂිකරුවන් සියල්ලන්ගේ සාක්ෂි සංක්ෂිප්ත ලෙස වෙන වෙනම දෙවන අතුරු වාර්තාවේ සඳහන් වන අතර එම වෘතාන්තවල පොදු ඒකමතිකභාවයක් පවතින හෙයින් සාක්ෂිකරුවන්ගේ සම්පූර්ණ සවිස්තරාත්මක ප්‍රකාශයක් II වන වෙළුමේ දැක්වේ. කෙටියෙන් පවසන්නේ නම්, ආරක්ෂක හමුදාවන් හෝ එල්.ටී.ටී.ඊ.ය විසින් සිදුකළ මිනීමැරුම් හෝ පැහැර ගැනීම් පිළිබඳ යාපනයේ සාක්ෂිකරුවන් පැවසූහ. යාපනයේ මුස්ලිම් සාක්ෂිකරුවන් ඔවුන්ව 1990 දී යාපනයෙන් බලහත්කාරයෙන් නෙරපීම පිළිබඳ හා ඉන්පසු ඔවුන් පුත්තලම වැනි අනෙකුත් නගරවල සරණ ගිය ආකාරය පිළිබඳ පැවසූහ. මුස්ලිම් සාක්ෂිකරුවන් සාධාරණ ඉඩම් බෙදා දීමක් ඉල්ලා සිටියදී යාපනයේ අනෙකුත් සාක්ෂිකරුවන් වන්දි ගෙවීම්, නිවාස හෝ ආර්ථික දීමනා පිළිබඳ සාකච්ඡා

කළහ. යාපනයේ ඇතැම් සාක්ෂිකරුවන් ඔවුනට අහිමි වූ සිය ආදරණීයන් නැවත ලබා දෙන්නයි තරයේ කියා සිටියහ.

854. ඒ සම්බන්ධයෙන් යාපනයේ සාක්ෂිකරුවන් කතා කළ වැදගත් කරුණු කීපයක් මෙම අවසාන වාර්තාවේ 5 වන ඡේදයේ සඳහන්වේ.

කිළිනොච්චියේ දී ලබා දුන් ප්‍රකාශ

855. යාපනයේ සාක්ෂිකරුවන් සිදුකළ ආකාරයටම කිළිනොච්චියේ සාක්ෂිකරුවන්ගෙන් බහුතරයක් ද මිනීමැරීම් හෝ පැහැර ගැනීම් පිළිබඳ කතා කළ අතර කිළිනොච්චියේ සාක්ෂිකරුවන්ගේ ප්‍රකාශ අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයේ අවධානයට යොමු කරන ලද අතර විත්දිතයන් පැමිණිලි කළ අතුරුදහන්වීම් සම්බන්ධයෙන් පරීක්ෂණ ආරම්භ කරන ලෙසට ඔවුන්ට උපදෙස් දෙන ලදී. ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාවේ නිර්දේශවලට ප්‍රස්තුත වන ඇතැම් සාක්ෂිකරුවන්ගේ ප්‍රකාශ මෙම අවසාන වාර්තාවේ 5 වන පරිච්ඡේදයේ සඳහන් වේ. සාක්ෂි ප්‍රකාශවල සවිස්තරාත්මක වාර්තාවක් මෙම අවසන් වාර්තාවේ II වන වෙළුමේ දක්නට ලැබේ.

කාත්තාන්කුඩිහි දී ලබා දුන් ප්‍රකාශ

856. ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාව විසින් කාත්තාන්කුඩිහි දී සිදු කළ සංචාරවලදී, එල්.ටී.ටී.ඊ. කෲරකම් හා ඒවා හමුවේ එල්.ටී.ටී.ඊ.ය අතින් සිය පවුලේ උපයන්නන් ඔවුනට අහිමි වූ ආකාරය පිළිබඳ සාක්ෂිකරුවන් චෝදනා කළ අතර කාන්තාවන් විශාල සංඛ්‍යාවක් එල්.ටී.ටී.ඊ.ය හේතුවෙන් සිය පවුලේ සාමාජිකයන් අතුරුදහන්වීම පිළිබඳ සාක්ෂි ලබාදීමට ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාව ඉදිරියේ පෙනී සිටියහ. ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාව විසින් මෙම සාක්ෂිකරුවන් ද අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය වෙත යොමු කරන ලදී.

857. මෙම අතුරුදහන් වීම් සම්බන්ධ පරීක්ෂණ කඩිනම් කරන ලෙස අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය වෙත නිර්දේශයක් ලබාදීමට ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාව කටයුතු කරනු ඇත. මෙම සාක්ෂිකරුවන් 1990 දී සිදු වූ එක්තරා සිදුවීමක් එනම්, කුරුක්කල්මාදම් නමැති ස්ථානයකදී මුස්ලිම් මිනිසුන් පිරි බස් රථයක් පැහැරගෙන ඔවුන් මරා සමූහ මිනී වළක වළලනු ලැබූ බවට ද පැවසූහ. ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාව මෙම අවසන් වාර්තාවේ 5 වන පරිච්ඡේදයේ අවසන් නිරීක්ෂණවල මෙම ප්‍රකාශ සඳහන් කර ඇත.

කොළඹදී ලබාදුන් ප්‍රකාශ

හිටපු සටන්කරුවන්ගේ සාක්ෂි

858. දෙවන අතුරු වාර්තාවේ IV වන පරිච්ඡේදයේ සාක්ෂි විස්තර කර ඇත. ඔවුන් සියලු දෙනාම උතුරු පළාතේ සිට පැමිණ කොළඹ කොමිෂන් සභාව හමුවේ කරුණු ඉදිරිපත් කළහ. සෙල්වනායගම් ආනන්දවර්ණන් හෙවත් අරවින්ද අවසානයේ ශ්‍රී ලංකාවේ අධිකරණයක් විසින් අත්අඩංගුවට ගෙන වරදකරු කරනු ලැබූ එල්.ටී.ටී.ඊ. සටන්කරුවෙකි. යුද්ධයේ අවසාන අදියරේදී සටන්වලට සහභාගි වූ බවට සාක්ෂි දුන් ඔහු යුද්ධයේදී රජය පාර්ශවයෙන් කළ මැදිහත්වීම් විස්තර කළේය. තමන් විමර්ශන කොමිෂන් සභාවක් හමුවේ පෙනී සිටින පළමු අවස්ථාව මෙය බව සඳහන් කළ ඔහු තමන්ට සහ තවත් පුද්ගලයන්ට අනතුරු සිදු කළ ෂෙල් ප්‍රහාර කීපයක් පිළිබඳව ප්‍රකාශ කළේය. උසාවියක දී මොහු මේ සියල්ල පැවසූ බවක් නොපෙනේ. මහාධිකරණ විනිසුරුවරයා මොහුට පවසා ඇත්තේ, "නිදහස් වීමම ඔබට ලොකු දෙයක්" යනුවෙනි.

859. ඔහුගේ සාක්ෂිය තුළ හිටපු එල්.ටී.ටී.ඊ. සටන්කරුවෙකු ලෙස නම් කිරීමෙන් ලද සමාජ අපකීර්තිය හේතුවෙන් ඔවුන් මුහුණ දෙන සමාජ අසමානතාවය පිළිබඳ ඔහු සඳහන් කළ අතර එසේ සමාජයෙන් කොන්වීම පිළිබඳ ඔහු තුළ වන කලකිරීම පිළිබඳ ඔහු හුවා දැක්වුවේය. එමෙන්ම ඔහු

සමග යුධ වැදී එල්.ටී.ටී.ඊ. සාමාජිකයන් අනුස්මරණය කිරීම පිළිබඳව ද ඔහු කතා කළ අතර තවද යුද්ධයේදී මිය ගිය ජනතාව අනුස්මරණය වෙනුවෙන් ද ඔහු කතා කළේය.

860. මෙම සාක්ෂිකරුවන්ගේ කණ්ඩායමේ අනුස්මරණයට අවසර ඉල්ලීම් රැසක් එක සේ පැවතිණි. එක් සාක්ෂිකරුවෙකු "කිසිම තුවාලයක් නැවත පාරන්න ඕනේ නෑ. යුද්ධයට පෙර ඇත්ත වශයෙන්ම අපි කිසිම ප්‍රචණ්ඩත්වයකින් තොරව සිටියා" යැයි පැවසීය.

861. හිටපු සටන්කරුවන් ජීවිතයේ මුහුණ දෙන දුෂ්කරතා පිළිබඳ කතා කළ හිටපු කාන්තා සටන්කාරියක් ද විය. කෙසේ නමුත් ප්‍රචණ්ඩත්වය නැවත කිසි දිනෙක මෙරට තුළ හිස එසවීමට මෙම කණ්ඩායමේ සිටි කිසිදු සාක්ෂිකරුවෙකුට අවශ්‍ය නොවීම විශේෂත්වයකි. ඔවුන්ට අවශ්‍ය හා ඔවුන් ඉල්ලා සිටි එකම දේ සාමයේ උදාවයි.

862. මෙම තත්ත්වය තුළ හිටපු සටන්කරුවන් ලෙස සමාජයේ කොන්වීම හා සමාජ අපවාදයට ලක්වීම පිළිබඳ මැසිවිලි නඟන හිටපු සටන්කරුවන්ගේ අවාසනාවන්ත තත්ත්වය හමුවේ ඔවුනට ජීවනෝපාය මාර්ග හා රැකියා අවස්ථා ලබා දීමෙන් ඔවුන්ගේ ජීවන තත්ත්වය නඟා සිටුවීමේ අරමුණින් ඊට විසඳුම් ලබාදිය යුතු බවට කොමිෂන් සභාව නිර්දේශ කරයි.

863. අනුස්මරණය කිරීම පිළිබඳ කොමිෂන් සභාවේ නිර්දේශය මෙම අවසන් වාර්තාවේ 6 වන පරිච්ඡේදයේ දී ලබාදෙනු ඇත.

864. යාපනය, කිළිනොච්චිය, කාත්තාන්කුඩි හා කොළඹ සාක්ෂිකරුවන් විසින් ලබාදුන් ප්‍රකාශ සම්බන්ධයෙන් කටයුතු කිරීමෙන් අනතුරුව, ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාව මීළඟට රජයේ නිලධාරීන්, රාජ්‍යතාන්ත්‍රිකයන්, සිවිල් සමාජ සාමාජිකයන්, විද්වතුන් හා විෂය විශේෂඥයින් ලබා දුන් සාක්ෂි හා සාක්ෂිකරුවන් කිහිප දෙනෙකු විසින් ලබා දුන් අනෙකුත් සාක්ෂි සියල්ල පිළිබඳ සිය අවධානය යොමු කරන අතර අනාගත ප්‍රකාශ අවසන් වාර්තාවේ ඇමුණුමෙහි (I වෙනි වෙළුම) අදාළ හා අවශ්‍ය නිරීක්ෂණ ද සහිතව සඳහන් වනු ඇත.

3. රජයේ නිලධාරීන්, රාජ්‍යතාන්ත්‍රිකයන්, සිවිල් සමාජ සාමාජිකයන්, විද්වතුන් හා විෂය විශේෂඥයන්ගේ ප්‍රකාශ

ගරු ඩග්ලස් දේවානන්ද මහතා

ධීවර අමාත්‍ය

865. මම ශ්‍රී ලංකාවේ ඉපදුණේ වාමාංශික චින්තනයන් හා සිතුවිලි මෙන්ම මානුෂීය සංකල්ප එක්කයි. අපේ ප්‍රජාව අරගලයකට අරන් ගියේ පත්වුණු රජයන්ගේ මර්ධනකාරී ක්‍රියාකාරකම් සහ සම්මතකරණ කටයුතු නිසායි. අපිව අපේ අයිතිවාසිකම් වෙනුවෙන් සටන් කරන තැනට ඔවුන් පත් කරනු ලැබුවා. අපි අපිව වෙන් කරගත යුතුයි කියලා අපේ ජන අරගලය ආරම්භ කළේ. අපේ කණ්ඩායම් අතර අභ්‍යන්තර ගැටලු පැවති කාලයේදී එකිනෙකාට එරෙහිව ආයුධ පාවිච්චි කරලා අපේ අභ්‍යන්තර ගැටළු විසඳා ගන්න අපි උත්සාහ කළා. මේ සුළු සුළු ආරවුල් අපේ නිදහස් සටන දුර්වල කළා. ඊළඟට ඉන්දු-ශ්‍රී ලංකා ගිවිසුම ආවා. ඉන්දු-ශ්‍රී ලංකා ගිවිසුම නිසා අපි තීරණය කළා ප්‍රධාන ධාරාවට එකතු වෙන්න. ඒ කාලේ මං හිටියේ ඉන්දියාවේ. මං හිතුවා අපේ ප්‍රශ්න සමාදානයෙන් විසඳගන්න. මං 1986 මැයි මාසයේදී ඉන්දියාවට ගිහින් 1990 මැයි වෙද්දි නැවත ලංකාවට ආවා. මං කියන්නම ඕනේ, මම උගත් පාඩම් හා ප්‍රතිසන්ධාන කොමිෂන් සභාවට සාක්ෂි දුන්නා. ඔයාලා ඇත්ත සත්‍යය හොයාගන්න ඕනේ. එතකොට තමා අපිට විසඳුම් හොයාගන්න පුළුවන් වෙන්නේ. සත්‍ය සොයන කොමිෂන් සභාවක සංකල්පයට මං කැමතියි. උගත් පාඩම් හා ප්‍රතිසන්ධාන කොමිෂන් සභාවට මම ලිඛිත පළකිරීම් කීපයක් දුන්නා වුනාට උගත් පාඩම් හා ප්‍රතිසන්ධාන කොමිෂන් සභාවේ වැඩදායී නිර්දේශ සමහරක් දුන්නත් ඔවුන් මට දුන්න යොමු

කිරීම් පක්ෂග්‍රාහීයි. උගත් පාඩම් හා ප්‍රතිසන්ධාන කොමිෂන් සභාව ඒගොල්ලන්ගේ වාර්තාවේ අපි ගැන සමහර නොමඟ යවන සුළු තොරතුරු සඳහන් කරලා තිබුණා. ඒ කාලේ හිටපු ජනාධිපතිතුමාට අපි ලියුමක් යැව්වා ඒ දුර්මත නිවැරදි කරන්න කියලා. පාර්ලිමේන්තුවේ හිටිය මගේ විරුද්ධවාදීන් අපිට විරුද්ධව කරපු සමහර ප්‍රකාශ දේශපාලන වාසි ගන්න ඔවුන් පාවිච්චි කළා.

ජනාධිපතිතුමාට ලිඛිතව කරුණු දක්වලා මං ඉල්ලා හිටියා උගත් පාඩම් හා ප්‍රතිසන්ධාන කොමිෂන් සභාවේ නිර්දේශ ක්‍රියාත්මක කරන්න පියවර ගන්න කියලා.

කලින් හිටපු කොමිෂන් සභා පුරුද්දක් විදියට රාජකාරි කළා මිසක කිසිම සත්‍ය ගවේෂණයක නියැළිලා නෑ. මේ කොමිෂන් සභාව ප්‍රකාශවල සත්‍ය අසත්‍යතාවය තහවුරු කරගන්න උනන්දුවක් දක්වනවා කියලා මට හිතෙනවා. ඒ හේතුව නිසයි ඔබේ කොමිෂන් සභාව ඉදිරියේ පෙනී සිටින්න මම තීරණය කළේ. මට දැනගන්න ලැබුණා මගේ වැඩිමහල් සහෝදරයාත් ඔබේ කොමිෂන් සභාවට සාක්ෂි ලබා දුන්නා කියලා. ඇත්ත වශයෙන්ම ඔහු විදේශයක ජීවත් වෙලා හිටියේ. මට මල්ලි කෙනෙකුත් හිටියා. ඔහුව එල්.ටී.ටී.ඊ.ය පැහැරගෙන අතුරුදන් කළා. එයාලා ඒක කළේ එයාලට මට ළං වෙන්න බැරි වුන නිසා. මම ඔහුට කීවා ඔබේ කොමිෂන් සභාවට පෙනී සිටින්න කියලා. මගේ මල්ලිව පැහැර ගත්තා. එදා ඉඳලා ඔහු අතුරුදන්. අනෙක් දෙමළ පක්ෂවලටත් මේ ප්‍රශ්නේ තියෙනවා, එයාලා ඒක පැසවන තුවාලයක් වගේ තියාගෙන ඉන්නවා. ඒත් අපිට අපේ ප්‍රශ්න විසඳගන්න ඕනේ. ඉන්දු-ශ්‍රී ලංකා ගිවිසුමට කලින් මම ශ්‍රී ලංකා රජය හඳුන්වන්නේ සිංහල ආණ්ඩුවක් කියල ගිවිසුමෙන් පස්සේ මම කිව්වේ .....

ශ්‍රී ලංකාව උත්සාහ කළා ප්‍රභාකරන් ඊට කැමති වුණේ නෑ.

පොඩි කාලේ ඉඳලා මම මාව හැඳින්වූයේ අපේ ආණ්ඩුව කියලා.

අපිව ඇත් කළේ මර්දනකාරී පියවරවල්.

I want to send the society order for this agreement with the running of its own evidence of the evening of April reported in any of 2.

මගේ පරිවර්තකයා කියන දේ ගැන මම සතුටු නෑ; සර් ඔබට තේරෙනවා වෙන්න පුළුවන් මම කියපු දේ. ඒත් අනෙක් මහත්වරුන්ට තේරුම් ගන්න බැරි වෙයි.

ඉන්දු-ලංකා ගිවිසුමෙන් පස්සේ තමා මං ඉන්දියාවේ ඉඳලා ලංකාවට ආවේ, ලංකාවේ ප්‍රධාන දේශපාලන ධාරාවට අපිට එකතු වෙලා පාර්ලිමේන්තු ප්‍රජාතන්ත්‍රවාදය හරහා අපට සංහිඳියාවට එකතු වෙන්න පුළුවන් වෙයි කියලා හිතලා.

ඔබ ශ්‍රී ලංකාවට ආවේ කවදාද?

මම 1986 මැයි මාසයේදී ඉන්දියාවට ගිහින් 1990 මැයි මාසයේදී ලංකාවට ආවා. මම එහේ හිටියේ ටික කාලෙකට. ඉන්දු ශ්‍රී ලංකා ගිවිසුමෙන් පස්සේ තමා මම ලංකාවට ආවේ.

ගරු සභාපතිතුමා සඳහන් කළා කලින් තිබුණු කොමිෂන් ගැන. ඒත් මං කැමතියි කියන්න මම උගත් පාඩම් හා ප්‍රතිසන්ධාන කොමිෂන් සභාවට මීට පෙර සාක්ෂි ලබා දීලා තියෙනවා. ඒ නිසා ඒ ගැන කියලා ඉන්නම් මුලින්ම.

මේ කොමිෂන් සභා කිසිම කරුණක් වසන් කරන්න හෝ සඟවන්න හිතන්නේ නැත්නම් එයාලා සත්‍ය සොයන්න ඕනේ. එතකොට තමා අපිට විසඳුමක් සොයා ගන්න පුළුවන් වෙන්නෙ. එය සත්‍ය ගවේෂණය කරන කොමිෂන් සභාවක් විය යුතුයි.

එහෙම හිතලා තමා මම උගත් පාඩම් හා ප්‍රතිසන්ධාන කොමිෂන් සභාවට සාක්ෂි දුන්නේ. ඒත් එයාලා කටයුතු කරලා තිබ්බේ ඒක පක්ෂග්‍රාහී වාර්තාවක් විදිහට පේන ආකාරයට. මං සම්බන්ධයෙන් ගත්තම උගත් පාඩම් හා ප්‍රතිසන්ධාන කොමිෂන් සභාව මට විරුද්ධව පක්ෂග්‍රාහී වාර්තාවක් ලබා දීලා තියෙනවා. පිළිගන්න පුළුවන් නිර්දේශ ගණනාවක් ලබා දීලා තිබුණත්. ඒ නිසා උගත් පාඩම් හා ප්‍රතිසන්ධාන කොමිෂන් සභාව ගරු ජනාධිපතිතුමාට ලබා දුන්න නිර්දේශයේ පිටපතක් අපිට දෙන්න පුළුවන්. එය පිටු නවය (09)ක වාර්තාවක්. ඒකෙත් අපි අපේ ගැටලු ගැන සඳහන් කරලා තියෙනවා.

සමහර කරුණු වසන් කරන්න තිබුණ වුවමනාවට පක්ෂග්‍රාහී වාර්තාවක් දීලා තිබුණ බව අපි ඒ වාර්තාවේ දැක්කා. ඒ නිසා වාර්තාව ඉදිරිපත් කළාට පස්සේ අපිට ඕන වුණා මේ කාරණය කොමිෂන් සභාවේ සභාපතිට යොමු කරන්න. අපිට ඕන වුණේ ඒ වගේ වාර්තාවක් සිදු කිරීම ගැන නීති ක්‍රියාමාර්ග ගන්න උසාවි යන්න. ඒත් අපිට ඒක කරන්න බැරි වුණා. මොකද වාර්තාව ඉදිරිපත් කළාට පස්සේ කොමිෂන් සභාවේ කටයුතු අවසන් කර තිබුණා. තවදුරටත් කොමිෂන් සභාව තිබුණේ නැති නිසා අපට නීති ක්‍රියාමාර්ග ගන්න හැකියාවක් තිබුණේ නෑ. කෙසේ නමුත් කොමිෂන් සභාවේ වාර්තාව පාර්ලිමේන්තුවේදී සභාගත කරලා තිබුණා. පාර්ලිමේන්තුවේ අපේ විරුද්ධවාදීන් ඒකෙන් දේශපාලන වාසි ගන්න මට විරුද්ධව තිබුණ සියල්ල භාවිතා කළා. උගත් පාඩම් හා ප්‍රතිසන්ධාන කොමිෂන් සභාවේ නිර්දේශයෙන් පසු ඇතැම් යෝජනා ක්‍රියාත්මක කරන ලෙසට අමාත්‍යවරයා ගරු ජනාධිපතිවරයාට දැනුම් දී තිබුණි. එය කොමිෂන් සභාවට ඉදිරිපත් කරන ලදී. ("A" ලෙස දක්වා) ඒක B වෙනි අයිතමයේම වෙනස් එකක්.

ඊළඟ ජනතා ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂයට (ඊ.පී.ඩී.පී. සංවිධානය) එරෙහිව උගත් පාඩම් හා ප්‍රතිසන්ධාන කොමිෂන් සභාව වාර්තාවට ඉදිරිපත් කරලා තිබුණු චෝදනා සම්බන්ධයෙන් මම 2012.03.12 දින අතිගරු ජනාධිපතිතුමාට ලිපියක් යැව්වා. ජනාධිපතිතුමාට මං ඉදිරිපත් කළ මගේ ප්‍රතිචාරය පිටපතේ ඇමුණුම (ආ) හි දැක්වෙනවා. ඇය උගත් පාඩම් හා ප්‍රතිසන්ධාන කොමිෂන් සභාවට පැමිණිලි කරල තියෙන සාක්ෂියේ පිපත්කරයක් මෙම කොමිෂන් සභාව ඉදිරියට පමුණුව නම්, එම පිටපත්කරය (ඇ) ලෙස ලකුණු කරනවා. මම අනුවාදය දෙන්නේ උගත් පාඩම් හා ප්‍රතිසන්ධාන කොමිෂන් සභාවේ වාර්තාවේ දක්වන චෝදනා සාධාරණ නොවන බවට කරුණු ඉදිරිපත් කරන්න. මම උගත් පාඩම් හා ප්‍රතිසන්ධාන කොමිෂන් සභාව ඉදිරියේදී දුන්න මගේ සාක්ෂි එයාලා වරදවා විස්තර කිරීමක් කරලයි තියෙන්නේ.

මම හිතන විදියට මේ වගේ කොමිෂන් සභා සත්‍ය සොයනවා වෙනුවට වෙන වෙන රාජකාරි තමා කරලා තියෙන්නේ. කලින් තිබුණු කොමිෂන් සභාවේ වැඩ කළේ පුරුද්දට වගේ මොකක් හරි සත්‍ය සොයන්න කියලා. ඒත් මේ කොමිෂන් සභාව සත්‍ය සොයන්න උනන්දුවක් දක්වනවා. ඒ වගේම මට දැනගන්න ලැබුණා, මේ කොමිෂන් සභාව එයාලා ඉදිරියේ දෙන සාක්ෂිවල ඇත්ත නැත්ත තහවුරු කරගන්න කටයුතු කරනවා කියලා. ඒ හේතුව නිසයි මම මේ කොමිෂන් සභාවට පෙනී සිටින්න තීරණය කළේ.

මගේ වැඩිමහල් සහෝදරයා පිටරටක ජීවත් වුණේ. මගේ මල්ලිව පැහැර ගත්තා. එදා ඉඳලා එයා අතුරුදන්, මගේ වැඩිමල් සහෝදරයාට හොඳට ඉංග්‍රීසි පුළුවන්. එයා ගොඩක් කල් ජීවත් වුණේ පිටරට. මේ සිද්ධිය ගැන ඔබේ කොමිෂන් සභාවට ඇවිත් සාක්ෂි දෙන්න එයාටත් ඕනේ වුණා. ඒත් මං දැනගත්තා එයා මේ වන විටත් කොමිෂන් සභාවට සාක්ෂි දීලා කියලා. මගේ මල්ලිව පැහැර ගත්තා. එදා ඉඳලා එයා අතුරුදහන්.

මගේ දේශපාලන පක්ෂයෙයි අනෙක් දෙමළ පක්ෂ අතර වෙනසක් තියෙනවා. මට හැමවෙලේම ඕනෙ වුණේ ගැටලු විසඳාගන්න. ඒත් අනෙක් දේශපාලන පක්ෂවලට දෙමළ ජනතාවගේ ගැටලු විසඳන්න ඕනෑකමක් නෑ. එයාලා ඒවා පැසවන තුවාලයක් වගේ තියාගෙන ඉන්නවා.

ඉන්දු-ලංකා ගිවිසුමට කලින් මං පුරුදු වෙලා හිටියේ ශ්‍රී ලංකා රජයට සිංහල රජය කියලා කියන්න. ඉන්දු-ලංකා ගිවිසුමෙන් පස්සේ මම ඒකට ශ්‍රී ලංකා රජයක් කියලා කිව්වා.

මගේ තාත්තා කොමියුනිස්ට් පක්ෂ සාමාජිකයෙක්, පොඩි කාලේ ඉඳලා අපි කියන්න පුරුදු වෙලා හිටියේ "අපේ ආණ්ඩුව" කියලා. මම හැදුනේ ඒ වගේ පවුල් පරිසරයක. අපිට එරෙහිව තිබ්බ සම්මතකරණයයි මර්දනකාරී ක්‍රියාමාර්ගයි නිසා තමයි අපේ කොන් වුණේ.

ඉන්දු-ලංකා ගිවිසුමට කලින් තිබුණ තත්ත්වය වෙනස් සහ ඉන්දු-ලංකා ගිවිසුම අත්සන් කළාට පස්සේ තිබ්බ තත්ත්වය සම්පූර්ණයෙන්ම වෙනස්. ශ්‍රී ලංකා රජයන් ගැටලු විසඳන්න හදන හැමවෙලේම ප්‍රභාකරන් ඇතුළු අනෙක් දෙමළ පක්ෂවලට ඒවා විසඳගන්න ඕන වුණේ නෑ. මගේ ජීවිතයට බලපෑම් ඇති වූ අවස්ථා තිබුණා. වෙනස්කම් තියෙනවා. එයාලට මට වගේ ඉතිහාස කතාවක් තිබිලා නෑ. අවාසනාවට දෙමළ මාධ්‍ය ඉදිරියට එන්නේ නෑ. මට මඩ ගහන්න ඒගොල්ලෝ උත්සාහ කළා. ඒගොල්ලන්ට ඕනෑ වුණේ මාව මරලා මේකෙන් මාව අයින් කරන්න. දෙමළ පක්ෂ වලට හැම වෙලේම ඕන වුණේ මෙතන ප්‍රශ්නයක් තියෙනවා කියලා පෙන්වන්න. එයාලට ඕනෙ නෑ දෙමළ මිනිස්සුන්ගේ ප්‍රශ්න විසඳන්න. ඒ නිසා එයාලට ඕනෙ මගේ චරිතය ඝාතනය කරන්න. මම මෙතැනට සාක්ෂි දෙන්න එන්න කලින් අතිගරු චන්ද්‍රිකා බණ්ඩාරනායක මහත්මියව හමු වුණා. මට එක්තරා සිද්ධියක් මතක් වුණා. ඇය කෝල් කරලා මට කිව්වා පොට්ටු අම්මාන් කියලා කෙනෙක් අත්අඩංගුවට අරන් තියෙනවා. එයාව එවල තිබුනේ මගේ ඩ්‍රින්ක් එකට වස දාලා මාව මරන්න කියලා. මම ඇයට කීවා ඇයට වැරදිලා කියලා. මොකද ප්‍රභාකරන් දැනගෙන හිටියා මම බොන්නෙ නෑ කියලා. ඒ නිසා වස දීලා මාව මරන්න කෙනෙක් එවන්නෙ නෑ. මම අදත් ඇයට ඒ සංවාදය ගැන මතක් කළා.

කොමිෂන් සභාවක් සාක්ෂිකරුවන්ගෙන් ප්‍රකාශ ලබා ගැනීමේදී ඒවායේ සත්‍යතාවය පිළිබඳව සොයා බැලිය යුතුයි.

දෙමළ දේශපාලන පක්ෂ හා ප්‍රභාකරන් ගිය පාරට ප්‍රතිවිරුද්ධ පාරක් මම තෝරා ගනිද්දී එයාලා උත්සාහ කළේ මට මඩ ගහලා මගේ කීර්ති නාමයට හානි කරන්න. මගේ ජීවිතයට බලපෑම් එල්ල කළ අවස්ථාවනුත් තිබුණා. ගොඩක් මිනිස්සු, විශේෂයෙන් දෙමළ අය මේ කොමිෂන් සභාවට සාක්ෂි දීලා ඇති. ඒත් ඒ අයට මං මුහුණ දුන් අත්දැකීම් නැතුව ඇති. මේ ඉතිහාස කතාවේ ආරම්භයත් එක්ක මං ඉපදෙද්දී අනිත් අය අතරමැද්දෙන් එකතු වුණේ. මගෙයි ඒගොල්ලන්ගෙයි වෙනස ඒකයි. අවාසනාවකට දෙමළ මාධ්‍ය දෙමළ ජනතාවට නිවැරදි දේ පෙන්නුවේ නෑ. ඔවුනට ඕනෑ වුණේ මෙතන ප්‍රශ්නයක් තියෙනවා කියලා පෙන්නලා දිගින් දිගටම ප්‍රශ්නෙ ඇදගෙන යන්න. ප්‍රශ්න විසඳන්න එයාලට උවමනාවක් නෑ. ඒ හේතුව නිසා තමයි දිගින් දිගටම එයාලා මට මඩ ගැහුවේ. ඔවුන් චරිත ඝාතනයේ යෙදුනා.

අතුරුදහන් වුණ තමන්ගෙ ස්වාමිපුරුෂයා පිළිබඳ සාක්ෂි දෙන්න ආව කාන්තාවකගෙන් සාක්ෂි ලබාගත් කොමිෂන් සභාවක් තිබුණා. මේ කියන්නේ ඔබේ කොමිෂන් සභාව සාක්ෂි කැඳවන්න පෙර වෙච්ච සිදුවීමක් හා ඒක අතුරුදහන් වූ පුද්ගලයන්ගේ කොමිෂන් සභාවක්. සාක්ෂි දෙන ගමන් ඇය කිවුවා ඇයට ඇගේ ස්වාමිපුරුෂයා අහිමි වුණේ යාපනය මුදවා ගැනීමෙන් පස්සේ කියලා. යාපනය අරියාලෙයි දක්වා රජය පාලනය යටතේත් අරියාලෙයි වලින් එහාට වන්නිය දක්වා එල්.ටී.ටී.ඊ.ය යටතේත් තිබුණේ. ඇය කොමිෂන් සභාවට කියලා කොටි පාලන ප්‍රදේශයේදී ඇයගේ ස්වාමිපුරුෂයා අතුරුදන් වුණා කියලා. ඒත් කොමිෂන් සභාව ඇහුවාම කවුද ඔහුව පැහැර ගත්තේ කියලා ඇය කිවුවේ ඊ.පී.ඩී.පී. සංවිධානය කියලා. එතැනදී කොමිෂන් සභාවට ඇගෙන් අහන්න තිබුණා කොහොමද කොටි පාලන ප්‍රදේශයකදී අතුරුදන් වුණ ඇගේ ස්වාමිපුරුෂයා ඊ.පී.ඩී.පී. සංවිධානය පැහැර ගත්තේ කියලා. ඒ කියන්නේ ඊ.පී.ඩී.පී. සංවිධානය රජය පාලන ප්‍රදේශයේ ඉඳලා තියෙන්න ඕනේ. මේ තමයි කොමිෂන් සභාව ඉදිරියේ කරලා තියෙන සමහර

වැරදි අර්ථ දැක්විම්. මේ වැරදි නිවැරදි කරලා නැති එකේ ප්‍රතිඵලයක් විදියට අපි හරියට දුක් වින්දා. මේක නිර්දේශ කළ යුතුයි. මේ තමයි කොමිෂන් සභාව ඉදිරියේ වන මගේ ප්‍රකාශය.

අවාසනාවකට ඊ.පී.ඩී.පී. සංවිධානය ඇයගේ ස්වාමිපුරුෂයා පැහැර ගත්තා කියන ප්‍රවෘත්තිය දෙමළ මාධ්‍ය නැවත නැවත පළ කළා. ඒක නිසා මේ කොමිෂන් සභාව ඉදිරියේ පවා මගේ සහෝදරයා වගේ ඇවිත් සාක්ෂි දීලා ගිය අය කීපදෙනෙක් ඉන්නවා. මගේ සහෝදරයාගේ ප්‍රකාශය හරිම අව්‍යාජයි. ඔහු මගේ සහෝදරයා නිසා මම කියනවා නෙවෙයි. එය සත්‍ය සිදුවීමක්. මගේ සහෝදරයා මේ කොමිෂන් සභාවට සාක්ෂි දීලා තියෙනවා. ඒක මගේ සහෝදරයා අතුරුදන් වීම වගේම සත්‍ය සිදුවීමක්.

අනෙක් අයත් විවිධ හේතු නිසා ඇවිත් කතන්දර කියනවා. සමහරු කතා කියන්නේ ඇත්තටම හේතු තියෙන නිසා. මගේ සහෝදරයා වගේ අය අවංක වෙන්න පුළුවන්. අර අඩියාලෙයි ඉඳලා ආපු කාන්තාව දැන් ඇයගේ ළමයි දෙන්නා එක්ක මුලතිවුවල ජීවත් වෙනවා. දවසක් මට ඇයව හම්බවුණා. ඇය අඬලා පාපොච්චාරණය කළා ඇයට එහෙම කියන්න කියලා බල කළා කියලා. දේශපාලන හේතු නිසා එයාලට අනෙක් අයගේ කීර්ති නාමය නැති කරන්න ඕනේ. දේශපාලන හේතු නිසා මිනිස්සු ඇවිත් අපේ පක්ෂයේ ප්‍රතිරූපය කෙලෙසනවා. එයාලට එහෙම කරන්න කියන;

- **එක හේතුවක් අවංකකම**
- **දෙවන හේතුව දේශපාලන හේතුවකට**
- **තුන්වන හේතුව ඔවුන් හිතනවා මේ කොමිෂන් සභාව හරහා එයාලට අඩුම තරමේ ජීවනෝපාය මාර්ගයක් හෝ කුමක් හෝ වන්දියක් ලබාගන්න පුළුවන් කියලා**

මම දැන් ඉන්නේ ශ්‍රී ලාංකිකයෙක් විදියට. මම පූජා අළු තවරා නොගත් හින්දු භක්තිකයෙක්. කුරුසය නැති කතෝලිකයෙක්. තොප්පිය නැති මුසල්මානුවෙක්. සිවුර නැති බෞද්ධයෙක්. මගේ ආගම මානව වාදයයි.

අමාත්‍යවරයා එසේ පැවසීය. ඔහුගේ සම්පූර්ණ ප්‍රකාශය මෙම වාර්තාවේ දෙවන වෙළුමේ දැක්වේ.

රෝහිත බෝගොල්ලාගම

හිටපු විදේශ කටයුතු අමාත්‍යවරයා

866. 2009 මැයි මාසේ 22 වැනිදා මම එක්සත් ජාතීන්ගේ සංවිධානයේ මහලේකම්වරයා වූ බෑන් කී මූන් මහතා සමග ඒකාබද්ධ ප්‍රකාශයට සහභාගී වුණා. ඔහු ශ්‍රී ලංකාවේ සංචාරය කළා. මම තමයි විදේශ කටයුතු ඇමති. මම ශ්‍රී ලංකා රජය වෙනුවෙන් ඒකාබද්ධ ප්‍රකාශයට අත්සන් කළා. එහිදී දේශීය ක්‍රියාවලියක් අනුව ප්‍රතිසංධාන ප්‍රයත්නයන් හා වගවීම යන කරුණු වලට එළැඹීම අපි හඳුනා ගත්තා. අපි හදපු ප්‍රකාශනයට එය වැදගත්. එය ඒකාබද්ධ ප්‍රකාශනයක් වගේම ඒ තමා අපි එක්සත් ජාතීන්ගේ සංවිධානය හා එළැඹුණු අවබෝධය. පසුකාලීන දියුණුවට, ජිනීවා ඉඳලා හා පසුගිය අවුරුදු 10 ක ඉඳලා මේ වෙනකල්ම පදනම එයයි. මේ ගැන සාකච්ඡා කළා. සමහර අවස්ථාවලදී වාද කළා. ඒ හා සමානව විවිධ මට්ටම්වල එය අනුගමනය කළා. යුද ගැටුමෙන් පැන නැහෙන ගැටලුවල ජාත්‍යන්තර මානයක් පිළිබඳ සිය සැලකිරීම් ඉදිරිපත් කරමින් මෙය ශ්‍රී ලංකාව තුළ හොල්මන් කරන කාරණයක් බව බෝගොල්ලාගම මහතා අදහස් කළේය. එල්.ටී.ටී.ඊ. සංවිධානය අන්තර්ජාතික පිළිගැනීම අත්කර ගත් ආකාරයට මෙය ආදේශ කරගත හැකි බව ඔහු පැවසීය.

ශ්‍රී ලංකා රජය (රාජ්‍ය පාර්ශවය) හා එල්.ටී.ටී.ඊ. සංවිධානය (රාජ්‍ය නොවන පාර්ශවය) අතර 2002 දී අත්සන් තැබූ සටන් විරාම ගිවිසුමට ඔහු කොමිෂන් සභාවේ අවධානය යොමු කරවීය. එතෙක් ශ්‍රී ලංකා රජය එල්.ටී.ටී.ඊ. සංවිධානයට එරෙහිව ඔවුන් ත්‍රස්ත කණ්ඩායමක්/ ත්‍රස්තවාදී සංවිධානයක් යන මතය පදනම්ව සටන් වැදුණු අතර 1997 සිට ඉන්දියාව, එක්සත් රාජධානිය වැනි රටවල් ගණනාවක් එල්.ටී.ටී.ඊ. සංවිධානය තහනම් කිරීම ආරම්භ කළ බව ඔහු පැවසීය. ඉන් අනතුරුව යුරෝපා සංගමයත් එල්.ටී.ටී.ඊ. සංවිධානය තහනම් කළ බව ඔහු පැවසීය.

ලෝකයේ බොහෝ රටවල් වලින් තහනම් කරනු ලැබූ ත්‍රස්ත කණ්ඩායමක් වුවත් 2002 සටන් විරාම ගිවිසුමෙන් පසුව ජාත්‍යන්තර ප්‍රජාවේ දෘෂ්ටියට අනුව ශ්‍රී ලංකා රජය හා එල්.ටී.ටී.ඊ. සංවිධානය සමසේ සැලකූ බව ඔහු පැවසීය.

"රාජ්‍ය පාර්ශවයක් සහ රාජ්‍ය නොවන පාර්ශවයක්, ත්‍රස්තවාදී සංවිධානයක් එකිනෙකාට සමානව සලකන ලදී."

ශ්‍රී ලංකා රජය හා එල්.ටී.ටී.ඊ. සංවිධානය සමානාත්මතාවයෙන් සැලකීමට හේතුව කුමක්දැයි කොමිෂන් සභාවේ සභාපති විමසූ කළ බෝගොල්ලාගම මහතා පැවසුවේ 2002 සටන් විරාම ගිවිසුම මඟින් දෙපාර්ශවයම සමාන සේ හඳුනාගත් අතර මුළු උතුරු පළාතේම හා මුළු නැගෙනහිර පළාතේම භෞතික පාලනය එල්.ටී.ටී.ඊ. සංවිධානය වෙත පැවරුණු බවයි.

තවද, මේ ප්‍රදේශවල හමුදා කඳවුරු පිහිටා තිබුණත් මුර සංචාරය කිරීමේ බලතල පැවරී තිබුණේ එල්.ටී.ටී.ඊ.ය වෙත හෙයින් එල්.ටී.ටී.ඊ.ය විසින් ලබා දී ඇති පැහැදිලි අවසරයකින් තොරව ශ්‍රී ලංකා හමුදාවට කිසිදු ආයුධයක් එල්.ටී.ටී.ඊ.ය පාලනය කළ ප්‍රදේශයට රැගෙන යා නොහැකි බවට නියමයක් සටන් විරාම ගිවිසුමේ අන්තර්ගත වූ බව ඔහු පැවසීය. ශ්‍රී ලංකා හමුදාවන් කඳවුරු වලට සීමාවූ බව ඔහු පැහැදිළි කළේය.

ශ්‍රී ලංකා රජයේ ක්‍රියාකාරකම් සහ එල්.ටී.ටී.ඊ. සංවිධානයේ මෙහෙයුම් පාලනය කිරීමේ කමිටුව ශ්‍රී ලංකා සටන් විරාම නිරීක්ෂණ කමිටුව (SLMM) වූ බව ඔහු සැල කළේය. සටන් විරාම ගිවිසුම ක්‍රියාත්මක වූ සමයේදී එල්.ටී.ටී.ඊ. සාමාජිකයන්ට ශ්‍රී ලංකාවට පැමිණීමේදී කටුනායක ගුවන් තොටුපළ භාවිතා කිරීමට හා කිළිනොච්චිය දක්වා මාර්ගය හරහා ආරක්ෂිතව ගමන් කිරීමට නිදහස පැවතිනි.

"රජයක් ලෙස උතුරු නැගෙනහිර සම්බන්ධයෙන් අපේ අධිකරණ බලය බොහෝ දුරට සීමා වී තිබුණා."

නැගෙනහිර මුදවා ගැනීම

2006 වසර අවසන් වන විට හෝ 2007 වසර ආරම්භ වන විට නැගෙනහිර පළාත මුළුමනින්ම මුදා ගැනීමට එවකට රජයට හැකි වූ බව ඔහු ප්‍රකාශ කළේය. 2006 අගෝස්තු 04 වැනි දින මුතූර් ප්‍රදේශයේ සිදු වූ ACF සංවිධානය හා සම්බන්ධ සිද්ධිය ඉතා වැදගත් වන්නේ මේ නිසා බව ඔහු වැඩිදුරටත් ප්‍රකාශ කළේය.

එල්.ටී.ටී.ඊ. සංවිධානය විසින් මාවිල්ආරුවේ වාන් දොරටු අවහිර කිරීමත් සමග ශ්‍රී ලංකා හමුදාව සිවිල් වැසියන් මුදා ගැනීම සඳහා එම ප්‍රදේශයට පැමිණි බව බෝගොල්ලාගම මහතා ප්‍රකාශ කළේය. එය දරුස්මාන් වාර්තාවෙන්ද හඳුනාගෙන ඇති බව ඔහු අවධාරණය කළේය.

සටන් විරාම ගිවිසුමේ ප්‍රතිඵලයක් ලෙස 2007 වසර ආරම්භය දක්වා නැගෙනහිර පළාතේ සම්පූර්ණ පාලනය එල්.ටී.ටී.ඊ.යට හිමි වූ බව ඔහු අවධාරණය කළේය.

ශ්‍රී ලංකා රජය නැගෙනහිර පාලනය යළි ලබා ගත්තේ කෙසේදැයි කොමිෂන් සභාව විසින් යොමු කළ ප්‍රශ්නයට බෝගොල්ලාගම මහතා මෙසේ ඉදිරිපත් කළේය.

"2005 වසරේ ජනාධිපති රාජපක්ෂගේ රජය බලයට පත්වූ විට අපට සටන් විරාම ගිවිසුමකට ගරු කිරීමට හා පිළිගැනීමට සිදුවිය".

ජනාධිපති රාජපක්ෂ රජයට පසු පත්වූ රජයට සටන් විරාම නිරීක්ෂණ කමිටුව විසින් අධීක්ෂණය කරන ලද ගිවිසුමේ ද්විපාර්ශවික කොන්දේසිවලට ගරු කිරීමට සිදු වූ බව ඔහු ප්‍රකාශ කළේය. මේ හරහා රජය ජාත්‍යන්තර ප්‍රජාව අතටම පත් වූ බව ඔහු ප්‍රකාශ කළේය.

"ජාත්‍යන්තර ප්‍රජාව විසින් අපව අධීක්ෂණය කරමින්, අපව නිරීක්ෂණය කරමින්, උල්ලංඝනය කිරීම් වාර්තා කරමින් සිටියේය. අප ස්වෛරී රාජ්‍යයක් ලෙස හැඳින්වුවද අපව අධීක්ෂණයට යටත් විය."

2006 වසරේ අවසානය වන විට ශ්‍රී ලංකා හමුදාව මාවිල්ආරු හරහා නැගෙනහිර පළාතට පිවිසීම ආරම්භ කළ බව ඔහු පැවසීය. එල්.ටී.ටී.ඊ. සංවිධානය විසින් වගාවට ජලය භාවිතා නොකිරීමට වාන් දොරටු අවහිර කරද්දී ශ්‍රී ලංකා හමුදාව එල්.ටී.ටී.ඊ.යට නිවැරදිව මුහුණ දී මාවිල්ආරුව දෙසට ගමන් කරමින් එම ප්‍රදේශය කොටි ග්‍රහණයෙන් මුදා ගැනීමට කටයුතු කළ බව ඔහු ප්‍රකාශ කළේය.

ජිනීවාහි පැවති පළමු වටයේ සාකච්ඡා අවසන් වන විටත් රටේ අනාගත ස්ථාවරත්වය සම්බන්ධයෙන් කිසිදු සාර්ථක සාකච්ඡාවකට එළැඹීමට රජයට නොහැකි වූ බව ඔහු පැවසීය. එල්.ටී.ටී.ඊ. දූත පිරිස ඉදිරියේ ළමුන් එල්.ටී.ටී.ඊ. සොල්දාදුවන් ලෙස බඳවා ගැනීම පිළිබඳ ප්‍රශ්නය තමා මතු කළ විට, ළමා සොල්දාදුවන් බලහත්කාරයෙන් බඳවා ගැනීම නැවැත්වීමේ අවශ්‍යතාවය එල්.ටී.ටී.ඊ. දූත පිරිස හඳුනාගත් බවද ඔහු සඳහන් කළේය. බලහත්කාරයෙන් ළමා සොල්දාදුවන් බඳවා ගැනීම නැවැත්වීමට එකඟ වීමට යුනිසෙෆ් (UNICEF) හා ජාත්‍යන්තර පීඩනයද හේතු වූ බව ඔහු සඳහන් කළේය. ඉන් ඔබ්බට ජිනීවා නුවර පැවති සාකච්ඡාවලින් සාර්ථක ප්‍රතිඵල නොලැබුණු බව ඔහු අවධාරණය කළේය. එල්.ටී.ටී.ඊ. සංවිධානය බෙදුම්වාදයේ න්‍යාය පත්‍රයකට කැප වී සිටින බවත්, වෙනම රාජ්‍යයක් දිනාගත හැක්කේ ත්‍රස්තවාදයෙන් පමණක් බව ඔවුන් විශ්වාස කරන බවත් ඔහු ප්‍රකාශ කළේය.

බෝගොල්ලාගම මහතා ප්‍රකාශ කළේ මාවිල්ආරු මුදවා ගැනීමෙන් පසු උතුර හා නැගෙනහිර පළාත් අතර එල්.ටී.ටී.ඊ. සාමාජිකයන්ගේ සංචරණය අවහිර වූ බවයි.

"මුලතිව් කලපුවේ සිට පහළට මඩකලපුව දක්වාත්, ඉන් ඔබ්බට අම්පාර දිස්ත්‍රික්කයේ සිංහල ජනාවාස දක්වාත් පාලනය සියතට ගැනීමට හමුදාවට හැකි වූ බැවින් එල්.ටී.ටී.ඊ. සංවිධානයේ කටයුතුවලට හා ආධාරක මාර්ගවලට බලපෑම් එල්ල වූ අතර කරුණා අම්මාන්ගේ පාර්ශවය කැඩී ගොස් ශ්‍රී ලංකා රජයට සහයෝගය දැක්වූහ. මෙය රජයේ ප්‍රයත්නයන් ශක්තිමත් කළ අතර එය දරුස්මාන් වාර්තාවෙන් පිළිගෙන ඇත."

කරුණා පාර්ශවය කැඩී යාම, වාකරේ සහ සාම්පූර් කලාපවලදී එල්.ටී.ටී.ඊ. සංවිධානයට සිදු වූ විශාල හානි මෙන්ම උතුරේ සිට පැමිණි එල්.ටී.ටී.ඊ. සැපයුම් මාර්ග අවහිර වීම නැගෙනහිර පළාත මුදාගැනීමට දායක වූ බවද බෝගොල්ලාගම මහතා සඳහන් කළේය.

මෙහි තීරණාත්මක සාධකය වූයේ ජාත්‍යන්තර ප්‍රජාව මේ සියල්ලේ නිරීක්ෂකයන් වූ බව ඔහු පැවසීය. ඔහු විදේශ අමාත්‍යවරයාව සිටි කාලය තුළ කොළඹ පමණක් නොව ජපානය, ඇමරිකා එක්සත් ජනපදය, නෝර්වේ ඇතුළු ලොව පුරා අනෙකුත් රටවල අගනගරවල නිතිපතා රැස්වීම්වලට සහභාගී වූ බව ඔහු ප්‍රකාශ කළේය. (2007 ජනවාරි 01 – 2010 අප්‍රේල් 20)

ශ්‍රී ලංකාවේ සිදුවන බවට ජාත්‍යන්තර ප්‍රජාවෙන් මෙන්ම රජයේ බුද්ධි සේවාවලින් ඔවුන් තක්සේරු කළ දෑ සම්බන්ධයෙන් තමා ධුරයේ සිටින විට නිරන්තරයෙන් දැනුවත් කිරීම් ලබාගත් බව ඔහු වැඩිදුරටත් ප්‍රකාශ කළේය.

ACF සංවිධානය හා සම්බන්ධ සිද්ධිය

ACF සංවිධානය හා සම්බන්ධ සිද්ධිය සම්බන්ධයෙන් උදලාගම කොමිසම විසින් ගෙන ඇති නිගමනවල අවිනිශ්චිත ස්වභාවය පිළිබඳව බෝගොල්ලාගම මහතා කොමිෂන් සභාවේ අවධානය යොමු කළේය.

ACF සිද්ධිය සම්බන්ධයෙන් උදලාගම කොමිෂන් සභාව ගත් නිගමන විවෘතව පවතින බව ඔහු ප්‍රකාශ කළේය. එසේ වුවද, වාර්තාවේ සඳහන් නිගමන තුනෙන් ශ්‍රී ලංකා හමුදාවට කිසියම් වරදක් පැටවීමේ හැකියාව මුළුමනින්ම බැහැර කරන බව ඔහු අවධාරණය කළේය.

උදලාගම වාර්තාවේ 112 – 114 දක්වා පිටුවල අඩංගු නිගමන උපුටා දක්වමින් බෝගොල්ලාගම මහතා සිද්ධියට සම්බන්ධ විය හැකි අපරාධකරුවන් සම්බන්ධයෙන් පහත සඳහන් කැපී පෙනෙන කරුණු සලකුණු කළේය.

1. එක් අවස්ථාවක් පෙන්වා දුන්නේ එල්.ටී.ටී.ඊ. සංවිධානය අපරාධයට වගකිවයුතු බවයි.
2. ත්‍රිවිධ හමුදාවට වරද පැටවීමට එල්.ටී.ටී.ඊ.ය මෙම ප්‍රහාරය එල්ල කළ බවට ඇති හැකියාව.
3. එල්.ටී.ටී.ඊ. සංවිධානය විසින් මුස්ලිම්වරුන් ඝාතනය කිරීම හේතුවෙන් වර්ධනය වූ වෛරය - ජහන්ජී, සාරුක් සහ කාදර් අපරාධයක කුමන්ත්‍රණකරුවන් ලෙස පෙනී යා හැකි බවට නිගමනය.

උදලාගම කොමිෂන් සභාව, ACF සිද්ධිය සම්බන්ධයෙන් වැඩිදුර පරීක්ෂණ නිර්දේශ කළ බව බෝගොල්ලාගම මහතා ප්‍රකාශ කළේය.

නව විමර්ශනයක් සිදුකරන අවස්ථාවක සොයා බැලුවහොත් ඉදිරිය දැකිය හැකි නව මානයන් තිබිය හැකි බව ඔහු සැල කළේය. එමෙන්ම මෙම විමර්ශනයන් සිදු කරන ලද්දේ නැගෙනහිර යුද්ධයේ උච්චතම අවස්ථාවක දී වන අතර එහෙයින් සාක්ෂිකරුවන්ට ප්‍රකාශ ලබාදීමට නිදහසක් නොපැවති අතර අනෙක් අතට ඔවුන් පීඩනයට ලක්ව සිටියා විය හැකිය. ACF යනු ජාත්‍යන්තරව පිටුබලය ලබන රාජ්‍ය නොවන සංවිධානයක් වන හෙයින් ACF සිද්ධිය සිය ධුර කාලයේදී මතු කළ ප්‍රධාන කරුණුවලින් එකක් වූ බව ඔහු ප්‍රකාශ කළේය.

දරුස්මාන් වාර්තාව

2010 වසරේදී පත්කළ දරුස්මාන් මණ්ඩලය පිහිටුවූයේ මහ ලේකම්වරයාට උපදෙස් දීම සඳහා බව ඔහු අවධාරණය කළේය.

ඔහු දරුස්මාන් මණ්ඩලයේ සොයා ගැනීම් විවේචනය කළ අතර ශ්‍රී ලංකාවේ සිදු කළ අන්තර්ජාතික ධූත මෙහෙවරවල මාර්ග හරහා සන්නිවේදනය කළ කරුණුවල සත්‍යතාව පිළිබඳ ඔවුන් නිශ්චය නොකළ බවත්, මානුෂීය අවශ්‍යතා සම්බන්ධයෙන් සිදුකළ උල්ලංඝනයන් පිළිබඳ නිගමනයන්ට එළැඹීමට පෙර රජයේ දෘෂ්ටිකෝණය සැලකිල්ලට නොගත් බවත් ඔහු ප්‍රකාශ කළේය.

"ඒ ඒ රටවල දේශීය බලකිරීම් වලට අනුකූලව වැඩ වශයෙන් ක්‍රියා කරන, ශ්‍රී ලංකාවට පක්ෂපාතී නොවන විදේශීය දූත මණ්ඩල සහ ශ්‍රී ලංකා මූලාශ්‍ර අතර කේන්ද්‍රීකරණ නාලිකා ක්‍රියාත්මක වූ ආකාරය මම පුද්ගලිකව දැන සිටියෙමි".

දරුස්මාන් වාර්තාවේ අන්තර්ගත තොරතුරුවල නිරවද්‍යතාවය යනු විවාදයට ලක් කළ යුතු කරුණක් බව ඔහු තරයේ කියා සිටියේය.

දරුස්මාන් වාර්තාව සම්බන්ධයෙන් වැඩිදුරටත් අදහස් දක්වමින් බෝගොල්ලගම මහතා පවසා සිටියේ ජාත්‍යන්තර ක්‍රියාමාර්ග අනුව එක්සත් ජාතීන්ගේ ආයතනයකට ලැබෙන පිළිගැනීම එම මණ්ඩලයට ලැබුණු බවයි. සිවිල් වැසියන්ගේ ජීවිත හානි, රෝහල්වලට බෝම්බ හෙළීම්, දරුවන්ගේ ජීවිත අහිමිවීම ආදී ගැටලු හා චින්දිතයන්ගේ සුබසිද්ධිය පිළිබඳ සොයා බලන ආයතනයක් ලෙස එක්සත් ජාතීන්ගේ සංවිධානය ශ්‍රී ලංකා රජය අභිබවා පැමිණි බව ඔහු ප්‍රකාශ කළේය. මෙම තොරතුරු රැස් කිරීමේදී කෙදිනකවත් එම කරුණුවල සත්‍යතාවය අදාළ පාර්ශව හා සාකච්ඡා කොට නිශ්චය කර නොගත් බව හෙතෙම පැවසීය.

"මණ්ඩලයේ කාර්යභාරයට රජය පිළිගැනීමක් ලබා දුන්නේ නැත. එය සම්පූර්ණයෙන්ම එක්සත් ජාතීන්ගේ ක්‍රමවේදයේ සහ UNSG කාර්යාලයේ ඒකපාර්ශවික තීරණයක් විය. ස්වෛරී රාජ්‍යයක් ලෙස ශ්‍රී ලංකාවට පැමිණීමට ඔවුන් කළ ඉල්ලීම ප්‍රතික්ෂේප විය. රජයේ අනුමැතියකින් තොරව සංස්ථාපිත වූ ඒකපාර්ශවික මණ්ඩල කීපයක් විය. ප්‍රබල ඩයස්පෝරා බලපෑම හා එල්.ටී.ටී.ඊ. සංවිධානයේ ක්‍රියාකාරී සැලසුම් අනුව ඔවුනට හුදෙක් ඇසෙන දේ මතම තීරණ ගැනීමට උත්සාහ කිරීමේදී ඔවුන් කම්ටුව වෙත පැවරුණු බලය ඉක්මවා යමින් සිටියහ."

හුදෙක් ජාත්‍යන්තර ප්‍රජාව තෘප්තිමත් කරනු වස් එවැනි කටයුතුවලට උපකාර කිරීමෙන් ජාතික අවශ්‍යතා බිලි නොදීමට එවකට පැවති රජය වගබලා ගත් බව ඔහු පැවසීය.

"පීඩනය සපුරාලිය යුතු නමුත් එය ලොව බොහෝ රටවල සිදුකර ඇති පරිදි යම් යම් කොන්දේසි යටතේ සිදුවිය යුතුය. යම් යම් කණ්ඩායම් හරහා ජාත්‍යන්තර කටයුතුවලට බලපෑම් ඇති කිරීමට ඔවුනට අවශ්‍ය නමුත් සමහර රටවලට බල කිරීමට ඔවුනට නොහැකිය. අප පමණක් නොව ත්‍රස්තවාදයට එරෙහිව සටන් කරන බොහොමයක් රටවල් මානුෂීය පැත්ත, මානව අයිතිවාසිකම් සාධක ආදී වෙනත් විවිධ මානයන් යටතෙහි ලා ගැනෙන අතර තොරතුරු දැන ගැනීමේ අයිතිය වැනි ඇතැම් නිදහසයන් යටපත් වීමට ලක්වේ".

ජාතික අවශ්‍යතා ඉදිරියේ ජාත්‍යන්තර ප්‍රජාව සමග වන සබඳතා සමව තබා ගැනීමට රජයට සිදු වූ බව ඔහු නැවත නැවතත් පැවසීය. ජාත්‍යන්තර ප්‍රජාව විසින් එල්ල කළ පීඩනය ඉදිරියේ සිය ජාතික අවශ්‍යතා සමබරව තබා ගැනීමට ගන්නා ලද උත්සාහයන් පිළිබඳව ශ්‍රී ලංකාව ඇගයීමට ලක් කළ යුතු බව ඔහුගේ අදහස විය.

ඔහු ප්‍රකාශ කළේ ශ්‍රී ලංකාව ජාත්‍යන්තර ප්‍රජාව ජයගත් බවත් 9/11 ප්‍රහාරයෙන් පසු ඇමෙරිකාවේ අනුග්‍රහයෙන් කරළියට පැමිණි ත්‍රස්තවාදයට එරෙහි සටන ශ්‍රී ලංකාව භාරගත් බවත් දරුස්මාන් වාර්තාවම පිළිගන්නා බවයි.

ශ්‍රී ලංකාව වර්තමානයේ ශක්තිමත් තත්ත්වයක සිටින බවත්, ජාත්‍යන්තර ප්‍රජාව පුන පුනා මතු කරන වගවීම වැනි ගැටලු විසඳීමට හැකියාව පවතින බවත් ඔහු නිගමනය කළේය. මෙවැනි කාරණා සම්බන්ධයෙන් නිශ්චිත වාර්තා තබා ගැනීමේ අවශ්‍යතාවය ඔහු අවධාරණය කළේය. ලබා දී ඇති කරුණුවල සත්‍ය අසත්‍යභාවය තහවුරු කර ගැනීමට ශ්‍රී ලංකාවට ශක්තිය ඇති බවට ඔහු ශුභවාදී විය.

දරුස්මාන් මණ්ඩලය ඉදිරියේ ප්‍රකාශ ලබා දුන් සාක්ෂිකරුවන් හෙළි නොකිරීම.

විදේශ රටවල සරණාගතයන් ලෙස ආරක්ෂාව හා පිහිට සොයන බොහොමයක් දෙනා ඔවුන්ගේ ඒකායන අරමුණ ශ්‍රී ලංකාවෙන් පිටවීම හේතුවෙන් පරීක්ෂණ කොමිෂන් සභා වෙත සභාය වීමට මැලිවන බව ඔහු කොමිෂන් සභාවේ අවධානයට ලක් කළේය.

කැන්බෙරා නගරයේදී පැවති සමුළුවකදී තමා සරණාගතයෙකු යැයි පවසන පුද්ගලයෙකු හමු වී ලද පෞද්ගලික අත්දැකීමක් ඉන්පසු බෝගොල්ලාගම මහතා අනාවරණය කළේය. සිය පවුලේ සාමාජිකයින් එකළොස් දෙනෙකු ඝාතනයට ලක් වූ බවත් තමුන් පමණක් දිවි බේරා ගැනීමට සමත් වූ බවත් එම පුද්ගලයා පැවසූ බව බෝගොල්ලාගම මහතා සඳහන් කළේය. ඉන්පසු ඒ පිළිබඳ පරීක්ෂණයක් ප්‍රාදේශීය ලේකම් කාර්යාලය හරහා සිදු කිරීම සඳහා ඔහුගෙන් පවුලේ සාමාජිකයින්ගේ නම් විමසා ඇත. කෙසේ නමුත් එම පුද්ගලයා නම් ලබා දීමට අපොහොසත් වී ඇත. එම පුද්ගලයා ඕස්ට්‍රේලියාවේ සරණාගතභාවය ලබා ගැනීමේ අරමුණින් පමණක් පෙනී සිටි බව බෝගොල්ලාගම මහතා ප්‍රකාශ කළේය.

බ්‍රිතාන්‍ය නීතිඥ ශ්‍රීමත් ඩෙස්මන්ඩ් ද සිල්වාගේ වාර්තාව

ශ්‍රීමත් ඩෙස්මන්ඩ් ද සිල්වාගේ වාර්තාව පිළිබඳ කොමිෂන් සභාව විසින් නගන ලද ප්‍රශ්නයක දී බෝගොල්ලාගම මහතා ප්‍රකාශ කර සිටියේ එම බ්‍රිතාන්‍ය නීතිඥවරයා දරුස්මාන් වාර්තාවේ සොයාගැනීම් පිළිබඳ එහි දැක්වෙන ඇතැම් කරුණු හෙළා දකිමින් සවිස්තරාත්මක වාර්තාවක් ලබා දුන් බවයි. තව ද, එම වාර්තාව සිය ධූර කාලයේ දී ඉදිරිපත් නොකළ බවත් ශ්‍රීමත් ඩෙස්මන්ඩ් ද සිල්වා ඔහු හා සාකච්ඡා කළ බවත් ඔහු පැවසීය. එම වාර්තාව පසුගිය රජය පැවති සමයේ දී පළ වූ බව හෙතෙම පැවසීය.

"2015 සිට බලයේ සිටි පසුගිය රජය සමග ඩෙස්මන්ඩ් ද සිල්වාගේ මතවාදයන් ඔවුනට ද ඉදිරිපත් කළ නමුත් මම දන්නේ නෑ ඒවා කොයිතරම් දුරට සම්මත වුණා ද කියලා."

චන්දිමා වික්‍රමසිංහ මහත්මිය

ජනාධිපති අතිරේක ලේකම්

867. උගත් පාඩම් හා ප්‍රතිසන්ධාන කොමිෂන් සභාවේ නිර්දේශයන් ක්‍රියාත්මක කිරීම සඳහා නිරීක්ෂණ කමිටුවක් පත් කිරීම සඳහා 2012 මැයි මාසයේ දී අමාත්‍ය මණ්ඩල අනුමැතිය හිමි විය.

එවකට සිටි ජනාධිපති ලේකම්වරයා කොමිෂන් සභාවේ ප්‍රධානියා ලෙස කටයුතු කළ අතර සාක්ෂිකරු ඇතුලු පිරිසක් එම කොමිෂන් සභාවේ අනියම් ලෙස කටයුතු කරමින් සිටියහ. කොමිෂන් සභාව විසින් රාමුවක් සකස් කරන ලදී, ආරම්භයේ දී වාර්තාවේ නිර්දේශ 91 ක් විය. එම නිර්දේශ තේමාත්මක අංශ පහකට කාණ්ඩගත කර ඇත.

1. ජාත්‍යන්තර මානුෂීය නීති ගැටලු
2. මානව හිමිකම් ගැටලු
3. ඉඩම් හා නැවත පදිංචි කිරීමේ ගැටලු
4. හානිපූරණය
5. සංහිදියාව

හිටපු නීතිපතිවරයා, අධිකරණ අමාත්‍යාංශයේ ලේකම්වරයා සහ ධාරා විජේතිලක මහත්මිය වැනි රජයේ නිලධාරින් ගණනාවක් නිරීක්ෂණ කමිටුවට සහභාගී වූ බව සාක්ෂිකාරිය වැඩිදුරටත් පැවසීය. නිර්දේශ 91ක් තේමාත්මක අංශ පහක් යටතේ කාණ්ඩගත කර ඇත. *උගත් පාඩම්* හා ප්‍රතිසන්ධාන කොමිෂන් සභාවේ නිර්දේශ නිරීක්ෂණය කිරීමේ ක්‍රියාකාරී සැලැස්ම ඊට වසරකට

පසු අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කෙරිණි. 2013 ජූලි මාසයේදී එය ඉදිරිපත් කොට අනුමැතිය ලබා ගන්නා ලද අතර ඊට තවත් නිර්දේශ පනස් තුනක් එකතු කිරීමෙන් මුළු නිර්දේශ සංඛ්‍යාව 144ක් විය. නිර්දේශ 144ක් අන්තර්ගත ඒකාබද්ධ ජාතික ක්‍රියාකාරී සැලැස්මක් සාක්ෂිකරුවන් කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කළහ. අවසන් යාවත්කාලීන ක්‍රියාකාරී සැලැස්ම 2015 සැප්තැම්බර් මස වන විට සකස් කරන ලදී. ඉන් අනතුරුව එය ක්‍රියාත්මක වන බවට වාර්තා වී නොමැති බව **සාක්ෂිකාරිය** ප්‍රකාශ කළාය. එම නිර්දේශ ක්‍රියාත්මක කිරීමේ වගකීම රේඛීය අමාත්‍යාංශ හා නියෝජිතායතන විසි හයකට පමණ පැවරිණි.

මානව හිමිකම් සහ සංහිඳියාව පිළිබඳ වූ නිර්දේශ ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය තවත් අමාත්‍යාංශ සහ නියෝජිතායතන තිබූ අතර අමාත්‍යාංශ අතර සහසම්බන්ධනය මත සාමූහිකව ක්‍රියා කිරීමට අපහසු වීම නිසා මෙය දුෂ්කර කාර්යයක් බවට පත්විය. 2013 වසරට පමණක් අයවැය නියමිත වූ බැවින් 2012 වසරේ එම නිර්දේශ ක්‍රියාත්මක කිරීමට අයවැයක් වෙන් කර නොතිබීම පිළිබඳව ද සාක්ෂිකාරිය සිය කණගාටුව ප්‍රකාශ කළාය. 2012 සිට 2015 වසර දක්වා නිර්දේශ ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් නියෝජිතායතන වෙත පැවරුණු රාජකාරි කිහිපයක් නිරීක්ෂණ කමිටුව විසින් අධීක්ෂණය කරන ලදී. ජාත්‍යන්තර මානුෂීය නීතිය පිළිබඳ වූ නිර්දේශ ක්‍රියාත්මක කිරීමේ ක්ෂේත්‍රවල ප්‍රගතිය ප්‍රමාද වූ බව ඇය වැඩිදුරටත් පැවසීය. සාකච්ඡාවට බඳුන් වූ සංකේතාත්මක සිද්ධීන් ගැන සාක්ෂිකාරිය සඳහන් කළාය. චැනල් 4 නාලිකාවේ වීඩියෝ පටවලට පාදක වූ යුධ හමුදා අධිකරණය පිළිබඳ ඇය කතා කළාය. එවැනි නඩු බොහොමයකට කාලය අවශ්‍ය වන අතර ඒවා හැකි තරම් ඉක්මනින් අවසන් කිරීමට හැකි වූ ඒවා නොවීය. වාර්තාවේ 9.4 සිට 9.38 දක්වා දැක්වෙන *උගන් පාඩම් හා ප්‍රතිසන්ධාන කොමිෂන් සභාව* විසින් ජාත්‍යන්තර මානුෂීය නීති ගැටළු පිළිබඳ ලබා දී ඇති ප්‍රධාන නිරීක්ෂණ 11 සහ නිර්දේශ පිළිබඳ සාක්ෂිකාරිය සඳහන් කළාය.

සාක්ෂිකාරියට අනුව මානව හිමිකම් නීතිය පිළිබඳ නිර්දේශ 51කි. ඉඩම් හා සම්බන්ධ කාරණා පිළිබඳ නිර්දේශ 24ක් වූ අතර සංහිඳියාව පිළිබඳ නිර්දේශ 50ක් විය. එම නිරීක්ෂණ කටයුතු 2015 දී පැවති රජය වෙනස් වන තෙක් ම ක්‍රියාත්මක විය. 2015න් පසු නිරීක්ෂණ යාන්ත්‍රණයේ පැහැදිළි අඛණ්ඩ පැවැත්මක් නොවූ බව ඇය තවදුරටත් පැවසීය.

සාක්ෂිකාරියට අනුව වෙනත් යාන්ත්‍රණ මඟින් මෙම නිරීක්ෂණ යාන්ත්‍රණය භාර ගෙන ඇති අතර, *උගන් පාඩම් හා ප්‍රතිසන්ධාන කොමිෂන් සභාවේ* ඍජු අනුප්‍රාප්තියක් වූ **මැක්ස්වෙල් පරණගම මහතාගේ ප්‍රධානත්වයෙන් ක්‍රියාත්මක වූ අතුරුදන් වූ තැනැත්තන් පිළිබඳ කොමිෂන් සභාව** පිළිබඳ මෙහිදී ඇය විශේෂයෙන් සඳහන් කළාය.

ධාරා විජයතිලක

හානිපූරණ කාර්යාලයේ සභාපති

868. 2018 අංක 34 දරන හානිපූරණය සඳහා වන කාර්යාලය පනත මඟින් ස්ථාපිත හානිපූරණ කාර්යාලයේ වර්තමාන සභාපතිත්වය ධාරා විජයතිලක මහත්මිය දරයි. මෙම නීති පද්ධතිය 2018 ඔක්තෝම්බර් 22 වන දින සිට බලාත්මක විය. ඇයගේ හානිපූරණ කාර්යාලය වෙත පැවරුණු එක් ප්‍රධාන කාර්යයක් වන්නේ පීඩාවට පත් තැනැත්තන්ට වන්දි ලබා දීම බව ඇය සඳහන් කළාය. පීඩාවට පත් තැනැත්තන් යන්නෙහි අර්ථය ස්වභාවයෙන්ම පුළුල් වන අතර ඉන් උතුරු සහ නැගෙනහිර පළාත්වල ඇති වූ සන්නද්ධ ගැටුම හෝ එහි පසුවිපාක ආවරණය කරයි. 2018 අංක 34 දරන හානිපූරණය සඳහා වන කාර්යාලය පනතේ 27 වන වගන්තියෙන් පීඩාවට පත් තැනැත්තන් යන්න මෙසේ අර්ථ නිරූපණය කරයි;

පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුව හොත් මිස, මෙම පනතෙහි, -

"පීඩාවට පත් තැනැත්තන්" යන්නෙන්-

(අ)

i. උතුරු හා නැගෙනහිර පළාත්වල සිදු වූ සන්නද්ධ ගැටුම් අතරතුර එහි ප්‍රතිඵලයක් වශයෙන්, හෝ ඊට සම්බන්ධව හෝ එහි පසුවිපාකයක් ලෙස, හෝ

ii. දේශපාලන නොසන්සුන්තාවයක් හෝ සිවිල් කැළඹීම හේතුවෙන්, හෝ

iii. ශ්‍රී ලංකාවේ පුද්ගලයන්ට, කණ්ඩායම්වලට හෝ ජන කොට්ඨාසවලට වූ හානිය දීර්ඝ සහ බරපතල ස්වභාවයේ හානියක් වීම හේතුවෙන්, හෝ

iv. 2018 අංක 5 දරන, බලහත්කාරයෙන් අතුරුදහන් කිරීම් වලින් සියලු තැනැත්තන් ආරක්ෂා කිරීම සඳහා වූ ජාත්‍යාන්තර සම්මුති පනතේ නිර්වචනය කර ඇති පරිදි වූ බලහත්කාරයෙන් අතුරුදහන් වීමක් හේතුවෙන්, ජීවිතය අහිමි වීම හෝ ඔවුන්ට හෝ ඔවුන්ගේ දේපළවලට හෝ හානි වීම හේතුවෙන් පීඩාවට පත් වූ තැනැත්තන්,

(ආ) (අ) ඡේදයේ අවස්ථානුගත කරුණුවල සඳහන් මිය ගිය තැනැත්තකුගේ හෝ අතුරුදහන් වූ තැනැත්තකුගේ ඥාතීන් අදහස් වේ.

හානිපූරණය පිළිබඳ අදහස් දක්වමින් හානිපූරණය යන්නෙන් හුදෙක් වන්දි ගෙවීම පමණක් අදහස් නොවන බව විජයතිලක මහත්මිය සඳහන් කළාය. එය මානව හිමිකම් සහ මානුෂීය මැදිහත්වීම් සන්දර්භය තුළ හානිපූරණය ලෙස සමස්ත පරාසයක භාවිතා කළ හැකි පිළියම් සහ යාන්ත්‍රණයන් දක්වයි. හානිපූරණ සංකල්පය ජාත්‍යාන්තර සම්මතයන්ට අනුකූල වන අතර මානව හිමිකම් බරපතල ලෙස උල්ලංඝනය කිරීම් සහ ජාත්‍යාන්තර මානුෂීය නීතිය බරපතල ලෙස උල්ලංඝනය කිරීම් හා සම්බන්ධ වින්දිතයන්ට හානිපූරණය කිරීමේ අයිතිය, සංක්‍රාන්ති යුක්ති තන්ත්‍රයේ අවශ්‍යතාවයක් බව ඇය වැඩිදුරටත් ප්‍රකාශ කළාය. ඇය සිය ධුරයේ වැඩ භාර ගත් 2019 අප්‍රේල් 01 දින සිට ඇයගේ කාර්යාලය දිවයින පුරා සංචාරය කොට උතුරේ හා දකුණේ වෙසෙන ජනතාව හමු වූ බවත් ඇයගේ මතයට අනුව පළාත් දෙකෙහිම වන ජනතාවගේ අභිලාෂයන් සමාන බවත් ඇය සඳහන් කළාය. ඇය එසේ අභිලාෂයන් ලෙස හඳුනාගත්තේ කුමක් දැයි විස්තර කරමින් උතුරේ හෝ දකුණේ වේවා සැමට සාමය අවශ්‍ය බව විජයතිලක මහත්මිය පැවසීය.

ඔවුන් තනි හා සාමූහික හානිපූරණය හා සම්බන්ධ හානිපූරණ ප්‍රතිපත්ති සහ මාර්ගෝපදේශ සකස් කිරීම පාලන තන්ත්‍රයේ අවශ්‍යතාවයක් වූ හෙයින් මන්නාරම, කිලිනොච්චිය, මුලතිව්, යාපනය, මඩකලපුව, මාතර හා හම්බන්තොට වැනි රටේ දිස්ත්‍රික්ක කිහිපයක ජනතාව සමග හමුවීම් බොහොමයක් පැවැත්වූ බව විජයතිලක මහත්මිය සඳහන් කළාය. ඒ අනුව එම රැස්වීම් සඳහා විශාල සංඛ්‍යාවක් සහභාගී වී ඇති අතර ඊට රජයේ ආරක්ෂක හමුදා, පොලිසිවල සාමාජිකයන් හා ඔවුන්ගේ පවුල් ඇතුළු පනතේ 7 වන වගන්තිය යටතේ හඳුනා ගැනෙන තත්ත්වයන් යටතේ පීඩාවට පත්ව සිටින බවට කියන එම ප්‍රදේශවල පදිංචිකරුවන් ඇතුළත් විය. ඔවුන්ගේ ප්‍රධානතම ඉල්ලීම වූයේ සිය ජීවිත යළි ගොඩනැඟීමට සහ යථා තත්ත්වයට පත් කිරීමට සමාජ ආර්ථික සහය ලබා දීමයි.

මහජන හමුවීම්වලට සහභාගී වීමට ආරාධනය ලැබූ පීඩාවට පත් වූ තැනැත්තන්ගේ කාණ්ඩ පහත පරිදි වේ.

- අතුරුදන් වූ තැනැත්තන්ගේ මව්වරු හා බිරින්දෑවරුන්, ගෘහමූලිකත්වය දැරූ කාන්තාවන් ද ඇතුළුව
- ගැටුමකදී, සිවිල් කැළඹීම් හෝ දේශපාලන නොසන්සුන්තාවයක දී සිය ස්වාමිපුරුෂයන් මිය ගිය කාන්තාවන්
- අභ්‍යන්තරව අවතැන් වූ සහ / හෝ නැවත පදිංචි වූ තැනැත්තන්

- ආබාධ සහිත තැනැත්තන්
- ගැටුම්, සිවිල් කැළඹීම් හෝ දේශපාලන නොසන්සුන්තාවයක දී තුවාල ලැබූ තැනැත්තන්
- ගැටුමේ දී, සිවිල් කැළඹීම්වල දී හෝ දේශපාලන නොසන්සුන්තාවයක දී මිය ගිය තැනැත්තන්ගේ පවුල්වල සාමාජිකයන්
- රජයේ සන්නද්ධ හමුදාවල හෝ පොලීසියේ විශ්‍රාමලත් හෝ ආබාධිත සාමාජිකයන් සහ ඔවුන්ගේ පවුල්
- රජයේ සන්නද්ධ හමුදාවල හෝ පොලීසියේ මිය ගිය හෝ අතුරුදන් වූ සාමාජිකයන්ගේ පවුල්
- පුනරුත්ථාපනය කර සාමාජානුගත කළ හිටපු එල්.ටී.ටී.ඊ. සාමාජිකයන්
- ඉන්දියාවේ සිට නැවත පැමිණ සිටින සරණාගතයන්
- ගැටුම්, සිවිල් කැළඹීම් හෝ දේශපාලන නොසන්සුන්තාවයක බලපෑම හේතුවෙන් මානසිකව බලපෑමට ලක්ව ඇති තැනැත්තන්
- ගැටුම්, සිවිල් කැළඹීම් හෝ දේශපාලන නොසන්සුන්තාවයක දී දේපළ (වංචල හා නිශ්චල) අහිමි වූ තැනැත්තන්

හානිපූරණ කාර්යාලය සිවිල් සමාජ සංවිධාන සහ ප්‍රවිචාරණ කාර්ය සාධන බලකාය නැමැති කාර්ය සාධන බලකාය සමග සම්බන්ධතා පැවතිණි.

පීඩාවට පත් වූ තැනැත්තන්ට සිය ජීවිත යළි ගොඩනැඟීමට සහ යථා තත්ත්වයට පත් කිරීමට සහ එමඟින් ඔවුන්ගේ යහපැවැත්ම ඉදිරියට ගෙන යාමට සහ අනාගත පරම්පරාව ද ඇතුළු සෑම ශ්‍රී ලාංකිකයෙකුගේම ආරක්ෂාව සඳහා කවර සහන පියවර හා සහයෝගයක් රජය විසින් සැපයිය යුතුද යන්න සැළකීමේදී විජයතිලක මහත්මිය විසින් හානිපූරණ කාර්යාලය මඟින් සම්පාදනය කළ පහත දැක්වෙන මැදිහත් වීමේ තේමාත්මක ක්ෂේත්‍ර අට ඇතුළත් ප්‍රතිපත්ති පිළිබඳ සඳහන් කළාය.

1. ජීවනෝපාය ආධාර
2. වන්දි හා ජීවනෝපාය ආධාර
3. ඉඩම් අයිතිය නැවත ලබා දීම
4. නිවාස ලබා දීම
5. ප්‍රජා යටිතල පහසුකම් සංවර්ධනය
6. පරිපාලන සහන
7. මනෝ-සමාජ ආධාර
8. සමඟිය, සංහිඳියාව ඉදිරියට ගෙන යාමට සහ ප්‍රචණ්ඩත්වය නැවත ඇති නොවීමට පියවර

තනි හා සාමූහික හානිපූරණ ලබා දීම සම්බන්ධයෙන් මාර්ගෝපදේශ 10ක් ද ඇය විසින් දක්වන ලදී, මෙම මාර්ගෝපදේශ, පනතේ 11(1)(උ) වගන්තිය අනුව ලබා දිය යුතු හානිපූරණ තීරණය කරනු ඇත. ඒවා නම්,

1. චින්දිත කේන්ද්‍රීයතාවය
2. හානිපූරණය ලබා ගත හැකි සන්තාපයේ ස්වභාවයට සහ බරපතලකමට අදාළ නිර්ණායකය ඇතුළත්ව හානිපූරණ ලබා ගැනීම සඳහා පීඩාවට පත් තැනැත්තන්ගේ යෝග්‍යතාව මැන බැලීම සඳහා වන නිර්ණායක
3. යෝග්‍ය පීඩාවට පත් තැනැත්තන් වෙත සපයනු ලබන හානිපූරණයන්ගේ ආකාරය සහ උචිත අවස්ථාවන්හි දී ඒවා සපයනු ලබන ප්‍රමාණය
4. මූල්‍ය වන්දි සඳහා පීඩාවට පත් තැනැත්තන්ගේ යෝග්‍යතාවය මැන බැලීම සඳහා වන නිර්ණායකය

5. නොපමාව ලබා දිය යුතු හානිපූරණය සඳහා පීඩාවට පත් තැනැත්තන්ගේ යෝග්‍යතාවය පිළිබඳ නිර්ණායකය
6. පීඩාවට පත් තැනැත්තන්ට විවිධ ආකාරයේ හානිපූරණයන් සැපයීම හෝ භාර දීම සඳහා සහය විය හැකි මණ්ඩලයන්
7. සත්‍යාපනය කරන ලද හානිපූරණ සඳහා වන ඉල්ලීම් සඳහා ප්‍රමුඛතාවය ලබා දීමට පදනම් කර ගත යුතු නිර්ණායක
8. තථ්‍යභාවය සත්‍යාපනය කිරීම සඳහා වන නිර්ණායක
9. මිය ගිය තැනැත්තන් අනුස්මරණය හා ස්මාරක සඳහා වන නිර්ණායක
10. පීඩාවට පත් තැනැත්තන්ගේ විශේෂිත කණ්ඩායම්වල විශේෂ අවශ්‍යතා ආමන්ත්‍රණය කිරීම

හානිපූරණ ප්‍රතිපත්ති හා මාර්ගෝපදේශ - 2021 සඳහා 2021 වසරේ අගෝස්තු මාසයේ දී අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය හිමි වී ඇත. සාරාංශයක් තුළ හානිපූරණ කාර්යාලයේ සභාපතිනිය විසින් එම ප්‍රතිපත්ති වින්දන කේන්ද්‍රීය බවත් එම වින්දන කේන්ද්‍රීය හානිපූරණ ප්‍රතිපත්ති පනතේ 12(1)(ඇ) වගන්තිය ප්‍රකාරව සම්පාදනය කළ යුතු බවත් සඳහන් කළාය. මෙයින් අදහස් වන්නේ පීඩාවට පත් තැනැත්තන්ගේ අවශ්‍යතා අර්ථවත් ලෙස ආමන්ත්‍රණය කරන තනි හා සාමූහික හානිපූරණ ලබා දීමයි. වින්දිතයන්ගේ අවශ්‍යතා වින්දිතයාගෙන් වින්දිතයාට, ප්‍රදේශයෙන් ප්‍රදේශයට සහ අවස්ථාවෙන් අවස්ථාවට අනුව වෙනස් වන හෙයින් නම්‍යශීලී හානිපූරණ යෝජනා ක්‍රම අනුගමනය කරනු ඇතැයි විජයතිලක මහත්මිය හැඟවීය. විජයතිලක මහත්මිය විසින් කොමිෂන් සභාව ඉදිරියේ සිදුකළ නියෝජනයට අනුව එම කාර්යාලය සෘජුවම ජනතාව හමු වී ඔවුන්ගේ අවශ්‍යතා තක්සේරු කිරීමට උත්සාහ දරනු ඇත. රෝහල්, සෞඛ්‍ය සේවා හා පාසල් ආදී ලෙස එම අවශ්‍යතා හඳුනා ගනු ලබන අතර නියමු වැඩසටහනකින් ඇරඹී එම කාර්යය ජුනි මස දී නිම වී ඇත. ජනතාව සවිබල ගැන්වීමට සහ ඔවුන් වෙත දැනුම හුවමාරු කර ගැනීමට අවශ්‍ය බව සාක්ෂිකාරිය හඳුනා ගෙන ඇත. ඔවුන් එය දැනටමත් කාන්තා මූලික කුටුම්බවලින් ආරම්භ කර ඇත. යුක්තිය පසිඳලීමේ අතිරේක වැඩසටහනක් ක්‍රියාත්මක කිරීමට අධිකරණ අමාත්‍යාංශය යෝජනා කර ඇති අතර ඊට හානිපූරණ කාර්යාලය ද සහභාගි වනු ඇත.

1983 ජූලි මාසයේ දී අසන්නට ලැබුණු සිදුවීම් ගැන සඳහන් කරමින් තම පාලනයෙන් තොර සිදුවීම් හේතුවෙන් තුවාල, අලාභ හෝ හානිවලට ලක් වූ පුද්ගලයන්ට වන්දි සහන ලබා දීමේ ප්‍රතිපත්තිය1983 ජූලි කැරැල්ලෙහි ප්‍රතිඵලයක් ලෙස ඇරඹුණු බව විජයතිලක මහත්මිය තරයේ ප්‍රකාශ කර සිටියාය. දේපළ හා කර්මාන්ත පුනරුත්ථාපන අධිකාරිය පිහිටුවීමට පාදක වූ 1983 අංක 01 දරන හදිසි (බලපෑමට ලක් වූ දේපළ, ව්‍යාපාර හෝ කර්මාන්ත පුනරුත්ථාපන) රෙගුලාසි පිළිබඳ විජයතිලක මහත්මිය සඳහන් කළාය. මෙම රෙගුලාසි මඟින් බලපෑමට ලක් වූ දේපළ අලුත්වැඩියා කිරීම සහ ප්‍රතිසංස්කරණය කිරීම සහ බලපෑමට ලක් වූ කර්මාන්ත සහ ව්‍යාපාර පුනරුත්ථාපනය කිරීම අරමුණු කර ඇත.

දීප්ති ළමාහේවා මහතා

අධ්‍යක්ෂ ජනරාල්, ජාතික සමගිය හා ප්‍රතිසන්ධානය සඳහා වන කාර්යාලය

869. දීප්ති ළමාහේවා මහතා 2022 පෙබරවාරි මස පළමු වන දින මෙම කොමිසම හමුවේ සාක්ෂි ලබාදෙන ලදී. පළාත තුළ දිස්ත්‍රික්ක පහම ආවරණය වන පරිදි උතුරු පළාතේ ක්‍රියාත්මක වූ ජංගම සේවාවකට සහභාගී වී ළමාහේවා මහතා ආපසු පැමිණ ඇත. දිවයිනේ සමස්ථ භූමි ප්‍රමාණයම ආවරණය වන අයුරින් ජාතික සමගිය සහ ප්‍රතිසන්ධානය සඳහා වන කාර්යාලය විසින් සිදු කරනු ලබන බරපතල කාර්යභාරය මෙම කොමිසමේ අවධාරණයට ලක්විණි. යාපනයේදී පවත්වනු ලැබූ ජංගම සේවාව පිළිබඳව විශේෂයෙන් සඳහන් කරමින් කොකුවිල් හින්දු විදුහලෙහි සුහුරු පන්ති කාමර 12කින් සමන්විත තෙමහල් පාසල් ගොඩනැගිල්ලක් විවෘත කිරීම පිළිබඳව

ඔහු ප්‍රකාශ කළ අතර කොමිෂන් සභාවට අනුව මෙය ජාතික සමගිය සහ ප්‍රතිසන්ධානය සඳහා වන කාර්යාලය ආරම්භ කරන ලද සාමය සහ සහජීවනයේ අපේක්ෂාව පුරෝකථනය කරනු ලබන අවස්ථාවකි. තෙමහල් පාසල් ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා රජය විසින් ජාතික සමගිය සහ ප්‍රතිසන්ධානය සඳහා වන කාර්යාලය හරහා රුපියල් මිලියන 42ක මුදලක් වියදම් කර ඇති අතර පාසල් සංවර්ධන සමිතිය විසින් සුහුරු පන්ති කාමර සඳහා අවශ්‍ය ගෘහ භාණ්ඩ සහ විද්‍යුත් තිර (Electronic screens) ලබාදුන් බව ඔහු කොමිසමේ අවධානයට යොමු කළේය. ජාතික සමගිය සහ ප්‍රතිසන්ධානය සඳහා වන කාර්යාලයට ව්‍යවස්ථාදායක පිළිගැනීමක් ලබාදිය යුතු බවත්, රටේ සෑම පළාතකටම මේ ආකාරයේ වැඩසටහන් තවත් දියත් කළ යුතු බවත් කොමිෂන් සභාවේ නිර්දේශය වේ.

උතුරේ ජනතාවට ගම් මට්ටමින් ජාතික සමගිය සහ ප්‍රතිසන්ධානය සඳහා වන කාර්යාලය විසින් ලබාදුන් ආර්ථික සංවර්ධන සහාය පිළිබඳව ද ළමාහේවා මහතා ප්‍රකාශ කළේය. ප්‍රදේශයේ ජනතාව විසින් පරිපාලනය සිදු කරන 'කෝප්' යනුවෙන් හඳුන්වන සුපිරි වෙළඳසැල් ඔවුන් ස්ථාපිත කර ඇති බැව් පැවසීය. මෙම ආර්ථික මධ්‍යස්ථානවල විකිණීම පිණිස ප්‍රාදේශීය නිෂ්පාදන තබා ඇති අතර උතුරු පළාතේ ගොවි ප්‍රජාව විසින් නිෂ්පාදනය කරන ගොවි නිෂ්පාදනය බෙදාහැරීමේදී හා විකිණීමේදී මැදිහත්කරුවන් සම්බන්ධ නොවීමෙන් එම ද්‍රව්‍ය විකිණීමෙන් ලබාගත හැකි ආදායම සූරාකෑමට ලක් නොවන බවද ඔහු පැවසීය.

සියලුම රාජ්‍ය විශ්වවිද්‍යාල තුළ සංහිඳියා කාර්යාල 17ක්, ස්ථාපිත කිරීම ජාතික සමගිය සහ ප්‍රතිසන්ධානය සඳහා වන කාර්යාලය විසින් සිදු කරන ලද තවත් වැදගත් කාර්යභාරයකි. විවිධ සමාජ ස්ථරවල සිට පාසල් හා විශ්වවිද්‍යාල වෙත පැමිණෙන සිසුන් ජාතික සංහිඳියාවේ.මුඛ්‍ය ධාරාවේ ඒකාබද්ධ කරනු ලැබුව හොත් පාසල් හා විශ්වවිද්‍යාල අධ්‍යාපනය මගින් සමගිය සහ සංහිඳියාව ඇති කිරීමට හැකි වන බව අවිවාදිත වන අතර සංහිඳියාව සහ ජාතික සමගිය පිළිබඳව විෂය මාලාවක් සංවර්ධනය කිරීමෙහිලා ශාස්ත්‍රාලීයයන් සමූහයක් කටයුතු කරන බව ළමාහේවා මහතාගෙන් දැන ගැනීමට ලැබීම සතුටට කරුණකි. බහුවාර්ගික, බහු ආගමික සහ බහු සංස්කෘතිකමය විවිධත්වයකින් යුතු ප්‍රජාවන් අතර සංහිඳියාව ඇති කිරීමේ අවශ්‍යතාවය, ශ්‍රී ලංකාවේ සමාජීය අනාවරණයේ බහුවාර්ෂික සංරචකයක් බවට පත් වී ඇති අතර විශ්වවිද්‍යාල තුළ සංහිඳියා මධ්‍යස්ථාන ස්ථාපිත කිරීම මගින් මෙම රටේ මූලික අවශ්‍යතාවයන් බවට පත්ව ඇති සමාජීය සහජීවනය සඳහා ප්‍රවේශයක් ඇති කරනු ලබයි. සංහිඳියාව ප්‍රවර්ධනය කරනු පිණිස විශ්වවිද්‍යාල අධ්‍යාපනයට සංහිඳියාව හා සම්බන්ධ විෂයන් ඇතුළත් කරමින් විෂය මාලා සංවර්ධනය කිරීම යන කාරණය මේ රටට ඉතා වැදගත් වේ.

මෙම රටේ ජාතික සංහිඳියාව සඳහා පවතින නෛතික යාන්ත්‍රණය පිළිබඳව සවිස්තරාත්මක පැහැදිලි කිරීමක් ළමාහේවා මහතාගෙන් ලබාගැනීමට කොමිසමට හැකි වූ අතර වර්තමානයේ ජාතික සමගිය සහ ප්‍රතිසන්ධානය සඳහා වන කාර්යාලය සාමය හා සංහිඳියා යාන්ත්‍රණයේ වැදගත් ස්ථම්භයක් ලෙස ක්‍රියා කරමින් පැවතීම විශේෂත්වයකි. ජාතික සමගිය සහ සංහිඳියාව සඳහා වූ කාර්යාලය, අංක 1945/41 හා 2015 දෙසැම්බර් මස 18 දිනැති ගැසට් පත්‍රය මගින් ස්ථාපිතකොට ඇති අතර ආර්ථික, සමාජීය, සංස්කෘතිකමය සහ දේශපාලනමය ක්ෂේත්‍රවල සම අවස්ථාවන් සහිත සමගියෙන් හා සමාදානයෙන් එකමුතුකමින් යුතු සියලු ශ්‍රීලාංකිකයන්ගෙන් සමන්විත බහුවිධතාවයන් සහ ඇතුළත් බවකින් යුතු සමාජයක් ගොඩනැංවීමේ මෙහෙවරක ජාතික සමගිය හා සංහිඳියාව සඳහා වන කාර්යාලය කටයුතු කරන බව මෙම කොමිසමට පෙනී ගොස් ඇත.

පහත සඳහන් තේමාගත ක්ෂේත්‍ර පිළිබඳව මෙම ක්‍රියාකාරී සැලැස්ම මගින් අවධානය යොමු කරනු ලබයි.

1. පාසල් සහ විශ්වවිද්‍යාල අධ්‍යාපනය:අධ්‍යාපන පද්ධතිය තුළ සමගිය සහ සංහිඳියාව ප්‍රධාන ධාරාගත කිරීම; 2022 වන විට ත්‍රෛභාෂා පාසල් 20ක් සහ සියලුම රාජ්‍ය විශ්වවිද්‍යාලවල සංහිඳියා මධ්‍යස්ථාන 17ක් පිහිටුවීම.

2. කලාව සහ සංස්කෘතිය: පාසල් තුළ බහු-ආගමික අංග ක්‍රියාත්මක කිරීම, ටෙලි නාට්‍ය, චිත්‍ර, නාට්‍ය, සංගීත වැඩසටහන් සහ උත්සව දිවයින පුරා සංවිධානය කිරීම.

3. ගැටුම් විපරිනාමය: සවිස්තරාත්මක අන්තර් ආගමික සහ අන්තර් සංස්කෘතිකමය කතිකාවන්.

4. සවිස්තරාත්මක දිස්ත්‍රික් සංවර්ධන සැලසුම්: උතුරු හා නැගෙනහිර පළාත් පිළිබඳව විශේෂ අවධානයක් යොමු කරමින් අවශ්‍ය යටිතල පහසුකම් සහ ආර්ථික සංවර්ධන මූලාරම්භයන් පිළිබඳව වෙනත් සංවර්ධන පාර්ශවකරුවන්ට පහසුකම් සැළසීම.

5. පුරවැසියන්ගේ භාෂා අයිතීන් සුරක්ෂිත කිරීම: සියලුම ශ්‍රී ලාංකිකයන්ගේ භාෂා අයිතීන් සහතික කිරීම පිණිස වෙනත් පාර්ශවකරුවන් සමග කටයුතු කිරීම.

6. මනෝ සමාජීය සහාය: මනෝ සමාජීය සහාය ලබාදීම සඳහා අවශ්‍ය සම්බන්ධීකරණය, සම්පත් සංචිතයක් සකස් කිරීම සහ පුහුණු කිරීම.

7. සංහිඳියාව සඳහා කාන්තාවන්: කාන්තාවන්ගේ පුද්ගලික හා සමාජ ආරක්ෂාව සහ දේශීය/ ප්‍රාදේශීය ආර්ථික සංවර්ධන මූලාරම්භයන් හි කාන්තාවන්ගේ භූමිකාව ප්‍රවර්ධනය කිරීම පිණිස සවිස්තරාත්මක වැඩ රාමුවක් වැඩිදියුණු කිරීම.

8. ජීවනෝපාය මූලාරම්භයන් සඳහා උපකාර කිරීම: වෙනත් සුවිශේෂ මූලාරම්භයන් තුළින් පහසුකම් සැළසීම.

9. සම්බන්ධිත ක්ෂේත්‍ර: ජාතික සංහිඳියා ක්‍රියාකාරකම් සැළැස්ම, සාමය සහ සංහිඳියාව සඳහා වන සමාජ සන්නිවේදන ව්‍යාපාරය, වෙනත් හිතැති නියෝජිත ආයතන සමග සහයෝගීත්වය සහ සහසම්බන්ධ වීම.

වර්ෂය සඳහා විස්තරාත්මක ක්‍රියාකාරකම් සැළැස්මක් මෙම කොමිසම වෙත ඉදිරිපත් කරන ලද අතර මෙම සැළැස්ම මනාව අධ්‍යයනය කරන බව මෙම කොමිසමට ඉතා පැහැදිලිය.

එකිනෙකාගේ විවිධත්වයන්ට/ අනන්‍යතාවයන්ට ගරු කරමින් හා අගය කරමින් සහජීවනයෙන් හා එකමුතුකමින් යුතුව සියලු ශ්‍රී ලාංකිකයින් වාසය කිරීම යන දැක්ම හා මෙහෙවර සාක්ෂාත් කර ගැනීමේ අරමුණ පෙරදැරි කරගෙන ක්‍රියාත්මක වන ජාතික සමගිය සහ ප්‍රතිසන්ධානය සඳහා වන කාර්යාලයෙහි මෙහෙවර, මූලික අයිතිවාසිකම්, නිදහස, නීතියේ ආධිපත්‍යය, සමානාත්මතාවය සහ විවිධත්වයට ගරු කරන සමාජයක් නිර්මාණය කිරීම පිණිස විවිධ පාර්ශවකරුවන් විසින් ගනු ලබන උත්සාහයන් ප්‍රවර්ධනය කිරීම සහ උත්ප්‍රේරණය කිරීමයි. වර්තමාන සමාජයේ අවබෝධය, තිරසාර සාමය, ආරක්ෂාව සහ සහජීවනය තුළින් මතභේදයන් තුරන් කිරීම යන තේමාව යටතේ මෑතකදී ජාතික සමගිය සහ ප්‍රතිසන්ධානය සඳහා වන කාර්යාලය විසින් වාර්ෂික සම්මේලනය පැවැත්වූ බව සතුටින් සඳහන් කර සිටී.

මැක්ස්වෙල් පරණගම

හිටපු මහාධිකරණ විනිසුරු

870. ඔහුගේ කරුණු දැක්වීම් පහත සඳහන් පරිදි වේ.

සිදුකර ඇති අපරාධ පිළිබඳ විස්තරය

- සාපරාධී ස්වරූපයේ අපරාධ සිදුකර ඇති අවස්ථාවකදී යුධ අපරාධ සිදු වී ඇතැයි ඔහුට එකඟවිය නොහැකි බව ඔහු පැවසීය.

- උගත් පාඩම් හා ප්‍රතිසංධාන කොමිෂන් සභාව මෙන්ම පරණගම කොමිසමද විමර්ශන ස්වභාවයේ ආයතනවලට වෙනස් ආකාරයේ විමර්ශන කොමිෂන් සභා බව ඔහු ඉස්මතු කොට දැක්වීය. තවදුරටත් විමර්ශනය කළ යුතු සාපරාධී ස්වභාවයක අපරාධ සඳහා නිර්දේශ නිකුත් කළ බව ඔහු පැවසීය. (පිටපතේ පිටු අංක 2,3 බලන්න.)

චැනල් 4 වීඩියෝව

- චැනල් 4 වීඩියෝවෙන් ගෙන හැර දක්වන ලද සිද්ධීන් විමර්ශනය කිරීමේදී එහි වීඩියෝ දර්ශන උගත් පාඩම් හා ප්‍රතිසංධාන කොමිෂන් සභාව ඉල්ලූ බවත්, නමුත් චැනල් 4 නියෝජිතයන් මුල්වීඩියෝ දර්ශන ලබාදීම ප්‍රතික්ෂේප කළ බවත් ඔහු පැවසීය. (පිටපතේ 10 පිටුව බලන්න)

- පරණගම කොමිසමේ විමර්ශන කණ්ඩායම චැනල් 4 වීඩියෝව හා සම්බන්ධ විමර්ශන සිදු කරන අතරවාරයේදී එම කොමිසමේ කටයුතු අවසන් වූ බව ඔහු කියා සිටියේය. (පිටපතේ 12 පිටුව බලන්න)

- විමර්ශන සිදු කරන අතරවාරයේදී මුහුණපෑමට සිදු වූ දුෂ්කරතාවයන් වශයෙන් ඒ සඳහා කාලය වැඩි වශයෙන් ගතවීම, විමර්ශනයට අදාළ සිද්ධීන් යළි ස්මරණය කිරීමට ඇතැම් පිරිස් මැලිවීම වැනි කරුණු ඔහු විශේෂයෙන් පෙන්වා දුන්නේය.

පරණගම කොමිසමට ඔවුන්ගේ කටයුතු තවදුරටත් පවත්වා ගැනීමට අවසර ලබා දුන්නේ නම් "සම්පූර්ණ වැඩක්සිදු කළ හැකිව තිබූ බව ඔහු පැවසීය.

තොරතුරු ලබාදීමට තානාපති කාර්යාල පැකිලීම.

- සරණාගතයින් පිළිබඳ තොරතුරු අනාවරණය කර ගැනීම සම්බන්ධයෙන් ලිඛිතව ඉල්ලීම් ඉදිරිපත් කරනු ලැබුවද, කැනේඩියානු තානාපති කාර්යාලය වැනි තානාපති කාර්යාල, එය රාජ්‍ය තාන්ත්‍රික නීතිරීති වලට පටහැනි බව පවසමින් එම රටවල වාසය කරන සරණාගතයින් සම්බන්ධයෙන් තොරතුරු අනාවරණය කිරීම ප්‍රතික්ෂේප කළ බව ඔහු සැළකර සිටියේය. (පිටපතේපිටු අංක 11 බලන්න)

- සරණාගත ස්වභාවය සඳහා ඉල්ලුම්කොට ඇති ඇතැම් අතුරුදන් වූ පුද්ගලයන් සම්බන්ධ තොරතුරු පරණගම කොමිසමට පැවති බවත්, විදේශ දූත සේවාවලින් තොරතුරු ඉල්ලීමට හේතුව එය බවත් ඔහු වැඩිදුරටත් පැවසීය. මෙම පුද්ගලයන්ගෙන් සමහරක් සරණාගත කඳවුරුවල සිටි බවත් ඇතැමුන් සරණාගත කඳවුරුවල තවදුරටත් වාසය කරන බවත් ඔහු පැවසීය. (පිටපතේ පිටු අංක 26 බලන්න)

ජනරාල් හෝම්ස්ගේ (General Holmes) විශේෂඥ මතයට ඔහු යොමු වූ අතර ශ්‍රී ලංකා හමුදාව බර අවි භාවිතා නොකළ බවට එම වාර්තාවේ නිගමනය වී ඇත. (පිටු අංක 13, 14)

පැහැර ගැනීමට ලක් වූ පුද්ගලයන්ගේ පවුල්වල සාමාජිකයන්ට සහන සැලසීමට රජය බැඳී සිටීම පිළිබඳ විමර්ශනය කිරීම.

- පරණගම කොමිසම යටතේ පුද්ගලයන් 600-800 පමණ ප්‍රමාණයකට මරණ සහතික නිකුත් කළ බවත් එමඟින් ඔවුන්ගේ පවුල්වල සාමාජිකයන්ට විවිධ දීමනා සහ වන්දි ලබා ගැනීමට හැකිවන බවත් ඔහු පැවසීය. (පිටපතේ පිටු අංක 16 බලන්න)

යටත් වූ එල්.ටී.ටී.ඊ. සාමාජිකයන් අතුරුදන් වී ඇති බවට වන චෝදනාව.

- ශ්‍රී ලංකා යුධ හමුදාවට යටත් වූ සහ අනතුරුව ශ්‍රී ලංකා ගමනා ගමන මණ්ඩලයේ බස්රථ වලට නංවාගනු ලැබූ එල්.ටී.ටී.ඊ. සංවිධානය සාමාජිකයන් 120ක් පමණ අතුරුදන් වීම පිළිබඳ චෝදනාව සම්බන්ධයෙන් එක් පුද්ගලයෙකු සාක්ෂි ලබා දුන් බව ඔහු පැවසීය. මෙම සාක්ෂියේ වාර්තා සටහන් රාජ්‍ය ලේඛනාගාරයට භාර දී ආරක්ෂා කෙරෙන බවත් එම සිද්ධිය විමර්ශනය කළ යුතු බවත් ඔහු පැවසීය. (පිටපතේ 17 පිටුව බලන්න)

පරණගම කොමිසම විසින් නිර්දේශ කොට ඇති යාන්ත්‍රණයන්

- විදේශීය විමර්ශනයන් නිර්දේශ කොට නොමැති බව පරණගම කොමිසම විසින් ලබා දී ඇති නිර්දේශ පිළිබඳව සඳහන් කරමින් ඔහු අදහස් දැක්වීය. දේශීය විමර්ශකයින් විසින්විමර්ශන සිදු කරනු ලබන විශේෂ මහාධිකරණයන් ස්ථාපිත කිරීමටත්, සත්‍ය සහ සංහිදියා කොමිසමක් ස්ථාපිත කිරීමටත්, කෙසේ වුවද, කොමිසම නිර්දේශ කළ බවද ඔහු පැවසීය. (පිටපතේ පිටු අංක 19 බලන්න)

බලහත්කාරයෙන් අතුරුදන් කරවීම පිළිබඳ විමර්ශන

- පැහැර ගැනීම් සම්බන්ධයෙන් ඔහු ප්‍රකාශ කළේ, පැහැර ගැනීම සිදු වූ ප්‍රදේශයේ පාලනය සිදු කළ පුද්ගලයන් පිළිබඳව සළකා බලමින් පැහැර ගැනීම සිදුකළ පුද්ගලයන්, පැහැර ගැනීම සිදුකළ පුද්ගලයින් හැඳ සිටි ඇඳුම් සහ පැහැර ගැනීම සිදු කළ පුද්ගලයන් කථා කළ භාෂාව ආදිය පිළිබඳව පරණගම කොමිසම අවධානය යොමු කළ බවයි. (පිටපතේ පිටු අංක 20 බලන්න)

- යාපනය ප්‍රදේශයෙන් බැහැර ප්‍රදේශවල සිදු වූ පැහැර ගැනීම් වලින් 85%කට වඩා එල්.ටී.ටී.ඊ. සංවිධානයය විසින් සිදුකොට ඇති බව ඔහු තවදුරටත් පැවසීය. (පිටපතේ පිටු අංක 5 බලන්න)

- විශ්‍රාමික අපරාධ පරීක්ෂණ නිලධාරීන් කණ්ඩායමක් විසින් සිදු කරන ලද විමර්ශන සම්බන්ධ වාර්තාව ජාතික ලේඛනාරක්ෂක වෙත භාර දී ඇති බව ඔහු පැවසීය. (පිටපතේ පිටු අංක 24 බලන්න)

විමර්ශනය අතරතුර අනාවරණය වූ පුද්ගලයන් 10 දෙනා

- ආධාර ලබා ගැනීම පිණිස ස්වකීය ඥාතීන් අතුරුදන්ව ඇති බවට ඇතැම් පුද්ගලයන් චෝදනා කරන බව ඔහු පැවසීය. (පිටපතේ පිටු අංක 25 බලන්න)

- පැන ගිය පුද්ගලයන් ද, අතුරුදන් වූවන් වශයෙන් වර්ගීකරණය කර ඇති බවටත්, කොමිසම විසින් සොයා ගන්නා ලද පුද්ගලයන්ගේ නම් වාර්තාවේ සඳහන්කොට ඇති බවටත් ඔහු එකඟවිය.(පිටපතේ පිටු අංක 7 බලන්න)

- එක් පුද්ගලයෙකු මදුරාසියේ සරණාගත කඳවුරකින් හමු වූ අතර ඔහු බිරිඳ සමග යළි එකතු වී ඇත.

- එක් පුද්ගලයෙකු තලවකැලේ ප්‍රදේශයෙන් හමු වී ඇත.

- පුද්ගලයන් දෙදෙනෙකු හෝ තිදෙනෙකු ආයුධ රැගෙන යමින් සිටියදී මාලදිවයින් නාවික හමුදාව විසින් අල්ලාගෙන ඇත. ඔවුන්ගෙන් එක් අයෙකු බන්ධනාගාරයේ දී තමාට කථා කළ බව ඔහු පැවසීය. (පිටපතේ පිටු අංක 26 බලන්න)

- උතුරේ සිට කොළඹට පැමිණ පදිංචි වී ඔවුන්ගේ නෑදෑ හිතවතුන් සමග සබඳතා නොපවත්වන ඇතැම් පුද්ගලයන් අතුරුදන්ව ඇති බවට උතුරේ ඥාති හිතවතුන් විශ්වාස කරන අවස්ථාද පවතින බව ඔහු තවදුරටත් පැවසීය. (පිටපතේ පිටු අංක 36 බලන්න)

- විවිධ ආධාර ලබා ගැනීමේ අරමුණින් ඇතැම් දෙමව්පියන් හුදෙක්ම සත්‍ය වසන් කරන බවත් සහ ඇතැම් දරුවන්ට ආපසු පැමිණීමට අවශ්‍යතාවයක් නොමැති බවත් නැතහොත් ආපසු පැමිණීමට බියක් දක්වන බවත් ඔහු වැඩිදුරටත් පැවසීය.

පුද්ගලයන් සංඛ්‍යා

- 6700කට ආසන්න ප්‍රමාණයක් වන අතුරුදන් වූ පුද්ගලයන් නිශ්චය කිරීම සඳහා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් සිදු කරන ලද සංගණනය වැදගත් වූ බව ඔහු පැවසීය. මෙම සංඛ්‍යා දරුස්මාන් වාර්තාව සමග නොසැසඳෙන බව යන කරුණ සමග ඔහු එකඟ විය. (පිටපතේ පිටු අංක 28/29 බලන්න)

- කොමිසම, චැනල් 4 පිළිබඳ සිය වාර්තාවේ මේ පිළිබඳව අදහස් දක්වනු ඇත.

ඉහත සාක්ෂිකරුගේ සාක්ෂිය ඉදිරිපත් කිරීමෙන් පසු ආචාර්ය කබ්රාල් මහතාගේ සාක්ෂිය ඉතා වැදගත් ප්‍රශ්නයක් මතු කරන බව කොමිසම සඳහන් කරයි. එනම්, ශ්‍රී ලංකා රජය, ශ්‍රීමත් ඩොනල්ඩ් ද සිල්වා රාජ්‍ය නීතිඥ, මහාචාර්ය ඩී.එම්. ක්රේන්, ශ්‍රීමත් ජෙෆ්රි නයිස් රාජ්‍ය නීතිඥ සහ රොඩ්නි ඩික්සන් මහතා රාජ්‍ය නීතිඥ වැනි නීති විශේෂඥයන් සහ කීර්තිමත් පුද්ගලයන් පත්කර ඇති අතර එම වාර්තා විදේශ කටයුතු අමාත්‍යාංශය සතුව පැවතීම.

දරුස්මාන් වාර්තාවේ පදනමම හෑල්ලුවට ලක් කරන මෙම අදහස් මෙන්ම එතැන් සිට ශ්‍රී ලංකාවට එරෙහිව මෙම යෝජනා සම්මත වන තුරු, පැන නගින කවර හෝ කාරණයක් නම්, එමගින් පෙනී යන්නේ මෙම අදහස් නොසලකා ශ්‍රී ලංකාවට එරෙහිව මෙම යෝජනා සම්මත කර ඇති බවයි. ඉහත කී මතය මානව හිමිකම් කවුන්සිලය හමුවේ ඉදිරිපත් කිරීම විදේශ කටයුතු අමාත්‍යාංශ පාර්ශවයේ වගකීම විය. මානව හිමිකම් කවුන්සිලයේ සංවාද; විශ්වීයත්වය, අපක්ෂපාතීත්වය, විෂය මූලිකත්වය, තෝරා ගැනීම, නිර්මාණාත්මක සංවාදය සහ සංස්ථාව, පුරෝකථනය, නම්‍යශීලීභාවය, වගවීම, තුලනය ඇතුළත් පුළුල් දෘෂ්ඨි කෝණයයන නිර්ණායකයන්ට අනුකූලව සිදුවිය හැකි වූයේ ඉන් අනතුරුව වන අතර එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් පවුන්සිලයේ ආයතන ගොඩනැගීමේ 2007 ජුනි 18 දිනැති 5/1 දරණ යෝජනාවේ දක්වා ඇති පරිදි කාර්යයන් ඉටුකිරීමේ වැඩසටහන් සඳහා වන න්‍යාය පත්‍රය හා රාමුව මෙහෙයවන මූලධර්ම ලෙස අනිවාර්යයෙන් ඉදිරිපත් කරන, තීරණ ක්‍රියාත්මක කිරීම සහ පසුවිපරම් කිරීම.සාක්ෂිකරුවන් කිහිප දෙනෙකු මෙම කොමිසම හමුවේ සිදු කරන ලද සැළකිරීම්වල ප්‍රතිඵලයක් වශයෙන් කොමිසම මෙම නිරීක්ෂණයන් සිදුකොට ඇත. කෙසේ වුවද, අනුගමනය කරන මානව හිමිකම් ක්‍රියා පටිපාටිය පිළිබඳව පළපුරුද්ද/ නිපුණත්වය පවතින පුද්ගලයන් කිහිප දෙනෙකුගෙන් වැඩිදුර විභාග සිදු කරන අතරවාරයේදී කොමිසම විසින් සාක්ෂි ලබා ගන්නා අතර, කොමිසම එහි බලය පැවරුමෙහි කොටසක් වශයෙන් සිය අවසන් වාර්තාව ඉදිරිපත් කිරීමේදී සිය අනාවරණයන් සහ සිය නිරීක්ෂණ ඉදිරිපත් කරනු ඇත. මහාචාර්ය ප්‍රතිභා මහානාමහේවා මහතාගේ සාක්ෂි ජාත්‍යන්තර මානව හිමිකම් නීතිය හා සම්බන්ධයෙන් වූ අතර අනතුරුව ඔහු උගත් පාඩම් හා ප්‍රතිසංධාන කොමිෂන් සභාව සහ අතුරුදන් වූ පුද්ගලයන් පිළිබඳ මැක්ස්වෙල් පරණගම කොමිසන් වාර්තාව යන වාර්තා දෙකෙහිම නිරීක්ෂණ පිළිබඳව කථා කළේය. මෙම කොමිෂන් සභා දෙකෙහිම නිර්දේශ සම්බන්ධයෙන් ඔහු ප්‍රකාශ කළේ ... මෙම කොමිසම හමුවේ තවදුරටත් සාක්ෂි ලබාදීමට සාක්ෂිකරු පොරොන්දු වූ අතර, මෙම කොමිසම ඔහුගේ සාක්ෂි කඩිනමින් ලබා ගැනීමට අපේක්ෂා කරයි.

මහාචාර්ය සර්වේස්වරන් අරුලානන්දම්

නීතිඥ, නීතිය පිළිබඳ මහාචාර්ය

871. කොළඹ විශ්වවිද්‍යාලයේ, නීති පීඨයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරයෙක් වන මහාචාර්ය සර්වේස්වරන් මහතා මෙම කොමිසම හමුවේ සාක්ෂි ලබා දෙමින් කරුණු සමූහයක් සම්බන්ධව අදහස් දැක්වූ අතර පශ්චාත් සන්නද්ධ ගැටුමකින් පසුව සමාජයේ දිශානතිය කෙසේ විය යුතුද යන්න පිළිබඳව කරුණු 17ක් යටතේ ඔහු කරුණු සැළකොට සිටියේය. ඔහු "DDR" යන සංකල්පයක් අවධාරණය කළ අතර එහි පළමු "D" අකුරෙන් නිරායුධකරණය ද (Disarmament), දෙවන "D" අකුරෙන් හමුදා සේවාවන්ගේ පාලනයෙන් මුදවීම (Demobilization) අදහස් කරන අතර "R" අකුරෙන් නැවත සිය රටට එවීඹ (Repatriation), නැවත පදිංචි කිරීම (Resettlement), පුනරුත්ථාපනය (Rehabilitation), නැවත සමාජ සංකලනය (Reintegration), සංහිඳියාව (Reconciliation) සහ ප්‍රතිනිර්මාණය (Reconstruction) යන කරුණු අදහස් වේ.

තවද, පශ්චාත් යුධ ගැටුම් කාලසීමාවක් සඳහා සත්‍ය සෙවීම (truth searching), නඩු කටයුතු සිදු කිරීම (Prosecution) හානිපූරණය (Reparation) සහ ආයතනික ප්‍රතිසංස්කරණ (Institutional reforms) ඇතුළත් "සංක්‍රාන්ති යුක්තියෙහි" (Transitional Justice) වැදගත්කම ඔහු අවධාරණය කළේය. සත්‍ය සෙවීම යන්නෙන් අදහස් කරනුයේ මානව හිමිකම් නීතිය සහ ජාත්‍යන්තර මානුෂීය නීතිය බරපතල ලෙස කඩ වී තිබේද යන්න පිළිබඳව සොයා බැලීමයි. ඉහත සඳහන් කරන ලද කඩකිරීම් සිදු වී ඇත්ද යන්න විමර්ශනය කිරීම පිණිස වරදකරුවන්ට එරෙහිව නීතිමය ක්‍රියාමාර්ග ගැනීම අවශ්‍ය වන අවස්ථාවලදී වින්දිතයන්ගේ නියෝජිතයන් සමග සාකච්ඡා කොට, ස්වාධීන යාන්ත්‍රණයක් ස්ථාපිත කිරීමට මහාචාර්යවරයා යෝජනා කරයි.

පශ්චාත් යුධ සමයේදී හමුදාව විසින් අත්කරගෙන සිටින පුද්ගලික ඉඩම්වල වින්දිතයන් විසින් මුහුණ දෙන ඉඩම්වල අයිතිය පිළිබඳ ගැටළුව සම්බන්ධයෙන් උගත් මහාචාර්යවරයා අවධානය යොමු කළේය. අදාළ හිමිකරුවන් වෙත එම ඉඩම් නිදහස් කළ යුතු බව මහාචාර්යවරයාගේ මතය වේ. නැගෙනහිර පළාතේ ඇතැම් ඉඩම් නිදහස්කොට ඇති නමුත් එම ක්‍රියාවලිය ඉතා මන්දගාමීය. පුද්ගලයන්ට ස්වකීය දේපළ හිමිව පැවතීමට ඇති අයිතියට ගරු කළ යුතු බව මහාචාර්යවරයා අවධාරණය කළේය.

යුද්ධය නිම වී වසර 12ක දීර්ඝ කාලසීමාවක් පසු වී ඇති බැවින් ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ අත්අඩංගුවට ගනු ලැබූ දරුවන් පුද්ගලයන් නිදහස් කළ යුතු බවත් ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත අහෝසි කළ යුතු බවත් මහාචාර්යවරයාගේ අදහස වේ. ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත විශේෂ විධිවිධාන පනතක් වශයෙන් පනවා ඇති නමුත් අද වන විට එය ශ්‍රී ලංකාවේ අපරාධ යුක්තිය පසිඳලීමේ පද්ධතිය තුළ ස්ථාවර පනතක් බවට පත්ව ඇති බව ඔහු පැවසීය. දණ්ඩ නීති සංග්‍රහය, අපරාධ නඩු විධාන සංග්‍රහය සහ සාක්ෂි ආඥා පනත ක්‍රියාත්මකව පවතින බැවින්, සියලු ආකාරයේම අපරාධ සම්බන්ධයෙන් කටයුතු කිරීමේදී ශ්‍රී ලංකාවේ පවතින නෛතික රාමුව ප්‍රමාණවත් බව මහාචාර්යවරයා පවසයි. එබැවින්, විශේෂ නීතියක අවශ්‍යතාවයක් පවතින්නේය යන මතය මහාචාර්යවරයා බැහැර කරයි.

ඇප ලබාදිය නොහැකි වරදවල් සම්බන්ධයෙන් මහාචාර්යවරයා අවධාරණය කළේ, නඩු විභාගය ආරම්භ කිරීම සඳහා නිශ්චිත කාලසීමාවක් පැවතිය යුතු බවත් එසේ නොමැති නම් ඔවුන් ඇප මත මුදාහැරිය යුතු බවත්ය.

ජනවාර්ගික ගැටළුවට දේශපාලනමය විසඳුමක් වශයෙන් මහාචාර්යවරයා ෆෙඩරල් ක්‍රමය යෝජනා කළේය. කෙසේ වුවද, "ෆෙඩරල්වාදය" යන දේශපාලන න්‍යාය, ශ්‍රී ලංකාව තුළ

"බෙදුම්වාදය" ලෙස වරදවා වටහාගෙන ඇත. නිදහස ලැබූ අවස්ථාවේ පටන්ම ද්‍රවිඩ ජනතාව ඉල්ලන්නේ ෆෙඩරල් ක්‍රමයක් බව මහාචාර්යවරයා පැවසීය. ශ්‍රී ලංකාවට වඩා ප්‍රමාණයෙන් කුඩා, බෙල්ජියම් හා ස්විස්ටර්ලන්තය වැනි රටවල ෆෙඩරල් ක්‍රමය අනුගමනය කරනු ලබයි. ශ්‍රී ලංකාවට අදාළ වන සුවිශේෂී ආකෘතියක් නිර්මාණය කිරීම වඩාත් උචිත වේ.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ අංක 154(A)(3) ව්‍යවස්ථාව මගින් නීති සම්පාදනය කිරීම තුළින් විධිවිධාන ඒකාබද්ධ කිරීමට ඉඩකඩ සපයයි. පළාත් නැවත සීමානිර්ණය කිරීමට මහාචාර්යවරයා යෝජනා කරයි. ද්‍රවිඩ ප්‍රදේශ උතුරු පළාත සමග සම්බන්ධ කරන ලෙසත්, නැගෙනහිර පළාතේ මුස්ලිම් හා සිංහල ප්‍රදේශ එසේම අනෙක් පළාත් සමග ඒකාබද්ධ කිරීමත් සිදු කළ හැකිය. දැනට පවතින 13 වන ව්‍යවස්ථා සංශෝධනය තුළ එය අන්තර්ගත බව, මක්නිසාද යත් එහි සීමිත පොලිස් බලතල හාව්‍යවස්ථාදායක බලතල වලට ප්‍රතිපාදන සපයන බැවිනි. 13 වන ව්‍යවස්ථා සංශෝධනය සම්පූර්ණයෙන් ක්‍රියාත්මක කළ යුතු බව මහාචාර්යවරයාගේ මතය වේ.

භාෂා අයිතිවාසිකම් සම්බන්ධ ගැටළු පිළිබඳවද සර්වේශ්වරන් මහාචාර්යවරයා අවධානය යොමු කරයි. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 13 හා 16 වන සංශෝධන අනුව දෙමළ භාෂාව ද රාජ්‍ය භාෂාවක් බවට පත්වී ඇත. සිංහල භාෂාව දැනටමත් රාජ්‍ය භාෂාවක් වන අතර ඉංග්‍රීසි භාෂාව සන්ධාන භාෂාවක් වේ. කෙසේ වුවද, භාෂා අයිතිවාසිකම් පූර්ණ ලෙස ක්‍රියාත්මක වී නොමැති බැවින් එය පූර්ණ ලෙස ක්‍රියාත්මක කිරීම සඳහා පියවර ගතයුතු වේ. රාජ්‍ය සේවයේ නියුතු නිලධාරීන් ද්විභාෂා ප්‍රවීනතාවය ලබාගත යුතු වේ.

ඉංග්‍රීසි භාෂාව සම්බන්ධයෙන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ලබා දී ඇති තත්ත්වය ප්‍රවර්ධනය කළ යුතු බවට මහාචාර්යවරයා අදහස් දැක්වීය. ඉංග්‍රීසි භාෂාව 'සන්ධාන භාෂාව' වශයෙන් සළකනු ලැබුවද යථාර්ථය වන්නේ එය නිල නොවන ආකාරයකට රාජ්‍ය භාෂාවක් වී ඇති බවයි. 1956 වර්ෂයේදී, 'සිංහල භාෂාව පමණක්ය' යන පනත සම්මත කොටගෙන ඉංග්‍රීසි හා දෙමළ භාෂාවන්ට පවතින තත්ත්වය පහත් කොට ඇත. නමුත්, මෙම ක්‍රියාව ඇති වී ඇති අහිතකර ප්‍රතිඵලය ජනවාර්ගික ගැටළුවක් දක්වා ඔඩුදුවමින් සමස්ත ජාතීන්ටම බලපෑම් එල්ලකොට ඇත. මෙම ක්‍රියාව, ලෝකයේ ඉදිරි ගමනක් යාමට අත්‍යවශ්‍ය භාෂාවක් වන ඉංග්‍රීසි භාෂාවේ තත්ත්වය හෑල්ලු කිරීමට ද එම පනත හේතු වී ඇත. එබැවින් ඉංග්‍රීසි භාෂාවට රට තුළ පවතින තත්ත්වය නංවාලන මෙන් සහ එය රාජ්‍ය භාෂාවක්කරන මෙන් මහාචාර්යවරයා ඉල්ලා සිටී.

වෙනස්කමකට භාජනය නොකිරීම (nondiscrimination) සම්බන්ධයෙන්ද මහාචාර්යවරයා සිය අදහස් ප්‍රකාශ කළේය. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12 (1) හා 12 (2) අනුව, කිසිම පුරවැසියෙකු කවර හෝ හේතුවක් මත වෙනස්කමකට භාජනය නොවිය යුතුය. සර්ව සාධාරණත්වය අනුපාත ක්‍රමය මත පදනම් නොවේ. කෙසේ වුවද, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ සඳහන් එම විධිවිධානයන් රාජ්‍ය අංශය සඳහා පමණක් අදාළ කරගනු ලබන අතර පුද්ගලික අංශය තුළ සිදුවන වෙනස්කමට භාජනය කිරීමද පැහැදිලිව දක්නට ලැබේ. සේවා නියුක්තියේදී සිදුවන වෙනස්කමක් භාජනය කිරීම සම්බන්ධව කටයුතු කිරීම පිණිස විධිවිධාන ශ්‍රීලංකාවේ නොපවතී. එය ජන වර්ගය, ආගම මත පමණක් නොව ස්ත්‍රී පුරුෂ භාවය මත ද පදනම් වේ. මෙම තත්ත්වයට විසඳුමක් වශයෙන්, බ්‍රිතාන්‍යයේ පවතින UK 200 පනතට සමානව, සර්ව සාධාරණත්වය (Equality) පිළිබඳව පනතක් සම්පාදනය කිරීම සුදුසු බවට මහාචාර්යවරයා යෝජනා කරයි. මූලික අයිතිවාසිකම් පිළිබඳව වන අධිකරණ බලය පළාත් මට්ටම්වලට බෙදාහැරිය යුතු බවත් එමඟින් අඩු වරප්‍රසාදලත් පුද්ගලයන්ට පවා ශ්‍රේෂ්ඨාධිකරණයට යාමට ඉඩකඩ සැලසෙන බව මහාචාර්යවරයාගේ මතය වේ.

ශ්‍රී ලංකාව තුළ පුද්ගල නීතිය සුරක්ෂිත කළ යුතු බව උගත් මහාචාර්යවරයා ප්‍රකාශ කළේය. එමගින් ශ්‍රී ලාංකීය සමාජයේ විවිධත්වය සංකේතවත් කරන අතර මෙම නීති මගින් අපරාධ වරදවල් සම්බන්ධයෙන් කටයුතු නොකරන නමුත් එම පුද්ගලයන්ගේ පුද්ගල සිවිල් ගැටළු

සම්බන්ධයෙන් කටයුතු කරනු ලබයි. එය බාහිර සමාජයකින් නොව අදාළ විශේෂිත ප්‍රජාවෙන්ම ඉදිරිපත් විය යුතු වේ. ඊට උදාහරණ ලෙස මහාචාර්යවරයා පැවසුවේ, තේසවලාමේ නීතියට අනුව නිශ්චල දේපලක් පැවරීම සම්බන්ධයෙන් යම් බිරිඳකට සැමියාගේ ලිඛිත අවසරය අවශ්‍ය වන බවයි. එබැවින් සර්ව සාධාරණත්වය සුරැකීමට නම් ස්වාමිපුරුෂයා දේපළක් පවරනු ලබන අවස්ථාවකදී ඒ සඳහා බිරිඳගේ අත්සන ලබාගත යුතු බවට යෝජනා කළ හැකි අතර මෙවන් සාධාරණ භාවිතයන් පුද්ගල නීතියට ඇතුළත් කිරීම අවශ්‍ය වේ.

වෛරී ප්‍රකාශ සිදු කිරීම යනු තෙල් විසිරී පවතින මතුපිටකට කුඩා ගිනි පුළිඟුවක් එක් කිරීම වැනි වන අතර එමගින් සැලකිය යුතු හානියක් සිදු කළ හැකිය. වෛරී ප්‍රකාශ සම්බන්ධ නීති පශ්චාත් යුධ සමයක දැඩි ලෙස ක්‍රියාත්මක වීම සිදුවිය යුතු බව මහාචාර්යවරයා තවදුරටත් පැවසීය.

මහාචාර්ය සර්වේස්වරන්ට අනුව, මැතිවරණ ප්‍රතිසංස්කරණ සිදු කිරීම අවශ්‍ය වන අතර සියලුම පක්ෂවල එකඟතාවය මත එය අවසන් කළ යුතු වේ. එය, විශේෂයෙන්ම උතුරු හා නැගෙනහිර පිට පළාත් හෝ දිස්ත්‍රික්ක සම්බන්ධයෙන් වන බැවින්, කිසියම් දිස්ත්‍රික්කයකින් හෝ පළාතකින් ඉදිරිපත් කෙරෙන පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් සංඛ්‍යාව කවර හෝ මැතිවරණ ප්‍රතිසංස්කරණ මගින් අඩු නොකළ යුතු වේ. පාර්ලිමේන්තුව තුළ කාන්තා නියෝජනය සළකා බැලීමේදී පසුගිය වර නියෝජිතයින් 11 දෙනෙකු සිටි බවත්, මෙවර 9 දෙනෙකු පමණ සිටින බවත් මහාචාර්යවරයා පැවසීය. රුවන්ඩාව උදාහරණය පිණිස ගනිමින් මහාචාර්යවරයා ප්‍රකාශ කළේ 1994 දී රුවන්ඩාවේ ජන සංහාරයක් සිදු වී ඇතත් මේ වන විට රුවන්ඩා පාර්ලිමේන්තුව තුළ 60%ක කාන්තා නියෝජනයක් පවතින බවයි. ශ්‍රී ලංකාවේ පාර්ලිමේන්තුව තුළ 30%ක් සහ පළාත් සභා තුළ 30%ක් වශයෙන් කාන්තා නියෝජනය සඳහා වෙන් කළ යුතු බවට යෝජනා පවතී. සේවක සංගම්වල නිලතල සඳහා යම් කාන්තා ප්‍රතිශතයක් ඇතුළත් විය යුතු බවට විධිවිධාන එක් කරමින් වෘත්තීය සංගම් ආඥා පනත සංශෝධනය කරන මෙන් මහාචාර්යවරයා යෝජනා කරයි. කාන්තාවන්ගේ දේශපාලන අයිතිවාසිකම් සම්බන්ධයෙන් වන විටදී ශ්‍රී ලංකාව තුළ කවර ආකාරයක හෝ බලය පැවරීමක් අවශ්‍ය වේ.

සාමය පිළිබඳ අධ්‍යාපනය ශ්‍රී ලංකාවේ අධ්‍යාපන පද්ධතියේ කොටසක් විය යුතු බවට සමාචාර්යවරයා අවධාරණය කරයි. යුධ හමුදා නිලධාරීන්ටද මානව හිමිකම් නීතිය, මානුෂීය නීතිය සහ සාම අධ්‍යාපනය සම්බන්ධව වැඩසටහන් පැවැත්විය යුතු වේ. එය බන්ධනාගාර නිලධාරීන්, පොලිස් නිලධාරීන් හට ද ලබාදිය යුතු වේ.

රටෙහි සංවර්ධනය ඉලක්ක කරගත් පාලනයේ වැදගත්කම පිළිබඳව මහාචාර්යවරයා අවධාරණය කළේය. මහාචාර්ය සර්වේසරන්ට අනුව ශ්‍රී ලංකාවේ පවතින සියලුම ආර්ථික ගැටළුවලට විසඳුම සංවර්ධනයයි. ශ්‍රී ලංකාවට ප්‍රතිලාභ අත්කර දෙන ව්‍යාපෘති ආරම්භ කළ යුතු අතර රැකියා අවස්ථා ඇති කළ යුතු වේ. කර්මාන්ත හා කර්මාන්තශාලා වැඩි වශයෙන් ස්ථාපනය කළ යුතු අතර සංචාරක ව්‍යාපාරය ප්‍රවර්ධනය කළ යුතුය. අර්ථවත් ලෙස යළි සමාජගත කිරීම සඳහා, හිටපු සටන්කරුවන්ට ද (ex-combatants) රැකියා අවස්ථා උදාකළ යුතු වේ.

අතුරුදන් වූවන් පිළිබඳ කාර්යාලය, හානිපූරණය සඳහා වන කාර්යාලය සහ ජාතික සමඟිය හා ප්‍රතිසන්ධානය සඳහා වන කාර්යාලය වැනි ආයතන ද්‍රවිඩ ජනතාවගේ ප්‍රශ්න විසඳා නොමැති බැවින් ඒවා ක්‍රියාත්මක විය යුතු වේ. අතුරුදන්වූවන්ගේ ප්‍රශ්නවලට හරවත් විසඳුම් ලබාදිය යුතු බැවින්, ආයතන ශක්තිමත් කිරීමේදී එවන් පුද්ගලයන් සමග සාකච්ඡාකොට එම කටයුතු සිදුකළ යුතු වේ.

අවසාන වශයෙන් මහාචාර්යවරයා ප්‍රකාශ කරනු ලැබුවේ ශ්‍රී ලංකාවට අවශ්‍ය කෙරෙනුයේ ජන කොටස් අතර සහජීවනය වන අතර ජාතීන් තුනට එක්ව වාසයකොට රට ඉදිරියට ගෙනයාම සහ එය ප්‍රවර්ධනය කිරීමයි. අනෙක් අතට, මානුෂීය නීතිය, ජාත්‍යන්තර මානුෂීය නීතිය සහ මානව

හිමිකම්නීතිය යන නීති දැඩි ලෙස උල්ලංඝනය සම්බන්ධයෙන් වන විටදී සුදුසු සහ ඵලදායී ක්‍රියාමාර්ග පැවතිය යුතු වේ. ජනවාර්ගික, ආගමික හෝ වෙනත් අනන්‍යතාවයන්ට වඩා ශ්‍රී ලාංකේය යන අනන්‍යතාවය ශ්‍රී ලාංකිකයින් අතර ස්වභාවයෙන්ම වර්ධනය විය යුතු වේ. එය සංහිඳියාව යන්නෙහි අත්‍යවශ්‍ය සංරචකයකි.

මහාචාර්ය ප්‍රතිභා මහානාමහේවා මහතා

නීතිඥ, ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ හිටපු සභාපති

872. මහාචාර්ය ප්‍රතිභා මහානාමහේවා මහතා කොළඹ විශ්වවිද්‍යාලය නීති පීඨයේ හිටපු ජ්‍යෙෂ්ඨ මහාචාර්යවරයෙකු වන අතරම මානව හිමිකම් කොමිසමේ හිටපු සභාපතිවරයෙකු ද වේ. ඔහු මින් පෙර පැවති උගත් පාඩම් හා ප්‍රතිසංධාන කොමිසම සහ අතුරුදන් වූවන් පිළිබඳ කාර්යාලය වැනි කොමිෂන් සභා විසින් සොයා ගන්නා ලද කරුණුවල ඇතැම් සිද්ධිවාචක අංශ සම්බන්ධයෙන් කටයුතු කොට ඇති අතර ජාත්‍යන්තර මානුෂීය නීතියට අදාළ වන ජාත්‍යන්තර මානව හිමිකම් නීතිය පිළිබඳව ඔහු අපගේ අවධානය යොමු කරන ලදී.

කොමිෂන් සභාවේ බලය පැවරීම පිළිබඳව අවධානය යොමු කරමින්, මහාචාර්ය ප්‍රතිභා මහානාම හේවා මහතා පළමුව, උදලාගම කොමිෂන් සභා වාර්තාව පිළිබඳව කථා කළේය. උගත් පාඩම් හා ප්‍රතිසංධාන කොමිසම සහ පරණගම වාර්තා මෙන් නොව උදලාගම කොමිෂන් සභා වාර්තාව ප්‍රකාශයට පත් කරනු නොලැබුව ද එය 2013 ඔක්තෝබර් මාසයේ දී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබූ බව ඔහු ප්‍රකාශ කළේය. මානව හිමිකම් කොමිෂන් සභාවේ ඔහු කටයුතු කරන අවදියේදී වාර්තාවේ පිටපතක් දුටු බව මහාචාර්යවරයා පැවසීය. 1990 ජුනි මස 10 වන දින සිට යුද්ධය අවසන් වූ 2009 මැයි 19 දින දක්වා කාලසීමාව තුළ උතුරු හා නැගෙනහිර පළාත්වල අතුරුදන් වූ පුද්ගලයන් සම්බන්ධයෙන් කටයුතු කිරීම පිණිස පරණගම කොමිසම පත්කොට ඇත. බරපතල වැරදි සිදු වී ඇත්දැයි සොයා බැලීම පිණිස ශ්‍රී ලංකා හමුදාව විසින් පිහිටුවන ලද විමර්ශනය පිළිබඳව ද මහාචාර්ය ප්‍රතිභා මහානාම හේවා මහතා කොමිසමේ අවධානය යොමු කරන ලදී. එකී කොමිෂන් සභාවල සියලුම වාර්තා මත පදනම්ව මෙම කොමිසමේ ප්‍රයෝජනය උදෙසා ඔහු වාර්තාවක් සකස්කොට ඇති බවද සාක්ෂිකරු පැවසීය.

ජාත්‍යන්තර මානුෂීය නීතිය උල්ලංඝනය වී ඇත්ද යන පැනයට, දරුස්මාන් වාර්තාවේ සඳහන් වන, කරනු ලදැයි කියනු ලබන සිද්ධීන්ගේ සංඛ්‍යාලේඛන මහාචාර්ය ප්‍රතිභා මහානාම හේවා මහතා ගෙනහැර දැක්වීය. දරුස්මාන් වාර්තාවට අනුව, පුද්ගලයන් 40,000කට ආසන්න සංඛ්‍යාවක් මරා දමනු ලැබ ඇති අතර ඇමෙන්ස්ටි ඉන්ටර්නැෂනල් වාර්තාවේ මෙම සංඛ්‍යාවට වෙනස් අගයන් දක්වමින් සඳහන් කර ඇත්තේ එය 100,000* ක් බවයි. හියුමන් රයිට්ස් වොච් ආයතනය ඉදිරිපත් කොට ඇති සංඛ්‍යාව 60,000කි. මෙම පරස්පර විරෝධී සංඛ්‍යාවල මූලාශ්‍රය අන් අයගෙන් ඇසීමෙන් පමණක් දත් (ශ්‍රැති මාත්‍ර) කරුණු බවත් සනාථකොට නොමැති බවත් මහාචාර්ය ප්‍රතිභා මහානාම හේවා මහතා පෙන්වා දුන්නේය. එක්සත් ජාතීන්ගේ සංවිධානය විසින් පිළිගෙන ඇත්තේ 7,000කට ආසන්න ප්‍රමාණයක් බවත් ඔහු පෙන්වා දුන්නේය. මෙය ත්‍රස්වාදීන්ට එරෙහි යුද්ධයක් බව එක්සත් ජනපදය පිළිගත යුතු බවත්, එබැවින් මෙහිදී ජාත්‍යන්තර මානුෂීය නීතිය මත පදනම් වූ නීති බලපැවැත්විය යුතු බවත් මහාචාර්ය ප්‍රතිභා මහානාම හේවා මහතා තර්ක කළේය. පුද්ගලයන් 11,000ක් පමණ ඝාතනය කරන ලදැයි වරක් ප්‍රකාශ කළ මහාචාර්ය රජීව විජේසිංහ මහතා මෙම අධිකරණය හමුවට කැඳවන මෙන් මහාචාර්ය ප්‍රතිභා මහානාම හේවා මහතා ආරාධනා කළේය. ක්‍රිශාන්ති කුමාරස්වාමි සහ වෙම්මානි වැනි ඝාතන නඩුවල වරදකරුවන්ට නීතිපති දෙපාර්තමේන්තුව විසින් නඩු පවරන සෑම අවස්ථාවකදීම හිටපු නිලධාරීන් සහ නීතිපතිවරයා විසින් මියගිය පුද්ගලයන්ගේ සංඛ්‍යාලේඛන ලබා දීම පිළිබඳව ද ඔහු සඳහන් කළේය.

ජාත්‍යන්තර රතුකුරුස සංවිධානය ජාත්‍යන්තර මානව නීතියේ රීති අංක 97 අනුව මිනිස් පලිහ භාවිතා කිරීම තහනම් කර තිබියදී මිනිස් පලිහ භාවිත කිරීමක් පිළිබඳව අනතුරුව මෙම ශ්‍රාස්ත්‍රඥයා සඳහන් කළේය. එල්.ටී.ටී.ඊ. සංවිධානය සංවිධානය විසින් එම වරද සිදුකර ඇත. අනතුරුව, උගත් පාඩම් හා ප්‍රතිසංධාන කොමිෂන් සභාව වාර්තාවේ IV පරිච්ඡේදයේ සඳහන් ඇමුණුම් පිළිබඳව ඔහු අවධානය යොමු කළේය. ඇමුණුම 4.2 හි ප්‍රකාශ කෙරෙන මානව හිමිකම් කඩ කිරීම්වල අනාවරණය වන පරිදි ශ්‍රී ලංකා ගුවන් හමුදාව පත්‍රිකා බෙදා හැර ඇති අතර "වන්නියේ ජීවත් වන සිවිල් ජනතාව වෙනුවෙන් ආරක්ෂිත කලාපයක් ප්‍රකාශ කර ඇත" යනුවෙන් සඳහන් පත්‍රිකා ශ්‍රී ලංකා පොලීසිය විසින් බෙදා හැර ඇත. ඔවුන් දෙලක්ෂ හැත්තෑ අට දහසක ජනතාවක් මුලතිවු ප්‍රදේශයට යවා ඇත. ජනතාවට පැමිණෙන මෙන් සඳහන් පත්‍රිකා නිකුත් කිරීම යන කාරණයන්ට, ශ්‍රී ලංකා හමුදාවේ අවංකභාවය පිළිබිඹු කරයි. ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ කිසිම අවස්ථාවක ජාත්‍යන්තර මානුෂීය නීතිය උල්ලංගනය කොට නොමැති බව උගත් පාඩම් හා ප්‍රතිසංධාන කොමිෂන් සභාව වාර්තාව ඉතා පරීක්ෂාකාරීව කියවීමේදී පැහැදිලි වන බව මහාචාර්යවරයා තර්ක කළේය.

යුද්ධයේ අවසන් දිනය පිළිබඳව ප්‍රකාශ කෙරෙන, ජාත්‍යන්තර රතුකුරුස සංවිධානය විසින් නිකුත් කොට ඇති රහස්‍ය ලිපියක් පිළිබඳව ද ඔහු කොමිසමේ අවධානය යොමු කළේය.

ආචාර්ය ජෙහාන් පෙරේරා

ශ්‍රී ලංකා ජාතික සාම මණ්ඩලයේ විධායක අධ්‍යක්ෂ

මගේ මුළු සේවා කාලයම කැප කරනු ලැබුවේ ජනවාර්ගික ගැටුමට තිරසාර විසඳුමක් සොයා ගැනීමේ කාර්යය වෙනුවෙන් වන අතර වෙනත් වැඩක් වෙනුවෙන් ගත කරනු ලැබුවේ කෙටි කාලයක්. එය ද සර්වෝදය ව්‍යාපාරය සමග, සමාජ සංවර්ධනය වෙනුවෙනුයි - එනම්, ඇති - නැති පරතරය අඩු කිරීම උදෙසායි. ඉතිං, මගේ සමස්ථ වෘත්තීය ජීවිතයම ගත කළේ සිවිල් සමාජය තුළ සහ ඊට අමතරව 1995 දී මා ජාතික සාම මණ්ඩලයේ ආරම්භකයෙක්. නමුත් මම, ජනවාර්ගික අර්බුධය යන ගැටළුව සම්බන්ධව මගේ වැඩ කටයුතු ආරම්භ කළේ මා විශ්වවිද්‍යාල ශිෂ්‍යයෙකුව සිටින අවදියේදීයි. එක්සත් ජනදයේ සිට මා නැවත පැමිණීමෙන් අනතුරුව කාලසීමාවේදී 1983 ජූලි කැරලි කෝලාහල අත්විඳීමට ලැබුණු අතර ඒ අනුව මට ඒ සම්බන්ධව විශ්ලේෂණයක් ලියා පුවත්පත් පළ කළා, ඒ 1984. ඉතිං 1984 අවුරුද්දේ පටන් මම මේ ගැටළුව ගැන අදහස් ප්‍රකාශ කරනවා.

දැනට පවතින බරපතල ප්‍රශ්නය, ඇත්ත වශයෙන්ම, මේ රට මානව හිමිකම් සම්බන්ධයෙන් සහ සංක්‍රාන්තික යුක්තියේදී පූර්ණ අවධානය යොමු කෙරෙන පශ්චාත් යුධමය සංහිඳියාව පිළිබඳව වගකීම් සහිතව ක්‍රියා කරන බව ජාත්‍යන්තර ප්‍රජාව වෙත ඒත්තු ගැන්වීම වන නමුත්, ඇත්තටම ජනවාර්ගික ගැටුමක් සම්බන්ධව කටයුතු කිරීම දීර්ඝකාලීන ගැටළුවක් කියලා මම විශ්වාස කරනවා. මෙම ගැටළුව විසඳීමට රජයන් ගණනාවක් උත්සාහ ගනු ලැබුවා.

1948 අපි බ්‍රිතාන්‍යයන්ගෙන් නිදහස ලබා ගන්නා විට අපි ආසියාවේ දෙවන ස්ථානයේ පැවති බව කියනවා. අපි දෙවැනි වුණේ ජපානයට විතරයි. ඒත් අපට පිටුපසින් සිටි කොරියාව, මැලේසියාව සහ තායිලන්තය දැන් අපිට වඩා ඉදිරියෙන් සිටිනවා. එය ඉතා කණගාටුදායකයි වගේම උපහාසාත්මකයි. 1948 දී අප දෙවන ස්ථානයේ පසුවන විට අපිව පාලනය කළේ කවුද, බ්‍රිතාන්‍ය ජාතීන්. ඔවුන් අපිව සූරාකෑමට උත්සාහ කළා. ඔවුන් සඳහා කුමන හෝ දෙයක් අපෙන් ලබා ගැනීමට උත්සාහ කළා. ඒකට තමයි ඔවුන් යටත්විජිත පවත්වා ගත්තේ. නමුත් එවන් වාතාවරණයක් යටතේදීත් අපිට දෙවන ස්ථානයේ පවතින්න පුළුවන් වුණා. ඊට පස්සේ බලය අපේ අතට පැමිණියා. දැන් අපි ඒ තරම් හොඳින් කටයුතු කරන්නේම නෑ.

මම විශ්වාස කරන විදියට, ඒකට මූලිකම හේතුව අපේ රට තුළ එකමුතුකම අඩුවීම. ඒක බෙදුණු පවුලක් වගේ. ජන කොටඨාශයන් එකිනෙකාව විශ්වාස කරන්නේ නෑ.

සංක්‍රාන්ති යුක්තිය ගැන විකල්ප දෙකකින් යුතුව ඉදිරිපත් කිරීමක් මට තියෙනවා. ඉන් එකක් සංක්‍රාන්ති යුක්තිය හා පශ්චාත් සංහිඳියා ගැටළුව පිළිබඳව කෙළින්ම කටයුතු කිරීම. අනෙක් විකල්පය වන්නේ අපේ මේ ගැටුමට මූලික හේතුව; මේ රට යුද්ධයකට ගියේ ඇයිද යන්න සොයා බැලීමයි. එය නිදහස ලැබීමෙන් පසු සිද්ධ වූ දෙයක් නොවන බවයි මගේ විශ්වාසය. මෙය ඔබ දැනටමත් දන්නවා ඇති. අපේ රට ගැන අපි කවුරුත් දන්නා දෙයට තරමක වෙනස් අර්ථකථනයක් තමයි මම ඉදිරිපත් කරන්නේ.

අපි සැවොම එක වගේ වුනත්, මේ තරම්ම බෙදී සිටින්නේ ඇයිද කියන එක පෙන්වන පින්තූරයකින් මම මෙය ආරම්භ කරන්නම්. මේකෙ සිංහල අය කවුද, දෙමළ අය කවුද, මුස්ලිම් අය කවුද කියලා කියන්න හුඟක් අමාරුයි. කොතරම් ප්‍රචණ්ඩ තත්ත්වයන් තිබුණත් ඇත්ත වශයෙන්ම අපේ රට තුළ බැඳීමක් තවමත් තියෙනවා, මට අමතක නොවන සිද්ධියක් තමයි මම එක් වරක් යුද්ධ කලාපයට ගියා, එක් වරක් විතරක් නොවෙයි, හුඟාක් කැඩිබිඳී විනාශ වූ තැනකට, හමුදාව යුද්ධ කරමින් හිටියා, එම ජනතාව අවතැන් වෙලා හිටියේ, සොල්දාදුවෝ ඇවිත් හිටියා, සිවිල් වැසියන් මැරිලා, දෙමව්පියන් මැරිලා, ඒත් අපි එහෙ ගියාම ඔවුන්ගේ දරුවන් අප වෙත දුවගෙන ආවා. ඔවුන් දන්නවා අපි ආවේ පිට පළාතකින් කියලා, ඔවුන් හොඳටම දන්නවා අපි සිංහල කියලා, අපිට දෙමළ භාෂාව කථා කරන්න බෑ, ඔවුන් මට කිවුවා, ඔවුන්ගේ දෙමාපියන් සිංහලයන්ට වෛර කරන්න කියලා ඔවුන්ට ඉගැන්නුවේ නැති බව. ප්‍රශ්නයක් තිබ්බා. මම අදහස් කරන්නේ යුද්ධයක් තිබුණා.

දැන් ශ්‍රී ලංකාවේ පවතින ප්‍රධානම කරුණ වන්නේ වාර්ගික අනාරක්ෂිතභාවයයි. ඇත්තටම, එය සිංහල සමාජය තුළ ඉතා ශක්තිමත්ව මුල් බැසගෙන, සිංහල, බෞද්ධයින්ගේ මනස මහා වංශයේ සඳහන් ඉතිහාසය විසින් මැනවින් හැඩගස්වා තිබෙනවා. ඒක හරියටම සිංහලයන්ට ශුද්ධ වූ ඉතිහාසයක් වගේ වන අතර එය ආරම්භ වන්නේ බුදුරජාණන් වහන්සේගේ පරිනිර්වාණයත් සමගයි. ඒ වෙලාවේ උන් වහන්සේ දෙවියන් කැඳවලා 'මේ වෙලාවේ ඉන්දියාවේ රාජ කුමාරයෙක් ලංකාව වෙත ගමන් කරනවා. ඔහු සිංහල ජාතිය ඇති කරනවා. එම සිංහල ජාතිය මගේ ධර්මය ආරක්ෂාකර ගන්නවා. ඔවුන් මේ දහම වසර පන්දහසක් පුරා ආරක්ෂා වී පවතිනවා' යනුවෙන් පවසා තියෙනවා. ඉන්දියාවේ පවතින බුදුදහම වැළලී යන බව එකල සිටි ඉතිහාසඥයින් පැවසූ බැවින් ඒ ඉරණම පිළිබඳ හැඟීම සිංහලයන් තුළ තියෙනවා. ඉතින්, ඉන්දියාවෙන් පැමිණි ස්වාමීන් වහන්සේලාට උවමනා වුණා ආගම සජීවීව පවත්වාගත හැකි ආකාරයේ, දීර්ඝ කාලයක් පවත්වාගෙන යන්න පුළුවන් විදියේ වෘත්තාන්ත කථාවක් නිර්මාණය කරන්න. අවුරුදු එක් දහස් පන්සීයකටත් පෙර ලියපු දෙයකින් අදටත් මේ රටේ මිනිස්සු අභිප්‍රේරණය වෙනවා. ඉතිං, සිංහල මිනිස්සුන්ගේ හැඟීමක් තියෙනවා මේ රට බුදුරජාණන් වහන්සේ දීපු බෞද්ධ රටක් කියලා.

ඉතිං දෙමළ මිනිස්සු ගත්තොත්, අනෙක් අතට, ඒගොල්ලන්ට මේ තත්ත්වය මීට තරමක් වෙනස්. දෙමළ කියන්නේ සුළු ජාතියට. ජනගහනයෙන් සියයට 12ක් විතරයි, ඔබ උතුරට ගියොත්, ඔබ යාපනය ගියොත්, ඔවුන් සියල්ලෝම දෙමළ. ඔවුන්ට තේරෙන්නේ නෑ ඔවුන් සුළුතරය කියලා, ඇත්තටම උතුරේ හා නැගෙනහිර සියයට 65ක් ද්‍රවිඩ. ඉතින් ද්‍රවිඩ ජනතාව සුළුතරය වුවත්, ඒ සංස්කෘතියේ ඔවුන් විශාල බහුතරය වී ඇති බව ඔවුන් හිතනවා. ඉතින් ඔවුනට මුස්ලිම් ප්‍රජාවට වගේ සුළුතරය කියන හැඟීම එන්නේ නෑ.

අනෙක් අතට මුස්ලිම් ප්‍රජාව සැළකුවොත් ඔවුන් සෑමතැනම ඉන්නවා, ඔවුන් අනෙකුත් ප්‍රජාවන් සමග එක්ව වාසය කරනවා. ඔවුන් සාමාන්‍යයෙන් සෑම තැනම සුළුතරය. ඉතින් ඔවුනට ද්‍රවිඩ ප්‍රජාවට දැනෙන ජාතිකත්වය යන හැඟීම දැනෙන්නේ නෑ.

තවද, ඔවුනට ද්‍රවිඩ ජනයාගේ සවිඥානකතාවය කියන දේ තියෙනවා. ඔවුන්ගේ සවිඥානකතාවය කියලා කියන්නේ ඔවුන් තමා එක් අවස්ථාවක ප්‍රධාන ප්‍රජාව තුළ එනම්, සුළුතරයට අයත් නොවන ස්වභාවය සවිඥානිකව දකිනවා. ඔවුන්ද සිංහලයන් මෙන්ම ප්‍රධාන ප්‍රජාවක් ද්‍රවිඩ ලේඛනවල ඔබට හමුවෙනවා, ඔවුන් කියනවා මේ රටේ ජාතීන් දෙකක් වාසය කරන බව. සිංහල හා ද්‍රවිඩ, ඔවුන් ප්‍රමාණය කොතරම් වුවත්, එය නොසළකා, සමාන බව පවසනවා. එක්සත් ජාතීන්ගේ සංවිධානය තුළ මහා ජාතීන් ඉන්නවා. සුළු ජාතීන් ඉන්නවා. නමුත් ඒ සියලු දෙනාම එක සමානයි. ඒ වාගේම ශ්‍රී ලංකාවේත් මහා ජාතීන් සහ සුළු ජාතීන් සමානයි. මේ තමයි ද්‍රවිඩ ජනතාවගේ මනෝභාවය (psychology).

දෙමළ ඩයස්පෝරාව ඉතා බලවත්. ඔවුන් රට හැර ගොස් ඇත්තේ ඔවුනට එසේ කිරීමට සිදු වූ බැවින්. ඔවුන් සාර්ථක්වයන්ට පත්වෙලා, ඔවුන් තුළ කේන්තියක් තියෙනවා, ඒ වගේම ඔවුන් ඩයස්පෝරාවේ ඉන්නකොට සමහර වේලාවට ඔවුන් කාටවත් අයිති නෑ වගේ වුණාට, මේ ගැටළුව ගැන උද්ඝෝෂණ කරනවා නම්, ඒ රටවල අදාළ ඉහළම රාජ්‍ය නිලධාරීන් හමුවෙන්න ඔවුනට හැකියාව තිබෙනවා.ඔවුනට වැදගත් යැයි හැඟෙනවා. ඒකත් එතන තියෙනවා, ඒ වගේම ඔවුන්ගේ ජාතිකත්වය පිළිබඳ හැඟීම. ආපසු සියරට පැමිණි පුද්ගලයන්ට වඩා ඩයස්පෝරාවේ පුද්ගලයන් ජාතිකවාදී බව සෑමවිටම කියනවා. ඔවුන් වෙනස් වෙන්නේත් නෑ. ඔවුන්ට තියෙන මනෝභාවය රට හැර යන අවස්ථාවේ දී පැවතුණු මනෝභාවය. ඉතිං "දෙමළ ඩයස්පෝරාව හරි ප්‍රබලයි. ඔවුන් දිනා නොගෙන ඔබට මෙහි සාර්ථක විසඳුමක් ලබාගත නොහැකියි" යනුවෙන් ඊට අනතුරු ඇඟවිය යුතුයි. ඒ වගේම දැන් ඔවුන්ට සම්පත් ගොඩක් තියෙනවා. ඔවුන් හොඳින් කටයුතු කරලා තියෙනවා. කණගාටුවට කරුණ නම් අපේ රට සංවර්ධනය කිරීම සඳහා දෙමළ ඩයස්පෝරාවේ සම්පත් යොදා ගැනීමට නොහැකි වීමයි.

ඊට පස්සේ අපි බලමු මුස්ලිම්වරු දෙස - නැගෙනහිර ජනගහනයෙන් සියයට 40ක්, ඔවුන් ද වින්දිතයන් බවට පත් වී තියෙනවා. සුළු ජාතීන් වශයෙන් මුස්ලිම් මෙන්ම ද්‍රවිඩ ප්‍රජාවන්ට පොදු සංවේදනයක් තියෙනවා. ඔවුන් දෙකොට්ඨාසයම වෙනස්කොට සැලකීමට භාජනය වෙනවා. ඔවුන් අසාධාරණයට ලක්වෙනවා යැයි ඔවුන්ට සිතෙන සිතුවිල්ල ඔවුන් තුළ ඇති කරන්නේත් රජයන්මයි. මක්නිසාද රජයේ නායකත්වය ගනු ලබන්නේත් මහජාතීන් විසින්මයි. ඇත්තටම, ඉතිං මෑත කාලයේදීත් කැරලි තිබිලා තියෙනවා. ඒත් අනෙක් අතට මුස්ලිම් ජනගහනය වැඩිවෙමින් තියෙනවා. සිංහල ප්‍රජාව තුළ බියක් තියෙනවා, මොකද, අනෙක් රටවල සිදු වී ඇති දේවල් පිළිබඳව සිංහල ප්‍රජාව සිතනවා, ප්‍රචාරයන්ට ඔවුන් තුළ බියක් නිර්මාණය කළ හැකියි. පාකිස්ථානයේ හා ඇෆ්ගනිස්ථානයේ සිදු වී ඇත්තේ කුමක්ද, එක්තරා කාලයක ඔවුන් බෞද්ධයින්. දැන් ඔවුන් මුස්ලිම්. ඒ දේම මෙහෙන් වෙන්න පුළුවන් කියලා ඔවුන් හිතනවා. ඉතිං සිංහලයන් තුළ ඒ භීතිය තියෙනවා. තවත් කෙනෙකුට හානි කිරීම හුදෙක් ප්‍රචණ්ඩත්වයම නොවේ. නමුත් බොහෝ විට අප ප්‍රචණ්ඩ වන්නේ සහ ප්‍රතිරෝධය දක්වන්නේ අප බිය වූ විටයි.

ඉතින්, අපට නැවත සහතිකයන් ලැබිය යුතුයි සහ ඒ නිසාමයි මමත් සිතන්නේ සහ මේ අවස්ථාවේදී පැත්තකට වී සිටින්නේ, එක අතකට මේ වේලාව බවයි. මේක හොඳ අවස්ථාවක්. කවදාවත් හොඳම කාලය තියෙන්නේ නෑ. මම අදහස් කරන්නේ නව අවස්ථාවක් උදාවෙන්න පුළුවන්, ඒත් විසඳුමකට එන්න පුළුවන් හොඳ අවස්ථාවක් මේක, මොකද බහුතර සිංහල ප්‍රජාව සත්‍ය වශයෙන්ම විශ්වාස කරන දේශපාලන නායකත්වයක් අපට තියෙනවා. බහුතර සිංහල බෞද්ධ ප්‍රජාව විශේෂයෙන්ම මෙම නායකත්වය විශ්වාස කරනවා. ඒ ඔවුන් සටන්කොට යුද්ධය ජයගත් ආකාරය නිසා සහ ඔවුන් ජනතාවගේ සහ බෞද්ධ භික්ෂූන්ගේ චින්තනයට සමීප වීම හේතුවෙන්. එබැවින් සත්‍ය වශයෙන්ම සාර්ථක්වයක් සහ වෙනසක් ළඟාකර ගතහැකි වේලාව මෙයයි. දැන් දේශපාලන මූලයන් පිළිබඳව සළකා බැලුවොත් මම දැනටමත් එය ප්‍රකාශ කර තියෙනවා. මධ්‍යම පාර්ලිමේන්තුවට බලය කේන්ද්‍රගත කරන ඒකීය රාජ්‍ය සහ අපට තියෙන්නේ

බහුතරය පාලනය කිරීමේ ක්‍රමයක්. මම අදහස් කරන්නේ ප්‍රජාතාන්ත්‍රවාදය. අපට ප්‍රජාතාන්ත්‍රවාදය කියන්නේ ඡන්දය පැවැත්වීම සහ ඉන් පසුව බහුතරය ලබාගන්නා පක්ෂය විසින් පාලනය සිදු කිරීමයි. දැන්, සමාජයක් වාර්ගිකව බෙදුනොත් ඔබට කොපමණ මැතිවරණ පැවැත්වූවත්, බහුතරය පවතින ජනවර්ගය දිනනවා සහ කොපමණ මැතිරණ පැවැත්වූවත් බලය බෙදා ගැනීම සඳහා වෙනත් ක්‍රමයක් නොතිබුණ හොත්, බහුතරය වන ජනවර්ගය තමයි තීරණ ගන්නේ.

1936 තරම් ඈත අතීතයේ දී පවා මෙය පැවතුනේ කෙසේද යන්න පිළිබඳව කුතුහල දනවන උදාහරණයකින් ඉදිරිපත් කරන්න මම කැමතියි. ඒ කාලයේ තිබුණු ව්‍යවස්ථාවට කිව්වේ ඩොනමෝර් ව්‍යවස්ථාව කියලා. ඒ කාලයේ ඒක ක්‍රියාත්මක වුණේ මම හිතන්නේ ව්‍යවස්ථාදායකය සඳහා තෝරා පත්කර ගන්නා ලද සාමාජිකයන් 49 දෙනෙකුගෙන්. ඒවා හත් දෙනෙකුගෙන් යුතු කමිටුවලට බෙදා තිබුණා. කමිටුවේ මන්ත්‍රීවරුන් හත්දෙනා විසින් තෝරා පත්කර ගනු ලබන එක් අයෙක් කමිටුවේ නායකයා වුණා. ඔවුන් කමිටුවේ සිටිනා විට, එම කමිටුවේ මන්ත්‍රීවරු හත් දෙනාගෙන් එක් පුද්ගලයෙකු ඇමතිවරයා ලෙස තෝරා පත්කර ගත්තා. ඉතින්, ඒ වෙලාවේ මෙන්න මේ ප්‍රශ්නය ඇතිවුණා. සිංහල හා දෙමළ පුද්ගලයින් අතර ඒ වන විටත් වෙනසක සළකුණු පෙනෙන්නට තිබුණි. මක්නිසාද, සිංහලයින්ට ඉක්මනින්ම නිදහස ලබා ගන්න ඕනේ වුණා. ද්‍රවිඩයින්ට එතරම් අවශ්‍යතාවයක් තිබුණේ නෑ, මොකද, නිදහස ලැබුනොත් වෙන්නේ මොකක්ද කියන දේ දෙමළ ජනයාට පේන්න තිබුණා. ඔවුන් සුළු ජාතියක් බවට පත් වෙයි. ඔවුන් ඉතා හොඳින් කටයුතු කරයි. ඔවුන් සංඛ්‍යාත්මකව සිංහලයන් හා සමාන විය යුතුයි. රට පාලනය කළේ බ්‍රිතාන්‍යයින්, ඔවුන් ඒ ක්‍රමයට කැමතියි. ඔවුන්ට නිදහස ලබා ගැනීමට එතරම් අවශ්‍යතාවයක් තිබුණේ නෑ. ඒත් සිංහලයන්ට ඉක්මනින් නිදහස ලබා ගැනීමට අවශ්‍ය වුණා. සිංහලයන්ට බ්‍රිතාන්‍යයන් සමග සාකච්ඡා කිරීම අවශ්‍ය වුණා. ද්‍රවිඩයන් සිය අරමුණු විනාශකර දමනු ඇතැයි සිංහලයන්ට හැඟීමක් ඇති වුණා.

ඉතින් ඔවුන් කළේ කුමක්ද, ඒ කාලයේ සියයට 65ක් සිංහලයන් වුණත් සියයට 35ක් සුළු ජාතික පිරිස, ඔවුන් කමිටුව සකස් කළේ එක් කමිටුවකට අවම වශයෙන් සිංහලයන් හතර දෙනෙකුවත් සිටින පරිදියි. අනතුරුව ඔවුන් සිංහලයකුම ඇමතිවරයා ලෙස තෝරා පත්කර ගත්තා. ඉතිං, ඇමතිවරු හත්දෙනයි - ඔක්කොමලා සිංහල. ඒකට කීවේ 1936 සර්ව-සිංහල අමාත්‍යාංශය කියලා. ඊලමක් හෝ ඒ වගේ දෙයක් තිබුණේ නෑ. එවිට ජී.ජී. පොන්නම්බලම් විසින් මෙම ඉල්ලීම සිදු කළා. අපට තවම මතකයි. ඔහු බ්‍රිතාන්‍යයන් වෙත ගිහිල්ලා 50:50 කීවා, මක්නිසාද ඔහු මේ ප්‍රශ්නයට ප්‍රතික්‍රියා දැක්වූවා. සිංහලයන් හට සියයට 50කුත්, අනෙකුත් සියලුම සුළු ජාතීන්ට සියයට 50කුත් ඕනෑ යැයි ඔහු පැවසුවා. ඔහු ද්‍රවිඩයන් වෙනුවෙන් සියයට 50ක් ඉල්ලුවේ නෑ. ඔහු ඉල්ලුවේ සියලුම සුළු ජාතීන් වෙනුවෙන් සියයට පනහක්.

බ්‍රිතාන්‍යයන් 'බෑ' අපිට බහුතරයක් කෘතිම වශයෙන් සුළුතරයක් බවට පත් කිරීමට නොහැකියි. ඒ වෙනුවට අපි ඔබට නිදහස ලබා දෙන විට අපි ඔබට අයිතිවාසිකම් පනතක් - Bill of Right ලබා දෙන්නම්. ව්‍යවස්ථාවෙන් අපි මේක ඉවරයක් කරනවා. එවිට වෙනස්කොට සැලකීමක් සිදුවන්නේ නෑ. උදාහරණයක් ලෙස 29 වන වගන්තියේ සඳහන් වෙනවා. "ඔබට එක්ප්‍රජාවක් සම්බන්ධයෙන් එක් ආකාරයකටත්, තවත් ප්‍රජාවක් සම්බන්ධයෙන් වෙනස් ආකාරයකටත් කටයුතු කළ නොහැකියි. ඔබට එක් අයෙකු ආරක්ෂා කිරීමටත් තවත් අයෙකුට වෙනස් කොට සැලකීමටත් නොහැකියි. මිනිසුන් පාඩම් ඉගෙන ගන්නා තුරු සහ ඔවුන් ඒ වෙනුවෙන් ක්‍රියාත්මක වන තුරු මේ ආරක්ෂාව ක්‍රියාත්මක වෙන්නේ නෑ. ඉතින් ශ්‍රී ලංකාව සම්බන්ධයෙන් බ්‍රිතාන්‍යයන් විසින් සුළු ජාතීන් පිළිබඳව කෝටාවක් ලබා දුන්නේ නෑ. ඔවුන් පැවසුවේ 'නෑ', ඒ වෙනුවට ඔබලා නීතිය මගින් ආරක්ෂා කෙරෙනු ඇති", ඒ අයිතිවාසිකම් පනතක් මගින්.

අප 1998 නිදහස ලබාගෙන බොහෝ කලකට පසුව නිදහස ලබාගත් සයිප්‍රසයේ - සයිප්‍රසය නිදහස ලබා ගත්තේ 1960 - ශ්‍රී ලංකාවේදී ප්‍රතික්ෂේප කරනු ලැබුවත් සයිප්‍රසයේ දී බ්‍රිතාන්‍යයන් විසින් ඔවුනට කෝටා ක්‍රමයක් ලබා දුන්නා. සයිප්‍රසයේ සියලු දේට සියයට 80ක ප්‍රතිශතයක් ග්‍රීක්වරුන්ට සහ සියයට 20ක ප්‍රතිශතයක් තුර්කිවරුන්ට වශයෙන් සියලු දේ සමානුපාතිකව බෙදුවා. ඔවුන් සිදුකළ අනුපාතය 60:40ක්. සාමාන්‍යයෙන් එය 80:20ක් විය යුතුයි. ඔවුන් ලබා දුන්නේ 60:40ක් සහ උප ජනාධිපති තුර්කි ජාතිකයෙකු විය යුතු බවට වන ක්‍රමයක්ද ලබා දුන්නා. බලය බෙදීම සඳහා ක්‍රමයක් ලබාදීමට උත්සාහ කළත් එය ක්‍රියාත්මක වූයේ නෑ. අවසානයේදී ග්‍රීක්වරුන් තුර්කි ජාතිකයින්ට වෙනස්කොට සැලකීමට පටන් ගත්තා. ගැටුම පුපුරා ගියා. අවසානයේ සිදුවුණේ තුර්කි ජාතිකයන් ඉදිරිපත් වී රට දෙකට බෙදනු ලැබීමයි. මෙහි ගතයුතු කාරණය වන්නේ රටක් පරිණත වන තුරුඑම ක්‍රමය ක්‍රියා නොකරන බවයි. ශ්‍රී ලංකාවට කෝටා ක්‍රමයක් නොදුන් අතර ලබාදුන් ක්‍රමය සාර්ථක වුණේ නෑ. සයිප්‍රසයට කෝටා ක්‍රමයක් ලබා දෙනු ලැබුවද, ඔවුන් ඒ සඳහා සූදානම්ව නොසිටි බැවින් එම ක්‍රමය සාර්ථක වුණේ නෑ. මට මේක අධ්‍යයනය කිරීමට අවශ්‍ය වුණේ නෑ. නමුත් ද්‍රවිඩ පුද්ගලයන් මෙවන් උදාහරණ සොයාගත්තා. මෙම ඇතැම් කරුණු අපි පුරවැසි පනත පිළිබඳව සිතන්න යොමු කරනවා.

මෙම තත්ත්වය තවදුරටත් පවතිනවා. මේ සියල්ල නිවැරදි කර තිබෙනවා. නමුත් තත්ත්වය තවදුරටත් පවතී. පුරවැසි පනත - ඉන්දියානු සම්භවයක් සහිත ද්‍රවිඩ පුද්ගලයන් තමයි තවමත් ඉතාම දුප්පත්. සිංහල පමණක්ය යන පනත - ඒක නිසි ලෙස ක්‍රියාත්මක වුණේ නෑ. ඉතින් දම්ළයන් තවමත් ලිපි ලේඛන ලබන්නේ සිංහල භාෂාවෙන්. එසේම එය අනෙක් අතටත් සිදු වෙනවා. ඒ අනුව බලපුවාම උතුරු පළාත් සභාවේ සිංහල සුළුතරය දෙමළ මාධ්‍යයෙන් ලිපි ලබනවා. ඒ මොකද කියනවා නම් අපි අනෙක් අය පිළිබඳව සංවේදී වෙලා සුළුතර ජනතාවගේ අයිතිවාසිකම් වලට ගරු කරන සංස්කෘතියක් අපට නෑ, මම හිතන්නේ ඔබ දන්නවා ඉස්සර සිවිල් සේවාවේ දමිළ පුද්ගලයන් රාශියක් හිටියා. නමුත් දැන් තත්ත්වය වෙනස්. විශ්වවිද්‍යාල ප්‍රවේශයේදී තවමත් කෝටා ක්‍රමයක් තියෙනවා. තවමත් අප රට තුළ කෝටා ක්‍රමයක් තියෙනවා. මම දැක්කා සමීක්ෂණයන් සිදු කරපු අවස්ථාවන්. එහි සඳහන් ආකාරයට යාපනයේ සහ උතුරු හා නැගෙනහිර පළාත්වල විශ්වවිද්‍යාල අධ්‍යාපනයක් පවතින්නේ දුර්වල මට්ටමක. ඒ කාලේ ඔවුන් එය ඉතා හොඳින් සිදු කරනු ලැබුවා. ඒ නිසා තමයි කෝටා ක්‍රමය හඳුන්වා දෙනු ලැබුවේ, මක් නිසාද ඒක සොයා ගනු ලැබුවේ - ඒක සොයා ගත්තේ 70 දශකයේදී, මොකද ඉංජිනේරු, වෛද්‍ය, විද්‍යා වැනි හොඳ රැකියා ලැබෙන පීඨවල සියයට 30-50 වගේ ප්‍රතිශතයක් නියෝජනය කළේ ද්‍රවිඩ සිසුන්. එතකොට එකල සිටි රජය සිදු කළේ සිංහල සිසුන් සඳහාද එවන් පහසුකම් සහිත විද්‍යාල වැඩිදියුණු කරනවා වෙනුවට කෝටා ක්‍රමයක් - ප්‍රමිතකරණය කිරීමට තීරණය කිරීමයි. ඉතින් ඒ තත්ත්වය තවමත් ක්‍රියාත්මක වෙනවා. තවමත් දිස්ත්‍රික්ක කෝටා ක්‍රමය ක්‍රියාත්මක වෙනවා. ඒක තවම නැතිවෙලා නෑ. ඉතින්, මේ තත්ත්වයන් තුළ තමයි අපට ක්‍රියා කරන්න වෙලා තියෙන්නේ. ඉතින් මේ දේවල් තමයි රට බෙදීමේ යෝජනාවක් දක්වා දම්ළ පුද්ගලයන් නැගී සිටීමකට පෙළඹවනු ලැබුවේ, මම කියන්නේ නෑ සියලුම ද්‍රවිඩ වැසියන්ට එල්.ටී.ටී.ඊ. සංවිධානයට උදවු කිරීමට හෝ රට බෙදීමට අවශ්‍ය වුණා කියලා. සියල්ලන්ටම දැනුනා ඔවුනට වෙනස්කොට සළකනවා - කොන් කරනවා කියලා. උදාහරණයක් ලෙස 72 ව්‍යවස්ථාව හඳන වේලාවේ ආචාර්ය කොල්වින් ආර් ද සිල්වා මහත්මයා මේක අතෑරලා දැම්මා.

දෙමළ පාර්ශවයන් ඇවිත් ඔවුන්ගේ අදහස් ඉදිරිපත් කිරීම් කරනකොට ඔවුන් මෙයට අවධානය යොමු කළේ නෑ. ඒක සළකා බැලීම ඔවුන් ප්‍රතික්ෂේප කළා. මක්නිසාදයත් ඔවුන්ගේ මනස පැලපදියම් වෙලා තිබුණු කරුණ වුණේ; 'අපිට ශක්තිමත් මධ්‍යම ආණ්ඩුවක් තිබිය යුතුයි. තේරී පත්වුණු දේශපාලනඥයින් පාලනය භාරගත යුතු වන අතර රජය ආර්ථිකය පාලනය කළ යුතුයි'. මේක තමයි ඔවුන්ගේ දැක්ම, අනෙක් අතට දමිළ දේශපාලන පක්ෂ හිතනවා 'අපිට ස්වයං

පාලනයක් අවශ්‍යයි. විමධ්‍යගතකරණයට එහා ගිය අපිට අපේ ප්‍රදේශ පාලනය කිරීම සඳහා යම් ක්‍රමයක් අවශ්‍යයි'. දමිළ දේශපාලන පක්ෂ ඉදිරිපත් කරන ලද අදහස් සළකා බැලීමක්වත් සිදු නොකළ අතර ව්‍යවස්ථා සම්පාදන ක්‍රියාවලියේදී සාකච්ඡාවට බඳුන් කෙරුණේත් නෑ. 78 ව්‍යවස්ථාවද ද්‍රවිඩ දේශපාලන පක්ෂ සමග සාකච්ඡා කළේ නෑ. ඒ රජයට 5:6 ක බහුතරයක් පැවතුණා. ඔවුන් ඔවුන්ට ඕනේ දේ කළා.

ඉතින් මට ඔබ හමුවේ ප්‍රකාශ කරන්න ඕනේ වුණේ මේ පසුබිම තමයි. ඒ වගේම සමහරවිට ඔබ දැකීමට අකමැති ලියවිල්ලකුත් මා ළඟ තියෙනවා - ඒ මේ ප්‍රශ්නයට මුහුණ දෙන්න එස්.ඩබ්ලිව්.ආර්.ඩී. බණ්ඩාරනායකගේ පටන් බලයට පත් වූ රජයන් මේ ප්‍රශ්නයට මුහුණ දෙන්න ගත් සියලු උත්සාහයන් ගැන එස්.ඩබ්ලිව්.ආර්.ඩී. බණ්ඩාරනායක ගත්තම - මූලික වශයෙන්ම මම කියන්නේ ප්‍රශ්න දෙකක් තිබුණා. මේවා තමයි ඒ ප්‍රශ්න දෙක සහ ඒවා අදටත් අඛණ්ඩව පවතිනවා. පළමුවෙනි ප්‍රශ්නය තමයි ප්‍රාදේශීයව පවතින ස්වයං පාලනය, මක්නිසාද සියයට 75ක බහුතරයක් සිටින විට ඔබ කොහොමද සහතික වෙන්නේ. සුළුතරයට තීරණගන්න පුළුවන් කියලා. වඩාත්ම සරළ මාර්ගය තමයි බලය බෙදා හැරීම. බලය බෙදුවොත් සහ ප්‍රාදේශීය රජයන් ඇති කළොත්; උදාහරණයක් වශයෙන් උතුරේ, ද්‍රවිඩ පාලනයක් සහිත රජයක් තියෙයි. නැගෙනහිර, ද්‍රවිඩ, මුස්ලිම් හා සිංහල එක්තරා ආකාරයක සංයෝජනයක් පවතීවි. ඒක ඒ ආකාරයට වෙයි. යෝජනා කරලා තියෙන විසඳුම් සියල්ලම සළකා බැලුවොත්, එම ප්‍රදේශවලට ස්වයං පාලනය වගේ විසඳුමක් දෙන්න පළාත් හෝ ප්‍රාදේශීය වශයෙන් ස්වයං පාලනය පිළිබඳ අදහසක් තමයි තියෙන්නේ. බණ්ඩාරනායක චෙල්වනායගම් ගිවිසුමෙන් ඇත්තටම දිස්ත්‍රික්ක ඒකාබද්ධ කිරීමට අවසර ලබා දී තියෙනවා. ඉතිං ඒක ඇත්තටම උතුරු පළාතට වඩා විශාල වන අතරම ඒකාබද්ධ වීමේ හැකියාවක් ඇතිවීම දමිළ ජනතාවට වැදගත්, නමුත් එය සිංහල ජනතාවගේ අප්‍රසාදයට හේතු වෙනවා. මොකද බලය බෙදීම සිදු කළහොත්, උතුරු පළාතට බලය ලබා දුන්නොත් සහ නැගෙනහිර පළාත තව තවත් බලතල ඉල්ලලා අන්තිමට වෙන් වෙන්නත් උත්සාහ කරයි කියලා සිංහල ජනතාව කනස්සල්ලට පත් වෙනවා. ඒ බිය එතැන තියෙනවා. උතුරු නැගෙනහිර එකතු වුණොත් ඒ බිය තවත් වැඩි වෙනවා. ඉතින්, ද්‍රවිඩ ජනතාවට ඒක වුවමනා කරනවා. මම දැක්කා දෙමළ ජාතික සන්ධානය ඉල්ලා සිටිනවා උතුරු - නැගෙනහිර ඒකාබද්ධ කරන්න කියලා. එය මේ මොහොතේ වඩාත්ම සුදුසු දෙය කියලා මම හිතන්නේ නෑ. සමහර විට එය නුවණට හුරු නෑ.

ඔබ අපට වෙනස් ආකාරයක දැක්මක් ඉදිරිපත් කරනවා. අපේ රටේ ඉතිහාසයේ පරිවර්තනීය සාධක කීපයක් තමයි ඔබ ඉදිරිපත් කළේ. ඔබගේ සාක්ෂිය තවදුරටත් ඉදිරිපත් කරන්න.

මම ලියවිල්ලක් සකස් කරනවා. එය ඔබ සමග බෙදා ගන්න බලාපොරොත්තු වෙනවා. මම එය ඔබට ලබා දෙන්නම්. ඒ දේශපාලන විසඳුමකින් එකඟතාවයකට පැමිණීමට උත්සාහ කළ සියලු ම අනුප්‍රාප්තීය රජයන් පිළිබඳව, පළමුව එස්.ඩබ්ලිව්.ආර්.ඩී. බණ්ඩාරනායක. මම කීව වගේ, එක් මූලික අංගයක් වුණේ ප්‍රාදේශීය ස්වයං පාලනය නැතහොත් බලය බෙදීම. ඔහුගෙන් පස්සේ ඩඩ්ලි සේනානායකත් ඒකම අනුගමනය කළා. ඔහු දිස්ත්‍රික්ක සභා ක්‍රමය පිළිබඳ අදහස දැරුවා. ඊට පස්සේ ජේ.ආර්. ජයවර්ධන. අනතුරුව ප්‍රේමදාස ජනාධිපතිතුමා, අනෝන්‍ය එකඟතාවයකට එන්න උත්සාහ කළා. චන්ද්‍රිකා බණ්ඩාරනායක උත්සාහ කළා. ඔවුන් ගොඩාක් උත්සාහ කළා. ඔවුන් සියල්ලටම අදහස තිබ්බා. නමුත් බැරි වුණා. ඒ සියල්ලෙහිම ප්‍රධාන අංග දෙක වුණේ සීමිත ස්වයං පාලනයක් මිස නිදහස් රටක් නොවේ. නමුත් එක්සත් රටක් කියන රාමුව ඇතුළේ. දෙවැනි එක භාෂාව. භාෂාව කියන දෙය අතිශය වැදගත්. දෙවනුව වඩාත්ම වැදගත්වන පැතිකඩ තමයි එය. දෙමළ භාෂාවට වඩා හොඳ තැනක් ලබාදිය යුතුයි. මම ඒ ඔස්සේ යන්නේ නෑ. මම දැන් සංක්‍රාන්තික යුක්තිය පිළිබඳ ගැටළුව ගැන කථා කරන්නම්.

ඉතින් මම කීවා වගේ අපට ගැටළු දෙකක් ගැන අවධානය යොමු කරන්න අවශ්‍යයි. එකක් අපට වර්තමානයේ තියෙන ප්‍රශ්නය. දීර්ඝ කාලීන ප්‍රශ්නය. මම කීව 77 - දශකයක් කරා දිවෙන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධන ගැටළුව. 30 අවුරුදු යුද්ධයට හේතු වූ ගැටළුවලට පිළියම් පිණිස බටහිර ලෝකයත් GSP+ වලිනුත් අපේක්ෂා කරන්නේ මෙයයි. ඒ තමයි සංක්‍රාන්ති යුක්තිය. මේකෙනුත් අදහස් කරන්නේ මොකක්ද කියලා මම කියන්නම්. සංක්‍රාන්තික යුක්තිය යන්නෙහි පාරිභාෂිකය මේ විදියයි. ඒක සංක්‍රාන්තික කාලසීමාවක්. රටවල් යුද අවස්ථා, ප්‍රචණ්ඩත්වය, මානව හිමිකම් කඩ කිරීම්වල සිට සාමය, තිරසර මානව හිමිකම් දක්වා සංක්‍රාන්ති වෙනවා සහ ඒ වගේම එකී කඩකිරීම් විශාල වශයෙන් සිදුවුණා නම් මානව හිමිකම් කඩවීම් ගැන කටයුතු කරන්න විශේෂ පියවර ගන්න වෙනවා. ඉතින් යම් රටක් යුද්ධයෙන් හෝ ඒකාධිපති පාලනයෙන් සංක්‍රාන්ති වෙමින් සාමය සහ ප්‍රජාතන්ත්‍රවාදයට අවතීර්ණ වීමේ දී පෙර වැරදි හඳුනාගෙන නිවැරදිකර ගැනීමටත්, විශාල වශයෙන් සිදුවූ මානව හිමිකම් කඩකිරීම ප්‍රත්‍යාගමනය කිරීම කටයුතු කිරීම සංක්‍රාන්ති යුක්තියේදී සිදුවනවා. සංක්‍රාන්ති යුක්තිය කියලා හඳුන්වන්නේ ඒක.

එක එක සංක්‍රාන්තික යුක්ති සාධක හතරක් එනම්, කුළුණු හතරක් මත රඳා පවතිනවා. ඉන් පළමුවැන්න සත්‍යය - ඔබ සත්‍යය පිළිගත යුතුයි. ඔබ සත්‍යයෙන් ආරම්භ කළ යුතුයි. ඊට පස්සේ වගවීම නැත්නම් නඩු පැවරීම යම් හෙයකින් වැරදි සිදුවෙලා තියෙනවා නම් ඒ වැරදි මොනවද කියලා ඔබ සොයාගත යුතුයි. එසේම ඔබට ඒ සඳහා දඬුවම් තිබිය යුතුයි. තුන්වැන්න හානිපූරණය- පෙර තිබූ තත්ත්වයට නැවත පත්වීම. පුද්ගලයන් යම් හෙයකින් අයහපත් දේ සිදුවී ඇත්නම් හැකි උපරිම ආකාරයෙන් ඒ හානිය පූර්ණය කළ යුතුයි සහ හතරවැන්න ආයතනික ප්‍රතිසංස්කරණ - ගැටළුවේ මුල හඳුනාගන්න උත්සාහ කළ යුතුයි වගේම ඊට පිළියම් යෙදිය යුතුයි. ඔබගේ ආයතන වෙනස් වුණේ මොනවායින්ද? යන්න හඳුනාගත යුතුයි. එවිට එය නැවත ඇතිවන එක වළකිනවා. සහ ස්වයං රාමුවක් තුලම ඔබ එය ඇතුළත් කිරීමට හේතුව - එවිට ඒවා එකිනෙකට අන්තර් සම්බන්ධ වෙනවා. ඒවා එකට ගැළපෙනවා. ඉතින් මේවා තමයි ඒ කුළුණු.

දැන් අපි බලමු ප්‍රතිසන්ධානය කියන්නේ මොකක්ද කියලා. ප්‍රතිසන්ධානයට තිබෙන අර්ථ නිරූපණ සමහරක් නම්; ඒක සම්බන්ධකම් පිළිබඳවයි. පෙර දිනයේ සිදුවූ ගැටුම් සහ වෛරයන් හොල්මන් නොකරන අද පවතින සම්බන්ධතාවයන් ගොඩනැගීම - ඒ අර්ථ නිරූපණය ප්‍රසලියා හේයනර් නමැති කාන්තාව විසින් ඉදිරිපත් කරන ලද්දක්. සත්‍යය කොමිෂන් සභාව (True Commission) කියන කාරණය පිළිබඳව ඇය හුඟක් අධ්‍යයනය කරල තියෙනවා. අනිත් එක තමයි පෙර සතුරුව සිටි පාර්ශ්ව අතර අලුත් හා වඩාත් හොඳ සම්බන්ධතා ගොඩනගා ගැනීම. ගැටුමකට මුල බීජයත් දීර්ඝ කාලීන විසඳුමත් සම්බන්ධතාවයයි. එසේම බිඳුනු අතීතයක සිට සමාජය ගමන් කරන්නේ මේ ක්‍රියාවලිය හරහායි. අපි අපේ අතීතයේ බෙදිලා හිටියා. අපි සහයෝගයෙන් කටයුතු කරන අනාගතයක් කරා ගමන් කරනවා අපි අනාගතයේ එකට වැඩ කරයි. එයට ප්‍රවේශයන් දෙකක් තියෙනවා. එක් ප්‍රවේශයක් වන්නේ ප්‍රතිවිපාකී යුක්තියේ මාවතයි - නඩු ඇසීම, දඬුවම් නියම කිරීම, දඬුවම් ලබාදීම - ඒකාධිපතිවාදී පාලනයක් තිබුණු රටවලින් තමයි ඇත්තටම ප්‍රතිවිපාකීය ප්‍රවේශය සිදුවෙලා තියෙන්නේ. දීර්ඝ කාලයක් පුරා හමුදා ඒකාධිපති පාලනයන් පැවති ලතින් ඇමෙරිකානු රටවල වගේ ඒක වෙන්න පුළුවන් හැකියාව පවතිනවා. අවසානයේ ආඥාදායකයන් බලයෙන් ඉවත් කරලා ප්‍රජාතන්ත්‍රවාදී ව්‍යාපාරය ශක්තිමත් වන කාලයක් එනවා. ආඥාදායකය ඉවත් කළාම ඔවුන් කුඩා කණ්ඩායමක්. එතකොට ඇත්තටම නඩු විභාග කරලා ඔවුන්ට දඬුවම් ලබා දෙන්න පුළුවන්. අනිත් ප්‍රවේශය වන්නේ, ප්‍රතිස්ථානගත කිරීමේදී යුක්තියේ ප්‍රවේශයයි.අප රට වගේ - දකුණු අප්‍රිකාව වගේ - සිවිල් යුද්ධයක් පැවති රටවලට තමයි ප්‍රතිස්ථානගත කිරීමේ ප්‍රවේශය වඩාත් වැදගත් වන්නේ. අපේ රටේ දඬුවම් කරන්න ඔබට ඉතාම අසීරුයි. පාර්ශව දෙකම සටන් වැදුණා. එක්තරා ආකාරයකට ඔවුන්ගේ සෙබළුන්

ඔවුන්ට වීරයින්. දඬුවම් පමුණුවන්න කුඩා කණ්ඩායමක්වත් නෑ. මේ දඬුවම් ක්‍රියාත්මක වෙනවාට ජනතාව හැමෝම කැමතියි ඒකාධිපති පාලනයක වගේ.

සිවිල් යුද්ධයක් පැවති රටවල, අතීතය සමඟ කටයුතු කිරීමට වඩාත්ම සුදුසු ක්‍රමවේදය මේක?

ඇත්තටම ඔව්. සංක්‍රාන්ති යුක්තිය පිළිබඳ සම්මත න්‍යාය වන්නේ වගවීමද වැදගත් බවයි. ඒකත් එතැන තියෙනවා. ඒකට නෙවෙයි අවධානය යොමු කරන්නේ.

දකුණු අප්‍රිකාවේ ඔවුන් කටයුතු කළේ කොහොමද?

මම ඒක ගැනත් කියන්නම්. මම මේ කතා කරන සංක්‍රාන්ති යුක්ති ආකෘතිය ගැන මම මුලින්ම පවුල් ජීවිතයෙන් නැවත උදාහරණයක් දෙන්නම්. සංක්‍රාන්ති යුක්තිය, සත්‍යය, වගවීම, වන්දි ගෙවීම, ආයතනික ප්‍රතිසංස්කරණ යන කුළුණු හතර මත පාදක වුණා කියලා කිව්වනේ. කෙනෙක් අහන්න පුළුවන් 'ඇයි මේ කුළුණු හතරක්? ඇයි පශ්චාත් ආර්ථික සංවර්ධනය කියලා කියන්න බැරිද?' ඒක ඇත්තටම හුඟක් වැදගත් වෙන්නේ රජය 2009 යුද්ධයේ අවසන් කාලයේදී කිව්වා, 'අපේ රට ආර්ථිකමය වශයෙන් සංවර්ධනය කරනවා. අපි දේශපාලන ගැටලු එච්චර බලන්නේ නෑ. අපි රට ආර්ථික වශයෙන් සංවර්ධනය කළොත් මේ ප්‍රශ්න නිකම් නැතිවෙලා යයි' කියලා.

දැන් ඒකට උත්තරේ මේකයි. මම නැවතත් පවුලකින්ම මේකට උදාහරණයක් දෙන්නම්. අම්මා ගෙදර ආපුවම තම දරු දෙදෙනා රණ්ඩුවී ඇති බව දකිනවා. මොකද එක්කෙනෙක් අඬනවා. ඇය පැමිණි විට දරු දෙදෙනා රණ්ඩු වී ඇති බව පෙනෙන්නට ඇති විට ඇය අසන පළමු ප්‍රශ්නය කුමක්ද? එක් දරුවෙක් අඬන නිසා, කුමක් හෝ දෙයක් සිදුවී ඇති බව තේරෙනවා. ඇය අහයි 'මොකද වුණේ?'එතන පොඩි ළමයි දෙන්නෙක් නිසා බොහෝ විට උත්තර දෙකක් තියෙන්න පුළුවන්. ඊළඟට ඇයගේ ප්‍රශ්නය වන්නේ 'මට ඇත්ත කියන්න?' මොකද, ඇය සත්‍ය දැනගන්නකම් ඇයට ඒ සම්බන්ධව මොකුත් කරන්න බෑ. මොකක්ද කරන්න ඕනේ කියලා ඇය දන්නේ නෑ. ඉතින් පළවෙනි කුළුණ තමයි 'සත්‍යය'. ඉතින් අපේ කතාවේ අම්මත් උත්සාහ කරන්නේ ඉස්සෙල්ලාම සත්‍ය සොයාගන්න.'මොකද වුනේ?'කියන ප්‍රශ්නයට පිළිතුර විය යුත්තේ එය කියලා හිතමු. ළමුන් දෙදෙනා රණ්ඩු ඕනේ පොඩි ළමයාගේ සෙල්ලම් බඩුවක් ලොකු ළමයා ඉල්ලලා ඒක පොඩි ළමයා දෙන්න බෑ කියලා. ඉතින් ලොකු ළමයා පොඩි ළමයාගේ අතින් ඒක බලෙන්ම උදුරා ගන්න හදනවා. ඒක බිම වැටිලා කැඩෙනවා. ඒ අතරේ ලොකු ළමයා පොඩි ළමයාට ගහනවා. එතකොට ඒක බිම වැටිලා කැඩුණු නිසා පොඩි ළමයා අඬනවා. එයාගේ සෙල්ලම් බඩුවත් කැඩිලා, අයියාගෙන් ගුටිත් කාලා. ඉතින්, අම්මා දැන් මොකද කරන්නේ? අම්මා මොකක් හරි කරන්න ඕනේ. එයා ළමයාට දඬුවම් කරන්න ඕනේ. මොකද ඇයට ළමයාත් එක්ක තරහයි. ඇයට දරුවා හොඳට හදාගන්න ඕනේ. ඉතින් සමහර විට ඇය දරුවට ගහයි. නැත්නම් කාමරයකට දමයි. නැත්නම් දවස් දෙකක් ඔයාට ටීවී බලන්න තහනම් කියයි. මෙය යම් ආකාරයක වගවීමක්. ඉතින් අංක දෙක වෙන්නේ වගවීම. වරද සිදුකළ කෙනාට යම් ආකාරයක දඬුවමක් දිය යුතුයි. ඒ ඔබට ඒ දරුවාට හානියක් කරන්න ඕන නිසා නෙවෙයි. ඔබට විනයක් පවත්වා ගන්න ඕන නිසා, පවුල තුළ ජීවත් වෙන්න ඕනේ විදිය ඔහුට කියාදිය යුතු නිසා. අනෙක් දරුවා තවමත් අඬන්නේ ඔහුගේ සෙල්ලම් බඩුව නැති වුණ නිසා සහ ගුටි කෑව නිසා. ඉතින් ඊළඟට අම්මා කියනවා 'මම ඔයාට ඒ වගේ සෙල්ලම් බඩුවක් ගෙනත් දෙන්නම්. මට ඒක දැන් කරන්න බෑ. දැන් හුඟක් රෑ වෙලා. ඒ උනත් හෙට හරි සෙනසුරාදා හරි බලන්නම්. මම ඔයාට සෙල්ලම් බඩුව හොයාගන්න උත්සහ කරන්නම්. එතකම් ඔයාට මේ චොක්ලට් එක දෙන්නම්. මේ චොක්ලට් එක ගන්න'. මෙය එක්තරා ආකාරයක වන්දියක්. අම්මා දැන් දන්නවා, හෙට ඇය ගෙදරින් ගියාම මේ ළමයි දෙන්නා ආයෙත් එකට එකතු වෙනවා, සමහරවිට හෙට වෙනත් දෙයකට - වෙන සෙල්ලම් බඩුවකට ආයෙත් රණ්ඩුවෙයි. ඉතින් එයා නීතියක් දානවා. එයා කියනවා ඔයාලට මං නීතියක් දානවා. ඔයාලා එක්කෙනෙකුටවත් අනිත් එක්කෙනාගේ බඩු

බලෙන් ගන්න බෑ. ඔයාලා ඒක ඉල්ලලා ගන්න ඕනේ. එක්කෙනෙකුටවත් අනිත් කෙනාට ගහන්න බෑ. අලුත් නීතියක්. ආයතනික ප්‍රතිසංස්කරණ. මම කියන්න උත්සාහ කරන්නේ රටක් හැටියට ගත්තත් මේ කරුණු හතර එකිනෙකට ගැළපෙනවා. සත්‍යය, වගවීම, හානිපූරණය, ආයතනික ප්‍රතිසංස්කරණ යන කරුණු. යුද්ධයකින් පසුව එකට ගළපාගන්න ඕනේ. ඉතින් ඒක තමයි ජාත්‍යන්තර ප්‍රජාවත් අපිට අනුගමනය කරන්න කියලා කියන ක්‍රියාවලිය.

ඉතින්, ඉතාම කෙටියෙන් මම ඒවා ගැන කියන්නම්. සංක්‍රාන්ති යුක්තියේදී 'සත්‍යය' ඉතාම වැදගත් අංගයක්. මක්නිසාද මෙම ආකෘතියේ අනෙකුත් සියලුම අංග සඳහා 'සත්‍යය' වැදගත් වන නිසා. දකුණු අප්‍රිකාවේ ක්‍රියාත්මක වන සත්‍යය හා ප්‍රතිසංධාන කොමිෂන් සභා, සත්‍යය සෙවීම සඳහා වන එක් උදාහරණයක්. පළමුවැනි සත්‍යය කොමිසම ආජන්ටිනාවේ ස්ථාපිත කළ දින පටන් මේ වනතුරු 40ක් විතර තිබිලා තියෙනවා. හුඟක් සත්‍යය කොමිෂන් සභාවල ප්‍රතිසන්ධානය යන වචනය ඇතුළත් වුණේ නෑ. මොකද ආජන්ටිනාවේ වගේ 'ප්‍රතිසන්ධානය' කියන එක ඔවුන්ගේ අරමුණ නොවේ. ප්‍රතිසංධානගත වීම අරමුණ නොවේ. ඔවුනට දඬුවම් ලැබුණා. ඔවුන්ට වුවමනා වුණා සත්‍ය සොයාගන්න. මිනිස්සු ගොඩක් අතුරුදන් වෙලා තිබුණා. ඔවුන්ට ඕන වුණා සත්‍යය සොයලා දඬුවම් පමුණුවන්න. ඉතින්, එතන කිසිම ප්‍රතිසන්ධානයක් තිබුණේ නෑ. නමුත් අරමුණ වුණේ, මොකක්ද සිද්ධ වුනේ කියලා හොයා ගන්න එක. කාටද ඒක වුණේ? ඇයි ඒක වුණේ? කොමිෂමෙන් සොයා ගත්ත කරුණු පදනම් කරගෙන සත්‍ය සහ ප්‍රතිසන්ධාන කොමිෂන් සභාව වාර්තාවක් හදලා ඉදිරි කටයුතු කරන්න වඩාත් සුදුසු විදිය මොකක්ද කියලා නිර්දේශ ඉදිරිපත් කරයි. සාමාන්‍යයෙන් සත්‍ය පිළිබඳ කොමිෂන් සභාවක අදහස වෙන්නේ සුවිශේෂී සිද්ධියක් හෝ සිද්ධීන් සමූහයක් පිළිබඳව සලකා බැලීම නොවෙයි. මෙහේ ඔයාලා සමස්ථ කාලසීමාවම ආවරණය කරනවා සහ ඒ සමස්ථ කාල සීමාව පුරාවටම සිදුවූ සියල්ලන්ම සොයාගන්නවා. හුඟක් විමර්ශන කොමිෂන්වල වගේ හුදෙක් සිද්ධීන් එකක් දෙකක් ගැන විතරක් නෙවෙයි. නමුත් ඔක්කොම ගැන ඔබ වාර්තාවක් ලියනවා සහ සත්‍ය සොයලා සනාථ කරගන්නවා. මම හිතන්නේ ඒක අපේ රජය, පසුගිය රජය පොරොන්දු වුණා. නමුත් තවම වෙලා නෑ.

සත්‍ය කොමිෂන් සභාවේ පොදු ගුණාංගය තමයි ඔවුන් අතීතය පිළිබඳව අවධානය යොමු කිරීම. ඔවුන්ගේ අරමුණ එක් සිද්ධියක් පිළිබඳව පමණක් සරලව සලකා බලන්නේ නැතිව, කාලාන්තරයක් තිස්සේ සිදුවූ මානව හිමිකම් කඩවීම් පිළිබඳව සවිස්තරාත්මක චිත්‍රයක් ඉදිරිපත් කිරීම. සත්‍ය කොමිෂන් සභාව ධීවරයෙක් වගේ ක්‍රියා කිරීම අවශ්‍යයි. සමස්ථ රටම ආවරණය කරමින් දැල එලන්න ඕනේ. ඔක්කොම අත්දැකීම් එක්කාසු කරන්න ඕනේ. ඒවා පවතින්නේ සීමිත කාලසීමාවකට විතරයි. සාමාන්‍යයෙන් තමන්ගේ වාර්තාව හදලා ඉවර වුණාම අවසන් වෙනවා. සාමාන්‍ය නීති ක්‍රියාවලිය සඳහා නම් ඉදිරිපත්කොට තිබුණත් සත්‍ය පිළිබඳ කොමිෂන් සභාව පුද්ගලයන්ට අධිචෝදනා එල්ල කරන්නේ නෑ.

ඔවුන් පොදු සමාවක් ලබා දෙන්නේ ඉතා කලාතුරකින්. දකුණු අප්‍රිකාවෙන් ඔවුන් පොදු සමාව ලබා දුන්නා. පොදු සමාව ලබා ගන්න නම් ඔබ කොමිසම හමුවට පැමිණිය යුතු අතර ඔබ සම්පූර්ණයෙන් සත්‍ය පැවසිය යුතුයි. ඔබ කියන්නේ සත්‍යම තමයි කියලා කොමිසමට විශ්වාසය ඇති වෙන්න ඕන. ඒ වගේම ඔබ ඔබට සමාවෙන්න කියලා කියන්න ඕනේ. ඔබ සිදු කළ දේට පසුතැවෙන්න ඕනේ. මේ උල්ලංඝනය කිරීම් කරලා ඔබ කළේ හරි දෙයක් කියලා ඔබට කියන්න බෑ. ඔබ ඒ ගැන පසුතැවිලා සත්‍යය ම ප්‍රකාශ කරන්න ඕනේ. ඒ තමයි ඔබට අවශ්‍ය නිර්ණායක. නමුත් හුඟාක් දෙනෙක් පොදු සමාව ලබන්නේ නෑ. අයදුම් පත්‍ර 7000ක් ලැබුණොත් පොදු සමාව වලින් ඔවුන් ලබා දෙන්නේ 849 කට. ඒක කොච්චර අමාරුද කියන එක පෙන්නන්න මෙය හොඳ චිත්‍රයක්. සුදු දකුණු අප්‍රිකාව සත්‍යයට සවන් දීම ප්‍රතික්ෂේප කරනවා. ඔවුන්ට සත්‍යයට සවන් දීමට අවශ්‍ය නෑ. ඉතින් වෙච්ච දේවල් ඔක්කොම නරකයි. ඇත්තටම ඒක සාර්ථක නෑ. මොකද දකුණු අප්‍රිකානුවන්ද ඒක ගැන සතුටු නෑ. සමහර අය හිටියා මේකට කිසිම විදියකින් කැමති නැති.

අනෙක් අතට සත්‍යය පිළිබඳ කොමිෂන් සභාව සියලු පුද්ගලයන්ට සිදු වූ දුක් ගැහැට පිළිබඳව රටට දැනගන්න ලැබෙනවා. එවන් පීඩාවන්ට ගොදුරු වූ පුද්ගලයන් ලබා දුන් සාක්ෂි නිතරම රේඩියෝවෙන් සහ රූපවාහිනියේ විකාශය කරනවා. සමහර විට ඔබට සත්‍යය සොයාගත්තට පස්සෙත් ප්‍රතිසන්ධානය වෙන්න අමාරු වෙනවා. ඒවා ලේසි දේවල් නොවේ. මේවා අමාරු දේවල්.

ඊළඟට නඩු පැවරීම, නඩු පැවරීම කියන දෙයින් වගවීම පිළිබඳව හැඟීමක් ඇතිවෙනවා වගේම විඳින්දිතයන්ට සමීප වෙනවා.

දේශපාලනය යම් කාර්යභාරයක් ඉටුකරන අතර දැන් එයට දේවල් හැඩගස්සවන්න පුළුවන්. දැන් ඔන්ටේරියෝ ඒ යෝජනාව සම්මත කරගත්තා. සහ කොහොම වුනත් ඒක පුළුල් ලෙස ප්‍රසිද්ධියට පත්කොට නොතිබුණත්. කෙටියෙන් කියනවා නම් ඊට පස්සේ උතුරු නැගෙනහිර කතෝලික බිෂොප්වරුන් හතර දෙනා සමූල ඝාතනයක් සිද්ධ වුණා කියලා එකම දේ ප්‍රකාශ කරලා ප්‍රකාශයක් නිකුත් කළා. මම හිතන්නේ නෑ. ඔවුන් එය අදහස් කළාද කියල හෝ ඔවුන් එය තේරුම් ගත්තා කියලා. හෝ ඒක කවුරු හරි ඔවුන්ට දුන්නා කියලා. නමුත් මේ විදියට තමයි ඇත්තටම දේවල් පාලනයෙන් ගිලිහිලා අපි දන්නෙම නැතිව ප්‍රචාරය වෙන්නේ. හරියට ආර්මේනියාවේ සිද්ධිය වගේ. පසුගිය අවුරුදු සියය පුරාම ආර්මේනියන්වරු කියනවා තුර්කියේ සමූල ඝාතන සිදුවුණා කියලා. තුර්කි රජය කියනව නෑ ආර්මේනියාවේ සමූල ඝාතන සිදුවුණේ නැහැ කියලා.

ඉතින් අපට දැන් දැනුනත් ශ්‍රී ලංකාවේ ඒ වගේ දේවල් සිදුවී නෑ කියලා. අපි මේ ප්‍රශ්නයට ගෝලීය මට්ටමෙන් ආමන්ත්‍රණය කළේ නැත්නම් ශ්‍රී ලංකාවේ සමූල ඝාතන සිදුවුණා කියලා කියන්න ඉඩ තියෙනවා. සමූල ඝාතනය කියන එකේ නිර්වචනය ඉලක්කගත කණ්ඩායමක්. ඒකට එහෙමනම් ශ්‍රීලංකාව තුළ වාසය කරන සමස්ත ද්‍රවිඩ ජනගහනය ම ඇතුළත් වෙන්න ඕනේ. නමුත් එහේ වාසය කරන එම ප්‍රජාව ඉලක්ක කරලා හිතාමතාම ඝාතනය කළා. අපිට විශ්වාස තරමටම එහෙම සිද්ධ වුනේ නෑ. සත්‍ය පිළිබඳ කොමිෂන් සභාවකට මෙම සැකය ඉවත් කරන්න පුළුවන්. ඒක තමයි මම හිතන්නේ පැවති රජයේ අරමුණ වුණේ. සත්‍ය පිළිබඳ කොමිෂන් සභාවක් පිහිටුවනවා පිළිගැනීමෙන් හා පැවසීමෙන් කියලා. නමුත් ඔවුනුත් එය සිදු කළේ නෑ. ප්‍රධාන කාරණය තමයි ඔබ කරුණු සමග කටයුතු නොකළොත් ඒක වර්ධනය වෙනවා සහ මේවා දේශපාලනමය දේවල්. ඔන්ටේරියෝ පාර්ලිමේන්තුව මේ දේවල් ගැන විශේෂඥයෙක් නොවෙයි.

ඔබ කියන්නේ මේ දැන් නැගෙන චෝදනා ගොඩක් දුරට දේශපාලනය කියලද?

ඒවා දේශපාලනය, නමුත් ඒ වාගේම ඒවා ඉදිරිපත් වෙන්නේ සාමාන්‍ය ජනතාව නැතිවීම පිළිගන්නේ නෑ කියන දමිළ පුද්ගලයන් තුළ පවතින හැඟීමත් එක්ක. අපිට ඇහිලා තියෙනවා මිනිස්සු කියන කතා. අපි උතුරට ගියාම මිනිස්සු කියනවා අපේ නෑදෑයෝ මරලා දැම්මා කියලා. සමහර වෙලාවට නිවැසියෝ ඔක්කොම මරලා දාලා. නමුත් අපි දන්නෙ නෑ කී දෙනෙක්ද කියලා. ඇත්තටම මමත් දන්නේ නෑ. කී දෙනෙක් මැරුණද කියලා. මුලදී රජය කීවා කවුරුවත් මැරුණේ නෑ කියලා. අනතුරට ලක්වූ සිවිල් වැසියන් එක්කෙනෙක්වත් නෑ. ඔවුන් එහෙම තමයි කිව්වේ. ඊළඟට ඔවුන් කිව්වා 1000ක් මැරුණා කියලා. ඊළඟට කිව්වා 7000ක් මැරුණා කියලා අපි දන්නේ නෑ

ද්‍රවිඩ අයගේ පැත්තෙන් ඔවුන් කියනවා 140,000ක් මැරුණා. සමහර අය කියනවා ඊට වැඩිය මැරුණා කියලා. එක්සත් ජාතීන් කියනවා 40,000ක් මැරුණා කියලා. මේ දේවල් වලට ස්ථීර පදනමක් නෑ. අපි දන්නවා හුඟක් පුද්ගලයන් මැරුණා. නමුත් අපි දන්නේ නෑ ඒ කීදෙනෙක්ද කියලා. ඉතින් මේ දේවල් නවත්තන්න ඕනේ.

ඊළඟට හානි පූර්ණය කිරීම, ඒක තමයි තුන්වෙනි කුළුණ. මෙහි අදහස තමයි පුද්ගලයා, වින්දිතයා, හැකි උපරිම මට්ටමෙන් යථා තත්ත්වයට පත් කිරීම. ඒක මුදල් වලින් විතරක් කරන්න පුළුවන්. ඒවා නිර්මාණය කිරීම දැරිය හැකි ප්‍රමාණයකට කළ හැකියි. ඒක සංකේතයක්, ස්මාරකයක්, සැමරුම් දිනයක් වෙන්න පුළුවන්. ඒ වගේම ඒක තමයි උගත් පාඩම් හා ප්‍රතිසංධාන කොමිෂන් සභාව කොමිෂන් සභාවෙනුත් නිර්දේශ කළේ. උගත් පාඩම් හා ප්‍රතිසංධාන කොමිෂන් සභාවෙන් හඳුනාගත් කාරණයන් තමයි අපි වෙන වෙනම දින දෙකේදී මිය ගිය පුද්ගලයන් සමරනවා කියන කාරණය. රජය මැයි මාසේ 19 වැනි දිනට සමරනවා. ද්‍රවිඩ පුද්ගලයන් සමරන්නේ මැයි 18 දින වෙනම දවස් දෙකක්. ද්‍රවිඩ පුද්ගලයන් ශෝක දිනයක් ලෙස සමරන අතරේ රජය ඒ සමරන්නේ යුද්ධයෙන් ජයග්‍රහණය කරවූ එක තහවුරු කරන්න.

අනුස්මරණය කරන්න සිදුවීම් දෙකක් ඇතිවීම ගැන ඔබේ දැක්ම මොකක්ද?

ඇත්තටම උගත් පාඩම් හා ප්‍රතිසංධාන කොමිෂන් සභාව යෝජනා කළේ මොකක්ද? උගත් පාඩම් හා ප්‍රතිසංධාන කොමිෂන් සභාව කිව්වේ අපි නිදහස් දවසේ. ඒ කියන්නේ අපේ නිදහස් උත්සවය පවත්වන දවසේ වේලාවක් වෙන් කර ගනිමු. අපි වේලාවක් වෙන්කර ගනිමු. මියගිය සියලු දෙනා සිහිපත් කරන්න විශේෂ අවස්ථාවන්. ඒක තමයි ඔවුන්ගේ නිර්දේශය සහ ඊට අමතරව මම හිතනවා රජය අවසර දෙන්න ඕනේ ජනතාවට සිහිපත් කරන්න මට තේරෙනවා ඔවුන්ට අවශ්‍ය නෑ එල්.ටී.ටී.ඊ. සංවිධානයට නැවත නැගී සිටින්න අවස්ථාවක් සකස් කරලා දෙන්න. නමුත් මට පුද්ගලිකව හැඟෙනවා. දැන් එල්.ටී.ටී.ඊ. සංවිධානය කියන්නේ අතීතයේ තිබුණ දෙයක්. එය නැවත නැගී සිටින්න වෙන්නේ නෑ. ඉතින් ඇත්තටම මේ යුද්ධය ඉවරවෙලා අවුරුදු 11 – 12 කට පස්සේ.

උගත් පාඩම් හා ප්‍රතිසංධාන කොමිෂන් සභාව සැදුම්ගෙන තිබුනේ අපේ ජ්‍යෙෂ්ඨ රජයේ නිලධාරීන්ගෙන්. ඔවුන්ට සිදුකළ දේ උපරිම හොඳින් කරලා තිබුණා. ඔවුන්ගේ නිර්දේශය වුණේ මම කිව්ව වගේ එක් දිනයකදී සමරන්න එක උත්සවයක් පවත්වෙලා. ඔවුන් කිව්වා ඇතැම් කරුණු වුනේ සියලුම රජයන්ගේ දේශපාලන නායකයින් වගකීම ගත යුතුයි. ඒ ඔවුන් කීව තවත් සමහර දේවල්. සහ ඔවුන් ඉදිරිපත් කරපු හුඟක් නිර්දේශ ක්‍රියාත්මක කරන්න අවශ්‍යම දේවල්. ඒවා උනන්දුවකින් අනුගමනය කරලා නෑ. වඩාත් වැදගත් වන්නේ උනන්දුව. අපි මෙය ක්‍රියාත්මක කළ යුතුයි. මොකද ඒක තමයි කරන්න ඕන හරි දේ සහ ඒක තමයි කැමැත්ත ඔබ එය කරන්න ඕනේ. කරන්න ඕන නිසා කරනව නෙවෙයි. ඒක ගැන විශ්වාස නොකර ඒකට බල නොකර අපි ඒක ඉවර කරලා දානවා. අපි ඒක සුදු අලියෙක්, අපිට ඒක කිසිසේත්ම ඕන නෑ කියලා.

ඉතින් හානි පූර්ණය කිරීම; විශ්‍රාම වැටුපක් ලබා දීලා, සත්‍ය පිළිබඳ කොමිෂන් සභාව වගේ ආයතනයක නිලධාරීන්ට තමන්ගේ කතාව කියන්න වින්දිතයන්ට අවස්ථාවක් ලබා දීලා, සිදු කරන්න පුළුවන්. ඉතින් මිනිස්සුන්ට ඇවිල්ලා තමන්ගේ කතාව කියන්න දෙනවා කියන එකත් හානි පූර්ණයක් තමයි. ඔවුන්ට ඔවුන්ගේ කතාව කියන්න ඕනේ. ඔවුන්ට ඕනෙ කවුරු හරි ඔවුන්ට ඇහුම්කම් දෙන්න. ඔවුන්ට ඕනෙ කාට හරි ඔවුන්ට ඒ දැනුණු වේදනාව දැනෙන්න. විශේෂයෙන්ම ඔවුන්ට ඕනේ රජයට ඒක දැනෙන්න සහ රජයට එය අවධාරණය කරන්න. ඔස්ට්‍රේලියාව වගේ අනෙක් රටවල අවුරුදු සිය ගණනකට පස්සෙත් ඔවුන් ඔවුන්ගේ ඇබෝරිජින්වරුන්ගෙන් සමාවෙන මෙන් ඉල්ලා සිටිනවා. ඉතින්, මොකද වෙන්නේ? කරන්න ඕනේ මොකක්ද? කියන එක ගැන උගත් පාඩම් හා ප්‍රතිසංධාන කොමිෂන් සභාවඉතා හොඳ නිර්දේශ දීලා තියෙනවා කියලා මම හිතනවා. තවත් සිත් ගන්නා කරුණක් තමයි වගවීම. හානිපූරණය කිරීම වඩාත් ඇතුළත් කාරණයක්. එය සෑම වින්දිතයෙකුටම කවර හෝ යමක් ලබා දෙන අතර ඔවුන් සත්‍ය කොමිෂන් සභාවකට පැමිණ කතා කළ යුතු නෑ. එය ඔවුන් යම් අපහසුතාවයකට පත්කරන විදියේ

දෙයක් විශේෂ අධිකරණවල වගේ අපරාධකරුවන්ට මුහුණ දියයුතු නෑ. ඉතින් හානි පූර්ණය සිදු කළ යුතු දෙයක්. අවධානය යොමු කළ යුතු දෙයක්. වගවීම අනෙක් අතට අවම වශයෙන් ඇතුළත් කාරණයක්. ඉතාම සුළු කොටසක් විතරයි අධිකරණය හමුවට පමුණුවන්නේ. සියරා ලියොන් වලින් උදාහරණයක් ගත්තොත් විශේෂ උසාවියක් පිහිටෙව්වා, හයිබ්‍රිඩ් උසාවියක් පිහිටෙව්වා, අවුරුදු හතක්, වරදකරුවන් විසි හතරක් ඩොලර් මිලියන 200ක්. අනෙක් අතට සත්‍ය කොමිෂන් සභාව නිර්දේශ කළා. වින්දිතයින් 32,000කට වන්දි ගෙවන්න සහ ඩොලර් මිලියන 13ක් වගවීම සඳහා ඩොලර් මිලියන දෙසීයක් වියදම් කළා. ඉතින් මුදල් විශාල ප්‍රමාණයක් මම අදහස් කලේ ඔබ පිළිතුරු දිය යුතුයි. මොකද ඒක යුක්තිය ඉටුකරන්න ඕනේ කියන ඒ ක්‍රමයේම කොටසක් සහ එතන වග වීම තියෙන්න ඕනේ. නමුත් වන්දි ගෙවීම පිළිබඳව අවධානය යොමු කිරීමෙන් වගවීම පිළිබඳ අවධානය යොමු කරනවට වඩා විශාල පිරිසක් වෙනුවෙන් යුක්තිය ඉටු කරන්න කටයුතු කරන්න පුළුවන්. වගවීමට සංකේතාත්මක වටිනාකමක් තියෙනවා. ඒකත් ගොඩක් වැදගත්. නමුත් මේ සියරා ලියොන් සිද්ධියේදී වින්දිතයින් 30,000ක් නිර්දේශ කළා. වන්දිය ඩොලර් මිලියන 13යි. වරදකරුවන් 24ක් හිටියා සහ ඩොලර් මිලියන 200ක් වැය කළා.

අවසාන වශයෙන්, ආයතනික ප්‍රතිසංස්කරණය. ආයතනික ප්‍රතිසංස්කරණය සංක්‍රාන්ති යුක්තියේ මූලිකාංගයක්. සංක්‍රාන්ති යුක්තියෙන් බලාපොරොත්තු වෙන්නේ යළි ගැටුම් ඇති වීම සඳහටම වළක්වන එක. ඒකෙන් කල් පවතින ප්‍රතිඵල තියෙන තිරසර ප්‍රතිසංස්කරණ කිරීමේ හැකියාවක් ලැබෙනවා. සත්‍යය වගේ නොවෙයි මේක ප්‍රගතිශීලීයි. සංක්‍රාන්ති යුක්තියේ අනාගතය දෙසට යොමුවුන මූලිකාංගය වෙන්නේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණය යි. වගවීම, වන්දි ගෙවීම වගේ අනෙක් ඒවා ඔක්කොම අතීතය හා සම්බන්ධයි, අතීතයේ දී මොකක්ද වුනේ කියලා. ආයතනික ප්‍රතිසංස්කරණය අනාගතයට බලපානවා, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණය ඒකෙ කොටසක්.

ඊ ළඟට එන ප්‍රශ්නය වෙන්නේ අනුපිළිවෙල සකස් කිරීමයි; ප්‍රමුඛත්වය ලබා දීමයි. සංක්‍රාන්ති යුක්තියේ මූලික කරුණු හතරම (ආධාරක කුළුණු) එක හා සමානව වැදගත්. ඒවා යම් සමස්තයක කොටස්. ඒවා සාකල්‍ය කරුණු; නමුත් වඩාත්ම පහසු දෙයින් වගේම කළ හැකි දෙයින් පටන් ගන්න අනුපිළිවෙලක් එතන තියෙන්න පුළුවන්. ශ්‍රී ලංකාවේ, අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයක් සහ හානි පූරණය (වන්දි ගෙවීම) සඳහා වන කාර්යාලයක් පිහිටුවලා තියෙනවා; නමුත් විය යුත්තේ ආයතනය පැවතීමම විතරක් නොවෙයි. ආයතනයට හොඳින් අරමුදල් සපයලා තියෙනවා; ආයතනය නිවැරදි පුද්ගලයන් මගින් මෙහෙය විය යුතුයි. ඔබ ආණ්ඩුවට විතරක් නොවෙයි හැම දෙනාටම පිළිගන්න පුළුවන් මූලිකත්වය ගන්න තැනැත්තකු (ප්‍රධානියකු) ඒවාට දාන්න ඕන. ඒ පුද්ගලයා වින්දිතයන්ට වගේම විපක්ෂයටද පිළිගත හැකි පුද්ගලයකු වෙන්න ඕන. අන්න එතනදි තමයි 19 වන සංශෝධනය වැදගත් වෙන්නේ. මොකද කියනවා නම්, 19 වන සංශෝධනයේ තියෙනවා වැදගත් රාජ්‍ය ආයතනවලට පත් කිරීම් කරන කොට රජය හා විපක්ෂය එක්ව සිවිල් සමාජයේ දායකත්වය ද සහිතව සිදු කරන්න ඕන කියලා. ඒත් මම දන්නවා පහුගිය ආණ්ඩුව කාලේ ඒක ඒ කඩදාසිවල ලියලා තිබුන තරම් සාධාරණව වුනේ නැහැ. හේතුව, පහුගිය ආණ්ඩුවේ විපක්ෂය තුළින් සත්‍ය විපක්ෂය නියෝජනය වුනේ නැහැ. විපක්ෂයේ නායකයා TNA එකෙන් (දෙමළ ජාතික සන්ධානයේ); ඒ පක්ෂය ආණ්ඩුවේ කටයුතුවලට ක්‍රියාකාරීව සහාය දක්වපු පක්ෂයක්, මෙතැනදී ප්‍රධාන විපක්ෂය බැහැර කරලා තිබුණා. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව ස්වාධීන වෙන්න ඕන තරම් ස්වාධීන වුනේ නැහැ; නමුත් 19 වන සංශෝධනය ඉතා හොඳ එකක්. යම් කිසි ක්‍රමයකට එම ක්‍රමය තුළම සංවරණ සහ තුලන තියෙන්න උවමනා නිසා 19 වන සංශෝධනය මේ ක්‍රමයට ගැළපෙන එකක්. වර්තමාන 20 වන සංශෝධනය යටතේ වගේ එක් තැනැත්තකුට, එනම් ජනාධිපතිට, අවසානයේ දී සියලු පත්කිරීම් කළ හැකි නම්. එතකොට, සහභාගි වීම පිළිබඳ හැඟීමක් විපක්ෂයෙත් නැහැ. සිවිල් සමාජයෙත් නැහැ. එතකොට විවේචනය

කරන්න වගේම පිළිගැනීමට ලක් නොවිය හැකි තීරණ ගන්න එකත් ලේසියි. ඒ හින්දා අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය, හානි පූරණය සඳහා වන කාර්යාලය - ඒක වැදගත්, මං ඒවායේ ඉන්න අය ගැන තීන්දු දෙන්නෙ නැහැ, නමුත් වැදගත් වන්නේ, එම ආයතනවලට පත්වන අයට, එම ආයතනවලින් සේවය ලබාගන්නා අයගේ, විශේෂයෙන්ම වින්දිත ප්‍රජාවේ, පිළිගැනීම තියෙන්න ඕන.

ඉතින්, දැන් අපේ අභියෝගය මේකයි. දැන් බලන්න යුද්ධය ඉවර වුනාට පස්සෙ සිද්ධ වුනේ මොකක්ද කියලා. මේ යුද්ධය ඉවර වුනාට පස්සෙ එළියට ආපු පින්තූර. මිනිස්සු එළියට ආවහම, මේ අවසාන ගැටුම්වලට මැදි වුන මිනිස්සු නිසා. එයාලව කම්බි වැටෙන් පිටිපස්සෙ තියන්න හේතුව, එයාලා අතර එල්.ටී.ටී.ඊ. සංවිධානය අය ඉඳිවි කියලා බයක් තිබුණ නිසා, කලබලයක් තිබූ නිසා. ඒ හින්දා එල්.ටී.ටී.ඊ. සංවිධානය අය මුලින්ම පරික්ෂා කරලා පිටතට ගන්න ඕන, නමුත් එල්.ටී.ටී.ඊ. සංවිධානය අය පරික්ෂා කරලා පිටතට ගන්න දීර්ඝ කාලයක් ගත වුණා. ඔයාලාට පේනවානෙ පොඩි ළමයිනුත් මේකෙ ඉන්නවා කියලා. එයාලා එතන මාස හයක් හිටියා. මෙතන තමයි ශ්‍රී ලංකාවට මීට වඩා හොඳින් මේ කටයුත්ත කරන්න තිබුණ තැන. ඒ කාලෙ තිබුණ ආණ්ඩුවට මීට වඩා හොඳින් මේ කටයුත්ත කරන්න තිබුණ තැන. ඇත්ත වශයෙන්ම, එගොල්ලන්ගේ අවධානය මුලින්ම යොමු වෙලා තිබුණේ ජාතික ආරක්ෂාවට. ඉතින්, ඒ හින්දයි මේ දේ සිද්ධ වුනේ. නමුත්, සබඳතා කඩවීමයි ජාත්‍යන්තර ප්‍රජාවට ඉතා ඍණාත්මක පණිවුඩයක් සන්නිවේදනය වීමයි මත. ඉතින්, මේක අපි ජය ගත යුතු තත්ත්වයක්. මේක අපි යටපත් කරන්න ඕනි මතකයක්. මේ මතකය යටපත් කරන්න නම් අපි එයාලා වෙනුවෙන් වැඩිපුර දෙයක් කරන්න ඕනි. ඉතින් අපිට මේක ජය ගන්න පුළුවන්.

ජාත්‍යන්තරයට අවශ්‍ය දේ ගැන හැඟීමක් ඇති කර ගන්නත් මේක තේරුම් ගන්න එක වැදගත් නිසා. මං කිව්ව විදිහට, මේක දැවෙන ප්‍රශ්නයක්, ඒත් දීර්ඝ කාලීන ගැටළුව වෙන දෙයක්. මං කියන්නෙ නෑ ජාත්‍යන්තරය කියන දෙයට විතරක් අපි ඇහුම් කන් දෙන්න ඕනි කියලා. එයාලා අද ඉන්නවා; හෙට නෑ. අපිට මේ ප්‍රශ්නෙ විසඳන්න ඕනි සදහටම මේ රටේ ජීවත් වෙන ජනතාවත් එක්ක. ජාත්‍යන්තරය - එගොල්ලො හැම වෙලාවෙම වෙනස් වෙනවා.

කොහොම වුනත්, මට මේක ඔයාලාට කියලාම ඔයාලාගෙන් සමුගන්න ඕනි. අපේ ජනාධිපතිතුමා ට්වීටර් පණිවුඩයක් නිකුත් කරලා තිබුණා. මට ඒ ගැන හරිම සතුටුයි. එතුමා ට්විටර් පණිවුඩය නිකුත් කළේ දවස් 2කට 3කට කලින්. ජනාධිපති ලේකම් කාර්යාලයත් ප්‍රකාශයක් නිකුත් කළා. කල් පවත්නා සාමයක් උදා කර ගන්න නම් වගවීම සහ මානව සම්පත් සංවර්ධනය තහවුරු කරන්න එක්සත් ජාතීන් හා ඊට අනුබද්ධිත ආයතන හා එක්ව කටයුතු කිරීම ආණ්ඩුවේ ප්‍රතිපත්තියයි.

එච්.එම්.ජී.එස්. පලිහක්කාර

හිටපු විදේශ ලේකම් සහ එක්සත් ජාතීන් සඳහා නිවියෝක් සහ ජිනීවාහි ශ්‍රී ලංකාවේ නිත්‍ය නියෝජිත

874. මම උපකල්පනය කරනවා මං මෙහි පෙනී ඉන්න එක ඔයාලාට අවශ්‍ය වුනේ මම උගත් පාඩම් හා ප්‍රතිසංධාන කොමිෂන් සභාව එකේ කොමසාරිස්වරයකු ලෙස සේවය කළ නිසාත් එය ක්‍රියාත්මක කිරීමේ හෝ එය ක්‍රියාත්මක කිරීමේ අඩුපාඩුකම් ඔබගේ විධිනියෝගයට අදාල වූ නිසාත් කියලා.

උගත් පාඩම් හා ප්‍රතිසංධාන කොමිෂන් සභාව එක ක්‍රියාත්මක වුනේ මීට අවුරුදු 10කටත් වඩා කලින්. ඒ කාලේ ඉඳලා ඒ ගැන වැඩි දෙයක් සිද්ධ වෙලා නැහැ; දැන් මගේ වයස අවුරුදු 74යි. ඒ හින්දා මට ඔයාලට කියන්න පුළුවන් ආයෙත් මට මතක් කරන්න පුළුවන් දේවල් විතරයි.

2010 මැයි මාසෙ පිහිටවපු උගත් පාඩම් හා ප්‍රතිසන්ධාන කොමිෂන් සභාව (LLRC) ඉතා විශාල ජාතික සහ ජාත්‍යන්තර අවධානයක් දිනා ගත්තා. එහි අවසාන වාර්තාව 2011 නොවැම්බර් මාසෙ ජනාධිපති මහින්ද රාජපක්ෂ මහතාට පිළිගන්වලා, 2011 දෙසැම්බර් මාසෙ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළාට පස්සෙ ඊටත් වඩා වැඩි අවධානයක් දිනා ගත්තා. ජනමාධ්‍ය, සිවිල් සමාජය, ඩයස්පෝරාව, දේශපාලන පක්ෂ වගේම ඉතාමත් වැදගත් වෙන්නේ සාක්ෂි දුන් පුරවැසියෝත් වින්දිතයෝත් දික් ගැහෙමින් තිබුණ දරුණු ගැටුමකට පස්සෙ ප්‍රතිසන්ධානයක වගේම සුවවීමක ආරම්භයක් වගේ පෙනුන මේ දෙය පිළිගැනීමයි.

උගත් පාඩම් හා ප්‍රතිසංධාන කොමිෂන් සභාව එක ආයෙමත් 2012 මාර්තු මාසයේ දී අවධානයට ලක් වුණේ ඒකෙන් සකස් කළ 'ඵලදායී' නිර්දේශ කියලා මානව හිමිකම් කවුන්සිලය හැඳින්වුව නිර්දේශ ක්‍රියාත්මක කරන්න කියලා ආණ්ඩුවෙන් ඉල්ලලා එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කවුන්සිලයෙන් යෝජනාවක් (එහි 19 වන සැසිවාරයේ දී) සම්මත කර ගත්තහම.

අවුරුදු එකහමරකට වඩා වැඩි කාලයක් පුරා (2010 වසරේ මැයි මැද සිට 2011 නොවැම්බර් දක්වා) කොමසාරිස්වරු මිනිස් පැය දහස් ගණනක් ගත කරලා ගැටුම් තිබුණ කලාපයෙයි ඉන් පිටතයි රට පුරාම තැන් සිය ගණනකට ගිහිල්ලා මිනිස්සු දහස් ගණනක් මුණගැහිලා විශේෂයෙන්ම, වින්දිත සිවිල් වැසියොයි සොල්දාදුවොයි මුණගැහිලා, 5000කට වඩා වැඩි ඉදිරිපත් කිරීම් සංඛ්‍යාවක් විභාග කරලා, වාර්තා සටහන් කරලා; විශ්ලේෂණය කරලා ඒ වගේම අර්ථ දැක්වලා පිටු 400කට ආසන්න වාර්තාවකට නිර්දේශ 285 ක් සකස් කළා.

කොහොම වුනත්, උගත් පාඩම් හා ප්‍රතිසංධාන කොමිෂන් සභාව එකේ නිර්දේශ ක්‍රියාත්මක කරන්න ආණ්ඩුවේ සමහර නායකයින් සහාය පළ කරලා සමහරු එම සහයෝගය තහවුරු කරලා විවිධ ප්‍රකාශ කරමින් අභවන ලද කැපවීම ගැන ඒ කාලෙ තිබුණ ආණ්ඩුවේත් ඇත්ත වශයෙන්ම ඊට පස්සෙ පත් වූ අනුප්‍රාප්තික ආණ්ඩුවලත් කැපවීම ගැන තිබුණේ පැහැදිලි බවකට වඩා වැඩි ව්‍යාකූල බවක්. ඒ වාර්තාව නිකුත් කළ කාලෙ මේ රටේ ජනාධිපති උගත් පාඩම් හා ප්‍රතිසංධාන කොමිෂන් සභාව නිර්දේශ ස්වධීනයි, සාධාරණයි, යුක්ති සහගතයි කියලා ප්‍රසිද්ධියේ ප්‍රකාශ කළා. කෙහොම වුනත් මේ නිර්දේශ ක්‍රියාත්මක කිරීම ගැන ඉහළ මට්ටමෙන් කරන ලද පැහැදිලි ප්‍රකාශයක් ගැන මට මතක් වෙන්නේ නැහැ. කොහොම හරි උගත් පාඩම් හා ප්‍රතිසංධාන කොමිෂන් සභාව නිර්දේශ ක්‍රියාත්මක කරන්න ජාතික ක්‍රියාකාරී සැලැස්ම (ක්‍රියාකාරී සැලැස්ම) ඉදිරිපත් කළාට පස්සෙ, රජය අඩු වශයෙන් එම නිර්දේශවලින් කීපයක් සම්බන්ධයෙන්වත් කටයුතු කරන්න කැප වෙයි කියලා වැඩි බලාපොරොත්තුවක් ඇති වුණා.

ආණ්ඩුවේ විවිධ ඇමතිවරුයි නිලධාරීනුයි උගත් පාඩම් හා ප්‍රතිසංධාන කොමිෂන් සභාව ක්‍රියාත්මක කරන එක ගැන වරින් වර අදහස් පළ කරලා තිබුණත්, පස්සෙ පත් වුන ආණ්ඩු මේ නිර්දේශ ක්‍රියාත්මක කරලා අත්කර ගත්ත ප්‍රගතියක් ගැන සාමූහික නිල ප්‍රකාශයක් තිබුණා ද කියලා පැහැදිලි නැහැ.

මගේ මතකය හරි නම්, ක්‍රියාකාරී සැලස්මේ ලැයිස්තුගත කරලා තිබුණේ තෝරා ගත්ත නිර්දේශ කිහිපයක් (140ක් හෝ ඒ වගේ ගණනක්. කරුණාකරලා මේක පරික්ෂා කරන්න) විතරයි; තෝරා ගැනීම සිදු කළේ කොයි පදනම මතද, බැහැර කළේ මොනවා ද කියලා පැහැදිලි කිරීමක් කළේ නැහැ.

ඒ වගේම අවාසනාවකට වගේ ආණ්ඩුවවත් විපක්ෂයවත්, තනි තනිව හරි සාමූහිකව හරි, විධායක නැත්නම් ව්‍යවස්ථාදායක, ක්‍රියාමාර්ග තුළින් නිදහසෙන් පසු ශ්‍රී ලංකාවේ වඩාත්ම තීරණාත්මක ජාතික ගැටළුව නැත්නම් වඩාත්ම තීරණාත්මක ජාතික ගැටළු අතරින් එකක් වුණ මෙම ''පුරවැසියන්ගේ ඒකමතිකභාවය'' ගැන ජාතික කතිකාවතකට පහසුකම් සපයන්න වෑයම් කළේ නෑ.

මේක, කොමිෂන් සභා විශාල ගණනක් තියෙන ක්‍රියාත්මක කිරීම අතින් දුර්වල වාර්තා සටහන් පෙළ එක්ක එකට තියලා බලන්න ඕන. - මෙම වාර්තා සටහන් බැලුවහම කොමිෂන් සභා විශාල සංඛ්‍යාවක් තියෙනවා; ක්‍රියාත්මක කිරීම් සංඛ්‍යාව ඉතා අල්පයි. ඇත්ත වශයෙන්ම, උගත් පාඩම් හා ප්‍රතිසංධාන කොමිෂන් සභාව එක ඉදිරියේ සාක්ෂි දුන්න බොහෝ දෙනා මීට කලින් තිබුණ කොමිෂන් සභාවල නිර්දේශවලට සිදු වුන දේ ගැන හිතලා මේකත් අසාර්ථක උත්සාහයක් වෙන්න පුළුවන් කියලා සැක පළ කළා.

හරියටම මෙන්න මේ හේතුව හින්දා තමයි අපි අවුරුදු දහයකට වඩා වැඩි කාලයකට ඉස්සෙල්ලා අපේ වාර්තාවට ප්‍රකාශ දෙකක් විශේෂයෙන්ම ඇතුළත් කළේ; ඒවා තමයි:

'කළ හැකි' ඒවා විදිහට කොමිෂන් සභාවට හැඟුණු උගත් පාඩම් හා ප්‍රතිසංධාන කොමිෂන් සභාව නිර්දේශවලටත් ඒ දේම වෙන එකට විරුද්ධව ආණ්ඩුවට අනතුරු ඇඟවීම; දෙවනුව, ඉදිරියට යන්න පුළුවන් මගක් වගේම මින් පිටතට යන්න පුළුවන් මගක් ඇති බව ජනතාවට දැන ගන්න පුළුවන් වෙන විදිහට කොමිෂන් සභා වාර්තාව භාෂා තුනෙන්ම ජනතාව අතට පත් වීම තහවුරු කිරීම.

උගත් පාඩම් හා ප්‍රතිසංධාන කොමිෂන් සභාව වාර්තාව 2011 නොවැම්බර් මාසයේ ජනාධිපතිවරයාට භාර දුන්නාට පස්සේ ඒක ප්‍රසිද්ධ කළ හින්දා, උගත් පාඩම් හා ප්‍රතිසංධාන කොමිෂන් සභාව නිර්දේශ ක්‍රියාත්මක කිරීම ගැන ආණ්ඩුව පොරොන්දු ගණනාවක් දීලා තියෙනවා. අවසාන වාර්තාවේ තියෙන සොයා ගැනීම් වගේම නිර්දේශ ආණ්ඩුව අනුමත කරනවා ද කියන කාරණය ඇතුළුව උගත් පාඩම් හා ප්‍රතිසංධාන කොමිෂන් සභාව එක ගැන රජයේ සමස්ත ස්ථාවරයේ අපැහැදිලි තත්ත්වයක් මතු වෙන විදිහට ආණ්ඩුවේ අමාත්‍යවරුන් පරස්පර විරෝධී ප්‍රකාශත් කරලා තියෙනවා.

උගත් පාඩම් හා ප්‍රතිසන්ධාන කොමිෂන් සභාවේ (උගත් පාඩම් හා ප්‍රතිසංධාන කොමිෂන් සභාව) අතුරු වාර්තාව ක්‍රියාත්මක කරන්න 2010 සැප්තැම්බර් මාසයේ අන්තර්-අමාත්‍ය කමිටුවක් පිහිටෙව්වා. ඒත් මේ ආරම්භක නිර්දේශ ක්‍රියාත්මක කරන තුරුවත් කොයි තරම් ප්‍රගතියක් අත් කර ගෙන තියෙනවාද කියලා පැහැදිලි නැහැ. අවසාන වාර්තාවයි ක්‍රියාකාරී සැලැස්මයි දෙකම මේ අතුරු නිර්දේශවලින් සමහරක් ක්‍රියාත්මක කිරීමේ අවශ්‍යතාව අවධාරණය කරනවා.

රටේ ජනාධිපතිතුමා "*ඩේලි මිරර්(ර්) - Daily Mirror*" පත්තරය (2014 ජනවාරි 01) එක්ක තිබුණ සම්මුඛ සාකච්ඡාවේදී කිව්වා

"උගත් පාඩම් හා ප්‍රතිසංධාන කොමිෂන් සභාව නිර්දේශ වලින් බොහොමයක් යුක්ති සහගතයි, අපක්ෂපාතියි. කොමිෂන් සභාව තමන්ගේ ස්වාධීනත්වය පෙන්නුම් කරලා තියෙනවා" කියලා. "කලින් විස්තර කළ විදිහට රජයට උගත් පාඩම් හා ප්‍රතිසන්ධාන කොමිෂන් සභාවේ (උගත් පාඩම් හා ප්‍රතිසංධාන කොමිෂන් සභාව) නිර්දේශ යම් කිසි සැලැස්මකට (road map) අනුව විතරක් ක්‍රියාත්මක කරන්න පුළුවන්; ඔක්කොම පාර්ශ්වකරුවන් එක්ක සාකච්ඡා නොකර එම වාර්තාව සම්පූර්ණයෙන්ම ක්‍රියාත්මක කරන්න බැහැ" කියලා කැබිනට් ප්‍රකාශක සහ ජනමාධ්‍ය ඇමති කිව්වා. (කැලුම් බණ්ඩාර, යම් කිසි සැලැස්මකට (road map) අනුව පමණක් උගත් පාඩම් හා ප්‍රතිසංධාන කොමිෂන් සභාව නිර්දේශ ක්‍රියාත්මක කළ හැකියි: *ඩේලි මිරර්(ර්)* 2012 ජනවාරි 06); "උගත් පාඩම් හා ප්‍රතිසංධාන කොමිෂන් සභාව එක සමහර තැන්වලදි ඒකට ජනාධිපතිතුමා ලබා දීලා තියෙන බලය පැවරුමෙනුත් එහාට ගිහින් තියෙනවා. නිර්දේශවලින් කොයි කොටස් ද වහාම ක්‍රියාත්මක කරන්න පුළුවන්, නිර්දේශවලින් කොයි කොටස් ද වැඩිදුර අවධානයට, ගැඹුරු අධ්‍යයනයට ලක් කරන්න ඕන, ඒ වගේම ඒවා රටේ අනාගතයට බලපෑමක් ඇති කරන්නේ කොහොමද යන්නත් රජය සලකලා බලන්න ඕන" කියලා ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ සභානායක වගේම එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් පිළිබඳ කොමිෂන් සභාවේ 19 වෙනි සැසිවාරයට

සහභාගි වූ ආණ්ඩුවේ දූත පිරිසේ සාමාජිකයෙක් ප්‍රකාශ කළා. (ඩේලි නිවුස්, 2012 මාර්තු 27). "උගත් පාඩම් හා ප්‍රතිසන්ධාන කොමිෂන් සභාවේ (උගත් පාඩම් හා ප්‍රතිසංධාන කොමිෂන් සභාව) ශ්‍රී ලංකාවට පිළිගන්න පුළුවන් කියලා සැළකෙන නිර්දේශ ක්‍රියාත්මක කරන්න ආණ්ඩුව කැප වෙලා ඉන්නවා. ඒත් අයුතු පීඩනයකට යටත් වෙන්නෙ නෑ." කියලා වැඩ බලන ජනමාධ්‍ය ඇමති වගේම කැබිනට් ප්‍රකාශක කිව්වා. (BBC Sinhala.com "උගත් පාඩම් හා ප්‍රතිසංධාන කොමිෂන් සභාව ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් තීරණ ගැනීමට පාර්ලිමේන්තුව", 2012 අප්‍රේල් 05, http://www.bb.co.uk/sinhala/news/sotry/2012/04/120405_yapa.shtml, අවසන් වරට ප්‍රවේශ වූයේ 2012 අගෝස්තු 21).

මෙම මාධ්‍ය වාර්තාවල සත්‍ය අසත්‍යතාව බලා ගන්න නම්, යෝජිත ක්‍රියාකාරී සැලැස්ම නිර්දේශවලින් වෙනස් වන විධියයි එහෙම වෙනස් වෙන්න හේතුයි එක්ක යෝජිත ක්‍රියාකාරී සැලැස්ම

කොයි උගත් පාඩම් හා ප්‍රතිසංධාන කොමිෂන් සභාව නිර්දේශ ද ක්‍රියාත්මක කරලා තියෙන්නේ

ක්‍රියාත්මක නොකළ ඒවායි ක්‍රියාත්මක නොකරන්න හේතුයි

සම්බන්ධයෙන් 2012 ඉඳන් අද දක්වා පිළිවෙලින් පත් වූ ආණ්ඩුවල විධායක අංශ වලින් පැහැදිලි ඒ වගේම කරුණු සහිත නිල වාර්තාවක් ඔබගේ කොමිෂන් සභාව ලබා ගන්න ඕන.

ඊට අමතරව, උගත් පාඩම් හා ප්‍රතිසංධාන කොමිෂන් සභාව ක්‍රියාකාරී සැලැස්ම ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය (නැත්නම් එහි අඩුපාඩුකම්) ගැන සවිස්තරාත්මක ඇගයීමක් කරපු පර්යේෂණ හැකියාවක් ඇති වෙරිටේ රිස(ර්)ච් (Verite Research) හා විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය වගේ ස්වාධීන විශ්ලේෂකයින්ට ඇහුම්කන් දෙන එක ප්‍රයෝජනවත් වෙන්න පුළුවන්. විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයට මුලින්ම උගත් පාඩම් හා ප්‍රතිසංධාන කොමිෂන් සභාව ගැන විශේෂ කොන්දේසි තිබුණා. සමහරු කියනවා ඒවා පදනම් විරහිතයි කියලා. අනිත් අය කියනවා ඒවාට හොඳ පදනමක් තිබුණා කියලා. ඒ කොහොම වුනත්, වාර්තාව බලද්දී පරික්ෂා කරන්න, ප්‍රසිද්ධ කරන්න ඒ වගේම ක්‍රියාත්මක කිරීමට බල කරන්න විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය හොඳ උත්සාහයක් දරලා තියෙනවා.

මං හිතනවා මේක පරණගම කොමිසමටත් අදාල වෙනවා කියලා. දැනටමත් සාක්ෂි දීලා නැත්නම් මට විශ්වාසයි මගේ මිත්‍රයා විනිසුරු මැක්ස්වෙල් පරණගම ඒ බවට මෙතන්දි සාක්කි දෙයි කියලා. එතුමාත් උගත් පාඩම් හා ප්‍රතිසංධාන කොමිෂන් සභාවෙ සාමාජිකයෙක්.

ඔබගේ බලය හරියට ක්‍රියාත්මක කරන්න එවැනි නිල වාර්තාවක්, කරුණු සහිත පදනමක් (හෝ දත්ත ගබඩාවක්) සථාපනය කරන්න ඕනඅ. ඒ වගේ පැහැදිලි පින්තූරයක් නැතිව, විශේෂයෙන්ම මානව හිමිකම් කොමිසම වගේ අන්තර්-රාජ්‍ය ආයතන, විදේශ ආණ්ඩු, යුරෝපීය පාර්ලිමේන්තුව, එක්සත් ජනපද කොංග්‍රසය වගේ පාර්ලිමේන්තු වගේම ජාත්‍යන්තර ක්ෂමා සංවිධානය, හියුමන් රයිට්සි වොච්, ඉන්ටර්නැෂනල් ක්‍රයිසිස් ගෘප් වගේ බලවත් ජාත්‍යන්තර මත හදන බාහිර ක්‍රියාකාරීන් ගණනාවක් ශ්‍රී ලංකාව සම්බන්ධයෙන් බලහත්කාරයෙන්, ඒ වගේම ඉස්සෙල්ලා නොතිබුණ විදිහේ මානව අයිතිවාසිකම් පිළිබඳ කොමිෂන් සභා යෝජනා සමග වෙනත් මත පළ කරලා තියෙන තත්ත්වයක් යටතේ වගවීම, ප්‍රතිසන්ධානය වගේම රටේ යහපාලනය සම්බන්ධයෙන් පවා සිද්ධ වෙන බාහිර මැදිහත්වීම්වල අභියෝග ආමන්ත්‍රණය කරන්න පුළුවන් ප්‍රවේශයක් හදන්න වර්තමාන පරිපාලනයට පුළුවන් වෙන්නේ නෑ.

දැන් ඊනියා දරුස්මාන් වාර්තාව ගැන වචනයක්. ආණ්ඩුව තමන් විසින්ම නැත්නම් ගැළපෙන අතරමැදි සංවාදකයන් හරහා එම වාර්තාවේ ආකාරයයි අඩංගු දේවලුයි වඩා හරවත් වඩා ශක්තිමත් විදිහට ආමන්ත්‍රණය කරලා තියෙන්න අවශ්‍යයි කියන එකට මං එකඟ වෙනවා. නමුත්

මං එකඟවෙන්නෙ නෑ මානව හිමිකම් කොමිසම යනාදි ඒවා වගේ විදේශ සම්මේලනවලදී වගවීම හා ප්‍රතිසන්ධානය ගැන ශ්‍රී ලංකාවට ගැටළු ඇති කරන එකම හේතුව ඒක කියලා. ගැටළුවේ ප්‍රධාන හේතුව තමයි දේශීය යාන්ත්‍රනයේ තියෙන ක්‍රියාත්මක කිරීමේ අඩුපාඩුකම්. උගත් පාඩම් හා ප්‍රතිසංධාන කොමිෂන් සභාව නිර්දේශ, පරණගම වාර්තාව, උදලාගම වාර්තාව, වගේම සමඟර යුද හමුදා කමිටු වාර්තා ක්‍රියාත්මක කරන්න අනුප්‍රාප්තික ආණ්ඩුවල අකැමැත්ත නැත්නම් නොහැකියාව නිසා වගවීම හා ප්‍රතිසන්ධානයට සම්බන්ධ ගැටළු විදේශගත වෙලා රාජ්‍ය තාන්ත්‍රික මට්ටමේ වගේම ආර්ථික ගැටළු බවට පත් වෙන්න හේතුවෙලා තියෙනවා. ඒ වගේම මගේ මැකීගෙන යන මතකය හරි නම්, උගත් පාඩම් හා ප්‍රතිසංධාන කොමිෂන් සභාව ප්‍රසිද්ධියට පත් කළේ 2000 මැයි මාසෙදී; දරුස්මාන් වාර්තාව මහලේකම් බන් කී මූන් ප්‍රසිද්ධියට පත් කළේ ඊට පස්සෙ. අපට ඉහළ මට්ටමේ රාජ්‍ය තාන්ත්‍රික සබඳතා තිබුණා නම්, අපේ රාජතාන්ත්‍රික සබඳතාවලට උගත් පාඩම් හා ප්‍රතිසංධාන කොමිෂන් සභාව සඳහා දේශීය ක්‍රියාවලිය සම්පූර්ණ වෙනකම් මෙම දරුස්මාන් වාර්තාව වළක්වා ගන්න නැත්නම් ප්‍රමාද කරගන්න මෙම කාල පරතරය යොදා ගන්න පුළුවන්කම තිබුණා.

කරුණාකරලා මෙතැනදී මට පොඩි අනවශ්‍ය තොරතුරක් දක්වන්න ඉඩදෙන්න මොකද ඒක ඔයාලාගේ විධිනියෝගයට ගොඩාක් සම්බන්ධ හින්දා.

රටේ සුභසිද්ධිය හදවතෙන්ම අපේක්ෂා කරන ඕනෑම අපක්ෂපාතී නිරීක්ෂකයකුට කරුණු දෙකක් පැහැදිලි වෙන්න ඕන:

- ප්‍රධාන උගත් පාඩම් හා ප්‍රතිසංධාන කොමිෂන් සභාව නිර්දේශ ‘ක්‍රියාත්මක කරන්න පුළුවන් ඒවා‘ වගේම රටේ සහ ජනතාවගේ එක්සත් බව, ඒකීයත්වය, ස්වාධීනත්වය සහ යහපැවැත්ම ආරක්ෂා කර ගනිමින් ඒවා ක්‍රියාත්මක කළ හැකිව තිබුණා.
- ඒවා ක්‍රියාත්මක කරලා තිබුණා නම්, කලින් කියපු විදිහේ ආගන්තුක බාහිර මැදිහත්වීම් (එක්සත් ජාතීනගේ මානව අයිතිවාසිකම් පිළිබඳ කොමිෂන් සභා යෝජනා) වළක්වා ගන්න, ලිහිල් කර ගන්න එහෙම නැතිනම් පිළිගත හැකි මට්ටමකට කතිකා කර ගන්න තිබුණා.

ඒ වගේ ක්‍රියාදාමයකට පහත සඳහන් අවශ්‍යතා ඇතිවීම වළක්වා ගන්න තිබුණා:

මානව හිමිකම් කොමිසමේ ඉටු කරන්න බැරි වගකීම් තියෙන යෝජනාවකට සම අනුග්‍රහය දක්වන්න යහපාලන ආණ්ඩුව ගත් අදූරදර්ශි ප්‍රවේශය

[වෙන විදිහකට කියනවා නම් අපි වගවීම හා ප්‍රතිසන්ධානය සම්බන්ධයෙන් දේශීය වශයෙන් ලබා දෙන්න පුළුවන් ප්‍රතිඵල ගැන සාකච්ඡා කරන්නේ නැතිව අන්තර්ජාතික අපේක්ෂා ලැයිස්තුවකට අත්සන කරනවා.]

මානව හිමිකම් කොමිසමෙන් ගැලවෙන්න මගක් සාකච්ඡා කරන්න රාජ්‍යතාන්ත්‍රික ක්‍රමෝපායක් නැති වර්තමාන ආණ්ඩුවේ අපරික්ෂාකාරී ඒකපාර්ශවීය ක්‍රියාව .

[වෙන විදිහකට කියනවා නම් අපි වගවීම හා ප්‍රතිසන්ධානය සම්බන්ධයෙන් දේශීය වශයෙන් ලබා දෙන්න පුළුවන් ප්‍රතිඵල සාකච්ඡා කරන්නේ නැතිව සංකේතාත්මක ඉවත්වීම් කරන්න ඒකපාර්ශ්වයීය පියවර ගන්නවා.]

මේ පියවරවල් දෙක වගේම මෙතනදී ද්වීපාක්ෂික එකඟතාවක් (වගවීම හා ප්‍රතිසන්ධානය පිළිබඳ) ඇති කර ගන්න ශ්‍රී ලංකාවේ දේශපාලනික වැඩසටහනක් නැතිවීමත් ඒ හා සම්බන්ධ රාජ්‍යතාන්ත්‍රික ක්‍රමෝපායක් නැතිවීමත් නිසා, අවාසනාවකට වගේ මේ රටේ වගවීම හා ප්‍රතිසන්ධානය ක්ෂුද්‍ර කළමනාකරණයට ලක් කිරීමට බලාපොරොත්තු වෙන බාහිරින් මෙහෙයවන බලවේගවලට (මානව හිමිකම් පිළිබඳ යෝජනා) අවස්ථාව ලැබිලා තියෙනවා. ඒ

වගේම අපේ නඩු පැවරීමේ කාර්යය, නොදැනීම බැහැරට ඒ කියන්නේ - මානව හිමිකම් පිළිබඳ මහකොමසාරිස්වරයාට අනුබද්ධිත ජිනීවා කාර්යාලයට පැවරෙනවා. ඒකෙන් වෙන්නේ හඳුනාගත් ශ්‍රී ලාංකිකයන්ට එරෙහිව කටයුතු කිරීමේ බලය විශ්ව අධිකරණ බලසීමාව දක්වා පැතිර යාමට සහාය වීමයි.

දැන් අපි ආපහු උගත් පාඩම් හා ප්‍රතිසංධාන කොමිෂන් සභාව ක්‍රියාත්මක කිරීමට යමු:

මාධ්‍ය වාර්තාවලිනුයි මං කිව්ව ස්වාධීන වාර්තාවලිනුයි වගේම පොදුවේ ලබාගන්න පුළුවන් සමහර තොරතුරුවලිනුයි උගත් පාඩම් හා ප්‍රතිසංධාන කොමිෂන් සභාව ක්‍රියාත්මක කරන එක ගැන තරමක් දුර්වල චිත්‍රයක් තමයි මැවෙන්නේ.

“ගොඩාක් මාධ්‍ය වාර්තා අතරින් පහත කියන එක විතරක් මට උපුටා දක්වන්න පුළුවන්.” 2012 මාර්තු 10, දිවයින කතුවැකිය.

“ජිනීවා නුවරදී රජය දුෂ්කරතාවයට පත්වෙන්න එක පැත්තකින් නීතියේ ආධිපත්‍යය කඩා වැටෙන්න වගේම ආයෙත් හරිගස්සන්න බැරි තරමටම රටේ කීර්ති නාමයට හානි වන විදිහට වැඩ කරපු රජයේ ඉහළ මට්ටම්වල හිටිය සාපරාධීකාරී කොටස් රජයටම පාලනය කරගන්න බැරි වීම හේතු වුණා. උගත් පාඩම් හා ප්‍රතිසන්ධාන කොමිසමේ (උගත් පාඩම් හා ප්‍රතිසංධාන කොමිෂන් සභාව) නිර්දේශ ක්‍රියාත්මක කරන්න පටන් අරගෙන තිබුණා නම්, රජයට වැඩි වෙහෙසක් නැතිව ශ්‍රී ලංකාවේ හතුරන්ව නිශ්ශබ්ද කරන්න තිබුණා. එහෙනම් එක්සත් ජනපදයට මේ රට සම්බන්ධයෙන් යෝජනාවක් ඉදිරිපත් කරන්න කිසිම අවශ්‍යතාවක් නැතිවෙන්න තිබුණා.”

උගත් පාඩම් හා ප්‍රතිසංධාන කොමිෂන් සභාවවල තිබුණ ක්‍රියාත්මක නොකළ ඒවා මොනවාද? මං කිව්ව විදිහට මේවා අවුරුදු 10ක් පරණයි. මතකය තරමක් අපැහැදිලියි. ඒ එක්කම ක්‍රියාත්මක කරපු ඒවා මොනවාද නොකළේ මොනවාද කියන එක ගැන නිල වාර්තාවක් මං දැකලා නැහැ. නමුත් මං දැන් කියන ඒවා පහසුවෙන් ක්‍රියාත්මක කරන්න පුළුවන්කම තිබුණ ඒත් නොවැදගත් ඒවා අතර තියෙන්න ඇති. ඔබලාට මේවායේ ඇත්ත නැත්ත නිල වාර්තාවලින් බලන්න වෙයි:

ඊට පටහැනි නිල වාර්තා නැති නම් කෙනෙකුට උපකල්පනය කරන්න පුළුවන් පහත දැකවෙන සැළකිය යුතු උගත් පාඩම් හා ප්‍රතිසංධාන කොමිෂන් සභාව නිර්දේශ හරියට ක්‍රියාත්මක නොවුණ ඒවා අතර ඇති කියලා.

අතුරුදහන්වීම් යැයි කියනු ලබන සිද්ධි සම්බන්ධයෙන් විශේෂ කොමසාරිස්වරයෙක්. මේක විත්දිත පවුල්වලට යම්කිසි අස්වැසිල්ලක් ලබාගන්නත් 30/1, 40/1, වැනි යෝජනා වගේ ජාත්‍යන්තරකරණයට ලක්වීම වළක්වන්නත් උපකාරී වෙන්න ඇති. ඇත්ත වශයෙන්ම පරණගම කොමිෂන් සභාව පත් කළේ මේක පරීක්ෂා කරන්න, නමුත් ඒකේ නිර්දේශවලට මොකක්ද වුණේ කියලා පැහැදිලි නැහැ. ඉතින් ඒකේ ප්‍රතිඵලයක් විදිහට මේ වැදගත් ගැටළුවට සම්බන්ධ සරල නිර්දේශයක් අවුරුදු ගණනාවකින් ප්‍රමාද වුණා වගේම ඒකෙන් ගැටළුව බාහිර අවධානයට ලක් වුණා - අන්තිමට ශ්‍රී ලංකාව තමන් සම්බන්ධයෙන් ම තිබුණ මානව හිමිකම් කවුන්සිලයේ යෝජනාවකට අඥාන විදිහට සමඅනුග්‍රහය දක්වමින් අවසාන වුණා.

දිස්ත්‍රික් මට්ටමේ අන්තර් ආගමික යාන්ත්‍රණය, කලින් අනතුරු ඇඟවීමේ හා කලින් ව්‍යාප්තවීමේ යාන්ත්‍රණයක් ලෙස ක්‍රියා කිරීම, මේක ක්‍රියාත්මක කරලා තිබුණා නම් අපිට අළුත්ගම සහ පොරුතොට ඛේදවාචක වගේම තවත් සුළු ජාතියක් - මුස්ලිම් ජාතිය - දුරස්ථභාවයට පත්වීම වළක්වාගන්න තිබුණා. අපිට වැදගත් රැකියා / වෙළඳ ගනුදෙනු සිදු කළ වෙළඳපොලක් වුන මෙච්චර කල් මිත්‍රශීලීව හිටිය ඉස්ලාම් රටවල් (ඉස්ලාම් සහයෝගිතා සංවිධානය - OIC) තරහා නොකරගන්න තිබුණා. මම මේ යාන්ත්‍රණය ස්ථාපිත කරන එක ගැන කිසිම වාර්තාවක් දැකලා නැහැ. අපි දැකලා තියෙන්නෙ දේශපාලකයෝ ඡන්ද අල්ලා ගන්න බලාගෙන ආගමික

නායකයෝ එක් රැස් කරන එක; නමුත් ඒගොල්ලන්ට මේ උදාර බලය ජාතිය ගොඩනැගීමේ යාන්ත්‍රණය පිහිටුවන්න යොදාගන්න බැරි වුණා. සෑම ආගමකින්ම පූජ්‍ය පක්ෂයේ සම්භාවනීය සාමාජිකයෝ කිහිප දෙනෙක්ම උගත් පාඩම් හා ප්‍රතිසංධාන කොමිෂන් සභාව ඉදිරියේ සාක්ෂි දීලා උදව් කරන්න ඉදිරිපත් වුණා.

ජන ජීවිතය පුරාම වගවීමේ සංස්කෘතියක් තහවුරු කරන්න, දුක්ගැනවිලිවලට සහනයක් ලබාදීමේ යාන්ත්‍රණයක් නැත්නම් සවිබලගන්වන ලද ඕම්බුඩ්ස්මන්වරයෙක්.

ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත (9.5 ඡේදය) යටතේ රැඳවුම්කරුවන් හා සම්බන්ධ සිද්ධි ගැන අධීක්ෂණය කරන්න, පරීක්ෂා කරන්න වගේම ඉවත දාන්න ස්වාධීන උපදේශන යාන්ත්‍රණයකින් වර්තමාන මතභේදය වැළකී යන්න නැත්නම් අඩු වශයෙන් ලිහිල් වෙන්න ඉඩ තිබුණා. දැන් අවුරුදු දහයකට පස්සේ යුරෝපා සංගමයයි එක්සත් ජනපදයයි GSP සහනය ත්‍රස්තවාදය වැළැක්වීමේ පනතටත් මානව හිමිකම්වලටත් සම්බන්ධ කරනවා.

එකාවන්බව, විවිධත්වය තුළ ඒකීයත්වය යනාදිය ප්‍රවර්ධනය කරන්න ජාතික දිනයේ න්‍යාය පත්‍රයට ද්විපාක්ෂික, බහුවාර්ගික බහුආගමික අංග. ඒක සියලුම ප්‍රජා කොටස්වල සියලුම දේශපාලන පක්ෂ සම්බන්ධ වෙන සංකේතාත්මක දෙයක් මෙන්ම සහජීවී දෙයක් විය යුතුව තිබුණා. මේකෙ තියෙන නෛසර්ගික වටිනාකමට අමතරව මේ ක්‍රියාමාර්ගය හින්දා දේශීය ප්‍රතිසන්ධානයටයි ගැටුම් නැවත ඇතිවීම වැළැක්වීමටයි වගේම ශ්‍රී ලංකාවේ පාලන ගැටළුවලට සහන පතාගෙන ජාත්‍යන්තර ආයතනවලට යන ප්‍රජා කොටස් ගණන වැඩිවෙන එක වළක්වන්න නැත්නම් අධෛර්යට පත් කරන්න පුළුවන්කම තිබුණා. ඒ ප්‍රජා කොටස්වලට දෙමළ, මුස්ලිම්, ක්‍රිස්තියානි සහ අනෙකුත් අය ඇතුළත් වෙනවා.

මඩකලපුවේ පොලිස් නිලධාරීන් 600ක් මරා දැමීමත් එක්ක හදුනාගත් සිද්ධි විමර්ශනය කිරීම., උගත් පාඩම් හා ප්‍රතිසංධාන කොමිෂන් සභාව වාර්තාවේ ලැයිස්තුගත කරලා තිබුණා.

උගත් පාඩම් හා ප්‍රතිසංධාන කොමිෂන් සභාව, අභ්‍යන්තර වශයෙන් අවතැන් පුද්ගලයන්ගෙන් තොර ශ්‍රී ලංකාවක් තහවුරු කරන්න ඉඩම් කච්චේරි වගේ ඉඩම් කොමසාරිස්ගේ / කොමිෂන් සභාවේ නිර්මාණශීලී වැඩසටහන (උදා: 2011/04 විශිෂ්ට චක්‍රලේඛය) පදනම් කර ගත්ත, කාල සීමාවලට යටත් ඉඩම් නිදහස් කිරීමේ සහ පදිංචි කිරීමේ සැලසුම ක්‍රියාත්මක කරන්න උපදෙස් දුන්නා. ප්‍රධාන යුද හමුදා කඳවුරු එකක්වත් වහන්නේ නැතිව මේ දේ කරන්න තිබුණා. අවස්ථාවෝචිත විදිහට කුඩා පොකුරු හැටියට ඉඩම් නිදහස් කළත්, යුද හමුදාවේ එකඟත්වයයි සාධනීය සහයෝගිත්වයයි ඇතිව අවුරුදු 5කට ඉස්සෙල්ලා උතුරු ආණ්ඩුකාර කාර්යාලය යෝජනා කළ එක වගේ ජාතික හා ජාත්‍යන්තර වශයෙන් දෘශ්‍යමාන වූ, ඵලදායී, ඒ වෙනුවෙන්ම කැප වූ සාමූහික ඉඩම් නිදහස් කිරීමේ වැඩසටහනක් මම දැකලා නැහැ. ගැටුම අවසන් වෙලා අවුරුදු 11ක් ගතවෙලත්, උගත් පාඩම් හා ප්‍රතිසංධාන කොමිෂන් සභාවේ පටන් අවුරුදු දහයක් ගතවෙලත්, අභ්‍යන්තරිකව අවතැන් වූ පුද්ගලයන් විදිහට කාලය ගත කරන පවුල් 2500 ක් තවමත් උතුරේ (280ක් චුන්නාකම් කඳවුරෙත් + 2280ක් ඥාතීන් සමගත්) ඉන්නවා. එල්.ටී.ටී.ඊ. සංවිධානය පන්නපු මුස්ලිම් ජනතාවයි සිංහල ජනතාවයි තවමත් උතුරට ආපහු එන්න බලන් ඉන්නවා.

මේවා තමයි බොහොම පොඩි වෙහෙසක් දරලා ක්‍රියාත්මක කරන්න පුළුවන්කම තිබුණ පහසු උගත් පාඩම් හා ප්‍රතිසංධාන කොමිෂන් සභා නිර්දේශ:

ශ්‍රී ලංකා ආණ්ඩුව අමාරු කොටස පහසුවෙන් කළා, ඒ කියන්නෙ ආණ්ඩුව තමන් තෝරාගත්ත අකාරයට ගැටුම අවසාන කරන්න පුළුවන් වෙන විදිහට එක්සත් ජාතීන්ගේ ආරක්ෂක

කවුන්සිලයේ මැදිහත් වීම වැළැක්වූවා. අමාරු කොටස පහසුවෙන් අවසන් කරලා සෑහීමකට පත් වෙලා ඊට සාපේක්ෂව පහසු කොටසේ දී (පශ්චාත් යුද සමය) නැවතුණා.

ඉදිරි මගක්

මම මගේ අදහස් ප්‍රකාශ කරන්න පදනම් කර ගන්නේ 'ජාතික සහ අන්තර්ජාතික වශයෙන් පාර්ශ්වකරුවන් සමග සහයෝගයෙන් කටයුතු කිරීම හා තිරසර විසඳුම් පතා මූල හේතුවට පිළියම් යෙදීම' තුළින් අනාගතය දෙස බැලීමේ අවශ්‍යතාව ගැන අතිගරු ජනාධිපතිතුමා එක්සත් ජාතීන්ගේ මහා සභාවේදී වගේම මෑතක දී පැවැත් වූ යුද හමුදා සංවත්සරයේදී දක්වපු නිර්මාණශීලී අදහස්.

එක හේතුවක් නිසා ක්‍රියාත්මක කිරීමේ ඌනතා හඳුනා ගන්න ඕන. ඔබේ කොමිසම ඒ සඳහා අවංකවම ආණ්ඩුව සංවේදී කරන්න ඕන. උගත් පාඩම් හා ප්‍රතිසංධාන කොමිෂන් සභාව එක ඒක හරියටම කළා. ඒ ගැටළුවක් ප්‍රතික්ෂේප කිරීම විසඳුමක් නොවන හින්දා.

අපේ ගෞරවනීය අධිකරණයට ස්වාධීනව වගේම ඍජුව කටයුතු කරන්න පහසුකම් ලබා දෙන ගමන් වගවීමේ සංස්කෘතියක් ක්‍රමය පුරාම ප්‍රවර්ධනය කරන්න ඕන.

අන්‍යෝන්‍යව ක්‍රියා කරන කොටස් දෙක එක්ක ද්විත්ව ක්‍රමෝපායක්:

කාර්ය සාධක බලකා දෙකක්: එකක් ප්‍රතිසන්ධානය සඳහා උගත් පාඩම් හා ප්‍රතිසංධාන කොමිෂන් සභාව නිර්දේශ ක්‍රියාත්මක කරන්න; අනෙක වගවීම සඳහා පරණගම කොමිසමේ නිර්දේශ ක්‍රියාත්මක කරන්න. මං විශ්වාස කරනවා කොමිසම, පිළිසකර වන සංක්‍රාන්ති යුක්තිය මත පදනම් වුන යම් ආකාරයක සත්‍යය පිළිබඳ කොමිෂන් සභාවක් ගැන අනුමාන කළා කියලා.

මානව හිමිකම් කවුන්සිලයේ 40/1 හා 46/1ට සම්බන්ධ ක්‍රියාවලි ඉවර කරන්න උත්සාහයක් දරන්න පුළුවන් වෙන විදිහට (මෙරට තුළ) සකස් කළ ප්‍රවේශයට ප්‍රමාණවත් සහයෝගයක් ලැබෙන එක තහවුරු කරන්න, මානය හිමිකම් කවුන්සිලයේ යෝජනාවලට සම්බන්ධ ඊනියා ප්‍රධාන කණ්ඩායම සමග සාකච්ඡා කිරීම වගේම ශ්‍රී ලංකාවට හිතවත් රටවල් ඒ සඳහා පොලඹවන්න රාජ්‍යතාන්ත්‍රික ක්‍රමෝපායක් සකස් කිරීම.

පැහැදිලිවම, මේක සිද්ධ වෙන්න තිබුණේ 40/1 හා 46/1 යෝජනා සම්මත වෙන්න කලින්. නමුත් දැන් ඒ ගැන ලතවෙවී කාලය අපතේ යවලා ඵලක් නැහැ.

ඒ එක්කම ඒකත් හරියට සිද්ධ වෙලා නෑ නේද? අපේ නඩු පැවරීමේ ක්‍රියාවලිය ජිනීවා වෙතට පවරන මානව හිමිකම් කවුන්සිලයේ යෝජනා වගේම විශ්ව අධිකරණ බලය හා සම්බන්ධ ක්‍රියාමාර්ග තමන්ගේ ම වූ ගම්‍යතාවක් ඇතිව ඉදිරියට ගිහින් තියෙනවාද?

මංගල මුණසිංහ කමිටුව කාලෙ කළා වගේ මේ වැඩසටහන දියත් කරන්න සුළු ජාතීන්ගේ පක්ෂ ද ඇතුළුව දේශපාලන පක්ෂ අතර පොදු එකඟතාවක් ඇති කරගන්න ආණ්ඩුවට පුළුවන්කම තිබුණා නම් එහෙම නොවෙන්න තිබුණා. ඒකපාර්ශවීය ප්‍රතියෝජනා මාලාවක් වෙනුවට, ඔයාලට වුවමනා සියලුම කරුණු ඇතුළත් දැඩි දේශීය සංවාදයක්. රජයට, කාබනික පොහොර වගාවට කළ ප්‍රශංසනීය කැපවීම හා සමාන ශක්තිමත් කැපවීමක් කරන්න පුළුවන් නම්, මේ කිව්ව දෙය සාක්ෂාත් කර ගන්න පුළුවන් මට්ටමට ගෙන එන්න හොඳ උත්සාහයක් ගන්න පුළුවන්.

ඔස්ටින් ප්‍රනාන්දු

ශ්‍රී ලංකාවේ හිටපු ජනාධිපති ලේකම්

875. කොමිසම මේ රටේ දී වගේම පිටරටදීත් කතා වෙන වැදගත් දේවල් කීපයක් ගැන කටයුතු කරනවා. මම ඒවායින් සමහර කටයුතුවලට ටික කාලයක් සම්බන්ධ වෙලා තියෙනවා. මම

හිතනවා, ආපස්සට හැරී බැලුවහම, මම මේකට සම්බන්ධ වෙන්නෙ ආරක්ෂක ලේකම් වෙලා හිටපු කාලෙ ඉඳලා.

ඒ කාල පරිච්ඡේදය මොකක්ද?

ඔව්, ආරක්ෂක ලේකම්, 2001 දෙසැම්බර් වලින් පස්සෙ වර්තමාන ජනාධිපති, එතුමා අගමැති වෙලා හිටිය කාලයේ දී එල්.ටී.ටී.ඊ. සංවිධානය එකේ ප්‍රභාකරන් එක්ක අත්සන් කළ සාම ගිවිසුම කළමනාකරණය සිද්ධ වුනා. ඒක ආරක්ෂක හමුදාවයි පොලීසියයි එක්ක සටන් බිමේදි කළමනාකරණය කළ නිලධාරියා මමයි.

ඒ 2002 දී ද?

2002 දී. නමුත් මම ලේකම් වුණේ 2001 දෙසැම්බර් මාසෙ. සාම ගිවිසුම අත්සන් කළේ 2002 පෙබරවාරි 21 වෙනිදා, මගේ මතකය හරි නම්, මට එක පැත්තකින් එල්.ටී.ටී.ඊ. සංවිධානය එක්කත් අනෙක් පැත්තෙන් අපේ හමුදා එක්කත් ඒක කළමනාකරණය කරන්න සිද්ධ වුණා. එල්.ටී.ටී.ඊ. සංවිධානය පුහුණු කළේ මරන්න. ඒ හින්දා ඒගොල්ලො මනුෂ්‍ය ඝාතන සිදු කරමින් හිටියා. අපේ සන්නද්ද හමුදාවටත් මරන්න පුහුණු කළා. ඒත් ඒගොල්ලන්ට මිනිස්සු මරන්න එපා කිව්වා. ඒ හින්දා ඒක බොහොම දුෂ්කර පැවරුමක් වුණා. අද අපි මුහුණ දීලා තියෙන තත්ත්වයට හේතුව සාම ගිවිසුම අසාර්ථක වීමයි. මම කියන්න ඕන සාම ගිවිසුම අසාර්ථක වුනේ එල්.ටී.ටී.ඊ. සංවිධානය නිසා මිසක් අගමැති හෝ ශ්‍රී ලංකා ආණ්ඩුව නිසා නෙමෙයි කියලා. ප්‍රතිශතයක් විදිහට ගත්තොත් 80%ක් විතර අසාර්ථක වීමේ වගකීම පැවරෙන්නේ එල්.ටී.ටී.ඊ. සංවිධානය.

ගැටුම් පැවතුන කාලේ අවතැන් වූ සමහර මිනිස්සු අපි දැක්කා. තුවාල වුණු, තමන්ගේ අතපය, අවයව, දරුවන්, බිරින්දෑවරුන්, දෙමව්පියන්, දුවලා පුතාලා අහිමි වුණු මිනිස්සු අපි දැක්කා. ඒ අයට එල්.ටී.ටී.ඊ. සංවිධානය සලකන විදිහත් අපි දැක්කා. මිනිසුන් ගෙන් ලැබුණ පැමිණිලිත් තිබුණා. අපේ හමුදාවලිනුත් වැඩක් නැහැ කියලා මිනිසුන් ගෙන් ලැබුණ පැමිණිලිත් තිබුණා. ඒ හින්දා අද ඔබ මුහුණ දෙන ප්‍රශ්න වලින් සමහර ඒවා ඒ කාලයේ ඉඳලා නැත්නම් ඊටත් කලින් ඉඳන් එන ඒවා.

අපි දැකලා තියෙනවා දේශපාලන පක්ෂ නායකයෝ, විශේෂයෙන්ම දෙමළ ප්‍රජාවේ අය ලොකු ගණන් වලින් පක්ෂ මාරු කරනවා. අපි දැකලා තියෙනවා මායිම් ගම්මානවල දුක, කොහොමද ඒ මිනිස්සුන්ව මැරුවෙ කියලා. අපි මේ කොළඹ, දෙහිවල, පිළියන්දල, මොරටුව, කැබිතිගොල්ලෑව, මුත්තූර්වල බෝම්බ පිපිරීම් ගොඩාක් දැකලා තියෙනවා. සිංහල ද, දෙමළ ද, මුස්ලිම් ද කියලා වෙනසක් නැතිව මිනිස්සුන්ව මැරුවා. අපට තිබුණෙ මේ මළ කඳන් භාරදෙන්න. අපි දැක්කා 1987 ජූනි 02 වැනි දා අරන්තලාවේ දි බෞද්ධ භික්ෂූන් වහන්සේලා තිස් නමක් ඝාතනය කළා.

ඔව්, ඒක සිද්ධ වුණා. ඒ කාලෙ හිටපු ජයවර්ධන ජනාධිපතිතුමාට උවමනා වුනා මං ගිහිල්ලා අම්පාර නගරයේ ජීවත් වුන දෙමළ පවුල් 144ක් ගැන හොයලා බලන්නත් ඒගොල්ලන්ගෙන් එක්කෙනෙකුටවත් අතක් නොතියන තරමට එයාලාගෙ ආරක්ෂාව තහවුරු කරන්නත්.

අම්පාරෙ?

ඔව්. ඒ කාලෙ ආරක්ෂක ලේකම් ජෙනරාල් සේපාල ආටිගල, එතුමා හෙලිකොප්ටරයක් ලැහැස්ති කරලා දුන්නා, මම තනියමයි ගියේ. මිනිස්සු කලබල වෙලා හිටියේ. සමහර සිංහල මුදලාලිලයි, සමහරවිට මැරවරයොයි කලබල ඇති කරන්න සංවිධානය වෙවී හිටියේ. සිංහලයෝ, ඒගොල්ලො කිව්වා, ඒගොල්ලො මට කිව්වා "මුංගෙ කැවුතු කන්න ඕන" *(උන්ගේ බඩවැල් කන්න ඕන) කියලා. මම මේ මිනිස්සු මුණගැහිලා ඒගොල්ලොත් එක්ක විස්තර කතා කළා. මම අමාත්‍යාංශයක ලේකම් කෙනෙක් විදිහට, සරොං වලාපොට ගහගෙන දුම් බොන, ගංජා පවා බොන මිනිස්සු

ඉන්න අඳුරු ගුහාවක් වගේ තැනකට ගිහින් සැඩ පරුෂ භාෂාවෙන් දෙස් දෙවොල් තියන එක අහගෙන ඉන්න වුන එක, ඒක අතකට මට ලොකු අවමානයක්. මට සිද්ධ වුණා ඒගොල්ලන්ගෙන් කාටවත් කරදරයක් නොවිය යුතුයි කියලා පහදලා දෙන්න. වාසනාවට වගේ, එක පවුලකටවත් අත තිබ්බෙ නැහැ. භික්ෂූන් වහන්සේලා තිස් නමගේ ආදාහන කටයුතු රජයේ මුදල් වලින් කරන්න මම පොරොන්දු වුනා. මට ඒක කරන්න පුළුවන්කම තිබුණා මොකද මගේ අමාත්‍යාංශයේ අත්‍යවශ්‍ය සේවා කොමසාරිස් ජෙනරාල් යටතේ මුදල් තිබුණ නිසා. අන්තිමට අපි අත්‍යවශ්‍ය සේවා කොමසාරිස් ජෙනරාල්ගේ මුදල් වියදම් කළේ නැහැ. ඒ ආදාහන කටයුතු ජනතාවගේ වියදමින් සිදු කළා. ඉතින් මේවා තමයි 1987 ජූනි 2වන දා ඉඳලා ඉදිරියට සිද්ධ වුණ දේවල්.

ඇයි ඔබතුමාලා, ගෞරවනීය කොමසාරිස්වරු, මෙතන ඉන්නේ? ඇයි මම මෙතන ඉන්න? අපි ඔක්කෝම මෙතන ඉන්නේ කලින් පත් කළ කොමිෂන් සභාවල කටයුතු ගැනයි ඒවයේ නිර්දේශ ගැනයි සොයා බලන්න ශ්‍රේෂ්ඨාධිකරණ විනිශ්චයකාරවරයකුගේ ප්‍රධානත්වයෙන් ගෞරවනීය මහත්මයකුයි නෝනා කෙනෙකුයි එක්ක කොමිසමක් පිහිටුවන්න හිටපු ජනාධිපතිතුමා එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කවුන්සිලයට පොරොන්දු වෙලා තියෙන නිසා. ඔබතුමාලාගේ ලේකම්ගේ වචන වලින්ම කියනවා නම්, ඒ කොමිෂන් සභාවල සොයා ගැනීම් හඳුනා ගන්න වගේම, බරපතල මානව හිමිකම් උල්ලංඝණය කිරීම්, අන්තර්ජාතික මානුෂීය නීතිය බරපතල ලෙස උල්ලංඝණය කිරීම් එක්ක වෙනත් වැරදි පිළිබඳ කමිටුවල සොයා ගැනීම් හඳුනා ගන්නයි, මෙම ප්‍රශ්න සම්බන්ධයෙන් කටයුතු කළ යුතු ආකාරය ගැන නිර්දේශ කරලා තියෙනවාද කියලා හඳුනා ගන්නයි.

මං මේ කොමිෂන් සභා වාර්තා කීපයක් කියවලා තියෙනවා. මම පරණගම වාර්තාව සම්පූර්ණයෙන් කියවලා නැහැ. නමුත් උගත් පාඩම් හා ප්‍රතිසංධාන කොමිෂන් සභාව වාර්තාව කලින් කියවලා තියෙනවා. මම දරුස්මාන් වාර්තාව කියවලා තියෙනවා. උදලාගම වාර්තාවේ සමහර කොටස් කියවලා තියෙනවා. සමහර සොයා ගැනීම් වාර්තාගත වෙලා තියෙනවා. වරක් ඒවා වාර්තාගත වුනාම ඒවා ක්‍රියාත්මක කරයි කියලා ඔබ ගෙන් බලාපොරොත්තු වෙන බව මට තේරෙනවා. මම හිතන්නේ, ඔක්කොම ආණ්ඩුවලටයි ඔක්කොම ජනාධිපතිවරුන්ට, අගමැතිවරුන්ට, ඇමතිවරුන්ට සහ ලේකම්වරුන්ට නිසි ගෞරවය ඇතිව මම කියන්න ඕන, අපි එහිදී අසාර්ථක වුණා කියලා.

අපි අසාර්ථක වුණා?

ඔව්. මේක ඔප්පු කරන්න මං ළඟ තිබුණ පරණ ලියකියවිලි ටිකක් මං ගෙනාවා. ඒකට කියන්නෙ උගත් පාඩම් හා ප්‍රතිසංධාන කොමිෂන් සභාව නිර්දේශ ක්‍රියාත්මක කරන්න හැදුව ජාතික කාර්ය සැලසුම කියලා. මේකේ දිනය 2012 ජූලි 26.

මම දැන් ඔයාලට මේ ලේඛනය ගැන යමක් කියන්නම්. උගත් පාඩම් හා ප්‍රතිසංධාන කොමිෂන් සභාව වාර්තාවට අනුව 9.23. මම ඒක අහඹු විදිහට තෝරා ගන්නවා. 'ඒකෙන් කියනවා අත්අඩංගුවට ගැනීම නතර කළාට පස්සෙ සිද්ධ වුණ අතුරුදහන්වීම් ගැන තියෙන චෝදනා සම්බන්ධයෙන් සම්පූර්ණ විමර්ශනයක් දියත් කරන්න කියලා. ඒ වගේ විමර්ශනවලදි යුද හමුදාවේ තනි සාමාජිකයන්ගේ පාර්ශ්වයෙන් සිද්ධ වුන යම් නීතිවිරෝධී ක්‍රියාවක් ගැන සාක්ෂි ලැබුණොත් ඔවුන්ට විරුද්ධව නඩු පවරන්න. වැරදි කළ අයට දඬුවම් කරන්න කියලා. ඊළඟට ඒකෙ කියනවා, ඉහත 1,2,3 කලින් සඳහන් කළ අනිත් දේවල් තුන වගේමයි කියලා. එයාලා කියනවා මාස දොළහක් ඇතුළත අපි දැනට කරගෙන යන විනය ක්‍රියාවලිය සම්පූර්ණ කරනවා, සම්පූර්ණ කරපු ගමන්ම අදාළ තැන්වලදි නඩු පවරන්න අවශ්‍ය පසුවිපරම් ක්‍රියාමාර්ග ගන්නවා කියලා. සැලසුම් කළේ මාස විසිහතරකට, දැන් අවුරුදු දහයක් ගිහිල්ලා. මම දන්නෙ නෑ පසුවිපරමක් ගැන කවදාහරි ආරංචි වුණා ද කියලා.

ගරු සභාපතිතුමනි, ඔබතුමාට නීතිපති දෙපාර්තමේන්තුවෙන් කරුණු විමසන්න බලය තියෙනවා. ඔබට යුද හමුදා අණදෙන නිලධාරියාගෙන් අහන්න පුළුවන් පරීක්ෂණ කීයක් පවත්වලා තියෙනවාද, විනය ක්‍රියාමාර්ග කීයක් අරගෙන තියෙනවා ද, සන්නද්ධ හමුදා නිලධාරීන්ට එරෙහිව නඩු පවරලා තියෙනවාද යනාදී දේ. දැන් මේක එකක්. මම ගන්නවා තවත් අහඹු උදාහරණයක්. මම නිකං මගේ ඇඟිල්ල මෙතන තිබ්බොත්, ඒකෙන් කියන්නෙ ඔය කියන 9:51 විමර්ශනය කරන්න විශේෂ විමර්ශන කොමසාරිස්වරයකු පත් කරන්න කියලා. ඔය කියන අතුරුදහන්වීම් විමර්ශනය කරන්න විශේෂ විමර්ශන කොමසාරිස්වරයකු පත් කරන්න, නීතිපතිට අවශ්‍ය කරුණු සපයන්න වගේ දේවල්.

ඒක මාස තුනක් ඇතුළත සම්පූර්ණ කරන්නයි යන්නේ. අපේ ආණ්ඩු බොරු කියලා තියෙන්නේ.

බොරු කිව්වා?

ඔව්, බොරු කිව්වා, ඒ හින්දා තමයි අපට මේ ප්‍රශ්න. ඒකයි ජනාධිපති ගෝඨාභය රාජපක්ෂට සිද්ධ වුණේ එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කොමිෂන් සභාවට ''මේවා ඔක්කොම ගැන හොයලා බලන්න මම අළුත් කොමසාරිස්වරු පත් කරන්නම්'' කියලා කියන්න. කරපු දේවල් එකක් හෝ දෙකක් ඇති. මම ඒක නෑ කියන්නේ නෑ. ඔබේ ඇඟිල්ල ඕනෑම තැනකින් තියලා ඒක කියවන්න. ''රැඳවියන් පරීක්ෂා කරලා බාලවයස් අයට, ඒ වගේම විශේෂ අය, ඒ කියන්නෙ පොඩි දරුවන් ඉන්න අයට, ශාරීරික ආබාධ ඇති අයට, සුවවෙන තුවාල ඇති අයට, වෛද්‍ය මැදිහත් වීම, උපදේශනය අවශ්‍ය අය වැනි අයට විශේෂ අවධානයක් යොමු කරන්න.'' මට දැනගන්න ඕනෑ මේවා සිද්ද වෙලාද කියලා. ඉතින් මම මේකෙන් ඉවර කරන්නම්. මට මුළු කාලයම ගන්න වුවමනා නෑ මොකද මට මේ විශේෂ දේ ගැන විතරක්ම පැය දෙකක් කථා කරන්න පුළුවන් නිසා. ඉතින් ඒක නිසා මම ඒක පැත්තකින් තියන්නම්.

මම කියන්න ඕනෑ අපි සත්‍ය සහ ප්‍රතිසන්ධාන කොමිෂන් සභාවක් ගැන හිතනකොට විවේචන ගොඩාක් තියෙනවා. අපි වගවීමේ යාන්ත්‍රණයක් ගැන හිතනවා. අපි මිනිස්සුන්ට නඩු පවරන එක ගැන හිතනවා. විවේචන තියෙනවා, මේ විවේචනවලින් සමහර ඒවා වලංගුත් වෙනවා. මම සාධාරණව ඒ විවේචකයන්ට කියන්න ඕනෑ, එයාලා කියනවා දරුස්මාන් වාර්තාවේ දීලා තියෙන ගණන් වැරදියි කියලා. ඔව්, මම ඒකට එකඟයි. එයාල එක එක ගණන් කිය කිය හිටියා. මම හිතනවා ඒ ගණන 140,000ක් නැත්නම් 160,000ක් කිව්වේ මන්නාරමේ මියගිය බිෂොප්වරයා.

එතකොට සමහර මිනිස්සු කිව්වා 100,000යි, 40,000යි කියලා (100,000,40,000). එතකොට, ඒ ගණන 7000යි කියලා කිව්ව එක්කෙනා තමයි නේස්බි සාමිවරයා. ඔහු ඒක කිව්වා. ඔහු කිව්වෙ ඔහුගේ ලිපිලේඛන අනුව; මගේ ළඟ පිටපත් තියෙනවා. මං ළඟ මුල් පිටපත් නෑ. මුල් පිටපත් සමහර විට ජනාධිපති ලේකම් කාර්යාලයේ කොහේ හරි ඇති. මට හරියට මතක නම් ඔහු කිව්වේ ගණන 7000ක් නැත්නම් 7000ක් විතර වෙනවා කියලා. කොමසාරිස්තුමියනි, ඔබ උතුරෙන් නිසා ගණන දන්නවා ඇති.

යහපාලන ආණ්ඩුව කාලේ, මම ආණ්ඩුකාරවරයෙක්. ලියකියවිලි හදන්න වගේම සමහර යෝජනා ක්‍රියාත්මක කරන්නත් උදව් කරන්න කියලා මංගල සමරවීර ඇමතිතුමා මට කිව්වා. එතුමා අනියම් විදිහට ක්‍රියාකාරී කණ්ඩායම් හතරක් පත් කළා. මම තුනක හිටියා. මම හිටියෙ නැති එකම එක ක්‍රියාකාරී කණ්ඩායම වගවීමේ යාන්ත්‍රණය පිළිබඳ කණ්ඩායමේ. ඒ මොකද ඒක නීතියට සම්බන්ධ කාරණයක්; මම දන්නවා නීතිඥයෝ කිහිප දෙනෙක් ඒකට සම්බන්ධ වෙලා හිටියා. මම උනන්දුවෙන් හිටිය නිසා මට එතැන සිද්ධ වුන දෙය (feedback) දැන ගන්න ලැබුණා. මට මේ කණ්ඩායමෙන් ලැබුණ සටහන් මම කියෙව්වා. අනෙක් තුන, මම හිතන්නේ මම සඳහන් කරන්න ඕන, ප්‍රතිසන්ධානයේ මූලික කරුණු හතර මත පදනම් වෙලා තිබුණා. සත්‍ය සෙවීමේ කණ්ඩායමේ (Truth-seeking group) මමයි, මහාචාර්ය සාවිත්‍රි ගුණසේකරයි, ප්‍රශාන්ති

මහින්දරත්නයි, සුරේන් ප්‍රනාන්දුයි, මනෝරි මුත්‍රුවගමයි, රමණි මුත්‍රුවගමයි, රාම් මාණික්කලිංගම්, විදේශ කටයුතු අමාත්‍යාංශයෙන් අසීස් වගේම අපිට හිටියා මියගිය එන් පද්මනාදන්. එතුමා ඒ කාලේ පුනරුත්ථාපන කොමසාරිස් ජෙනරාල්; ඒ වගේම පුද්ගලයින්, දේපළ හා කර්මාන්ත පුනරුත්ථාපන අධිකාරියෙත් හිටියා. මං හිතන්නෙ එතුමා ඒ අධිකාරියේ සභාපති. අපි සත්‍ය සහ ප්‍රතිසන්ධාන කොමිෂන් සභාවකට සංකල්ප පත්‍රිකාව / පනත් කෙටුම්පත හැදුව කණ්ඩායමේ හිටියා. අතුරුදහන්වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයටත් සංකල්ප පත්‍රිකාව / පනත් කෙටුම්පත හැදුවෙ අපි.

හුඟක් හොඳ නීතිඥයෝ ඒකේ හිටියා; අපි නීති කෙටුම්පත් කරලා දේශපාලන අධිකාරීන්ට යැවුවා. පස්සෙ එයාලා ඒක එතැනින් නීති කෙටුම්පත් සම්පාදකට යැවුවා. අතුරුදහන්වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය කළෙත් ඒ විදිහට. සත්‍ය සහ ප්‍රතිසන්ධාන කොමිෂන් සභාව ටික කාලයක් ක්‍රියාත්මක වුනේ නෑ. මම කණගාටු වුණා සත්‍ය සහ ප්‍රතිසන්ධාන කොමිෂන් සභාව සාකච්ඡා මට්ටමේ පවතිනවා කියලා අලි සබ්‍රි ඇමතිතුමා කිව්වාම. ඒ මොකද, වර්තමාන ජනාධිපතිතුමා, 2018 අගමැති වෙලා ඉන්නකොට අමාත්‍ය මණ්ඩලයට යවපු වාර්තාවක් තිබුණා. ඒකෙ තවත් සාකච්ඡා කරන්න තියෙන්නේ මොනවාද?

මට දැන් ඔබෙන් අහන්න ඕන 2018 දි ඒක භාර දුන්නා. ඉතින් ඇයි ඒක දිගටම ඉදිරියට කරගෙන ගියේ නැත්තේ?

ආහ්, ඒක බොහොම සරල උත්තරයක්. ඔක්තෝබර් 26 වන දා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා කුමන්ත්‍රණයක් සිද්ධ වුණා. සිරිසේන ජනාධිපතිතුමා එතකොට හිටියෙ. අගමැති රනිල් වික්‍රමසිංහව පන්නා දැම්මා. මේ සිද්ධිය ඒ කාලෙදිම සත්‍ය සහ ප්‍රතිසන්ධාන කොමිෂන් සභාව පනත් කෙටුම්පත කුණු කූඩයට විසි කරලා දාන්න ඇති.

ඒ කාලෙදි ජනාධිපති ලේකම් ඔබ ද?

මම එතන හිටියේ නැහැ. මම 2018 ජූලි 5වන දා තනතුර අත්හැරියා. මම මහ කොමසාරිස් විදිහට ඉන්දියාවට යන්න ලැහැස්ති වෙවී හිටියේ.

අමාත්‍ය මණ්ඩලය කවදාවත් මේක සාකච්ඡා කළේ නැහැ?

මම හිතන්නේ නැහැ මොකද 2018 ඔක්තෝබර් 26වෙනිදාට පස්සේ තත්ත්වය වෙනස් වුණ නිසා. වෙනත් දෙයක් ප්‍රමුඛත්වය ගනිමින් තිබුණා. මාස දෙකක් තිස්සේ. එතකොට. ඒක ආයෙත් මතුවෙන කාලෙ වෙනකොට, එයාලා පාර්ලිමේන්තුව විසුරුවන්න සැලසුම් කර කර හිටියෙ. වෙන එක එක විදිහේ දේවල් සිද්ධ වෙවී තිබුණා. ඉතින්, ඉබේම මේ දේවල් පැත්තකට විසි වුණා. ඒක නිකම්ම කුණු කූඩයට විසිවෙන්න ඇති. මම කියන්නේ, 2015 දි අපි පොරොන්දු වුණා. 2018 දි අමාත්‍ය මණ්ඩල පත්‍රිකාවක් ගෙනාවා. ඒකත් අසාර්ථක වුණා.

ඉතින් කොහොම හරි මේ දේවල් අසාර්ථක වෙලා තියෙන හින්දයි මෙහේ ආණ්ඩුවට ..... ජනාධිපති රනිල් වික්‍රමසිංහ සහ සමාගමට වගේම ජාත්‍යන්තරයට පිළිගන්න පුළුවන් දෙයක් සකස් කරන්න ඔබ හිතන හින්දයි මම කැමතියි විසඳුම් කිහිපයකට එන්න.

මම හිතනවා මට සරලව කියන්න කරුණු කීපයක් කියන්න පුළුවන් කියලා සත්‍ය සහ ප්‍රතිසන්ධාන කොමිෂන් සභාව එක හදද්දී අපි අසාර්ථක වුණ තැන් ගැන. දැන් මම දන්නෙ නැහැ දකුණු අප්‍රිකාවේ මහ කොමසාරිස් මේ කොමිසමට කිව්වේ මොනවාද කියලා. කොහොමද කොමිසමක් අවශ්‍යතාවක් බවට පත්වෙන්නේ, ජාතික තෝරා ගැනීමක් වශයෙන්? අපිට හොයලා බලන්න සිද්ද වෙනවා. සත්‍ය සහ ප්‍රතිසන්ධාන කොමිෂන් සභාව එකක් නැතිව, එයාලා මුහුණදීලා තියෙන ප්‍රශ්න තෝරන්නවත් ආයෙත් පිළිවෙලට හදන්නවත් බැරි බව එයාලා දැනගෙන හිටියා.

දැන්, ඇයි අපි ඒක කරන්නේ? ඒ මේ රටේ අයට සංක්‍රාන්ති යුක්තිය ඕන නිසාද නැත්නම් විදේශිකයන්ට ඒක ඕන නිසාද? විජාතිකයන්ගේ තේරීමක් නිසා අපි ඒක ජාතික තේරීමක් කර ගන්නවා! එයාලා ඉල්ලන්නේ ඒ වගේ දේවල්.

මේ වගේ මානව හිමිකම් උල්ලංඝණය කිරීම් අනිත් රටවලත් සිද්ධ වෙනවා, උදාහරණයක් විදිහට ඉන්දියාවේ. ඉන්දියාව ඒකට ප්‍රසිද්ධයි. වර්තමාන ආණ්ඩුව, භාරතීය ජනතා පක්ෂ ආණ්ඩුව තමන්ගේ NRC එකේ ඉන්න මුස්ලිම් අයට පුරවැසි ලේඛනය විවේචනයට ලක් කිරීමත් එක්ක සළකන විදිහ. සමහර වෙලාවට කොහොම ද ගැහැණු මරන්නෙ? කොහොම ද පිරිමි මරන්නේ? ඒවත් උල්ලංඝණය කිරීම්. ඒ වුනත් ජාත්‍යන්තරය එයාලාට අත තියන්නේ නෑ. අපි දුප්පත් පොඩි රටක් නිසා ඒක සිද්ධ වෙනවා.

කොමිෂන් සභා සාමාජික චන්ද්‍රා ප්‍රනාන්දු මහතා:

ඒකද එකම හේතුව?

වෙන හේතුත් තියෙනවා. තවත් එක හේතුවක් තමයි මොනවා කිව්වත් කළත් හින්දුතාවා චින්තනය නිසා ආණ්ඩුව ඉතාමත් ශක්තිමත්. එයාලා ඉතාම ශක්තිමත්. සමහර විට ඒක මෙහෙත් වෙන්න පුළුවන්. සුප්‍රසිද්ධ සාෆි වෛද්‍යවරයාගේ සිද්ධියයි ඊට පස්සෙ සිද්ධ වූ දේවල් ඔක්කොමයි සළකන්න. මේ ගැටළුව දේශපාලන වාසි බලාපොරොත්තුවෙන් නිර්මාණය කළා. ඒක සිද්ධවෙමින් තියෙනවා.

ඉතින් මට කියන්න ඕන දේ තමයි ඒ වගේ තත්ත්වයක දී කොහොමද නීතියක් හදන්නේ. දැන් මේ සත්‍ය සහ ප්‍රතිසන්ධාන කොමිෂන් සභාව නීතියත් ඒ වගේ නිර්මාණයක් ද? කවුද ඒක හැදුවේ? අපි ඒක හැදුවේ - සාවිත්‍රි ගුණසේකර, අනිත් නීතිඥවරු වුණේ සුරේන් ප්‍රනාන්දු, ප්‍රශාන්ති මහින්දරත්න, සහ අනෙකුත් අය. අපි තමයි එකට එකතු වෙලා ඒක හදපු අය. ඊට පස්සෙ ඒක ගියා විදේශ කටයුතු ඇමතිතුමාට, එතැනින් අගමැතිතුමාට සහ අමාත්‍ය මණ්ඩලයට. ඒක ආණ්ඩුවට ප්‍රයෝජනවත් දෙයක් වුණා මිසක ජාතික වශයෙන් වාසියක්වත් සැළකිය යුතු යමක්වත් වුණේ නැහැ.

අපේ පර්යේෂණවලින් පෙන්වනවා ඒක, ඇත්ත වශයෙන්ම ප්‍රශංසනීයයි ඒක අරගෙන තියෙන්නේ .... යම් විශේෂ අකෘතියකින් නමුත් ඒක හොඳයි.

මට කියන්න ඕන දේ තමයි අනිත් රටවල සිවිල් සමාජය, රාජ්‍ය නොවන සංවිධාන, දේශපාලඥයෝ සමහර වෙලාවට විදේශීය සංවිධාන එකට එකතු වුණා. දැන් දකුණු අප්‍රිකාව සඳහා කොමසාරිස්වරු පත් කරන කොට එයාලා ඉල්ලුම්පත් කැඳෙව්වා; ඉල්ලුම්පත් 300ක් විතර ලැබුණා. එයාලා ලැයිස්තුව 50කට කෙටි කළා. ඒ පනස්දෙනා සම්මුඛ පරීක්ෂණයට භාජනය කළා. 25 දෙනෙක් තෝරා ගෙන ජනාධිපති මැන්ඩෙලාට යැව්වා; එතුමා 17 දෙනෙක් තෝරා ගෙන ඔවුන්ව පත් කළා.

මෙහේ මොකද වෙන්නේ? අතුරුදහන්වූ තැන්ත්තන් පිළිබඳ කාර්යලය වුනත්, හානිපූරණය වුනත්, සත්‍ය සහ ප්‍රතිසන්ධාන කොමිෂන් සභාව වුනත් ඒක මොකක් වුනත්? ඔබට දකින්න තියෙනවා ද ඒ වගේ සිද්ධ වෙන දේවල්? සමහර විට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව ඒ ගැන කල්පනා කරනවා වෙන්න පුළුවන්, මම දන්නෙ නැහැ දැන් ඒක වෙනවා ද කියලා. දැන් ඒක ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවක් තරම් ශක්තිමත් නැති පාර්ලිමේන්තු සභාවක් නිසා. ඉතින් අපි කුසලතා මත මිනිස්සු තෝරන්නෙ නෑ.

ඒ නිසා තමයි උදලාගම කොමිෂන් සභාවට කොමසාරිස්වරු අටදෙනෙක් හිටියෙ; එයාලගෙන් පස්දෙනෙක් නීතිඥයෝ.

දැන්, ඔක්කෝටම ඉස්සෙල්ලා, ඔබ මේ දේවල් අහනකොට මම සෙන්චෝලෙයි සිද්ධිය ගැන කතා කරන්නම්. සෙන්චෝලෙයි සිද්ධියට සම්බන්ධ සොයා ගැනීම තමයි පහරදීම අවුස්සගත්තේ එල්.ටී.ටී.ඊ. සංවිධානයයි කියන එක.

ඒ දේ සිදු වුනේ එල්.ටී.ටී.ඊ. සංවිධානය හින්දා?

ඒක එල්.ටී.ටී.ඊ. සංවිධානයේ වැඩක්; ඒ නිසා එල්.ටී.ටී.ඊ. සංවිධානය යුද හමුදාව අවුස්සගත්තා.

මේක තමයි වාර්තාව කියන දේ.

ඔව්, මේවා උදලාගම වාර්තාවේ තියෙන සෙන්චෝලෙයි සිද්ධිය ගැන විස්තරවලින්.

උදලාගම වාර්තාව

ඊළඟට ඒකෙ කියනවා සෙන්චෝලෙයි සිද්ධිය ගැන ජාතික ආරක්ෂක කවුන්සිලයට දැනුම් දුන්නා කියලා. ජාතික ආරක්ෂක කවුන්සිලය මගින් ගත්ත තීරණයක් තිබුණා; ඒ තීරණය පදනම් කර ගෙන තමයි ඉලක්ක කිරීම කරලා තියෙන්නේ. මට හිතා ගන්න බෑ මම දන්නේ නෑ ජාතික ආරක්ෂක කවුන්සිලය මගින් තීරණය කරලා නියෝග කරපු දෙයක් ගැන පරීක්ෂා කරන්න ජනාධිපති කොමිෂන් සභාවකට කියන්න ආණ්ඩුවට වුවමනා වුනේ ඇයි කියලා. මම ඔයාලාට කියන්නේ ජනාධිපති කොමිෂන් සභාවක විෂය පථයේ තියෙන දේ තාර්කික විය යුතුයි කියලා. ඒක අතාර්කිකයි. ඒ මොකද උදලාගම වාර්තාවට අනුව ජාතික ආරක්ෂක කවුන්සිලය තමයි තීරණය කරලා තියෙන්නේ සෙන්චෝලෙයි ඉලක්ක කරන්න.

නමුත් දැන් ආධාරකරුවෝ.....

ආධාරකරුවෝ නෙමෙයි. මෙතන තමයි හරියටම දැන් කුමරන් පත්මනාදන් පදිංචි වෙලා හිටියේ. ඒ කාලේ එයා එහෙ නෙමෙයි හිටියෙ. එයා හිටියේ මැලේසියාවේ. ඉතින් සෙන්චෝලෙයි ගැන සලකා බැලුවොත්, ඒක කරගෙන ගියේ අනාථ නිවාසයක් විදිහට. ඒක තමයි මිනිස්සුන්ට තිබුණ අවබෝධය. නමුත් ආණ්ඩුවට තිබුණේ වෙනින් අවබෝධයක්. ඒ අවබෝධය තමයි ඒක එල්.ටී.ටී.ඊ. සංවිධානය පුහුණු කඳවුරක් කියන එක. ඒ වගේම යුද්ධයක් තියෙනකොට ඔබ සාතන කරනවා. එල්.ටී.ටී.ඊ. සංවිධානය බෝට්ටු උවමනාවෙන්ම නාවික හමුදා බෝට්ටුවල හැප්පිලා මුහුදේ දී ඇති කර ගත්ත ගැටුම්වලට මම සම්බන්ධවෙලා තියෙනවා. මම ඒක දැනගෙන හිටියා. ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම් කෙනෙක් හැටියට දැනගෙන සිටිය යුතුව තිබුණ නිසා මම දැනගෙන හිටියා පහර දෙන එක හරි කියලා. කවුරුවත්, එල්.ටී.ටී.ඊ. සංවිධානයවත්, බෝට්ටුවල හිටිය කොල්ලො මරන එක ගැනවත් ගිලෙන එක ගැනවත් කවදාවත් විරුද්ධ වුනේ නෑ. එයාලා කවදාවත් ඒක ගැන ප්‍රශ්න කළේ නෑ. ඉතින් මම කියන්නේ ඒක අයින් කරන්න ඕන කියලා ජාතික ආරක්ෂක කවුන්සිලය තීරණය කළාම, ඒ සිද්ධියෙන් පස්සෙ වැරදිලා තියෙන්නේ මොනවාද කියලා පරීක්ෂා කරන්න විනිශ්චයකරුවකුටයි නීතිඥයෝ පස්දෙනෙකුටයි කියන්නෙ ඇයි? කොමිෂන් සභාවකින් බලාපොරොත්තු වෙන්න පුළුවන් ඉතාමත්ම අසාධාරණ දේ.

වීඩියෝ සාකච්ඡාව කුමක් ගැන ද?

විදේශගතව ජීවත්වන මිනිසුන්ගෙන් සාක්ෂි ලබාගන්න.

සාක්ෂි දෙන්නද?

ඔව්, ස්කයිප් (skype) හරි සූම් (zoom) හරි මොකක් හරි තාක්ෂණික උපකරණයක් හරහා.

නෑ. නෑ. උදලාගම කොමිෂන් සභාව තිය තිය හිටිය වීඩියෝ සාකච්ඡා නැවැත්තුවා. දැනුවත්ව ද නොදැනුවත්ව ද මම දන්නේ නෑ.

එයාලා ඒක නවත්වන්න තීරණය නොකර ඉන්න තිබුණා.

මට ඒකත් එක්ක කිසිම ප්‍රශ්නයක් නැහැ. ඔබ දන්නවා ආණ්ඩුව වීඩියෝ සාකච්ඡා නැවැත්වුවොත් ඒක ආණ්ඩුවේ ප්‍රශ්නයක්. මට ඒකත් එක්ක කරන්න දෙයක් නැහැ. මම ආණ්ඩුව නොවෙයි; සල්ලි නොදීපු එක ගැන මට කිසිම ප්‍රශ්නයක් නැහැ මොකද, මම ජනාධිපති ලේකම් වුණා නම් මම සල්ලි දෙන නිසා.

පොදු ක්ෂමාව දෙන වෙනත් රටවල් තිබුණා. නමුත් මම හිතන්නේ එයාලා ඒක කරන්නේ මිනී මැරීම්වලට, ස්ත්‍රී දූෂණවලට නොවෙයි. ඉතින් ඒ වගේම අපි මුහුණදීලා තියෙන ගැටළු අනුව, අපි ජීවිතය දිහා බලන විදිහ අනුව ඒක අවස්ථානුකූල වෙන්න ඕන. අපි දෙන්නා කර්මය කියන කෝණයෙන් සිද්ධ වෙන දේවල් දිහා බලන්න පුළුවන්. 'ඒක සිද්ධ වුනේ කර්මය නිසා' නමුත් වෙන කෙනෙක් ඒ දිහා ඒ විදිහට නොබලන්න පුළුවන්. එතකොට ඔබට ඒ දේවල් දිහා ඒ විදිහට බලන්න වෙනවා.

දේශපාලන කැමැත්ත - දේශපාලකයෝ සත්‍ය සහ ප්‍රතිසන්ධාන කොමිෂන් සභාව එක ගැන බරපතල විදිහට හිතනවාද නැත්නම් එයාලා ඒක සළකන්නේ ආණ්ඩුවට ඕන ඇඳගෙන ගිහිල්ලා ප්‍රදර්ශනය කරන්න පුළුවන් බාහිර ඔපය තියෙන ඇඳුමක් විදිහට ද. දේශපාලන කැමැත්ත තමයි කොමසාරිස්වරු හරි විදිහට තෝරන එකෙන්, මුදල් ලබාදෙන එකෙන් වගේම අනෙක් පහසුකම් ලබාදීමෙන් වැළකී ඉන්න එක.

මම හිතන්නෙ ලක්ෂ්මන් කදිරගාමර් සතන විමර්ශනය සඳහාත් දිනවකවානු තීරණය කළේ උදලාගම කොමිෂන් සභාව, නමුත් ඒක සිද්ධ වුනේ නෑ. අපිට තේරෙනවා ඇයි කියලා. ඇයි ඒක නොගත යුත්තේ කියලා, ගොඩක් අර්ථ කථන තියෙනවා. හරියටම සෙන්ෂෝලෙයි සිද්ධිය වගේම අපි ඒකටත් අවසර නොදී ඉන්න තිබුණා. ලක්ෂ්මන් කදිරගාමර් සිද්ධිය ලැයිස්තුවට ඇතුළත් වෙන්න ඕන එකක් නෙමෙයි. ඇත්ත වශයෙන්ම ඒක ඉල්ලා අස්කර ගෙන, නමුත් ඒක ඉතාම සංවේදී නිසා මම ඒක ඇතුලත් කරන්නේ නැහැ. ඒක දේශපාලනික වශයෙන්, ජාතිවාදී වශයෙන්, ජනවාර්ගික වශයෙන් සංවේදි දෙයක්.

ඊළඟට කාර්ය මණ්ඩලය ලබා දීම, මුදල් ලබා දීම, ලිපිලේඛන නිදහස් කිරීම තවත් ගැටළු. ඔබ කේ.සී. ලෝගේස්වරන්ගේ ස්වයංචරිතාපදානය කියෙව්වොත්, ඔහු මේ සමහර දේවල් ගැන ඒකෙ කථා කරනවා. මම සැක කරනවා ඔහු කියන්නෙ නැති දේවලුත් තියෙනවා කියලා. ඇත්ත වශයෙන්ම, මම නිකං ඔහුගෙන් ඇහුවා. මම ඔහුගේ ස්වයංචරිතාපදානය කියවලා එතුමාගෙන් ඇහුවා. මම ඇහුවා ඇයි එතුමා ඉල්ලා අස්වුනේ කියලා. නෑ. නෑ මම ඔබට පෙන්නන්නම් මම පත්තරයට ලියපු වාර්තාව. මේක ගොඩක් කාලයකට ඉස්සෙල්ලා එකක්. 2010 ජුනි 10 වන දා "*දි අයිලන්ඩ්*" (The Island) පත්තරයට ලියපු එකක්. මම ලිව්වේ '*Learn Reconciliation from South African Old Lady* - දකුණු අප්‍රිකානු වයසක කාන්තාවගෙන් ප්‍රතිසන්ධානය ඉගෙන ගන්න.' මම ඒක ලිව්වේ '*Call me David* - මට ඩේවිඩ් කියලා කතා කරන්න' කියන පොත කියෙව්වාට පස්සෙ. මම හිතන්නේ ඒක ලිව්වේ ඕස්ට්‍රේලියානු ජාතිකයෙක්. ඒකෙ පසුබිම් කථාව බොහොම රසවත්. එකම දේ ඒක මෙහේ සිද්ධ වෙයිද කියන එකයි. මම ලිපියේ කොටසක් කියවන්නම්, මුළු එකම නෙවෙයි. ඒ කතාව ස්වාමිපුරුෂයා පැහැර ගෙන ගිය කාන්තාවක් ගැන. එක දවසක් ස්වාමිපුරුෂයා පෙන්නන්න අපරාධකාරයෝ මේ කාන්තාව එක්ක ගෙන ගියා. ඔහුට පහර දීලා ඇටකටු කඩලා තිබුණෙ. එතැන දී ඒ අපරාධකාරයෝ ඔහුට ගිනි තිබ්බා. සුදු මිනිස්සු ඔහුව පිච්චුවා. එයාලා සොල්දාදුවො; නැත්නම් පොලිසියෙ; කවුරු හෝ වේවා. අර මනුස්සයා

එතන පිච්චෙන කොට ඔවුන් සාදයක මත්පැන් බී බී හිටියේ. ඇය ආපහු ආවා. ඔබගේ ඉරියව්වලින් මම දන්නවා කොමසාරිස්තුමියනි, අහගෙන ඉන්න හරිම අමාරුයි කියලා.

ඊ ළඟට මම හිතන්නේ දවස් කිහිපයට පස්සේ, එයාලා ඇවිත් ඇයගේ පුතා අරගෙන ගියා.

ඇය ගිහින් මේක සත්‍ය සහ ප්‍රතිසන්ධාන කොමිෂන් සභාව එකට වාර්තා කරනවා; මේ කණ්ඩායමේ නායකයා වුන වැන් ඩී බෘක් මහත්තයාව කැඳවලා ප්‍රශ්න කළා. එයා පිළිගන්නවා ඒගොල්ලො ඔහුව මැරුවා කියලා. ඊළඟට ඒගොල්ලො අර ගැහැණු කෙනාගෙන් ඇහුවා, මේ කොටස මම කියවන්නම්. 'දැන් කාන්තාව උසාවි කාමරයේ හිටගෙන වැන් ඩී බෘක් මහත්තයා කරන පාපොච්චාරණය අහගෙන ඉන්නවා. කොමිසමේ සාමාජිකයෙක් ඇය දිහාට හැරිලා ඇහුවා, "ඉතින් ඔබට මොනවා ද ඕන? ඔබගේ පවුල ඔය තරම් කුරිරු විදිහට විනාශ කළ මිනිහාට එරෙහිව යුක්තිය ඉෂ්ට කරන්නේ කොහොමද?"

සභාපති:

දකුණු අප්‍රිකානු සත්‍ය සහ ප්‍රතිසන්ධාන කොමිෂන් සභාව ක්‍රියාවලියේ තියෙන රසවත්ම කොටස තමයි අපරාධකාරයයි චින්දිතයයි මුහුණට මුහුණ හමු වෙන එක.

ඔව්, "මට දේවල් තුනක් ඕන," කාන්තාව පටන් ගත්තා, සන්සුන්ව ඒත් විශ්වාසයකින් යුතුව.

"ඉස්සෙල්ලාම මට ඕන මගේ ස්වාමියාගේ දේහය පුච්චපු තැනට මාව ගෙනියන එක. එතකොට මට පුළුවන් මගේ ස්වාමියාගේ අළු එකතු කරල ඒවා ගෞරවනීය විදිහට භූමදානය කරන්න."

ඇය ටිකක් නැවතිලා ආයෙත් පටන් ගන්නවා. මගේ ස්වාමියයි පුතයි තමයි මගේ එකම පවුල. ඒ නිසා මට දෙවනුව ඕන වැන් ඩී බෘක් මහත්තයා මගේ පුතා වෙන්න. මා ළඟ කොපමණ සෙනෙහසක් ඉතිරි වෙලා තියෙනවා ද කියලා මට ඔහුට කියන්න පුළුවන් වෙන විදිහට මම කැමතියි ඔහු මාසෙකට දෙසැරයක් ගෙටෝ (ghetto) වලට ඇවිත් මාත් එක්ක කාලය ගත කරනවා නම්. "

අන්තිමට, ඇය කියනවා "මට තුන්වන දෙයකුත් ඕන. මම කැමතියි වැන් ඩී බෘක් මහත්තයා දැනගන්නවා නම් මම එයාට සමාව දෙනවා කියලා. මොකද ජේසුස් ක්‍රිස්තුස් වහන්සේ මිය ගියේ සමාව දෙන්න නිසා. මෙය මගේ ස්වාමියගේ ද කැමැත්ත වුණා; ඒ නිසා මට වැන් ඩී බෘක් මහත්තයාව අතින් අල්ලාගෙන, වැළඳගෙන මම ඇත්තටම එයාට සමාව දුන්නා කියලා දන්වන්න පුළුවන් වෙන විදිහට කවුරුහරි මගේ ළඟට ඇවිල්ලා මේ උසාවි කාමරය හරහා මාව වැන් ඩී බෘක් මහත්තයා ළඟට එක්ක යන්න කියලා මම කාරුණිකව ඉල්ලා සිටිනවා. මේ වැඩිමහළු කාන්තාව කාමරය හරහා එක්ක ගෙන යන්න උසාවි සේවකයකු ආ විට, වැන් ඩී බෘක් මහත්තයා තමාට මේ දැන් ඇහුණ දෙය දරාගන්න බැරුව ක්ලාන්ත වුණා. උසාවි කාමරය තුළ හිටිය අය - දශක ගණනාවක් පීඩාවට හා අසාධාරණයට ලක් වූ අය වුන යහළුවෝ, පවුලේ අය, අසල්වාසීන් ඔහුව පිළිගන්න පටන් ගත්තා. "විශ්මිතයි ස්තුතියි මං වගේ කාලකණ්ණියෙක් බේරා ගත්ත ඒ හඬ කොච්චර මිහිරි ද"

තවත් දෙයක් තමයි ජාත්‍යන්තර සහයෝගය. දැන් ඇත්ත වශයෙන්ම, මම කිව්ව විදිහට දැන් අදහස් වෙනස් නිසා ගැටළු තියෙනවා. මම ඔබට මෙතන කිව්වා වගේ අපි දකුණු අප්‍රිකානු කතාවක් දිහා බලනවා. ඒ කාන්තාවගේ අවබෝධයන් තමන්ගේ ස්වාමියා හා පුතා මැරුණු යාපනයේ කාන්තාවකගේ අවබෝධයන්ට වඩා ගොඩක් වෙනස්. කොමසාරිස්තුමියනි, ඒ එකම දෙයද? එකම දෙයද? ඒක එහෙම නොවෙයි. ඒ හින්දා ඔබට, දකුණු අප්‍රිකාව ඉෂ්ට කර ගැනීමට බලාපොරොත්තු වුණ දෙය ඉෂ්ට කර ගැනීමට බලාපොරොත්තු වෙන්න බැහැ. කොහෙත්ම බෑ. ඉතින් ඒ හින්දා ඔබ කරන දෙය ගැන ඔබ සැලකිලමත් වෙන්න ඕන .

ඊළඟට පෞද්ගලික අරමුණු. දරුස්මාන් කොමිසම ගන්න. වුනේ මොකක් ද කියලා දරුස්මාන් වාර්තා කලහම, ආණ්ඩුවේ දේශපාලඥයෝ ඔක්කොම ඒක මාතෘකාවක් කර ගත්තා විවේචකයෝ තක්කඩියා (rogue) කියන වචනය පාවිච්චි කළේ නැති වුනාට දරුස්මාන් 'තක්කඩියෙක්' (rogue) විතරයි. ඒගොල්ලො අදහස් කළේ දරුස්මාන් කොමසාරිස්වරු කියන්නේ යුද විරුවෝ පෝරකයට යවන අන්තර්ජාතික කපටි කුමන්ත්‍රණකරුවෝ කියලා. සිංහල ජනමාධ්‍යවල එයාලා කියන්නේ ''අන්තර්ජාතික කුමන්ත්‍රණකරුවෝ'' කියලා. ඒත් ඔබ දන්නවාද ඒ දරුස්මාන්ටම අපේ ආණ්ඩුව අන්තර්ජාතික විශේෂඥයන් කණ්ඩායමක් එක්ක මෙතන ඉන්න ආරාධනා කළා කියලා. ඔහු එක සාමාජිකයෙක් විතරයි. නම් ලැයිස්තුව කියවන්න. ඔහු ලැයිස්තුවේ හිටියා. ඉතින්, ඒ නිසා, ඔබට දරුස්මාන්ලවා ඔබ කැමති දෙයක් කරගන්න ඕන වෙනකොට, ඔහු හොඳයි. මේ විවේචකයෝ මේක තේරුම් ගන්න ඕන. ඔහු අපේ පැත්තෙන් වැරදි දෙයක් කරන කොට, ඔහු වැරදි මිනිහෙක්. අන්තර්ජාතික වශයෙන් ඔහු නරක හාදයෙක්.

ජාත්‍යන්තර මානුෂීය නීතිය වෙතට ප්‍රවේශවීම් සහ ජාත්‍යන්තර මානුෂීය නීතිය

ඊළඟට මානව හිමිකම් වෙතට ප්‍රවේශ වීම් සහ මානුෂවාදී නීතිය. නේස්බිගේ සිද්ධිය ගන්න. මම කලින් කිව්වා වගේ, ඒක විදේශීය ආණ්ඩුවක රාජ්‍ය ලේඛනවලට ප්‍රවේශවීමේ සිද්ධියක්. දැන් නේස්බි සාමිවරයා බ්‍රිතාන්‍ය ආරක්ෂක නියෝජිතගේ ලියකියවිලි ගන්න උත්සාහ කළා. මගේ ගෙදර තියෙනවා නේස්බි සාමිවරයාට ලැබුණු දේවල්. ඔහුට අවසානයේදී ලැබුණු දේ ගොඩක් දුරට සංස්කරණය කරලා. ඔබට ලේඛනයේ අඩංගු සම්පූර්ණ දේ ගන්න බෑ. නමුත් බ්‍රිතාන්‍ය ප්‍රසිද්ධියේ කියන්නේ ඔවුන් මානව හිමිකම් වෙනුවෙන් පෙනී සිටිනවා කියලා. මේ සැරේ එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කවුන්සිලයේ යෝජනා මෙහෙයවන්නේ එයාලා, ඇමරිකාවයි බ්‍රිතාන්‍යයි. ඒ ලියකියවිලි ඉල්ලලා නේස්බි, උද්‍යෝගමත් ආයාචනයක් කළත් එයාලට ක(ර්)නල් නේෂ්ගේ (ආරක්ෂක නියෝජිත) ලියකියවිලි දෙන්නවත් බෙදාහදා ගන්නවත් වුවමනාවක් තිබ්බේ නැහැ. කොහෙත්ම නැහැ!

ඊ ළඟට ජාත්‍යන්තර රාජ්‍ය නොවන සංවිධාන, ඇත්ත වශයෙන්ම අපිට ඒක කරන්න බැහැ මොකද මෙහේ, ඕනෑම රාජ්‍ය නොවන සංවිධානයක්, ජාත්‍යන්තර වුනත් නැතත්, ජාත්‍යන්තරය විසින් උදව් කරනවා නම් කියන්නේ ඩොලර් කාක්කා කියලා. මම ආරක්ෂක ලේකම් වෙලා ඉන්නකොට, මම ජාත්‍යන්තර රතුකුරුස සංවිධානයත් එක්ක වැඩ කළා. මම ඒ සොල්දාදුවෝ-නාවික හමුදාවේ නිලධාරීන් හා භටයෝ දෙන්නෙක් - ප්‍රභාකරන්ගෙන් නිදහස් කර ගත්තා. මම ඒගොල්ලොත් එක්ක සාකච්ඡා කරලා එයාලව එළියට ගත්තා. මේ නිදහස් කිරීම් කරගන්න මට ගොඩාක් උදව් කළ තරුණ කාන්තාවක් ජාත්‍යන්තර රතුකුරුස සංවිධානය එකේ හිටියා.

ඒ වගේම, අපිට පුළුවන් සමහර වෙලාවට ජාත්‍යන්තර රාජ්‍ය නොවන සංවිධාන එක්ක වැඩ කටයුතු ඉදිරියට කරගෙන යන්න. නමුත් ඔබ එයාලත් එක්ක වැඩ කරන්න ඕන. ඒ එක්කම, ඔබට සැකය තියෙන තාක්, කොමසාරිස් ආචාර්ය නේෂියා අනෙක් පාර්ශ්වයේ නීතිඥයෙක් එක්ක කතා කරනකොටත්, ආරක්ෂක නිලධාරීන් වෙනුවෙන් පෙනී හිටිය, වෙන නීතිඥයකුගෙන් ලොකු හා හෝවක් තියෙනවා කියලා නිරීක්ෂණය කළා. එතකොට විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය එක චෝදනා එල්ල කළ සිද්ධි එකකින් හරි දෙකකින් හරි ආචාර්ය නේෂියාට අයින් වෙලා ඉන්න කියලා කිව්වා. ඉතින් ඒ හින්දා අන්තර්ජාතික සහයෝගයටයි ජාතික රාජ්‍ය නොවන සංවිධානවල සහයෝගයටයි සම්බන්ධ යම් යම් දේවල් සම්බන්ධයෙන් කටයුතු කරද්දී අනෙකුත් පාර්ශවවලට පිළිගන්න පුළුවන් ආකාරයට සුදුසුම දේ තෝරා ගන්න කෙනෙකුට සිද්ධ වෙනවා.

වැඩිදුර උපදෙස් ලබාගැනීම

ඊ ළඟට ඔබට සත්‍ය සහ ප්‍රතිසන්ධාන කොමිෂන් සභාව එක දකුණු අප්‍රිකාවේදි වගේ කටයුතු කරන්න ඕන නම්, වැඩිදුර උපදෙස් ලබාගැනීමක් සිදු විය යුතුයි. උපදෙස් ලබාගැනීමක් නැතිව

සත්‍ය සහ ප්‍රතිසන්ධාන කොමිෂන් සභාව එකක් හදන්න බැහැ. නමුත් මෙතන වෙන්නේ, ජනාධිපති තීරණය කරනවා කොමසාරිස්වරු, (ආවරණය විය යුතු විෂය පථය) යොමු කිරීම් අනුදේශ, පරීක්ෂණය සඳහා කාලසීමාව යනාදිය විස්තර කළ යුතුයි.

උපදෙස් ලබගැනීමක් නැහැ. යහළුවෝ කිහිප දෙනෙකුගෙන් හරි ඇමතිවරු කිහිප දෙනෙකුගෙන් හරි උපදෙස් ගන්න ඇති. ඒක කාර්යක්ෂම සත්‍ය සහ ප්‍රතිසන්ධාන කොමිෂන් සභාව එකකට හරියන්නෙ නැහැ.

අතිගරු එස්.ඊ. චෝක්

දකුණු අප්‍රිකානු මහ කොමසාරිස්

876. දකුණු අප්‍රිකාවේ සත්‍ය සහ ප්‍රතිසන්ධාන කොමිෂන් සභාව පිහිටෙව්වේ 1995 අංක 34 දරන ජාතික සමගි ප්‍රවර්ධන සහ ප්‍රතිසන්ධාන පනත යටතේයි. ඒක ඒ කාලයේ තිබුණ ප්‍රධාන විරුද්ධවාදී බලමුළුවල ගිවිස ගැනීම් හා සමාදානවීම්වල ප්‍රතිඵලයක්; ජාතික පක්ෂයයි, ඒකේ වර්ණභේදවාදී ආණ්ඩුවයි, නිදහස් ව්‍යාපාරයයි, අප්‍රිකානු ජාතික කොංග්‍රසයයි. මේ සම්බන්ධයෙන්, විධිමත් රැස්වීම් දෙකක් පැවැත්වුවා. සාකච්ඡා කර සම්මුතියකට එළඹීමට ඇති බාධකයි ඒවා ජය ගන්න විධියි එයාලා හඳුනාගත්ත නිසා සත්‍ය සහ ප්‍රතිසන්ධාන කොමිෂන් සභාව එක පිහිටුවීම සම්බන්ධයෙන් ඒවායේ නිගමන (*ග්‍රූට් ස්කර්* Groote Schuur සහ *ප්‍රිටෝරියා මිනිට්ස්* Pretoria Minutes) දෙක අතර තහවුරු කළ හැකි පරාමිතීන් තිබෙනවා. දේශපාලනික සිරකරුවා හා දේශපාලනිකව උසි ගැන්වූ අපරාධ යන්නෙහි අර්ථ දැක්වීම්, දේශපාලනික සිරකරුවන් නිදහස් කිරීම, නාගරික ප්‍රදේශවලින් ආරක්ෂක හමුදා ඉවත් කර ගැනීම, හදිසි අවස්ථා තත්ත්වය ඉවත් කිරීම සහ ප්‍රචණ්ඩත්වය මුලිනුපුටා දමා නැවත සාකච්ඡා පටන් ගැනීම පිළිබඳ එකඟතාවක් තිබුණා. වැදගත්ම දේ එයාලා එක්සත් ජාතිවාදයෙන් තොර සමාජයක දැක්මට හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සම්පාදන මණ්ඩලයක් මගින් කෙටුම්පත් කළ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවකට එකඟතාව දැක්වීම. පුළුල්ව කතා කළොත්, පූර්ණ, නිදහස් වගේම ප්‍රජාතන්ත්‍රවාදී දකුණු අප්‍රිකාවක් බවට පත්වීමේ දී සත්‍ය සහ ප්‍රතිසන්ධාන කොමිෂන් සභාව එක තීරණාත්මක අංගයක් වුනා.

ඒකට ලබා දී තිබූ බලය පැවරුම තමයි සාක්ෂි දැරීම, වාර්තා කිරීම, හා සමහර සිද්ධිවලදි හිමිකම් උල්ලංඝනය කිරීම්වලට සම්බන්ධ අපරාධකරුවන්ට, සමාව දීම, වන්දි ගෙවීම හා පුනරුත්ථාපනය කිරීම.

සත්‍ය සහ ප්‍රතිසන්ධාන කොමිෂන් සභාව එකේ කාර්යය කමිටු තුනක් මගින් කරගෙන ගියා, ඒ කියන්නේ, මානව හිමිකම් උල්ලංඝනය වීම් හා සම්බන්ධ කමිටුව. ඒක 1960යි 1994යි අතර සිද්ධ වුණ අපයෝජන ගැන විමර්ශනය කළා. වන්දි ගෙවීමේ හා පුනරුත්ථාපන කමිටුවට භාර දීලා තිබුණෙ වින්දිතයින්ගේ ගරුත්වය යළි ඇති කිරීම වගේම ඔවුන්ට පුනරුත්ථාපනය මගින් සහාය දැක්වීමට අවශ්‍ය යෝජනා සකස් කිරීමයි. ක්ෂමා කමිටුව පනතේ විධිවිධාන අනුව ක්ෂමාව ඉල්ලලා ඉදිරිපත් කරලා තිබුණ ඉල්ලුම්පත් සළකා බැලුවා.

න්‍යායාත්මකව, සත්‍ය සහ ප්‍රතිසන්ධාන කොමිෂන් සභාව එකට බලය පවරලා තිබුණා කොන්දේසි දෙකක් සපුරනවා නම් වර්ණභේදවාදය කාලේ සිදු කළ දාමරිකකම්වලට චෝදනා ලබලා හිටිය අයට ක්ෂමාව දෙන්න: ඒ කොන්දේසි නම්, ඒවා දේශපාලනිකව උසි ගැන්වූ අපරාධ වීම වගේම ක්ෂමාව බලාපොරොත්තු වෙන තැනැත්තා සම්පූර්ණ සත්‍ය පවසා තිබීම. විකෘති සාධාරණයක් ඉටු වීම වළක්වන්න වුවමනා නිසා කිසිම තැනැත්තෙක් ඒ වගේම කිසිම පැත්තක් කොමිෂන් සභාව ඉදිරියේ පෙනී සිටීමේ අවශ්‍යතාවෙන් නිදහස් කළේ නැහැ.

ක්‍රියාවලිය සම්බන්ධයෙන් බැලුවොත්, මානව හිමිකම් උල්ලංඝනය වීම් හා සම්බන්ධ කමිටුවේ හා ක්ෂමාව ප්‍රදානය කිරීම හා සම්බන්ධ කමිටුවේ මහජන පැමිණිලි විභාග කිරීම් රට පුරා බොහෝ තැන්වල පැවැත්වූවා.

සංඛ්‍යාත්මකව බැලුවොත්, මිනිස්සු 19,050ක් ඉතා අප්‍රසන්න මානව හිමිකම් උල්ලංඝණය කිරීම්වල වින්දිතයන් බවට පත් වෙලා තියෙනවා. ක්ෂමාව ඉල්ලලා ඉදිරිපත් කළ ඉල්ලුම්පත්වලින් අතිරේක වින්දිතයන් 2,975ක් හඳුනා ගෙන තියෙනවා. මෙම සංඛ්‍යා වාර්තා කිරීමේ දී, වන්දි බලාපොරොත්තු වන වින්දිතයනුයි සමාව බලාපොරොත්තු වන වින්දිතයනුයි අතර, දෙකම ඉල්ලූ අය ඉතා කුඩා සංඛ්‍යාවක් සිටීම ගැන කොමිසම කණගාටුව ප්‍රකාශ කළා.

සමාව ඉල්ලලා ඉදිරිපත් කළ ඉල්ලුම්පත් වලින් ඔක්කොම ඉල්ලුම්පත් 5,392ක් ප්‍රතික්ෂේප කළා. 7,111කින් 849කට විතරක් ක්ෂමාව ප්‍රදානය කළා.

මේ සත්‍ය සහ ප්‍රතිසන්ධාන කොමිෂන් සභාව එක ලෝකයේ වෙන වෙන තැන්වල කලින් තිබූ ඒවාට වඩා හොඳටම වෙනස්. ඒකෙන් දඬුවමින් නිදහස් කිරීමවත් පළිගැනීමවත් කියන දෙකෙන් එකක්වත් කළේ නැහැ. මහාචාර්ය මහ්මූඩ මම්ඩානි ප්‍රකාශ කළා වගේ, උදාහරණයක් විදිහට, සාමාන්‍යයෙන් සමූහ ප්‍රචණ්ඩකාරීත්වය සඳහා වගකීම අර්ථ දැක්වීමේ ආකෘතියක්/ටෙම්ප්ලේටරයක් විදිහට නියුරෙම්බර්ග් සළකනවා. ඔවුන්ගේ අදහස තමයි සමූහ ප්‍රචණ්ඩකාරීත්වය සම්බන්ධ වෙන තැනක හැම වෙලාවෙම ක්‍රම දෙකක් අතර තෝරා ගැනීමක් තියෙනවා. එකක් ජයග්‍රාහකයන් බල කරන නැත්නම් පරාජිත පාර්ශ්වය කිසිදු දේශපාලනික විසඳුමකට එළඹෙන එකෙන් බැහැර කරන්න පෙළඹෙන බාහිර බලවතුන් බල කරනු ලබන අධිකරණමය ප්‍රවේශය. අනෙක තමයි තමන් විසින් මොනයම් අපරාධයක් කර තිබුණත් අනාගතය ගැන සාකච්ඡා කිරීමට සියළුම පාර්ශ්වයන් අනිවාර්යයෙන් සම්බන්ධ වන කතිකාවත.

නියුරම්බ(ර්)ග් න්‍යාය - ICC එක දීර්ඝ වශයෙන්, සිවිල් යුද්ධයක පාර්ශ්වයන් අන්තර්කරණ විසඳුම්වලින් බැහැරට මෙහෙයවලා කණ්ඩායම්වලට බෙදෙන්නත් යුදමය ජයග්‍රහණ ලබාගැනීම දෙසට යොමු කරන්නත් පෙළඹෙනවා. දකුණු අප්‍රිකානු ක්‍රියාමාර්ග ඒක වැළැක්වූවා.

සභාපතිතුමනි,

දකුණු අප්‍රිකාව වර්ණභේදවාදයෙන් බැහැරට සංක්‍රමණය වෙනකොට ජයග්‍රහණ කිහිපයක් අත්පත් කරගත්තා. ජනාධිපති නෙල්සන් මැන්ඩෙලා 1994 මැයි මාසෙ දිවුරුම් දුන්නාට පස්සෙ, දකුණු අප්‍රිකාවේ ජාතික සන්ධාන ආණ්ඩුවක් පිහිටෙව්වා. ඒ කාලයේ දී, වෙන් කිරීම නවත්වන්න බහුපාක්ෂික සංවාද තුළින් අන්තර්වාර ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් කතිකා කර ගත්තා - ඒ ක්‍රියාවලිය පටන් ගත්තෙ 1990 දී. එක වෙලාවක බලවත්ව හිටිය වර්ණභේදවාදී රාජ්‍ය යන්ත්‍රය තව දුරටත් නැති වුණාම, ප්‍රතිසන්ධානගත කළ නොහැකි ගැටුමක හිරවෙලා හිටිය බලවේගවලට ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් කරා යන්න සාකච්ඡාමය මාවතක් හම්බ වුණා. පළවෙනි ප්‍රජාතන්ත්‍රවාදී ඡන්දය, බැරෑරුම් අභියෝග තිබුණත්, යොදා ගත්ත දවසේම, ඒ කියන්නේ 1994 අප්‍රේල් 27 වෙනිදාම පැවැත්වූවා. අවුරුදු ගණනාවක් තිස්සෙ සිද්ධ වුණ එක තැන පල්වීමටයි ආර්ථිකය පහළ වැටීමටයි පස්සෙ අප බලාපොරොත්තුවුනාටත් වඩා වැඩි වර්ධනයක් අත්වින්දා.

දකුණු අප්‍රිකාවට සිය අනාගත දැක්මෙන් සිවිල් යුද්ධයක සෙවනැල්ල ටිකෙන් ටික මැකී යමින් තිබුණත්, සාමකාමීව එක්සත් ජාතියක් විදිහට අනාගතයට මුහුණ දීමට හැකියාව ඇති කරන ආකාරයට අතීත සිදුවීම් දරාගැනීමේ අභියෝගයට දකුණු අප්‍රිකානුවන් මුහුණ දුන්නා. දකුණු අප්‍රිකානුවන්ට තමන්ගේ ගැටළු විසඳා ගැනීමටයි, එක්සත් සාමකාමී රටක් පිළිබඳව අප හැමදෙනාම තුළ තිබුණ දැක්ම සැබෑ කර ගැනීමටයි තිබුණ හැකියාවයි ධෛර්යසම්පන්න බවයි හමුවේ, ඉරණම පිළිබඳ අනාගත වක්තෘවරුන් නැවත නැවත ව්‍යාකූලභාවයට පත් වී තිබුණා.

මම කලින් දැක්වූවා වගේ, 1995 ජූලි මාසෙ, අපේ අළුත් පාර්ලිමේන්තුව, 1993 දකුණු අප්‍රිකානු අන්තර්වාර ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ අවසාන වගන්තිය පදනම් කරගෙන සත්‍ය සහ ප්‍රතිසන්ධාන කොමිෂන් සභාව එක හදන්න අවසර දෙමින් 1995 අංක 34 දරන ජාතික සමගිය හා ප්‍රතිසන්ධාන ප්‍රවර්ධන පනත සම්මත කළා.

හිටපු අධිකරණ ඇමති, ඩුල්ලා ඕමාර් (*Dullah Omar*) කිව්වා, මම උපුටා දක්වන්නම්: "...සදාචාරාත්මකව පිළිගත් පදනමක් මත දකුණු අප්‍රිකානුවන්ට තමන්ගේ අතීත සිදුවීම් දරා ගැනීමේ හැකියාව ඇති කර ගැනීමට සහ ප්‍රතිසන්ධාන ක්‍රියාදාමය වඩා උසස් බවට පමුණුවන්න අවශ්‍ය කර්තව්‍යයක් තමයි කොමිෂන් සභාවක් කියන්නේ."

මේ කොමිසම 1995 දෙසැම්බර් මාසෙ පත් කළා. ඒකෙ සභාපති වුනේ අගරදගුරු ඩෙස්මන් ටුටු පියතුමා. ඒකට භාර දීලා තිබුණ කර්තව්‍යය ඉතාම දුෂ්කර එකක්. ඒ වගේම දකුණු අප්‍රිකානු ජාතියේ අනාගතයට විශාල බලපෑමක් තියෙන එකක්. දකුණු අප්‍රිකානු සත්‍ය සහ ප්‍රතිසන්ධාන කොමිෂන් සභාව එක වෙත පැවරිලා තිබුණේ, වේදනාකාරී සත්‍යය නිරාවරණය වීම තහවුරු වන ආකාරයට බරපතල මානව හිමිකම් උල්ලංඝණය වීම් සම්බන්ධයෙන් කටයුතු කරලා අපේ සාමාජයේ ශක්‍යතාව තුළයි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුකූලව නීතියේ රාමුව තුළයි වින්දිතයින්ට යුක්තිය ඉටු කිරීමයි. ඒ විදිහටත් කරලා ක්ෂමාවත් දීලා අරමුණු කළේ කල්පවත්නා ප්‍රතිසන්ධානයක් / සංහිඳියාවක් තහවුරු කිරීමයි.

කොමිසමේ ප්‍රධාන අරමුණ වුනේ සත්‍යය පූර්ණ වශයෙන් නිරාවරණය කිරීම මගින් වර්ණභේදවාදයේ අපරාධකාරයොයි වින්දිතයොයි අතර ප්‍රතිසන්ධානයක් ඇති කිරීමයි, සමාව දීමට අනුබල ලබා දීමයි.

කොමිසමට නිශ්චිත කාර්යයන් තුනක් භාර දුන්නා.

පළවෙනි එක, 1960යි 1994යි අතර කාලයේ දකුණු අප්‍රිකාවේ සිදු වුණ මානව හිමිකම් උල්ලංඝණය කිරීම්වලට හේතුයි ඒවායේ ස්වභාවයයි සොයා ගැනීම;

දෙවන එක, වන්දි ගෙවීමේ අරමුණ ඇතිව වින්දිතයින් හඳුනාගැනීම; හා

තුන්වෙනි එක, දේශපාලනික වශයෙන් උසිගැන්වූ මානව හිමිකම් උල්ලංඝණය කිරීම්වලට තමන්ගේ සම්බන්ධය පූර්ණ වශයෙන් හෙළි කළ අයට ක්ෂමාව ප්‍රදානය කිරීමට අවසර දීම.

මෙම බලය පැවරීම කමිටු තුනක් මගින් ක්‍රියාත්මක කළා.

- මානව හිමිකම් උල්ලංඝණය කිරීම හා සම්බන්ධ කමිටුව
- වන්දි ගෙවීමේ හා පුනරුත්ථාපන කමිටුව
- ක්ෂමාව දීම හා සම්බන්ධ කමිටුව

මානව හිමිකම් උල්ලංඝණය කිරීම හා සම්බන්ධ කමිටුව මගින් 1960 සිට 1994 දක්වා සිදු වූ මානව හිමිකම් උල්ලංඝණය කිරීම් පිළිබඳව විමර්ශනය කළා. මේ කමිටුවෙන් වින්දිතයන්ගේ අනන්‍යතාව; අතීතයේ දී හා වර්තමානයේ දී ඔවුන් ගැවසුන/ගැවසෙන තැන්; අත්විඳින ලද හානියේ ස්වභාවය හා විශාලත්වය; සමග මානව හිමිකම් උල්ලංඝණය කිරීම් රජය, වෙනත් යම් සංවිධානයක්, කණ්ඩායමක් නැත්නම් පුද්ගලයෙක් සිතාමතා කරන ලද සැලසුමක ඍජු ප්‍රතිඵලයක් ද කියලා තහවුරු කළා.

ඒවා හඳුනාගත් වහාම, වින්දිතයින්ගේ ගෞරවය සත්‍ය සහ ප්‍රතිසන්ධාන කොමිෂන් සභාව එක මගින් නැවත ප්‍රකෘතිමත් කරන බවට තහවුරු කරන්නත්, දිවි බේරා ගත්ත අය, ඔවුන්ගේ පවුල්

එක්කම සමස්තයක් වශයෙන් ප්‍රජා කොටස් පුනරුත්ථාපනය කිරීම වගේම සුවපත් කිරීම සම්බන්ධයෙන් ප්‍රතිපත්ති යෝජනා හා නිර්දේශ හැදීම තහවුරු කරන්නත් ඔවුන්ව, වින්දිතයින්ට සහාය ලබා දීමේ පනතින් බල ගැන්වුනු හානිපූරණ හා පුනරුත්ථාපන කමිටුව වෙත යොමු කළා.

මෙවැනි සිද්ධි ආයෙත් ආයෙත් සිදු නොවෙන එක, සුවපත් වීම වගේම මනා සහජීවනයක් ඇති වීම තහවුරු කරන එක තමයි ඔක්කොම නිර්දේශවලින් අපේක්ෂා කරපු සමස්ත කාර්තව්‍යය වුනේ.

ජනාධිපතිතුමා නියම කළ රෙගුලාසිවලට අනුකූලව වින්දිතයින්ට හදිසි අතුරු වන්දියක් ගෙවන්න පාර්ලිමේන්තුවෙනුයි පෞද්ගලික පරිත්‍යාගවලිනුයි මුදල් දාලා ජනාධිපති අරමුදලක් පිහිටෙව්වා.

ක්ෂමාව සඳහා ඉදිරිපත් කළ සියළුම ඉල්ලුම්පත්වල කටයුතු පනතේ විධිවිධානවලට අනුකූලව සිදු කළ බව ක්ෂමාව දීම හා සම්බන්ධ කමිටුව විසින් තහවුරු කළා. ඉල්ලුම්කරුවන්ට 1960 මාර්තු 1 වෙනිදා ඉඳලා 1993 දෙසැම්බර් 06 වැනි දා දක්වා කාලය තුළ දේශපාලනික අරමුණක් හා සම්බන්ධ ඕනෑම ක්‍රියාවක්, ප්‍රමාද දෝෂයක් නැත්නම් වරදක් සඳහා ක්ෂමාව ඉල්ලුම් කරන්න පුළුවන් වුණා. මෙම අවසාන දිනය පස්සෙ 1994 මැයි 11වෙනිදා දක්වා දීර්ඝ කළා; ඉල්ලුම්පත් සඳහා අවසාන දිනය වුනේ 1997 සැප්තැම්බර් 30 වැනි දා.

අතීතය අමතක කිරීම ඉතාම හොඳයි කියලා අදහසක් තියෙනවා. සමාව දෙන්න පුළුවන් වුණාට කවදාවත් අමතක කරන්න බැහැ කියලා දකුණු අප්‍රිකානුවො කිව්වාම අපිව විවේචනයට ලක් කළා. අතීතයේ සිදු වුන දේ ආයෙත් සිද්ධ වෙන්නෙ නෑ කියලා තහවුරු කරන්න නම් ඒ පිළිබඳ දැනුවත් කළ යුතුයි කියලා සාමාන්‍ය දකුණු අප්‍රිකානුවෝ තදින් විශ්වාස කළා. අපි මේ දේ ප්‍රාර්ථනා කළා, හැබැයි පලිගැනීමේ අදහසින් නෙමෙයි, අපිට එක්සත්ව අනාගතයට යන්න පුළුවන් වෙන්න. අපේ ජාතියේ තේරීම වුනේ අතීතය හෙළි කළ යුතුද කියන එක නෙමෙයි, ඒක පිළිබඳ දැනුවත් වෙන්න ඕන සංහිඳියාව හා සාමය ප්‍රවර්ධනය වෙන විදිහටයි කියන එක තහවුරු කරන්න.

කොමිසමේ වැඩ කටයුතුවලට ස්වාධීනත්වය වගේම දේශපාලන මැදිහත් වීමෙන් තොරව ක්‍රියාත්මක වීමේ නිදහස අත්‍යවශ්‍ය වුණා. 1996 පෙබරවාරි 13 වැනි දා සත්‍ය සහ ප්‍රතිසන්ධාන කොමිෂන් සභාව එකට සිදු කළ අන්තර්-ආගමික කොමිසමේ ස්වාධීනත්වයට හා අපක්ෂපාතිත්වයට ගරු කරන ලෙස ජනාධිපති නෙල්සන් මැන්ඩෙලා සියළුම දකුණු අප්‍රිකානුවන්ගෙන් ඉල්ලා සිටියා.

සියළුම දකුණු අප්‍රිකානුවන්ට සංහිඳියාවට හා ජාතිය ගොඩනැගීමේ කර්තව්‍යයට සහභාගිවීමට සත්‍ය සහ ප්‍රතිසන්ධාන කොමිෂන් සභාව එක අවස්ථාවක් ලබා දුන්නා.

සියලු අප්‍රිකානු වැසියන් හට සංහිඳියාව සහ ජාතිය ගොඩනැංවීම සඳහා සහභාගී වීමට සංහිඳියා / ප්‍රතිසන්ධාන කොමිසම විසින් අවස්ථාව සලසා දෙන ලදී. ප්‍රජා පාදක සංවිධානවලට සහ රාජ්‍ය නොවන සංවිධානවලට ද ඔවුන්ගේ කාර්ය භාරය ඉටු කිරීමට එමගින් ඉඩ ලැබිණි. එමෙන්ම, සෑම පුද්ගලයෙකු විසින් දායකත්වය ලබා දිය යුතු කාර්යයක් ද ඊට ඇතුළත් විය. කමිටුවේ කාර්ය භාර්යයේ වැදගත්කම තෙතරම් ද යත් ඒ සඳහා සියලු අප්‍රිකානු වැසියන්ගේ සහයෝගීත්වය අපේක්ෂා කරනු ලැබිණි.

මෙහිදී වඩා සුවිශේෂී චරිතය වූයේ, දේශපාලනඥයා හෝ කොමිසම නොව වින්දිතයා ය. බොහෝ අවස්ථාවලදී වින්දිතයන් සමාජය තුළ නොසලකා හරිනු ලැබේ. එබැවින්, පීඩාවට පත් වූ පුද්ගලයන්, ඔවුන්ගේ පවුල් සහ ප්‍රජාවන් හඳුනාගැනීම අවශ්‍ය විය. කෙසේ වෙතත් මිදීම සහ නැවත ගොඩනැගීම අවශ්‍ය වනුයේ ජාතියක් වශයෙන් වන බැවින් අන් සියල්ලට වඩා සමස්ත ජාතිය යන සාධකය සුවපත් වීමේ ක්‍රියාවලියට ඇතුළත් වේ.

සංහිදියා / ප්‍රතිසන්ධාන කොමිසම මගින් සංහිදියාව පිළිබඳ ලේඛනය (Register of Reconciliation) විවෘත කරනු ලැබූ අතර මානව හිමිකම් උල්ලංඝනය කරනු ලැබීම් වළක්වා ගැනීමට අපොහොසත් වීම පිළිබඳ තම කණගාටුවත්, සංහිදියාව පිළිබඳ තම කැපවීමත් ප්‍රකාශ කිරීමට පොදු මහජනතාවට ඉන් අවස්ථාවක් ලැබිණි. එම ලේඛනය මානව හිමිකම් සම්බන්ධයෙන් අතීතයේ සිදුවූ අසමත්වීම් සහ එකී මානව හිමිකම් උල්ලංඝනය කරනු ලැබීම් වළක්වා ගැනීම සඳහා තමා විසින් කළ හැකිව තිබූ දෑ පිළිබඳ තම ශෝකය ප්‍රකාශ කිරීම සඳහා අප්‍රිකානු වැසියන්ගේ සිත් තුළ පැවති දැඩි ආශාව ට ප්‍රතිචාර දැක්වීමක් විය. එවැනි උල්ලංඝනය කිරීම් සිදු නොවනු ලබන අනාගතයක් උදෙසා තම කැපවීම වඩාත් සංකේතාත්මකව දැක්වීමට මිනිසුන්ට එමගින් හැකි විය. බෙදා වෙන් කිරීම සහ වෙනස් ආකාරයෙන් සැලකීම පිළිබඳ ඉතිහාසයෙන් බැහැර වීමට බොහෝ අප්‍රිකානුවන් සැදී පැහැදී සිටියහ.

වැරදි ක්‍රියාවන් වඩා හොඳ සමාජයක් ගොඩ නැගීම සඳහා ධනාත්මත කැපවීම් බවට පරිවර්තනය කිරීම හෙවත් වරද කමා කර ගැනීම පිළිබඳ හිතකර සහ ඵලදායක ස්වරූපය සංහිදියා / ප්‍රතිසන්ධාන කොමිසමෙහි ක්‍රියාවලිය තුළින් ක්‍රියාත්මක කරනු ලැබිණි.

සංහිදියා / ප්‍රතිසන්ධාන කොමිසම විසින් ආසන්න වශයෙන් වින්දිතයන් 21000 ක් වෙතින් සාක්ෂි ලබාගන්නා ලදී. මෙම වින්දිතයන්ගෙන් 2000 ක් පමණ ප්‍රසිද්ධ නඩු විභාග සඳහා පෙනී සිටියහ. එහිදී මානව හිමිකම් උල්ලංඝනය කිරීම පිළිබඳ බරපතල වැරදි පිළිබඳ ප්‍රධාන අපරාධකරු ලෙස වර්ණභේදවාදී රජය හඳුනාගන්නා ලදී.

තරමක් විස්තරාත්මක ස්වරූපයක් ගන්නා සංහිදියා / ප්‍රතිසන්ධාන කොමිසමෙහි කාර්යයන් පිළිබඳව ලියැවුණු වූ ද කොමිසමෙහි සාමාජිකයන් සියලු දෙනා විසින් පරීක්ෂා කරනු ලැබුවා වූ ද කෘති ගණනාවක් පවතින අතර වර්තමානයේ දී දකුණු අප්‍රිකානු ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේනතුවෙහි ඒවායෙන් පිරී පවතී. මෙම ලේඛන විද්වතුන්, මාධ්‍යවේදීන් සහ අපගේ ඉතිහාසය පිළිබඳ පර්යේෂණ කරනු ලබන අනෙකුත් පුද්ගලයන් හට පරම්පරා ගණනාවක් සඳහා අති විශාල වශයෙන් වැදගත් වනු ඇත. පර්යේෂණමය දෘෂ්ටි කෝණයෙන් සලකා බැලූ විට, මෙය කොමිසමෙහි උසස්තම දායදය විය හැකිය.

අභියෝග රාශියක් විය. සාක්ෂි දීම මවු භාෂාවෙන් කළ බැවින් නම් වල දෝෂ, සාවද්‍ය පිටපත්කරණ /පරිවර්තන, ශ්‍රවණය කළ නොහැකි ප්‍රතිචාර ආදියට හේතු විය.

මානව හිමිකම් උල්ලංඝනය කිරීම සම්බන්ධ අපරාධකරුවන්ට සමාව ලබා දීමට හැකි නම් ඊට පෙර ඔවුන් එකී මානව හිමිකම් උල්ලංඝනය කිරීම පිළිබඳ සම්පූර්ණ හෙළිදරව්වක් සිදුකොට ඔවුන් කළ දෑ පිළිගත යුතුය යන අදහසට සංහිදියා / ප්‍රතිසන්ධාන කොමිසමෙහි විචාරකයන් එකඟ නොවූහ. එමෙන්ම ඒ පිළිබඳ නඩු විභාග පවත්වනු ලබමින් සිටින අවස්ථාවන් හි දී ද ඒ සම්බන්ධයෙන් මැදිහත්කරණ සිදුකළ යුතු යැයි අවධාරණය කළ පිරිස් ද වූහ.

සංහිදියාව පිළිබඳ දකුණු අප්‍රිකානු කොමිසමෙහි සුවිශේෂී ලක්ෂණයක් වූයේ එහි විවෘත සහ විනිවිද ස්වභාවය යි. ලෝකයේ විවිධ රටවල පැවති එබඳු කොමිසම් රහස්‍ය ආකාරයෙන් හමුවද්දී දකුණු අප්‍රිකානු කොමිසමෙහි මහජනතාව ඉදිරියේ පූර්ණ ලෙස විවෘත වෙමින් ක්‍රියාත්මක විය. මෙම කොමිසමෙහි වාර්තාව 1998 ඔක්තෝබර් මස 29 වන දින එවක ජනාධිපති නෙල්සන් මැන්ඩෙලා මහතා හට පිළිගන්වනු ලැබූ අතර එම වාර්තාවෙහි අඩංගු වූ කරුණු ඒ වන විටත් මහජනතාව අතර ප්‍රචලිතව පැවතිණි.

කොමිසම විසින් ලබා දුන් නිර්දේශ මගින් චින්දිතයන් සඳහා පිරිනැමීමට නිර්දේශ කළ වන්දිවල ස්වරූපයට ;

- ප්‍රදාන සහ ශිෂ්‍යාධාර;
- නිදහස් උද්‍යාන වැනි අනුස්මරණ සංකේත සහ ස්මාරක නිර්මාණය කිරීම;
- වර්ණභේදවාදයේ චින්දිතයන්ව මියගිය තැනැත්තන් සඳහා ගෞරවනීය භූමදානය;
- විශේෂ විශ්‍රාම වැටුප් ; සහ
- නිවාස

යනාදිය ඇතුළත් විය.

එසේම, ඉදිරියේදී සිදුවිය හැකි මානව හිමිකම් උල්ලංඝනය වීම් වැළැක්වීම ඉලක්ක කර ගත් පියවර ද රැසක් ද දකුණු අප්‍රිකාව විසින් ගනු ලැබූ අතර එය අපගේ ව්‍යවස්ථාවේ දැක්වෙන මානව හිමිකම් සමාජ නිර්මාණය කිරීම කේන්ද්‍ර කොටගෙන ඇත. පසුගිය වර්ෂයේදී අප විසින් එහි 25 වන සංවත්සරය සමරනු ලැබීය.

කොමිසමෙහි විශ්ලේෂණ, සොයා ගැනීම් සහ නිර්දේශ වර්ණභේද වාදයේ චින්දිතයන් සඳහා උපහාරයක් ද සියලු දකුණු අප්‍රිකානුවන්ට ප්‍රජාතන්ත්‍රවාදයේ ඵලය භුක්ති විඳීම සඳහා කැපවූ සියල්ලන් සඳහා ජීවමාන සිහිවටනයක් ද වේ. තම දුක්ඛිත භාවය පිළිබඳ ප්‍රකාශ කිරීම සඳහා පෙරට පැමිණි පුද්ගලයන්ගේ කතා ඊට ඇතුළත් වේ. තම කතාව පැවසීමට පෙරට නොපැමිණි බොහෝ දකුණු අප්‍රිකානුවන්ගේ සුවිසල් අත්දැකීම් සහ වේදනාවන් එමගින් සංකේතවත් වේ.

ජාත්‍යන්තර සබඳතා සහ සහයෝගීත්වය පිළිබඳ මාගේ අමාත්‍යවර ආචාර්ය. නලේඩි පැන්ඩෝර් (Naledi Pandor) විසින් එක් අවස්ථාවක දී ශ්‍රී ලංකාවේ විදේශ සබඳතා පිළිබඳ අමාත්‍යවරයා හට පැවසූ දෙයින් මෙය අවසාන කරන්නට ඉඩ දෙන්න. මම එය උපුටා දක්වන්නම්.“ අපගේ තත්ත්වය පරිපූර්ණ නැත. ඇතැම් පිරිස්වලට පොදු සමාව දීම ම්ලේච්ඡත්වයෙන් මිදීම සඳහා හේතුවිය හැකිය. මෙය අප රට තුළ බොහෝ දෙනාට බලපාන කරුණක් ව පවතී. එමෙන්ම, වන්දි හිමිවූ පවුල් විසින් එම වන්දි සතුටුදායක යැයි සලකා නොමැත. එමෙන්ම තෙවැනි ගැටළුව උද්ගත වනුයේ තම ආදරණීයයන් අහිමි වූ පවුල් වෙතිනි. එනම්, ව්‍යවස්ථාපිත බලය ලැබූවන්/ යුධ හමුදාව / පොලීසිය යන අංශවල කිසිවෙකු ඉදිරිපත්ව ඔවුන්ගේ ක්‍රියාකාරකම් සඳහා වගකීම භාර ගැනීමට කැමත්තක් නොදැක්වීම ය. ”

නේස්බි ස්වමිවරයා (Lord Naseby)

බ්‍රිතාන්‍ය දේශපාලනඥ

877. 2009 මැයි 26 වන දින ජනාධිපති මහින්ද රාජපක්ෂ සහ එක්සත් ජාතීන්ගේ සංවිධානයේ මහ ලේකම් විසින් හවුල් ප්‍රකාශයක් නිකුත් කරනු ලැබූ අතර එයින් මෙසේ කියැවේ.

“ මානව හිමිකම් පිළිබඳ ජාත්‍යන්තර ප්‍රමිතීන් සහ ශ්‍රී ලංකාවේ ජාත්‍යන්තර බැඳීම්වලට අනුකූලව මානව හිමිකම් ප්‍රවර්ධනය සහ ආරක්ෂා කිරීම සම්බන්ධයෙන් වූ දැඩී බැඳියාව ශ්‍රී ලංකාව නැවත නැවතත් ප්‍රකාශ කරයි. ජාත්‍යන්තර මානුෂීය සහ මානව හිමිකම් නීති උල්ලංඝනය කිරීම් සම්බන්ධයෙන් පියවර ගැනීම සඳහා වගවීමේ ක්‍රියාවලියක වැදගත් කම මහ ලේකම්වරයා විසින් විශේෂයෙන් දක්වන ලදී. එම දුක්ගැනැවිලි විසඳීම සඳහා රජය විසින් පියවර ගනු ඇත. ”

එබැවින්, වගවීමේ ක්‍රියාවලියක් කැඳවීම සඳහා ජනාධිපතිවරයාම ඉදිරියෙන් සිට ඇති බව සඳහන් කරමින් ආරම්භ කළ යුතුය. ඔබ දන්නා පරිදි, මහින්ද රාජපක්ෂ ජනාධිපතිවරයා විසින් '' උගත් පාඩම් සහ ප්‍රතිසන්ධාන කොමිසම'' (උගත් පාඩම් හා ප්‍රතිසංධාන කොමිෂන් සභාව) පත් කළ අතර, ඉන් පසු ඔහු විසින් ''අතුරුදහන් වූවන් පිළිබඳ පැමිණිලි විමර්ශනය කිරීම සඳහා ජනාධිපති කොමිසම'' (පරණගම කොමිසම) පත් කරන ලදී. ඊට වෙනත් අයද ඇතුළත්ව ගරු. ඩෙස්මන්ඩ් ද සිල්වා රාජ්‍ය නීතිඥ (එක්සත් රාජධානිය) සහ මහාචාර්ය ඩේවිඩ් ක්‍රේන් (ඇ.එ.ජ) යන අයගෙන් සැදුම්ලත් විදේශීය උපදේශක සභාවත් ඇතුළත් විය. එසේම රොඩ්නි ඩික්සන් මහතා (එක්සත් රාජධානිය/ දකුණු අප්‍රිකාව), යුධ අපරාධ සම්බන්ධයෙන් ඇ.එ.ජනපද තානපතිවරයාගේ ජ්‍යෙෂ්ඨ උපදේශක වශයෙන් පෙර සේවය කළ වැන්ඩර්බිල්ට් විශ්වවිද්‍යාලයෙහි මහාචාර්ය මයිකල් නිව්ටන් (ඇ.එ.ජ.), මහාචාර්ය නීනා ජෝර්ගසන් පර්යේෂණ සාමාජික බ්‍රිතාන්‍ය විශේෂ ගුවන් සේවාවෙහි අණදෙන නිලධාරී සහ ප්‍රති ත්‍රස්ත මෙහෙයුම් පිළිබඳ විශේෂඥ හාවඩ් විශ්වවිද්‍යාලයේ මේජර් ජෙනරල් ජෝන් හෝම්ස් සහ කොමිසමමෙහි යෝජනාවන්හි සත්‍ය සහ සංහිදියාව යන අංශ සම්බන්ධයෙන් කටයුතු කළ මහා බ්‍රිතාන්‍ය අධි නීතිඥ පෝල් මයිල්වාගනම් ඇතුළු පිරිසක් ද උපදේශක සභාව සඳහා සහාය දැක්වූහ.

මෙය ජාත්‍යන්තර අපරාධ නීතිය පිළිබඳව වඩාත් විශිෂ්ඨ ප්‍රවීණයන් කිහිප දෙනෙකුගෙන් සැදුම්ලත් මණ්ඩලයක් විය. නීතීඥයන්ගෙන් බොහෝ දෙනා පැමිණිලි මෙහෙයවන්නන් වූ අතර, ඔවුන්ගෙන් බහුතරය යුධ අපරාධ පිළිබඳ වාර්තා ලිවීමට වඩා ඒ පිළිබඳ පැමිණිලි මෙහෙයවීම පිළිබඳ අත්දැකීම් සහිත වූවන් විය.

<u>සංහිදියා කොමිසම පිළිබඳ විශේෂ ලක්ෂණ</u>

ඉදිරිපත් කරනු ලැබූ වාර්තාව සුදු හුණු ගෑමක් නොවීය. උගත් පාඩම් හා ප්‍රතිසන්ධාන කොමිසම විසින් පෙන්වා දුන් පරිදි, පරණගම කොමිසම විසින් ද පහත සඳහන් කරුණු හඳුනාගන්නා ලදී.

1. සිදුවීමට ඉඩ ඇති අපරාධවලට බැලූ බැල්මට අදාළ යැයි එයින් නිර්දේශ කරනු ලැබූ, සාක්ෂි, විමර්ශනයට හේතු විය යුතුය.

   පහත සඳහන් යෝජනා කරමින් පරණගම වාර්තාව අනෙකුත් වාර්තාවන්ට වඩා ඉදිරියට යන ලදී. එනම්;

2. සියලු ජාතින් එක්තරා ප්‍රමාණයකට ඔවුන්ගේ ස්වාධීනත්වය පොදුවේ ලිහිල් කරනු ලබන අතර, ඔවුන් විසින් අත්සන් කරනු ලැබූ ජාත්‍යන්තර ප්‍රඥප්තීන්ට බැඳී සිටී.

3. නොබැඳි ජාතීන්ගේ විනිසුරුවන්ට ශ්‍රී ලංකාව තුළ විමර්ශන විනිශ්චයාධිකරණයක නිරීක්ෂකයන් ලෙස කාර්යයක් ඉටු කළ හැකිව තිබූ අතර, යුධ අපරාධ , කඩකිරීම් පිළිබඳව සොයා බැලීම සඳහා විශේෂ පැමිණිලි මෙහෙයවන්නෙකු පත් කරනු ලැබීම සඳහා විෂය ක්ෂේත්‍රයත් පැවති බව. වගවීම පිළිබඳව එක් අනිවාර්යය ක්‍රියාවලියක් නොව ඒ සඳහා යොදාගත හැකි විවිධ ආකෘති කිහිපයක් කොමිසම විසින් යෝජනා කොට පවතින තත්ත්වය අනුව හොඳම විකල්පය තෝරාගැනීම ශ්‍රී ලංකා රජයට භාර කරනු ලැබීය. සිදු විය යුත්තේ එය යන්න මාගේ ද මතය යි.

ඉහත කරුණු සුදු හුණු තැවරීමක් ලෙස විග්‍රහ කිරීමට නොහැකි ය.

4. යුද්ධයේ අවසන් අදියර තුළ පූර්වයෙන් සැලසුම් කළ ජන සංහාරයක් පැවති බවට වූ මතය අභියෝගයට ලක් කරන ලදී. එවැනි සොයාගැනීමක් ගොඩනැංවීම සඳහා අදාළ කරගත් ඉහළ සීමාවක් සහිත පරීක්ෂණය විසින් විශ්ලේෂණය කරනු ලැබූ අතර, එවැනි චෝදනාවක් සඳහා පදනම් කර ගත හැකි යමක් සොයා ගැනීමට ඔවුනට නොහැකි විය.

5. එබැවින්. ප්‍රධාන වශයෙන් ඔවුහු යුධ අපරාධ ඉස්මතු කිරීම සඳහා සැලසුම් කරන ලද මෙහෙයුමකින් ශ්‍රී ලංකා යුද්ධ හමුදාව නිදොස් කළහ. එමෙන්ම ගැටුම් පැවති ප්‍රදේශවල විසූ සාමාන්‍ය පුද්ගලයින් හිතාමතා කුසගින්නේ තැබීම පිළිබඳ චෝදනාවෙන් ද ඔවුන් ශ්‍රී ලංකා යුද්ධ හමුදාව නිදොස් කළ අතර, 2009 යුධ මෙහෙයුමෙහි අවසන් අදියරෙහිදී විනාශයට ලක් වූයේ යැයි චෝදනා කරනු ලැබූ ජීවිත සංඛ්‍යාව සමග එකඟ නොවීණි. එල්.ටී.ටී.ඊ. සංවිධානය ඔවුනගේ සාමන්‍ය දමිළ වැසියන් මානුෂීය පළිහක් ලෙස යොදාගත් බව ඔවුන් සොයා ගන්නා ලදී.

කෙසේ වෙතත්, මීට පෙර අවස්ථා කිහිපයකදී ම මා කියා ඇති පරිදි " පිරිසුදු යුද්ධයක්" යැයි යමක් නැති බව පහදා දෙන්නට මට ඉඩ දෙන්න. මෙම කරුණ කණගාටුදායක වුවත්, එය මහා බ්‍රිතාන්‍යය, ඇමරිකා එක්සත් ජනපද සහ ඕස්ට්‍රේලියානු යුධ හමුදාවන් ඇතුළුව සියලු හමුදාවන්ට පොදු වන අතර ශ්‍රී ලාංකික සෙබලුන් සම්බන්ධයෙන් ද අරුමයක් නොවේ. යුධ උණුසුම තුළ සිදුවන සිදුවීම් සෑමදා පවතින අතර, මෙහිදී ඔබ කටයුතු කරනු ලැබුයේ ලොව වඩාත්ම දරුණු තස්ත්‍රවාදී සංවිධානයක් සමග වූ අතර, මා සෑම අවස්ථාවකදීම යථාර්තවාදී එහෙත් සාධාරණ ප්‍රවේශයක් ගත් බවටත් කිසියම් " නරක තැනැත්තෙකු" වූයේ නම් ඔවුන් සොයා ගැනීමටත් ඒ පිළිබඳ වගවීමෙන් බැඳ තැබීම සඳහා විමර්ශන කටයුතු කිරීම සඳහා දිරිදුන් බවට විශ්වාස කරමි. මාගේ නිහතමානී අදහස තුළ මෙය ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේත් රටේත් කීර්තිය හානියට ලක් කරනු ලබනවාට වඩා එය ආරක්ෂා කරනු ඇත. විශේෂයෙන්ම, තම ආදරණීයයන් අහිමි වූවන් සඳහා වගවීම අති වැදගත් සාධකයක් වනු ඇත.ඔවුන්ට අවම වශයෙන් එම අතුරුදන් වූවන් හට සිදුවූයේ කුමක්ද යන්න පිළිබඳව හෝ හොඳින් වටහා ගැනීමට හෝ අවශ්‍ය වේ. එහෙත් මා දේශපාලනඥයෙකු වනු අතර, " හැකි දෙයෙහි කලාව" යන්න වගවීම පිළිබඳ යාන්ත්‍රණයෙහි මූලික සාධකය වන බවද සියලු පාර්ශ්වයන් මෙම ප්‍රබල කරුණ වටහා ගත යුතු බව මට වැටහේ.

එක් අතිවිශාල දුෂ්කරතාවක් එහි රැඳී පවතී. වගවීම සාක්ෂාත් කර ගැනීම සඳහා යොදගනු ලැබිය යුත්තේ කිනම් ක්‍රමවේදයක් ද ?

පැරෂුට් කරුවන් මෙන් ගොඩබසින ජාත්‍යන්තර විනිශ්චයකරුවන් සහ පැමිණිලි මෙහෙයවන්නන් මීට පිළිතුර විය නොහැකි ය. එහෙත් ශ්‍රී ලංකාවට කිසිවක් සිදු නොකොට පසෙකට වී සිටිය හැකි යැයි මම විශ්වාස නොකරමි. දමිළ ඩයස්පෝරාව යනු බලවත්, ධනවාදී සහ නවීන ප්‍රජාවක් වන අතර ඔවුන්ගෙන් සුළුතරයක් මෙම ගැටළුව නිසලව පැවතීමට කිසිදා ඉඩ නොදෙනු ඇත. සාධාරණව බැලූ විට, සත්‍යය සොයා ගැනීමට අයිතියක් ඇති පිරිසක් ද සිටී. එනම් තම ආදරණීයයන් අහිමි වූ අය සහ සෙබල බිරින්දෑවරු ආදී පිරිස් ය.

ඇත්ත වශයෙන්ම, යුධ හමුදාවට ද මේ සම්බන්ධයෙන් කිසියම් නිමාවක් දකිනු ලැබීම අවශ්‍යය. අප විසින් එක්සත් රාජධානිය තුළ උතුරු අයර්ලන්ත "Troubles" නම් වාර්ගික ගැටුම සම්බන්ධයෙන් කාලයක් තිස්සේ කටයුතු කරන ගැටළුවකි. අසූවන වියේදී පිට කොන්දේ ආබාධයකින් සුවපත් වෙමින් සිටියදී ලන්ඩනයේදී අත් අඩංගුවට පත් වූ ජෙනරල් පිනෝඡේ ගේ සිදුවීම හෝ තමාට එසේ විය නොහැකි නොහැකි යැයි මීට වසර කිහිපයකට පෙර විශ්වාස කළ ඔමාර් බෂීම් ජාත්‍යන්තර අපරාධ අධිකරණයෙහි විලංගුවට හසුවීම කෙනෙකුට සැලකිල්ලට ගත හැකිය. ඒ අනුව, වගවීම පිළිබඳ ගැටළුව යනු සරල ලෙස ඉවත් කොට දැමිය හැකි යමක් නොවේ. එනම්, ජාත්‍යන්තර නීතියෙහි රෝද කැරකෙනු ඇත්තේ සෙමින් විය හැකි වුවත්, නිසැකවම ඒවා කැරකෙන බව පැහැදිලි ය.

එබැවින්, ශ්‍රී ලංකා රජයට මා උනන්දු කරන්නේ යථාර්ථවාදී වන ලෙසත්, මෙම ගැටළුව පාර අයිනකට තල්ලු නොකරන ලෙසත් ය; එය විසඳීම සඳහා ප්‍රායෝගික සහ ප්‍රඥාවන්ත පියවර ගන්නා ලෙසය.

<u>සත්‍ය සහ ප්‍රතිසන්ධාන කොමිෂන් සභාව පිළිබඳ විශේෂ ලක්ෂණ</u>

I. මාගේ මතය වනුයේ ශ්‍රී ලංකාව සඳහා ශක්තිමත් සංහිදියා කොමිසමක් පිළිබඳව හැදෑරීම හොඳ ආරම්භක පියවරකි. වගවීම සාක්ෂාත් කරගැනීම සඳහා පශ්චාත් යුධ ගැටුම් සහිත රාජ්‍යයන් කිහිපයක් විසින් සත්‍යය පිළිබඳ කොමිසම් යොදා ගෙන තිබේ.

II. මා නීතිඥයෙකු නොවේ. එහෙත් ජාත්‍යන්තර නීතිය යටතේ ඇත්ත වශයයෙන්ම සමාව දීම් තහනම් කොට ඇත්ද නැතහොත් පොදු සමාව දීම ඇතුළත් ක්‍රියාවලීන් විනිදිතයන් සඳහා සාධාරණය සහ වගවීම ලබාදීම සඳහා ප්‍රමාණවත් ද යන ගැටළුව පැන නගී.

III. මාගේ අවබෝධය වන්නේ ජාත්‍යන්තර නීතිය තුළ පොදු සමාව දීම පිළිබඳව පොදු සම්මුතියක් නොමැති බවයි. පොදුවේ සමාව දීම් සඳහා ඉඩ දෙනු නොලැබිය හැකි අතර, ඇතැම් සමාව දීම් ප්‍රායෝගික සහ අවශ්‍ය ඒවා වේ; උදාහරණයක් ලෙස ජිනීවා සම්මුතියේ අමතර ප්‍රොටෝකෝලයෙහි මෙසේ දක්වා ඇත;

“ යුධ ගැටුම් හා සම්බන්ධ සිරකරුවන් සහ රැඳවියන් නිදහස් කළ යුතුය, මිලිටරි පාලනයෙන් ඉවත් කරගත යුතුය, හමුදාවන්ගෙන් මුදා ගත යුතුය, නැවතත් සමාජය හා ඒකාබද්ධ වීමට හැකි පුද්ගලයෙකු බවට පත් කළ යුතුය.”[513]

IV. සත්‍යය පිළිබඳ කොමිසන් බොහෝ ප්‍රමාණයක් සත්‍ය සහ සංහිදියාව / ප්‍රතිසන්ධානගත වීම පිළිබඳ දකුණු අප්‍රිකානු කොමිසම විසින් පළමුවෙන්ම අනුගමනය කරනු ලැබූ “ සත්‍යය සඳහා පොදු සමාව දීම” යන ක්‍රියාවලිය තුළ හැඩ ගස්වා ඇති බව පැහැදිලිය.

V. මෙම දකුණු අප්‍රිකානු ක්‍රියාවලිය මගින් සමාව දීම් “ අපරාධ නීතියට අදාළ සියලු සාධක සම්බන්ධයෙන් යුධ අපරාධකරු විසින් සම්පූර්ණ හෙළිදරව් කිරීමක් සිදුකිරීම” වෙනුවෙන් ලබාදීම උදෙසා ක්‍රමවේදයක් සපයනු ලබයි.

VI. සත්‍යය පිළිබඳ කොමිසන් ක්‍රියාවලින් තුළට ඇතුළත් කරගනු ලැබෙන පොදු සමාව දීම පිළිබඳ මෙම ක්‍රමවේදය පශ්චාත් යුධ ගැටුම් සහිත වෙනත් රාජ්‍යයන් ගණනාවක් විසින් ද භාවිත කොට ඇත. එනම්, දකුණු කොරියානු, ස්පාඤ්ඤ, ගැම්බියා සහ වෙනත් බෙහෝ රටවල සත්‍යය පිළිබඳ කොමිසන් විසිනි. යුධ අපරාධ පිළිබඳව පූර්ණ වශයෙන් නඩු පැවරීම් සම්බන්ධයෙන් සිදුවන්නා සේම, ප්‍රතිසන්ධාන කොමිසමෙහි සාර්ථකත්වයද සිදුවනුයේ විවිධ මට්ටමනි. කිසිදු පද්ධතියක් පරිපූර්ණ නොවේ. පසුගිය යුගෝස්ලාවියුනු යුධ සමයට අදාළව බෝල්කන් සිදු වීම සම්බන්ධයෙන් UN (ICTY) අධිකරණය තුළ මිලියන ගණනාවක් වියදම් කිරීමෙන් පසු වුවද (ICTY) ය මගින් ගැටුම විසඳු බව සහ බෝල්කන් වැසියන්ගේ වේදනා සුවපත් වූ බව අපට අවංකවම පැවසිය හැකිද? ඊට සමානව කෙන්යාව තුළ, මිලියන සිය ගණනාවක් වියදම් කිරීමෙන් පසුව ද ICC නඩු පැවරීම් අසාර්ථක වනු අපට දැකිය හැකි විය. වගවීම පිළිබඳ කිසිදු මගක් පහසු මගක් නොවේ.

VII. කෙසේ වෙතත්, මෙම අධිකරණ පාත්‍රතාව තුළ සමාව දීම් යනු අසා නැති යමක් නොවේ. 1998 වසරේදී, මහ සිකුරාදා සාම ගිවිසුමට පෙර මහා බ්‍රිතාන්‍යය තුළ සිදුවූ පාර මිලිටරිමය අපරාධ සම්බන්ධයෙන් නඩු පැවරීම්වලට බියව මිනිසුන් පළා යෑම පිළිබඳ ගැටළුව විසඳා ගැනීම සඳහා බ්‍රිතාන්‍ය අධිකරණය විසින් ආරම්භයක් වශයෙන් පුද්ගලයන් 187 දෙනෙකුට සමාව ලබාදීම පිළිබඳව අප දනිමු.

[513] II වෙනි අමතර කෙටුම්පතෙහි 65 වෙනි වගන්තිය

VIII. වර්තමාන කොන්සර්වෙටිව් රජය උතුරු අයර්ලන්තයෙහි ගැටළුව විසඳීම සඳහා සංහිදියා කොමිසමක් පිළිබඳව විමසා බලමින් සිටින බව අපි දනිමු. එමෙන්ම, එවැනි යාන්ත්‍රණයක් නිර්මාණය කරනු ලබනවාට විරෝධය දක්වන සහ අපරාධ නඩු විභාග ඉල්ලා සිටන බොහෝ පිරිසක් ද සිටී. මේ අවස්ථාවේදී රජය මෙම තරහකාරී ඉල්ලීම් අතර සමබරතාවයක් පවත්වා ගැනීම සඳහා හැකි සෑම ප්‍රයත්නයක්ම දරමින් සිටින අතර, ශ්‍රී ලංකාව මුහුණ පා සිටින්නේ කෙබඳු අරගලයකට ද යන වග හොඳින් තේරුම් ගනී. ශ්‍රී ලංකාව සමග කිට්ටු ඓතිහාසික / සංස්කෘතික සම්බන්ධයක් පවතින මහා බ්‍රිතාන්‍යය, ඔවුන්ගේ තේරීම ම ඔවුන් මෙන්ම තවත් පොදු රාජ්‍යය මණ්ඩලීය රටක් විසින් අනුගමනය කරනු ලබන විට ඒ සඳහා සහාය වීමට පොළඹවාගත් නොහැක්කේ මන්දැයි මට නොවැටහේ. එම යෝජනාව තවමත් මෙහි එනම් මහා බ්‍රිතාන්‍යයෙහි මේසයක් මත පවතිද්දී, ඔබගේ අනුමැතියට සුදුසු වේ නම් මම ශ්‍රී ලංකාවට කඩිනම් යෝජනාවක් ඉදිරිපත් කරනු කරමි. එනම්, උතුරු අයර්ලන්ත සංහිදියා කොමිසම පිළිබඳව මහා ඔබගේ අනුමැතියට සුදුසු වේ නම් ස්ථාවරය, එහි රජයේ අභිමතාර්ථයක් වුවද ඒ පිළිබඳව සලකා බලන ලෙසය.

IX. කොළොම්බියානු සංහිදියා කොමිසම සකස් කිරීම සඳහා ජාත්‍යන්තර ප්‍රජාව සහය දුන් බවත් ඔවුන් ඊට මූල්‍යමය සහ දේශපාලනික වශයෙන් දායකත්වය ලබා දී ඇති බවත් අප දනිමු. කොළොම්බියානු ගැටුම ශ්‍රී ලංකාවේ පැවති ගැටුමට වඩා බොහෝ කාලයක් පැවති අතර එයට බිලිවූ ජීවිත සංඛ්‍යාවද සාපේක්ෂව වැඩිය. එබැවින් මෙම ප්‍රයත්නයේදී එක් රටකට සහාය වීමත් තවත් රටකට අවහිර බාධා කිරීම් සිදුවන්නේත් මන්දැයි මා මගෙන්ම අසමි.

X. එසේම, ම හට ශ්‍රී ලංකාවට පැවසීමට ඇත්තේ, සංහිදියා කොමිසම පිළිබඳ යාන්ත්‍රණයකට ඔවුන් උනන්දු වන්නේ නම්, ඔවුනට ජාත්‍යන්තර ප්‍රජාව; පොදු රාජ්‍ය මණ්ඩලය සමග කටයුතු කිරීමට සහ ඔවුන්ගේ ම දක්ෂතා සහිත පුරවැසියන් සහ ද්විත්ව පුරවැසියන්ගේ දායකත්වය ඊට ලබා ගැනීමට සිදුවන බවය. මන්ද, ජාත්‍යන්තර ප්‍රජාව වෙතින් ඒ පිළිබඳව විශ්වාසනීයත්වයක් දිනා ගනිමින් අවශ්‍ය සහාය ලබා ගැනීමට හැකි ස්වාධීන සහ ශක්තිමත් සංහිදියා කොමිසමක් සකස් කර ගැනීම සඳහා එය අවශ්‍ය සාධකයක් වන බැවිනි. මා මෙහි සිට ශ්‍රී ලංකාවට කිසිවක් අණ නොකරමි. එහෙත් පොදු රාජ්‍ය මණ්ඩලය වෙතින් සපයා ගනු ලබන ජාත්‍යන්තර නීතිවේදීන් සහ රාජ්‍ය තාන්ත්‍රික මඩුල්ලකට ලොව පුරා සහාය එක්රැස් කරගන්නා අතරවාරයේදී ම ශ්‍රී ලංකාවට සම්පූර්ණයෙන්ම අයත් වන්නාවූ සංහිදියා කොමිසමක් සකස් කිරීම සඳහා අනුශාසනා කළ හැකි බව යෝජනා කරමි. ඇත්ත වශයෙන්ම, ශ්‍රී ලංකාවට පොදු රාජ්‍ය මණ්ඩලීය මඩුල්ල ද තෝරාගත හැකි අතර, ලබාගත හැනි පුළුල්ම සහාය පදනම ලබාගන්නා බව සහතික කිරීම උදෙසා විශ්වසනීය පුද්ගලයන් තෝරා ගැනීම පිළිබඳව විමසා බලනු ඇති බව ද නිශ්චිතය.

අවසාන කිරීමේ සටහන

මා දුටු සියල්ල ඇසුරින් ගත් කළ ශ්‍රී ලංකාව යනු ඉතා ඉහළ විභවතාවයකින් යුතු රටකි. කළාපයේ බොහෝ දෙනෙකුගේ විසින් ඉර්ෂ්‍යා කරනු ලබන අකාරයේ ඉහළ සාක්ෂරතාවයකින් යුතු ශ්‍රම බලකායක් සහිත මානව ප්‍රාග්ධනයක්, නිදහස් අධ්‍යාපන සහ සෞඛ්‍ය පද්ධතියක් ඔබ සතුවේ. ඉන්දියාව සහ ඊටත් ඔබ්බට පිනුම් ගැසිය හැකි ආර්ථිකයක් උදෙසා හැකියාව ලබා දිය හැකි වරාය නගරයක් ඔබට ඇත. රටක් වශයෙන් ඉතා පියකරු සුන්දරයත්වයක් සහ ස්වභාවික සම්පත් ඔබට ඇත. එහෙත් ගැටුම් සහ සිවිල් කෝලහාලවල ප්‍රතිවිපාක බරක් මෙන් ඔබගේ ගෙල වටා එල්ලී පවතී. මෙම ගැටළු විසඳා නොගෙන ශ්‍රී ලංකාවට තම පූර්ණ ධාරිතාවයට ළං විය හැකි

යැයි මම නොසිතමි. සියලු රටවල් මෙන්ම ශ්‍රී ලංකාව ද කෝවිඩ් වසංගතයෙහි බලපෑමෙන් ඇති වූ ආර්ථික දුෂ්කරතාවන් පිළිබඳ ප්‍රබල ගැටළුව අභියස හිඳී. එබැවින් ආර්ථික වශයෙන් නැවත නැඟී සිටීමට පමණක් නොව අතීතයේ වේදනාවන් වලින් සුවපත් වීම සඳහා සහාය ලබා දීමට හැකියාව සහ ප්‍රවීණත්වයක් සහිත පාර්ශ්වයන් වෙත එළඹීම සිදු කළ යුතුය. එවැනි ක්‍රියාකාරකම් සහ වගවීම පිළිබඳ පියවරයන්ගෙන් බැහැර වන්නේ නම් වරාය නගරය වැනි ප්‍රයත්නයන් තුළින් පමණක් සශ්‍රීකත්වයට පත් විම කළ නොහැකි වනු ඇත.

ඔබේ රටට මිතුරන් සිටින්නේ මහා බ්‍රිතාන්‍යය තුළ පමණක් නොවේ, පොදු රාජ්‍ය මණ්ඩලය පුරා ම සහ ලොව වටා මිතුරන් සිටී. එබැවින්, මෙම ගමනේදී ඔබ අසල අඛණ්ඩව රැඳී සිටීමටත් ඔබට සහයට වීමටත් අප ඉදිරිපත් වන්නෙමු.

5 වන පරිච්ඡේදය

අවසන් කිරීමේ නිරීක්ෂණ

1. හැඳින්වීම.

878. මීට පෙර 1, 2 සහ 3 වන පරිච්ඡේද තුළින්, විමර්ශනය පිළිබඳ ජනාධිපති කොමිසම පිළිබඳ විධි නියෝගයෙහි (අ) සහ (ආ) ඡේදවල විශේෂයෙන් දක්වා තිබූ කරුණු කිහිපයක් පිළිබඳව සාකච්ඡා කරනු ලැබීය. ඒ අනුව, එහි (අ) ඡේදය මගින් ජාත්‍යන්තර මානව හිමිකම් පිළිබඳ නීතිය (IHRL) සහ ජාත්‍යන්තර මානුෂීය නීති උල්ලංඝනය කරනු ලැබීම් සම්බන්ධයෙන් මීට පෙර ක්‍රියාත්මක කොමිසම්වල සොයාගැනීම් තහවුරු කරගැනීමේ අවශ්‍යතාවය දක්වා තිබූ අතර මීට පෙර පැවති කොමිසම්වල නිර්දේශ ශ්‍රී ලංකා රජය විසින් ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් (ආ) ඡේදය යටතේ අවධානය යොමු කරන ලදී. කොමිසම පිළිබඳ විධි නියෝගයෙහි සඳහන් ඉහත අංශ පිළිබඳව මෙම අවසන් වාර්තාවේ 1, 2 සහ 3 වන පරිච්ඡේද තුළින් සාකච්ඡා කරන ලදී. විමර්ශනය පිළිබඳ ජනාධිපති කොමිසම විසින් පවත්වන ලද විමර්ශන සහ පරීක්ෂණ පිළිබඳ තොරතුරු මෙම අවසන් වාර්තාවේ 4 වන පරිච්ඡේදයට ඇතුළත් වේ. කොමිසමෙහි අවසන් නිරීක්ෂණ වලට හේතු වූ මෙම පරිච්ඡේදයේ (5 වන පරිච්ඡේදය) සඳහන් මෙහි 1, 2,3 පරිච්ඡේද තුළින් සාකච්ඡා කරනු ලැබූ සමස්ත කරුණු මෙහි 6 වන පරිච්ඡේදයෙහි සඳහන් කොමිසමෙහි නිර්දේශ සකස් කිරීමට හේතු වේ.

879. විමර්ශනය පිළිබඳ ජනාධිපති කොමිසම විසින් සිදුකරන ලද කාර්යයන් එනම්, කොමිසම ඉදිරියට පමුණුවන ලද සාක්ෂි සහ විස්තර විමසා බැලීම මෙම වාර්තාවේ 4 වන පරිච්ඡේදය මගින් විස්තරාත්මකව සලකා බලනු ලැබීය. මෙම සාක්ෂිකරුවන් අතරට එල්. ටී.ටී.ඊ. සංවිධානයෙහි හිටපු සාමාජිකයන්, වින්දිතයන්, සිවිල් සමාජ වැසියන්, දේශපාලන නායකයක් ඇතුළුව ශ්‍රී ලංකාව සහ විදේශ රටවල්වලට අයත් විවිධ සමාජ කොටස්වලින් පැමිණි සාමාජිකයන් ඇතුළත් වූ අතර ඇතැම් සාක්ෂිකරුවන් සහ සම්මුඛ සාකච්ඡාවන්ට සහභාගී වූවන්ගෙන් ප්‍රධාන කොටස උතුරු සහ නැගෙනහිර ප්‍රදේශවල පැවති ගැටුම් හේතුවෙන් ඥාතීන් සහ හිත මිතුරන් අහිමි වූ පිරිස විය.[514] [514] සාක්ෂිකරුවන් විසින් කොමිසම ඉදිරියේ තැබූ එකී සාක්ෂි මත පදනම්ව අප විසින් මෙම නිරීක්ෂණ සහ අවසන් සටහන් තබන ලදී.

880. ජනාධිපති විමර්ශන කොමිසම විසින් මෙම නිරීක්ෂණ සහ අවසන් සටහන් ඉදිරිපත් කිරීමට යොමු කරවනු ලබන තවත් අවශ්‍යතාවයක් ඉහත කී කොමිසමෙහි විධි නියෝගයට ඇතුළත් වේ. එනම් රාජ්‍ය ප්‍රතිපත්තියට ද අනුකූල වෙමින් පසුගිය කොමිසන් සභාවන් හි නිර්දේශ ක්‍රියාත්මක කිරීම සඳහා ගත හැකි පියවර කවරේද යන්න යි. මෙමගින් වගවීම, තිරසාරත්ව සාමය සහ සංහිඳියාව අත්පත් කරගැනීම සඳහා ජනාධිපති විමර්ශන කොමිසන් සභාවෙහි ඉදිරි දැක්මක් නිශ්චිතව සකස්කොට ඉදිරිපත් කිරීමට යෝජනා කරනු ලබයි. අප විසින් සංක්‍රාන්ති යුක්තියෙහි (transitional justice) ඉලක්ක කුළුණු 04 ක්[515] යටතේ විස්තර කළ ද එම කුළුණුවල පහළ ස්ථරය වශයෙන් සාධාරණත්වය, සාමය සහ සමාජ ඒකබද්ධතාවය වැනි කරුණු කිහිපයක් පවතින බව මෙහිදී කිව යුතු නොවේ. කොමිසම පිළිබඳ විධි නියෝගයෙහි (ඇ) සහ (ඈ) ඡේද කියවීමෙන් පසු ඉහත සඳහන් කළ පරිදි විමර්ශන කොමිසම සඳහා ඉදිරි දැක්මක් සකස් කිරීමේ අවශ්‍යතාවය හොඳින් පැහැදිලි වන අතර එමගින් පහත කරුණු ක්‍රියාත්මක කිරීමට හැකි වනු ඇත.

514 4 වෙනි පරිච්ඡේදයේ ඇති යාපනය, කිලිනොච්චි සහ කාත්තන්කුඩි ප්‍රදේශ වලින් ලබාගත් සාක්ෂි බලන්න.

515 සංක්‍රාන්ති යුක්තියෙහි කුළුණු මොනවාද? එක්සත් ජාතීන්ගේ සංවිධානය, සිවිල් සමාජය සහ *justice cascade*

(ඇ) වර්තමාන රජයේ ප්‍රතිපත්තියට අනුකූලව ඉහත නිර්දේශ ක්‍රියාත්මක කිරීම සඳහා ගත හැකි පියවර කවරේද යන්න නිශ්චය කිරීම;

(ඈ) ඉහත (ඇ) සහ (ඈ) ඡේදවලට අනුව පියවර ගනු ලබමින් සිටින්නේ දැයි අධීක්ෂණය කිරීම.

881. මෙම පරිච්ඡේදයේ දැක්වෙන අවසන් නිරීක්ෂණ අප විසින් සකස් කොට ඇත්තේ ඉහත ඡේදවල විෂය සීමාව තුළය. මෙම නිරීක්ෂණ අවසන් වශයෙන් අපගේ නිර්දේශ සඳහන් කොට ඇති 6 වන පරිච්ඡේදය තුළ වඩා පැහැදිලිව දැක්වෙනු ඇත. එනම් සාක්ෂි සහ අදාළ ලේඛන ජනාධිපති විමර්ශන කොමිසම වෙත රැගෙන එමින් මෙම කොමිසම ඉදිරියේ පමණක් නොව මීට පෙර පැවති කොමිසම් හමුවට ද පැමිණ වූ වින්දිතයන්ගේ යටපත් කළ නොහැකි හඬ වන පිළියමක් සඳහා ඇති අයිතිය යන්න වඩාත් වර්ධනය කරගනු ලබන්නේ සහ අත්පත් කරගන්නේ කෙසේද[516] යන්න පිළිබඳව සාකච්ඡා කිරීමට මෙම ජනාධිපති විමර්ශන කොමිසම යොමුවනු ඇත. පෙනෙන පරිදි, මෙම අවසන් වාර්තාවේ 4 වන පරිච්ඡේදවය ඇතුළත් සාක්ෂිකරුවන්ගේ සාක්ෂි දීම්වලින් වැඩි ප්‍රමාණය තුළින් පෙර කොමිසන්වල නිර්දේශ ක්‍රියාත්මක නොකිරීම පිළිබඳව කණගාටුව පළ වූ අතර එම තත්ත්වය තුළ උගත් පාඩම් ප්‍රතිසන්ධාන කොමිසමේ සොයාගැනීම් සහ නිර්දේශ කෙරෙහි මෙම කොමිසමෙහි අවධානය යොමු කරනු ලැබිණි.[517]

882. මීට පෙර ක්‍රියාත්මක වූ ජනාධිපති විමර්ශන කොමිසන් වල නිර්දේශ ක්‍රියාත්මක කිරීම / නොකිරීම සම්බන්ධයෙන් මෙම වාර්තාවේ 3 වන පරිච්ඡේදයෙහි සාකච්ඡා කළ බව සඳහන් කිරීම සුදුසු ය. උගත් පාඩම් සහ ප්‍රතිසන්ධාන කොමිසමෙහි (LLRC) නිර්දේශ කිහිපයක් ක්‍රියාත්මක නොකිරීම සම්බන්ධයෙන් චන්දිම වීරක්කොඩි මහතා විසින් ද විමසන ලදී.[518] පෙර පැවති කොමිසන්වල නිර්දේශ ක්‍රියාත්මක නොකිරීම සම්බන්ධයෙන් අතඇප්තිමත් හඬ නැඟූ සාක්ෂිකරුවන් අතර තවත් සුවිශේෂී සාක්ෂිකරුවන් රැසක් විය.[519]

883. මෙමගින් වසර ගණනාවක දේශපාලන උඩු යටිකුරු වීම් සහ ප්‍රචණ්ඩකාරී බව හේතුවෙන් අප රටේ ප්‍රතිචාරයෙහි දිශානතිය දෙපසකට විසිර පවතින්නක් බවට පත් කළ මීට පෙර ක්‍රියාත්මක වූ කොමිසන් වෙත අප රැගෙන යයි.

884. මෙම කොමිසම මීට පෙර ක්‍රියාත්මක වූ උදලාගම කොමිසම, පරණගම කොමිසම සහ උගත් පාඩම් සහ ප්‍රතිසන්ධාන කොමිසම වැනි කොමිසම් සමඟ සලකා බලනු නොලැබුවත්, රටෙහි බහුල වශයෙන් ක්‍රියාත්මක වූ කොමිසම් වෙත යොමු වීම මෙම කොමිසමට මුළුමනින්ම අදාළ නොවේ යැයි පැවසිය නොහැක. මෙමගින් අතීතයේ දී සංක්‍රාන්ති යුක්තිය සම්බන්ධයෙන් දරන ලද ප්‍රයත්නයන් ද පිළිබිඹු කරනු ලබයි. කිසියම් පුද්ගලයෙකු විසින් ප්‍රජාවන් අතර පැවති සංකීර්ණ, දුරවබෝධ සහ එකිනෙකට සම්බන්ධ ආරවුල් පිළිබඳ ඉතිහාසයන් සහ ඔවුන් අතර ඇතිවූ භේද භින්න වීම් සඳහා සුවිශේෂී ප්‍රතිචාරයන් බඳු පෙර ක්‍රියාත්මක වූ කොමිසම්වල ගමන් පථය වෙත අවධානය යොමු කිරීමට පෙර එම තැනැත්තා සංක්‍රාන්ති යුක්තිය නම් සංකල්පය විවර කොට

---

516 පිළියමක් සහ හානි පූරණයක් සඳහා "වින්දිතයෙකුට" ඇති අයිතිය කොටස් කිහිපයක් යටතේ සාකච්ඡා කළ හැකිය. සාධාරණත්වය සඳහා අයිතිය, සාධාරණත්වය සහ හානි පූරණයක් සඳහා අයිතිය - 2005 දෙසැම්බර් 16 වන දින එක්සත් ජාතීන්ගේ මහා රැස්වීමේදී සකස් කරගනු ලැබූ 60/147.***A/Res/ 147*** යෝජනාවෙහි ජාත්‍යන්තර මානව හිමිකම් නීති සහ ජාත්‍යන්තර මානුෂීය නීති (මූලික සිද්ධාන්ත සහ මාර්ගෝපදේශ) සම්බන්ධයෙන් බරපතල ගනයේ කඩකිරීම් සම්බන්ධයෙන් පිළියමක් සහ හානිපූරණයක් සඳහා වින්දිතයෙකුට ඇති අයිතිය පිළිබඳ මූලික සිද්ධාන්ත සහ මාර්ගෝපදේශ බලන්න.

517 මෙම අවසන් වාර්තාවේ 3 වන පරිච්ඡේදයේ 370 – 375 ඡේද බලන්න.

518 මෙම අවසන් වාර්තාවේ 4 වන පරිච්ඡේදයේ සඳහන් චන්දිම වීරක්කොඩි මහතාගේ සාක්ෂිය බලන්න.

519 මෙම අවසන් වාර්තාවේ 4 වන පරිච්ඡේදයේ සඳහන් ඔස්ටින් ප්‍රනාන්දු, ආචාර්ය ජෙහාන් පෙරේරා, මහාචාර්ය සර්වේස්වරන් විසින් ලබා දුන් සාක්ෂි බලන්න.

බැලිය යුතුය. Ronald Dworkin[520] ගේ වචන වලින් පවසන්නේ නම් Frank Haldmann විසින් සංක්‍රාන්ති යුක්තිය පිළිබඳ සංකල්පය පහත සඳහන් පරිදි විස්තරය කරනු ලබයි.

"සංක්‍රාන්ති යුක්තිය පිළිබඳව තථ්‍ය සහ පොදු ප්‍රස්තුතය සංක්‍රාන්ති යුක්තිය නම් අදහස ස්ථාපනය වී ඇති ගසෙහි ප්‍රධාන කඳ කොට සංස්ථාපනය කරනවා වැනි ය."[521].

885. සංක්‍රාන්ති යුක්තිය පිළිබඳ ආරම්භක සහ පෘතුල සංකල්පය ගසක අතු පතර දෙසට අප රැගෙන යන කඳ කොටසට සමාන කළ හැකි අතර එහි අතු මගින් සංක්‍රාන්ති යුක්තිය පිළිබඳ විවිධ සංකල්ප එනම්, සත්‍යය, හානි පූරණය සහ නැවත නැවතත් සිදු නොවීම වැනි කරුණු නියෝජනය වනු ඇත. ගසෙහි මුල්වලට වතුර සහ පෝෂණය ලබා නොදෙන තෙක් එහි අතුවල ඵල හට ගැනීම සිදු විය නොහැකි බව මෙම ජනාධිපති විමර්ශන කොමිසමෙහි අදහස ය. සංකල්පයක් සහ ඒ පිළිබඳ විවිධ අවබෝධයන් අතර පවතින සියුම් වෙනස නීති විශේෂඥයින් ගේ මතවාද තුළින් මෙහිදී ඉදිරිපත් කරනු ලැබේ.[522]

886. ඉහත ප්‍රකාශයෙන් පැහැදිලි වන පරිදි, සංක්‍රාන්ති යුක්තිය පිළිබඳ සංකල්පය සම්බන්ධයෙන් ඇති විවිධ වටහා ගැනීම් එනම්, සත්‍යය ගවේෂණය කිරීම, යුක්තිය (වගවීම), හානි පූරණය සහ නැවත නැවත සිදු නොවීම (ආයතනික ප්‍රතිසංස්කරණ) ආදිය මගින් සංක්‍රාන්ති යුක්තියෙහි ස්වරූපය ගසක කඳ කොටසින් අතු විහිද යන ආකාරයට දක්වනු ලබන අතර සත්‍ය ගවේෂණය සඳහා ශ්‍රී ලංකාව විසින් ස්ථාපිත කරනු ලබනු යාන්ත්‍රණය එහි නම කවරක් වුවද ඉහත කී ගසෙහිම තවත් ශාඛාවක් /අත්තක් වනු ඇති අතර, එහි අනෙකත් අතු ඉති පෝෂණය කිරීම තුළින් සමස්ත ගසෙහි පැවැත්ම වඩා ස්ථීර සාර කරනු ඇත.

887. ගසක කඳ කොටසට උපමා කරනු ලැබූ සංක්‍රාන්ති යුක්තිය පිළිබඳ සංකල්පය පිළිබඳව කරුණු රැසකි. එහි ශාඛා එකිනෙකට සම්බන්ධ වන බව ද සත්‍ය ගවේෂණය පිළිබඳ යාන්ත්‍රණයක් සකස් කරනු ලැබූ විට, සංක්‍රාන්ති යුක්තිය පිළිබඳ ඉහත වටහා ගැනීම් සම්බන්ධයෙන් ජාත්‍යන්තර ප්‍රමිතීන් සංතෘප්ත වන ආකාරයෙන් ප්‍රතිචාර දැක්විය යුතු බව ද අවධාරණය කළ යුතුය. අවසාන වශයෙන් එය සත්‍ය ගවේෂණය සඳහා වන ඉදිරි යාන්ත්‍රණය ජාත්‍යන්තර ප්‍රමිතීන් හි මට්ටමට අනුකූල වනු ඇති ද යන අති වැදගත් ප්‍රශ්නය දක්වා ලුහුඬු වනු ඇත. මෙම ප්‍රමිතීන් ලේඛන කිහිපයක් දක්වා ඇති අතර, මෙම ප්‍රමිති ඉහත කී සත්‍ය ගවේෂණය පිළිබඳ යාන්ත්‍රණයට නුදුරේදී ම ඇතුළත් කර ගනු ලබන විශ්වසනීයත්වය, විවෘත භාවය සහ විනිවිදභාවය ආදී ප්‍රාමාණික සංකල්ප තුළ ගැබ් වී ඇත.

සංක්‍රාන්ති යුක්තිය පිළිබඳ නිර්වචන.

888. සංක්‍රාන්ති යුක්තිය යනු කුමක් දැයි විග්‍රහ කිරීම සඳහා ගත් උත්සාහ කිහිපයකි. ඒ අනුව Ruti Teitel ගේ නිර්වචනය සලකා බලමු. ඇයට අනුව, සංක්‍රාන්ති යුක්තිය යනු පූර්වගාමී පීඩක රජයන් විසින් සිදුකළ වැරදි සඳහා නෛතික ප්‍රතිචාරවලින් සැකසුණු, දේශපාලනික වෙනස්කම් සහිත කාල වකවානු ආශ්‍රිතව යුක්තිය යැයි වටහා ගනු ලබන සංකල්පයකි.[523] විමර්ශනය

---

520 Dworkin, Ronald ගේ *Law's Empire* (Oxford : Hart) 70 වන පිටුව බලන්න.

521 ෆ්‍රැන්ක් හෝල්ඩ්මන්, "Transitional Justice for Foxes: Conflict, Pluralism & the politics of Compromise (2023) පි. 16

522 බලන්න : H.L.A. Hart,1994 *The concept of Law* p. 160 ; Rawls, 2005 *Political Liberalism*, p.14, Swift, 2014 *Political Philosophy*, *A beginner's Guide for students and Politicians*, pp. 13 -20.

523 මෙම ජනාධිපති විමර්ශන කොමිෂන් සභාවේ අවසන් වාර්තාවේ 3 වෙනි පරිච්ඡේදයේ 'සංක්‍රාන්ති යුක්තිය එදිරිඋගත් පාඩම් හා ප්‍රතිසන්ධාන කොමිෂන් සභාව' මාතෘකාව යටතේ ඇ.ි සත්‍යය, යුක්තිය සහ හානිපූරණය සඳහා ඇති අයිතිය පිළිබඳ සාකච්ඡාව කියවන්න.

පිළිබඳ ජනාධිපති කොමිසමේ අවසන් වාර්තාවේ 3 වන පරිච්ඡේදයේ දැක්වෙන උගත් පාඩම් සහ ප්‍රතිසන්ධාන කොමිසමෙහි සංක්‍රාන්ති යුක්තිය නම් තේමාව යටතේ සත්‍යය, යුක්තිය සහ හානි පූරණය සම්බන්ධයෙන් ඇති සාකච්ඡාව බලන්න. [524]**Naomi Rohit Arraiaza** සංක්‍රාන්ති යුක්තිය ඉතා පුළුල් පරාසයක් තුළ අර්ථකථය කරයි. ඇයට අනුව සංක්‍රාන්ති යුක්තිය යනු ගැටුමක්, සිවිල් ආරවුලක් හෝ අවපීඩන / අවපාත කාල පරිච්ඡේදයකට පසුව එන ව්‍යවහාර , යාන්ත්‍රණ සහ සැලකිලිමත් වීමේ විධි රාශියක් වන අතර එමගින් අතීතයේ සිදුවූ මානව අයිතින් උල්ලංඝනය කිරීම් සහ මානුෂීය නීති කඩ කිරීම් වෙත සෘජුවම යොමුවීම සහ ඒ පිළිබඳ සිදුවීම් සම්බන්ධයෙන් කටයුතු කරනු ලබයි.[525] ඒ ආකාරයටම, **Pablo De Grieff** විසින් සංක්‍රාන්ති යුක්තිය මෙසේ අර්ථ දක්වනු ලබයි. එනම්, " මහා පරිමාණයේ / අති විශාල ස්වභාවයේ මානව හිමිකම් කඩකිරීම්වල පසු විපාකවලට නැවත නැවත සැරහුම් දැමීම " සඳහා ක්‍රියාත්මක කළ හැකි පියවර රාශියක් වශයෙනි. "මානව හිමිකම් කඩකිරීම් වල පසු විපාක සඳහා සැරහුම් දැමීම" වශයෙන් මෙහිදී අදහස් කරනු ලබන්නේ ක්‍රමිකව උල්ලංඝනය කරනු ලැබ මානව හිමිකම් පිළිබඳ ආචාර ධර්මව නැවත බලාත්මක කිරීම ය.[526] එසේම, Louis Bickford ගේ අදහස වන්නේ සංක්‍රාන්ති යුක්තිය යනු වඩා ප්‍රජාතන්ත්‍රවාදී, සාධාරණ නැතහොත් සාමකාමී අනාගතයක් ගොඩ නැගීම උදෙසා අතීතයේ සිදුවූ මානව අපයෝජනයන් සඳහා නැවත පිළියම් යොදන්නේ කෙසේද යන කරුණ වටා කේන්ද්‍රගත වූ ක්‍රියාකාකරම් හා විමසා බැලීම් රාශියක එකතුවක් වන බවය. එහෙත් සංක්‍රාන්ති යුක්තිය සම්බන්ධයෙන් බහුලවම යොදා ගැනෙන නිර්වචනය වන්නේ නීතියේ ආධිපත්‍යය (Rule of Law) පිළිබඳව එක්සත් ජාතීන්ගේ සංවිධානයේ මහ ලේකම්ගේ වාර්තාවෙහි (2004) දක්වා ඇති සටහන මගිනි. එය පහත දක්වා ඇත.

සංක්‍රාන්ති යුක්තිය යන සංකල්පය ... වගවීම, සහතික කිරීම, යුක්තිය ඉටුකිරීම සහ ප්‍රතිසන්ධානය සාක්ෂාත් කර ගැනීම පිණිස මහා පරිමාණ අපයෝජනවල උරුමය පිළිගැනීමට සමාජය දරන ප්‍රයත්නයන් හා සම්බන්ධ ක්‍රියාවලි සහ යාන්ත්‍රණවල සම්පූර්ණ පරාසයෙන් සමන්විත වේ. විවිධ මට්ටම්වල ජාත්‍යන්තර සම්බන්ධවීම් සහිතව (හෝ කිසිදු ජාත්‍යන්තර සම්බන්ධවීමක් නොමැතිවව), පුද්ගලයන්ට නඩුපැවරීම්, හානිපූරණය, සත්‍ය සෙවීම, ආයතනික ප්‍රතිසංස්කරණ, විමර්ශන සිදුකිරීම සහ බැහැර කිරීම්, හෝ ඒ සියල්ලෙහි සංයෝජනයක් සහිත අධිකරණමය සහ අධිකරණමය නොවන යාන්ත්‍රණ මෙයට ඇතුළත් වේ.[527]

889. ගැටුම් සමාජ සහ පශ්චාත් ගැටුම් සමාජ තුළ, නීතියේ ආධිපත්‍යය සහ සංක්‍රාන්ති යුක්තිය සම්බන්ධයෙන් 2004 වර්ෂයේදී එවකට එක්සත් ජාතීන්ගේ සංවිධානයේ මහ ලේකම් කොෆී අන්නන් මහතා විසින් නිකුත් කරන ලද වාර්තාව මගින් සංක්‍රාන්ති යුක්තිය පිළිබඳ නිර්වචනය සඳහා සුසමාදර්ශයක් ඉදිරිපත්කොට ඇති අතර, Frank Holdemann ට අනුව එය සංක්‍රාන්ති යුක්තිය පිළිබඳව ප්‍රබල ආදර්ශයකි.[528]

890. ඉහත සඳහන් කළ ප්‍රධාන යාන්ත්‍රණ ස්ථාපනය කිරීම සඳහා ඇති වගකීම, විශේෂයෙන් ම එක්සත් ජාතීන්ගේ සංවිධානයේ පරිවය මගින් පිළිබිඹු වන පරිදි, යම් එකඟත්වයක් ඉස්මතු වෙමින්

---

524 ටෙටෙල් රුටි ජී, *සංක්‍රාන්ති යුක්තිය ගෝලීයකරණය කිරීම, සමකාලීන ලිපි, පි. 49, (*NY Oxford University Press)

525 රෝහිත-අරියාසා, නඕමි (2006), *'සංක්‍රාන්තිය යුක්තියේ නව භූ දර්ශනය'*, නඕමි රෝහිත් - අරියාසි සහ ජේවියර් මේරයස් කරිනා (සංස්කරණය), *විස් එක්වෙනි සියවසේ සංක්‍රාන්ති යුක්තිය,* පි. 1 - 16, පි.2

526 ඩී. ග්‍රීෆ්, පැබ්ලෝ (2012), "*සංක්‍රාන්ති යුක්තිය න්‍යායකරණය කිරීම",* පි. 31 - 77

527 මහලේකම්වරයාගේ වාර්තාව, ගැටුම් පවතින සහ ගැටුම්වලින් පසු සමාජයන්හි නීතියේ ආධිපත්‍යය සහ සංක්‍රාන්ති යුක්තිය, UN.Doc.S/2004/616 (2024 අගෝස්තු 23), 8 වෙනි ඡේදය.

528 ඉහත 521 බලන්න.

තිබෙන්නේ යැයි පෙනී යන සංක්‍රාන්ති යුක්තිය සඳහා වන සංකල්ප රාමුව සංස්ථාපනය කරයි.[529] ඉහත 886 වෙනි ඡේදයෙහි පෙන්වා දී ඇති පරිදි, නිර්වචනයෙහි දී ඇති විවිධ අංග, දැනගැනීම සඳහා ඇති අයිතිය (සත්‍ය සෙවීම), යුක්තිය වෙත ප්‍රවේශ වීම සඳහා ඇති අයිතිය, හානිපූරණය සඳහා ඇති අයිතිය සහ ප්‍රචණ්ඩත්වය නැවත ඇති නොවන බවට සහතිවීම් (වැළැක්වීමේ වගකීම) වැනි එක්සත් ජාතීන්ගේ සාධනපත්‍ර[530] වලින් පිළිගෙන ඇති චින්දිතයන්ගේ ඇතැම් අයිතිවාසිකම් වලට අනුරූප වේ.

2. ශ්‍රී ලංකාව තුළ සංක්‍රාන්ති යුක්තිය පිළිබඳව පැවති අතීත ප්‍රවේශ

අ. අතුරු දහන් වූවන් පිළිබඳ කොමිසම (1994)

891. ශ්‍රී ලංකාව තුළ ප්‍රධාන වශයෙන් අවස්ථා හතරක දී සත්‍ය ගවේෂණය පිළිබඳව ක්‍රියාමාර්ග ගෙන ඇත. 1994 වසරේදී 1980 සිට 1990 වසරේ මුල් කාලය දක්වා සිදුවූ බලහත්කාර අතුරුදහන්වීම් පිළිබඳව විමර්ශනය කිරීම සඳහා ජනාධිපති කොමිසම් 04 ක් පත්කරනු ලැබූ අතර, එමඟින් වාර්ගික - දේශපාලනික ගැටුම මෙන්ම, දකුණෙහි සිවිල් කැරැල්ල සම්බන්ධයෙන් ද කටයුතු කරනු ලැබීය.[531] පසුව මෙම විමර්ශන අතරමඟදී නතර කරනු ලැබූ අතර, ඊට පෙර පැවති කොමිසම් 03 විසින් තීරණයකට නොපැමිණ තිබූ (අවසන් නොකරන ලද) විමර්ශන කටයුතු ඉදිරියට ගෙන යෑම සඳහා 1998 වර්ෂයේ දී කොමිසමක් ස්ථාපිත කරන ලදි

කැමැත්තෙන් සිදු නොකරන ලද ඉවත්කිරීම් (ස්වේච්ඡා නොවන ඉවත් කිරීම්) සහ ඇතැම් පුද්ගලයන්ගේ අතුරුදහන්වීම් (දිවයින පුරා සිදුවූ) හෝ නැතහොත් නොවිසඳා ඉතිරිව පවතින විමර්ශන පිළිබඳව කටයුතු කිරීම සඳහා හතරවැනි විමර්ශන කොමිසම මෙය විය. මෙහි සියලුම සොයා ගැනීම් ඇතුළත් අවසන් වාර්තාවක් 2002 දී ප්‍රකාශයට පත් කරනු ලැබීය.[532] එකී කොමිසම්වල ප්‍රයත්නය ඵල එහිත නොවීමට නම්, වගවීම පිළිබඳ ප්‍රමුඛතම මූලධර්මයෙහි පැවැත්ම සහතික වීම පිණිස, අපයෝජනය පිළිබඳව සොයාබැලීම සහ අදාළ ගැටළු නිරාකරණය කිරීම සඳහා වන දේශපාලනමය අභිලාෂය පිලිබිඹු වන්නාවූ කොමිසම් ස්ථාපිත කළයුතු බව අතුරුදහන් වූවන් පිළිබඳ කොමිසම මගින් අවධාරණය කරන ලදි. ඒ සඳහා ඉහත කී කොමිසම් හතරෙහි නිර්දේශ වල සහාය ද ලබාගන්නා ලදී.

අදාළ නිලධාරීන්ගේ තත්ත්වය සහ තරාතිරම සැලකිල්ලට නොගනිමින්, ඔවුන්ට විරුද්ධව වහාම අධිකරණ ක්‍රියාමාර්ග ගතයුතු බවට ද කොමිසම විසින් නිර්දේශ කරන ලදි. එමෙන්ම මීට පෙර පැවති කොමිසම්වල නිර්දේශ මත 1997 වර්ෂයේ දී පොලිස් දෙපාර්තමේන්තුව තුළ ස්ථාපිත කරන ලද අතුරුදහන්වීම් විමර්ශන ඒකකය (Disappearance Investigation Unit) සහ අතුරුදහන් වූ පුද්ගලයන් පිළිබඳ ඒකකය (Missing Person Unit) ඇතුලුව 1998 දී නීතිපති දෙපාර්තමේන්තුව තුළ ස්ථාපිත කරනු ලැබූ අනෙකුත් විමර්ශන සහ නෛතික කාර්යයන් (නඩු පැවරීම්) පිළිබඳ යාන්ත්‍රණයන් හරහා කොමිසම විසින් හඳුනාගනු ලැබූ සිදුවීම් සම්බන්ධයෙන්

529 2005 පෙබරවාරි 8 දිනැති එක්සත් ජාතීන්ගේ E/CN.4/2005/102/Add.1 *Updated Set of Principles for the Protection and Promotion of Human Rights Through Action to Combat Impunity* නම් ලේඛනය විශේෂයෙන් බලන්න.

530 බලන්න 2005 දෙසැම්බර් 16 දිනැති එක්සත් ජාතීන්ගේ මහා මණ්ඩල රැස්වීමෙදි අනුගමනය කරනු ලැබූ Basic Principles and Guidelines on the Right to Remedy and Reparation of Gross Violations of International Human Rights Law and Serious Violations of International Humanitarian Law

531 1995.04.25 දින ප්‍රකාශයට පත් කරන ලද අංක 855/18, 855/19 සහ 855/20 දරන ගැසට් නිවේදන තුන බලන්න.

532 " Disappearance Commissions of Sri Lanka " - එහි වාර්තාවන් පිළිබඳ වාර්තා වැඩසටහන - සී.එම්. ඉක්බාල්

සඵලදායක ලෙස ඉදිරි පියවර ගැනීම සඳහා අවශ්‍ය මූල්‍යාධාර සහ සම්පත් ලබාදිය යුතු බවටද කොමිසමෙහි අවසන් වාර්තාව මගින් නිර්දේශ කරනු ලැබීය.

892. විශේෂයෙන් සහන සැලසීම සහ නැවත ගොඩනැගීම පිළිබඳ නිර්දේශ ඇතුළත් කරගනිමින් මීට පෙර පැවති කොමිසම් තුනෙහි නිර්දේශ නැවතත් තහවුරු කරන අතරතුර සියලුම කොමිසම් පමණ ඉක්මවා යන සහ කිසියම් අන්තවාදී ස්වභාවයක් ගන්නා වාතාවරණයන් පාලනය කිරීම සහ ජාතික සංහිදියාව ඇති කිරීම සඳහා අවශ්‍ය ආයතනික සහ නෛතික ප්‍රතිසංස්කරණ සම්බන්ධයෙන් අවධානය යොමු කළ බව සටහන් කිරීම අවශ්‍යය. කෙසේ වෙතත් පෙර පැවති කොමිසම් සමඟ මෙන්ම සමස්ත ලංකා කොමිසම විසින් ස්ථාපිත කරනු ලැබූ මතය වූයේ අතුරුදහන් වීම් සම්බන්ධයෙන් ප්‍රධානතම අපරාධකරු වන්නේ රාජ්‍ය අංශය සහ උප හමුදාවන් /යුධ පුහුණුව ලැබූ හමුදාවන් වන බවත්, එමෙන්ම රාජ්‍ය නොවන බොහෝ කණ්ඩායම් ද ඊට සම්බන්ධ වන බවත් ය. උදාහරණයක් වශයෙන් ගත්විට දමිළ ජනතාව අතර භීතිය පැතිරවීමත්, ඔවුන් පාලනය කිරීමත් සඳහා පැහැර ගැනීම් උපයෝගී කරගනු ලැබිණි. කොමිසම විසින් මෙම තත්ත්වය වටහා ගනු ලැබූ අතර, මානව හිමිකම් උල්ලංඝනය කරනු ලැබීම් සම්බන්ධයෙන් රාජ්‍ය නොවන සන්නද්ධ අංශයෙහි වගවීම ස්ථාපිත කිරීම සඳහා ජාත්‍යන්තර නීතිය යොදාගැනීමේ වැදගත්කම කොමසමෙහි අවසන් වාර්තාව මගින් ඉස්මතු කොට දක්වන ලදි.

(ආ) ජනවාර්ගික ප්‍රචණ්ඩත්වය පිළිබඳව ජනාධිපති සත්‍ය කොමිසම (2001)

893. 1981 සහ 1984 කාලය තුල (1983 ජනවාර්ගික ප්‍රචණ්ඩත්වය ද ඇතුළුව) හටගත් ප්‍රචණ්ඩත්වය පිළිබඳව විමර්ශනය කොට එහි බලපෑමට ලක්වූවන් හට වන්දි/හානි පූරණයන් ලබාදීම සඳහා 2001 වර්ෂයේ දී හිටපු අගවිනිසුරු ශර්වානන්ද මහතාගේ ප්‍රධානත්වයෙන් යුතුව, ජනවාර්ගික ප්‍රචණ්ඩත්වය පිළිබඳ ජනාධිපති සත්‍ය කොමසමක් ස්ථාපිත කරන ලදි. තිදෙනෙකුගෙන් සැදුම්ලත්, එම ශර්වානන්ද කොමිසම මගින් සිදුවීම් 900 කට අධික ප්‍රමාණයක් විමසා බැලූ අතර, වින්දිතයන් සඳහා අවම හානිපූරණයන්/වන්දි නිර්දේශ කිරන ලදි. එහි වාර්තාව 2004 වර්ෂයේ දී එළිදක්වනු ලැබූ අතර, ශර්වානන්ද කොමසම මගින් නිර්දේශ කළ වන්දි/හානිපූරන පිරිනැමීමක් සඳහා ජනාධිපති ලේකම් කාර්යාලයේ දී පැවති රැස්වීමක් සඳහා වන්දිහිමි පිරිස බොහෝ ප්‍රමාණයක් සහභාගී වූහ.

අප විසින් මෙම අවසන් වාර්තාවේ 111 වන කොටසෙහි 3 වන පරිච්ඡේදයෙහි හානි පූරණය සඳහා කාර්යාලය නම් නම් උප ශීර්ෂය යටතේ දක්වා ඇති පරිදි එම අවස්ථාව 1983 වාර්ගික කෝලහාලය සම්බන්ධයෙන් එවකට ශ්‍රී ලංකාවේ ජනාධිපතිවරයා විසින් ප්‍රකාශ කරනු ලැබූ පළමු සමාව අයදීමේ ප්‍රකාශය තුළින් ද සනිටුහන් කරනු ලැබිණි.

894. ශර්වානන්ද කොමිසම විසින් ජනවාර්ගික ප්‍රචණ්ඩත්වය (1981-1984 කාලය තුළ) පිළිබඳ ජනාධිපති සත්‍ය කොමිසමේ අභියාචනා විමසීම කරනු ලැබුවද එම කොමිසම හමුවට පැමිණ සිදුවූ දේ පිළිබඳව කරුණු ඉදිරිපත් කරනු ලැබුවේ වින්දිතයන් පමණක් බවද, කොමිසම හමුවට අදාළ අපරාධකරුවන් නොපැමිණි බව ද සටහන් කිරීමට වටිනා කරුණකි. එනම් වින්දිතයන් සහ අපරාධකරුවන් එක්ව ශර්වානන්ද කොමිසම වෙත නොපැමිණියහ.

895 එසේ වුවද ශ්‍රී ලංකාව තුළ සත්‍ය කොමිසමක් සකස් කිරීම පිළිබඳව අදහස පළමු වතාවට ශ්‍රී ලංකාව තුළ ස්ථාපිත කරනු ලැබුවේ ශර්වානන්ද කොමිසම විසින් බව සටහන් කළයුතුය. එහි කෙටි සහ තාවකාලික විධි නියෝගය (short & temporal mandate) හේතුවෙන් බොහෝ කල්ගත වූ සහ වෙහෙස ඇතිකරවන සුළු ජනවාර්ගික ගැටුමක් පිළිබඳව අවධානය යොමුකිරීමේ වැදගත් කම පිළිබඳව හඬ අවධි කිරීමට හැකියාව ලැබිණි.[533] 2009 මැයි මාසයේ දී එල්.ටී.ටී.ඊ.

533 ජනවාර්ගික අර්බුදය (1981- 1984) පිළිබඳ ජනාධිපති සත්‍ය කොමිසමෙහි වාර්තාව 2202 - 92 පිටුව බලන්න

සංවිධානය යටපත් කරනු ලැබීමට තුඩු දුන් සිදුවීම්වලට ආරම්භයේ දී ඉහත සඳහන් කරුණු සම්බන්ධයෙන් උපදේශනයක් / අනුශාසනය ලබාදිය හැකිව තිබූ අවස්ථාවේ දී පවා එය කිසිදා ඉස්මතු නොවීය.

896. Robert I Rotberg - සත්‍ය කොමිසම් සහ සත්‍ය පිළිබඳ විධිවිධාන, යුක්තිය සහ සංහිඳියාව නම් ඔහුගේ ප්‍රකාශනයේ පහත සඳහන් පරිදි සඳහන් කරයි.

"*අතීතයේ සිදුවූ බිහිසුණු ක්‍රියා වළක්වා ගැනීමටත්, පුද්ගලයන් සහ සමූහ වශයෙන් මුහුණදෙනු ලැබූ පීඩාකාරී සහ දිගු කාලීන බලපෑම් සහිත හානි/පීඩාවන්ගෙන් මිදීමට නම්, එවැනි සාහසික අතීතයන් සමඟ කිසියම් එකඟතාවයකට පැමිණීම සඳහා අතීතයේ දී සිදුවූයේ කුමක්ද සහ එසේ සිදුවූයේ මන්ද යන්න එම සමාජයේ සාමාජිකයන් විසින් හැකි තරම් ගැඹුරින් තේරුම් ගත යුතුය." "කවුරුන් විසින් කුමක් කරනු ලැබුවේ ද? එසේ කලේ කාටද? එසේ නම් වී ඒ ඇයි? කාගේ අණ යටතේ ද? " යන්න ඔවුන් විසින් සංක්ෂිප්ත වශයෙන් හෝ සොයාගත යුතුය. අවම වශයෙන් ඔවුන් ඒ දක්වා සිදුවූ දේ සත්‍ය ලෙස දැන ගැනීමට හෝ උත්සාහ කළයුතුය.*[534]

897. 2022 පෙබරවාරි මස අපගේ අතුරු වාර්තාවෙන් සහ 2023 පෙරවාරි මස එහි අවසන් නිර්දේශ පිළිබඳ සාරාංශය මගින් ඉහත සඳහන් කළ විශ්වාසනීය සත්‍ය ගවේෂණ යාන්ත්‍රණය අප විසින් ද නිර්දේශ කළ විට[535] එය ඒ දක්වා දිගු කාලයක් තිස්සේ අපගේ මනස් තුළ පැවති ප්‍රමුඛතාවයක් විය. අප විසින් ලබාගත් අතිවිශාල ස්ථිර සාර සාක්ෂි ප්‍රමාණය ද අතුරු වාර්තාවෙහි එම නිර්දේශය ස්ථිර කිරීමට ඉවහල් විය.

898. අප ඉහතින් සටහන් කර ඇති පරිදි අපගේ මෙම දිවයින තුළ මෙවැනි අතිරික්තයක් බදු කොමිසම් ගණනාවක් ක්‍රියාත්මක කොට ඇති අතර, මෙම කොමිෂම ඉදිරියේ සාක්ෂි ලබා දුන් බොහෝ පිරිස ඒවාට ඉදිරිපත් වීමෙන් කිසිදු ඵලක් ප්‍රයෝජනයක් ලබන්නට නොහැකි වීම පිළිබඳව තම කණගාටුව ප්‍රකාශ කළහ.

899. අප විසින් එක්රැස් කරගන්නා ලද සාක්ෂි සත්‍ය ගවේෂණය කිරීම පිළිබඳ යාන්ත්‍රණය සහ සංහිඳියාවෙහි බලපෑම පිළිබඳ වෙනත් වැදගත් කරුණු සම්බන්ධයෙන් අප විසින් අවසන් වශයෙන් සිදුකරනු ලබන නිර්දේශ සඳහා අවශ්‍ය සහ අදාළ වන සාධකයකි. අප විසින් එම කාර්යය භාරගැනීමට පෙරාතුව, මෑතක පවත්වන ලද කොමිසම් කිහිපයක් පිළිබඳව සාකච්ඡා කොට බැලීම වටී.

(ඇ) උදලාගම කොමිසම (2006)

900. 2005 අගෝස්තු මාසයේ දී ආරම්භ වී සිදුයෙන් ඉහළ ගිය ගැටුම්කාරී වාතාවරණය තුළ සිදුවූ බරපතල ගනයේ මානව හිමිකම් උල්ලංඝනය වීමේ සිදුවීම් පිළිබඳව විමර්ශනය කිරීම සඳහා 2006 නොවැම්බර් මස දී එවකට ශ්‍රී ලංකාවේ ජනාධිපතිවරයා විසින් විමර්ශන කොමිසන් සභාවක් පත් කරන ලදි. විනිසුරු උදලාගම මහතාගේ ප්‍රධානත්වයෙන් ක්‍රියාත්මක වූ මෙම කොමිසම පැවරුණු කාර්යභාරය වූයේ එවකට සිටි විදේශ කටයුතු පිළිබඳ අමාත්‍යවරයා ඝාතනය කිරීම, 2006 ජනවාරි 06 වන දින දී ත්‍රිකුණාමලයේ දී තරුණයක් 05 දෙනෙකු ඝාතනය කිරීම (Trinco 5) 2006 අගෝස්තු මාසයේ දී Action Contra la faim (ACF) නම් සංවිධානයෙන් ආධාර සේවකයන් 17 දෙනෙකු ඝාතනය කිරීම සහ උතුරු නැගෙනහිර සාමාන්‍ය වැසියන් වෙත එල්ල කරන ලද ප්‍රහාර කිහිපයක් ඇතුළු ප්‍රචණ්ඩකාරී සිදුවීම් 15 ක් සම්බන්ධයෙන් විමර්ශන සිදු කිරීම

534 බලන්න - Truth v Justice : Morality of Truth Commissions, 1 වන පරිච්ඡේදය (සංස්කරණය කරන ලද්දේ - Robert. 1. Rotberg and Dennis F. Thompson)

535 දෙවෙනි අතුරු වාර්තාව සහ සංක්ෂිප්තය පිළිබඳ සඳහනක් සහ 12 වෙනි පරිච්ඡේදයේ දී ඇති ශ්‍රී ලංකා රජය එයට දැක්වූ ප්‍රතිචාරය බලන්න.

ය.[536] මාස කිහිපයකට පසුව මෙම කොමිසමෙහි කාර්යයන් නිරීක්ෂණය කිරීම සඳහා විදේශීය විශේෂඥයින්ගෙන් සැදුම්ලත් ස්වාධීන කණ්ඩායමක් (an international group of Eminent persons - IIGEP) පත් කරන ලදි. මෙම ජනාධිපති විමර්ශන කොමිසම ඉහත කී විදේශීය විශේෂඥයන්ගේ කණ්ඩායම සහ (UC) උදලාගම කොමිසම අතර දක්නට ලැබුණු සුවිශේෂී වෙනස්කම් සම්බන්ධයෙන් අවධානය යොමුකොට ඇත. අවසානයේ දී අසාර්ථක තත්ත්වයකට පත්වූ, තවත් එක් කරුණු සොයා බලනු ලබන කොමිසමක් සහ ජාත්‍යන්තර නිරීක්ෂකයන් අතර මෙම සුවිශේෂී සම්බන්ධතාවය මගින් ඉස්මතු කරනු ලබන කරුණකි. එනම් විමර්ශන යාන්ත්‍රණයකදී ඊට ප්‍රවීණයන් සහ උපදේශකයන් සහභාගී කරගැනීමේදී ඒ සඳහා පැහැදිලිව නිර්වචනය කරනු ලැබුවා වූද, නිශ්චිතවම දක්වා ඇත්තාවූ ද රීතියක් ඇතුළත් වියයුතු බවය. මෙම ජනාධිපති විමර්ශන කොමිසම විසින් මෙම අවසන් වාර්තාවේ 145 ඡේදයේ සටහන් කොට ඇති පරිදි, නිගමනය කරනු ලබන්නේ සත්‍ය සහ සංහිඳියා කොමිසමට විමර්ශන කටයුතු පවරනු ලැබිය යුතු බවත්, එබැවින් ප්‍රවීණයන් සහ නිරීක්ෂකයන් කිසිදු ආකාරයකින් එවැනි විමර්ශන කටයුතු සඳහා සම්බන්ධ නොවිය යුතු බවත් ය. ව්‍යවස්ථාපිතව ඔවුන්ගේ කාර්යභාරය නෛතික සහ තාක්ෂණික කරුණු සම්බන්ධයෙන් උපදෙස් දීම සඳහා පමණක් සීමා කළයුතු අතර, එම ව්‍යවස්ථාපිත අවශ්‍යතාවය පිළිබඳව ප්‍රවීණයන් ද දැනුම්වත් වන ආකාරයෙන් ඒ බව අදාළ ගිවිසුම් තුළ විශේෂයෙන් සඳහන් කොට සංක්ෂිප්තව දැක්විය යුතුය. විමර්ශන පැවැත්වීමේ දී උදලාගම කොමිසම සහ විශේෂඥ පුද්ගලයන්ගේ ජාත්‍යන්තර කණ්ඩායම සහ උදලාගම කොමිසම මුහුණ දුන් දුෂ්කරතා ඉවත් කරගැනීමට එය ඉවහල් වනු ඇත.

901. "Trinco Five" සහ "Action Contra la faim (ACF) සංකේතාත්මක සිද්ධීන් සම්බන්ධයෙන් උදලාගම කොමිසම විසින් සිදුකරන ලද විමර්ශන සඳහා මෙම ජනාධිපති කොමිසමෙහි දැඩි අවධානය යොමු වී ඇත. උගත් පාඩම් හා ප්‍රතිසන්ධාන කොමිසම(LLRC) මෙන්ම පරණගම කොමිසම යන කොමිසම් දෙකම ඉහත කී "Trinco Five" සිදුවීම සහ Action Contra la faim (ACF) සිදුවීම නැවත විමර්ශනය කළයුතු බවට නිර්දේශ කොට ඇත. මහේස්ත්‍රාත් උසාවිය තුළ මෙම නඩු සම්බන්ධ අධිකරණ විමර්ශන කටයුතු සතුටුදායක ලෙස සිදු වී නොමැති අතර, "වරදට දඬුවම් හිමි නොවීම" පිළිබඳ ගැටළුව නිදැල්ලේ පවතී.

මෙම සිදුවීම් දෙකම සම්බන්ධයෙන් ජනාධිපති විමර්ශන කොමිසම විසින් මෙම අවසන් වාර්තාවේ III වන පරිච්ඡේදය මගින් අවධානය යොමුකොට ඇත. එකී උපහැරණාත්මක/නිදර්ශනාත්මක සිදුවීම් දෙක සම්බන්ධයෙන් අපක්ෂපාති සහ දැඩි අවධානයකින් යුතු විමර්ශනයක් පැවැත්වීමේ අවශ්‍යතාවය විශේෂයෙන් ඉස්මතු කොට ඇත. එනම් මෙම සිදුවීම් දෙක හරහා ඉටුනොවූ යුක්තිය ඉටු කිරීම සඳහා එමගින් හැකියාව ලැබෙන බැවිනි.

902. වරදට දඬුවම් නොලබා සිටීම පිළිබඳව චෝදනාව ඉහත සිදුවීම සම්බන්ධයෙන් අඛණ්ඩව ඉස්මතු වී ඇති ආකාරය අප විසින් දක්වා ඇති අතර, මෙම චෝදනාව බැහැර කිරීම කළ හැකි වනුයේ උදලාගම කොමිසමෙහි දී සිදුවූවා මෙන් විදේශීය සාක්ෂි ලබාගැනීමට පහසුකම් නොතිබීම වැනි කිසිදු බාහිර සාධක වලින් බලපෑමට ලක්නොවන ආකාරයේ විමර්ශනයකින්ම පමණක් වන අතර, ඉහත කී පරිදි වරදට දඬුවම් නොලබා නිදැල්ලේ සිටීමට හේතු වන තත්ත්වයන් පැවතීම නිසා කිසියම් කොමිසමක සත්‍ය සොයාගැනීම සඳහා වූ සත්‍ය සෙවීමේ මෙහෙවරෙහි පැවතිය යුතු ස්වාධීනතම හා විශ්වාසනීය යන ලක්ෂණ අහිමි වී යා හැකිය.

2023 අංක 10 දරණ අපරාධයක චින්දිතයන් සහ සාක්ෂිකරුවන් හට සහයදීමේ සහ ආරක්ෂා කිරීමේ පනත නිසි ස්ථානයේ තබා ඇති අතර, යෝජිත සත්‍ය ගවේෂණය කිරීමේ යාන්ත්‍රණයට

536 මෙම සිද්ධීන් පිළිබඳ සාකච්ඡාවක් සඳහා II වෙනි කොටසේ 3 වෙනි පරිච්ඡේදයේ 594 වෙනි ඡේදය බලන්න

ඉහත නිදර්ශනාත්මක/උපැහැරණාත්මක සිදුවීම සම්බන්ධයෙන් සාධාරණය ඉටුකිරීම සඳහා විදේශවල සාක්ෂි පවා ලබාගනිමින් තම විමර්ශන ඉතා පහසුවෙන් ශක්තිමත්ව පවත්වාගෙන යාහැකිය. මෙහිදී, අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන් හට සහය දීම සහ ආරක්ෂා කිරීම සඳහා වන ජාතික අධිකාරිය සත්‍ය ගවේෂණය කිරීමේ යාන්ත්‍රණයට සහය ලබා දෙනු ඇත. සාක්ෂිකරුවන් ආරක්ෂා කර ගැනීම සඳහා වන ශක්තිමත් වැඩසටහනක් හෝ ඒකකයක් ඇති විට පමණක් සත්‍ය ගවේෂණය කිරීම සඳහා වූ එකඳු කොමිසමක් හෝ ජාත්‍යන්තර ප්‍රමිතීන් හා මුසුවීමට හැකිදැයි නිරීක්ෂණය කිරීමට විමර්ශනය පිළිබඳ ජනාධිපති කොමිසම අපේක්ෂා කරයි.

<u>උගත් පාඩම් හා ප්‍රතිසන්ධාන කොමිසම (2010) (LLRC)</u>

903. ශ්‍රී ලංකාවේ ජනාධිපතිවරයා විසින් පත්කරන ලද සාමාජිකයන් අට දෙනෙකුගෙන් සැදුම්ලත්

උගත් පාඩම් හා ප්‍රතිසන්ධාන කොමිසම සත්‍ය ගවේෂණය සඳහා දැරූ තවත් ප්‍රයත්නයක් වූ අතර, එමගින් පහත කාර්යයන් ඉටුකරගැනීමට අපෙක්ෂා කරන ලදි.

2002 පෙබරවාරි සිට 2002 මැයි දක්වා කාලය තුළ සිදුවූ සිදුවීම් වලින් උගත හැකි පාඩම් සහ එම සිදුවීම්වල ප්‍රතිඵලයක් වශයෙන් සිදුවන දේ පිළිබඳ වාර්තා කිරීම සහ එවැනි තත්ත්වයක් නැවත හට නොගන්නා බවට සහතික වීම සඳහා නිර්දේශ ලබාදීම.

904. අප දැනටමත් මෙහි විධි නියෝගය තුළද මෙම අවසාන වාර්තාවේ ආරම්භක පරිච්ඡේද තුළද අපගේ නිරීක්ෂණ දක්වා ඇත. ජාතික ක්‍රියාකාරී සැලැස්ම හා අන්තර් ආයතන උපදේශක කමිටුව මගින් එහි නිර්දේශ ක්‍රියාත්මක කිරීමද අප විසින් එහි නිර්දේශ කිහිපයක් පිළිබඳව සැලකිල්ලට ගෙන ඒ පිළිබඳව විශ්වසනීය සහ අව්‍යාජ සාරාංශයක් මෙම වාර්තාවේ 2 වන ඇමුණුමට යාකොට ඇත. එකම කරුණු නැවත නැවත ප්‍රතිරාවය කිරීමක් වශයෙන් පෙනුන ද මෙම අවසාන නිරීක්ෂණ තුළින්ද අපඋගත් පාඩම් හා ප්‍රතිසන්ධාන කොමිෂන් සභාවකොමිසමෙහි සිත්ගන්නා සුළු සොයාගැනීම් කිහිපයක් අවධානයට හසුකර ගැනීමට ප්‍රයත්න දරමු.

උගත් පාඩම් හා ප්‍රතිසන්ධාන කොමිෂන් සභාව ඉදිරියට පැමිණි සාක්ෂිකරුවන් කිහිපදෙනෙකුගේම සාක්ෂි වලට සවන්දීමෙන් පසුඋගත් පාඩම් හා ප්‍රතිසන්ධාන කොමිෂන් සභාවවාර්තාව එහි පෙරවදන පහත සඳහන් සිත්ගන්නා සුළු පෙරවදනින් ආරම්භ කොට ඇත.

"සමාජයෙහි සෑම අස්සක් මුල්ලකින් මෙන්ම සමාජයේ සියලුම ස්ථර වලින් ආ මෙම අදහස් වලට සවන් දීමෙන් පසු, පැහැදිලිව පෙනෙන අවිනිශ්චිතා මධ්‍යයේ වුවද කොමිසම සුභවාදී අදහසක් බෙදාහදා ගැනීමට උත්සුක වේ. කෙසේ වෙතත්, බහු වාර්ගික පරිසරයක් සහිත ජාතියක් වශයෙන් තමා සමගත් ප්‍රජාතාන්ත්‍රික ශ්‍රී ලංකාව වශයෙනුත් සාමකාමී තත්වයෙන් පසුවන අතරතුර ඉහත කී අපෙක්ෂාවන් මුදුන්පත් කරගැනීමට නම් කොමිසමෙහි නිර්දේශ සද්භාවයෙන් යුතුව ඉටුකිරීම සඳහා ශ්‍රී ලංකා රජය මෙන්ම දේශපාලනික නායකයින් ද අවංක උත්සාහයක් සහ ප්‍රායෝගික අභිලාෂයකින් යුතුව කටයුතු කළ යුතුයි.

කොමිසම විසින් මිනිසුන් වෙතින් අසනු ලැබූ දෑවලට අනුව එහි ස්ථාවර මතය වනුයේ දේශපාලනික නායකයින් මැදිහත්කාරී, ඉවසන සුළු සහ සියල්ලන්ම ඇතුළත් කරගනු ලබන්නාවූ අධ්‍යාශයකින් යුතුව කටයුතු කිරීම සඳහා නායකත්වය ගන්නා තෙක් පුරවැසියන් ජාතික යහපත, ජාතික සංහිඳියාව, සියලු පුරවැසියන් සඳහා සාමානාත්මතාවය ඉටුකිරීම සඳහා වන ඒකමතික ප්‍රවේශ සඳහා සහයෝගය ලබාදීමට සූදානම් බවයි.

905. තවදුරටත් මෙම පණිවුඩය මගින්උගත් පාඩම් හා ප්‍රතිසන්ධාන කොමිෂන් සභාවකොමිසම පහත සඳහන් කරුණු ප්‍රකාශ කරනු ලබයි.

එබැවින් මෙම නිර්දේශ බලාත්මක කරන මෙන් සහ මෙහි නිර්දේශ සහ ඒවා ක්‍රියාත්මක කිරීම පිළිබඳව මහජනයා දැනුම්වත් කරන මෙන් කොමිසම දිරිගන්වයි. එවැනි ක්‍රියාවලියක් සියලුම ජාතීන්ට සාමයෙන් සහ සමගියෙන් ජීවත්වීමට සහ නැවතත් ත්‍රස්තවාදයේ සහ ප්‍රචණ්ඩත්වයේ අවලස්සන හිස එසවීම සඳහා අවකාශයක් නොමැති බව තහවුරු කරගැනීම සඳහා උපකාරී වේ.

906. සංක්‍රාන්ති යුක්තිය පිළිබඳව අදහස් වල සංකලනයක් ප්‍රධානතම වශයෙන්මඋගත් පාඩම් හා ප්‍රතිසන්ධාන කොමිෂන් සභාවකොමිසම් වාර්තාවට ඇතුළත් වූ බව මෙම අවසන් වාර්තාව මගින් අප දැනටමත් නිරීක්ෂණය කොට ඇත. එහි පූර්විකා ඡේදයෙහි සඳහන් කර ඇති පරිදි නැවත කිසිදිනෙක ශ්‍රී ලංකාවට ත්‍රස්තවාදය සමඟ එකඟ වීමට සිදුනොවිය යුතුය යන අදහස අවධාරණය කිරීමට ප්‍රයත්න දරා ඇති බව කිසිවෙකුට බැහැර කළ නොහැක. වෙනත් වචනවලින් පවසන්නේ නම්,උගත් පාඩම් හා ප්‍රතිසන්ධාන කොමිෂන් සභාවහි ගැබ්ව ඇති පණිවුඩය වන්නේ, ත්‍රස්තවාදී හා ප්‍රචණ්ඩකාරී ක්‍රියා නැවත නැවතත් සිදු නොවිය යුතු බවය.

සියලු පාර්ශවයන් විසින් යුද්ධ සමය තුළ සිදුකරන ලද වැරදි ක්‍රියාවන් පිළිබඳව සාක්ෂි ලද වහාම ඒවා විමර්ශනය කිරීම, මානව හිමිකම් සහ මානුෂීය නීති කඩකරන්නන් පිළිබඳ චෝදනා ලද සියලු පාර්ශවයන්ට විරුද්ධව නඩු පැවරීමඋගත් පාඩම් හා ප්‍රතිසන්ධාන කොමිෂන් සභාවවාර්තාව මගින් දිරිමත් කරනු ලබයි.[537]

908. ජාත්‍යන්තර මානුෂීය නීති (IHL) උල්ලංඝනය කිරීම සම්බන්ධයෙන් උගත් පාඩම් හා ප්‍රතිසන්ධාන කොමිසමෙහි නිර්දේශ සහ වගවීම වැඩි වර්ධනය කිරීම සඳහා එමගින් නිර්දේශ කරන ලද ක්‍රමවේද පිළිබඳව මෙම අවසන් වාර්තාවේ 390 ඡේදය මගින් විශේෂයෙන් දක්වා ඇත. උගත් පාඩම් හා ප්‍රතිසන්ධාන කොමිසම මෙන්ම පරණගම කොමිසම මගින් ද නැවත නැවතත් ප්‍රකාශ කර ඇත්තේ සාමාන්‍ය වැසියන් ඝාතනය[538], ශ්‍රී ලංකා යුද්ධ හමුදාවට හාරවූවන් ද ඇතුලුව පුද්ගල අතුරුදහන්වීම් සහ සුදු වෑන් රථවලින් පැමිණ කළ පැහැරගැනීම් සම්බන්ධයෙන් විමර්ශනය කිරීම ශ්‍රී ලංකා රජයෙහි පාර්ශවයෙන් වගකීමක් වන බවයි.[539] මෙවැනි සිදුවීම් කිහිපයක් සම්බන්ධයෙන් අප මෙහි II වන කොටසෙහි 3 වන පරිච්ඡේදය මගින් දක්වා ඇත. විමසා බැලීමේ පහසුව සඳහා ‘‘සුදු වෑන් රථවලින් පැමිණ පැහැර ගැනීමේ සිදුවීම ’’ මෙහි ඇමුණුම 2 හි දක්වා ඇත.

උගත් පාඩම් හා ප්‍රතිසන්ධාන කොමිසම (LLRC) මෙන්ම පරණගම කොමිසම විසින් ද, බරපතල ගනයේ අපරාධ පිළිබඳ චෝදනා සම්බන්ධයෙන් විමර්ශනය කිරීම හා නඩු පැවරීම සම්බන්ධයෙන් වූ මීට පෙර ක්‍රියාත්මක වූ විමර්ශන කොමිසම්වල නිර්දේශ ක්‍රියාත්මක කරන ලෙස රජයට දැඩිලෙස අවධාරණය කිරීම පිළිබඳව අප දැනටමත් මෙහි දක්වා ඇත. එය 2005 අප්‍රේල් සිට හිස එසවූ බරපතල ඝනයේ මානව හිමිකම් උල්ලංඝනය කිරීම් පිළිබඳ විමර්ශනය කිරීම සඳහා 2005 දී පත් කරනු ලැබූ කොමිසම (උදලාගම කොමිසම) සඳහා ආශ්‍රිත මූලාශ්‍රයක් වූ අතර, 2006 වසරේ දී ත්‍රිකුණාමලයේදී තරුණයන් පස් දෙනෙකු ඝාතනය කිරීම (“Trinco Five”) සහ 2006 අගෝස්තු මස ACF හි ආධාර සේවකයන් 17 දෙනෙකු ඝාතනය සම්බන්ධයෙන් උදලාගම කොමිසමෙහි අසාර්ථක විමර්ශනයන්, උගත් පාඩම් හා ප්‍රතිසන්ධාන කොමිසමෙහි නිර්දේශයන් ලබාදීමේ දී කේන්ද්‍රීය අදියර බවට පත්වී තිබේ. එවැනි පියවර ගැනීම් සුවපත් වීමේ ක්‍රියාවලියට එක් අතකින් බලපානු ලබන නීතියේ ආධිපත්‍යයට ගරු කරනු ලැබීම තහවුරු කිරීම

---

537 සුදු වෑන් රථවලින් පැමිණ පැහැර ගැනීම සම්බන්ධයෙන් LLRC වාර්තාවෙහි 5.27, 5.70 සහ 5.72 ඡේද බලන්න ; එසේම මෙම අවසන් වාර්තාවේ ඇමුණුම 2 යටතේ මානව හිමිකම් යටතේ දැක්වෙන වගුව බලන්න.

538 LLRC වාර්තාවෙහි 9.5, 9.9,9.23, සහ 9.37 අ ඡේද බලන්න.

539 සුදු වෑන් රථවලින් පැමිණ පැහැර ගැනීම සම්බන්ධයෙන් LLRC වාර්තාවෙහි 5.27, 5.70 සහ 5.72 ඡේද බලන්න ; එසේම මෙම අවසන් වාර්තාවේ ඇමුණුම 2 යටතේ මානව හිමිකම් යටතේ දැක්වෙන වගුව බලන්න.

සම්බන්ධයෙන් ශක්තිමත් ඉගියක් දක්වනු ඇති බවඋගත් පාඩම් හා ප්‍රතිසන්ධාන කොමිෂන් සභාවකොමිසම ප්‍රශසංසාත්මකව සටහන් කොට ඇත.[540]

909 හිටපු මහාධිකරණ විනිසුරු මැකැස්වල් පරණගම මහතාගේ ප්‍රධානත්වයෙන් ක්‍රියාත්මක වූ ජනාධිපති විමර්ශන කොමිසම පිළිබඳව අවධානය යොමුකිරීම ද වැදගත් වේ. එහිදී ඔහුට එම විමර්ශනයන් සඳහා විධිනියෝග 2 ක් ලැබුණු අතර, ඉන් පළමුවැන්න මගින් යුද්ධ කාලයේ දී උතුරු සහ නැගෙනහිර පළාත් වලින් අතුරුදහන් වූ තරුණයන් පිළිබඳව සිදුවීම් සම්බන්ධයෙන් විමසා බැලීම සඳහා වූ අතර, 2014 ජූලි මස දී ඉහත 2 වන විධිනියෝගය මගින් ප්‍රකාශකරනු ලැබුයේ 2009 මැයි මස අවසන් වූ ගැටුම්කාරී වාතාවරණය තුළ සාමාන්‍ය වැසියන්ගේ ජීවිත අහිමිවීම් පිළිබඳව කරුණු සම්බන්ධයෙන් මෙන්ම ජාත්‍යන්තර මානුෂීය නීති කඩකිරීම් සම්බන්ධයෙන් කිසියම් පුද්ගලයෙකු සමූහයක් හෝ ආයතනයක් විසින් දැරිය යුතු වගකීම පිළිබඳව ප්‍රශ්ණය කොමිසම විසින් වැඩිදුරටත් විමර්ශනය කළයුතු බවය.

910. මෙම අවසන් වාර්තාවේ 2 වන පරිච්ඡේදය තුළින් මෙම ජනාධිපති විමර්ශන කොමිසම, උදලාගම කොමිසම,උගත් පාඩම් සහ ප්‍රතිසන්ධාන කොමිසම සහ පරණගම කොමිසමෙහි සිය නියෝග (Mandates) පිළිබඳව දීර්ඝ වශයෙන් සාකච්ඡා කොට ඇත. එමෙන්ම මෙහි 3 වන පරිච්ඡේදය මගින් යෝජිත සත්‍ය ගවේෂණය කිරීමේ යාන්ත්‍රණය තුළින් විමර්ශනය කිරීම සඳහා ප්‍රමුඛත්වය ලබාදියයුතු ජාත්‍යන්තර මානුෂීය නීති හා සබැඳි ගැටළු සහ අපරාධ සම්බන්ධයෙන් සාකච්ඡා කරනු ලබයි.

මෙහි 9 වන පරිච්ඡේදයෙහි දක්වා ඇතිඋගත් පාඩම් හා ප්‍රතිසන්ධාන කොමිෂන් සභාවහි මූලික නිරීක්ෂණ සහ නිර්දේශ, භාවිතයේ පහසුව පිණිස මෙහි ඇමුණුම 2 හි සාරාංශ කොට දක්වා ඇති පරණගම කොමිසමෙහි සොයාගැනීම් සහ නිර්දේශ සාරාංශ කොට ඇමුණුම 3 සහ 4 දක්වා ඇත.

911. ජාත්‍යන්තර ප්‍රජාවගේ අවධානය නිරන්තරයෙන්ම මෙම නිර්දේශ වලට යොමුව තිබූ අතර, මීට පෙර ක්‍රියාත්මක වූ එම දේශීය විමර්ශන කොමිසම්වල නිර්දේශ විශ්වාසනීය ආකාරයෙන් ක්‍රියාත්මක කොට අනුගමනය කරනු නොලැබුවේ යැයි අපට පැවසිය නොහැක.

3. ශ්‍රී ලංකාව සම්බන්ධයෙන් එක්සත් ජාතීන්ගේ සංවිධානයෙහි මානය හිමිකම් කවුන්සිලයෙහි යෝජනාව.

912. 2008 වසරේ දී ශ්‍රී ලංකාව එක්සත් ජාතීන්ගේ සංවිධානයෙහි මානව හිමිකම් කවුන්සිලයෙහි සාමාජිකත්වය ලබාගත් අතර[541], එහි 2009 වර්ෂයේ සැසිවාරය ආරම්භ වීමට පෙර ශ්‍රී ලංකාව එක්සත් ජාතීන්ගේ සංවිධානයෙහි මහලේකම් සමඟ හවුල් නිල නිවේදනයක් නිකුත් කළ අතර, එයින් මානව හිමිකම් ආරක්ෂා කිරීම සහ ප්‍රවර්ධනය කිරීම, මානව හිමිකම් පිළිබඳව බැඳී සිටීමට සහ ඒ පිළිබඳ ජාත්‍යන්තර මට්ටම හා සමඟ සම්බන්ධ වීමට ශ්‍රී ලංකාව සතු කැමැත්ත විශේෂයෙන් ඉස්මතු කරන ලදි.[542]

913. එක්සත් ජාතීන්ගේ සංවිධානයෙහි මහලේකම් වරයා විසින් වගවීම පිළිබඳව යාන්ත්‍රණයක් පැවතීමේ අවශ්‍යතාවය ප්‍රකාශ කරන ලද අතර, රජය විසින් එකී දුක්ගැනවිලි විසඳීම සඳහා පියවර

---

540 LLRC වාර්තාව, 5.163 ඡේදය

541 එක්සත් ජාතීන්ගේ

542 එක්සත් ජාතීන්ගේ මහ ලේකම්. එක්සත් ජාතීන්ගේ මහලෙකම් සහ ශ්‍රී ලංකා රජය විසින් සිදුකළ හවුල් ප්‍රකාශයෙහි අන්තර්ජාල සබැඳිය : < http://www.un.org/press/en/2009/sg2151.doc.htm>අවසන් වරට පිවිසියේ 2023 දෙසැම්බර් 22.

ගත්බවට ප්‍රකාශ කළහැකිය.[543] ඉහත කී හවුල් නිල නිවේදනය සහ PEO ඊට පසුව උගත්පාඩම් සහ ප්‍රතිසන්ධාන කොමිසම පත්කිරීම සම්බන්ධයෙන් දැනටමත් මෙම අවසන් වාර්තාවේ 1 වන පරිච්ඡේදයෙහි දක්වා ඇත.[544]

914. අප විසින් පෙන්වා ඇති පරිදි, ඉහත කී හවුල් නිල නිවේදනයේ 2009 මැයි 27 දිනැති අංක S - 11/1 දරණ ශ්‍රී ලංකාවේ එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් පිළිබඳ කවුන්සිලයෙහි සම අනුග්‍රාහක යෝජනාව මගින් නැවත තහවුරු කරන ලදි.[545] ඉහත කී සම අනුග්‍රාහක යෝජනාවේ සිට 2011 නොවැම්බර් 11 වන දින උගත් පාඩම් සහ ප්‍රතිසන්ධාන කොමිසමෙහි වාර්තාව ඉදිරිපත් කිරීම දක්වා කාලය තුළ දී ශ්‍රී ලංකාවට එරෙහිව යෝජනාවක් නොවූ බව සටහන් කළ යුතුය.

<u>HRC/Res/19/2 යෝජනාව - ශ්‍රී ලංකාව තුළ සංහිදියාව සහ වගවීම ප්‍රවර්ධනය කිරීම[546]</u>

915. කෙසේ වෙතත් මීට පෙර ක්‍රියාත්මක වූ කොමිසම්හි නිර්දේශ, විශේෂයෙන්ම උගත් පාඩම් සහ ප්‍රතිසන්ධාන කොමිසමෙහි නිර්දේශ ක්‍රියාත්මක නොකිරීම පිළිබඳ සැක සංකාවන් සීඝ්‍රයෙන් වර්ධනය වූ අතර, ශ්‍රී ලංකාව සංහිදියාව සහ වගවීම ප්‍රවර්ධනය කිරීම සඳහා හිමිකම් සහිතව 2012 සකස් කරන ලද එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් පිළිබඳ කවුන්සිලයෙහි A/HRC/Res/19/2 දරණ යෝජනාව මගින් උගත් පාඩම් සහ ප්‍රතිසන්ධාන කොමිසමෙහි නිර්දේශ ක්‍රියාත්මක කිරීම සඳහා ශ්‍රී ලංකා රජයට නියම කරන ලදි. එසේම ඉහත කොමිසමෙහි නිර්දේශ පූර්ණ වශයෙන් ක්‍රියාත්ම කිරීම සඳහා එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් පිළිබඳ කවුන්සිලයෙහි සහය මෙන්ම එහි සාමාජික රටවල සහය සහ වෙනත් ක්‍රියාකාරීන්ගේ සහය ලබාදීම සඳහා එම යෝජනාව මගින් ඉඩසලසන ලදි.

එම යෝජනාවෙහි ඇතුලත් ඇතැම් කැපී පෙනෙන ඡේද පසුව දැක්වීම වටී.

උගත් පාඩම් සහ ප්‍රතිසන්ධාන කොමිසමෙහි වාර්තාව එහි සොයාගැනීම් සහ නිර්දේශ සහ ශ්‍රී ලංකාවේ ජාතික සංහිදියාවට එයින් ලබාගත හැකි දායකත්වය සැලකිල්ලට ගෙන [547] අධිකරණ බාහ්‍ය / අධිකරණ බලතලවලින් ඔබ්බට ගමන් කරන (Extra Judicial) ඝාතන සහ බලහත්කාර පැහැර ගැනීම් පිළිබඳව පැතිර පවත්නා චෝදනා ද විශ්වසනීය ලෙස විමර්ශනය කිරීම සඳහා ඇතුළුව උගත් පාඩම් සහ ප්‍රතිසන්ධාන කොමිසම් වාර්තාවේ ඇතුළත් ඵලදායක නිර්දේශ පිළිගනිමු.

ජාත්‍යන්තර නීති උල්ලංඝනය කිරීම් පිළිබඳව මෙම වාර්තාව මගින් ප්‍රමාණවත් පරිදි අවධානය යොමුකොට නොමැති බව සැලකිල්ලෙන් යුතුව සටහන් කරමු.[548]

1. උගත් පාඩම් සහ ප්‍රතිසන්ධාන කොමිසම් වාර්තාවට ඇතුළත් ප්‍රයෝජනවත් නිර්දේශ ක්‍රියාත්මක කරන ලෙසත් සියලු ශ්‍රී ලාංකිකයන් සඳහා සාධාරණත්වය, සමානාත්මතාවය, වගවීම සහ සංහිදියාව සහතික කිරීම පිණිස විශ්වසනීය සහ ස්වාධීන ක්‍රියාමාර්ග ගැනීම

543 එම

544 *මෙම අවසාන වාර්තාවේ 16, 19 සහ 90 ඡේද බලන්න.*

545 *එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කොමිසමෙහි යෝජනාව සඳහා යොමු කරනු ලැබූ මෙම අවසාන වාර්තාවේ 17 සහ 376 ඡේද බලන්න.*

546 ශ්‍රී ලංකාව තුළ සංහිදියාව සහ වගවීම ප්‍රවර්ධනය කරනු ලබන එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කොමිසමෙහි 19/ 2 යෝජනාව - *https://documents-ddsny.un.org/doc/RESOLUTION/LTD/G12/115/97.pdf ? Open Element*

547 *පූර්විකා ඡේදය 4 – Op. cit. Res.*

548 *පූර්විකා ඡේදය 6 – Op. cit. Res.*

සඳහා අදාළ වන නෛතික බැඳීම් සහ වගකීම් ඉටුකිරීමේදී අවශ්‍ය වන අනෙකුත් සියලු අමතර පියවර ගන්නා ලෙස ශ්‍රී ලංකා රජයට වගකීම පවරමු.[549]

2. උගත් පාඩම් සහ ප්‍රතිසන්ධාන කොමිසම් වාර්තාවේ සඳහන් නිර්දේශ ක්‍රියාත්මක කිරීමටත්, එමෙන්ම ජාත්‍යන්තර නීතිය උල්ලංඝනය කිරීම පිළිබඳ චෝදනා විමසා බැලීමත් සඳහා ශ්‍රී ලංකා රජය විසින් දැනට ගෙන ඇති සහ ඉදිරියේදී ගනු ලබන පියවර ඇතුළත් විස්තරාත්මක ක්‍රියාකාරී සැලැස්මක් හැකි ඉක්මණින් ඉදිරිපත් කරන මෙන් ශ්‍රී ලංකා රජයෙන් ඉල්ලා සිටිමු.[550]

යෝජනා සම්මතය *HRC/Res/22/1* - ශ්‍රී ලංකාවේ ප්‍රතිසන්ධානය සහ වගවීම ප්‍රවර්ධනය කිරීම[551]

916. 2013 මාර්තු මාසයේදී ශ්‍රී ලංකාවේ ප්‍රතිසන්ධානය, වගවීම සහ මානව හිමිකම් ප්‍රවර්ධනය කිරීම මැයෙන් වූ එ.ජා.මා.හි.කවුන්සිලයේ A/HRC/Res/22/1 යෝජනාව 2013 මාර්තු 21 වනදා සම්මත කර ගනු ලැබූ අතර ජාත්‍යන්තර මානව හිමිකම් නීතිය සහ ජාත්‍යන්තර මානුෂීය නීතිය උල්ලංඝනය කිරීම සම්බන්ධයෙන් වූ බරපතල චෝදනාවලට ජාතික ක්‍රියාකාරී සැලැස්ම ප්‍රමාණවත් පරිදි ප්‍රතිචාර දක්වා නොමැති බවට සහතික කොට කියා සිටින ලදී. තවද, ඊට වසර දෙකකට පෙර සිදු කරන ලද නිර්දේශ එම යෝජනාව මගින් යළි අවධාරණය කරන ලදී. යෝජනා සම්මතයේ ඡේද දෙස බැලීමේදී, එ.ජා.මා.හි.ක. ශ්‍රී ලංකාව සම්බන්ධයෙන් බරපතල සුපරීක්ෂාවක් කරා ගමන් කරමින් සිටින බවට වන නිගමනය කරා යමෙකු එළඹීම වැළැක්විය නොහැකිය.

917. යෝජනා සම්මතයේ සඳහන් කිරීමට යෝග්‍ය වන්නා වූ ඡේද

සිය සමස්ත ජනගහණය මානව හිමිකම් හා මූලික නන් වැදෑරුම් නිදහස පූර්ණව භුක්ති විඳින බවට සහතික කිරීම එක් එක් රාජ්‍යයේ වගකීම බවට යළි තහවුරු කරන ලදී.[552]

ත්‍රස්තවාදය මර්ධනය කිරීම පිණිස ගන්නා කවර හෝ ක්‍රියාමාර්ගයක් ජාත්‍යන්තර නීතිය, විශේෂයෙන්ම අදාළ පරිදි ජාත්‍යන්තර මානව හිමිකම් නීතිය, සරණාගතයන් පිළිබඳ ජාත්‍යන්තර නීතිය සහ ජාත්‍යන්තර මානුෂීය නීතිය යටතේ වන බැඳීම්වලට අනුකූල වන බවට රාජ්‍යයන් වග කිව යුතු බව යළි තහවුරු කරන ලදී.[553]

ශ්‍රී ලංකාවේ උගත් පාඩම් හා ප්‍රතිසන්ධාන කොමිසමේ වාර්තාව ශ්‍රී ලංකාවේ ජාතික ප්‍රතිසන්ධාන ක්‍රියාවලියට ලබා දීමට ඉඩ ඇති දායකත්වය පිළිගනිමින් එමගින් අනාවරණය කළ කරුණු සහ නිර්දේශ සැලකිල්ලට ගන්නා ලදී.[554]

කොමිෂන් සභාවේ නිගමන සහ නිර්දේශවලට ප්‍රතිචාර ලෙස ශ්‍රී ලංකා රජයේ උගත් පාඩම් සහ ප්‍රතිසන්ධාන කොමිෂන් සභාවේ නිර්දේශ සහ එහි බැඳීම් ක්‍රියාත්මක කිරීම පිණිස වූ ජාතික ක්‍රියාකාරී සැලැස්ම පිළිබඳව අවධානය යොමු කරන ලදී.[555]

---

549 *මෙහෙයුම් ඡේදය 1 – Op. cit. Res.*

550 *මෙහෙයුම් ඡේදය 2* – ශ්‍රී ලංකාව තුළ සංහිඳියාව සහ වගවීම ප්‍රවර්ධනය කරනු ලබන එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කොමිසමෙහි 19/ 2 යෝජනාව

551 එ.ජා.මා.හි.ක. යෝජනා සම්මතය 22/1 ශ්‍රී ලංකාවේ ප්‍රතිසන්ධානය සහ වගවීම ප්‍රවර්ධනය කිරීම -*https://documents-dds-ny.un.org/doc/RESOLUTION/LTD/G1211597PDFG1211597.pdf?Open Element*

552 *පූර්විකාව ඡේදය 6 –Op.cit.Res*

553 *පූර්විකාව ඡේදය 7 –Op.ci.Res*

554 *පූර්විකාව ඡේදය87 –Op.ci.Res*

කොමිෂන් සභාවේ සියලු නිගමන සහ සාධනීය නිර්දේශ, ජාතික ක්‍රියාකාරී සැලැස්ම ප්‍රමාණවත්ව ආමන්ත්‍රණය නොකරන බව සැලකිල්ලට ගන්නා ලදී.[556]

ජාත්‍යන්තර මානව හිමිකම් නීතිය සහ ජාත්‍යන්තර මානුෂීය නීතිය උල්ලංඝනය කිරීම් පිළිබඳ බරපතල චෝදනා, ජාතික ක්‍රියාකාරී සැලැස්ම සහ කොමිෂන් සභාවේ වාර්තාව ප්‍රමාණවත්ව ආමන්ත්‍රණය නොකරන බව මහත් ඕනෑකමින් සැලකිල්ලට ගන්නා ලදී.[557]

ජාත්‍යන්තර මානව හිමිකම් නීතියෙහි සහ ජාත්‍යන්තර මානුෂීය නීතියෙහි සිදුවූවේ යැයි පැවසෙන උල්ලංගනයකිරීම් පිළිබඳ ස්වාධීන සහ විශ්වසනීය ජාත්‍යන්තර විමර්ශනයක් සඳහා මහ කොමසාරිස්වරයා සිදු කළ ඉල්ලීම සැලකිල්ලට ගන්නා ලදී.[558]

1. *ශ්‍රී ලංකාවේ ප්‍රතිසන්ධානය සහ වගවීම ප්‍රවර්ධනය කිරීම පිළිබඳව ශ්‍රී ලංකා ර ජයට උපදෙස් සහ තාක්ෂණික සහාය ලබා දීම පිළිබඳව එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කොමසාරිස්ගේ කාර්යාලයේ වාර්තාව සහ එහි අන්තර්ගත නිර්දේශ සහ නිගමන, විශේෂයෙන්ම සංක්‍රාන්තික යුක්තිය වෙත වඩා විස්තීරණ සහ අන්තර්කරණ ප්‍රවේශයක අනිවාර්ය කොටසක් ලෙස සත්‍ය සෙවීමේ යාන්ත්‍රණයක් ස්ථාපිත කිරීම පිළිබඳව වන නිර්දේශ සාදරයෙන් පිළිගන්නා ලදී.*[559]

2. *මහ කොමසාරිස්වරයාගේ කාර්යාලයේ වාර්තාවේ සිදු කර ඇති නිර්දේශ ක්‍රියාත්මක කරන ලෙසට ශ්‍රී ලංකා දිරිමත් කරන ලද අතර අදාළ පරිදි ජාත්‍යන්තර මානව හිමිකම් නීතිය සහ*

ජාත්‍යන්තර මානුෂීය නීතිය උල්ලංඝනයවීම් පිළිබඳ චෝදනා සම්බන්ධයෙන් ස්වාධීන සහ විශ්වසනීය විමර්ශනයක් සිදු කරන ලෙස රජයෙන් ඉල්ලා සිටින ලදී.[560]

3. *උගත් පාඩම් සහ ප්‍රතිසන්ධාන කොමිෂන් සභාවේ වාර්තාවේ සඳහන් සාධනීය නිර්දේශ සඵලව ක්‍රියාත්මක කරන ලෙස සහ සියලු ශ්‍රී ලාංකිකයන් සඳහා යුක්තිය, සාධාරණය, වගවීම සහ ප්‍රතිසන්ධානය සහතික කිරීම පිණිස විශ්වසනීය සහ ස්වාධීන ක්‍රියාමාර්ග ආරම්භ කිරීම පිණිස වන අදාළ නෛතික බැඳීම් සහ ප්‍රතිඥා ඉටු කිරීමට අවශ්‍ය සියලු අතිරේක පියවර ගන්නා ලෙසට ශ්‍රී ලංකා රජයෙන් කළ සිය ඉල්ලීම නැවත අවධාරණය කරන ලදී.*[561]

918. ස්වාධීන සහ විශ්වසනීය ජාත්‍යන්තර විමර්ශනයක් අවධාරණය කිරීමට අමතරව සත්‍ය සෙවීමේ යාන්ත්‍රණයක් ස්ථාපිත කිරීම නිර්දේශ කළේ මෙම යෝජනා සම්මතය බව සටහන් කිරීම වටී.

919. අවසාන වශයෙන්, එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කොමසාරිස්වරයාගෙන් ශ්‍රී ලංකාව පිළිබඳ ජාත්‍යන්තර අපරාධ විමර්ශනයක් සිදු කරන ලෙස බලවත් ඉල්ලීමක් කළ යෝජනාව 2014 වසරේදී සම්මත කර ගන්නා ලදී.

---

555 *පූර්විකාව ඡේදය 11 –Op.cit.Res*

556 *පූර්විකාව ඡේදය 12 – Opt cit.R s*

557 *පූර්විකාව ඡේදය8 14 – Opt cit.Res*

558 *පූර්විකාව ඡේදය8 l8 – Opt cit.Res*

559 *මෙහෙයුම ඡේදය 1 – Opt cit.Res*

560 *මෙහෙයුම ඡේදය 2 – Opt cit.Res*

561 *මෙහෙයුම ඡේදය 3 – Opt cit.Res*

යෝජනා සම්මතය HRC/Res/25/1 – ශ්‍රී ලංකාවේ ප්‍රතිසන්ධානය සහ වගවීම ප්‍රවර්ධනය කිරීම,[562]

*ශ්‍රී ලංකාවේ **උගත් පාඩම් හා ප්‍රතිසන්ධාන කොමිසමේ** වාර්තාව ශ්‍රී ලංකාවේ අර්ථාන්විත ජාතික ප්‍රතිසන්ධාන ක්‍රියාවලියට ලබා දීමට ඉඩ ඇති දායකත්වය පිළිගනිමින් එමගින් අනාවරණය කළ කරුණු සහ නිර්දේශ සැලකිල්ලට ගනිමින් ද[563]*

*කොමිෂන් සභාවේ නිගමන සහ නිර්දේශවලට ප්‍රතිචාර ලෙස දක්වා ඇති ශ්‍රී ලංකා රජයේ උගත් පාඩම් සහ ප්‍රතිසන්ධාන කොමිෂන් සභාවේ නිර්දේශ සහ එහි බැඳීම් ක්‍රියාත්මක කිරීම පිණිස වූ **ජාතික ක්‍රියාකාරී සැලැස්ම** පිළිබඳව අවධානය යොමු කරමින් ද,[564]*

කොමිෂන් සභාවේ සියලු නිගමන සහ සාධනීය නිර්දේශ, ජාතික ක්‍රියාකාරී සැලැස්ම ප්‍රමාණවත්ව ආමන්ත්‍රණය නොකරන බව සැලකිල්ලට ගනිමින් ද, සහ කොමිෂන් සභාවේ වාර්තාවේ සියලු මූලිකාංග ප්‍රමාණාත්මකව ආමන්ත්‍රණය කිරීම සඳහා සැලැස්මේ විෂය පථය පුළුල් කිරීමට ශ්‍රී ලංකා රජය උනන්දු කරවමින්ද,[565]

ජාත්‍යන්තර මානව හිමිකම් නීතිය සහ ජාත්‍යන්තර මානුෂීය නීතිය උල්ලංඝනය කිරීම් පිළිබඳ බරපතල චෝදනා, ජාතික ක්‍රියාකාරී සැලැස්ම සහ කොමිෂන් සභාවේ වාර්තාව ප්‍රමාණවත්ව ආමන්ත්‍රණය නොකරන බව මහත් ඕනෑකමින් සැලකිල්ලට ගනිමින් ද,[566]

අනෙකුත් කරුණු අතර, ප්‍රචණ්ඩක්‍රියා සහ අවහාවිත නැවැත සිදුවීම වැළක්වීම අරමුණු කරගනිමින් වගවීම සහතික කිරීම, යුක්තිය ඉටුකිරීම, චින්දිතයන් සඳහා පිළියම් සැපයීම, සුවපත්කිරීම සහ ප්‍රතිසන්ධානය ප්‍රවර්ධනය කිරීම, ආරක්ෂක පද්ධතිය සඳහා ස්වාධීන අධීක්ෂණයක් ස්ථාපිත කිරීම රජයේ ආයතන කෙරෙහි ඇති විශ්වාසය ප්‍රතිස්ථාපනය කිරීම පිණිස සහ ජාත්‍යන්තර මානව හිමිකම් නීතිය ප්‍රකාරව නීතියේ ආධිපත්‍යය ප්‍රවර්ධනය කිරීම පිණිස අනෙකුත් කරුණු අතර ඒකභාවී නඩුපැවරුම්, හානිපූරණ, සත්‍යය සෙවීම, ආයතනික ප්‍රතිසංස්කරණ, රාජ්‍ය සේවකයන් සහ නීලධාරීන් පිළිබඳව කරුණු සොයාබැලීම හෝ යෝග්‍ය පරිදි සකස්කරන ලද ඒවායේ සංයෝගයක් ඇතුළුව අධිකරණමය සහ අධිකරණය නොවන පුර්ණ ක්‍රියාමාර්ග මාලාවක් අන්තර්ගත කර ඇත්තාවූ සංක්‍රාන්තික යුක්තිය වෙත විස්තීරණ ප්‍රවේශයක වැදගත්කම අවධාරණය කරමින්ද,[567]

අතීත මානව හිමිකම් උල්ලංඝනය කිරීමේ රටාවන් සහ ඒවායේ හේතු සහ ප්‍රතිවිපාක විමර්ශනය කරන්නාවූ සත්‍යය සහ ප්‍රතිසන්ධාන කොමිෂන් සභා බදු සත්‍යය සෙවීමේ ක්‍රියාදාම අධිකරණමය ක්‍රියාදාම ඌනපූරණය කළ හැකි වැදගත් මෙවලම් බව සහ ස්ථාපිත

කළ විටදී එබදු යාන්ත්‍රණ සැලසුම් කළ යුත්තේ නිශ්චිත සමාජීය සංදර්භයක් තුළ බව සහ ස්ථාපනය කළ යුත්තේ රාජ්‍ය නොවන සංවිධාන ඇතුළුව චින්දිතයන් සහ සිවිල් සමාජය අන්තර්ගත කරන්නාවූ පුළුල් ජාතික උපදේශන මත බව අවධාරණය කරමින්ද,[568]

---

562 *එ.ජා.මා.හි.කො යෝජනා සම්මතය 25/1 ශ්‍රී ලංකාවේ ප්‍රතිසන්ධානය, වගවීම සහ මානව හිමිකම් ප්‍රවර්ධනය කිරීම කිරීම - https://documents-dds-ny.un.org/doc/RESOLUTION/GEN/G14/132/86/PDF/G1413286.pdf?Open Elemen*

563 *පූර්විකාව ඡේදය 18 – Opt cit.Res*

564 *පූර්විකාව ඡේදය 20 –Op.cit.Res*

565 *පූර්විකාව ඡේදය 21 – Opt cit.Res*

566 *පූර්විකාව ඡේදය 22 – Opt cit.Res*

567 *පූර්විකාව ඡේදය 23 – Opt cit.Res*

568 *පූර්විකාව ඡේදය 24 –Op.cit.Res*

දුර්විපාක නොලබා සිටීම අවසන් කිරීමේ අරමුණින්, මානව හිමිකම් බරපතල ලෙස කඩකිරීම් සහ ජාත්‍යන්තර නීතිය යටතේ අපරාධ සංස්ථාපනය කරන්නාවූ ජාත්‍යන්තර මානව හිමිකම් නීතිය බරපතල ලෙස උල්ලංඝනය කිරීම් සඳහා වගකිවයුත්තන්ට නඩු පැවැරීම සඳහාවූ අදාළ බැඳීම් සමග අනුකූලව කටයුතු කිරීමේ රාජ්‍යයන්ගේ වගකීම මෙනෙහි කරමින්ද,[569]

සත්‍යය ස්ථාපිත කිරීමට සහ යුක්තිය ලභාකර ගැනීමට ජාතික යාන්ත්‍රණ නිරතුරුව අපොහසත් වී ඇති බවට වූ මහකොමසාරිස්වරියගේ නිගමනය සහ ජාත්‍යන්තර මානව හිමිකම් නීතියෙහි සහ ජාත්‍යන්තර මානුෂීය නීතියෙහි සිදුවූවේ යැයි පැවසෙන උල්ලංගනයකිරීම් තවදුරටත් විමර්ශනය කිරීම පිණිස ජාත්‍යන්තර විමර්ශන යාන්ත්‍රණයක් මානව හිමිකම් කවුන්සිලය ස්ථාපිත කළ යුතු බවට සහ කවර හෝ දේශීය වගවීම් ක්‍රියාදාම අධීක්ෂණය කළ යුතු බවට වූ ඇගේ නිර්දේශය යළි සිහිපත් කරමින්ද,[570]

2. අදාළ පරිදි, ජාත්‍යන්තර මානව හිමිකම් නීතිය සහ ජාත්‍යන්තර මානුෂීය නීතිය උල්ලංඝනය කළ බවට වන චෝදනා පිළිබඳ ස්වාධීන සහ විශ්වසනීය විමර්ශනයක් පවත්වන ලෙස ද, එබදු උල්ලංඝනයකිරීම් සම්බන්ධයෙන් වගකිව යුත්තන් වගවීමට ලක්කරන ලෙසද, ශ්‍රී ලංකාවේ මානව හිමිකම් කඩකිරීම් සහ අපයෝජන පිළිබදව දිගින් දිගටම සිදුවීම් අවසන් කරන ලෙසද, එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් මහ කොමසාරිස් කාර්යාලයේ වාර්තාවල සඳහන් නිර්දේශ ක්‍රියාත්මක කරන ලෙසද ශ්‍රී ලංකා රජයෙන් ඉල්ලා සිටියි.[571]

3. උගත් පාඩම් සහ ප්‍රතිසන්ධාන කොමිෂන් සභාවේ වාර්තාවේ සඳහන් සාධනිය නිර්දේශ සඵලව ක්‍රියාත්මක කරන ලෙස සහ සියලු ශ්‍රී ලාංකිකයන් සඳහා යුක්තිය, සාධාරණය, වගවීම සහ ප්‍රතිසන්ධානය සහතික කිරීම පිණිස විශ්වසනීය සහ ස්වාධීන ක්‍රියාමාර්ග ආරම්භ කිරීම

පිණිස වන අදාළ නෛතික බැඳීම් සහ ප්‍රතිඥා ඉටු කිරීමට අවශ්‍ය සියලු අතිරේක පියවර ගන්නා ලෙසට ශ්‍රී ලංකා රජයෙන් කළ සිය ඉල්ලීම නැවත අවධාරණය කරයි.[572]

සිදුවෙමින් පවතින මානව හිමිකම් උල්ලංඝනය කිරීම් සහ ප්‍රත්‍යක්ෂ ප්‍රතිඵල සහිත විශ්වසනීය ජාතික ක්‍රියාදාමයක් නොපැවතීම නිසාවෙන් ජාත්‍යන්තර විමර්ශන යාන්ත්‍රණයක අවශ්‍යතාව පිළිබඳ මහ කොමසාරිස්වරියගේ නිර්දේශ සහ නිගමන සැළකිල්ලට ගනියි.[573]

920. මානව හිමිකම් කවුන්සිලයේ 25 වැනි සැසිවාරයේදී, ගැටුමේ අවසන් මාසවලදී ශ්‍රී ලංකාවේ පාර්ශව දෙක විසින්ම සිදු කරන ලද්දේ යැයි පැවසෙන මානව හිමිකම් උල්ලංඝන කිරීම් හා අවභාවිතා කිරීම් සම්බන්ධයෙන් විස්තීරණ විමර්ශනයක් සිදු කරන ලෙස මානව හිමිකම් පිළිබඳ මහකොමසාරිස්වරයාගේ කාර්යාලයෙන් කවුන්සිලය ඉල්ලා තිබුණි.

921. කෙසේ වෙතත්, සිය විදේශ අමාත්‍යවරයා විසින් නියොජනය කරනු ලැබූ ශ්‍රී ලංකා රජය, යෝජනාවට සහ අපේක්ෂිත වාර්තාවට දැඩි ප්‍රතිරෝධයක් දැක්වීය.

922. 2015 මාර්තු මාසයේදී ඉදිරිපත් කිරීමට නියමිතව තිබූ මානව හිමිකම් මහකොමසාරිස්වරයාගේ කාර්යාලයේ ශ්‍රී ලංකාව සම්බන්ධයෙන් වූ වාර්තාව, ශ්‍රී ලංකාවේ නව රජයේ මැදිහත්වීමෙන් පසුව අවසානයේදි ඉදිරිපත් කරනු ලැබුයේ 2015 සැප්තැම්බර් මාසයේදීය. මානව හිමිකම් පිළිබඳ මහකොමසාරිස්වරයාට ලිපියක් යොමු කරමින්, තමන්ගේම විමර්ශන සිදු කිරීමට සහ වගවීම,

569 *පූර්විකාව ඡේදය 25 – Opt cit.Res*

570 *පූර්විකාව ඡේදය 26 – Opt cit.Res*

571 *මෙහෙයුම් ඡේදය 2 – Opt cit.Res*

572 *මෙහෙයුම් ඡේදය 3 – Opt cit.Res*

573 *මෙහෙයුම් ඡේදය 10 – Opt cit.Res*

වැදගත් මානව හිමිකම් යටිතල පහසුකම් රාමුවක් සකස් කිරීම පිණිස නීති පැනැවීමට සහ නීතියේ ආධිපත්‍ය යළි ස්ථාපිත කිරීමට තවත් කාලය ඉල්ලා සිටි බව මෙහි ලා සඳහන් කිරීම වටී.[574]

2015 ඔක්තෝබර් 14 වන දින සම්මත වූ යෝජනාව HRC/Res/30/1 – ශ්‍රී ලංකාවේ ප්‍රතිසන්ධානය, වගවීම සහ මානව හිමිකම් ප්‍රවර්ධනය කිරීම:[575]

ආගම්, ඇදහිලි සහ වාර්ගිකත්වය පිළිබඳ භේද ගැන නොතකා සියලුම ශ්‍රී ලාංකිකයන්ට සාමකාමී හා ඒකීය භූමියක් තුළ මානව හිමිකම් පූර්ණ වශයෙන් භුක්ති විඳීම සඳහා ඇති අයිතිය ගැන නැවත ප්‍රතිඥා දෙමින්,[576]

වගවීම තහවුරු කර ගැනීමත්, සාධාරණත්වය සලසා දීමත්, විපතට පත්වූවන් සඳහා පිළියම් සෙවීමත්, සමථයකට පත් කිරීමත්, ප්‍රතිසන්ධාන කටයුතු කිරීමත්, සමස්ත ආරක්ෂක පද්ධති ගැන ස්වාධීනව සොයා බැලීමත්, රජයේ ආයතන පිළිබඳ විශ්වාසය තහවුරු කිරීමත්, ජාත්‍යන්තර මානව හිමිකම් පිළිබඳ නීතියට අනුකූලව නීතියේ ආධිපත්‍යය ප්‍රවර්ධනය කිරීමත්, ප්‍රචණ්ඩත්වය හා අපචාර නැවත සිදුවීමේ අවස්ථා ඇතිරීමත් සඳහා අධිකරණමය හා අධිකරණමය නොවන පියවර ගැනීම, පෞද්ගලික නඩු පැවරීම් හා හානිපූරණයන්, සත්‍ය සෙවීම්, ආයතනික ප්‍රතිසංස්කරණ සඳහා කටයුතු කිරීම, රාජ්‍ය සේවකයන් හා නිලධාරීන් විශේෂ පරීක්ෂණයට භාජනය කිරීම හා එම කටයුතු නිසි ආකාරව කිරීම සම්බන්ධයෙන් සමවබෝධ ප්‍රවේශයක් ගැනීමේ වැදගත්කම අවධාරණයට ලක් කරමින්,[577]

පසුගිය කාලයේ සිදුවූ අවභාවිතයන් හා උල්ලංඝනය කිරීම් සම්බන්ධයෙන් සහන කටයුතු කරන ආයතන ස්වාධීන, අපක්ෂපාතී හා විනිවිදභාවයෙන් යුතු වන විට, ඒවා ඉහළම නිපුණත්වයෙන් යුතු, අවංක හා අපක්ෂපාතී පුද්ගලයන් විසින් නිර්මාණාත්මක හා සහභාගිත්ව ක්‍රම අනුගමනය කරමින්, එනම් සියලුම ප්‍රදේශවල සියලුම ආගමික හා වාර්ගික කොටස් නියෝජනය කරන විපතට පත්වූවන්, කාන්තාවන් හා තරුණ තරුනණියන්ගේ සහභාගිත්වය ඇතිව, එහෙත් ඔවුන්ට පමණක් සීමා නොකොට සියලු දෙනා සාධාරණ

සහයෝගිත්වයෙන් සිදුකරන විට එම යාන්ත්‍රණය මනාව ක්‍රියාත්මක වන බව පිළිගනිමින්,[578]

වරදට දඩුවම් ලබා නොදීමේ යුගය අවසාන කිරීමේ අරමුණ සහිතව ජාත්‍යන්තර නීතිය යටතේ අපරාධ ගණයෙහි ලා සැලකෙන මානව හිමිකම් බරපතල ලෙස උල්ලංඝණය කිරීම් හා ජාත්‍යන්තර මානුෂීය නීතිය බරපතල ලෙස උල්ලංඝනය කිරීම් සඳහා වගකිව යුතු වන පුද්ගලයන්ට නඩු පැවැරීම සඳහා ඇති බැඳීම ඉටු කිරීම පිණිස රාජ්‍යයන්ට ඇති වගකීම සිහිපත් කරමින්,[579]

උගත් පාඩම් හා ප්‍රතිසන්ධාන කොමිෂන් සභා වාර්තාවේ ඇති හිතකර නිර්දේශ ඵලදායී ලෙස ක්‍රියාත්මක කරන මෙන් ශ්‍රී ලංකා රජයෙන් ඉල්ලා සිටිමින්,[580]

---

574 කලම්බු ටෙලිග්‍රාෆ් 'මානව හිමිකම් මහකොමසාරිස්වරයාට විදේශ අමාත්‍ය මංගල සමරවීර මහතාගේ 2015 පෙබරවාරි 13 දිනැති ලිපිය, <https//www.colombotelegraph.com/wp-content/uploads/2015/02/hclettertocouncilpres-13feb.pdf> අවසන් වරට පිවිසුනේ 2023 දෙසැම්බර් 26 වනදාය.

575 එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කවුන්සිලය ශ්‍රී ලංකාවේ ප්‍රතිස්න්ධානය, වගවීම හා මානව හිමිකම ප්‍රවර්ධනය

576 *පූර්විකාව ඡේදය 12 - Opt cit.Res*

577 *577 පූර්විකාව ඡේදය 15 - Opt cit.Res*

578 *පූර්විකාව ඡේදය 15 - Opt cit.Res*

579 *පූර්විකාව ඡේදය 18 - Opt cit.Res*

580 *පූර්විකාව ඡේදය 21 - Opt cit.Res*

ශ්‍රී ලංකාවේ සිදුවූ බවට පැවසෙන මානව හිමිකම් බරපතල ලෙස උල්ලංඝනය කිරීම්, අයථා භාවිතයන් හා ඒ හා අදාළ අපරාධ සම්බන්ධයෙන් 25/1 මානව හිමිකම් කවුන්සිල යෝජනාව මගින් ඉල්ලා සිටි විමර්ශනය අවශ්‍ය වූයේ වගවීම පිළිබඳ විශ්වාසනීය ජාතික ක්‍රියාවලියක් නොමැති වූ නිසා බව හඳුනා ගනිමින්,[581]

සත්‍ය සෙවීම, සාධාරණත්වය, හානිපූරණය හා එවැනි සිද්ධීන් නැවත සිදු නොවන බවට සහතික කිරීම සඳහා අවශ්‍ය පියවර ගැනීමේ දී ඒවායේ ඇතුළත් නිර්දේශ ක්‍රියාත්මක කිරීමට ශ්‍රී ලංකා රජයේ උනන්දු කරවමින් ඇගයීමට ලක් කරමු.[582]

2. 2015 ජනවාරි මාසයේ සිට ශ්‍රී ලංකා රජය හා මානව හිමිකම් මහ කොමසාරිස්වරයා හා ඔහුගේ කාර්යාලය අතර පැවැති ධනාත්මක වූ අන්‍යෝන්‍ය සම්බන්ධතාවය පිළිගනිමින්, මානව හිමිකම් ප්‍රවර්ධනය කිරීම හා ආරක්ෂා කිරීම පිණිස සහ සත්‍ය සෙවීම සහ සාධාරණත්වය සඳහා ශ්‍රී ලාංකීය ක්‍රියාවලීන්ට සහභාගිවීම පිණිස මෙන්ම ජාත්‍යන්තර සහාය ලබා දිය හැකි යෝග්‍ය ආකාරයන්

සොයා බැලීම පිණිස ද එවැනි අන්තර් සම්බන්ධතා දිගින් දිගටම පවත්වා ගෙන යා යුතු බවට දිරිමත් කිරීමට උත්සුක වෙමු.[583]

3.සත්‍ය සෙවීම, සාධාරණත්වය ඇති කිරීමේ හා හානිපූරණ ක්‍රියාවලීන්හි විශ්වාසනීයත්වය ශක්තිමත් කිරීම හා ආරක්ෂා කිරීම සඳහා ශ්‍රී ලංකා රජයේ ඇති කැපවීමට සහාය ලබා දෙමින්, ජාත්‍යන්තර විශේෂඥතා සහාය හා විශිෂ්ඨ පරිවයන්ගෙන් ආභාෂය ලබා ගැනීමට, මෙම ක්‍රියාවලීන් සැලසුම් කරන හා ක්‍රියාත්මක කරන ආකාරය පිළිබඳව අදහස් ලබා ගනිමින් බලපෑමට ලක් වූ සියලු ප්‍රජාවන්, වින්දිතයන් හා සිවිල් සමාජය, රාජ්‍ය නොවන සංවිධාන ඇතුළත් කරගනිමින් පුළුල් ජාතික කතිකාවතක නියැළීම, මෙවැනි සිද්ධීන් නැවත ඇති නොවන බවට සහතික වීම සම්බන්ධ වන ක්‍රියාමාර්ගවලට සහයෝගය දෙමු.[584]

5. ශ්‍රී ලංකාව පිළිබඳ එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් සංවිධානයේ විමර්ශන වාර්තාවේ සඳහන් කර ඇති ආකාරයට දෙමළ ඊලාම් විමුක්ති කොටි සංවිධානය විසින් කරන ලද මානව හිමිකම් උල්ලංඝණය කිරීම් හා නීති කඩ කිරීම් සෙවීම සඳහා විගවීමේ හා ප්‍රතිසන්ධාන ක්‍රියාවලියක අවශ්‍යතාව අපි පිළිගන්නෙමු.[585]

8. සංක්‍රාන්තික යුක්තිය පසිඳලීමේ ක්‍රියාවලියේ කොටසක් වශයෙන්, යුධ හමුදාවේ කීර්තිය හා ගෞරවනීයභාවය ඉහළ නැංවීමට ඉවහල් වන, කාර්යක්ෂම ආරක්ෂක ක්ෂෙත්‍ර ප්‍රතිසංස්කරණ හඳුන්වා දීමට ශ්‍රී ලංකා රජය උනන්දු කරවයි; මානව අයිතිවාසිකම් උල්ලංඝනය කිරීම් සහ අනිසි ලෙස භාවිතය සහ අන්තර්ජාතික මානුෂීය නීතිය උල්ලංඝනය කිරීම්වලට අදාළ බරපතල අපරාධවලට, සාධාරණ පරිපාලන ක්‍රියාවලියක් හරහා ආරක්ෂක හා බුද්ධි අංශ සාමාජිකයන් ඇතුළුව, යම් කිසිවෙකු සම්බන්ධ වූ බවට විශ්වාසනීය සාධක ඇත්නම්, එවැනි කිසිවෙකු යුද හමුදාවෙහි රඳවා ගැනීමට හෝ යුද හමුදාවට බඳවා ගැනීමට ඉඩක් නොතිබිය යුතුය; සියලුම ශ්‍රී ලාංකිකයන්ගේ මානව අයිතිවාසිකම් ප්‍රවර්ධනය සහ රැකවරණය කේන්ද්‍ර කොට ගෙන පුහුණුව සහ දිරි ගැන්වීම් ඉහළ නැංවිය යුතුය.[586]

---

581 *පූර්විකාව ඡේදය 23 - Opt cit.Res*

582 *මෙහෙයුම් ඡේදය 1 - Opt cit.Res*

583 *මෙහෙයුම් ඡේදය 2 - Opt cit.Res*

584 *මෙහෙයුම් ඡේදය 3- Opt cit.Res*

585 *මෙහෙයුම් ඡේදය 5- Opt cit.Res*

586 *මෙහෙයුම් ඡේදය 8- Opt cit.Res*

923. 2015 සැප්තැම්බර් වාර්තාවට පාදක වූ එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කවුන්සිලයේ A/HRC/Res/25/1 යෝජනා සම්මතය, ශ්‍රී ලංකාව පිළිබඳ එක්සත් ජාතින්ගේ මානව හිමිකම් මහකොමසාරිස් කාර්යාලයේ විමර්ශනය ස්ථාපිත කළ බව ඉහත වාර්තාවෙන් පැහැදිළි වන අතර, 2015 ඔක්තෝබර් මාසයේ සම්මත කරන ලද තදනන්තර 30/1 යෝජනා සම්මතය "දෙමුහුන් විනිශ්චය අධිකාර" ස්ථාපනය කිරීම හෝ විදේශ විනිසුරුවන් යොදා ගැනීම පිළිබඳ මතභේදයන්ට හා වාග්ලංකාරවලට හේතු කාරක වූ අතර කවර හෝ ආකාරයක ජාත්‍යන්තර මැදිහත්වීමට එරෙහි විරෝධය උත්තේජනය කරන ලදී. පසුව ශ්‍රී ලංකා රජය පැහැදිලිව ප්‍රකාශ කර සිටියේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ විධිවිධාන තුළ, යුද්ධය පිළිබඳ සත්‍ය නිශ්චිතව දැන ගැනීම පිණිස දේශීය යාන්ත්‍රණයක් සම්පාදනය කිරීම මගින් ශ්‍රී ලංකාවේ ස්වෛරීත්වය සහතික වන බවයි. ඒ අනුව එවැනි අධිකරණ යාන්ත්‍රණයක් ස්ථාපිත කිරීමේ හැකියාව බැහැර කරන ලදී.

924. එ.ජා. මා.හි. කවුන්සිලයේ 30/1 යෝජනා සම්මතයේ පාඨ සඳහා මානව හිමිකම් කවුන්සිලයේ 30 වන සැසිවාරයේදී ශ්‍රී ලංකාව විසින් සම අනුග්‍රාහකත්වය දක්වන ලද බව යළි සිහපත් කළ යුතුය. රජයේ දූත මණ්ඩලය, එහි සිය රාජතාන්ත්‍රික සටහනෙහි:

ශ්‍රී ලංකාව සම්බන්ධයෙන් වන මානව හිමිකම් පිළිබඳ කොමසාරිස් කාර්යාලයේ විමර්ශනයේ වචාර්තාව ද සැලකිල්ලට ගනිමින්, එම වාර්තාව අපරාධ විමර්ශනයක් නොව මානව හිමිකම් විමර්ශනයක් නියෝජනය කරන බව පූර්ණව අවබෝධ කර ගන්නා අතර පිහිටුවීමට අපේක්ෂා කරනු ලබන නව යාන්ත්‍රණ ඇතුළුව එහි අන්තර්ගතය මෙන්ම නිර්දේශ ද අදාළ බලධාරීන්ගේ නිසි අවධානය ලබන බවට සහතික කරනු ඇත,[587]

යන්න ප්‍රකාශ කරමින් දේශීය පාර්ශවකරුවන් මෙන්ම ජාත්‍යන්තර මානව හිමිකම් යාන්ත්‍රණය සමග සම්බන්ධ වී කටයුතු කිරීම සඳහා සිය කැපවීම ප්‍රකාශ කළේය.

925. විෂය මූලික විශ්ලේෂණයකින් ඉතා පැහැදිලි වන පරිදි, මෙම 30/1 එ.ජා. මා.හි.කවුන්සිලයේ යෝජනාව සම්මත කර ගැනීමේ සංකීර්ණ ගමන, වගවීම පිළිබඳව වූ පූර්ව කොමිෂන් සභාවල නිර්දේශ මන්දගාමීව ක්‍රියාවට නැංවීම හෝ ඒවා සම්බන්ධයෙන් විශ්වසනීය ක්‍රියාත්මක කිරීමේ ක්‍රියාවලියක් නොමැතිවීම මගින් වඩා පහසු කර ඇති අතර කිසිදු වරදක් නොකළ/හෝ වැරැදි චෝදනාවන්ට ලක් වූ සෙබලුන් නිර්දෝෂ කිරීම හා ඔවුන්ගේ ගෞරවය හා වෘත්තීමය කීර්තිනාමය ආරක්ෂා කිරීම පිණිස දේශපාලන අදිටනක් නොමැතිකමක් සහ ඒ සඳහා වන රජයේ බැඳීම පිළිබඳ මහජන දුර්මතයක් ඇති බව අපි නිගමනය කරන්නෙමු.[588]

926. ශ්‍රී ලංකාවට එරෙහිව එ.ජා.මා.හි.කවුන්සිලයේ අනුගාමී යෝජනාවල පෙළ සහ අප රටට එරෙහිව කවුන්සිලයේ සාමාජිකයන් එක් එක් යෝජනාව සඳහා වඩ වඩාත් සහයෝගය ලැබීමේ ඡන්ද රටාව, මානව හිමිකම් සහ මානුෂීය නීති උල්ලංඝනය කිරීම් සඳහා වගවීම ඉටු කිරීම සඳහා වන සිය බැඳීමට අදාළව ශ්‍රී ලංකාව විශ්වාසය පිළිබඳ ඌනතාවක් නිර්මාණය කර ඇති ආකාරය පැහැදිළිව නිරූපණය කරයි.

927. එසේම, එ.ජ.මා.හි.කවුන්සිලයේ 30/1 යෝජනා සම්මතය කරා වූ දිගු මාර්ගය අපගේම වැරදි පියවරවලින් ගහණව තිබූ බවත් ඒකාබද්ධ නිවේදනය සමගින් ආරම්භ වූ ප්‍රතිඥාවන් අප විසින් කඩ කිරීම ඊට පිටුබලයක් වූ බවත් පිළිගත යුතුය. 2012 වසරේ 19/2 යෝජනා සම්මතය මගින්

587 ශ්‍රී ලංකා රජය, මානව හිමිකම් පිළිබඳ මහකොමසාරිස් කාර්යාලය වෙත රාජ්‍යතාන්ත්‍රික සටහන, Ref.279/2015 p.2.

588 උගත් පාඩම් සහ ප්‍රතිසන්ධාන කොමිෂන් සභාව වාර්තාව 151 පිටුවේ 4.376 ඡේදය බලන්න; එ.ජ.මා.හි.ක. යෝජනා සම්මතය 30/1,2: "මානව හිමිකම් උල්ලංඝනය කිරීම් හා අයථා භාවිතය වඩාත්ම වගකිව යුතු පුද්ගලයන් හා විශ්වාසනීය වගවීමේ ක්‍රියාවලියන් ස්ථාපනය කිරීම මගින්, ගරුත්වයෙන් හා වෘත්තීයභාවයෙන් යුතුව යෝග්‍ය ආකාරයෙන් කටයුතු කළ ආරක්ෂක හමුදා ඇතුළු සියලු පුද්ගලයන්ගේ කීර්තිය ආරක්ෂා වනු ඇති බව පිළිගනිමින්;

උගත් පාඩම් හා ප්‍රතිසන්ධාන කොමිෂන් සභාවේ නිර්දේශ ක්‍රියාත්මක කිරීම සඳහා වූ කාරුණික අයැදීම, එල්ටීටීඊ සංවිධානය ඇතුළුව සියලු පාර්ශවයන් විසින් සිදු කරනු ලැබුයේ යැයි පැවසෙන මානව හිමිකම් සහ මානුෂීය නීති උල්ලංඝනය කිරීම්වලට අදාළව බරපතල සොයා ගැනීම් සහ නිගමන අන්තර්ගත මානව හිමිකම් මහ කොමසාරිස් කාර්යාලයේ ශ්‍රී ලංකාව පිළිබඳ වාර්තාව සඳහා මග පෑදූ, ශ්‍රී ලංකාව සම්බන්ධයෙන් අන්තර්ජාතික විමර්ශනයක් සිදු කළ යුතු බවට[589] වූ දැඩි ඉල්ලීමක් දක්වා 2014 වන විට වර්ධනය විය.[590]

928. 19/2(2012) ආරම්භ වී 30/1 (2015) දක්වා වූ යෝජනා සම්මතයන් පෙල අධ්‍යයනයේදී, සංක්‍රාන්තික යුක්ති යාන්ත්‍රණ සහ සත්‍ය සෙවීම එම සියලු යෝජනාවල අනිවාර්ය අවශ්‍යතාවක් ලෙස බහුලව දක්නට ඇති බව සක්සුදක් සේ පැහැදිළිය.

929. 30/1 යෝජනා සම්මතය සඳහා වන වගකීම බාරගැනීම 2020 වසරේදී තදනන්තරව ප්‍රතික්ෂේප කරනු ලැබුව ද, එම නිෂ්ප්‍රභකිරීම පැන නැගුනේ රට තුළ දේශපාලනික වශයෙන් වූ බලකිරීම් නිසා බව පැහැදිළි නමුත්, එ.ජා.මා.හි.කවුන්සිලයේදී සිදු කළ සිය ප්‍රකාශනයේදී යුක්තිය සහ ප්‍රතිසන්ධානය ප්‍රවර්ධනය කර සහතික කරන අතරම එක්සත් ජාතීන්ගේ නියෝජිතායතන සමග ශ්‍රී ලංකාව අඛණ්ඩව කටයුතු කරන බවට නැවත නැවතත් අවධාරණය කර කියා සිටින ලදී. අප නිගමනය කර ඇති පරිදි, අන්තර්ජාතික ප්‍රමිති සපුරාලන්නා වූ දේශීයව සකස් කළ ක්‍රියාමාර්ග මගින් සඵලව ක්‍රියාත්මක කළ හැකි සංක්‍රාන්තික යුක්ති යාන්ත්‍රණයක් සැලසුම් කිරීමේදී අධිකරණ යාන්ත්‍රණ නිවේශනය පනවනු ලැබීම නිසාවෙන් ද දේශීය බලකිරීම පැන නගින බව පෙනී යයි.

930. 2020 පෙබරවාරි මාසයේදී එ.ජා.මා.හි.කවුන්සිලයේ ප්‍රකාශනය දේශීය යාන්ත්‍රණයක් දිගටම පවත්වා ගෙන යාම පිළිබඳ විවෘත හා ප්‍රසිද්ධියේ ප්‍රකාශයට පත් කළ ප්‍රතිපත්තියක් ප්‍රබලව ප්‍රකාශයට පත් කිරීමට අවස්ථාව උදා කළ අතර පූර්වෝක්ත ශ්‍රී ලංකා විමර්ශන කොමිෂන් සභාවල වාර්තා සමාලෝචනය කිරීම සහ ඒවා ක්‍රියාවට නැංවීම පිණිස ගත හැකි ක්‍රියාමාර්ග යොජනා කිරීම පිණිස පත් කරනු ලබන විමර්ශන කොමිෂන් සභාවක ප්‍රධානත්වය ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරුවරයකු විසින් හොබවනු ඇතැයි ප්‍රකාශ කරන ලදී.[591]

931. මෙම ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාවේ සම්භවය මෙයින් පැහැදිළි කරන අතර එ.ජා.මා.හි.කවුන්සිලයේ යෝජනාවේ අගය කළ හැකි ලක්ෂණ තිබූ බවත් ජාතික ප්‍රතිසන්ධානය කරා මග පාදන සංක්‍රාන්තික යුක්තිය සඳහා අත්‍යවශ්‍ය වන සාධනීය ක්‍රියාමාර්ග අන්තර්ගත වූ බවත් සඳහන් කළ යුතුය. ඇත්ත වශයෙන්ම, එ.ජා.මා.හි.කවුන්සිලයේ 30/1 යෝජනා සම්මතය, ශ්‍රී ලංකාව එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කවුන්සිලය සමග කටයුතු කරන ආකාරයේ සුසමාදර්ශී විස්ථාපනයක් ඇති කරන ලදී. එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කවුන්සිලය සමග ශ්‍රී ලංකාව මෙලස එක්ව කටයුතු කිරීමෙන් තොරතුරු දැනගැනීමේ පනත පැනවීම. අතුරුදහන්වූ තැනැත්තත් පිළිබඳ කාර්යාලය, හානිපූරණ කාර්යාලය සහ ජාතික සමගිය හා ප්‍රතිසන්ධානය සඳහා වන කාර්යාලය ස්ථාපිත කිරීම සිදු විය.

932. තවමත් කිරීමට ඉතිරිව පවතින දෙයක් වනුයේ විශ්වසනීය සත්‍ය සෙවීමේ යාන්ත්‍රණයක් වන අතර මහජන අදහස් ලබාගැනීම් ගණනාවක් සහ ගැටුමෙන් දිවි ගලවාගත් වින්දිතයන් සහ හිටපු

---

589 එ.ජ.මා.හි.කවුන්සිලයේ 30/1 යෝජනා සම්මතය, ඉහත සඳහන් කර ඇති පරිදි යෝජනාවේ මෙසේ දැක්වේ; "ශ්‍රී ලංකාවේ සිදුවූ බවට පැවසෙන මානව හිමිකම් බරපතල ලෙස උල්ලංඝනය කිරීම්, අයථා භාවිතයන් හා ඒ හා අදාළ අපරාධ සම්බන්ධයෙන් 25/1 මානව හිමිකම් කවුන්සිල යෝජනාව මගින් ඉල්ලා සිටි විමර්ශනය අවශ්‍ය වූයේ වගවීම පිළිබඳ විශ්වාසනීය ජාතික ක්‍රියාවලියක් නොමැති වූ නිසා බව හඳුනා ගනිමින්"

590 එ.ජා.මා.හි.ක. "මානව හිමිකම් මහකොමසාරිස්ගේ කාර්යාලයේ ශ්‍රී ලංකාව පිළිබඳ විමර්ශනය", (2015 සැප්තැම්බර් 16)

591 මෙම අවසන් වාර්තාවේ 1 වන පරිච්ඡේදයේ අවසන් සටහන 1 බලන්න

එල්ටීටීඊ් සටන්කරුවන්ගෙන් පවා සාක්ෂි ලබා ගැනීමෙන් අනතුරුව, මෙම කොමිෂන් සභාව 2022 පෙබරවාරි මාසයේ ඉදිරිපත් කළ සිය දෙවන අතුරු වාර්තාවෙන් සත්‍ය සෙවීමේ යාන්ත්‍රණයක් ස්ථිරසාරව යෝජනා කරන ලදී. 2023 පෙබරවාරි මාසයෙදී වත්මන් ජනාධිපතිවරයාට ඉදිරිපත් කළ තම අවසන් වාර්තාවේ ඇතුළත් කිරීමට නියමිතව තිබූ නිර්දේශ සංක්ෂේපයේ පවා මෙම ජනාධිපති පරීක්ෂණ විමර්ශන කොමිෂන් සභාව සත්‍යය හා ප්‍රතිසන්ධානය සඳහා වන කොමිෂන් සභාවක සඳහා බොහෝ කලක සිට පවතින අවශ්‍යතාව දැඩිව අවධාරණය කළ අතර එහි ආකෘතිය සම්බන්ධයෙන් අපගේ අවසන් වාර්තාවෙන් කටයුතු කරන බවට අපි පොරොන්දු වූයෙමු.

933. අන් කවරදාකටවත් වඩා මෙරටෙහි එවැනි සත්‍යය හා ප්‍රතිසන්ධානය පිළිබඳ කොමිෂන් සභාවක දැඩි අවශ්‍යතාවයක්ව ඇත්තේ කුමක් නිසාදැයි යන්නට අතිගාමී සහ අනිවාර්ය හේතු තිබේ. එහි ගමන් පථය අතිශයින්ම පැහැදිළිය. කෙටියෙන් පවසන්නේ නම්, මෙරටට සත්‍ය කොමිසමක් වන ආයතනයක බරපතල අවශ්‍යතාවයක් ඇතැයි 2022 දී එවකට අග්‍රවිනිශ්චයකාර ශර්වානන්ද මහතා ප්‍රධානත්වය දැරූ විමර්ශන කොමිෂන් සභාවක ප්‍රබලතම නිර්දේශය විය. අනතුරුව, ප්‍රමාණවත් පරිදි ක්‍රියාත්මක නොකළ ජාත්‍යන්තර මානුෂීය නීතිය සහ ජාත්‍යන්තර මානව හිමිකම් නීතිය උල්ලංඝනය

කිරීමේ සිදුවීම් කිහිපයකට අදාළව සත්‍ය නිශ්චිතව දැන ගැනීමට විධි නියෝග ලත් උගත් පාඩම් හා ප්‍රතිසන්ධාන කොමිෂන් සභාව ස්ථාපිත කෙරුණි.

934. වගවීම සම්බන්ධයෙන් කටයුතු කළ පරණගම කොමිෂන් සභාව ජාත්‍යන්තර මානුෂීය නීතියේ සහ ජාත්‍යන්තර මානව හිමිකම් නීතියේ සිදුවූවේ යැයි පැවැසෙන උල්ලංඝනය කිරීම් විමර්ශනය කිරීමේ එක් විකල්පයක් ලෙස සත්‍ය කොමිෂන් සභාවක් ස්ථාපිත කිරීම නිර්දේශ කරන ලදී.

935. වත්මන් ජනාධිපති රනිල් වික්‍රමසිංහ මහතා, 2018 සැප්තැම්බර් මාසයේදී සත්‍ය හා ප්‍රතිසන්ධාන කොමිසමක් පිළිබඳ පනත් කෙටුම්පතක් සහිතව අමාත්‍ය මණ්ඩල පත්‍රිකාවක් ඉදිරිපත් කරන ලද බව මෙහි ලා සඳහන් කළ යුතුය. මේ සියල්ලෙන්ම පෙනී යන්නේ, සැලකිය යුතු ප්‍රමාදයකින් පසුව හෝ සිය ප්‍රතිඥා සම්බන්ධයෙන් කටයුතු කිරීමට ප්‍රයත්න දැරීමේ ශ්‍රී ලංකාවේ පරිණාමික ක්‍රියාදාමයයි. බාහිර බලකෙරීම් සහ දේශපාලන අදිටන නොමැතිවීම කල්පවත්නා සහ තිරසර විසඳුම් සොයා යෑම ප්‍රමාද කිරීමට පාදක වූ බව අවබෝධ කරගත යුතුය. චෝදනාවල සත්‍යතාව හෝ අසත්‍යතාව තහවුරු කිරීමේ අරමුණින් ස්වාධීන විමර්ශනයකට මුල පුරන ලෙස සහ රටේ නීතිය ප්‍රකාරව ඒ සම්බන්ධයෙන් ක්‍රියාමාර්ග ගන්නා ලෙස උගත් පාඩම් සහ ප්‍රතිසන්ධාන කොමිෂන් සභාව ශ්‍රී ලංකා රජයෙන් ඉල්ලා සිටිය ද, වගවීමේ ක්‍රියාදාමය ස්ථාපිත වීමට දීර්ඝ කාලයක් ගත විය.

936 2022 පෙබරවාරි මාසයේ නිකුත් කළ සිය දෙවන අතුරු වාර්තාවේ සත්‍ය සෙවීමේ කොමිසමක් සඳහා වූ මෙම නිර්දේශය කිරීමට ජනාධිපති විමර්ශන කොමිසම මෙහෙය වූ තවත් ප්‍රබල සාධකයක් විය. එය නම් රටේ යුද්ධයෙන් පීඩාවට පත් ජනතාව, දේශපාලනඥයන් සහ සිවිල් සමාජ සංවිධානවලින් ජනාධිපති කොමිසම රැස්කර ගත් විශාල සාක්ෂි ප්‍රමාණයයි. අප රැස්කර ගත් සාක්ෂි ඇගයීමෙන්, 6 වන පරිච්ඡේදයේ අපගේ නිර්දේශ වෙත ප්‍රවේශ වීමට පෙර, අප වත්මනෙහි සාකච්ඡා කරන සත්‍ය සෙවීමේ යාන්ත්‍රණයක අවශ්‍යතාව සම්බන්ධයෙන් කොමිෂන් සභාවට කිසිදු සැකයක් ඇති නොකරයි.

937. අපගේ නිර්දේශ ඉදිරිපත් කිරීමේ කාර්යය අප ඉටු කිරීමට පෙර, අප ඉදිරියේ ලබා දුන් සාක්ෂිවල සාරාංශයෙහි ඇගයීමක් අපි දැන් සිදු කරන්නෙමු. මෙම අවසන් වාර්තාවේ දෙවන වෙළුමේ සියලු සාක්ෂිකරුවන්ගේ විස්තීරණ සාක්ෂි තිබෙනු ඇත. සැලකිල්ලට බඳුන්ව ඇති අදාළ කරුණුවල

ඇතැම් විශේෂ ලක්ෂණ පිළිබඳව කථා කළ සාක්ෂිකරුවන්ගේ කෙටි සාක්ෂි 4 වන පරිච්ඡේදයේ සඳහන්ව ඇති අතර ඒවා අපෙගේ නිර්දේශ සඳහා පදනම් පූර්වාවයවය වූයේද ඒවාය.

938. එබැවින්, සංක්‍රාන්තික යුක්ති ක්‍රියාවලීන් ආරම්භ කිරීමේ අවශ්‍යතාව පෙරමුණට ගෙන ආ එ.ජා.මා.හි.කවුන්සිලයේ 30/1 යෝජනා සම්මතය හැරුණු විට, යුද්ධයෙන් බැට කෑ උතුරු හා නැගෙනහිර පළාත්වලින් අප ලබා ගත් සාක්ෂිවලින් සත්‍ය තහවුරු කර ගැනීම පිණිස සහ සියලු ප්‍රජාවන්ගේ සිදුවූයේ යැයි පැවසෙන උල්ලංඝනය කිරීම්වල වින්දිතයන්ට ඵලදායී විසඳුම් සැපයීම පිණිස සැබෑ සහ විශ්වසනීය ක්‍රියාදාමයක් ස්ථාපනය කිරීමේ වැදගත්කම අවධාරණය කෙරුණි. එම සිතුවිල්ල සමගින් අපි සාක්ෂි ඇගයීම කරා යොමු වන්නෙමු.

939. ආරම්භයේදී තේරුම් ගත් පරිදි, සංක්‍රාන්තික යුක්තියේ කුළුණු හතර වන සත්‍යය, යුක්තිය, හානිපූරණය සහ නැවැත සිදුනොවීමට වග බලා ගැනීම කෙරෙහි සහභාගිකයන් සහ සාක්ෂිකරුවන් විසින් පෙන්නුම් කළ ආකල්පය අපගේ නිර්දේශවලට සම්බන්ධ අදාළ ප්‍රකාශ නිරූපණය කරයි.[592]

940. අප කලින් පැවැසූ පරිදි, සත්‍යය සෙවීමේ යාන්ත්‍රණයට අදාළව අප සිදු කරන නිර්දේශ මෙම ජනාධිපති විමර්ශන කොමිෂන් සභාව හමුවේ සාක්ෂිකරුවන් විසින් අනුරාවය කළ පැහැදිළි ප්‍රකාශයන්ගේ සවිඥානක ස්වීකරණයකින් ද පැන නගින අතර එය නිර්දේශාත්මක යාන්ත්‍රණයක යම් පූර්වකල්පිත අදහසක් පාදක කර ගත්තක් නොවේ.

4. යාපනය සහ කිලිනොච්චි වාචික සාක්ෂි ඇගයීම

<u>යාපනය වාචික සාක්ෂි</u>

941. යාපනයේ දී කොමිෂන් සභාව හමුවේ ලබා දුන් සාක්ෂිවලින් ගම්‍ය වූ පරිදි, සාක්ෂිකරුවන් විසින් සඳහන් කළ ඇතැම් පැහැර ගැනීම් හා ඝාතන 2009 වසරට පෙර සිදුව ඇතැයි පැවසේ. එහෙත් යාපනයේදී සහ කිලිනොච්චියේදී අපට අසන්නට ලැබුණු සාක්ෂි සුපරික්ෂාකාරීව විමර්ශනය කිරීමේදී, සාක්ෂිකරුවන්ගේ ප්‍රකාශවල ප්‍රමුඛ තේමාව වූයේ තම ජීවිත ඉදිරියට ගෙන යාම පිණිස වන්දි ලබා ගැනීම පිණිස වූ ඔවුන්ගේ අභිලාෂයයි.[593] යාපනයේදී සාක්ෂිකරුවන් ලබා දුන් සාක්ෂි ආවර්ජනය කිරීමේදී, යාපනයේ සාක්ෂිකරුවන් 45 දෙනාගෙන් කිසිවෙකුත් ඔවුන්ගේ වේදනාකාරී අත්දැකීම් සහ වැරැදි සිදු කළ තැනැත්තන් අතින් ඔවුන් විඳි පීඩා සහ හානි තිබියදීත්, පළිගැනීම ඉල්ලා නොසිටි බවට වූ නිගමනය අපි කරන්නෙමු. සංක්‍රාන්තික යුක්තිය වින්දිත කේන්ද්‍රීය වන අතර එහිදී වඩා වැදගත් වනුයේ ඔවුන්ගේ ප්‍රථමතාවයයි. කෙසේ වෙතත්, යුක්තිය ඉටු කිරීම පිණිස, වැරැදි විමර්ශනය කිරීම සඳහා රජයට ඇති බැඳීමට පූර්වයෙන් වූ කොමිෂන් සභා මගින් අධිකාරී බලය ලබා දී ඇති බව අප පෙන්වා දී ඇත්තෙමු. වින්දිතයන්ට අවශ්‍යව ඇත්තේ පළමු අභියෝගය බව ඇතැම්

> ලේඛකයන් පවා පිළිගෙන ඇත. කාලයත් සමගින් සහ වින්දිතයන් අතරම පවා[594] වින්දිතයන්ගේ අපේක්ෂාවන් සහ ඉලක්ක සංස්කෘතික වෙනස්කම්, වයස, ස්ත්‍රීපුරුෂභාවය අනුව රටින් රටට සැලකිය යුතු ලෙස වෙනස් වේ.[595] ඊට අමතරව, වෙනස් සංදර්භයන් වෙනස් අභියෝග එල්ල

592 මෙම අවසන් වාර්තාවේ 888- 890 ඡේදයේ සංක්‍රාන්තික යුක්තිය පිළිබඳ සාකච්ඡාව බලන්න

593 මෙම අවසන් වාර්තාවේ 4 වන ඡේදය බලන්න.

594 එෆ්. මැකේ (2013) "වින්දිතයන් සඳහා කවර ප්‍රතිඵල ද?" ඩී. ෂෙල්ඩන්, *ජාත්‍යන්තර මානුෂීය නීතිය පිළිබඳ ඔක්ස්ෆ(ර්)ඩ් අත්පොත:* ඔක්ස්ෆ(ර්)ඩ් විශ්වවිද්‍යාල මුද්‍රණාලය පිටු 921 සිට 954 දක්වා

595 ආජන්ටිනාව වැනි පශ්චාත් අධිකාරීවාදී පාලන තන්ත්‍රයක, වගවීම වින්දිතයන්ට වැදගත්ම දේ සේ පෙනුණි. එහෙත්, ඇතැමුන් සිතනුයේ පශ්චාත් ගැටුම් තත්ත්ව තුළ මෙය එසේ නොවන බවයි; එහිදී, බිම් මට්ටමේ ජනතාවගේ ප්‍රධාන සැලකිල්ල

කරයි. උදාහරණයක් ලෙස, ඇතැම් තැනැත්තන් වින්දිතයෝ සහ වරදකරුවෝ යන දෙපිරිසම බවට පත් වේ. උදා., ළමා සොල්දාදුවන්

942. මෙම සංදර්භය තුළ, 2007 වසරේදී අපචාරී හමුදා නිලධාරියකු අතින් ලිංගික අපයෝජනයට ලක්වීම පිළිබඳව පැවැසූ යාපනයේ අවසාන සාක්ෂිකාරියගේ සාක්ෂිය පැහැදිළිව අපගේ මතකයට නැගේ.[596] එම වරද බියකරු මෙන්ම දෝෂාරෝපණීය වන්නා සේම, මෙම පිළිකුල් කටයුතු උල්ලංඝනය කිරීම පිළිබඳ ඇයගේ මෙම භාව විශෝධන කථාන්තරයෙහි, එතැන් සිට ඇය එම සිදුවීම පසෙක ලා ජීවිතය අළුතින් ආරම්භ කළ බවක් ද හැඟවේ. ඇගේ කථාව බෙහෙවින් දුක්බර වූ බැවින්කොමසාරිස්වරුන්ට කථා කිරීම පිණිස සියලු සාක්ෂිකරුවන් පිටත්ව යන තුරු ඇය රැඳී සිටි ආකාරය අනුවේදනීයව අප මතකයේ රැඳී තිබේ. අප ප්‍රශ්න කිරීමේ හමුවේ, ඇයට මෙම අපරාධය සිදු කළ පුද්ගලයා හඳුනා ගැනීමේ අසීරුතාවක් තිබෙන බව ඇය පැවසූ හෙයින් ඔහු මුහුණට මුහුණ ලා මුණ ගැසීමට ඇයගේ කැමැත්තක් නොතිබූ නමුත් ඔහු අයත් සේවාව ඇය සඳහන් කළාය. එම වරද සිදු කළ පුද්ගලයා තවමත් ජීවතුන් අතර සිටින්නේ නම් ඔහු සොයා ගැනීම දුෂ්කර නොවනු ඇත. සත්‍ය හා ප්‍රතිසන්ධාන කොමිෂන් සභාවක තම අමිහිරි අත්දැකීම් පොදු අවධානයට හා සාකච්ඡාවට යොමු කොට සහනයක් ලබා ගැනීමට සාක්ෂිකරුවන්ට හැකි වන ලෙස සත්‍ය හා ප්‍රතිසන්ධාන කොමිසමක් වැනි සත්‍ය ප්‍රකාශ කිරීම සඳහා නිරුපද්‍රිත වේදිකාවක් මෙම තත්ත්වයන් තුළ අතිශයින් තීරණාත්මක වනු ඇත. තම ශෝචනීය ජීවිත කථා අන් අය සමග බෙදා හදා ගනිමින් ජීවිතය සුවපත් කර ගැනීමට අවශ්‍ය බොහෝ අය අතුරින් එක් තැනැත්තියක් ඇය වනු ඇත. මානව හිමිකම් නීතිය සහාසික උල්ලංඝනයන් හා ජාත්‍යන්තර මානුෂීය නීතියේ බරපතල උල්ලංඝනයන්හි වින්දිතයන්ට ලබා ගත හැකි ප්‍රතිකර්ම හා හානිපූරණ සඳහා අයිතිය පවතින යාන්ත්‍රණ හරහා හෝ යෝජිත සත්‍ය සෙවීමේ ක්‍රියාදාමය හරහා තහවුරු කර පෙන්විය යුතුය.[597] ඇගේ සාක්ෂිය හා පැවසූ සිදුවීම් පෙළ, සත්‍ය සහ ප්‍රතිසන්ධාන කොමිසමක හානිපූරණ යුක්තිය සඳහා සත්‍ය පැවැසීමට සුදුසු වන අතර එහිදී කොමසාරිස්වරුන්ට

සාපරාධී වගකීම සඳහා ආවේශ්‍ය සාක්ෂි අනාවරණය වුවහොත් කොමසාරිස්වරුන්ට දණ්ඩන ස්වභාවයේ නිර්දේශ පවා තීරණය කළ හැක.

943. යාපනයේ මුස්ලිම් සාක්ෂිකරුවන් 1990 දී සිය නිවෙස්වලින් ඔවුන් බලහත්කාරයෙන් පලවා හැරීම සහ අනතුරුව ඔවුන් දිවයිනේ බොහෝ ප්‍රදේශවලට විසිර යාමට සිදුවීම සම්බන්ධයෙන් අදහස් දැක්වීය. ඔවුන් අතරින් එක් සාක්ෂිකරුවකු තමන්ට එලෙස සාමූහිකව නික්මයාමට සැලැස්වීම උතුරු පළාතේ වසර ගණනාවක් පුරා ජීවත් වූ සුළුතර මුස්ලිම් ප්‍රජාව ජනවාර්ගික පවිත්‍රකරණයට ලක් කිරීමක් ලෙස හැඳින්වීය. කිසිදු බාධාවන් පැමිණවීමකින් තොරව වන්දි ලබා දීම සහ නැවැත පදිංචි වීම ඔවුන් ද ඉල්ලා සිටින ලදී. තමන්ට සම අවස්ථා ලබා දෙන මෙන් ඔවුන් බලකර කියා සිටි අතර ප්‍රසිද්ධියේ ප්‍රකාශ කළ ජනවාර්ගික පවිත්‍රකරණය සහ ජීවිත හා දේපළ අහිමිවීම පැවැතියේ වුව ද, ඔවුන්ගේ සාක්ෂිවලින් නිරූපණය වූයේ ප්‍රතිසාධන ක්‍රියාදාමයක සංරචක විය හැකි සහනශීලීබව, සමාව දීම සහ සානුකම්පිතබවයි. මෙම වින්දිතයන්ට, ඔවුන්ගේ කළින් වාසස්ථාන ප්‍රතිස්ථාපනය උදෙසා වරද සිදු කළ අයගේ වගවීම තීරණාත්මක නොවීය. මෙම

යොමු වනුයේ ද්‍රව්‍යමය භාණ්ඩ වෙත ප්‍රවේශය බවට ඉඟි කර තිබේ.- බලන්න 'යුධ අපරාධ නඩු විභාග යහපතට වඩා අයහපත සිදු කරන්නේද?' (2007) ආර්. ගෝල්ඩිස්ටෝන්. එල්. වින්ජාමුරි සහ ඒ. ඩවුකින්- එහි වින්ජිමුරිගේ අදහස් දැක්වීමම්

596 මෙම අවසන් වාර්තාවේ 4 වන පරිච්ඡේදය බලන්න.

597 මානව හිමිකම් පිළිබඳ ජනාධිපති විමර්ශන කොමිෂන් සභාව විසින් 2005 අප්‍රේල් 19 වැනි දින 2005/35 යෝජනා සම්මතයේ සහ ආර්ථික සහ සමාජීය කවුන්සිලය විසින් 2005 ජූලි 25 දින 2005/30 යෝජනා සම්මතයේ ජා.මා.හි.නීතිය සාහසික ලෙස උල්ලංඝනය කිරීම් සහ අ.මා.නී. බරපතල ලෙස උල්ලංඝනය කිරීම් සඳහා ප්‍රතිකර්ම හා හානිපූරණයේ අයිතිය පිළිබඳ මූලික මූලධර්ම සහ මාර්ගෝපදේශ, එහිදී කවුන්සිලය එම මූලික මූලධර්ම සහ මාර්ගෝපදේශ සම්මත කර ගන්නා ලෙස මහා සභාවට නිර්දේශ කරන ලදී.

සාක්ෂිකරුවන්ට සිය ගැටලු සහ දුක් ගැනවිලි විසඳාලීම පිණිස විශේෂ කොමිෂන් සභාවක් හෝ ජනාධිපති කාර්යසාධක බලකායක් අවශ්‍ය වූ අතර එල්ටීටීඊ සංවිධානය විසින් සිදු කරන ලද අති සාහසික අපරාධ අතුරින් එකක් වූ යාපනයේ සිය නිවාසවලින් මුස්ලිම් ජනයා බලහත්කාරයෙන් ඉවත් කිරීම වාර්තා කොට ආමන්ත්‍රණය කළ හැක හොඳම වේදිකාව වනුයේ විශ්වසනීය සත්‍ය සෙවීමේ යාන්ත්‍රණයක් බව මෙම කමිටුව නිර්දේශ කරයි.

කිලිනොච්චි වාචික සාක්ෂි

944. කිලිනොච්චියේ සාක්ෂිකරුවන්ගේ වාචික සාක්ෂි සලකා බැලීමේදී, බොහෝ සාක්ෂිකරුවන් තම ආදරණීයයන් අහිමි වූ ඔවුන්ගේ සිත් සසල කරවන අත්දැකීම් වේදනාකාරීව යළි ආවර්ජනය කළ බව අපි සටහන් කරන්නෙමු. සිදුවීමෙන් සිදුවීම පදනමෙන් ගත් කළ, පුද්ගලික අත්දැකීම් බෙදා හදා ගන්නා අතරතුර සහභාගිකයන් සිය වරණයන් බෙදා හදා ගන්නා ලදී. කිලිනොච්චි සාක්ෂිකරුවන්ගේ ප්‍රකාශ මෙම වාර්තාවේ 4 වන ඡේදයේ දැක්වේ.

945. KW_1 සහ KW_2 බඳු කිලිනොච්චියේ ඇතැම් සාක්ෂිකරුවන් පවසා සිටියේ යුධ හමුදාව සහ නාවික හමුදාව තම ආදරණීයයන් පැහැර ගත් බවත් KW_2 තවදුරටත් කියා සිටියේ 1999 වසරේ සිදු වූයේ යැයි පැවසෙන ඇගේ පුත්‍රයා පැහැර ගත් අවස්ථාවේ ඇය එතැන සිටි බැවින් ඇයට පැහැරගත්ත වූවන් හඳුනා ගත හැකි බවයි. මන්නාරමේ අතුරුදහන් වූ පුද්ගලයන්ගේ සංගමයේ සභාපතිවරිය වූ KW_2 මෙම ජනාධිපති විමර්ශන සභාවේ අවධානයට යොමු කළේ ඇය දැනටමත් පරණගම කොමිෂන් සභාව ඉදිරියේ සාක්ෂි දී ඇති බවයි. ඇයගේ ඉල්ලීම වූයේ ජාත්‍යන්තරව නොව රට තුළින්ම මේ සඳහා විසඳුම් සොයා ගත යුතු බවයි. මැක්ස්වෙල් පරණගම මහතාම කොමිසම හමුවේ අපට ශෝකී ස්වරයෙන් කියා සිටියේ, 2015 දී බලධාරීන් විසින් බලාත්මක කිරීම පිණිස තම නිර්දේශ සැලකිල්ලට නොගත් බවයි. KW_2 ගේ සාක්ෂිය සම්බන්ධයෙන් අප කටයුතු කළ පසු මේ කරුණ වෙත අප ඉක්මනින්ම ආපසු පැමිණෙන්නෙමු.

946. ඇයගේ පැමිණිල්ල අතුරුදහන්වූ තැනැත්තත් පිළිබඳ කාර්යාලයට ද ඉදිරිපත් කර ඇති අතර, 1999 වසරේ සිය පුත්‍රයා පැහැර ගැනීමෙන් පසුව ඇය වෙනත් ආකාරයක නීති සහනයක් සම්බන්ධයෙන් කටයුතු කළේ ද යන්න පිළිබඳව නිශ්චිත තොරතුරු ඉදිරිපත් නොකළාය. ඇයගේ පුත්‍රයා අතුරුදහන්වීම සම්බන්ධයෙන් මෙම සාක්ෂිකාරිය යුධ හමුදාවට දෝෂාරෝපණය කළ ද, ඇයගේ චිත්තවේගී කම්පනයේ දණ්ඩනීය ප්‍රතිඵල සම්බන්ධයෙන් ඇය පසුවූයේ දෙගිඩියාවෙනි. මෙම කොමිසම වෙත ඇයගේ අවසන් ආයාචනය වූයේ ඇයගේ ආර්ථික තත්ත්වය සඳහා සහන සැලසිය යුතු බවත් එය වඩා සතුටුදායක කළ යුතු බවත්ය.

947. ඇයගේ පැමිණිල්ල අතුරුදහන්වූ තැනැත්තත් පිළිබඳ කාර්යාලයට ඉදිරිපත් කර තිබූ බැවින්, මෙම කොමිෂන් සභාව දැනටමත් ඇගේ පැමිණිල්ල හා ඒ පිළිබඳ විස්තර අ.පි.කා. වෙත යොමු කර තිබූ අතර අ.පි.කා. පනතේ 13 වන වගන්තිය යටතේ විමර්ශනයක් ආරම්භ කරන ලෙස උපදෙස් දෙන ලදී.

948. මෙම කොමිසම සිය රැස්වීම් පවත්වන කිළිනොච්චි මහලේකම් කාර්යාලයට ඇය ඇතුළුවීමට පෙර, අතුරුදහන් වූවන්ගේ පවුල්වල අයට එම ලේකම් කාර්යාලයේ මරණ සහතික නිකුත් කිරීමේ ක්‍රියාවලියක මෙම කොමිසම නිරතව සිටින බවට වූ ව්‍යාජ ප්‍රවෘත්තියක් පතුරුවා හැරීම මගින් වෙනත් අරමුණු ඇති යම් කණ්ඩායම් ඇයට මෙම පරිශ්‍රයට පිවිසීමට බාධා කර තිබුණි. මෙම බාධාකාරී බලවේගවල දැඩි විවේචනවලට භාජනය වෙමින් සාක්ෂි දීම පිණිස පරිශ්‍රයට ඇතුළු වූ බව ඇය පවසි සිටියාය.

949. 2009 ජූනි 26 දින ඇයගේ ස්වාමි පුරුෂයා පැහැරගත් බවට පැමිණිළි කළ තවත් සාක්ෂිකාරියක වන KW_6 සම්බන්ධයෙන් ද එම නිර්දේශයම සිදු කරනු ලබයි. ඇයගේ ස්වාමි පුරුෂයා

තලෙයිමන්නාරම ජැටියේ නාවික හමුදා කඳවුරට ගොස් ඔහුගේ ධීවර කටයුතු සඳහා වූ බලපත්‍රයක් අළුත් කර ගෙන ඇති අතර එය ඔහු අවසන් වරට දුටු අවස්ථාව විය. ඇයගේ ස්වාමි පුරුෂයා අතුරුදහන් වීමෙන් අනතුරුව සාක්ෂිකාරිය පසු දින කඳවුරට ගොස් ඇති අතර සැමියා සොයා ගැනීමට ඇය ගත් උත්සාහය නිරර්ථක විය. ඇයගේ සාක්ෂියෙන් පෙනී යන්නේ ස්වාමි පුරුෂයා අතුරුදහන් වූ දිනට පසු දින කඳවුරේ සිටි අය ඇයට හඳුනා ගැනීමට හැකි වුවත්, අතුරුදහන් වූ දිනයේ පැහැර ගත්ත වූවන්ගේ අනන්‍යතාව පිළිබඳවා ඇයගේ හඳුනාගැනීම අපැහැදිලි බවයි. කෙසේ වෙතත්, සාක්ෂිකරුවන් බහුතරය මෙන්ම ඇය ද ඉල්ලා සිටියේ ජීවිතය ඉදිරියට පවත්වා ගෙන යාමට ආර්ථික සහනයක් ලබා දෙන ලෙසයි.

950. වැරැදිකරුවන් යුධ හමුදාව සහ නාවික හමුදාව ලෙස හඳුනාගත් සාක්ෂිකරුවන් වූයේ KW_2 සහ KW_6 යන මෙම සාක්ෂිකාරියන් දෙදෙනා පමණක් වන අතර ආරක්ෂක හමුදා විසින් පැහැර ගැනීම් සිදු කළ බවට පැවැසූ අනෙකුත් සාක්ෂිකරුවන්ට පැහැර ගැනීම සිදු කළ අයගේ අනන්‍යතාව අවිනිශ්චිත විය. මෙම පැමිණිළිකරුවන් සිය පැමිණිළි සිදු කර තිබූ අතුරුදහන්වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයට මෙම සිදුවීම් සම්බන්ධයෙන් කඩිනම් විමර්ශන සිදු කරන ලෙසට මෙම ජනාධිපති විමර්ශන කොමිසම පසුව දැනුම් දෙන ලදී. තවද, වින්දිතයන්ගේ අවශ්‍යතා පිළිබඳ තක්සේරුවක් සිදු කර සහනයක් ලැබීමට ඔවුන් සුදුසු වන්නේ නම් හානිපූරණය සඳහා කටයුතු කරන ලෙසට ද ජනාධිපති විමර්ශන කොමිසම උපදෙස් දෙන ලදී.

951. මෙම සාක්ෂිකාරියන් දෙදෙනෝ හානිපූරණ පමණක් ඉල්ලා සිටිය ද, යම් වරදකරුවන්ට එරෙහිව සාපරාධී වගකීම තහවුරු කළ හැකිදැයි නිශ්චිතව දැන ගැනීම පිණිස සිය විමර්ශන අඛණ්ඩව සිදු කරන මෙන් ජ.වි.කොා. අතුරුදහන්වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයට නිර්දේශ කරන ලදී.

952. එසේම, යාපනයේ සාක්ෂිකරුවන් පරිද්දෙන්ම, කිලිනොච්චියේ සාක්ෂිකරුවන් ගණනාවක් ද, තම දරුවන් සහ ආදරණීයයන් පැහැර ගැනීම සම්බන්ධයෙන් එල්ටීටීඊයට දොස් පැවැරූ අතර තම වැඩිමහල් පුත්‍රයා පැහැර ගත් තැනැත්තා නමින් හඳුනා ගැනීමට හැකි වූයේ එක් සාක්ෂිකරුවකුට පමණි. එල්ටීටීඊ පොලිස් බලකාය තම වැඩිමහල් පුතු රැගෙන ගියේ බවත් ඉන් අනතුරුව ඔහුගේ දෙවැනි පුතා සහ දියණිය රැගෙන ගිය බවත් ඔහු පැවැසීය. සිදුවීම් තුන සම්බන්ධයෙන් ඔහුගේ සාක්ෂිය විස්තීරණ විය. මෙම කරුණ අප කොමිසම අතුරුදහන්වූවන් පිළිබඳ කාර්යාලයේ අවධානයට යොමු කළ අතර මෙම විමර්ශනවල ප්‍රගතිය පිළිබඳව අ.පි.කාර්යාලයට උපදෙස් දීම පිණිස නීතිපති දෙපාර්තමේන්තුවේ විශේෂ ඒකකයක් ස්ථාපිත කළ යුතු බවට නිර්දේශ කරනු ලැබේ. මෙම ජ.වි.කොා. හමුවේ සාක්ෂිකරුවන් විසින් පවසනු ලැබූ සිදුවූයේ යැයි කියනු ලබන පැහැර ගැනීම් හා මිනීමැරුම් පිළිබඳ මෙම සියලු සිද්ධි, වින්දිතයන්ට ප්‍රතිකර්ම සඳහා අයිතිය ලබා දීමේ අරමුණින් විමර්ශන ආරම්භ කර දිගටම පවත්වා ගෙන යාමේ ඉල්ලීම සහිතව අතුරුදහන්වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයට වාර්තා කළ යුතු බව මෙම මෙම කොමිෂන් සභාව නිර්දේශ කරයි. මෙම සාක්ෂිකරුවන්ගේ දුක්ගැනවිලිවලට පිළියම් යෙදීමේ කාර්යය සඳහා මෙම සිද්ධි ප්‍රමුඛතා ගත කිරීම මගින් ඔවුන් යෝජිත සත්‍ය කොමිෂන් සභාව වෙත කැඳවිය යුතුය.

යුද්ධයේ අවසන් අදියර

953. යුද්ධයේ අවසන් අදියරවලට අදාළව, යුද පෙරමුණේ සිදු වන්නේ කුමක් ද යන්න පිළිබඳව ව්‍යක්තව අදහස් දැක්වූ එක් සාක්ෂිකරුවකු විය.[598] 2008 නොවැම්බර් 9 දින එල්ල වූ ෂෙල් වෙඩි ප්‍රහාරයකින් ඒ වන විටත් ඔහුට තම පුතු අහිමිව තිබූ අතර 2008 වසරට බොහෝ කලකට පෙර සිය බිරියගේ පියා සහ තවත් පුතෙක් අහිමිවීමේ ඛේදවාචයට ඔහු මුහුණ දී තිබුණි. යුද්ධය දිගින් දිගටම පැවැති කාලය තුළ ඔහු තැනින් තැනට ගොස් තිබූ අතර ඔහු වෙනත් කලාපයක සිටි නිසා

598 මෙම අවසන් වාර්තාවේ 4 වන පරිඡේදයේ ඔහුගේ සාක්ෂිය බලන්න.

ඔහු ඔහුගේ පුතාගෙන් වෙන් කරනු ලැබුයේ මෙම කාලය තුලය. ඔහු පවසා සිටියේ පාර්ශවයන් දෙකම යුද්ධයේ නියැළී සිටි බවත් ඒ සඳහා ඔවුන් වගකිව යුතු බවත් ය. සිය බිරිඳ සමග ඔහු බන්කර්වල ජීවිතය ගත කරමින් තිබූ අතර යුද්ධයේ පීඩාවන් සහ පුතුන් දෙදෙනෙකු සහ බිරියගේ පියා අහිමිව තිබුණ ද, රටේ සාමය උදාවනු දැකීමට ඔහුට අවශ්‍යව තිබූ අතර දෙමළ හා සිංහල ජනයා අතර සංහිඳියාව සඳහා අවශ්‍යතාව සම්බන්ධයෙන් අදහස් දැක්වීය. සිංහල භාෂාව පිළිබඳ ඔහුගේ ප්‍රවීණතාවය හේතුවෙන්, ගැටුම් සමය තුළ ඔහු භාෂා පරිවර්තකයෙකු ලෙස ද කටයුතු කර තිබුණි.

954. කොමිසම හමුවේ මෙම සාක්ෂිකරු සිංහල හා දෙමළ භාෂා දෙකෙන්ම කථා කළ අතර යුද කාලය තුළ සිදුවූ සියලු සිදුවීම් දුටු බවට ප්‍රකාශ කළේය. ඉටු කිරීමට හැකියාවක් නොමැති අනවශ්‍ය ඉල්ලීම් සිදු කිරීමේ කිසිදු ඵලක් නොමැති බව ඔහු උපේක්ෂාවෙන් යුතුව කොමිසම හමුවේ පැවසීය. ඒ වෙනුවට මේ මොහොතේ අවශ්‍යව ඇත්තේ සාමය හා සංහිඳියාව බව ඔහු අවධාරණය කළේය. එම සාක්ෂිකරුව දාර්ශනිකව පවසා සිටියේ "වෛරයෙන් වෛරය නොසන්සිඳෙන" බවයි.

955. යුද්ධයේ පාර්ශවකරුවන් කිසිවෙකුට හෝ දොස් පැවැරීමට ඔහුට අවශ්‍ය නොවූ අතර ආයතන කිහිපයක් හමුවේ ඔහුගේ අවාසනාවන්ත තත්ත්වය කියා පෑමට ඔහු බොහෝ කාලයක් පුරා දැරූ ප්‍රයත්න ඔහු විස්තර කළ අතර ඔහුට අවශ්‍ය වූයේ මුලින් පැවැති තත්ත්වය යළි ඇතිවනු දැකීමයි. ඔහුගේ සාක්ෂියේ තානය සහ වයනයෙහි ගැටුම නිසා ඇතිවූ මානසික පීඩා පැහැදිලිව විද්‍යමාන වුව ද, ඉදිරි ගමන් මග සම්බන්ධයෙක් ඔහුගේ අදහස් ප්‍රකාශ කළ විටදී, භාව විශෝධනයක හැඟීමක් අපට දක්නට ලැබුණි.

956. **"සිදුවූ සියලු දේ සම්බන්ධයෙන් කවුරුන් හෝ සමාව ඉල්ලීමක් සිදු කළ යුතුයි"**[599] යන්නෙන් සාක්ෂිකරු ප්‍රකාශ කළේය. ඔහු පැවසුයේ එම සංඥාව සමාවදීමේ සංස්කෘතියක් මුදා හැරීමට ප්‍රමාණවත් බවයි. පාකිස්ථානයේදී ශ්‍රී ලාංකික පුරවැසියෙන් කෲර ලෙස ඝාතනය කිරීම වෙනුවෙන් එවකට සිටි පාකිස්ථානු අග්‍රාමාත්‍යවරයා සමාව අයැද සිටීමේ ප්‍රතිසමතාව ඔහු ගෙන හැර දැක්වූ අතර එවැනි ආකාරයේ සමාදානමය ක්‍රියාවකින් රට ප්‍රතිසාධනය සහ ප්‍රතිෂ්ඨාපනය සඳහා වූ ගමන් මග කරා යොමු කරනු ඇතැයි ඔහු ප්‍රකාශ කර සිටියේය.

957. මෙම සාක්ෂිකරු මෙම කොමිසම හමුවේ ප්‍රකාශ කළ දේ ඔහුගේ මතකයන් පොදු අවධානයට හා සාකච්ඡාවට යොමු කිරීම පිණිස වූ භාව විශෝධනය වැනි අවස්ථාවක් වන අතර ඔහුගේ සාක්ෂිය අවසානයේ සාක්ෂිකරු තරයේ කියා සිටියේ "අපට යුද්ධය අවශ්‍ය නැහැ; අපට අවශ්‍ය සාමය පමණයි" යන්නයි.

958. මෙය යුද්ධයේ අවසන් අදියර මධ්‍යයේ ජීවත්ව සිටි පුද්ගලයකුගේ සාක්ෂිය වන නමුත් ඔහුගේ සාක්ෂියේ කිසිදු අවස්ථාවක යුද අපරාධ අධිකරණයක් යෝජනා කිරීමට ඔහුට අවශ්‍ය නොවීය. ඔහු දෙපාර්ශවයටම ප්‍රතිදෝෂාරෝපණය කළ මුත් ඔහුගේ සාක්ෂියෙන් විශද වූයේ සියලු දේ අළුතින් ආරම්භ කර ජීවිත ගමන ඉදිරිය කරා රැගෙන යාමට ඔහුට අවශ්‍ය බවයි.

959. යාපනය විශ්වවිද්‍යාලයෙන් තෘතීයික අධ්‍යාපනය ලබා පසුව කොළඹ රැකියාවක නිරත වූ සිය දියණිය ගැන ඔහු සඳහන් කළේය. මෙම සාක්ෂිකරු ව්‍යක්තව සිංහල භාෂාවෙන් කතා කළ අතර ඔහුගේ සාක්ෂියේ හරය වූයේ දෙමළ හා සිංහල ජනයා අතර සංහිඳියාව සහ සමාජීය අන්තර්ක්‍රියාව පෝෂණය කොට ඉදිරියට රැගෙන යා යුතු බවයි. ඔහුගේ පුත්‍රයා සහ මාමණ්ඩිය අතුරුදහන්වීම සම්බන්ධයෙන් ඔහු අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට හා ජාත්‍යන්තර රතු කුරුස කමිටුවට

599 මෙම සාක්ෂියේ වඩා විස්තිරණ වාර්තාවක් සඳහා මෙම අවසන් වාර්තාවේ 4 වන පරිච්ඡේදය බලන්න (කිලිනොච්චියේ අවසන් සාක්ෂිකරු)

පැමිණිළි කර තිබූ අතර මෙම කොමිෂන් සභාව සිය රැස්වීම් පැවැත්වූ ශාලාවේමථ එනම් කිලිනොච්චි මහලේකම් කාර්යාලයේදීම ඔහු පරණගම කොමිෂන් සභාව හමුවේ සාක්ෂි දී තිබුණි. මීට පෙර ද මෙම ශාලාවේම දොරටුවෙන්ම ඇතුළු වී ඔහුගේ කථාව පැවැසුවත්, ඉන් පසුව කිසිවක් සිදු නොවීම සම්බන්ධයෙන් ඔහු සිය නොසතුට ප්‍රකාශ කර සිටියේය.

960. සාක්ෂිකරුවන් කිහිප දෙනෙකුම පරණගම කොමිෂන් සභාව[600] හමුවේ සාක්ෂි දුන් බව සිහිපත් කළේය යන කරුණ සඳහන් කිරීමට මෙම අවස්ථාවේ අපි මදකට නතර වන්නෙමු. මෙම අවසන් වාර්තාවේ 4 වන පරිච්ඡේදය පිරී ඇත්තේ පරණගම කොමිෂන් සභාව සහ අනෙකුත් කොමිෂන් සභා හමුවට ගිය පුද්ගලයන්ගෙනි. මෙම අවසන් වාර්තාවේ II වන වෙළුමේ ඔවුන් පැවසූ සිදුවීම් පෙළ දක්වා ඇත.

ජනාධිපති කොමිෂන් සභාවේ සභාපති මැක්ස්වෙල් පරණගමගේ සාක්ෂිය වෙත යොමුවක්

961. කොළඹ පැවැති සිය මහජන අදහස් ලබා ගැනීමේ රැස්වීමේදී මැක්ස්වෙල් පරණගම මහතාට සවන් දීමට මෙම කොමිෂන් සභාවට අවස්ථාව හිමි විය. ඔහුගේ සාක්ෂිය හෙළිදරව් කරන සුළු විය. පැහැර ගැනීම් සහ අතුරුදහන් වූ පුද්ගලයන් සම්බන්ධයෙන් වූ පැමිණිළිවලට අදාළව ඔහුගේ කොමිෂන් සභාව ඉටු කිරීමට බාර ගත් දැවැන්ත කාර්ය භාරය මැක්ස්වෙල් පරණගම මහතා අප කොමිෂන් සභාව හමුවේ විස්තර කරන ලදී. අතුරුදහන් වූ පුද්ගලයන් සම්බන්ධයෙන් සාක්ෂි සටහන් කර ගැනීමෙන් පසු, එම පැමිණිළි විභාග කරන ලෙසට විමර්ශන නිලධාරින් කණ්ඩායමකට ඔහුගේ කොමිෂන් සභාව නියෝග කළ අතර එක් එක් පැමිණිල්ල සඳහා, පැමිණිල්ලට අදාළ විමර්ශන ඩොසියරය සකස් කරන ලදී. එම සාක්ෂිවලට කුමක් වුයේදැයි විමසූ විට පරණගම මහතා කියා සිටියේ ඒවා මේ වන විට ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුවේ තැන්පත් කර ඇති බවයි.

962. ජනාධිපති කොමිෂන් සභාව රැස් කර තිබූ සාක්ෂිමය තොරතුරු අති විශාල ප්‍රමාණයක් කෙරෙහි පෙන්නුම් කර තිබූ අලස උදාසීනත්වය සහ අභිප්‍රායික නොසැලකිල්ල හේතුවෙන් පරණගම කොමිෂන් සභාව හමුවේ සාක්ෂි දී තිබූ සාක්ෂිකරුවන්ට මෙම කොමිෂන් සභාව ඉදිරියට පැමිණ නැවැත වරක් එම කථාවම පැවැසීමට සිදු වීම සම්බන්ධයෙක් නොමිෂන් සභාව විමතියට පත් විය.2015 අගෝස්තු මාසයේ කොමිෂන් සභාවේ වාර්තාව හා නිර්දේශ ඉදිරිපත් කරනු ලැබූ විටදී ඒවාට නිසි සැලකිල්ල යොමු කළ යුතුව තිබුණි.[601]

963. මෙම අවස්ථාවේදී පහත දැක්වෙන ලෙස ප්‍රකාශ කර ඇති 2008 අංක 16 දරන පරීක්ෂණ කොමිෂන් සභා (සංශෝධන) පනතේ 24 වන වගන්තිය කෙරෙහි අවධානය යොමු කිරීමට අපි කැමැත්තෙමු.

"1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහ පනතේ හෝ වෙනත් යම් නීතියක පටහැනිව කුමක් සඳහන් වුව ද, මේ පනත යටතේ පත් කරන ලද පරීක්ෂණ කොමිෂන් සභාවක් විසින්, අවස්ථාවෝචිත පරිදි පවත්වන ලද විමර්ශනයක දී හෝ පරීක්ෂණයකදී හෝ එම විමර්ශනය සහ පරීක්ෂණය යන දෙකේදීම ලබාගත් තොරතුරු මත පදනම්ව යම් වරදක් සම්බන්ධයෙන් නීතිපතිවරයා විසින් යම් අධිකරණයක දී අපරාධ නඩු පැවැරීම නීත්‍යානුකූල වන්නේය."

967. මෙම විධිවිධානය පරණගම කොමිෂන් සභාව හෝ මෙම කොමිෂන් සභාව වැනි පරීක්ෂණ කොමිෂන් සභා විසින් ලබා ගත් තොරතුරු මත විශ්වාසය තබා කටයුතු කිරීමට සහ එම

600 2013 අගෝස්තු 15 වනදා ස්ථාපිත කළ පැහැර ගැනීම් සහ අතුරුදහන්වීම් පිළිබඳ පැමිණිළි විමර්ශනය කිරීමේ ජනාධිපති කොමිෂන් සභාව. එම කොමිෂන් සභාව 2105 අගෝස්තු මාසයේදි සිය වාර්තාව හා නිර්දේශ ඉදිරිපත් කරන ලදී.

601 මෙම අවසන් වාර්තාවේ 113 වන ඡේදයේ සාක්ෂිවල මෙම අංශය සම්බන්ධයෙන් මෙම ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාවේ නිරීක්ෂණ හා නිර්දේශ බලන්න.

තොරතුරුවල සාධ්‍ය වටිනාකම පරීක්ෂා කරනු ලැබීමෙන් අනතුරුව අපරාධ නඩු පැවැරීමක් සිදු කළ හැක්කේ ද යන් නිශ්චය කිරීම පිණිස එම තොරතුරු පිරික්සීමට නීතිපතිවරයාට බලය ලබා දෙයි. පරීක්ෂණ කොමිෂන් සභාව විසින් ලබා ගත් තොරතුරු මත සාපරාධී වගකීම සහතික කරන්නේ නම්, තව දුරටත් විමර්ශන හා නඩු පැවරීමේ කාර්යය සඳහා ඉහත විමර්ශන සටහන් නීතිපති දෙපාර්තමේන්තුව විසින් බාරයට ගත යුතු බව මෙම කොමිෂන් සභාවේ නිර්දේශයයි.

965. මැක්ස්වෙල් පරණගමගේ වාචික ප්‍රකාශය පිළිබඳ අපගේ නිරීක්ෂණ එසේ සිදු කිරීමෙන් පසුව, අපි නැවැතත් වරක් කිලිනොච්චියේ වාචික සාක්ෂි කරා යොමු වෙමු.

966. එල්ටීටීඊ සංවිධානය අතින් සිය පුත්‍රයා අහිමි වූ මවක් වන KW29 සාක්ෂිකාරිය, ඇගේ ස්වාමි පුරුෂයා එල්ටීටීඊ සංවිධානය විසින් අත් අඩංගුවට ගෙන රැගෙන ගිය ආකාරය පිළිබඳ සිත් කම්පා කරවන අත්දැකීම විස්තර කළාය. යුද්ධය අතරතුර 2009 මාර්තු මාසයේ දිනයකදී, එල්ටීටීඊය ඇගේ පුත්‍රයා ට්‍රැක්ටරයක නංවා බලහත්කාරයෙන් රැගෙන ගිය බවත් එය එල්ටීටීඊය විසින් සිදු කරනු ලැබූ ළමයකු පැහැර ගැනීමක් සේ සැලකිය හැකි බවත් ඇය පැවැසීය. ඇයගේ මෙම සිත් සසල කරවන අත්දැකීම සම්බන්ධයෙන් ඇය එල්ටීටීඊය දැඩිව හෙළා දුටු අතර ඇගේ පුතා සමගින් තවත් කුඩා ළමුන් හත් දෙනෙකු එල්ටීටීඊය රැගෙන යන ආකාරය ඇය දැක තිබුණාය. මෙම ළමුන් ඊලාම් රාජ්‍යය උදා කර දෙනු ඇතැයි අපේක්ෂාවෙන් මෙන් එල්ටීටීඊය ඔවුන් රැගෙන ගිය බව හද කම්පා කරවන ආකාරයෙන් ඇය විස්තර කළාය. තම පුතු බලහත්කාරයෙන් රැගෙන යද්දී ඒ දරුවා මව ඉල්ලමින් හඬා වැටුණු විට ඇය අත් විඳි දැඩි මානසික කම්පනය ඇය සිහිපත් කළාය.

967. එල්ටීටීඊ සංවිධානය විසින් ඇයගේ පුත්‍රයා රැගෙන ගිය ද, කොමිෂන් සභාවෙන් ඇය කළ ඉල්ලීම වූයේ ඇයගේ පුතා සොයා ගැනීමට මෙම කොමිෂන් සභාව ඇයට උදව් කළ යුතු බවයි. මෙම සාක්ෂිකාරිය යුද්ධයේ අවසන් අදියර දැක තිබුයේ වුව ද හා ඇගේ පුතා අහිමිවීමත් සමගින් දැඩි මානසික කම්පනයකින් පීඩාවට ලක්ව තිබුයේ වුව ද, ඇය ඒ වේදනාකාරී අත්දැකීමට ඔරොත්තු දී සිටිය නමුත් යුද්ධයට සම්බන්ධ පාර්ශවයන්ට එරෙහිව පෙරළා දොස් නැගීමක් හෝ කිසිදු ආකාරයක සම්බාධක පැනවීමක් ඇය ඉල්ලා නොසිටියාය. තම පුතා සොයා ගැනීම පිණිස කඳවුරු කිහිපයක් වටා ඇයගේ පුතාගේ ඡායාරූප ප්‍රදර්ශනය කළ සාක්ෂිකාරිය ඇය වූ නමුත්ඵ ඔහු කිසි දිනෙක ආපසු නොපැමිණියේය. උගත් පාඩම් සහ ප්‍රතිසන්ධාන කොමිෂන් සභාව විසින් සඳහන් කළ ළමුන් යුද්ධයට බඳවා ගැනීම පිළිබඳව මෙය පැහැදිළි සිදුවීමක් වූ අතර, එහි වාර්තාවෙහි එය සඳහන් කරනුයේ බොහෝ ළමුන් කොහි සිටින්නේදැයි තවමත් නොදන්නා බවයි. තවද, උගත් පාඩම් සහ ප්‍රතිසන්ධාන කොමිෂන් සභාවප්‍රකාශ කරනුයේ ළමුන් යුද්ධයට බඳවා ගැනීම යුද ගැටුම් සමය තුළ එල්ටීටීඊය විසින් සිදු කළ අපරාධ අතුරින් දරුණුතම අපරාධය බවයි. තමන්ගේ අහිමිවීම් වටා ඇති සිදුවීම් පිළිබඳ පූර්ණ අනාවරණයක් සිදු කිරීම පිණිස සහ ඔවුන්ගේ සන්තාපය සහ වියෝ කිරීම සඳහා උචිත සහනයක් ඉල්ලා සිටීමට KW29 වැනි සාක්ෂිකාරියන් යෝජිත සත්‍ය සෙවීමේ යාන්ත්‍රණය හමුවට ඉදිරිපත් කරන මෙන් මෙම පරීක්ෂණ කොමිෂන් සභාව අයැද සිටියි.[602]

968. නැගෙනහිර පළාත තුළ කොමිෂන් සභාවේ රැස්වීම් පැවැත්වුයේ කාත්තන්කුඩියේදී වන අතර එහිදී දෙමළ සහ මුස්ලිම් දෙපිරිසම සාක්ෂි දෙනු ලැබීය. තමන්ට එරෙහිව සිදු කරනු ලැබූ ම්ලේච්ඡ ක්‍රියාවන් පිළිබඳව පාර්ශවයන් දෙකම සාක්ෂි දුන්නේය. ඇතැම් දෙමළ සාක්ෂිකරුවන් එල්ටීටීඊ සහ අනෙකුත් නීති විරෝධී කණ්ඩායම් විසින් ළමුන් බලහත්කාරයෙන් බඳවා ගැනීම සම්බන්ධයෙන් අදහස් දැක්වූ අතර සුදුසු සහනයක් ඉල්ලා සිටියේය.

602 පහත 5.79 ඡේදයේ ළමුන් බඳවා ගැනීම පිළිබඳ උගත් පාඩම් සහ ප්‍රතිසන්ධාන කොමිෂන් සභාවසභාවේ නිරීක්ෂන බලන්න.

969. කාත්තන්කුඩි හා ඒ අවට ප්‍රදේශවල අය වූ සියලුම මුස්ලිම් සාක්ෂිකරුවන් එල්ටීටීඊ විසින් මුස්ලිම් මිනිසුන් පැහැර ගැනීමේ හා මරා දැමීමේ සිදුවීම් කිහිපයක් පිළිබඳව සඳහන් කළේය. එල්ටීටීඊ නැගෙනහිර පළාත පාලනය කළ කාලය තුළ එල්ටීටීඊ සංවිධානය තම ස්වාමි පුරුෂයන් හා පියවරුන් මරා දැමීම පිළිබඳව පැවැසීමට කාන්තා සාක්ෂිකරුවන් විශාල සංඛ්‍යාවක් පැමිණියේය. එල්ටීටීඊය සිදු කළ සාහසික අපරාධ පිළිබඳව සඳහන් කිරීම මේ අවස්ථාවේදී මුළුමණින්ම අදාළ නොවන්නක් නොවේ. 1990 අගෝස්තු මාසයේදී කාත්තන්කුඩි මුස්ලිම් දේවස්ථානයේ යාඥා කරමින් සිටි මුස්ලිම් ජාතිකයන් කිහිප දෙනෙකු එතැනට කඩා වැදුණු එල්ටීටීඊ තුවක්කුකරුවන් කණ්ඩායමක් විසින් වෙඩි තබා ඝාතනය කළ අතර එසේම 1990 ඔක්තෝබර් මාසයේදී කල්මුණේ සිට සිය නිවෙස් කරා ආපසු පැමිණෙමින් සිටි මුස්ලිම් ජාතිකයන් විශාල පිරිසක් අතරමගදී පැහැරගෙන ගොස් මරා දමා කුරුකාල්මඩම් හි සමූහ මිනිස්වලක වල දමා තිබුණි. කාත්තන්කුඩි මුස්ලිම් දේවස්ථාන සම්මේලනය එම මිනී වල භාර සිරුරු ගොඩ ගෙන මල සිරුරු කොටස් ආගමික චාරිත්‍රානුකූලව භූමදාන කිරීම සඳහා ලබා දෙන මෙන් හැඟුම්බර ඉල්ලීමක් කරන ලදී. සාක්ෂිකරුවන් කිහිප දෙනෙකුම මෙම සිදුවීම් සඳහා හානිපූරණය ඉල්ලා සිටි අතර චාර්තා කිරීමේ කාර්යය සඳහා මෙම වින්දිතයන් සියලු දෙනාම යෝජිත සත්‍ය සෙවීමේ යාන්ත්‍රණය හමුවට කැඳවන ලෙසට මෙම කොමිෂන් සභාව නිර්දේශ කරයි.

970. මෙම කොමිෂන් සභාවට අසන්නට ලැබුණු සාක්ෂිවලදී දුර්ලභ අභිසරණයක් විද්‍යමාන විය.වින්දිතයන් අතර කෝපය හා ඉච්ඡා භංගත්වය ද තම ආදරණීයයන් සොයා ගැනීමේ නොනිත් ආශාවක් ද පැවැතියද, යාපනයේදී මෙන්ම සාක්ෂිකරුවන් විශාල සංඛ්‍යාවක් තමන්ට වන්දි ප්‍රදානය කරනු ලැබීමට හා ආර්ථික තත්ත්වය වඩා යහපත් කරනු ලැබීමට දැඩි කැමැත්තක් ප්‍රකාශ කළේය. ගැටුම අතරතුර සාක්ෂිකරුවන්ට තම පවුල්වල සාමාජිකයන් අහිමි වූයේ කවර අවස්ථානුගත තත්ත්වයන් යටතේ වුව ද, බලහත්කාරයෙන් ඉවත්කිරීම නිසා තම නිවාස හා වාසස්ථාන අහිමි වීම පිළිබඳ ඔවුන් සඳහන් කළ සියලු සාක්ෂිවලදී, ඔවුන් පැවසූ කථාවල සංජානනය කළ හැකි එක් අංගයක් දැකිය හැකි විය. කොමිෂන් සභාව ඉදිරියේ සාක්ෂි දුන් ජනයාගේ අයැදීම්වල ආර්ථික වැඩි දියුණුව ප්‍රමුඛතව වුව ද, සාමය හා සංහිඳියාව සඳහා සර්ව ව්‍යාපී ඉල්ලීමක් තිබුණි.

971. එහෙයින් සත්‍ය සෙවීමේ යාන්ත්‍රණයක් සකස් කිරීමේදී, බිම් මට්ටමේ සැවොම අතර ඇති මෙම සම්මුතිය බරපතල ලෙස සැලකිල්ල යොමු කිරීම වැදගත් වේ.

972. සාක්ෂිකරුවන්ගේ ඉහළම කැමැත්ත තිබුයේ සමාජ අභිවෘද්ධිය සහ ආර්ථික විභිනතාව තුරන් කිරීම කෙරෙහිය යන නිරීක්ෂණය සිදු කිරීම මගින් සාක්ෂිකරුවන්ගේ හා වින්දිත දිවි ගලවාගත් වූවන්ගේ සාක්ෂි අපගේ අදහස් දක්වීම අවසානයකට ගෙන එන්නෙමු. තමන්ට අහිමි වූ පවුලේ ආදයම් උපයන්නන් හා දරුවන් සොයා ගැනීම පිළිබඳ අවධාරණය කළ අයගේ සාක්ෂි අපට නොතකා සිටිය නොහැක.

973. අතුරුදහන්වූවන් පිළිබඳ කාර්යාලයක් පිහිටුවීම පිළිබඳ අපගේ සාකච්ඡාවෙන්, අතුරුදහන් වූ තැනැත්තන් සම්බන්ධයෙන් කටයුතු කිරීමේ ස්ථීර යාන්ත්‍රණයක් සඳහා වූ නිර්දේශ, ශ්‍රී ලංකාවට එරෙහිව ශක්තිමත් වෙමින් පැවැති ජාත්‍යන්තර මතයේ බලපෑම නොතකා සිටීමට තව දුරටත් නොහැකි වන තෙක් වසර 4 ක් මුළුල්ලෙහි කිසිදු අවධානයක් යොමු නොකට පසෙකට දා තිබූ ආකාරය පැහැදිළි වන අතර මෙම ව්‍යාකූලතාව සඳහා වූ බහු විධ හේතු අතුරින් එකක් වූයේ පූර්ව කොමිෂන් සභාවල නිර්දේශ විශ්වාසනීය ආකාරයකින් ක්‍රියාත්මක කිරීම සඳහා වූ ශ්‍රී ලංකාවේ නොකැමත්තයි. උගත් පාඩම් හා ප්‍රතිසන්ධාන කොමිෂන් සභාව ස්ථීර යාන්ත්‍රණයක් ඉල්ලා සිටිය විටදී, පරණගම කොමිසම පත් කිරීමෙන් රජය ඊට ප්‍රතිචාර දැක්වූ අතර ජිනීවාහිදි ඒ සඳහා ප්‍රතිඥාවක් ලබා දීමට ශ්‍රී ලංකාව සූදානම් වෙමින් සිටින විටදීත් එම කොමිෂන් සභාව අතුරුදහන්වීම් විමර්ශනය කරමින් තිබුණි. තමන්ගේම

කොමිෂන් සභාවල නිගමන හා නිර්දේශ බලාත්මක කිරීමට සියලු රජයන්ගේ උදාසීන ප්‍රවේශය මෙමගින් පෙන්නුම් කරයි.

974. ස්ථිර යාන්ත්‍රණයක් ස්ථාපිත කිරීම ඉල්ලා සිටි ශ්‍රී ලංකාව ද පාර්ශවයක් වූ යෝජනා සම්මතයෙන් පසුව පවා, අතුරුදහන් වූවන් පිළිබඳ කාර්යාලය ක්‍රියාත්මක වීමට වසර තුනකට ආසන්න කාලයක් ගත විය. කොමිෂන් සභාවට පැමිණි පළිහක්කාර හා ඔස්ටින් ප්‍රනාන්දු වැනි සාක්ෂිකරුවන් රාජ්‍ය යාන්ත්‍රණය ක්‍රියාත්මක වීමේ කුසීත ආකාරය මෙම මන්දෝත්සාහීබවට හේතුව වශයෙන් දක්වන ලදි. එසේ වුවත් එවකට සිටි අග්‍රාමාත්‍යවරයා සහ විදේශ කටයුතු අමාත්‍යවරයා ප්‍රමාද වී හෝ අතුරුදහන් වූවන් පිළිබඳ කාර්යාලය ස්ථාපිත කිරීමේ නීතිය සම්මත කර ගැනීම සඳහා කටයුතු කල බව ඔවුන්ගේ ගෞරවය පිණිස මෙහි ලා සඳහන් කළ යුතුය.

975. සාක්ෂි සම්බන්ධයෙන් අප ඇඟවීම් සිදු කරනුයේ, මෙම සියලු සාක්ෂිකරුවන්ට වේදනාවෙන් දරා සිටීමට සිදු වූ අතිශය කටුක දුෂ්කරතා සහ අමිහිරි අත්දැකීම් නොතකමින් සිය ජීවිත ගමනේ ඉදිරියට යාමට සාක්ෂිකරුවන්ගේ අතිප්‍රසාරී කැමැත්ත ඉන් පිළිබිඹු වන නිසාය.

හිටපු සටන්කාමීන්ගේ සාක්ෂි

976. ඔවුන්ගේ සාක්ෂි ද දෙවන අතුරු වාර්තාවේ IV වන පරිච්ඡේදයේ සිදුවීම් වූ පිළිවෙළින් වාර්තා කර ඇත. ඔවුන් සියලු දෙනාම උතුරු පළාතේ සිට බොහෝ දුර බැහැර ගෙවා කොළඹට පැමිණ මෙම කොමිෂන් සභාව ඉදිරියේ සිය ඉදිරිපත් කිරීම් සිදු කරන ලදී. සෙල්වනායගම් ආනන්දවර්නන් හෙවත් අරවින්ද හිටපු එල්ටීටීඊ සටන්කරුවක වන අතර අන්තිමේදී ඔහු අත් අඩංගුවට ගෙන ශ්‍රී ලංකා අධිකරණයක් මගින් වරදකරු කර තිබුණි. යුද්ධයේ අවසන් භාගයේදී එදිරිවාදිකම්වලට සහභාගි වූ බවට ඔහු සාක්ෂි දුන් අතර යුධ සමය තුළ රජයේ පාර්ශවයෙන් සටන් වැදුණු ආකාරය ඔහු විස්තර කළේය. පරීක්ෂණ කොමිෂන් සභාවක් ඉදිරියේ ඔහු සාක්ෂි දුන් පළමු අවස්ථාව මෙය බව ප්‍රකාශ කළ අතර තමන්ට සහ අනෙකුත් මිනිසුන්ට තුවාල සිදු කරමින් එල්ල වූ ෂෙල් වෙඩි ප්‍රහාර පිළිබඳ විස්තර ඉදිරිපත් කළේය. උසාවියේ ඔහුට එරෙහි නඩු විභාගය පැවැතෙද්දී ඔහු මේ සියල්ල පැවැසූ බවක් නොපෙනේ. මහාධිකරණ විනිසුරු තුමා පවසා ඇත්තේ "නිදහස් කිරීමම ඔබට සිදුවන ඉතාමත්ම හොඳ දෙයක්" යන්නයි.

977. ඔහුගේ සාක්ෂියේදී හිටපු එල්ටීටීඊ සාමාජිකයකන්ට ආරෝපණය කර ඇති අපකීර්තිය නිසාවෙන් තමන් අත් විඳින සමාජ අසාධාරණත්වය පිළිබඳ ඇඟවීමක් ඔහු සිදු කළ අතර හිටපු සටන්කරුවන්ගේ ජීවිත වටා ඇති සමාජ බහිෂ්කරණය ඔහුගේ බලවත් කණස්සල්ලට හේතු වී තිබුණි. යුද්ධයේදී ඔහු සමග එක්ව සටන් කළ මියගිය එල්ටීටීඊ සාමාජිකයන් සඳහා සිහිවටන නිර්මාණය කිරීම ගැන ඔහු සඳහන් කළ අතර තවද යුද්ධයේ මියගිය මිනිසුන් සිහිවීම පිණිස සිහිවටන නිර්මාණය කිරීම වෙනුවෙන් අදහස් දැක්වීය.

978. යුද්ධයෙන් මියගිය අය අනුස්මරණය කිරීමට අවසර දිය යුතු බවට මෙම සාක්ෂිකරුවන් කණ්ඩායම එක හඬින් ඉල්ලීම් සිදු කළ අතර එක් සාක්ෂිකරුවකු පැවසුයේ " සියලු තුවාල යළි පෑරවීම නොකළ යුතුයි.. යුද්ධයට පෙර අපි ඇත්තෙන්ම අවිහිංසාවට යොමුව සිටියෙමු....."

979. හිටපු සටන්කාමීන් තම ජීවිතයේ මුහුණ දෙන දුෂ්කරතා පිලිබඳව සඳහන් කළ හිටපු කාන්තා සටන්කාරියක ද වූවාය. මෙම කණ්ඩායමේ සාක්ෂිකරුවන් කිසිවෙකුට හෝ මේ රට තුළ නැවත ප්‍රචණ්ඩත්වය හිස ඔසවනු දැකීමට අවශ්‍ය නොවූ බව විශේෂයෙන් සඳහන් කළ යුත්තකි. ඔවුන්ට අවශ්‍ය වූ සහ ප්‍රකාශ කළ එකම දේ වූයේ සාමයේ උදාවයි.

980. මෙම අවස්ථානුගත තත්ත්වයන් තුළ මෙම කොමිෂන් සභාව නිර්දේශ කරනුයේ මෙම හිටපු සටන්කාමීන්ට ජීවනෝපාය මාර්ග සහ රැකියා අවස්ථා සැපයීම මගින් ආන්තිකකරණය සහ සමාජ අපකීර්තිය පිළිබඳව පැමිණිළි කරන ඔවුන්ගේ මෙම අවාසනාවන්ත තත්ත්වය සම්බන්ධයෙන් නිසි ක්‍රියාමාර්ග ගත යුතු බවයි.

981. සැමරුම් සිහිවටන සම්බන්ධයෙන් සිය නිර්දේශ මෙම අවසන් වාර්තාවේ වෙනත් කොටසක සිදුකිරීමට කොමිෂන් සභාව කටයුතු කරනු ඇත.

982. කොමිෂන් සභාව නැගෙනහිර පළාතේ ද සංචාරය කොට කාත්තන්කුඩියේදී සිය සැසිවාර පැවැත්වූ අතර එහිදී සාක්ෂිදීම පිණිස කළ පොදු ආරාධනයට විශාල ප්‍රතිචාර සංඛ්‍යාවක් ලැබුණි.

සිවිල් සමාජ ක්‍රියාධරයන්ගේ සහ අනෙකුත් පාර්ශවකරුවන්ගේ සාක්ෂි

ආචාර්ය ජෙහාන් පෙරේරා

983. සංක්‍රාන්තික යුක්තිය පිළිබඳ ජාතික උපදේශකයකු වන ආචාර්ය ජෙහාන් පෙරේරා බිම් මට්ටමේදී ප්‍රජා පාදක සංක්‍රාන්තික යුක්තිය පිළිබඳ පුහුණුවීම්වල නිරතව සිටියි. ආචාර්ය පෙරේරාගේ මතය වූයේ වාර්ගික අර්බුදයේ මූල හේතුව දේශපාලනික විනා ජාතීන් අතර පවතින මුල් බැස ගත් වෛරය නොවන බවයි. විස්තරාත්මක ඓතිහාසික දේශපාලන ආඛ්‍යානයක, ඔහු තර්ක කළේ සිංහලයන් සුළුතර මනෝව්‍යාධිය සහිත බහුතරයක් බවත් තමන් පදිංචි ප්‍රදේශවල බහුතරය වන සහ ඉන්දියාවේ දෙමළ ප්‍රජාවට සංස්කෘතික බැඳීම් ඇති දෙමළ ජාතිකයන්ට ආකෘතික සුළු ජාතික මනෝ විහිතයක් නොමැති බවයි.

984. පක්ෂ දේශපාලනය පිළිබඳ සැලකිල්ලක් නොමැතිව තීරණ ගනු ලැබීම සඳහා අවස්ථාවක් උදා කරමින්, බහුතරය විසින් දේශපාලන නායකත්වය කෙරෙහි තබා ඇති අවල විශ්වාසය නිසාවෙන් වාර්ගික ගැටලුවට විසඳුමක් සඳහා වත්මන් තත්ත්වය කාලානුරූපය යන මතය ඔහු ප්‍රකාශ කළේය. යම් ප්‍රමාණයක ස්වයං පාලනයක් ලබා දීමේ අවශ්‍යතාව සහ එබඳු ප්‍රමාණයක ස්වයංපාලනයක් අවසානයේදී වෙනම රාජ්‍යයකට මග පාදන බවට බහුතරයේ ඇති බිය තුලනය කිරීම ඔහු අවධාරණය කළේය.

985. සංක්‍රාන්තික යුක්තියේ කුළුණු හතර වන සත්‍යය, වගවීම, හානිපූරණය සහ ආයතනික ප්‍රතිසංස්කරණවල වැදගත්කම ආචාර්ය පෙරේරා අවධාරණය කළේය. විපාකදායි යුක්ති හා ප්‍රතිසංස්කරණ යුක්ති විකල්ප ඔහු සැලකිල්ලට ගත් අතර ශ්‍රී ලාංකික සංදර්භය තුළ ප්‍රතිසංස්කරණ යුක්තිය වඩා උචිත බව ප්‍රකාශ කළේය. සඵල ප්‍රතිසන්ධාන ක්‍රමවේදයක් සත්‍යය හා පශ්චාත්තාපය සඳහා විධිවිධාන සැලසියු යුතු බව ඔහු අවධාරණය කරයි.

986.හානිපූරණය පිළිබඳ විකල්ප ක්‍රමවේද ගවේෂණය කිරීමේ වැදගත්කම පිළිගන්නා අතරම උගත් පාඩම් සහ ප්‍රතිසන්ධාන කොමිෂන් සභාව විසින් නිර්දේශ කරන ලද පරිදි සැමරුම් දින නම් කිරීමේ වැදගත්කම ඔහු අවධාරණය කළ අතර උගත් පාඩම් සහ ප්‍රතිසන්ධාන කොමිෂන් සභාවසභාවේ නිර්දේශ සැබෑ හැඟීමෙන් යුතුව ක්‍රියාත්මක කරනු ලැබුවහොත් ප්‍රතිසන්ධාන ක්‍රියාවලිය සඳහා ඉතා ප්‍රතිඵලදායක වනු ඇතැයි පැහැදිළි කළේය. සත්‍ය සෙවීම සහ සමාජ කැපවීමට අදාළව හානිපුරණයේ වැදගත්කම ඔහු පහදා දුන්නේය.

987. ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යොදා ගැනීම තාවකාලිකව කල් දැමීමකට පක්ෂපාතිව කරුණු දක්වන ආචාර්ය පෙරේරා ඇප ලබා දීම සහ නඩු විභාග කඩිනමින් අවසන් කිරීමේ විධිවිධාන සහතික කිරීම පිණිස එම පනත පරිච්ඡින්න කිරීම හෝ සංශෝධනය කිරීම යෝජනා කරයි. කඩිනමින් පළාත් සභා මැතිවරණය පැවැත්වීම; සංකේතාත්මක නඩුවලට අදාළව විමර්ශන හා නඩු පැවැරීම, ආගමික හා වාර්ගික සුළුතර කොටස්වල සාධාරණව නියෝජනයක් ඇතුලත් කිරීම පිණිස ඓතිහාසික ස්මාරක සඳහා කාර්යසාධක බලකාය ප්‍රතිසංස්ථාපනය; ඉඩම් නිදහස් කිරීමට අදාළ ගැටලු විසඳීම; රාජ්‍ය නොවන සංවිධාන මහලේකම් කාර්යාලය ආරක්ෂක අමාත්‍යාංශයේ විෂය පථයෙන් ඉවත් කිරීම; මිශ්‍ර සමානුපාතික නියෝජන ක්‍රමයක් යටතේ මැතිවරණ පැවැත්වීම; අවම වශයෙන් 1/3 ක කාන්තා නියෝජනයක් සහතික කිරීම; පළාත් සභා ක්‍රමවේදය ශක්තිමත්

කිරීම; කොවිඩ් මරණවලට අදාළව මුස්ලිම් භූමදාන සම්බන්ධ තීරණය යළි සලකා බැලීම; ආයතනික ප්‍රතිසංස්කරණ හා භාෂා අන්තර්ගතභාවය ආදියට පක්ෂපාතිව ඔහු කරුණු දැක්වීය.

988. විශේෂයෙන්ම, ශ්‍රී ලංකා සංදර්භය තුළ ගැටුමේ අවස්ථානුගත තත්ත්වයන් සහ ඒවායේ ප්‍රතිඵල ලෙස ඇති වූ ගැටලුවලදී, ප්‍රතිසන්ධානය කරා දඩුවම් නොපැමිණීමේ ප්‍රවේශයක් වඩාත්ම උචිත බව ආචාර්ය පෙරේරා ප්‍රකාශ කළේය.

මහාචාර්ය ඒ.සරවේස්වරන්ගේ කරුණු දැක්වීම

989. කොළඹ විශ්වවිද්‍යාලයේ නීති පීඨයේ ජ්‍යෙෂ්ඨ ආචාර්යවරයකු වන මහාචාර්ය සරවේස්වරන්, මෙම කොමිෂන් සභාව ඉදිරියේ සාක්ෂි ලබා දෙමින් කරුණු ගණනාවක් සම්බන්ධයෙන් අදහස් පළ කළ අතර සන්නද්ධ ගැටුමකින් පසුව සමාජයක් ගමන් කළ යුතු දිශාවට අදාළව කරුණු 17 කෙරෙහි ඔහුගේ කරුණු දැක්වීම කේන්ද්‍ර ගත කළේය. නිරායුධකරණය (Disarmament), සේනා විමුදනය (Demobilization) සහ R අකුරෙන් කියවෙන කරුණු 6 ක් එනම් හානිපූරණය, නැවැත පදිංචි කිරීම, පුනරුත්ථාපනය, යළි සමාජගත කිරීම, ප්‍රතිසන්ධානය සහ නැවත ගොඩනැගීමෙන් සමන්විත "DDR" යන සංකල්පය ඔහු අවධාරණය කරන ලදී.

990. තව දුරටත් කරුණු දක්වමින්, පශ්චාත් ගැටුම් සමයකට සත්‍ය සෙවීම, නඩු පැවැරීම්, හානිපූරණ සහ ආයතනික ප්‍රතිසංස්කරණවලින් සමන්විත "සංක්‍රාන්ති යුක්තියේ" වැදගත්කම ඔහු අවධාරණය කළේය. සත්‍ය සෙවීය යනු මානව හිමිකම් නීතියේ සහ ජාත්‍යන්තර මානුෂීය නීතියේ බරපතල උල්ලංඝනයවීම් සිදුකර ඇත්දැයි සොයා බැලීමයි. ඉහතින් සඳහන් කළ උල්ලංඝනය කිරීම් පිළිබඳ විමර්ශනය කිරීම පිණිස, වින්දිතයන්ගේ නියෝජිතයන්ගේ අදහස් විමසා වැරැදිකරුවන්ට එරෙහිව නෛතික ක්‍රියාමාර්ග ගැනීම අවශ්‍ය වන්නා වූ ස්වාධීන යාන්ත්‍රණයක් ස්ථාපිත කළ යුතු බව මහාචාර්යවරයා යෝජනා කළේය.

991. ආරක්ෂක හමුදා යාපනයේ පුද්ගලික ඉඩම්වල රැඳී සිටීමේ ගැටලුව සම්බන්ධයෙන්ද උගත් මහාචාර්යවරයා සඳහන් කළේය. එම ඉඩම් ඒවායේ අයිතිකරුවන්ට නිදහස් කළ යුතු බව මහචාර්යවරයාගේ අදහස විය. නැගෙනහිර පළාතේ ඇතැම් ඉඩම් නිදහස් කර ඇතත්, එම ක්‍රියාදාමය ඉතා මන්දගාමී බව ඔහු කියා සිටියේය.

992. වාර්ගික ගැටලුව සඳහා දේශපාලන විසඳුමක් ලෙස පෙඩරල් ක්‍රමය මහාචාර්යවරයා යෝජනා කරන ලදී. කෙසේ වෙතත්, "පෙඩරල්වාදය" යන දේශපාලන න්‍යාය "බෙදුම්වාදය" ලෙස ශ්‍රී ලංකාව තුළ වරදවා වටහා ගෙන ඇත. මහාචාර්යවරයාට අනුව, නිදහස ලැබූ දා සිට දෙමළ ජනතාව ඉල්ලා ඇත්තේ පෙඩරල් ක්‍රමයකි. බෙල්ජියම හා ස්විට්සර්ලන්තය යන ශ්‍රී ලංකාවටත් වඩා කුඩා රටවල් මෙම පෙඩරල් ක්‍රමය යොදා ගෙන ඇත. ශ්‍රී ලංකාවට අදාළ කර ගත හැකි අනන්‍ය ආකෘතියක් නිර්මාණය කිරීම වටී. එය සීමිත පොලිස් බලතල හා ව්‍යවස්ථාදායක බලතල සඳහා විධිවිධාන සලසන බැවින් මෙය දැනට පවතින 13වැනි සංශෝධනයට අනුකූල වේ. 13 වන සංශෝධනය පූර්ණව ක්‍රියාත්මක කිරීමට පක්ෂව මහාචාර්යවරයා කරුණු දැක්වීය.

993. භාෂා අයිතිවාසිකම් ගැටලුව පිළිබඳව ද මහාචාර්ය සරවේස්වරන් පැහැදිලි කළේය. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 13 වැනි සහ 16 වැනි සංශෝධනයන්ට අනුව, දෙමළ භාෂාව ද රාජ්‍ය භාෂාවක් වී තිබේ. සිංහල දැනටමත් රාජ්‍ය භාෂාවක් වන අතර ඉංග්‍රීසි භාෂාව සන්ධාන භාෂාවකි. කෙසේ වෙතත්, භාෂා අයිතීන් පූර්ණව ක්‍රියාත්මක නොකරන නිසා, ඒවා පූර්ණව ක්‍රියාත්මක කිරීමට පියවර ගත යුතුය. රාජ්‍ය සේවයේ සිටින නිලධාරීන්ට ද්විභාෂා ප්‍රවීණතාව තිබිය යුතුය.

994. සාම අධ්‍යාපනය ශ්‍රී ලංකාවේ අධ්‍යාපන පද්ධතියේ කොටසක් විය යුතු බව මහාචාර්යවරයා ප්‍රකාශ කළේය. මානව හිමිකම් නීතිය, මානුෂීය නීතිය සහ සාම අධ්‍යයනය පිළිබඳ වැඩසටහන් හමුදාවේ නිලධාරීන් වෙනුවෙන් ද පැවැත්විය යුතුය. ඒවා බන්ධනාගාර නිලධාරීන් හා පොලිස් නිලධාරීන් සඳහා ද ඒවා අඛණ්ඩව පැවැත්විය යුතුය.

995. විද්වතුන් සහ වෙනත් සාක්ෂිකරුවන් රැසක් සිටි අතර ඔවුන්ගේ සාක්ෂි අවසන් වාර්තාවේ දෙවන වෙළුමේ අන්තර්ගත කරනු ඇත. සංක්‍රාන්තිය යුක්තියේදී යොදා ගැනීමට නියමිත යාන්ත්‍රණය සම්බන්ධයෙන් එම සාක්ෂි දෙක වෙනස් වුව ද, ඉහත සාක්ෂි දෙක තෝරා ගනු ලැබුයේ ඒවා ප්‍රතිසන්ධානය හා සාමය යන ජාතිකව වැදගත් කරුණු ඒකරාශී කරන බැවිනි. ආචාර්ය ජෙහාන් පෙරේරා ප්‍රතිෂ්ඨාපන යුක්තිය වෙනුවෙන් සිය අදහස් දැක්වූ අතර මහාචාර්ය සර්වෙස්වරන් ප්‍රකාශ කළේ දණ්ඩන යුක්ති යාන්ත්‍රණයක් යොදා ගත යුතු බවයි.

996. ඉහත සාක්ෂිවලට අනුව, සාමයේ හා ප්‍රතිසන්ධානයේ යුගයක් උදා කරලීම පිණිස අප යොදා ගත යුත්තේ කවර යාන්ත්‍රණයක් ද යන ප්‍රශ්නය පැන නගී.

සත්‍යය හා යුක්තිය

997. මෙම කොමිෂන් සභාව ඉදිරියේ දැනටමත් ඉදිරිපත්ව ඇති සාක්ෂි පිළිබඳව ආවර්ජනය කිරීමේදී, ඇතැම් සාක්ෂිකරුවන් විපාකදායී යුක්තිය අවධාරණය කළ අතර අනෙක් අය ප්‍රතිෂ්ඨාපන යුක්තිය සෙවූ බව පැහැදිළිය.

998. වෙන්ඩි ලැබ්බෝර්න් සඳහන් කළ විකල්ප ආකෘති අපි සිත්හි තබා ගනිමු;

> නවීන වර්ධනයන් සහ ඒවායේ ප්‍රකාශනය පිළිබඳ අන්තර්දෘෂ්ටික කියවීමකදී, ගෝලීයව සංස්ථාපනය කරනු ලැබූ ආයතන හා යාන්ත්‍රණ දේශීය තත්ත්වයන්හි අවශ්‍යතාවන්ට සෘජුවම අදාළ කර ගැනීම පිණිස, එක හා සමාන ගැටලු සඳහා ප්‍රතිචාරයක් ලෙස නිසැකවම අත්‍යවශ්‍ය වන්නේ ඒවා යොදා ගැනීම බව අතැඹුලක් සේ පැහැදිළිය. අප පෙන්වා දී ඇති පරිදි, කොමිෂන් සභාව ඉදිරියේ සාක්ෂි දුන් බොහෝ සාක්ෂිකරුවන් උචිත ආකෘතියක් සකස් කිරීමේදී සැබෑ වටිනාකමකින් යුත් පර්යාලෝක සහ අන්තර්දෘෂ්ටි ඉදිරිපත් කර තිබේ.

999. පළිගැනීම හෝ ඇසට ඇසක් හෝ දතට දතක් අදහස සඳහා ඉල්ලීමක් නොතිබූ බව අපි නැවත වරක් අවධාරණය කරන්නෙමු. ඊට පටහැනිව, නැවතුණු තැනින් යළි ආරම්භ කරමින් ජීවිතය ඉදිරියට පවත්වා ගෙන යනු පිණිස වත්මන් තත්ත්වයට අනුගත වෙමින් ද්‍රව්‍යමය හා මනෝ සමාජීය යන දෙයාකාර සහාය ලබා ගැනීම ප්‍රමුඛතාව අපේක්ෂාව විය.

1000. මෙය සිත්හි තබා ගනිමින්, සත්‍යය සෙවීමේ ආයතනවල ස්වභාවය සහ විෂය පථය, ශ්‍රී ලංකාව සඳහා සත්‍යය සහ ප්‍රතිසන්ධාන කොමිෂන් සභාවක ප්‍රකාරතාවට අදාළව විකල්ප රාශියකට අපගේ සිත් සතන් යොමු කළෙමු. අප මින් පෙර ද සඳහන් කර ඇති ආකාරයට ක්‍රියාවට නැංවීමට බොහෝ කලක් ප්‍රමාද වී ඇත්තේ මෙම ආයතනයයි.

1001. සම්ප්‍රදායික යුක්තිය මෙන් නොව සංක්‍රාන්තික යුක්තිය අනාගතය වඩා යහපත් ලෙස වෙනස් කිරීමේ ක්‍රම තෝරා ගැනීමට උත්සාහ කරයි. එබැවින් අසමානතාව, වෙනස් කොට සැලකීම, හෝ දණ්ඩ මුක්තිය මෙන්ම ගැටුම් සහ අර්බුදවල මූල හේතු වැනි පද්ධතික ගැටලු අනාවරණය කිරීමට සංක්‍රාන්තික යුක්තියට හැකිය. එහෙයින් ව්‍යුහාත්මක ප්‍රචණ්ඩත්වයේ විෂම චක්‍රය බිඳලීමේ ආරම්භයේ එය තිබිය හැකිය. කෙසේ වෙතත්, සංක්‍රාන්තික යුක්තිය මගින් පමණක් මෙම වෙනස සාක්ෂාත් කර ගැනීමට නොහැකිය. බිම් මට්ටමේ සිදු කරන කටයුතුවලට ආධාර කිරීමට හා අඛණ්ඩව පවත්වා ගෙන යාමට, අතිරේක සංවර්ධන හා සාමය ගොඩ නැගීමේ ක්‍රියාමාර්ග අවශ්‍ය

කරනු ලැබේ. සංක්‍රාන්තික යුක්ති යාන්ත්‍රණයන්ට ජීවය ලබා දිය හැක්කේ දේශපාලන අභිප්‍රායට හා සුජාතභාවයටය.

1002. ප්‍රමුඛතාව ගත යුත්තේ යුක්තිය කෙරෙහි වූ චින්දිත දිශානත ප්‍රවේශයන්ය. යුක්තිය වරදකරුවන්, චින්දිතයන් හා දිවි ගලවා ගත්තවුන් කෙරෙහි සියලු අවධානය යොමු කළත් යුක්තිය කෙරෙහි වූ ජනතා කේන්ද්‍රීය ප්‍රවේශයක් සඳහා වැදගත් පාඩම් පැහැදිළි කිරීමට සංක්‍රාන්තික යුක්තියට හැකිය.

1003. චින්දිත කේන්ද්‍රීය සංක්‍රන්තික යුක්තියට ක්‍රමානුකූලව චින්දිතයන්ගේ හා දිවි ගලවා ගත්තවුන්ගේ අදහස් විමසා බැලිය හැකි අතර සංක්‍රාන්තික යුක්තියේ අනාගතය සඳහා තීරණාත්මක වන ක්‍රියාදාමයන්ට සහභාගි වීමේ අවස්ථාවක් ලබා දිය හැකිය.

1004. චින්දිතයන්ගේ ප්‍රතිකර්ම ලෙස අපේක්ෂා කරනු ලබන හානිපූරණ පරිවර්තනීය විය යුතු අතර කාන්තාවන්, ළමුන සහ සුළුතර කණ්ඩායම්වල සාමාජිකයන් ඇතුළු චින්දිතයන් විසින් අත් විඳිනු ලැබූ වෙනස්කොට සැලකීමේ සහ ආන්තිකකරණයේ ඡේදන ස්වරූප පිළිබඳ නිසි ක්‍රියාමාර්ග ගත යුතු බව ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාව අවධාරණය කරයි.

1005. සංක්‍රාන්තික යුක්තිය සාමාන්‍යයෙන් "පසුගාමී අවලෝකන" සහ "ඉදිරි අවලෝකන" ලෙස පොදුවේ විස්තර කෙරේ. මින් ප්‍රකාශ කරන අදහස වනුයේ සංක්‍රාන්තික යුක්ති ක්‍රියාදාමයන්හි අරමුණ වන්නේ අතීතය සම්බන්ධයෙන් කටයුතු කිරීම පමණක් නොව සංක්‍රාන්තික තත්ත්වය පරිණාමනය කිරීමය බවයි. එබැවින්, විකල්පයන් තේරීම සිදු කරනු ලබන්නේ අතීත අසාධාරණයන්ට අදාළව පමණක් නොව ඇතැම් සංක්‍රාන්තික යුක්ති ඉලක්ක සපුරා ගැනීමේ ක්‍රමවේදයක් ලෙසයි. මෙම ඉලක්ක අතුරින් වඩාත්ම වැදගත් ඉලක්කය ලෙස සාමාන්‍යයෙන් සලකනු ලබන්නේ 'යුක්තිය', 'සත්‍යය', 'ප්‍රතිසන්ධානය' සහ 'සාමයයි. මේවා ගැටුමකින් එළියට පැමිණි රාජ්‍යයන්ගේ හර වටිනාකම්වලින් සමන්විත වේ.

මෙම ඉලක්ක එකිනෙක සමග සබඳතාව

1006. මෙම සංක්‍රාන්තික යුක්ති ඉලක්ක අතර සබඳතාව වෙනස් ප්‍රතිඵල සහිත විවිධ ක්‍රමවලින් විශ්ලේෂණය කර තිබේ. 1990 ගණන්වලදී, දකුණු අප්‍රිකාවේ වර්ණභේදවාදී ප්‍රතිපත්තිය සම්බන්ධයෙන් කටයුතු කිරීමේදී, ඒ වන විට පැවැති මතය වූයේ 'සාමය' වෙනුවෙන් ගෙවිය යුතු මිල වනුයේ දඩුවම් කිරීම අත්හැර දැමීම- එනම් 'යුක්තිය' බවයි. දකුණු අප්‍රිකාවේ සත්‍යය සහ ප්‍රතිසන්ධාන කොමිෂන් සභාවේ කාර්යය වූයේ 'සත්‍යය' අනාවරණය කර ප්‍රසිද්ධියට පත් කිරීම සහතික කිරීමයි, මෙම සත්‍යය නොමැතිව 'ප්‍රතිසන්ධානය' සහ 'සාමය' කිසිසේත් ඇති කර ගැනීමට නොහැකි බව විශ්වාස කරනු ලැබීය. සත්‍ය වශයෙන්ම කොමිෂන් සභාවේ පණිවිඩය වූයේ 'සත්‍යය නොමැතිව ප්‍රතිසන්ධානයක් නොමැත' යන්නයි.

1007. කෙසේ වෙතත් එවක් පටන්, ඉදිරියට පැමිණ ඇති මතය වන්නේ 'ප්‍රතිසන්ධානය', 'සාමය' සහ 'යුක්තිය' අන්‍යෝන්‍ය වශයෙන් අනන්‍ය නොවන බවත්, සංක්‍රාන්තියේ ඉලක්ක විය යුත්තේ 'සාමය සහ යුක්තිය' බවත් ය. මෙය පොළඹවනු සුලු තර්කයක් වේ.

1008. හුදෙක්ම එදිරිවාදිකම් නැවැත්වීමට වඩා වැඩි යමක් නියෝජනය කිරීම පිණිස එක් අතකින් සාමය සහ යුක්තියේ පූර්ණ අර්ථයෙන් සහ නඩු විභාග මගින් දණ්ඩනීය යුක්තිය අනෙක් අතින් ගත් කළ, ඒවා එකිනෙකට විරුද්ධ හෝ පරස්පර විරෝධී විය නොහැකිය. වඩා නිවැරැදිව පවසන්නේ නම්, ඒවායේ පූර්ණ පුළුල් අර්ථයෙන් ගත් කළ, සාමය හා යුක්තිය අනහෝසිකර ලෙස අන්තර් බන්ධිත, අන්‍යෝන්‍ය පරායත්ත සහ අන්‍යෝන්‍ය වශයෙන් සවිබල ගන්වන සුළු වන අතර එකවර ක්‍රියාවේ යෙදවිය හැකිය හා යුතුය. ප්‍රතිසන්ධානය යන්නට බොහෝ අර්ථයන් තිබෙන්නේ වුව ද, සාමය සහ යුක්තිය අතර, අතීතය සහ අනාගතය අතර පරතරයක් නිරූපණය කරයි. එවැනි අයැදීමකට අපේක්ෂිත ප්‍රතිඵල උදා කර දිය හැක්කේ සත්‍ය සෙවීමේ යාන්ත්‍රණයකින් පමණි.

දේශපාලන අභිප්‍රාය නොමැති වීමෙන් සහ යුක්තිය පිළිබඳ සංකල්පය පිළිබඳ දුර්මතය නිසාවෙන් පෙර කොමිෂන් සභාවල නිර්දේශ ක්‍රියාත්මක කිරීමේ පළමු පියවරේදී අප දුබල වී ඇති බැවින් වගවීම සාක්ෂාත් කර ගැනීමේදී අපට අපේක්ෂිත ඉලක්කය ළඟා කර ගැනීමට නොහැකි වී ඇත.

1009. හානිපූරණය ප්‍රදානය කිරීම චින්දිතයා අයුක්තියකට ලක්ව ඇති බව හෝ ඉන් පීඩාවාව පත්ව ඇති බව පිළිගැනීමක් සහ හානිපූරණ ප්‍රතිකර්මය තවත් ආකාරයක් යුක්තියක් බැවින් හානිපූරණ යුක්තිය, යුක්තිය පිළිබඳ සාමාන්‍ය මතය මුළුමණින්ම නිශේධනය නොකරයි. සංක්‍රාන්තික යුක්තිය පිළිබඳ වත්මන් පරිවයන් යුක්ති යාන්ත්‍රණ සහ ක්‍රියාදාම පිළිබඳ නව ගම්‍යාර්ථයන් නිර්මාණය කිරීම මගින් දැනටමත් සිදු කර ඇති දෙයක් නැවැත කිරීමට කාලය කා දැමීමක් බවට කෙනෙකුට තර්ක කළ හැක්කේ එම පදනමෙනි. භාවිතයේදී, හානිපූරණ යුක්තිය නඩු විභාග සහ සත්‍යය කොමිෂන් සභා ඇතුළු සංක්‍රාන්තික යුක්තියේ දැනට පවතින සියලු ක්‍රමවේද බැහැර නොකරනු ඇත. මෙම ජනාධිපති පරීක්ෂන කොමිෂන් සභාව හමුවේ ඇතැම් සාක්ෂිකරුවන් සාක්ෂිදීමේදී, සැමරුම් ස්මාරක නිර්මාණය කිරීම කිරීම සහ තම ආගමික් වත් පිළිවෙත් හා ඇදහිලි ප්‍රකාරව අවසන් කටයුතු සිදු කිරීමට මියගිය සිරුරු කොටස් නැවත ගොඩගැනීම පවා දැඩි ලෙස ඉල්ලා සිටියහ.

1010. වරදකරුවන්ට දණ්ඩනයක් ඉල්ලා නොසිට හා ඒ වෙනුවට සිහි කිරීම සහ හානිපූරණය සඳහා දැඩිලෙස ඉල්ලීමක් කළ කාත්තන්කුඩියේ දී සියල්ල අභිභවමින් අපට ඇසුණු ඒ ඒකමතික හඬ සංක්‍රාන්තික යුක්තියේ වඩා පෘථුල ප්‍රතිවර්තනවල ආයාචනය යළි පණ ගන්වයි. යාපනයේ තවත් සාක්ෂිකරුවකු දේශපාලනඥයන්ගෙන් හා නායකයන්ගෙන් සමාව ඉල්ලීමක් හා පශ්චත්තාපවීමක් ඉල්ලා සිටි අතර එවැනි ප්‍රසිද්ධ පිළිගැනීමක් එබඳු ආයාචනයකින් සාක්ෂිකරු අදහස් කළ යුක්තියේ ස්වරූපය පෙන්නුම් කරයි. එහෙයින් සංක්‍රාන්තික යුක්තිය සැමරීම, සුව කිරීම, අධ්‍යාපනය, සමාව ඉල්ලීම්, පිළිගැනීම සහ ප්‍රතිඛානය වැනි පුළුල් පරාසයක පිළියම් පිරිනමයි. පසමිතුරුවාදී වින විධිමත් නඩු විභාගයක් මගින් එවැනි ආයාචනයකින් අපේක්ෂිත පිළියම් ලබා ගත නොහැක. අප ඉදිරියේ සිදු කළ මෙම කරුණු දැක්වීම් සැලකිල්ලට ගෙන, යුක්තියේ සියලු ප්‍රතිවර්තන සඳහා වන ආයාචනයක් සිදු කළ හැක්කේ සත්‍ය පිළිබඳ කොමිසමක් බඳු සත්‍ය සෙවීමේ යාන්ත්‍රණයකින් පමණක් බව අප දරන මතය වේ.

1011. මෙම අවස්ථානුගත තත්ත්වයන් තුළ සත්‍යය, යුක්තිය, හානිපූරණය සහ නැවැත සිදු නොවීම සහතික කළ හැක්කේ සත්‍යය හා ප්‍රතිසන්ධාන කොමිෂන් සභාවක් මගින් පමණක් බව අපි දැඩිව විශ්වාස කරන්නෙමු.

1012. අවසාන වශයෙන් හානිපූරණ යුක්තිය, ප්‍රතිසන්ධානය මුදුන්පත් කර ගැනීම සහ ගැටුමේ ප්‍රවණ්ඩ බෙදුම්වලින් පසුව සහභාගිත්ව දේශපාලන ප්‍රජාවක් පුනර්ජනනය සඳහා පදනම දැමීම සඳහා පුළුල් සංකල්පීය රාමුවක් සහ ප්‍රායෝගික, අදාළ කර ගත හැකි න්‍යාසයක් සපයයි. බොහෝ පශ්චාත් ගැටුම් සමාජයන්හි විවිධාකාර සහ බොහෝ විට නොසලකා හැර ඇති අවශ්‍යතාවලට ප්‍රතිචාර දැක්වීම පිණිස වඩා පුළුල්, වඩා යථාර්තවාදී හානිපූරණ රාමුවක අවශ්‍යතාව එය අවධාරණය කරයි. මෙම හානිපූර්ණ ප්‍රවේශයෙහි, ගැටුමේදී දිවි ගලවා ගත් සියලු දෙන අතර සහ ඇතුලත්වන්නා වූ ප්‍රතිසන්ධානයේ මෙම වඩා පුළුල් අවශ්‍යතාව සමග එකේළි වෙමින් වඩා කල් පවතින සහ ස්ථාවර සාමයන් සපුරා ගැනීම පිණිස සංක්‍රාන්තික යුක්ති යාන්ත්‍රණ ක්‍රියාවෙහි යොදවනු ඇත. එම තර්කනය සිත්හි දරා ගනිමින් නිර්දේශ හා ඉදිරි ගමන්මග පිළිබඳ ඊළඟ පරිච්ඡේදය කරා අපි පිවිසෙන්නෙමු.

6 වන පරිච්ඡේදය

ඉදිරි ගමන් මග සහ නිර්දේශ

1. හැඳින්වීම

1013. මෙම ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාව එය හමුවට පැමිණි සාක්ෂිකරුවන්ගේ සාක්ෂිවල ආවර්ජක විශ්ලේෂණයක් පොදුවේ සිය අවසාන නිරීක්ෂණවල දැනටමත් කෙටියෙන් දක්වා ඇත. එය සමාජයේ සියලු ස්ථරයන්ගේ පුළුල් ආවලියක් බව අප නිරීක්ෂණය කර ඇත්තෙමු. වාචික ප්‍රකාශ ලබා ගැනීම සහ තොරතුරු විමසීම සිදුකළේ ගැටුමේ විත්දිතයන්ගේ පවුල්, හිටපු එල්ටීටීඊ සටන්කරුවන්, සිවිල් සමාජ සංවිධාන, මත නිර්මාණය කරන්නන්, විද්වතුන් සහ විෂය ප්‍රවීණයන්, පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් සහ රාජ්‍ය නිලධාරීන්, තානාපති නිලධාරීන්, විදේශීය සාක්ෂිකරුවන්, ගරුතර ආගමික නායකයන් සහ අනෙකුත් පාර්ශවකරුවන්ගෙනි. යාපනය, කිලිනොච්චිය, කාත්තන්කුඩි සහ මඩකලපුවේදී පැවැති අපගේ මහජන අදහස් විමසීම්වලදී විත්දිතයන්ගේ පවුල්වල අය සාක්ෂි දුන් අතර අනෙකුත් ප්‍රකාශ ලබා ගත්තේ කොළඹ පැවැති මහජන අදහස් විමසීම්වලින් සහ විදේශයන්හි සිට ශ්‍රව්‍ය දෘෂ්‍ය සබැඳි මගිනි. යාපනයේ සිට පැමිණි හිටපු එල්ටීටීඊ සටන්කරුවන් කොළඹ පැවැති සභා රැස්වීම්වලදී සාක්ෂි දුන්නේය.

1014. 4 වන පරිච්ඡේදයේ පල වී ඇත්තේ ඉහත සාක්ෂිකරුවන්ගේ සහ උපදේශාර්ථීන්ගෙන් සාක්ෂිවල විශේෂයෙන් වැදගත් වන කරුණුවල සංක්ෂිප්ත සහ ලුහුඬු සාරාංශයක් වන අතර එක් එක් සාක්ෂිකරුගේ විස්තීරණ සහ පූර්ණ වාචික ප්‍රකාශ මෙම අවසන් වාර්තාවේ දෙවන වෙළුමේ පල කරනු ඇත.

1015. 5 වන පරිච්ඡේදයෙහි, අපගේ නිර්දේශ සහ ඉදිරි ගමන් මග පිළිබඳ සාකච්ඡාව සඳහා පදනම අප දැමූ අතර අප මෙම පරිච්ඡේදයට පැමිණියේ එහි ඇති අපගේ නිර්දේශ සහ ඉදිරි ගමන් මගට අදාළ සාක්ෂිවල වැදගත් කොටස් අවධාරණය කිරීමෙන් පසුවය. අප ක්‍රියාවට නැංවීමට බැඳී ඇති කොමිෂස් සභාවේ තාර්ය භාරය, එනම් පෙර කොමිෂන් සභා ජාත්‍යන්තර මානුෂීය නීතිය හෝ ජාත්‍යන්තර මානව හිමිකම් නීතිය උල්ලංඝනය කිරීම් හෝ විය හැකි උල්ලංඝනය කිරීම් සොයා ගත්තේ ද යන්න අප පූර්ණව සිත්හි දරා ගත්තෙමු. එසේ වී ඇත්නම්, පූර්ව නිර්දේශ මුළුමණින්ම ක්‍රියාවට නැංවුයේ ද යන්නට අදාළව විධි නියෝගයේ ඊ ළඟ ප්‍රශ්නය ඇසීමට අපට සිදු වේ. එය විශ්වසනීය හා සැබෑ ක්‍රියාත්මක කිරීමක කොන්දේසි සහිත බව පූර්වකල්පනය කරයි. පෙර පරීක්ෂණ කොමිෂන් සභාවල නිර්දේශ විශ්වසනීයව ක්‍රියාත්මක කළේ ද යන්න සම්බන්ධයෙන් අපි 5 වන පරිච්ඡේදයේ නිගමනය කරනු ලැබුයේ ඒවා ක්‍රියාත්මක නොවීමට සාධක කිහිපයක් දායක වූ බවයි. කෙසේ වුවත්, පෙර පරීක්ෂණ කොමිෂන් සභාවල නිර්දේශ ක්‍රියාත්මක කිරීම පිළිබඳ ප්‍රශ්නය මෙම අවසන් වාර්තාවේ 3 වන පරිච්ඡේදයේ III වන කොටසෙහි සාකච්ඡා කරනු ලබයි.

1016. පෙර කොමිෂන් සභාවල නිර්දේශ පූර්ණව බලාත්මක කර නොමැති නම්, ගනිමින් සිටින පියවර සැලකිල්ලට ගනිමින් නිර්දේශ ඉදිරිපත් කිරීමට ද අපට බලය පවරා ඇත. මෙම විධි නියෝගයේ සීමාවන් තුළ අප සැමවිටම කටයුතු කර ඇති අතර කඩිනමින්ම අප අපගේ නිර්දේශ ඉදිරිපත් කරන නමුත් එසේ කරනුයේ මෙම පරිච්ඡේදයේ අඩංගු කර ඇති යෝජිත ඉදිරි ගමන් මග සඳහා තාර්කිකය සහ හේතු අප ලබා දීමට පෙර නොවේ.

1017. අපගේ නිර්දේශ සිදු කිරීම සහ ඉදිරියට යාමට ගත යුතු මග නිර්දේශ කිරීම පිණිස අප පහත දැක්වෙන නිරවශේෂ නොවන මූලාශ්‍ර ලැයිස්තුව ප්‍රයෝජනයට ගන්නා ලදී.

- පළමුව, මෙම ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාවේ බලය සහ ඊට පවරන ලද රාජකාරී
- දෙවනුව, පරීක්ෂණ කොමිෂන් සභාව ඉදිරියේ සාක්ෂිකරුවන්ගේ ප්‍රකාශ සහ අදහස් විමසීම්
- තෙවනුව, පෙර පරීක්ෂණ කොමිෂන් සභාවල නිර්දේශ
- සිව්වනුව, පෙර පරීක්ෂණ කොමිෂන් සභාවල නිර්දේශ ක්‍රියාත්මක නොකිරීම
- පස්වනුව, ජාත්‍යන්තර මූල ලේඛන, මාර්ගෝපදේශ, ප්‍රඥප්ති, මූලික මූලධර්ම සම්මත සහ
- සයවනුව, සංක්‍රාන්තික යුක්ති මූලධර්ම සහ මාර්ගක

1018. ඉදිරි ගමන් මග නිර්දේශ කිරීමේ කාර්ය ඉටු කිරීමේදී, සමහර සාක්ෂිකරුවන්ගේ ප්‍රකාශවල සංවේගය සහ අපේක්ෂා භංගත්වය පිළිබඳ ලකුණු මුල් සාක්ෂි ලබා ගැනීමේ දී අපට අනාවරණය වූ අතර සත්‍යය හා වගවීම සඳහා වන සෙවුම මෙතෙක් සපුරා ගෙන නොමැති බවට වූ ස්ථීර නිගමනයකට අපි එළඹුනෙමු. අතීතය සම්බන්ධයෙන් කටයුතු කිරීම හා බරපතල උල්ලංඝනය කිරීම්වල වින්දිතයන්ට එම අප්‍රසන්න අත්දැකීම නිමාවකට ගෙන ඒම පිණිස ඔවුන් උදක්ම ඉල්ලා සිටි සහතික කරන ලද සත්‍යය වෙත අයිතිය පූර්ණව තහවුරු කර පෙන්වීම තීරණාත්මක විය. ඇත්තෙන්ම කොමිෂන් සභා අතිරික්තයක් තිබූ නමුත් විශ්වසනීය සත්‍ය සෙවීමකට අවස්ථා තිබුයේ ඔවුනට ළඟා වීමට නොහැකි තරම් දුරිනි. සාක්ෂිකරුවන් කිහිප දෙනෙකුගේ ප්‍රකාශවල වැදගත්කම අවධාරණය කළ මෙම අප්‍රකාශිත ප්‍රධාන පූර්ව ප්‍රකාශ පිළි ගනු ලැබ, අපගේ දෙවන අන්තර්කාලීන වාර්තාවේ විශ්වසනීය සත්‍යය සෙවීමේ යාන්ත්‍රණයක් අපි යෝජනා කළෙමු. එවැනි යාන්ත්‍රණයක භාවාර්ථය බොහෝ දෙනෙකුගේ පිළිගැන්මට ලක් වීමෙන් අප උනන්දුවට හා ධෛර්යයට පත් වූ බව හැඟෙන අතර එය ප්‍රමාදව ඇතත්, ඒ සම්බන්ධයෙන් කටයුතු කිරීම පිණිස කාලය හා අවකාශය ශ්‍රී ලංකාවට ලබා දිය යුතුය යන්නට කිසිවෙකු අකැමැත්තක් නොදක්වනු ඇත. ඇත්තෙන්ම, අප අනාවරණය කළ පරිදි, සංක්‍රාන්ති යුක්ති යාන්ත්‍රණ ගැටුමකින් පසුව කඩිනමින් ආරම්භ කළහොත් වඩා යෝග්‍ය වන නමුත් ඉතා දිගු කාලයක් ගතවීමෙන් පසුව පවා එය ආරම්භ කළහොත් එය සම්පූර්ණයෙන්ම ඒ කාල සමයට නොගැලපීමක් නොවනු ඇත. ගැටුම දුරස්ථ මතකයක් බවට පත්ව කෙතරම් කාලයක් ගතව ඇතත්, සත්‍යය සොයා යාම අප ජනතාවගේ සිත් තුළ තවමත් තදින්ම මුල් බැස පවතින අතර, මතකයන් අමිහිරි වුවත් අතීතය කටුක වුවත් පෙර පරිද්දෙන්ම ඒ පිළිබඳ නැවුම් බලාපොරොත්තු සිත් තුළ පිරී පවතී. 5 වන පරිච්ඡේදයේදී අප සිහිපත් කළ පරිදි, අපගේ දෙවන අතුරු වාර්තාවේ විශ්වසනීය සත්‍ය සෙවීමේ යාන්ත්‍රණයක් නිර්දේශ කිරීම කරා අප මෙහෙයවුයේ කිලිනොච්චියේ සාක්ෂිකරුවකුගේ හැඟීම්බර කථාව සහ එකමුතුකම හා ප්‍රතිසන්ධානය සඳහා වන ඔහුගේම රාමුව සංක්‍රාන්තික යුක්තියේ උසස් අරමුණු සමග අනුනාද වන අතර සත්‍යය, සුවවීම, ප්‍රතිසන්ධානය සහ සාමය සඳහා මෙරට ජනතාව අතර පවතින අතිප්‍රසාරී හැඟීමයි. සත්‍ය සෙවීමේ යාන්ත්‍රණයෙහි සාක්ෂිකරුවකු අස්වැසිල්ල පතන්නේ එමගින් නම්, වගවීම සඳහා තිබිය හැකි කවර හෝ හැකියායක් අපි බැහැර නොකරන බව මෙම ක්‍රියාදාමය තුළ අප අපටම සිහිපත් කර දෙන්නෙමු. අන් සියල්ලටම වඩා, යෝජිත සත්‍යය සෙවීමේ යාන්ත්‍රණයේ ප්‍රාණය විය යුත්තේ වින්දිත කේන්ද්‍රීයබවයි, එය අන් සියල්ල අභිබවා ඉහළින්ම තිබිය යුතුය.

1019. මෙම ක්‍රියා දාමයේදී අප ගත් ගමන් මගේ ප්‍රභවය අප සාකච්ඡාවට අපි විමසා බලමු.

1020. මින් පෙර අප පෙන්වා දුන් පරිදි, ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාව විසින් පැහැදිළිව ප්‍රකාශ කළ සත්‍යය සෙවීමේ යාන්ත්‍රණය පිළිබඳ සංකල්පය අවංකව හා බලවත් ඕනෑකමින් යුතුව සැලකිල්ලට ගත යුතුය යන්නට ශ්‍රී ලංකා රජය දැක්වූ ක්ෂණික ප්‍රතිචාරය මගින් අප ශාක්තිමත් කරනු ලැබ ඇති බට කොමිෂන් සභාවට හැඟෙන අතර දකුණු අප්‍රිකාව සහ යුරෝපා සංගමය වැනි විදේශීය දූත මණ්ඩල දෙකක කීර්තිමත් තානාපතිවරුන් කොමිෂන් සභාව හමුවේ පෙනී සිට ශ්‍රී ලංකාවෙහිම ඓතිහාසික, දේශපාලනික සහ සංස්කෘතික සංදර්භයෙන් පැන නගින ශ්‍රී ලංකාව

සඳහා සත්‍යය සහ ප්‍රතිසන්ධාන කොමිෂන් සභාවක ශුභාරංචිය පතුරුවාලීම උචිත යැයි සිතීම කොමිෂන් සභාවේ ෙවිශ්වසනීයත්වයට විශාල ලෙස දායක වෙයි. දකුණු අප්‍රිකානු මහකොමසාරිස් සැන්ඩයිල් ඊ. ෂාල්ක් මහතාගේ ප්‍රකාශයෙහි දකුණු අප්‍රිකානු සත්‍යය සහ ප්‍රතිසන්ධාන කොමිෂන් සභාවේ සම්භවය සහ පුරෝගාමී ස්වරූපය සම්බන්ධයෙන් විස්තරාත්මකව කරුණු ඉදිරිපත් කළ අතර යුරෝපා සංගම් දූත මණ්ඩල නියෝජ්‍ය ප්‍රධානී ලාර්ස් බ්‍රෙඩල් මහතා කොලොම්බියානු සත්‍යය කොමිෂන් සභාව පිළිබඳව අදහස් දැක්වීය. දකුණු අප්‍රිකානු සත්‍යය හා ප්‍රතිසන්ධාන කොමිෂන් සභවේ පුරෝගාමී කාර්යය සහ එහි හානිපූරණ බලපෑම පිළිබඳ විස්තරයක් සඳහා මෙම අවසන් වාර්තාවේ 4 වන පරිච්ඡේදයේ සැන්ඩයිල් ඊ. ෂාල්කගේ සාක්ෂිය කෙරෙහි අවධානය යොමු කරනු ලැබේ. දකුණු අප්‍රිකානු සත්‍යය හා ප්‍රතිසන්ධාන කොමිෂන් සභාවේ ඓතිහාසික වැදගත්කම සැමවිටම ගෝලීය අවධානය ලබා ගෙන ඇතැයි යන්න බැහැර කළ හැක්කක් නොවේ. කෙසේ වෙතත්, සෑම ගැටුමක්ම ඊටම අනන්‍ය වූ යාන්ත්‍රණයක් ඇති කරන බව ඔහු අවධාරණය කළ අතර ශ්‍රී ලංකාව තමන්ගේම වූ සත්‍යය සෙවීමේ දේශීය යාන්ත්‍රණයක් යොදා ගැනීම වෙනුවෙන් ඔහු කරුණු දක්වා අන්‍යෝන්‍ය බැඳියාවන් පිළිබඳ පර්යෝලෝක බෙදා හදා ගන්නා ලදී. කොලොම්බියානු අත්දැකීම් සම්බන්ධයෙන් ගත් කළ, ලෙස් බ්‍රෙඩෙල් විස්තර කළේ කොලොම්බියානු සත්‍යය සෙවීමේ යාන්ත්‍රණය චින්දිත කේන්ද්‍රීය සාමය ඇති කිරීමක් බවයි. වසර හතරක් පුරා ජනාධිපති ජුවාන් මැනුවෙල් සැන්ටොස්ගේ අනුයාත රජයන් සහ කොලොම්බියානු විප්ලවීය සන්නද්ධ හමුදාව (FARC- EP) අතර සම්මුති සාකච්ඡාවට ලක් කළ සාම ගිවිසුම් පහක විස්තීරණ පැකේජයකින් සංක්‍රාන්තික යුක්තිය සඳහා නව යුගයක් උදා කළේ කෙසේදැයි ඔහු දීර්ඝ වශයෙන් විස්තර කළේය. අතීත අපරාධ සම්බන්ධයෙන් කටයුතු කිරීමේ උන්නතිකාමී ක්‍රමවේදයක් ලෙස සත්‍යය, යුක්තිය, හානිපූරණය සහ නැවැත ඇති නොවීම පිළිබඳ සර්වග්‍රාහී පද්ධතියක් නිරමාණය කරන ලදී. දිගු කල් පවත්නා සාමය සහ ස්ථාවරත්වය සහතික කරනු වස් කොලොම්බියාවේ සත්‍යය කොමිෂන් සභාව සංක්‍රාන්තික යුක්තියේ සියලු කුළුණු සම්බන්ධයෙන් කටයුතු කිරීම අරමුණු කරන ලදී. මෙම ක්‍රමවේදය තුළ, ප්‍රතිසන්ධානය සුරක්ෂිත කරමින් සාමය ප්‍රවර්ධනය කරන අතරම යුක්තිය පසිඳලීමේ කාර්යය සාමය සඳහා වූ විශේෂ බල අධිකාරියට පැවරුණි. එසේ කිරීම පිණිස, මෙම සංක්‍රාන්තිකි යුක්ති අධිකාරිය දණ්ඩනීය සහ ප්‍රතිෂ්ඨාපන ක්‍රියා මාර්ග සහ සම්බාධක යන දෙකම ඒකාබද්ධ කරයි. රට තුළ යුක්තිය හා සාමය යන දෙකම සහතික කරමින් එය අපරාධ යුක්තිය වෙත වූ මිශ්‍ර ප්‍රවේශයක් මූර්තිමත් කරයි. සංක්‍රාන්තික සැකසුමක ජාතික හා ජාත්‍යන්තර අපරාධ යුක්තිය පසිඳලීම සඳහා මෙම ප්‍රවේශය මැනවින් සුදුසු බව යෝජනා කිරීම මගින් මෙම නව්‍ය මිශ්‍ර ප්‍රවේශය පිළිබඳව ලේඛකයන් දෙදෙනා බොහෝ තොරතරු සපයයි.[603]

1021. වෙන්ඩි ලැම්බර්න්ගේ සම්භාව්‍ය කියමනක් වූ[604] *සියලු දෙනාටම එකම ප්‍රමාණය ගැලපෙන්නේ නැත* යන්න සිහි කැඳවමින් තමන්ගේ ගැටුමට ගැලපෙන ලෙස එක් එක් රට තමන්ගේම වූ සත්‍යය කොමිෂන් සභාවක් සකස් කර යුතුය යන කරුණ අවධාරණය කිරීම පිණිස ඉහත අධිකරණය බල ප්‍රදේශ දෙකම සහ ඒවායේම සත්‍යය කොමිෂන් සභා අපි අවධානය යොමු කරන්නෙමු.

1022. ශ්‍රී ලංකාව සඳහා සත්‍යය, යුක්තිය, හානිපූරණය සහ නැවැත සිදු නොවීම සම්බන්ධයෙන් වනඉදිරි වගවීමේ යාන්ත්‍රණයක් ගත් කළ ඉදිරි මග විය යුත්තේ සත්‍යය හා ප්‍රතිසන්ධාන කොමිෂන් සභාවක් බව අප නිගමයන කරන්නේ මෙම හේතුව නිසාය.

---

603 කොලොම්බියාවේ යුක්තිය හා සාමය යන දෙකම කර ළඟා වීම: ජාත්‍යන්තර අපරාධ සම්බන්ධයෙන් කටයුතු කිරීම පිණිස සාමය සඳහා වූ විශේෂ බල අධිකාරියේ මිශ්‍ර ප්‍රවේශය, ජෙරම් ෂූලියන් සාර්කින් සහ ඉනෙස් පෙරෙයිරා ලෝපෙස් (2023) සම්ප්‍රදායික යුක්ති සමාලෝචනය පිටුව 1

604 සංක්‍රාන්තික යුක්තියේ කුළුණු මොනවාද? එක්සත් ජාතීන්, සිවිල් සමාජය සහ බුරුන්ඩියේ යුක්ති ප්‍රවාහය, වෙන්ඩි ලැම්බෝන් 13 එල්.ජේ. මැක්ක්වාරී 41 (2014)

1023. ජිනීවාහි සිදු කළ නිල ප්‍රකාශ සහ අදාළ අමාත්‍යවරුන් විසින් ඒකාබද්ධව ඉදිරිපත් කරනු ලැබූ අමාත්‍ය මණ්ඩල සංදේශයක් පිළිබඳ මාධ්‍ය පලකිරීම් මගින් සත්‍යය හා ප්‍රතිසන්ධාන කොමිෂන් සභාවක් සඳහා ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාව විසින් සිදු කළ නිර්දේශය සම්බන්ධයෙන් ශ්‍රී ලංකා රජය දිගටම කටයුතු කරන බව කොමිෂන් සභාවට දැන ගැන්මට ලැබුණි.

1024. දෙවෙනි අතුරු වාර්තාවෙන් පසුව, 2023 පෙබරවාරි මාසයේදී ජනාධිපතිතුමන්ට අප ඉදිරිපත් කළ නිර්දේශ සාරාංශයක සත්‍යය සහ ප්‍රතිසන්ධාන කොමිෂන් සභාවක් පිළිබඳ සංකල්පය අපි අවධාරණය කළෙමු. එම නිර්දේශ සාරාංශයේ, සත්‍ය හා ප්‍රතිසන්ධාන කොමිෂන් සභාවක ස්වරූපය සිය අවසන් වාර්තාවෙන් පැහැදිලිව විස්තර කරන බව ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාව නිවේදන කළේය.

1025. මෙම පරිච්ඡේදයේ 5 වන ඡේදයේ අයිතම වශයෙන් සඳහන් කර ඇති මූලාශ්‍රයන්ගෙන් තොරතුරු ලබා ගනිමින් බෙදී වෙන්ව ඇති ජාතිය සුවපත් කළ හැක්කේ සහ අප සැවොම එක්සත් කළ හැක්කේ සත්‍යය හා ප්‍රතිසන්ධාන කොමිෂන් සභාවකට බව අපි නිගමනය කරන්නෙමු. අවස්ථානුගත තත්ත්යන් තුළ සත්‍ය හා ප්‍රතිසන්ධාන කොමිෂන් සභා ගණනාවක් අපි සමීක්ෂණය කළ අතර ඒ සියල්ල සංදෘෂ්ඨික තර්කානුකූල පදනමක් දරයි. වඩාත් යෝග්‍ය ලෙස ප්‍රඥප්තියක් බවට පත් වනු ඇතැයි අප සිතන ආකෘතිය කරා අප සංක්‍රමණය වීමට පෙර දේශීය සත්‍යය සහ ප්‍රතිසන්ධාන කොමිෂන් සභාවක් ස්ථාපිත කිරීම සඳහා සාධාරණීයකරණ හේතුව කෙරෙහි අපි අවධානය යොමු කරමු.

2. සංදෘෂ්ඨික තාර්කිකය

1026. සත්‍යය කොමිෂන් සභාව පිළිබඳ ඇගේ යාවත්කාලීන වාර්තාවෙන් ප්‍රසිලා බී. හේනර් සත්‍ය කොමිෂන් සභා පොදුවේ බෙදා හදා ගන්නා ලක්ෂණ පහක් හඳුනා ගන්නා ලදී.

> සත්‍ය කොමිෂන් සභාවක් (1) දැනට සිදුවෙමින් පවතින සිදුවීම්වලට වඩා අතීතය වෙත කේන්ද්‍ර ගත වේ; (2) යම් කාල සීමාවක් පුරා සිදු වූ සිදුවීම් රටාවක් විමර්ශනය කරයි; (3) බලපෑමට ලක් වූ ජනතාවගෙ අත්දැකීම්
>
> රැස් කරමින්, ඔවුන් සමග සෘජුව හා පුළුල්ව සම්බන්ධ වේ; (4) අවසන් වාර්තාවෙන් සමාප්ත කිරීමේ අරමුණ ඇති තාවකාලික ආයතනයකි; සහ (5) සමාලෝචිත රජය විසින් නිල වශයෙන් බලතල ලබා දී ඇත.[605]

1027. මෙම අර්ථ නිරූපණය සත්‍යය කොමිෂන් සභාවක් යම් කාලසීමාවක් තුළ සිදුවූ සිද්ධිවලට අදාළ කරුණු පහැදිලි කිරීමට අරමුණු කිරීමේ හේතුව නිසාවෙන් එය අධිකරණ කොමිසන් සභාවකින් වෙන් කොට හඳුනා ගත හැකිය.

1028. අපගේ මතය අනුව, සත්‍යය කොමිෂන් සභාවක් යනු සංක්‍රාන්තික යුක්තියේ අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා ක්ෂෙත්‍රයක් ස්ථාපිත කරන අද්විතීය යාන්ත්‍රණයකි. වින්දිතයන්ගේ අවශ්‍යතා කෙරෙහි විශේෂ සැලකිල්ලක් සහිතව වගවීම පිළිබඳ ප්‍රතිමාන ප්‍රවර්ධනය කිරීමට ඊට හැකිය.[606] සත්‍ය කොමිෂන් සභා යනු "වැරදි හැසිරීම් තහවුරු කරන්නා වූ පුද්ගලීකෘත විමර්ශන ක්‍රියාදාම

---

605 ප්‍රිසිලා බී. හේනර්, *Unspeakable Truths, Transitional Justice and the Challenge of Truth Commissions* (නිව්යෝක් සහ ලංඩන්: රූට්ලෙජ්, දෙවන මුද්‍රණය 2011) පිටුව 11-12

606 ටී.ඩී.ඔස්ලන්, එල්.ඒ.ජේන්, සහ ජී.ඒ.රෙයිටර්., *'The Justice Balance: When Transitional Justice Human Rights and Democracy' , Human Rights Quarterl*y 32,2010

අන්තර්ගත සහ සොයා ගත් කරුණු විධිමත් ක්‍රමානුකූලව සිදු කරනු ලබන ක්‍රියාදාම හරහා ප්‍රසිද්ධියට පත් කරන යාන්ත්‍රණ වේ."[607] සත්‍යය පිළිබඳ කොමිෂන් ක්‍රියාදාමයන්හි වරදකරුවන් සහ වින්දිතයන් සහභාගිවීම අත්‍යවශ්‍ය වේ. "ලජ්ජාවට පත් කිරීම", අපරාධකරුවන් සමාජීය දෝෂාරෝපණයට ලක් කිරීම, මෙන්ම දඬුවමක ලක්ෂණ ඇති පුද්ගලික පාපෝච්චාරණ හරහා අපරාධකරුවන්ගේ වැරදි නිරාවරණය කිරීමම අවිධිමත් ස්වරූපයේ දඬුවමකි.[608]

1029. නක්වි ට අනුව රාජ්‍යයන් මත අනුරූපී බැඳීම් සහිතව සත්‍යය සඳහා අයිතියක් තිබේ.[609] එපරිද්දෙන්ම, හෙන්කින් අවධාරණය කරනුයේ,

සත්‍යය දැන ගැනීමට හැකිවන පරිදි සහ ජාතියේ ඉතිහාසය කොටසක් නිර්මාණය කිරීම පිණිස සත්‍ය කරුණු විමර්ශනය කර තහවුරු කිරීම සඳහා බැඳීමක් අනුප්‍රාප්තික රජයන්ට තිබේ. දැනුම සහ පිළිගැනීම යන දෙකම තිබිය යුතුය: සිදුවීම් නිල වශයෙන් පිළිගෙන ප්‍රසිද්ධියේ අනාවරණය කිරීම අවශ්‍ය වේ. සත්‍යය පැවැසීම..... වින්දිතයන් සඳහා යුක්තිය ඉල්ලා සිටීමට ප්‍රතිචාර දක්වයි, ජාතික ප්‍රතිසන්ධානයට පහසුකම් සලසයි.[610]

1030. ඉහත දැක්වූ දේවලින් සත්‍යය පිළිබඳ කොමිෂන් සභාවක සංක්‍රාන්තික යුක්තියේ ඉතා වැදගත් සංරචක දෙකක් සිදු වන බව සටහන් කිරීම උචිත වේ; එනම් සත්‍යය නිශ්චිතව දැන ගැනීම සහ සත්‍යය පිළිගැනීමයි. තවද, සත්‍යය කොමිෂන් සභාවක නඩු පැවරීම සඳහා මාර්ගයක් විවෘත වන අතර වින්දිතයන්ගේ අවශ්‍යතාවල ප්‍රමුඛතාව මත පාදකව හානිපූරණ සඳහා නියෝග ලබා දෙනු ලැබේ. සත්‍යය කොමිෂන් සභා පිළිබඳ පුළුල් සමාලෝචනයක් සමීක්ෂණය කළ ප්‍රභවාත්මක ලේඛක ප්‍රිසිලා හේනර් ශ්‍රී ලංකාවේ අතුරුදහන්වූ තැනැත්තත් පිළිබඳ කොමිෂන් සභාව සත්‍ය කොමිෂන් සභාවක් ලෙස ඇයගේ ග්‍රන්ථයේ විෂය පථය තුළට ගෙන ආ අතර එම කොමිෂන් සභා නිර්දේශ කර ඇත්තේ හානිපූරණ පමණක් බව ලේඛන ගත කරයි.[611]

1031. අතුරුදහන්වූ තැනැත්තත් පිළිබඳ වරදකරුවන් මෙකී කොමිෂන් සභා හමුවේ පෙනී නොසිටිය බැවින්, එම කොමිෂන් සභාවල කාර්යයන්හි ප්‍රතිඵලයක් ලෙස හට ගන්නා ප්‍රතිසන්ධානය හෝ සමාවදීම සඳහා අවස්ථා නොතිබුණි. අප වෙනත් ස්ථානයක පෙන්නුම් කර ඇති පරිදි, ෂර්වානන්ද කොමිෂන් සභාව වාර්ගික ප්‍රචණ්ඩත්වය පිළිබඳ ජනාධිපති සත්‍යය කොමිෂන් සභාව ලෙස නම් කළ ද, බොහෝ සාක්ෂිකරුවන් සත්‍යය ප්‍රකාශ කළ ද, වරදකරුවන් නොසිටි නමුත් සාක්ෂිකරුවන් හානිපූරණය උදක්ම ඉල්ලා සිටි අතර අනාගතයේ ස්ථාපිත කිරීමට නියමිත සත්‍යය කොමිෂන් සභාවක් හරහා ප්‍රතිසන්ධානය ඇති කළ යුතු බව ෂර්වානන්ද කොමිෂන් සභාවේ කොමසාරිස්වරුන් දැඩිව ඉල්ලා සිටියහ. ශ්‍රී ලංකාවේ සත්‍යය කොමිෂන් සභාවක් සඳහා වූ මෙම ආයාචනය ෂර්වානන්ද කොමිෂන් සභාව සිදු කළේ 2002 වසර තරම් ඈත කාලයේය.

1032. මෙම අවසන් වාර්තාවේ 5 වන පරිච්ඡේදයේ අප සඳහන් කර ඇති පරිදි, මෙම ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාවට ද, තමන් විසින් වැරදි හා පීඩාවන් දරා සිටිය ද හානිපූරණය ඉල්ලා සිටි ඒ හා

---

607 රුටි ජී. ටෙයිටෙල්, සංක්‍රාන්තික යුක්තිය, ඔක්සෆර්ඩ් 2000, පිඩු 89-90

608 "ඇතැමුන් සත්‍යය දකිනුයේ නඩු පැවැරීම වැනි අනෙකුත් නෛතික ක්‍රියාදාම කරා යොමු කරන පෙරනිමිත්තක් ලෙස අතර තවත් අය සත්‍යය විමර්ශන දකිනුයේ අනෙකුත් ප්‍රතිචාර සඳහා සම්පූර්ණයෙන්ම ස්වාධීන විකල්පයක් ලෙසින්ය. ඒ අනුව උදාහරණයක් ලෙස නුන්කා මාස්, ආජන්ටිනාවේ වාර්තාව අතීතය සම්බන්ධයෙන් කටයුතු කිරීමේ රටේ ව්‍යාපෘතියේ හුදෙක්ම පළමු පියවරයි"

609 *වයි. නාක්වි*, " ජාත්‍යන්තර නීතියේ සත්‍යය වෙත අයිතිය: ඇත්තක් ද ප්‍රබන්ධයක් ද?" (2006) 88 රතු කුරුසයේ ජාත්‍යන්තර සමාලෝචනය

610 ඒ.එච්. හෙන්කින් State Crimes; *Punishment or Pardon (1989)* 4-5, රුටි ජී.ටෙයිටෙල්ගේ සංක්‍රාන්තික යුක්තියේ උපුඩා දක්වා ඇති පි.69

611 *Unspeakable Truths; Facing the challenge of Truth Commissions: පළමු මුද්‍රණය (2001) පි.161*

සමාන සාක්ෂිකරුවන් හමු වූ අතර එහෙත් ඔවුන්ගෙන් සමහරක් පවසා සිටියේ තමන්ට අභිමි වූ ආදරණීයයන්ට කුමක් වුයේදැයි දැන ගැනීමට ඔවුන්ට අවශ්‍ය බවයි. තමන්ට පක්ෂව ලබා දෙන්නේ කවර ආකාරයක යුක්තියද යන්න සාක්ෂිවල සියලු අංශ විමර්ශනය කර සාක්ෂිකරුවන් ප්‍රකාශ කළ අවශ්‍යතාවන්ට සවන් දීමෙන් අනතුරුව සත්‍යය හා ප්‍රතිසන්ධාන කොමිෂන් සභාවක් විසින් නිර්ණය කළ යුතු කරුණක් වේ.

1033. 1981 සහ 1984 අතර සිදුවූ වාර්ගික ප්‍රචණ්ඩ ක්‍රියා විමර්ශනය කළ ශර්වානන්ද කොමිෂන් සභාව, 2020 වසරේ එවකට සිටි ජනාධිපතිවරයා විසින් මුලසුන දරන ලද ප්‍රසිද්ධ උත්සවයකදී හානිපූරණ ප්‍රදානය කළ බව අපි දැනටමත් නිරීක්ෂණය කර ඇත්තෙමු. 1983 ජූලි කෝලහල වෙනුවෙන් එවකට සිටි ජනාධිපතිවරයා සමාව ඉල්ලීමක් ද සිදු කළේය.

1034. 1994 වසරේ පත් කළ වසරේ අතුරුදහන්වූ තැනැත්තත් පිළිබඳ කොමිෂන් සභාව අධිකරණය තුළින් යුක්තිය ඉල්ලා සිටි අතර තවදුරටත් ක්‍රියාමාර්ග ගැනීම සඳහා සැකකරුවන්ගේ නම් අභියෝදකවරු වෙත ඉදිරිපත් කරන ලදී. 2002 වසරේ ෂර්වානන්ද කොමිෂන් සභාව සමාව ඉල්ලීම් නිර්දේශ කළ අතර විශේෂයෙන්ම එක් සාක්ෂිකරුවකු, එනම් එවකට ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ සභාපති ආචාර්ය ගොඩ්ෆ්‍රි ගුණතිලක මහතා උපුටා දක්වමින් ශ්‍රී ලංකාව සඳහා හුදෙක් එක් සත්‍යය කොමිෂන් සභාවක් නොව ප්‍රතිසන්ධාන ක්‍රියාවලිය සම්පූර්ණ වන තෙක් අඛණ්ඩව පවත්වා ගෙන යා යුතු සත්‍යය පිළිබඳ බොහෝ කොමිෂන් සභා තිබිය යුතු බවට යෝජනවක් ප්‍රකාශ කළ බැව් දක්වන ලදී.

1035. ආචාර්ය ගොඩ්ෆ්‍රි ගුණතිලක ඉදිරිපත් කළ මෙම යෝජනාව ෂර්වානන්ද කොමිෂන් සභාව නිසි අවධානයට ගත් අතර සත්‍යය කොමිෂන් සභා එකකට වඩා පිහිටුවන මෙන් දැඩිව නිර්දේශ කරන ලදී.

1036. සත්‍යය කොමිෂන් සභා කිහිපයක් පිළිබඳ ෂර්වානන්ද කොමිෂන් සභාවේ මෙම උවදෙස වෙන කවරදාටත් වඩා වර්තමානයට අදාළ වූවත්, අප සමාජය වෙනුවෙන් ඉටු කිරීමට අප බැඳී තිබෙන සමාජ සම්මුතියේ අපගේ ප්‍රතිඥා සහ වගකීම් අපි පැහැර හැර ඇත්තෙමු.

1037. මෙම බාරදුර අවස්ථාව අපට මග හැරුණහොත්, අපට යළි කිසිදු දිනෙක සත්‍යයේ අවසාන ඉලක්කය, එහි නිශ්චිත බව හෝ එහි පිළිගැන්ම, ජාතික සමගිය හෝ ප්‍රතිසන්ධානය සාක්ෂාත් කර ගැනීමට නොහැකි වනු ඇති හෙයින් අප මෙවරවත් හෝ මෙම අවස්ථාව දැඩිව ග්‍රහණය කර ගත යුතුය. මෙය අප සැවොම පුල පුලා බලා සිටි මොහොත වන අතර යෝජනා සම්මතයන්හි ගාම්භීරව ප්‍රකාශ කර ඇති

පරිදි එ.ජා.මා.හි.කවුන්සිලය ඇතුළුව ජාත්‍යන්තර ප්‍රජාව නඩු පැවරීමේ ක්‍රමවේදයක් අන්තර්ගත මෙරට දේශීය සත්‍ය සෙවීමේ යාන්ත්‍රණය ඉදිරියට රැගෙන යාම පිණිස මෙරට සමග සිටගත යුතුය.

1038. එවැනි කොමිෂන් සභාවක් වහාම මෙරට යථාර්ථයක් විය යුත්තේ පසුගිය ඉතිහාසය සහ පෙර කොමිෂන් සභාවල නිර්දේශ මගින් ශක්තිමත් කරනු ලැබූ එවැනි පසුබිමකය. අතුරුදහන්වූවන් පිළිබඳ කොමිෂන් සභාවේ සහ ශර්වානන්ද කොමිෂන් සභාවේ අත්දැකීම් අප ජීවත් වන මෙම අභියෝගාත්මක දේශපාලන සංදර්භය තුළ, වින්දිත ජනගහණයේ ප්‍රමුඛතා සම්බන්ධයෙන් නිසි පරිදි කටයුතු කිරීමේදී සංක්‍රාන්තික යුක්ති ක්‍රියාදාමවල විභවය සාමූහිකව සංඥා කරන බව මෙහි ලා සටහන් කළ යුතුය. ඒ විශ්වසනීය සත්‍ය සෙවීමේ යාන්ත්‍රණයක ඉරණම සහ විධි නියෝගය මෙහයවුනු ලබන්නේ වින්දිත කේන්ද්‍රීයබව නිසාවෙනි. විශ්වසනීය සත්‍ය සෙවීමේ යාන්ත්‍රණයක ආකෘතිය අප නිර්මාණය කරනුයේ මෙම පසුබිම තුළය. එවැනි යාන්ත්‍රණයක් පාලනය කරන්නා වූ පරිපාටියට සහ හරයට යන දෙකටම අදාළව අපේ නිර්දේශ කඩිනමින් ඉදිරිපත් කරනු ඇත.

1039.අප තාර්කිකයෙන් ඉවත්ව යාමට පෙර, සත්‍ය සෙවීමේ යාන්ත්‍රණයක් වෙනුවෙන් වූ උගත් පාඩම් සහ ප්‍රතිසන්ධාන කොමිෂන් සභාවසභාවේ සහ පරණගම කොමිෂන් සභාවේ නිර්දේශ සම්බන්ධයෙන් අපි සඳහන් කළෙමු.

1040. එ.ජා.මා.හි.කවුන්සිලයේ 30/1 යෝජනා සම්මතයේ ප්‍රතිඵලයක් ලෙස, එවකට අග්‍රාමාත්‍යවරයාව සිටි වත්මන් ජනාධිපතිවරයා 'දැන ගැනීමට ඇති අයතිය කුළුණ' තුලට ගැනෙන සත්‍යය හා ප්‍රතිසන්ධාන කොමිෂන් සභාවක් සහ අනෙත් ආයතනය වන අතුරුදහන්වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය ස්ථාපිත කිරීම පිණිස 2018 වසරේදී අමාත්‍ය මණ්ඩල පත්‍රිකාවක් ඉදිරිපත් කළ බව යළි මතකයට නගා ගැනීම වැදගත් වේ. සාක්ෂිකරුවකු හරහා අප අනාවරණය කර ගත් පරිදි, අවාසනාවකට මෙන්, අග්‍රාමාත්‍යවරයාගේ පාලනයෙන් ඔබ්බට ගිය බාහිර තත්ත්වයන් හේතුවෙන් එම ප්‍රයත්නය බිඳ වැටුණි.

1041. මේ වන විට අපගේ දෙවන අතුරු වාර්තාවේ ඇති සත්‍යය හා ප්‍රතිසන්ධානය සඳහා වූ අපගේ යෝජනාව සම්බන්ධයෙන් කටයුතු කර ඇති අතර එවැනි යාන්ත්‍රණයක් නිසි ආකෘතියකින් වර්ධනය වනු ඇතැයි අපි අපේක්ෂා කරන්නෙමු. සිත්හි තබා ගත යුතු වැදගත් කරුණ වන්නේ අනාගතයේ ස්ථාපිත කිරීමට නියමිත එවැනි යාන්ත්‍රණයක් ජාත්‍යන්තර ප්‍රමිතින්ට අනුකූල වන බව සහතික කළ යුතු බවත් වින්දිතයන්ට සත්‍යය වෙත ඇති අයිතිය සහතික කළ යුතු බවත්ය.

1042. පෙර කොමිෂන් සභාවල කටයුතු සහ ඔවුන්ගේ නිර්දේශ ක්‍රියාවට නැංවීමේ ප්‍රගතිය මඳ බව විශ්වසනීයත්වය පිළිබඳ හිඩැසක් නිර්මාණය කර ඇති අතර එබැවින් මානව හිමිකම් ආරක්ෂා කිරීම ශක්තිමත් කිරීම ඉතා වැදගත් වන අතර ස්ථාපිත කිරීමට නියමිත සත්‍ය සෙවීමේ යාන්ත්‍රණයට එම යාන්ත්‍රණය මත තබන විශ්වාසය සාධාරණීකරණය කිරීමට හැකි වනු ඇතැයි අපි බලාපොරොත්තු වන්නෙමු.

1043. නිසැකවම, මානව හිමිකම් සහ ජාත්‍යන්තර මානුෂීය නීතිය බරපතල ලෙස උල්ලංඝනය කිරීම් පිළිබඳ ඓතිහාසික වාර්තාවක් සත්‍යය හා ප්‍රතිසන්ධාන කොමිෂන් සභාවට සැපයිය හැකි අතර මානම හිමිකම් ප්‍රවර්ධනය කර ආරක්ෂා කිරීම පිණිස නීතියේ සහ භාවිතයේ ආයතනික ප්‍රතිසංස්කරණ සඳහා බලපෑම් සිදු කළ හැක. තීරණාත්මකව, සිදුවිය හැකි උල්ලංඝනය තිරීම් වැළැක්වීම, නීතියට අනුකූලතාවය ප්‍රවර්ධනය කිරීම සහ වින්දිතයන් සඳහා යුක්තිය වෙත මාර්ග සැපයීම සහ සහන සැලසීම පිණිස මූලික වන බරපතල උල්ලංඝනය කිරීම් සඳහා වගවීම සහතික කිරීමට ඒවා සහාය ලබා දෙයි. සත්‍ය, යුක්තිය, ප්‍රතිකර්ම සහ හානිපූරණය වෙත අයිතිය සම්බන්ධයෙන් කටයුතු කරන සහ නැවැත සිදු නොවීම සහතික කරන සංක්‍රාන්තික යුක්ති යාන්ත්‍රණ දියත් කරමින්, බොහෝ සත්‍යය කොමිෂන් සභා ප්‍රචණ්ඩත්වයේ සහ උල්ලංඝනය කිරීමේ මූල හේතු ගවේෂණය කර තිබෙන අතර ඒ අනුව වඩා තිරසාර සාමය ගොඩනැගීමේ සහ ප්‍රතිසන්ධාන ප්‍රයත්නයන් බිහි කර ඇති අතර ගැටුම් දේශපාලනිකව නිරාකරණය කිරීමට සහාය ලබා දී තිබේ.

1044. සත්‍යය කොමිෂන් සභාවක තිබිය යුතු අත්‍යවශ්‍ය ගුණාංග කෙරෙහි අපි දැන් අවධානය යොමු කරමු.

3. යෝජිත සත්‍යය කොමිෂන් සභාවේ ගති ලක්ෂණ/ආකෘතිය/ මාර්ගෝපදේශ

1045. සත්‍ය කොමිෂන් සභාවක් නිර්මාණය කිරීම සහ මෙහෙයවීම වෙනුවෙන් මාර්ගෝපදේශ හෝ අවම ප්‍රමිති පිළිබඳ පළමු විස්තරාත්මක යෝජනාව, දණ්ඩ මුක්තිය එරෙහිව ක්‍රියාමාර්ග හරහා මානව හිමිකම් ආරක්ෂාව සහ ප්‍රවර්ධනය සඳහා "මූලධර්ම මාලා" කෙටුම්පතක ස්වරූපයෙන් 1996

වසරේදී වෙනස් කොට සැලකීම වැළැක්වීම සහ සුළු ජාතීන් ආරක්ෂා කරිම සඳහා වන එක්සත් ජාතීන්ගේ අනු කමිටුව විසින් ප්‍රකාශයට පත් කරන ලදී.[612]

අ. පොදු බලතල

1046. විවිධ කොමිෂන් සභා කටයුතු කිරීමට නියෝග කරනු ලැබ ඇති පිළිගත් බලතල සහ විධාන මාලාවක් තිබේ. එම විධාන පුළුල් සහ නම්‍යශීලී විය යුතුය. කොමිෂන් සභාවට සිතාසි නිකුත් කිරීමේ බලතල (ඕනෑම අයෙකු කැඳවීමේ බලය) සහ සෝදිසි කිරීමේ සහ තහනමට ගැනීමේ ශක්තිමත් බලතල ලබා දිය යුතුය. යෝජිත සත්‍ය සෙවීමේ කොමිෂන් සභාවේ විධි නියෝගය විමර්ශන ප්‍රමුඛතා ගත කිරීම පිණිස සත්‍ය සෙවීමේ කොමිෂන් සභාව සවිබල ගැන්වෙන පරිදි පෙර කොමිෂන් සභා විසින් විමර්ශනය කිරීමට නියෝග කරනු ලැබූ නිශ්චිත සිදුවීම්, උපලේඛනයක ලැයිස්තු ගත කළ යුතු බවට සහ සංකේතාත්මක සිද්ධි ඇතුළු එම සිදුවීම්වල කරුණු සහ රටාවන් වාර්තා කිරීම සිදු කළ යුතු බවට ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාව මෙම අවස්ථාවේදී නිර්දේශ කරනු ඇත. උපලේඛනයේ ඇතුලත් කිරීමට නියමිත සිදුවූයේ යැයි පැවැසෙන මෙම උල්ලංඝනය කිරීම් සත්‍ය වශයෙන්ම මෙම පරිච්ඡේදයේ පසුව දක්වා ඇති නිර්දේශ පිළිබඳ කොටසේ නිර්දේශ ලෙස යෝජනා කරනු ලැබ ඇත.

1047. විවෘත සහ විනිවිද පෙනෙන ආකාරයෙන් මහජන මත විමසීමේ රැස්වීම් පැවැත්වීමට කොමිෂන් සභාවට බලතල පැවැරිය යුතුය. සත්‍යය සෙවීමේ යාන්ත්‍රණයට මහජන විශ්වාසය දිනා ගත හැකි පරිදි රූපවාහිණියෙන් ප්‍රචාරය කරන රැස්වීම් වාර ද මීට ඇතුලත්ය.

1048. විමර්ශනය කිරීමට නියමිත අපයෝජන වර්ගවලට ජාත්‍යන්තර මානුෂීය නීතිය සහ ජාත්‍යන්තර මානව හිමිකම් නීතිය උල්ලංඝනය කිරිම්, අතුරුදහන් කිරීම් සහ බලහත්කාරයෙන් අවතැන් කිරීම් ආදිය ඇතුලත් වනු ඇත.

1049. ව්‍යවස්ථාදායක සාධන පත්‍රයක් හරහා සත්‍යය සෙවීමේ කොමිෂන් සභාව ස්ථාපිත කිරීමට පෙර මහජනතාව, විනිදිත ප්‍රජාවන්, දේශපාලනඥයන් සහ රාජ්‍ය නොවන සංවිධාන සමග සම්බන්ධවී කටයුතු කළ යුතුය. පූර්ව ව්‍යවස්ථාදායක ක්‍රියාවලිය ඉදිරියට යාමේදී, එවැනි අදහස් විමසීමේ ක්‍රියාවලියක් අවශ්‍ය වනු ඇත.

ආ. මහජන සහභාගිත්වය සහ අදහස් විමසීම

1050. පරීක්ෂණ කොමිෂන් සභාව ඉදිරියේ පෙනී සිටි සාක්ෂිකරුවන් සහ උපදෙස් පතන්නන් විශාල පිරිසක් ජාතියේ ප්‍රගමනයට බාධා කළ විනාශකාරී යුද්ධය හේතුවෙන් තමන් විඳි පීඩාවන් සහ අතුරුදහන්වීම් පිළිබඳ තමන් දන්නා තොරතුරු ඉදිරිපත් කළහ. 4 වන සහ 5 වන පරිච්ඡේදයන්හි අප මින් පෙර සඳහන කර ඇති පරිදි, මෙම සාක්ෂිකරුවන් කොමිෂන් සභා කීපයක් ඉදිරියේ සාක්ෂි ලබා දී ඇති අතර තමන්ට

සිදු කළ සාහසික ක්‍රියා සහ විනාශයන් පිළිබඳව පැමිණිලි කළේය. මෙම ඇතැම් විස්තර ආරක්ෂක හමුදා සහ එල්ටීටීඊ යන දෙපාර්ශවයෙන්ම සිදු කළ බලහත්කාරයේ අතුරුදහන් කිරීම් සම්බන්ධයෙන් වේ. ඕනෑම සංක්‍රාන්තික යුක්ති යාන්ත්‍රණයක් විනිදිත කේන්ද්‍රීය විය යුතු බැවින්, මෙම සාක්ෂිකරුවන්ගේ අදහස් පළමුව විමසිය යුතු අතර ප්‍රඥප්තියක ආකාරයෙන් යෝජිත සත්‍ය සෙවීමේ යාන්ත්‍රණය ස්ථාපිත කිරීමේ කටයුතු ශ්‍රී ලංකා රජය ආරම්භ කිරීමට පෙර සිදු කළ යුතු කවර හෝ මහජන අදහස් විමසීමකට අදාළව ඔවුන්ට ප්‍රමුඛතාව හිමි විය යුතුය. වෙනත්

612 මෙම මූලධර්ම මාලාව සත්‍ය වෙත අයිතිය සැකෙවින් විස්තර කොට ලේඛනමය සාක්ෂි ආරක්ෂාව සහ ඒවා වෙත ප්‍රවේශ්‍යතාව සඳහා විශ්ව ප්‍රමිතියක් නිර්දේශ කරන ලද අතර කරුණු තහවුරු කිරීම පිණිස බාහිරාධිකරණ පරීක්ෂණ කොමිෂන් සභාවක් ඉල්ලා සිටින ලදී.

වචනවලින් කිවහොත්, මෙම පරීක්ෂණ කොමිෂන් සභාව ඉදිරියේ සාක්ෂි දී තමන්ගේ ප්‍රතිකර්ම ගැන අදහස් දැක්වූ විත්දිතයන්ගේ අදහස් ද විමසිය යුතුය.

1051. මෙම සාක්ෂිකරුවන් පිළිබඳ විස්තර සඳහා මෙම අවසන් වාර්තාවේ පළමුවන ඇමුණුමේ දක්වා ඇති විත්දිත 'සාක්ෂිකරුවන්ගේ ලැයිස්තුව" කෙරෙහි අවධානය යොමු කරනු ලැබේ. ඔවුන් සමග ප්‍රමාණවත් අදහස් විමසීමක් සිදු නොකරන්නේ නම්, සත්‍යය හා ප්‍රතිසන්ධාන කොමිෂන් සභාවක හානිපූරණ බලපෑමේ කාර්යය සපුරා ගත නොහැකි වනු ඇත.

1052. යෝජිත සත්‍ය සෙවීමේ යාන්ත්‍රණය පිළිබඳව උචිත සුදුසුකම් සහිත විශේෂඥයකු විසින් සිදු කිරීමට නියමිත සංවේදීකරණ වැඩසටහනක් පැහැර හැරිය නොහැකි අවශ්‍යතාවයක. එය ජාතික මට්ටමට ඉලක්ක කළ යුතු අතර යථාර්ථවාදී කාල රේඛාවක් තිබිය යුතුය. විත්දිතයන් හැරුණු විට, උතුරු සහ නැගෙනහිර පළාතේ සිංහල සහ මුස්ලිම් ජනගහණය ඇතුළුව උතුරේ සහ නැගෙනහිර ජනතාවගේ අදහස් විමසිය යුතුය. ප්‍රතිසන්ධානය, වගවීම, අපරාධ යුක්තිය, වන්දි ගෙවීම/හානිපූරණ වැඩසටහන් සහ අතුරුදහන්වූ පුද්ගලයන් සම්බන්ධයෙන් වූ ප්‍රශ්නාවලියක් තිබිය යුතුය. පහත දැක්වෙන පිරිස්වල අදහස් විමසිය යුතුය.

1. ආරක්ෂක හමුදා පිරිස්, පොලීසිය
2. අතුරුදහන්වුවන්ගේ පවුල්
3. විත්දිතයන් සහ විත්දිතයන් නියෝජනය කරන සිවිල් සමාජ කණ්ඩායම්
4. යුද වැන්දඹුවන්
5. සිවිල් සේවකයන්
6. ආගමික නායකයන්
7. සිවිල් සමාජයේ පිරිස්
8. දේශපාලන නායකයන් සහ සාමාජිකයන්
9. දේශපාලන පක්ෂවල සාමාජිකයන්
10. පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්
11. තරුණයන්
12. පුනරුත්ථාපනය කළ එල්ටීටීඊ සාමාජිකයන්
13. අබාධිත පිරිස්, තුවාල ලැබුවන් ඇතුළු ගැටුමෙන් පිඩාවට පත්වූවන් සහ එල්ටීටීඊ පාලනය යටතේ පැවැති ප්‍රදේශවල ජනතාව
14. ප්‍රාදේශීය මට්ටමේ දේශපාලනඥයන්, එනම් පළාත් සභා, නගර සභා ආදියේ සාමාජිකයන්
15. කාන්තාවන් සහ ළමුන්
16. සාමාන්‍ය මහජනතාව
17. ජාතික මානව හිමිකම් කොමිෂන් සභාව
18. වෘත්තික සංවිධාන
19. මාධ්‍යවේදීන්
20. වෘත්තීය සමිති පිරිස්
21. විද්වතුන්

1053. මෙම ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාව විසින් සිදුකළ නිර්දේශ සහ සත්‍ය සෙවීමේ යාන්ත්‍රණයක් මගින් මෙකී නිර්දේශ සාක්ෂාත් කර ගැනීමට යත්න දරන්නේ කෙසේද යන්න පිළිබඳව මෙම සියලු කොටස් දැනුවත් කළ යුතුය. යෝජිත සත්‍යය සහ ප්‍රතිසන්ධාන කොමිෂන් සභාවේ විෂය පථය සහ විෂය සීමාව උපදෙස් පතන්නන්ට පහදා දිය යුතුය. මෙය දකුණු අප්‍රිකාවේ සිදු විය. එරට තුළ සත්‍ය හා ප්‍රතිසන්ධාන කොමිෂන් සභාවක් පිහිටුවිය යුතු බවට සම්මුතියක් ඇති

වූයේ මෙම දීර්ඝ සහ පුළුල් මහජන අදහස් විමසීම හේතු කොට ගෙනය. දකුණු අප්‍රිකානු මහකොමසාරිස්වරයා මෙම කොමිෂන් සභාව හමුවේ ලබා දුන් වාචික සාක්ෂියේදී මේ බව අවධාරණය කළේය.[613] ජාතිය පුරා එවැනි මහජන අදහස් ලබා ගැනීමක් සිදු වූ බව තහවුරු කරන ලිපි ලේඛන සැලකිය යුතු ප්‍රමාණයක් තිබේ.[614]

1054. විශ්වසාය සහ ප්‍රතිෂ්ඨාපනයේ අනිවාර්ය කොටසක් ලෙස "විශ්වාස සබඳතා" ගොඩ නගා ගැනීම සහතික කිරීම පිණිස, සත්‍යය සෙවීමේ යාන්ත්‍රණයේ සක්‍රීයව නිරත වීම කරා චින්දිත දිවි ගලවාගත්වූවන් සහ අනෙකුත් පාර්ශවකරුවන් පෙරට යාමට ඔවුන් ධෛර්යමත් කිරීමට සහ හැකියාව ලබා දීමට ඔවුන් සමග අදහස් විමසීමේ පුළුල් ක්‍රියාදාමයක් පැවැත්විය යුතුය. කොමිෂන් ගණනාවකට මුහුණ දීමට සිදුවූ ජනතාවගේ හෙම්බත්වීම සහ උකඩලී බව පිළිබඳව අපේ සභා වාරවල බොහෝ වරක් අප අසා ඇත. එබැවින් එම මූලාරම්භය ආරම්භ වීමට පෙර, ස්වභාෂා පිළිබඳ මනා

දැනුමක් ඇති නිපුණ තැනැත්තන් විසින් සත්‍යය හා ප්‍රතිසන්ධාන කොමිෂන් සභාවක ප්‍රතිලාභ ප්‍රචාරණය කළ යුතුය. සත්‍යය කොමිෂන් සභාවක් වරදකරු හා චින්දිතයා එක් තැනකට ගෙන ඒම සහ වරද පිළිගැනීමට ඉඩ තිබීම යන සියල්ල සත්‍යය කොමිෂන් සභාවක ස්වභාවය නිරූපණය කරණ ලක්ෂණ වේ. සත්‍යය පිළිබඳ කොමිෂන් සභාවක නඩු විභාගයක පවතින කර්කශ බවින් මුළුමණින්ම තොරවන්නේය යන කරුණ චින්දිතයන්ට සහ මහ ජනතාවට අවබෝධ කර දිය යුතුය.

1055. සහායක කර්තව්‍යයන් පැනවූ ලෝම් ගිවිසුමට ස්තූති වනන්නට තාක්ෂනික සහයෝගය සැපයීම මගින් සියරා ලියොන්හි සත්‍යය හා ප්‍රතිසන්ධාන කොමිෂන් සභාව ස්ථාපති කිරීමේ ක්‍රියාදාමයට නායකත්වය ලබා දුන්නේ එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් මහකොමසාරිස් කාර්යාලයයි. දකුණු අප්‍රිකානු අත්දැකීම උදාහරණයක් ලෙස සැසඳීමේදී සියරා ලියොන්හි සිවිල් සමාජයට හැඟී ගියේ සා.ප්‍ර.කොා.ස. සැකැස්ම සම්බන්ධයෙන් මහකොමසාරිස් කාර්යාලය ප්‍රමාණවත් අදහස් විමසීමක් නොකළ බව හා තමන්ගේ අදහස් සැලකිල්ලට නොගත් බවයි. දකුණු අප්‍රිකාවේ සා.ප්‍ර.කොා.ස. ස්ථාපිත කිරීමේ නීතිය සම්මත වීමට පෙර වසරක කාලයක් පුරා චින්දිතයන් සහ සිවිල් සමාජය ඇතුළුව පාර්ශවකරුවන් සමග අදහස් විමසීම් එම නීතිය පැනවීමට පෙර සිදුවූ බව යළි අවධානයට ගත යුතුය.

1056. ඊ ළඟ ප්‍රශ්නය පැන නගිනුයේ පත්කිරීමට නියමිත කොමසාරිස්වරුන්ගේ සංයුතිය සම්බන්ධයෙනි.

ඇ. යෝජිත සත්‍ය සෙවීමේ යාන්ත්‍රණයේ සංයුතිය හා සාමාජිකත්වය

1057. කොමිෂන් සභාවේ සාමාජිකත්වය බහුත්වවාදී සහ සර්වග්‍රාහී වන්නා සේම, කොමිෂන් සභාවේ සාමාජිකත්වයෙහි ප්‍රයෝජනවත් විය හැකි විශේෂිත විශේෂඥ ක්ෂෙත්‍රයන්හි නිපුණ පුද්ගලයන් ඇතුළත් විය යුතු අතර විවිද අදහස් හා පසුබිම්වල මෙන්ම ස්ත්‍රී පුරුෂභාවයේ සාධාරණ නියෝජනයක් සහතික කළ යුතුය. එහි සංයුතිය බහුවාර්ගික විය යුතු අතර සාමාජිකයන් සිංහල, දෙමළ, මුස්ලිම් සහ බර්ගර් ප්‍රජාවන්ගෙන් විය යුතුය.

1058. එසේ පත්කරනු ලබන්නන්ට සහකම්පනයෙන්, දයානුකම්පාවෙන් සහ කරුණාවන්තභාවයෙන් යුතුව මහජනයා සමග කටයුතු කළ හැකි ද යන්න නිශ්චිතව දැන ගැනීම පිණිස පුළුල් තේරීමේ නිර්ණාකයවලට අදාළව ඔවුන් සියුම්ව පරීක්ෂා කර බැලීම අත්‍යවශ්‍ය වේ. ග්වාතමාලාහි සත්‍යය පිළිබඳ කොමිෂන් සභා කාර්ය මණ්ඩලයේ සිටි එක්සත් ජනපද මානව විද්‍යාඥයෙකු පිළබඳ

613 ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාවේ අවසන් වාර්තාවේ 4 වන පරිච්ඡේදය බලන්න.

614 සාම ගිවිසුම් හා මානව හිමිකම්, ක්‍රිස්ටින් බෙල් (ඔක්ස්ෆඩ් 2000) පිටු 273-278

උදාහරණයක් දී ඇති අතර ඔහුට තේරුම් ගිය කරුණ වූයේ කොමිෂන් සභාවේ ආරම්භයේදී කාර්ය මණ්ඩලයේ වෙනත් කිසිදු සමාජ විද්‍යාඥයකු නොසිටින බවත් දත්ත සමුදා උපදේශකයන් වීම හැර සම්මුඛ පරීක්ෂණ ගණනාවකින් යුත් ක්ෂෙත්‍ර පරීක්ෂණ සහ දත්ත රැස්කිරීමේ ව්‍යාපෘතිවල අත්දැකීම් නොමැති එම පිරිස කොමිෂන් සභාවේ තොරතුරු කළමනාකරණය සහ ක්ෂෙත්‍ර පර්යේෂණ ක්‍රමවේදය සකස් කළේ කෙසේද යන්නයි. විවිධ විෂය ක්ෂෙත්‍ර පරාසයක විශේෂඥ දැනුම සහිත පුද්ගලයන්ගෙන් සාමාජිකයන් තෝරා ගැනීම නිර්දේශ කෙරේ.

- **ස්ත්‍රීපුරුෂ සමාජභාවී මධ්‍යස්ථතාවය**

1059. යෝජිත සත්‍යය සෙවීමේ යාන්ත්‍රණයේ සංයුතියෙහි ස්ත්‍රීපුරුෂ සමාජභාවී මධ්‍යස්ථතාවය එක්සත් ජාතීන්ගේ ආරක්ෂක කවුන්සිලයේ කාන්තාව, සාමය සහ ආරක්ෂාව පිළිබඳ යෝජනා සම්මතය (2023-2017) ක්‍රියාත්මක කිරීම සඳහා වූ ශ්‍රී ලංකාවේ ජාතික ක්‍රියාකාරී සැලැස්ම සමග ද අනුකූල වේ.

1060. ගැටුමෙන් පීඩාවට පත් කාන්තාවන් කෙරෙහි සහකම්පනය පෙන්වීම සඳහා උගත් පාඩම් සහ ප්‍රතිසන්ධාන කොමිෂන් සභාව ඔවුන්ගේ අවසන් වාර්තාවේ ඡේද ගණනාවක් වෙන් කරන ලදී. අවදානම් පාත්‍ර කණ්ඩායම්[615] යටතට ගැනෙන කාණ්ඩයක් ලෙස සාපේක්ෂව හඬක් නැති පිරිසක් වන කාන්තාවන් වර්ගීකරණය කිරීම මගින් පහත දැක්වෙන මනෝ භාවය -"ප්‍රචණ්ඩත්වය එහි ගමන් මග ඔස්සේ බොහෝ විට හඬක් නොමැති අවිහිංසක ජීවිතවලට කොකියන ලද හා නොපෙනෙන හානියක් ඉතිරි කර යයි" ප්‍රතිරාව නැංවීම මගින් ඔවුනට හඬක් ලබා දෙයි.[616]

1061. ඔවුන්ගේ අවශ්‍යතා මූලික ආහාර සහ හිසට සෙවනක සිට ආදායම් උත්පාදන ක්‍රියාකාරකම්, සමාජීය හා පුද්ගලික ආරක්ෂාව දක්වා පරාසයක විහිදෙයි. කාන්තාවන් විසින් මතු කළ පශ්චාත් ගැටුම් ගැටලුවලදි වැන්දඹුවන් සහ කාන්තා ගෘහමූලික පවුල් සංඛ්‍යාව වැඩිවීම පිළිබඳම සඳහන් කරන ලදී. එවැනි බොහෝ නිවාස කුඩා ළමුන්, වැඩිහිටියන් සහ ආබාධිත අය රැක බලා ගැනීම පිණිස තම පවුලේ කාන්තාවන් මත පරායත්ත වේ.

1062. යාපනයේ , කිලිනොච්චියේ හා කාත්තන්කුඩියේ අගතියට පත් කාන්තාවන්ගේ වාචික සාක්ෂි රැසකට කොමිෂන් සභාව සවන් දුණි. පරිච්ඡේද 4 සහ 5 හි, කාන්තාවක් ඉදිරිපත් කළ කරුණු දැක්වීමකට ද කොමිෂන් සභාව අවධානය යොමු කළ අතර එහිදි ඇය සඳහන් කළේ ඇය "විවිධ ආකාරයේ ලිංගික හා ස්ත්‍රීපුරුෂ සමාජභාවී ප්‍රචණ්ඩත්වයට නිරාවරණය වූ බවයි," නැගෙනහිර පළාතේ එල්ටීටීඊය සිදු කළ සාහසික ක්‍රියා නිසාවෙන් පීඩාවට පත්වූ තවත් කාන්තා කණ්ඩායමක් වෙතද අවධානය යොමු කිරීමට මෙම කොමිෂන් සභාව අදහස් කරයි. එල්ටීටීඊයේ පැහැර ගැනීම්, බලහත්කාර අතුරුදහන් කිරීම් සහ මිනී මැරුම්වල ප්‍රතිඵලයක් ලෙස ඔවුන්ට ඔවුන්ගේ ස්වාමි පුරුෂයන්, සහෝදරයන් හා දරුවන් අහිමි වූ ආකාරය කොමිෂන් සභාවට පැවසීමට බොහෝ කාන්තාවන් පිරිසක් කාත්තන්කුඩියට පැමිණියහ. සාක්ෂිදීම සඳහා පැමිණෙන ලෙස වූ මෙම කොමිෂන් සභාවේ ඉල්ලීමට ඉතා ප්‍රබල ලෙස ප්‍රතිචාර දැක්වූ කාන්තාවන් අති විශාල සංඛ්‍යාව දෙස බැලූ කළ, ලජ්ජාව වාර්තා කිරීම, දුක් ගැනවිලි පැවසීම, අභිමානය තහවුරු කිරීම, පැවැත්ම සඳහා වූ ඔවුන්ගේ අරගලයේ සුවිශේෂීබව සැමරීම සහ ඔවුන්ගේ එදිනෙදා ජීවිතයේදි පසු නොබැස කටයුතු කිරීම පිණිස වින්දිතයන් අවශ්‍යයෙන්ම ප්‍රසිද්ධියේ සාක්ෂි දිය යුතු බව මෙම කොමිෂන් සභාව දැඩිව විශ්වාස කරයි. මෙම කාන්තාවන්ගේ පවුල්වල ආදායම් උපයන්නන් ඔවුන්ගේ ජීවිතයේ හොඳම කාලයේදී උදුරා ගත් විටදී ඔවුන් ජීවිතය පවත්වා ගෙන යාමට අරගල කළ ආකාරය සම්බන්ධයෙන් අපට අවබෝධ කර දුන් විටදි මේ සියල්ලේ හිතකර බලපෑම

615 උගත් පාඩම් සහ ප්‍රතිසන්ධාන කොමිෂන් සභාව 5.100 -5.122 ඡේද බලන්න

616 උගත් පාඩම් සහ ප්‍රතිසන්ධාන කොමිෂන් සභාව 5.107 ඡේදය

කිලිනොච්චියේදී, යාපනයේදී, මඩකලපුවේදි, කාත්තන්කුඩියේදි සහ කොළඹ දී මෙම කොමිෂන් සභාවේ කොමසාරිස්වරුන්ට ප්‍රත්‍යක්ෂණීයව හැඟුණේය. මෙම අප්‍රසන්න අත්දැකීමේ නිමාව සඳහා වියෝගය, දොම්නස, අසරණභාවය සහ නොනැසී පැවැත්ම පිළිබඳ හැඟීම් සත්‍යය හා ප්‍රතිසන්ධාන කොමිෂන් සභාවක දී පැවැසිය යුතුය යන මතය මෙම පරීක්ෂණ කොමිෂන් සභාව දරන්නේ එබැවින් වන අතර ඇතැම් චින්දිත දිවි ගලවාගත්තවුන් නැවත වරක් මානසික කම්පනයට පත් විය හැකි බවත් දොම්නස හා තැවුල යන හැඟීම් ඔවුනට ඇති විය හැකි බවත් යන පදනම මත සත්‍යය කොමිෂන් සභාවක් සහ එහි භාව විශෝධන බලපෑම අභියෝගයට ලක් කර ඇතිය යන කරුණ අපි බැහැර නොකරන නමුත් ප්‍රතිඵලවනයේ සහ භාව විශෝධනයේ යාන්ත්‍රණයක් ලෙස සත්‍යය හා ප්‍රතිසන්ධාන කොමිෂන් සභාවත් අවශ්‍ය බව අප ඉදිරියේ සාක්ෂි දුන් සාක්ෂිකරුවන් රැසකගේ වාචික සාක්ෂි පාදකව අප අතර පොදු එකඟතාවක් තිබේ. ස.ප්‍ර.කොා.සභාවක් අතීත අපයෝජන සහ අතුරුදහන් වූ ඥාතීනට සිදුවූයේ කුමක්ද යන්න පිළිබඳ ඓතිහාසික වාර්තාවක් ස්ථාපිත කිරීමේ ක්‍රියාදාමය තුළ සෑම විටම සත්‍ය පැවසීමේ සහ සත්‍ය සෙවීමේ විකල්ප යාන්ත්‍රණයක් වේ.

සාමය ගොඩනැගීම, ගැටුම් වැළැක්වීම, ගැටුම් නිරාකරණය, තීරණ ගැනීම සහ දේශපාලනයේ කාන්තා සහභාගිත්වය ප්‍රවර්ධනය කිරීම

1063. මෙම අවස්ථානුගත තත්ත්වයන් තුළ, යෝජිත සත්‍යය හා ප්‍රතිසන්ධාන කොමිෂන් සභාවේ කොමසාරිස්වරුන් ලෙස, අසාධාරණයට සහ උල්ලංඝනය කිරීම්වලට ලක් වූ හෝ කාන්තාවන්ගේ සහභාගිත්වය දැඩිව නිර්දේශ කරනු ලැබේ. කාන්තාවන් හමුවේ තම දුක් ගැනවිලි ඉදිරිපත් කිරීමේදී කාන්තාවන්ට වඩා පහසුවක් දැනෙන බැවින් මෙම නිර්දේශය කෙරෙහි බරපතල අවධානයා යොමු කළ යුතු වේ. තවද, කාන්තා කොමසාරිස්වරියන්ගේ සහභාගිත්වය සාමය ගොඩනැගීම, ගැටුම් වැළැක්වීම, ගැටුම් නිරාකරණය සහ තීරණ ගැනීම උදෙසා ඔවුන්ගේ සහභාගිත්වය ප්‍රවර්ධනය කරනු ඇත.

- **නීති වෘත්තිකයෝ**

1064. සත්‍යය කොමිෂන් සභාව විසින් විමර්ශන සඳහා ප්‍රමුඛතා ගත කරන ලද වගවීමට අදාළ ගැටලු සම්බන්ධ සිද්ධිය පිළිබඳ ප්‍රශ්න නීතිය පිළිබඳ ප්‍රශ්න මතු කරන බැවින්, මෙම ගැටලු ඇගයීම පිණිස නෛතික දැනුම අවශ්‍ය වන අතර, එහෙයින් සත්‍යය හා ප්‍රතිසන්ධාන කොමිෂන් සභාවේ සාමාජිකයන ලෙස නීතිඥයන් පත් කිරීම අවශ්‍ය වේ. ජාත්‍යන්තර මානුෂීය නීතිය සහ ජාත්‍යන්තර මානව හිමිකම් නීතිය උගත් නීති වෘත්තිකයන් සභාවේ සංයුතියට ඇතුළත් කළ හැකිය. ජාත්‍යන්තර විශේෂඥයන් ඇතුලත් කොමිෂන් සභාවට අනුයුක්ත උපදේශන මණ්ඩලයක් ජාත්‍යන්තර මානුෂීය නීතිය සහ ජාත්‍යන්තර මානව හිමිකම් නීතිය උගත් පුද්ගලයන්ගෙන් සමන්විත විය යුතුය.

- **අනෙකුත් විෂය ක්ෂෙත්‍රයන්හි විශේෂඥයන්**

1065. නීති වෘත්තිකයන් කොමසාරිස්වරුන් ලෙස ඇතුලත් කිරීම සම්බන්ධයෙන් වන ඉහත නිර්දේශයෙන්, ලෝකයේ ඕනෑම ස්ථානයක අන් අය සමග උරෙනුර ගැටී කටයුතු කළ හැකි අනෙකුත් විෂය ක්ෂෙත්‍රයන්හි සුවිශේෂී දක්ෂතා දක්වා ඇති ඇතැම් පිරිමින් සහ කාන්තාවන් බැහැර කළ යුතු බව කිසිසේත්ම නොසැලකිය යුතුය.

ඈ. ක්‍රමවේදය

1066. රහස්‍ය ප්‍රකාශ ලබා ගැනීම, සහභාගිවන්නන් සඳහා මනෝ විද්‍යාඥයකුගේ සේවය ලබා දීම සහ විශේෂයෙන්ම ලිංගික ප්‍රචණ්ඩත්වය වැනි සංවේදී කරුණු වෙනුවෙන් ඉලක්ක කණ්ඩායම් රැස්වීම් පැවැත්වීම වැනි පහසුකම් හා සහයෝගය ලබා දීම මගින් නැවත මානසික පීඩන ඇති කිරීමේ හැකියාව අවම කිරීමේ ක්‍රියාමාර්ග ගත යුතුය.

2023 අංක 10 දරන අපරාධයක විත්දිතයන් සහ සාක්ෂිකරුවන් හට සහාය දීමේ සහ ආරක්ෂා කිරීමේ පනත

1067. සාක්ෂිකරුවන් සහ විත්දිතයන් හට ආරක්ෂාව සැලසීමට පමණක් නොව දුරස්ථ ස්ථානයක සිට සාක්ෂි ලබා දීම වැනි බලදායී පරිසරයක් සැපයීම මගින්, යෝජිත සත්‍ය සෙවීමේ යාන්ත්‍රණය විසින් නීතිකරණයේ ඇති මෙම පහසුකාරක ක්‍රියාදාමයෙන් නිසි ඵල ලබා ගත යුතුය. සත්‍යය සෙවීමේ යාන්ත්‍රණයක සාර්ථකත්වය රඳා පවතිනුයේ සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීමේ ශක්තිමත්

වැඩසටහනක බැවින්, එවැනි යාන්ත්‍රණයක විශ්වසනීයභාවය සහ ගුණකාය ඉහළ නැංවිය හැක්කේ 2023 අංක 10 දරන අපරාධයක විත්දිතයන් සහ සාක්ෂිකරුවන් හට සහාය දීමේ සහ ආරක්ෂා කිරීමේ පනත යටතේ ස්ථාපිත අපරාධයක විත්දිතයන් සහ සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීම සඳහා වන ජාතික අධිකාරිය හරහා මෙම පහසුකම් සැපයීම මගින් පමණකි.

1068. මෙම සංදර්භය තුළ, සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීමේ වැඩසටහනක් ශ්‍රී ලංකාවේ ඇති කිරීම සම්බන්ධයෙන් ඇති අපේක්ෂාවට අදාළව අයිසීජී, හියුමන් රයිට්ස් වොච් සහ ඇම්නෙස්ටි ඉන්ටනැෂනල් පවසා ඇති දෙය ජනාධිපති කොමිෂන් සභාව යළි මතකයට ගෙන එයි.[617]

සැබවින්ම ස්වාධීන කොමිෂන් සභා සාමාජිකයන්, සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීමේ සඵල බලතල, සහ සිදුවුවා යැයි පැවසෙන ජාතික සහ ජාත්‍යන්තර නීතියේ උල්ලංඝනය කිරීම් පූර්ණ පරාසය ගවේෂණය කිරීම පිණිස විධානයක් සහිතව; සහ දණ්ඩන මුක්තිය අවසන් කිරීම පිණිස රජයේ ක්‍රියාකාරකම්වලින් ස පොලිසිය සහ අධිකරණය සඵල සහ අපක්ෂපාතී නඩු පැවැරීම් දියත් කරන බව සහතික කරන සැබෑ සහ විශවසනීය ක්‍රියාදාමයක් ස්ථාපනය කරනු ලැබුවහොත්, එය හමුවේ පෙනී සිටීමට අප සියලු දෙනා සතුටු වන අතර .....

ඉ. ආගමික අනුශාසකවරු

1069. යෝජිත සත්‍යය පිළිබඳ කොමිෂන් සභාවට සියලු ආගමික ප්‍රජාවන්ගේ තෝරා ගනු ලබන ගෞරවනිය අනුශාසකවරුන් සිටිය යුතුය.[618]

- **කොමසාරිස්වරුන්ගේ ස්වාධීනත්වය**

1970. පහත දැක්වෙන ප්‍රමිති සහ මූලධර්ම පිළිගතහොත් පොදුවේ ස්වාධීනත්වය සපුරා ගත හැක.

- කොමිෂන් සභාවේ ස්වාධීනත්වයට ගරු කිරීමට රාජ්‍ය ආයතනවලට යුතුකම්ක් තිබේ. කොමිෂන් සභාවේ අපක්ෂපාතීභාවය, අභිමානය, ප්‍රවේශ්‍යතාව සහ සඵලතාව සහතික කිරීමට ඔවුන් ඊට සහාය දී එය ආරක්ෂා කළ යුතුය.

- කාර්යක්ෂම, නිපුණ සහ අපක්ෂපාතී විමර්ශනයක් රඳා පවතිනුයේ කොමිෂන් සභාවේ මූල්‍ය සුරක්ෂිතතාව සහ සංවිධානමය වෘත්තීයභාවය මතය.

- කොමසාරිස්වරුන් සහ ඔවුන්ගේ කාර්ය මණ්ඩලය දේශපාලන කණ්ඩායමකට පක්ෂපාතී නොවිය (හෝ එසේ වන බවට දකිනු නොලැබිය) යුතුය. මීට රජයේ ආයතනවලින් ද්වීතියික පදනමින් අනුයුක්ත කළ අය ද ඇතුළත් වේ.

617 ශ්‍රී ලංකාවේ උපුටා දක්වා ඇති අයිසිජී 210ආ සහ ආරක්ෂා කිරීමේ වගකීම; දේශපාලනය, චාර්ගිකත්වය සහ සමූලඝාතනය, ඩේමියන් කිංස්බරි

618 9.268 ඡේදයේ ඇති උගත් පාඩම් සහ ප්‍රතිසන්ධාන කොමිෂන් සභාවසභාවේ නිර්දේශ හා මෙය අනුකූල වේ.

- කොමසාරිස්වරුන් පූර්ණ කාලීන පදනමින් කොමිෂන් සභාවේ කටයුතු කළ යුතුය.
- ඉහළම ප්‍රමිතියෙන් සිය කර්තව්‍ය ඉටු කිරීමට සහ එහි සම්පත් වෙන්කිරීම නිර්ණය කිරීම සඳහා සහභාග වීමට හැකියාව ඇති කරනු පිණිස කොමිෂන් සභාවට ප්‍රමාණවත් අරමුදල් තිබිය යුතුය.
- කොමිෂන් සභාවට නිසි පුහුණුව ලැබූ කාර්ය මණ්ඩලයක් සහ ප්‍රමාණවත් පහසුකම් තිබිය යුතු අතර එය සාධාරණ, ප්‍රවේශ්‍ය සහ ප්‍රතිචාරී විය යුතුය.

උ. කටයුතු සහ වාර්තාව

1071. වේදනාකාරී අතීතයක් වලළනු සඳහා කොමිෂන් සභාව අනාරණය කරගන්නා කරුණුවලට උපරිම විශ්වාසනීයත්වයක් ලබා දීම පිණිස ශ්‍රී ලංකාව තුළ ස.ප්‍ර.කො.ස. සිදුකරන කටයුතු සහ එහි වාර්තාව ජාත්‍යන්තර ප්‍රමිති පිළිඹිබු කිරීම වැදගත් වේ. කොමිෂන් සභාව සිය පූර්ව අතුරු වාර්තාවලින් මෙම කරුණ පෙන්නුම් කර දී ඇති අතර ශ්‍රී ලංකාවේ ආර්ථිකය සෙමින් යථා තත්ත්වයට පත්වෙමින් තිබියදී, සංචාරය ව්‍යාපාරය හිස ඔසවමින් සිටියදී සහ එහි ජනතාවගේ කාරුණිකභාවයෙන් සහ සුහදතාවයෙන් සංචාරකයන් ප්‍රමෝදයට පත් වෙමින් සිටියදී, සාමය හා සංහිඳියාව ශ්‍රී ලංකාවට අතිශයින් වැදගත් වනු ඇතැයි යන සුබවාදී අපේක්ෂාව කොමිෂන් සභාව දරා සිටියි.

1072. යුද්ධයේ අවසන් අදියර සම්බන්ධ සාක්ෂි විශ්ලේෂණය කිරීමේදී, ජාත්‍යන්තර මානුෂීය නීතිය සහ ජාත්‍යන්තර මානව හිමිකම් නීතිය උල්ලංඝනය කිරීම් පිළිබඳ සිදුවීම් සම්බන්ධයෙන් එක් අතකින් උගත් පාඩම් සහ ප්‍රතිසන්ධාන කොමිෂන් සභාව සහ ජනාධිපති කොමිෂන් සභාව අතර අනෙක් අතින් විශේෂඥ මඩුල්ල සහ එ.ජා.මා.හි.කො.කාර්යාලයේ ශ්‍රී ලංකාව පිළිබඳ විමර්ශනය අතර අපසරණයක් පවතී. කටුක අන්‍යෝන්‍යව විනාශකාරී ගැටුමක් හේතුවෙන් මෙරට සිදුවූ නිරර්ථක ලේ වැගිරීම පිළිබඳව වින්දිතයන් පවසන දේ ඇසීමට නැවත වරක් අවස්ථාවක් එළඹ තිබේ. විශ්වසනීය සත්‍ය සෙවීමේ යාන්ත්‍රණයක් මෙම ක්‍රියාදාමයේ පාලනය සියතට ගැනීමට ආසන්නව ඇති බැවින් සහ ප්‍රමාණවත් සාක්ෂි ඉදිරිපත් වුවහොත් නඩු පැවරීම සඳහා මාර්ගයක් සැපයීම එවැනි සත්‍ය සෙවීමේ යාන්ත්‍රණයක් අඛණ්ඩව සිදු කරන බැවින් එම යාන්ත්‍රණය හරහා විශ්වාසනීය විමර්ශනයක් පැවැත්වීම පිණිස ශ්‍රී ලංකාවට ජාත්‍යන්තර සහාය ලබා දිය යුතු අතර අදාළ සියලු දෙනා විසින් මෙම මෙම ක්‍රියාදාමයට සහයෝගය දැක්විය යුතුය.

1073. මෙම සාක්ෂි අප රැගෙන යන්නේ කොතැනටදැයි විනිශ්චය කිරීම අපට අයත් දෙයක් නොවන අතර දේශීය සැකසුමක් තුළ අවසානාත්මක, පූර්ණ සහ ස්වාධීන විමර්ශනයක් ශ්‍රී ලංකාව සහතික කළ යුතු අතර අප ජනතාවගේ දිගු කාලීන සාමය සහ සංහිඳියාව සඳහා සංක්‍රාන්තික යුක්තියේ කුළුණු හතර වෙන් කළ නොහැකි ලෙස සංකලනය කොට එකට වෙළිය යුතුය. මෙතරම් දිගු කාලයක් අපගෙන් ගිලිහී ගිය ප්‍රතිසන්ධානය මෙම දිවයිනට නොබෝ දිනකින්ම එළඹෙනු ඇත්තේ එවිට පමණි. ශ්‍රී ලාංකිකයන් සැවොම මහත් බලාපොරොත්තු දල්වා සිටි ලහා කර ගැනීමට නොහැකි වූ ඒ සාමය මෙරරට උදා වනු ඇත්තේ ප්‍රතිෂ්ඨාපන සහ දණ්ඩණීය යන දෙයාකාර ආකෘතියක් මත ව්‍යුහගත සත්‍ය හා ප්‍රතිසන්ධාන කොමිෂන් සභාවකින් පමණි. සාමය සහ සාමයම පමණක් පැන නගිනු ඇත්තේ සියලු චෝදනා සම්බන්ධයෙන් කටයුතු කරන ස්වාධීන, විස්තීරණ සහ විශ්වාසනීය විමර්ශනයකින් පමණි.

ඌ. දේශපාලන විසඳුම

1074. ගැටුමට හේතු පාදක වූ හෙතු ආමන්ත්‍රණය කරන සියලු සර්වග්‍රාහී දේශපාලන විසඳුමක් සාමය සහ සාමයේ ප්‍රගමනය කරා තවදුරටත් දායකත්වය ලබා දෙනු ඇත. බලය විමධ්‍යගත කිරීම වැනි

කරුණු මෙරට ජනතාව එක්සත් කිරීමට මග හෙළි කරන බැවින් මෙම කරුණු සම්බන්ධයෙන් නිර්දේශ ඉදිරිපත් කිරීමට සත්‍යය හා ප්‍රතිසන්ධාන කොමිෂන් සභාවට හැකිය.

එ. ජාත්‍යන්තර සහයෝගය

1075. සාර්ථක කොමිෂන් සභාවක් සඳහා වගකීම තනිකරම ශ්‍රී ලංකා රජය මත පමණක්ම පවතින්නක් නොවේ. සභාවේ කටයුතු නිරීක්ෂණය මගින් සිදුකරන අධීක්ෂණය පමණක් නොව තාක්ෂණික සහයෝගය සහ ආයතනික ධාරිතාවය සැපයීම මගින් ජාත්‍යන්තර ප්‍රජාවට ද ඉටු කිරීම පිණිස වැදගත් භූමිකාවන් ගණනාවක් තිබේ. ලෝකයේ අනෙකුත් රටවල සත්‍ය සෙවීමේ යාන්ත්‍රණයක් ස්ථාපනය කරනු ලැබූ සෑම විටකදීම, විදේශ රජයන් විසින් ඔවුන්ගේ සක්‍රීය සහයෝගය ලබා දී තිබේ. කොලොම්බියාව මේ සඳහා කදිම උදාහරණයකි. එ.ජා.මා.හි.කවුන්සිලයේ යෝජනා සම්මත ශ්‍රී ලංකාවේ සත්‍ය සෙවීමේ යාන්ත්‍රණයක් සඳහා සහාය ලබා දෙන බවට ප්‍රතිඥා දී ඇති අතර අප රටේ මෙම මූලාරම්භයට සහාය ලබා දෙන ලෙස එ.ජා.මා.හි.කවුන්සිලයට සෘජු ඉල්ලීමක් ශ්‍රී ලංකාව සිදු කළ යුතු බවට නිර්දේශ කරනු ලැබේ.

1076. සත්‍ය සෙවීමේ යාන්ත්‍රණයේ ව්‍යුහය, යාන්ත්‍රණය සහ ක්‍රියාවලිය වේගවත් කිරීම පිණිස ශ්‍රී ලංකා රජයට සහායවීම පිණිස ජාත්‍යන්තර තාක්ෂණික උපදේශකයන් දෙතුන් දෙනෙකු පත් කිරීමට ශ්‍රී ලංකාව කඩිනමින් කටයුතු කළ යුතුය.

1077. ව්‍යවස්ථාපිතව, යෝජිත සත්‍යය හා ප්‍රතිසන්ධාන කොමිෂන් සභාවේ දේශීය සහ ජාත්‍යන්තර විශේෂඥයන් නෛතික සහ තාක්ෂණික කරුණු පිළිබඳ උපදෙස් ලබා දීමට පමණක් සීමා කළ යුතු අතර ඔවුන් කිසිදු ආකාරයකින් විමර්ශන හෝ තීරණ ගැනීමට සම්බන්ධ නොවිය යුතුය. විශේෂඥයන් සමග එළඹෙන ගිවිසුම්වල එවැනි ව්‍යවස්ථාපිත අවශ්‍යතාවයක් සලකුණු කර පැහැදිළිව විස්තර කළ යුතුය. විමර්ශන සිදු කිරීමේදී විමර්ශන ඒකකයට සහ ජාත්‍යන්තර ස්වාධීන සම්භාවනිය තැනැත්තන් කණ්ඩායමට මුහුණ පෑමට සිදුවන දුෂ්කරතා එමගින් මගහරවා ගත හැකි වනු ඇත.

1078. ශ්‍රී ලංකා රජය මෙම මූලාරම්භය බරපතල ලෙස සලකන බවට වන සද්භාවය නිරූපණය කිරීම පිණිස ඉහළ බලතල සහිත සංක්‍රාන්තික යුක්ති ජාත්‍යන්තර උපදේශන මණ්ඩලයක් නිර්මාණය කළ යුතුය. දැනටමත් සිදුවෙමින් පවතින මහජන අදහස් විමසීමේ ක්‍රියාවලියක් ඇති බැවින්, සත්‍ය සෙවීමේ යාන්ත්‍රණයක කටයුතු අවසන් කර එහි කටයුතු ආරම්භ කිරීමට පෙර මහජනතාවගේ සහ වින්දිත ප්‍රජාවන්ගේ සහාය ලබා ගැනීම සඳහා මාස කිහිපයක් ගතවීමට ඉඩ ඇත. එම අතරමැදි කාලය තුළ සංක්‍රාන්තික යුක්තිය පිළිබඳ අන්තර්ජාතික උපදේශන මණ්ඩලය හරහා ශ්‍රී ලංකාවට අවශ්‍ය ජාත්‍යන්තර සහාය ලබා ගැනීම අත්‍යාවශ්‍ය වන්නේය.

ඒ. සත්‍යය හා ප්‍රතිසන්ධාන කොමිෂන් සභාව පිළිබඳ පසු විපරම

1079. සත්‍යය හා ප්‍රතිසන්ධාන කොමිෂන් සභාව පීඩාවට පත් ජන කොටස් වෙනුවෙන් නිර්දේශ ඉදිරිපත් කළ හැකි ව්‍යවස්ථාපිත ආයතනයක් වනු ඇත. සත්‍යය පිළිබඳ කොමිෂන් සභාව විසින් කරනු ලබන නිර්දේශ පද්ධතිමය අපරාධවලට එරෙහිව නඩු පැවැරීම, වින්දිතයන් සඳහා හානිපූරණ, හෝ කාන්තා

අයිතිවාසිකම්වලට ගරු කිරීම ශක්තිමත් කිරීම පිණිස ප්‍රතිසංස්කරණ සම්බන්ධයෙන් වනු ඇත.[619] පසු විපරමක් නොමැතිවීම රජයේ නොසැලකිල්ල හා උදාසීනත්වය පිළිබඳව පොදුවේ පවතින අදහස ශක්තිමත් කළ හැකි බැවින්, චින්දිතයන්ගේ සහ සාක්ෂිකරුවන්ගේ අවශ්‍යතා හෝ ඔවුන් හඬ නගන මතය සඳහා ප්‍රමුඛතාවක් නොමැත්තේය යන සංජානනය ඇති නොවන පරිදි සත්‍යය හා ප්‍රතිසන්ධාන කොමිෂන් සභාවේ නිර්දේශ ක්‍රියාත්මක කිරීම අධීක්ෂණය සඳහා ප්‍රතිපාදන තිබිය යුතුය.

1080. සත්‍යය හා ප්‍රතිසන්ධාන කොමිෂන් සභාවේ අවසන් වාර්තාව පාර්ලිමේන්තුවේ සභාගත කළ යුතු අතර මහජනයාට ලැබෙන්නට සැලැස්විය යුතුය.

1081. සියරා ලියොන් සම්බන්ධයෙන් ගත් කළ, සඵල නිර්දේශ නොමැතිවීම මහජන කළකිරීම සහ සත්‍යය හා ප්‍රතිසන්ධාන කොමිෂන් සභාවේ සාක්ෂි දුන් විවිධ ක්‍රියාධරයන් අතර විවේචනයට හේතු කාරක විය.

ඔ. පසුවිපරම සඳහා ප්‍රමාණවත් අරමුදල් සැපයීම

1082. සත්‍යය හා ප්‍රතිසන්ධාන කොමිෂන් සභාවේ නිර්දේශ ක්‍රියාත්මක කිරීම සඳහා පිහිටුවන ලබන යම් කමිටුවක් එම කොමිෂන් සභාවේ නිර්දේශ යථාර්තයක් බවට පරිවර්තනය කිරීම පිණිස ප්‍රමාණවත් අරමුදල් ලබා ගැනීමේ පසුවිපරම් යාන්ත්‍රණයක් සකස් කළ යුතුය. එසේ නොවුණහොත්, දිගු කාලීන තිරසර සැලසුම්කරණයකින් තොරව ප්‍රතිඥා ලබා දී බලාපොරොත්තු ඉහළ නැංවීම වෙනුවෙන් එම ක්‍රියාදාමයේ වැරදි පෙන්වා දෙමින් විවේචන සිදු කිරීමට ඉඩ ඇත. කොමිෂන් සභාව විසින් කරනු ලබන නිර්දේශවල ප්‍රගතිය පිළිබඳව වාරික වාර්තා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ යුතුය.

1083. අරමුදල්කරණය පිළිබඳව වන නිරීක්ෂණය සත්‍යය හා ප්‍රතිසන්ධාන කොමිෂන් සභාව සඳහා කාර්යාලය සුදානම් කිරීම හා ස්ථාපනය කිරීම වෙනුවෙන් වූ අරමුදල්කරණ අවශ්‍යතා සහ සම්පත් සඳහා ද අදාළ වනු ඇත. සංවිධානමක කරුණු සඳහා වන වියදම් සපුරාලීම සඳහා සම්පත් වෙන් කිරීම ප්‍රමාණවත් නොවන බව ඇතැම් කොමිෂන් සභා පසුව අවබෝධ කර ගත් විටදී තමන් වෙත පවරනු ලැබ ඇති ඇතැම් අභිමානවත් විධි නියෝග ක්‍රියාත්මක කිරීමේදී බොහෝ කොමිෂන් සභා මුහුණ දුන් බාධක ප්‍රිසිලා හේනර් විස්තර කරයි. කොමිෂන් සභාවේ මන්දගාමී ආරම්භය සම්බන්ධයෙන් කලකිරීමට පත්විය හැකි චින්දිතයන් සහ අයිතිවාසිකම් අධිවාචකයන් එනිසා ඉවිඡා භංගත්වයට පත්වනු ඇත. මෙම අවස්ථානුගත තත්ත්වයන් තුළ, කොමිෂන් සභාවේ මෙහෙයුම් කටයුතු ආරම්භ වීමට පෙර, ප්‍රතිපත්ති සහ ගිවිසුම් රාමුවල ස්ථාපිත කිරීමේ කාලය නිශ්චිතව නියෝග කිරීම මගින් සත්‍යය සෙවීමේ කොමිෂන් සභාව මෙම ප්‍රබල අන්තරාය මග හරවා ගත යුතුය.

1084. මෙම විෂය පිළිබඳ ජාත්‍යන්තර උපදේශකයන්ගේ සහ විශේෂඥයන්ගේ සායය ඇතිව තව දුරටත් වර්ධනය කළ හැකි ඉහත දැක්වෙන ආකෘති පිළිබඳ දළ සටහනක් සකස් කිරීමෙන් අනතුරුව, කොමිෂන් සභාව විමර්ශනවල සිය ප්‍රධාන අරමුණුවලට අවධානය යොමු කිරීමේදී, සත්‍යය හා ප්‍රතිසන්ධාන කොමිෂන් සභාව ප්‍රමුඛතා ගත කළ යුතු සිද්ධීන් ඇතුළුව සිය නිර්දේශ කිරීමට කටයුතු කරනු ඇත.

619 දකුණු අප්‍රිකානු සත්‍යය කොමිෂන් සභාවේ නිර්දේශ පිළිබඳ විස්තර සඳහා, වාර්තාව, වෙළුම V (1998) පිටුව 117 සහ පසුව දැක්වෙන දෑ

4. යෝජිත සත්‍ය සෙවීමේ සහ ප්‍රතිසන්ධාන කොමිෂන් සභාව පිළිබඳ තවත් නිර්දේශ - සත්‍ය සෙවීමේ සහ ප්‍රතිසන්ධාන කොමිෂන් සභාව විසින් විමර්ශනය කළ යුතු පූර්වගාමී කොමිෂන් සභාවල නිර්දේශ

1085. පූර්ව පරිච්ඡේදවල අපගේ සාකච්ඡා මගින් පෙන්වා දී ඇති පරිදි, පෙර කොමිෂන් සභාවල නිර්දේශ සතුටුදායක ආකාරයෙන් ක්‍රියාත්මක කර නොමැත. යෝජිත සත්‍යය හා ප්‍රතිසන්ධාන කොමිෂන් සභාව විසින් අප පහත දක්වා ඇති මෙම සියලු සිදුවීම් ප්‍රමුඛතාවක් ලෙස විමර්ශන කොට පරීක්ෂා කරනු ලැබිය යුතු බව අප නිර්දේශ කරනුයේ මෙම හේතුව නිසාය.

1086. පෙර කොමිෂන් සභා විසින් විමර්ශනය කළ යුතු බවට නියෝග කරනු ලැබූ පහත දැක්වෙන සිදුවීම්වලට සත්‍ය සෙවීමේ යාන්ත්‍රණය සිය විමර්ශනවලදී ප්‍රමුඛතාවය ලබා දිය යුතු බව අප අදහස් කරන්නෙමු. යෝජිත සත්‍යය හා ප්‍රතිසන්ධාන කොමිෂන් සභාව ස්ථාපිත කරන ප්‍රඥප්තියේ වෙනම උපලේඛනයක මෙම සිදුවීම් ලියා දැක්විය යුතු අතර වෙනත් කවර හෝ සිදුවීමකට වඩා ප්‍රමුඛතාව අවශ්‍ය කරන සිදුවීම් ලෙස එකී කොමිෂන් සභාවට බාර දිය යුතුය. ස.ප්‍ර.කො.ස. විසින් මෙම වරදවල් විමර්ශනය කිරීමේදී, විමර්ශනයේ සියලු අංග සත්‍යය සෙවීමේ යාන්ත්‍රණය මගින් ඇගයිය යුතු අතර වරදකරුවන්ගේ අනන්‍යතාව හෙළිදරව් කරන සාක්ෂි තිබේ නම් යෝජිත සත්‍යය සෙවමේ කොමිෂන් සභාව ඔහුට සිතාසි නිකුත් කර කරුණු ඉදිරිපත් කිරීමට අවස්ථාව දිය යුතුය.

1087. උදලාගම කොස., උගත් පාඩම් සහ ප්‍රතිසන්ධාන කොමිෂන් සභාව සහ පරණගම කොස. විසින් උල්ලංඝනය කිරීම් විය හැකි බවට සොයා ගත් සිදුවීම් පහත දක්වා ඇති අතර එම සිදුවීම්වලට ප්‍රමුඛතාව ලබා දීමේ කාර්යය සඳහා

යෝජිත සත්‍යය සෙවීමේ යාන්ත්‍රණය නිර්මාණය කරන්නා වූ පනතේ උපලේඛනයට ඒවා අන්තර්ගත කළ යුතු බව මෙම ජනාධිපති විමර්ශන කොමිෂන් සභාවේ නිර්දේශයයි.

1. ත්‍රිකුණාමල පහ සිදුවීම (උදලාගම කොමිෂන් සභාව)
2. ඒසීඑෆ් සහන සේවකයන් 17 දෙනා ඝාතනය කිරීම (උදලාගම කොමිෂන් සභාව)
3. සිවිල් වැසියන්ගේ මරණ සහ තුවාලවීම් පිළිබඳ විමර්ශන සහ සාක්ෂි පාදකව වැරැදිකරුවන්ට නඩු පැවැරීම.[620]
4. රෝහල්වලට එල්ල කළ ෂෙල් වෙඩි ප්‍රහාරවලට වරදකරු කවර පාර්ශවය ද යන්න අදාළ නොවන බව උගත් පාඩම් සහ ප්‍රතිසන්ධාන කොමිෂන් සභාව පවසා විමර්ශනයකින් පසුව පීඩාවට පත්වූවන්ට සහන ලබා දීම පමණක් නිර්දේශ කළ ද, පරණගම කොමිෂන් සභාව විනිශ්චයකරුවකුගේ නායකත්වයෙන් යුතු පරීක්ෂණයක් නිර්දේශ කර ඇති බැවින්,[621] යෝජිත සත්‍යය සෙවීමේ යාන්ත්‍රණය මගින් ඉහත සිදුවීම් සම්බන්ධයෙන් නව විමර්ශනයක් සිදු කළ යුතු බව ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාව නිර්දේශ කරයි.[622]

620 උගත් පාඩම් සහ ප්‍රතිසන්ධාන කොමිෂන් සභාව ඡේදය 4.286 බලන්න

621 පරණගම කොමිෂන් සභාව, ඡෙද 470 සහ 478 බලන්න; එසේම අවසන් වාර්තාවේ ඡේද 466 සිට පහළට මෙම කරුණ පිළිබඳ සාකච්ඡාව බලන්න.

622 උගත් පාඩම් සහ ප්‍රතිසන්ධාන කොමිෂන් සභාව ඡේදය 4.294 බලන්න

5. සැපයුම් තක්සේරු කළ හැකි අදාළ සියලු සාධක සැලකිල්ලට ගනිමින් යුද්ධයේ අවසන් දින කිහිපය අතරතුර ගැටුම් පැවැති ප්‍රදේශවල සිවිල් වැසියන්ට වෛද්‍ය සැපයුම් නිකුත් කිරීමේ මානුෂීය කරුණ පිළිබඳ විමර්ශනය.[623]

6. ශ්‍රී ලංකා යුධ හමුදාවට යටත් වූ නිශ්චිත ප්‍රදේශ පිළිබඳ පරීක්ෂණයක් හා විමර්ශනයක්; හමුදාවේ නිල බාරයට යටත් වීමෙන් පසු බලහත්කාර අතුරුදහන් කිරීම් පිළිබඳ සාක්ෂි ඉදිරිපත් වුවහොත් වරදකරුවන්ට එරෙහිව නඩු පැවැරිය යුතු බව මෙම කොමිෂන් සභාව නිර්දේශ කරයි.[624]

7. සිවිල් වැසියන්ට හිතාමතා ම පහරදීම පිළිබඳව වාර්තා කර ඇති සිදුවීම් විමර්ශනය කිරීම සහ සාක්ෂිවලින් හෙළිදරව් වීම මත වරදකරුවන්ට නඩු පැවරීම පිණිස උචිත නෛතික ක්‍රියාමාර්ග ගත යුතුය.[625] වාර්තා වී ඇති එවැනි සිදුවීම් උගත් පාඩම් සහ ප්‍රතිසන්ධාන කොමිෂන් සභාව වාර්තාවේ 4.359 ඡේදයේ VI (අ) සහ (ආ) හි සඳහන් කර ඇත.

8. චැනල් 4 වාර්තා චිත්‍රපට වීඩියෝ පටයේ චෝදනාවල සත්‍යතාව නිර්ණය කිරීම පිළිබඳ පරීක්ෂණය.[626] චැනල් 4 වීඩියෝ පටය පිළිබ උගත් පාඩම් සහ ප්‍රතිසන්ධාන කොමිෂන් සභාවසහා සාකච්ඡාවට අදාළ නිරීක්ෂණ ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභා අවසන් වාර්තාවේ 311-315 දක්වා ඡේදවල දක්වා ඇත. තවද, චැනල් 4 විඩියෝ පටය පිළිබඳ පරණගම කොමිෂන් සභාවේ සාකච්ඡාවට අදාළව ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභා නිරීක්ෂණ මෙම අවසන් වාර්තාවේ ඡේද 466-472 හි දක්වා ඇත.

1088. තවදුරටත් විමර්ශනය කිරීම අවශ්‍ය වන සිදුවීමේ ලෙස උගත් පාඩම් සහ ප්‍රතිසන්ධාන කොමිෂන් සභාව සහ පරණගම කොමිෂන් සභාව යන දෙකම විසින් ඔවුන්ගේ අවසන් වාර්තාවල මෙම සිදුවීම් නිශ්චිතව සඳහන් කර ඇති බැවින්, සිදු කළේ යැයි පැවසෙන ඉසයිප්‍රියා, කර්නල් රමේෂ් සහ බාලචන්ද්‍රන් ප්‍රභාකරන් ඝාතනය කිරීම් යෝජිත සත්‍ය සෙවීමේ යාන්ත්‍රණය මගින් විමර්ශනය කළ යුතු යැයි මෙම කොමිෂන් සභාව නිර්දේශ කරයි.

1089. මෙම කොමිෂන් සභාවේ අවසන් වාර්තාවේ දෙවන කොටසේ 3 වන පරිච්ඡේදයේ අප පෙන්වා දී ඇති පරිදි, පරණගම කොමිෂන් සභාව ද මෙම කරුණුම විමසා බලා ඇති අතර ඒවා අතුරින් ෂෙල් වෙඩි ප්‍රහාර එල්ල කිරීම, වෛද්‍ය සැපයුම්, යටත්වීම් සහ අතුරුදහන් වීම් ආදිය වැනි සිදුවීම් පිළිබඳව එම කොමිෂන් සභාවේ වැදගත් නිරීක්ෂණ තිබේ. මෙම අවස්ථානුගත තත්ත්වයන් තුළ, මෙම සියලු සිදුවීම් යෝජිත සත්‍යය සෙවීමේ යාන්ත්‍රණයට විමර්ශනය පිණිස බාර දිය යුතු යැයි අපි නිර්දේශ කරන්නෙමු. එම සිදුවීම් විමර්ශනය කිරීමේ ක්‍රියාදාමය තුළ, ඉහළම සුපිළිපන්බව සහිත පොලිස් නිලධාරීන් විය හැකි දක්ෂ විමර්ශකයන් කණ්ඩායමක් විසින් සත්‍යය හා ප්‍රතිසන්ධාන කොමිෂන් සභාවට සහය ලබා දී ආධාර කළ යුතුය. උල්ලංඝනය කිරීම් අභවමින් සත්‍ය සෙවීමේ යාන්ත්‍රණය ඉදිරියේ සාක්ෂි ඉදිරිපත් වූ විටදී, විමර්ශකයන් කණ්ඩායම සත්‍යය හා ප්‍රතිසන්ධාන කොමිෂන් සභාවේ විමර්ශන කර්තව්‍යයන්ට අවශ්‍ය සියලු සහාය ලබා දිය යුතුය. සාමාන්‍යයෙන් විමර්ශන කණ්ඩායමක් වැනි විමර්ශනාත්මක ඒකක සත්‍යය කොමිෂන් සභාවකට සමාන්තරව, ඊට පෙර හෝ පසුවිපරමක් ලෙස ක්‍රියාත්මක වෙයි.

---

623 උගත් පාඩම් සහ ප්‍රතිසන්ධාන කොමිෂන් සභාව ඡේදය 4.311 බලන්න

624 උගත් පාඩම් සහ ප්‍රතිසන්ධාන කොමිෂන් සභාව ඡේදය 4.319 බලන්න.

625 උගත් පාඩම් සහ ප්‍රතිසන්ධාන කොමිෂන් සභාව ඡේදය 4.360 බලන්න.

626 උගත් පාඩම් සහ ප්‍රතිසන්ධාන කොමිෂන් සභාව ඡේදය 4.375 සහ 9.39 බලන්න

සත්‍ය සෙවීමේ හා ප්‍රතිසන්ධාන කොමිෂන් සභාව විසින් සාක්ෂි ඇගයීම

1090. සාක්ෂි ඇගයීම සඳහා සැල්වදෝරියානු සත්‍යය කොමිෂන් සභාව පහත දැක්වෙන අවශ්‍යතා දක්වන ලදි.

'තමන් එකකු කරනු ලැබූ සාක්ෂිවල විශ්වාසවන්තභාවය සහතික කිරීම පිණිස, දැනටමත් සත්‍යතාව තහවුරු කර ඇති මූලාශ්‍ර විශාල සංඛ්‍යාවකට ප්‍රතිපක්ෂව ඒවා පරීක්ෂා කරමින් සියලු ප්‍රකාශවල කරුණු සත්‍යාපනය කිරීම, තහවුරු කිරීම සහ සමාලෝචනය කිරීම කොමිෂන් සභාව අවධාරණය කරන ලදී. යම් නිගමනයකට එළඹීම පිණිස කොමිෂන් සභාව සඳහා අවශ්‍ය කරනු ලබන යම් විනිශ්චයට පාදක ප්‍රශ්නය පිළිබඳ සත්‍යය තහවුරු කිරීම පිණිස කිසිදු තනි මූලාශ්‍රයක් හෝ සාක්ෂිකරුකු ප්‍රමාණවත් සේ නොසැලකීමට තීරණය කරන ලදී. එසේම, තව දුරටත් තීරණය කරනු ලැබුයේ ද්විතියික මූලාශ්‍ර, උදාරහණ ලෙස, ජාතික හෝ අන්තර්ජාතික රජයන්ගේ හෝ පුද්ගලික ආයතනවල වාර්තා සහ තමන් වාර්තා කළ කරුණු පිළිබඳ ප්‍රභවයෙන්ම ලබා ගත් දැනුම නොමැති පුද්ගලයන්ගේ ප්‍රකාශ, යම් නිගමනයකට එළඹීම පිණිස ප්‍රමාණවත් පදනමක් ඒවා මගින් පමණක් සංස්ථාපනය නොකරන්නේ යැයි තීරණය කරන ලදී. කෙසේ වෙතත්, ප්‍රාථමික මූලාශ්‍ර මත පදනම්ව අනාවරණය කරගත් කරුණු සත්‍යාපනය සඳහා පරිවේෂණීය සාක්ෂි සමගින් මෙම ද්වීතියික මූලාශ්‍ර යොදා ගන්නා ලදී. සාක්ෂි මගින් කොමිෂන් සභාව 'ඒකාන්තයෙන්ම තහවුරු කර ගත්තේ නම්' මෙම වාර්තාවේ නම් සඳහන් කර ඇත.[627]

1091. සිය විමර්ශන කණ්ඩායමේ සහායෙන් සත්‍යය හා ප්‍රතිසන්ධාන කොමිෂන් සභාව නිගමනයකට එළඹ වරදකරුවන් හඳුනාගත් විටදී, නඩු පැවරීම සඳහා ස.ප්‍ර.කො.ස. සිය නිර්දේශය ලබා දිය යුතුය. සත්‍යය සෙවීමේ යාන්ත්‍රණයේ විමර්ශන කර්තව්‍ය සහ සාක්ෂි ඇගයීම වින්දිත කේන්ද්‍රීයබව මූලධර්මය කර ගත යුතු බවට වන අදහස සංගතව මෙම ජනාධිපති කොමිෂන් සභාව පවත්වා ගනියි. නිර්දේශ ලෙස වින්දිතයන්ට උචිත ප්‍රතිකර්ම සැපයීම සම්බන්ධයෙන් ගත් කළ, සත්‍ය සොයා යාමේ ක්‍රියාවලියේදී වින්දිතයන්ගේ හඬට සෑම විටම ප්‍රමුඛතාව ලැබිය යුතුය.

5. අනෙකුත් නිර්දේශ

අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය

අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය විසින් ඉදිරි කටයුතු කිරීමට නියමිත මෙම ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාව ඉදිරියේ ඇති සාක්ෂි සහ සත්‍යය, යුක්තිය සහ හානිපූරණය සඳහා යෝජිත සත්‍ය සෙවීමේ යාන්ත්‍රණය හමුවට ඉදිරිපත් කිරීමට නියමිත එවැනි සාක්ෂි.

1092. ආරක්ෂක හමුදා හෝ එල්ටීටීඊ්ය සිදු කළ පැහැර ගැනීම් හෝ ඝාතන නිසා තමන්ගේ ආදරණීයයන් අහිමි වූ අවස්ථානුගත තත්ත්වයන් පිළිබඳව මෙම ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාව ඉදිරියේ සාක්ෂි ලබා දුන් යාපනයේ, කිලිනොච්චියේ, කාත්තන්කුඩියේ සහ මඩකලපුවේ සාක්ෂිකරුවන් විය. ලිංගික හිංසනය පිළිබඳව යාපනයේ සාක්ෂිකරුවන් චෝදනා එල්ල කළ අතර යෝජිත සත්‍ය සෙවීමේ යාන්ත්‍රණය විසින් ඔවුන් ද විමර්ශනයට ලක් කළ යුතුය.[628]

1093. සිදු කළේ යැයි පැවසෙන් වැරදි පිළිබඳ විස්තර හා ඒවායේ ස්වභාවය මෙම ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාව අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය සමග බෙදා හදා ගන්නා ලදී. ඇතැම් සාක්ෂි පිළිබඳව 5 වන පරිච්ඡේදයෙහි කොමිෂන් සභාව සැකෙවින් අදහස් දක්වා ඇත. 4

627 එල් සැල්වදෝරයේ සත්‍යය පිළිබඳ කොමිෂන් සභාව, උන්මාදයේ සිට බලාපොරොත්තුව කරා: එල් සැල්වදෝරයේ 12 වසරක යුද්ධය (අප්‍රේල් 1,1993) එ.ජා. ලේඛණ එස්/25500, පිටුව 24 සහ ඉන් පසු පිටු

628 මෙම අවසන් වාර්තාවේ 4 සහ 5 වන පරිච්ඡේදවල යාපනයේ අවසාන සාක්ෂිකරුගේ ප්‍රකාශය පිළිබඳ සඳහන බලන්න

වන සහ 5 වන පරිච්ඡේද එම සාක්ෂිකරුවන්ගේ නම් නිශ්චිතව සඳහන් කර නොමැත්තේ වුව ද, මෙම අවසන් වාර්තාවේ දෙවන වෙළුමේ ඔවුන්ගේ විස්තරාත්මක ප්‍රකාශ අන්තර්ගත වේ. විමර්ශන සඳහා මෙම සාක්ෂිකරුවන්ගේ පැමිණිළිවලට ප්‍රමුඛතාව ලබා දිය යුතු බව ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාව නිර්දේශ කරන අතර ඔවුන්ගෙන් සමහරක් ආර්ථික සහන ඉල්ලා ඇති බැවින් උචිත හානිපූරණ ප්‍රදානය කිරීම මගින් ඔවුන්ගේ තත්ත්වය වඩා ඉහළ මට්ටමකට ගෙන ආ යුතුය. වන්දි ලබා ගැනීම ප්‍රතික්ෂේප කළ එහෙත් සත්‍යය නිශ්චිතව තහවුරු කිරීම ඉල්ලා සිටි අය සම්බන්ධයෙන් ගත් කළ, අදාළ විමර්ශන අතුරුදහන්වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය විසින් සිදු කළ යුතුය. මෙම සාක්ෂිකරුවන් පැවැසූ සිදුවීම් සම්බන්ධයෙන් යෝජිත සත්‍ය සෙවීමේ කොමිෂන් සභාව ඉදිරියේ කරුණු කියා සිටීමට අවස්ථාව දිය යුතු බව සහ ඔවුන්ගේ සාක්ෂි, අදහස් සහ වරණයන් නිසි සැලකිල්ලට ගෙන ඔවුනට උචිත පිළියම් ලබා දිය යුතු බව නිර්දේශ කරනු ලබයි.

1094. මෙම කොමිෂන් සභාව මෙම කරුණු අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයේ අවධානයට යොමු කළ අතර මෙම විමර්ශනවල ප්‍රගතිය පිළිබඳව අතුරුදහන්වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයට උපදෙස් දීම පිණිස නීතිපතිවරයාගේ කාර්යාලයේ විශේෂ ඒකකයක් ස්ථාපිත කළ යුතු බවට නිර්දේශ කරනු ලැබේ.

නීතිපති දෙපාර්තමේන්තුවේ ස්ථාපිත කිරීමට නියමිත විශේෂ ඒකකය

1095. අධිකරණ විමර්ශනයක විෂය කරුණක් වන මළ සිරුරු ගොඩ ගැනීම වැනි ඇතැම් හදිසි කරුණු පිළිබඳව අතුරුදහන්වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය නීතිපතිවරයාගෙන් උපදෙස් සහ අවවාද ඉල්ලා ඇති බව ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාවේ අවධානයට යොමු කර ඇත. උපදෙස් කඩිනමින් ලබා නොදුනහොත් අධිකරණයේ නඩු විභාග ප්‍රමාද විය හැකිය. අතුරුදහන්වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයේ ගැටලු සම්බන්ධයෙන් කටයුතු කිරීම පිණිස නීතිපති දෙපාර්තමේන්තුවේ විශේෂ ඒකකයක් ස්ථාපිත කළ යුතු බවට නිර්දේශ කරනු ලැබේ.

අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයේ වත්මන් දත්ත සමුදායට අදාළ ප්‍රධාන ගැටලු ආමන්ත්‍රණය කිරීමට එම කාර්යාලයට සහාය ලබා දිය යුතුය: පහත දැක්වෙන මූලික ගැටලු හඳුනාගනු ලැබ ඒවා මෙම කොමිෂන් සභාවේ අවධානයට යොමු කර ඇත.

- දත්ත අවදානම සහ දත්ත අසංගතතාව:

දැනට පවතින එක්සෙල් දත්ත සමුදාය අනපේක්ෂිතව දත්ත අහිමිව යාමේ අවදානමක් මතු කර ඇති බව පැවැසේ. ඇතැම් අවස්ථාවල, සොයා ගැන්මට නොහැකි වූ මැල්වෙයා හේතුවෙන් දැනටමත් ඇතුළත් කර ඇති දත්ත සහ තොරතුරුවලට හානි විය හැකිය. ඒ ආකෘතිකරණයේදී සහ භාවිතා කරනු ලබන අතුරු මුහුණත්වල අසංගතතාව වැනි දත්ත නිවේශන ගැටලුවලට අමතරවය. මේ සඳහා යෝජිත විසඳුම වනුයේ දත්ත නිවේශනය කිරීම සහ ගබඩා කිරීම පිණිස අතුරු මුහුණත් සහිතව දත්ත කළමනාකරණ මෘදුකාංගයක් සකස් කිරීමයි.

- බහු පරිශීලක ප්‍රවේශ්‍යතාව

දත්ත සමුදාය පිළිබඳව කටයුතු කරන නිලධාරීන් වෙනම කටයුතු කරන බව පැවසේ. ඒ සඳහා යෝජිත විසඳුම වන්නේ පද්ධතිය වෙත ප්‍රවේශය සමකාලික කිරීම සහ අනතුරුව එය දිය යුත්තේ අවසර ලත් සහ අදාළ නිලධාරීන්ට පමණක් ලබා දීමය.

- දත්ත ප්‍රතිසාධන හා ආරක්ෂා කිරීමේ ගැටලු

දැනට, අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයේ දත්ත සතියකට වරක් උපස්ථ කර බාහිර මතක ගබඩාවක (hard drive) සුරකිනු ලැබේ. දත්ත ආරක්ෂාවට අදාළ ගැටලු විසඳීම සඳහා අතුරුදහන්වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය නව සර්වරයක් මිලදී ගත යුතුය.

- අනුපිටපත් නිවේශනය

ඇතැම් අවස්ථාවල යම් නිවේශන සහ වාර්තා අනුපිටපත් වීමේ නැමියාවක් පවතින අතර ඒ හේතුවෙන් ඉදිරිපත් කරනු සංඛයා අනවශ්‍ය පරිදි විස්තාරණය විය හැකි අතර ඇතැම් විට විමර්ශන පැවැත්වීමේදී ප්‍රමාදයන් සිදු විය හැකිය. ඒ සඳහා යෝජිත විසඳුම වන්නේ පද්ධතියට ඇතුළු කිරීමට පෙර අයන්ත්‍රික පරීක්ෂාවන් සිදු කිරීමයි.

1096. අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයේ දත්ත කළමනාකරණ පද්ධතිය සකස් කිරීමේදී එක්සත් ජාතීන්ගේ සංවිධානය හෝ ජාත්‍යන්තර රාජ්‍ය නොවන සංවිධානවල ආයෝජන ලබා ගන්නා ලෙසට දැඩිව නිර්දේශ කරනු ලැබේ. සියලු ආරක්ෂක ක්‍රියාමාර්ග, භෞතික සම්පත් සහාය සහිතව දත්ත කළමනාකරණ පද්ධතියක් සංවර්ධනය කිරීමට අදාළ ඕනෑම මිලදි ගැනීම් හෝ ගිවිසුම් අත්සන් කිරීම සඳහා සහ ජාත්‍යන්තර සම්මත හා අවශ්‍යතා ප්‍රකාරව මානව සම්පත් කළමනාකරණය, දත්ත කළමනාකරණය, පද්ධති සංවර්ධන උපදේශනය සඳහා පිරිස් සහ අනකුත් ස්වේච්ඡා/සීමාවාසිකයන් බඳවා ගැනීම සඳහා එක්සත් ජාතීන්ගේ විභව්‍ය සහයෝගය අවශ්‍ය වේ.

අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයේ සෙවීම් ඒකකය

1. සෙවුම් සහ විමර්ශන ධාරිතා ස්ථාපනය කිරීම සහ ශක්තිමත් කිරීම

විමර්ශනවල මෙම වැදගත් අංගය සම්බන්ධයෙන් පහත කරුණු මතු විය.

- සෙවුම් සහ විමර්ශන ඒකකයක් ස්ථාපිත කිරීම පිණිස අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය පියවර නෙ ඇත.
- තවද, 2022 වසරේදී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් විමර්ශන මණ්ඩල එකොළහක් නම් කරන ලද අතර පරීක්ෂණ ක්‍රියාවලිය සිදුවෙමින් පවතී.

මැදිහත්වීමේ ක්‍රමවේද තුනක් යොදා ගැනීම මගින් සුදුසුකම් සහිත පුද්ගලයන්/ නිපුණ සේවා බලකායක්/ මානව සම්පත්, ධාරිතාවය සහ හවුල්කාරිත්ව නොමැතිවීම ආදියට අදාළ ගැටලු සම්බන්ධයෙන් කටයුතු කළ හැක.

1. වැළැක්වීමේ ක්‍රියාමාර්ග

හවුල්කාරිත්ව ශක්තිමත් කිරීම, නිර්දේශක සහාය, ධාරිතා ගොඩනැගීම සහ සමාන රටවල් හෝ අත්දැකීම්වලට නිරාවරණය කිරීම හා සම්බන්ධ ක්‍රියාකාරකම් මීට අයත් වේ.

2. පිළියම් විකල්ප

පරීක්ෂණ, විමර්ශන, නෛතික සහාය සහ පවුල් වෙත සහාය, පවුල්වලට උපකාර කිරීම සහ සහාය ලබා ගැනීම සඳහා පැමිණිළි යොමු කිරීම ආශ්‍රිත ක්‍රියාකාරකම් මීට අයත් වේ.

3. පෙළඹවීම් කිරීම සහ උද්දේශනය

ප්‍රතිපත්ති සංවාද, නිලධාරීන් දැනුවත් කිරීම, ප්‍රතිපත්ති වෙනස්කම්, අනෙකුත් නියෝජිතායතන සමග ක්‍රියාකාරී සබඳතා ශක්තිමත් කිරීම ආශ්‍රිත ක්‍රියාකාරකම් මීට අයත් වේ.

විමර්ශන කණ්ඩායම්වල පරීක්ෂණවලින් පසුව උපදෙස් සඳහා යොමු කිරීම් සහාය සලකා බලනු ඇත,

- පනතේ 12(ඇ) වගන්තිය ප්‍රකාරව, සැක සහිත මිනීවලවල් හැරීම සහ මෘත දේහය ගොඩ ගැනීම සහ වෙනත් නීති කෘත්‍යවල දී නිරීක්ෂකයකු ලෙස ක්‍රියා කිරීම සඳහා මහේස්ත්‍රාවරයකු වෙත ඉල්ලීමක් කිරීමට අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයට බලතල ඇත. කාර්යාලය විසින් නිරීක්ෂණය කරනු ලබන දැනට අසමින් පවතින නඩු 21 ක් ඇතත්, විමර්ශන ක්‍රියාවලියේ පරමතර ලක්ෂණ වන කාබන් කාල නිර්ණය, ජාන පරීක්ෂාව, ඩීඑන්ඒ පරීක්ෂාව සහ දත්ත බැංකු අවශ්‍යතා ආදියට අදාළ ගැටලු දිගටම පවතී.

- මෙම ගැටලුව විසඳීම සඳහා අධිකරණ නිලධාරීන්, උසාවි කාර්ය මණ්ඩලය සහ පළාත් පාලන බලධාරීන් පුහුණු කිරීම සහ ජාත්‍යන්තර ප්‍රමිතීන් ප්‍රකාරව එම භූමි සම්බන්ධයෙන් කටයුතු කිරීම සඳහා සූදානම් කිරීම අවශ්‍ය වේ.

- අධිකරණ වෛද්‍ය නිලධාරීන් සමග ක්‍රියාකාරී සබඳතා ස්ථාපිත කළ යුතුය. ඒ අනුව, අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය වෙත වාර්තා කරනු ලැබූ සිදුවූවා යැයි පැවසෙන සිදුවීම් පිළිබඳ පැමිණිළවලට විකල්පයක් ලෙස වැඩි දුර විමරශන ක්‍රියාවලි සලකා බලනු ඇත.

1097. මෙම කොමිෂන් සභවේ අවධානයට යොමු කළ ඉහත ගැටලුවලට අදාළව අමාත්‍යාංශයේ පාර්ශවයෙන් කඩිනම් ක්‍රියා මාර්ග ගැනීස අවශ්‍ය කරන්නා වූ පහත දැක්වෙන දෑ හදිසි ප්‍රමුඛතා ලෙස සැලකිල්ලට ගත යුතුය.

1) අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයේ අභ්‍යන්තර ධාරිතා ශක්තිමත් කිරීම.

2) අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ දත්ත පද්ධතිය සකස් කිරීම සහ සංස්ථාපනය

3) අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයේ සෙවුම් සහ විමර්ශන ධාරිතා ස්ථාපනය කිරීම සහ ශක්තිමත් කිරීම.

4) අතුරුදහන් වූ තැනැත්තන් සහ අදාළ පාර්ශවකරුවන්ගේ පවුල්/ඥාතීන් සමග එක්ව කටයුතු කිරීම වර්ධනය කිරීම.

5) අතුරුදහන් වූ තැනැත්තන්ගේ පවුල්/ ඥාතීන් කෙරෙහි සහායක යාන්ත්‍රණ ශක්තිමත් කිරීම.

අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය පිළිබඳ විශ්වාසය ගොඩ නැගීම

1098. වින්දිත පවුල් බොහෝමයක්, විශේෂයෙන්ම තවමත් "සත්‍යය හා යුක්තිය" අපේක්ෂා කරන්නන්, අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය තම අපේක්ෂාවන් ඉටුකරන ආයතනයක් ලෙස දැනට විශ්වාස නොකරයි. මහජනයා එම කාර්යාලය දකින ආකාරය වැඩි දියුණු කිරීම සහ විශ්වාසය ගොඩ නැගීම මගින් මෙම සංජානන වෙනස් කිරීම අවශ්‍ය වනු ඇත. වින්දිත පවුල් සහ කාර්යාලයේ කාර්ය මණ්ඩලය අතර බාධා රහිත අන්තර්ක්‍රියා ඇති වනුයේ එමගින් පමණි. මේ සඳහා මූලාරම්භයක් ලෙස, අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය වත්මනෙහි ඉලක්ක ගත කර ඇති ප්‍රධාන කාර්යය වන දක්නට නොමැති බවට වූ සහතිකයක් (Certificate of Absence) නිකුත් කිරීමේ ක්‍රියාවලියේ කාර්යක්ෂමතාව වැඩි දියුණු කිරීමට ක්‍රියා මාර්ග ගැනීමට කාර්යාලයට හැකිය.

හානිපූරණය

1099. වින්දිත පවුල් සමග සිදු කළ අදහස් විමසීම්වලදී ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාව විසින් හඳුනාගනු ලැබූ ප්‍රධාන සාධකයක් වන්නේ, තමන් කළින් දැරූ ස්ථාවරය වූ "සත්‍යය හා යුක්තිය"

හැර අන් කිසිවක් අවශ්‍ය නැත යන ස්ථාවරයෙන් ඉවත්ව යමින් හානිපූරණය පිළිගැනීමට කැමැති ජනයාගේ ප්‍රතිශතය ඉහළ යෑමයි. අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයට අනුව, වින්දිත පවුල් සමග සිවිල් සමාජ සංවිධාන මෑතක දී පැවැත් වූ සමාලෝචන රැස්වීම්වලදී ද මෙය ප්‍රත්‍යක්ෂණීයව නිරීක්ෂණය වී ඇත.

1100. කොමිෂන් සභාව මෙම අවසන් වාර්තාවේ 3 වන පරිච්ඡේදයේ III වන කොටසේ පෙන්වා දී ඇති පරිදි, හානිපූර්ණය සඳහා වන කාර්යාලය හානිපූර්ණ මුදල් ගෙවීම සඳහා ස්ථාපිත කර ඇති යාන්ත්‍රණයක් වුව ද ඒ සඳහා නිසි පරිදි අරමුදල් වෙන් කිරීමක් කර නොමැත. ඔවුන්ගෙන් බොහෝ දෙනෙකු දරිද්‍රතා රේඛාවෙන් පහළ ජීවත් වන බැවින් සහ එය ඔවුන්ගේ අවසන් බලාපොරොත්තු වී ඇති බැවින් එය ඉච්ඡා භංගය තවදුරටත් වැඩි කිරීමට හේතු වනු ඇත. වත්මන් ආර්ථික තත්ත්වය සැලකිල්ලට ගැනීමේදී, මේ සඳහා අතුරුදහන් වූ තැනැත්තන්ගේ කාර්යාලයට සිදු කළ හැක්කේ කුමක්දැයි ප්‍රශ්නකාරී වන නමුත් හානිපූරණ නොසැපයීම මිනිසුන්ගේ බලාපොරොත්තු මුළුමණින්ම කඩවනු ඇත. එහි ප්‍රතිඵලය වන්නේ අනාගතයේදී ඉතා සතුරු පරිසරයක කටයුතු කිරීමට කාර්යාලයට සිදු වීමයි. කොමිෂන් සභාව මෙම පැහැදිලි නිරීක්ෂණය අවධාරණය කරනුයේ මෙම තත්ත්වයට පිළියම් යෙදීමට අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය සක්‍රීයව මැදිහත් වනු ඇතැයි යන අපේක්ෂාවෙනි.

ඒකාකාර කාර්ය පරිපාටි සහ පිළිවෙත්

1101. වින්දිත පවුල්වලට සිය සේවා සැපයීමේදී විවිධ දිස්ත්‍රික්කවල රජයේ නිලධාරීන් වෙනස් පිළිවෙත් අනුව කටයුතු කරන බව පෙනී ගොස් ඇත. ඇතැම් දිස්ත්‍රික්කවල ග්‍රාම නිලධාරීන් "අදාළ වින්දිතයා දකින්නට නොමැත" යන්න සඳහන් කරමින් සරල ලිපියක් නිකුත් කිරීමට අදිමදි කරන නමුත් තවත් දිස්ත්‍රික්කවල ග්‍රාම නිලධාරීන් එසේ කරයි.

1102. එසේම ඇතැම් දිස්ත්‍රික් ලේකම් කාර්යාලවලට අනුයුක්ත දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර්වරු දක්නට නොමැති බවට වූ සහතිකය අළුත් කිරීම පිණිස කිසිදු ලේඛනයක් ඉල්ලා නොසිටින අතර තවත් ඇතැම් දිස්ත්‍රික්කවල රෙජිස්ට්‍රාර්වරුන් ලේඛන සපයන මෙන් පවුලේ සාමාජිකයන්ගෙන් ඉල්ලීමක් කරයි. මේ ආකාරයේ තවත් පිළිවෙත් තිබිය හැකි අතර ඒ සියල්ල පිළිබඳ තොරතුරු රැස් කිරීම අවශ්‍ය වේ. එවිට අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයට අදාළ අමාත්‍යාංශ සමග මෙම කරුණු සාකච්ඡා කොට පවුල්වල සාමාජිකයන්ට පහසු වන පරිදි ඒකාකාර පිළිවෙත් ක්‍රියාත්මක කිරීම පිණිස කටයුතු යෙදිය හැක.

සත්‍යය සහ යුක්තිය

1103. බොහෝ පවුල්වල සාමාජිකයන් "සත්‍යය හා යුක්තිය" පිළිබඳ බලාපෙරොත්තු අත් හැර දමා ඇති බවක් පෙනුණ ද, දැඩි ඕනැකමකින් එය ඉල්ලා සිටින පවුල් සාමාජිකයන් සිටිති. 4 වන පරිච්ඡේදයේ වාර්තා කර ඇති පරිදි, සාක්ෂි දුන් ඇතැම් සාක්ෂිකරුවන්ට තම අහිමි වූ ඥාතීන් හැර අන් කිසිවක් අවශ්‍ය නොවූ අතර ඇතැම් නිශ්චිත බලහත්කාර පැහැර ගැනීම් පිළිබඳ විස්තර ඔවුන් මෙම ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාවේ අවධානයට යොමු කළේය. අතුරුදහන්වීම් පිළිබඳ තොරතුරු පෙර කොමිෂන් සභාවලට ඔවුන් බොහෝ වතාවක් ලබා දී ඇති බවට ඔවුන් සාක්ෂි ලබා දුන් නමුත් මේ දක්වා කිසිදු ආනුෂංගික සහනයක් ලබා දී නොමැත. ඔවුන්ගෙන් ඇතැමෙක් ප්‍රකාශ කළේ අතුරුදහන්වීමට කළින් රඳවා ගැනීම සිදු වූ බවයි.

1104. අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයට විමර්ශනය කිරීමේ බලතල ඇතත්, දැනට පවතින තත්ත්වය සැලකිල්ලට ගැනීමේදී, ආයතනය ගන්නේ කවර ක්‍රියාමාර්ග ද යන්න ප්‍රශ්නයට තුඩු දෙන්නකි. කෙසේ වෙතත්, එම කාර්යය වෙනුවෙන් ස්ථාපිත කරනු ලැබූ ආයතනයක් බැවින්,

අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයට මෙම කරුණ සම්පූර්ණයෙන්ම නොසලකා සිටිය නොහැක.

අතරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයේ කළමනාකරණ තොරතුරු පද්ධතියක් ක්‍රියාත්මක කිරීම

1105. අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයේ කළමනාකරණ තොරතුරු පද්ධතියක් නොමැතිවීම එම කාර්යාලයේ නිලධාරීන් මෙම කොමිෂන් සභාව හමුවේ මතු කළ ඔවුන්ගේ කණස්සල්ලට හේතු වූ ප්‍රධාන කරුණකි. ඇත්තෙන්ම, එතරම් විශාල දත්ත ප්‍රමාණයක් අයන්ත්‍රිකව කළමනාකරණය කිරීම කළ නොහැක්කකි. ක.තො.ප. මගින් අයදුම්පත්‍ර ද්විකරණයවීම සහ ප්‍රමාද දෝෂ වළක්වා ගැනීමට අ..තැ.පි.කාර්යාලයට හැකි අතර කෙටි කාලයක් තුළ ක.තො.ප. වාර්තා ලබා ගැනීමට හැකි තත්ත්වයක සිටිනු ඇත. ක.තො.පද්ධතියක් අනෙකුත් සම්බන්ධිත දෙපාර්තමේන්තුවලට පහසුවෙන් තොරතරු වෙත ප්‍රවේශවීමට පහසුකම් සපයන අතර සේවා සැපයුම් ක්‍රියාවලිය වඩා කාර්යක්ෂම කරනු ඇත.

සෘජුවම සම්බන්ධිත අනෙකුත් දෙපාර්තමේන්තු සමග සම්බන්ධීකරණය වැඩි දියුණු කිරීම

1106. අ.තැ.පි.කාර්යාලය, හානිපූරණය සඳහා වන කාර්යාලය සහ රෙජිස්ට්‍රාර් ජෙනරාල් දෙපාර්තමේන්තුව අතර පවතින සම්බන්ධීකරණ ගැටලු සම්බන්ධයෙන් නීසි ක්‍රියා මාර්ග ගැනීම අවශ්‍ය වේ. සම්බන්ධීකරණය වැඩි දියුණු කිරීමෙන් පළමුව රෙජිස්ට්‍රාර් ජෙනරාල් කාර්යාලයට තොරතුරු ඉදිරිපත් කිරීම සහ දක්නට නොමැති බවට වූ සහතිකයක් නිකුත් කිරීම සහ අනතුරුව හානිපූරණ නිදහස් කිරීම අතර කාල පරතරය අඩු කරනු ඇත. සමහර විට ඒකාබද්ධ පුහුණු වැඩමුළුවකින් කාර්යක්ෂමතාව ඉහළ නැංවීමේ අවසාන අරමුණ සහිතව එකි ආයතනවල නිලධාරීන් අතර සම්බන්ධීකරණය වැඩි දියුණු කිරීමට සහ අන්තර් පුද්ගල සම්බන්ධතා ගොඩ නගා ගැනීම මග පාදනු ඇත.

දක්නට නොමැති බවට වූ සහතිකය පිළි ගැනීම සහ වලංගුභාවය

1107. වන්දි සහ හානිපූරණ ලබා ගැනීම සඳහා වැදගත්ම කරුණ වන්නේ දක්නට නොමැති බවට වූ සහතිකයක් බව චින්දිත පවුල්වල බොහෝ සාමාජිකයන් විශ්වාස කරන හෙයින් දක්නට නොමැති බවට වූ සහතිකයක් ලබා ගැනීමේ ඔවුන්ගේ ප්‍රධාන අරමුණ වන්නේ එම සහන ලබා ගැනීමයි. ඔවුන්ගෙන් බොහෝ දෙනෙකු ඉතා දිළිඳු වන අතර එබැවින් ඊට ඇතුළත් කර ඇති අනෙකුත් සහන ලබා ගැනීමට ඔවුන් සැබවින්ම උත්සාහ නොකරයි. කෙසේ වෙතත්, වෙනත් කාර්යයන් සඳහා දක්නට නොමැති බවට වූ සහතිකය භාවිතා කිරීමට උත්සාහ කළ ටික දෙනාට බොහෝ බාධකවලට මුහුණ පෑමට සිදු විය. කළින් සඳහන් කර ඇති පරිදි, විවිධ ප්‍රදේශවල විවිධ ආයතන විසින් දක්නට නෙමැති බවට වූ සහතිකයට දී ඇති පිළිගැනීම ඒකාකාර නොවේ. ඇතැම් ආයතන එය පිළිගන්නා අතර තවත් සමහරක් එය පිළි නොගනියි. එහි ප්‍රතිඵලයක් ලෙස දක්නට නොමැති බවට වූ සහතිකය එය ඉටු කර ගැනීමට අපේක්ෂා කළ අරමුණ සාක්ෂාත් නොකරයි. එබැවින්, දක්නට නොමැති බවට වූ සහතිකය නෛතික අවශ්‍යතාවයක් වන කරුණුවලට අදාළව එම ආයතන එම සහතික පිළිගැනීමට සැලැස්වීම සඳහා අ.තැ.පි.කාර්යාලය මැදිහත්වීම අවශ්‍ය වේ. සමහර විට අදාළ ගෘහ පත්‍රයේ අංකය සහිතව එය පිළිගත හැක්කේ කවර කරුණ සඳහා ද යන්න සඳහන් කරමින් වෙනම ලේඛනයක් නිකුත් කිරීම චින්දිත පවුල්වල අනෙකුත් අවශ්‍යතා සඳහා පහසුවක් විය හැක. පවුලේ සාමාජිකයකු විසින් අතුරුදහන් වූ තැනැත්තාගේ මූල්‍ය කටයුතු සම්බන්ධයෙන් වන විට පරිශීලකයා සඳහා දක්නට නොමැති බවට වූ සහතිකයේ සඵලතාව මහ බැංකුව විසින් මේ සම්බන්ධයෙන් සෑදීමට නියමිත උචිත නියෝග මගින් බලාත්මක කළ යුතු

අතර මහ බැංකුව විමසා අදාළ ආයතන වෙත උචිත උපදෙස් මගින් සපුරාලීමට නියමිත වින්දිත පවුල්වල මෙම අවශ්‍යතාවය අවධානයට ගන්නා ලෙස නීතිපතිවරයාට නිර්දේශයක් කරන ලබයි.

1108. වසර දෙකකට වැඩි කාලයක වලංගුතා කාල සීමාවක් සහිතව දක්නට නොමැති බවට වූ සහතිකයක් නිකුත් කරන ලෙසට වින්දිත පවුල් බොහෝ කාලයක් තිස්සේ කරුණු දක්වා තිබේ. 2010 අංක 19 දරන මරණ ලියාපදිංකි කිරීම (තාවකාලික විධිවිධාන) පනත ක්‍රියාත්මක වන බලාත්මක කාල සීමාව 2023 දෙසැම්බර් 9[629] සිට 2028 දෙසැම්බර් 9 දක්වා තවත් වසර පහකට දීර්ඝ කිරීම දිරි ගන්වන සුළු බව සඳහන් කළ යුතුය.

මනෝසමාජීය උපකාරය

1109. අපගේ උපදේශනවල දී මෙතෙක් තමන් තුළ සිර කර ගෙන සිටි සංවේගය සහ මානසික පීඩනය මුදා හැරී අවස්ථාවේ ඔවුන්ගේ ආදරණීයයන්ට ජීවිත අහිමි වූ ඛේදජනක තත්ත්වයන් මතකයට නැගී සිහිපත් වූ අවස්ථාවේ සැනසිය නොහැකි ලෙස හඬා වැටුණු සාක්ෂිකරුවන් විශාල සංඛ්‍යාවක් මෙම ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාවට මුණ ගැසුණි. එම කාන්තාවන් සහ පිරිමින් සඳහා මනෝ සමාජීය උපකාර සඳහා පවතින දැඩි අවශ්‍යතාව එම අවස්ථා මගින් තහවුරු කෙරුණි. මෙම උපකාරය ලබා දීම ප්‍රමාණවත්ව සිදු නොවන බවට පෙනී යයි. තම ප්‍රාදේශීය කාර්යාලවල මනෝ සමාජීය සහාය ලබා දීමේ කාර්යය අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයේ වින්දිත සහ පවුල් සහ පවුල් සහාය ඒකකය විසින් සිදු කරන ලබන බව එම කාර්යාලය ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාවට දැනුම් දුන්නේය. එහෙත් වින්දිත පවුල්වල මානසික සෞඛ්‍යය සහ යහපැවැත්ම අන්තර්ගත කිරීම පිණිස මෙම සහායේ විෂය පථය පුළුල් කළ යුතු බව මෙම ජ.ප.කොමිෂන් සභාව නිර්දේශ කරයි.

දිළිඳුකම පිටුදැකීම සහ ජීවනෝපාය සංවර්ධනය

1110. අවධානය යොමු කළ යුතු තවත් වැදගත් ක්ෂේත්‍රයක් වනුයේ වින්දිත පවුල්වල දරිද්‍රතා මට්ටමයි. මෙම අ.තැ.පි.කාර්යාලයේ කාර්ය භාරයට ඇතුළත් නොවන නමුත් දක්නට නොමැති බවට වූ සහතිකය නිකුත් කිරීමෙන් ඔබ්බට සිය සේවා ව්‍යාප්ත කිරීම කෙරෙහි අ.තැ.පි.කාර්යාලයට සලකා බැලිය හැකිය.

1111. අ.තැ.පි.කාර්යාලයට දිළිඳුකම පිටුදැකීම සහ ජීවනෝපාය සංවර්ධනය කෙරෙහි මැදිහත් වීමට සිදු නොවුණ ද, සහාය අවශ්‍ය අය හඳුනා ගැනීම මගින් එයට මෙම ක්‍රියාවලියට සහභාගි විය හැකි අතර වින්දිත පවුල්වල මෙම සාමාජිකයන් රජයේ ආධාරයෙන් ක්‍රියාත්මක වන දිළිඳුකම පිටුදැකීමේ සහ ජීවනෝපාය සංවර්ධන වැඩසටහන්වලට යොමු කළ හැකිය. එමගින් එම පවුල්වලට ප්‍රතිලාභ ලැබෙන අතර වින්දිත පවුල් අතර අ.තැ.පි.කාර්යාලයේ ප්‍රතිරූපය ද ඉහළ නංවාලීමට හැකිය.

1112. රජයේ රැකියා ලබා දීමේ දී සහ වෘත්තීය පුහුණු ආයතනවලට තරුණ තරුණියන් බඳවා ගැනීමේ දී වින්දිත පවුල්වල සාමාජිකයන්ට ප්‍රමුඛතාව ලබා දීම පිණිස ප්‍රතිපත්තිමය තීරණ ගැනීමට රජයට බල කිරීම වැනි අනෙකුත් ක්‍රම සහ විධි පිළිබඳව සොයා බැලීමට ද අ.තැ.පි. කාර්යාලයට හැකිය.

බිම් මට්ටමේ වැඩ කරන රජයේ නිලධාරීන්ගේ දැනුවත්භාවය ඉහළ නැංවීම

1113. පරීක්ෂණ කොමිෂන් සභාව හමුවේ පෙනී සිට ඔවුන් අ.තැ.පි.කාර්යාලය, එහි කාර්ය භාරය සහ එහි සේවා සැපයුම් ක්‍රියාදමය පිළිබඳව එතරම් නොදන්නා බව පැවසූ රජයේ නිලධාරීන් ඇතුළු සාක්ෂිකරුවන් ගණනාවක් විය. ඒ සඳහා වඩාත්ම යෝග්‍ය ප්‍රතිකර්මය වන්නේ ඔවුන්ට දැනුම

629 අංක 2357/18 දරන 2023.11.06 දිනැති ගැසට් නිවේදනය බලන්න

ලබා දීම පිණිස දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීමයි. ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල පවත්වනු ලබන ග්‍රාම නිලධාරීන්ගේ මාසික රැස්වීම් විනාඩි 15-30 ක් වැනි කෙටි කාලයකට ඇමතීම වැනි වියදම් දැරීමට සිදු නොවන ඇතැම් ක්‍රියාමාර්ග මෙම සාක්ෂිකරුවන්ට සහ නිලධාරීන්ට යටත් පිරිසෙයින් යම් මූලික දැනුවත්කමක් ලබා දෙනු ඇත. ඒ සඳහා ප්‍රාදේශීය ලේකම්වරු අවසර දෙනු ඇතැයි අපේක්ෂා කරන අතර, සේවා සැපයුම් ක්‍රියාදාමය ආරම්භ වනුයේ රාජ්‍ය නිලධාරීන්ගේ අනුමැතිය සහිතව බැවින් බිම් මට්ටමේදී ඔවුන් අතර දැනුවත්බව ඇති කිරීම ඉතා වැදගත් වේ.

ඉහළ නායකත්වය විසින් කැපවීම පෙන්නුම් කිරීම

1114. නායකත්වය අභිනත සංස්කෘතියක් ශ්‍රී ලංකාවේ පවතින බැවින්, රාජ්‍ය නිලධාරීන් සහ සාමාන්‍ය මහ ජනතාව යන දෙපිරිසම ඉහළ නායකත්වය පවසන දේ සහ කරන දේ කෙරෙහි සැලකිය යුතු අවධානයක් යොමු කරයි. ජනාධිපතිවරයා ජාතික ප්‍රතිසන්ධාන ක්‍රියාවලියට ප්‍රසිද්ධියේම කැපව සිටින බැවින් සහ තම මතය ප්‍රබලව ප්‍රකාශ කිරීම සඳහා ඉහළ මට්ටමේ රාජ්‍ය නිලධාරීන්ගේ රැස්වීම් කැඳවා ඇති බැවින් වර්තමානය කාලානුරූප වේ. අ.තැ.පි.කාර්යාලයේ නායකත්වය එම කාර්යාලයේ සහ ඒ ආශ්‍රිත නියෝජිතායතනවල කාර්ය මණ්ඩලයේ ධාරිතාව වැඩි දියුණු කිරීමෙහි සහ ජාත්‍යන්තර ප්‍රජාවේ සහ සිවිල් සමාජයේ සාමාජිකයන් හමුවීමෙහි ලා පෙන්නුම් කර ඇති සක්‍රීය උනන්දුව ඒ හා සමාන අයුරින්ම ක්‍රියාත්මක කිරීමේ ක්‍රියාවලියට වැඩි විශ්වාසයක් එක් කරනු ඇත.

1115. සාක්ෂිකරුවන් ගණනාවක් මූල්‍යමය වශයෙන් වන්දි ගෙවනු ලැබීමට සහ ආර්ථික වශයෙන් ඉහළට ඔසවා තබනු ලැබීමට පමණක් සිය කැමැත්ත කොමිෂන් සභාව හමුවේ ප්‍රකාශ කොට ඇති බැවින්, මූල්‍යමය හානිපූරණය සඳහා පමණක් ඉදිරිපත් කර ඇති එසේ ලැබීමට සුදුසු අයදුම්පත්‍ර හැකිතාක් ඉක්මණින් හානිපූරණය සඳහා වන කාර්යාලයට යොමු කරන ලෙස නිර්දේශ කිරීමට අ.තැ.පි.කාර්යාලයට උපදෙස් දෙනු ලැබේ.

අ.තැ.පි.කා සහ හා.ස.ක. සත්‍යය හා ප්‍රතිසන්ධාන කොමිෂන් සභාවේ අත්‍යවශ්‍ය සංරචක බවට පත් කිරීම

1116. සත්‍යය කොමිෂන් සභාවට හානිපූර්ණය සඳහා නිර්දේශ ලබා දීමට බලතල ලබා දී ඇති බැවින් යෝජිත සත්‍යය සෙවීමේ යාන්ත්‍රණයට සමග හානිපූරණය සඳහා වන කාර්යාලය සහජීවන සහක්‍රියාවක් තිබිය යුතු අතර එය සත්‍යය සහ ප්‍රතිසන්ධාන කොමිෂන් සභාවේ අත්‍යවශ්‍ය කොටසක් බවට පත් කළ යුතු බවට නිර්දේශ කරනු ලැබේ.[630] එම ආකාරයෙන්ම අ.තැ.පි.කා සහ හා.ස.ක හි ශාඛා කාර්යාල ස.ප්‍ර.කො.සභාවෙහි ස්ථාපිත කළ යුතුය.

හානිපූරණය

1117. මෙම අවසන් වාර්තාවේ 3 වන පරිච්ඡේදයේ III වන කොටසේ ඇති එහි සාකච්ඡාවේදී 'එක්සත් ජාතීන්ගේ මූලික මූලධර්ම'[631] පිළිබඳව නිසි සැලකිල්ල යොමු කළ අතර සත්‍යය කොමිෂන් සභාව හානිපූරණ පිළිබඳ සිය නිර්දේශ ඉදිරිපත් කරන අතරෙහි සත්‍යය පිළිබඳ කොමිෂන් සභාවෙහි අනිවාර්ය අනුබද්ධයක් වන හානිපූර්ණය සඳහා වන කාර්යාලය ජාත්‍යන්තර ප්‍රමිතීන් සැලකිල්ලට ගෙන ලබා දීමට නියමිත වන්දි ගෙවීම සඳහා ඉදිරි කටයුතු කළ යුතුය. ශ්‍රී ලංකාව දැවැන්ත සාර්වආර්ථික අභියෝගවලට මුහණ පා

630 අවශ්‍ය නිර්දේශ සඳහා හානිපූරණය යටතේ 6 වන පරිච්ඡේදය බලන්න

631 එක්සත් ජාතීන්ගේ සංවිධානය, ජාත්‍යන්තර මානව හිමිකම් නීතියේ සැහැසි උල්ලංඝනය කිරීම්වල සහ ජාත්‍යන්තර මානුෂීය නීතියේ බරපතල උල'ලංඝනය කිරීම් වල විත්දිතයන් සඳහා ප්‍රතිකර්ම හා හානිපූරණය වෙත අයිතිය පිළිබඳ මූලික මූලධර්ම සහ මාර්ගෝපදේශ (2005 දෙසැම්බර් 16), එ.ජා. ලේඛන A/RES/60/147 පිටුව 7. 2005 වසරේ කොලම්බියානු යුක්තිය සහ සාමය පනතේ 8 වන වගන්තියේ හානිපූරණය පිළිබඳ නිර්වචනය ද මේ මත පදනම්ව ඇත.

ඇති බව පෙන්වා දීම අදාළ නොවන්නක් නොවන අතර, එබැවින් වින්දිතයන්ට වන්දි ගෙවීම රටේ ආර්ථිකය යථා තත්ත්වයට පත් කිරීම අවධානමට හෙළිය හැක. උදාහරණයක් ලෙස එල් සැල්වදෝරය, ග්වාතමාලාව, හයිටි සහ පේරු යන රටවල වන්දි සඳහා සත්‍යය පිළිබඳ කොමිෂන් සභාවේ නිර්දේශ කිසි දිනෙක ක්‍රියාත්මක නොකළ බව සඳහන් කළ යුතුය.[632] දකුණු අප්‍රිකාවේ ද, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා අධිකරණය AZAPO තීන්දුවෙහි අවධාරණය කළේ රාජ්‍යයේ සම්පත් සීමිත බවත් එය සමස්ත ජනගහණයේ ප්‍රතිලාභය සඳහා යෙදවිය යුතු බවත්ය. අධිකරණය ප්‍රකාශ කළේ:

ප්‍රජාවේ වැඩිම කොටසකට සහනය සැලසෙන සහ බලාපොරොත්තු ඇති කරන ආකාරයෙන් අපගේ වර්ගවාදී අතීතියේ ලැජ්ජාවේ සහ වේදනාවේ උරුමයෙන් සෘජුවම හෝ වක්‍රව පීඩාවට පත්ව ඇති සෑම තැනැත්තෙකුගේම සැඟවුණු මානව විභවය සහ සම්පත් සමස්ත ජාතියේ උන්නතිය සඳහා සංවර්ධනය කරමින් ප්‍රතිසංස්කරණ ක්‍රියාවලියට පහසුකම් සැපයීම පිණිස රාජ්‍යයේ සම්පත් පරිකල්පිතව, ඥාණවන්තව, කාර්යක්ෂමව සහ සාධාරණව යොදා ගත යුතුය.[633]

හානිපූරණ මූලාශ්‍ර

1118. වන්දි ඉල්ලීම් සඳහා මුදල් ගෙවීමට හැකියාව ඇති කරනු පිණිස නව්‍යකරණ ආර්ථික විසඳුම් අවශ්‍ය කරනු ලබන අතර මේ දක්වා එවැනි විසඳුම් වර්ධනය කිරීම ආරම්භ වී පමණක් ඇත.[634] වන්දි සඳහා සම්පත් ජනනය කිරීම සඳහා යෝජනාවලට ධනවත් අය මත විශේෂ බදු පැනවීම, ජාත්‍යන්තර ආධර ප්‍රදායකයන්ගේ ආධාරය සහ හිටපු නායකයන් නීති විරෝධීව ලබා ගත් දේපල රාජසන්තක කිරීම සහ අහිමි කිරීම ඇතුළත් වේ.[635] සෝවියට් ආඥාදායකත්වය විසින් දේපල ජනසතු කිරීම සඳහා වූ වන්දි ගෙවීම වෙත එස්තෝනියාව ආකර්ෂණීය ප්‍රවේශයක් ගන්නා ලදී. රජෙය් අරමුදල් සීමිත බැවින්, පුද්ගලීකරණ බැඳුම්කර යැයි කියනු ලැබූ බැඳුම්කර නිකුත් කරන ලදී. ඒවා ඒ සමග ක්‍රියාත්මක වූ රාජ්‍ය දේපල පුද්ගලීකරණය කිරීමේ ක්‍රියාවලියේදී ප්‍රතිලාභීන්ට භාවිතා කළ හැකි ගිණුම් ඒකක විය.[636]

පොදු වගන්තිය 3 ඇතුළත් කිරීම[637]

1119. ජිනීවා සම්මුති හතරෙහි සෑම එකකම එක හා සමාන වන්නා වූ 3 වන පොදු වගන්තිය 2006 අංක 4 දරන ජිනීවා සම්මුති පනත සැලකිල්ලට නොගන්නා හෙයින් විධිවිධානවල හිඟකමක් පවතින

---

632 ඒ සෙගෝවියා (2006) හානිපූරණ වැඩසටහන් මූල්‍යකරණය: ජාත්‍යන්තර අත්දැකීම් ආවර්ජනය. පී. ඩි ග්‍රෙයිෆ්, හානිපූරණ අත්පොත (පිටුව 650 සිට පහළට)

633 දකුණු අප්‍රිකානු ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා අධිකරණය, 1996 ජූලි 25 දිනැති තීන්දුව (ඇසේනියන් ජනතා සංවිධානය සහ තවත් අය එදිරිව දකුණු අප්‍රිකානු ජනරජයේ ජනාධිපති ඇතුළු තවත් අය, ඡේදය 43; බලන්න සී.කොල්වින් (2006) දකුණු අප්‍රිකාවේ හානිපූරණ වැඩසටහන පිළිබඳ සංක්ෂේපය. පී. ඩි ග්‍රෙයිෆ්, හානිපූරණ අත්පොත (පිටු 176,184)

634 සෙගෝවියා (2006) පිටුව 650 (න්‍යායාත්මකව මෙන්ම භාවිතයේදී ද හානිපූරණ වැඩසටහන්වල අඩුවෙන්ම අධ්‍යයනය කළ අංගයක් වනුයේ හානිපූරණයයි)

635 සොගෝවියා හි සංක්ෂේපය බලන්න (2006) එම පිටුව 661 සිට පහළට. මේ සම්බන්ධයෙන් ක්ෂුද්‍රමූල්‍ය ප්‍රවේශයන්හි කාර්ය භාරය පිළිබඳව; බලන්න එච්.ඩී. සෙයිබෙල්, ඒ. ආම්ස්ට්‍රෝං (2006) හානිපූරණ සහ ක්ෂුද්‍රමූලය යෝජනා ක්‍රම පී. ඩි ග්‍රෙයිෆ්, හානිපූරණ අත්පොත (පිටුව 676 සිට පහළට)

636 එස්තෝනියා ජනරජයේ 1991 ජූනි 13 දරන හිමිකාරිත්ව ප්‍රතිසංස්කරණ මූලධර්ම පනතේ 17 වන වගන්තියෙන් කියවෙනුයේ: '(1) නීති විරෝධීව පවරා ගනු ලැබූ දේපල සඳහා වන්දි ගෙවීම පිණිස, හිමිකාරිත්ව ප්‍රතිසංස්කරණ යටතේ හිමිකම් ඇති තැනැත්තන්ට වන්දි වවුවර පත් නිකුත් කරනු ලැබෙන (....) (3) පුද්ගලීකරණයට යටත් තොග හෝ වෙනත් දේපල සඳහා මෙම වගන්තියේ (1) වන උපවගන්තියේ නිශ්චිතව දක්වා ඇති වවුවර පත්‍ර හුවමාරුව මගින් නීතිවිරෝධීව පවරා ගනු ලැබූ දේපල වෙනුවෙන් වන්දි ගෙවනු ලැබේ.' බලන්න ඊ.සී. පෙට්ටායි සහ පෙට්ටායි V (2014) බෝල්ටික් රාජ්‍යයන්හි සංක්‍රාන්තික සහ අතීතානුයෝගී යුක්තිය (පිටුව 206)

637 පොදු වගන්තිය 3 හි ප්‍රතිමානිත සංකල්ප සඳහා 3 වන පරිච්ඡේදයේ පළමු කොටස සහ මෙම අවසන් වාර්තාවේ 6 වන පරිච්ඡේදයේ පහත දැක්වෙන දෑ පිළිබඳ ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාවේ නිර්දේශ බලන්න.

බව ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාව නිරීක්ෂණය කරයි. 2006 අංක 4 දරන ජිනීවා සම්මුති පනතේ උචිත සංශෝධනයක් මගින් ව්‍යවස්ථාදායකය පොදු වගන්තිය 3 හි අභිමතය පිළිබිඹු කරමින් ඊට නිසි සැලකිල්ල දැක්විය යුතු බව අපි නිර්දේශ කරන්නෙමු.

1120. කෙසේ වෙතත්, ශ්‍රී ලංකාවේ දණ්ඩ නීති යටතට ජාත්‍යන්තර මානුෂීය නීතියේ උල්ලංඝනය කිරීම් ගෙන ආ නොහැකිය යන්න ඉන් අදහස් නොවන්නේය යන කරුණ අවධාරණය කිරීමට කොමිෂන් සභාව ඉක්මන් වන්නෙමු. ඊව් ලා හායේ වැනි ප්‍රභවාත්මක ලේඛකයන් අභ්‍යන්තර සන්නද්ධ ගැටුම්වල දී පොදු වගන්තිය 3 හෝ II වන මූල ලේඛය උල්ලංඝනය කිරීම යුධ අපරාධයක් ද යන්න සාකච්ඡා කර ඇත. මෙම ලේඛකයන් තර්ක කර ඇත්තේ පොදු වගන්තිය 3 සහ II වන මූල ලේඛය කවර හෝ බලාත්මක කිරීමේ යාන්ත්‍රණයක් සඳහා විධිවිධාන සලසා නොමැති බැවින් එය යටතේ ඇති නෛතික රාමුව දෝෂ සහගත බවයි. මේ සම්බන්ධයෙන් දිගු කලක සිට පවතින මතය වන්නේ අභ්‍යන්තර සන්නද්ධ ගැටුමකදී සිවිල් වැසියන් ඝාතනය කිරීම සහ ස්ත්‍රී දූෂණය දේශීය වශයෙන් සිදු කරන අපරාධයක් සේ සැලකිය යුතු බවත් එවනි අපරාධවල වරදකරුවන්ට එරෙහි නඩු දේශීය අධිකරණ විසින් විභාග කළ යුතු බවත්ය.[638] එසේ වුවද, ඊව් ලා හායේ වැඩි දුරටත් ප්‍රකාශ කරනුයේ;

කෙසේ වෙතත්, යථාර්ථය පෙන්නුම් කර ඇත්තේ, මෙම මූල ලේඛනවල බරපතල උල්ලංඝනය කිරීම් බොහෝමයක් සිදුව ඇති බවත් ඒවා බොහෝ විට පුළුල් පරිමාණයෙන් සිදු කර ඇති බවත්ය. එදිරිවාදිකම්වල අවසානයේදී බොහෝ විට දකිනුයේ වරදකරුවන් සම්බන්ධයෙන් කිසිදු අපරාධ නඩු විභාග කිරීම් නොමැතිවීම සහ ගැටුමේ සියලු පාර්ශවයන්ට පුළුල් සමාවක් ප්‍රදානය කිරීමය. අභ්‍යන්තර සන්නද්ධ ගැටුම් අතරතුර සිදු කරනු ලද යුද්ධයට අදාළ නීති උල්ලංඝනය කිරීම්වල ඉතා බරපතල ස්වභාවය හා ඇදුණු එම අපරාධ සම්බන්ධයෙන් කටයුතු කිරීමේදී දේශීය අධිකරණවල ඵලදායී නොවන බව, අභ්‍යන්තර සන්නදධ ගැටුම්වල දී යුධ අපරාධ පිළිබඳ සංකල්පය යොදා ගැනීම ඉල්ලා සිටියි".[639]

1121. අභ්‍යන්තර සන්නද්ධ ගැටුම් අතරතුර සිදු කරනු ලද යුද්ධයට අදාළ නීතිවල බරපතල උල්ලංඝනය කිරීම් හා ඇදුණු දණ්ඩ මුක්තිය පිළිබඳ සංසිද්ධිය වැළැක්වීමට කටයුතු කිරීම අභිමත පමණක් නොව ඉතා තීරණාත්මක ද වේ. අභ්‍යන්තර සන්නද්ධ ගැටුම්, හුදෙක්ම දේශීය නීතියෙන්ම පමණක් නියාමනය වන අධිකාර පථයක සිට ක්‍රමිකව සන්නද්ධ ගැටුම් පිළිබඳ නීතියට යටත්වන්නක් බවට පත්ව තිබේ.[640]

1122. අන්තර්ජාතික නොවන සන්නද්ධ ගැටුමක් අතරතුර සිදු කරන ලද ජාත්‍යන්තර මානුෂීය නීතියට අදාළ වැරදි සඳහා නඩු පැවැරීම පිණිස දේශීය නීතිය යොදා ගත හැකි වුව ද, පොදු වගන්තිය 3 අන්තර්ගත කිරීම අභිමත වන්නේ ද යන්න සලකා බැලීම පාර්ලිමේන්තුවේ කටයුත්තක් වන්නේ මෙම සංදර්භය තුළය.

විධානීය වගකීම

1123. සංකේතාත්මක සිද්ධි පිළිබඳ තව දුරටත් විමර්ශන නිර්දේශ කරන අතරම, විධානීය වගකීම මෙරට නීතියේ කොටසක් විය යුතු බවට වූ නිර්දේශය ද උදලාගම කොමිෂන් සභාව ඉදිරිපත් කළේය. අන්තර්ජාතික නොවන ගැටුම් පිළිබඳ සංදර්භය තුළ පරණගම කොමිෂන් සභාව ද මෙම කරුණ

638 බලන්න "අභයන්තර සන්නද්ධ ගැටුම්වල යුධ අපරාධ" ඊව් ලා හායේ (2008 පිටුව 121)

639 එම

640 එම

සාකච්ඡා කරයි.[641] එල්ටීටීඊ දේශපාලන අංශයේ නායකයා වන බාලසිංහම් නඩේසන්, එල්ටීටීඊයේ සාම ලේකම් කාර්යාලයේ ප්‍රධානී සීවරත්නම් පුලිදේවන් වැනි එල්ටීටීඊ නායකයන්ගේ ඊනියා "සුදු කොඩි සාතන" සිද්ධියේදී, උගත් පාඩම් සහ ප්‍රතිසන්ධාන කොමිෂන් සභාව විසින් සොයා ගත් පරිදි, පරණගම කොමිෂන් සභාවේ මතය වූයේ සිවිල් වැසියන් හට හිතාමතාම පහරදීමේ නිශ්චිත අවස්ථාවන්ට අදාළව මෙම කරුණු විමර්ශනය කළ යුතු බවයි. පරණගම කොමිෂන් සභා වාර්තාවේ 46 වන ඡේදයේ විධානය හෝ උත්තර වගකීම පිළිබඳ සිද්ධාන්තය සාකච්ඡා කරනු ලබන අතර එසේ කරනුයේ තමන් යටතේ සේවය කරන පිරිස් යුධ අපරාධ කිරීමට සූදානමින් සිටි බවට හෝ යුධ අපරාධ සිදු කර ඇති බවට හමුදා හෝ සිවිල් ප්‍රධානීන් දැන සිටියේ නම් හෝ දැන ගැනීමට හේතු තිබූයේ නම් සහ ප්‍රධානියා එවැනි අපරාධ වැළැක්වීමට හෝ ඒවාට දඬුවම් දීමට ප්‍රධානීන් අපොහොසත් වූ විට ඔවුන් යටතේ සිටි පිරිස් සිදු කළ අපරාධවලට ඔවුන් වගකීමට ලක් කළ හැකි බව යන අදහසිනි.

1124. කාර්ය පටිපාටි සහ හරයාත්මක ජාත්‍යන්තර නීතිය ප්‍රකාරව ආධීනතා දාමයක් ස්ථාපික කිරීමට තරම් ප්‍රබල සාක්ෂි මතු වන්නේ නම් මෙම ආධීනතාවයේ පදනම සත්‍යය හා ප්‍රතිසන්ධාන කොමිෂන් සභාව විසින් සැලකිල්ලට ගැනීමට වටිනේය.

අනුස්මරණය කිරීම

1125. අපගේ දෙවන අන්තර්කාලීන වාර්තාවේ අප පෙන්වා දී ඇති පරිදි, කොමිෂන් සභාව ඉදිරියේ සාක්ෂිකරුවන් විසින් අනුස්මරණය පිළිබඳ කරුණු රැසක් සාකච්ඡා කළ අතර අනුස්මරණය කිරීමේ බලය ගැටුමකින් පසු කාල වකවානුවේ ගැඹුරු සමාජීය බෙදීම් යටපත් කිරීම අරමුණු කර ගත් සංකේතාත්මක හානිපූර්ණ ස්වරූපයක් ලෙස පුළුල්ව පිළිගන්නා බව කොමිෂන් සභාව පිළිගනියි. අනුස්මරණය කිරීම සංකේතාත්මක හානිපූරණවල ප්‍රකෘතිමත් කිරීමේ සහ පරිණාමනීය ධාරිතා පුළුල් කරයි.

1126. අනුස්මරණය කිරීමේ බලය දිගු කලක් පැවැති ගැටුමකින් පසු කාල වකවානුවේ ගැඹුරු සමාජීය බෙදීම් යටපත් කිරීම අරමුණු කර ගත් සංකේතාත්මක හානිපූර්ණ ස්වරූපයක් ලෙස පුළුල්ව පිළිගනු ලබයි.

1127. අනුස්මරණය කිරීමේ ප්‍රශ්නය පිළිබඳව මෙම ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාව සම්මුඛ පරීක්ෂිතයන්ගේ විවිධ වූ අදහස්වලට සවන් දෙන ලදී. තම ආදරණීයයන්ගේ ජීවිත අහිමිවීම සම්බන්ධයෙන්, ඒවා සිදුවූ අවස්ථානුගත කරුණු නොතකා, ශෝක වීමට තමන්ට අවස්ථාව ලබා දෙන ලෙසට මෙම කොමිෂන් සභාවට ආයාචනය කළේ හිටපු සටන්කාමීන්ය.

1128. මෙම තත්ත්වය තුළ ජනතාවට තමන්ගේ නැසී ගිය ආදරණීයයන්ගේ මරණය වෙනුවෙන් වැළපීමට සහ ඔවුන්ට ගෞරවය දැක්වීමට අයිතිය ලබා දිය යුතු බවට අපි නිර් දේශ කරන්නෙමු. කෙසේවුව ද, මෙය ත්‍රස්තවාදය සහ ත්‍රස්තවාදය ක්‍රියාත්මක කළ තැනැත්තන්ගේ ජීවිත පූජාව ගෞරව සම්මානයට භාජනය කිරීමකට මඟපෑදීමක් නොවිය යුතු බව විරුද්ධවාචකය වේ. නැසී ගිය ආදරණීයයන් සිහිපත් කිරීම සහ ඔවුන් වෙනුවෙන් වැළපීම ස්වභාවික මානව සහජබුද්ධියක් වන අතර එය ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් කිසිදු විරෝධතාවක් නොමැත. ත්‍රස්තවාදීන් පිළිබඳ මතකය ගෞරව සම්මානයට භාජනය කිරීම සහ ත්‍රස්තවාදය ක්‍රියාත්මක කළ සහ ජීවිත සහ දේපළ විනාශ කළ තැනැත්තන් ජීවිත පූජා කළ වීරයින් බවට උසස් කිරීම වැනි තත්ත්වයන්ට මෙම පහසුකම විකෘති කළ නොහැකි විය යුතුය යන වැදගත් කොන්දේසියට යටත්ව මෙම ඉල්ලීම සඳහා අවස්ථාව ලබා දිය යුතුය.

1129. අනුස්මරණය මඟින් ජනකොටඨාස සිය අතීත උරුමයන්ට මුහුණ දෙමින් තමන්ව සුවපත් කර ගන්නේ නම්, දැනට පවතින ව්‍යවහාර අඛණ්ඩව පවත්වා ගැනීමට ඉඩ දිය යුතු වන අතර එය ජනකොටඨාස අතර

641 පරණගම කොමිෂන් සභා වාර්තාවේ XXV පිටුව බලන්න

විවාදයට භාජනය වීමට ඉඩ නොදිය යුතුය. අප ඉහත දුටු සුසමාදර්ශක මාදිලිය (paradigmatic model) මඟින් අර්ථදක්වන ලද පරිදි සංක්‍රාන්තික යුක්තිය (transitional justice) යන්නෙන් අතීතයේ සිදු වූ මහා පරිමාණ අපයෝජනවල මතකය සම්බන්ධයෙන් සමාදානවීමට සමාජ උත්සාහයන් ආශ්‍රිත ක්‍රියාවලීන් සහ යාන්ත්‍රණ අදහස් වන්නේ නම්, අනුස්මරණය කිරීම වන්දි විෂය යටතට වැටේ. අනුස්මරණය කිරීම සංකේතාත්මක වන්දි ගෙවීමක් වන අතර ඒ සඳහා වන ආණ්ඩුවේ තුලනාත්මක ප්‍රවේශයක් සංහිදියාව සහ සුවපත්වීම අත්පත් කර ගැනීම සඳහා නිසැකවම ඉතා වැදගත් අංගයක් වනු ඇත. උගත් පාඩම් සහ ප්‍රතිසන්ධාන කොමිෂන් සභාව මඟින් පවා අනුස්මරණය කිරීම ආමන්ත්‍රණය කර ඇත;

දීර්ඝ කාලයක් ඇදුනු යුද්ධයේ අමිහිරි ස්වභාවය සහ එමඟින් සිදු කළ මනුෂ්‍ය ජීවිත සහ දේපළ විනාශය සැලකීමේ දී, සිංහල, දෙමළ, මුස්ලිම් හෝ වෙනත් ජනකොට්ඨාසවලට අයත් සිවිල් ජනතාව හෝ සොල්දාදුවන් හෝ වේවා, යුද්ධයේ සියලුම වින්දිතයින් සාමූහිකව අනුස්මරණය කිරීමේ ජාතික අවශ්‍යතාව කොමිෂන් සභාව ඉදිරියට පැමිණි සියලුම දෙනා පාහේ ප්‍රකාශ කළහ. එබැවින්, යුද්ධයෙන් පීඩා විඳි සියලුම වින්දිතයින් සම්බන්ධයෙන් එකමුතුකම සහ සහකම්පනය ප්‍රකාශ කිරීම සඳහාත්, රට තුළ නැවත කිසි දිනෙක එවැනි ලේ වැගිරීම් සිදු නොවන බවට සහතික කිරීම වෙනුවෙන් අපගේ සාමූහික කැපවීම සපථ කිරීම සඳහාත් ජාතික දිනයේ දී වෙනම උත්සවයක් සංවිධානය කළ යුතු බවට කොමිෂන් සභාව දැඩිව නිර්දේශ කරයි. එවැනි ගාම්භීර අවස්ථාවක දී, සහ ඉහළ දේශපාලන මට්ටමක දී, පවත්වනු ලබන මෙම අනුස්මරණ වැඩපිළිවෙල මඟින් සමස්තයක් ලෙස ජාතිය ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කරන සංහිදියා ක්‍රියාවලියට අවශ්‍ය වේගශක්තිය ලබා දෙනු ඇතැයි, කොමිෂන් සභාවට ලැබී ඇති සාක්ෂි මත පදනම්ව, කොමිෂන් සභාවට හැඟී යයි.

අනුස්මරණය කිරීම ලෙස මිය ගිය තැනැත්තන්ගේ ශරීර කොටස් ගොඩගැනීම

1130. කාන්තන්කුඩි හි පැවති අපගේ එක් රැස්වීමක දී ජනතාව - ''කරුණාකර අපට කුරුක්කල්මඩම් හි දී පහර දී, බලෙන්පැහැරගත්, මරා දැමූ අපගේ සැමියන්ගේ, සහෝදරයින්ගේ සහ පුතුන්ගේ දේහයන් යළි ගොඩගැනීමට උපකාර කරන්න'' ලෙස ඉල්ලා සිටි ආකාරය සිහිපත් වේ.

1131. එමෙන්ම ඔවුන්ගේ ආගමික චාරිත්‍රවලට අනුකූලව වලදැමීම සඳහා මිය ගිය තැනැත්තන්ගේ අස්ථි කොටස් ලබා දෙන ලෙසට ද ජනතාව ඉල්ලා සිටියහ. මේ සම්බන්ධයෙන් ජනාධිපති විමර්ශන කොමිෂන් සභාව මඟින් විමර්ශනයක් සිදු කළ අතර මෙම අයැදුම් සම්බන්ධයෙන් කටයුතු කිරීමේ දී මහේස්ත්‍රාත් අධිකරණයේ විශාල ප්‍රමාදයක් ඇති බවටත් වින්දිතයින්ගේ සමීප පවුල් සාමාජිකයින් විසින් වින්දිතයින්ගේ අනන්‍යතාව හඳුනා ගැනීම දැනටමත් සිදු කර ඇති බැවින් මහේස්ත්‍රාත් අධිකරණය භාරයේ ඇති වින්දිතයින්ගේ ශරීර කොටස් සාම්පල එම පුද්ගලයින්ට නිදහස් කළ යුතු බවට නිගමනය කරයි. උපදෙස් සඳහා මෙම සංවේදී කරුණු යොමු කර ඇති නීතිපති විසින් මනුෂ්‍ය ශරීර කොටස් සහ සාම්පල නිදහස් කිරීම සඳහා යෝග්‍ය නියෝගයක් නිකුත් කිරීම පිණිස සිය මතය මහේස්ත්‍රාත්වරයාට නියෝග කළ යුතුය. නිමාවක් අත්දැකීමට හැකියාව ඇති කළ යුතු තැනැත්තන් මෙමඟින් සුවපත් වනු ඇත.

සංහිදියාව සඳහා නිර්දේශ

1132. යුක්තිය සහ සාමය අතර සෑමවිටම දක්නට ලැබෙන ආතතියක් තිබීම යුක්තිය පිළිබඳ ප්‍රේහේලිකාව වේ. සාමය යන්නෙන් සංහිදියාව සහ ඇතැම් විට සමාවදීම ඇඟවිය හැකිය. යුක්තිය පසිඳලීම, නඩු පැවරීම ආශ්‍රයෙන් ඉදිරිපත් කරන බොහොමයක් දෙනා, විපායදායී යුක්තිය, ප්‍රතිස්ථාපන යුක්තියෙන් වෙනස් කොට සලකයි. පෙර සඳහන් කළ කොමිෂන් සභා (උගත් පාඩම් කොමිෂන් සභාව සහ ජනාධිපති කොමිෂන් සභාව) කිසිවක් විපායදායී යුක්තිය සම්පූර්ණයෙන්ම ප්‍රතික්ෂේප කර නොමැත. කොමිෂන් සභා මගින් අන්තර්ජාතික මානුෂවාදී නීතිය සහ අන්තර්ජාතික මානව අයිතිවාසිකම් නීතිය උල්ලංඝනය කිරීම් පිළිබඳ ඇතැම් චෝදනා සම්බන්ධයෙන් වැඩිදුර විමර්ශනය කිරීම් නිර්දේශ කර ඇති අතර විශ්වාසදායක විමර්ශනයකින් පසුව අපරාධ චෝදනා ගොනු කිරීමට ප්‍රමාණවත් සාක්ෂි මතු වී තිබෙන්නේ නම්, අපරාධ නඩු ගොනු කිරීමේ හැකියාව ඒවායින් බැහැර කර නොමැත. විශ්වාසදායක සාක්ෂි මත නඩු පැවරීම් අපේක්ෂා කර තිබුනේ නම්, මෙම කොමිෂන් සභාවට විපාකදායී යුක්තිය පසිඳලීමෙන් බැහැරව, ප්‍රතිස්ථාපන යුක්තිය පසිඳලීම පමණක් නියම කළ නොහැක. නිර්දේශ ඇතුළත්ව ඉදිරිපත් කළ අපගේ අතුරු වාර්තාවලින් අප ඉදිරිපත් කළ යාන්ත්‍රණය පැහැදිලිය. පෙර කොමිෂන් සභාවල නිර්දේශ ක්‍රියාත්මක

කරවිය යුතුය. පරණගම කොමිෂන් සභාව මෙහෙයවන ලද මැක්ස්වෙල් පරණගමගේ සාක්ෂි විමසීමෙන් අනතුරුව, ඔහුගේ පොලිස් පරීක්ෂකයින් විසින් සිදු කළ විමර්ශනවලින් මතු වූ බවට ඔහු පැවසූ විමර්ශන සටහන් සම්බන්ධයෙන් කිසිදු පියවරක් නොගෙන ඒවා ජාතික ලේඛනාගාරයේ තබා ඇති බවටත් ඒවා නීතිපති දෙපාර්තමේන්තුවට ලබා දිය යුතු බවටත් ජනාධිපති විමර්ශන කොමිෂන් සභාව මඟින් එහි දෙවැනි අතුරු වාර්තාවෙන් පෙන්වා දෙන ලදී. මෙම නිර්දේශය මෙතෙක් ක්‍රියාත්මක කර නොමැති බවට පෙනීයයි. මෙම වාතාවරණය තුළ, නීතිපතිතුමා විසින් මෙම විමර්ශන සටහන් විශේෂ ඒකකයක් යටතට පවරා ගෙන, පරණගම කොමිෂන් සභාව මඟින් එකතු කළ විමර්ශන සටහන්වලින් අතුරුදහන් කිරීම් වැනි අපරාධ සිදු කළ බවට සාක්ෂි හෙළිදරව් වන්නේ දැයි තීරණය කළ යුතු බවට **ජනාධිපති විමර්ශන කොමිෂන් සභාව මඟින් නිර්දේශ කරනු ලැබේ**. එසේ නම්, විමර්ශනය සහ නඩු පැවරීම ආරම්භ කිරීම සඳහා එම කරුණු භාවිතා කළ හැකිය.

බලය බෙදීමේ ගැටළු

13 වැනි සංශෝධනය

1133. මෙම කරුණ විවාදිත බවට පත්ව ඇති අතර ඉඩම් පැවරීම මඟින් ප්‍රශ්නගත කරුණු මතුවන බවටට ප්‍රතික්ෂේප කළ නොහැක. ජනාධිපති විමර්ශන කොමිෂන් සභාව ඉදිරියට පැමිණි සාක්ෂිකරුවන් අර්ථාන්විත බලය බෙදීමක අවශ්‍යතාව පිළිබඳව මෙම කොමිෂම ඉදිරියේ අවධාරනය කළ අතර 13 වැනි සංශෝධනය සැබවින්ම වාර්ගික අර්බුදය සඳහා විසඳුමක් සෙවීමේ වෑයමකි. මෙම පසුබිම තුළ, ... යුක්තියට සැබෑ අර්ථයක් දීමට නම්, 13 වැනි සංශෝධනය ක්‍රියාත්මක කිරීම අත්හරින ලද විසඳුමකි, ඒ මන්දයත් එය දැනටමත් ක්‍රියාත්මක පවතින ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාමය වැඩපිළිවෙල තුළ අන්තර්ගත අංගයක් වන බැවිනි.

1134. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ කොටසක් වන 13 වැනි සංශෝධනය පිළිපැද, ක්‍රියාත්මක කළ යුතු බවට සාක්ෂි දුන් සාක්ෂිකරුවන් කිහිප දෙනෙක් විය.

1135. උගත් පාඩම් සහ ප්‍රතිසන්ධාන කොමිෂන් සභාව මඟින් පළාත් සභා ක්‍රමයේ පරිපාලන දුර්වලතා පෙන්වා දී තිබූ බවත් යෝග්‍ය නව ක්‍රමවේද භාවිතා කිරීමෙන් පරිපාලනය පුනර්ජීවනය කිරීමේ අවශ්‍යතාව අවධාරණය කර තිබූ බවත් ජනාධිපති විමර්ශන කොමිෂන් සභාව මගින් සිහිපත් කරයි.

1136. ජාතික ආරක්ෂාව පිළිබඳ කරුණු හේතුවෙන් සම්පූර්ණ අනුකූලවීම සිදු කළ නොහැකි වුව ද 13 වැනි සංශෝධනය ක්‍රියාත්මක කිරීම සඳහා වූ ස්වේච්ඡා පොරොන්දුව 2008 වසරේ විශ්ව ... සමාලෝචනයේ දී සිදු කළ බවටත්, ජනාධිපති විමර්ශන කොමිෂන් සභාව මගින් සිහිපත් කරයි.

2009 මැයි 27 දිනැති එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කවුන්සිලය යෝජනාසම්මුතිය

1137. ශ්‍රී ලංකාව, එහි ජීවත්වන සියලුම වාර්ගික සහ ආගමික කණ්ඩායම් අතර එකිනෙකාගේ අයිතිවාසිකම් පිළිබඳ ගෞරවය ඇති කිරීම පිළිබඳ සම්මුතියක් මත පදනම්ව, දේශපාලන විසඳුමක ක්‍රියාවලියක් වැඩිදියුණු කිරීම සහ ශ්‍රී ලංකාව තුළ දිගු කාලීන සමානය හා සංවර්ධනයක් ගෙනඒම පිණිස සියලුම පාර්ශ්ව සමඟ පුළුල් සංවාදයක් ආරම්භ කිරීමට කැමැත්ත ප්‍රකාශ කරන බවට 2009 මැයි 27 වැනි දිනැති එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කවුන්සිලය යෝජනාසම්මුතිය S-11/1 ප්‍රකාශ කරයි.

1138. එක්සත් ජාතීන්ගේ මහ ලේකම්ගේ ශ්‍රී ලංකා සංචාරය අවසානයේ දී ශ්‍රී ලංකා ආණ්ඩුව සහ එක්සත් ජාතීන්ගේ සංවිධානය මඟින් 2009 මැයි 23 නිකුත් කළ ඒකාබද්ධ නිවේදනය මඟින් සම්මුතිය ස්ථිර කරනු ලැබේ.

1139. ඇතුළත් කර ගන්නා, දේශීයව නිර්මාණය කළ සහ ක්‍රියාත්මක කළ සහ ආණ්ඩුවේ ප්‍රතිපත්ති රාමුවට අනුකූලව දැනට පවතින යාන්ත්‍රණවලට යෝග්‍ය යොදා ගැනීම් ඇතුළත් සංහිඳියාවේ සහ වගවීමේ ක්‍රියාවලියක් හරහා දිගු කාලීන සාමයක් අත්කර ගැනීමට කැපවී සිටින බවට ශ්‍රී ලංකා ආණ්ඩුව මඟින් 2020 පෙබරවාරි මස 26 වැනි දින ජිනීවා හි පිටිහි එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කවුන්සිලය ඉදිරියේ වැඩිදුරටත් ප්‍රකාශයක් සිදු කරන ලදී. එය 13ට වැඩි දෙයක් ද අඩු දෙයක් ද යන ගැටළුව මතු වී තිබේ. නීතිසම්පාදකයින්ට ආණ්ඩුක්‍රමව්‍යවස්ථා විධිවිධානවලට විරුද්ධවීමේ වාසිය සහ වරප්‍රසාදය ඇති අතර

ඔවුන්ට දැනට පවතින ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාමය විධිවිධානවලට එකඟවීමේ හෝ විරුද්ධවීමේ ව්‍යවස්ථාමය කුසලතාව භාවිතා කළ හැකිය. මෙම කරුණ ජනාධිපති විමර්ශන කොමිෂන් සභාව ඉදිරියට යොමු කර ඇති බැවින්, මෙම කරුණ පිළිබඳව තීරණය කිරීම නීතිසම්පාදකයින්ට අයිති බවට අපි නිරීක්ෂණය කරමු.

ඉඩම් ගැටළුව

අ) ජාතික ඉඩම් කොමිෂන් සභාව (NLC)

1140. ඉඩම් ආශ්‍රිත ගැටළු අර්ථාන්විත සංහිදියාවක් අත්කර ගැනීමේ දී වැඩි අවධානයක් යොමු වන කරුණකි. එය දැනටමත් උතුරු සහ නැඟෙනහිර පළාත්වල සියලුම ජනකොට්ඨාස අතර අවිශ්වාසය සහ සැකය ඇති කිරීමට හේතු වී ඇති කරුණකි. ඉඩම් ආරාවුල් විසඳීමේ ප්‍රගතිය අඩු බවටත් නිලධාරීන් සම්බන්ධයෙන් අකාර්යක්ෂම සහ ඵලදායී නොවන තත්ත්වයන් පවතින බවට යාපනය සහ කාත්තන්කුඩි ප්‍රදේශවලින් පැමිණි සාක්ෂිකරුවන්ගේ සම්මුඛසාකච්ඡා සහ සාක්ෂිවලින් පෙනී ගිය අතර යාපනයේ සිටි මුස්ලිම් සාක්ෂිකරුවන් පැවසූ ආකාරයට ඔවුන්ගේ ප්‍රශ්න පළාත් ආණ්ඩුවේ දැඩි ස්ථාවරය සහ අසමාන ඉඩම් බෙදාදීමට සම්බන්ධවිය.

1141. මෙම තත්ත්වය තුළ දිවයිනේ ප්‍රධාන ගැටළුවක් බවට පත්ව ඇති ඉඩම් ආශ්‍රිත ගැටළු විධිමත් කිරීම සඳහා පහත දැක්වෙන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාමය ක්‍රියාමාර්ග අනුගමනය කළ යුතු බවට ජනාධිපති විමර්ශන කොමිෂන් සභාව නිර්දේශ කරයි.

1. ජාතික ඉඩම් ප්‍රතිපත්තිය සකස් කිරීම සහ ජාතික සම්පත් කළමනාකරණයට අදාළ සියලුම විෂයන් නියෝජනය කරන තාක්ෂණික ලේකම් කාර්යාලයක් නිර්මාණය කිරීම සිදු කරනු ලබන ජාතික ඉඩම් කොමිෂන් සභාවක් ස්ථාපිත කිරීම පිණිස ජාතික ඉඩම් කොමිෂන් සභාවක් (NLC) පනවනු ලැබේ.[642]

2. ජාතික ඉඩම් කොමිෂන් සභාව මඟින් ශක්තීන් සහ දුර්වලතා හඳුනා ගැනීම සඳහා මූලිකවම දැනට පවතින ජාතික ඉඩම් ප්‍රතිපත්තීන් සහ ඒවායේ ක්‍රියාත්මකවීම සමාලෝචනය කළ යුතුය.

3. එමඟින් බලය බෙදීම සඳහා අවදානම් සහ වැඩිදුර වැඩිදියුණු කිරීම් සඳහා ඉඩප්‍රස්ථාවන් සොයා ගත යුතුය.

4. එමඟින් ආණ්ඩුව රජයේ ඉඩම් භාවිතාව, ඉඩම් මුදාහැරීම, අන්සතු කිරීම සහ බෙදාහැරීමේ ක්‍රියාවලීන්ට සංශෝධන සිදු කළ යුතු ක්ෂේත්‍ර අදහස් විමසීම මඟින් සොයා ගත යුතුය. ජාතික ඉඩම් ප්‍රතිපත්තිය මෙම සාකච්ඡාවල ප්‍රතිඵලයක් විය යුතු වන අතර ඇතැම් විට ජාතික ඉඩම් කොමිෂන් සභාවේ තාක්ෂණික ලේකම් කාර්යාලය සිදු කරන බරපතල අධ්‍යයන මඟින් විය හැකිය. එය තත් කාර්ය තීරණ සහ සංවේදන මත සිදු නොවිය යුතුය.

5. ජාතික ඉඩම් කොමිෂන් සභාව මඟින් ජාතික ඉඩම් ප්‍රතිපත්තිය පිළිබඳ ධවල පත්‍රිකාවක් සකස් කළ යුතු වන අතර එය අනුමැතිය සඳහා අමාත්‍ය මණ්ඩලයට ඉදිරිපත් කිරීමට පෙර, ඒ පිළිබඳව පළාත් සභා සහ පාර්ලිමේන්තු උපදේශක කාරක සභාවේ දී සාකච්ඡා කළ හැකිය. අතීත මැදිහත්වීම් පිළිබඳව ඉහත සඳහන් කළ විශාල තොරතුරු ප්‍රමාණය මෙම ධවන පත්‍රිකාව සකස් කිරීමේ දී යෝග්‍ය පරිදි ප්‍රයෝජනයට ගත හැකිය. මෙම ක්‍රියාවලිය මඟින් ප්‍රතිපත්ති සම්පාදනය සඳහා II වැනි ලැයිස්තුවේ පූර්විකාවේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාමය අවශ්‍යතාවන් සම්පූර්ණ කරනු ලබන අතර අමාත්‍ය මණ්ඩලය පළාත් සභාවලට ද්විතීයක වන බවට සැකකරන ඍණාත්මක නිෂේධනය මකාලනු ඇත.

6. ජාතික ඉඩම් ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමේ දී උපරිම මට්ටම දක්වා ගැටුම් අවම කිරීම සහතික කිරීම සඳහා එම ප්‍රතිපත්තිය සකස් කිරීමේ, ක්‍රියාත්මක කිරීමේ, අධීක්ෂණය කිරීමේ සහ සමාලෝචනය කිරීමේ අදියරවල දී නීතිපතිවරයා විසින් ජාතික ඉඩම් ප්‍රතිපත්තිය යොදා ගැනීම පිළිබඳව අධීක්ෂණය කිරීමටත්, උපදෙස් දීමටත් ආණ්ඩුව සහ පළාත් සභා තුලනය කළ යුතු සහ ඒවායේ සැක දුරු කළ යුතු පොදු ඉඩම් පරිපාලන ව්‍යවස්ථාවක් කෙටුම්පත් කිරීමට සහාය දැක්වීමත් කළ යුතුය. ඉඩම් නීතිය පිළිබඳ ප්‍රවීණතාව ඇති නීතිපති දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨ නිලධරයෙක් මෙම ලේකම් කාර්යාලයට

642 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 2 වෙනි පරිශිෂ්ඨයේ විෂය අංක 3.1 සහ 3.2 බලන්න.

පූර්ණ කාලීනව අනුමත කිරීම හෝ අවම වශයෙන් ජාතික ඉඩම් කොමිෂන් සභාවට සහායවීම සඳහා නම් කිරීම හෝ සිදු කළ යුතුය.

7. ජාතික ඉඩම් ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමේ දී සිදු විය හැකි ප්‍රගතිය හෝ ප්‍රතිගමනය හෝ වෙනස්වීම් අධීක්ෂණය සහ ඇගයීම මඟින් ජාතික ඉඩම් කොමිෂන් සභාව කෙරී ගෙන යන සහ අඛණ්ඩ ව්‍යායාමයක් ලෙස ක්‍රියාත්මක විය යුතු වන අතර එය ඵලදායී සහ කාර්යක්ෂම කෘත්‍ය ක්‍රියාවලියක් බවට පත් කිරීමට අවශ්‍ය වෙනස්කම් සහ සංශෝධන යෝජනා කළ යුතුය. අවශ්‍ය ආකාරයට අමාත්‍ය මණ්ඩලයට නෛතික සහ මෙහෙයුම් සංශෝධන පිළිබඳව තීරණය කළ හැකි වන පරිදි, අනාගත ප්‍රතිපත්තිමය සහ ක්‍රියාත්මක කිරීමේ සංශෝධන අවශ්‍ය වන ක්ෂේත්‍ර සම්බන්ධයෙන් ජාතික ඉඩම් කොමිෂන් සභාව ආණ්ඩුවට (එනම් අමාත්‍ය මණ්ඩලයට) උපදෙස් ලබා දිය යුතුය.

ආ) පෞද්ගලික ඉඩම් මුදා හැරීම

1142. පෞද්ගලික ඉඩම් ඒවායේ නීත්‍යානුකූල හිමිකරුවන් වෙත ප්‍රතිස්ථාපනය කිරීම පිළිබඳ මෑත කාලීන යෝජනාව ජනාධිපති විමර්ශන කොමිෂන් සභාව සාදරයෙන් පිළිගනියි. මෙමඟින් ජනාධිපති විමර්ශන කොමිෂන් සභාව ඉදිරියේ ඉඩම් ගැටළු සම්බන්ධයෙන් සාක්ෂි දුන් සාක්ෂිකරුවන් බොහොමයකගේ පැමිණිලි සම්බන්ධයෙන් කටයුතු කරනු ඇත. විශේෂයෙන්ම LTTE මඟින් උතුර සහ නැඟෙනහිර පළාත්වලින් පලවා හරින ලද සරණාගතයින් නැවත පදිංචිකරවීමේ දීර්ඝ කාලීන ගැටළුව වැනි ගැටළු රාශියක් විසඳීමට තිබේ. යාපනයේ සිටි මුස්ලිම් ජාතික සාක්ෂිකරුවන් මෙම ගැටළු සම්බන්ධයෙන් සාක්ෂි දුන් අතර මෙම ගැටළු විසඳීම සඳහා ප්‍රමුඛතාව ලබා දීම වඩාත් සුදුසු වේ.

සමාව ඉල්ලීම් සහ බලවත් පශ්චාත්තාපය ප්‍රකාශ කිරීම්

1143. සුවවීම අත්කර ගත හැක්කේ සත්‍ය පිළිගැනීම මඟින් පමණි. අවංකවම පිරිනමන ලද සමාව ඉල්ලීම් භාවාත්මක තුවාල සුවවීමේ දී සහ හානි වූ සබඳතා ප්‍රතිස්ථාපනය කිරීමේ දී ඉතා වැදගත් කාර්යභාරයක් ඉටු කරයි. මෙම තත්ත්වය තුළ රටේ ජ්‍යෙෂ්ඨ නායකයෙක්/ නායකයින් දෙපාර්ශ්වයේම වින්දිතයින්ට සිදු වූ අයුක්තිය පිළිබඳ සත්‍ය පිළිගැනීම **නිර්දේශ කරනු ලැබේ**.[643]

කාන්තාවන් සවිබල ගැන්වීම

1144. උගත් පාඩම් සහ ප්‍රතිසන්ධාන කොමිෂන් සභාව සහ මෙම ජනාධිපති විමර්ශන කොමිෂන් සභාව ඉදිරියේ ලබා දුන් කාන්තාවන්ගේ සාක්ෂිවලින් යුද්ධයෙන් දිවි බේරාගත් කාන්තාවන්ගේ සාමාජීය අවශ්‍යතාව පමණක් නොව සහභාගීත්ව තීරණ ගැනීමේ සහ සත්‍ය සෙවීමේ යාන්ත්‍රණවලට අවශ්‍ය ඔවුන්ගේ කාර්යභාරය අවධාරණය කරයි.

643 4 සහ 5 වැනි පරිච්ඡේදවල ඇතුළත් සමාව ඉල්ලා සිටීම සඳහා මෙම ජනාධිපති විමර්ශන කොමිෂන් සභාව ඉදිරියේ සාක්ෂිකරුවෙක් සිදු කළ විලාප සහගත අයැදීම බලන්න.

1145. දීර්ඝ කාලීනව, යුද්ධයෙන් බලපෑමට ලක් වූ කාන්තාවන්ගේ සේවානියුක්ති අපේක්ෂාවන් සහ ප්‍රතිඵල වැඩිදියුණු කිරීම සඳහා ඔවුන්ගේ මානව සම්පත සම්බන්ධයෙන් ආයෝජනය කිරීම අවශ්‍ය වේ. ගැහැණු ළමයින් පාසැල් හැර යන විට ඔවුන්ගේ සේවානියුක්තිය සහ ප්‍රයෝජනවත්භාවය වැඩිදියුණු කරන සාමාන්‍ය අධ්‍යාපන පහසුකම් සහ සේවා සම්බන්ධ ප්‍රතිපත්ති උතුරු පළාත තුළ හදිසි අවශ්‍යතාවක් ලෙස ස්ථාපිත කළ යුතුය. ස්මාර්ට් දුරකථනයක් හරහා සජීවීව ලබා දිය හැකි තොරතුරු තාක්ෂණය පදනම් කර ගත් අධ්‍යාපන පහසුකම්වලින් ඉගැන්වීමේ ගුණාත්මකභාවය සහ ලිපි ලේඛනවල අඩුපාඩු වැනි ප්‍රශ්න වඩාත් හොඳින් කළමනාකරණය කිරීමේ විකල්පය ශ්‍රී ලංකා ආණ්ඩුවට සලකා බැලිය හැකිය. ශ්‍රී ලාංකිකයින්ට, ඔවුන් කොතැනක ජීවත් වූ ද, පැරණි අධ්‍යාපන ක්‍රමයේ බැමි කඩා දමා, තොරතුරු තාක්ෂණය හා බැඳුනු නව ලෝකයට පියමං කර, සේවානියුක්ති වෙළඳපොළ ඉල්ලා සිටින කුසලතා ග්‍රහණය කර ගත හැකිවීම පිණිස, අධ්‍යාපනය පරිමාර්ථය කර ගත් අන්තර්ජාල වෙත විශ්වීය ප්‍රවේශය සඳහා මුදලින් ආධාර කිරීම මෙම ක්‍රියාවලිය තුළ දී ශ්‍රී ලංකා ආණ්ඩුවට සලකා බැලිය හැකිය.

643 4 වෙනි සහ 5 වෙනි පරිච්ඡේදවල සඳහන් කර ඇති, සමාව ඉල්ලා මෙම කොමිෂන් සභාව ඉදිරියේ සාක්ෂි දුන් සාක්ෂිකරුවෙක්ගේ දුක්මුසු වැළපීම බලන්න.

1146. ආර්ථික දරිද්‍රතාව මෙම ජනාධිපති විමර්ශන කොමිෂන් සභාව ඉදිරියේ සාක්ෂි දුන් බොහොමයක් කාන්තාවන්ගේ දුක්ඛිත තත්ත්වයන්ට හේතුපාදක වී ඇති බවට පෙනී යන අතර මෙම කාන්තාවන්ගේ ධාරිතාවන්, ගතිකත්වය සහ නායකත්ව ගුණාංග වැඩිදියුණු කිරීම අත්‍යවශ්‍යය වේ. යුද්ධය හේතුවෙන් ඉතා තරුණ වියේදීම සිය සැමියන් අහිමි වූ කාන්තාවන් කිහිප දෙනෙක්ගේ සාක්ෂි ජනාධිපති විමර්ශන කොමිෂන් සභාව මඟින් විමසන ලද අතර ඔවුන් සිය දෛනික අවශ්‍යතාවන් සපුරා ගැනීමේ දී මුහුණ දුන් දුෂ්කර අරගලය පැහැදිලි කළහ. යුද්ධයේ ප්‍රතිඵලයක් ලෙස සිය සැමියන් අහිමි වූ කාන්තාවන් මූල්‍ය සහාය සහ ආර්ථික සවිබලගැන්වීම සඳහා කළ ඉල්ලීම් අපි සිහිපත් කරමු. යුධ හමුදාව අතින් බරපතල ලිංගික අපයෝජනයට ලක් වූව ද මූල්‍ය සහාය සහ වන්දි පමණක් ඉල්ලා සිටි යාපනයේ සිට පැමිණි සාක්ෂිකාරියක් අපට ඉතා හොඳින් සිහිපත් කළ හැකිය. මෙම කාන්තාවන්ගේ දුක්ගැනවිලි සම්බන්ධයෙන් හැකි පළමු අවස්ථාවේ දීම කටයුතු කළ යුතු වන අතර මෙම දුක්ගැනවිලි සඳහා සහන සහ වන්දි ලබා ගැනීම වෙනුවෙන් යෝජිත සත්‍ය සෙවීමේ යාන්ත්‍රණය හැරුණු කොට වෙනත් අවස්ථාවක් නොතිබිය හැකිය.[644]

1147. එල්.ටී.ටී.ඊ. සංවිධානය සහ නීතිවිරෝධී අවිගත් කණ්ඩායම් කුරුක්කල්මඩම් හි දී මුස්ලිම් පුද්ගලයින් සිටි බස් රථයක් පැහැර ගෙන, ඔවුන් මරා දමා, සමූහ මිනීවලක වළදැමූ බවට කාන්තන්කුඩිවලින් පැමිණි සැමියන් අහිමි වූ මුස්ලිම් කාන්තාවන් කිහිප දෙනෙක් අප ඉදිරියේ සාක්ෂි දුනි. මෙම තරුණ වැන්දඹුවන් සිය ජීවිකාව සරිකර ගැනීම සඳහා අරගලය කළ ආකාරය අපට අවබෝධ කර ගත හැකිය. එබැවින්, බලහත්කාරයෙන් සිදු කළ අතුරුදහන් කිරීම්වල බලපෑම්වල විශේෂයෙන්ම ස්ත්‍රී-පුරුෂභාවී ස්වභාවය කෙරෙහි අවධානය යොමු කිරීම වැදගත් වේ: බලහත්කාරයෙන් සිදු කළ අතුරුදහන් කිරීම්වලට භාජනය වූ වැඩි පිරිස පුරුෂයින් සහ පිරිමි ළමයින් වූ අතර කාන්තාවන්ට විසමානුපාතිකව අතුරුදහන් කිරීම්වල සාමාජීය, ආර්ථික සහ මනෝ-සාමාජීය ප්‍රතිඵලවල බර දැරීමට සිදු වේ. මෙම සියලුම කාන්තාවන්ට ඉතා පහත් මට්ටමේ කටයුතු කිරීමට සිදු වූ අතර සිය පවුල නඩත්තු කිරීම සඳහා සුළු ආහාර සකස් කිරීම වැනි සුළු ව්‍යාපාරවල නිරතවීමට සිදු විය.

1148. කිලිනොච්චියේ දී ද අපට එම අදෝනාවම ඇසුනි. මෙම කාන්තාවන්ට බරපතල ලෙස වන්දි ගෙවිය යුතු වන අතර වන්දි සඳහා වූ කාර්යාලයට ඔවුන්ගේ ආර්ථික අභිමිකිරීම සහ මූල්‍ය අවශ්‍යතාවන් තක්සේරු කළ යුතුය. ප්‍රමාණවත් වන්දි ලබාදීම හරහා ඔවුන්ගේ චිත්ත කම්පනයන් සුවපත් කළ යුතුය.

1149. මෙම සාක්ෂිකරුවන් ඔවුන්ගේ පැමිණිලි OMP හෝ OR වෙත ඉදිරිපත් කර තිබෙන්නේ නම්, මෙම පැමිණිලි පිළිබඳව ඉක්මනින් සොයා බලා, හැකි ඉක්මනින් සහන ලබා දිය යුතු බවට අපි නිර්දේශ කරන්නෙමු.

1150. එබැවින් OR හි ශාඛාවක් සත්‍ය සෙවීමේ යාන්ත්‍රණයට ඇදිය යුතු බවට නිර්දේශ කරනු ලැබේ.

ඉදිරි මග

1151. රාජ්‍ය මඟින් තහවුරු කර ඇති පරිදි, ශ්‍රී ලාංකික ජනතාව ලෙස සාමයෙන් සහ සමගියෙන් ජීවත්වීමට ඇති අයිතිය රටේ සියලුම පුරවැසියන්ට ඒකාර්ථයෙන්ම තහවුරු කරමින්, බහුවිධතාව සහ විවිධත්වය තුළ ඒකීයත්වය පිළිබඳ ශ්‍රී ලාංකික අනන්‍යතාව පිළිබඳ ආණ්ඩුකුම ව්‍යවස්ථාමය පිළිගැනීමක් සහ ඵලදායී හඳුනා ගැනීමක්; ආණ්ඩුකුම ව්‍යවස්ථාවේ 9 වැනි සහ 10 වැනි ව්‍යවස්ථාව මඟින් බුද්ධ ධර්මයට සහ සියලුම අනෙකුත් ආගම්වලට ලබා දී ඇති තත්ත්වය සුරකිමින්, සිංහල, දෙමළ, මුස්ලිම්, උඩරට දෙමළ, මැලේ, බර්ගර් ජාතිකයින් සහ සියලුම ආගමික, සංස්කෘතික සහ භාෂාමය ජනකොට්ඨාස එක්ව, තනි එක් ජාතියක බෙදිය නොහැකි, සහ ඒකායන කොටසක් වන බව.

1152. කිසිදු සහනයක අපේක්ෂාවක් නොමැතිව, එකම කථාන්දරය කොමිෂන් සභා කිහිපයක් ඉදිරියේ නැවත නැවත කීමට සිදුවීමෙන් සාක්ෂිකරුවන් විසින් අප ඉදිරියේ ප්‍රදර්ශනය කළ ඉන්ද්‍රීය ඒකකාරීභාවය අප දැක ඇති බැවින් මෙම දිවයින තුළ sunset of the Commission සඟලක්ෂණය සඳහා අවසර ලබා දිය යුතු බවට ජනාධිපති විමර්ශන කොමිෂන් සභාව මඟින් දැඩි ලෙස නිර්දේශ කරනු ලැබේ.

644 යාපනයේ දී අවසානයට සාක්ෂිදුන් සාක්ෂිකාරියගේ කතාව කියවීම සඳහා 4 වෙනි පරිච්ඡේදය බලන්න.

දණ්ඩමුක්තිය සංස්කෘතියක අවසානය

(අ) දණ්ඩමුක්තිය සංස්කෘතිය යන්නෙන් දේශපාලකයින් කොටසක් සහ ආරක්ෂක අංශයේ සාමාජිකයින් කිහිප දෙනෙක් ඇතුළුව, තනි පුද්ගලයින් සහ කණ්ඩායම් දණ්ඩමුක්තිය ඇතිව බරපතල මානව අයිතිවාසිකම් අපයෝජන සහ වෙනත් නීතිවිරෝධී ක්‍රියාවන් සිදු කිරීමේ දිගු කාලීන ගැටළුවක් හැඳින්වේ. මෙය යුද්ධය ඇතුළු අතීත අපරාධ සම්බන්ධයෙන් වගවීම අඩුවීමකට දායක වී ඇත.

(ආ) රටේ දණ්ඩමුක්තිය සංස්කෘතිය අවසාන කිරීම, ජනතාවගේ තෝරා පත් කර ගත් නියෝජිතයින්ගේ සමස්ත ජාතික කීර්තිය මෙන්ම පොලිස් සේවය ඇතුළු රටේ සන්නද්ධ හමුදාවල යහපත් ප්‍රතිරූපය ගලවා ගැනීම පිණිස, වෙනත් කරුණු අතර, පියවර කිහිපයක් යෝජනා කරනු ලැබේ:

1) යුද්ධය අතරතුර සහ ඉන් අනතුරුව මේ දක්වා සිදු කළ මානව අයිතිවාසිකම් උල්ලංඝනය කිරීම් පිළිබඳ සියලුම චෝදනා සහ මානව අයිතිවාසිකම් අපයෝජනයන් විමර්ශනය කිරීමට සහ නඩු පැවරීමට ස්වාධීන සහ අපක්ෂපාතී අධිකරණ යාන්ත්‍රණයක් ස්ථාපිත කිරීම.

2) ආරක්ෂක අංශය ප්‍රතිසංස්කරණය කිරීම සහ මානව අයිතිවාසිකම් උල්ලංඝනය කිරීම්වලට ඔප්පු වූ ආරක්ෂක අංශ සාමාජිකයින් එම වැරදිවලට වගවීමට ලක් වන බවට සහතික කිරීම.

3) වගවීම ප්‍රවර්ධනය කිරීමට සහ දණ්ඩමුක්තිය සංස්කෘතිය අවසාන කිරීමට කටයුතු කරන මානව අයිතිවාසිකම් ආරක්ෂකයින්, ජනමාධ්‍යවේදීන් සහ ක්‍රියාකිරීන් ආරක්ෂා කිරීම.

4) දණ්ඩමුක්තිය සංස්කෘතියට දායක වී ඇති වර්ගවාදය සහ ආගම පදනම් වූ වෙනස්කොට සැලකීම සහ අසමානතාව ඇතුළු වෙනස්කොට සැලකීම් සහ අසමානතා සම්බන්ධයෙන් කටයුතු කිරීම.

5) දූෂණ විරෝධී ක්‍රමවේද හරහා ඇතුළුව, ආණ්ඩුවේ සහ ව්‍යාපාරවල විනිවිදභාවය සහ වගවීම දිරිමත් කිරීම.

6) විවිධ ජනකොට්ඨාස අතර විශ්වාසය ගොඩනැගීම සහ සත්‍ය සෙවීම හරහා ඇතුළුව, සංහිඳියාව ප්‍රවර්ධනය කිරීම සහ අතීත මානව අයිතිවාසිකම් අපයෝජන පිළිබඳව කටයුතු කිරීම.

(ඇ) ශ්‍රී ලංකාව 'බනානා ජනරජයකට' සමාන කරමින් රටේ සාමාන්‍ය කීර්තිය බරපතල ලෙස පළුදු කර ඇති ශ්‍රී ලංකාවේ දණ්ඩමුක්තිය සංස්කෘතිය අවසාන කිරීම සඳහා සිංහල සහ දෙමළ මාධ්‍ය, සියලුම ජනකොට්ඨාසවල පූජකයින්, ආණ්ඩුව, සිවිල් සමාජය සහ බිම් මට්ටමේ නායකයින් ඇතුළු උනන්දුවක් දක්වන පුළුල් පාර්ශ්ව ගණුනාවක අඛණ්ඩ ව්‍යායාමය සහ සහයෝගය අවශ්‍ය වේ.

ඩයස්පෝරාවේ නියැලීම

1153. යෝජිත සත්‍ය සහ සංහිඳියා කොමිෂන් සභාව සමඟ ඩයස්පෝරාව නියැලෙන්නේ නම් එය රටටත් ජනකොට්ඨාස සුවවීමට යහපත් දෙයක් වනු ඇත.

වින්දිතයින් සිහිපත් කිරීමේ ජාතික දිනයක්

1154. ජාතික අනුස්මරණ දිනයක් යනු රටක ඉතිහාසය තුළ වැදගත් සිදුවීම්, ජනතාව හෝ තේමාවන් අනුස්මරණය කිරීම සඳහා ආණ්ඩුවක් විසින් නම් කර ඇති දිනයකි. එය නිල උත්සව, ආගමික සේවාවන් සහ මහජන ඒකරාශීවීම්වලින් සලකුණු කරනු ලබන අතර කොඩි ප්‍රදර්ශනය කිරීම, මල් මාලා පැළඳවීම සහ බැලූන් හෝ පරවියන් මුදා හැරීම ඇතුළත් විය හැකිය.

1155. වින්දිතයින් සිහිපත් කිරීමේ ජාතික දිනයක අරමුණ වන්නේ පුද්ගල ජීවිත අනවශ්‍ය ලෙස අහිමි වූ මේ ආකාරයේ සිදුවීම් නැවත සිදු නොවීම සහතික කිරීමේ අවශ්‍යතාව පොදු ජනතාවට සිහිපත් කරවීම සහ අපරාධ සහ ගැටුම් නැවත සිදු නොවීම සඳහා මහජන ප්‍රකාශනය දිරිමත් කරවීමට මෙන්ම ආරාවුල් නිරවුල් කිරීම සඳහා සාමකාමී ක්‍රමවේදවලට යොමුවීමේ අවශ්‍යතාව වෙනුවෙනි.

1156. අපි මෙයට පෙර කොමිෂන් සභා නිර්දේශ හා එකඟ වන බවට ප්‍රකාශ කරන්නට කැමැත්තෙමු. විමර්ශන සහ නඩු පැවරීම් සිදු කළ යුතු බවට ඔවුන්ගේ නිගමනවලට අප සහයෝගය දක්වන්නෙමු. එසේ කිරීමට අපොහොසත්වීමෙන් දණ්ඩමුක්තිය ප්‍රවර්ධනය කරන අතර එය අරාජකත්වයට මාර්ගයක් වනු ඇත. UC,

උගත් පාඩම් සහ ප්‍රතිසන්ධාන කොමිෂන් සභාව, සහ PC නිර්දේශ පමණක් නොව ඒවාට පෙර පත් කළ කොමිෂන් සභාවල නිර්දේශ රාශියක් ක්‍රියාත්මක කිරීමට නොහැකිවීම සම්බන්ධයෙන් අපි අපගේ කණගාටුව සටහන් කරමු. අපි පළමු බාධකයේදීම අපොහොසත් වී ඇත. සම්පූර්ණ වගවීමක් සඳහා අපට දේශපාලන අධිෂ්ඨානය හෝ මහජන සහයෝගය තිබී නොමැති බවට පැහැදිලි වේ. TRC සඳහා නිර්දේශ කිරීම සහ සියලුම කෲරත්වයන් සඳහා පූර්ණ වගවීම ඇති කිරීම සඳහා පරිසරයක් නිර්මාණය කිරීමට දේශපාලන අධිෂ්ඨානය නිර්මාණය කරන සහ මහජන සහයෝගය ගොඩනැඟීම ඇතුළත් අපගේ සියලුම නිර්දේශ සම්පූර්ණයෙන්ම ක්‍රියාත්මක කළ යුතු බවට අපි යෝජනා කරන්නෙමු.

1157. යුක්තිය පසඳලීමට ඇති ප්‍රමාදය සැබවින්ම යුක්තිය අහිමි කිරීමකි. නමුත් තවදුරටත් සිදු වන ප්‍රමාදය සත්‍ය සොයන තැනැත්තන් සඳහා විශාල වේදනාවක් සහ ආපදාවක් වනු ඇත. නිර්දේශ වහාම සහ සම්පූර්ණයෙන් ක්‍රියාත්මක කිරීමෙන් සත්‍ය සොයන තැනැත්තන්ගේ වේදනාව අඩු වීමක් හෝ ඔවුන්ගේ කදුළු පිසදැමීමක් සිදු නොවනු ඇත. එය සත්‍ය, වන්දි, ප්‍රතිසංස්ථාපනය, සංහිදියාව සහ නැවත සිදු නොවීම මාර්ගයට අවතීර්ණවීමක් වන අතර සියලුම අනාගත කෲරත්වයන් සම්පූර්ණයෙන්ම විමර්ශණය කරනු ලැබීමට උපකාර වනු ඇත.

1158. ප්‍රායෝගිකවාදය නුවණට හුරු නොවන අතර අප විසින් යෝජනා කළ පරිදි සංකේතාත්මක සිදුවීම් ඇතුළුව සිදුවීම් විමර්ශනය කිරීමට ප්‍රමුඛතාව දීමෙන් සත්‍ය මතුකර ගැනීමට සහ යුක්තිය ඉටු කිරීමට ඇති කැපවීම සහතික කිරීමට උපකාර විය යුතුය. මාටින් ලූතර් කින් වරක් පැවසුයේ;

“ඕනෑම තැනක ඇති අයුක්තියක්, සෑම තැනකම යුක්තියට තර්ජනයකි.”

අපි ඉරණම නම් තනි ආණ්ඩුවක උත්සාහ කරන ලද, නොවැළැක්විය හැකි අන්‍යෝන්‍ය ජාලයකට හසු වී සිටිමු. කෙනෙක්ට සෘජුවම බලපාන දෙයක්, සියලුම දෙනාට වක්‍රව බලපායි.

ඇමුණුම 1: ජනාධිපති විමර්ශන කොමිෂන් සභාව ඉදිරියේ සාක්ෂි දුන් සාක්ෂිකරුවන්ගේ ලැයිස්තුව

කොළඹ දී සාක්ෂි දුන් සාක්ෂිකරුවන්

මුළු සාක්ෂි ගණන 39

1.	ගරු අජිත් නවාඩ් කබ්රාල්, හිටපු මුදල් හා මූල්‍ය වෙළඳපොළ සහ රාජ්‍ය ව්‍යවසාය ප්‍රතිසංස්කරණ රාජ්‍ය අමාත්‍යවරයා, ශ්‍රී ලංකා මහ බැංකුවේ 12 වැනි සහ 16 වැනි අධිපති.	-	2021 අප්‍රේල් 22
2.	මහාචාර්ය ප්‍රතිභා මහානාමහේවා, ශ්‍රී ලංකා ශ්‍රේෂ්ඨාධිකරණ නීතිඥ, ජ්‍යෝෂ්ඨ කථිකාචාර්ය, නීති පීඨය, කොළඹ විශ්වවිද්‍යාලය, හිටපු ශ්‍රී ලංකා මානව අයිතිවාසිකම් කොමසාරිස්, නියෝජිත/ ජිනීවා හි එක්සත් ජාතීන්ගේ මානව අයිතිවාසිකම් කවුන්සිලයේ (එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කවුන්සිලය) 39 වැනි සැසියේ ලෝක ශ්‍රී ලාංකික සංගමය	-	2021 අප්‍රේල් 30 2021 ජුලි 16
3.	මැක්ස්වෙල් පරණගම මහතා, හිටපු මහාධිකරණ විනිසුරු සහ උගත් පාඩම් සහ සංහිදියාව කොමිෂන් සභාවේ (උගත් පාඩම් සහ ප්‍රතිසන්ධාන කොමිෂන් සභාව) සාමාජිකයෙකි, අතුරුදහන් වූ තැනැත්තන් සහ යුධ අපරාධ පිළිබඳ පැමිණිලි විමර්ශනය සඳහා වූ ජනාධිපති කොමිෂන් සභාවේ (පමණගම කොමිෂන් සභාවේ) සභාපති	-	2021 මැයි 13
4.	ආචාර්ය පාක්කියසෝති සරවනමුත්තු, විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයේ (CPA) ආරම්භක විධායක අධ්‍යක්ෂ, විදේශ ප්‍රතිපත්ති උපදේශන කණ්ඩායමේ සහ අන්තර්ජාතික සහ ක්‍රමෝපායන අධ්‍යයන සඳහා වූ ලක්ෂ්මන් කදිරගාමර් ආයතනයේ මණ්ඩලයේ සාමාජිකයෙකි.	-	2021 ජුලි 14
5.	රෝහිත බෝගොල්ලාගම මහතා, නීතිඥ, නැඟෙනහිර පළාතේ හිටපු ආණ්ඩුකාර, හිටපු විදේශ කටයුතු අමාත්‍යවරයා.	-	2021 ජුලි 26 2021 අගෝස්තු 06 2021 නොවැම්බර් 23
6.	ආචාර්ය ජෙහින් පෙරේරා, ශ්‍රී ලංකා සාම කවුන්සිලයේ විධායක අධ්‍යක්ෂ	-	2021 ජුලි 27 2022 ඔක්තෝබර් 03
7.	මහාචාර්ය සර්වේස්වරන් අරුලනාන්දන්, නීතිඥ, කොලඹ විශ්වවද්‍යාලයේ නීති පීඨයේ පුද්ලික සහ තුලනාත්මක නීති අධ්‍යයන අංශයේ නීතිය පිළිබඳ මහාචාර්ය	-	2021 අගෝස්තු 04
8.	මහාචාර්ය ටී. ජයසිංහම්, නීතිඥ, අධ්‍යක්ෂ, ජාතික සාම කවුන්සිලය, නැඟෙනහිර විශ්වවිද්‍යාලයේ හිටපු උපකුලපති, නැඟෙනහිර පළාත් සභාව සඳහා වූ රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ හිටපු සාමාජික.	-	2021 ඔක්තෝබර් 13
9.	ආචාර්ය ජෝ විලියම්, ශ්‍රී ලංකා ජාතික සාම කවුන්සිලයේ ආරම්භක සාමාජික සහ සභාපති (NCP) සහ සන්නිවේදන පුහුණු මධ්‍යස්ථානයේ විධායක අධ්‍යක්ෂ, යුක්තිය සඳහා එකමුතුවේ කැඳවුම්කරු.	-	2021 ඔක්තෝබර් 13
10.	විසාකා ධර්මදාස මිය, සාම ක්‍රියාකාරී, යුද්ධයෙන් බලපෑමට ලක් වූ කාන්තාවන් සහ යුද්ධයේ දී අතුරුදහන් වූ සෙබළුන්ගේ දෙමාපියන්ගේ සංවිධානයේ ආරම්භක සාමාජික සහ සභාපති	-	2021 ඔක්තෝබර් 13

11.	හිල්මී අහමඩ් මහතා, ශ්‍රී ලංකා මුස්ලිම් කවුන්සිලයේ (MCSL) උප සභාපති.		2021 ඔක්තෝබර් 13
12.	බිෂොප් ආසිරි පෙරේරා, හිටපු සභාපති, ශ්‍රී ලංකා මෙතෝදිස්ත දේවස්ථානය		2021 ඔක්තෝබර් 13
13.	එච්. එම්. ජී. එස්. පලිහක්කාර මහතා, හිටපු විදේශ අමාත්‍යාංශ ලේකම් (2006) සහ නිව්යෝක් හි ශ්‍රී ලංකා නිත්‍ය නියෝජිත (2008-2009) සහ ජිනීවා හි එක්සත් ජාතීන්ගේ සංවිධානයේ ශ්‍රී ලංකා නිත්‍ය නියෝජිත (1997-2000)		2021 ඔක්තෝබර් 27
14.	ගරු ආචාර්ය ඒ. වේලුසාමි රාධාක්‍රිෂ්ණන්, පා.ම. උඩරට ජනතා පෙරමුණේ නායක (UCPF), දෙමළ ප්‍රගතශීලී සන්ධානයේ (TPA) සාමාජික සහ යහ පාලනය සඳහා එක්සත් ජාතික පෙරමුණේ සාමාජික (UNFGG)		2021 නොවැම්බර් 11
15.	ආචාර්ය සතිෂ්කුමාර් සිවලංගම්, උඩරට ජනතා පෙරමුණේ ජ්‍යෙෂ්ඨ උප සභාපති		2021 නොවැම්බර් 11
16.	රාමක්‍රිෂ්ණන් ප්‍රභාකරන් මහතා		හිටපු සටන්කාමීන්
17.	ෆිල්ක්ස් ඇන්ටන් කොලින් මහතා		2021 නොවැම්බර් 11
18.	සෙල්වනායගම් ආනන්දවර්ණන් (මුල් නම) අරවින්ද මහතා		
19.	ක්‍රිස්ටි සුතර්ෂන් මහතා		
20.	ෆ්‍රැන්සිස් රෙජීස් මහතා		
21.	බාපු කජෙන්තිනී මිය		
22.	නේස්බි සාමිවරයා PC - බ්‍රිතාන්‍ය දේශපාලනඥ		2021 නොවැම්බර් 12
23.	මහාචාර්ය වසන්ත සෙනෙවිරත්න, කොළඹ විශ්වවිද්‍යාලයේ නීති පීඨයේ මහජන සහ අන්තර්ජාතික නීතිය අධ්‍යයන අංශයේ ප්‍රධානී සහ මහජන සහ අන්තර්ජාතික නීතිය අධ්‍යයන අංශයේ මහාචාර්ය		2021 නොවැම්බර් 19
24.	රජීව විජේසිංහ මහතා, හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රී, ශ්‍රී ලංකා ආණ්ඩුවේ හිටපු මහ ලේකම් සහ ආපදා කළමනාකරණය සහ මානව අයිතිවාසිකම් පිළිබඳ අමාත්‍යාංශයේ හිටපු ලේකම්		2021 දෙසැම්බර් 03
25.	ධාරා විජේතිලක මිය, සභාපති, වන්දි සඳහා කාර්යාලය		2021 ජනවාරි 05
26.	වීරසිංහම් ආනන්දසංගරී මහතා, හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රී සහ දෙමළ එක්සත් නිදහස් සන්ධානයේ නායක		2021 දෙසැම්බර් 24
27.	එස්. බී. දිවාරත්න මහතා, විශ්‍රාමික මහා භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම්, සාමාජික, මැතිවරණ කොමිෂන් සභාව, සභාපති, දරිද්‍රතාව තුරන්කිරීම සහ ජීවනෝපාය සංවර්ධනය සඳහා වූ අධි බලැති කාර්යසාධනය		2021 දෙසැම්බර් 28
28.	දීප්ති ලමාහේවා මහතා, අධ්‍යක්ෂ ජනරාල්, ජාතික එකමුතුව සහ සංහිදියාව සඳහා කාර්යාලය		2022 පෙබරවාරි 01
29.	මහේෂ් කටුලන්ද මහතා, සභාපති, අතුරුදහන් වුවන් පිළිබඳ කාර්යාලය		2022 පෙබරාවරි 28

30.	ගරු මනෝ ගනේසන්, පාර්ලිමේන්තු මන්ත්‍රී		2022 මැයි 31
31.	කේ. කේ. විජයානන්ද මහතා, එක්සත් රාජධානියේ පුරවැසියෙකි		2022 ජුනි 09
32.	පූජ්‍ය ගල්කන්දේ ධම්මානන්ද හිමි, බෞද්ධ අධ්‍යාපනය පිළිබඳ වල්පොල රාහුල ආයතනයේ ප්‍රධානී		2022 ජුනි 17
33.	නෙවිල් ලද්දුවහෙට්ටි මහතා, ස්වාධීන දේශපාලන විචාරක		2022 ජුනි 29
34.	ගරු ඩග්ලස් දේවානන්ද පාර්ලිමේන්තු මන්ත්‍රී		2022 අගෝස්තු 26
35.	අති ගරු එස්. ඊ. ෂෝක් මහතා, අති ගරු මහ කොමසාරිස්, දකුණු අප්‍රිකානු මහ ලේකම් කාර්යාලය, කොළඹ		2022 ඔක්තෝබර් 12
36.	ඔස්ටින් ප්‍රනාන්දු මහතා, අති ගරු ජනාධිපතිතුමාගේ හිටපු ලේකම්		2022 ඔක්තෝබර් 14 2022 නොවැම්බර් 08
37.	ගරු ජීවන් තියාගරාජා ආණ්ඩුකාරවරයා, උතුරු පළාත		2022 නොවැම්බර් 11
38.	අති ගරු ලාස් බ්‍රේඩල්, දූත පිරිසේ නියෝජ්‍ය ප්‍රධානී, දූත පිරිසේ සහ යුරෝපා සංගම් දූත පිරිසේ නියෝජ්‍ය ප්‍රධානී		2022 නොවැම්බර් 17
39.	චන්දිම වික්‍රමසිංහ මිය, අති ගරු ජනාධිපතිතුමාගේ අතිරේක ලේකම්		2022 නොවැම්බර් 18

කොළඹ දී සාක්ෂි දුන් සාක්ෂිකරුවන්

මුළු සාක්ෂි ගණන 45

1.	මොහොමඩ් නිෆාහිර් මහතා
2.	ෂරාෆුල්නන් මහතා
3.	එන්. එම්. අබ්දුල්ලා මහතා
4.	ජයමාරි වික්ටෝරියා මිය
5.	වී. මාරි ලොසාරියා මිය
6.	වී. පුෂ්පකුමාරි මිය
7.	තංගවඩිවේලු විජයකුමාර් මහතා
8.	පරමේෂ්වරන් ජයරානී මිය
9.	රංගනාදන් විසලස්මි මිය
10.	වල්ලිපුරම් තිලකමලර් මිය
11.	තිවියා මහේන්ද්‍රන් මිය
12.	අනුෂියා චන්ද්‍රකුමාර් මිය
13.	විග්නේෂ්වරන් අනුෂියා මිය

14.	රත්නසිංහම් කමලම්බිහායි මිය
15.	ජෙයබාලන් සර්වලිංගේස්වරී මිය
16.	වල්ලිපුරම් මහලිංගම්
17.	ජෙගනාතන් ලලිතානිදි මිය
18.	වී. එස්. ජේසුරත්නම් මහතා
19.	වල්ලිපුරම් රාධක්‍රිෂ්ණන් මහතා
20.	චන්ද්‍රකුමාර් සරෝජිනී මිය
21.	රජ්කුමාර් මේරි දෙවොල්තා මිය
22.	ටී. සරෝෂා මිය
23.	ප්‍රියදර්ශන පෙරේරා ජෙයරානී මිය
24.	කෝනේෂ්වරලිංගම් වරදලක්ෂ්මි මිය
25.	කනගරාසා සුකුණාවතී මිය
26.	ජගතීස්වරන් තවමනි මිය
27.	ජෝගනාදන් ජයසීලී මලර් මිය
28.	සුරේෂ් උදයකුමාර් මිය
29.	උදයකුමාර් රාහුමත්බිබි මිය
30.	ජේසුදාසන් රෙජිනා මිය
31.	කනගයියා ජයතීස්වරී මිය
32.	චන්ද්‍රකුමාර් ඊස්වරී මිය
33.	නඩේසන් චන්ද්‍රෙල්ඛා මිය
34.	අරුද්කුමාර් සිවාජිනී මිය
35.	කනගරත්නම් පරමේස්වරී මිය
36.	තර්මසිරි කලයිවෙල්වි මිය
37.	ජේසුතාසන් මේරි වික්ලෝරියා මිය
38.	උදයසෙල්වම් මේරි රෝස් මිය
39.	ඇන්තනී ෆ්‍රැන්සිස් නිලානි මිය
40.	ප්‍රබාහරන් තයලිනි මිය
41.	අමිර්තලින්ගම් ජයරානී මිය
42.	සෙල්වරාජා වසන්තකුමාර් මහතා
43.	අරුල්නායගම් හොමාස් හෙලෙන් මිය

44.	ශෂිකරන් කවන්තිනි මිය
45.	පද්මශ්‍රීදරන් දමයන්ති මිය

කිළිනොච්චියේ දී සාක්ෂි දුන් සාක්ෂිකරුවන් - 2021 දෙසැම්බර් 13

මුළු සාක්ෂි ගණන 31

1.	කවුප්පන්නන් සුප්පයියා මහතා
2.	අමරසිංහම් රංජිනී මිය
3.	මනෝහරන් අන්නපූරනී මිය
4.	සින්නයියා නාගේස්වරී මිය
5.	ෂම්මුගවේල් සුහාෂිනී මිය
6.	ප්‍රේම්නාත් සහායා ෂර්මිලා මිය
7.	සහයනාදන් තෙරෙස්සම්මා මිය
8.	ෆ්‍රැන්සිස් සූසයියම්මා මිය
9.	බී. වික්ටෝරියා කොස්තා මිය
10.	ඒ. නාල්ලම්මා මිය
11.	ජයරාජා මේරි තෙරේස් කුන්යා මිය
12.	මැටිල්ඩා රෝසරි කුන්යා මිය
13.	සුවයිෂි පුෂ්පලතා කෘෂ්ණ මිය
14.	සිසිලියම්මා කුන්යායි මිය
15.	එම්. ජෙනිවි දලිමා මිය
16.	වින්සෙන්ට් සහායරානී මධුෂි මිය
17.	පී. එමිලියාස් මිය
18.	පැමිලා රොස් පුස්පා මිය
19.	එම්. පාපු සෙබස්තියනාම්මා මිය
20.	ස්ටීවන් සප්පයා මිය
21.	ෆ්‍රැන්සිස් රෙමන්ඩ් මාරියා පියුලා මිය
22.	විමලදාසන් ජයර්මා ඩයස් මිය
23.	ඒ. ජුඩිත් මාරියන් හරෙතානි මිය
24.	කේ. මනොන්මානි මිය
25.	සන්තාන් සිල්වා මිය

26.	සීනිවාසම් රංජිතම් මිය
27.	යෝගරාජා මාරිඅම්මා කෘෂ්ණස් මිය
28.	තලිසියාස් අනිලා ලැම්බර්ට් මිය
29.	කමලමතී ධර්මලිංගම් මිය
30.	ජී. සප්ත සංගරී මහතා
31.	ඩී. අරුද්වෙල්වම් මහතා, සාම විනිසුරු

මඩකලපුව, කාන්තන්කුඩි හි දී සාක්ෂි දුන් සාක්ෂිකරුවන් -

2022 ඔක්තෝබර් 22 සහ 23

මුළු සාක්ෂි ගණන 141

1.	එම්. එල්. එම්. නිසාර් මහතා
2.	කේ. එම්. මින්හාජ් මහතා
3.	මොහොමඩ් අක්මල් මහතා
4.	එම්. ඒ. අයි. අබිතා මිය
5.	උඩියුමාල් ලෙබ්බේ කතීජා උම්මා මිය
6.	ඒ. එල්. එම් එස්. මර්ලියා මිය
7.	කේ. එම්. එල්නා උම්මා මිය
8.	එම්. එම්. සවුමියා මිය
9.	කලන්තර් ඉසඩීන් මහතා
10.	ෆරීඩා බිබි මිය
11.	සුලයිමා ලෙබ්බේ සුමම්බු මිය
12.	ඉස්මයිල් ලයිලතුම්මා මිය
13.	උසනාර් අලි උඩුමල් ලෙබ්බේ මිය
14.	මොහොමඩ් අලියාර් සේදුන් බිබී මිය
15.	මොහමෙඩ් ඉස්මයිල් කතීජා බිබී මිය
16.	එච්. එම්. අජ්මීර් මහතා
17.	එම්. මොහොමඩ් ලෙබ්බේ මහතා
18.	එම්. අයි. සිති ෆරීඩා උම්මා මිය
19.	ඉබ්‍රාහිම් මර්ලියා මිය
20.	මීරා සයිබු පාතිමා බිබි මිය
21.	රහුමත් උම්මා මිය

22.	මොහොමඩ් මාසිම් සාජියා මහතා
23.	මොහොමඩ් කාසිම් හවුවාඋම්මා මිය
24.	අබ්දුල් මජීඩ් සිති රෆිකා මිය
25.	කාවි මොහොමඩ් හයාත් කලන්තර් මිය
26.	ඇඩම් ලෙබ්බේ ආලිමා බීබී මිය
27.	උතුමල් ලෙබ්බේ සිති ෆහීරා මිය
28.	මීරා සහීබ් වාතුරු නිෂා මිය
29.	මොහොමඩ් හනීෆා රබීතේ බීබී මිය
30.	මොහොමඩ් හනීෆා අබ්දුල් මජීඩ් මහතා
31.	ඇඩම් ලෙබ්බේ ජෙරීනා මිය
32.	මොහමෙඩ් පාසි සතකතුල්ලා මහතා
33.	අහමඩ් ලෙබ්බේ හමීතා බීබී මහත්මිය
34.	අබුබකර් උම්මු හලීමා මිය
35.	මුස්තාෆා අව්වාපිල්ලේ මිය
36.	කාසි මුතු ෂබ්ඩීන් මහතා
37.	පල්ලිතම්බි සල්මා බීබී මිය
38.	මොහමඩ් අමනුල්ලා පාතුම්මා නුස්රත් මිය
39.	මොහමෙඩ් තම්බි සල්මා බීබී මිය
40.	සේකු මුහයිදීන් සිත්ති බීබී මිය
41.	මීරා ලෙබ්බේ මාරියම්බු මිය
42.	සෙයේඩ් අහමඩ් රුකුකයා බීබී මිය
43.	අබුදුල් ලතීෆ් අම්ජත් මහතා
44.	අහමඩ් ලෙබ්බේ සිතිමර්ජා මිය
45.	කාදර් ඊබ්‍රහිම් අබ්දුල් අසාන් මහතා
46.	අබ්දුල් අසීස් නූරුල් මර්සූනි මිය
47.	සරිෆ්ඩීන් සිත්ති ෆයිසා මිය
48.	කාවි මොහොමඩ් සිති ෆවුසියා මිය
49.	අදාම් ලෙබ්බේ සිති සරීනා මිය
50.	මොහොමඩ් මුස්තාෆා මොහොමඩ් සිති කතීජා මිය
51.	මොහොමඩ් මුස්තාෆා පතුමුතු මිය

52.	මොහොමඩ් අබ්දුල් කාදර් අයිෂා බිබි මිය
53.	මොහොමඩ් ඉස්මයිල් මොහොමඩ් අෂ්රෆ් මහතා
54.	කාවි මොහොමඩ් සවාරි වනාච්චි මිය
55.	මොහොමඩ් සම්සුදීන් මොහොමඩ් පාතුම්මා මිය
56.	එම්. එම්. සාජහන් මහතා
57.	සම්සුදීන් රසීනා මිය
58.	අලියර් සුහාරා උම්මා මිය
59.	සින්නමරික්කාර් රහූමා බිබි මිය
60.	අහමඩ් ලෙබ්බේ හලීමා බිබි මිය
61.	යූසුෆ් ලෙබ්බේ මාරියම් බිබි මිය
62.	කච්චිමොහොමඩ් උම්මු සල්මා මිය
63.	අබ්දුල් රසූර් පාතිමා තූෆා මිය
64.	අසානාර් රහුමුතුම්මා මිය
65.	මොහොමඩ් මුස්තාෆා උම්මු නජීමා මිය
66.	අහමඩ් ලෙබ්බේ අබ්දුල් රහුමාන් මහතා
67.	කලන්තර් ලෙබ්බේ හිතායා මිය
68.	පකීර්තම්බි අව්වා උම්මා මිය
69.	උමාර් ලෙබ්බේ සෙයිතූන් මිය
70.	කයාතු මොහොමඩ් ෆවුසුල් හිනායා උම්මා මිය
71.	කයාතු මොහොමඩ් මවුෆිකා මිය
72.	සහබ්දීන් ෆවුසුල් හිතායා මිය
73.	එම්. අයි. අමිනා උම්මා මිය
74.	අයිනුල්රියානා මොහොමඩ් මොහිදීන් මිය
75.	මොහොමඩ් ඊබ්‍රාහිම් කසාරා උම්මා මිය
76.	මොහොමඩ් කාසිම් මන්සූර් මහතා
77.	අදාම් ලෙබ්බේ මොහොමඩ් ෆරීඩා මිය
78.	රාජන් තේවකි මිය
79.	තත්පරමූර්ති ප්‍රවීනා මිය
80.	කන්දප්පර් පාකියම් මිය
81.	පෝකවති සේල්වරත්නම් මිය

82.	යෝගරාසා ජිනදාස් මිය
83.	කුමාරමුතු කුනරාසි මිය
84.	වසන්තමෝහන් ශාන්තරූබී මිය
85.	වෙල්මුරුගු විජයරානී මිය
86.	නාගරාසා තේවිකා මිය
87.	කමලදේවි කීතපොන්කලන් මිය
88.	රාජකුමාර් කුනරාජා මහතා
89.	යෝගේන්ද්‍රන් යෝගේෂ්වරී මිය
90.	මොහොමඩ් ලේබ්බේ ඉක්බාල් මහතා
91.	කච්චි මොහොමඩ් අබ්දුල් මජීඩ් මහතා
92.	තුවාන් තසීම් තුවාන් කිච්චිල් මහතා
93.	මොහොමඩ් අබ්දුල් රෂීඩ් අමනුල්ලා මහතා
94.	අබූබකර් හයාරුල් ෆයේෂා මිය
95.	අබ්දුල් කාදර් පූඋම්මා මිය
96.	හයාතු මොහොමඩ් නවාසියා මිය
97.	එම්. ඊබ්‍රාහිම් රසානා මිය
98.	කලන්තර් ලෙබ්බේ සුහාරා උම්මා මිය
99.	ඒ. එල්. සෆූරා උම්මා මිය
100.	හයාතු මොහොමඩ් සිත්ති ෆවුසියා මිය
101.	හයාතු මොහොමෙතු මොහොමඩ් රිස්මි මහතා
102.	මොහොමතු ලෙබ්බේ සිති ලතීෆා මිය
103.	මොහොමතු ඊබ්‍රාහීම් රහුමුතුම්මා මිය
104.	නහජ්දීන් මිය
105.	මුස්තාෆා ලෙබ්බේ ආසියා උම්මා මිය (ඒ. එස්. එම්. වසීම් සයීර් මහතා)
106.	රවියා උම්මා මිය
107.	අබ්දුල් මජීඩ් සල්මා බිබි මිය
108.	අහමඩ් මීර්සයිබු උම්මා මිය
109.	පකීර් මොහොමඩ් කතීජා උම්මා මිය
110.	මොහොමඩ් මුස්තාෆා උම්මුකුල්තූ මිය
111.	හයාතු කලතාර් සල්හා බිබි මිය

112.	මොහොමඩ් හුසේන් සිත්ති සරීනා මිය
113.	මුස්තාෆා ලෙබ්බේ සෙයිනම්බු මිය
114.	අහමතු ලෙබ්බේ සිතු පාතුම්මා මිය
115.	මොහොමඩ් මොහයිදීන් පාතුම්මා මිය
116.	මොහොමඩ් කාසිම් තජීන් බිබි මිය
117.	සෙයේද් බුහාරි සිත්ති නසීලා මිය
118.	අබූබකර් මොහොමඩ් ෆායිස් මහතා
119.	උමාර් ලෙබ්බේ මොහොමඩ් ජබීර් මහතා
120.	නගූර් ලෙබ්බේ හයාතු බිබි මිය
121.	අලි උදය සූරතුම්මා මිය
122.	සීනි මොහොමඩ් ලත්ෆුනීෂා මිය
123.	අබ්දුල් මජීඩ් අල්ෆා මිය
124.	මීරා සයිබෝ මොහොමඩ් ජවුෆාර් මහතා
125.	කච්චිමුතු නවාස් මහතා
126.	අබ්දුල් කාදර් සෙයිතුන් උම්මා මිය
127.	ජමාල්ඩීන් පාතිමා රිෆ්කා මිය
128.	මොහොමඩ් සරීෆු සිති රෆීකා මිය
129.	ලතීෆ් ජුනයිඩීන් මහතා
130.	මොහොමඩ් හුසේන් ආදම් අලි මහතා
131.	ආදම්ලෙබ්බෙකිතුර් උම්මා මිය
132.	වෙල්ලතම්බි මොහොමඩ් අසනාර් මිය
133.	නූර් මොහොමඩ් සැම්සුල් නිසා මිය
134.	නූර් මොහොමඩ් කුතුෆුනීෂා මිය
135.	මොහොමඩ් හනීෆා ජමීසා මිය
136.	ඒ. එල්. ෂරීෆා උම්මා මිය
137.	කේ. එම්. හමීදා බිබි මිය
138.	මොහොමඩ් මීරසිහිබු ෆරීඩා බිබි මිය
139.	මීරා සයිබු ෆරීඩා උම්මා මිය
140.	නායතු මොහොමඩ් ආසියා උම්මා මිය
141.	මොහොමඩ් කාසීම් අහමඩ් රිස්බි මහතා

ඇමුණුම 2 - උගත් පාඩම් සහ ප්‍රතිසන්ධාන කොමිෂන් සභාවේ වාර්තාවේ සාරාංශය

පරිච්ඡේද

2 වැනි පරිච්ඡේදය - සටන් විරාම ගිවිසුම

3 වැනි පරිච්ඡේදය - ආරක්ෂක අංශ මෙහෙයුම් පිළිබඳ දළ විශ්ලේෂණය

5 වැනි පරිච්ඡේදය - මානව අයිතිවාසිකම්

8 වැනි පරිච්ඡේදය - සංහිඳියාව

9 වැනි පරිච්ඡේදය - නිරීක්ෂණ සහ නිර්දේශ

පරිච්ඡේදයේ නම	සාරාංශය
2 වැනි පරිච්ඡේදය - සටන් විරාම ගිවිසුම	• වාර්ගික යුද්ධයට මඟපාදන ලද සාධක පිළිබඳව නියෝජනය කිරීම් සිදු කළේය. වෙනස්කොට සැලකීම, අධ්‍යාපනය ප්‍රමිතකරණය, භාෂා ප්‍රතිපත්තිය, උතුර/ නැඟෙනහිර සඳහා දේශපාලන ස්වාධීනත්වය අඩුවීම, වඩුක්කොඩේ විසඳුමට මඟපාදන ලද බණ්ඩාරනායක-චෙල්වනායගම් ගිවිසුම අසාර්ථකවීම ආදිය (2.3 - පිටුව 12) • ඓතිහාසිකව සුළු ජන පක්ෂ ඔවුන්ට ලැබුනු ඉඩප්‍රස්ථාවලින් ප්‍රයෝජනය ගැනීමට අපොහොසත් විය. ගැටළු විසඳීමට ගත් බොහොමයක් ව්‍යායාම අසාර්ථක විය. (2.4 - පිටුව 12) • CFA ගිවිසුම හවුල් ආණ්ඩුවක් පැවති පසුබිමක හඳුන්වා දුන් අතර එමඟින් ව්‍යුහය සහ ක්‍රියාකාරිත්වය සංකීර්ණ විය. (2.7 - පිටුව 14) • නෝර්වීජියානු පහසුකම් සපයන්නන් ශ්‍රී ලංකාවට පැමිණෙන විට ඔවුන්ට පළමුවෙන්ම ඇන්ටන් බාලසිංහම් හමු වී, ලේඛනය ඔහුගෙන් අනුමත කරවා ගැනීමට සිදු විය. මෙය බාලසිංහම්ගේ ග්‍රන්ථයේ සහතික කර ඇත. (2.11 - පිටුව 15) • මෙහි ප්‍රතිඵලයක් ලෙස, සටහන් විරාම ගිවිසුමට සැලකිය යුතු ගැටළු විසඳීමට නොහැකි වූ අතර එල්.ටී.ටී.ඊ. සංවිධානයට ආණ්ඩුවේ ප්‍රදේශවල අවසර දුන් අතර ආණ්ඩුවට එල්.ටී.ටී.ඊ. ප්‍රදේශවල වැඩ කිරීම තහනම් කරන ලදී. එමෙන්ම එමඟින් එල්.ටී.ටී.ඊ. සංවිධානය ළමා සෙබළුන් බඳවා ගැනීම ආදිය තහනම් නොකරන ලදී. (2.12 - පිටුව 15) (පසු ඡේදවලින් වැඩිදුර තොරතුරු සපයයි) • CFA ගිවිසුමට මානව අයිතිවාසිකම් අංගයක් ඇතුළත් නොවූ අතර එල්.ටී.ටී.ඊ. සංවිධානය මානව අයිතිවාසිකම් නියමවලින් බැඳීමට නොහැකි විය. මානව අයිතිවාසිකම් පරීක්ෂාවක් සිදු කිරීම සඳහා ජාත්‍යන්තර ක්ෂමා සංවිධානයේ නිර්දේශ ඇන්ටන් බාලසිංහම් විසින් ප්‍රතික්ෂේප කළේය. (2.20 - පිටුව 18) • CFA ගිවිසුම මුස්ලිම් ජනකොටඨාසය සම්බන්ධයෙන් ඍණාත්මක බලපෑමක් සිදු කරන ලදී. විශේෂයෙන්ම 2002 අප්‍රේල් මාසයේ දී මුතූර් හි දී මුස්ලිම් ජනතාවට පහර දෙන විට, ආරක්ෂක අංශ බලා සිටි බවට නිරූපණය කළ මාධ්‍ය ආවරණ සපයන ලදී. CFA ගිවිසුම අනුව පැවති අනුකූලතා හේතුවෙන් ආරක්ෂක අංශවලට කටයුතු කළ නොහැකි වූ බවට තර්ක ඉදිරිපත් විය. (2.21 - පිටුව 18) • සාම පහසුකම් සලසන්නා සහ ශ්‍රී ලංකාවේ අධීක්ෂණ දූත කණ්ඩායමේ (SLMM) ප්‍රධානියා ලෙස නෝර්වේ හි භූමිකාව ගැටුම්කාරී කාර්යයන් ඇති කරන ලදී. එය ඔවුන්ගේ මධ්‍යස්ථභාවයට බලපෑමක් එල්ල කරන ලදී. (2.23- පිටුව 19) **නිරීක්ෂණ** • කොමිෂන් සභාවට රනිල් වික්‍රමසිංහ (හිටපු අගමැති), චන්ද්‍රිකා බණ්ඩාරනායක (හිටපු

	ජනාධිපති) හෝ TNA සංවිධානය හමුවිය නොහැකි විය. සියල්ලන්ට ආරාධනා කළ ද කිසිවෙක් නියෝජනය නොකළේය) (2.32 - පිටුව 22) • ජාතික ගැටළු කෙරෙහි CFA ගිවිසුමේ පක්ෂග්‍රාහී ප්‍රවේශය හේතුවෙන් එය අසාර්ථක විය. (2.34 - පිටුව 22) • යුධ හමුදා ප්‍රධානියා ද වූ චන්ද්‍රිකා ජනාධිපතිනිය CFA ගිවිසුම අධ්‍යයනය කිරීමට කාලය ඉල්ලා සිටිය ද ඒ වන විටත් එය අත්සන් කරන ලදී. (2.36 - පිටුව 23) • හිතකර නොවන දේශපාලන පරිසරය CFA ගිවිසුමේ අසාර්ථකත්වයට මඟපෑදූ බවට වන තර්කය පිළිගැනීම කොමිෂන් සභාව මඟින් ප්‍රතික්ෂේප කරයි. 2.39 - පිටුව 24) • නෝර්වේ මඟින් හඳුන්වා දුන් CFA ගිවිසුම සම්මුති පරීක්ෂණයක් විය. (2.42 - පිටුව 24) • CFA ගිවිසුම මඟින් රට එල්.ටී.ටී.ඊ. පාලන ප්‍රදේශය සහ ආණ්ඩුවේ පාලන ප්‍රදේශය ලෙස බෙදීමක් ඇති කරන ලදී. මෙමඟින් එල්.ටී.ටී.ඊ. සංවිධානයට සාකච්ඡා ක්‍රියාවලිය දිගින් දිගට ඇදගෙන යාමට දිරිමත් කරවන ලදී. (2.49 - පිටුව 27) • පැහැර ගැනීම්, බලහත්කාරයෙන් හමුදා සේවයට බඳවා ගැනීම්, කප්පම් ගැනීම්, ලක්ෂ්මන් කදිරගාමර් ඝාතනය කිරීම, නිරායුධ සෙබළුන් මරා දැමීම, කැබතිගොල්ලෑව සිවිල් වැසියන් සමූහ ඝාතනය සහ යුධ හමුදාපති ඝාතනය කිරීමට තැත් කිරීම වැනි ක්‍රියා හේතුවෙන් එල්.ටී.ටී.ඊ. සංවිධානය CFA ගිවිසුම උල්ලංඝනය කිරීම සඳහා ප්‍රධාන අපරාධකරුවන් විය. එල්.ටී.ටී.ඊ. සංවිධානය එහි හමුදාව ශක්තිමත් කිරීම සඳහා CFA ගිවිසුම භාවිතා කරන ලදී. (2.52 - පිටුව 28) • CFA ගිවිසුම රටේ පොදු පරිසරය වර්ධනය කරවන ලදී. එල්.ටී.ටී.ඊ. සංවිධානයේ හමුදාව ශක්තිමත් කිරීමට ද එය උපකාර විය. (2.54 - පිටුව 29) • ප්‍රභාකරන් වෙනත් එල්.ටී.ටී.ඊ. නායකයින් ඝාතනය කළ අතර විසංවාදය ඇති කරවන ලදී. නැඟෙනහිර සෙබළුන්ට විරුද්ධව සිදු කළ වෙනස්කම් කරුණා සමඟ බෙදීමට මඟපාදන ලදී. මෙම ක්‍රියාවලිය තුළ CFA ගිවිසුම උත්ප්‍රේරකයක් විය. (2.57 - පිටුව 29)
3 වැනි පරිච්ඡේදය - ආරක්ෂක අංශ මෙහෙයුම් පිළිබඳ දළ විශ්ලේෂණය	• 2005 න් පසුව කැබතිගොල්ලාව ඝාතන සහ හමුදා නායකයින් ඝාතනය කිරීම් යුද්ධය ප්‍රකාශ කිරීමේ සලකුණක් විය. (3.3 - පිටුව 29) • ත්‍රීකුණාමලය අවහිර කර මුහුදු මාර්ගය හරහා උතුරට භාණ්ඩ ප්‍රවාහනය කිරීම වැළැක්වීම මේ කාලයේ දී එල්.ටී.ටී.ඊ. සංවිධානයේ ක්‍රියාපිළිවෙල විය. (3.4 - පිටුව 32) **නැඟෙනහිර මෙහෙයුම්** • 2006 ජූලි 21 වැනි දින එල්.ටී.ටී.ඊ. සංවිධානය මාවිල් ආරු ජලාශයේ ජල සැපයුම අවහිර කර, කුඹුරු වගාවට බලපෑම් සිදු කරන ලදී. (3.5 - පිටුව 32) • මාවිල් ආර් පාලනය යළි ලබා ගැනීම නැඟෙනහිර මෙහෙයුමේ පළමු පියවර විය. (3.7 - පිටුව 33) • නැඟෙනහිර මෙහෙයුම් ජූලි 28 වැනි දින දියත් කර, 2007 ජූලි මාසයේ දී මඩකලපුව අල්ලා ගැනීමත් සමඟ අවසන් වූ බවට LLRC ට ඉදිරිපත් කළ ලේඛනවලින් දැක් වේ. (3.9 - පිටුව 33) වන්නි මෙහෙයුම් • වන්නි මෙහෙයුම් 2007 පෙබරවාරිවල දී ආරම්භ විය. කාර්ය බලකාය 1 දියත් කරන ලදී. කාර්ය බලකාය 2, කාර්ය බලකාය 3 සහ කාර්ය බලකාය 4 වවුනියාව උතුර මෙහෙයුම්වලට සහභාගී විය. උතුරේ සිට 53 සහ 55 අංශ මෙහෙයුම් පවත්වන ලදී. (3.13 - පිටුව 34) • ආරක්ෂක අංශ මඟින් 2009 ජනවාරි 09 වැනි දින අලිමංකඩ අල්ලා ගැනීමෙන් පසුව ඒ9 මාර්ගයේ පාලනයට නතු කර ගත්තේය. එල්.ටී.ටී.ඊ. සංවිධානයට ඔවුන්ගේ උපායමාර්ගය වෙනස් කිරීමට සිදු වූ අතර ආරක්ෂක අංශ සිවිල් වැසියන් ආරක්ෂා කිරීම සඳහා 'යුධ මුක්ත කලාප' ප්‍රකාශයට පත් කිරීම ආරම්භ කරන ලදී. (3.17 - පිටුව 36)

	• එල්.ටී.ටී.ඊ. සංවිධානයෙන් එල්ල කළ ප්‍රහාර සහ විශාල සංඛ්‍යාවක ජීවිත අහිමිවීමෙන් පසුව ආරක්ෂක අංශවලට පුදුකුඩියුරුප්පුවලින් පසුබැසීමට සිදු විය. සිවිල් වැසියන් පුදුමාතලන් වෙත රැගෙන යන ලදී. නන්දි කඩාල් කලපුවේ සිට පුදුමාතලන් සහ වෙල්ලමුල්ලිවයික්කාල් හරහා අතර ප්‍රදේශයේ සිවිල් ජනතාව සීමාවූ අතර සිවිල් ජනතාව යුධ කලාපයට ආසන්නයේ සිටි බැවින්, ගුවන් ප්‍රහාර නවතා දමන ලද අතර යුද්ධය සුළු අවිවලට සීමා විය. (3.18 - පිටුව 36) ආරක්ෂක අංශ සහ එල්.ටී.ටී.ඊ. සංවිධානයේ ජීවිත හානි • 2002 ජූලි සිට 2009 මැයි දක්වා ආරක්ෂක අංශවලට යුද්ධයේ දී නිලධාරීන් 5,556 දෙනෙක් අහිමි වී ඇති අතර 28,414 දෙනෙක් තුවාල ලබා, 169 දෙනෙක් අතුරුදහන් වී ඇත. එල්.ටී.ටී.ඊ. සංවිධානයේ සෙබළුන් 22,247 අහිමි වී ඇති අතර ඔවුන්ගෙන් 11,812 දෙනෙක් නම්වලින් හඳුනා ගෙන ඇත. (3.20 - පිටුව 37)
4 වැනි පරිච්ඡේදය - මානවවාදී නීති ගැටළු	• මෙම අවසාන වාර්තාවේ II වැනි කොටසේ 3 වැනි පරිච්ඡේදය බලන්න.
5 වැනි පරිච්ඡේදය - මානව අයිතිවාසිකම්	• කොමිෂන් සභාව සිදු කළ මහජන රැස්වීම්වල දී සහ යුද්ධයෙන් බලපෑමට ලක් වූ ප්‍රදේශවල සිදු කළ ක්ෂේත්‍ර චාරිකාවල දී යුද්ධයෙන් බලපෑමට ලක් වූ ජනතාවගේ මූලික අයිතිවාසිකම් සහ නිදහස උල්ලංඝනය කිරීම් පිළිබඳ කරුණු ඉදිරිපත් කිරීම් රාශියක් සිදු විය. පැහැරගැනීම්, බලහත්කාරයෙන් හෝ අකමැත්තෙන් සිදු කළ අතුරුදහන් කිරීම්, අත්තනෝමතික රඳවා තබා ගැනීම්, බාල වයස්කාර ළමයින් හමුදාවට බඳවා ගැනීම, නීතිවිරෝධී, ලඝු හෝ අත්තනෝමතික ඝාතන, ප්‍රකාශනයේ, යාමේ ඊමේ, සමාගමයේ නිදහස, ආගමික නිදහස, සහ මාධ්‍ය නිදහස උල්ලංඝනය කිරීම මෙයට ඇතුළත් වේ. (5.1 - පිටුව 154) • ශ්‍රී ලංකාව දේශීය ව්‍යවස්ථාකරණය හරහා අපරානුමත කර ඇති පහත දැක්වෙන ප්‍රධාන සම්මුති 7 හි පාර්ශ්වකරුවෙක් වන අතර මෙම සම්මුති LLRC යටතේ සලකා බලන ලදී. 1. සියලුම ආකාරයේ වාර්ගික වෙනස්කොට සැලකීම් මුලිනුපුටා දැමීම පිළිබඳ අන්තර්ජාතික සම්මුතිය 2. සිවිල් සහ දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ අන්තර්ජාතික සම්මුතිය 3. ආර්ථික, සාමාජීය සහ සංස්කෘතික අයිතිවාසිකම් පිළිබඳ අන්තර්ජාතික සම්මුතිය 4. කාන්තාවන්ට එරෙහි සියලුම ආකාරයේ වෙනස්කොට සැලකීම් මුලිනුපුටා දැමීම පිළිබඳ සම්මුතිය 5. වධහිංසාව සහ වෙනත් කෲර, අමානුෂික සහ අවමන් සහගත සැලකීම හෝ දඬුවම්වලට එරෙහි සම්මුතිය 6. ළමා අයිතිවාසිකම් පිළිබඳ සම්මුතිය 7. සියලුම සංක්‍රමණික කම්කරුවන්ගේ සහ ඔවුන්ගේ පවුල්වල සාමාජිකයින්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම පිළිබඳ අන්තර්ජාතික සම්මුතිය (5.2 - පිටුව 154) <u>**යුද්ධයෙන් මතු වන මානව අයිතිවාසිකම් ගැටළු**</u> • එල්.ටී.ටී.ඊ. සංවිධානය සිදු කළ නීතිවිරෝධී මනුෂ්‍ය ඝාතන, පැහැර ගැනීම්, අත්තනෝමතික සිරභාරයට ගැනීම් සහ රඳවා තබා ගැනීම් සහ අතුරුදහන් කිරීම් ඇතුළු මානව අයිතිවාසිකම් උල්ලංඝනය කිරීම් මාලාවක් සම්බන්ධය චෝදනා සහ ආරක්ෂක අංශය සිදු කළ මානව අයිතිවාසිකම් උල්ලංඝනය කිරීම් සම්බන්ධ චෝදනා පිළිබඳ නියෝජනය කිරීම් කොමිෂන් සභාව මඟින් විමසන ලදී. අභ්‍යන්තර වශයෙන් අවතැන් වූ තැනැත්තන් (IDPs) සහ යුද්ධය හේතුවෙන් මානව අයිතිවාසිකම් උල්ලංඝනයවීම්වින් පීඩාවිඳි කාන්තාවන් සහ ළමයින් වැනි වෙනත් අවදානමට ලක් විය හැකි කණ්ඩායම් ද වේ. (5.9 - පිටුව 155)

- රතු කුරුස සංවිධානයේ සහ ICRC සංවිධානයේ සහාය ඇතිව 2003 දී මානව අයිතිවාසිකම් නියම සහ යාන්ත්‍රණ පිළිබඳව අධ්‍යාපනය ලබාදීම සඳහා වැඩසටහනක් ආරම්භ කරන ලදී. (5.10 - පිටුව 156)

<u>අතුරුදහන් වූ තැනැත්තන්, අතුරුදහන් කිරීම් සහ පැහැරගැනීම් පිළිබඳ චෝදනා</u>

- කොමිෂන් සභාව අම්පාරේ සංචාරය කළ විට, මොනරාගල දිස්ත්‍රික්කයේ පුද්ගලයින් ගණනාවක් අතුරුදහන් බවට නියෝජනයක් සිදු කළ ද බිය හේතුවෙන් පැමිණිල්ලක් කිරීම සඳහා කිසිවෙක් ඉදිරිපත් නොවීය. (5.14 - පිටුව 157)
- කොමිෂන් සභාව මඩකලපුවේ සිටින විට, ආරක්ෂක අංශ මඟින් සිදු කළ පැහැරගැනීම් අවම වශයෙන් සිදුවීම් 12ක් පිළිබඳව වාර්තා විය. ඔවුන්ගෙන් ඇතැම් පිරිස ආරක්ෂක අංශ මඟින් අත්අඩංගුවට ගෙන, රැඳවුම් භාරයේ තබා ඇත. පැහැරගත් තැනැත්තන් හඳුනා නොගත් සිදුවීම් 4ක් වාර්තා විය. අභිංසක සිවිල් වැසියන් දහස් ගණනක් අතුරුදහන් වූ බවට මඩකලපුව සාම කමිටුව වාර්තා කළේය. (5.15 - පිටුව 157)
- කොමිෂන් සභාව යාපනයේ සිටින විට, පුද්ගලයින් 9 දෙනෙක් පැහැර ගැනීම පිළිබඳ පැමිණිලි හඳුනා නොගත් පුද්ගලයින් විසින් වාර්තා කළහ. අතුරුදහන් වූ පුද්ගලයින් 12 දෙනෙක් පිළිබඳව ද වාර්තා විය. (5.16 - පිටුව 158)
- 'මේජර් සීලන්' නම් තැනැත්තෙක් 51 වැනි සේනාංකයෙන් පැහැරගත් තැනැත්තන් මුදා හැරීම සඳහා පුද්ගලයින්ගෙන් මුදල් බලයෙන් ලබා ගෙන ඇත. එවැනි නමකින් කිසිවෙක් හඳුනා ගැනීමට නොහැකි වූ බවට 51 වැනි සේනාංකය වාර්තා කළේය. විමර්ශනයක් සිදු කළ අතර මේජර් සීලන්ගේ සගයෙක් අත්අඩංගුවට ගන්නා ලදී. (5.17 - පිටුව 158)
- කොමිෂන් සභාව යාපනයේ සංචාරය කළ විට, භික්ෂුවක් විසින් අතුරුදහන් වූ පුද්ගලයින් 100 දෙනෙකුගේ ලැයිස්තුවක් භාර දුන් අතර සැබෑ සංඛ්‍යාව වැඩි විය හැකි බවට පවසන ලදී. (5.21 - පිටුව 159)
- මඩු හි දී පුද්ගලයින් 13 දෙනෙක් අතුරුදහන් කිරීම පිළිබඳව වාර්තා කරන ලදී. (5.22 - පිටුව 160)
- ත්‍රීකුණාමලයේ දී සිය ආදරණීයයන් අතුරුදහන් වූ බවට පුද්ගලයින් 74 දෙනක් පැමිණිල්ලක් ගොනු කරන ලදී. (5.23 - පිටුව 160)
- මුතූර් හි දී පුද්ගලයින් 17 දෙනෙක් අතුරුදහන් වූ බවට වාර්තා කළ අතර වවුනියාවේ දී පුද්ගලයින් 7 දෙනෙක් අතුරුදහන් වූ බවට වාර්තා විය. (5.34 - පිටුව 160)
- යාපනය, මඩකලපුව සහ මුතූර්වල දී සිදු කළ පැමිණිලිවලින් එල්.ටී.ටී.ඊ. සංවිධානය සිදු කළ පැහැරගැනීම් වාර්තා විය. (5.25 - පිටුව 160)
- යාපනයේ දී සුදු වෑන් පැහැරගැනීම් 6ක් වාර්තා විය. (5.27 - පිටුව 161)
- එල්.ටී.ටී.ඊ. සංවිධානය සිදු කළ අරන්තලාවේ සහ අනුරාධපුරයේ භික්ෂූ සමූල ඝාතනය ඇතුළු භික්ෂූන්ට එරෙහිව සිදු කළ ප්‍රචණ්ඩත්වය පිළිබඳ නියෝජනය කිරීම් කිහිපයක්. (5.28 - පිටුව 161)
- සිය දරුවන් එල්.ටී.ටී.ඊ. සංවිධානයේ සෙබළුන් බවට සහ ඔවුන් අතුරුදහන් වී ඇති බවට දෙමාපියන් වාර්තා කළහ. (5.30 - පිටුව 162)
- පුත්තලමේ සිටි රාසික් පත්තානිගේ සිදුවීම වැනි අතුරුදහන් වූ තැනැත්තන් සම්බන්ධයෙන් තීරණාත්මක නීතිය ක්‍රියාත්මක කිරීමේ ක්‍රියාමාර්ග නොමැතිකම දක්නට ලැබුනි. පැහැරගත් තැනැත්තා දේශපාලන සම්බන්ධතා හේතුවෙන් අත්අඩංගුවට ගැනීමෙන් මහහරින ලදී. (5.31 - පිටුව 162. මෙම කථාව 5.32 හි දී විස්තර කර ඇත)
- දේශපාලන මැදිහත්වීම් පොලිස් පරිපාලනයට අහිතකර ලෙස බලපා ඇත. (5.31 - පිටුව 162)

	• පොලිස් ස්ථානවලට, ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවට සහ ICRC සංවිධානයට විධිමත් පැමිණිලි සිදු කර ඇත. ඇතැම් සිදුවීම්වල දී, මෙයට පෙර පැවති විමර්ශන කොමිෂන් සභාවලට ද ඉදිරිපත් කිරීම් සිදු කර ඇත. එසේවුව ද, අතුරුදහන් වූ තැනැත්තන් සිටින ස්ථාන පිළිබඳව තවමත් නොදන්නා බවට ඔවුන්ගේ සමීප ඥාතීන් පැමිණිලි කරයි. මෙම චෝදනා සම්බන්ධයෙන් නිසි විමර්ශන සිදු කරන බවට සහ අපරාධකරුවන් යුක්තිය ඉදිරියට ගෙන එන බවට සහතික කිරීම සඳහා ඉක්මන් පියවර ගැනීම වෙනුවෙන් නීතිය ක්‍රියාත්මක කරන අධිකාරීන්ට නියෝග කිරීමේ ආණ්ඩුව වගකීමකින් බැඳී සිටී. (5.34 - පිටුව 163) • අතුරුදහන් වූ තැනැත්තන්ගේ ගැටළුව ඕනෑම සහභාගීත්ව සහ සංහිදියාව පිළිබඳ දිගු කාලීන ක්‍රියාවලයකට බාධාවන් ඇති කළ හැකි බැවින් එම ගැටළුව විසඳීම සඳහා වූ විස්තීරණ ප්‍රවේශයක්, හදිසි අවශ්‍යතාවක් ලෙස, ක්‍රියාත්මක කළ යුතුය. (5.36 - පිටුව 163) • අතුරුදහන් වූ තැනැත්තන් සොයා ගැනීම සම්බන්ධයෙන් ICRC සංවිධානය නියැලිය යුතුය. (5.381 - පිටුව 164) • අදාළ වන අන්තර්ජාතික ප්‍රමිති සැලකිල්ලට ගනිමින්, අවශ්‍ය අවස්ථාවල දී, මරණ සහතික නිකුත් කිරීම සහ මූල්‍ය වන්දි ගෙවීම්, ප්‍රමුඛතා කරුණක් ලෙස, සිදු කළ යුතුය. (5.39 - පිටුව 164) • අත්අඩංගුවට ගැනීම් සහ රැඳවුම් භාරයේ තැබීම් සම්බන්ධයෙන් විධිමත් කුවිතාන්සි නිකුත් කළ යුතු බවට සහ රැඳවුම් භාරයේ තැබීම් නෛතිකව පිළිගත් ස්ථානවල පමණක් සිදු කළ යුතු බවට කොමිෂන් සභාව නිර්දේශ කරයි. (5.40 - පිටුව 164) • පොලීසිය අත්අඩංගුවට ගඅනීම්, රැඳවුම් භාරයේ තැබීම් හෝ මාරු කිරීම් වාර්තා නොකරන්නේ නම්, එය සාපරාධී වරදක් වන අතර ඒ සම්බන්ධයෙන් පියවර ගත යුතුය. (5.42 - පිටුව 165) • PTA යටතේ අත්අඩංගුවට ගත් තැනැත්තන්, අත්අඩංගුවට ගත් කාලය අධීක්ෂණය කිරීම සහ පරීක්ෂා කිරීම සඳහා ස්වීධීන උපදේශන කමිටුවක් පත් කළ යුතු බවට LLRC නිර්දේශ කරයි. (5.44 - පිටුව 165) • අතුරුදහන් වූ තැනැත්තන්ගේ පවුල් සඳහා මූල්‍යමය සහයෝගය ලබා දිය යුතුය. (5.45 - පිටුව 166) • බලහත්කාරයෙන් සිදු කරන අතුරුදහන් කිරීම් සාපරාධී අපරාධයක් බවට පත් කළ යුතුය. (5.46 - පිටුව 166) • පාසැල් දරුවන්, තරුණ ප්‍රජාව, ආරක්ෂක අංශ සාමාජිකයින් සහ පොලීසිය ඉලක්ක කර ගත් දීප ව්‍යාප්ත සහ විස්තීරණ මානව අයිතිවාසිකම් පිළිබඳ අධ්‍යාපන වැඩසටහන් නිර්දේශ කරයි. (5.47 - පිටුව 166) • චෝදනා කරනු ලබන අතුරුදහන් කිරීම් පිළිබඳව විමර්ශනය කිරීම සහ යෝග්‍ය පරිදි අපරාධ අධිකරණ නඩු කටයුතු ආරම්භ කිරීම සඳහා නීතිපතිට කරුණු සැපයීම පිණිස විශේෂ විමර්ශන කොමසාරිස්වරයෙක් පත් කළ යුතු බවට කොමිෂන් සභාව මඟින් නිර්දේශ කරයි. (5.48 - පිටුව 166) • හිටපු එල්.ටී.ටී.ඊ. සටන්කරුවන් 11,954 දෙනෙක් පුනරුත්ථාපනයට භාජනය වෙමින් සිටී බවට කොමිෂන් සභාව අවබෝධ කර ගනී. පුනරුත්ථාපන මධ්‍යස්ථානවල සංචාරය කළ අතර සෑහීමකට පත් වෙයි. (5.49 - පිටුව 166. 5.50 දක්වා ඇත.) • ළමා සොල්දාදුවන්ගේ පාපොච්චාරණ (5.52 – 5.54 - පිටුව 167) • පහත දැක්වෙන කරුණු ඉලක්ක කර ගත් කරුණු ඉදිරිපත් කිරීම් අ. රැඳවියන් රඳවා සිටින ස්ථාන, විශේෂයෙන්ම ස්වේච්ඡාවෙන් යටත් වූ තැනැත්තන් ආ. නිශ්චිත තොරතුරු ලබා ගැනීමේ දුෂ්කරතාව

	ඇ. තරුණ රැඳවියන්ගේ විධිමත් අධ්‍යාපනය සම්පූර්ණ කිරීම සඳහා වන විශේෂ අවශ්‍යතාවන් ඈ. රැඳවුම් භාරයේ සිටින පවුල්වල දිවි පෙවෙත රකින්නන් ඉ. විමර්ශන සහ නෛතික ක්‍රියාවලි ඉක්මන් කරවීමේ අවශ්‍යතාව (5.55 - පිටුව 170) • විමර්ශන සහ නෛතික ක්‍රියාවලි ඉක්මන් කරවීමේ අවශ්‍යතාව (5.57 - පිටුව 171) • සියලුම අන්තර්කාලීන නිර්දේශ සම්පූර්ණයෙන්ම ක්‍රියාත්මක කිරීම සහතික කිරීම සඳහා අදාළ බලධාරීන්ට නියෝග කිරීමට ආඥාවට බල කිරීම (5.581 - පිටුව 171) • අදාළ බලධාරීන් විසින් ICRC සංවිධානය සහ ස්වේච්ඡා සංවිධාන සමඟ සහයෝගයෙන් රැඳවුම් ස්ථානවල සිටින පවුලේ සාමාජිකයින් බැලීම සඳහා සමීප ඥාතීන්ව ප්‍රවාහනය කිරීමට ඇති පහසුකම් වැඩිදියුණු කිරීම කොමිෂන් සභාව මඟින් නිර්දේශ කරයි. (5.59 - පිටුව 171) • ICRC සමඟ සහයෝගයේ ප්‍රතිපත්තිය කොමිෂන් සභාව මඟින් පිළිගන්නා අතර රැඳවියන්ගේ සුභසාධනය සඳහා ආඥාවට මඟින් ICRC සහ වෙනත් ඒ හා සමාන මානුෂවාදී සංවිධාන සමඟ මෙම සහයෝගයේ ප්‍රතිපත්තිය සහ වැඩදායක නියැලීම පුළුල් කිරීම දැඩි ලෙස නිර්දේශ කරයි. (5.60 - පිටුව 171) • නීතිය ක්‍රියාත්මක කරන බලධාරීන් මඟින් පුද්ගලයින් අත්අඩංගුවට ගැනීමේ දී අත්අඩංගුවට ගැනීමේ විධිමත් කුවිතාන්සියක් නිකුත් කිරීම සහ රැඳවුම් ස්ථානය පිළිබඳ විස්තර ලබා දීම වැනි දැඩි නෛතික විධිවිධාන අනුගමනය කළ යුතුය. (5.61 - පිටුව 171) • විශේෂයෙන්ම එල්.ටී.ටී.ඊ. සංවිධානය මඟින් බලහත්කාරයෙන් හමුදාවට බඳවා ගැනීම හේතුවෙන් අධ්‍යාපනය කඩාකප්පල් වී ඇති තැනැත්තන් වැනි තරුණ රැඳවියන් සඳහා විශේෂ අවධානය ලබා දිය යුතුය. (5.62 - පිටුව 172) • චෝදනා ගොනු කර මෙම නඩු කටයුතු ක්‍රියාත්මක කිරීම සඳහා හෝ කිසිදු සාපරාධී වරදක් සිදු කර ඇති බවට සාක්ෂි නොමැති අවස්ථාවල දී ඔවුන් මුදා හැරීම සඳහා තීරණාත්මක පියවර ගත යුතු බවට කොමිෂන් සභාව මඟින් නැවත අවධාරණය කරයි. (5.62 - පිටුව 172) • නීතිවිරෝධී අවිගත් කණ්ඩායම් සිදු කළ පැහැරගැනීම්, නීතිවිරෝධී රඳවා ගැනීම් සහ බලහත්කාරයෙන් මුදල් ලබා ගැනීම් පිළිබඳ චෝදනා රාශියක් ඇති බැවින් මෙම කණ්ඩායම්වල ඇතැම් නීතිවිරෝධී ක්‍රියාවන් ජනතාවගේ ජීවත්වීමට ඇති අයිතිය වැනි මූලික අයිතිවාසිකම්වලට බලපෑම් එල්ල කර ඇත. (5.66 - පිටුව 172) • 5.68 – 5.73 දක්වා අවිගත් කණ්ඩායම්වල නීතිවිරෝධී ක්‍රියාකාරකම් සඳහන් වේ. 5.74 සහ 5.78 සංහිදියා ක්‍රියාවලිය සාර්ථකවීම සඳහා විසඳිය යුතු ගැටළු අවධාරණය කරයි. (පිටුව 173 – 175) • (5.79 – 5.85 ළමයින් බලහත්කාරයෙන් බඳවා ගැනීම පිළිබඳ කරුණු ඉදිරිපත් කිරීම් කිහිපයක් ඇතුළත් වේ. (පිටු 175 – 176)) • ළමයින් බලහත්කාරයෙන් බඳවා ගැනීම පිළිබඳ UNICEF (5.87 - පිටුව 177) • "TMVP මඟින් ළමයින් බඳවා ගැනීම නැවැත්වීම සහ සන්නද්ධ කණ්ඩායම මඟින් බඳවා ගත් හෝ භාවිතා කරන සියලුම ළමයින් මුදා හැරීම සහ නැවත අන්තර්ග්‍රහණය කර ගැනීමට සහාය ලබාදීම සහතික කිරීම" සඳහා 2008 දෙසැම්බර් මාසයේ දී TMVP, පුනරුත්ථාපන කොමසාරිස් ජෙනරාල් සහ UNICEF අතර ඇති කර ගත් ත්‍රෛපාර්ශ්වික කාර්ය සැලසුම කොමිෂන් සභාව මඟින් සටහන් කරනු ලබයි. 5.90 - පිටුව 178) • සහායක් නොමැති ළමයින් සහ වෙන්වුනු ළමයින් සඳහා වවුනියාවේ දිසාපති සහ (උතුරු පළාතේ) පුනරුත්ථාපන සහ ළමා රැකවරණ කොමසාරිස් විසින් ස්ථාපිත කළ පවුල් සොයා ගැනීමේ සහ නැවත එක්සත් කිරීමේ ඒකකය (FTR) කොමිෂන් සභාව මඟින් අගය කරයි. (5.91 - පිටුව 178)

<u>නිරීක්ෂණ/ නිර්දේශ</u>

- හිටපු ළමා සටන්කරුවන් පුනරුත්ථාපනය කිරීම ක්ෂණික පශ්චාත් ගැටුම් අදියරේ දී ආණ්ඩුවේ ප්‍රධානම ප්‍රමුඛතාවක් විය යුතුය. (5.94 – 5.95 - පිටුව 178 - 179)
- ළමයින් සටන්කරුවන් ලෙස බලයෙන් බඳවා ගැනීම පිළිබඳ බැලූ බැල්මට සාක්ෂි තිබෙන්නේ නම්, එවැනි වූදිත සිදුවීම් පිළිබඳව විමර්ශනය කළ යුතු වන අතර වැරදිකරුවන් යුක්තිය ඉදිරියට ගෙන ආ යුතුය. (5.96 - පිටුව 179)
- පෞද්ගලික අංශයේ උපදෙස් ලබා ගෙන යුද්ධයෙන් බලපෑමට ලක් වූ ප්‍රදේශවල වැඩි රැකියා අවස්ථා සලසන මෙන් කොමිෂන් සභාව අදාළ බලධාරීන්ගෙන් ඉල්ලා සිටියි. (5.97 - පිටුව 180)
- ආණ්ඩුව ද අදාළ UN නියෝජිතායතනවල, ICRC, INGO සහ NGO සහ යුද්ධයට සම්බන්ධ වූ ළමයින් පිළිබඳව කටයුතු කිරීමේ දැනුම සහ අත්දැකීම් ඇති සිවිල් සමාජ සංවිධානවල සහාය ලබා ගැනීමේ හැකියාව සොයා බැලිය යුතුය. (5.98 - පිටුව 180)
- ප්‍රජා මට්ටමේ සහාය කණ්ඩායම්වලට ද දුෂ්කර තත්ත්වයන් සහ පෞද්ගලික බිඳවාවකයන් හේතුවෙන් කම්පනයට භාජනය වූ තැනැත්තන්ගේ භාවාත්මක සහ අධ්‍යාත්මක අවශ්‍යතාවන් සම්බන්ධයෙන් කටයුතු කළ හැකිය. (5.101 - පිටුව 181)
- කාන්තාවන්ට, ළමයින්ට සහ වැඩිහිටි තැනැත්තන්ට ඔවුන් ආරක්ෂිත පරිසරයක ජීවත් වන බවටත් ඔවුන්ගේ මානව අභිමානය සුරක්ෂිත වන බවට සහ ආරක්ෂා කරන බවට දැනීමටත් අවශ්‍ය වේ. (5.102 - පිටුව 181)
- කාන්තාවන්ට සුවිශේෂී ගැටළු පිළිබඳ කොමිෂන් සභාවේ නිරීක්ෂණ:

  අ. වැන්දඹුවන් සහ කාන්තාවන් මුල් තැන ගන්නා කුටුම්බ සංඛ්‍යාව වැඩි කිරීම

  ආ. දිළිඳු වැන්දඹුවන්ගේ විශේෂ අවශ්‍යතා

  ඇ. සංවර්ධනයේ සහ සංහිදියා ක්‍රියාවලියේ සහභාගීවූවන් ලෙස කාන්තාවන්

  ඈ. කාන්තාවන්ගේ ඉඩම් අයිතිවාසිකම් සහ ආරක්ෂිත ජීවනෝපායක් සඳහා ඔවුන්ට ඇති අයිතිය

  ඉ. ජීවනෝපාය සහායක වැඩසටහන්

  ඊ. යුද්ධයේ විවිධ ආකාර ප්‍රචණ්ඩත්වයෙන් පීඩා විඳි නමුත් කිසිදු යුක්තියක් ඉටු නොවූ කාන්තාවන්

  උ. නීතිවිරෝධී අවිගත් කණ්ඩායම් කාන්තාවන්ට බලපාන බොහොමයක් මානව අයිතිවාසිකම් උල්ලංඝනය කිරීම් සඳහා වගකිව යුතුය.

  ඌ. කාන්තාවන්ට එරෙහි සියලුම ආකාරයේ වෙනස්කොට සැලකීම් මුලිනුපුටා දැමීම පිළිබඳ එක්සත් ජාතීන්ගේ සම්මුතිය (CEDAW) සහ එක්සත් ජාතීන්ගේ ආරක්ෂක මණ්ඩල යෝජනා අංක 1325 ක්‍රියාත්මක කළ යුතුය. (5.204 - පිටුව 182)
- මෙම කාන්තාවන්ගේ සහ කාන්තාවන් ප්‍රමුඛස්ථානය ගන්නා කුටුම්භවල සුභසිද්ධිය ඉටු කළ යුතු ප්‍රධාන පශ්චාත් යුධ අභියෝගයක් ලෙස කොමිෂන් සභාව මඟින් සලකයි. (5.111 - පිටුව 1862)
- කාන්තාවන්ගේ, ළමයින්ගේ, වැඩිහිටියන්ගේ සහ යුද්ධයෙන් බලපෑමට ලක් වූ ආබාධිත තැනැත්තන් වැනි වෙනත් අවදානමට ලක් විය හැකි කණ්ඩායම්වල අවශ්‍යතාවන් ආමන්ත්‍රණය කිරීමට නියම කළ අන්තර් නියෝජිතායතන කාර්යසාධක බලකායක් ප්‍රමාදයකින් තොරව ස්ථාපිත කළ යුතුය. (5.113 - පිටුව 186)
- පශ්චාත් යුධ පරිසරයක දී එවැනි කාන්තාවන්ට රැකියාවක් සොයා ගැනීමට සහ/ හෝ වෙනත් ජීවනෝපාය කටයුත්තක නියැලීමට පහසුකම් සැලසිය හැකි ඔවුන්ගේ විධිමත් අධ්‍යාපනය අඛණ්ඩව කර ගෙන යාමට හෝ වෙනත් ආකාරවල අධ්‍යාපනයක් සහ/ හෝ වෘත්තීය පුහුණුවක් සඳහා අවස්ථාවන් සහ විකල්ප ලබා දිය යුතු බවට කොමිෂන් සභාව නිර්දේශ කරයි. (5.115 - පිටුව 187)

	• අතුරුදහන් වූ තැනැත්තන්, පැහැරගැනීම්, අත්තනෝමතික රඳවා තබා ගැනීම්, දිගු කාලීන සහ අවිනිශ්චිත කාලයකට රඳවා තබා ගැනීම්, සහ අතුරුදහන්වීම් ආදියේ වින්දිතයින් බොහෝවිට කාන්තාවන්ගේ සැමියන්, පුතුන්, පියවරු සහ සහෝදරයින් වන බැවින් සහ ඔවුන් සාම්ප්‍රදායක කුටුම්භවල දිවි පෙවෙත රකින්නන් මෙන්ම ආරක්ෂකයින් ලෙස වැදගත් කාර්යභාරයක් ඉටු කරන බැවින් එම තත්ත්වයන් සම්බන්ධ ගැටළු කාන්තාවන්ට සෘජු බලපෑමක් එල්ල කරයි. (5.117 - පිටුව 187) • ළමයින් සඳහා සහයෝගය, විශේෂයෙන්ම ඔවුන්ගේ අධ්‍යාපනය සඳහා අනුග්‍රහය, මූලික ප්‍රමුඛතාවක් බවට කොමිෂන් සභාව විසින් නිර්දේශ කරයි. (5.118- පිටුව 187) • විධිමත් අධ්‍යාපන ක්‍රමය මෙන්ම එවැනි ක්ෂේත්‍රවල වැඩ කරන වෙනත් ප්‍රජා, සිවිල් සමාජ කණ්ඩායම් හරහා ආණ්ඩුව මඟින් විශේෂ අවධානය අවශ්‍ය කරන ළමයින්, ප්‍රමුඛතා කරුණක් ලෙස හඳුනාගත යුතු බවට කොමිෂන් සභාව මඟින් දැඩි ලෙස නිර්දේශ කරයි. (5.119 - පිටුව 188) • කොමිෂන් සභාව මඟින් පහත දැක්වෙන කරුණු දැඩි ලෙස නිර්දේශ කරයි: අ. යුද්ධයෙන් බලපෑමට ලක් වූ පවුල්වල තත්ත්වය වැඩිදියුණු කිරීම ඉලක්ක කර ගත් වැඩසටහන්වලට සිය විස්තීරණ පවුල් පවත්වා ගැනීමේ සහ රැකබලා ගැනීමේ වගකීමෙන් වැඩිමහලු තැනැත්තන් නිදහස් කිරීම ඇතුළත් විය යුතුය. ආ. ආණ්ඩුව සහ වෙනත් පාර්ශ්වයන් විසින් ආබාධිතතාව සහ යුද්ධය සම්බන්ධ කම්පනය ඇතුළු වෙනත් දිගු කාලීනව නොසැලකිල්ලට භාජනය වූ සෞඛ්‍ය ගැටළු හේතුවෙන් වැඩිමහලු තැනැත්තන්ගේ විශේෂ අවශ්‍යතා පිළිබඳව අවධානය යොමු කළ යුතුය. (5.121 - පිටුව 188) • යුද්ධයෙන් බලපෑමට ලක් වූ ප්‍රදේශවල සිටින ආබාධිත තැනැත්තන්ට සහායවීම පිණිස හදිසි අවශ්‍යතාවක් ඇති බවට කොමිෂන් සභාව හඳුනා ගනී. (5.124 - පිටුව 189) • ආබාධිතතා ඇති තැනැත්තන්ගේ අයිතිවාසිකම් පිළිබඳ එක්සත් ජාතීන්ගේ සම්මුතියට අනුව ආබාධිතතා ඇති පුද්ගලයින්ගේ අයිතිවාසිකම් හඳුනා ගැනීම සඳහා අවශ්‍ය ජාතික නීති සම්මත කළ යුතු බවට කොමිෂන් සභාව මඟින් නිර්දේශ කරයි. (5.126 - පිටුව 189) • "අභ්‍යන්තරව අවතැන් වූ පුද්ගලයින්ට අයිතිවාසිකම්වල සම්පූර්ණ පරාසය භුක්තිවිඳීමට නොහැකිය ..." (5.128 - පිටුව 190) • යුද්ධයේ අවසාන අදියරේ දී අවතැන් වූ අභ්‍යන්තරව අවතැන් වූ පුද්ගලයින් නැවත භාරදීමේ ක්‍රියාවලිය බොහෝදුරට සම්පූර්ණ කර ඇත. (5.130 - පිටුව 191) • ආපසු පැමිණෙන අයට ස්ථිර නිවාස අළුත්වැඩියා කිරීමට හෝ ඉදිකිරීමට සහාය ලබා දිය යුතුය. (5.131 - පිටුව 191) • නැවත පදිංචි කර වූ තැනැත්තන් හට ඉඩම්වල නෛතික භිමිකාරත්වය ප්‍රදානය කිරීමේ අවශ්‍යතාවක් ඇත. (5.132 - පිටුව 191) • ආරක්ෂක අවශ්‍යතාව ඇතුළු පුද්ගලයින්ගේ අවශ්‍යතාවන් පිළිබඳව කටයුතු කළ යුතු වන්නේ බිය, අල්ලා ගැනීම හෝ අවිශ්වාසය පිළිබඳ පරිසරයකට මඟපෑදීමක් නොවන ආකාරයකිනි. (5.135 - පිටුව 192) • සිය කැමැත්ත අනුව ශ්‍රී ලංකාවට නැවත පැමිණ, පදිංචිවීමට අපේක්ෂා කරන ඉන්දියාවේ ජීවත් වන අවතැන් වූ ජනතාව සඳහා ආණ්ඩුව මඟින් පහසුකම් සලසා, දිරිමත් කළ යුතුය. (5.136 - පිටුව 192) • 1990 ඔක්තෝබර් තරම් ඈත කාලයේ එල්.ටී.ටී.ඊ. තර්ජන හේතුවෙන් (යාපනය, මන්නාරම, කිලිනොච්චිය, මුලතිවු සහ වවුනියාව) දිස්ත්‍රික්ක පහෙන් අවතැන් වූ මුස්ලිම් ජාතික අවතැන් වූ ජනතාවගේ ගැටළුව ප්‍රධානතම පශ්චාත් යුධ අභියෝගයකි. (5.137 - පිටුව 192) • මුස්ලිම් ජාතික අවතැන් වූ ජනතාවගේ ගැටළු (5.140 - පිටුව 193)

	• මුස්ලිම් ජනතාවට ඔවුන්ගේ මුල් බිම් වෙත ආපසු පැමිණීමට තත්ත්වය යහපත් බවට 5.141 සඳහන් කරන අතර සිය මුල් බිම් වෙත ආපසු පැමිණීමට අවශ්‍ය නොමැති පුද්ගලයින් 5.143 සඳහන් කරයි. (පිටුව 193) • ඇතැම් මුස්ලිම් ජනතාව අභ්‍යන්තරව අවතැන් වූ පුද්ගලයින් ලෙස වර්ගීකරණය නොකරයි. (5.144 - පිටුව 194) • පලවා හැරීමේ ඉතිහාසය, වසර 20ක අවතැන් වූ අත්දැකීම සහ ආපසු පැමිණීමේ වර්තමාන අත්දැකීම් විමර්ශනය කිරීම සඳහා පුරවැසි කොමිෂන් සභාවක් ස්ථාපිත කර ඇත. (5.146 - පිටුව 195) • දිගු කාලයක් පුත්තලමේ කඳවුරුවල ජීවත්වීමට සිදු වූ යාපනයේ මුස්ලිම් ජනතාවගේ දුක්ඛිත තත්ත්වය පිළිබඳව නිසි අවධානයක් යොමු කර නොමැති බවට ද සඳහන් විය. (5.148 - පිටුව 185) • ශ්‍රී ලංකාවේ දිග්ගැස්සුනු යුද්ධය හේතුවෙන් සිදු වූ දිගු කාලීන අභ්‍යන්තරව අවතැන් වූ පුද්ගලයින්ගේ ගැටළුවක් ලෙස මුස්ලිම් ප්‍රජාවගේ දුක්ඛිත තත්ත්වය සම්බන්ධයෙන් කල්පවතින විසඳුමක් සොයා ගත යුතුය. (5.149 - පිටුව 195) • 5.152 – 5.155 දක්වා ජනමාධ්‍යවේදීන්ට සහ භාෂණයේ නිදහසට සිදු කළ ප්‍රහාරයන් පිළිබඳ කරුණු ඉදිරිපත් කිරීම් සඳහන් කරයි. (පිටුව 196 - 197) • කොමිෂන් සභාව මඟින් පහත දැක්වෙන කරුණු නිර්දේශ කරයි. අ. මාධ්‍ය නිලධාරීන්ට සහ ආයතනවලට හානි කිරීම සහ පහරදීම වැළැක්වීම සඳහා සියලුම පියවර ගත යුතුය. ආ. එවැනි වැරදි සඳහා වැළැක්වීමේ දඬුවම් පැනවීමට පියවර ගත යුතුය. ඇ. එවැනි නීතිවිරෝධී ක්‍රියාවන් පිළිබඳ අතීත සිදුවීම් නිසි ලෙස විමර්ශනය කළ යුතුය. ඈ. ආණ්ඩුව මඟින් උතුරු සහ නැගෙනහිර පළාත්වල මාධ්‍ය නිලධාරීන්ගේ ගමන් කිරීමේ නිදහස සහතික කළ යුතුය. ඉ. තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම සහතික කිරීමට නීති සම්පාදනය කළ යුතුය. • සංහිඳියාව පිළිබඳ ඕනෑම විශ්වාසදායක සහ තිරසාර ක්‍රියාවලියක් සඳහා ජනතාවට නිදහසේ සිය ආගම ඇදහීම සහ සමාගමේ සහ ගමන් කිරීමේ නිදහස වැනි වෙනත් නිදහස් භුක්තිවිඳීම ගරු කරන, ප්‍රවර්ධනය කරන සහ ආරක්ෂා කරන පරිසරයක් නිර්මාණය කිරීම අවශ්‍ය වේ. (5.159 - පිටුව 198) • බිම් බෝම්බ ඉවත් කිරීමේ කටයුතු සඳහා අවශ්‍ය කරන සීමාවන් හැරුණු කොට ජනතාවට සිය ආගමික ස්ථාන වෙත යාම සීමා කරන තහනම් කිරීම් ඉවත් කිරීමට ආණ්ඩුව මඟින් ඉක්මන් පියවර ගත යුතුය. අධි ආරක්ෂක කලාය ඇතුළත පිහිටි ආගමික සිද්ධස්ථාන වෙත ප්‍රවේශවීම ද මෙයට ඇතුළත් විය යුතුය. (5.160 - පිටුව 199) • ජනතාවට, ප්‍රජා නායකයින්ට සහ ආගමික නායකයින්ට සීමා කිරීම්වලින් තොරව, සාමකාමී උත්සව සහ රැස්වීම් සංවිධානය කිරීමට නිදහස තිබිය යුතුය. (5.161 - පිටුව 199) • විදේශවලින් පැමිණෙන අමුත්තන්ට කිසිදු අනිසි සීමා කිරීම්වලින් තොරව, මෑතක දී නැවත පදිංචි කළ ප්‍රදේශවල සිටින සිය මිතුරන් සහ ඥාතීන් බැලීමට ඉඩදිය යුතුය. (5.163 - පිටුව 199) • **2005 අගෝස්තු සිට මතු වූ චෝදනා ලද බරපතල මානව අයිතිවාසිකම් උල්ලංඝනය කිරීම් විමර්ශනය කිරීමට සහ විමසීමට පත් කළ ජනාධිපති විමර්ශන කොමිෂන් සභා වාර්තාවේ නිර්දේශ ක්‍රියාත්මක කිරීම කොමිෂන් සභාව මඟින් දැඩි ලෙස නිර්දේශ කරයි.**

8 වැනි පරිච්ඡේදය - සංහිදියාව	• 8.5 පහත දැක්වෙන කරුණු සම්බන්ධයෙන් අදහස් දක්වා ඇත. - ජනතාවගේ නැවත පදිංචි කරවීමේ, ජීවනෝපාය, අධ්‍යාපනික, වෛද්‍ය, ප්‍රවාහන සහ ස්ථිර වාසස්ථානවල අවශ්‍යතා සම්බන්ධයෙන් බලපෑමට ලක් වූ සියලුම ප්‍රදේශවල සාමූහික ව්‍යායාම ගෙන ඇති අතර (මූල්‍ය සහ වෙනත් සහනාධාර පැකේජ ප්‍රදානය කිරීම හරහා ඇතුළුව) සැලකිය යුතු ප්‍රගතියක් අත් කර ගෙන ඇත. - ඉඩම් අභියෝගයකි - ස්ථිර වාසස්ථාන සැලකිය යුතු කරුණකි - අවදානමට ලක් විය හැකි කණ්ඩායම්වලට වඩාත් ඉලක්කගත ප්‍රවේශයක් අවශ්‍ය කරයි - සිවිල් පරිපාලනය ස්ථාපිත කිරීම ප්‍රමාද වේ. (8.5 - පිටුව 255) • ආණ්ඩුව උතුරේ සංවර්ධනය සඳහා සැලකිය යුතු අරමුදල් වෙන් කර ඇති නමුත් ගැටළු විසඳීමට කාලයක් ගත වනු ඇත. ආණ්ඩුව රටේ සංවර්ධන හවුල්කරුවන් කෙරෙහි වඩාත් නියැලුනු සහ අර්ථසාධක දැක්මක් යොදා ගත යුතු බවට කොමිෂන් සභාව නිරීක්ෂණය කරයි. (8.6 - පිටුව 256) • ආරක්ෂක අංශ පෞද්ගලික ඉඩම්වල සුළු ව්‍යාපාරවල නිරතවීම පිළිබඳ ගැටළුව කොමිෂන් සභාව මඟින් සලකා බලයි. ආරක්ෂක අංශ සිවිල් ක්‍රියාකාරකම්වලින් බැහැරට පැමිණිය යුතු බවට කොමිෂන් සභාව නිර්දේශ කරයි. (8.7 - පිටුව 256) **<u>පොදු අදහස්</u>** • උතුර සහ නැඟෙනහිර සමස්තයක් ලෙස බැලිය යුතුය. (8.9 - පිටුව 256) • 1970 සිට පළමු වරට උතුරේ සහ නැඟෙනහිර ජනතාවට නිදහස දැනෙයි. නමුත් සිංහල ජනතාව උතුරේ සංචාරය කිරීම සහ ආරක්ෂක අංශ සිංහලෙන් කථා කිරීම ඔවුන් අවමානයට ලක් කිරීමකි. තමන්ට එරෙහිව ජයගෙන ඇතැයි ජනතාවට හැඟෙන අතර සෑම දිනකම ආණ්ඩුව විසඳුමක් ප්‍රමාද කරයි, ජනතාව එල්.ටී.ටී.ඊ. සංවිධානයට ආපසු යාමට කැමති බවට පෙනේ. (8.10 - පිටුව 257) **<u>නැවත පදිංචි කරවීම - සාමාන්‍ය</u>** • 8.11 සිට 8.18 දක්වා නැවත පදිංචිකරවීම පිළිබඳ කරුණු සම්බන්ධයෙන් සිදු කළ කරුණු ඉදිරිපත් කිරීම් සඳහන් වේ. දේපළ විස්තාපනයවීම්, නැවත පදිංචිකරවීමේ විෂමතා ආදිය වාර්තා විය. ආණ්ඩුව සංවර්ධන ව්‍යාපෘති ගණනාවක නියැලී ඇති බවට ද සටහන් වේ. (පිටුව 258 - 259) නැවත පදිංචිකරවීම සහ නවාතැන් • රැකියා උත්පාදනය කිරීමේ අවශ්‍යතාවක් විය. දකුණේ කොන්ත්‍රාත්කරුවන් මාර්ග ඉදිකිරීමට යොදා ගන්නා ලදී. (8.20 - පිටුව 259) • දකුණේ මිනිසුන් ව්‍යාපාර සඳහා මඩකලපුවට භාණ්ඩ ගෙන ඒම එම පළාතේ මිනිසුන්ට බලපෑ බවට මඩකලපුවේ දී දක්නට ලැබුනි. (8.10 - පිටුව 260) • මන්නාරමේ දී නැවත පදිංචි කළ පුද්ගලයින්ට මසුන් ඇල්ලීම, ගොවිතැන් කිරීම ආදිය සඳහා සහාය අඩු විය. (8.22 - පිටුව 260) • මුලතිවු හි දී නැවත පදිංචිකරවීම අතරතුර සහයෝගය අඩු විය. (8.25 - පිටුව 260) • මඩු හි දී නැවත පදිංචිකරවීම සඳහා සහාය ප්‍රමාණවත් නොවීය. (8.28 - පිටුව 261) **<u>අධ්‍යාපනය</u>** • 8.29 – 8.38 අධ්‍යාපන අවශ්‍යතාවන් පිළිබඳව සාකච්ඡා කරයි. ගුරුවරුන්ගේ හිඟය, කැඩී ගොස් ඇති පාසැල් ගොඩනැගිලි, දෙමාපියන් සහ සහෝදරයින් අහිමි වූ ශිෂ්‍යයින්ගේ භාවාත්මක සුභසිද්ධිය, කම්පනය ආදිය. (පිටු 261 - 263)

	<u>ධීවර කර්මාන්තය</u> • 8.39 – 8. 49 ධීවරයින් මුහුණ දෙන දුෂ්කරතා පිළිබඳව සාකච්ඡා කරයි. හමුදාව ධීවර ජනතාවට සහයෝගය ලබා දෙන බවට සටහන් වේ. (පිටු 264 - 265) **<u>කෘෂිකර්මාන්තය</u>** • 8.50 – 8.53 කෘෂිකාර්මික දුෂ්කරතා සහ ආණ්ඩුවේ සහයෝගී කටයුතු පිළිබඳව සාකච්ඡා කරයි. (පිටු 266 - 267) **<u>ඉඩම්</u>** • ලේඛණමය සාක්ෂි අහිමිවීම හේතුවෙන් ඉඩම්වල හිමිකාරත්වය ඔප්පු කිරීමට නොහැකිවීම, එල්.ටී.ටී.ඊ. සංවිධානය සිවිල් වැසියන්ට ලබා දුන් ඉඩම් ආශ්‍රිත ගැටළු සහ බලයෙන් අල්ලා ගැනීම සිදු වූ ඉඩම් මෙන්ම වෙනත් භාවිතා කිරීම් සඳහා ඉඩම් ලබා දී තිබූ අවස්ථාවල දී එම ඉඩම් නැවත හිමිකරුවන්ට ලබා නොදී ඇති අවස්ථා පිළිබඳ ගැටළු (8.54 - පිටුව 267) **<u>වෛද්‍ය පහසුකම්</u>** • මඩුන්කෙර්නි රෝහල 6,000කට අධික රෝගීන් සංඛ්‍යාවකට ප්‍රතිකාර කළ මූලික රෝහල වූ නමුත් නේවාසික වෛද්‍යවරයෙක් හෝ පරිපූරක වෛද්‍ය කාර්ය මණ්ඩලයක් නොතිබුනි. රෝහල නැවත ඉදිකිරීමට අවශ්‍ය විය. (8.55 - පිටුව 267) • 8.57 – 8.59 පච්චිලයිපල්ලේ, මුලතිවු සහ මඩු පිහිටි රෝහල්වල පවතින අඩුපාඩු සාකච්ඡා කරයි. (පිටු 267 - 268) **<u>මරණ සහතික නිකුත් කිරීම</u>** • මිය ගිය තැනැත්තන් හට මරණ සහතික නොලැබුනි. (8.61 - පිටුව 268) **<u>වන්දි</u>** • අහිමි වූ වංචල සහ නිශ්චල දේපළ, අහිමි වූ ජීවිත, අතුරුදහන්වීම්, මරණ, අත් පා අහිමිවීම් සහ පුද්ගලයින්ට සහ දේපළවලට සිදු වූ හානි සඳහා වන්දි ගෙවීම පිළිබඳ ගැටළුව. (8.63-8.65 - පිටුව 268) **<u>නීතිය සහ සාමය</u>** • පැහැරගැනීම් සහ බලෙන් මුදල් ලබා ගැනීම් දේශීය සහ අන්තර්ජාතික පොලිසියට සහ මානව හිමිකම් සංවිධානවලට වාර්තා කර ඇත. (8.67 - පිටුව 269) • යුද්ධයෙන් පසුව පවා TELO, PLOTE, EPDP, EPRLF, ENDLF, TMVP සියල්ල අබණ්ඩව ප්‍රචණ්ඩත්වය, පැහැරගැනීම්, කප්පම් ඉල්ලීම්, ඝාතන ආදියේ නියැලේ. (8.68 - පිටුව 269) • අවිගත් කණ්ඩායම් අවි රැගෙන තවමත් ගැවසේ. (8.69 - පිටුව 269) **<u>විනාශ වූ ආගමික ස්ථාන/ ආගමික ස්ථානවලට පහරදීම</u>** • යුද්ධයෙන් විනාශ වූ මුස්ලිම්, ක්‍රිස්තියානි, බෞද්ධ සහ හින්දු ජනතාවගේ ආගමික ස්ථාන නැවත ඉදිකිරීමට අවශ්‍ය වේ. (8.69 - පිටුව 269) **<u>හින්දු ආගමික චාරිත්‍රවලට බාධා කිරීම සහ විනාශ කිරීම</u>** • යුද්ධය අතරතුර දී බැතිමතුන් නොපැමිණි දේවාලවලින් කලා කෘති, අශ්වරථ, පිළිම ආදිය ඉවත් කර ඇත. (8.74 - පිටුව 270) **<u>සොල්දාදුවන්ගේ පවුල්</u>** • අපි සිය ජීවිත අහිමි වූ සොල්දාදුවන්ගේ පවුල් අමතක නොකළ යුතුය. (8.75 - පිටුව 271) **<u>සංවර්ධන ගැටළු සහ පාලනය සඳහා ජනතාවගේ සහභාගීත්වය</u>** • 1999 සිට 2008 දක්වා බස්නාහිර පළාත ද.ජා.නිෂ්පාදනයට ආසන්න වශයෙන් 50%ක් දායක වී ඇති අතර උතුරු සහ නැගෙනහිර පළාත්වල දායකත්වය 9%කටත් අඩු

	මට්ටමක් විය. මහ බැංකු සංඛ්‍යාලේඛන අනුව 2003 සහ 2004 වර්ෂවල දී නැගෙනහිර පළාත අඩුම සාක්ෂරතා අනුපාතය වාර්තා කර ඇත. (8.77 - පිටුව 271) • උතුරේ සංවර්ධනයට ප්‍රදේශයේ ජනතාවගේ ද සහභාගීත්වය තිබිය යුතුය. (8.78 - පිටුව 272) • කරුනා සහ පිල්ලෙයාන් සංවර්ධන කටයුතුවලට සම්බන්ධ වුව ද මුස්ලිම් ජනතාව සම්බන්ධ වී නොමැත. (8.82 - පිටුව 273) • සංවර්ධනය තිබුන ද සංවර්ධනය ප්‍රමාණවත් නොවේ. අධ්‍යාපනයට, සෞඛ්‍ය රැකවරණයට සහ නිවාස ආදියට අවධානය යොමු කළ යුතුය. (8.84 - පිටුව 273) **<u>උතුරු සහ නැඟෙනහිර පළාත්වල සිවිල් පරිපාලනය</u>** • 8.85 – 8.94 පාරිපාලනය සිවිල් නිලධාරීන් යටතේ නොවන බවටත් සිවිල් නිලධාරීන්ට මාරු කළ යුතු බවටත් වන පැමිණිලි සම්බන්ධයෙන් සාකච්ඡා කරයි. (273 - 275) **<u>පළාත් බලධාරීන්</u>** • රාජ්‍ය මගින් පළාත්වලට වැඩිපුර බලය විමධ්‍යගත කළ යුතුය. විභව තත්ත්වයන් සීමා කර ඇත. යුද්ධයේ සිට පශ්චාත් යුධ තත්ත්වය දක්වා සිදු වූ මාරුව තුළින් පාලන රික්තයක් නිර්මාණය කර ඇත. (8.95 - 275) • ආණ්ඩුව පළාත් පාලනය සම්බන්ධයෙන් ජාතික ප්‍රතිපත්තියක් යොදා ගෙන ඇත. (8.96 - 276) **<u>උතුරු පළාතේ හමුදාව සිටීමේ ආක්‍රමණශීලීභාවය</u>** • 8.99 – 8. 103 උතුරු පළාතේ හමුදාව සිටීමේ ගැටළු පිළිබඳව සාකච්ඡා කරයි. හමුදාව තමන් අවසානයේ දී අදියරෙන් අදියර ඉවත් කර ගන්නා බවට ප්‍රකාශ කළ ද, අවදානම් හේතුවෙන් හමුදාවට සම්පූර්ණයෙන්ම ඉවත් විය නොහැකිය. (පිටු 277 - 279) **<u>ජනවිකාසය වෙනස් කිරීම පිළිබඳ කරුණු</u>** • රාජ්‍ය අනුග්‍රහයෙන් සිදු කරන නැවත පදිංචිකරවීමේ ව්‍යාපෘතිවලින් ප්‍රදේශයේ ජනවිකාසය වෙනස්කිරීමට උපක්‍රමයක් ඇති බවට අදහස් මතු කරයි. (8.104 - පිටුව 279) • එවකට නැවත පදිංචිකරවීම පිළිබඳ අමාත්‍යවරයා වූ වී. මුරලිදරන් (පිල්ලෙයාන්), ජනවිකාසය වෙනස්කිරීමට උත්සාහයන් තිබූ බවට ප්‍රතික්ෂේප කළේය. වසර 30කට පෙර උතුර සහ නැඟෙනහිර ප්‍රදේශවල සිංහල ජාතිකයින් රාශියක් ජීවත් වූ බවට ඔහු පැවසීය. (8.105 - පිටුව 279) • ප්‍රදේශය තුළ සිංහල ජනතාව පදිංචි කරවීමට සහාය පළ කරන සාක්ෂි. (8.106 – 8.108 - පිටු 279 - 280) **<u>යුද්ධය තිබූ ප්‍රදේශ ආසන්නයේ ඇති සිංහල ගම්මාන</u>** • 8.109 – 8.110 යුද්ධය තිබූ ප්‍රදේශ ආසන්නයේ ඇති සිංහල ගම්මානවල ගැටළු විස්තර කරයි. (පිටු 280 - 281) **<u>උතුරේ මුස්ලිම් ජනතාව නැවත පදිංචිකරවීම</u>** • යාපනයේ ජීවත් වූ සහ 1990 දී අවතැන් වූ මුස්ලිම් ප්‍රජාව (8.111 - පිටුව 281) • පහත දැක්වෙන කරුණු හේතුවෙන් මුස්ලිම් ජනතාව කොන් කර ඇත. අ. දිග්ගැස්සුනු අවතැන්වීම් පිළිබඳ ප්‍රතිපත්තියක් නොමැත ආ. මහළු අභ්‍යන්තරව අවතැන් වූ පුද්ගලයින් සහ ඔවුන්ගේ අවශ්‍යතාවන් පිළිබඳව කිසිදු ප්‍රසිද්ධ පිළිගැනීමක් නොමැත 112 ඇ. නැවත පදිංචිකරවීමේ සහාය සඳහා මුදල් ප්‍රදාන නොමැත ඈ. නිවාස සම්බන්ධයෙන් සහායවීමට කැපවීමක් නොමැත ඉ. ඔවුන්ගේ කිසිදු වරදක් නොමැතිව, වසර 20ක් නොසැලකිල්ල හේතුවෙන් දේපළවලට

	සිදු වූ අලාභ හානි සකස් කිරීමට විධිවිධාන නොමැත ඊ. යුද්ධය සහ පලවාහැරීම හේතුවෙන් සමාජ සම්බන්ධතාවලට වූ හානිය නිවැරදි කිරීමට විධිවිධාන නොමැත, ජීවනෝපාය සම්බන්ධයෙන් සහායක් නොමැත උ. වන්දි සඳහා සැලසුමක් නොමැත (8.112 - පිටුව 282) **<u>අධි ආරක්ෂිත කලාප/ ආරක්ෂක අංශ භාවිතා කරන ඉඩම් සහ ගොඩනැගිලි සහ නැවත පදිංචිකරවීමට ඇති බලපෑම</u>** • මුල් ඉඩම් නැවත ලබාදීම සහ දුෂ්කරතා ඇතුළු අධි ආරක්ෂිත කලාප සම්බන්ධ ගැටළු රාශියක්. (8.113 - පිටුව 282) • යුද්ධය අතරතුර දී සාම්පූර්වල ජනතාවට කිලිවෙඩ්ඩි කඳවුරට යාමට බල කරන ලදී. (8.114 - පිටුව 282) • පලාලි වසර ගණනාවක් අධි ආරක්ෂිත කලාපයක් විය. (8.114 - පිටුව 283) • 8.113 – 8. 128 අධි ආරක්ෂිත කලාප සම්බන්ධයෙන් සාකච්ඡා කරයි. (පිටුව 283 - 285) **<u>බිම් බෝම්බ ඉවත් කිරීම</u>** • බිම් බෝම්බ වැඩි ප්‍රමාණයක් ඉවත් කර, ජනතාව නැවත පදිංචි කර ඇත. පුදුකුඩිරුප්පු පමණක් ඉතිරිව ඇත. ජනතාව නැවත පදිංචිකරවීම සඳහා UNHRC මඟින් බෝම්බ ඉවත් කිරීම පිළිබඳ සහතිකයක් ලබා දිය යුතු විය. - ගෝඨාභාය රාජපක්ෂ - (8.129 - පිටුව 285) • 8.128 – 8.132 බිම් බෝම්බ ඉවත් කිරීම සහ සිවිල් ජනතාව ඉලක්ක කර ගැනීම සම්බන්ධයෙන් සාකච්ඡා කරයි. (පිටුව 285 - 286) **<u>පශ්චාත්-ගැටුම් ඩයස්පෝරාවේ ගැටළු</u>** • තිරසාර සාමයක් සඳහා තර්ජනය විදේශවලින් එල්ල විය හැකිය. (8.133 - පිටුව 286) **<u>අවබෝධය කළමනාකරණය</u>** • විශේෂයෙන්ම යුද්ධයෙන් බලපෑමට ලක් වූ ප්‍රදේශ පිළිබඳ අවබෝධය ඇතුළුව අවබෝධය කළමනාකරණය කිරීම ප්‍රමුඛතාවකි. (8.135 - පිටුව 287) **<u>සංහිදියාව</u>** • ප්‍රචණ්ඩ යුද්ධයකට පසුව සම්බන්ධතා ගොඩනැගීම, පොදු ලක්ෂණ සහ වෙනස්කම් පිළිගැනීම අතරතුර විශ්වාසය නැතිකම, අවිචාර මතය සහ නොඉවසීම වැනි ගැටළු ආමන්ත්‍රණය කිරීම සංහිදියාවේ මූලික හරයන් වේ. (8.136 - පිටුව 288) • මානව අයිතිවාසිකම් සහ මානව විවිධත්වය පිළිබඳව ගරු කිරීමේ සංස්කෘතියක් ගොඩනැගිය යුතුය. (8.137 - පිටුව 288) • යාපනය පුස්තකාලය ගිනිගැනීම ඇසින් දුටු සිංහල ජනතාව, ත්‍රස්තවාදය පිළිබඳව කණගාටුව පළ කළ දෙමළ ජනතාව සහ කාන්තන්කුඩි හි දී පීඩාවට පත් මුස්ලිම් ජනතාව ඇතුළු සියලුම ජනකොටඨාසවල පුද්ගලයින් සාක්ෂි දුන්නේය. සියල්ලන්ටම අවශ්‍ය වූයේ සාමයයි. (8.144 - පිටුව 290) • යුද්ධය අවසන් කර වසර 2කට පසුව වුව ද සමාජ සහ දේශපාලන ජීවිතය තුළ ප්‍රචණ්ඩත්වය, සැකය සහ වෙනස්කොට සැලකීම පිළිබඳ හැඟීම තවමත් ඇත. (8.147 - පිටුව 290) **<u>දෙමළ ප්‍රජාවගේ දුක්ගැනවිලි</u>** • දෙමළ ජනතාවට දුක්ගැනවිලි ඇති බව ප්‍රතික්ෂේප කිරීම යථාර්තවාදී නොවන කරුණකි. (8.153 - පිටුව 292)

	<u>ශ්‍රී ලංකාවේ බහුතර - සුළුතර සම්බන්ධතා ආශ්‍රිත ඓතිහාසික පසුබිම</u> • සිදු වූ ගැටළු සම්බන්ධයෙන් කටයුතු කිරීමට පරිපාලන සහ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාමය ආරක්ෂිත ක්‍රමවේද අවශ්‍ය වුව ද, බහුතරය සහ සුළුතරය එකිනෙකා කෙරෙහි ඇති නැඹුරුතාවයේ මූලික වෙනස්කමක් නොමැතිව, මේ කිසිවක් ප්‍රමාණවත් නොවන බවට සෝල්බරි කොමිෂන් සභාව තීරණය කරන ලදී. (8.157 - පිටුව 293) <u>දෙමළ දුක්ගැනවිලි විස්තර කිරීමේ විවිධ අදියර</u> • පළමු අදියර අතරතුර දී, ස්වාධීනත්වය අවස්ථාවේ දී ඇති කර ගත් එකඟතාවය 1955 දක්වා අඛණ්ඩව පවතින විට, දුක්ගැනවිලි ප්‍රකාශ කිරීම පිළිබඳ පැහැදිලිව හඳුනාගත හැකි මතවාදී මානයක් නොමැති විය. දෙමළ ජනතාවගේ සැලකිල්ල යොමු වූ කරුණු වූයේ ප්‍රතිලාභ ක්‍රියාත්මක කරවීම සහ බෙදාහදා ගැනීම පිළිබඳ ප්‍රායෝගික ගැටළු විය. (8.158 - පිටුව 293) • ලබා දුන් පොරොන්දු ඉටු නොකිරීම සම්බන්ධයෙන් ප්‍රධාන පක්ෂ දෙකේම ආණ්ඩු වගකිව යුතුය. බණ්ඩාරනායක - වෙල්වනායගම් ගිවිසුම අගමැති බණ්ඩාරනායක විසින් ඒකපාර්ශ්විකව අවලංගු කරන ලදී. මෙය භාෂාව පිළිබඳ ගිවිසුම උල්ලංඝනය කිරීමෙන් පසුව සිදුවිය. ඉන් අනතුරුව, පත් වූ විවිධ ආණ්ඩු මඟින් කඩකළ පොරොන්දු, සිංහල - දෙමළ සම්බන්ධතාවේ සහ දෙමළ ජනතාවගේ අභිභවා යන දුක්ගැනවිල්ලේ නැවත නැවත සිදු වූ ලක්ෂණයක් විය. දිස්ත්‍රික්ක කවුන්සිල පිළිබඳ ඩඩ්ලි - වෙල්වනායගම් ගිවිසුම ඉවත දැමීමට සිදු විය. පසුව සම්මත කර ගත් 1972 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ඒකීය ස්වභාවය ඒකාබද්ධ කළ ද බලය බෙදීමේ යම් ක්‍රමයක් සැපයීමට අපොහොසත් විය. 1980 දී ස්ථාපිත කළ දිස්ත්‍රික්ක සංවර්ධන කවුන්සිලවලට ප්‍රමාණවත් බලයක් ලබා නොදුන් බැවින් ඒවා ද ඉක්මනින්ම අක්‍රීය විය. දිගු කාලීන නිශ්චල සාකච්ඡාවලින් පසුව 13 වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය සාකච්ඡාවට භාජනය වූ අතර බාහිර බලපෑම්වල ප්‍රතිඵලයක් ලෙස අවසානයේ දී එය සම්මත කර ගනු ලැබීය. එබැවින් එයට විශ්වාසයේ පදනමක් නොවීය. (8.159 - පිටුව 293) • බණ්ඩාරනායක - වෙල්වනායගම් ගිවිසුමේ සාකච්ඡා කළ ප්‍රධාන කරුණු හතර - භාෂාව, ඉඩම්, ඉන්දියානු සම්භවයක් ඇති දෙමළ ජනතාවගේ පුරවැසිභාවය සහ ප්‍රාදේශීය කවුන්සිල ස්ථාපිත කිරීම (8.160 - පිටුව 294) • අන්තර් වාර්ගික සම්බන්ධතාවේ තීරණාත්මක බෙදීම පළමුව 1958 කැරැල්ලෙන් ආරම්භව, පසුව 1977 කැරැල්ල සහ අවසානයේ දී1983 ‘කලු ජූලිය’ ලෙස හඳුන්වන සහ දෙමළ ජනතාවට ප්‍රමාණවත් ආරක්ෂාවක් සැපයීමට එවකට පැවති ආණ්ඩුවේ නින්දිත අසමත්වීමත් සමඟ උච්චස්ථානයට පැමිණියේය. (8.163 - පිටුව 294) <u>මුස්ලිම් ජනතාවගේ දුක්ගැනවිලි</u> • උතුරේ ජීවත් වූ මුස්ලිම් ජනතාවගේ ප්‍රශ්නය ආරම්භවූයේ 1990 ඔක්තෝබර් මස 30 වැනි දින LTTE සංවිධානය මඟින් මුස්ලිම් ප්‍රජාව බලෙන් පෙනෙරපීමත් සමඟය. කොමිෂන් සභාව ඉදිරියේ සිදු කළ කරුණු ඉදිරිපත් කිරීම් අනුව විශේෂයෙන්ම යාපනයේ සහ මන්නාරම ඇතුළු උතුරු සහ නැඟෙනහිර පළාත්වල මුස්ලිම් ජනතාව විශාල සංඛ්‍යාවක් ජීවත් විය. (8.167 - පිටුව 295) • යාපනයෙන් පලවා හැරිය මුස්ලිම් ජනතාව පුත්තලම දිස්ත්‍රික්කයේ පදිංචිව සිටියි. (8.168 - පිටුව 295) • 8.169 – 8.172 මුස්ලිම් ජනතාවගේ ගැටළු සාකච්ඡා කරයි, භාෂාව, රෙජිස්ටරයෙන් නම් ඉවත් කිරීම, අවතැන් වූ මුස්ලිම් ජනතාව අභ්‍යන්තරව අවතැන් වූ තැනැත්තන් ලෙස පිළිනොගැනීම, සහ මුස්ලිම් ජනතාව සඳහා ප්‍රමුඛතාව නොමැතිකම මෙම ගැටළු කිහිපයකි. (පිටුව 296) • ආණ්ඩුව මඟින් මුස්ලිම් ජනතාව ඉක්මනින් නැවත පදිංචිකරවීම සඳහාත් වෙනස්කොට සැලකීමකින් තොරව මුස්ලිම් පල්ලි නැවත ගොඩනැගීමටත් පහසුකම් සැලසිය යුතු බවට කොමිෂන් සභාව මඟින් නිර්දේශ කරයි. (8.173 – 8.175 - පිටු 296 - 297)

	<u>**යුද්ධය පැවති ප්‍රදේශ ආසන්න ගම්මානවල සිටින් සිංහල ජනතාවගේ දුක්ගැනවිලි**</u> • වැලිඔය, මොනරාගල සහ කැබතිගොල්ලාව ජීවත් වන ජනතාව අති විශාල තර්ජන හමුවේ ජීවත් විය. (8.177 - පිටුව 297) • LTTE සංවිධානය සිදු කළ හානිවලින් නිවාස විනාශ වුව ද, ඒවා නැවත ඉදිකරවීමට ආණ්ඩුවේ කිසිදු උත්සාහයක් නොවිය. (8.178 - පිටුව 297) • ආණ්ඩුව මෙම ජනතාවගේ අවශ්‍යතාවන් හඳුනා ගෙන, ඒවාට විසඳුම් ලබා දිය යුතු බවට කොමිෂන් සභාව නිර්දේශ කරයි. <u>**ඉන්දියානු සම්භවය සහිත දෙමළ ජනතාවගේ දුක්ගැනවිලි**</u> • අධ්‍යාපන සහ සෞඛ්‍ය පහසුකම් නොමැතිකම. (පි. 8.184 – 298) <u>**දුක්ගැනවිලි විසඳීම සහ සංහිඳියාව ප්‍රවර්ධනය කිරීමට අදාළ ගැටළු: නීතියේ පාලනය බලාත්මක කිරීමට අසමත්වීම**</u> • ගැටළු: අ. දේශපාලන සම්බන්ධතා ඇති තැනැත්තන් විසින් අපරාධ වැරදි සිදු කර ඇති අවස්ථාවල දී එම වැරදි පිළිබඳව විමර්ශනය කිරීමට සහ අපරාධකරුවන් නීතිය ඉදිරියට ගෙන ඒමට නීතිය බලාත්මක කරන නිලධාරීන් අසමත්වීම. ආ. යුද්ධය අවසන් වුව ද නීතිය හා සාමය පිළිබඳ වැදගත් ගැටළු තවමත් ඉතිරිව ඇත. අවිගත් කණ්ඩායම් විසින් කප්පම් ගැනීම් සහ පැහැරගැනීම්, අතුරුදහන් කිරීම්, මංකොල්ලකෑම් ආදී වෙනත් සාපරාධී ක්‍රියාවන් අඛණ්ඩවම සිදුවීම හේතුවෙන් උතුර සහ නැඟෙනහිර ජීවත් වන ජනතාවගේ මනසේ භීතිය ඇත. 152 දේශපාලනඥයින් ගණනාවක් නීතියේ රැකවරණය ලබමින් කටයුතු කරන බවට චෝදනා එල්ල විය. ඔවුන් සමාජයේ සිටින අපරාධ අංශ සමඟ සිදු කරන ගනුදෙනු හේතුවෙන් පොලීසියට කරන අනිසි බලපෑම් මඟින් යුක්තිය පසිදලීම මහහරින අතර මේ හේතුවෙන් පොලීසිය දේශපාලනීකරණය වේ. ඇ. අවි ආයුධ භාවිතා කිරීම සමඟ සිදු කරන දේශපාලන ප්‍රචණ්ඩත්වය මෙම රටේ නීති ගරුක ජනතාව තුළ දැඩි කණස්සල්ලක් ඇති කර තිබේ. දේශපාලන ප්‍රචණ්ඩත්වය වර්ධනවීම සහ දේශපාලකයින් සහ ඔවුන්ගේ ආධාරකරුවන් විසින් අවි ආයුධ නීතිවිරෝධී ලෙස සන්තකයේ තබා ගැනීම සහ භාවිතා කිරීම කොමිෂන් සභාවේ දැඩි සැලකිල්ලට යොමු වී ඇත. ඈ. ආණ්ඩුව මඟින් අනවසර අවි ආයුධ සන්තකයේ තබා ගන්නා තැනැත්තන් නිරායුධ කිරීමට සහ එවැනි අපරාධකරුවන්ට එරෙහිව නඩු පැවරීමට ඉක්මන් පියවර ගත යුතු බවට කොමිෂන් සභාව දැඩිව නිර්දේශ කරයි. ඉ. මෑතක දී අවසන් වූ පළාත් පාලන ඡන්දයෙන් පසුව පුද්ගල මරණ සහ තුවාලවීම් ගණනාවක් ප්‍රතිඵලය වූ එකම දේශපාලන පක්ෂයේ දේශපාලකයින් දෙදෙනෙක් සම්බන්ධ වූ බරපතල වෙඩි තැබීමේ සිදුවීමක් පිළිබඳව මෙම වාර්තාව ලියනු ලබන අවස්ථාවේ දී කොමිෂන් සභාවට දැන ගැනීමට ලැබුනි. එවැනි ශෝචනීය දේශපාලකයින් විසින් නිරූපණය කළ එවැනි අන්‍යෝන්‍ය අවබෝධය නොමැතිකමේ ශෝචනීය තත්ත්වය සහ ගැටළු විසඳීම සඳහා එවැනි නිර්ලජ්ජිත ප්‍රචණ්ඩත්වයට යොමුවීම ජාතික සංහිඳියා ක්‍රියාවලියක් දියත් කරනු ලබන මෙවැනි අවස්ථාවක දී ජනතාවගේ නියෝජිතයින් වශයෙන් අපේක්ෂා කරනු ලබන ආදර්ශයක් නොවේ. (8.186 - පිටුව 300) • දේශපාලන පක්ෂ සහ සංවිධාන සිදු කළ සැලකිය යුතු පැහැරගැනීම්, මංකොල්ලකෑම් සහ කප්පම්ගැනීම් කිහිපයක් වාර්තා වුව ද කිසිදු විමර්ශනයක් සිදු කර නොමැත. විශේෂයෙන්ම කරුනා සහ EPDP යන නම් සඳහන් වී ඇත. (8.187 - පිටුව 300) • මේජර් සීලන් විසින් සිදු කළ පැහැරගැනීම්, කප්පම් ගැනීම් සහ සංකොල්ලකෑම්. (8.188 - පිටුව 301) • කොමිෂන් සභාවේ අන්තර්කාලීන නිර්දේශ සම්පූර්ණයෙන්ම ක්‍රියාත්මක නොකිරීම පිළිබඳව කොමිෂන් සභාව කණගාටු වෙයි. (8.190 - පිටුව 302)

	• කොමිෂන් සභාව ස්වාධීන පොලිස් කොමිෂන් සභාවක් නිර්දේශ කරයි. (8.194 - පිටුව 302) <u>පාලනයේ ගැටළු</u> • කාලයත් සමඟ රජයේ ආයතන ප්‍රජාතන්ත්‍රවාදයට ඒකාබද්ධවීම දුර්වල වී ඇත. (8.196 - පිටුව 303) • දේශපාලකයින් සහ දේශපාලන ප්‍රභූවරු රාජ්‍ය බලය අනෙක් අයගේ අනර්ථය සඳහා ක්‍රියාත්මක කරයි. (8.198 - පිටුව 302) • ජනතාවගේ දුක්ගැනවිලි සම්බන්ධයෙන් කටයුතු කිරීම සඳහා කොමිෂන් සභාව මඟින් විශේෂ ආයතනයක් නිර්දේශ කරයි. මෙම කාර්යය ඉටු කිරීම සඳහා පරිපාලන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු කොමසාරිස්වරයා ප්‍රමාණවත් නොවේ. (8.201 - පිටුව 303) • විශේෂයෙන්ම වාර්ගිකත්වය හෝ ආගම පදනම් වූ, ඕනෑම විධායක හෝ පරිපාලන කටයුත්තකින් පැන නගින දුක්ගැනවිල්ලක් ඇති මේ රටේ ඕනෑම පුරවැසියෙකුට, ස්වාධීන ආයතනය ඉදිරියේ සහනයක් ලබා ගැනීමට අයිතිය තිබිය යුතුය. (8.202 - පිටුව 303) • දිස්ත්‍රික්ක සහ පළාත් මට්ටම්වලින් ස්ථාපිත කළ හැකි අන්තර් ආගමික සංහිදියාව සහ සාමය කමිටු විශේෂ ආයතනයේ කාර්යයන්ට සහාය වනු පිණිස පෝෂක යාන්ත්‍රණයක් ලෙස ක්‍රියා කළ යුතුය. (8.204 - පිටුව 304) • ව්‍යවස්ථාකරණය පිළිබඳ අධිකරණ සමාලෝචනය නොමැතිවීම ද කණස්සල්ලට කරුණකි. (8.205 - පිටුව 304) • පද්ධති සහ කාර්යපටිපාටි විශේෂයෙන්ම සුළුතරය ඇතුළු පුරවැසියන්ගේ සංවේදීතා සැලකිල්ලට ගත යුතුය. සම්පූර්ණ විනිවිදභාවය සහ ආණ්ඩුවේ තීරණ පිළිබඳ තොරතුරු සඳහන් විය යුතුය. (8.206 - පිටුව 304) • ජනතා සහභාගීත්වයෙන් සංවර්ධන කටයුතු සිදු කළ යුතුයි. (8.207 - 304 වන පිටුව) • රාජ්‍ය සේවයේ කාර්යයන් ආශ්‍රිත ආචාර ධර්ම වැඩිදියුණු කිරීම සඳහා පුහුණු වැඩසටහන් හරහා ආකල්පමය වෙනස්කම් ඇති කිරීම පිණිස නිශ්චිත වැඩපිළිවෙළක් සකස් කර ක්‍රියාත්මක කළ යුතු බව කොමිෂන් සභාව නිර්දේශ කරයි (8.208 - 305 වන පිටුව) • ස්වාධීන රාජ්‍ය සේවා කොමිෂන් සභාවක් පිහිටුවීමට කොමිසම තරයේ නිර්දේශ කරයි (8.210 —305 වන පිටුව) උතුරු පළාත නැවත සිවිල් පරිපාලනය යටතට පත් කළ යුතුය. (8.211 305 වන පිටුව) <u>බලය බෙදීමේ අවශ්‍යතාවය</u> • බලය බෙදීම සම්බන්ධයෙන් එවැනි සම්මුතියකට එළැඹීම සඳහා මහජනතාවගේ අදහස් හා සියලු දේශපාලන පක්ෂ වල සහයෝගීතාව ලබාගැනීම රජයේ මූලික වගකීම වේ. (8.213 - 305 වන පිටුව) • මිනිසුන්ගේ ප්‍රජාතන්ත්‍රවාදී බලගැන්වීම සිදු විය යුත්තේ මානව හිමිකම් ප්‍රවර්ධනය සහ ආරක්ෂා කිරීමේ පුළුල් රාමුව තුළ ය. (8.219 - 306 වන පිටුව) • බලය බෙදීම පිළිබඳ ගැටලුවට පිළියම් සෙවීමේ දී කරුණු දෙකක් කෙරෙහි රජයේ අවධානය යොමු විය යුතුය. ඉන් පළමුවැන්න නම්, බිම් මට්ටමේ වැඩි ජනතා සහභාගීත්වයක් සහතික කිරීම සඳහා පළාත් පාලන ආයතන සවිබල ගැන්වීම, දෙවනුව, පළාත් සභා ක්‍රමයේ ක්‍රියාකාරිත්වය තුළ දැකිය හැකි අඩුපාඩු වලින් උගත් පාඩම් ද මෙහි දී වැදගත් වේ. (8.220 - 306 වන පිටුව)

- සලකා බැලිය හැකි අතිරේක යාන්ත්‍රණයක් වන්නේ පළාත්වලින් තෝරාගත් නියෝජිතයන්ගෙන් සමන්විත දෙවන මණ්ඩලයක් පිහිටුවීමේ හැකියාවයි. (8.221 - 307 වන පිටුව)
- එබැවින් බලය බෙදීම සම්බන්ධයෙන් සම්මුතියක් සංවර්ධනය කිරීම පිණිස සද්භාවයෙන් ප්‍රයත්න දැරීම සඳහා වත්මන් අවස්ථාව ප්‍රයෝජනයට ගන්නා ලෙස කොමිෂන් සභාව නිර්දේශ කරයි. (8.225 - 307 වන පිටුව)

<u>භාෂා ප්‍රතිපත්තිය</u>

- භාෂාව පදනම් කර ගනිමින් වෙනසකට ලක් කිරීම සම්බන්ධයෙන් දෙමළ ප්‍රජාව මැසිවිලි නඟයි. (8.227 - 308 වන පිටුව)
- දහතුන්වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයෙන් පසුව භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් රජය කටයුතු කර නොමැත. (8.228 - 308 වන පිටුව)
- දෙමළ භාෂාව කතා කරන පොලිස් නිලධාරීන් බඳවා ගැනීම ප්‍රමාණවත් නැත. (8.229 - 308 වන පිටුව)
- ත්‍රෙභාෂා අධ්‍යාපන ක්‍රමය මගින් කුඩා කාලයේ සිට ම දරුවන්ට එකිනෙකා දැන හඳුනා ගැනීමට ත්, සංහිඳියාව ඇති කර ගැනීමට ත් හැකියාව ලැබේ. (8.223 - 309 වන පිටුව)
- එකිනෙකාගේ භාෂා ඉගෙනීම, පාසල් විෂය මාලාවේ අනිවාර්ය අංගයක් බවට පත් කළ යුතුය. (237 - 310 වන පිටුව)
- එබැවින් 2020 වසර වන විට ත්‍රෙභාෂික දේශයක් සඳහා වූ රජයේ මූලික පියවර කාලෝචිත බව කොමිෂන් සභාව පිළිගනියි. (3.239 —310 වන පිටුව)
- සියලුම රජයේ කාර්යාල වල සෑම අවස්ථාවක දී ම දෙමළ භාෂාව කතා කරන නිලධාරීන් සිටීම අනිවාර්ය කළ යුතුය. (8.241 —310 වන පිටුව)
- රාජ්‍ය භාෂා කොමිෂන් සභාව, යෝග්‍ය බලතල සහිත ක්‍රියාත්මක කිරීමේ අධිකාරියක් විය යුතු අතර, සෑම පළාතක ම එහි ශාඛා පිහිටුවිය යුතුය. (3.242 - 311 වන පිටුව)
- තාවකාලික පියවරක් ලෙස, දිගුකාලීන ප්‍රතිපත්ති සහ ක්‍රියාමාර්ග බලපවත්වන තෙක් එක් භාෂාවකින් තවත් භාෂාවකට පරිවර්තනය කිරීම සඳහා මෘදුකාංග වැඩසටහන් භාවිතා කළ හැකිය. (8.243 - 311 වන පිටුව)

අධ්‍යාපනය:- සමාන අවස්ථා:- පාසල් වලට ඇතුළත් කර ගැනීම:-

- වාර්ගික හෝ ආගමික හේතු මත සිසුන් නුසුදුස්සන් කිරීම සංහිඳියාව සම්බන්ධයෙන් යහපත් බලපෑම් ඇති නොකරයි. එවැනි ඕනෑම චර්යාවක් වැළැක්විය යුතුය. (8.246 —311 වන පිටුව)
- එබැවින්, අනාගත පරම්පරාවේ යහපත උදෙසා, කුසලතා මත පදනම් වූ ඇතුළත් කර ගැනීමේ ක්‍රමයක් හඳුන්වාදීම පිණිස මෙම කෝටා ක්‍රමය පිළිබඳව සුපරීක්ෂාකාරී සමාලෝචනයක් සිදු කිරීම කාලෝචිත වනු ඇත. (8.248 - 311 වන පිටුව)
- අධ්‍යාපන පහසුකම් සාධාරණ ලෙස බෙදා හැරීමේ ප්‍රබල වැඩපිළිවෙලක් රජය විසින් සක්‍රීය ලෙස ක්‍රියාත්මක කළ යුතුය. (8.249 - 312 වන පිටුව)

- විවිධ ජනවාර්ගික සහ ආගමික පසුබිම්වල දරුවන්ට අධ්‍යාපනය ලබා දෙන මිශ්‍ර පාසල් සංකල්පය දිරිමත් කිරීම සඳහා රජයට පෙරටුගාමී ප්‍රතිපත්තියක් තිබිය යුතුය. (8.250 —312 වන පිටුව)
- විවිධ පළාත් වල පාසල් අතර හවුල්කාරිත්වයක් ඇති කිරීම, ශිෂ්‍ය හුවමාරු වැඩසටහන් සහ පාසල්වල ප්‍රතිසන්ධාන සමාජ පිහිටුවීම වැනි යාන්ත්‍රණයන් තුළින් සිසුන් අතර වැඩි අන්තර් ක්‍රියාකාරිත්වයක් ඇති කිරීම සඳහා සෑම ප්‍රයත්නයක් ම දැරිය යුතුය. මීට අමතරව, ජාතික තරුණ සේවා සභාව විසින් තරුණ පිරිස් ඉලක්ක කරගත් වඩාත් ඵලදායී හුවමාරු වැඩසටහන් අනුගමනය කළ යුතුය. (8.252 - 312 වන පිටුව)

<u>සාමය පිළිබඳ අධ්‍යාපනය ලබාදීම</u>

× රජයේ ක්‍රියාකාරී සහභාගීත්වය සහිත ව පාසල් විෂය මාලාවට සාමය පිළිබඳ අධ්‍යාපනය හඳුන්වා දිය යුතුය. (8.253 - 312 වන පිටුව)

- ප්‍රායෝගිකව හැකි තාක් දුරට එකම පන්ති කාමරයේ අන්තර් ක්‍රියාකාරිත්වයන් දිරිමත් කළ යුතුය. කෙසේ වෙතත්, විවිධ භාෂා වලින් උගන්වන විෂයයන් සඳහා ඔවුන් විවිධ පන්ති කාමරවලට මාරු කළ හැකිය. (8.257 —313 වන පිටුව)
- රාජ්‍ය විශ්වවිද්‍යාලවල භාෂා තුනෙන්ම අධ්‍යනය කළ හැකි පාඨමාලා තෝරාගැනීමක් සහිත ව ජනවාර්ගික වශයෙන් මිශ්‍ර ශිෂ්‍ය ජනගහනයක් ඇති කිරීමට අවශ්‍ය පියවර ගත යුතුය. (8.258 - 314 වන පිටුව)
- අන්තර් පළාත් මට්ටමින් ක්‍රීඩා තරඟාවලි පැවැත්විය යුතු අතර විශේෂයෙන් උතුරු නැගෙනහිර පළාත් වල සහ දිවයින පුරා, වැදගත් ජාතික ක්‍රීඩා තරඟ පැවැත්විය යුතු බවට කොමිසම නිර්දේශ කරයි. (8.29 —314 වන පිටුව)
- සමහර 'දෙමළ ඩයස්පෝරා කණ්ඩායම්' පුළුල් ප්‍රතිසන්ධාන ප්‍රයත්නයන් සඳහා සාධනීය ලෙස දායක වීමට උත්සාහ දරන අතර, විශේෂයෙන් ම, එල්ටීටීඊයට සහාය දක්වන්නන් වශයෙන් ඇතැමුන් විසින් ප්‍රකාශ කරනු ලබන අනෙකුත් ඩයස්පෝරා කණ්ඩායම්, විරුද්ධවාදී ප්‍රවේශයක් අනුගමනය කරන බව කොමිසමේ අවධානයට යොමු වී ඇත. (8.260 - 314 වන පිටුව)
- සතුරු ඩයස්පෝරා කණ්ඩායම්වල තර්ජනය අක්‍රීය කිරීමේ මූලික ක්‍රමවේද:

  අ. බලය බෙදීම සහ අනෙකුත් දුක්ගැනවිලි සම්බන්ධයෙන් සුළු පක්ෂ වලින් තේරී පත් වූ නියෝජිතයන් අර්ථවත් සංවාදයකට සම්බන්ධ කර ගැනීම

  ආ. තවමත් එදිරිවාදී ආකල්ප සහ දෙකඩ වීමේ එල්ටීටීඊ මතවාද දරන කණ්ඩායම් සමග විධිමත් පරිදි සම්බන්ධ වීම.

  ඇ. අන්තර්ජාතික ප්‍රජාව සමග ක්‍රියාශීලී රාජ්‍ය තාන්ත්‍රික ක්‍රියාමාර්ග වලට පිවිසීම.

  ඈ. ශ්‍රී ලංකාවේ ආයෝජනය කිරීම සඳහා සහ වැඩ කිරීම සඳහා කැමති විදේශිකයන් කෙරෙහි වඩාත් නිදහස් ප්‍රතිපත්ති සහ ආකල්ප හඳුන්වාදීම. (8.262 - 315 වන පිටුව)
- විදේශගත ප්‍රජාවගේ මතු අපේක්ෂිත අවස්ථා ප්‍රයෝජනයට ගැනීම සඳහා සහ ඊනියා සතුරු ඩයස්පෝරා කණ්ඩායම් වල කටයුතු අක්‍රීය කිරීම සඳහා ක්‍රියාකාරී වැඩපිළිවෙළක් යෝජනා කිරීම පිණිස ජනාධිපති ලේකම් කාර්යාලය, විදේශ කටයුතු අමාත්‍යාංශය, ආරක්ෂක අමාත්‍යාංශය, විදේශ රැකියා නියුක්ති කාර්යාංශය, පෞද්ගලික අංශය සහ විද්වතුන් ඇතුළත් බහු ආංශික කාර්ය

	සාධක බලකායක් රජය විසින් පිහිටුවිය යුතු බවට කොමිෂන් සභාව නිර්දේශ කරයි. (8.265 - 315 වන පිටුව) **<u>අන්තර් ආගමික ක්‍රියාකාරකම් - සංහිඳියාව සඳහා ආගමේ කාර්යභාරය</u>** • නාඳුනන මැර කල්ලි විසින් පූජනීය ස්ථාන විනාශ කළ මෑත කාලීන සිදුවීම් කිහිපයක් පිළිබඳව කොමිසම දැඩි කනස්සල්ල පළ කරන ලදී. (8.26 - 316 වන පිටුව) • එවැනි විනාශකාරී සිද්ධීන් වැළැක්වීම සඳහා දැඩි නිවාරක ක්‍රියාමාර්ග ගත යුතුය. (8.269 - 316 වන පිටුව) • මෙම සන්දර්භය තුළ, එවැනි සන්ධානගත සහ සාමූහික ක්‍රියාමාර්ග සැලසුම් කිරීම සහ ක්‍රියාත්මක කිරීම මගින්, වාර්ගික හා ආගමික සහජීවනය ප්‍රවර්ධනය කිරීමේදී අන්තර් ආගමික කණ්ඩායම් වලට ඉටු කළ හැකි ඵලදායී කාර්යභාරය පිළිබඳව අවධාරණය කිරීමට කොමිෂන් සභාව අපේක්ෂා කරයි. (8.272 —316 වන පිටුව) • පූර්ව අනතුරු ඇඟවීමක් වශයෙන් සහ කලින් සන්නිවේදනය කිරීමේ ක්‍රියා පටිපාටියක් වශයෙන් රජයේ අධිකාරය යටතේ, අන්තර් ආගමික කණ්ඩායම් වල එකඟතාව සහිත ව එවැනි යාන්ත්‍රණයක් ස්ථාපිත කිරීම සඳහා රජය විසින් පහසුකම් සැලසිය යුතු බවට කොමිෂන් සභාව නිර්දේශ කරයි. (8.274 - 317 පිටුව) **<u>සංහිඳියාව ප්‍රවර්ධනය කිරීමේ මාර්ග වශයෙන් භාෂාමය සහ සංස්කෘතික බැඳීම්</u>** • සෑම පක්ෂයක ම දේශපාලකයන් විසින් තම වසමට පමණක් සීමා වූ පටු සම්බන්ධතාව ඉවත් කර එම ක්‍රියාවලිය සාර්ථක කර ගැනීම සඳහා පොදු එකඟතාවකින් යුක්ත ව නායකත්වය සපයන්නේ නම් මෙම විචක්ෂණශීලී පොදු කරුණු සංහිඳියාව සහ සාමය ගොඩනැංවීමේ ස්ථායී ක්‍රියාවලියකට වඩාත් හොඳ පෙර නිමිත්තක් සපයන බැවින්, රටේ අති ගෞරවනීය ආගමික නායකයින්, කලාකරුවන් සහ නිවැරදි චින්තනයක් සහිත අනෙකුත් පුරවැසියන් අතර එවැනි පොදු පදනමක් ඇති කිරීම සම්බන්ධයෙන් කොමිසම සතුටට පත් විය. (8.290 - 320 වන පිටුව) **<u>ජාතික ගීය</u>** • දෙමළ භාෂාවෙන් ඇති ප්‍රධාන සාහිත්‍ය කෘති, සිංහලට පරිවර්තනය කිරීමේ දී හා ප්‍රකාශයට පත් කිරීමේ දී මෙන්ම සිංහල සාහිත්‍ය කෘති දෙමළ භාෂාවට පරිවර්තනය කිරීම සහ ප්‍රකාශයට පත් කිරීම කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුය. එවැනි ප්‍රකාශන විශේෂයෙන් ම පාසල් සිසුන් සහ තරුණ තරුණියන් අතර බෙදා හැරීම මඟින් එකිනෙකාගේ සංස්කෘතීන් පිළිබඳ වැඩි අවබෝධයක් සහ සංවේදීතාවයක් ඇති කිරීම ඉතා වැදගත් වේ. (8.294 - 321 පිටුව) • ජාතික ගීය පිළිබඳ ප්‍රශ්නයේදී ද ජාතික ගීය භාෂා දෙකෙන්ම එකම අවස්ථාවේ දී එකම තාලයකට අනුව ගායනා කිරීමේ පුරුද්ද ඇති කළ යුතුය.. (8.296 - 321 වන පිටුව) **<u>පුද්ගලයන් අතර අන්තර් සබඳතා</u>** කොමිෂන් සභාව මෙම මතය තරයේ අනුමත කරන්නේ, විශේෂයෙන්ම මුහුණට මුහුණ අන්තර් ක්‍රියාකාරකම් මඟින් සම්මුතින් ගොඩනැගීමට සහ සහජීවනය ප්‍රවර්ධනය කිරීම සඳහා දායකත්වයක් සපයන බැවින් එය මේ සඳහා යොදා ගත හැකි ඵලදායී මෙන්ම සඵල මෙවලමක් වන නිසාය. (8.297 - 322 වන පිටුව)

	<u>දේශපාලන සම්මුතියක අවශ්‍යතාව</u> • මේ රටේ ස්වෛරීභාවය දෙකඩ කළ එදිරිවාදී දේශපාලනය තුළින් දේශපාලන පක්ෂ ඇත්ව සිටීම අතිශයින් වැදගත් ය. සියලු ජන කොටස් වලට අයත් දේශපාලනඥයන් විසින් මැතිවරණ වාසි තකා සිදු කරන ජනවර්ග කේන්ද්‍ර කරගත් දේශපාලනය මඟින් ප්‍රජාවන් දෙකඩ කරන අතර අසමගිය ද ඇති කරයි. අත්‍යවශ්‍ය ජාතික ගැටලු සම්බන්ධයෙන් සම්මුතිවාදී දේශපාලනය හරහා විවිධ ප්‍රජාවන් අතර සංහිඳියාව ගොඩනැගීම පිණිස අවශ්‍ය නායකත්වය සහ මඟ පෙන්වීම පිළිබඳ හැඟීමක් දේශපාලනඥයන් විසින් ලබා දිය යුතුය. (8.302 - 323 වන පිටුව) • පසුගිය දශක හතරේ සිට පහ දක්වා කාලය තුළ ප්‍රධාන වාර්ගික අසමගියට 'වෛරී ප්‍රකාශ' හේතු පාදක වූ අවස්ථා බොහෝමයක් ඇති බව කොමිසම නිරීක්ෂණය කරයි. වාර්ගිකත්වය, ආගම සහ සාහිත්‍ය සම්බන්ධ 'වෛරී ප්‍රකාශ' මඟින් වාර්ගික හා ආගමික නොරිස්සුම් සහිත බව උග්‍ර කරන අතර අසමගිය සහ ගැටුම් ඇති කරයි. එබැවින් එවැනි භාවිතයන් සම්බන්ධයෙන් කටයුතු කිරීම සඳහා නිවාරක නීති පැනවිය යුතු අතර මෙම නීති දැඩි ලෙස ක්‍රියාත්මක කළ යුතුය.(8.302 —323 වන පිටුව) • එබැවින්, ඛේදනීය ගැටුම් වලට ගොදුරු වූ සියලු දෙනා වෙනුවෙන් එකමුතුකම, සහයෝගීතාවය සහ සංවේදනය ප්‍රකාශ කිරීම සඳහා ජාතික දිනයේ දී විශේෂ අවස්ථාවක් වෙන් කළ යුතු බව කොමිසම දැඩි ලෙස නිර්දේශ කරයි. නැවතත් රට තුළ එවැනි ලේ වැගිරීමක් කෙදිනකවත් සිදු නොවිය යුතු බව සාක්ෂාත් කිරීම සඳහා සාමූහික ව කැපවන බවට ප්‍රතිඥා දිය යුතුය. (8.304 - 324 වන පිටුව) • පසුගිය කොමිෂන් සභා වාර්තාවල නිර්දේශ ක්‍රියාත්මක නොවූ පරිදි, මෙම නිර්දේශ ද ක්‍රියාත්මක නොකරනු ඇතැයි යන්න සම්බන්ධයෙන් කොමිසම සැලකිලිමත් වේ. (8.305 - 324 වන පිටුව)
9 වැනි පරිච්ඡේදය - ප්‍රධාන නිරීක්ෂණ සහ නිර්දේශ	**<u>සටන් විරාමය සම්බන්ධ නිරීක්ෂණ</u>** • දශක ගණනාවක් තිස්සේ ත්‍රස්තවාදයෙන් සහ ප්‍රතිප්‍රචණ්ඩත්වයෙන් පීඩා විඳි ජනතාවට මෙන් ම රටට ද සටන් විරාම ගිවිසුම මඟින් කෙටිකාලීන සහනයක් ලබාදුන් නමුත් දිගුකාලීන සාමයකින් එය අවසන් නොවීය. (9.1 - 327 වන පිටුව) • එල්.ටී.ටී.ඊ සංවිධානය සටන් විරාම ගිවිසුමෙහි පැවති සංකල්පික සහ ක්‍රියාත්මීකරණ ඌණතා පැහැදිලිව ම සිය වාසියට හරවා ගන්නා ලදී. භෞමික ප්‍රතිඵල අත්කර ගනිමින් එමඟින් තමන්ට පිළිගැනීම ද දිනා ගන්නා ලදී. සම තත්වයෙන් සහ පරස්පරතාවන් නොමැතිකමෙන් වාසි අත්පත් කර ගන්නා ලදී. (9-3 - 327 වන පිටුව) **<u>යුධ ගැටුම්වල අවසාන අදියරට අදාළ ජාත්‍යන්තර මානුෂීය මානව නීති ගැටලු පිළිබඳ නිරීක්ෂණ සහ නිර්දේශ:-</u>** • එල්.ටී.ටී.ඊ සංවිධානයේ පාලනය යටතේ පැවති ප්‍රදේශ නැවත අත්පත් කරගැනීම සඳහා අනුගමනය කරන ලද යුධ උපායමාර්ග මනාව සංකල්පනය කරන ලද එකක් බවට කොමිසම සෑහීමකට පත්වේ.(9-4 —328 වන පිටුව) • මිලිටරි මෙහෙයුම් ක්‍රියාවට නැවීම සඳහා ප්‍රතිපත්තියක් සකස් කිරීමේ දී සිවිල් වැසියන්ගේ ජීවිත ආරක්ෂා කිරීම ප්‍රධාන සාධකයක් වූයේය යන ස්ථාවරය සමග මෙම සාධක ගැලපේ. වැඩිදුර පරීක්ෂණ පැවත්වීම අවශ්‍ය කරන විශේෂිත සිදුවීම්

පිළිබඳව ඉහත 4 වන ඡේදයේ II කොටසෙහි (4.106, 4.107. 4.109, 4.110 සහ 4.111 ඡේද බලන්න) සඳහන් වන නමුත්, සිවිල් වැසියන් හිතාමතා ඉලක්ක කර ගැනීම ප්‍රතිපත්තියේ අවශ්‍ය කොටසක් විණැයි කෙරෙන ඕනෑම යෝජනාවකට මෙම සාධක බාධකයක්ව පවතී. (9-5 - 328 වන පිටුව)

<u>යුධ මුක්ත කලාප</u>

- තමන් හමුවේ ඇති සියලු කරුණු සැලකිල්ලට ගත් කොමිසම, වෙඩි හුවමාරුවල දී සිවිල් වැසියන්ට සැබවින්ම හානි සිදුවුණ ද ආරක්ෂක හමුදා යුධ මුක්ත කලාප වල සිටි සිවිල් වැසියන් හිතාමතා ම ඉලක්ක කර නොගත් බව නිගමනය කරයි. (9.6 - 328 වන පිටුව)
- ඉහත විස්තර කරන ලද පරිදි එළඹී තත්ත්වයෙහි පැවති සංකීර්ණතාව සැළකිල්ලට ගෙන කොමිසම විසින් සියලු අංශ පිළිබඳව ඉතා හොඳින් සලකා බැලීමෙන් අනතුරුව, කොමිසමේ අදහස වූයේ ආරක්ෂක හමුදාවන්ට වෙනත් විකල්පයක් නොතිබූ බැවින් සහ එම තත්ත්වයන් තුළ ප්‍රායෝගික ව කළ හැකි සියලු "ඵලදායී පූර්වාරක්ෂක ක්‍රියාමාර්ග" ගෙන තිබූ බැවින් ඔවුන් පෙර නොවූ විරූ තත්ත්වයකට මුහුණ පා සිටි බවය. (9-7 - 328 වන පිටුව)

<u>සිවිල් වැසියන් මරණයට පත්වීම හෝ තුවාල සිදුවීම පිළිබඳ විශේෂිත උදාහරණ</u>

- සිවිල් වැසියන්ගේ ජීවිත අහිමි වීම සම්බන්ධයෙන් කොමිසමේ අවධානයට ලක්කර තිබෙන ඇතැම් සිදුවීම් ප්‍රතිනිර්මාණය කිරීමට ප්‍රයත්න දැරීමේ දී කොමිසම ද සමාන දුෂ්කරතාවයන්ට මුහුණ දෙයි. ඉහත 4 පරිච්ඡේදයේ II වන කොටසෙහි විස්තර කරන ලද පරිදි (4.106, 4.107, 4.109, 4.110, සහ 4.111 ඡේද බලන්න) එවැනි සිදුවීම් හට ගත්තේ කවර නිශ්චිත තත්ත්වයන් යටතේ දැයි තීරණය කිරීමේ දී කොමිසම දුෂ්කරතාවන්ට මුහුණ දුන්න ද හානි කිරීමේ අදහසින් තොරව හෝ සිවිල් වැසියන්ට මරණ හෝ තුවාල සිදු කිරීම සම්බන්ධයෙන් ආරක්ෂක හමුදා වගකිව යුතු බවක් තොරතුරු වලින් කිසිසේත් ම නොඇඟ වේ. එවැනි සිදුවීම් හට ගත හැක්කේ කවර තත්ත්වයන් යටතේ දැයි වඩාත් විස්තරාත්මක ලෙස සොයා දැන ගැනීමට ත්, අයුතු කල්ක්‍රියාවක් පැවතිනැයි එවන් පරීක්ෂණ වලින් හෙළිදරව් වන්නේ නම් වැරදිකරුවන්ට එරෙහිව චෝදනා ඉදිරිපත් කොට දඬුවම් පැමිණවීමට ත් රජයේ පාර්ශවයෙන් යුතුකමක් ඇතැයි කොමිසම අවධාරණය කර සිටී. (9.9-329 වන පිටුව)

<u>රෝහල්/තාවකාලික රෝහල්</u>

- හානි සහ තුවාල හෝ මරණ සිදු කරමින් රෝහල් වලට ෂෙල් වෙඩි ප්‍රහාර එල්ල වූ බවට කොමිසම පිළිගනී. කෙසේ වෙතත්, කොමිෂන් සභාව හමුවේ ඉදිරිපත් කර තිබූ කරුණු වලට අනුව කාලය, නිශ්චිත ස්ථානය සහ වෙඩි තැබූ දිශාව අනුව සළකා බැලීමේ දී එකී සිදුවීම්වල නිශ්චිත ස්වභාවය පිළිබඳව තරමක් ව්‍යාකූල චිත්‍රයක් පෙන්වා දෙයි. (9.10 - 329 වන පිටුව)
- <u>කොමිෂන් සභාව මුහුණ දුන් දුෂ්කරතා:</u>

  අ. ගැඹුරු විශ්ලේෂණයක් සහිත ක්ෂණික විමර්ශනයක් ආරම්භ කර නොතිබුණි.

  ආ. රෝහල්වලට පතිත වූ ෂෙල් වෙඩි ප්‍රහාර එල්ල කරන ලද්දේ ශ්‍රී ලංකා යුධ හමුදාවෙන් ද නැතහොත් එල්.ටී.ටී.ඊ පාර්ශවය විසින් ඉලක්ක කරන ලද ඒවා ද යන්න නිශ්චිතව ම තහවුරු කළ හැකි තත්ත්වයක තමන් සිටින බව ප්‍රකාශ කිරීමට කොමිසම හමුවේ පෙනී සිටින කිසිවකුට නොහැකි විය. (9.13 — පිටුව වන 330)

- ඇත්ත වශයෙන්ම රෝහල් වලට අලාභහානි සිදු කරමින් සහ ඇතැම් අවස්ථාවල දී සිවිල් ජීවිත වලට හානි හෝ තුවාල සිදු කරමින් රෝහල් මතට ෂෙල් වෙඩි ප්‍රහාර එල්ල වී ඇති බවට සිවිල් වැසියන් විසින් අවස්ථා ගණනාවක දී ප්‍රකාශ ඉදිරිපත් කර ඇත. ප්‍රතිසන්ධාන ක්‍රියාවලිය කෙරෙහි විශ්වාසය ඇති කෙරෙන මානුෂීය පියවරක් ලෙස නිසි පරීක්ෂණයකින් පසු විපතට පත් වූවන්ට සුදුසු සහන කඩිනමින් ලබා දීම පිළිබඳව නිසි සැලකිල්ල යොමු කළ යුතුය. (9.14 - 330 වන පිටුව)

<u>ගැටුම් පැවති ප්‍රදේශවල ජීවත් වූ සිවිල් වැසියන්ට ආහාර සහ ඖෂධ ඇතුළු මානුෂීය සහන සැපයීම</u>

- 2009 වසරේ මුල් භාගය දක්වා, එල්ටීටීඊ්ය විසින් රඳවාගෙන සිටි සිවිල් වැසියන්ට ආහාර සැපයීම සාධාරණ ලෙස ප්‍රමාණවත් මට්ටමක පැවති බව කොමිසම සඳහන් කරයි. කෙසේ වෙතත්, ගැටුම් තීව්‍ර වීමත් සමග 2009 වසරේ පෙබරවාරි, මාර්තු, අප්‍රේල් සහ මැයි මස පළමු භාගය තුළ දී මෙම මට්ටම් සැළකිය යුතු පරිදි අඩු වී ඇති බව පෙනේ. (9.15 - 330 වන පිටුව)
- එල්.ටී.ටී.ඊ් ය විසින් ප්‍රාණ ඇපකරුවන් ලෙස රඳවාගෙන සිටි සිවිල් වැසියන්ගේ ඇස්තමේන්තුගත ලේඛන අදාළ සිවිල් බලාධිකාර වලින් ලබාගත් ලේඛනගත සාක්ෂි සමග සත්‍යාපනය කිරීමට කොමිෂන් සභාව උපරිම උත්සාහයක් ගත්තද, කිසිදු ආකාරයක මුල් ප්‍රලේඛනයක් ලබා ගැනීමට කොමිසමට නොහැකි වී ඇත. (9.20 - 331 වන පිටුව)

<u>වෛද්‍ය සැපයුම්</u>

- කොමිසම හමුවේ පවතින කරුණුවල අවිනිශ්චිත ස්වභාවය සැලකිල්ලට ගෙන, යුධ ගැටුම්වල අවසන් දින වල දී ගැටුම් පැවති ප්‍රදේශ වල සිවිල් වැසියන් හට වෛද්‍ය සැපයුම් ලබාදීම පිළිබඳ ව පැන නැගී ඇති ප්‍රශ්නය සම්බන්ධයෙන් මානුෂීය කරුණු මත නිසි සැලකිල්ල යොමු කිරීමෙන් අනතුරුව ඒ සම්බන්ධයෙන් වැඩිදුර පරීක්ෂණයක් අවශ්‍ය වන බවට කොමිසම පිළිගනී. (9.22 - 332 වන පිටුව)

<u>යටත් වීමෙන්/අත්අඩංගුවට ගැනීමෙන් පසු සිදු වුනා යයි කියනු ලබන අතුරුදන්වීම් පිළිබඳ චෝදනා</u>

- (4 වන පරිච්ඡේදයේ II කොටසේ 4.242 සිට 4.258 දක්වා ඇති පරිදි) ඇතැම් පුද්ගලයන් යුද හමුදා අත්අඩංගුවට පත් වන බව තමන් නිශ්චිතව ම දුටු බව ප්‍රකාශ කළ පුද්ගලයන් ගණනාවකගේ කරුණු දැක්වීම් සම්බන්ධයෙන් කොමිෂන් සභාව ස්වකීය අවධානය යොමු කරන ලදී. එවැනි නිශ්චිත චෝදනා සම්බන්ධයෙන් අවශ්‍ය පරීක්ෂණ පැවැත්වීම සහ එම පරීක්ෂණ මගින් යුද හමුදාවේ තනි තනි සාමාජිකයන්ගේ පාර්ශවයෙන් යම් නීති විරෝධී ක්‍රියාවන් සිදුවූ බවට සාක්ෂි ඉදිරිපත් වන්නේ නම්, අදාළ වැරදිකරුවන්ට එරෙහිව චෝදනා ඉදිරිපත් කොට නඩු පැවරීම සහ දඬුවම් කිරීම රජයේ පූර්ණ වගකීම බව කොමිසම අවධාරණය කරයි. (9.23 - 332 පිටුව)

<u>එල්.ටී.ටී.ඊ් සංවිධානයේ කල් ක්‍රියාව</u>

- විශේෂයෙන්ම යුධ මුක්ත කලාප සම්බන්ධයෙන් එල්.ටී.ටී.ඊ් සංවිධානය විසින් ජාත්‍යන්තර මානුෂීය නීතියේ හර මූලධර්ම බරපතල ලෙස උල්ලංඝනය කිරීම පිළිබඳ තොරුතරු 4 වන පරිච්ඡේදායේ II කොටසේ සඳහන් කර ඇත. කෙසේ වෙතත්, සමාප්ති නිරීක්ෂණ වශයෙන්, පහත සඳහන් කරුණු අනාවරණය කිරීම කොමිසම සතු වගකීමකි.

	අ. තම මිලිටරි මූලෝපාය තවදුරටත් ඉදිරියට ගෙන යාම සඳහා සිවිල් වැසියන් මිනිස් පළිහක් ලෙස යොදා ගැනීම පිළිබඳ සැබෑ කරුණු මෙන්ම, ආ. සාමාන්‍ය පුරවැසියන් රැඳී සිටි මධ්‍යස්ථාන තුළ යුධ උපකරණ ස්ථානගත කිරීම සහ භාවිතා කිරීමේ චර්යාවන් පවත්වාගෙන යාම. ඇ. ආරක්ෂිත ප්‍රදේශවලට පලා යාමට උත්සාහ දරමින් සිටි සිවිල් වැසියන්ට වෙඩි තැබීම. ඈ. යුධ ගැටුම් වල අවසන් අදියරේ දී පවා, සටනෙහි යෙදවීම සඳහා තරුණ ළමුන් බලාත්කාරයෙන් හමුදාවට බඳවා ගැනීම. ඉ. සිවිල් වැසියන් අනතුරට ලක්වීමට ඉඩ ඇති බව දැන දැන ම යුධ ගැටුම් පවතින කලාපයෙන් පිටත පවා බිම් බෝම්බ සහ ක්ෂණ නිර්මිත පිපුරුම් ද්‍රව්‍ය ස්ථානගත කිරීම. ඊ. තම යුධ අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා ඔවුන්ට අවශ්‍ය උපකාරක සේවා සැපයීම පිණිස සිවිල් වැසියන් බලාත්කාරයෙන් යොදා ගැනීම. එමඟින්, විශේෂයෙන්ම සෙනග එක්රැස් වී තදබදය පැවති අවසන් යුධ මුක්ත කලාප වල දී සිවිල් වැසියන් සහ සටන්කරුවන් පැහැදිලිව හඳුනාගැනීමට නොහැකි වීම සඳහා උපක්‍රමශීලී ව කටයුතු කිරීම; සහ උ. අහිංසක සිවිල් වැසියන්ගේ ජීවිත අහිමි කරමින් මරාගෙන මැරෙන ප්‍රහාර අඛණ්ඩ ව එල්ල කිරීම. (9.25-333 වන පිටුව) • චෝදනා ඉදිරිපත් කිරීම සඳහා විමර්ශන තුළින් බැලූ බැල්මට පිළිගත හැකි සාක්ෂි සහ වැදගත් කරුණු අනාවරණය වන එල්.ටී.ටී.ඊ. සාමාජිකයන්ට එරෙහි ව චෝදනා ගොනු කිරීමේ දී, මූලික මානව හිමිකම් සහ ජාත්‍යන්තර මානුෂීය නීතියේ හර මූලධර්ම උල්ලංඝනය කර ඇති පිරිස් වලට එරෙහිව නිසි සැළකිල්ල යොමු කළ යුතුය. එවැනි අපරාධ වල බරපතළ ස්වභාවය සැළකිල්ලට ගෙන ඊට සරිලන දඬුවමක් ලබා දිය යුතුය. (9.26-333 වන පිටුව) **<u>ජාත්‍යන්තර මානුෂීය නීති, අභ්‍යන්තර ගැටුම් සම්බන්ධයෙන් අදාළ කර ගැනීමේ දී ඉදිරිපත් කරන ලද නිරීක්ෂණ</u>** • සිවිල් ආරක්ෂක කලාප ඇතුළත ස්ථාපිත කර ඇති මිලිටරි ස්ථාන අක්‍රීය කිරීම අවශ්‍ය වන අවස්ථාවන් වල, රාජ්‍ය නොවන සන්නද්ධ කණ්ඩායම් වල සටන් මූලෝපායන්ට මුහුණ දීම සඳහා රජයට බල කෙරෙන අවස්ථා වල දී සිවිල් වැසියන් ද දරුණු අනතුරු වලට භාජනය වේ. (9.27-333 වන පිටුව) • සිවිල් වැසියන්ගේ ආරක්ෂාව සඳහා සපයා ඇති එවැනි කලාප සාකච්ඡාවෙන් ප්‍රකාශයට පත් කිරීම සඳහා එකඟ වන ලෙස රාජ්‍ය නොවන සන්නද්ධ කණ්ඩායම් වලට කවර හෝ අභිප්‍රායක් නොමැත. එහෙත් රජය, ඒක පාර්ශ්වික ව එවැන්නක් ප්‍රකාශයට පත් කළ විට ඒවා තම සටන් මූලෝපාය සහ මෙහෙයුම් පෙරට ගෙන යාම සඳහා ප්‍රයෝජනයට ගන්නා අවස්ථා වල දී (උදාහරණයක් ලෙස:- කලාපය තුළ සිටින සිවිල් වැසියන් විසින් මිනිස් පලිහක් ලෙස යොදා ගැනීම) රජය සහ ක්ෂේත්‍ර ආඥාපතිවරු එක් අතකින් සිවිල් වැසියන් ආරක්ෂා කිරීමේත්, අනෙක් අතින් යුධ මුක්ත කලාපයෙන් එල්ල කරන සතුරු ප්‍රහාර අක්‍රීය කිරීමේත් උභතෝටික ගැටලුවට මුහුණ දෙති. (9.28-334 වන පිටුව) • අභ්‍යන්තර ගැටුම්කාරී තත්ත්වයන් තුළ දී පවත්නා ජාත්‍යන්තර මානුෂීය නීතීන්ට එල්ලවන සමකාලීන අභියෝගවලට විසඳුම් සෙවීමේ දී එවැනි තත්ත්වයන් සම්බන්ධයෙන් කටයුතු කිරීම සඳහා නිසි ප්‍රමිතීන් සහ ක්‍රියා පටිපාටි සම්පාදනය කිරීමේ දැඩි අවශ්‍යතාවයක් මතු විය.

- 4 වන පරිච්ඡේදයේ විස්තර කර ඇති පරිදි අභ්‍යන්තර ගැටුම් මඟින් ඉස්මතු වන සියලුම සංකීර්ණතා සහ අභියෝග සැලකිල්ලට ගනිමින්, රජය සහ රාජ්‍ය නොවන සන්නද්ධ කණ්ඩායම් අතර ගැටුම් සම්බන්ධයෙන් බලපවත්නා නීතිමය රාමුවක් ගොඩනැංවීම මඟින් රාජ්‍ය නොවන සන්නද්ධ කණ්ඩායම්, ජාත්‍යන්තර මානුෂීය නීතියේ මූලධර්ම වලට වඩාත් අනුකූල වීම සහතික කිරීමෙහි ලා විසඳුමක් සැපයිය හැකිය. (9.31-334 වන පිටුව)
- යුධ ගැටුම් ආශ්‍රිතව ගොදුරු බවට පත් වූ සියලුම වින්දිතයන් සම්බන්ධයෙන් අන්තර්ජාතික ප්‍රජාවේ වගකීම ඉටු කිරීම සඳහා මෙම අත්දැකීම් පාදක කර ගනිමින් ප්‍රබල නීතිමය කාර්ය රාමුවක් සම්පාදනය කිරීම පැහැදිලිව ම අවශ්‍යතාවයක් බවට පත්ව ඇත. (9.32-334 වන පිටුව)

<u>තුවාලකරුවන් පිළිබඳ ගැටළුව සම්බන්ධ නිරීක්ෂණ සහ නිර්දේශ</u>

- මිනිස් පලිහකට මුවා වී ආරක්ෂාව සොයමින් සිටි මරාගෙන මැරෙන ඇදහිලි පදනම් කර ගත් ත්‍රස්තවාදී කණ්ඩායමක් අක්‍රීය කිරීමේ සංකීර්ණ අභියෝගයට ආරක්ෂක හමුදා මුහුණ දුන් ආකාරය කොමිසම අගය කරයි. (9.34-355 වන පිටුව)
- සත්‍ය අසත්‍යතාව පරීක්ෂා කිරීම සඳහා සිවිල් පරිපාලනයෙන් හෝ මිලිටරියෙන් ක්‍රියාත්මක කරන කිසිදු විධිමත් ක්‍රියාවලියක් නොපැවතීම මත තුවාලකරුවන් සංඛ්‍යාව සම්බන්ධයෙන් අනුමානාත්මක ස්වභාවයක් ගත් සත්‍යාපනය නොකල පුළුල් සාමාන්‍යකරණයට ලක් වූ තොරුතුරු ඉදිරිපත් කර ඇත. (9.35-335 වන පිටුව)
- එම නිසා පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් පියවර ගත යුතු බවට කොමිසම නිර්දේශ කර සිටියි.-

  අ) 4.359 vi (අ) සහ (ආ) නිරීක්ෂණවල දී සඳහන් කළ සුවිශේෂ සිදුවීම් සහ හිතාමතා ම සිවිල් වැසියන්ට ප්‍රහාර එල්ල කිරීම පිළිබඳව වාර්තාගත ඕනෑම සිදුවීමක් පරීක්ෂා කිරීම.

  ආ) ගැටුම් කාල පරිච්ඡේදය තුළ දී සිදු වූ සිවිල් මරණවල සහ තුවාලවල පරිමාණය පිළිබඳ නිසැක තොරතුරු දැන ගැනීම සඳහා, බලපෑමට ලක් වූ සියලු පවුල් ආවරණය කරමින් දිවයිනේ සියලු කොටස් තුළ වෘත්තීය වශයෙන් සැළසුම් කළ කුටුම්භ සමීක්ෂණයක් සිදු කිරීම. (9.37-335 වන පිටුව)

<u>"වැනල් 4" වීඩියෝව සම්බන්ධ නිරීක්ෂණ සහ නිර්දේශ</u>

- කොමිසම සතුව පහත දැක්වෙන නිරීක්ෂණ සහ නිර්දේශ ඇත.

  අ) රූපාවලියෙහි එන සිදුවීම් ''සැබෑ'' ඒවා වුනත් ''නිර්මිත''ඒවා වුනත්, එහි අඩංගු ඡායාරූප සැබැවින් ම බිහිසුනු අතර පිළිකුල් සහගතය.

  ආ) කෙසේ වුවද, ආණ්ඩුව මෙන්ම සබැඳියාකරුවන්ගේ විශේෂඥයින් ද පෙන්වා දෙන්නේ අපැහැදිලි ශිල්පීය විකෘතිතා කිහිපයක් වීඩියෝවේ පවතින බවයි.

  ඇ) වීඩියෝවේ සත්‍යතාව සම්බන්ධයෙන්, ස්වාධීන විශේෂඥයින්. එනම් ආචාර්ය චතුර ද සිල්වා සහ මහාචාර්ය ඊ.ඒ. ෆැන්ටිස් විසින් අවධාරණය කළ තවත් ශිල්පීය ගැටලු සහ අධිකරණ වෛද්‍ය ප්‍රශ්න පවතී.

  ඈ) විකාශනය කරන ලද රූපාවලියේ පිටපතක් නොමැතිකම මත එවැනි ශිල්පීය වෙනස්කම් පිළිබඳව තීරණාත්මක පැහැදිලි කිරීමක් අනාවරණය කර ගැනීමේ දී ගැටලු මතු වේ.

ඉ) මෙම වීඩියෝවේ සත්‍යතාව සහ අන්තර්ගතයේ විශ්වාසනීයත්වය පිළිබඳව සැලකිය යුතු තරමේ සැකයක් ඇති කරවන බවත් බැරෑරුම් ස්වභාවයක, වෙහෙසකර ශිල්පීය සහ අධිකරණ වෛද්‍යමය ගැටලු පවතින බවත් කොමිසම නිශ්චිත ව ප්‍රකාශ කරයි. අනතුරු වලට ගොදුරු වූවන්ගේ සිරුරුවල පැහැදිලිව පෙනෙන ප්‍රබල කම්පනය, හෝ ඒ සඳහා යොදා ගත් ආයුධයට සහ වෙඩි තැබීම සිදුවුන බව පෙනෙන සමීප පරාසයට එහි අනුරූප බවක් පෙනෙන්නට නොමැති බව ද සඳහන් කරයි. රූපාවලියේ කොටස් ස්වභාවික පරිසරයක් තුළ පටිගත කරන ලදැයි පෙනෙන බව සහ අනතුරට පාත්‍ර වූවන් යැයි කියනු ලබන ඇතැම් පුද්ගලයන්ගේ සිරුරු කායික ව හෝ ඩිජිටල් උපක්‍රම වලින් හසුරුවා කෘත්‍රිම ආකාරයෙන් නිර්මාණය කර ඇති කිසිවක් පෙන්නුම් නොකරන බව ද කොමිසම නිරීක්ෂණය කරයි.

ඊ) වඩා පුළුල් තොරතුරු සම්පාදනය කරන ලෙස කොමිසම කළ ඉල්ලීමට විකාශකයා ධනාත්මක ව ප්‍රතිචාර නොදැක්වීම පිළිබඳ ව කොමිසම කනගාටුව පළ කරයි.

ඉහත තොරතුරු සැලකිල්ලට ගන්නා කොමිසම සත්‍යය තහවුරු කර ගැනීම සඳහා මෙම වීඩියෝ රූපාවලියෙන් මතුවන චෝදනා පිළිබඳව ආණ්ඩුව, ස්වාධීන පරීක්ෂණයකට මුල පිරිය යුතු යැයි නිර්දේශ කරයි. (9.39-336 වන පිටුව)

- ඉහත නිර්දේශ කිරීම් සඳහා හේතු :- (9.40-336 වන පිටුව)
- මෙම චෝදනා වල සත්‍ය/අසත්‍යතාව සොයා බැලීමට හෝ වෙනත් ආකාරයකින් තහවුරු කර ගැනීම සඳහා, රටේ නීතියට අනකූල ව ක්‍රියාමාර්ග ගැනීම පිණිස ශ්‍රී ලංකා රජය මෙම ගැටලුව සම්බන්ධයෙන් ස්වාධීන පරීක්ෂණයක් ආරම්භ කළ යුතු බවට කොමිසම නිර්දේශ කරයි. (9.41-336 වන පිටුව)

<u>මානව හිමිකම් පිළිබඳ නිරීක්ෂණ සහ නිර්දේශ</u>

- යුධ ගැටුම් මත බලපෑමට ලක්වුනු ජනතාවගේ මූලික අයිතිවාසිකම් සහ නිදහස උල්ලංඝනය කිරීම් පිළිබඳව චෝදනා ඉදිරිපත් කෙරිණි. මේ යටතට, පැහැර ගෙන යාම්, බලාත්කාරී අතුරුදන් කිරීම්, අත්තනෝමතික ලෙස රඳවා ගැනීම, කුඩා දරුවන් බලෙන් හමුදාවට බඳවා ගැනීම, අධිකරණයෙන් බැහැරව හා නීතිමය පටිපාටියකින් තොරව වහාම හෝ අත්තනෝමතික ව මරණ දඬුවම පැමිණවීම, අදහස් ප්‍රකාශනය, යාමේ ඊමේ සහ සාමාගමයේ නිදහස අහිමි කිරීම, ආගමික නිදහස සහ මාධ්‍යයේ ස්වාධීනත්වය උල්ලංඝනය කිරීම ආදිය ඇතුළත් වේ. (9.42-338 වන පිටුව)

<u>සොයා ගත නොහැකි පුද්ගලයන්, අතුරුදන් වීම් සහ පැහැර ගෙන යාම සම්බන්ධ චෝදනා</u>

- පැහැර ගෙන යාම්, නීති විරෝධී ලෙස අත්අඩංගුවට ගැනීම්, අත්තනෝමතික ලෙස රඳවා ගැනීම් සහ අනිච්ඡානුග අතුරුදන් කිරීම් වල ප්‍රතිඵලයක් ලෙස ඇතැම් විට වසර ගණනාවක් තිස්සේ ආගිය තැනක් නොදන්නා අය සම්බන්ධයෙන් ප්‍රකාශ විශාල සංඛ්‍යාවක් ඉදිරිපත් කෙරිණි. (9.43-338 වන පිටුව)
- ප්‍රකාශ ඉදිරිපත් කළ බොහෝ පුද්ගලයන් කොමිසමට අවධාරණය කළේ, අතුරුදන් කිරීම් යැයි චෝදනා ලත් සිදුවීම් වලට එරෙහිව තීරණාත්මක පියවර ගැනීම මෙන්ම ඒවා වැළැක්වීම සඳහා පියවර ගැනීම ප්‍රතිසන්ධාන ක්‍රියාවලිය කෙරෙහි සැළකිය යුතු බලපෑමක් ඇති කරනු ලබන බවයි. (9.44-338 වන පිටුව)

	• දේශපාලනික මැදිහත් වීම නිසා අපරාධ පරීක්ෂණ, නීතිය බලාත්මක කිරීම සහ පොලිස් පරිපාලනය ආදිය හානිකර බලපෑමකට ලක්ව ඇති බවට ද, එහි ප්‍රතිඵලයක් ලෙස අපරාධ යුක්ති පද්ධතිය සම්බන්ධ විශ්වාසය බිඳ වැටී ඇති බවට ද බොහෝ පිරිස් ප්‍රකාශ ඉදිරිපත් කරන ලදී. (9.45-338 වන පිටුව) • එම නිසා, මෙම චෝදනා පිළිබඳව නිසි පරිදි පරීක්ෂණ පවත්වා, අපරාධකරුවන් නීතිය හමුවට පමුණුවන බව සහතික කිරීම සඳහා වහාම පියවර ගත යුතු බවට නීතිය බලාත්මක කරන බලාධිකාර වලට නිර්දේශ කිරීමට ආණ්ඩුව බැඳී සිටිය යුතුය. (9.46-339 වන පිටුව) • යටත් වීම හෝ අත්අඩංගුවට ගැනීම හරහා ආණ්ඩුවේ බලාධිකාර වලින් අත්අඩංගුවට ගැනුනු කවර පුද්ලයෙකුගේ වුව ආරක්ෂාව සහ සුරක්ෂිතතාව සහතික කිරීම රජයේ වගකීම බව අවධාරණය කිරීමට කොමිසම ක්‍රියා කරයි. (9.47-339 වන පිටුව) • සොයා ගත නොහැකි පුද්ගලයන් පිළිබඳ ගැටලුව, හදිසි කටයුත්තක් ලෙස සළකා, එම ගැටලුවට විසඳුම් සෙවීම සඳහා පුළුල් පිවිසුමක් ඇති කර ගත යුතුය. (9.48-339 වන පිටුව) • සොයා ගත නොහැකි තම ආදරණීයයන් ආගිය තැන් දැන ගැනීමට ඒ පුද්ගලයන්ගේ සමීප ඥාතීන්ට අයිතිය ඇති බවට කොමිසම අවධාරණය කර සිටියි. (9.49-339) වන පිටුව) • සොයා ගත නොහැකි පුද්ගලයන් ආ ගිය තැන් සොයා ගැනීමට සහ ඔවුන්ගේ පවුල් සමග යලි එක් වන බව සහතික කිරීමට, අදාළ ආයතන වල විශේෂයෙන් ම, ජාත්‍යන්තර රතු කුරුස කමිටුවේ සහයෝගය ඇතිව, නීතිය බලාත්මක කරන බලාධිකාරයන් සියලු පරිශ්‍රමයන් දැරිය යුතුය. (9.50 - 340 වන පිටුව) • සිදු වූ බව කියන අතුරුදන් වීම් පිළිබඳව පරීක්ෂා කොට සුදුසු පරිදි අපරාධ පටිපාටිකරණයට මුල පිරීම සඳහා නීතිපතිවරයා වෙත තොරතුරු සැපයීමට විශේෂ පරීක්ෂණ කොමසාරිස්වරයෙකු පත් කළ යුතු යයි කොමිසම නිර්දේශ කර සිටී. (9.51-340 වන පිටුව) • අවශ්‍ය අවස්ථාවල දී මරණ සහතික සහ මූල්‍ය වන්දි නිකුත් කිරීම කෙරෙහි අවධානය යොමු කළ යුත්තේ අදාළ ජාත්‍යන්තර මිනුම් දඬු සැලකිල්ලට ගනිමින් සහ ප්‍රමුඛතාව දිය යුතු මූලික කාරණයක් ලෙස සලකමිනි. (9.52-340 වන පිටුව) • කිසිදු නිල වාර්තාවක් නොමැතිව, පුද්ගලයන් අත්අඩංගුවට ගැනීම සම්බන්ධ චෝදනා ගණනාවක් කොමිසමට අසන්නට ලැබිණි. එමනිසා, පුද්ගලයන් අත්අඩංගුවට ගන්නා අවස්ථාවල දී, අත්අඩංගුවට ගැනීම සම්බන්ධයෙන් අදාළ නීතිමය විධිවිධාන, නීතිය බලාත්මක කරන බලාධිකාරයන් විසින් පිළිපැදිය යුතු යැයි කොමිසම නිර්දේශ කර සිටියි. (9.53-340 වන පිටුව) • අදාළ වන දේශීය නීති:- අ) නීතියට අනුව කටයුතු කිරීම සඳහා අත්අඩංගුවට ගැනෙන පුද්ගලයා වහාම මහෙස්ත්‍රාත්වරයා හමුවට පැමිණවිය යුතුය. ආ) රැඳවුම් ස්ථානය සම්බන්ධයෙන් සිදු වන කවර වූ වෙනසක් වුව ද, අත්අඩංගුවට ගැණුනු පුද්ගලයාගේ පවුල සහ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිසම වෙත වහාම දැනුම් දිය යුතුය.

ඇ) මහෙස්ත්‍රාත්වරු සෑම මසකම රැඳවුම් ස්ථාන වෙත වාර්තා කළ යුතුය.

ඈ) රැඳවුම් ස්ථාන වලින් නිදහස් කිරීම කළ යුත්තේ අධිකරණය හරහාය. (9.54-341 වන පිටුව)

- අත්අඩංගුවට ගැනීමක්, රඳවා ගැනීමක් හෝ සිටින ස්ථානය මාරු කිරීමක් වාර්තා කිරීමට හෝ පැහැර ගැනීම් පිළිබඳ පැමිණිලි සටහන් කර ගැනීමට පොලීසිය අසමත් වීම හෝ ප්‍රතික්ෂේප කිරීම සහ ඒ පිළිබඳ පරීක්ෂණ පැවැත්වීමට අසමත් වීම සාපරාධී අපරාධයකට සමාන වන අතර, එවන් වැරදි කළ තැනැත්තන්ට එරෙහිව නීතිමය පියවර ගැනීමට ක්‍රියා කළ යුතුය. (9.55-341 වන පිටුව)
- පුද්ගලයන් ගණනාවක් අත්අඩංගුවට ගැනීම සම්බන්ධ ඇතැම් සිදුවීම් වල කරුණු මහජන ආරක්ෂාවට අදාළ කිසිදු වරදක් අනාවරණය නොකරන නමුත් හදිසි නීතිය යටතේ රඳවා ගෙන සිටින බවට කෙරෙන චෝදනා ද කොමිසමට ඉදිරිපත් කර ඇත. (9.56-341 වන පිටුව)
- ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ දිගු කාලයක් තිස්සේ අත්අඩංගුවේ රඳවාගෙන සිටින පුද්ගලයන් පිළිබඳව සිදුවීම් කොමිසම නිරීක්ෂණය කර ඇත. මේ සම්බන්ධයෙන් ගත් කල, මහජන ආරක්ෂක පනත හෝ ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතට ගැනෙන කවර හෝ නීතියක් යටතේ අත්අඩංගුවට ගැනුණු පුද්ගලයන් සම්බන්ධ රඳවා ගැනීම් සහ අත්අඩංගුවට ගැනීම නිරීක්ෂණය කිරීම සහ විමර්ශනය කිරීම සඳහා ස්වාධීන උපදේශක කමිටුවක් පත් කළ යුතු බවට කොමිසම නිර්දේශ කර සිටී. (9.57-341 වන පිටුව)
- බලාත්කාරී හෝ අනිච්ඡානුග අතුරුදන් කිරීම්, විශේෂිතව ම සාපරාධීකරණය කිරීමට දේශීය නීති සකස් කළ යුතු බවට කොමිසම දැඩිව ම නිර්දේශ කර සිටී. (9.59-342 වන පිටුව)
- විශේෂිතව ම බලාත්කාරී හෝ විරෝධතා නොසළකා කරනු ලබන අතුරුදන් කිරීම්, සාපරාධීකරණය කළ යුතු බවට කොමිසම දැඩිවම නිර්දේශ කර සිටියි. (9.60-342 වන පිටුව)

<u>රැඳවියන්ට සැළකීම</u>

- පුනරුත්ථාපන මධ්‍යස්ථාන කිහිපයක චාරිකා කළ කොමිසම එහි වැඩසටහන් පැවැත්වෙන ආකාරය පිළිබඳව සෑහීමට පත්විය. (9.61-342 වන පිටුව)
- කොමිසමේ අන්තර්වාර නිර්දේශ යටතේ එල්.ටී.ටී.ඊ ය විසින් තැනැත්තන් බලෙන් හමුදාවට බඳවා ගත් වාතාවරණය පිළිබඳව දැනටමත් අවධානය යොමු කර ඇති අතර සිදුවීමෙන් සිදුවීම එවැනි සිද්ධීන් විභාග කිරීම සඳහා විශේෂ යාන්ත්‍රණයක් නිර්මාණය කළ යුතු බව නිර්දේශ කළ කොමිසම, සුදුසු පරිදි එක් එක් සිද්ධිය විභාග කොට අවසන් කිරීමට අදාළ ක්‍රියාමාර්ග නිර්දේශ කරයි. (9.62-342 වන පිටුව)
- රඳවාගෙන සිටින තම පවුලේ සාමාජිකයන් පිළිබඳව තොරතුරු දැන ගැනීම සඳහා රැඳවියන්ගේ ලැයිස්තුවක් සහිත මධ්‍යගත දත්ත එකතුවක් (රැඳවුම් ස්ථානය මෙන්ම සිටින ස්ථානය මාරු කිරීම් පිළිබඳ වාර්තා සහිත ව) සමීප ඥාතීන්ට ලබා ගැනීමට හැකිවන පරිදි පහසුකම් සැලසිය යුතුය. (9.63 -342 වන පිටුව)

	• අදාළ බලාධිකාරයන්, ජාත්‍යන්තර රතු කුරුස කමිටුවේ සහ ස්වේච්ඡා සංවිධාන වල සහයෝගය සහිත ව, රැඳවුම් මධ්‍යස්ථාන වල සිටින තම පවුලේ සාමාජිකයින් හමුවීම සඳහා සමීප ඥාතීන්ට ලබාදෙන වත්මන් ප්‍රවාහන පහසුකම් වැඩි දියුණු කළ යුතු බව කොමිසම නිර්දේශ කර සිටී. (9.65-343 වන පිටුව) • ජාත්‍යන්තර රතු කුරුස කමිටුව සමග සහයෝගී වීමේ මෙම ප්‍රතිපත්තිය කොමිසම විසින් අගය කරන අතර, රජය විසින් මෙම සහයෝගී ප්‍රතිපත්තිය පුළුල් කළ යුතු යැයි ද, රැඳවියන්ගේ සුභසාධනය සහතික කිරීම සඳහා ජාත්‍යන්තර රතු කුරුස කමිටුව සහ ඒ හා සමාන වෙනත් මානුෂීය සංවිධාන සමග ඵලදායී එකඟතාවකට පැමිණිය යුතු යැයි ද දැඩි ලෙස නිර්දේශ කර සිටී. (9.66-343 වන පිටුව) • තරුණ රැඳවියන් කෙරෙහි, විශේෂයෙන් ම එල්.ටී.ටී.ඊ ය බලෙන් හමුදාවට බඳවා ගැනීම හේතු කොටගෙන අධ්‍යාපනය කඩාකප්පල් වී ඇති අය සහ තම විධිමත් අධ්‍යාපනය සම්පූර්ණ කිරීමට අපේක්ෂා කරන අය කෙරෙහි විශේෂ අවධානයක් යොමු කළ යුතු යැයි කොමිසම නිර්දේශ කර සිටී. (9.68-343 වන පිටුව) • කායික වශයෙන් ආබාධිතයන් සහ තුවාල වලින් සුවය ලබමින් සිටින තැනැත්තන් පිළිබඳ කරුණු (9.69-343 වන පිටුව) • ඇතැම් රැඳවියන් චෝදනා ඉදිරිපත් නොකර දිගු කාලයක් තිස්සේ සිරගත කර තැබීම සම්බන්ධයෙන් කොමිසම ස්වකීය කණස්සල්ල පළ කර සිටී. (9.70-343 වන පිටුව) • පුනරුත්ථාපනය කර සිටින රැඳවියන් සිවිල් සමාජයට මුදා හැරීමට පියවර ගන්නා බව සහතික කිරීම පිණිස රජය වැඩසටහන් ක්‍රියාත්මක කළ යුතු ය. (9.71-344 වන පිටුව) **<u>නීති විරෝධී සන්නද්ධ කණ්ඩායම්</u>** • විශේෂයෙන් ම සමාලෝචනයට ලක්වන කාල පරිච්ඡේය තුළ දී නීති විරෝධී සන්නද්ධ කණ්ඩායම් සිදු කළ ක්‍රියාකාරකම් පිළිබඳව කොමිසම බරපතළ කනස්සල්ල පළ කර සිටී. (9.72-344 වන පිටුව) • නීති විරෝධී සන්නද්ධ කණ්ඩායම් වලට එරෙහි චෝදනා සම්බන්ධයෙන් නිසි පරීක්ෂණයක් පැවැත්විය යුතු බවට කොමිසම අදහස් කරයි. (9.73-344 වන පිටුව) • මෙම කණ්ඩායම නිරායුධ කිරීම සඳහා සහ ඒවායේ නීති විරෝධී ක්‍රියාකාරකම් අවසන් කිරීම සඳහා ද පියවර ගත යුතුය. (9.74-344 වන පිටුව) **<u>ළමයින් බලහත්කාරයෙන් හමුදාවට බඳවා ගැනීම</u>** • ළමුන් බලෙන් හමුදාවට බඳවා ගැනීම, යුධ ගැටුම් සමය තුළ දී එල්.ටී.ටී.ඊ ය කළ දරුණුම අපරාධ වලින් එකකි. (9.75-345 වන පිටුව) • නැගෙනහිර පළාතේ ළමුන් සන්නද්ධ කණ්ඩායම් වලට බඳවා ගැනීමේ පිළිවෙත සම්බන්ධයෙන් 2008 දෙසැම්බර් මාසයේ දී තමිල් මක්කල් විඩුදලෙයි පුලිකල් (TMVP) සහ පුනරුත්ථාපන කටයුතු පිළිබඳ මහ කොමසාරිස්වරයා සහ යුනිසෙෆ් ආයතනය අතර අත්සන් කෙරුණු ත්‍රෙපාර්ශවීය ක්‍රියාකාරී සැලැස්ම පිළිබඳව කොමිසම අවධාරණය කරයි. (9.76-345 වන පිටුව)

- රජයේ ඉහළම ප්‍රමුඛතාව විය යුත්තේ හිටපු ළමා සොල්දාදුවන් පුනරුත්ථාපනය කිරීම යි. (9.77-345 වන පිටුව)
- ළමුන් තම ප්‍රජාවන් තුළ තම දෙමව්පියන් සමග සහ/හෝ විස්තෘත පවුල් සාමාජිකයන් සමග ජීවත් වීමේ වැදගත්කම කොමිසම අවධාරණය කර සිටියි. (9.78-345 වන පිටුව)
- සටන්කරුවන් වශයෙන් ළමුන් බලෙන් බඳවා ගැනීම පිළිබඳව බැලූ බැල්මට පිළිගත හැකි සාක්ෂි තිබෙන අවස්ථාවල දී චෝදනා ඉදිරිපත් කරනු ලබන එවැනි ඕනෑම සිදුවීමක් පිළිබඳව පරීක්ෂා කළ යුතු අතර, වැරදිකරුවන් නීතිය හමුවට පැමිණවිය යුතුය. (9.79-346 වන පිටුව)
- අදාළ බලාධිකාරයන් විසින් පෞද්ගලික අංශයේ උපදෙස් විමසා වැඩි රැකියා අවස්ථා සම්පාදනය කළ යුතු බවට කොමිසම අවධාරණය කරයි. (9.80-346 වන පිටුව)
- සන්නද්ධ ගැටුම් වලට නිරාවරණය වූ ළමුන් සම්බන්ධයෙන් කටයුතු කිරීම පිළිබඳ දැනුම සහ අත්දැකීම් ඇති එක්සත් ජාතීන්ගේ අදාළ ආයතන වලින්, ජාත්‍යන්තර රතු කුරුස සංවිධානයෙන්, ජාත්‍යන්තර රාජ්‍ය නොවන සංවිධාන වලින්, රාජ්‍ය නොවන සංවිධානවලින් සහ සිවිල් සමාජීය සංවිධාන වලින් හා විශේෂයෙන් ම යුනිසෙෆ් ආයතනයෙන් සහය ලබා ගැනීමේ හැකියාව පිළිබඳව ද රජය සොයා බැලිය යුතුය. (9.81-346 වන පිටුව)

<u>අවධානමට ලක්විය හැකි කණ්ඩායම්</u>

- කාන්තාවන්, ළමුන්, අභ්‍යන්තරික ව අවතැන් වූවන් සහ ආබාධිතයන් වැනි අවදානමට ලක්විය හැකි කණ්ඩායම් සඳහා රජය විසින් සහාය සැළසිය යුතුය. (9.83-346 වන පිටුව)
- ජීවිත බරපතළ ලෙස කඩා බිඳ වැටෙමින් යුධ ගැටුම් වලින් අතිශය පීඩාවට පත්වන ජන කොටස් වන්නේ කාන්තාවන්, ළමුන් හා වයස්ගත තැනැත්තන් බව පැහැදිලි වී ඇත. (9.84-347 වන පිටුව)
- **කොමිසම මෙම නිරීක්ෂණ සම්බන්ධයෙන් සානුකම්පිත වන අතර අවසානයක් පිළිබඳ හැඟීමක් ඇති කිරීමේ අවශ්‍යතාවක් පවතින බව හඳුනාගෙන ඇති අතර මෙම හැඟීම ඕනෑම අර්ථාන්විත සමාදාන සහ ප්‍රතිසන්ධාන ක්‍රියාවලියක් උදෙසා වැදගත් දායකත්වයක් සපයනු ඇත. (9.85-347 වන පිටුව)**

<u>කාන්තාවෝ</u>

- කාන්තා මූලික කුටුම්භයන්ට සහාය දීම සඳහා මෙම ක්ෂේත්‍ර සම්බන්ධයෙන් විශේෂඥතාවක් සහ සම්පත් නිමි අදාළ ජාත්‍යන්තර සංවිධාන වල සහ සිවිල් සමාජීය කණ්ඩායම් වල සේවාවන් ලබා ගැනීම හා යොදා ගැනීම සඳහා රජය වඩා පුළුල් සහ තිරසාර පරිශ්‍රමයක් දැරිය යුතුය. (9.88-348 වන පිටුව)
- තමන් ජීවත් වන්නේ සුරක්ෂිත වාතාවරණයක බව හැඟී යන පරිදි එවන් උපකාරී වාතාවරණයක් නිර්මාණය කිරීමට රජයට වගකීමක් තිබිය යුතුය. (9.90-348 වන පිටුව)
- ප්‍රමුඛතාව දිය යුතු කාරණයක් ලෙස කාන්තාවන්ට තම ආදරණීයයන් ආගිය තැනක්, රඳවා ඇති තැනක් පිළිබඳ දැන ගැනීමට අයිතියක් ඇත. (9.91-348 වන පිටුව)
- ගැටුමේ බලපෑමට ලක්වුණු කාන්තාවන්, ළමයින්, වයස්ගත වූවන් සහ ආබාධිතයන් වැනි අවධානමට ලක්විය හැකි කණ්ඩායම් වල අවශ්‍යතාවන්ට

	පුළුල් ආකාරයෙන් විසඳුම් සෙවීම සඳහාත්, අවශ්‍ය සහන සැපයීම සඳහාත් විධි නියෝග සහිත අන්තර් ආයතනික කාර්ය බලකායක් නොපමාව ම පිහිටුවිය යුතුය. (9.92-348 වන පිටුව) **<u>ළමයින්</u>** • ළමයින්ට, විශේෂයෙන් ම ඔවුන්ගේ අධ්‍යාපනය සම්බන්ධයෙන් උපකාර කිරීම ප්‍රධාන ප්‍රමුඛතාවක් විය යුතු බව කොමිසම දැඩිව ම නිර්දේශ කර සිටී. (9.93-349 වන පිටුව) • විධිමත් අධ්‍යාපන පද්ධතිය හරහා මෙන්ම එවැනි ක්ෂේත්‍ර වල ක්‍රියාකාරී වෙනත් ප්‍රජා, සිවිල් සමාජීය කණ්ඩායම් හරහා ප්‍රමුඛතාව දිය යුතු කාරණයක් ලෙස සළකා, රජය විසින් විශේෂ අවධානයක් අවශ්‍ය කරන එවැනි ළමුන් හඳුනාගත යුතු යැයි කොමිසම දැඩි ලෙස නිර්දේශ කර සිටී. (9.94-349 වන පිටුව) **<u>වයස්ගත කණ්ඩායම්</u>** • යුධ ගැටුම් වල බලපෑමට ලක් වූ ප්‍රදේශ වල වෙසෙන වයස්ගත කණ්ඩායම් අප්‍රමාණ ලෙස පීඩා විඳ ඇති බව කොමිසම හඳුනා ගනී. එමනිසා කොමිසම පහත සඳහන් පියවරයන් දැඩි ලෙස නිර්දේශ කර සිටී. අ) ගැටුමේ බලපෑමට ලක් වූ පවුල් වල ජීවන තත්ත්වය වැඩි දියුණු කිරීම අරමුණු කර ගත් වැඩ සටහන් ක්‍රියාත්මක කිරීම; ආ) ආබාධිත බව හේතුවෙන් වයස්ගත කණ්ඩායම් වලට ඇති වී තිබෙන විශේෂ අවශ්‍යතා කෙරෙහි රජය සහ අනෙකුත් පාර්ශවකරුවන් අවධානය යොමු කළ යුතුය. (9.96-349 වන පිටුව) • වයස්ගත වූවන්ට සහාය වීමේ දී දේශීය ආගමික ආයතන සහ පූජනීය ස්ථාන හා පූජකයන් ද මේ සම්බන්ධයෙන් ප්‍රමුඛ කාර්යභාරයක් ඉටු කළ යුතු යැයි කොමිසම ඉල්ලා සිටී. රජය එවැනි පරිශ්‍රමයන්ට පහසුකම් සැලසිය යුතුය. (9.97-350 වන පිටුව) **<u>ආබාධිත පුද්ගලයෝ</u>** • ගැටුමේ බලපෑමට ලක් වුණු ප්‍රදේශ වල වෙසෙන, ආබාධිත පුද්ගලයන්ට සහාය වීමේ හදිසි අවශ්‍යතාවක් පවතින බව කොමිසම හඳුනා ගනී. • ආබාධිත පුද්ගලයන්ගේ අයිතිවාසිකම් සාක්ෂාත් කර ගැනීම සඳහා අවශ්‍ය ජාතික නීති, ආබාධිත තත්ත්වයන් සහිත පුද්ගලයන්ගේ අයිතිවාසිකම් පිළිබඳ එක්සත් ජාතීන්ගේ ප්‍රඥප්තියට අනුකූලව සම්පාදනය කළ යුතු බවට කොමිසම නිර්දේශ කර සිටී. (9.100-350 වන පිටුව) **<u>අභ්‍යන්තරිකව අවතැන් වූ ජනතාව</u>** • යුධ ගැටුම් වල අවසන් කාල පරිච්ඡේදය තුළ දී අභ්‍යන්තරික ව අවතැන් වූ ජනතාවගෙන් බොහෝමයක් දෙනා යලි පදිංචි කර ඇති බව කොමිසම සඳහන් කරන්නේ සතුටිනි. (9.101-350 වන පිටුව) • යලි පදිංචි කළ ජනතාවට අඛණ්ඩව පැන නඟින අවශ්‍යතා පිළිබඳව අවධානය යොමු කළ යුතුය. (9.102-350 වන පිටුව) • බොහෝමයක් දෙනා තවමත් ජීවත් වන්නේ තාවකාලික වාසස්ථාන වල බැවින් ස්ථීර නිවාස අලුත්වැඩියා කර ගැනීම හෝ ගොඩනගා ගැනීම සඳහා ආපසු පැමිණි ජනතාවට සහාය සැපයිය යුතුය. (9.103-350 වන පිටුව) • යලි පදිංචි කර ඇති ජනතාව වෙත ඉඩමේ නීතිමය හිමිකම ප්‍රදානය කිරීමේ අවශ්‍යතාවක් පවතී. (9.104-351 වන පිටුව)

- ශ්‍රී ලංකාවට ආපසු පැමිණීමට සහ ස්වේච්ඡාවෙන් යළි පදිංචි වීමට කැමති ඉන්දියාවෙහි ජීවත් වන අවතැන් වූවන්ට රජය පහසුකම් සැළසිය යුතු ය. (9.108-351 වන පිටුව)

<u>උතුරෙහි සහ නැගෙනහිර මුස්ලිම් ප්‍රජාව සම්බන්ධ ගැටලු</u>

- එල්.ටී.ටී.ඊ තර්ජන නිසා 1990 ඔක්තෝබර් තරම් ඈතක දී දිස්ත්‍රික්ක පහක (යාපනය, මන්නාරම, කිලිනොච්චිය, මුලතිව් සහ වවුනියාව) අවතැන් වූ මුස්ලිම් ජනතාව පිළිබඳ ගැටලුව පශ්චාත් යුධ අභියෝගයන්ගෙන් එකක් ලෙස පවතී. (9.109-351 වන පිටුව)
- උතුරු පළාතෙන් පළවා හැරුණු මුස්ලිම් ජනතාව අභ්‍යන්තරික ව අවතැන් වීම සම්බන්ධයෙන් පවතින දිගුකාලීන ගැටලුව විසඳීම සඳහා තිරසාර විසඳුම් සොයා ගත යුතු බව කොමිසමේ අදහසකි. මෙම අභ්‍යන්තරික ව අවතැන් වූවන් යළි පදිංචි කරවීම සහ/හෝ ඔවුන් සත්කාරක ප්‍රජාවට ඒකාබද්ධ කිරීම අරමුණු කරගත් සමරූපී රාජ්‍ය ප්‍රතිපත්තියක් නිර්මාණය කිරීම හරහා මෙම අවශ්‍යතාව සපුරාලිය හැකි වනු ඇතැයි අපේක්ෂා කෙරේ. (9.111-352 වන පිටුව)
- එවැනි රාජ්‍ය ප්‍රතිපත්තියක් යටතේ, මූල්‍යමය සහාය සහ නිවාස ඉදි කිරීම සඳහා සහාය ලබාදීම වැනි වෙනත් ද්‍රව්‍යමය ආධාර ඇතුළු සහායක පැකේජයක් ද ඇතුළත් කළ යුතුය. (9.112-352 වන පිටුව)
- අභ්‍යන්තරික ව අවතැන් වූවන්ගෙන් සහ සත්කාරක ප්‍රජාවන්ගෙන් පුළුල් ව අදහස් ලබා ගැනීමෙන් අනතුරුව, තිරසාර විසඳුම් පිරික්සා බැලීම සඳහා සහ ගැටලුව පිළිබඳ ව පුළුල් රාජ්‍ය ප්‍රතිපත්තියක් සකස් කිරීම සඳහා විශේෂ කමිටුවක් පත් කළ යුතුය. (9.113-352 වන පිටුව)

<u>අදහස් ප්‍රකාශනයේ නිදහස සහ තොරතුරු ලබා ගැනීමේ අයිතිය</u>

- පුවත්පත් කලාවේදීන්ට සහ මාධ්‍ය ආයතන වලට ප්‍රහාර එල්ල කිරීම පිළිබඳව කොමිසම අතිශයින් ම කැළඹීමට පත් විය. (9.114-353 වන පිටුව)
- කොමිසම පහත සඳහන් පියවරයන් නිර්දේශ කර සිටී.

  අ) මාධ්‍ය කාර්ය මණ්ඩල සහ ආයතන වලට අඩන්තේට්ටම් කිරීම සහ ප්‍රහාර එල්ල කිරීම වැළැක්වීම සඳහා සියලු පියවර ගත යුතුය.

  ආ) එවැනි වැරදි සම්බන්ධයෙන් නිවාරක දඬුවම් පැනවීමට පියවර ගත යුතුය.

  ඇ) එවැනි නීති විරෝධී ක්‍රියාවන් පිළිබඳ අතීත සිදුවීම් නිසි ලෙස පරීක්ෂාවට ලක් කළ යුතුය.

  ඈ) රජය විසින් උතුරු නැගෙනහිර තුළ මාධ්‍ය කාර්ය මණ්ඩල වල යාමේ සහ ඒමේ නිදහස සහතික කළ යුතුය.

  ඉ) තොරතුරු දැන ගැනීමේ අයිතිය සහතික කිරීම සඳහා නීති පැනවිය යුතුය. (9.115-353 වන පිටුව)

<u>තමන් කැමති ආගමක් ඇදහීමේ, සමාගමයේ සහ යාමේ සහ ඒමේ නිදහස</u>

- ආගමික ක්‍රියාකාරකම් වලට කිසිදු බාධාවක් නොකර ආගමික උත්සව වලට පැමිණීමට පහසුකම් සැපයීමෙන් අවදානමට ලක් වූවන් අතර පවතින අවිනිශ්චිතතාව පිළිබඳ හැඟීම අවසන් කිරීමේ අවශ්‍යතාව කොමිසම අවධාරණය කර සිටී. (9.116-354 වන පිටුව)

- බිම් බෝම්බ ඉවත් කිරීමේ ක්‍රියාකාරකම් සඳහා අවශ්‍ය කරන සීමා පැනවීම් හැර පූජනීය ස්ථාන වෙත පිවිසීම සම්බන්ධයෙන් කවර හෝ සීමා කිරීමක් පනවා ඇත්නම් ඒවා ඉවත් කිරීමට රජය ක්ෂණික පියවර ගත යුතුය. (9.117-354 වන පිටුව)

<u>අතීත කොමිෂන් සභා වාර්තා පිළිබඳව පසු විපරම් කිරීම</u>

- "2005 අගෝස්තු මස සිට සිදු කරන ලද බරපතල මානව හිමිකම් උල්ලංඝනය කිරීම් පිළිබඳව කෙරෙන චෝදනා පරීක්ෂා කිරීම සඳහා සහ විමර්ශනය කිරීම සඳහා පත් කෙරුණු ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභා වාර්තාවේ" නිර්දේශ, ක්‍රියාත්මක කළ යුතු බවට කොමිසම දැඩි ලෙස අවධාරණය කර සිටී. (9.120-354 වන පිටුව)

<u>**ඉඩම් ගැටලු පිළිබඳ නිරීක්ෂණ සහ නිර්දේශ: නැවත පැමිණීම සහ යළි පදිංචි කිරීම**</u>

- නීති විරෝධී ලෙස ඉඩම් පැවරීම, බියගැන්වීම සහ ප්‍රචණ්ඩ ක්‍රියා මත අන්සතු කිරීම වැනි ක්‍රියාකාරකම් සඳහා ඉඩ ප්‍රස්ථා නොමැති බව සහතික කිරීම වැදගත් බව කොමිසම හඳුනා ගනී. (9.121-355 වන පිටුව)
- රජයේ ඉඩම් ප්‍රතිපත්තිය කිසියම් පළාතක ජන විකාශ රටාවෙහි අස්වාභාවික වෙනස්කම් ඇති කිරීම සඳහා වන මෙවලමක් නොවිය යුතුය. (9.124-355 වන පිටුව)
- අවතැන් වුනු පුද්ගලයන් ආපසු පැමිණීම සහ යළි පදිංචි කිරීම සම්බන්ධයෙන් රජය අනුගමනය කරන ඉඩම් ප්‍රතිපත්තිය කොමිසම අගය කරයි. එමෙන් ම ඊට සම්බන්ධිත ව 2011 ජූලි මාසයේ දී යෝජනා කෙරුණු, ඉඩම් ප්‍රලේඛනය සහ හිමිකම් සම්බන්ධ ආරවුල් සහ අවතැන් වූවන්ගේ පරිශීලක අයිතිවාසිකම් පිළිබඳ ගැටලු විසඳීමට සැළසුම් කළ "උතුරු හා නැගෙනහිර පළාත් වල ඉඩම් කළමනාකරණය සම්බන්ධ ක්‍රියාකාරකම් නියාමනය කිරීම" නම් වැඩසටහන ද කොමිසමේ අගය කිරීමට ලක්ව ඇත. (9.125-355 වන පිටුව)
- මෙම වැඩසටහන සහ ඊට සම්බන්ධ යාන්ත්‍රණයන් අධිකරණයේ පිහිට පැතීම වෙනුවට භාවිතා කරනු ලබන ආදේශකයක් නොවන බව නිසි ප්‍රචාරණ මාධ්‍යයක් හරහා මහජනතාව වෙත පූර්ණ වශයෙන් පැහැදිලි කළ යුතු බව ද සහ සහතික කළ යුතු යැයි ද අදාළ බලාධිකාරයන්ට දැඩි ලෙස නිර්දේශ කිරීමට කොමිසම අපේක්ෂා කරයි. (9.126-355 වන පිටුව)
- වැඩසටහන ක්‍රියාත්මක කිරීමේ දී, සැළසුම් කළ පරිදි සම්පූර්ණ කෙරෙන බව සහ මතු වන කවර ගැටලුවක් සහ බාධාවක් වුව ද ඵලදායී ව සහ අප්‍රමාදී ව විසඳා ගන්නා බව ද සහතික කිරීම සඳහා වන ශක්තිමත් දේශපාලන දැක්මක් සමග බැඳුනු දේශපාලනයෙන් තොර පිවිසුමක් යොදා ගත යුතු යයි කොමිසම නිර්දේශ කර සිටී. (9.128-356 වන පිටුව)
- අපක්ෂපාතීත්වය සහ විනිවිදභාවය සහතික කිරීම සඳහා වැඩසටහන ක්‍රියාත්මක කිරීමේ කර්තව්‍ය පැවරෙන සිවිල් පරිපාලන නිලධාරීන් අධීක්ෂණය කිරීම, අදාළ දිසාපතිවරු විසින් ද, ක්‍රියාත්මක කිරීමේ ගුණාත්මක බව නිරීක්ෂණය කිරීම, ජාතික මට්ටමේ දී ඉඩම් පිළිබඳ කොමසාරිස්වරයා විසින් ද කළ යුතු යැයි කොමිසම නිර්දේශ කර සිටී.
- නව වැඩසටහන පිළිබඳ ව දේශපාලනික ආකල්ප වලින් තොර නිවැරදි සහ පැහැදිලි අදහසක් ප්‍රක්ෂේපණය කිරීමට මාධ්‍යයට හැකියාව ලබා දීම සඳහා, යෝජිත නව වැඩ සටහන පිළිබඳව මනා ලෙස සැළසුම් කළ මාධ්‍ය සම්මන්ත්‍රණයක් සංවිධානය කිරීමට ඉඩම් කොමසාරිස් ජනරාල්

	දෙපාර්තමේන්තුවට හැකි බවට කොමිසම නිර්දේශ කර සිටී. (9.131-357 වන පිටුව) • ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවෙන් සහ අදාළ දිසාපතිවරු, විවිධ කමිටු සඳහා තෝරා ගැනෙන සියලු නිලධාරීන් සහ ප්‍රජා නායකයන් උදෙසා මැනවින් සැළසුම් කළ පුහුණු වැඩ සටහන් පැවැත්විය යුතු යැයි කොමිසම නිර්දේශ කර සිටී. (9.132-357 වන පිටුව) • වැඩසටහනෙන් සැපයෙන විවිධ සේවාවන් සම්බන්ධයෙන් අවතැන් වූවන් ගත යුත්තේ කවර විශේෂිත පියවරක් ද යන්න පිළිබඳව තොරතුරු ඇතුළත් කොට, මැනවින් සැළසුම් කළ, පදිංචිකරුවන් කේන්ද්‍ර කරගත් සහ ප්‍රධාන වශයෙන් සරල දෙමළ භාෂාවෙන් මෙන්ම සිංහල භාෂාවෙන්, සන්නිවේදන ව්‍යාපාරයක් දියත් කළ යුතු යයි ද කොමිසම නිර්දේශ කර සිටී. (9.133-357 වන පිටුව) • ආරක්ෂක හමුදා හැකි තරම් ඉක්මනින් සිවිල් පරිපාලනය හා සම්බන්ධ සියලු ක්‍රියාකාරකම් වලින් ඉවත් විය යුතු බවට කොමිසම ප්‍රතිපත්තියක් ලෙස රජයට දැඩිව අවධාරණය කරයි. (9.134-358 වන පිටුව) • නව වැඩසටහන, පළමු (පරීක්ෂණ) කොමිසමට සහ දෙවන (පරීක්ෂණ) කොමිසමට සම්බන්ධ නිරීක්ෂණ කමිටු හරහා ප්‍රජා උපදෙස් ලබා ගැනීමේ වැඩ පිළිවෙලක් හඳුන්වා දී ඇති බව කොමිසම සඳහන් කර සිටී. ඒ ඒ දිස්ත්‍රික් ලේකම් කාර්යාල ප්‍රදේශවල පළමු කමිටු විසින්, පළමු කමිටු පරීක්ෂණ ක්‍රියාදාමය දියත් කිරීමට පෙරාතුව, මැනවින් ප්‍රසිද්ධ කළ ප්‍රජා උපදෙස් විමසුම් රැස්වීමක් සංවිධානය කර පැවැත්විය යුතු බවට නිර්දේශ කර සිටී. (9.135-358 වන පිටුව) • ඉඩම් කොමසාරිස් ජනරාල්වරයා විසින්, ප්‍රජා උපදෙස් විමසුම් රැස්වීම් හරහා ඉදිරිපත් කෙරෙන ඵලදායක යෝජනා ඉක්මනින් සළකා බැලීම සඳහා යාන්ත්‍රණයක් පිහිටුවිය යුතු යැයි ද කොමිසම නිර්දේශ කර සිටී. (9.136-358 වන පිටුව) • තාවකාලික/ද්විතියික පදනම මත සහ/හෝ සුදුසුකම් සහ නිපුණතා සහිත විශ්‍රාමික කාර්ය මණ්ඩල කොන්ත්‍රාත් පදනම මත පත් කර ගැනීම හරහා ද වැඩසටහන ඵලදායී ව හා කාර්යක්ෂම ව ක්‍රියාත්මක කිරීමට සහාය වීම සඳහා ගිවිසගත් කාල පරිච්ඡේදයකට අලුතින් බඳවා ගැනීම සහ/හෝ අනුයුක්ත කිරීම මඟින් ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවට අතිරේක පරිපාලන සේවා කාර්ය මණ්ඩල පත් කිරීම හරහා ද ක්‍රියාත්මක කිරීමේ සෑම මට්ටමක දී ම මානව සම්පත් කණ්ඩායම් ශක්තිමත් කිරීමට විධිවිධාන යෙදිය යුතු යයි කොමිසම නිර්දේශ කර සිටී.(9.137-359 වන පිටුව) • එල්.ටී.ටී.ඊ ය විසින් දෙනු ලබන ආඥාවකින් හෝ එවැනි ආඥාවකින් තොරව ද්විතීයික පදිංචිකරුවන් වී සිටින සියලු පවුල් වලට, පරීක්ෂණ කොමිසමේ තීන්දු මත ඔවුන් වර්තමානයේ පදිංචි වී සිටින ඉඩම සැබෑ මුල් අවසර පත් දරන්නන් වෙත ප්‍රදානය කෙරෙන්නේ නම්, එකී පවුල් වලට ඉඩම් හිමිවිය යුතු යැයි ද කොමිසම නිර්දේශ කර සිටී. (9.139-359 වන පිටුව) • යෝජිත වැඩසටහන ක්‍රියාත්මක කෙරෙන තෙක්, වෙනත් අනුමත අරමුණු සඳහා රාජ්‍ය ඉඩම් අවශ්‍ය කරන අවස්ථාවල දී හැර, අභ්‍යන්තරික ව අවතැන් වූවන් සඳහා හැර වෙනත් තැනැත්තන් ට කවර හෝ රජයේ ඉඩම් පවරා දීමක් සිදු වීම වැළැක්වීම සඳහා දැඩි පාලන විධික්‍රම යොදා ගත යුතු යැයි ද කොමිසම නිර්දේශ කර සිටී. (9.140-359 වන පිටුව)

	• වැඩසටහනට සහාය වීම සඳහා සංවර්ධන හවුල්කරුවකුගේ සහයෝගය ලබා ගැනීමට ශ්‍රී ලංකා රජය සක්‍රීයව උත්සාහ දැරිය යුතු බව කොමිසම නිර්දේශ කර සිටී. (9.141-360 වන පිටුව) • පලාලි හි සහ ත්‍රිකුණාමල- සාම්පූර් හි පවත්නා අධි ආරක්ෂිත කලාප දෙක මෙන් ම දිස්ත්‍රික්ක තුළ දී වර්තමානයේ ආරක්ෂක අරමුණු උදෙසා ප්‍රයෝජනයට ගැනෙන සුළු පෞද්ගලික ඉඩම් ප්‍රමාණය ද, ජාතික ආරක්ෂක අවශ්‍යතා සැලකිල්ලට ගන්නා අතර ම වැඩි ඉඩම් ප්‍රමාණයක් මුදා හැරීමේ දැක්මකින් යුතුව සමාලෝචනය කළ යුතු යැයි කොමිසම නිර්දේශ කර සිටී. නිල අධි ආරක්ෂිත කලාප නිසා හෝ වෙනත් නිල නොලත් හෝ තත්කාර්යමය ආරක්ෂක අවශ්‍යතා නිසා ඉඩම් සහ හෝ නිවාස අහිමිව සිටින සියලු පවුල්වලට විකල්ප ඉඩම් ලබා දිය යුතු යැයි සහ හෝ අදාළ නීතිවලට අනුව වන්දි ගෙවිය යුතු යැයි ද කොමිසම නිර්දේශ කර සිටී. විකල්ප ඉඩම් සැපයීම සහ හෝ වන්දි ගෙවීම නිශ්චිත කාල රාමුවක් තුළ සම්පූර්ණ කළ යුතු යැයි ද කොමිසම තවදුරටත් නිර්දේශ කර සිටී. (9.142-360 වන පිටුව) • ආණ්ඩුව, සංවර්ධන හවුල්කරුවන්ගේ සහාය ඇතිව, ප්‍රදේශයෙන් ප්‍රදේශයට, අවශ්‍යතාව පරිදි, සැලසුම් කෙරුණාට වඩා දිගු කලක් තිස්සේ, 'අලුතින් අභ්‍යන්තරව අවතැන් වුණු' පවුල්වලට ජීවනෝපාය සකසා ගැනීම සඳහා සහාය පිරිනැමිය යුතු යැයි කොමිසම නිර්දේශ කර සිටී. (9.143-360 වන පිටුව) • නැගෙනහිර පළාතෙහි පිහිටි සිය කෘෂිකාර්මික ඉඩම්වලින් එල්.ටී.ටී.ඊ ය බලාත්කාරයෙන් නෙරපා හළ සහ එහි ප්‍රතිඵලයක් ලෙස ජීවන තත්ත්වයන් උග්‍ර ලෙස පිරිහී ඇති මුස්ලිම් පවුල්වල ඉඩම් ගැටලු ඵලදායී ලෙස සහ කඩිනමින් විසඳිය යුතු යැයි කොමිසම නිර්දේශ කර සිටී. (9.144-361 වන පිටුව) • යාපනය දිස්ත්‍රික්කයෙන් සිංහල පවුල් පලවා හැරීම සම්බන්ධ නිල දත්ත වැරදි සහිත බව පෙනෙතැයි සඳහන් කරන කොමිසම, වඩා නිශ්චිත දත්ත ලබා ගනු පිණිස, කවර හෝ වාර්ගික හෝ ආගමීන්ට හේතු පාදක නොවන පරිදි අගති විරහිත ව සහ භික්මීමෙන් යුතුව, නමුත් ක්‍රමානුකූල ආකාරයෙන් මෙම පැතිකඩ සමාලෝචනයට ලක් කළ යුතු යැයි නිර්දේශ කර සිටී. (9.145-361 වන පිටුව) • යාපනයට සහ උතුරු පළාතට ආපසු යාමට ස්වේච්ඡාවෙන් ඉදිරිපත් වන ඉතිරි මුස්ලිම් පවුල් ආපසු යාම සහ යළි පදිංචි කිරීම ඉක්මන් කළ යුතු යැයි කොමිසම නිර්දේශ කර සිටී. (9.146-361 වන පිටුව) • පෙර පැවති තර්ජිත ගම්මානවල ජීවත් වූ ඇතැම් පවුල්වල ඉඩම් ගැටලු සහ ජීවනෝපාය ගැටලු බොහෝ දුරට අමතක කර දමා සහ නොවිසඳා ඇති බව කොමිසම කනගාටුවෙන් සඳහන් කර සිටී. මෙම පවුල්වල වර්තමාන තත්ත්වය පිළිබඳව වාර්තාව සකස් කරන සමය වන තෙක් කොමිසමට ප්‍රමාණවත් තොරතුරු නොලැබුණි. පෙර පැවති තර්ජිත ගම්මානවල ගැටලුවලට සහ පවුල් අවතැන් වීමේ විශේෂ ස්වභාවය අධ්‍යයනය කිරීම අරමුණු කොට ගත් ආයතනයක් නම් කළ යුතු යැයි කොමිසම නිර්දේශ කරයි. (9.147-361 වන පිටුව) • ගැටුම් කාල පරිච්ඡේදයේ දී ක්‍රියාත්මක වුණු ඉඩම් පැවරීම/පදිංචිය සම්බන්ධයෙන් කාලාවරෝධය ආශ්‍රිත අදාළ නීති සංශෝධනය කළ යුතු බව කොමිසමේ අදහසයි. (9.148-362 වන පිටුව) • 'පැරණි අභ්‍යන්තරව අවතැන් වූවන්' යැයි කියනු ලබන- 2008 අප්‍රේල් මාසයට කලින් අවතැන් වුණු පිරිස් සැලකිය යුතු ප්‍රමාණයක් සහ 1980 ගණන් වල සිට

	අවතැන් ව සිටින- ජනයා මුහුණ දෙන තත්ත්වය පිළිබඳව කොමිසම උත්සුකතාව පළ කර සිටී. රජය සහ අනෙක් පාර්ශවකරුවන් ක්‍රියා නොකිරීම නිසා හෝ මන්දගාමීව ක්‍රියා කිරීම නිසා, වෙනස්කම් වලට භාජනය කිරීමෙන් තමන් පීඩාවට පත්ව ඇතැයි පැරණි අභ්‍යන්තරික ව අවතැන් වූවන්ට හැඟේ. 'පැරණි අභ්‍යන්තරික ව අවතැන් වූවන්' ආපසු යාම සහ යළි පදිංචි කිරීම සම්බන්ධයෙන් රෙකමදාරු කරන සම්බන්ධීකාරක නිර්දේශය වන මෙම නිර්දේශය, 9.151, 9.153, 9.154, 9.155 සහ 9.156 නිර්දේශවලට සම්බන්ධ වේ. ආණ්ඩුව 'පැරණි අභ්‍යන්තරව අවතැන් වූවන්ගේ' ගැටලුවල පරිමාණය සොයා දැන ගත යුතු බව ද, එක්සත් ජාතීන්ගේ සහාය ඇතිව ස්වේච්ඡාවෙන් ආපසු යාමට කැමති මෙම අවතැන් වූවන් ආපසු යැවීම සහ යළි පදිංචි කිරීම සඳහා වැඩසටහනක් ආරම්භ කළ යුතු බව ද කොමිසමේ අදහසයි. ඉහත (9.138) විස්තර කෙරුණු යෝජිත ව්‍යාපෘතිය, පැරණි අභ්‍යන්තරව අවතැන් වූවන්ගේ ස්වේච්ඡාමය ආපසු යාම හෝ යළි පදිංචි වීම සඳහා සහ ඔවුන්ගේ ගෙවත්ත සහ කෘෂිකාර්මික ඉඩම් යළි ලබා ගැනීමට සහාය වීම සඳහා ද ප්‍රයෝජනයට ගත හැකිය. අවතැන් වීම පිළිබඳ එක්සත් ජාතීන්ගේ මාර්ගෝපදේශක මූලධර්ම සහ අවතැන් වූවන්ගේ ඉඩම් හිමිකම් ප්‍රතිෂ්ඨාපනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ මාර්ගෝපදේශක මූලධර්ම, අවතැන් වුණු කාල පරිච්ඡේදය හෝ අවතැන් වීමට බලපෑ හේතු පදනම් කර ගෙන අවතැන් වූවන්ට යෝග්‍යතාවක් ලබා නොදෙන බව සඳහන් කිරීම ද මෙහි උචිත වේ. (9.149-362 වන පිටුව) • යෝග්‍ය අනාගත ජාතික ඉඩම් ප්‍රතිපත්ති මාර්ගෝපදේශ යෝජනා කරනු පිණිස ආණ්ඩුව ජාතික ඉඩම් කොමිසමක් (NLC) පිහිටුවීමේ ක්‍රියාව කඩිනම් කළ යුතු බව කොමිසමේ අදහස යි. (9.150-362 වන පිටුව) • 'වන්නියෙ හි සහ යාපනයෙ හි අවතැන් වූවන්ගේ සහ උතුරු පළාතෙ හි සහ නැගෙනහිර පළාතෙහි කෘෂිකාර්මික ඉඩම් සහ තර්ජිත ගම්මානවල නිවාස අහිමි වූවන්ගේ ඉඩම් හිමිකම් ප්‍රතිෂ්ඨාපනය කිරීම' ආණ්ඩුවේ සහ විපක්ෂයේ දේශපාලන පක්ෂ විසින් පටු දේශපාලන වාසි තකා මෙවලමක් ලෙස යොදා නොගන්නා බවටත්, ද්විපාර්ශ්වික අවබෝධයකට එළඹිය යුතු යැයි ද කොමිසම සියලු දේශපාලන පක්ෂවලින් ඉල්ලා සිටින අතර සියලු දේශපාලන පක්ෂ වලට නිර්දේශ කර සිටී. (9.152-363 වන පිටුව) **<u>හිමිකම් ප්‍රතිෂ්ඨාපනය/වන්දි සහන පිළිබඳ නිරීක්ෂණ සහ නිර්දේශ</u>** • ගෙවීම් ලැබීම සඳහා සුදුසුකම් ඇති අයට සැලකිය යුතු කාල රාමුවක් තුළ ඒවා ලබා ගත හැකි බව සහතික කිරීමට කොමිසම අපේක්ෂා කරයි. (9.153-363 වන පිටුව) • ත්‍රස්තවාදී ප්‍රචණ්ඩත්වය සහ ආණ්ඩුවේ ආරක්ෂක හමුදා වල මෙහෙයුම් නිසා හානි වීමෙන් පීඩාවට පත්ව සිටින පුද්ගලයා/පුද්ගලයන් සඳහා වන්දි සහන ලබා දීම පිළිබඳ ව ශ්‍රී ලංකාවේ ආණ්ඩුවේ ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් වගකීම දරන විශේෂඥ ආයතනය වනුයේ පුද්ගලයන්, දේපොල සහ කර්මාන්ත පුනරුත්ථාපන අධිකාරිය (REPPIA) යි. (9.154-363 වන පිටුව) • පශ්චාත් ගැටුම් අවශ්‍යතා සැපිරීමට උර දීමේ දී රෙපියා (REPPIA) ආයතනය සතු කාර්ය භාරය සහ සම්පත් වඩා කාර්යක්ෂම කිරීමේ සහ ප්‍රවර්ධනය කිරීමේ දැක්මකින් යුතුව රජය එහි කාර්ය භාරය සහ ධාරිතාව සමාලෝචනයට ලක් කළ යුතු යැයි කොමිසම නිර්දේශ කර සිටී. (9.155-363 වන පිටුව) • බලපෑමට ලක් වුණු පුද්ගලයන්ට සහන සැපයීමෙහි ලා පවතින වඩාත් ම තීරණාත්මක හා එකම ගැටලුව වන්නේ සුදුසුකම් ලබා ඇති ගෙවීම් සපුරා ලීම

සඳහා අවශ්‍ය කරන අරමුදල් දැඩි ලෙස හිඟ වීම යි. (9.156-363 වන පිටුව)

- නියමිත වේලාවට සහ පූර්ණ වශයෙන් ගෙවීම් සඳහා ප්‍රමුඛතාව දීම සම්බන්ධයෙන් ආණ්ඩුව වගකීම භාර ගත යුතු ය. (9.157-364 වන පිටුව)
- ගැටුමේ අවසානය දක්වා අත්විඳි පාඩු වෙනුවෙන් ගෙවීම් සම්පූර්ණ කිරීමට කාල සීමාවක් නියම කළ යුතු ය. (9.158-364 වන පිටුව)
- මරණ, තුවාල සහ නිවාසකරණ හිමිකම් වලට අදාළව 'පොදු මහජනතාව' සහ 'රජයේ සේවකයන්' වෙත කළ යුතු ගෙවීම් වලට රෙපියා ආයතනය වහා ප්‍රමුඛතාව දිය යුතු ය. රාජ්‍ය නොවන සංවිධානවල සහන වැඩ සටහන්වල දී, විශේෂයෙන් ම නිවාසකරණය සඳහා සැපයෙන සහායේ දී, සුදුසුකම් නොලබන පිරිසක් බවට පත් කර ඇති රජයේ සේවකයන් පිළිබඳ ගැටලුව යළි සලකා බැලිය යුතු ය. (9.162-364 වන පිටුව)
- වන්දි ප්‍රමාණය වැඩි කරන ලෙස රෙපියා ආයතනයට ඉල්ලීම් ඉදිරිපත් කර ඇත. කෙසේ වුව ද, අතපසු වුණු ගෙවීම් සහ තවමත් තීරණයක් ගෙන නොමැති අයදුම්පත් අනුමත කිරීම සඳහා අවශ්‍ය මූල්‍යමය කැප කිරීම සැලකිල්ලට ගන්නා කොමිසම, ප්‍රමාණය වැඩි කිරීම ඉටු කළ හැකි පියවරක් යැයි නො සලකයි. (9.163-364 වන පිටුව)
- පුළුල් ප්‍රතිසන්ධාන දැක්මෙන් න්‍යායිකව සලකන කළ කොමිසමේ අදහස වන්නේ හිටපු සටන්කරුවන් සහ සමීප ඥාතීන් ද වන්දි සහන සඳහා සුදුස්සන් ලෙස සැලකිය යුතු බවයි. (9.164-365 වන පිටුව)
- නිවාස අවශ්‍යතා වලට වහා විසඳුම් සෙවිය යුතු ය. (9.165-365 වන පිටුව)

<u>අටවන පරිච්ඡේදය : ප්‍රතිසන්ධානය - I වන කොටස: පශ්චාත් යුධ ප්‍රතිසන්ධානය කෙරෙහි බලපාන ගැටලු පිළිබඳ නිරීක්ෂණ</u>

- මෙම ගැටලු සලකා බැලිය යුත්තේ ප්‍රතිසන්ධානය සහ මිත්‍රත්වය සහ ජාතික සුසංවාදය පිළිබඳ තත්ත්වය තුළ යැයි කොමිසම සළකා බලයි. එදිනෙදා ජීවිතයට සෘජුව අදාළ වන බවට ඉස්මතු කෙරුණු ගැටලු කිහිපයක් සම්බන්ධයෙන් කොමිසම සිවිල් පරිපාලකයන්ගෙන් (දිසාපතිවරුන්ගෙන්) සහ ආරක්ෂක හමුදාවලින් යාවත්කාලීන කළ තොරතුරු බලාපොරොත්තුවෙන් සිටින අතර, සමස්තයක් ලෙස ගත් විට මතු කරනු ලබන ගැටලු සම්බන්ධයෙන් සැලකිය යුතු ප්‍රගතියක් අත් කර ගෙන ඇති බව සහ එම ප්‍රගතිය අඛණ්ඩව පෙරට යමින් පවතින බව පෙන්නුම් කරන, 2011 වසරේ දී නිකුත් කරන ලද උතුරු පළාතේ යළි පදිංචි කිරීම්, සංවර්ධනය සහ ආරක්ෂාව සම්බන්ධ ජනාධිපති කාර්යාසධක බලකා වාර්තාව, මහ බැංකුවේ සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ වාර්තා මෙන් ම මානුෂීය කටයුතු සම්බන්ධීකරණ කාර්යාලය (OCHA) සකස් කළ මානුෂීය සහ යථා තත්ත්වයට පත් වීම පිළිබඳ ඒකාබද්ධ යාවත්කාලීන වාර්තා ද කොමිසමේ සලකා බැලීමට ලක් වේ. (9.168-365 වන පිටුව)
- යළි පදිංචි කිරීම්, ජීවනෝපාය, අධ්‍යාපන, වෛද්‍ය, ප්‍රවාහන සහ ස්ථිර නිවාස පිළිබඳ මහජන අවශ්‍යතා වලට විසඳුම් සෙවීම සඳහා බලපෑමට ලක් වුණු සියලු දිස්ත්‍රික්කවල දී සාමූහික ව පරිශ්‍රම දරනු ලබයි.

  ආ. ඉඩම් සම්බන්ධ ගැටලු අඛණ්ඩ ව අභියෝගයක්ව පවතී.

  ඇ. සැබෑ කැප කිරීම් සහ බෙදා හැරීම් සමග සසඳන කල, ස්ථිර වාසස්ථාන අවශ්‍යතා බරපතළ සැලකිල්ලක් දැක්විය යුතු කාරණාවකි.

ඈ. අවදානමට ලක් විය හැකි ඇතැම් පුද්ගල කණ්ඩායම් වල අවශ්‍යතා සඳහා වඩා යොමු වුණු ප්‍රවේශයක් ඉල්ලා සිටී.

ඉ. ඇතැම් දිස්ත්‍රික්කවල, සිවිල් පරිපාලනය යළි ස්ථාපනය කිරීම තවමත් සිදුවන්නේ ඉතා මන්දගාමීව ය. ග්‍රාම නිලධාරී තනතුරු සම්බන්ධයෙන් බොහෝ පුරප්පාඩු පවතී. (9.169-365 වන පිටුව)

- ශ්‍රී ලංකාවේ ආණ්ඩුව උතුරට සහ නැගෙනහිරට සැලකිය යුතු අරමුදල් සහ සම්පත් ප්‍රමාණයක් සැබැවින් ම කැප කර ඇති බව ද, ශ්‍රී ලංකාවේ සංවර්ධන හවුල්කරුවන් මෙම පරිශ්‍රමයන්ට දායක වෙමින් සිටින බව සහ ආණ්ඩුවේ ආයතන සමග සහයෝගයෙන් වැඩ කරමින් සිටින බව ද කොමිසම සඳහන් කර සිටී. ඒ අතර ම, සම්පත්, ප්‍රායෝගික දැනුම සහ අත්දැකීම් සජීවිකරණය කිරීම සම්බන්ධයෙන් විදේශීය සංවර්ධන හවුල්කරුවන් සතු පූර්ණ ශක්තිය උකහා ගැනීම පිණිස, රට තුළ සහ විදේශයෙ හි සිටින තම සංවර්ධන හවුල්කරුවන් සම්බන්ධයෙන් වඩා ගිවිසුම්ගත සහ ඵලදායී ප්‍රතිපත්තියක් යොදා ගත යුතු යැයි කොමිසම අදහස් කරයි. (9.170-366 වන පිටුව)
- සැලකිය යුතු කාල සීමාවන් ලබා දී, ආරක්ෂක හමුදා සිවිල් ක්‍රියාකාරකම් වලට සම්බන්ධ වීම සහ ආරක්ෂක හමුදා පෞද්ගලික ඉඩම් ප්‍රයෝජනයට ගැනීම ක්‍රමික ව නතර කළ යුතු යැයි කොමිසම නිර්දේශ කර සිටී. (9.171-367 වන පිටුව)

<u>අටවන පරිච්ඡේදය: ප්‍රතිසන්ධානය - II වන කොටස: ප්‍රතිසන්ධානය පිළිබඳ නිරීක්ෂණ සහ නිර්දේශ</u>

- ගැටුම අවසන් වූ තැන් සිට වසර දෙකක් ගත වී ඇතත්, ප්‍රචණ්ඩත්වය, සැකය සහ වෙනස්කම් වලට ලක් කිරීම පිළිබඳ හැඟීම සාමාජීය සහ දේශපාලනික ජීවිතය තුළ තවමත් පැතිර පවතින බව ද කොමිසමට සිහිපත් කෙරිණ. පැහැදිලි ලෙස යොමු කළ පශ්චාත් යුධ සමය ගොඩ නැගීමේ න්‍යාය පත්‍රයක් ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් සිදුව තිබෙන පමාව මෙම තත්ත්වයට හේතු වී තිබෙනවා විය හැකිය. (9.181-369 වන පිටුව)
- ශ්‍රී ලංකාවෙහි ජනවාර්ගික ගැටුමේ මූල හේතුව පවතින්නේ දෙමළ ජනතාවගේ අව්‍යාජ දුක් ගැනවිලි වලට විසඳුම් සෙවීමට අනුපිළිවෙලින් බලයට පත් වූ ආණ්ඩු අසමත් වීම තුළ යැයි කොමිසම අදහස් කරයි. (9.184-369 වන පිටුව)

<u>දෙමළ ප්‍රජාවේ දුක් ගැනවිලි</u>

- දෙමළ ජනයා දුක් ගැනිවිලි ඉදිරිපත් කිරීම සිංහල-දෙමළ සම්බන්ධතා මධ්‍යයේ දිගින් දිගට ම පවතින අතර, පශ්චාත් ගැටුම් ප්‍රතිසන්ධාන සහ සාමකාමී සහජීවන ක්‍රියාවලියෙහි පළමු පියවර ලෙස සලකා ඒවා ඍජුව සහ සාධාරණ ලෙස හඳුනාගෙන විසඳුම් සෙවිය යුතුය. (9.187-369 වන පිටුව)

<u>ශ්‍රී ලංකාව තුළ බහුතර-සුලුතර සම්බන්ධතාවන්ගේ ඓතිහාසික පසුබිම</u>

- හේතු පාදක වුණු ගැටලු විසඳීම සඳහා පරිපාලනමය සහ ව්‍යවස්ථාමය සුරක්ෂිතතාවන් අවශ්‍ය වුණු නමුත්, බහුතරයේ සහ සුලුතරයේ අන්‍යෝන්‍ය පැවතුම් වල මූලික වෙනසකින් තොරව අපේක්ෂිත අරමුණු ළඟා කරගත නොහැකි බව සෝල්බරි කොමිසම නිගමනය කළේ ය. දෙපාර්ශවයේ මෙම හැඟීම් ප්‍රජාවන් දෙක අතර සම්බන්ධතා කෙරෙහි තීරණාත්මක බලපෑමක් ඇති කරන ලදී. (9.189-370 වන පිටුව)
- අන්තර් ජනවාර්ගික සම්බන්ධතාවේ තීරණාත්මක මතභේදය, පළමුව පැමිණියේ 1958 කැරැල්ල සමග ය. අනතුරුව 1977 දී ය. කූට ප්‍රාප්තියට පත් වූයේ 1983

	‘කළු ජූලිය’ නමින් හඳුන්වන ලද ගැටුම්කාරී තත්ත්වය වන අතර එහිදී දෙමළ පුරවැසියන්ට ප්‍රමාණවත් ආරක්ෂාවක් සැපයීමට එවකට පැවති ආණ්ඩුව පිළිකුල් සහගත ලෙස අසමත් විය. (9.191-370 වන පිටුව) **<u>මුස්ලිම් ප්‍රජාවේ දුක් ගැනවිලි</u>** • අවතැන් වුණු මුස්ලිම්වරුන්ට උතුරු පළාතෙහි තම මුල් පදිංචි ස්ථාන වෙත ආපසු යාම සඳහා කල් තියා ආපසු පැමිණීමට ආණ්ඩුව පහසුකම් සැපයිය යුතුය. (9.194-371 වන පිටුව) • එල්ටීටීඊ ය විනාශ කළ හෝ හානි කළ මුස්ලිම් දේවස්ථාන, නිවාස සහ පාසල් යළි ඉදි කිරීමට සහාය වීම සඳහා ආණ්ඩුව ක්ෂණික පියවර ගත යුතුය. (9.195-371 වන පිටුව) • අසමානතාව සම්බන්ධයෙන් ‘පැරණි අභ්‍යන්තර ව අවතැන් වූවන්’ තුළ පවතින හැඟීම් වල යම් වැදගත්කමක් තිබෙන බව කොමිසමේ විශ්වාසය යි. සමානතාව සහ වෙනස්කම් නොකිරීම යනු ශ්‍රී ලංකාව ද එකඟව තිබෙන එක්සත් ජාතීන්ගේ සියලු මානව හිමිකම් මෙවලම් වල ප්‍රමුඛ මූලධර්ම වේ. මෙලෙස, ‘පැරණි අභ්‍යන්තර අවතැන් වූවන්ගේ’ තත්ත්වයට විසඳුම් සෙවීමේ දී, තම සංවර්ධන හවුල්කරුවන්ගේ සහයෝගය ඇතිව සමානතාවේ සහ වෙනස්කම් නොකිරීමේ මූලධර්ම සැලකිල්ලට ගැනීම ශ්‍රී ලංකාවේ ආණ්ඩුවේ වගකීමකි. (9.196-371 වන පිටුව) **<u>පෙර පැවති ගැටුම් ප්‍රදේශව ලට ආසන්නව පිහිටි ගම්මානවල ජීවත් වන සිංහලයන්ගේ දුක් ගැනවිලි</u>** • මෙම ප්‍රදේශවල වෙසෙන ජනයාගේ ජීවනෝපාය වැඩි දියුණු කිරීම පිළිබඳ ප්‍රශ්නයට විසඳුම් සෙවීම සඳහා ඔවුන්ගේ අවශ්‍යතාවන් හඳුනා ගැනීමට ආණ්ඩුව පූර්ණ අධ්‍යයනයක් ආරම්භ කළ යුතු ය. (9.198-371 වන පිටුව) • ආණ්ඩුව ගම්මාන වලට එක සමාන සම්පත් වෙන් කිරීමක් සහ සංවර්ධනයක් සහතික කළ යුතු බව කොමිසමේ අදහස යි. (9.199-371 වන පිටුව) **<u>දෙමළ ජනයාගේ දුක් ගැනවිලි</u>** • සෞඛ්‍ය සහ අධ්‍යාපනික පහසුකම් වැඩි දියුණු කිරීම සඳහා ද, වතු ප්‍රදේශ තුළ වඩා යහපත් ජීවන තත්ත්වයන් සම්පාදනය කිරීමට ද අවශ්‍ය පියවර ගත යුතු යැයි ආණ්ඩුවට නිර්දේශ කර සිටී. (9.200-372 වන පිටුව) • වඩා පුළුල් පශ්චාත් ගැටුම් සංවර්ධන න්‍යාය පත්‍රයක් සහ ප්‍රතිසන්ධාන වැඩසටහන් වර්ධනය කර දෙමළ ජනයාගේ ඉතා වැදගත් අවශ්‍යතාවන් කෙරෙහි සැලකිල්ල යොමු කළ යුතු යැයි ද කොමිසම නිර්දේශ කර සිටී. (9.201-372 වන පිටුව) **<u>දුක් ගැනවිලි වලට විසඳුම් සෙවීම සහ ප්‍රතිසන්ධානය ප්‍රවර්ධනය කිරීම සම්බන්ධ ගැටලු: නීතියේ ආධිපත්‍ය ක්‍රියාත්මක කිරීමට අසමත් වීම</u>** සාකච්ඡා අතරතුර දී පැන නැගුණු ගැටලු අතර පහත සඳහන් ඒවා විය: අ. දේශපාලන සම්බන්ධකම් සහිත පුද්ගලයන් අපරාධ කළ විට, අපරාධ පිළිබඳ පරීක්ෂණ පැවැත්වීමට සහ අපරාධකරුවන්ගෙන් නිදහසට කරුණු විමසා සිටීමට නීතිය බලාත්මක කරන බලාධිකාරයන් අසමත් වීම. ආ. ගැටුම අවසන්ව තිබිය දීත්, තවමත් නීතිය සහ සාමය පිළිබඳව සැලකිය යුතු ගැටලු පවතී.

	ඇ. ගිනි අවි පාවිච්චිය සමග බැඳුණු දේශපාලන ප්‍රචණ්ඩත්වය මෙම රටේ නීතිගරුක පුරවැසියන් අතර බොහෝ ගැටලු මතු කර ඇත. • අනවසර ආයුධ ළඟ තබා ගෙන සිටින පුද්ගලයන් නිරායුධ කිරීමට මෙන්ම එවැනි වැරදිකරුවන්ට එරෙහි ව නීතිමය පියවර ගැනීමට ද ආණ්ඩුව ක්ෂණික පියවර ගත යුතු යැයි කොමිසම දැඩි ලෙස නිර්දේශ කර සිටී. (9.204-373 වන පිටුව) • පැහැර ගෙන යාම, බලෙන් මුදල් ලබා ගැනීම, කොල්ල කෑම යනාදි අපරාධ කිහිපයක්, නැගෙනහිර පළාතේ දී භාරති නැමැත්තෙකු කර ඇති බවට ඉදිරිපත් වුණු චෝදනා පැවතිණ. කොමිසම මෙම කරුණ අදාළ බලාධිකාරයන්ගේ අවධානයට යොමු කළේ ය. වැරදි කළැයි කියනු ලබන තැනැත්තාට එරෙහිව කිසිම අර්ථාන්විත පියවරක් ගෙන නොතිබීම ගැන කොමිසම සඳහන් කරන්නේ කනගාටුවෙනි. කෙසේ වුව ද, පොලිස් නිලධාරීන් හයසියයක් ඝාතනය කිරීම සම්බන්ධයෙන් මේ වන තෙක් කිසිදු පරීක්ෂණයක් පවත්වා නැති බව මෙම කොමිසම සඳහන් කරන්නේ කනගාටුවෙනි. අපරාධයේ ස්වභාවය සහ ප්‍රතිසන්ධානය කෙරෙහි එය කරන බලපෑම නිසා, මෙම කාරණය පූර්ණ පරීක්ෂණයක අවශ්‍යතාව මතු කරන බව කොමිසමේ අදහසයි. (9.207-373 වන පිටුව) • ඊපීඩීපීයට එරෙහිව පැමිණිලි කිහිපයක් පවතින නිසා මෙම චෝදනා සම්බන්ධයෙන් පූර්ණ පරීක්ෂණයක් පැවැත්විය යුතු බව කොමිසමේ අදහස යි. (9.208-373 වන පිටුව) • බොහෝ ප්‍රකාශ ඉදිරිපත් කරන්නෝ මේජර් සීලන් නමැති පුද්ගලයෙකු නායකත්වය දරන කල්ලියක නීති විරෝධී ක්‍රියාවන් කෙරෙහි කොමිසමේ අවධානය යොමු කරවූහ. කොමිසම මෙය ප්‍රදේශයේ නියෝජ්‍ය පොලිස්පතිවරයාගේ අවධානයට ලක් කරවූයේ ය. කෙසේ වුව ද, චෝදනාවට ලක්ව සිටින ප්‍රධාන අපරාධකරුවා තවමත් නිදැල්ලේ පසු වෙයි. (9.209-374 වන පිටුව) • පළාතේ සේවය කරන පොලිස් නිලධාරීන්ට පරීක්ෂණ සම්බන්ධ නීතිමය ප්‍රවීණතාව ලබා ගැනීමේ සහ නීතිමය පියවර ගැනීම සිදු කරන ආකාරය දැක බලා ගැනීමේ අවස්ථාවක් නොමැති බව කොමිසම සඳහන් කර සිටී. (9.212-374 වන පිටුව) • දේශපාලන සම්බන්ධකම් නොතකා සියලු චෝදනා පරීක්ෂාවට ලක් කළ යුතු යැයි ද, වැරදි කළ තැනැත්තන්ට එරෙහිව නීතිමය පියවර ගෙන දඬුවම් පැමිණවිය යුතු යැයි ද කොමිසම අවධාරණය කර සිටී. එවිට, අපරාධ යුක්තිය කෙරෙහි මහජනයා අතර විශ්වාසය ඇති කරවිය හැකි වනු ඇත. (9.213-374 වන පිටුව) • රාජ්‍යයේ ආරක්ෂාව පිළිබඳ වගකීම දරන සන්නද්ධ හමුදා සම්බන්ධයෙන් කටයුතු කරන ආයතන සහ පොලිස් දෙපාර්තමේන්තුව අතර පවතින සම්බන්ධතා බිඳ හෙලිය යුතු ය. (9.214-374 වන පිටුව) • ස්වාධීන ස්ථිර පොලිස් කොමිසමක් යනු පොලීසිය ඵලදායී ලෙස ක්‍රියාත්මක වීම සහ මහජන විශ්වාසය ඇති කිරීම සහතික කිරීම සඳහා වන පූර්ව අවශ්‍යතාවක් බව කොමිසම සඳහන් කරයි.

	<u>පාලනය පිළිබඳ ගැටලු</u> • පරිපාලන පද්ධතියෙහි පවතින ඌණතා හේතුවෙන් ඇතැම් සුලුතර දුක්ගැනවිලි සහ යහපාලනයක් නොමැතිකම, ජනවර්ගය නොතකා සියලු පුරවැසියන්ට බලපාන බවට ඉදිරිපත් කළ ප්‍රකාශ කොමිසමට අසන්නට ලැබිණ. මෙම ඌණතා සියලු පාර්ශවකරුවන්ගේ සාමූහික අවශ්‍යතාවන් ඉස්මතු කරයි. (9.216-375 වන පිටුව) ***පුරවැසි දුක් ගැනවිලිවලට විසඳුම් සෙවීම සඳහා විශේෂ ආයතනයක්*** • 1994 අංක 26 දරන පනතින් හඳුන්වා දුන් සංශෝධනය මඟින් මහජන පෙත්සම් ක්‍රියා පටිපාටිය වැඩි දියුණු කිරීමට උත්සාහ කළ ද, පරිපලානය පිළිබඳ පාර්ලිමේන්තු කොමසාරිස්වරයාගේ කාර්යාලය හා සම්බන්ධ වත්මන් නීතිය හා රජයේ ක්‍රියාවන් පිළිබඳ පැන නඟින දුක් ගැනවිලි වලට ඵලදායීව විසඳුම් සෙවීම සඳහා එය ප්‍රමාණවත් නොවේ. එමනිසා, රටේ පාලන කටයුතු වල නිරතව සිටින රජයේ නිලධාරීන් සහ වෙනත් පුද්ගලයන් බලය අනිසි ලෙස පාවිච්චි කිරීම නිසා පැන නගින සියලු පුරවැසියන්ගේ, විශේෂයෙන් ම සුලුතර ප්‍රජාවන්ගේ දුක් ගැනවිලි වලට විසඳුම් සෙවීම සඳහා ආණ්ඩුව ස්වාධීන ආයතනයක් පිහිටුවිය යුතු යැයි කොමිසම නිර්දේශ කර සිටී. (9.218-375 වන පිටුව) • කවර හෝ විධායක හෝ පරිපාලනමය ක්‍රියාවක් නිසා, විශේෂයෙන් ම ජනවාර්ගිකත්වය හෝ ආගම පදනම් කර ගෙන පැන නැඟි දුක් ගැනවිල්ලක් සම්බන්ධයෙන් මෙම රටේ ඕනෑම පුරවැසියෙකුට ස්වාධීන ආයතනය හමුවේ සහන ඉල්ලා සිටීමට අයිතිය තිබිය යුතු ය. (9.219-375 වන පිටුව) • දිස්ත්‍රික්ක සහ පළාත් මට්ටමින් අන්තර් ආගමික ප්‍රතිසන්ධාන සහ සාම කමිටු පිහිටුවිය හැකි ය. (9.221-375 වන පිටුව) <u>වෙනත් වැඩ පිළිවෙළ</u> • සියලු පුරවැසියන්ගේ, විශේෂයෙන් ම සුලුතර ප්‍රජාවන්ගේ උත්සුකතාවන් සහ කාංසාවන් පිළිබඳව සංවේදී නිර්ණායක වලින්, නියමයන්ගෙන් සහ කල්ක්‍රියා සංග්‍රහයන්ගෙන් රාජ්‍ය සේවයේ පද්ධති වලට සහ ක්‍රියා පටිපාටි වලට මග පෙන්වනු ලැබිය යුතු ය. (9.222-375 වන පිටුව) • සංවර්ධන ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කළ යුත්තේ ප්‍රදේශයේ ජනයාගේ උපදෙස් විමසා සහ ඔවුන්ගේ සහභාගීත්වය ඇතිව බව ආණ්ඩුව සහතික කළ යුතු ය. (9.223-376 වන පිටුව) • රාජ්‍ය සේවයේ කාර්ය ආචාර ධර්ම වැඩි දියුණු කිරීම සඳහා වන පුහුණු වැඩසටහන් හරහා ද ඇතුළුව ආකල්පමය වෙනස්කම් ඇති කිරීම සඳහා විශේෂ වැඩසටහනක් සකස් කර ක්‍රියාත්මක කළ යුතු යැයි කොමිසම නිර්දේශ කර සිටී. (9.224-376 වන පිටුව) • අප්‍රමාදීව ස්වාධීන රාජ්‍ය සේවා කොමිසමක් පිහිටුවිය යුතු යැයි කොමිසම දැඩි ලෙස නිර්දේශ කර සිටී. (9.226-376 වන පිටුව) • මිලිටරියේ පෙනී සිටීම ක්‍රමයෙන් අඩු කළ යුතු ය. (9.227-376 වන පිටුව) • ඕනෑම යෝජිත විධිවිධානයක ව්‍යවස්ථානුකූල භාවය සම්බන්ධයෙන් ශ්‍රේෂ්ඨාධිකරණය ඉදිරියේ ක්‍රියාකාරී ලෙස අදහස් විමසීම සඳහා මහජන සාමාජිකයන්ට සහ වෙනත් සංවිධාන වලට ප්‍රමාණවත් නීතිමය විධිවිධාන පැවතිය යුතු ය. එමනිසා, යෝජිත නීතිවලට අභියෝග කිරීම සඳහා ප්‍රමාණවත් කාල රාමුවක් සම්පාදනය කිරීමට, සුදුසු ව්‍යවස්ථාමය සංශෝධනයක් පිළිබඳව

	ඒකමතිකත්වයකට එළඹීම සඳහා ආණ්ඩුව සහ විපක්ෂය සියලු පරිශ්‍රමයන් දැරිය යුතු යැයි කොමිසම නිර්දේශ කර සිටී. (9.228-376 වන පිටුව) <u>**බලය බෙදා හැරීමේ අවශ්‍යතාව**</u> • තිරසර සාමය සහ ආරක්ෂාව සහතික කිරීම සඳහා යාන්ත්‍රණයක් සහ රාමුවක් ඇති කළ යුතුය. (9.230-377 වන පිටුව) බලය බෙදා හැරීම යනු: අ. බලය බෙදා හැරීම මගින් අනිවාර්යයෙන්ම වඩා පුළුල් සුසංවාදයක් සහ එකමුතුකමක් ප්‍රවර්ධනය කරයි; ආ. සෑම මට්ටමක දී ම, විශේෂයෙන් ම ආණ්ඩුවේ සියලු මට්ටම්වල දී සියලු ප්‍රජාවන්ට අයත් ජනයාට බලය පැවරෙන බව සහතික කිරීමට අවධානය යොමු විය යුතුය. ඇ. මහජයනයා ප්‍රජාතන්ත්‍රවාදයෙන් බල ගැන්වීම සිදු විය යුත්තේ, මානව හිමිකම් ප්‍රවර්ධනය කිරීමේ සහ ආරක්ෂා කිරීමේ පුළුල් රාමුව තුළ ය. ඈ. පළමුව, ප්‍රජා මූල මට්ටමේ දී වඩා පුළුල් මහජන සහභාගීත්වයක් සිදු වන බව සහතික කිරීම සඳහා පළාත් පාලන ආයතන බල ගැන්විය යුතු ය. දෙවනුව, සුදුසු බලය බෙදා හැරීමේ පද්ධතියක් සැලසුම් කර ගැනීමේ දී පළාත් සභා ක්‍රමයේ ක්‍රියාකාරීත්වය තුළ පවතින අඩුපාඩුකම් වලින් උගත් පාඩම් සැලකිල්ලට ගැනීම ද අවශ්‍යයෙන්ම කළ යුත්තකි. (9.232-378 වන පිටුව) • සැලකිල්ලට ගත හැකි අතිරේක යාන්ත්‍රණයක් නම් පළාත් නියෝජිතයන්ගෙන් සමන්විත උත්තර මන්ත්‍රී මණ්ඩලයක් පිහිටුවීමට ඇති හැකියාව යි. (9.232-378 වන පිටුව) • ඒකමතික බලය බෙදා හැරීමේ රාමුවක් සමඟින් අවශ්‍යතා සපුරන ප්‍රජාතන්ත්‍රාවදී ක්‍රමය ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීම තුළ නිසඟයෙන්ම පිහිටි ගුණාංග සහ ආයතන නිසා, සුලුතර ප්‍රජාවන්ගේ දුක් ගැනවිලි වලට ද විසඳුම් සපයනු ඇත. (9.233-378 වන පිටුව) • ජනවාර්ගික ගැටලුවේ අනවශ්‍ය ජාත්‍යන්තරීකරණය ද, ඩයස්පෝරාව යොදන බාහිර පීඩනය සහ දේශපාලන එකඟතාවක් සඳහා කෙරෙන සාකච්ඡාවලට ඉන් සිදු වන බලපෑම ද දෙමළ නායකයන් සැලකිල්ලට ගත යුතුය. (9.234-378 වන පිටුව) • බලය බෙදා හැරීමේ හෝ බලය බෙදාහදා ගැනීමේ කවර යාන්ත්‍රණයක් වුව ද මුදුන් පමුණුවා ගත යුත්තේ ස්වෛරී, දේශපාලනිකව ස්වාධීන සහ බහුජනවාර්ගික ශ්‍රී ලාංකික රාජ්‍යයක පුළුල් රාමුව තුළ ය යන්න අවශ්‍යයෙන්ම සිදු විය යුත්තක් බව කොමිසමේ අදහස යි. (9.235-378 වන පිටුව) • විශේෂයෙන්ම ප්‍රජා මූල මට්ටමේ දී ප්‍රත්‍යන්ත ප්‍රදේශ වලට හැකි උපරිම බලය බෙදා හැරීම සඳහා මෙන්ම මධ්‍යම ආණ්ඩුවේ දී බලය බෙදාහදා ගැනීම සඳහා දැනට පවත්නා කරුණු පදනම් කරගෙන, බලය බෙදා හැරීම පිළිබඳව ඒකමතික භාවයක් ඇති කර ගැනීම සඳහා සද්භාවයෙන් යුතු පරිශ්‍රමයකට මුල පිරීමට වත්මන් අවස්ථාව ප්‍රයෝජනයට ගත යුතු යැයි කොමිසම නිර්දේශ කර සිටී. (9.236-379 වන පිටුව) <u>**භාෂා ප්‍රතිපත්තිය**</u> • දෙමළ භාෂාව කතා කරන පොලිස් නිලධාරීන් බඳවා ගැනීම සිදු වෙමින් පවතින බව පිළිගන්නා නමුත්, ජනාධිපතිවරයා වෙත කළ තම අන්තර්වාර

	සන්නිවේදනයේ දී මෙම කාරණා වලට අදාළ හදිසි පියවරයන් පිළිබඳව කොමිසම ඉදිරිපත් කළ නිර්දේශ තවමත් ක්‍රියාත්මක කර නැති බව කොමිසම සඳහන් කරන්නේ කනගාටුවෙනි. (9.240-379 වන පිටුව) • භාෂා ප්‍රතිපත්තිය පූර්ණ ලෙස ක්‍රියාත්මක කිරීම තුළ, ප්‍රජා මට්ටමින් වෙන් කළ ක්‍රියාකාරී සැලසුම් අඩංගු විය යුතු අතර, පුරවැසි සහභාගීත්වය ඇතිව නිරීක්ෂණය කළ හැකි ඉලක්ක සහිතව, කොට්ඨාස සහ පළාත් මණ්ඩල නිසි ලෙස ආවරණය විය යුතු ය. (9.241-379 වන පිටුව) • අවබෝධය, විවිධත්වය සහ ජාතික ඒකාබද්ධතාව ප්‍රවර්ධනය කිරීම සඳහා නිල භාෂා ප්‍රතිපත්තිය ඵලදායී ආකාරයෙන් ක්‍රියාත්මක කිරීම අවශ්‍යයෙන්ම කළ යුත්තකි. (9.242-380 වන පිටුව) • එකිනෙකාගේ භාෂාවන් ඉගෙනීම පාසල් විෂය නිර්දේශයේ අනිවාර්ය කොටසක් කළ යුතු ය. (9.243-380 වන පිටුව) • වසර 2020 වන විට ත්‍රෛභාෂීය ජාතියක් ගොඩ නැගීම සඳහා වන ආණ්ඩුවේ මුල පිරීම කොමිසම සාදරයෙන් පිළිගනී. (9.245-380 වන පිටුව) • කිසිම දිස්ත්‍රික්කයක් හෝ පළාතක් භාෂාව පදනම් කරගෙන වර්ගීකරණය නොකළ යුතු ය. රාජ්‍ය සේවයෙහි නිලධාරීන්ට රටේ ඕනෑම කොටසක සේවය කිරීම සඳහා භාෂා නිපුණතා පැවතිය යුතු ය. (9.246-380 වන පිටුව) • රජයේ සියලු කාර්යාලවල හැමවිට ම දෙමළ කතා කරන නිලධාරීන් සිටිය යුතු යැයි අනිවාර්ය කළ යුතු ය. (9.247-380 වන පිටුව) • රාජ්‍ය භාෂා කොමිසම, ක්‍රියාත්මක කිරීමේ ඵලදායී බලතල සහිත අධිකාරියක් විය යුතු අතර, එහි ශාඛා සෑම පළාතක ම පැවතිය යුතු ය. (9.248-380 වන පිටුව) • භාෂා බාධකය ජය ගැනීම සඳහා පවතින මෙවලමක් ලෙස ප්‍රයෝජනයට ගත හැකි තොරතුරු තාක්ෂණයට වඩා පුළුල් අවධානයක් යොමු කළ යුතු ය. (9.249-380 වන පිටුව) **<u>අධ්‍යාපනය: සමාන අවස්ථා</u>** • කුසලතා මත පදනම්ව පාසල් වලට ඇතුළත් කර ගැනීමේ ක්‍රමයක් හඳුන්වා දීමේ දැක්මකින් යුතුව මෙම පංගු ක්‍රමය පිළිබඳව පරිස්සමින් සමාලෝචනයක් කිරීම කාලෝචිත වනු ඇත. එවන් සමාලෝචනයක් කිරීම භාර ගත යුත්තේ අධ්‍යාපනයට සම්බන්ධ විශේෂඥයන්ගේ කමිටුවක් යැයි කොමිසම නිර්දේශ කර සිටී. (9.251-381 වන පිටුව) • සුලුතර ප්‍රජාවන්ට හැඟෙන හා දැනෙන වෙනස්කම් කිරීම පිළිබඳ කවර හෝ හැඟීමක් අවම කිරීම සඳහා දැරෙන සාමූහික පරිශ්‍රමයට දායකත්වයක් ලැබෙන පරිදි, ආණ්ඩුව දැඩි උනන්දුවකින් යුතුව අධ්‍යාපන පහසුකම් සාධාරණ ලෙස බෙදා හැරීමේ වැඩ සටහනක් ආරම්භ කළ යුතුය. (9.252-381 වන පිටුව) • විවිධ ජනවාර්ගික සහ ආගමික පසුබිම්වලට අයත් ළමයින්ට අධ්‍යාපනය සපයන මිශ්‍ර පාසල් වලට අනුබල දීමට මුල පුරන ප්‍රතිපත්තියක් ආණ්ඩුවට තිබිය යුතු යැයි ද කොමිසම නිර්දේශ කර සිටී. (9.253-381 වන පිටුව) **<u>සාමය පිළිබඳ අධ්‍යාපනය</u>** • ත්‍රෛභාෂා ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක කිරීමේ දී, විවිධ ප්‍රජාවන්ට අයත් සිසුන් අතර අන්තර් ක්‍රියාකාරකම් වලට සෑම අවස්ථාවක් ම තිබෙන බව සහතික කිරීමට පියවර ගත යුතු ය. (9.256-382 වන පිටුව)

- රාජ්‍ය විශ්වවිද්‍යාලවල ජනවාර්ගික වශයෙන් මිශ්‍ර ශිෂ්‍ය ගහනයක් සිටින බවත්, එමෙන්ම භාෂා තුනෙන් ම පාඨමාලා පිරිනැමෙන බව සහ ඒවා පිළිබඳව තේරීමක් කිරීමට අවස්ථාවක් තිබෙන බවත් සහතික කිරීමට පියවර ගත යුතු ය. (9.257-382 වන පිටුව)
- අන්තර් පළාත් මට්ටමේ දී ක්‍රීඩා තරඟාවලි ද, වැදගත් ජාතික ක්‍රීඩා තරඟ ද රට පුරා පැවැත්විය යුතු යැයි කොමිසම නිර්දේශ කර සිටී. (9.258-382 වන පිටුව)

<u>ඩයස්පෝරාව</u>

- ඇතැම් 'දෙමළ ඩයස්පෝරා කණ්ඩායම්' පුළුල් පදනමක් සහිත ප්‍රතිසන්ධාන පරිශ්‍රමයන්ට ඵලදායක ලෙස දායක වීමට උත්සාහ කරන නමුත්, ඇතැම් ඩයස්පෝරා කණ්ඩායම්, එදිරිවාදී පිවිසුමක් තෝරා ගෙන ඇති බව පෙනෙතැයි කොමිසම සඳහන් කළේ ය. (9.259-382 වන පිටුව)
- විදේශගත ප්‍රජාවේ ශක්තිය ප්‍රයෝජනයට ගැනීම සඳහා, ආණ්ඩුවට අදාළ පාර්ශවකරුවන් සමඟ එක්ව පුළුල් පිවිසුමක් සකස් කර ගත යුතු යැයි කොමිසම අවධාරණය කරයි.
- එදිරිවාදී පිවිසුමක් සහිත ඩයස්පෝරා කණ්ඩායම් වල තර්ජන මැඩපැවැත්වීම සඳහා ගත යුතු ක්‍රියාමාර්ග

  අ. සුලුතර පක්ෂවලට අයත් ඡන්දයෙන් පත් වුණු නියෝජිතයන් සමග බලය බෙදා හැරීම සහ වෙනත් දුක් ගැනවිලි පිළිබඳව අර්ථාන්විත සංවාදයක යෙදීම.

  ආ. තවමත් එදිරිවාදී ආකල්ප සහ එල්.ටී.ටී.ඊ.යේ වෙන්වීමේ ප්‍රවේශය සිත් වල දරා සිටින එම කණ්ඩායම් ඵලදායී ලෙස සම්බන්ධ කර ගැනීම සඳහා පියවර ගැනීම.

  ඇ. ජාත්‍යන්තර ප්‍රජාව සමග රාජ්‍ය තාන්ත්‍රික මුල පිරීමක යෙදීම.

  ඈ. ශ්‍රී ලංකාව තුළ ආයෝජනය කිරීමට සහ වැඩ කිරීමට කැමති විදේශගත වූවන් සම්බන්ධයෙන් ආණ්ඩුව සතුව වඩා ලිබරල් ප්‍රතිපත්ති සහ ආකල්ප පැවතිය යුතු ය.

  ඉ. ශ්‍රී ලංකා රාජ්‍ය තාන්ත්‍රික දූත මෙහෙයන් හරහා ගොඩ නැගෙන වැඩ පිළිවෙලක් සකස් කිරීම අවශ්‍ය ය. (9.261-383 වන පිටුව)
- ශ්‍රී ලංකාව තුළ සහ විදේශයන්හි තම සංවර්ධන හවුල්කරුවන් ඵලදායී ලෙස සම්බන්ධ කර ගැනීම ආණ්ඩුව අවශ්‍යයෙන්ම සිදු කළ යුත්තකි. මෙය වූකලී, නිවාසරකණය, පාසල්කරණය, සෞඛ්‍ය රැකවරණය සහ ජීවනෝපාය ක්‍රියාකාරකම් වැනි ක්ෂේත්‍රවල දී සංවර්ධන හවුල්කරුවන් සමග සහයෝගීව වැඩ කරමින්, ශ්‍රී ලාංකික 'ඩයස්පෝරාවට' ශ්‍රී ලංකාවේ ආණ්ඩුවට ආධාර කළ හැකි ය. (9.262- 383 වන පිටුව)
- විදේශගත ප්‍රජාවේ පාවිච්චි නොකළ ශක්තිය ප්‍රයෝජනයට ගැනීමට වැඩ පිළිවෙලක් යෝජනා කිරීම සඳහා සහ 'සතුරු ඩයස්පෝරා කණ්ඩායම්' යැයි කියනු ලබන කණ්ඩායම්වල විරෝධතාවන් සඳහා ප්‍රතිචාර දැක්වීම පිණිස සහ ඔවුන් ප්‍රතිසන්ධාන ක්‍රියාවලියෙහි නිරතව සිටින ආණ්ඩුව සහ අනෙක් පාර්ශවකරුවන් සමග ඵලදායීව සම්බන්ධ කිරීම සඳහා, ජනාධිපති කාර්යාලය, විදේශ කටයුතු අමාත්‍යාංශය, ආරක්ෂක අමාත්‍යාංශය, විදේශ රැකියා නියුක්ති කාර්යාංශය, පෞද්ගලික අංශය සහ විශේෂඥයින් යන අංශවල නියෝජිතයන් ඇතුළත් බහු විෂයීය කාර්ය බලකායක් පිහිටුවීමට ආණ්ඩුව පියවර ගත යුතු යැයි කොමිසම නිර්දේශ කර සිටී. (9.263-384 වන පිටුව)

	<u>අන්තර් ආගමික ක්‍රියාකාරකම්- ප්‍රතිසන්ධානයෙහි ලා ආගමට ඉටු කළ හැකි කාර්යභාරය</u> • නීති විරෝධී ක්‍රියාවන් පිළිබඳ පරීක්ෂණ පැවැත්වීමට සහ ඒවාට වගකිව යුත්තන්ට එරෙහිව නීතිමය පියර ගැනීමට නීතිය බලාත්මක කරන ආයතන මේ දක්වා අසමත් වී තිබීම පිළිබඳව කොමිසම සඳහන් කරන්නේ කනගාටුවෙනි. (9.267-384 වන පිටුව) • සියලු ආගම්වල සියලු ජනයා දිරි ගන්වමින්, සර්ව ආගමික නායකයක් එක්සත්ව නායකත්වය සැපයිය යුතු ය. (9.268-384 වන පිටුව) • කල්තබා අනතුරු ඇඟවීමේ සහ කල්තබා විසුරුවා හැරීමේ ක්‍රියා පටිපාටියක් ලෙස ක්‍රියා කිරීමට විධි නියෝගයක් සහිත යාන්ත්‍රණයක් අන්තර් ආගමික කණ්ඩායම් වල උපදෙස් ඇතිව පිහිටුවීමට ආණ්ඩුව පහසුකම් සැපයිය යුතු යැයි කොමිසම නිර්දේශ කර සිටී. (9.270-385 වන පිටුව) **<u>*කලාව සහ සංස්කෘතිය: ප්‍රතිසන්ධානය ප්‍රවර්ධනය කිරීමේ මෙවලම් ලෙස භාෂාමය සහ සංස්කෘතික සබඳතා*</u>** • ජාතික ප්‍රතිසන්ධාන ක්‍රියාවලියේ දී සංස්කෘතික බැඳීම් වල පවත්නා වැදගත්කම කොමිසම හමුවේ ඉදිරිපත් කෙරුණු ප්‍රකාශවලින් අවධාරණය විය. (9.272-385 වන පිටුව) • විවිධ ප්‍රජාවන් අතර පවත්නා භාෂාමය සහ සංස්කෘතික සබඳතාම් පිළිබඳව වඩා පුළුල් දැනුවත්කමක් ඇති කිරීම පුළුල් ප්‍රතිසන්ධානයක් ප්‍රවර්ධනය කිරීම සඳහා ප්‍රබල මෙවලමක් වනු ඇති බව කොමිසමේ අදහසයි. (9.274-385 වන පිටුව) • ප්‍රධාන දෙමළ සාහිත්‍ය කෘති සිංහලෙන් ද එසේම සිංහල සාහිත්‍ය කෘති දෙමළෙන් ද පරිවර්තනය කොට ප්‍රකාශයට පත් කිරීම කෙරෙහි විශේෂ අවධානයක් යොමු කළ යුතු ය. (9.275-386 වන පිටුව) • ජාතික ගීය පිළිබඳ ප්‍රශ්නය සම්බන්ධයෙන් ගත් කළ, ජාතික ගීය එකවිට එකම තාලයට භාෂා දෙකෙන් ම ගායනා කිරීමේ පිළිවෙත අඛණ්ඩව පවත්වාගෙන යා යුතු අතර, ඊට සහාය දිය යුතු ය. (9.277-386 වන පිටුව) **<u>පුද්ගලයන් අතර අන්තර් සම්බන්ධතාව</u>** • විශේෂයෙන්ම, මුහුණට මුහුණ ලා අන්තර් සම්බන්ධතා පැවැත්වීම යනු ඒකමතිකත්වය ගොඩ නැගීමේ සහ සුසංවාදය ප්‍රවර්ධනය කිරීමේ මෙවලමක් බව ඔප්පු වී ඇති නිසා, කොමිසම මෙම දැක්ම දැඩි ලෙස අනුගමනය කරයි. (9.278-386 වන පිටුව) • අදාළ ක්ෂේත්‍රවල රජයේ සියලු අමාත්‍යාංශ සහ වෙනත් ආයතන තම වගකීම්වල විෂය පථයට වැටෙන එවන් නිර්මාණාත්මක වැඩසටහන්වලට මුල පිරිය යුතු යැයි දැඩි ලෙස නිර්දේශ කර සිටී. මෙය කළ යුත්තේ සිවිල් සමාජීය කණ්ඩායම් සමග සහයෝගයෙනි. එවිට, එවන් වැඩසටහන්වල සහාය ලබා ගත හැකි පුළුල් පදනමක් ඇති කර ගත හැකි වනු ඇත. (9.281-386 වන පිටුව) **<u>දේශපාලනික ඒකමතිකත්වයේ අවශ්‍යතාව</u>** • ‘‘ද්වේශ සහගත කතාබහ’’ මහා වාර්ගික විසංවාදයන්ට දායක වුණු අවස්ථා පසු ගිය දශක හතර පහ තුළ පැන නැගී ඇති බව කොමිසම නිරීක්ෂණය කරයි. ‘ද්වේශ සහගත කතාබහ’ ජනවාර්ගිකත්වයට, ආගමට ජනවාර්ගික සහ ආගමික ආතතිය ඇවිස්සීමට, සාහිත්‍යයට සම්බන්ධ නිසා, එවැනි පිළිවෙත් කෙරෙහි අවධානය යොමු කිරීම සඳහා නිවාරක නීති පැනවිය යුතු අතර, එම නීති දැඩි

	ලෙස බලාත්මක කළ යුතු ය. (9.283-387 වන පිටුව) • **සිදු වුණු දෙය සම්බන්ධයෙන් සාමූහිකව බලවත් සේ පශ්චාත්තාප වීමක්, එක් පාර්ශවයක් තුළ වත් පහසුවෙන් හට නොගනු ඇත. එය හටගනු ඇත්තේ, සිදු වී ඇති මානව ඛේදවාචකය පදනම් කර ගෙන බලගතු සදාචාරාත්මක ස්වංතක්සේරුවක යෙදීමට ඔවුන් සූදානම් නම් පමණකි. ප්‍රතිසන්ධානයේ බීජවලට දළු ලා වැඩිය හැක්කේ සමාව සහ දයාව පවතින්නේ නම් පමණකි. සියලු පාර්ශව වල නායකයන් නිහතමානී ව එකිනෙකා වෙත අත දිගු කොට, එබඳු ගැටුමක් පැන නැගීම වැළැක්වීමට සියලු පාර්ශවයන්හි දේශපාලන නායකත්වය සාමූහිකව අසමත් වීමේ ප්‍රතිඵලයක් ලෙස මෙම ගැටුමේ ගොදුරු බවට පත් වුණු අහිංසක සිවිල් වැසියන්ගෙන් සමාව ඉල්ලා සිටිමින් ඒකාබද්ධ ප්‍රකාශයක් කළ යුතු ය. ආගමික නායකයක් සහ සිවිල් සමාජය ඒ උදෙසා ක්‍රියා කළ යුතු ය. එමඟින් සමස්ත ප්‍රතිසන්ධාන ක්‍රියාවලිය කෙරෙහි ඇති කරන සමාදානමය බලපෑම අවධාරණය කළ යුතු ය. (9.285-387 වන පිටුව)** • ජාතික දිනයේ දී වෙන ම පැවැත්වෙන වෙන ම උත්සවයක් නියම කර, ඛේදජනක ගැටුමට ගොදුරු වුණු සියලු දෙනාට සාමූහිකත්වය සහ සහානුභූතිය ප්‍රකාශ කළ යුතු යැයි ද, රට තුළ නැවත වතාවක් එවන් ලේ හැලීමක් සිදු නොවන බව සහතික කිරීම සඳහා අප වෙත ඇති සාමූහික කැප වීම පිළිබඳව ප්‍රතිඥා දිය යුතු යැයි ද කොමිසම දැඩි ලෙස නිර්දේශ කර සිටී. (9.285-387 වන පිටුව)

<u>සාරාංශය - 7 වන පරිච්ඡේදය - ශ්‍රී ලංකා රජයට සහ ශ්‍රී ලංකා හමුදාවට එරෙහිව එල්ලවී තිබෙන ප්‍රධාන චෝදනා</u>

- සත්‍ය සොයාගැනීමටත් විත්දිතයන් සඳහා යුක්තිය ඉටු කිරීමටත් යුධ අපරාධ/ මනුෂ්‍යත්වයට එරෙහි අපරාධ ගණයට ඇතුළත් විය හැකි බරපතළ සිද්ධීන් විමර්ශනය කිරීම සඳහා ස්වාධීන විනිශ්චයකාරවරයෙකු විසින් මෙහෙයවන විමර්ශනයක් සිදුකිරීම අවශ්‍ය බව පරණගම කොමිෂන් සභාවේ මතය වේ. 100 වන පිටුවේ 419 වන පරිච්ඡේදය බලන්න.

චෝදනා	නිරීක්ෂණ/ නිගමන සහ නිර්දේශ
අ. චැනල් 4 වීඩියෝ දර්ශන	- "වරදකරුවන් බවට පත්කිරීම සඳහා අවශ්‍ය වන සාක්ෂි" පිළිබඳව කථා කිරීමේ දී චැනල් 4 ආයතනය සඳහන් කරන ලද්දේ කුමන නීති පද්ධතියක්ද යන්න පිළිබඳ සටහනක් නොමැති බව මූලික කරුණක් ලෙස කොමිෂන් සභාවේ අවධානයට ලක්වී තිබේ. " චැනල් 4 ආයතනය 'වරදකරුවන් බවට පත්කිරීම සඳහා අවශ්‍ය වන සාක්ෂි' යනුවෙන් තම නිරීක්ෂණ වලින් අදහස් කරන ලද්දේ එම වැඩසටහන්වල අන්තර්ගතය මගින් ශ්‍රී ලංකා හමුදාව යුධ අපරාධ කළේ ද යන්න සාධාරණ සැකයකින් තොරව තහවුරු කිරීම සඳහා විමර්ශනයක් සිදුකිරීම සාධාරණීකරණය කරන්නේය සහ එය අහිංසකත්වය යන උපකල්පනය මත පදනම් වන්නේය යන උපකල්පනය මත මෙම කොමිෂන් සභාව තම ඉදිරි කටයුතු සිදු කරනු ඇත." වීඩියෝ පටයේ අන්තර්ගතය විමර්ශනයක් සිදු කිරීමට ප්‍රමාණවත් වුව ද යුධ අපරාධ සම්බන්ධයෙන් අවසන් නිගමනයකට පැමිණීමට එය ප්‍රමාණත් නොවන බව කොමිෂන් සභාව තවදුරටත් අවධාරණය කර තිබේ. 102 පිටුවේ 425 -426 බලන්න - මෙම චෝදනා සම්බන්ධයෙන් කටයුතු කිරීම ශ්‍රී ලංකා රජය පාර්ශ්වයෙන් ප්‍රමාද වූ නිසා මෙම චෝදනා ඔප්පු කරන ලද චෝදනා මට්ටමට ප්‍රවලිත වීමට එය හේතුවක් වූ බව සඳහන් කළ යුතු ය. <u>චැනල් 4 වීඩියෝ පටයේ විශ්වසනීයත්වය</u> - අධිකරණ ක්‍රියාවලියෙන් බාහිර, ලඝු හෝ අත්තනෝමතික ඝාතන සම්බන්ධව කටයුතු කරන එක්සත් ජාතීන්ගේ විශේෂ නියෝජිත විසින් ඉදිරිපත් කරන ලද වාර්තා සැළකිල්ලට ගනිමින් එම විඩියෝ පටයේ පෙන්වන රූප සත්‍ය ඒවා බවට වන තාවකාලික උපකල්පනය මත තමන් කටයුතු කරන බව පරණගම කොමිෂන් සභාව සඳහන් කර තිබේ. 132 පිටුවේ 547 බලන්න " චැනල් 4 නාලිකාවේ චෝදනා උපරිම මට්ටමින් ගත් කළ එහි අඩංගු කරුණු සත්‍ය හෝ සත්‍ය විය හැකි බවට වන පදනම මත කොමිෂන් සභාව කටයුතු කරන අතර එමනිසා

	යුධ අපරාධ සම්බන්ධ ශක්තිමත් පරිවේෂණීය සාක්ෂි එමගින් ඉදිරිපත් වේ.” 103 පිටුවේ 428 බලන්න - විධිමත් අධිකරණ විමර්ශනයක අවශ්‍යතාව කාරක සභාව නැවතත් අවධාරණය කරයි. 103 පිටුව 428 බලන්න. - වැනල් 4 වීඩියෝ පටය සම්බන්ධයෙන් යුධ අධිකරණය විසින් සොයාගත් කාරණා කොමිෂන් සභාවට ඉදිරිපත් කර නැත. එම චෝදනාවට ලක්වූ අපරාධ සම්බන්ධයෙන් මුල් විඩියෝ පටය ලබා නොදීම සම්බන්ධයෙන් කොමිෂන් සභාව වැනල් 4 නාලිකාව විවේචනයට ලක්කර තිබේ. - වැනල් 4 වීඩියෝ පටය තුලින් මතුවන පහත සඳහන් විශ්වසනීයත්වය සම්බන්ධ කාරණා වලට අමතරව වෙනත් ගැටළු කිහිපයක් ද කොමිෂන් සභාව විසින් මතු කර දක්වා තිබේ. ඒවා අතර පහත සඳහන් කාරණා ඇතුළත් වේ. ➢ එල්. ටී.ටී.ඊ. සංවිධානය සිවිල් වැසියන්ට ෂෙල් වෙඩි ප්‍රහාර සහ වෙඩි ප්‍රහාර එල්ල කරන බව පැහැදිලිව තිබිය දී ෂෙල් වෙඩි ප්‍රහාර එල්ල කරන්නේ කවුරුන්ද යන්න වෙන් කර ගැනීමට වැඩසටහන්කරුට නොහැකි වීම. ➢ ඝාතනය කරන ලද සිවිල් වැසියන් සංඛ්‍යාව සම්බන්ධයෙන් සාධාරණව කටයුතු කිරීමට නොහැකි වීම සහ වැඩසටහන්කරුගේ පාර්ශ්වයෙන් ගත් කළ එල්.ටී.ටී.ඊ. සංවිධානය යුධ මුක්ත කළාප පිළිගැනීමට අපොහෝසත් වීම පිළිබඳ අවධාරණය කිරීමට නොහැකි වීම නිසා ජාත්‍යන්තර නීතිය යටතේ යුධ මුක්ත කළාප නොපැවතීම. ➢ එල්.ටී.ටී.ඊ. සංවිධානය සිවිල් වැසියන්ට තමන් සමඟ පසුබැසීමට බලකිරීම නිසා සිවිල් වැසියන්ගේ ජීවිත වලට තිබූ තර්ජනය සඳහන් කිරීමට අපොහොසත් වීම. ➢ සිවිල් ජනතාව මුදවා ගැනීමට ශ්‍රී ලංකා රජය සතු වගකීම. පිටු 104 -105 හි 433 බලන්න. - විමර්ශනය සඳහා වන යුධ අධිකරණයක් තුළ විශ්වාසය ගොඩනැගීම සඳහා අපක්ෂපාතිත්වය සහ ස්වාධීනත්වය රහිත විය හැකි නිසා මෙම වීඩියෝ පටය තුළ විනිශ්චයකාරවරයෙකු විසින් මෙහෙයවන විමර්ශනයක් සඳහා ප්‍රමාණවත් සාධක තිබෙන බව අවසන් වශයෙන් කොමිෂන් සභාව අවධාරණය කරයි. -132 පිටුවේ 546 බලන්න - අපරාධ හැසිරීමක් ලෙස විශ්වසනීය චෝදනා ලෙස හමුවූ කාරණා සම්බන්ධයෙන් පූර්ණ පරීක්ෂණයක් සිදු කිරීම සඳහා විමර්ශන කණ්ඩායමක් පත් කරන ලෙස කොමිෂන්

	සභාව ඉල්ලීම කර තිබේ. 101 පිටුවේ 422 බලන්න • “ කොමිෂන් සභාව විසින් පවත්වමින් තිබෙන විමර්ශන කටයුතු වලට සහාය වීම සඳහා විමර්ශන ඒකකයක් පිහිටුවන ලෙස ඉල්ලීමක් කිරීම තුළින් උගත් පාඩම් සහ ප්‍රතිසන්ධාන කොමිෂන් සභාවට වඩා තමන් ඉදිරියට ගොස් තිබේ. මෙම වාර්තාවේ 420 ඡේදයේ සඳහන් ආකාරයට පත්කර තිබෙන විමර්ශන කණ්ඩායමේ වැඩකටයුතු ආරම්භ වී ඉදිරියට යමින් පවතින බව එහි අවසානයේ කොමිෂන් සභාව සඳහන් කර තිබේ.
<u>**ආ. යුද්ධයේ අවසන් අදියර තුළ රැඳවියන් අතුරුදහන් වීම.**</u>	• වැනල් 4 වීඩියෝ පටයේ සඳහන් සිද්ධීන්ට අදාලව;යුද්ධයේ අවසන් අදියර තුළ බස් රථයකට ගොඩවූ 100කට ආසන්න පිරිසක් බලහත්කාරයෙන් අතුරුදහන් කරවීම සහ ඝාතනය කිරීම - විනිශ්චයකාරවරයෙක් විසින් මෙහෙයවන විමර්ශනයක් අවශ්‍ය බවත් මේ සම්බන්ධයෙන් ඔවුන් විමර්ශන කණ්ඩායමක් පත් කර තිබෙන බවත් කොමිෂන් සභාව සඳහන් කර තිබේ. • කොමිෂන් සභාව තවදුරටත් මෙසේ සඳහන් කරයි. *“මේ සම්බන්ධයෙන් වන සාක්ෂි විමසා බැලීමෙන් අනතුරුව මෙම පුද්ගලයන් ඝාතනය කරන්නට ඇති බව විශ්වාස කිරීමට සාධාරණ පදනමක් තිබෙන බව අප සොයාගෙන තිබේ.* 105 පිටුවේ 437 බලන්න • 105 -106 පිටුවල 439 -444 - ශ්‍රී ලංකා හමුදාව භාරයට පත්වූ පුද්ගලයන් ඔවුන් නිදහස් වූයේ නම් ඒ අවස්ථාවන්හිදී තම පවුල් සමඟ සම්බන්ධතා ඇතිකරගැනීමට කටයුතු කළ තත්ත්වයක් තිබූ බවට පැහැදිලි සාක්ෂි සහිතව කොමිෂන් සභාව විසින් විමර්ශන කරන ලද අතුරුදහන් වීමේ අවස්ථා - 105-106 පිටුවල 439 -444 ඡේද. • කෙසේ වෙතත්, **සත්‍ය ලෙස සිදුවී නොමැති අතරුදහන් වීම්** නොසලකා හැරිය නොහැකි බව කොමිෂන් සභාව අවධාරණය කරයි.- කදිරාවල් තයපරාජා ගේ සිද්ධිය බලන්න; 107 පිටුව 445 • පහත සඳහන් කාරණා රචනා කළ හිටපු බ්‍රිතාන්‍ය මාධ්‍යවේදියාගේ නිරීක්ෂණ ද කොමිෂන් සභාවේ අවධානයට ලක් වී තිබේ. *‘පහළ තනතුරු වල සිටින සොල්දාදුවන් අනුකම්පාව නිසා හෝ අල්ලස් ගැනීම නිසා අහිංසක අසරණ සිවිල් වැසියන් උෂ්ණාධික, අපිරිසිදු රැඳවුම් ස්ථාන වලින් පැනයාම නොදැක්කා සේ සිටින බව ජ්‍යෙෂ්ඨ නිලධාරීන්ට ඉතා ඉක්මනින් පැහැදිළි විය.”*107 පිටුවේ 445 බලන්න.

	▪ විදේශ රටවල සරණාගතයන් ලෙස සිටින අය පිළිබඳව තොරතුරු හෙළි කරන ලෙස කොමිෂන් සභාව විදේශ කටයුතු අමාත්‍යාංශය හරහා විදේශ රාජ්‍යන්ට කරන ලද ඉල්ලීම් ප්‍රතික්ෂේප කරන ලද බව කොමිෂන් සභාව තව දුරටත් සඳහන් කර තිබේ. *" අත්අඩංගුවේ සිටි පුද්ගලයන් ඔවුන් නිදහස් වීමෙන් පසුව ඔවුන්ගේ පවුල්වල දැනුවත්භාවයකින් තොරව විදේශගතවීම හෝ විකල්පයක් ලෙස සැඟවී සිටීම හෝ තම අනන්‍යතාව වෙනස් කිරීම හෝ සිදු කිරීමට හැකියාවක් තිබෙන අතර මෙ දක්වා දැනගැනීමට නොහැකි වී තිබෙන මෙම අතුරුදහන් වූවන්ගේ දෛවය සම්බන්ධ තහවුරු කර ගැනීමක දී මේ පිළිබඳ සත්‍ය තහවුරු කරගත යුතු ය. මෙය සහසන්ධානය සඳහා ඉතාම වැදගත් දායකත්වයක් ලබා දෙන බව කොමිෂන් සභාවේ අදහස වේ."* 108 පිටුවේ 449 බලන්න.
<u>ඇ. "සුදු කොඩි සාතන"</u>	▪ " සුදු කොඩි සාතන" ලෙස නම් කරන ලද 2009 මැයි 18 දින සිදුවූ බවට චෝදනා ලබන ලද නීති විරෝධී සාතන ස්වාධීන අධිකරණයක විමර්ශනයට ලක්විය යුතු ය යන්න කොමිෂන් සභාවේ අදහස වේ. 108 පිටුවේ 450 බලන්න. "යටත් වීම සඳහා සුදු කොඩි යොදාගත් සහ හමුදාභාරයේ දී කිසිදු හානියකට ලක්නොවූ සටන්කරුවන් සහ සිවිල් වැසියන් (එල්.ටී.ටී.ඊ. සංවිධානයේ යටත් වීමට පැමිණි නායකත්වය සම්බන්ධයෙන් නොවේ) ගෙන් ලබාගත් සාක්ෂි වෙත උගත් පාඩම් සහ ප්‍රතිසන්ධානය පිළිබඳ කොමිෂන් සභාව අවධානය යොමු කරයි. කෙසේ වෙතත්, මෙම කොමිෂන් සභාවේ අදහස වන්නේ , මෙම සාක්ෂි මගින් එල්.ටී.ටී.ඊ. නායකත්වයේ යටත් වීම සම්බන්ධ චෝදනා වඩා කෲර තත්ත්වයට පත් කරනු ලබන අතර එමගින් එම නායකත්වය සාතනය කිරීම සඳහා වෙන් කර කොට කටයුතු කර තිබෙන ආකාරයක් පෙන්නුම් කරයි." 108 පිටුව 451 බලන්න. ▪ (108 -109) පිටුවල 452 -458 ඡේදවල "සුදු කොඩි සාතන" සම්බන්ධයෙන් කොමිෂන් සභාව විවිධ ත ආකාරයේ අදහස් ලැයිස්තුගත කර තිබේ. ▪ මේ සම්බනධයෙන් කාරණා තහවුරු කර සත්‍ය තීරණය කිරීම සඳහා ස්වාධීන විමර්ශනයක් අවශ්‍ය බව කොමිෂන් සභාවේ අවසන් නිගමනය වේ. 110 පිටුවේ 460 බලන්න. ▪ සාතනය කිරීම සම්බන්ධයෙන් තනි වශයෙන් එල්ලවී තිබෙන චෝදනා විමර්ශන කළ යුතු බව කොමිෂන් සභාවේ අදහස වේ.

	➢ ශෝභා නැක්මන් ඉසයිප්‍රියා ගේ වීඩියෝ පටය - අතුරුදහන් වීම සම්බන්ධයෙන් ඇගේ පවුලෙන් ම සෘජු තොරතුරු ලැබුණ බවත් චැනල් 4 නාලිකාවේ පෙන්වන ලද මළ සිරුර "පැහැදිළිව නීතියට පටහැණිව කරන ලද ඝාතනයක්" ලෙසට කොමිෂන් සභාව සඳහන් කරයි. ➢ කර්නල් රමේෂ් හෙවත් ටී. තුරෙයිරාජසිංහම්- *චැනල් 4 සහ වෙන මූලාශ්‍රවලින් ලබාගත් වීඩියෝ පට සහ ඡායාරූප තුළින් මෙම එල්.ටී.ටී.ඊ. අණ දෙන නිළධාරියා ආරක්ෂක අංශ විසින් ප්‍රශ්න කිරීමට ලක් කරන ආකාරය දක්වයි. මෙය පටිගත කරන වීඩියෝ කැමරාව මගින් යුද්ධයේ අවසන් අවසන් අවධිය තුළ ශ්‍රී ලංකා හමුදාව මගින් සිදු කරන ප්‍රශ්න කිරීමක් ආකාරයට මෙය දැක්වීමට උත්සාහ ගන්නා අතර එහදී ප්‍රශ්න කරන්නන්ගේ මුහුණු ද පිළිබඹු වන ආකාරයට එය සිදු කරමින් ඒ ශ්‍රී ලංකා යුධ හමුදාව බව චැනල් 4 විසින් චෝදනා කරයි. මෙයින් දින කිහිපයකට පසුව පටිගත කිරීමේ උපකරණයෙන් ලබා ගත් පාරදත්ත අනුව කර්නල් රමේෂ් ගේ විකෘති කරන ලද නිසල සිරුර සහිත ඡායාරූප මගින් නැවතත් නීතිවිරෝධී ඝාතනයන් පිළිබඳ ඇඟවීමක් කරයි."* ➢ එල්.ටී.ටී.ඊ. නායකයාගේ අවුරුදු 12ක වයසැති පුත්‍රයා වන බාලචන්ද්‍රන් ප්‍රභාකරන් - 110 පිටුවේ 463 බලන්න
<u>ඈ. සිවිල් රෝහල් වලට ෂෙල් ප්‍රහාර එල්ල කිරීම</u>	🔹 112 පිටුවේ 465 ඡේදයේ සඳහන් පරිදි ෂෙල් ප්‍රහාර එල්ල වූ බවට චන්ද්‍රිකා ඡායාරූප තිබෙන බව තමන් පිළිගන්නා බව කොමිෂන් සභාව සඳහන් කරයි. *"යුධ මුක්ත කළාපය ප්‍රකාශයට පත්කිරීම ශ්‍රී ලංකා හමුදාවේ කාලතුවක්කු බැරල් මගින් සළකුණු කෙරුණ නිසා යුධ මුක්ත කලාපයට එල්ල කරන ලද ෂෙල් ප්‍රහාර ශ්‍රී ලංකා හමුදාවෙන් සිදුකළ බවට ඉන් ඇඟවෙන්නේය යනුවෙන් දරුස්මාන් වාර්තාවේ 101 වන පරිච්ඡේදයේ සඳහන් වන කාරණය කොමිෂන් සභාවේ යුධ කටයුතු පිළිබඳ විද්වතා ප්‍රතික්ෂේප කරයි."* 🔹 යුධ විශේෂඥයින් විසින් ප්‍රකාශ කර ඇති පරිදි" කුමන පක්ෂයේ කාලතුවක්කු සහ මෝටාර් විසින් හඳුනාගත් ෂෙල් ප්‍රහාර වලින් සෑදුණ වලවල් ඇතිකරන්නට ඇතිද යන්න නිවැරදිව සඳහන් කළ නොහැකිය" යන කාරණය සමඟ තමන් එකඟ වන බවත් අපරාධ මට්ටමකට තහවුරු වන ආකාරයේ වන චෝදනාවන් ඔප්පු කිරීමට පවතින බාධාවන් මෙයින් මතුවන බවත් කොමිෂන් සභාව සඳහන් කරයි. මේ සම්බන්ධයෙන් යුධ විශේෂඥයින්ගේ වැඩිදුර කරුණු පැහැදිලි කිරීම් සඳහා 112 පිටුවේ 469 බලන්න.

	<u>සමානුපාතික තක්සේරුව</u> • *“ සිවිල් වැසියන් සිටින ප්‍රෙද්ශ වලට කාලතුවක්කු ප්‍රහාර එල්ල කිරීම නීති විරෝධී ලෙස සැළකිය නොහැකි බව පැහැදිලි වුව ද ඒවා සාම්ප්‍රදායික විශ්ලේෂණයන් වන වෙන් කිරීම, යුධමය අවශ්‍යතාව සහ සමානුපාතිකත්වය යන්නට යටතේ විය යුතු බව කොමිෂන් සභාව සඳහන් කරයි.* • පහත සඳහන් කාරණා නිසා කුමන පාර්ශ්වයක ෂෙල් වෙඩි ප්‍රහාර නිසා සිවිල් වැසියන් කී දෙනෙකු ඝාතනය වන්නට ඇත්ද යන කාරණය නිර්ණය කිරීමේ අපහසුතාවකට තමන් මුහුණ දුන්බව කොමිෂන් සභාව සඳහන් කරයි. ➢ එල්.ටී.ටී.ඊ. සංවිධානය තම සිවිල් ප්‍රාණ ඇපකරුවන්ට ෂෙල් ප්‍රහාර එල්ල කිරීම; ➢ එල්.ටී.ටී.ඊ. සංවිධානය තමන් විසින්ම සකස් කරගත් මල්ටි බැරල් රොකට් ප්‍රහාර එල්ල කිරීම. ➢ එල්.ටී.ටී.ඊ. සටන්කරුවන් බොහොමයක් නිල ඇඳුම් ඇඳ නොසිටීම. 114 පිටුවේ 476 බලන්න. • යම් කිසි ප්‍රහාරයක ස්වාභාවය, ඉලක්කය සහ සමානුපාතික බව තීරණය කිරීමේ දී ආණ්ඩුවේ හමුදාවන්ට සළකා බැලීමට තිබුණ විවිධ සාධක පිළිබඳ කොමිෂන් සභාවේ අවධානය යොමු කර තිබේ. ➢ වන්නි දිස්ත්‍රික්කයේ සිටින සිවිල් ජනතාව ආණ්ඩුවේ හමුදා පැරදවීම සඳහා වන අවශ්‍යතාව සඳහා පමණක් යොදාගැනීමේ එල්.ටී.ටී.ඊ. සංවිධානයේ ක්‍රමෝපාය; ➢ සිවිල් ජනතාව සමඟ සටන් කරුවන් මුසුවීම; ➢ සිවිල් වැසියන් සිටින ප්‍රදේශවල සිටි ප්‍රහාර එල්ල කිරීම සහ සිවිල් වැසියන් සිටින ප්‍රදේශවල සහ රෝහල් අසල ආයුධ ගබඩා කර තැබීම; ➢ යුධ මුක්ත කලාපයේ සිට කාලතුවක්කු ප්‍රහාර එල්ල කිරීම; ➢ 2009 වැනි මුල් අවස්ථාවල ආණ්ඩුව දුන් අවස්ථාවන් වලදී යටත් වීම එල්.ටී.ටී.ඊ. සංවිධානය ප්‍රතික්ෂේප කිරීම; ➢ මරාගෙන මැරෙන කණ්ඩායම් භාවිතා කිරීම සහ සටන් කරුවන් අහිමි වන අවස්ථාවන්හිදී වැඩිහිටියන් සහ ළමයින් සටන් සඳහා බඳවා ගැනීම. 114-115 පිටුවල 477 බලන්න. • යුද්ධයේ අවසන් අදියරට වසර දෙකකට පෙර ශ්‍රී ලංකා හමුදාව විසින් නොසැළකිලිමත් ලෙස ෂෙල් ප්‍රහාර

එල්ල කළ බවට චෝදනා නොමැති බව කොමිෂන් සභාවේ අවධානයට පාත්‍ර විය.

- කොමිෂන් සභාවේ යුධ විශේෂඥයා පවසන ආකාරයට 116 පිටුවේ 418 හි මෙසේ සඳහන් වේ.

  "විශේෂයෙන්ම යුධ මුක්ත කළාප 2 සහ 3 හි තාවකාලික සිවිල් වාසස්ථාන විනාශ කිරීම සඳහා ඉතා කුඩා කාලයක් තුළ කාලතුවක්කු විහවය පවතින ෂෙල් ප්‍රහාර එල්ල කිරීම මගින් ශ්‍රී ලංකා හමුදාව විසින් හිතාමතා සිවිල් ජනතාව ඝාතනය කළායයි යන චෝදනාව එල්ල කිරීම ඉතාම අපහසුය *යන්න කතුවරයාට මෙමගින් වැටහෙයි. අත්වැරදීම් ලෙස අනවශ්‍ය ලෙස සිවිල් වැසියන් මරණයට පත්වීම සිදුවීම ශ්‍රී ලංකා හමුදාව විසින් සිදුවන්නට ඇති අතර ඕනෑම අරගලයක දී ඕනෑම හමුදාවක් අතින් එවන් අත්වැරදි සිදුවිය හැකිය. IDF රෝහලට එල්ල වූ ප්‍රහාරය වැනි නොසැළකිලිමත් සහ තදබල විශ්ලේෂනයන්ට ලක්වූ යම් යම් සිද්ධීන් ද තිබිය හැකිය. නැවතත් එය තීරණය වන්නේ ශ්‍රී ලංකා හමුදාව, රෝහල් සහ රෝගීන් අනතුරට පත් කිරීමේ අපේක්ෂාවෙන් ප්‍රහාර එල්ල කොට පළා යාමේ ක්‍රමවේදය අනුගමනය කරන එල්.ටී.ටී.ඊ. සංවිධානය විසින් එල්ල කරන ලද ප්‍රහාර වලට ප්‍රතිප්‍රහාර එල්ල කිරීමේ දීද යන කාරණය මත වේ.*"

- ශ්‍රී ලංකා හමුදාවේ මෙහෙයුම් අවස්ථානුකූලව සමානුපාතික වන බවට වන යුධ හමුදා විශේෂඥයාගේ අවසන් නිගමනය කොමිෂන් සභාව විසින් ද පිළිගනු ලබයි. යම් යම් විශේෂිත ෂෙල් ප්‍රහාර එල්ල කිරීමේ අවස්ථාවන් සම්බන්ධ අපරාධ වගකීම මනා ලෙස තීරණය කළ හැකි වන්නේ විමර්ශන කණ්ඩායම මෙහෙයවීම සඳහා විශ්‍රාමික විනිසුරුවරයෙකු පත්කළ යුතු යැයි කරන ලද කොමිෂන් සභාවේ යෝජනාව අනුව සිදුකරන අධිකරණමය නඩු විභාගයකින් පමණි.

<u>රෝහල් වලට ෂෙල් ප්‍රහාර එල්ල කිරීම</u>

- පුදුකුඩුඉරුප්පු රෝහල - රෝහලේ ප්‍රමාණය මත නොමඟ යන ලද ෂෙල් ප්‍රහාර වලට සහ එම ප්‍රදේශයේ පුපුරන ලද ෂෙල් ප්‍රහාර වලට එය ලක්වීමට තිබෙන අවදානම වැඩිය යන කාරණය සම්බන්ධයෙන් තමන් සාධාරණ නිගමනයක් සිදුකළ බව කොමිෂන් සභාව සඳහන් කරයි.

- එල්.ටී.ටී.ඊ. සංවිධානය එම ප්‍රදේශයේ සිට ජංගම කාලතුවක්කු ප්‍රහාර එල්ල කළාය යන කාරණය සම්බන්ධයෙන්ද කොමිෂන් සභාව තම අවධානය යොමු කරයි. රෝහල යුධ කටයුතු සඳහා භාවිතා නොකරන ලද බවට වන දරුස්මාන් වාර්තාවේ

නිගමනය වැරදි බව කොමිෂන් සභාවේ මතය වේ. කොමිෂන් සභාවේ අවසන් නිගමනය තහවුරු කළ හැක වැඩිදුර සාක්ෂි සඳහා 120 පිටුවේ 489 බලන්න.

" ශ්‍රී ලංකා හමුදාව විසින් හිතාමතා ෂෙල් ප්‍රහාර එල්ල කරන ලද බවට වන චෝදනා සම්බන්ධයෙන් කොමිෂන් සභාවේ මතය වන්නේ අපරාධයක් හෝ අපරාධ සිදුවී තිබෙන බවට සාධාරණ විශ්වාසයක් ඇතිවීම සඳහා ප්‍රමාණවත් සාක්ෂි තිබෙන බවයි. ප්‍ර වේශමෙන් විමර්ශනය කරන සාක්ෂි මත බැලූ බැල්මට පෙනෙන සිද්ධියක් තිබෙන අතර පවතින නීතිය යටතේ මෙම චෝදනා සම්බන්ධයෙන් තීරණය කිරීම සඳහා විනිශ්චයකාරවරයෙකු විසින් මෙහෙයවන විමර්ශනයක් සිදුකළ යුතු බව කොමිෂන් සභාවේ මතය වේ. "

<u>ප්‍රවේශය වැළැක්වීමේ ආයුධ, පොස්පරස් සහ පොකුරු බෝම්බ</u>

- ශ්‍රී ලංකා හමුදාව විසින් නීති විරෝධී ආයුධ භාවිතා කරන ලද බවට කිසිදු සාක්ෂියක් හමුවී නොමැති බව කොමිෂන් සභාවේ අවසන් නිගමනය වේ.
- පුදුකුඩුඉරුප්පු අවට ප්‍රදේශයේ පොකුරු බෝම්බ සහ සුදු පොස්පරස් භාවිතා කිරීම- චෝදනා සඳහා 121 පිටුවේ 402-494 බලන්න.
- එවන් ආයුධ භාවිත කිරීම එම කාලය තුළ නීති විරෝධී නොවුණ අතර පොකුරු පුපුරණ ද්‍රව්‍ය සම්බන්ධ ප්‍රඥප්තිය එම යුගයේ බලාත්මක නොවුණ අතර එවන් ආයුධ භාවිත කරන ලද බවට වන කරුණක් ඔප්පු කිරීමට හැකි වුවහොත් එහි ප්‍රධාන ගැටළුව වන්නේ සමානුපාතිකත්වය වේ.
- මෙවන් ආයුධ භාවිතා කිරීම සම්බන්ධයෙන් අවසන් නිගමනයකට එළඹීමට තරම් සාක්ෂි දරුස්මාන් වාර්තාවේද අඩංගු නොවන බව කොමිෂන් සභාව තවදුරටත් අවධානයට යොමු කරයි.
- කෙසේ වෙතත් පොකුරු පුපුරණ ද්‍රව්‍ය වලින් හෝ පොස්පරස් පිළිස්සීම් වලින් සිවිල් ජනතාවට පහර වැදුණේ ය යන කාරණය නොසළකා හැරිය නොහැකි බව කොමිෂන් සභාව සඳහන් කරයි. 121 පිටුවේ 498 බලන්න.
- මෙම ක්ෂේත්‍රය පිළිබඳ වැඩිදුර විමර්ශන/ වාර්තා වූ තුවාල සම්බන්ධයෙන් විස්තීරණ වෛද්‍ය වාර්තා සමාලෝචනයක් අවශ්‍ය බවත් කොමිෂන් සභාව නිගමනය කරයි.

" මෙම ගැටළුව සම්බන්ධයෙන් ඡායාරූප වැනි වැඩිදුර දේවල් හෙළි කිරීමට හැකි තත්ත්වයක එක්සත් ජාතීන් සිටින්නේ ද, මෙය සැකයකින් තොරව මෙම කාරණය

	තවදුරටත් පරීක්ෂා කරන දේශීය හෝ වෙනත් විමර්ශනයන්ට සහායක් වනු ඇත.“
<u>ඉ. මානුෂීය සහාය ප්‍රතික්ෂේප කිරීම.</u>	➢ යුද්ධයේ අවසන් මාස කිහිපය තුළ ශ්‍රී ලංකා හමුදාව විසින් කිසිදු ආකාරයකට යම් ප්‍ර දේශයකට පැමිණීම හෝ පිටවීම තහනම් කරමින් යුධ කටයුතු වල යෙදුණ බවට සාක්ෂි හමුවී නොමැත. එසේම සිවිල් ජනතාව හාමත් කිරීම අරමුණු කරගත් ව්‍යාපාරයක් හිතාමතා සිදුකළ බවට සාක්ෂි නොමැති බව කොමිෂන් සභාවේ මතය වේ. ➢ ආහාර සහ බෙදාහැරීමේ ජාලයන් ද ඇතුළත්ව මානුෂීය ද්‍රව්‍ය වලට පහර දීමට එරෙහි තහනම උල්ලංඝනය කරන ලද බවට දරුස්මාන් වාර්තාවේ සඳහන් වන චෝදනා පිළිබඳ කොමිෂන් සභාව විවේචනාත්මකව කරුණු දක්වයි. 123 පිටුවේ 504 සහ 124-125 පිටුවල 507-513 බලන්න. ➢ යුධ උපකරණ සිවිල් ජනාතව ජීවත්වන ප්‍රදේශවල ස්ථානගත කිරීමෙන් සහ යුධ කටයුතු පවතින ප්‍ර දේශ වලින් සිවිල් ජනයා ඉවත් කිරීමට කටයුතු නොකිරීම යන කාරණා තුළ සිවිල් ජනතාව ආරක්ෂා කිරීමට එල්.ටී.ටී.ඊ. සංවිධානය සතු වගකීම උල්ලංඝනය කළ බව කොමිෂන් සභාව නිරීක්ෂණය කරයි. ➢ ආහාර පෝලිම් වේතාන්විතව ඉලක්ක කළ බවට වන චෝදනා සම්බන්ධයෙන් පූර්ණ පරීක්ෂණයක් සිදුකිරීම අවශ්‍ය වන බව කොමිෂන් සභාවේ අදහස වේ. ➢ යුද්ධයේ අවසන් අදියර තුළ ආහාර සහ බෙහෙත් ද්‍රව්‍ය සැපයීමේ යම් අඩුවක් දක්නට ලැබුණ අතර කොමිෂන් සභාවේ මතය වන්නේ “ *ශ්‍රී ලංකා රජයට තිබුණේ හාමත් කිරීම තුළින් සිවිල් ජනතාව මරණයට පත්කිරීමේ අභිලාෂයක් නොව එල්.ටී.ටී.ඊ. සංවිධානයට යටත් වීම සඳහා බලපෑමක් කිරීමේ අපේක්ෂාව බව යි.*“
<u>ඊ. ජනසංහාරය</u>	➢ යුද්ධයේ අවසන් අදියර තුළ සිදුවූවායයි කියන ජනසංහාරය පිළිබඳ චෝදනා වෙත පමණක් තම අවධානය යොමු කරන බව කොමිෂන් සභාව පවසයි. *“ශ්‍රී ලංකාව තුළ පැවති අර්බුධයේ අවසන් අදියර තුළ යම් කිසි ජාතියක්, ජනවර්ගයක්, හෝ වාර්ගික හෝ ආගමික කණ්ඩායමක් කොටසක් හෝ සමස්ථයක් වශයෙන් විනාශ කිරීමට යම් කිසි [අපේක්ෂිත] අපරාධකරුවෙකු ලක් කරන නෛතික පරීක්ෂණයේ මට්ටමට ශ්‍රී ලංකාවේ ප්‍රතිපත්ති ළඟා වී තිබෙන බවට වන අදහස කොමිෂන් සභාව ප්‍රතික්ෂේප කරයි.“* – 1948 ජනසංහාරය පිළිබඳ අපරාධ වලට දඬුවම් කිරීම සහ වැළැක්වීම සඳහා වන ප්‍රඥප්තියේ 2 වන වගන්තිය.

	✦ ඉහත නිගමනය පැමිණීම සඳහා කොමිෂන් සභාව විසින් විශ්වාසය තබන ලද සාක්ෂි - ➢ එක්සත් ජනපදයේ තානාපති ක්ලින්ට් විලියම්සන් පිළිබඳ සඳහන් කරමින් දකුණු ආසියාවේ ජාත්‍යන්තර රුකුල් කුරුස සංවිධානයේ මෙහෙයුම් පිළිබඳ සඳහන් කරමින් එවන ලද එක්සත් ජනපදයේ රාජ්‍යතාන්ත්‍රික පණිවිඩයක සඳහන් වන ආකාරයට ආණ්ඩුවේ හමුදාවන් විසින් සිදුකරන ලදැයි කියන ඕනෑම අපරාධයක් ජනසංහාරයක් බවට පත්වී නොමැති බව සඳහන් වේ.128 පිටුවේ 529 බලන්න ➢ 2010 ජූනි 10 මානව හිමිකම් සඳහා වන විශ්වවිද්‍යාල ආචාර්යවරු, යාපනය විසින් ඉදිරිපත් කරන ලද වාර්තාවේ කරන ලද තහවුරු කිරීම්. 129 පිටුව 530 ✦ විවිධ ආණ්ඩු විසින් දීර්ඝකාලීනව සිදුකරන ලද ආගමික සහ වාර්ගික වශයෙන් සුළු ජන කොටස්වලට කරන ලද වෙන් කොට සැළකීම ජන සංහාරයක් ලෙස අර්ථ දැක්වීමට ප්‍රමාණවත් නොවන බව කොමිෂන් සභාව අවධාරණය කරයි.
<u>**උ. සාක්ෂිකරුවන් නොමැති යුද්ධය**</u>	“ සන්නද්ධ අරගලයේ අවසන් මාස කිහිපය තුළ ගැටුම් පවතින ප්‍රදේශ වලින් මාධ්‍යවේදීන් ඉවත් කිරීමට ක්‍රියාමාර්ග ගැනීම පිළිබඳව අප තක්සේරු කළ යුත්තේ මාධ්‍යවේදීන් ආරක්ෂා කිරීමට සහ ඔවුන් එම ප්‍රදේශවල සිටීම නිසා විරුද්ධවාදීන්ට අනවශ්‍ය යුධ වාසියක් ලැබීම වැළැක්වීම යන ජාත්‍යන්තරව පිළිගත් ක්‍රමවේදය ට අනුව වේ.“ ✦ ගැටුම් පවතින ප්‍රදේශවලට ප්‍රවේශවීමට තිබෙන අයිතිය අනිවාර්ය අයිතියක් නොවන බවත් යුධමය සහ ජාතික ආරක්ෂාව මෙන්ම මාධ්‍යවේදීන්ගේ ආරක්ෂාව සඳහා සාධාරණ සීමාවන් පැනවීමේ හැකියාව තිබෙන බවත් කොමිෂන් සභාවේ මතය වේ. ✦ ගැටුම් පවතින ප්‍රදේශවලට නිදහස් ප්‍ර වේශය ලබාදීමට ශ්‍රී ලංකා රජය මැළිකමක් දක්වන ලද්දේ එල්.ටී.ටී.ඊ. සංවිධානයේ මනා ලෙස අරමුදල් සපයන ලද සහ දියුණු මට්ටමක පැවතුණ ප්‍රචාරණ යාන්ත්‍රණයට එරෙහිව කටයුතු කිරීමට තිබූ අපහසුතාව නිසා විය හැකිය යන්න කොමිෂන් සභාවේ මතය වේ. 131 පිටුව බලන්න. ✦ මානව වර්ගයාට එරෙහි ජනසංහාරයක් සැඟවීම සඳහා සාක්ෂිකරුවන් නොමැති ආණ්ඩුවේ ප්‍රතිපත්තියක් පවත්වාගෙන ගිය ආකාරයක් දක්නට නොලැබෙන බව කොමිෂන් සභාවේ අවසන් නිගමනය වේ.

<u>සාරාංශය - 8 වන පරිච්ඡේදය- වගවීමේ යාන්ත්‍රණය</u>

- ජාත්‍යන්තර නීතිය යටතේ " විමර්ශන සහ නඩු විකල්ප නොවේ" යනුවෙන් දරුස්මාන් වාර්තාවේ ගෙන තිබෙන ස්ථාවරය නිරවද්‍ය නොවන පිළිබිඹුවක් බව කොමිෂන් සභාව සඳහන් කරයි. විමර්ශන සහ කරුණු සෙවීමේ මෙහෙයුම් වලට ලබාදෙන ලද එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කවුන්සිලයේ මෙහෙයුම් නිර්ණායක වල සඳහන් වන පරිදි වගවීමේ යාන්ත්‍රණය ජාතික තක්සේරු (සියළුම ආකෘතිවලට එකම ප්‍රමාණයක් ගැලපෙන්නේය යන්නට විරුද්ධව) පදනම් කරගතයුතු බව කොමිෂන් සභාව තවදුරටත් අවධාරණය කරයි.
- තම අරමුණ වශයෙන් කොමිෂන් සභාව පහත සඳහන් දේ සඳහන් කරයි.

  "පුළුල් ජාත්‍යන්තර සන්දර්භය තුළ පැවති සහ පවතින ශ්‍රී ලංකා ආණ්ඩු දියත් කරන ලද මූලාරම්භයන් පරීක්ෂා කිරීම සඳහා සහ ඒවා යම්කිසි පිළිගත් සහ සංවර්ධනය කරන ලද ධර්මතා හෝ සන්නද්ධ අරගලයකින් මතුවන ජාතියක් වෙතින් අපේක්ෂා කළ හැකි තත්ත්වයන්ට අනුව සිදුවන්නේද යන්න මැන බැලීම."

- <u>තම අවසන් නිගමනය වන්නේ ශ්‍රී ලංකා රජය විසින් අනුගමනය කරන ලද ප්‍රවේශය ජාත්‍යන්තර නීතිය සහ ව්‍යවහාරයන්හි සාමාන්‍ය අවශ්‍යතා වලට අනුකූල වන්නේ ද යන්න සොයාබැලීම බව කොමිෂන් සභාව සඳහන් කර තිබේ.</u> – 135 පිටුවෙ 560 බලන්න

<u>දරුස්මාන් වාර්තාවේ ස්ථාවරය</u>

- බරපතල උල්ලංඝනය කිරීම් (සංක්‍රාන්ති යුක්ති යාන්ත්‍රණයන්) විමර්ශනය කිරීමට සහ නඩු පැවරීමට රාජ්‍යයන්ට තිබෙන නෛතික වගකීම පිළිබඳ දරුස්මාන් වාර්තාව අවධාරණය කරයි. 135 පිටුවේ 562 බලන්න. වගවීමේ යාන්ත්‍රණයන් අඩුවීම සම්බන්ධයෙන් උගත් පාඩම් සහ ප්‍රතිසන්ධාන කොමිෂන් සභාවට හිටපු එල්.ටී.ටී.ඊ. සාමාජිකයන්ට සහසන්ධානයට මගක් ලෙස සිරගත නොකර දඬුවම් ලබා දීම ශ්‍රී ලංකා රජය විසින් සළකා බැලීම සම්බන්ධයෙන් ද දරුස්මාන් වාර්තාව විවේචනාත්මක වේ.
- වගවීම සහ සහන සැළසීම ළඟාකරගැනීමට වන යාන්ත්‍රණයන් මත කටයුතු කරන රාජ්‍ය ව්‍යවහාරයන් සහ වෙන් අධිකාරි ආයතනවල අපරාධ නඩු මූලික අංගයක් ලෙස පෙන්නුම් නොකරයි.
- වගවීමේ සහ යුක්තිය පසිඳලීමේ ක්‍රියාවලියට, අර්බුධය සම්බන්ධ කරුණු සහ සිද්ධීන් පිළිබඳ පූර්ණ විමර්ශනයක් සිදුකිරීම අත්‍යවශ්‍ය බව කොමිෂන් සභාව තවදුරටත් අවධාරණය කරයි.

<u>වගවීම සඳහා වන යාන්ත්‍රණයන්</u>

- මූලික කාරණා හතර - අධිකරණ ක්‍රියාවලිය, හානිපූරණ ක්‍රියාවලිය, සත්‍ය සෙවීමේ ක්‍රියාවලිය සහ ආයතනික ප්‍රතිසංස්කරණ ක්‍රියාවලිය 137 පිටුවේ 571 බලන්න)
- ජාත්‍යන්තර නීතිය යටතේ මෙම සංකල්ප වලට අනිවාර්ය බැඳියාවක් තිබේද යන්න පිළිබඳව ගැටළුව සම්බන්ධයෙන් කොමිෂන් සභාවේ මතය වන්නේ;

  "සියළුම තත්ත්වයන් තුළ එයට අදාළ ලක්ෂණ කුමක් වුවද ඒවාට අදාළ වන රීති සහ ප්‍රමිතීන් පද්ධතියක් පිළිබඳ ජාත්‍යන්තර වශයෙන් පිළිගත් සම්මුතියක් නොමැත."

<u>නඩු පැවරීමට තිබෙන් බැඳියාවේ ප්‍රමාණය</u>

- නඩු පැවරීමට තිබෙන වගකීම සම්බන්ධයෙන් තිබෙන මානව හිමිකම් පිළිබඳ ප්‍රඥප්තීන් වල අනනුකූලතාවක් කොමිෂන් සභාව විසින් නිරීක්ෂණය කර තිබේ. 138 -139 පිටුවල 574 -576 බලන්න.
- " යුක්තිය තුළින් සාමය උදා වන්නේය යන්න සම්බන්ධයෙන් තිබෙන සාක්ෂි ඉතා අල්පය " යන කාරණාව සහ පූර්ණ වගවීමේ යාන්ත්‍රණයක් ලෙස අපරාධ නඩු විසඳීම සිදුවන යම් තත්ත්වයන් තුළ සාමය ට යම් තර්ජනයක් එල්ල වීම සහ අර්බුධයකින් මිදුණ වහාම රාජ්‍යක් අස්ථාවර බවට පත්කිරීමේ තත්ත්වයක්ද ඇතිවිය හැකිය යන කාරණය තමන් වටහාගත් බව කොමිෂන් සභාව මතුකර දක්වයි.

උදාහරණ වශයෙන් කොමිෂන් සභාව සහ ශාස්ත්‍රීය විවාද වලින් මතුකරන ලද කාරණා සඳහා 140 -141 පිටුවල 579-580 බලන්න.

<u>වගවීමේ යාන්ත්‍රණයක් ලෙස සත්‍ය සෙවීමේ කොමිෂන් සභාව</u>

- සමාවදීම සහ වගවීම පිළිබඳ බෙල්ෆාස්ට් මෙහෙයුම් නිර්ණායක අනුව (අල්ස්ටර් විශ්ව විද්‍යාලයේ සංක්‍රාන්ති යුක්තිය පිළිබඳ ආයතනය ප්‍රකාශිත) යම් කිසි රාජ්‍යක් වඩාත් යෝග්‍ය වගවීමේ යාන්ත්‍රණය පිළිබඳ ඇගයීමක් කරන විට ජාත්‍යන්තර නීතිය අනුව නඩු පැවරීම වෙනුවට නෛතික නොවන වගවීමේ යාන්ත්‍රණයක් යොදාගැනීම ජාත්‍යන්තර නීතිය අනුව පිළිගෙන තිබෙන මතය කොමිෂන් සභාවද පිළිගෙන තිබේ.
- අපරාධකරුවන් විසින් අදාළ අපරාධ සිද්ධියට අදාළ පූර්ණ සත්‍ය හෙළිකිරීම මත සමාව ලබා දීමේ " සත්‍ය සඳහා සමාව" යන දකුණු අප්‍රිකානු ආකෘතිය බොහෝ රටවල් අනුගමනය කරන බව කොමිෂන් සභාවේ අවධානයට ලක්වී තිබේ.
- 2015 වසරේදී උපදේශන කාරක සභාවේ ඩෙස්මන් ද සිල්වා මහතා ට සංක්‍රාන්ති යුක්තිය පිළිබඳ යාන්ත්‍රණය සහ සත්‍ය සහ සහසන්ධාන කොමිෂන් සභාවක් පිහිටුවීමේ දී දකුණු අප්‍රිකාවේ අත්හදාබැලීම සම්බන්ධයෙන් තම අත්දැකීම් බෙදාගැනීමට පැමිණි දකුණු අප්‍රිකානු නියෝජිත පිරිසක් සමඟ පෞද්ගලික හමුවක් සඳහා අවස්ථාව ලැබුණු බව කොමිෂන් සභාවේ අවධානයට ලක් විය.

<u>ජාත්‍යන්තර නීතිය යටතේ සමාව</u>

- දරුස්මාන් වාර්තාවේ සඳහන් වන ප්‍රකාශවලට පටහැනි ආකාරයට ජාත්‍යන්තර නීතිය සහ රජයේ ව්‍යවහාරයන් බහුරුත් රහිතව සමාව තහනම් නොකරන බව කොමිෂන් සභාවේ මතය වේ. සමාව සම්බන්ධයෙන් පැහැදිලි එකඟත්වයක්ද නොමැතිබව ද එහි තවදුර අවදානයට ලක් වී තිබේ.
- "සියල්ලන්ටම පොදු සමාවක්" ලබා දිය නොහැකි වුව ද සමඟර අවස්ථාවල සමාව අවශ්‍ය වන අතර උදාහරණයක් ලෙස " අර්බුධයට සම්බන්ධ සිරකරුවන් සහ රැඳවියන් නිදහස් කිරීම, නිරායුධ කිරීම සහ සමාජයට නැවත සම්බන්ධ කිරීම කළ යුතු වේ.
- අමතර කෙටුම්පත II හි 6 (5) වගන්තිය හි අඩංගු වන තත්ත්වය යටතේ-" *ප්‍රචණ්ඩ ක්‍රියා අවසන් වූ වහාම එම සටන් වලට සහභාගි වූ දෙපාර්ශ්වයටම සහ අරගලය නිසා තම නිදහස අහිමි වූ සියල්ලන්ටම පුළුල් සමාවක් බලධාරීන් විසින් ලබා දිය යුතුය*"
- ජාත්‍යන්තර රතුකුරුස සංවිධානය - ජාත්‍යන්තර නීතිය යටතේ අපරාධ සිදුකළ අයට මෙම සමාවන් අදාළ නොවේ.
- දණ්ඩ මුක්තියට එරෙහි ක්‍රියාවන් හරහා මානව හිමිකම් ආරක්ෂා කිරීම සහ ප්‍රවර්ධනය කිරීම පිළිබඳ යවත්කාලීන කරන ලද මූලධර්ම මාලාව - බාධා කිරීමකින් තොරව සමාව ලබා දීම සම්බන්ධයෙන් තවමත් සළකාබලමින් සිටියි.
- වධබන්ධන වලට එරෙහි සම්මුතිය - සම්මුතියේ සඳහන් ආකාරයට නඩු පැවරීමේ වගකීම සමාව දීම තහනම් නොකරයි.
- සමාව දීමට අදාළව රාජ්‍යන් විසින් කරන ලද දේවල් වලට උදාහරණ ලෙස 145 -146 පිටුවල 595 බලන්න.

<u>හානිපූරණය සහ නැවත ගොඩනැගීම</u>

- "*සංවර්ධන වැඩසටහන් සහ මානුෂීය සහාය හානිපූරණය සමඟ සමාන නොකළ යුතුය*" යනුවෙන් දරුස්මාන් වාර්තාව දරන ස්ථාවරය සම්බන්ධයෙන් කොමිෂන් සභාව විවේචනාත්මක මතයක් පළ කරන අතර එවන් චෝදනාවකට කිසිදු ස්ථාවරයක පත් බලධාරියෙක් සහාය නොදක්වන බව කොමිෂන් සභාවේ අදහස වේ.
- "*හානි පූරණයකිරීම යනු වරදකාරී හැඟීමක් පිළිගැනීමක් තුළ ක්‍රියාත්මක වන කොටසක් විය යුතුය යන නෛතික අවශ්‍යතාවක් කිසිදු තැනක සඳහන් නොවේ.*" යනුවෙන් කොමිෂන් සභාව අවධාරණය කරයි.
- "*ජාත්‍යන්තර මානව හිමිකම් නීතිය බරපතළ ලෙස උල්ලංඝනය කිරීමෙන් වින්දිතයන් වූ පිරිස් සඳහා ප්‍රතිකර්ම සහ හානිපූරණය කිරීමේ අයිතිය සම්බන්ධ මූලික මූලධර්ම සහ මෙහෙයුම් නිර්ණායක*" පිළිබඳව

දරුස්මාන් වාර්තාව සඳහන් කළ ද එම වාර්තාව තුළ එහි සඳහන් මෙහෙයුම් නිර්ණායක සළකා බැලීම ට නොහැකිවීම සම්බන්ධයෙන් දරුස්මාන් වාර්තාව පිළිබඳව කොමිෂන් සභාව විවේචනාත්මක වේ. 148 පිටුවේ 599 බලන්න.

- ජාත්‍යන්තර මානුෂීය නීතිය බරපතළ ලෙස උල්ලංඝනය කිරීම සහ ජාත්‍යන්තර මානව හිමිකම් නීතිය බරපතළ ලෙස උල්ලංඝනය කිරීම තුළ එහි වින්දිතයන්ට ප්‍රතිකර්ම සහ හානිපූරණ සඳහා වන අයිතිය පිළිබඳ මූලික මූලධර්ම සහ මෙහෙයුම් නිර්ණායක සහ එක්සත් ජාතීන්ගේ මහලේකම්වරයාගේ සංක්‍රාන්ති යුක්තිය මගපෙන්වීමේ සටහන් වල සඳහන් කර තිබෙන මහ පෙන්වීම් වෙතද කොමිෂන් සභාව තම අවධානය යොමුකර තිබේ.

<u>ශ්‍රී ලංකාවේ අනුගමන කරන ලද යාන්ත්‍රණය</u>

- ශ්‍රී ලංකා රජය " *යුද්ධයේ අවසන් අදියර තුළ රාජ්‍ය වෙනුවෙන් බරපතළ අපරාධ කළ අයට එරෙහිව වගවීමක් අපේක්ෂා නොකිරීමට ගත් තත්ත්වාකාර තීරණය*" පිළිබඳ චෝදනා කිරීමේ දී උගත් පාඩම් සහ ප්‍රතිසන්ධානය පිළිබඳ කොමිෂන් සභාවේ විධිනියෝගය පිළිබඳ අවධානය දැක්වීමට දරුස්මාන් වාර්තාවට නොහැකිවීම සම්බන්ධයෙන් කොමිෂන් සභාව තම දැඩි අවධානය යොමු කරයි.
- කොමිෂන් සභාව ස්ථාපිත කිරීම මෙන්ම උගත් පාඩම් සහ ප්‍රතිසන්ධානය පිළිබඳ කොමිෂන් සභාවේ විශේෂිත නිර්දේශ ඉතා වැදගත් වර්ධනයන් ලෙස කොමිෂන් සභාව අදහස් කරයි. 105 පිටුවේ 603 – 605 බලන්න.
- ශ්‍රී ලංකා රජයේ ප්‍ර වේශය " වින්දිත කේන්ද්‍රීය" නොවන බවට සහ යුක්තියේ "විපාකදායී" පැතිකඩ වෙත ප්‍රමාණවත් අවධානයක් යොමු නොකිරීම පිළිබඳව වන දරුස්මාන් වාර්තාවේ තිබෙන චෝදනාව සම්බන්ධයෙන් කොමිෂන් සභාව විවේචනාත්මක මතයක් දරයි.
- ආර්ථික සහ සමාජීය ප්‍රතිසංස්කරණ සඳහා වන රජයේ වැඩසටහන් සියළුම වින්දිතයන්ට වන්දි ලබා දීමක් ලෙස වටහාගත යුතු බව කොමිෂන් සභාවේ අවසන් මතය වේ.
- 2015 පත්වූ නව රජය ගත් ක්‍රියාමාර්ග වන උතුර සහ නැගෙනහිර පළාත්වල සිටි හමුදා ආණ්ඩුකාරවරු වෙනුවට වෙනත් අය පත් කිරීම, ආරක්ෂක කලාප ලෙස පෙර පවත්වාගෙන ගිය ඉඩම් නිදහස් කිරීම සහ දෙමළ දේශපාලන සිරකරුවන් නිදහස් කිරීම යන කාරණා සම්බන්ධයෙන් ද කොමිෂන් සභාව තම අවධානය යොමු කරයි.

<u>ශ්‍රී ලංකාවේ අධිකරණ පද්ධතිය තුළ යුධ අපරාධ අංශයක් ස්ථාපිත කිරීම</u>

- ජාත්‍යන්තර සහ ජාත්‍යන්තර නොවන සන්නද්ධ අරගල වලට අදාළ වන මූලික මූලධර්ම ශ්‍රී ලංකා නීති පද්ධතියට ශ්‍රී ලංකා රජය විසින් ඇතුළත් නොකරන්නේ නම් ජාත්‍යන්තර අපරාධ විමර්ශනය කිරීම සඳහා ඵලදායී දේශීය යාන්ත්‍රණයක් බිහි නොවන බව කොමිෂන් සභාවේ අවධානයට ලක්වී තිබේ. 152 පිටුවේ 613 බලන්න
- කොමිෂන් සභාව උදාහරණ දක්වයි
  - උගන්ඩාව, කෙන්යාව - ජාත්‍යන්තර අපරාධ අංශය (මහාධිකරණයේ කොටසකි)
  - බොස්නියාව සහ හර්සිගොවීනියාව - රජයේ උසාවියේ කොටසක් ලෙස යුධ අපරාධ උසාවිය
  - ෆිජී - අපරාධ තීන්දු ප්‍රකාශය
- ශ්‍රී ලංකාව පූර්ණ වශයෙන් දේශීය අධිකරණයක් යොදාගැනීමට කටයුතු කරන්නේ නම් ජාත්‍යන්තර තාක්ෂණික සහාය සහ නිරීක්ෂකයන් අවශ්‍ය බව කොමිෂන් සභාව නිර්දේශ කරයි. එය ගැම්බියාවේ යොදාගන්නා ලද අත්හදාබැලීම දෙස ධනාත්මකව අවධාන යොමු කරයි. 152 පිටුවේ 616 බලන්න.
- ජාතික වශයෙන් එවන් නීති යොදාගැනීම ද සමාව ලබාදීමේ හැකියාව ලබාදෙන බව කොමිෂන් සභාව මතුකර දක්වයි.
- *"අභ්‍යන්තර අරගල වලට සාමාකාමී බවක් ලබා දීම සඳහා ද ජාතික නීතිය යටතේ සමාව සම්බන්ධ විශේෂිත කොන්දේසි වලට අනුව සහසන්ධානය ප්‍රවර්ධනය කිරීම සඳහා ද වන අරමුණින් මෙම ජාතික සමාවන් නිරන්තරයෙන් ප්‍රදානය කරනු ලැබේ. සමාව දීම සම්බන්ධයෙන් අදාළ වන ජාතික නීතියට අනුව ජාතික පද්ධතිය විසින් ජාත්‍යන්තර නීතිය වෙත ඉල්ලා සිටින්නේ වුව ද ජාතික වශයෙන් දෙන සමාවන් ජාත්‍යන්තර නීතිය හමුවේ අදාළ නොවිය හැකි නමුත් ජාතික පද්ධතිය තුළ ජාතික වශයෙන් නඩු ඇසීමකදී එයින් මුක්තියක් ලැබේ." 153 පිටුවේ 618 බලන්න.*

කොමිෂන් සභාවේ නිර්දේශ

- "විශ්වසනීය සත්‍ය සහ සහසන්ධාන කොමිෂන් සභාවක් වගවීම ආමන්ත්‍රණය කිරීමේ දී අත්‍යවශ්‍ය උපාංගයක් වනු ඇති බව කොමිෂන් සභාවේ අදහස වේ.
- නඩු ඇසීමක් සිදුවිය යුතු ද යන ගැටළුව ශ්‍රී ලංකා රජයේ සීමාව තුළ තිබෙන කාරණයක් බව කොමිෂන් සභාව තවදුරටත් සඳහන් කර තිබේ. (154 පිටුවේ 620 බලන්න)
- මේ සිද්ධියේදී ජනසංහාරයක් සිදුවී තිබේ යැයි යන්න සොයාගතහොත් නඩු පැවරීම සඳහා වන අපරාධ විමර්ශනයක් සිදුකිරීම නොවැළැක්විය හැකි නමුදු කොමිෂන් සභාව වෙනත් අකාරයකට අවසන් නිගමනයකට පැමිණ තිබේ.
- තනි තනිව හෝ එක්ව ගතහැකි පහත සඳහන් යාන්ත්‍රණයන් අනුගමනය කිරීම කොමිෂන් සභාව නිර්දේශ කරයි.

I. මානව හිමිකම් උල්ලංඝනය වූ බවට රජය වෙනුවෙන් වන පිළිගැනීම නියෝජනය කිරීම සඳහා වන හානිපූරණය.
II. දකුණු අප්‍රිකානු ආකෘතියට සමාන වන ආකාරයට සමාවක් සහිත සත්‍ය සහ සහසන්ධාන කොමිෂන් සභාවක්.
III. සමාව සහිත සත්‍ය සහ සහසන්ධාන කොමිෂන් සභාවක්
IV. යුධ අපරාධ/ මනුෂ්‍යත්වයට එරෙහි අපරාධ සිදුකළ බවට චෝදනා එල්ල වී තිබෙන සියල්ලන්ට එරෙහිව දේශීය උසාවි ක්‍රමය තුළ නඩු පැවරීම.
V. යුධ අපරාධ/ මනුෂ්‍යත්වයට එරෙහි අපරාධ සිදුකළ බවට චෝදනා එල්ල වී තිබෙන සියල්ලන්ට එරෙහිව දේශීය උසාවි ක්‍රමය තුළ නඩු පැවරීම සිදු කිරීමේ දී වැඩි වගකීම දැරූ පිරිසට එය සීමා කිරීම.
VI. (V) සඳහන් වන ආකාරයට දේශීය උසාවි ක්‍රමය තුළ නඩු පැවරීම සහ සියරා ලියෝන්හි මෙන් සත්‍ය සහ සහසන්ධාන කොමිෂන් සභාවක් යන දෙකම සිදු කිරීම.

යෝජිත යාන්ත්‍රණය (156 – 157 පිටුවල 625 -626)

I. සත්‍ය සහ සහසනධාන කොමිෂන් සභාවක් නිර්මාණය කිරීම(මින් මතු ශ්‍රී ලංකා සත්‍ය සහ සහසන්ධාන කොමිෂන් සභාව යනුවෙන් හැඳින්වේ) සහ මහාධිකරණයේ යුධ අපරාධ අංශයක් ස්ථාපිත කිරීම (මින් මතු අධිකරණය ලෙස හැඳින්වේ).
II. යම් කිසි පුද්ගලයෙක් තනිව අපරාධමය වශයෙන් යුධ නීතිය උල්ලංඝනය කිරීමක් හෝ කිරීම් වලට වගකිවයුතු බවට එවන් වැරැද්දක් හෝ වැරදි වලට අදාළ තනි අපරාධ වගකීමක් තිබෙන බව දැක්වෙන සාක්ෂි හෝ අවස්ථාවන් පිළිබඳව විනිශ්චයකාරවරයෙකු විසින් මෙහෙයවන විමර්ශනයක් මගින් තහවුරු වන සාක්ෂි තිබෙන විට, ඒ සම්බන්ධයෙන් නීතිපතිවරයා සතුව තිබෙන සාක්ෂි පදනම් කරගෙන එම අධිකරණයෙහි විනිශ්චයකාරවරයෙක් ඉදිරියේ එම සාක්ෂි ඉදිරිපත් කිරීමට ශ්‍රී ලංකාවේ නීතිපතිවරයාට බලය ලබා දීම.
III. යම් කිසි පුද්ගලයෙක් තනිව අපරාධමය වශයෙන් යුධ නීතිය උල්ලංඝනය කිරීමක් හෝ කිරීම් වලට වගකිවයුතු බවට එවන් වැරැද්දක් හෝ වැරදි වලට අදාළ තනි අපරාධ වගකීමක් තිබෙන බව දැක්වෙන සාක්ෂි හෝ අවස්ථාවන් පිළිබඳව විනිශ්චයකාරවරයෙකු විසින් මෙහෙයවන විමර්ශනයක් මගින් තහවුරු වන සාක්ෂි තිබෙන විට, ඒ සම්බන්ධයෙන් නීතිපතිවරයා සතුව තිබෙන සාක්ෂි පදනම් කරගෙන එම අධිකරණයෙහි විනිශ්චයකාරවරයෙක් ඉදිරියේ එම සාක්ෂි ඉදිරිපත් කිරීමට ශ්‍රී ලංකාවේ නීතිපතිවරයාට බලය ලබා දීම.
IV. නීතිපතිවරයා විසින් ලබා දෙන සාක්ෂි එම උසාවියේ විනිශ්චයකාරවරයා විසින් බැලූ බැල්මට නඩුවක් ලෙස පෙනෙන්නේ නම් යම් පුද්ගලයෙකුට එරෙහිව එම සොයාගැනීම් සිදුකරන ලද්දේනම් එම "නම් කරන ලද පුද්ගලයා" සත්‍ය සහ සහසන්ධාන කොමිෂන් සභාව ඉදිරියට කැඳවීම සිදුකරනු ලබන අතර ඔහුට එහිදී තෝරාගැනීමක් කිරීමට අවස්ථාව ලබා දෙනු ඇත. එසේ පැමිණීමට නොහැකි වුවහොත් පහත සඳහන් එක් දඬුවමකට හෝ දඬුවම් කිහිපයකට යටත් වීමට එම " නම් කරන ලද පුද්ගලයාට" සිදුවනු ඇත;

අ. දඩයක්

ආ. ප්‍රජා අයිතිය අහිමි වීම

ඇ. සිරදඬුවමකට යටත් වීම.

V. "නම් කරන ලද පුද්ගලයා" කැඳවීමට ප්‍රතිචාර දක්වමින් සත්‍ය සහ සහසන්ධාන කොමිෂන් සභාව ඉදිරියේ පෙනී සිටියහොත් එම " නම් කරන ලද පුද්ගලයාට" තෝරාගැනීමක් සඳහා අවස්ථාව ලැබෙනු ඇත. එම " නම්කරන ලද පුද්ගලයාගේ තේරීම් පහත ඒවායන් එකක් විය හැකිය;

අ) සත්‍ය සහ සහසන්ධාන කොමිෂන් සභාව ඉදිරියේ පෙනී සිට සාක්ෂි ලබා දෙන්නේද නැත්නම් උසාවිය ඉදිරියේ සිදුකරන නඩුවිභාගයක් තෝරාගන්නේ ද යන්න සඳහන් කළ හැකි ය.

ආ) "නම් කරන ලද පුද්ගලයා" සත්‍ය සහ සහසන්ධාන කොමිෂන් සභාව ඉදිරියේ පෙනී සිටීම තෝරාගෙන පූර්ණ වශයෙන් චෝදනා පිළිගන්නේ නම් එම " නම්කරන ලද පුද්ගලයා"ට ඉන්පසුව සත්‍ය සහ සහසන්ධාන කොමිෂන් සභාවට තමන් පිළිගත් කාරණය සම්බන්ධයෙන් සමාව සඳහා ඉල්ලුම් කළ හැකිය. තමන් ඉදිරියේ එම ඉල්ලීම සිදුකරන පුද්ගලයා අවංක සහ සත්‍යවාදී යයි සත්‍ය සහ සහසන්ධාන කොමිෂන් සභාව තෘප්තිමත්වන්නේ නම් එවන් පුද්ගලයෙකුට සමාවක් ලබා දීමට එම කොමිෂන් සභාව සතුව අභිමතානුසාරී බලයක් තිබෙන අතර එමගින් එම පුද්ගලයාට එරෙහිව ශ්‍රී ලංකාව තුළ තවදුරටත් යම් අපරාධ හෝ සිවිල් නඩු කටයුත්තක් සිදුකිරීම වැළැක්වීමට එමගින් හැකියාව ලැබේ. සමාව ලබා දීම සිදුකළ යුතු වුවත් සත්‍ය සහ සහසන්ධාන කොමිෂන් සභාවට තම අභිමතානුසාරී බලය මත යෝග්‍ය අවස්ථාවන්හිදී ප්‍රජා අයිතිය අහෝසි කිරීමට සහ හානිපූරණයක් නියම කිරීමට ද බලතල තිබිය යුතු ය.

ඇ) තමන් ඉදිරියේ පෙනී සිටින යම් පුද්ගලයෙක් සත්‍ය පැවසීමට අපොහොසත් වූ බවට සත්‍ය සහ සහසන්ධාන කොමිෂන් සභාව තෘප්තිමත් වන්නේ නම් එම " නම් කරන ලද පුද්ගලයා" ඉහත (V) (අ) හි සඳහන් ආකාරයට තම තෝරාගැනීමට අවස්ථාව දුන් කළ නඩු මාර්ගය තෝරාගත්තාක් මෙන් සළකා එම කාරණය නඩුමාර්ගයට යොමු කිරීමට කොමිෂන් සභාවට බලය තිබිය යුතු ය.

ඈ) " නම් කරන ලද පුද්ගලයා" ඔහුගේ / ඇයගේ නඩු විමසීම තෝරාගැනීම හෝ ඉහත (ඇ) හි සඳහන ආකාරයට කටයුතු කරන්නේ නම් එම කාරණය වෙනත් අපරාධ නඩුවක් විසඳන ආකාරයට ශ්‍රී ලංකා අධිකරණ සීමාව තුළ විභාග කෙරෙනු ඇත.

ඉ) වරදකරු බවට පත්වන ඕනෑම කෙනෙකුට එම තීන්දුවට එරෙහිව අභියාචනාධිකරණයට අභියාචනාවක් ඉදිරිපත් කළ හැකිය.

ඇමුණුම 5 |අතුරුදහන්වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයේ ප්‍රගතිය සහ කාර්යයන්

තම ක්‍රියාකාරකම්වල ප්‍රගතිය පිළිබඳ අතුරුදහන්වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය මෑතකදී ලබා දුන් යවත්කාලීන කිරීම්

	ක්‍රියාකාරකම	ප්‍රගතිය
අතුරුදහන් වූවන් පිළිබඳ කාර්යාලය		
1.0	අතුරුදහන්වූවන් පිළිබඳ කාර්යාලය ඩිජිටල්කරණය කිරීම අවසන් කිරීම	• අතුරුදහන් වූ ලිපිගොනු දත්ත පද්ධතියකට යවත්කාලීන කරන ල අතර එම ඩිජිටල්කරණය කිරීමේ ක්‍රියාවලියට රු. මිලියන 16 ක් වෙන් කර තිබේ. එම ගෙවීම සේවා සපයන්නා වෙත ලබා දෙන අතර දත්ත පද්ධතිය 2024 ජනවාරි අගදී සංවර්ධනය කරනු ඇත. • තාක්ෂණික කමිටුව සඳහා තොරතුරු සන්නිවේදන තාක්ෂණ නියෝජිත ආයතනයේ නියෝජිතයන්ව ඉල්ලා සිටින ලද අතර පවතින තත්ත්වය මත ඔවුන්ට සම්පත් හෝ කාර්ය මණ්ඩලය ඔවුන්ට ලබා දිය නොහැකි බව තොරතුරු සන්නිවේදන තාක්ෂණ නියෝජිත ආයතනය විසින් දැනුම් දෙන ලදී. • මේ සඳහා අතුරුදහන්වූවන්ගේ කාර්යාලය ගෝලීය ප්‍රමිති යවත්කාලීන කිරීම සඳහා ජාත්‍යන්තර රතු කුරුස සංවිධානය සමඟ සාකච්ඡා පැවැත්වූ අතර අතුරුදහන් වූවන් සඳහා ඵලදායී දත්ත කළමනාකරණ පද්ධතියක් සඳහා සහාය ලබා දීම සඳහා තාක්ෂණික සහාය ලබා දීමට එකඟ විය.ඒ අනුව ජනවාරි මසදී අමාත්‍යාංශ මට්ටමේ සාකච්ඡා පැවැත්වෙනු ඇත.
2.0	අතුරුදහන් වීමේ සහ මරණ සහතික නිකුත් කිරීම වේගවත් කිරීම	1. දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර්වරුන්ගේ සහාය සහිතව අතුරුදහන්වීමේ සහතික නිකුත් කිරීම වේගවත් කිරීම සඳහා රෙජිස්ට්‍රාර් ජෙනරාල්වරයා සමඟ අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය සමීපව වැඩකටයුතු සිදු කරයි. අතුරුදහන් වීම පිළිබඳ සහතික ලබා ගැනීම සඳහා පැමිණිලි 939 කට සහාය ලබා දුන් අතර මරණ සහතික ලබා ගැනීම සඳහා තවත් පැමිණිලි 816 කට සහාය ලබා දී තිබේ. 2. අතුරුදහන් වීම පිළිබඳ සහතික සහ මරණ සහතික ලබා ගැනීම සඳහා තවත් අයදුම්පත් 388 ක් රෙජිස්ට්‍රාර් ජෙනරාල්වරයා වෙත ඉදිරිපත් කරන ලදී.(මෙයට අතුරුදහන් වීම පිළිබඳ සහතික සඳහා 339 ක් ද මරණ සහතික සඳහා 49 ක් ද ඇතුළත් වේ) 3. මේ පිළිබඳ පසුවිපරම් කරන ලෙස රෙජිස්ට්‍රාර් ජෙනරාල් වරයා විසින් දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර්වරුන්ට වක්‍ර ලේඛ නිකුත් කරන ලදී. අතුරුදහන්වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයේ ප්‍රාදේශීය සම්බන්ධීකාරකවරු දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර්වරු සමඟ සහයෝගයෙන් කටයුත්ත කරති. 4. අතුරුදහන්වීම පිළිබඳ සහතික සහ මරණ සහතික නිකුත් කිරීම නිර්දේශ කිරීමේ දී අතුරුදහන්වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය සහ රෙජිස්ට්‍රාර් ජෙනරාල්වරයා සමගාමීව කටයුතු කරති. 5. ඉහත කාරණාවලට අමතරව, පවුලේ පුනර්ජීවනය අපේක්ෂාවෙන් ලිපිගොනු 1.889 ක් හානිපූරණ කාර්යාලය වෙත යොමු කර තිබේ. ඒ අතරින් 2023 වසරේදී 306 දෙනෙකුට රුපියල් මිලියන 61.2 කින් සහාය ලබා දී තිබේ.
3.0	අතුරුදහන්වීම පිළිබඳ සහතිකයේ	1. 2010 අංක 19 දරන මරණ ලියාපදිංචි කිරීමේ (තාවකාලික විධිවිධාන) පනතෙහි වලංගු කාලය

	වලංගුභාවය දීර්ඝ කිරීම	2023 දෙසැම්බර් 09 වන දින සිට 2028 දෙසැම්බර් 09 වන දින දක්වා තවත් වසර පහකට දීර්ඝ කිරීම. 2. මේ සම්බන්ධයෙන් අංක 2357/18 දරන නිල ගැසට් නිවේදනයක් නිකුත් කිරීම. 3. අතුරුදහන් වීම පිළිබඳ සහතිකය නිල වශයෙන් පිළිගැනීම සඳහා නීතිපති දෙපාර්තමේන්තුව සහ ශ්‍රී ලංකා මහ බැංකුව සමඟ අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය සාකච්ඡා පැවැත්වීම.
4.0	සෙවීම් ඒකකයේ ප්‍රගතිය	1. පොලිස්පති කාර්යාලයේ විශේෂ ඒකකයක් පිහිටුවා තිබෙන අතර අතුරුදහන් වූ පුද්ගලයන්ගේ ලිපිගොනු 75 ක් පමණ එම ඒකකය සමඟ හුවමාරුකරගෙන තිබේ. ඒකාබද්ධ මෙහෙයුම් ක්‍රියාත්මකව පවතී යි. 2. සෙවීමේ මෙහෙයුම් නිර්ණායක කෙටුම්පත් කිරීමේ දී 2023 දෙසැම්බර් 13 දින ජාත්‍යන්තර රතු කුරුස සංවිධානය සමඟ පවත්වන ලද රැස්වීමේ දී ගත් අදහස් ඒකාබද්ධ කිරීම. 3. අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයේ අධ්‍යක්ෂ මණ්ඩලය අනුමත කරන ලද සෙවීමේ මෙහෙයුම් නිර්ණායක 2024 ජනවාරි මස අවසන් වශයෙන් සම්පූර්ණ කරනු ඇත. 4. අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයේ සෙවීම් ඒකකයට අතුරුදහන් වූ ප්‍රද්ගලයන් 12කගේ ඉරණම සොයාගැනීමට/ හෝඩුවාවක් ලබා ගැනීමට හැකිවී තිබේ. මෙම පුද්ගලයන් පිළිබඳ තොරතුරු 2024 ජනවාරි මස මුලදී හෙළි කරනු ඇත.
5.0	නීතිපති දෙපාර්තමේන්තුවේ උපදෙස් සහිතව විමර්ශන ක්‍රියාවලියේ මෙහෙයුම් නිර්ණායක සම්පූර්ණ කිරීම.	1. එලදායී පැමිණිලි කළමනාකරණය ඉලක්ක කරගත් මෙහෙයුම් නිර්ණායක 2023 දී අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලද අතර වර්තමානයේ ක්‍රියාත්මක වේ. 2. අමාත්‍ය මණ්ඩලය දෙන ලද මෙහෙයුම් නිර්ණායක අනුව සෙවීම් මෙහෙයුම් නිර්ණායක සකස් කරනු ඇත. 3. ලිපිගොනු 512 ක් හඳුනාගෙන වසා දැමිය හැකිය යන පදනමින් අධ්‍යක්ෂ මණ්ඩලය වෙත යොමු කරන ලද අතර සෙවීම් ඒකකය මගින් කටයුතු කරන ලද ලිපිගොනු 12 ද මෙයට ඇතුළත් වේ.
6.0	මාධ්‍ය ක්‍රමෝපාය සංවර්ධනය කිරීම	ලද මාධ්‍ය සහ මාධ්‍යවේදීන් සමඟ උපදේශණ කටයුතු සිදුවී තිබේ; අග්‍රාමාත්‍ය කාර්යාලයේ මාධ්‍ය ඒකකය සහ ජනාධිපති මාධ්‍ය ඒකකය ද යවත්කාලීන කරන ලදී. 2. අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයේ වැඩ සඳහා වන දෘශ්‍යතාව වැඩිකිරීම - අතුරුදහන් වූ පුද්ගලයන් සොයාගැනීම පිළිබඳ සාර්ථක කථාන්තර පිළිබඳ තොරතුරු සහ සම්පූර්ණ කරන ලද විමර්ශන සහ පවුල්වලට ගෙවන ලද වන්දි / සහාය සහ පවුල්වල සාමාජිකයන්ගේ ධනාත්මක ප්‍රතිපෝෂණ ආදිය අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයේ වෙබ් අඩවියේ පළකිරීම සහ එම තොරතුරු බෙදා ගැනීම.
7.0	වින්දිත පවුල්වලට තොරතුරු සඳහා ප්‍රවේශය තහවුරු කිරීම	1. සිවිල් සමාජ සංවිධාන සහ දිස්ත්‍රික් ලේකම් කාර්යාලවල සහාය සහිතව අයදුම්පත් 4,819 ක් ලබා ගැනීමටත් ඔවුන්ගේ සාක්ෂි වාර්තාකර ගැනීමටත් අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලයට හැකිවිය. මෙය පළමුවන අදියරේ අතුරුදහන්වූ ලිපිගොනු වලින් 79.9% ක් පමණ වේ. (පළමු අදියරේ අතුරුදහන් වූවන්ගේ ලිපිගොනු සංඛ්‍යාව - 6075 කි) 2. අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය කොළඹ, උතුරු සහ දකුණු පළාත්වල සිවිල් සමාජ සංවිධාන සමඟ සාකච්ඡා පවත්වන ලදී. මෙම සාකච්ඡා පදනම්ව ව්‍යාපෘති යෝජනා තුනක් කෙටුම්පත් කරන ලද අතර අරමුදල් සම්පාදනය සඳහා අදාළ නියෝජිතායතන සමඟ හුවමාරු

		කරගන්නා ලදී. (මනෝ සමාජීය සහ ආර්ථික සහාය වෙත ඉලක්ක කර ගනිමින්, දත්ත ඇතුළත් කිරීම සහ ධාරිතා වර්ධනය සහ නෛතික දැනුවත්භාවය / වින්දිතයන්ට පුහුණු, මාධ්‍ය, උසාවි කාර්ය මණ්ඩලය සහ නීතිඥවරු අරමුණු කරයි) 3. අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය අඛණ්ඩව සහායෝගය ලබාගත හැකි ක්ෂේත්‍ර එනම් මනෝසමාජයීය සහාය/ ජීවනෝපාය සහාය/ ධාරිතා වර්ධනය සහ තාක්ෂණික සහාය වැනි ක්ෂේත්‍ර සමඟ අඛණ්ඩව සම්බන්ධ වී කටයුතු කරයි. 4. අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය මෙම ක්ෂේත්‍ර තුළ සාමූහිකව කටයුතු කිරීම සඳහා සංක්‍රමණිකයන් සඳහා වන ජාත්‍යන්තර සංවිධානය, ජාත්‍යන්තර රතු කුරුස සංවිධානය සහ සිවිල් සමාජ සංවිධාන සමඟ සාකච්ඡා පවත්වා තිබේ. 5. අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය විසින් අවශ්‍යතා තක්සේරු වාර්තාව ප්‍රකාශයට පත්කර තිබෙන අතර 2024 සඳහා වාර්ෂික සැළැස්ම අවශ්‍යතා තක්සේරුවේ සොයාගැනීම් පදනම් කරගෙන කෙටුම්පත් කර තිබෙන අතර එය සංක්‍රමණිකයන් සඳහා වූ ජාත්‍යන්තර සංවිධානය හා එක්සත් ජාතීන්ගේ නිත්‍ය සහ මානුෂීය සම්බන්ධීකාරක විසින් සිදුකර තිබේ.
		6. කැණීම් සහ මළසිරුරු ගොඩගැනීම් පිළිබඳ සම්මත මෙහෙයුම් පටිපාටි කෙටුම්පත් කරන ලද්දේ අධිකරණ වෛද්‍ය නිලධාරීන්ගේ සංගමය කොක්ක්තෝඩුවායි සිද්ධිය නියමු ලෙස ගෙන වේ.
	ඈ) ජාතික සමගිය සහ ප්‍රතිසන්ධානය සඳහා වන කාර්යාලය	
1.0	සහසන්ධාන ජාතික ක්‍රියාකාරී සැළැස්ම සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය (2022 -2026)	
	ඉ) හානිපූරණ කාර්යාලය	
1.0	අතුරුදහන් වූ තැනැත්තන්ගේ පවුල්වලට සහන ලබාදීමේ ප්‍රගතිය	